**2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.**

දිනය: 2020.07.03 වේලාව: ප.ව 3.55

සටහන් කළේ - නිල්මිණි කුමාරි විසිනි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

**පෙනී සිටීම**

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නීතීඥ රවිශානි පීරිස් මහත්මිය, ජනාධිපති නීතීඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

**<u>සාක්ෂි කැඳවීම ආරම්භ කරමි.</u>**

**සාක්ෂි අංකය : 128**
**නම : සනූන් මොහොමඩ් ඉෂාක්**
**වයස : අවුරුදු 52යි**
**ජාතිය : මුස්ලිම්**
**ආගම : ඉස්ලාම්**
**රැකියාව : ඉෂානා එක්ස්පෝර්ට් pvt limited company**
**තනතුර : කළමණාකරු.**

**ප්‍රතිඥා දී කැඳවයි. (දෙමළ භාෂාවෙන් ප්‍රතිඥා ලබා දෙයි)**
**මම මේ කියන සාක්ෂිය සැබෑය. සම්පූර්ණ සැබෑය. සැබෑවක්ම මිස අන්කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.**

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>**

ප්‍ර: මහත්මයා ඔබ දැනට Ishana exportආයතනයේ කළමනාකරු වශයෙන් සේවය කරනු ලබන බවට ප්‍රකාශ කරා?

පි: ඔව්.

ප්‍ර: ඔබ Ishana exportආයතනයේ කොපමණ කාලයක ඉඳලා සේවය කරනු ලබනවද?

පි: 1992 ඉඳන් මේ වනතුරු.

ප්‍ර: ඒ කියන්නේ ඔබ ආසන්න වශයෙන් අවුරුදු 28ක පමණ කාලයක් මේ Ishana exportආයතනයේ සේවයේ කරනු ලබනවා?

පි: ඔව්

ප්‍ර: ඔබ දැන් සේවයේ කරන්නේ කළමනාකරු තනතුරේ?

පි: ඔව්.

ප්‍ර: ඔබ මුලින් මේ 1992 වර්ෂයේ Ishana exportආයතනයේ රැකියාවට ආවේ මොන තනතුරටද?

පි: Account Clerk විදිහට.

ප්‍ර: ඉන්පස්සේ ඔබ එහි දීර්ඝ කාලයක් සේවය කරනකොට ඔබේ තනතුර වෙනස් වුණාද උසස්වීමක් විදිහට?

පි: ඔව්.

ප්‍ර: ඒ ගැන අපිට පැහැදිලි කරන්න.

පි: Account විදිහට හිටියා. ඊට පස්සේ Manager, Shipping Manager එහෙම තනතුරු හම්බුණා මට.

ප්‍ර: ඒ කියන්නේ මේ අපනයන අංශ කළමනාකරු විදිහට ඔබ සේවය කරනු ලැබුවා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්.

ප්‍ර: කොහේද මේ Ishana exportආයතනය පිහිටලා තියෙන්නේ ?

පි: නෝ:37, පරණ යොවුන් වීදිය , කොළඹ 12.

ප්‍ර: මේ ආයතනයේ අයිතිකරු කවුද?

පි: අයිතිකරු යුසුෆ් මොහොමඩ් ඊබ්‍රහිම්

ප්‍ර: දැන් මේ ආයතනයේ යම්කිසි අධ්‍යක්ෂක මණ්ඩලයක් ඉන්නවද?

පි: ඔව්.

ප්‍ර: කවුද අධ්‍යක්ෂක මණ්ඩලයේ ඉන්නේ ?

පි: අධ්‍යක්ෂක මණ්ඩලයේ chairman විදිහට යුසුෆ් මොහොමඩ් ඊබ්‍රහීම්.Managing Director හැටියට ඉන්ෂාෆ් අහමඩ්.Director විදිහට ඉල්හාම් මොහොමඩ්.

ප්‍ර: දැන් ඔබ කිව්වා මේ කොළඹ 12 ලිපිනයේ තමයි මේ ආයතනය පිහිටලා තියෙන්නේ කියලා?

පි: ඔව්

ප්‍ර: ඒ ආයතනයේ 2019 අප්‍රේල් කාලය වෙනකොට කොච්චර සේවක පිරිසක් සේවය කරනු ලැබුවද?

පි: ඔෆිස් එකෙන් 15 දෙනෙක් හිටියා.

ප්‍ර: මේ Ishana exportආයතනයෙන් මොනවද කරන ව්‍යාපාර කටයුතු?

පි: කුළුබඩු අපනයන කිරීමයි. Local Sales. ලංකාවේ විකිණීම

ප්‍ර: ඒකියන්නේ Local Sales කියලා ඔබ අදහස් කළේ මේ ලංකාවෙත් කුළු බඩු විකිණීමේ ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබනවා?

පි: සිදු කරනු ලබනවා.

ප්‍ර: දැන් ඔබ කිව්වා ඔබේ ඒ ආයතනයේ යුසුෆ් මොහොමඩ් ඊබ්‍රහීම් කියන පුද්ගලයායි තවත් ඉල්හාම් සහ ඉන්ෂාෆ් කියන පුද්ගලයන් දෙදෙනෙක්ගේ නම්?

පි: ඔව්.

ප්‍ර: ඒ යුසුෆ් මොහොම්ඩ් ඊබ්‍රහීම් කියන පුද්ගලයාගේ පවුලේ අයද ඔබ මේ අනිත් නම් සඳහන් කරපු අය?

පි: ඔව් පවුලේ අය.

ප්‍ර: කවුද එයාගේ?

පි: පුතාලා.

ප්‍ර: පුතාලා දෙදෙනා?

පි: පුතාලා දෙදෙනා.

ප්‍ර: දැන් ඔබ මේ Ishana exportආයතනයේ කළමනාකරු විදිහටම සේවය කරනකොට ඒ ස්ථානයේම තවත් ව්‍යාපාර කටයුත්තක රාජකාරි කරනවද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව් එකම office එකේම. කොලේසියස් pvt limited කියන ආයතනය සේවකයෝ වැඩ කරනවා. එතනම

ප්‍ර: ඒ කියන්නේ මේ Moore street එකේ තියෙන,Moorestreet එකේ අංක 37 කියන ස්ථානයේ තිබෙන office එකේම ඒ ගොඩනැඟිල්ලේම තමයි කොලෝසියස් පුද්ගලික සමාගමෙත් වැඩකටයුතු සිදු කරගෙන යන්නේ?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔබ ඒ ආයතනයේ කළමනාකරු විදිහට සේවය කරන්නේ ?

පි: දෙකේම.

ප්‍ර: මම අහන්නේ 2019 අප්‍රේල් කාලය වෙනකොට ඔබ ඒ කොලෝසියස් පුද්ගලික සමාගමේ කවුරු විදිහට ද සේවය කළේ ?

පි: Manager විදිහට කළමනාකරු

ප්‍ර: ඒ ආයතනයේ අයිතිකරු කවුද?

පි: ඒ ආයතනයේ අයිතිකරු මුලින්ම හිටියේ ඉන්ෂාෆ් අහමඩ් විතරයි. 2019 මාර්තු 29 දින අධ්‍යක්ෂකවරු ලෙස මොහොමඩ් යුසුෆ් මොහොමඩ් ඊබ්‍රහිම් , ෆාතිමා ෂික්කා ඉන්ෂාෆ් අහමඩ් දෙන්නාම අධ්‍යක්ෂක ලෙස දාලා තියෙනවා.

ප්‍ර: දැන් එහෙම මේකේ අධ්‍යක්ෂක වශයෙන් හිටපු ඉන්ෂාෆ් මොහොමඩ් යන අය ඉවත් කරලා අධ්‍යක්ෂක මණ්ඩලය වෙනස් කරා කියලා මහත්මයා දැන ගත්තේ කොයි වේලේද?

පි: ඒ registration එකේ copyක් මගේ ගාව තියෙනවා. මට දුන්නා. ඒකාලේ

ප්‍ර: ඔබ දැන ගත්තේ කොයි වෙලේද කියලා?

පි: April මාසේ

ප්‍ර: April මාසේ කවදද? අප්‍රේල් මාසේ කවදද?

පි: April මාසේ මුලදී

ප්‍ර: අප්‍රේල් මාසේ මුලදී ?

පි: ඒ කියන්නේ registration එකෙන් change copyක් මට භාර දුන්නා.

ප්‍ර: කවුද ඔබට ඒක ලබා දුන්නේ?

පි: අපේ office එකේ සේවය කරන එක්කෙනෙක්.

ප්‍ර: දැන් මේ කොලෝසියස් පුද්ගලික සමාගම, සමාගම් මැදුරේ ලියාපදිංචි කරලා තිබුණාද?

පි: ලියාපදිංචි කරලා තිබුණා. ලියාපදිංචි කරලා තියෙනවා 2011යේ.

ප්‍ර: ඒ ලියාපදිංචිය සම්බන්ධයෙන් ඒ ලේඛනත් කළමනාකරු වශයෙන් ඔබ භාරයේ තිබුණද?

පි: භාරයේ තියෙනවා.

ප්‍ර: ලියාපදිංචි අංකය කුමක්ද කියලා ඔබට මතක ද?

පි: PV78677

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**සාක්ෂිකරුට දැනටමත් C – 757 වශයෙන් ලකුණු කරපු ලේඛනයක් පෙන්වා සිටී.**

ප්‍ර: දැන් ඔබ මෙම පෙන්වන ලේඛනය හඳුනාගන්නවද?

පි: මේක හරි.

ප්‍ර: මොකක් ද මේක හරි කියන්නේ ?

පි: මේ කොලෝසියස් සමාගමේ විශේෂ registrationcopyඑක.

ප්‍ර: ව්‍යාපාරය ලියාපදිංචිය සම්බන්ධයෙන් තියෙන ලේඛනය?

පි: ඔව්.

ප්‍ර: දැන් මේ කොලොසියස් පුද්ගලික සමාගමේ කාර්යාලයේ ඔබ කළමනාකරු විදිහට සේවය කරා කිව්වා තව එහි සේවය කරන අය තව කී දෙනෙක් ඉන්නවද ?

පි: ඔක්කෝම 15 දෙනෙක් ඉන්නවා.

ප්‍ර: දැන් ඔබ කිව්වානේ ඉෂානා අපනයන ව්‍යාපාරයෙත් කළමණාකරු ඔබ කියලා ?

පි: ඔව්

ප්‍ර: ඊළඟට ඔබ කිව්වා සේවකයෝ 15ක් ඉන්නවා කියලා?

පි: ඔව්

ප්‍ර: දැන් මේ කොලොසියස් කියන ආයතනයේ සේවය කරන්නේ ඒකේ සේවය කරන අයමද නැත්නම් වෙනම සේවක කණ්ඩායමක් ඉන්නවද?

පි: ඒකේ සේවය කරන කට්ටියම තමයි මේකෙත් වැඩ කරන්නේ.

ප්‍ර: ඔබ ඇතුළු අනිත් අයත් ඒ Ishana exportආයතනයේ සේවය කරන අයතමයි මේ ආයතනයෙත් සේවය කරනු ලබන්නේ?

පි: ඔව්.

ප්‍ර: දැන් මේ කොලෝසියස් පුද්ගලික සමාගමේ දැන් ඔබ කිව්වානේ එතන තියෙන්නේ කාර්යාලයේ කියලා?

පි: කාර්යාලය.

ප්‍ර: දැන්මේකේ මේ මොනවා සම්බන්ධයෙන් ද ව්‍යාපාර කටයුතු කරන්නේ?

පි: තඹ exportකරන Company එකක්. තඹ අපනයනය කරන Companyක් මේ.

ප්‍ර: කොහේද ඔය කර්මාන්තය පිහිටලා තියෙන්නේ?

පි: කර්මාන්ත ශාලාව තියෙන්නේ 111/6, අවිස්සාවේල්ල පාර, වැල්ලම්පිටිය.

ප්‍ර: ඔබ ඔය අවිස්සාවේල්ල පාර වැල්ලම් පිටිය මේ තඹ කර්මාන්තශාලාව තිබිච්චි ස්ථානයට ගිහිල්ලා තියෙනවද ?

පි: ගිහිල්ලා තියෙනවා.

ප්‍ර: එහි සේවකයෝ කීදෙනෙක් විතර ඒ කර්මාන්ත ශාලාවේ සේවය කරාද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: කර්මාන්ත ශාලාවේ ලංකාවේ කට්ටිය 30 දෙනෙක් විතර හිටියා. විදේශ කට්ටිය ඉන්දියන් කට්ටිය 20 දෙනෙක් විතර, අනිකුත් නේපාලයේ එක්කෙනෙක් හිටියා. බංගලාදේශයේ කට්ටියත් හිටියා.

ප්‍ර: ඔබේ හිටපු සේවකයෝ සංඛ්‍යාව සම්බන්ධයෙන් විස්තර දන්නේ කොහොමද ?

පි: විස්තර මම office එකෙන් තමයි ඒගොල්ලන්ගේ පඩි ගෙවන්නේ. වීසා ඔක්කෝම දාන්නේ එතනින් අපි.

ප්‍ර: දැන් ඇයි මේ විදේශිකයෝ මේ කර්මාන්ත ශාලාවේ සේවයට බඳවා ගෙන තිබෙන්නේ?

පි: අර machineOperationsහැටියට දැනුමක් තියෙන්නේ විදේශ අර ඉන්දියන් කට්ටියට.

ප්‍ර: මොන machine Operators සම්බන්ධයෙන් ද?

පි: තඹ උණු කරන machine එහෙම තියෙනවා. ඒ machine වලින් වැඩ කරන හොඳ දැනුමක් තියෙන කට්ටිය ඉන්දියන් Companyක් තියෙනවා අපේ Import කරන්න. ඒ කට්ටියව තමයි වැඩ කරන කට්ටිය යවන්නේ.

ප්‍ර: දැන් ඔබ කිව්වානේ මේ තඹ කර්මාන්තශාලාවක් කියලා?

පි: ඔව්.

ප්‍ර: මොනවද ඒකේ නිෂ්පාදනය කරන්නේ

පි: නිෂ්පාදනය කරන්නේ තඹ බට, තඹ ටියුබ්, තඹ, rods

ප්‍ර: ඒවා නිෂ්පාදනය කරලා මොකද කරන්නේ ?

පි: නිෂ්පාදනය කරලා අපනයනය කරනවා.

ප්‍ර: කොයි රටටද අපනයනය කරන්නේ?

පි: වැඩි වශයෙන් ඉන්දියාවට. මුලදී නෙදර්ලන්තයට යවලා තියෙනවා. මැලේෂියාවලට යවලා තියෙනවා.

ප්‍ර: 2019 අප්‍රේල් කාලේ වෙනකොට කොයි රටට ද වැඩිපුර ඇරියේ?

පි: ඉන්දියාවේ.

ප්‍ර: ඒ කාලේ වෙනකොටත් වෙන රටවල් වලට යනවද?

පි: ඒ කාලේ වෙන රටවල් නැහැ. 2018,2019 මුලින්ම ඉන්දියාවේ තමයි යවලා තියෙන්නේ.

ප්‍ර: දැන් ඒ පිරවින් ගෙන සේවයන්ගේ දැන් ඔබ කිව්වා ඔබ කළමනාකරු විදිහට වීසා සම්බන්ධයෙන් කටයුතු කරනවා කියලා වීසා ලබාගැනීම සම්බන්ධයෙන්?

පි: ඔව්.

ප්‍ර: කොහොමද කටයුතු කරන්නේ ?

පි: අපේ office එකේ

ප්‍ර: කොහොමද කරන ක්‍රියාවලිය කියලා අහන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි: ක්‍රියාවලිය වාණිජ අමාත්‍යාංශයෙන් approve එකක් ගන්න ඕනි. Approve අරන් තමයි වීසා දාන්නේ.

ප්‍ර: දැන් ඔය තඹ වාණිජ කටයුතු අමාත්‍යාංශයට ඔබ මේ සේවකයන් සම්බන්ධයෙන් විස්තර හදලා ඉදිරිපත්කරනු ලබනවා?

පි: ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: ඉන් පස්සේ වෙන්නේ කොහොමද කියලා ඔබට දැනීමක් තිබෙනවද?

පි: දැනීමක් නැහැ.

ප්‍ර: දැන් ඔය කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු සඳහා මොනවද අවශ්‍ය වෙන්නේ?

පි: අඛලි ද්‍රව්‍ය

ප්‍ර: ලෝහ අඛලි ද්‍රව්‍ය ?

පි: ලෝහ අඛලි ද්‍රව්‍ය.

ප්‍ර: කොහොමද මේ කර්මාන්ත ශාලාවට ලෝහ අඛලි ද්‍රව්‍ය ලබා ගන්නේ?

පි: ලෝහ අඛලි ද්‍රව්‍ය ලබා ගන්නේ අපේ සැපයුම්කරු ගොඩාක් ඉන්නවා. ඒ සැපයුම් වැඩි පිරිසක් සපයන්නේ සැපයුම්කරු.

ප්‍ර: සැපයුම්කරුවන් කියන්නේ කවුද?

පි: අපිට ගෙනත් දෙන කට්ටිය ඉන්නවා ලංකාවේ කට්ටිය.

ප්‍ර: ලෝහ අඛලි ද්‍රව්‍ය ගෙනල්ලා දෙනවා?

පි: ගෙනල්ලා දෙනවා අපේ ෆැක්ටරියටම ගෙනල්ලා දෙනවා. විශාල වශයෙන් ඉන්නවා අපේ කට්ටිය. නම් වශයෙන් වුණත් ඕනිනම් කියන්න පුළුවන් මට. ඊට අමතරව ශ්‍රීලංකා ටෙලිකොම් ආයතනයෙන් වැඩිදුරට අපි ටෙන්ඩර් මඟින් අරන් තියෙනවා. IDB ආයතනයෙත් සුළු ප්‍රමාණයක් අරන් තියෙනවා.

ප්‍ර: IDB කියලා ඔබ කියන්නේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයද?

පි: ඔව් Industrial Development Board.

ප්‍ර: ඔබ සඳහන් කරා මේ සුළු වශයෙන් ලබා ගන්නවා කියලා?

පි: ඔව් එකේ මේ පොඩි ප්‍රමාණයක් අපි ගන්නේ මැතිනියනි.

ප්‍ර: ඒ කියන්නේ ඔබේ මේ කොලෝසියස් කර්මාන්තශාලාවේ මුළු නිෂ්පාදන ධාරිතාවෙන් ඔබ කියන විදිහට සුළු කොටසක් තමයි ලබා ගන්නේ මේ ?

පි: සුළුම සුළු කොටසක් IDB එකෙන් අරගෙන තියන්නේ. ඒ කියන්නේ මං පැහැදිලි කරනවානම්

ප්‍ර: පැහැදිලි කරන්න.

පි: පැහැදලි කරනවානම් 2012 ඉඳන් 2019 වෙනකොම් 2019 April වෙනකම් මට දැනුමේ හැටියටකන්ටේනර්370ක් විතර exportකරලා තියෙනවා. ඒ 370 වෙන් සාමාන්‍යයෙන් එක කන්ටේනර් යන ටොන් 20ක් ,25ක් අතරexportකරනවා. එහෙම වෙනවනම් ටොන් අටදහසකට වැඩිය අපි exportකරලා තියෙනවා. IDB එක අපිට හම්බවෙන අඛලි ද්‍රව්‍ය

FAIR COMMENT BY JEZEEM

ටොන් 150ක් විතර මම හිතන්නේ මගේ දැනුමේ හැටියට. මං අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුමේන්තුවට ලියකියවිලිcopies වගයක් දුන්නා. එකෙන් බලනකොට ඒතරමට තමයි අපිට ලැබිලා තියෙන්නේ කියලා අපිට කියන්න පුළුවන්.

ප්‍ර: ඒ කියන්නේ ඔබට කියන්න පුළුවන් ද මේ ප්‍රතිශතයක් විදිහට කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් කොච්චර විතර ප්‍රමාණයක් ද ලබා ගත්තේ කියලා මුළු නිෂ්පාදන ධාරිතාවෙන් ?

පි: 8000kgකටත් 150කටත්, 8000ක් අපි export කරලා තියෙනවා.8000කට වැඩිය. 150kg අපිට හම්බවෙලා තියෙන්නේ මම දන්න තරමට.

ප්‍ර: දැන් මේ කොලොසස් පුද්ගලික සමාගමේ අයිතිකරු නැත්නම් අධ්‍යක්ෂක කවුද?

පි: අධ්‍යක්ෂක ඉන්ෂාෆ් අහමඩ්.

ප්‍ර: මේ ඉන්ෂාෆ් අහමඩ් කියන අය ඔබ කොච්චර කාලෙක ඉඳලා අඳුරනවද?

පි: පොඩි කාලේ ඉඳන්ම අඳුරනවා. 1992 ඉඳන්ම.

ප්‍ර: ඒ කාලේ වෙනකොට ඔහු කොච්චර විතර වයසක කෙනෙක් ද ආසන්න වශයෙන්?

පි: අවුරුදු 10ක්

ප්‍ර: ඒ කාලේ ඉඳන්ම ඔබ ඔය පුද්ගලයා අඳුරනවා?

පි: අඳුරනවා.

දැන් වේලාව: ප.ව.4.15

මෙතැන් සිට ල/ලේ: චන්දිමා මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව:ප.ව 4.15
පෙර සටහන්:නිල්මිණි කුමාරි.
මෙතැන් සිට:චන්දිමා දිල්හානි.

**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය**

ප්‍ර: දැන් ඔහු මේ පරන යොන් වීදියේ තිබෙන රාජකාරි කාර්යාලයට නිතර එනවද?

පි: නිරත එනවා.

ප්‍ර: හැමදාම එනවාද?

පි: හැමදාම වගේ එනවා.අනිවාර්යෙන්

ප්‍ර: ඔහු 2019 අප්‍රේල් කාලය වෙන කොට ඔහු ඒ කාල වකවානුව වෙන කොට ඔහු කොහොම ද ඒ රැකියාව කරන ස්ථානයට ආවේ?

පි: සැලරි මාවත.

ප්‍ර: නැවත මං අහන්නම් ප්‍රශ්නය දැන් ඔබ කිව්වානේ මේ ඉන්ෂාෆ් අහමඩ් තමයි කියලා කොලෝසස් පුද්ගලික සමාගමේ අයිතිකරු කියලා?

පි: ඔව්.

ප්‍ර: ඔබෙන් අහන්නේ ඒ ඔබ රැකියාව කරපු කාර්යාලයේ පිහිටි ස්ථානයට ඉන්ෂාෆ් අහමඩ් හමදාම වැඩට එනවද?

පි: ඉන්ෂාෆ් අහමඩ් මුලදි හැමදාම වගේ ඔපිස් එකට එනවා. මෑත කාලයේදී මං හිතන්නේ අවුරුද්දක් විතර එයා සුමානයකට සැරයක් තමයි ඔපිස් එකට එන්නේ.

ප්‍ර: දැන් පැහැදිලි කරන්න ඉස්සර කියලා ඔබ සඳහන් කරේ කොයිකාලේද?අවුරුද්දක් විතර කියලා කිව්වේ කවදා ඉදලා අවුරුද්දකට විතර කාලයකද?

පි: 2018 භාගයේ ඉදන් 2019 වෙනකම් එයාගේ සෙඩ්‍යුල් එක වෙනස්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: 2018 කවදා ඉදලාද?

පි: 2018 මට මතක හැටියට ඒ හයවෙනි මාසයේ.ඒ වගේම කාලයේ ඉදන්.එයා මුලදි උදේ වරුවේ පැක්ට්‍රියට යනවා. පැක්ට්‍රියට ගිහිල්ලා දවල් වරුවේ ඔපිස් එකට එනවා. ඔපිස් එකට ඇවිල්ලා හවස් වෙනකම් ඉදලා තමයි ඔප් වෙලා යන්නේ. අන්තිම කාලයේදී උදය වරුවේ වැඩිම ඉන්නේ එයාගේ බිරිඳ ළමයින් එක්ක ගෙදර ඉන්නේ කෑමෙන් පස්සේ ප්‍රැක්ට්‍රි එකට යනවා. පැක්ට්‍රියට ගිහිල්ලා ප්‍රැක්ට්‍රියට යන මගින් තමයි අපෙන් වෙක් එහෙම අත්සන් කරලා ගන්නේ එහෙම නැත්නම් ප්‍රැක්ට්‍රියට ගිහිල්ලා වෙක් එහෙම අත්සන් කරලා ගන්නවා. හවස හතර,4.30 ,5.00 වෙනකොට අම්මාව බලන්න හමදාම යනවා වගේ සෙඩුයල් එකක් තිබෙනවා අපි එයා සදහන් කරේ.

ප්‍ර: දැන් ඔබ දන්නවානේ මේ ඉන්ෂෆා අහමඩ් දැන් ජීවතුන් අතර ඉන්නවද?

පි: නෑ.

ප්‍ර: කවදද ඔහු මිය ගියේ?

පි; 2019 අප්‍රේල් 21 වෙනිදා.

ප්‍ර: දැන් ඔය මිය යන කාලේට ආසන්න වශයෙන් කොච්චර කාලයක ඉදලද ඔහු සමාන්‍ය දින ඔහුගේ චර්යාව වෙනස් විදියට ඔපිස් එකට එන්න පටන් ගත්තේ?

පි: මාස 06 ක් නැත් නම් අවුරුද්දක් විතර වෙනවා අද දිනැතිව.

ප්‍ර: දැන් ඔබ කිව්වා හවසට අම්මාව බලන්න යනවා කියලා ඔබට දැනගන්න ලැබුණායි කියලා?

පි: දැන ගන්න ලැබුණා.

ප්‍ර: කොහේද ඔහුගේ අම්මා ඉන්නේ?

පි: මහවිල ග්‍රාඩින් එකේ.

ප්‍ර: දැන් ඔබ කොලෝසස් පෞද්ගලික සමාගමේ කළමණාකරු විදියට මොනවද ඔබට භාර වෙලා තිබ්බිච්ච රාජකාරි?

පි: අපනයන ඩොකියුමන්ට් සකස් කිරීම බැංකුවෙන් එම වැඩ බැලීම. හැමදාම දිනපතාම දෙන වෙක් පත් සල්ලි ඔක්කෝම ලියවීම දිනපොතේ ලියවීම

ප්‍ර: ඒ කියන්නේ මේ ඉන්සාෆ් අහමඩ් කියන මේ පුද්ගලයාගේ මුල්‍ය කටයුතු සම්බන්ධයෙන් ඔබ මූලික වශයෙන් කටයුතු කරේ ඔබ කියලා කිව්වොත් හරිද?

පි: හරි.

ප්‍ර: කොලෝසස් පුද්ගලික සමාගමට අදාලව බැංකු ගිණුම් කීයක් පවත්වාගෙන ගියාද?

පි: බැංකු ගිණුම් කොමර්ෂල් බැන්ක් එකෙන් ඇමරිකන් ඩොලර් එකවුන්ට් එකකුයි ජංගම ගිණුම්කුයි තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කොමර්ෂල් බැංකුවේ කුමන ශාඛාවේ මොන ගිණුම් අංකය යටතේද ඒ ගිණුම් පවත්වාගෙන ගියේ කියලා ඔබට කියන්න පුළුවන්ද?

පි: කියන්න පුළුවන්. කොමර්ෂල් බැංකුවේ පිටකොටුවේ ශාඛාවේ ජංගම ගිණුම් අංකය 1240011707 එකවුන්ට එකකුයි ඇමරිකන් ඩොලර් එකවුන්ට එක 1010003330 එකවුන් නම්බර් එක.

ප්‍ර: දැන් ඔබ මුලින් සාක්ෂි දෙන කොට කිව්වා මේ ඉෂානා එක්ස්පෝඩ් කියන ආයතනයෙන් අධ්‍යක්ෂකවරයෙක් විදියට ඉන්ෂාෆ් අහමඩ් සේවය කරයි කියලා ?

පි: එහෙමයි.

ප්‍ර: එසේම ඔබ කිව්වා යුෂුප් මොහොමඩ් ඉබ්‍රහිම්ට අමතරව ඉල්හාම් මොහොමඩුත් ඉෂානා සමාගමේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් කටයුතු කරයි කියලා දැන් එ අධ්‍යක්ෂක මණ්ඩලයේ යම් කිසි දවසකදි වෙනස් වීමක් සිදු වුනාද?

පි; 2018 දෙසැම්බර් 2019 මුලදී එයා ඉන්ෂාෆ් අහමඩින්,ඉල්හාම් මොහමඩින් වෙනම director බෝඩ් එකෙන් අයින් වෙනවා කියලා ලියුමක් දුන්නා තාත්තාට ඒ වගේ ලියුමක් බැන්කුවටත් දීලා තිබුණා.

ප්‍ර: ඇයි ඒ? ඔබට දැනීමක් තිබෙනවද ඇයි ඒ?

පි: මට කියපු කාරණාව ඒ තාත්තා බැංකුවෙන් ලෝන් පැසලිටිස් අරන් පොලිය ගෙවනවා පොලිය ගෙවන එක පාපයි එක හින්දා අපි මෙතනින් අයින් වෙනවා කියලා කිව්වා.

ප්‍ර: පාප කියලා කිව්වේ මොකක්ද ඒක තව පැහැදිලි කරන්න?

පි: ඉස්ලාම් ආගමේ හැටියට පොලිගන්න එක ගනුදෙනු කරන එක අපිටත් පාපයි කියලා කියන්නේ.

ප්‍ර: කාටද මේ ඉල්හාම් සහ ඉන්ෂාෆ් ඔබට කියලා තියෙනවද?

පි: ඉල්හාම් සහ ඉන්ෂාඩ් කියනවා මටම ඇහිලා තියෙනවා.මම බැංකුවේ යන්නේ මංනේ බැංකු කටයුතු සිදුකරන්නේ.

ප්‍ර: ඔවුන් මේ සමඟ ඔවුන්ගේ පියා ඉබ්‍රාහිම් සමඟ කතා කරනවා ඔබට ඇහිලා තියෙනවද? තාත්තා එක්ක කතා කරනවා? මං මේ අහන්නේ ඔය අධ්‍යක්ෂක දූරයෙන් ඉවත් වීම සම්බන්ධයෙන්?

පි: ඒක අපි දැනුවත් නැහැ.

ප්‍ර: දැන් ඔය ඔබ සඳහන් කරා ඉන්ෂාප් අහම්ඩ් යන අය 2018 ජූනි මාසෙන් විතර පස්සේ සාමාන්‍යයෙන් වැඩට එන එක වෙනස් කරලා දවල් වරුවේ තමයි ඔබේ කාර්යාලයට ආවේ කියලා?

පි: පැක්ට්‍රියට. මේ කර්මාන්ත ශාලාවට

ප්‍ර: කර්මාන්ත ශාලාවට ගියේ දවල් වරුවේ කියලා?

පි: ඔව්

ප්‍ර: ඔපිස් එකට ආවේ?

පි: හැම සුමානේකට සැරයක් එනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඊට පෙර ඔහු නිරතම හැමදාම ආවා?

පි: හැමදාම ආවා.

ප්‍ර: ඊට පස්සේ තමයි සුමානයකට සැරයක් එන්න පටන් ගත්තේ?

පි: සුමානයකට සැරයක් එන්න පටන් ගත්තේ.

ප්‍ර: ඉල්හාම් කියලා ඔබ සඳහන් කරපු මේ අනිත් අධ්‍යක්ෂකවරයා ඔපිස් එකට නිතර ආවාද?

පි: නිතර ආවේ නැහැ.මුලදි පැක්ට්‍රියට යනවා. ඉදලා හිටලා ඔපිස් එකට ඇවිල්ලා යනවා.

ප්‍ර: ඉල්හාම් ගැන අහන්නේ?

පි: ඉල්හාම් ඉල්හාම් ඉදලා හිටන් ඔපිස් එකට යනවා.ඒ කියන්න් අවුරුදු දෙකකට කලින්.ප්‍රැක්ට්‍රියේ ටික කාලයක් වැඩ කරා අපේ කුලු බඩු ප්‍රැක්ටියෙන් කොලිටි බලන විදියට වැඩ කරා. ඊට කලින් කැලෙක්සි සෙන්ටර් තිබුණා කෑගල්ලේ ඉන් පසුව බඩල් කුඹුරේ,එතැනින් අපි කුළු බඩු collect කරලා අපි ඔපිස් එකට පැක්ට්‍රියට යනවා.

ප්‍ර: දැන් ඔබ දන්නවද මේ ඉල්හාම් කියන අය දැනට ජීවතුන් අතර ඉන්නවද?

පි: නැහැ.

ප්‍ර: ඔහු මිය ගියේ කවදද?

පි: 2019 අප්‍රේල් 21 වෙනිදා ශ්‍රැංග්‍රිලා හෝටලයේ.

ප්‍ර: බෝම්බ පිපිරීමෙන් කියලා කිව්වොත් හරිද?

පි: හරි.

ප්‍ර: දැන් ඔබෙන් අහන්නේ ඉල්හාම් යන අය 2019 අප්‍රේල් කාලයට කලින් ඔය ව්‍යාපර කටයුතු වලට ආවාද රාජකාරියට?

පි: එයා මං වෙනම හිටියාට මං අවුරුදු දෙකක් විතර ආවේ නැහැ. කිසිම බිස්නස් එකකට පවුලේ හිටියේ නැහැ.

ප්‍ර: කිසිම බිස්නස් එකකට ආවේ නැහැ?

පි: ආවේ නැහැ.

ප්‍ර ඔහු වෙන මොනව හරි ව්‍යාපාරය කටයුත්තක් කලාද?

පි: ඒක නම් මං හරියට දන්නේ නැහැ. මහත්තයලාගේ ඉඩමක් තිබුණා ඒ ඉඩමේ ඉදිකිරිම්වල ගියාපු එක විතරයි මං දන්නේ.

ප්‍ර: ව්‍යාපාර කටයුතු වලට ආවේ නැහැ කියලා කියන්නේ?

පි: ආවේ නැහැ.

ප්‍ර: දැන් ඉන්සාප් අහමඩ් යන අය පදංචිවෙලා හිටියේ කොහේද?

පි: පදිංචි වෙලා හිටියේ කොල්ලුපිටියේ ඉදලා .

ප්‍ර: ඔහු විවිහා වෙලා හිටියාද ඒ කාලය වෙනකොට?

පි: විවාහ වෙලා හිටියා.

ප්‍ර: දරුවෝ හිටියද?

පි: දරුවෝ 4 දෙනෙක් ඉන්නවා.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර; ඔහු වාහනයක් පාවිච්චි කරාද? ඔහු මිය යන කාල වකවානුව වෙන කොට?

පි: කලිනුත් වාහනයක් තිබුණා ඊට පස්සේ අලුතෙනුත් වාහනයක් අරන් තිබුණා.

ප්‍ර: ඔහු මිය යන්න කොච්චර විතර කාලයකට කලින්ද ඔය වාහනය ගත්තේ?

පි: ඒ වාහනය මං දැක්කේ අන්තිමය මහත්මයා මුණ ගැහුනාට පස්සේ. 18 වෙනිදා. අප්‍රෙල් මාසයේ.

ප්‍ර: මොකක්ද වාහනය කියලා ඔබට මතකයක් තිබෙනවාද?

පි: ටොයටෝලා ලැන්ඩ් ක්‍රෘසර්.

ප්‍ර: දැන් ඔබේ කාර්යාලයේ මේ ඔපිස් එක කොච්ච විතර ප්‍රමාණයේ ඔපිස් එකක් ද කොටස් කියක් විතරද තියෙනවාද ඒ කියන්නේ ඔපිස් එකේ ඇතුල පිහිටීම අහන්නේ?

පි: පුල් ඉඩමම සික්ස් පර්චරස් පර්චස් 6 ඉඩම.

ප්‍ර: තනි තට්ටුවේ ගොඩනැගිල්ලක්ද තට්ටු කීපයක්ද?

පි: තට්ටු දෙකක්.

ප්‍ර: යට තට්ටුවේ මොනවද තියෙන්නේ?

පි: යට තට්ටුවේ මිස්ටර් ඊබ්‍රහිම්ගේ ඔපිස් එකක් තියෙනවා. මෙහා පැත්තෙන් කැෂියර්ගේ ඔපිස් එකක් තියෙනවා. උඩ තට්ටුවේ අපේ export කරන තැන වැඩක් තියෙනවා. conference room තියෙනවා.

ප්‍ර: ඔබ කිව්වා මේ උඩ තට්ටුවේ conference room එකකුත් තියෙනවා කියලා ?

පි: තියෙනවා

ප්‍ර: conference room රූම් එක මොනවටද සාමාන්‍යයෙන් පාවිච්චි කරන්නේ?

පි: සාමාන්‍යයෙන් පාවිච්චි කරන්නේ අපේ විදේශිකයන් අපේ එක්ස්පෝට් විදේශිකයෝ ආපු වෙලාවේ ඒ කොන්ෆරන්ස් එක තියෙනවා අනිත් එක ඉබ්‍රහිම් හජ්ජියාර් ට්‍රෙඩ් ස්ටේෂන් එකෙත් chairman කෙනෙක් ඒ ගොල්ලන්ගේ මීටින්වලටත් යූස් කරනවා.

ප්‍ර: ඊට අමතරව මේ conference room එක වෙනත් කටයුතුවලට යොදා ගන්නවා ඔබ දැකලා තියෙනවාද?

පි: මම දන්න විදියට අවුරුදු තුනකට කලින් අරාබි භාෂා ක්ලාස් එකක් තිබිලා තිබුණා එකෙන් ඒකට තුන්දෙනෙක් සහභාගී වෙලා තිබුණා .

ප්‍ර: තුන්දෙනා කවුද කියලා නම් කියන්න?

පි: ඉන්සාඩ් අහමඩ්,ඉල්හාම් මොහොමඩ්,ජමීල් කියලා කියනවා.

ප්‍ර: ජමීල් කියන්නේ කවුද?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ජමිල් කියන්නේ ඒ ගොල්ලන් අදුනන කෙනෙක් වෙන්න ඇති එයා ඔපිස් එකට එනවා.

ප්‍ර: දැන් ඔබ දන්නවානේ ජමීල් ගැන?

පි: ඔව්.දැන් ජමීල් දන්නවා.

ප්‍ර: ඒ කවුද මොකක්ද ඔබ කියන්න ඒ සම්බන්ධව?

පි: එයාගේ සම්බන්ධකම අපේ බොස්ගේ මහවිල ගාන්ඩ් එක ගෙදරට ඉස්සරහා ගෙදර ජමිල්ගේ අයියා ඉන්නවා එයාගේ අකිම් කියලා එහෙම තමයි දන්නේ.

ප්‍ර: දැන් ජමීල් ඉන්නවද ජීවතුන් අතර?

පි: නෑ.

ප්‍ර: එයාට මොකද වුනේ ?

පි; එයත් බෝම්බ පිපුරුමකට යනවා.

ප්‍ර: කොහේ පුපුරපු බෝම්බයකින්ද?

පි: දෙහිවල.

ප්‍ර දැන් මේ ඔබ කිව්වා conference room එකේ අරාබි භාෂාව උගන්වන පන්ති පැවැත්තුවායි කියලා?

පි: එහෙමයි.

ප්‍ර; ඒකට සහභාගිවුනේ ඉන්සාප්ට් ඉල්හාම් හා ජමිල් කියන අය කියලත් ඔබ දැකලා තියෙනවා කියලා ඔබ කිව්වා?

පි: කිව්වා.

ප්‍ර; conference room එක වායු සමීකරණය කරන ලද කාමරයක්ද?

පි; ඔව්.

ප්‍ර: AC කරන ලද කාමරයක්ද?

පි: AC කරන ලද කාමරයක්.

ප්‍ර එහි දොරවල් සම්පූර්ණයෙන් වහන්න පුළුවන්ද?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔබ කොහොමද දන්නේ අරාබි දැන් ඔබට කිව්වේ අරාබි භාෂාව උගන්වන පන්තියක් කියලා?

පි: ඔව්.

ප්‍ර: නමුත් ඒත් ඇතුලේ මොකද්ද උගන්වන්නේ කථා කරන්නේ කියලා පිටතට ඉන්න කෙනෙක්ට ඇහෙනවද?

පි: ඇහෙන් නෑ. මම ඇතුලට කීපාරක් ගිහිල්ලා තියෙනවා ඒ කියන්නේ අරාබි භාෂාව උගන්නපු. sir කෙනෙකුට 20,000.00 ක් පඩියක් දුන්නා ඒ පඩිය දෙන කොට මම ඇතුලට ගිහිල්ලා තිබුනා. බෝඩ් එකේ ලියලා තිබ්බ දේ මම බැලුවා අනෙක් එක පොතක් තිබුණා එතැන.තාම තියෙනවා ඒ පොත. ඒ ගොල්ලෝන්ගේ ඒ පොත .

ප්‍ර: මොනවද ඒ බෝඩ් එකේ තිබ්බේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: බෝඩ් එකේ අරාබි භාෂාව ලියලා අරාභි භාෂාවේ ලියලා ඉංග්‍රිසියෙන් බෝල් කියලා ලියලා බෝල්වලට අරාභි භාෂාවෙන් මොනවද කියන්නේ ඇපල් වලට මොනවද කියන්නේ ඒ වගේ බෙසිත් අරාභි භාෂාවක්උගන්නවලා තිබුණා.තොරතුරුවලට කලින්

ප්‍ර: ඒ අරාභි භාෂාව දැන් ඔබ කිව්වේ අරාබි භාෂාව උගන්වන්න කියලනේ උගනවන්න ආපු පුද්ගලයා ලංකාවේ එක්කෙනෙක් ද නැත්නම් පිටරට එක්කෙනෙක්ද නැත්නම් විදේශිකයෙක්ද?

පි: ලංකාවේ එක්කෙනෙක්.

ප්‍ර: ඔහු ඔබ හඳුනනවද ඔහු කවුද කියලා?

පි: නෑ දන්නේ නෑ.

ප්‍ර: ඔහුගේ නම දන්නවද?

පි: නම දන්නේ නැහැ දෙපාරක් දැකලා තියෙනවා.

ප්‍ර: ඇ?

පි: දෙපාරක් දැකලා තියෙනවා.සෙනසුරාදා වගේ දවස්වල

ප්‍ර: කොයි වගේ පුද්ගලයෙක්ද?ඔහු මොනවද අදින්නේ පලදින්නේ ඔබ දැකලා තියෙන දේ විස්තර කරන්න?

පි: කලිසන් සර්ට් ඇඳගෙන කොට එක්කෙනෙක්.

ප්‍ර: මූණ ඒ වගේ රැවුල වවලද ඒ වගේ විස්තර කරන්න?

පි: රැවුල වවලා තිබුණේ මුණ එහෙම මට කියන්න බැහැ.ඇතුලට ගිය වෙලාවේ දැක්ක එක තමයි වෙක් එක දෙන්න යන කොට තමයි දැක්කේ විතරයි. ඒත සුමාන දෙකක් නැත්නම් තුනක් තමයි දවස් තුනක් තමයි ඒ පැවැත්තුවේ.ඊට පස්සේ එක එත තිබුන් නැහැ.

ප්‍ර: දැන් මේ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් අඛ්ලි ලෝහ ලබා ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් කටයුතු කලේ කවුද?

පි: අපේ ඔපිස් එකේ සේවකයෙක්.

ප්‍ර: මොකක්ද නම?

පි: අබ්දුල් කාදිල්.

ප්‍ර: ඔබ ඒ සම්බන්ධයෙන් කටයුතු කලේ නැද්ද?

පි: කටයුතු කලේ නැද්ද ඒකට වෙක් ඉෂු කරන එක විතරයි මං බලන්නේ.

ප්‍ර: වෙක් ඉෂු කරනවා පමණයි .

පි: පමණයි.

ප්‍ර: ඒ වෙක් පොත් ඔබ භාරයේද තිබුණේ?

පි: භාරයේ තිබුණේ.

ප්‍ර: දැන් මේ ඉන්ෂාප් අහමඩ් කියන ඉන්ෂාප් අහමඩ්ව ඔබට ඔබ සඳහන් කරා 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා ඔහු මිය ගියා කියලා ඔබ ඔහුට අවුරුදු 10 කාලයක ඉදලා සෑහෙන කාලයක ඉදලා ඔබ ඔහුව දන්නවා දැකලා තියෙනවා කියලා කිව්වා?

පි: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් සාමාන්‍යයෙන් කොයි විදියේ පුද්ගලයෙක්ද?

පි: හරි හොඳ පුද්ගලයෙක් මට හොඳට ගෞරව කරන කෙනෙක් මට විතරක් නෙවේ කාට වුනත් හොඳට ගෞරව කරන කෙනෙක් වැඩ කරන කට්ටියටත් හරි කිසිම වෙලාවක බයිනෙත් නැහැ. ඒ වගේ හොඳ පුද්ගලයෙක්. මං දන්න විදියට .

ප්‍ර: දැන් ඔහු මිය යන්න ආසන්න කාලයේදී ඔබ කිව්වා 2018 ජූනි මාසේන් පස්සේ සාමාන්‍යයෙන් එදිනදා තිබිච්ච දින චර්යාවේ ඔබ වෙනසක් දැක්කා කියලා මොනවද ඔබ ඒ දැක්ක වෙනස් කම් පැහැදිලි කරන්න පුළුවන්ද?

පි; එකක් ඇදුමින් කලිසම අදිනකොට ගොඩාක් කොට විදියට අදිනවා.රෑවුල පොඩ්ඩක් වැඩිය වවාගෙන ගියා අනිත් එක වෙලාවට ආගම පිළිපදිනවා.කවුරු හිටියත් හරි සමහර සමර වෙලාවට විදේශිකයෝ ඇවිල්ලා හිටියත් හරි එයා යන්න ඕනේ කියලා ආගම පිළිපදින්න යනවා.

ප්‍ර: ඔහු ආගම ඔබ කිව්වා නේද මේ වැඩි වශයෙන් පිළිපදිනවා ඔබ දැක්කා කියලා ඔහුව මොනවද කතා කරලා තිබෙන්නේ ඔබත් සමඟ මේ ආගම සම්බන්ධයෙන් ?

පි: ආගම සම්බන්ධයෙන් වැඩියෙන් කතා කරලා නැහැ. මාත් එක්ක කතා කරලා තියෙන්නේ හරාම් දේවල් කරන්න එපා කියලා හරාම් කියලා.

ප්‍ර: මොනවද ඒ හරාම් කරන්න එපා කියපු දේවල් කියන්න ?

පි; හාරම් කියන්නේ බැංකු වැඩ තමයි කියන්නේ .

ප්‍ර: මොනවද බැංකු වැඩ?

පි: බැංකුවෙන් පොලියට සල්ලි ගන්නේ එක තාත්තාට අපි සල්ලි අරන් දෙන එක මටත් ඒක පවක් වෙනවා කියලා ඒකෙන් අයින් වෙන්න කියලා මටත් කියනවා.

ප්‍ර: දැන් ඔබට ඉන්ෂාප් අහමඩ් අවසන් වරට හමුවුනේ කවදද?

පි; 17,18, 2019 අප්‍රේල් මාසේ.

ප්‍ර: 2019.අප්‍රේල් 17 වෙනිදා.

ප්‍ර: 18,වෙනිදයි . දවස් දෙකක්.

ප්‍ර: 2019 අප්‍රේල් 17 වෙනිදා ඔබට කොහේදිද ඉන්ෂාප් අහමඩ් හම්බුනේ?

පි: ඉන්ෂාඩ් අහමඩ් දවල් වරුවේ එක හමාරතුලදි ඔපිස් එකට ආවා ඇවිල්ලා චෙක් එකක් ලියලා දුන්නා මට මාරු කරන් ගේන්න කියලා ඒ මිලියන 34 චෙක් එකක් ඒ චෙක් එක අරගෙන අපි ඔෆිස් එකේ සේවකයෝ දෙන්නෙක් එක්ක මම බැංකුවට ගියා ඒ චෙක් එක මාරු කරා මාරු කිරීමෙන් පසුව ඒ චෙක් එමවුන්ට එකෙන් මං ලක්ෂ 54 ඉන්ෂාඩ්ගේ මල්ලි වන ඉප්‍රලාල්ගේ එකවුන්ට එකට ඩිපොසිට් කරා බැලැන්ස් මුදල මං ඔපිස් එකට අරගෙන ආවා එකෙන් 27 දශම 05 මුදලක් ඉන්ෂාප්ට ලබා දුන්නා 1 දශම 1 මුදලක් මගේ සේප්පුවේ තියා ගත්තා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මිලියන 1 දශම 1 කින්ද?

පි: එකතුව 34 යි මිලියන.

ප්‍ර: දැන් ඔබ කිව්වා වෙක් එකක් ලියලා අත්සන්කරා කියලා මිලියන 34 ක ඊට පස්සේ ඔබ කිව්වා මේ යම් කිසි මුදලක් ඔහුගේ සහෝදරයාගේ බැංකු ගිනුවේ තැන්පත් කරා කියලා?

පි: එහෙහමයි.

ප්‍ර: නම් මොකක්ද සහෝදරයාගේ?

පි: ඉප්ලාල් අහමඩ්.

ප්‍ර: කාගේද උපදෙස් මත ද ඔහු ඒ ඉප්ලාල් අහමඩ් යන අයගේ ගිනුමේ තැන්පත් කරේ?

පි; ඉන්ෂාප්ඩ්ගෙන් .

ප්‍ර: ඒ කියන්නේ ඔබට කිව්වා ද එහෙම තැන්පත් කරන්නක කියලා?

පි: කිව්වා.

ප්‍ර: කොපමණ මුදලක් ඉන්ෂාප් ලබා ගත්තද?

පි: 27 දශම 5 ක මුඅදලක් .

පි: මිලියන?

පි: මිලියන 27 දශම 5යි

ප්‍ර: ඒ කියන්නේ ලක්ෂ 275 ක් ?

පි: 200ට

ප්‍ර: ඉතුරු සල්ලිවලට මොකද කරේ? ඉතුරු එතකොට ලක්ෂ 11 ක් වෙනවානේ?

පි: ඉතුරු ලක්ෂ 11 ක් මගේ සේප්පුවේ තියාගත්තා. ඊළඟ දවසේ ඇවිල්ලා එදා එකේ පොඩි කොල තිබුණේ 500 කොලකුයි,1000 කොලයකුයි ඊළඟ දවසේ 5000 කොලෙන් ඒක මාරු කරලා දෙන්න කියලා ඊට අමතරව තවත් ලක්ෂ 54 ක වෙක් එකකුත් අත්සන් කරලා දීලා ගියා.

ප්‍ර: එදාම?

පි: එදාම.

ප්‍ර: දැන් ලක්ෂක 275ක් ඉන්ෂාප් ඔහුගේ අතට ලබා ගත්තා කිව්වා තව ලක්ෂ 11 ක මුදලක් ඔබට සේපපුවේ තියන්න කියලා ඔබට උපදෙස් ලබා දුන්නද?

පි: උපදෙස් ලබාදුන්නා.

ප්‍ර: ඒ එක්කම තවත් ලක්ෂ 54 ක වෙක් පත්‍රයක් නැවත ලියලා දුන්නා?

පි: දුන්නා.

ප්‍ර: ඔබට දුන්නා?

පි: දුන්නා.

ප්‍ර: මොනවා කරන්න ද ඒ ලියලා දුන්නේ?

පි: ඊ ළඟ දවසේ ඒක මාරුකරලා දෙන්න කියලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ තවත් ලක්ෂ 54 ක් මාරු කරලා දෙන්නයි කියලා පහුවදාට?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔය ආකාරයට මේ ලක්ෂ 275 කියන්නේ සැලකිය යුතු විශාල මුදලක් ?

පි: විශාල මුදලක් .

ප්‍ර: දැන් ඔය ආකාරයට ඉන්ෂාප් ඔය විදියේ විශාල මුදල් නිතර ලබා ගන්නවද?

පි: නිතර ලබාගෙන නෑ. මිට කලින් ලබලා තියෙන්නේ ඉඩම් ගන්න කොට අරන් තියෙනවා ස්වාමිනි. ඉඩම් ගන්න කොට ලොකු ප්‍රමාණයක් අරන් තියෙනවා ඊට පස්සේ පොඩි පොඩි එමවුන්ට තමයි ගන්නේ. ලක්ෂ පහයි ලක්ෂ තුනයි. ඒ වගේ මුදල් තමයි අරගෙන තියෙන්නේ. එදා විතරයි ලොකු එමවුන්ට් එකක් අරන් තියෙන්නේ. ඒ පොතේ සඳහන් වෙලා තියෙන්නේ ඉන්ෂාප් අහමඩිට දුන්න විදියට.

ප්‍ර: දැන් ඔබ කිව්වා ඔබ පොතක් පාවිච්චි කරනවා කියලා?

පි: ඔව් ඩේ බුක් එක.

ප්‍ර: ඒ මුදල් ලබා ගැනීම් අදිය සම්බන්ධයෙන් ගිණුම් පවත්වාගෙන යනවද ඔබ ?

පි: පොතක් කියලා කිව්වේ ඔබ මොකක්ද පොත ?

පි: ඩේ බුක් දින පොත.

ප්‍ර: ඩේ බුක් එක හැමදාම ගනු දෙනු කරන හැම දෙයක්ම එකෙන් සඳහන් වෙනවා.

ප්‍ර: එය මේ අවස්ථාවේදී ඔබේ භාරයේ තිබෙනවද?

පි: දැන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ දීලා තියෙන්නේ.

ප්‍ර: දැන් ඔබ ඒ පොතේ මේ ලබා ගන්න මුදල් මුදල් සම්බන්ධ ගනුදෙනු දිනපතා සටහන් කරනු ලබනවද?

පි: දින පතා සටහන් කරනු ලබනවා.

ප්‍ර: දැන් මේ මොනවහරි විශාල මුදලක් ලබා ගත්තත් ඒ ලබා ගත්ත මුදල ලබා ගත්තේ මොකට ද කියලා කාරණය සාමන්‍යයෙන් එකේ ඉදිරියෙන් සටහන් කරනවාද?

පි; සමාන්‍යයෙන් සටහන් කරනවා.

ප්‍ර: දැන් මේ 2019.04 මාසේ 17 වෙනිදා ඔහු ලක්ෂ තුන්සිය මිලියන 34 ක ලක්ෂ තුන්සිය 40ක මුදලක් බැංකුවෙන් ලබා ගන්න කටයුතු කරයි කියලා ඔබ කිව්වා?

පි: ඔව්.

ප්‍ර: ඔහු අතට ලක්ෂ 275 ක් ඔහු අරගෙන ගියා කියලා ඔබ කිව්වා?

පි: කිව්වා දැන් ඔය පොතේ ඔය මුදල් ලබා ගත්තේ මොකට ද කියලා ඔබ කොහෙමද සටහන් කරලා තියෙන්නේ?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: මොකට ද කියලා එයාගේ නමින් ලියලා විතරයි කියලා තිබුණේ. ඒවිදියට මං ලියලා තියෙනවා.

ප්‍ර: වෙනදාට එහෙම කියනවද නැත්නම් ඒ ගන්නේ මොකටද කියලා දැනුම් ඔබටදෙනවද?

පි: සමහර කාලේ දැනුම් දෙනවා.සමහර පොඩි පොඩි එමවුන්ට් එයාගේ නමින් ලියන්න කිව්වා නම් එයාගේ නමින් ලියන්නේ.වැඩියෙන් අපිට අහන්න බැහැනේ.

ප්‍ර: දැන් ඔය විදියේ මුදල් ඒ කියන්නේ ව්‍යාපාර කටයුතුත්ත මොකක්ද කියලා ඔබ දැනුවත් නොකර මුදල් ඔය විදියට බැංකුවෙන් මීට කලින් ලබා ගෙන තියෙනවද?

පි: ලොකු එමවුන්ට් එකක් අපි අරන් නැහැ ඉඩම් ගන්න ඒක අරන් තියෙනවා සමහර දවස් වලට සල්ලි අරගත්තා නම් පස්සේ ඇවිල්ලා සඳහන් කරනවා මේකට කියලා.

ප්‍ර; දැන් මේ මුදල් ගත්තේ මොකටද කියලා ඔබට සඳහන් කරාද ?

පි: සඳහන් කරේ නැහැ.

ප්‍ර: දැන් ඔබ කිව්වා මේ 2019 සඳහන් කරේ නැහැ කියලා කිව්වා ඔබ ඇහුවාද මේ ලොකු ගානක් ලොකු මුදලක් මොනවද මේ හදිසියේ ගන්නේ කියලා නෑ ඇහුවේ නෑ ඇහුවේ නෑ වගේ ඇයි එහෙම ඇහුවේ නැත්තේ මේ දවස්වල ඉඩම් මොනව හරි ගන්නවද කියලා අපට කියන්න නැතුව ගන්නවද කියලා ඒක මම හරියට දන්නැහැ දැන් ඔබ කිව්වා 2019 4 වෙනි මාසේ 17 වෙනිදා තමයි ඔය ආකාරයට ඇවිල්ලා මේ මුදල් ලබා ගැනීම සිද්ධ කරේ කියලා?

පි: කියලා.

ප්‍ර: කොහොමද එදා ඉන්සාප් ආවේ? කොහෙට ඇවිල්ලද ඔබට ඔය මුදල් ලබා දෙන වෙක් අත්සන් කරලා දුන්නේ

පි: එයා ආවේ ත්‍රිවිල් එකෙන් ආවේ කියලා මට කිව්වා. එනකොට කරේ බැග් එකක් දාගෙන ඔපිස් එකට ආවා ඔපිස් එකේ එයාගේ රූම් එක ඇතුලේ තිබි මම තමයි එයාගේ සල්ලි අරන් කරේ දාපු බැග් එක ඇතුලේ දැම්මේ ඒ බැග් එක ඇතුලේ කහපාට කලිසමකුයි කැප් එකකුත් තිබුණා ඒ දෙක ඒළියට අරන් ඊට පස්සේ ඒ අර සල්ලි ඔක්කෝම බෑග් එකේ දාලා ඒ කලිසමකුයි කැප් එකකුයි උඩින් තියලා මම තමා භාර දුන්නේ ඊට පස්සේ කරේ දාගෙන යන කොට කොහොම ගියා ද දන්නේ නැහැ. ආවේ ත්‍රිවිල් එකේ කියලා කිව්වා.වාහනයේ සර්විස් එකට දාලා කියලා.

ප්‍ර: ඔහු සාමාන්‍යයෙන් ත්‍රිවිල් වල යන ත්‍රිවිලස් පාවිච්චි කරනවාද?

පි; සමාන්‍යයෙන් එයාගේ වෙහිකලේ එයා එලවගෙන එන එක්කෙනෙක්.

ප්‍ර: ඔහු සාමාන්‍යායෙන් මේ ඔබ ඔය බැග් එක ඇතුලේ තියෙනවායි කියලා දැක්ක විදියට සාමාන්‍යායෙන් තොප්පි දානවද?

Presidential Secretariat Copy
EAIR COMMENT BY JEZEEM

පි: තොප්පි දාන්නේත් නැහැ. කරේ බෑග් එකකුත් දාගෙන එන්නෙත් නැහැ.එදා තමයි පරස්ට් ටයිම් දැක්කේ.

ප්‍ර: බෑගය ඇතුලේ තිබිච්ච තොප්පිය කොයි වගේ එකක්ද?

පි; ඉස්සරහට තියෙන්නේ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

**සාක්ෂි කරු ඔහුගේ නළලට අත තියා ඉස්සරහට තොප්පියේ ඉදිරිපස් කොටස තිබූ හැටි සටහන් කර තබමි.**

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මිය</u>**

ප්‍ර: දැන් ඔබ කිව්වානේ මේ සාමන්‍යායෙන් බෑග් එහෙම කරේ දාගෙන එන්නේ නැහැ එදා බෑග් එකක් දාගෙන ආවා කියලා මොන වගේ බෑග් එකක්ද?

පි; අර ඉස්කෝලේ යන කාලේ බෑග් තියෙන්නේ පිටපස්සේ දාගන යන බෑග් තියෙන්නේ බැක් පැක් එක.

**දැනටමත් C 78 වශයෙන් ලකුණු කර ඇති CD පටයෙහි ඇති රූපයක් සාක්ෂිකරුට පෙන්වීමට අවසර ඉල්ලා සිටිනවා.**

ප්‍ර: සැක්ෂිකරු දැන් ඔබට මං මේ තිරයේ රූපයක් දිස්වෙනවා ඒකේ ඉන්න පුද්ලයා ඔබ හදුනනවද කියලා බලන්න?

පි: හදුනනවා ඉන්ෂාප් අහමඩ්.

ප්‍ර: දැන් ඔහු තොප්පියක් සහ බෑගයක් පැළදගෙන ඉන්නවා ඔබට පෙනී යනවද?

පි: ඔව්.

ප්‍ර: මොකක්ද ඔබට ඒ ගැන කියන්න පුළුවන්?

පි; ඒ හෝටලයේ ඇතුල් වෙන තිරයක් .

ප්‍ර; ම්ම.ම්.

පි ඒ හෝටලයට ඇතුල්වෙන තිරයක්.

ප්‍ර: දැන් ඔබ කිව්වානේ ඔබ එදා 2019 .04 වෙනි මාසේ 17 වෙනිදා දකින අවස්ථවේදී ඔහුගේ බෑග් එකේ තොප්පියක් තියෙනවා කියලාස?

පි: ඔව්. ඒ කළු පාට තොප්පියක්.මේ වගේම තොප්පියක් කළු පාට.

ප්‍ර: බෑග් එක ගැන මොකක්ද ඔබට කියන්න පුළුවන්?

පි: මේ බෑග් එකක් නෙමේ .බැලැක් ඇන්ඩ් .

ප්‍ර; රූපයක් බලන්න තීරයක පෙන්වා සිටිනවා ඉන්න පුද්ගයා ඔබ හදුන ගන්නවද?

පි: ඔව් ඉන්ෂාඩ් අහමඩ්.

ප්‍ර: අ.....?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඉන්ෂාප් අහමඩ්.

ප්‍ර: මොනවද ඔබට දකින්නට ලැබෙන්නේ?

පි; ඒ කැප් එකයි බෑග් එකයි දාගෙන ආපු එක තමයි.

ප්‍ර: ඇ...?

පි: එයා ඔපිස් එකෙන් ආපු ඒ කැප් එකයි එම බෑග් එකයි.

**මේ අවස්ථාවේදී සාක්ෂිකරුට පෙන්වා සිටිනවා දැනටමත් C709 වශයෙන් ලකුණු කරන ලද CD තැටියේ ඇති දර්ශනයක් බවට ගෞරවයෙන් සැල කර සිටිනවා.**

ප්‍ර: දැන් එදා මේ 2019 අප්‍රේල් 17 වෙනිදා ඉන්ෂාප් අහම්ඩ් ඔබට වෙන මොනවාහරි කිව්වාද?

පි; වෙන මුකුතු කිව්වේ නැහැ.සල්ල ටික අරන් ගියා.

ප්‍ර: දැන් තව ඔබ කිව්වා ලක්ෂ 54 ක වෙක් පතක් මුදල් කරලා සේප්පුවේ තියන්න කියල ඔබට දැනුම් දුන්නද?

පි; දැනුම් දුන්නා.

ප්‍ර; ඔබ ඒ අනුව ක්‍රියා කරාද?

පි: ඔව්.

ප්‍ර: ඔබ සඳහන් කරා ඊට පස්සේ 2019.04 වෙනි මාසේ 18 වෙනිදා ඔබට ඉන්ෂාප්ව හම්බුනායි කියලා?

පි: ඔව්.

ප්‍ර ඒ කොහේදීද හම්බුනේ?

පි: 2019..18 වෙනිදා රෑ 7 ,8 වෙලාවක් ඇති මගේ කාර්යාලයට පැමිණියා නොම්බර් 37 ,පරණගම වීදියේ කාර්යාලයට එයා ජීප් රථයෙන් ඇවිල්ලා කාර්යාලයේ එළියේ ඉදන් මට එන්න කියලා කිව්වා. පල්ලෙහාට ඒ මුදල් අරන් එන්න කියලා එකේ තිබුණු මුදල 6.5 ක මුදලක් මගේ අතේ තිබුණා.

ප්‍ර: 6 දශම 5 ක මුදලක් කියන්නේ ලක්ෂ 65 ක්ද?

පි: ලක්ෂ 65 ක් ලක්ෂ 54 ක වෙක් එක මාරු කිරීමයි කලින් 1.1 මිලියන් මගේ ගාව තිබ්බිව ඒදෙකේ එකතුව ලක්ෂ 65 ක් ඒ මුදල රැගෙන පල්ලෙහාට එන්න කියලා ජීප් එකේ පිටිපස්සේ කෑල්ලෙන් ඒක තියන්න කියලා කිව්වා ඒක තිබ්බා පසුව ඒ ජීප් රථයේ ඕරිජිනල් පොත අලුතෙන් ගත්ත ජීප් රථයේ ඔරිජිනල් පොත සහ සමහර ලියකියවිලි මට භාර දී පරිස්සන් කර තියන්න කියලා කිව්වා.

ප්‍ර: ඒ කියන්නේ ජීප් රථයේ ලියාපදිංචිය සම්බන්ධව?

පි: ලියාපදිංචිය සම්බන්ධ කොට පරීස්සන් කරලා තියන්න කියලා කිව්වා පසුව මට වෙක්පත අරන් එන්න කිව්වා. වෙක් 10 ක් අත්සන් කිරීම සඳහා මගේ ජීප් රථයේ මගේ ලාච්චුවේ තියලා වෙක් බුක් වෙක් 10 ක් සීල් කර ගෙන පල්ලෙහාට අරන් ඇවිත් බැලැන්ක් වෙක් 10 ක් එයා අත්සන් කරලා දුන්නා

FAIR COMMENT BY JEZEEM

ප්‍ර; ඒ මොන බැංකුවෙන්ද?

පි කොමර්ෂල් බැංකුවෙන්. අර කොලෝසස් ආයතනයෙන් ජංගම ගිනුමෙන්

ප්‍ර: මොන ගිනුමෙන්ද ගිණුම් අංකයත් සටහන් කරන්නකෝ?

පි: 1240011707 එකවුන්ට් එකෙන් ඒ චෙක් පොත දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවෙන් ඒ දවස්වල මුල දවස්වලම භාර දීලා තියෙනවා.

ප්‍ර; දැන් ඒ චෙක් අත්සන් කරේ කොහේ ඉදන්ද?

පි: ජීප් එකේ ඉදන්. ජීප් එකේ ඇතුලේ ඉදන්.

ප්‍ර: ඒ ජීප් රථයේ එදා වෙන කවුරු හරි හිටියද?

පි කවුරුත් හිටියේ නැහැ එයා විතරයි හිටියේ.

ප්‍ර: තනියෙන්ද ආවේ?

පි: තනියෙන් ආවේ.

ප්‍ර: දැන් ඔහු මේ ආකාරයට හිස් චෙක් පත් අත්සන් කරලා මීට කලිනුත් එහෙම දෙනවද?

පි; මීට කලිනුත් එහෙම දෙනවා. සමාන්‍යයෙන් පිටරට යනකාලයේ මක්කම යන කාලයේ බැලැන්ක් චෙක් අත්සන් කරලා මට දීලා යනවා. එකේ ගනු දෙනු මං ඒ දවස්වලම මං එවා වට්ස් සැප් කරනවා. බැලැන් චෙක් ඔක්කෝම එදාට දෙන්න ඕන පේමස් ඕකේකාම ලියලා චෙක් එකේ ගිනුම කාට කාටද දෙන්නේ කියලා විස්තරේ දීලා ඒ පොටෝ අරන් වට්ස්සැප් කරනවා. සමාන්‍යයෙන් සිද්ධ වෙන එකක් පිටරට යන කාලේ.

ප්‍ර: දන් ඔය චෙක් 10 ක් එදා අත්සන් කරලා දුන්නායි කියලා කිව්වානේ ?

පි: ඔව්

ප්‍ර: ඒ වගේ චෙක් 10 ක් වගේ ලොකු සංඛ්‍යාවක් දීලා තියෙනවද?

පි: දීලා තියෙනවා.10,20 ක් විතර අත්සන් කරලා යනවා.

ප්‍ර: දැන් එදා ඔබ ඇහුවේ නැද්ද ඇයි මේ හිස් චෙක් අත්සන් කරලා දෙන්නේ කියලා මොනවටද ඒක පාවිච්චි කරන්න ඕනේ කියලා මොකටද කියලා?

පි: පරීස්සම් කරලා තියන්න කියලා විතරයි කිව්වේ. මං හිතුවා කොහේ හරි යනවා ඇති කියලා.

ප්‍ර: ඔහු සාමන්‍යයෙන් පිරට යනවානම් ඔබට කලින් දැනුම් දෙනවද?

පි: කලින් දැනුම් දෙනවා.

ප්‍ර: දැන් මේ අවස්ථාවේදී එහෙම ඔබට දැනුම් දිමක් කරලා තිබුණද?

පි: දැනුම් දීමක් කර තිබුණ් නැහැ. ඒ වුනාට එයා මැලේසියා යන්න ටිකට් පත්වගයක් මේවා කරලා තිබුණා මං හිතන්නේ 23 වෙනිදා එයා එයාගේ පවුලේ කට්ටියත් සමඟ සමාන්‍යයෙන් අප්‍රේල් නිවාඩු කාලයේ කොහේහරි යනවා. ඒවගේ මැලේසියා යන්නත් ටිකට් එක බුක් කරලා තිබුණා. එක මං පසුව තමයි දන්නේ. මේ කේෂ් එකෙන් පසුව අපරාධ පරීක්ෂන දෙපාර්ත මේන්තුවත් සමඟ ටිකට් පර්චර්ස් කරපු තැන් වලට ගියා ගිය වර තමයි දන්නේ එයා මැලේසියා යන්න 23 වෙනිදා ටිකට්

FAIR COMMENT BY JEZEEM

බුක් කරලා සල්ලි පේ කරලත් තියෙනවා. ඒ වගේම මැයි මාසේ මක්කම යන්නත් මුළු පැමිලියම යන්නත් ටිකට් වෙන් කරලා තියෙනවා.

ප්‍ර: ඒ මාසේ කිව්වේ කොයි මාසේද?

පි: මැයි මාසේ .

ප්‍ර: මැයි මාසේ 2019 මැයි මාසේ?

පි: 2019 මැයි මාසේ.

ප්‍ර: දැන් ඔය 2019 අප්‍රේල් ඔබ සඳහන් කරේ 23 ක දී හෝ ආසන්න දිනයකදි මැලේසියා යන්න ටිකට් බුක් කරලා තිබ්බායි කියලා?

පි: ඔව්.කරලා තියෙනවා.

ප්‍ර: ඒ පස්සේ ඔබ දැන ගත්තාද කොයි ආයතනයෙන් මේ අකාරයට ටිකට් වෙන් කිරීම කරලා තිබුනේ කියලා?

පි: ඔව් මම අපරාධ පරික්ෂණ දෙපාර්තමේනතුවත් එක්ක මමත් ගියා ගිහිල්ලා ඒගොල්ලෝ එක් inquire කර ගත්තා.

ප්‍ර: කොහේද ඒ කුමන ආයතනද?

පි: ද ට්‍රැවල් ගෝබල් කියලා.කම්පැනියක් කොටුවේ පිපල්පාක්ස් තියෙන්නේ.

ප්‍ර: ට්‍රැවල් බැනක් ද?

පි: ට්‍රැවල් බෑග්.ද ට්‍රැවල් බෑන්ග්

ප්‍ර: අයේ කියන්න නම්?

පි: ද ට්‍රැවල් බෑග්.

ප්‍ර: ඔහු වෙනදට පිටරය යන කොට මේ ටිකට් වෙන් කිරීම කරන්නේ කොයි ආයතනයෙන්ද?

පි: ද ට්‍රැවලස්,ට්‍රැවල්ස් බැන්ග් කම්පැනි දෙකෙන්ම කරනවා.

ප්‍ර: දැන් මේ ඔහු ඔය 2019 මාර්තු මාසේ ඒ ආසන්නයේ කාලයේදී ආයතනය මොනවාහරි විශේෂ දානමය කටයුත්තක් ලැස්ති කරලා තිබ්බාද? දානයක් දුන්නද?

පි: ආයතනයේ දානයක් දුන්නේ නැහැ. මේ එළු මස් එළු කපලා මස් වගයක් දුන්නා මාර්තු මාසේ අන්තිම වගේ මගේ මතකය හැටියට.

ප්‍ර: කොපමණ වශයෙන් ද ආසන්න වශයෙන් ද කොච්චර විතර කිලෝ ප්‍රමාණයක්ද ?

පි: කිලෝ ස්වාමිනි බැග් එකට ස්වාමිනි කිලෝ 2 ක් විතර එයි. මට එළු එකක් විතර එක එළු කපලා එකේ මස් ටික මට දුන්නා.ස්ටාෆ්ස්ලාට බෙදන්න කියලා.මම මගේ මල්ලිත් එක්ක ත්‍රිවිල් එකෙන් බෙදුවා අනිත් ඒවා අපේ ප්‍රැක්ට්‍රියේ ඩ්‍රයිවර් කෙනෙක් හිටියා ලොරිත් එක්ක එයත් අරන් ගිහිල්ලා ඇති. මං හිතන්නේ තුනක් හතරක්වත් කපලා ඇති.

ප්‍ර ඇ?

පි: මං හිතන්නේ එළු තුනක් 4 ක්වත් කපලා ඇති.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ කිව්වා ඔබ තමයි මේ අපනයන මේ ඉන්ෂාප් අහමඩ්ගේ කොලෝසස් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන අපනයනය කිරීම සම්බන්ධයෙනුත් කටයුතු කරන්නේ කියලා මේ අපනයනය කරන්නේ මොනවද?

පි: අපනයනය කරන්නේ තඹ.

ප්‍ර: තඹ මොනවා වශයෙන්ද අපනයනය කලේ ?

පි: තඹ කම්බි, තඹ බට ,තඹ රෝඩ්.

ප්‍ර: සාමාන්‍යයෙන් මාසයකට මේ තඹ නිෂ්පාදන කොපමන විතර ප්‍රමාණයක් අපනයන කරනවද?

පි: එක එක කාලය difference එකක් තියෙනවා. 2017,2018 කාලයේ වැඩි ප්‍රමාණයක් export කරලා තියෙනවා.මන් දන්න මතකය විදියට ඒ අවුරුදු දෙක කන්ටේනර් අවුරුදු 150 කට වැඩිය export කරලා තියෙනවා.

ප්‍ර: මාසයකට සාමන්‍යයෙන් ?

පි: මාසයකට සාමාන්‍යයෙන් කන්ටේනර් 08 ක් 10 ක් විතර.

ප්‍ර: මේ කොච්චර විතර ප්‍රමාණයේ කන්ටේනර්ද?

පි: අඩි 20 කන්ටේනර් එකෙන් ටොන් 20,25 විතර ප්‍රමාණයකින්.

ප්‍ර: දැන් මේ යවන ඔබ ගිණුම් කටයුතු කරන නිසා ඔබ දන්නවා ඇතිනේ මේ යවන එක කන්ටේනර් එකක වටිනාකම ආසන්න වශයෙන් කොච්චර විතර වෙනවද?

පි: ඒක කාලෙන් කාලය ඩිපරෙන්ට් වෙනවා සාමාන්‍යයෙන් එක කන්ටේනරයට 12 ලක්ෂයේ ඉදලා ලක්ෂ 130 ක් වෙනකම් යනවා .

ප්‍ර: රුපියල් වලින් මුදල්වලින් කිව්වොත්?

පි: කොට දෙකයි දෙක හමාරයි වෙනවා. එකේ ඩොලර් different එකක් තියෙනවා මිලේ different එකක් තියෙනවා. ඒ කාලයේ වෙනස් වන විදියට.

ප්‍ර: කෝටි?

පි: කෝටි දෙකක ප්‍රමාණයක් තමයි එන්නේ.

ප්‍ර: දැන් අවසාන වශයෙන් මේ ඔහු ඉන්සාප් අහමඩ් මිය යන්න කලින් අවසාන වශයෙන්මේ කන්ටේනර් අපනයන කිරීම තඹ අපනය කිරීම කොයි කාලේද කලේ?

පි: මාර්තු අන්තිම ඉදන් අප්‍රේල් 12 වෙනකම් අපි එක්ස්පෝට් කරලා තියෙනවා. එකෙන් මට මතක හැටියට කන්ටේනර් පින් 07 ක් විතර කරලා ඇති.එකට ඩොලර් නම ලක්ෂ පනස්දාහක් පමණ අපිට funds එන්න තිබුණා. මන් බැකුවලට document දීපු විදියට නමලක්ෂ පනස් දාහක් විතර ඩොලර් නම් නම ලක්ෂ පනස් දාහක් අපට එන්න තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

**ප්‍ර:** **මේ අවස්ථාවේදී සාක්ෂිකරුට හඬ පටයක් ඔබට දැන් හඬපටයක් අසන්නට සලස්වනවා ඒ හඬ පටයේ අහලා කටහඬ කාගේද ඔබට හදුන ගන්න පුළුවන්ද කියලා බලන්න එසේම එය ද්‍රවිඩ භාෂාවෙන් තිබෙනවා නම් ඒක සිංහලයට ඔබට පරිවර්ථනය කරලා මොනවද කියලා තියෙන්නේ කියලා හැකියාවක් තියෙනවද ඇහුවොතින් ඔබ**

පි: ඇහුවොතින් පුළුවන්.
**ඒ සඳහා අවසර ඉල්ලා සිටිනවා**

ප්‍ර: ඒ කට හඬ කාගේ ද කියලා ඔබට හදුන ගන්න හැකියාවක් තියෙනවද?

පි: තියෙනවා. ඉන්ෂාෆ් අහමඩ්.

ප්‍ර: නම හයියෙන් කියන්න?

පි: ඉන්ෂාෆ් අහමඩ්.

වේලාව.ප.ව. 4.15
මෙතැන් සිට මුතුමාලි

වේලාව : ප.ව.05.15 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>
**මේ අවස්ථාවේදී සාක්ෂිකරු හට ඇසීමට සැලැස්සූ පටිගත කිරීම සවන් දීමෙන් පසු ඔහු ඉතාම සංවේදී වූ බව සටහන් කර තබමි.**

**********

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>



President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ ඒ හඬ පටිය ශ්‍රවණය කළානේ?

පි : ඔව්.

ප්‍ර : ඔබට ඒ හඬ පටිත තිබුණේ ද්‍රවිඩ භාෂාවෙන්?

පි : ද්‍රවිඩ භාෂාවෙන්.

ප්‍ර : ඔබට එය කොටස් වශයෙන් නැවත අහන්න සැලැස්සුවොත් ඒක සිංහලට පරිවර්තනය කරලා කියන්න පුළුවන්ද?

පි : කියන්න පුළුවන්. සාලම් කියලා එයා පටන් ගන්නවා. ඉන්ෂාෆ් කියනවා සේවකයන්ට සමහර දේවල් එයා දීලා තියෙනවලු ඒක හරියට කරන්න කියලා පළමුවෙන්ම කියනවා. ඒ කියන්නේ අමානිදම් කියන්නේ එයා මොනවා හරි දෙයක් අපිට දීලා තියෙනවා නම් මොනවා හරි කරන්න කියලා තියෙනවා නම් ඒක හරියට කරන්න කියලා කියලා තියෙන්නේ. ඒ කියන්නේ සේවකයොන්ට කියනවා එයා ජීහාත් කරන්න යනවා කියලා. ඒ හින්දා දෙවියන් වහන්සේ වෙනුවෙන් ඒක අපිට ඒක පිළිගන්න කියලා කියනවා. දෙවියන් වහන්සේ වෙනුවෙන් පිළිගන්න දෙවියන් වහන්සේ වෙනුවෙන් පිළිගන්න කියලා දෙතුන් පාරක්ම කියනවා. එයා ජීහාත් කරන්න යන්නේ කියලා. ඒ කියන්නේ Job කරන කට්ටිය එයා කාට කාටද මොනවද දීලා තියෙන්නේ ඒක ඒ විදිහටම පිළිපදින්න ඕනේ ඒ අමානිදම් එක පිළිපදින්න ඕනේ. ඒ වේලාවේ එයාගේ ළමයි සමහර වේලාවට ඉගෙල් වෙන්න පුළුවන්ලු. එයාගේ කිසිම දෙයක් නැති වෙලා යන්න පුළුවන්ලු. එහෙම වුනොත් හරි අල්ලාහ් දෙවියන් ඒ වෙනුවට ස්වර්ගයේ ඉදී කියලා කියන්නේ. දෙවියන් වහන්සේ ඒකට උපහාර දෙයි කියලා දෙවියන් වහන්සේගේ උපහාර දෙවියන් වහන්සේගේ ආශිර්වාදය දෙවියන් වහන්සේ හැම දෙයක්ම හම්බ වෙයි කියලා එයා කියන්නේ. මෙම ස්ථානය හරියාකාරයෙක් කරලා තියෙනවලු. ඒක දිගට කරගෙන යන්නලු. එහෙම නැත්නම් සමහර වේලාවට මේක ආණ්ඩුවෙන් seize කරලා එහෙම කරොතින් ඒකට අල්ලාහ්ගෙන් ආශිර්වාදය ඔයාට ලැබෙයි කියලා කියන්නේ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර : කාෆිර් කියන්නේ ආණ්ඩුවද?

පි : ආණ්ඩුවෙන් හරි කොහොම හරි මේක නැතුව ගියත් හරි නැති වෙන එක හරියට කරලා තියෙනවා නම් ඒක පවත්වා ගෙන යන්න කියලා කියන්නේ සේවකයොන්ට. එහෙම නැතුව ගියොත් හරි අල්ලාහ් දෙවියන් වෙනුවෙන් ඒක සමා කර ගන්න කියනවා.

ප්‍ර : කුර්ආනයේ කාෆිර් කියලා වචනේ තියෙනවා නේද?

පි : කාෆිර් කියලා වචනයක් තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කුර්ආනයට අනුව කාෆිර් කියන්නේ කවුද?

පි : මේ කාෆිර් කියලා කියන්නේ මුස්ලිම් නොවන අය. දෙවියන් වහන්සේ වෙනුවෙන් මේ අපේ දේපළ ඉඩම් එහෙම සමහර විට නැති වෙන්න පුළුවන්. දෙවියන් වහන්සේ ඒක මුලින්ම ඒක කියලා ඉවරයි. එක්කොා ඔයාගේ හොඳම එක හම්බ වෙයි. නැත්නම් නැති වෙයි. දිගටම සාමයෙන් ඉන්න කියලා කියන්නේ. නැති වෙන්නත් පුළුවන් ඇති වෙන්නත් පුළුවන් දිගටම සාමයෙන් ඉන්න කියලා කියන්නේ. තමන්ට පුළුවන් විදිහට මේ ඔක්කොම කරලා තියෙනවලු. ඒක ඉස්සරහට අරන් යන එක තමයි ඕගොල්ලොන්ගේ වැඩේ කියලා කියන්නේ. දීන් කියන්නේ අපේ ආගම අගය පිළිපදින්නලු. ඒ වගේම ආගම හොඳට ඉගෙන ගන්නලු. ඉගෙන ගෙන ඒ විදිහටම හැසිරෙන්න කියලා කියනවා. මේ වෙනුවෙන් අපිට හිරිහැරක් වෙන්න පුළුවන් එහෙම ආවා නම් ඒක සමාව ඉල්ලනවා ඒකට. ඒකට කුලිය ස්වර්ගයෙන් හම්බ වෙයි කියලා කියන්නේ. දෙවියන් වහන්සේ කියලා තියෙනවලු ජිහාත් කරලා මැරෙන එක්කෙනාට සහීඩ් කියලා කියනවා. ඒ සහීඩ් කියලා ඒ යන්න යන දවසට හම්බ වුණානම් 72 දෙදෙනෙකුට ස්වර්ගයේ ගෙනියන්න පුළුවන්ලු. ඒකෙන් එයාට විශ්වාසයෙන් ඉන්න අයවත් එයාට එක්කන් යන්න පුළුවන් කියලා මේකක් කියන්නේ. එයාත් එක්ක හොඳ විශ්වාසයෙන් හොඳින් කවුද හිටියේ. එයා මැරුණයින් පස්සේ කවුද විශ්වාසවන්තව වැඩ කරන්නේ. ඒගොල්ලනුත් එක්කන් ස්වර්ගයේ යන්න පුළුවන් කියලා කියන්නේ. එයාට ණය මුදල්ද දෙන්න තියෙනවලු සමහර අය. දෙන්න පුළුවන් විදිහේ තියෙනවා නම් ඒක එයාගේ පවුල්වලට අනිවාර්යෙන් දෙන්න කියනවා. එහෙම ඇත්තටම දෙන්න බැරිව ඉන්න කට්ටිය නම් එයා ඒකට හලාල් කියලා කියනවා දෙන්න බැරි කට්ටිය. අනිත් එක එයා අපිට දෙන job එක හරිටයට කරන්නලු. එහෙම කරේ නැත්නම් ඒකට පාපය එයාට සුර ලෝකෙන් පෙන්වයි කියලා කියනවා. අපි එයාට මොනවා හරි කරලා තියෙනවා නම් එයා ඒකට සමාව දෙනවලු. එයාගෙන් මොනවා හරි අපිට එහෙම දෙයක් වෙලා තියෙනවා නම් එයාගෙන් අපිට සමාව ඉල්ල ගන්න කියලා තියෙනවා. නිෂාම් කියලා අපේ සේවකයෙක් හිටියා. ඒ සේවකයා පොඩි වැරැද්දක් කරලා තිබුණා. මට හරියට මතක නෑ මොනවද කළේ කියලා. එයා ඒ වැරැද්ද පිළිගත්තේ නෑ. එයා ඉන්න කාලේ පිළිගත්තේ නෑලු. ඒක හින්දා එයා හුඟක් දොස් කියලා තියෙනවා. එයා ඒක පිළි අරගෙන දෙවියන් වහන්සේ වෙනුවෙන් ඒකට මේ සමාව ඉල්ලන්න කියලා කියනවා. නිෂාම් කියන එක්කෙනා එයා එච්චර

FAIR COMMENT BY JEZEEM

කල් ඉඳලත් ඒයා මේවා කළේ නැල්ලු. එයා දෙවියන් වහන්සේ වෙනුවෙන් ඒකට සමාව ඉල්ල ගන්න ඕනේලු. එහෙම නැත්නම් එයාට අර පාපය එනවා කියලා කියනවා. අනිත් එක මේ ගොල්ලන් කරපු වැඩේ හරියට ඉගෙන ගෙන හරියට කුර්ආන් පොතේ හදීස් පොතේ ඉගෙන ගෙන මේවා ගැන හොඳ නරක කියලා කාටවත් කියන්න එපයිලු. හොඳට ඉගෙන ගෙන ඊට පස්සේ ඒකට judgment එකක් දෙන්න කියලා කියනවා. මේ වෙනුවෙන් ආගම හොඳට පිළිපදින්නලු. පොත හොඳට ඉස්ලාම් history එක හොඳට ඉගෙන ගන්න කියලා කියනවා. ඒ වගේම නබිතුමාගේ කාලේ සහාබීවරුන් ගොඩක් දුක් වේදනාවට මේ ඉස්ලාම් ආගම පිළි පැද්දේ නැති හින්දා දුක් වේදනාවට ගියාලු. ඒක හින්දා ඒ history එක හරියට ඉගෙන ගෙන මේකට success වෙන්න. කාෆිර් කියන්නේ මුස්ලිම් නොවන අය. මේ ගැන ලොකු මේවා එකක් කරයි. ඒක හින්දා මුස්ලිම් කෙනෙක් කියන්නේ අපි ඒ කියන්නේ මේ ඉවසන්න ඕනේ. මේ වගේ දේවල් අපිට අපහසුවක් එයි. ඒ හින්දා අපි ඒ විදිහට ඉවසන්න ඕනේ. ඒක දෙවියන්ගේ මේකක්. ඒක එහෙම වෙනවාමයි කියලා මේක මොනවා හරි දෙයක් වෙනවා නම් දෙවියන්ගේ ඒ කියන්නේ දෙවියන් මුලින්ම තීරණය කරලා ඉවරයි මෙහෙම දෙයක් වෙනවා කියලා තීරණය කරලා ඉවරයි ඒකයි යන්නේ කියලා. මේයා දැන් කතා කරලා තියෙන්නේ අර Audio එක. මුස්ලිම් නොවන අය කාටයත් පෙන්වන්න එපා කියලා කියනවා පෙන්වන්න එපා. ඒක දැන ගන්න එපා. මුස්ලිම් අය වුනත් හරි හොඳට විශ්වාස අයට විතරක් ඒක පෙන්වන්න කියලා තියෙන්නේ. මේකේ කියලා තියෙන දේවල් හරි විදිහට පිළිපදින්න. මේ Audio එක මුස්ලිම් නොවන කාටවත් දෙන්නේ නැතුව එක්කෝ destroy කරලා දාන්න. නැත්නම් හංගල තියන්න. මේකෙන් කියලා තියෙන දේවල් දෙතුන් පාරක් හරියටම අහගන්න කියලා කියන්නේ. මුස්ලිම් අය වුනත් හරි හොඳට විශ්වාසේ තියෙන මුස්ලිම් අයට විතරක් පෙන්වන්නලු. වෙන කාටවත් ඒක පෙන්වන්න එපා කියලා කියනවා. එයා කියන දේ මේ audio එයා විශ්වාසවන්ත තියා ගන්න කියලා කියනවා. මෙම ජීහාත් ඔක්කොටම ලැබෙන්න ඕනේ කියලා ප්‍රාර්ථනා කරනවා. ආරාබි භාෂාවෙන් එයා ද්වා කරනවා. ඔක්කොටම ඇහෙන්න ද්වා කරනවා.

ප්‍ර : ද්වා කරනවා කියලා කියන්නේ මොකක්ද?

පි : දෙවියන් වහන්සේ වෙනුවෙන් යාඥා කරනවා.

FAIR COMMENT BY JEZEEM

කොමිෂන් සභාවේ කටයුතු නැවත පස්වරු 06.00 ට ආරම්භ කරන බව දන්වමි.
දැන් වේලාව : පස්වරු 05.35 යි.

**********

විවේකයෙන් පසු කොමිෂන් සභාව නැවත ආරම්භ කරන ලදී.
දැන් වේලාව : 06.10 යි.
නම : - සනුන් මොහොමඩ් ඉෂාක්
සාක්ෂිකරු දමිළ භාෂාවෙන් ප්‍රතිඥා දී නැවත කැඳවයි.
(මම මේ කියන සාක්ෂිය, සැබෑය, සම්පූර්ණ සැබෑය, සැබෑවක් මිස අන් කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.)

**<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>**

ප්‍ර : ඔබ සඳහන් කළා සාක්ෂි ලබා දෙන අවස්ථාවේදී කොලෝසස් පුද්ගලික සමාගමේ සේවකයන්ගේ පඩි ගෙව්වේ ඔබ කියලා?
පි : ඔව්.
ප්‍ර : පඩි ගෙවන්න මේ ලේඛන සකස් කළේ පඩි ගෙවීම සම්බන්ධයෙන් ලේඛන පවත්වාගෙන ගියේ ඔබ කියලා?
පි : ඔව් office එකෙන්.
ප්‍ර : ඒ අනුව ඔබට 2019 මාර්තු මාසේ වන විට එකී කොලෝසස් පුද්ගලික සමාගමේ සේවයකන් වශයෙන් සේවය කරපු පුද්ගලයන්ගේ විස්තර ඇතුළත් ලේඛනයක් ඉදිරිපත් කරන්න හැකියාව තිබෙනවද?
පි : ඔව් මේක හරි.
ප්‍ර : ඉදිරිපත් කරන්න පුළුවන්ද?
පි : ඉදිරිපත් කරන්න පුළුවන්.
ප්‍ර : ඒ ලේඛනය ඔබ විසින් සකස් කරන ලද්දක්ද?
පි : office එකේ සේවකයෙක් සකස් කළේ ඒක.
ප්‍ර : office එකේ?
පි : වෙන සේවකයෙක් තමයි සකස් කරන්නේ ඒක.
ප්‍ර : ඔබ පරීක්ෂා කරලා බැලුවද?
පි : පරීක්ෂා කරලා බැලුවා.
ප්‍ර : ඒක නිවැරදිද?
පි : ඔව් හරි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ 2019 මාර්තු මාසේ වෙනකොට කොලෝසස් සමාගමේ සේවය කරපු සේවකයන්ගේ ලැයිස්තුවක් තමයි දැන් මේ ඔබ ඉදිරිපත් කරන්නේ?

පි : ඉදිරිපත් කරන්නේ.

ප්‍ර : එහි සේවකයෝ කී දෙනෙක්ගේ සේවයේ යෙදිලා තිබෙනවද ඒ 2019 මාර්තු මාසේට අදාළව?

පි : 29 දෙනෙක්.

ප්‍ර : 29 දෙනෙක්ගේ නම් සඳහන් කරලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : එසේම ඔබ ඒ අයගේ ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංක සහ ලිපිනයනුත් ඒ ලේඛනයේ සටහන් කරලා තියෙනවා?

පි : සටහන් කරලා තියෙනවා.

ප්‍ර : අර විදේශිකයින්ගේ නම් එතන සටහන් වෙනවද?

පි : නෑ විදේශිකයන්ගේ නම් ඒක වෙන list එකක් තියෙන්නේ.

ප්‍ර : ආ.... මේ දැන් ඔබ 29 ක් කියලා ඔබ සටහන් කරලා තිබෙන්නේ දේශීය සේවයකන් පමණයි?

පි : දේශීය සේවයකයන් සම්බන්ධයෙන් පමණයි.

**මෙම ලේඛනය C 788 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.**

ප්‍ර : එසේම ඔබ කොලෝසස් පුද්ගලික සමාගමේ 2019 මාර්තු මාසේ වන විට සේවය කරන ලද විදේශීය සේවකයන් සම්බන්ධයෙනුත් වාර්තාවක් සකස් කරනු ලැබුවද?

පි : සකස් කරලා තිබෙනවා.

ප්‍ර : ඒ ලේඛනය ඔබ පොලිස් විමර්ශන ඒකකයට භාර දුන්නද?

පි : භාර දීලා තියෙනවා.

ප්‍ර : මේ ලේඛනය කවුරු මොන කරුණු පදනම් කරගෙනද මේක හදලා තියෙන්නේ කොහොමද හැදුවේ?

පි : ඒක අපේ සේවකයෙක් තමයි හදන්නේ. ඒක එයාගේ visa pass port number එකයි, එයාගේ නමයි, එයාගේ visa date එකයි දාලා තියෙනවා ඒකේ.

ප්‍ර : ඔබ මෙය පරීක්ෂා කරලා බැලුවද?

පි : පරීක්ෂා කරලා බැලුවේ නෑ.

ප්‍ර : ඒක නිවැරදිද කියලා දන්නවද?

පි : ඔව් නිවැරදිව තියෙනවා. ඒ කරන කෙනාගෙන් ඔක්කොම අහලා තියෙන්නේ මං.

ප්‍ර : පරීක්ෂා කරලා බැලුවා?

පි : පරීක්ෂා කරලා බලලා තියෙන්නේ.

ප්‍ර : නිවැරදි?

පි : නිවැරදි.

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අනුව විදේශීය සේවකයන් කී දෙනෙක් සේවය කළාද ඒ කාලේ වෙන කොට?

පි : ඒ කාලේ වෙන කොට 20 දෙනෙක් හිටියා. ඒක ඉන්දියානු කට්ටිය.

ප්‍ර : මේ ඉන්දියානු ඉන්දියාවෙන් ඇවිදිල්ලා සේවය කරපු අයගේ?

පි : සේවය කරපු අයගේ list එකක්.

ප්‍ර : ලේඛනයක්?

පි : ලේඛනයක්.

ප්‍ර : එහි ඔවුන්ගේ ලංකාවට පැමිණි දිනය ඒ අයගේ වීසා කාලය අවසන් වන දිනයත් ඔබ සටහන් කරලා තිබෙනවා?

පි : සටහන් කරලා තිබෙනවා.

**මෙම ලේඛනය C 789 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.**

ප්‍ර : දැන් ඔබ මේ ඉන්දිය සේවකයන්ගේ ලිපිය ලැයිස්තුවක් පමණයිනේ දුන්නේ?

පි : ඔව්.

ප්‍ර : ඔබ සාක්ෂි දෙන කොට කිව්වනේ මේ නේපාලයේ, බංග්ලාදේශයේ අයත් සේවය කළා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ අයගේ නම් මේ ලේඛනයේ ඇතුළත් කළේ නැද්ද?

පි : ඒකේ නෑ. Check කරන කට්ටිය කොහේ තිබ්බද දන්නේ නෑ. ඒක මට හරියට ගන්න බැරි වුණා.

ප්‍ර : ගන්න බැරි වුණා. ඒක හින්දා ඉදිරිපත් කළේ මේ ඉන්දියන් ජාතිකයෝ සේවය කරපු විස්තර පමණයි?

පි : විස්තර පමණයි.

ප්‍ර : දැන් ඔබ සඳහන් කළා මේ බැංකු ගිණුම් දෙකක් සම්බන්ධයෙන් කොලෝසස් පෞද්ගලික සමාගමේ ව්‍යාපාර කටයුතු වලට පවත්වා ගෙන යනු ලැබූ?

පි : ලැබූ.

ප්‍ර : ඊට අමතරව ඉන්ෂාෆ් අහමඩ් වෙනත් ගිණුම් පවත්වා ගෙන ගියාද කියලා ඔබට දැනීමක් තිබෙනවද?

පි : අමානා bank එකේ account එකක් තියෙනවා එයාගේ personal නමින්.

ප්‍ර : එහි බැංකු කටයුතු ඔබ සිදු කරනු ලැබුවද?

පි : නෑ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර : සාක්ෂිකරු ඔබ මේ කොලෝසස් පුද්ගලික සමාගමේ කටයුතුවලටත් ඔබ කටයුතු කෙරුවා නේද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : කටයුතු කෙරුවා.

ප්‍ර : ඒ කර්මාන්ත ශාලාවටත් යන්න ඇතිනේ ඔබගේ රාජකාරී කටයුතු කරන්න නේද?

පි : වැඩි දුරටත් කර්මාන්ත ශාලාවට යන්න ඕනේ වෙන්නේ නෑ. මගේ වැඩ office එකේ ඉඳන්මයි කරන්නේ.

ප්‍ර : ඉඳලා හිටලා හරි ගිහිල්ලා තියෙනවනේ?

පි : ගිහිල්ලා තියෙනවා.

ප්‍ර : නේද?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒ කර්මාන්ත ශාලාවේනේ අර උදුන් එහෙම ඔක්කොම තිබ්බේ Furnaces එහෙම තිබ්බේ?

පි : Furnaces එහෙම ඔක්කොම.

ප්‍ර : ඒ Furnaces වල මේ ලංකාවේ පුද්ගලයින් සහ විදේශීය පුද්ගලයන් දෙගොල්ලොම වැඩ කෙරුවා නේද?

පි : වැඩ කෙරුවා.

ප්‍ර : එතකොට ඒ කියන්නේ අර ලංකාවේ පුද්ගලයින් අර Furnace එක ක්‍රියා කරන්නත් පත් කරලා තිබ්බනේ?

පි : ඒක හරියට මම දන්නේ නෑ. වැඩ කරන කට්ටිය ඉන්නවා.

ප්‍ර : ලංකාවේ අයත් Furnace factory එකේ වැඩ කරනවනේ?

පි : factory යේ වැඩ කරනවා.

ප්‍ර : Furnace එක?

පි : කවුරු කවුරු කොහොමද වැඩ කරන්නේ කියලා මං හරියට දන්නේ නෑ.

ප්‍ර : ඔබ ගිහිල්ලා තියෙනවනේ එතෙන්ට?

පි : ගිහිල්ලා තියෙනවා. එක පාරක් දෙපාරක් වගේ ගිහිල්ලා තියෙන්නේ. අවුරුද්දට එක සැරයක් දෙපාරක් යනවා එහෙම තමයි.

ප්‍ර : එතකොට ඔය යන වේලාවේ දකිනවනේ කවුද Furnace එක ගාව එහෙම වැඩ කරන්නේ කියලා නේද?

පි : ඒ තරම්ම අපි බලන්න මේවා එකක් නෑ සර්.

ප්‍ර : දැන් ඔය දුන්න list එකේ මේ විදේශීය අයට විතරක් Furnace operators ලා කියලා දාලා ලංකාවේ අයගේ designation එක දන්නේ නැද්ද?

පි : ලංකාවේ ගොඩක්ම අර supervising අර වගේ වැඩේ තමයි කර කර හිටියේ.

ප්‍ර : Furnace එකෙත් වැඩ කරපු අය හිටියනේ නේද?

පි : ඒක මම හරියට දන්නේ නෑ සර්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : විදේශීය රටවල් වලින් ආපු අය කොහේද වැඩ කෙරුවේ?

පි : ඔක්කොම factory එක ඇතුළේ.

ප්‍ර : ආ.....

පි : factory යේ.

ප්‍ර : factory යේ?

පි : ඔව්.

ප්‍ර : ඒ කට්ටිය කොහොමද මේ වැඩට ගත්තේ?

පි : ඒක කර්මාන්ත ශාලා වාණිජ අමාත්‍යාංශයෙන් එතෙන්ට ගිහිල්ලා එතනින් ඉහළ order එකක් දෙන්න ඕනේ .

ප්‍ර : නෑ ඒක නෙවේ මම අහන්නේ. ඒ කට්ටිය තෝර ගත්තේ කොහොමද?

පි : තෝර ගත්තේ සර් අපි machine imports කරනවා.

ප්‍ර : ආ....

පි : Engineering කියලා company එකක්.

ප්‍ර : ආ.....

පි : ඒ ගොල්ලන් තමයි ඒ අපිට ඒ Labours ලා දෙන්නේ. ඒ ගොල්ලන්ගේ machine දෙනකොට machine එක්ක ඒ ගොල්ලොන්ගේ කට්ටිය දෙනවා පඩි අපි ගෙවනවා.

ප්‍ර : කොහේන්ද ඒවා ගෙනාවේ?

පි : ඉන්දියාවෙන්.

ප්‍ර : ඉන්දියාවේ කොහේන්ද?

පි : ඉන්දියාවේ රට හරියට මතක නෑ. මම document එකක් දීලා තියෙනවා මෙතන.

ප්‍ර : නෑ ඉන්දියාවේ කොයි පළාතෙන්ද ගෙනාවේ?

පි : document එක බලලා තමයි හරියට කියන්න වෙන්නේ?

ප්‍ර : තියෙනවද document එක?

පි : document එකක් දුන්නා මම ඊයේ.

ප්‍ර : හරි කමක් නෑ හොයා ගන්න බැරිද? කමක් නෑ. දැන් මේ කොලෝසස් පුද්ගලික සමාගමේ වැඩ කටයුතු කරන්න කාර්මික සංවර්ධන මණ්ඩලයත් එක්ක මේ ලියුම් එහෙම කෙරුවානේ ගනුදෙනු?

පි : ඔව්.

ප්‍ර : ඒ ඔක්කොම කෙරුවේ ඔබද?

පි : අපේ වෙන සේවකයෝ.

ප්‍ර : registration කෙරුවේ කවුද?

පි : registration වෙන සේවකයෙක් තමයි යන්නේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ ඒ කාර්මික සංවර්ධන මණ්ඩලයත් එක්ක කටයුතු කළේ නැද්ද?

පි : කටයුතු කළේ නෑ.

ප්‍ර : කවුද ඒ වෙන සේවකයා?

පි : ඉල්ෂාන් කියලා සේවකයෙක් ඉන්නවා. අබ්දුල් කාලී කියලා තව සේවකයෙක් ඉන්නවා.

ප්‍ර : තාමත් ඒ දෙන්න ඉන්නවද?

පි : ඔව්. Office එකේ වෙන වැඩ කරන්නේ.

ප්‍ර : ඔබ කාර්මික සංවර්ධන මණ්ඩලයට ගියේ නෑ?

පි : ගිහිල්ලා නෑ.

ප්‍ර : කාර්මික අමාත්‍යාංශයට ගියාද?

පි : අමාත්‍යාංශයට ගියේ නෑ.

ප්‍ර : දැන් ඔබ ඔබේ සාක්ෂියේ කිව්වා ඉන්ෂාෆ්, ඉල්හාම් සහ ජමිල්

පි : ජමිල්

ප්‍ර : මේ ඔය කර්මාන්ත ශාලාව තියෙන office එකට ආවා කියලා නේද?

පි : කාර්යාලයට.

ප්‍ර : කාර්යාලයට ආවා?

පි : කාර්යාලයට.

ප්‍ර : ඒ කාර්යාලයේ ඔබ කියපු අර උඩ කාමරයක ඉඳලා

පි : conference room

ප්‍ර : conference room එකේ වෙන කවුද එතෙන්ට ආවේ පවුලේ අය සැරෙන් සැරේට ආවාද එතෙන්ට?

පි : වෙන කවුරුත් ආවේ නෑ එයාලා තුන්දෙනා විතරයි හිටියේ. සෙනසුරාදා දවස්වල හවස 04.00 ට විතර ඒ class එක පටන් ගන්නේ. මම සාමාන්‍යයෙන් හය හත වෙනකම් මම office එකේ ඉන්නවා. ඒ වේලාවට මම දැකලා තියෙන්නේ.

ප්‍ර : එතකොට ඔය ඊබ්‍රහීම් ඒ කියන්නේ ඉන්ෂාෆ්ලාගේ තාත්තා

පි : තාත්තා

ප්‍ර : ඔතෙන්ට එනවද?

පි : තාත්තා ඒ class එක කරන්ට කැමති නෑ. එයා බැන්නා දෙපාරක්. ඊට පස්සේ තමයි ඒ class එක සුමාන දෙකකින් එතනින් අයින් කළා.

ප්‍ර : නෑ මම ඇහුවේ ඔතෙන්ට එනවද කියලා කාර්යාලයට එනවද කියලා?

පි : කාර්යාලයට හැමදාම එනවා. හැමදාම උදේ ඉඳන් හවස් වෙනකම් ඉන්නවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒ ආපු වේලාවේ ජමිල් එහෙම දැකලා තියෙනවද එතන ඉන්නවා?

පි : තාත්තාද

ප්‍ර : ඔව්.

පි : දැකලා ඇති. ඒ කියන්නේ පල්ලහායින්නේ සර් එන්න ඕනේ. පල්ලහායින් ඇවිල්ලා තමයි උඩට එන්න ඕනේ.

ප්‍ර : දැන් ඊබ්‍රහීම් ඒ කියන්නේ ඉල්හාම් ඉන්ෂාෆ්ගේ තාත්තා

පි : තාත්තා ජමිල්ව දැකලා තියෙනවා.

ප්‍ර : තාත්තා කාර්යාලයට ආවාම ජමිල් එතන ඉන්නවා දැකලා තියනවද කියලා ඇහුවේ?

පි : සෙනසුරාදා සවස එයා එන්නේ නෑ. මිස්ටර් ඊබ්‍රහීම් සෙනසුරාදා දවස්වල normally එන්නේ නෑ. ආවොතින් පැයක් දෙකක් ඉඳලා යනවා. Class එක හවසනේ. අර Class කරන දවස් දැකලා නැතුව ඇති. ඊට කලින් එයා ඇවිල්ලා ගිහිල්ලා තියෙනවා. ඒ දවස්වල දැකලා ඇති පල්ලේහා office room එක තියෙන්නේ. එයාගේ office room එක පහු කරලා තමයි උඩට එන්න ඕනේ.

**********

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : ඉෂාක් දැන් තමුන් තමයි මේ කොලෝසස් සමාගමේ හිටපු ඉතාම විශ්වාසවන්තම සේවකයා?

පි : ඔව් සර්.

ප්‍ර : නේද?

පි : ඔව්.

ප්‍ර : නැත්නම් අත්සන් කරලා blank check 20 ක් විතර දීලා යන්නේ නැනේ සාමාන්‍යයෙන් රට යනකොට නේ?

පි : ඇත්තමයි සර්.

ප්‍ර : දැන් ඒ කියන්නේ පොඩි කාලේ ඉඳලම ඉන්ෂාෆ් තමුන් එක්ක බොහොම ළඟින් ආශ්‍රය කරලා තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : දැන් තමුන්ට තේරෙන විදිහට ඉන්ෂාෆ් මේ විදිහට මේ මුස්ලිම් ඉස්ලාම් අන්තවාදයට යොමු වුණේ කොයි කාලේ වගේද ඔහු?

පි : මම දන්න හැටියට අවුරුදු එකක් එක හමාරක් ඇතුළත මම හිතන්නේ.

ප්‍ර : ඊට කලින් එයා බොහොම හොඳට හිටියයි කියලද ඔබ හිතන්නේ?

පි : හොඳට හිටියා.

ප්‍ර : දැන් ඔබ දැනන් හිටියද මෙයා මේ විදිහට මේ ඉස්ලාම් අන්තවාදී අදහස් ඔළුවට දාගේන ඉන්නේ කියන එක?

Proof Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙම කෙනෙක් නෙවේ සර් මම අන්තිම මොහොත වෙනකම් මම නම් හිතුවේ නෑ මෙයා මිය ගියයි කියලා. මිය ගියා කියලත් මට හිතුන් නෑ මෙයා එහෙම කරයිද කියලා.

ප්‍ර : දැන් බැරි වේලාවත් ඔබට දැන ගන්න ලැබුණා නම් අඩු ගාණේ මීට මාස මීට නෙවේ අප්‍රේල් 21 වෙනිදාට මාස 6 කට 10 කට ඉස්සෙල්ලා මෙයා මෙවැනි කටයුතුවලට යොමු වෙලා ඉන්නවා කියලා ඔබ මොකද කරන්නේ එහෙනම්?

පි : දැන ගත්තා නම් මගේ job එක ගියත් කමක් නෑ. සමාජය අපි ආරක්ෂා කිරීමට මම ගිහිල්ලා ඔත්තු දෙනවා සර්.

ප්‍ර : ඔබ හිතනවද ඉන්ෂාෆ් කරපු වැඩේ වැරදි කියලා?

පි : වැරදි කියලා කියනවා.

ප්‍ර : ඔබ ඉස්ලාම් භක්තිකයෙක් හැටියට ඇයි ඔබට එහෙම හිතෙන්නේ දැන්?

පි : මුළු සමාජයම මෙවැනි අපහසුතාවයට පත් වෙලා වෙනවා. රටම අපහසුතාවයට පත් වෙලා තියෙනවා. අනික අපේ සේවකයින් ඔක්කොටම සේවය නෑ. දැන් වුනත් job එකට කොහේ හරි ගියොතින් කොයිද වැඩ කළේ කියලා අහලා job එක දෙන්නේ නෑ. ඒ කියන්නේ මගේ පුතත් මෙතන වැඩ කරපු කෙනෙක්. එයාත් job තුන්පළකට interview ගිහිල්ලත් එයාට job එකක් හම්බ වුණේ නෑ තාම. ඒ වගේම අපහසුතාවයන් ගොඩාක් වෙලා තියෙනවා. සමාජය මුළු සමාජයම ඒ වෙනුවෙන් අපහසුතාවයට පත් වෙලා තියෙන්නේ.

ප්‍ර : දැන් ඔබ මුස්ලිම් සමාජයේ අනිත් අයත් එක්ක කතා බහ කරන කොට ඔබට දැනෙනවා නේද, ඔබට හැඟෙනවා නේද, ඔබට තේරෙනවා නේද මේ වගේ අන්තවාදී අදහස් ඔළුවේ තියන් ඉන්න තවත් තරුණ දරුවෝ ඉන්නවා කියලා ඔබට දැනුණේ නැද්ද දැන් මම අහන්නේ?

පි : මෙච්චර සිද්ධිය වෙලත් එහෙම ඉන්නවා නම් ඒක හරි පාඩුවක්.

ප්‍ර : දැන් ඔබට හිතෙනවද ඉස්ලාම් දරුවෝ මේ අන්තවාදී අදහස් වලින් බේර ගන්න මොකක්ද කරන්න ඕනේ කියලා?

පි : අනිවාර්යෙන්ම අපි බේර ගන්න ඕනේ.

ප්‍ර : මම අහන්නේ කොහොමද කියලා?

පි : ඒකෙන් අපේ උගතුන් ඒ ගොල්ලන්ව හරි විදිහට හරි ආකාරයට guide කරන්න ඕනේ.

ප්‍ර : ඒ අන්තවාදී අදහස් දරන අයට මොකක්ද ඔබ කියන්නේ? ඔබට මොකක් හරි පණිවිඩයක් දෙන්න පුළුවන්ද ඒ අන්තවාදී අදහස් හිතේ තියන් ඉන්න අයට?

FAIR COMMENT BY JEZEEM

පි : හිතේ තියන් ඉන්න අය කොහොම හරි ඒකෙන් කොහොම හරි බේර ගන්න ඕනේ. බේරලා මේකෙන් තියෙන හරි වැරදි ටික ඒ ගොල්ලන්ට කියලා දෙන්න ඕනේ. සාමාන්යයෙන් ඒ ගොල්ලො එක පැත්ත විතරක් බලා ගෙන ඉදී. අනිත් ඒවා දන්නේ නැතුව ඉන්නවනේ. එක දේශනාවක් විතරක් බලා ගෙන අනිත් ඒවා බලන්නේ නැතුව සාමාජය ගැන හිතන්නේ නැතුව අනිත් එක රට ගැන හිතන්නේ නැතුව ඉන්නවනේ. ඒ වගේ අයව ඒකෙන් කොහොම හරි බේරන්න අපේ උගතුන් කොහොම හරි ඒක කරන්න ඕනේ.

ප්‍ර : දැන් ඔබට තේරෙන විදිහට මෙච්චර හොඳට කාලය ගත කරපු flower road එකේ ගෙදර.

පි : ගෙදර.

ප්‍ර : ළමයි, wife ඔක්කොමලා හොඳට ඉන්නවා. යන්න එන්න මේ වගේ Luxury vehicle තියෙනවා. ඉඩ කඩම් වතු පිටි ඔක්කොම තියෙනවා. සල්ලි තියෙනවා. එහෙම තිබිලත් ඉන්ෂාෆ්ට මෙහෙම වුණේ මොකද ඔබ හිතන විදිහට ?

පි : එයා සාමාන්‍යයෙන් සල්ලවලට යට වෙන කෙනෙක් නෙවෙයි. හොඳට ඔක්කොටම හොඳට උපකාර කරනවා. සල්ලි දෙනවා ඔක්කොටම වගේ. හොඳට ආධාර දෙනවා. ඒ වගේ කෙනෙක්. මේයා කරපු එක නම් සල්ලිවලට කරලා නෑ. එයා හඬපටියෙන් ආපු විදිහට දෙවියන් වෙනුවෙන් කරලා තියෙනවා කියලා තමයි එයා කියන්නේ. ඒක හරිද වැරදිද කියලා මට හරියට කියන්න බෑ.

ප්‍ර : දැන් මේ එයාගේ අන්තිම කතාවනේ ඔය?

පි : කතාව.

ප්‍ර : 20 වෙනිදා රෑ එයා කරලා තියෙන ඔබට ඒක ඇහුවාම මොකද හිතෙන්නේ දැන්?

පි : එයා කියලා තියෙන එක සාමාන්‍යයෙන් හදීස්වල තියෙන සමහර සිද්ධි කියලා තියෙනවා. ඒ වුනත් ආගම හැටියට යුද්ධ කාලේ වුනත් කෙළින්ම යුද්ධ කරලා මරණ එක තමයි හරි. Suicide එකක් අපේ ආගමේ හැටියට Suicide කරන්න බෑ කියලා මට හිතෙනවා.

ප්‍ර : දැන් එයා කියනවා නේද ඒකේ ඉස්ලාම් නොවන හැමොම අර මරලා දාන්න ඕනේ කියන එක.

පි : එහෙම දෙයක් කියන්නේ නෑ.

ප්‍ර : එහෙම දෙයක් කියන්නේ නෑ?

පි : එහෙම දෙයක් කියලා නෑ.

ප්‍ර : ආ..... එහෙනම් ඒක වෙන තැනක කියනවා ඇත්තේ. දැන් ඉස්ලාම් නොවන අය කුෆර්ලා කියලනේ කියන්නේ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : කාෆිර්ලා කියලා.

ප්‍ර : කාෆිර්ලා කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒකෙන් එයා අදහස් කරන්න මොකක්ද ඒ අය නුසුදුසු අයද ජීවත් වෙන්න ඒකද අදහස් කරන්නේ?

පි : නුසුදුසු අය නෙවෙයි ඒ ගොල්ලො කොහොම හරි අපේ ඉස්ලාම් ආගමට ගන්න ඕනේ කියලා.

ප්‍ර : ගන්න ඕනේ කියලා කියන්නේ?

පි : ඔව්. ඉස්ලාම් ගැන කියලා කොහොම හරි ඒ ගොල්ලන්වත් convert කර ගන්න ඕනේ කියලා තමයි කියන්නේ.

ප්‍ර : convert කරන්න ඕනේ කියලා? හරි මට තව එක ප්‍රශ්නයක් තියෙනවා. ඔබට මතකද ඔබ 2018 වසරේ වගේ Industries Ministry එකට ගියා මොනවා හරි වැඩ වගේකට?

පි : මම ගියේ නෑ සර්.

ප්‍ර : කවදාවත් ගිහිල්ලා නෑ?

පි : කවදාවත් ගිහිල්ලා නෑ. Industries Ministry යේ වැඩවලට මම ගිහිල්ලම නෑ.

ප්‍ර : ඔබ එතන ඉන්න ඉහළ නිලධාරීන් කාට හරි කතා කරපු බවක් ඔබට මතකද?

පි : Industries Ministry වලටද

ප්‍ර : ඔව්. කර්මාන්ත අමාත්‍යාංශයේ?

පි : කර්මාන්ත අමාත්‍යාංශයට.

ප්‍ර : අර නවම් මාවතේ තියෙන්නේ එක දවසක් හරි ගිහිල්ලා කතා කළේ නැද්ද?

පි : මට මතක හැටියට නෑ සර්. ඒ වගේ වැඩවලට මම normally යන්නේ නෑ.

ප්‍ර : normally යන්නේ නෑ?

පි : ඔව්.

ප්‍ර : හරි ඔබ කිව්වනේ මම අහන්නේ එක දවසක් හරි ගියාද ඔබ?

පි : 2018 ද

ප්‍ර : 2018 වගේ ඔව් 2018 වගේ.

පි : 2018 වගේ මට යන්න වුවමනාවක් තිබුණේ නෑ සර්.

ප්‍ර : තිබුණේ නෑ. එහෙනම් ඔබ ජනාධිපති කාර්යාලය පැත්තේ ගියාද?

පි : එත් ගිහිල්ලා නෑ.

ප්‍ර : දැන් යම් අවස්ථාවකදී මේ පිත්තල, කොපර් වැඩිපුර ගන්න ලියුම් එහෙම සුදානම් කළා නේද ඔබ?

පි : ඔව් office එකෙන් ලියුම් ලියලා තියෙනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ ලියුම් ඔක්කොම Draft කළේ ඔබ නේද?

පි : නෑ නෑ ඒක Draft කරන්නේ normally ඉන්ෂාෆ් තමයි Draft කරන්නේ.

ප්‍ර : ඉන්ෂාෆ්මයි?

පි : ඉන්ෂාෆ් English ඒවා එයාට තමයි හොඳට පුළුවන්.

ප්‍ර : ඔබ ඒ ලියුම් දැකලා තියෙනවනේ?

පි : දැකලා තියෙනවා.

ප්‍ර : එතකොට ලියුම් ඇරියේ පුළුවන් නම් තව කොපර්, brass ඒවා සමාගටම අර ගන්නනේ?

පි : ඔව්.

ප්‍ර : වැඩිපුර නේ?

පි : වැඩිපුර.

ප්‍ර : ඉතින් එවැනි අවස්ථාවල ඉන්ෂාෆ් ගිහිල්ලා මුණ ගැහුණද මේ ඇමතිතුමාව එහෙම.

පි : ඒක මම හරියට දන්නේ නෑ සර්.

ප්‍ර : තමුන් දන්නේ නෑ?

පි : මම දන්නේ නෑ.

ප්‍ර : ඉන්ෂාෆ් ඔබට කියලා නැද්ද?

පි : කියලා නෑ.

ප්‍ර : මේ ගැන?

පි : කියලත් නෑ.

ප්‍ර : කියලා නෑ. ඔබ අහලා තියෙනවද ඉන්ෂාෆ්ගෙන් ඒවා ගැන කොහොමද මේවා කර ගත්තේ කියලා?

පි : office එකෙන් අනික් staff ලා තමයි මේ වැඩ වලට යනවා නම් යන්නේ.

ප්‍ර : හ්ම්.

පි : කර්මාන්ත ශාලා වුනත්, ID වුනත් යන්නේ අනිත් staff ලා ඉන්නවා. එතන ඉන්නවා accouter කෙනෙක් ෆාජී කෙනෙක් කියලා. මේ වගේ අවස්ථාවල සමහර වේලාවට ගිහිල්ලා ඇති. කවුද මුණ ගැහුණේ කොහේද ගියේ කියලා මම හරියට දන්නේ නෑ.

ප්‍ර : දැන් වෙන්න තියෙන දේවල් ඔක්කොම වෙලා ඉවරයිනේ?

පි : ඉවරයි.

ප්‍ර : ඒ හින්දා අපි දැන් ඇත්තනේ හොයන්නේ. ඇත්තටම මොකද වුණේ කියලා?

පි : වුණේ කියලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඉතින් ඔබට ඔබේ හිතට එකඟව අපිට කියන්න පුළුවන්ද ඉන්ෂාෆ් මෙහෙම වැඩිපුර මේ කෝපර්, Brass මේවා වැඩිපුර සමාගමට ලබා ගන්න කොයි විදිහටද උත්සාහ කළේ කොහොමද try කළේ එයා එහෙම කර ගන්න ඔබ දන්න විදිහට?

පි : දන්න විදිහට ලියුම් මාර්ගයෙන් තමයි.

ප්‍ර : ලියුම් ලිව්වා?

පි : ඔව්. ලියුම් වලින් copies මා ඟාව office එකේ තියෙනවා මම සකස් කරපු ඒවා.

ප්‍ර : ඔව්. ඒ ලියුම් කාටද කාටද ලිව්වේ කියලා මතක් කරන්නකෝ?

පි : ඒක මම හරියට දන්නේ නෑ. මින් පස්සේ තමයි මම බලන්න සාමාන්‍යයෙන් ඒක බලන්නේ නෑ.

ප්‍ර : නමුත් ඒයා කාට කාට හරි ලියුම් ලියලා උත්සාහ කරලා තමයි කර ගත්තේ?

පි : උත්සාහ කරලා එහෙම කරලා ඇති.

ප්‍ර : එතකොට දැන් ඔය අන්තිම දවස් දෙකට ඉස්සෙල්ලා එයා මේ වගේ ඔබ අර ඉස්සෙල්ලා සඳහන් කළා වගේ ලොකු ගණන් සල්ලි withdraw කරලා තියෙනවද දැන් අර ඔබ කිව්වනේ withdraw කළා කියලා 34 Million

පි : 34 Million

ප්‍ර : ඒ වගේ ලොකු ගණන් මීට කලින් withdraw කළා ඔබට මතකද?

පි : withdraw කළා 2018 10 th lane ඉඩමක් ගන්න විතරයි withdraw කරලා තියෙන්නේ.

ප්‍ර : කොච්චර withdraw කරලා තියෙනවද?

පි : 20,22 එහෙම 20 million, 22 million ඒවගේ.

ප්‍ර : මාතලේ ඉඩමද?

පි : ඈ.....

ප්‍ර : මාතලේ ඉඩම ගන්නද?

පි : නෑ නෑ කොල්ලුපිටියේ.

ප්‍ර : කොල්ලුපිටියේ?

පි : කොල්ලුපිටියේ 10 th lane එකේ ඉඩමක් තියෙනවා. ඒ ඉඩම ගන්න ලොකු ගාණක් අරන් තියෙනවා. ඊට පසසේ එයා අරන් තියෙනවා පොඩි ගාණවල් ලක්ෂ පහයි, තුනයි වැඩිම ගත්තොත් ලක්ෂ දහයක් එහෙම තමා අරන් තියෙන්නේ.

ප්‍ර : මාසේකට සාමාන්‍යයෙන් කොච්චර විතර withdraw කරලා එයා ගන්නවද?

පි : දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් 2018, 2019 මුළු අවුරුද්දේම හැම check එකම check කළා. මගේ පොතෙන් හැම

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

list එකට මම ගණන් දීලා තියෙනවා. ඒකේ 2019 ජනවාරි ඉඳන් 2019 /18 වෙනිදා වෙනකම් එයා ගත්ත මුදල් 45 million

ප්‍ර : 45 Million. ලක්ෂ 450 ක් ?

පි : ලක්ෂ 450 ක්. 35 Million යනුත් එක්ක.

ප්‍ර : ආ..... ඒකත් එක්ක?

පි : අන්තිමට ගත්ත 35 Million එක්ක එයා ගත්ත මුදල් 45 Million

ප්‍ර : 45 Million කවදා ඉදලා කවදාටද ඔබ ආයෙත් කියන්න?

පි : 2019 ජනවාරි ඉඳන් April 18 වෙනිදා වෙනකල්.

ප්‍ර : 2019 April 18 වෙනිදා වෙනකල්?

පි : ඔව්. ඊට කලින් අවුරුද්දේ ඉතින් 2018 අවුරුද්ද දැන් check කර ගෙන යනවා. ඒකෙන් ලොකු ප්‍රමාණ මොකුත් අරගෙන නෑ.

ප්‍ර : ඒ වගේම ඔබට දැන් ඔබේ සමාගමට විශාල වශයෙන් මුදල් ලැබුනෙත් ඔය 2016,17 වගේ කාලේ නේද?

පි : 2016, 17 වගේ.

ප්‍ර : විශාල ආදායමක් ලැබුණා ඒ කාලේ නේද?

පි : ඔව්.

ප්‍ර : ඒවාට උදව් කළේ කවුද?

පි : වැඩිම අපි export කරලා තියෙනවා export එකට අපිට වැඩියෙන්ම බඩු ඇවිල්ලා තියෙන්නේ අපේ සැපයුම්කරුවෙක්ගෙන්. ගොඩාක් අපේ සැපයුම්කරුවෝ ඉන්නවා. ඒ ගොල්ලන්ගෙන් ලැබිලා තියෙනවා. අනිත් එක ශ්‍රී ලංකා ටෙලිකොම්. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ටෙන්ඩර් මඟින් ගොඩක් අපි උදව් වුණා. ඒක තමයි අපි වැඩිම shipment කරලා තියෙන්නේ.

ප්‍ර : එතකොට මේවා කොහේටද export කළේ?

පි : ඉන්දියාවට. වැඩිම කළේ ඉන්දියාවට තමයි අන්තිම කාලේදී. මුලදී නෙදර්ලන්ඩ් කරලා තියෙනවා export

ප්‍ර : නෙදර්ලන්ඩ්?

පි : නෙදර්ලන්ඩ්.

ප්‍ර : දැන් ඔබ දන්නවා නේද අර ගම්මිරිසුත් export කළා නේද?

පි : ඔව් ගම්මිරිම් වැඩි වශයෙන් export කළා.

ප්‍ර : ඔව්. එතකොට ඒ ගම්මිරිස් export කරන්න ලංකාවේ ගම්මිරිස්ම ප්‍රයෝජනවත් වුණේ නැනේ මදිනේ ලංකාවේ quantity එක?

පි : ලංකාවේ quantity එක ගොඩක් තියෙනවා සර්.

ප්‍ර : ඔව් නමුත් සමහර අවස්ථාවල් වල ඔබ දන්නවා නේද ?

පි : ඔව්.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අර වියට්නාම වලින් ගෙනාපු ගම්මිරිස්?

පි : ගෙනාපු ගම්මිරිස් ගැන දන්නවා.

ප්‍ර : එතකොට දැන් මෙවැනි කටයුතු කරලා මේවා ඔක්කොම කරලා මේවා මෙහෙය වෙව්වේ ඔබ කියන්නේ ඉන්ෂාෆ්ද නැත්නම් තාත්තාද?

පි : අපි ලංකාවේ නිෂ්පාදනය කරන කුළුබඩු ඇර වෙන කිසිම දෙයක් අපි කරලා නෑ. මම ආපු කාලේ ඉඳන්ම 1992 මම ආපු කාලේ ඉඳන් අද වෙනතුරු අපි කරලා තියෙන්නේ ලංකාවේ නිෂ්පාදන බඩු විරතයි export කරලා තියෙන්නේ. ඒකට අදාළව documents මං ගාව තියෙනවා. Customs statistic බැලුවා නම් සර්ට බලන්න පුළුවන් එහෙම දෙයක් වෙලා තියෙනවද කියලා. ඒක input එකක් ආවානම් customs statistics එකෙන් යනවා. ඒ මේ වෙනුවෙන් වැඩිදුර සටන් කෙරුවේ අපේ ඊබ්‍රහීම් මහත්මයා. අර input කරලා export කරන කොට ලංකාවේ market ගොඩක් අඩු වුණා. ලංකාවේ කට්ටිය උද්ඝෝෂණත් කළා. මම හිතන්නේ මිද්දෙනිය මහත්මයාට විරුද්ධව උද්ඝෝෂණත් කළා. ඒ වෙනුවෙන් පත්තරේ ගොඩක් අපි ඊබ්‍රහීම් හජ්ජියාර් පත්තරේ ගොඩක් මේක මේ article ඔක්කොම දාලා තිබුණා. ඒ වෙනුවෙන් ගොඩක් ලියුම් ලියලා තියෙනවා ජනාධිපති කාර්යාලයට. Prime Ministry ට එහෙම හැම තැනම ඒ වගේ හැම document වගයක්ම අපේ file එකේ තියෙනවා office එකේ.

ප්‍ර : දැන් එවැනි කටයුතු ඔය export වැඩ වැඩිහරියක් කළේ ඉන්ෂාෆ්මද?

පි : export වලට 2005 ඉන්ෂාෆ් අපේ office එකට joint වුණේ. 2005 ඉඳන් 2018 වෙනකම් export අපනයනය කිරීමට foreign buyers ලා එක්ක කතා කරලා orders ගන්නේ ඉන්ෂාෆ්. සැපයුම්කරු වන කතා බහ කරන්නේ ඊබ්‍රහීම් හජ්ජියාර් තාත්තා.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මහතා</u>**

ප්‍ර : සාක්ෂිකරු ඔබ කිව්වා නේද දැන් ටික වේලාවකට ඉස්සෙල්ලා ඔබට ඔබලා විශාල වශයෙන් ලාභ ගත්තේ ප්‍රයෝජන ගන්න උදව් වුණේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙක් කියලා. ඒ කොහොමද ටෙන්ඩර් වලින් කියලා?

පි : ටෙන්ඩර් වලින් ගත්තේ ඒක.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ තමන්ලා කොපර් කේබල් ගලවපු වේලාවේ ෆයිබර් කේබල් දාන වේලාවේ කොපර් කේබල් වැඩි වශයෙන් විශාල ප්‍රමාණයක් ගත්තේ තමන්ලා?

පි : ඔව් ගත්තා.

ප්‍ර : එහෙම ටෙන්ඩර් සම්බන්ධයෙන් යම් කිසි අකටයුත්තක් වෙලා කියලා පැමිණිලි තිබුණද?

පි : නෑ කිසිම දෙයක් නෑ. ටෙලිකොම් එකේ එහෙම දෙයක් වෙලා නෑ.

ප්‍ර : නමුත් තමන්ලට තමුන්ලා තමයි ඒකේ විශාල ප්‍රමාණයක් ටෙන්ඩර් එකෙන් ගත්තේ?

පි : අරන් තියෙනවා ඔව්.

ප්‍ර : සමාගම් කිහිපයකුත් ගත්තා?

පි : ඔව් ඔක්කොටම ගත්තා. එයාට ටෙන්ඩර් call කරන කොට අපිට අපි price එකක් කලින් දෙන්න ඕනේ ටෙන්ඩර් call කරලා. අපේ price හොඳ price නම් අපිට ඒ ටෙන්ඩර් එක හම්බ වෙනවා. අනිත් එක අර ටෙලිකොම් ටෙන්ඩර් වැඩේ පොඩ්ඩක් විශාලයි. ඒ කියන්නේ එක එක තැන්වල ගිහිල්ලා පොළොවේ තියෙන වයර් එහෙම ඇදලා ගන්න ඕනේ. ඒක හින්දා වැඩිය කට්ටිය ගන්නේ නෑ ඒ ගොල්ලො වැඩ වැඩි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් වෘත්තිය සමිති වලින් පැමිණිලි ලැබිලා තිබුණා කියලා දන්නවද තමුන්?

පි : ඒක දන්නේ නෑ සර් මං.

ප්‍ර : තමන්ලට ඔය තමන්ගේ ව්‍යාපාර කර ගෙන යෑමට පවතින රජයන්ගෙන් සහය ලැබුණද?

පි : රජයෙන් සහය කියන්නේ සර් සහය ලැබුණා සර්.

ප්‍ර : සහය ලැබුණා?

පි : ඔව්.

ප්‍ර : මොන ආකාරයෙන්ද කවුද දේශපාලඥයෝ එහෙම දෙන්න ඇති නේ?

පි : නෑ සර් අපි රජයෙන් සහය කියන්නේ මේ සමහර කාලේ අර තඹ export කරන්න

ප්‍ර : ඔව්.

පි : ඒ ගොල්ලො license issue කරනවා.

ප්‍ර : එතකොට කොහොමද සහය ලැබෙන්නේ?

පි : එතකොට ඒ license අපි ගන්න යන කොට සමහර ආයතනයෙන් order එක යක් දෙන්න ඕනේ. ඒ කියන්නේ මම හිතන්නේ මේ කර්මාන්ත අමාත්‍යාංශය වෙන්න ඕනේ. ඒ ගොල්ලොන්ගෙන් order එකක් දුන්නොත් තමයි ඒ license එක issue කරන්නේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒ ගොල්ලොන්ගේ orders දෙන කොට මොකක්ද සහය වුණායි කියන්නේ උදව් වුණා කියන්නේ?

පි : ඒ තමයි උදව් වුණා කියන්නේ අපි ඉල්ලීමක් කළා නම් ඒ වේලාවේම ඒ ගොල්ලන් license එක issue කරන්න කියලා ලියුමක් දෙනවා. ඒක අපි අපනයන ආනයනය දෙපාර්තමේන්තුවෙන් ඒ license එක ගන්න අපිට ලේසි වුණා.

ප්‍ර : සමහර කටයුතු සම්බන්ධයෙන් තමන්ලට දේශපාලඥයන්ගේ මාර්ගයෙනුත් කර ගත්තද?

පි : ඉන්ෂාෆ් කොයි දේශපාලඥයත් එක්කත් සම්බන්ධ වෙන්නේ නෑ normally. අර එහෙම යන එක පහසුවක් නෑ.

ප්‍ර : දැන් කලින් ප්‍රශ්නයක් අපේ කොමසාරිස්තුමිය අහන කොට ජනාධිපති කාර්යාලය හා කර්මාන්ත අමාත්‍යාංශයට ගියේ නැද්ද කියලා ඇහුවාම තමන් කිව්වා තමන්ට මතක නැහැ කියලා. ඒ කියන්න ඉස්සෙල්ලා කිව්වා 2018 දී කියලා. මොකද ඒ 2018 කියලා තමන්ට මතක් වුණේ?

පි : 2018 ද කියලා මම ඇහුවේ සර්

ප්‍ර : ඇයි විශේෂයෙන්ම ඒක මතක් වුණේ 2018 කියලා?

පි : නෑ ඒක office එකේ ලියුම්වල තියෙනවා ගිය කට්ටිය.

ප්‍ර : ඒ කියන්නේ 2018 විතරද ගියේ?

පි : කවුරු හරි ගිහිල්ලා තියෙනවා ජනාධිපති කාර්යාලයට ඒ ලියුමේ copy එකක් මම බලලා තියෙනවා 2018 මම හිතන්නේ වෙන්න ඇති office එකේ තියෙනවා.

**********

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ මෙම කොමිෂම හමුවේ කියා සිටියා ඉන්ෂාෆ්ගේ අර ඔබත් ඇහුවානේ video එකක්?

පි : ඔව්.

ප්‍ර : ඒකේ කාෆිර්වරුන් කියන්නේ ඉස්ලාම් ආගමේ නොවන අනිත් ආගමිකයන් කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ එක්කම ඔබ කිව්වා ඒ අන්‍ය ආගමිකයන්ව ඉස්ලාම් ආගමට ගන්න ඕනේ කියලා. ඔබ කියන්න ඔය ඉන්ෂාෆ් අහමඩ් ඔබලාගේ ඔබගේ අර කාර්යාලයේ දේශන පන්ති වගයක් පැවැත්තුවානේ තුන් දෙනෙක් එක්ක එකතු වෙලා?

පි : ඔව්.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔය වැල්ලම්පිටිය කර්මාන්ත ශාලාවේ ඉස්ලාම් ආගමට අන්‍ය ආගමිකයන් හරවන මොනවා හරි කළාද? දැන් ඔබත් කිව්වනේ ඉස්ලාම් ආගමට හරව ගන්න ඕනේ කියලා?

පි : ඔව්.

ප්‍ර : ඉන්ෂාෆ් අහමඩ් එහෙම කළාද?

පි : ඒක factory එකේ මොනවා වුණාද කියලා මම දන්නේ නෑ.

ප්‍ර : factory යේ දන්නේ නෑ?

පි : ඔව්.

ප්‍ර : ඔබ මොහොමඩ් ඊබ්‍රහීම් ඉන්ෂාෆ්ගේ තාත්තා එයාගේ ගෙදරට ගිහිල්ලා තියෙනවද?

පි : ගිහිල්ලා තියෙනවා.

ප්‍ර : ඒ ගෙදර අර තුන්වෙනි මහලේ තියෙනවනේ ලොකු ශාලාවක්?

පි : ඔව්.

ප්‍ර : ඒකේ එහෙම දේශනා පවත්වනවාද?

පි : ගෙදර වෙන සිද්ධියක් මම දන්නේ නෑ.

ප්‍ර : ඉන්ෂාෆ් අහමඩ් ආගමික දේශනා පවත්වන එක්කෙනෙක් හැටියටත් කටයුතු කළාද?

පි : ඒක නම් අපි දන්නේ නෑ සාමාන්‍යයෙන්.

ප්‍ර : දන්නේ නෑ. දැන් ඉන්ෂාෆ් අහමඩ්ගේ කතාවේදී එයා නිතරම කියනවා දීන් සහ මර්කත් පාඩම් කරන්න කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ දීන් සහ මර්කත් කියන්නේ මොනවද ඉස්ලාම් ආගමේ?

පි : ඉස්ලාම් ආගමේ කුර්ආන් පොත, හදීස් පොත, නබිතුමාගේ දේශනාව ඒවා පාඩම් කරන්න කියලා කියන්නේ.

ප්‍ර : ඒවා මේ නමින්ද හඳුන් වන්නේ දීන් මර්කත් කියන්නේ ?

පි : ඔව් මර්කත් කියන්නේ.

ප්‍ර : හදීස්වලට කියන නම්මනේ?

පි : දීන් මර්කත් කියන්නේ හදීස්වලට

ප්‍ර : හදීස්වලට?

පි : ඔව්.

ප්‍ර : දෙමළ භාෂාවෙන්ද?

පි : ඔව්.

ප්‍ර : දීන් කියන්නේත් මොකක්ද එතකොට කුර්ආනයටද?

පි : කුර්ආනයට.

ප්‍ර : එයා කියනවා ඒවා නිතරම කියනවා එයා ඒවා පාඩම් කරන්න කියලා?

පි : පාඩම් කරන්න කියලා. ඒක පාඩම් කරලා ඒ විදිහට පිළිපදින්න කියලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒවා පාඩම් කළාම කෙනෙක් ආගමික අන්තවාදයට යන්න පුළුවන්ද?

පි : එහෙම යන්න බෑ. ඒක හරි දේශනාවෙන් තමයි ඒක කරන්නේ. ඒ කියන්නේ ඒකෙන් කුර්ආන් හදීසයෙන් එක දෙයක් කියන්න ඕනේ ඒක කෙළින්ම කියලා ඇති ඒකට විචාරය කරනවනේ. ඒ ගොල්ලො විචාරය කරන කොට තමයි වැඩිදුරට කරන්න කියන්නේ කුර්ආනය ගැන .

ප්‍ර : දැන් කොමිෂන් සභාවේ එක කොමසාරිස්තුමෙක් ඔබගෙන් ඇහුවා කොහොමද දැන් මේ ඉස්ලාම් ආගමික අන්තවාදයට ඉස්ලාම් තරුණයෝ යන එක වළක්ව ගන්නේ කියලා. ඔබට දරුවන් පස් දෙනෙක් ඉන්නවා නේද?

පි : ඔව්.

ප්‍ර : ඒ අයව කොහොමද ඔබ මේ ආගමික අන්තවාදයට යන එකෙන් බේරා ගන්න කටයුතු කරන්නේ ඉස්ලාම් ආගමික දැන් ඔය ඉන්ෂාෆ්ට එහෙම නිකම්ම නෙවේනේ ඕක වෙලා තියෙන්නේ ඔබට තේරුණානේ නේද?

පි : ඔව් තේරුණා.

ප්‍ර : ඉන්ෂාෆ් ආගම දැඩි ලෙස අන්තවාදී ලෙස ගිහිල්ලා තියෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබත් දරුවන් පස් දෙනෙක් ඉන්න පියෙක්නේ?

පි : ඔව්.

ප්‍ර : කියන්නකො බලන්න ඉස්ලාම් දෙමාපියන්ට කොහොමද මේ දරුවෝ ටික මේ අන්තවාදයට යන එකෙන් බේරා ගන්න මොනවද කරන්න ඕනේ කියලා ඔබට හිතෙන විදිහට?

පි : සාමාන්‍යයෙන් කුර්ආන් හදීසයේ කියන හරි දේවල් හරියට පිළිගත්තා නම් ඒක හරි කියලා මම හිතන්නේ වැරදි විදිහට දැන ගැනීම තමයි තියෙන්නේ. ඒ වගේම දේශනා කරන තැන්වලට අපේ ළමයින්ව යවන්නේ නැතුව ඉන්න එක තමයි හොඳ.

ප්‍ර : එහෙම දේශනාවල් කරන තැන් කියන්නේ මොනවද ඔබ දන්නවද එහෙම තැන් තියෙනවද ලංකාවේ?

පි : ඉතින් හැම වේලාවේම ප්‍රචාරය වෙන්නේ අර තවුහිද් ජමාත් ගැනනේ.

ප්‍ර : ඔව්.

පි : ඒ වගේම මේ සංවිධානවලට අපි ළමයින්ව යවන්නේ නැතුව ඉන්න එක තමයි හොඳ දෙයක්.

ප්‍ර : එතකොට ඔය ඊබ්‍රහීම් මොහොමඩ් ඉන්ෂාෆ්ගේ තාත්තා අයිති මොන නිකායටද?

FAIR COMMENT — BY JEZEEM

පි : නිකාය කියන්නේ එයා ඉස්ලාම් ආගම තමයි.

ප්‍ර : තවුහිද් ජමාත්ද?

පි : තවුහිද් ජමාත් නෙවෙයි. එයා හැම එකම පිළිපදිනවා. සාමාන්‍යයෙන් ඉල්හාම් ඉන්ෂාෆ් කියන සමහර දේවල් තියෙනවා. ඉතින් අපි පරණ කට්ටිය කර ගෙන ආපු සමහර දේවල් තියෙනවනේ. ඒ කියන්නේ මැරුණායින් පස්සේ අපි තුන්වෙනි දවසේ අපි ආගමික කටයුතු කරනවා. ඒ වගේම අර මවුලවිත් කියලා ඉන්දියාවෙන් ආපු සමහර දේවල් තියෙනවා. ඒ වගේ දේවල් අපි කර ගෙන ඉන්නේ. ඉන්ෂාෆ්ගේ තාත්තාත් ඒවා කරනවා. අනිත් එක අර මේ කොඩි නංගලා ඒක මේ කෑම බීම එහෙම දෙනවනේ. ඒ වගේ දේවල් ඔක්කොම ඉන්ෂාෆ්ගේ තාත්තා කරනවා.

ප්‍ර : එතකොට ඉන්ෂාෆුත් කළාද එහෙම ඒ තාත්තලා කරන ඒවා?

පි : ඉන්ෂාෆ් ඉල්හාම් ඒකට විරුද්ධයි.

ප්‍ර : විරුද්ධයි?

පි : ඔව්.

ප්‍ර : කොයි වගේ කාලේ ඉඳලද විරුද්ධ වුණේ?

පි : ඒක මේ මෑතකදී ආවේ අවුරුදු ඉන්ෂාෆ් ඇවිල්ලා අවුරුදු එක හමාරක් තමයි.

ප්‍ර : ඔබ ජමිල් කියලා එක්කෙනෙක් ගැනත් දැකලා තියෙනවා නේද?

පි : දැකලා තියෙනවා.

ප්‍ර : ජමිල් මොහොමඩ්?

පි : දැකලා තියෙනවා.

ප්‍ර : ඔය ඊබ්‍රහීම් මොහොමඩ්ගේ ගම කොහේද?

පි : ඊබ්‍රහීම් මොහොමඩ්ගේ.

ප්‍ර : ඔව්.

පි : ජමිල්ද ඊබ්‍රහීම්ද

ප්‍ර : නෑ මම දෙකම අහනවා. ඊබ්‍රහීම් මොහොමඩ්ගේ ගම කොහේද මුල් ගම?

පි : ඊබ්‍රහීම් කියන්නේ තාත්තාගේ ගම.

ප්‍ර : ඉන්ෂාෆ්ගේ තාත්තා?

පි : ඉන්ෂාෆ්ගේ තාත්තා පල්ලේගම.

ප්‍ර : කොහේද?

පි : දෙල්තොට පල්ලේගම.

ප්‍ර : මේ ජමිල් මොහොමඩ්ගේ ගම කොහේද?

පි : එයා හිටියේ මහවිල garden එකේ ඒ ගොල්ලන්ගේ අයියගේ ගෙදර ඉන්නේ. ඊට අමතරව එයා දැන් බැඳලා කොහේද ඉන්නේ කියලා මම හරියට දන්නේ නෑ. ගම්පොළ හරි මම හිතන්නේ

Presidential Secretariat
FAIR COMMENT BY JEZEEM

ප : දෙල්තොටද එයා?

පි : දෙල්තොට නෙවේ. ඒ හරියේ වෙන ගම්මානයක් තියෙනවා.

ප : ඒ ඊබ්‍රහීම් මොහොමඩ් මහත්මයා ඔය ඉන්ෂාෆ්ගේ තාත්තා දෙල්තොට ඉස්ලාම් මද්‍රසා පාසලක් හැදුවද?

පි : මද්‍රසා පාසලක් හැදුවා.

ප : කොහේද ඒක හැදුවේ?

පි : දෙල්තොට පල්ලේගම එයාගේ ගමේ.

ප : කොයි අවුරුද්දේද?

පි : හුඟක් කල් කරනවා. මම දන්න හැටියට මම ආපු කාලේ ඉඳලම ඒකට උදව් කර ගෙන ඉන්නවා. ඒ වගේම technical college එකකුත් තියෙනවා එතන.

ප : ඒයාද ඔක්කොම හැදුවේ?

පි : ඔව් වැඩියෙන්ම එයා වියදම් කළා.

ප : ඒක විවෘත කළේ මොන අවුරුද්දේද?

පි : එම අවුරුද්දෙම පොඩ්ඩ පොඩ්ඩ විවෘත කර ගෙන යනවා.

ප : තාම හදලා ඉවර නැද්ද?

පි : දැන් ඉවර වෙලා ඇති. පොඩි පොඩි වැඩ තිබුණේ.

ප : මොකක්ද මද්‍රසා පාසලේ නම?

පි : දෙල්තොට මවුහුල් උලමා Arabic college

ප : Arabic college. කොච්චර ලොකුයිද ඒ පාසල?

පි : ඉඩ ප්‍රමාණය ලොකුයි.

ප : නෑ ළමයි ළමයි කොච්චරක් එනවද ඒකට ඉගෙන ගන්න?

පි : ළමයි තිස් දෙනෙක් හෝ හතළිස් දෙනෙක් ඉන්නවා ඉගෙන ගන්න.

ප : එතකොට අර තව මොකක්ද හැදුවා කිව්වේ මද්‍රසා පාසලත් එක්ක තව?

පි : technical college එකක්.

ප : technical college එකක්. ඒකේ නම මොකක්ද?

පි : ඒක ඊබ්‍රහීමියා technical college.

ප : ඊබ්‍රහීමියා technical college. කොහේද තියෙන්නේ මේකේ ලිපිනය දන්නවද ඔබ?

පි : ලිපිනය දන්නේ නෑ දෙල්තොට කියලා දන්නවා.

ප : දෙල්තොට?

පි : දෙල්තොට.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප : සාක්ෂිකරු ඔබ තාමත් රැකියාවේ යෙදී ඉන්නවද?



President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මේ ගොල්ලොන්ගේ මේ වගේ වැඩ වලට විතරයි එන්නේ සර්.

ප්‍ර : ඉෂානා ට්‍රේඩරස් තාම වැඩ පටන් ගත්තේ නෑ?

පි : තාම වැඩ පටන් ගත්තේ නෑ වගේ තියෙන්නේ.

**මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියට අවශ්‍ය දැයි විමසමි. අවශ්‍ය නැත යනුවෙන් ප්‍රකාශ කරයි.**

**සාක්ෂිකරු මුදා හරිමි.**

**කොමිෂන් සභාවට පැමිණ සාක්ෂි ලබා දීමෙන් දැක්වූ සහයෝගයට කොමිෂන් සභාව ස්තූතිය පල කරනවා.**

පි : පොඩි ඉල්ලීමක් කරන්න පුළුවන්ද සර්.

ප්‍ර : ඔව්.

පි : මේ අපි කුළුබඩු අපනයනය ක්ෂේත්‍රයේ ගොඩාක් අපනයනය කරපු කෙනෙක් ඊබ්‍රහීම් හජ්ජීයාර්. ලංකාවේ ආර්ථිකයට ගොඩක් ශක්තිමත් කරපු විදේශ මුදල් ගෙනාපු කෙනෙක්. ඒ වගේම දුගී දුප්පත් ජනතාවට නැති බැරි අයට ආපදා තත්ත්වයේදී ගොඩාක් උදව් කළ කෙනෙක්. මම කාරුණිකව ඉල්ලා සිටිනවා එයා නිදහස් කරලා දුන්නොත් ලොකු පිනක්.

ප්‍ර : මෙම කොමිෂන් සභාවට තියෙන්නේ සීමිත බලතල. කාවවත් වැරදි කරුවෙක් හෝ නිදහස් කරන්න කොමිෂන් සභාවට බලතල නෑ. ඒක අධිකරණයකින් කරන්න ඕනේ. තාම අපි කරන්නේ අපිට ලබා දීලා තියෙන කාර්යය විතරයි ඒක නිදහස් කරනවද නැද්ද කියන අධිකරණයකින් තමයි කරන්න පුළුවන්.

**********

දැන් වේලාව : ප.ව. 06.40 යි.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President's Counsel's Copy
FAIR COMMENT BY JEZEEM

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

# 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.07.03 වේලාව: ප.ව. 06.50

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

**පෙනී සිටීම:-**

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

* කාර්මික සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති මහින්ද ජිනසේන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා සමඟ නීතිඥ හරීන් සද්ධාසේන මහතා සමඟ ගිතාංජලී තෙන්නකොන් මෙනවිය පෙනී සිටී.

* දික්වැල්ල මහතා වෙනුවෙන් නීතිඥ චලක විදානගේ මහතා පෙනී සිටී

**නම** : **මහින්ද ජිනසේන.**
**වයස** : **අවු 62**
**ජාතිය** : **සිංහල**
**ආගම** : **බුද්ධාගම**
**දැනට දරණ තනතුර** : **කළමනාකරණ අධ්‍යක්ෂ අශෝක ග්ලාස් ඇන්ඩ් මීර** ප්‍රයිවට් ලිමිටඩ්.
**ලිපිනය** : **977/4/ B දවටගහවත්ත පාර පැලවත්ත, බත්තරමුල්ල.**

**ප්‍රතිඥා දී කැඳවයි.**

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

**මේ අවස්ථාවේ දී මෙම සාක්ෂිකරු වෙනුවෙන් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා සමඟ නීතිඥ සද්ධාසේන සහ නීතිඥ තෙන්නකෝන් මෙනවිය පෙනී සිටින බව සඳහන් කරමි.**

**********

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

ප්‍ර: මහත්මයා ඔබ ඊයේ දින මේ ගරු කොමිෂන් සභාවේ දී සාක්ෂි ලබාදුන්නා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඒ සාක්ෂි ලබාදෙන අවස්ථාවේ දී ඔබ පිළිගත්තා 2017 මැයි 17 වැනිදා ඔබ එවකට අලෙවි අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කරපු සරත් උදයසිරි මහතාගෙන් අබලි ලෝහ කළමණාකරන ඒකකයේ රාජකාරී කටයුතු ඉවත් කරලා එයට ඩී.පී.පී. දික්වැල්ලා කියලා මහත්මයෙක් පත් කරයි කියලා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: දැන් මේ දික්වැල්ල මහතාව ඒ අබලි ලෝහ කළමනාකරණ ඒකකයේ රාජකාරී කටයුතු කරගෙන යන්න ඔබ පත් කරේ අධ්‍යක්ෂක මණ්ඩල තීරණයකින් තොරව ඔබේ ස්ව ඔබේ තනි කැමැත්තට පත්කරන ලද සිදුවීමක් කියලා මං කිව්වොත් ඔබ ඒක පිළිගන්නව ද?

උ: පිළිගන්නේ නැත ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඇයි ඔබ ඒක පිළිගන්නේ නැත්තේ?

උ: එයට අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් තිබෙන නිසා ස්වාමීනි.

ප්‍ර: එය ඔබට මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරන්න හැකියාවක් තියෙනව ද?

උ: මට මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරන්න හැකියාවක් නැත ස්වාමීනි.

ප්‍ර: එහෙමනම් කොහොමද ඔබ මේ ගරු කොමිෂන් සභාව සෑහීමට පත්කරන්නේ? මේක මේ අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් මතයි සිදුකළේ කියන කාරණය ?

උ: ඒ ගැන මට හොඳ මතකයක් තියෙනවා ස්වාමීනි . තවද ඉදිරියේ දී එම තොරතුරු දැන ගැනීමේ පනත යටතේ හෝ කොමිසම මාර්ගයෙන් එම ලිපි ලබාගැනීමට මම අදහස් කරනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කියන විදියට එහෙම තීරණයක් ගන්න මේ උදයසිරි මහත්මයගෙන් ඒ රාජකාරී කටයුතු ඉවත් කරන්න මොකද්ද විශේෂ හේතුවක් තිබ්බ ද?

උ: ප්‍රධානතම හේතුව වුණේ ඔහුගේ Performance ඉතාම අඩු තක්සේරුවක් තිබුණේ ස්වාමීනි.

ප්‍ර: දැන් එහෙම අඩු තක්සේරුවක් තිබ්බයි කියලා ඔබ ඔහුට කලින් දැනුම්දීමක් නැත්නම් ඔහුගේ මේ සම්බන්ධයෙන් ඔහුට අවවාද කිරීමක් කලින් කරලා තිබ්බ ද?

උ: සෑම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමකදීම ඔහුට අවවාද කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ඒ කියන දේවල් මේ ගරු කොමිෂන් සභාවට ඔබට ලිඛිතව සාක්ෂි මගින් ඉදිරිපත් කිරීමේ හැකියාවක් තියෙනව ද?

උ: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට ඊයෙත් කාලය ලබා දුන්නා මේ ලේඛන ඉදිරිපත් කරන්න. අද ඉදිරිපත් කරනව ද ඒ ලේඛන?

උ: එම ලේඛන අද ඒ කියන ලේඛන අතර නැත ස්වාමීනි.

ප්‍ර: මං ඔබට යෝජනා කරනවා ඔබ උදයසිරි මහත්මයව අයින් කරලා එම නිලධාරියට කනිෂ්ඨ පහළින් රාජකාරී කරපු නිලධාරියෙක් පත් කරේ ඔබේ සෘජු අධීක්ෂණයට ඒ නිලධාරියාව නතුකරගැනීමේ පරමාර්ථයෙන් කියලා?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ පිළිගත්ත ඔබට දැනීමක් තියෙනවයි කියලා මේ 2013 මාර්ගෝපදේශය සංග්‍රහය ඒ කියන්නේ අබලි ලෝහ කළමනාකරණ ඒකකය සම්බන්ධයෙන් පිහිටලා තිබෙන මෙම මාර්ගෝපදේශය සංග්‍රහය පිළිබඳ ඔබට දැනීමක් තිබෙනවා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ මාර්ගෝපදේක සංග්‍රහය ඇති කළේ කැබිනට් මණ්ඩල තීරණයක් මත කියලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

FAIR COMMENT BY JEZEEM

උ: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: එම මාර්ගෝපදේශය සංග්‍රහයට එවකට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති නවාස් රාජාබ්ඩීන් මහතාත් එවකට සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසායක සංවර්ධන අමාත්‍යාංශය ලේකමුත් අත්සන් තබලා තියෙනවා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට එහි තිබෙන එක වගන්තියකුත් මා පෙන්වා සිටියා ඊයේ දින අලෙවි අංශයේ අබලි ලෝහ කළමාකරණ ඒකකය මගින් සිදුකළ යුතු අතර එහි ප්‍රධාන වගකිව යුතු නිලධාරියා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අධ්‍යක්ෂක වේ කියලා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ අලෙවි අධ්‍යක්ෂක කියලා තනතුරක් පැවතුණා ඒ අලෙවි අධ්‍යක්ෂක තනතුරෙන් නිලධාරියාගේ රාජකාරී කටයුත්තක් තමයි ඔබ දික්වැල්ල මහතා වෙතට යොමු කළේ. ඒක හරිද?

උ: හරි ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

මේ අවස්ථාවේ දී සටහන් කර තබන්නේ දික්වැල්ල මහතා වෙනුවෙන් නීතිඥ චලක විදානගේ මහතා පෙනී සිටින බවයි.

**********

**<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>**

ප්‍ර: ඒ අනුව 2013 මාර්ගෝපදේශක සංග්‍රහයේ ලිඛිතව දක්වා තිබෙන අලෙවි අධ්‍යක්ෂක වෙත ව්‍යවස්ථාපිතව යොමු කර තිබෙන රාජකාරියක් තමයි ඔබ එය උල්ලංඝණය කරලා ඔබ ඒ මාර්ගෝපදේශය සංග්‍රහයට පටහැනිව වෙනත් නිලධාරියෙක්ව ඒ සඳහා යොමු කරලා තිබෙන්නේ කියලා කිව්වොත් ඔබ ඒක පිළිගන්නව ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: ඇයි පිළිගන්නේ නැත්තේ?

උ: ඒ සඳහා සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබුණා. සභාපතිවරයා වශයෙන් මම ක්‍රියාත්මක කළේ අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: මාර්ගෝපදේශ සංග්‍රහය සම්මත කෙරුවේ අධ්‍යක්ෂක මණ්ඩලය ද?

උ: නැත ස්වාමීනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඒක කවුද අනුමත කෙරුවේ?

උ: එවකට සිටි කැබිනට් මණ්ඩලය සහ ලේකම් විසින්

ප්‍ර: කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරපු දෙයක් අධ්‍යක්ෂක මණ්ඩලයට වෙනස් කරන්න පුළුවන් ද?

උ: ස්වාමීනි Guid line එක වශයෙන් පාවිච්චි කරලා ඒ ඒ අවස්ථාවට අනුරූපව සුළු වෙනස්කම් කාලානුරූපව කරලා තියෙනවා. ඒ වගේ තීරණ ගන්නවා ස්වාමීනි.

ප්‍ර: නැහැ මං අහන්නේ කැබිනට් මණ්ඩලය ගත්තු තීරණයක් වෙනස් කරන්න පුළුවන් ද අධ්‍යක්ෂක මණ්ඩලයට ?

උ: වෙනස් කරන්න බැහැ ස්වාමීනි.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>**

ප්‍ර: දැන් ඔබට දැනීමක් තියෙනව ද අබලි ලෝහ කළමනාකරණ ඒකකයෙන් අබලි ලෝහ මිලදී ගැනීමේ කටයුතු සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි වූ කර්මාන්තකරුවන්ට නිකුත් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ?

උ: දැනීමක් තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව රජයේ ආයතන වලින් බැහැර කරන අබලි ලෝහ කර්මාන්ත සංවර්ධන මණ්ඩලයට මිල කමිටුව විසින් නියම කරන මිලක් මත ලබාගැනීම සිදුකළ යුතුයි කියලා ඔබ දැනුවත් ද?

උ: දැනුවත් ස්වාමීනි.

ප්‍ර: දැන් මේ අබලි ලෝහ ඒ එක් එක් වර්ෂයේ ලියාපදිංචි වෙච්ච කර්මාන්තකරුවන් අතර බෙදාහරින්නේ කොහොමද? ක්‍රමවේදය මොකද්ද?

උ: අපගේ දිස්ත්‍රික් කාර්යාල 19 ක් තිබෙනවා. එම සෑම දිස්ත්‍රික් කාර්යාලයකම Enterprise promotion manager EPM ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීතුමෙක් ඉන්නවා. බොහේ විට නෙමේ හැමතිස්සේම ඔහු විද්‍යා අංශයෙන් ඉගනගත්ත උපාධිදාරියෙක්. ඔහුව එම කාර්යාලය තුළ ස්ථාපිත කර තිබෙන්නේ අබලි ලෝහ සම්බන්ධව ගැනීම් සහ බෙදාහැරීම සම්බන්ධව කටයුතු කරන්න.

ප්‍ර: දැන් ඔබ සඳහන් කළේ 19 ක් ඉන්නවා කියලනේ. 19 ක් ද 25 ක් ද ?

උ: සමාවෙන්න 25 ක් ස්වාමීනි.

ප්‍ර: ඒ එක් එක් දිස්ත්‍රික්කයකට එක නිලධාරියෙක් බැගින් පත්කර තිබුණ ද?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: මම ඔබෙන් අහන්නේ දැන් මේ කර්මාන්කරුවන්ට අබලි ලෝහ නිකුත් කිරීමේ පදනම මොකද්ද මොන පදනමක් මත මේ අර අබලි ලෝහ නිකුත් කිරීම සිද්ධ කරන්නේ?

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔවුන්ගේ කර්මාන්තය ඒ ධාරිතාව මත ඒවා නිකුත් කරනු ලබනවා ස්වාමීනි.

ප්‍ර: ඒ ධාරිතාව මත කොපමණ් ප්‍රමාණයක් නිකුත් කළ යුතුයි ද කියලා කවුද තීරණය කරන්නේ?

උ: එම දිස්ත්‍රික් කාර්ලයේ නිලධාරීන් විසින් තීරණය කරනු ලබන්නේ ස්වාමීනි.

ප්‍ර: ඉන් අනතුරුව එය ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබනව ද?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඒ ඉදිරිප්ත කරනු ලැබූ අවස්ථාවේ දී ප්‍රධාන කාර්යාලයේ අලෙවි අංශයේ මේ සඳහා පත්කරනු ලැබ තිබෙන නිලධාරී එය පරීක්ෂ කළ යුතුයි ද?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: එම වගකීම එන්නේ අධ්‍යක්ෂක අලෙවි වෙත කව්වොත් ඒක හරිද?

උ: එය හරි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ඒ කාල වකවානුවේ දී ඔබ පිළිගත්තා මේ අධ්‍යක්ෂක අලෙවි ඒ රාජකාරියෙන් ඉවත් කරලා දික්වැල්ල මහත්මයා පත්කරලා තිබ්බයි කියලා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව ඒ වගකීම ඒ අවස්ථාවේ දී ඔබ පවරලා තිබුණා දික්වැල්ල මහතාට?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: මේ විශාල වශයනේ පිත්තල , තඹ කර්මාන්තකරුවන්ට නිකුත් කරන ලද ඒ සඳහා සාමාන්‍යය ක්‍රියාපටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම සිදු කරනව ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: දැන් විශාල ප්‍රමාණයෙන් කරුමාන්තකරුවන්ට ඒ අබලි ලෝහ නිකුත් කරන කොට ඒ සඳහා ඔබ මැදිහත් වෙලා අනුමැතිය දීපු අවස්ථාවන් තියෙනව ද?

උ: නැත ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

ප්‍ර: සාක්ෂිකරු ඔබ දැන් දුන්නු උත්තරය වෙනස් කරන්න ඕන ද නැත්නම් ඔබ ඒ දුන්න උත්තරයේ ස්ථාවරයේම ඉන්නව ද?

උ: එම ස්ථාවරයේම ඉන්නවා ස්වාමීනි.

**********

**<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>**

FAIR COMMENT BY JEZEEM

**මේ අවස්ථාවේ දී සාක්ෂිකරුට දැනටමත් DPP 12 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටී.**

ප්‍ර: මෙම ලේඛනය ඔබේ අවධානයට යොමු වෙලා තියෙනව ද, ඔබේ සටහනක් තිබෙනව ද?

උ: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: මේ ලේඛනය කුමක්ද කියලා ඉස්සෙල්ලා කියන්න පුළුවන් ද?

උ: මෙය කොලොසස් පුද්ගලික සමාගමෙන් අධ්‍යක්ෂ කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත. සාම්පල් වශයෙන් මොටාර් කොපු කිලෝ 50 ක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටින ලියුමක් සර්.

ප්‍ර: එහි කොහේද ඔබේ සටහන තිබෙන්නේ. දැනටමත් 12 C වශයෙන් ලකුණු කර ඇති ස්ථානයක් සාක්ෂිකරු පෙන්වා සිටී. මොකද්ද ඔබ ඒ ඔබ යොදලා තිබෙන සටහන?

උ: Approved .

ප්‍ර: මොනවටද ඔබ ඒ අනුමැතිය ලබාදීලා තිබෙන්නේ?

උ: මෙම කිලෝ 50 ක් නිකුත් කිරීම පිළිබඳව ස්වාමීනි.

ප්‍ර: කාටද මොනවද?

උ: Scrab, Artery mortar, shells

ප්‍ර: ඒ කියන්නේ කාලතුවක්කු උන්ඩ කොපු?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: පිත්තල කොපු?

උ: පිත්තල කොපු. ඒවා නිකුත් කරන්න කිලෝ 50 ක් . කොලෝසස් ආයතනයට. සාම්පල් වශයෙන්. මිලදී ගැනීමට කැමැත්ත ඉල්ලීමක් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ අනුව මේ ලේඛනය අනුව ඔබ සාම්පල් වශයෙන් කිලෝ 50 ක් කොලෝසස් පෞද්ගලික සමාගමට නිකුත් කිරීමට ඔබ විශේෂ අනුමැතියක් ලබාදීලා තිබෙනවා?

උ: ඒ පල්ලෙහායින් ගොඩනැගිල්ල ආපු ලේඛනයට මම ඒ අවස්ථාවේ සෑහීමට පත්වෙලා අවසරදීලා තියෙනවා.

ප්‍ර: නැවත ඔබ **DPP 12 ලේඛනය පරීක්ෂා කර බලන්න.** කාටද මේ ලිපිය යොමු කරලා තිබෙන්නේ? කොලෝසස් සමාගමේ.

උ: අධ්‍යක්ෂ ජනරාල්වරයාට ස්වාමීනි.

ප්‍ර: ඔබ Approved කියලා ඔබ අනුමැතිය දීලා තියෙන්නේ කාටද ?

උ: අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එය මං දැක්කා එවලා තියෙනවා දික්වැල්ලට FNA For necessary Action කියලා ස්වාමීනි. ඉන්පසුව දික්වැලල් මහතා එය මා වෙත ගෙනවිත් මගේ අනුමැතිය ලබාගෙන තිබෙනවා ස්වාමීනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ දික්වැල්ල මහත්මයගේ රාජකාරී ඔබ සෘජුව අධීක්ෂණය කිරීමක් සිදු කරලා තිබෙනවා?

උ: සැවොම දන්නවා මේ සම්බන්ධව. අධ්‍යක්ෂ ජනරාලුත් දන්නවා මමත් දන්නවා. දික්වැල්ල මහත්මයත් දන්නවා ස්වාමීනි.

දැනටමත් **DPP 13** සාක්ෂිකරුට පෙන්වා සිටී.

ප්‍ර: මහත්මයා දැන් ඔබට පෙන්වන ලේඛනය බලන්න. ඒ ලේඛනය කුමක්ද?

උ: ඔක්තෝම්බර් මස 04 වැනි දින 2017 කොලෝසස් පුද්ගලික සමාගම විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත මොටාර් කොපු මෙක්ට්‍රික් ටොන් 05 ක් ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීම ශීර්ෂය යටතේ ඉස්සෙල්ලා දුන්නු කිලෝ 50 ස්තූති කරලා ඒවා ඔහුගේ විද්‍යාගාර වල සඳහා පාවිච්ච කළාය. ස්වාමීනි එහෙම සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර: ඔබේ සටහනක් තියෙනවා ද?

උ: සමාවෙන්න.

ප්‍ර: ඔබේ සටහනක් තිබෙනව ද?

උ: මගේ සටහනක් නැහැ ස්වාමීනි මෙතැන.

සාක්ෂිකරුට **DPP 11** වශයෙන් ලකුණු කර ඇති තවත් ලේඛනයක් පෙන්වා සිටී.

ප්‍ර: මහත්මයා දැන් ඔබට පෙන්වන ලේඛනය කුමක් ද?

උ: මෙයද කොලෝසස් පුද්ගලික සමාගමෙන් ඔක්තෝම්බර් මාස 24 2017 අධ්‍යක්ෂක කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත under ground copper cable ටොන් 05 නිකුත් කරන ලෙස දන්වා එවපු ලිපියක්.

ප්‍ර: ටොන් 05 කියන්නේ කිලෝ කීයක් ද කියලා කිව්වොත්?

උ: ටොන් 05 ක් කියන්නේ කිලෝ 5000 ක් ස්වාමීනි. නමුත් භූගත ඒ කොපර් කේබල් වල බාහිරව තිබෙන ඩබල් පටලය ඉතාමත්ම ගණකම එකක්. මා දන්නා පරිදි මේගොල්ලොන්ට ලැබෙන්නේ මේවා ගන්න බරින් 40% ක පමණ ප්‍රමාණයක් තමයි ලෝහමය වශයෙන් ලැබෙන්නේ. එයා මුලින් තීරණය කරපු තත්ත්වයක් තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ කිලෝ 5000 ක් නේද, ටොන් 05 ක් ඉල්ලා තමයි කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ ලිපිය යොමු කර තිබෙන්නේ?

උ: අධ්‍යක්ෂකතුමා වෙත.

ප්‍ර: එහි ඔබේ සටහනක් තිබෙනව ද මේ ලේඛනයේ?

උ: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: කොහේද තිබෙන්නේ ඔබේ සටහන පෙන්වන්න ? දැනටමත් **DPP 11 A** වශයෙන් ලකුණු කර ඇති කොටස සාක්ෂිකරු පෙන්වා සිටී. මොකද්ද ඔබ යොදලා තිබෙන්නේ එහි?

Registered Secretaryies Copy
FAIR COMMENT BY JEZEEM

උ: TEC assessment ඒ කියන්නේ තාක්ෂණික කමිටුවෙන් කරන ලද අධ්‍යයනය. අප කාර්මික සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණික කමිටුව විසින් කරන අධ්‍යයනය. කමිටුවේ කණ්ඩායම විසින් කරන ලද අධ්‍යයනය අනුව මෙම ආයතනයට මෙම භාණ්ඩදීම සුසුදු යැයි දන්වා ඇති බැවින් මම එය අනුමත කරලා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔව් ඒ අනුව මේ ලිපිය අනුවත් ඔබ මේ අවස්ථාවේ දී ඒ විශාල ප්‍රමාණයක් ඉල්ලා ඇති එක් අවස්ථාවක් වශයෙන් හදුන්වන්න පුළුවන් ඔබ අනුමැතිය ලබාදුන්න?

උ: එහෙමයි ස්වාමීනි.

**සාක්ෂිකරුට දැනටමත් DPP 03 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටී.**

ප්‍ර: මහත්මයා මෙය කොලෝසස් පුද්ගලික සමාගමෙන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක වෙත ඉදිරිපත් කරන ලද ලේඛනයක් ද?

උ: අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද ලේඛනයක්.

ප්‍ර: මොකද්ද එහි තිබෙන්නේ?

උ: කොලෝසස් පුද්ගලික සමාගමෙන් මෙක්ට්‍රික් ටොන් 15 ක් මෝටාර් කොපු මුලින් දුන්න කිලෝ 1.6 ට ස්තූති කරමින් ඔවුන්ගේ වාස්තු තාක්ෂණයෙන් නිෂ්පාදනය දිගටම කරගෙන යෑම සඳහා බ්‍රාස් වයර් කෝඩ් නිෂ්පාදනය සඳහා ටොන් 20 ත් 25 ත් අතර අමුද්‍රව්‍යය අවශ්‍ය වෙනවා එක බැච් එකක් නිෂ්පාදනය සඳහා පැය 24 ක් මෙම ආයතනය දුවනවා 365 දවසේම . මේ මෙක්ට්‍රික් ටොන් 15 ගත් පසු අපිට පෙන්වා දෙන්න පුළුවන් අපගේ Finished product එක ඒ කියන්නේ අවසාන නිපැයුම ඔබගේ විපරම සඳහා.

ප්‍ර: දැන් ඔබේ සටහනක් මේ ලිපියේ තිබෙනවද?

උ: මගේ සටහනක් තිබෙනවා ස්වාමීනි.

පෙන්වන්න. දැනටමත් **DPP 03 B වශයෙන් යොදා ඇති සටහනක් සාක්ෂිකරු විසින් හඳුනාගනී.**

ප්‍ර: මොකද්ද ඔබ යොදලා තිබෙන සටහන?

උ: එය ස්ථිර කර තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: අනුමැතිය ලබාදීලා තිබෙනව ද සභාපතිතුමා වශයෙන්. ඒ කියන්නේ මෙක්ට්‍රික් ටොන් 15 ක් කියන්නේ කිලෝ 15000 ක ප්‍රමාණයක් ලබාදීමට ඔබේ අනුමැතිය ලබාදීලා තියෙනවා ?

උ: එසේ ස්වාමීනි.

සාක්ෂිකරුට **DPP 10 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටී.**

ප්‍ර: මහත්මයා මෙයද කොලෝසස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂක විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත 2017

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දෙසැම්බර් 14 වැනි දින අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද ලිපියක් කියලා ඔබ පිළිගන්නව ද? සාක්ෂිකරුට අදාළ ලේඛනය පෙන්වා සිටී.

උ: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: මොකද්ද ඒ ලිපියෙන් ඉල්ලා සිටින්නේ?

උ: කොලෝසස් පුද්ගලික සමාගමෙන් මොටාර් හිස් පිත්තල කොපු මෙක්ට්‍රික් ටොන් 25 ක් ඉල්ලා සිටිනවා මෙම ලිපියෙන් ස්වාමීනි.

ප්‍ර: ඔබේ සටහනක් තිබෙනවද?

උ: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: පෙන්වන්න පුළුවන්ද?

දැනටමත් **DPP 10 A වශයෙන්** ලකුණු කර ඇති සටහනක් සාක්ෂිකරු විසින් පෙන්වා සිටී.

ප්‍ර: මහත්මයා කියන්න පුළුවන් ද මොකද්ද ඒ ඔබ විසින් යොදා ඇති සටහන කියලා?

උ: Please issne as batch production කරුණාකර ඔවුන්ගේ වැඩමුර අනුව නිකුත් කරන්න.

ප්‍ර: ඒ කියන්නේ ඔබ මෙක්ට්‍රික් ටොන් 25 ක් පිත්තල ලබාදෙන්න ඔබේ අනුමැතිය අනුව මේ ලේඛනය අනුව ලබාදීලා තියෙනවා ද?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: දැන් මෙහි අධ්‍යක්ෂක ජනරාල්තුමාගේත් යම්කිසි සටහනක් තිබෙනව ද? ඔහුගේ අත්සනක් තිබෙනව ?

උ: එසේ ස්වාමීනි.

**සාක්ෂිකරු 2020/07/02 දින සහිතව යොදා ඇති අත්සනක් පෙන්වා සිටී.**

ප්‍ර: ඒ කාගේ අත්සන කියලද ඔබ අදුරගන්නේ?

උ: අධ්‍යක්ෂක ජනරාල්වරයගේ අත්සන යොදා මා වෙත යොමු කරලා තියෙනවා.

ප්‍ර: මෙක්ට්‍රික් ටොන් 25 ක් කියන්නේ කිලෝ 25000 ක් කියලා කිව්වොත් ඒක හරිද?

උ: නිවැරදි ස්වාමීනි.

සාක්ෂිකරුට දැනටමත් **DPP 08 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටී.**

ප්‍ර: මෙය 2018 ජනවාරි 05 දින දරණ කොලෝසස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂක විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද ලිපියක් බවට මහත්මයට පෙනී යනවද?

උ: පෙනී යනවා ස්වාමීනි.

සාක්ෂිකරුට අදාළ ලේඛනය පෙන්වා සිටී.

ප්‍ර: එයින් මොනවද ඒ ලිපියේ සඳහන් වෙලා තිබෙන්නේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: මේ ලිපියද එම ආයතනය විසින් අධ්‍යක්ෂක ජනරාල්වරයාට නිකුත් කරලා තියෙන්නේ ස්වාමීනි. මෙහි දී ඒ මොටාර් උණ්ඩ මෙක්ට්‍රික් ටොන් 25 ක් ඉල්ලා ඇති බව පෙනී යනවා ස්වාමීනි.

ප්‍ර: ඔබේ සටහනක් තිබෙනවා ද?

උ: නැත ස්වාමීනි.

සාක්ෂිකරුට දැනටමත් **DPP 06 වශයෙන් ලකුණු කරපු ලේඛනයක් පෙන්වා සිටී.**

ප්‍ර: මෙයද කොලෝසස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂක විසින් 2018 මාර්තු 19 වැනි දින කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කරන ලද ලිපියක් කියලා කිව්වොත් මහත්මයා ඒක පිළිගන්නව ද?

උ: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: මෙම ලේඛනයේ ඔබේ සටහනක් තිබෙනව ද?

උ: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: කොහේද පෙන්වන්න පුළුවන් ද?

දැනටමත් **DPP 06 A වශයෙන් ලකුණු කර ඇති සටහනක් සාක්ෂිකරු පෙන්වා සිටී.**

ප්‍ර: මේ ලිපිය කුමක් සම්බන්ධයෙන් ද නිකුත් කරලා තිබෙන්නේ? ඒ ඔබේ සටහනේ මොකද්ද යොමු කරලා තිබෙන්නේ?

උ: මේ 2018 මාර්තු 19 මේ ලිපයෙන් මෙක්ට්‍රික් ටොන් 25 ක් මොටාර් උණ්ඩ අවසාන කොපු ඉල්ලා සිට තියෙනවා. ඒ ගොල්ලොන්ගේ නිෂ්පාදන කාර්ය ගැන සටහනක් කරමින්. එහි තිබෙන අනිත් අත්සන් ගැනත් කියන්න ද ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කොපමණ ප්‍රමාණයක් කොලොසස් පුද්ගලික සමාගමට නිකුත් කරන්න ද අනුමැතිය ලබාදීලා තිබෙන්නේ?

උ: මෙක්ට්‍රික් ටොන් 25 ස්වාමීනි.

ප්‍ර: පිත්තල

උ: පිත්තල උණ්ඩ කොපු.

ප්‍ර: එහි තවත් සටහන් තිබෙනව ද?

උ: අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අත්සනින් යොදා මා වෙත යොමු කිරීමෙන් පසු මම එය Approved කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව ඔබ මෙක්ට්‍රික් ටොන් 25 කොලෝසස් සමාගමට එදින ලබා දෙන්නත් මේ ලේඛනය අනුව අනුමැතිය ඔබ විසින් ලබාදීලා තිබෙනවා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: සාක්ෂිකරුට දැනටමත් **DPP 07 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටී. එය 2018 මාර්තු 21 දින දරණ** කොලෝසස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂක විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද ලිපියක්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මහත්මයා දැන් ඔබට පෙන්වා සිටින ලේඛනය ඔබට මොකද්ද සඳහන් වෙලා තිබෙන්නේ?

උ: ට්‍රාන්ස්ෆෝමර්ස් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර තියෙනවා ස්වාමීනි. කොපර් වයර් රොඩිස්, ට්‍රිප්ස් සහ බ්‍රාස් නිෂ්පාදනය කරන්න. අධ්‍යක්ෂක ජනරාල් වෙත යොමු කරමින්. මාර්තු 21 වැනිදා 2018 ස්වාමීනි.

ප්‍ර: එහි ඔබේ සටහනක් තියෙනවද?

උ: තියෙනවා ස්වාමීනි.

**ඔබ මොකද්ද ඒ යොදලා තියෙන සටහන. දැනටමත් ඔබේ සටහන පෙන්වන්න. දැනටමත් DPP 07 A වශයෙන් ලකුණු කර ඇති ලේඛනය සටහන සාක්ෂිකරු පෙන්වා සිටී.**

ප්‍ර: මොකද්ද ඔබේ සටහන ඒ සම්බන්ධයෙන් ?

උ: මෙම ලිපිය මට මතකයි ස්වාමීනි. තුල්හිරිය විදුලි බල මණ්ඩලයෙන් මෙම ට්‍රාන්ස්ෆෝමර්ස් තියෙන භූමියේ ඒ ගොල්ලොන්ට අලුතෙන් ලැබෙන විදුලි ජනක යන්ත්‍ර සවි කිරීමට තිබෙන බව පවසා 11/04 /18 දිනට පෙර මෙම ඔවුන් අප වෙත යොමු කර තිබෙන මට මතකයේ හැටියට තෙල් සහිත ඒවා මිලියන 27 ක් විතර තෙල් රහිත ඒවා මිලියන 07 ක් පමණ. ඒ ට්‍රාන්ස්ෆෝමර්ස් මිලදීගෙන ඉවත් කරගන්න. නැතහොත් ඔවුන්ට ඒවා කෙළින්ම මේවා ගන්නා අය වෙත විකුණුම් කිරීමට සිදුවෙන බව දන්වා තිබෙනවා.

ප්‍ර: ඔබ ඒ කොලෝසස් පුද්ගලික සමාගමට නිකුත් කරන්න අනුමැතියක් ලබාදීලා තියෙනව ද ඔය ලිපිය අනුව?

උ: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: කොච්චර ප්‍රමාණයක් ද?

උ: 75% ක් ස්වාමීනි.

ප්‍ර: ඒ ප්‍රමාණයෙන් 75% ක් ලබාදෙන්නයි කියලා ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එය මෙක්ට්‍රික් ටොන් නැත්නම් කිලෝ වශයෙන් කොපමණ කියලා කියන්න හැකියාවක් තිබෙනව ද?

උ: මෙය ගණනය කරන්නේ ඒකක වශයෙන් ස්වාමීනි කිලෝ වශයෙන් නොවේ.

**දැනටමත් DPP 04 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරු පෙන්වා සිටී.**

ප්‍ර: මෙය කොලෝසස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂක විසින් 2018 මාර්තු 27 වැනි දින කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කරන ලද ලිපියක් වශයෙන් ඔබ පිළිගන්නවද?

උ: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: මොනවද ඒ ලිපියේ සඳහන් වෙලා තිබෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

උ: මෙක්ට්‍රික් ටොන් 25 ක් මොටාර් උණ්ඩ කොපු 2018 මාර්තු 27 වැනිදා ඉල්ලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබේ සටහනක් තිබෙනව ද?

උ: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: කොහි තිබෙන්නේ පෙන්වන්න. එය ඔබ හඳුනාගන්නවද?

උ: ඔව්.

මේ අවස්ථාවේ දී **දැනටමත් DPP 04 A වශයෙන් ලකුණු කර ඇති සටහන සාක්ෂිකරු විසින් පෙන්වා සිටී.**

ප්‍ර: ඔබ කාටද ඒ සටහන යොදලා තිබෙන්නේ මොකද්ද ඒ යොදලා තිබෙන සටහන?

උ: AD marketing ඒ කියන්නේ Assistant director marketing සහකාර අධ්‍යක්ෂ (අලෙවි) නිර්දේශ කරමි කියලා සඳහන් කර තිබෙනවා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ ඒ අවස්ථාවේදීත් කොලොසස් පුද්ගලික සමාගමට මෙක්ට්‍රික් ටොන් 25 ක පිත්තල ලබාදෙන්න අනුමැතියක් ලබාදීලා තිබෙනවා?

උ: එසේ ස්වාමීනි.

**දැනටමත් DPP 05 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරු පෙන්වා සිටී.**

ප්‍ර: මෙම ලේඛනය නියෝජ්‍යය අධ්‍යක්ෂක කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ අත්සන සහිතව 2018 සැප්තැම්බර් 07 දින දරණ ලේඛනයක් මෙය විදුලි ට්‍රාන්ස්ෆෝමර් ලබාගැනීමේ ලේඛනයක් කිව්වොත් ඔබ පිළිගන්නවද?

උ: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: ඔබේ සටහන්ක තිබෙනවාද?

උ: තිබෙනවා ස්වාමීනි.

පෙන්වන්න පුළුවන්ද? **DPP 05 A වශයෙන් ලකුණු කර ඇති සටහන සාක්ෂිකරු පෙන්වා සිටී.**

ප්‍ර: මොකද්ද ඔබේ සටහනේ ?

උ: එය නිර්දේශ කර තිබෙනවා ස්වාමීනි. එය අනුමත කර තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ට්‍රාන්ස්ෆෝමර්ස් 150 ලබාදීම සුදුසුයි කියලා නිර්දේශ ඔබේ අනුමැතිය ලබාදීලා තියෙනවා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: දැන් මේ ලේඛන අනුව මහත්මය පිළිගන්නව ද කොලෝසස් පුද්ගලික සමාගමට පිත්තල සහ තඹ කොලෝසස් පුද්ගලික සමාගමට විශාල ප්‍රමාණ වලින් ලබාදීමේදී ඔබවෙත ඉදිරිපත් කර ඔබේ අනුමැතිය මත මේ ලබාදීම සිදු කර තිබෙනවයි කියලා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: දැන් සාමාන්‍යය කර්මාන්තකරුවන්ට ඒ සමාන්‍යයෙන් එහෙම ලබාදෙන කොට හැම අවස්ථාවකදීම ඔබට ඉදිරිපත් කිරීමක් සිදු කරන්නේ නැහැනේ. සමාන්‍යයයෙන් පොඩි ගණන් ලබාදෙන කොට?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: ලබාදෙනව ද එහෙම ?

උ: පිත්තල සම්බන්ධව මේ මොටාර් සම්බන්ධව ලබාදීමේ දී මා දැනුවත් කිරීමක් සිදුවුවා ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: දැනුවත් කිරීමක්ද අනුමැතියක් ලබා ගත්තේ?

උ: අනුමැතියකුත් ලබාගත්තා ස්වාමීනි. ගම්මාන වෙත ගෙන ගොස් බෙදාහැරීම සඳහා ස්වාමීනි.

ප්‍ර: ඔබට කලින් මෙම කොමිෂන් සභාවට සාක්ෂි ලබාදුන් දික්වැල්ල මහතා කොමිෂන් සභාවට කිව්වා සුළු හා කුඩා පරිමාණ කර්මාන්තකරුවන්ට අබලි ද්‍රව්‍යය ලබාදීමේදී කිසිම අවස්ථාවක ඔබගෙන් අනුමැතිය ලබාගත්තේ නැහැ කියලා. අනිත් අවස්ථාවලදී අවස්ථා 11 ක දී විතර ඔබ අනුමැතිය දීලා තියෙනවා කිව්වා මහා පරිමාණ කර්මාන්තකරුවන්ට ලබාදෙන්න. ඒ 11 න් 10 ක්ම කොලෝසස් සමාගමට තමා ඔබ අනුමැතිය ලබාදීලා තිබෙන්නේ. දික්වැල්ල මහතා ඒ බව කොමිෂන් සභාවට දැන්නුවානම් දික්වැල්ල මහතා කියන එකද හරි ඔබ කියන එකද හරි?

උ: මම මුලින් පැවසුවේ ස්වාමීනි මෙම පිත්තල කොපු වෙන් කරගත්තාම එනම් ටොන් 700 ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් ලබාගන්නා මේ පිත්තල කොපු සම්බන්ධයෙන් කෙරෙන සෑම ක්‍රියාවලියක්ම සඳහා මට දන්වා මගෙත් අනුමැතිය ලාබගත්තා ස්වාමීනි මේ සඳහා පමණක්.

ප්‍ර: ඒක තමා දික්වැල්ල මහතා කිව්වේ මේ විදියට ලියුම් එවලා ඔබගේ අනුමැතිය අනුව සැපයීම් කෙරුවේ අවස්ථා 11 යි තිබ්බේ එයින් 10 ක් ම කොලෝසස් සමාගමට ඔබගේ අනුමැතිය යටතේ සපයපු අවස්ථා කියලා. ඒක තමයි දික්වැල්ල මහතා කිව්වේ. මම අහන්නේ දික්වැල්ල මහතා කියපු එක හරිද ඔබ කියන එකද හරි?

උ: ඔහු කී දේ හරි ස්වාමීනි. මගේ නිලධාරීන් ඒ ගොල්ලොන්ට තියෙන ක්‍රියාපටිපාටිය අනුගමනය කරලා මා වෙත ඉදිරිපත් කරයින් පස්සේ මගේ අනුමැතිය දීලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබ අනුමැතිය දීලා තියෙන අවස්ථා 11 න් 10 ක් ම කොලෝසස් සමාගමට නේද දීලා තියෙන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එකම අවස්ථාවයි වෙනත් ආයතනකට දීලා තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඇයි එහෙම වුණේ?

උ: හැම අවස්ථාවේම ස්වාමීනි වෙළඳපොළේ මෙවැනි මුදලක් යොදවා මිලදී ගැනීමට හැකි තවත් ගනුදෙනුකරුවෙකු වශයෙන් තමයි අපි සලකලා තිබෙන්නේ. ඉතිං ඒ අවස්ථාවේ මම ව්‍යාපාරයේ ඉන්න අය පාවිච්චි කරලා ආයතනය වෙනුවෙන් ලබාගෙන තියෙනවා ස්වාමීනි.

ප්‍ර: නැහැ ඔය අවස්ථා 10 ය කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් තනියම ගත්තු තීරණ නෙවෙයිනේ. කර්මාන්තකරු කරන ලද ඉල්ලීම ඔබ අනුමත කරලා තියෙනවා?

උ: අනුමත කිරීමට පෙර මට හොඳටම විශ්වාසයි අපේ ඒ කාර්ය මණ්ඩලය ඒ අවශ්‍ය කරන නිර්දේශයන් ලබාගැනීමට කටයුතු කර තිබෙන බව විශ්වාසයි ස්වාමීනි.

ප්‍ර: ඔබ කියන හැටියට මේ ද්‍රව්‍යය ලබා ගැනීමට හැකි එකම ආයතනය කොලෝසස් සමාගම නම් ඔබෙන් විශේෂ අනුමැතියක් ඒකට ගන්න අවශ්‍යය නැහැ නේද?

උ: ස්වාමීනි මෙම පිත්තල කොපු සඳහා අපේ සම්පූර්ණ කමිටුවක් රැස් කරලා මේ මේ ගනුදෙනු පිළිබඳ සිදුවන සෑම දෙයක්ම ඒ නිරීක්ෂණය කරා. ඉතිං එතැනදී මේ ගනුදෙනු සඳහා පමණක් ඒවා මා වෙත ඉදිරිපත් කරන්න ඇති ස්වාමීනි.

ප්‍ර: ඔය ලියුම් 10 එකක්වත් කමිටුවට ගිහිල්ලා ඔබට ආවා කියලා තියෙනව ද?

උ: යන්න ඇති ස්වාමීනි.

ප්‍ර: නැහැ ඔය ලියුමේ දාලා තියෙනව ද, දැන් ලියුමනේ ඔබට එන්නේ. ඔබගේ අත්සන දාලා ?

උ: ලිව්මේ දාලා නැහැ ස්වාමීනි.

ප්‍ර: අනුමත කරලා තියෙන්නේ ලියුමේනේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ලියුමේ සටහනක් නැහැ නේද? ඒක Technical Evaluation Committee එකෙන් නැත්නම් වෙන කමිටුවකින් අනුමත කරලා තියෙනවා කියලා?

උ: ලියුම් එකක පමණක් තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: එකක පමණක් තිබෙනවා. සාමාන්‍යයෙන් මේ වාගේ ලියුමක් ආයතනයට ලැබුණාම ඒක එවැනි කමිටුවක් හරහා ඔය ලියුම ඔබ වෙත එනව නම් ඒ කමිටුවේ නිර්දේශ ඔය ලියුමෙම තියෙනවා නේද?

උ: දැන් මේ ලියුම මා වෙත ඔබ වෙත ගෙන එනු ලබනු ඇත්තේ එක්කෝ දික්වැල්ල මහතා හෝ ඔහුගේ සහායක විසින් වෙන්න පුළුවන් ස්වාමීනි. ඒ ගොල්ලන් ඒ ගොල්ලන්ගේ රාජකාරිය හරියට ඉටු කරලා මා වෙත ගේනව නම් මම විමසා බලලා ඉවර වෙලා Approved කරනවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නමුත් ඔයි ලේඛන එකම ලේඛනයකවත් එකක ඇරෙන්න ඒ කමිටු හරහා අවා කියලා නැහැනේ ද?

උ: මේ සමඟ අනිකුත් ඇමුණුම් තියෙන්න ඇති ස්වාමීනි.

ප්‍ර: නැහැ ඔය ලිපි 10 න් 01 ක තියෙනවා නේද කමිටුව හරහා ආවා කියලා සටහනක්?

උ: ඒ ඇවිල්ලා ස්වාමීනි මේ කොපු සඳහා නොවේ. අර ට්‍රාන්ස්පෝමර් සඳහා ස්වාමීනි.

ප්‍ර: නැහැ මං කියන්නේ ඕනම අයිතමයක් සඳහා Technical Evaluation Committee එකෙන් ආවනම් ඒ සටහනේ ඒ ලියුමෙම තියෙනවනේ. ඔතැන දැන් එකක් ඔබ කිව්වා Technical Evaluation committee එකේ සටහන්ක තියෙනවා කියලා ඔය ලියුමකම තියෙනවා කියලා. එතකොට අනෙක් ලියුම වලටත් Technical Evaluation Committee හරහා ආවන්ම ඔය ලියුමෙමනේ ද ඕක සටහන් වෙන්නේ?

උ: ස්වාමීනි දැන් මේ පිත්තල සඳහා Technical Evaluation Committee එක සම්පූර්ණව එකපාරක් හෝ දෙවරක් හෝ තුන්පාරක් වාඩි වී ඒ සඳහා නිර්දේශ කර අවසන් ස්වාමීනි. නමුත් අර ඒ හාණ්ඩයේ ස්වභාවය වෙනස් වුණ හින්දා තමයි Technical Evaluation Committee එකක් දාලා තියෙන්නේ. ඒ වේලාවේ මට පෙන්නන්න ඇති ඒක හින්දා තමයි මං අත්සන් කරලා තියෙන්නේ.

ප්‍ර: Technical Evaluation Committee එකකින් ඔය අනුමත කරලා තියෙනව නම් ඔබට එන්න අවශ්‍යතාවක් නැහැනේ?

උ: සමහර විට ප්‍රමාණය නිසා මා වෙත එන්න ඇති ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ Technical Evaluation Committee එකටත් අනුමත කරන්න බැහැ කියන ප්‍රමාණයක් එවන්නේ ඔබ ගාවට?

උ: නැත ස්වාමීනි. ඒ ඔහුගේ ඉල්ලීම මත අපගේ නිලධාරීන් ගොස් එය පරීක්ෂා කර බලා අනුමත කරන ඒ ප්‍රමාණයට වඩා ඉහළින් නොදීමට මං වගබලා ගෙන තියෙන බව වගකීමෙන් ප්‍රකාශ කරන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: ඒක නෙවෙයිනේ ප්‍රශ්නේ මං ප්‍රශ්නයක් ඇහුවේ ඔය අවස්ථා 10 කදීම කොලෝසස් සමාගමට අනුමත කරලා තියෙන්නේ ඔබ විසින් නේද කියලා? Technical Evaluation Committee එකක් හරහාආවේ නැහැ නේද කියලා මං ඇහුවේ?

උ: නැත ස්වාමීනි . මං කියන්නේ මේ කොපු සඳහා Technical Evaluation Committee එකවරකින් රැස්වෙලා ඒකේ මිල ගණන් දියයුතු ප්‍රමාණයන් කාටද දෙන්න පුළුවන් ඒ අනුව ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් අපිට ඉතාමත් බලපෑම් තිබුණා සාධාරණ ඉක්මන් වාණිජමය කාර්ය පාරසයක් තුළ අරන් ඉවත් කරගන්න කියලා. ස්වාමීනි අපිට ගබඩා කරගන්න තැනක්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

තිබුණේ නැහැ. අපිට ඇත්තේ නැහැ. ඉතිං මේ ක්‍රියාවලිය ඉක්මනින් කරන්න තිබුණා ස්වාමීනි.

ප්‍ර: මං නැවතත් ප්‍රශ්නේ ඔබට දාන්නම් ඔය අවස්ථා 10 කදී ඔබ අනුමත කරලා තියෙන්නේ ඔබගේ තනි තීරණයක් මත නේද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: එහෙනම් කාගේ තීරණයක් මත ද?

උ: මගේ නිලධාරින් විසින් ස්ථාන පරීක්ෂා කරබලා අනුමත කරන ලද ප්‍රමාණයන් ස්වාමීනි.

ප්‍ර: එහෙම නම් ඔය ලිපියේ දිනෙයි ඔබගේ අනුමත දිනයයි අතර යම්කිසි කාලසීමාවක් තියෙන්න ඕන නේද?

උ: ඒක මට හරියට කියන්න බැහැ ස්වාමීනි.

ප්‍ර: නැහැ ඔබ කියන විදියට ඔබේ නිලධාරීන් ඔය ලිපිය බලලා ඒ අනුමත කරලා ඔබට එවනව නම් ඔබේ අනුමැතියට ලිපියේ දිනයයි ඔබගේ අත්සන යටතේ තියෙන දිනයයි අතර යම්කිසි කාලසීමාවක් තියෙන්න ඕනනේද නැද්ද?

උ: සමහර විට දැන් මේ ආයතනයට ගොස් පරීක්ෂා කර බලා එම වර්ෂයට අනුමත කරන ලද අයදුම්පත 2014 එකක් 2018 එකක් ස්වාමීනි. එතකොට මේ ලිපිය ලැබෙන දිනය ඒ දිනම වෙන්න බැහැ ස්වාමීනි. නමුත් ලිපිය ලද දිනයෙම එහෙම මා වෙත ලබා දෙන්නට හැකියාවක් තියෙන්න ඇති ස්වාමීනි.

ප්‍ර: ඔබ කියන්නේ ඔබගේ යටතේ ඉන්න තාක්ෂණික ඇගයුම් කමිටුව Technical Evaluation Committee වලින් අනුමත කරන කර්මාන්තකරුවන්ට වුණත් අදාළ දේ ලබාදීමට පෙර ඔබගේ අනුමතය ලබාගන්න ඕන කියල ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: එතකොට අවශ්‍යය වෙන්නේ නැහැ ඔබේ අනුමැතිය? අවශ්‍ය ද නැද්ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: ඒක තාක්ෂණික ඇගයුම් කමිටුවෙන් අනුමත කරලා තියෙනවා නම් ඒක කෙළින්ම දෙන්න පුළුවන් නේ කර්මාන්තකරුට?

උ: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: ඔබට එන්නේ මොන වගේ ලේඛන ද?

උ: සමහර විට මිලෙන් අධික මෙම ගනුදෙනුවෙ මිල අධික නම් ඔවුන් පැමිණ මගෙන් ඒ සඳහා අනුමැතිය ලබාගන්නවා විය හැකියි ස්වාමීනි.

ප්‍ර: ඔබ ඒ මොනව හරි මිලදී ගන්නව නම්නේ? නේද?

උ: නැහැ මෙය කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබෙන ආදායමක් වශයෙන් සලකන්නේ ඒ අවස්ථාවේ දී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ලැබෙන ආදායම හැමවෙලේම අනුමත කරගන්න ඕනේ නැහැනේ සභාපතිවරයා වශයෙන්. තමන් මොනව හරි විකුණනවනම් විතරයිනේ ඒ අනුමතයක් ගන්න ඕන නේද?

උ: නික්තු කිරීමට වෙන්න ඇති ඉතිං. අනුමත කරගන්නේ ඇත්තේ ස්වාමීනි.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>**

ප්‍ර: දැන් මහත්මයා මෙසේ සුළු කාලයක් තුළ එක් කර්මාන්තකරුවෙකුට කොලෝසස් කර්මාන්තශාලවේ කර්මාන්තකරුට තඹ සහ පිත්තල මේ ආකාරයට නිකුත් කරාම අනිකුත් කර්මාන්තකරුවන්ට මේකෙන් අසාධාරණයක් සිද්ධ වෙනවනේද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: ඇයි අසාධාරණයක් සිද්ධ වෙන්නේ නැත්තේ. මේක බෙදෙන්නේ අසමතුලිතවනේ?

උ: මා දන්නා පරිදි ස්වාමීනි සම්පූර්ණ සුළු, මධ්‍යම සහ කුඩා කර්මාන්තකරුවන් 350 ක් පමණ අප ආයතනයේ ඒ කාලේ ලියාපදිංචිව වෙලා තිබුණා. එයින් 179 ක් පමණ තමයි පිත්තල සඳහා. මේ 179යම ස්වාමීනි ඒ දිස්ත්‍රික්ක විශේෂයෙන් 02 යි. මුලින් නුවර සහ ගම්පහ. ඒ ඒ ප්‍රාදේශීය කාර්යාල වලින් ඔවුන්ගේ කෝවර් ධාරිතාව අනුව නිර්දේශ කර එවන අගයන් අපි අනිවාර්යෙන් දීලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට එවකට මේ අබලි ලෝහ කළමනාකරණ ඒකකයේ රාජකාරී ඔබ භාරදීලා තිබුණු දැක්වැල්ල මහතා ඔබට දැනුම්දුන්න ද මේ එක් කර්මාන්තකරුවෙකුට පමණක් මේ ආකාරයෙන් විශාල වශයෙන් පිත්තල සහ තඹ ලබාදීමෙන් අනෙකුත් කර්මාන්තකරුවන්ට මෙයින් අසාධාරණයක් සිදුවෙනවයි කියන දේ ගැන ඔබට මේ දික්වැල්ල මහත්මයා දැනුම්දුන්න ද, මේ ගැන සාකච්ඡා කෙරුවද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: දැන් දික්වැල්ල මහත්මයා මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබාදීලා ප්‍රකාශ කරලා තිබෙනවා නම් මේ බව ඔබට දැනුම් දුන්නා. ඔබේ අනුමැතිය මත තමයි මේ ආකාරයට මේ කොලෝසස් පුද්ගලික සමාගමට විශාල වශයෙන් තඹ, පිත්තල ලබාදුන්නෙ කියලා කියලා තියෙනව නම් මොකද්ද ඔබට ඒ ගැන කියන්න තියෙන්නේ?

උ: මම එය පිළිගන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට මේ ලේඛන අනුව අනිවාර්යෙන්ම පිළිගන්නව ද ඔබ අධික ප්‍රමාණ වලින් තඹ පිත්තල එක සමාගමකට කෙටි කාලයක් තුළ ලබාදීලා තියෙනවයි කියලා?

උ: මගේ නිලධාරීන් විසින් එවකට සිටි නිලධාරීන් විසින් අනුමත කරන ලද ප්‍රමාණයට අඩුවෙන් නිකුත් කළ බව පිළිගන්නවා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: මොකද්ද ඔබ අදහස් කරන්නේ අනුමත කරලා තියන දැන් මේ ඔබට පෙන්නපු ලද ලේඛන අනුව නිලධාරීන් ඔබට කියලා නැහැනේ නිලධාරීන්ගේ තීරණයක් නෙවෙයිනේ ඔබ්බේ අනුමැතිය ලබාදීලා තිබෙන්නේ ඉල්ලලා තියෙන ප්‍රමාණයම ලබාදෙන්නයි කියලා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව ඔබ පිළිගන්නව ද ඔබේ අනුමැතියට යටත්ව තමයි ඒ අනුමැතිය මත තමයි මේ නිකුත් කිරීම සිදු කරලා තිබෙන්නේ කියලා?

උ: එසේය ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිරු ඔබ කියන හැටියට මේ ලිපි වලින් කරලා තියෙන්නේ ඔබගේ පහළ නිලධාරීන් විසින් අනුමත කරන ලද ප්‍රමාණය ඇතුළත කොලෝසස් පුද්ගලික සමාගමට මේ ද්‍රව්‍යය සැපයීම නම් දැනටමත් ඔබේ අදාළ නිලධාරීන් ඒ ප්‍රමාණය අනුමත කරලා තියෙනවා නම් ඇයි සභාපතිවරයාගේ විශේෂ අවසරයක් ගන්න ඕන?

උ: ස්වාමීනි මේ මුලින් සඳහන් කර පරිදි ස්වාමීනි මෙම ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් ලබාගන්නා පිත්තල කොපු සඳහා අපි නිතර ඒ කමිටුවක් රැස් වෙලා ඒ කරන සෑම ගනුදෙනුවක්ම හොඳින් අධීක්ෂණය කරනවා. ඒ සෑම දෙයක්ම අපිට දන්වලා කරන්න කියලා තියෙනවා. අපිට උපදෙස් දීලා තිබෙනවා ස්වාමීනි. ඒ නිසා ඔය සෑම ගනුදෙනුවක්ම මා වෙත යොමු කරනවා.

ප්‍ර: උගත් ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරිවය ඔබගෙන් අහපු ප්‍රශ්නයට ඔබ උත්තරය දුන්නේ මේ කොලෝසස් පුද්ගලික සමාගමට ඔබ විසින් අනුමත කරලා තියෙන්නේ ඔබගේ පහළ නිලධාරීන් විසින් ඔවුන්ට මේ වර්ෂය තුළ දීමට අනුමත කරපු සම්පූර්ණ ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් කියලා ඒක නේද ඔබ ඉස්සෙල්ලා කිව්වේ?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඉතිං ඔබගේ පහත නිලධාරීන් වසරක් තුළදී දී මේ සමාගමට දිමට අනුමත කරලා තියෙන ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කොලොසස් පුද්ගලික සමාගමට ලබාදෙනව නම් ඒකට ඔබේ විශේෂ අවසරයක් මොකටද?

උ: නැවත සැරයක් මම කියන්නේ ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් මේ ලැබනෙ දේ අපිට මං හිතන්නේ ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉතිහාසයේ පළමු වරට සහ අවසාන වරට ලැබෙන භාණ්ඩ තොගයක් ඒ සඳහා අපි විශේෂ අවධානයක් යොමු කරන්න තිබුණා විවිධ කාරණා පැති සඳහා මෙම තොගය පිළිබඳ පමණයි අපි මේ විදියට ක්‍රියාවලියක් අනුගමනය කරේ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නමුත් ඔබ කිව්වා මේ තොගයට මේ තොගයටත් ඔබගේ ප්‍රාදේශීය කාර්යාලවලින් එක් එක් සැපයුම්කරුවන්ට දිය හැකි උපරිම ප්‍රමාණයක් අනුමත කරලා තියෙන්නේ කියලා හරිද එක?

උ: හරි ස්වාමිනි.

ප්‍ර: කොලොසස් පුද්ගලික සමාගමටත් ඒක වලංගුවෙනවානේ ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට කොලෝසස් පුද්ගලික සමාගමට අවුරුද්දට දිය හැකි උපරිම ප්‍රමාණය ඔබගේ ප්‍රාදේශීය කාර්යාලවලින් අනුමත කරලා තියෙනවද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඉතින් ඒ වසර තුළ කොලෝසස් පුද්ගලික සමාගමට දෙන ප්‍රමාණය මොකක් හෝ තඹ හෝ පිත්තල හෝ වේවා ප්‍රාදේශීය කාර්යාලයෙන් අනුමත කරපු ප්‍රමාණයට වඩා අඩුනම් ඇයි ඔබේ විශේෂ අවසරයක්?

උ: ස්වාමිනි දැන් මහනුවර හෝ නැත්නම් ගම්පහ ප්‍රදේශවල බෙදාහැරීමට ගෙනියන්න ඉතා විශාල තොගයක් ඒ පැත්තේ සම්පූර්ණ කර්මාන්තකරුවන්ගේ එකතුව සඳහා මේ අනිවාර්යෙන්ම මේ මගෙන් හෝ නැත්නම් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අවසර ගන්න ඕනේ.

ප්‍ර: ඔබ දුන්නු උත්තරයක් තමා මං මේ පැහැදිලි කර ගැනීමක් හදන්නේ. ඔබ කිව්වා ඔබගේ ප්‍රාදේශීය කාර්යාලවලින් ලැබෙන තොරතුරු අනුව එක් එක් සැපයුම්කරුවන්ට අවුරුද්දට දිය හැකි උපරිම ප්‍රමාණය අනුමත කරලා ඉවරයි කියලා? ඔව් ද නැද්ද?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: එතකොට කොලෝසස් පුද්ගලික සමාගමටත් අවුරුද්දක් තුළ දිය හැකි තඹ , පිත්තල, යකඩ ඔක්කෝම උපරිම ප්‍රමාණය අනුමත කරලා තියෙනවා ද නැද්ද?

උ: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඔබ කියන්නේ මේ ඔබට පෙන්නපු ලිපි 10 නුත් කොලොස් පුද්ගලික සමාගමට ලබා දුන් ලේඛන මේ ද්‍රව්‍ය ඒ අවුරුද්දට අනුමත කරපු සීමාව ඇතුළත තියෙන්නේ කියලා?

උ: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඉතිං එහෙම අනුමත කරපු උපරිම සීමා ඇතුළත තියෙනවා නම් ඇයි ඔබේ විශේෂ අවසරයක් ඕනේ?

උ: මේ වටිනාකම වැඩි නිසා ඔවුන් මා වෙත යොමු කර මගේ . approval එක ගන්න ඇති ස්වාමීනි.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු දැන් ඔයයුධ හමුදාවෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් දෙන්නේ වෙඩි උණ්ඩ මෝටාර් වගේ උණ්ඩවල කොපු නේද ?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ: එහෙමයි ස්වාමිනි

ප්‍ර: ඒවා දෙන කොට විශේෂ ආරක්ෂාවක් ඇතුව දෙන්න ඕන නිසා සමාගම් වලට කොහේ හරි සඳහන් වෙලා තියෙනවද සභාපතිතුමාගේ අනුමැතිය අවසාන වශයෙන් අවශ්‍යයි කියලා?

උ: නැත ස්වාමිනි.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>**

ප්‍ර: දැන් මේ එකම කර්මාන්තකරුවෙකුට කොලෝසස් පුද්ගලික සමාගමට මේ ආකාරයෙන් තඹ සහ පිත්තල විශාල ප්‍රමාණයක් ලබා දෙන්න මොකක් හරි විශේෂ හේතුවක් නැත්නම් කාගේ හරි බලපෑමක් තිබුණද?

උ: නැත ස්වාමිනි

ප්‍ර: නැත්නම් කාගේ හරි මේ සම්බන්ධයෙන් එලෙස ක්‍රියාකරන්න කියලා ඔබට නියෝගයක් දැනුම්දීමක් සිදු කරලා තිබ්බ ද?

උ: නැත ස්වාමිනි.

ප්‍ර: ඇයි එහෙම නම් ඔබ මේ අකාරය ක්‍රියාකළේ, ඒ කියන්නේ එක පුද්ගලයෙකුට කෙටි කාලයක් තුළ තඹ සහ පිත්තල විශාල ප්‍රමාණයක් ලබා දෙන්න අනුමැතිය ලබා දුන්නේ ඇයි?

උ: සැපයුම ඉල්ලුම අනුව ඒ තීරණය අරන් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඉල්ලුම් කරපු තවත් කර්මන්තකරුවන් ඒ අවස්ථාවේදී හිටියානේ මහත්මයා තඹ සහ පිත්තල ඉල්ලුම් කරුවන්?

උ: එසේය ස්වාමිනි

ප්‍ර: දැන් එතකොට එක පුද්ගලයෙක්ට වැඩි ප්‍රමාණයක් දුන්නාම අනෙකුත් කර්මාන්තකරුවන් අතර එම ද්‍රව්‍යම තඹ සහ පිත්තල ඉල්ලා සිටින අයට ඒක ලබා ගැනීමේ හැකියාවක් නැතිව යනවනේ අසමතුලිතාවයක් මත බෙදුවාම?

උ: නැත ස්වාමිනි

ප්‍ර: ඇයි නැත්තේ?

උ: ඔවුන් ඔවුන්ගේ ධාරිතාවය අනුව සලකා බැලුවාම එහෙම අසමතුලිතතාවයක් වෙන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: දැන් මේ ධාරිතාව සලකලා බලලා තමයි කුඩා මධ්‍යම සහ සුළු පරිමාණ කර්මාන්තකරුවන් වර්ගීකරණය කිරීමක් සිදු කර තිබෙන්නේ මේ මාර්ගඋපදේශකයේ?

උ: එසේය ස්වාමිනි

ප්‍ර: දැන් කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් කල යුතුව තිබුණේ ඒ කුඩා සහ සුළු මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට ඔවුන්ට අතහිතදීමක් විදියට ඔවුන්ටත් සහනදායි මිලට මේ ද්‍රව්‍ය සමතුලිතව බෙදාදීම කළයුතුව තිබුණයි කියලා මම ඔබට යෝජනා කරනවා?

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: එසේ බෙදා තිබුණා ස්වාමිනි.

ප්‍ර: එතකොට එක පුද්ගලෙයකුට වැඩි ප්‍රමාණයක් ලබා දුන්නාම අනිත් අයට ඒක සමානව ඒ අකාරයට බෙදී යන්නේ නැහැනේ. ඔවුන්ගේ ඉල්ලුමට අවශ්‍ය සපුරාලීමක් කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් සිද්ධවෙන්නේ නැහැනේ?

උ: මේ සියල්ල අපි කමිටුවක් මගින් සාකච්ඡා කරනවා ස්වාමිනි.යුධ හමුදාවෙන් අපිට ලැබෙන්නේ ඉතාම විශාල ප්‍රමාණයක්. නුවරට අවශ්‍ය වෙන්නේ මට හිහෙතන විදියට ටොන් 1.9 යි. ඒ කියෙන්නේ කිලෝග්‍රෑම් 1900 යි. මෙතන කිලෝ ග්‍රෑම් 7 ලක්ෂයක් තියෙනවා. මේ ලක්ෂ 07 , එක්දහස් නවසිය ගානේ කොතෙක් කල් බෙදා හරින්නද ස්වාමිනි. යුධ හමුදාවෙන් අපිට පවසලා තියෙනවා මේවා ඉතාමත් ඉක්මනින් ඉවත් කරගන්න කියලා ස්වාමිනි. සමහර විට අවුරුදු 10 ක් විතර යන්න තිබුණා එසේ නම් ඊටත් වඩා යන්න තිබුණා ස්වාමිනි

ප්‍ර: දැන් ඔය කියපු කමිටු තීරණයක් මොනවා හරි ඒකට ඔබ ලිඛිතව මේ අවස්ථාවේ දි ඉදිරිපත් කරනවා ඒ ලේඛන

උ: මම වගකීමෙන් මට මතකයි මිල කමිටුවක් විකිණෙන්ඩ ඕන මේ අධ්‍යනය කරන්න යන්න කමිටු ඒවා පත්කරලා තියෙනවා කියලා මට මතකයි ස්වාමිනි.

ප්‍ර: දැන් සභාපති විදියට ඔබට ඉහලින් හිටිය නිලධාරින් කවුද දැන් කවුද ඔබ සභාපති ඔබට ඉහලින් හිටපු නිලධාරින් කවුද?

උ: නියෝජ්‍ය ලේකම්වරු,අමාත්‍යාංශයේ ලේකම්තුමා, නියෝජ්‍ය ඇමතිතුමා, ඇමතිතුමා.

ප්‍ර: ඒ අයගේ කාගෙන් හරි බලපෑමක් දැනුම්දීමක් තිබුණද මේ ආකරයට මේ කොලෝසස් පුද්ගලික සමාගමට මේ එකම පුද්ගලයෙක්ට මේ ආකාරයට භාණ්ඩ බෙදාහැරි සම්බන්ධව ?

උ: නැත ස්වාමිනි.

වේලාව: ප.ව.07.50
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

Presidential Secretariat Copy
FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.7.50
පෙර සටහන් ල/ලේ: සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය**

ප්‍ර: දැනටමත් C- 764 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටී. මෙම ලේඛනය 2017, 2018 සහ 2019 වර්ෂවල දී කොලෝසස් පුද්ගලික සමාගමට සහ අනිකුත් කර්මාන්තකරුවන්ට ලබාදී ඇති අබලි ලෝහ ප්‍රමාණයන් සහ ඒවායේ ප්‍රතිශතය සම්බන්ධයෙන් සකස් කරන ලද ලේඛනයක්. දැන් මහත්මයා ඔබට මෙම ලේඛනය කාර්මික සංවර්ධන මණ්ඩලයේ වර්තමාන අලෙවි අධ්‍යක්ෂක විසින් ඉදිරිපත් කරන ලද ලේඛනයක් ඒ වශයෙන් දැනටමත් ලකුණු කර ඉදිරිපත් කර තිබෙනවා. දැන් මේ ලේඛනයේ තිබෙන දත්ත අනුව කොලෝසස් පුද්ගලික සමාගමට 2017 වර්ෂයේ කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් නිකුත් කර ඇති අබලි ලෝහ වලින් කුමන ප්‍රතිශතයක් ලබාදීලා තිබෙනවද?

පි: එකතුවක් නේද 19.1%ක් ස්වාමිනි.

ප්‍ර: 2018 වර්ෂයේ කොලෝසස් පුද්ගලික සමාගමට මුළු අබලි නිකුත් කර ඇති අබල් ලෝහ ප්‍රමාණයෙන් කොපමණ ප්‍රමාණයක් ලබාදීලා තියෙනවද?

පි: 34.31%

ප්‍ර: 2019 වර්ෂයේ?

පි: 12.39% ස්වාමිනි. 2019 මම හිතන්නේ මාස කිහිපයක් ස්වාමිනි.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මාස කිහිපයක් කියලා ඔබ අදහස් කරේ කුමක්ද?

පි: බොහෝ විට මාර්තු මාසේ වෙනකම් විය හැකියි ස්වාමීනි.

ප්‍ර: දැන් මේ ඒ කියන්නේ 2019 අප්‍රේල් 21 බෝම්බ පිපිරීම සිද්ධ වෙන්න කළින් ලබා දුන්නු ප්‍රමාණය කියලා ඔබ සඳහන් කරා?

පි: අනිවාර්යෙන් එසේ විය යුතුයි ස්වාමීනි.

ප්‍ර: මේ කොලෝසස් පුද්ගලික සමාගමට මේ 30%කට ප්‍රතිශතයකට වැඩි ප්‍රමාණයක් අබලි ලෝහ ලබා දීම සම්බන්ධයෙන් මීට පෙර අහන්තර විගණක විසිනුත් සිදු කරන ලද පරීක්ෂණයේදී අනාවරණය වී තිබෙනවා කියලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

පි: මට හරියටම මතක නැහැ ස්වාමීනි ඒ සම්බන්ධව.

ප්‍ර: දැනටමත් C- 762 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටි. මෙම ලේඛනය අභ්‍යන්තර විගණක ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි වෙත කොලොසියස් පුද්ගලික සමාගමට පිත්තල නිකුත් කිරීම පැහැදිලි කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද විගණක විමසුමක්. මේ ලේඛනය ඔබ හඳුන ගන්නවද?

පි: මේ ලිපිය මට ලැබෙන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: පසුව හරි ඔබට දක්නට ලැබුණද?

පි: මම පළවෙනි වරට මේ දකින්නේ ස්වාමීනි.

ප්‍ර: දැන් එම ලේඛනය කාර්මික සංවර්ධන මණ්ඩලයේ විගණක විසින් ඉදිරිපත් කරන ලද ලේඛනයක් කියලා ඔබ පිළිගන්වද?

පි: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: දැන් මෙම ලේඛනයේ විගණක පරීක්ෂණයක් පවත්වා ප්‍රශ්න විමසීමක් සිදු කර තිබෙන කාරණා අතර එක් කාරණයක් තමයි 2017.08.01 සිට 2018.04.28 දක්වා කාලය තුළ පිත්තල ammunition cups කියලා තිබෙනවා. brass කියලා. වරහන් තුල ඉංග්‍රීසියෙන් සටහන් කරලා කර්මාන්තකරුවෝ 129 දෙනෙකු අතර බෙදා දීමට තිබුණා. එම තොගයෙන් 30%ක ප්‍රමාණයක් කොලොසියස් පුද්ගලික සමාගටම නිකුත් කර ඇති අතර නිරීක්ෂණය වන බවටත් එම කර්මාන්තකරු සඳහා පමණක් වැඩි තොග ප්‍රමාණයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා තිබෙනවාද? සාක්ෂිකරුගේ අවධානය අංක 2 කෙරෙහි යොමු කරනවා.

පි: පැහැදිලියි ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව අභ්‍යන්තර විගණකයේදීත් නිරීක්ණය වෙලා තියෙනවා මේ කර්මාන්තකරුට කෙටි කාලයක් තුල 30%ක් වැඩි ප්‍රමාණයක් නිකුත් කර ඇති බවට. ඒ අනුව ඒක ඔබ පිළිගන්නවද?

පි: මේකේ කෙටි කාලයක් කියලා නැහැ. මේ කාලය තුළ කියලා තියෙනවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හරි ඔබ දක්වන කාලය නැවත කියන්න.

පි: 2017 අගෝස්තු 01 වෙනිදා සිට 2018 අප්‍රේල් 28 දක්වා.

ප්‍ර: දැන් මේ විගණක විමසුමට ඔබ විසින් පත් කළ නියෝජ්‍ය අලෙවි අධ්‍යක්ෂක විසින් පිළිතුරු සපයලා තියෙනවද? මේ අවස්ථාවේ දී සාක්ෂිකරුට දැනටමත් C- 763 වශයෙන් ලකුණු කර ඇති ලේඛනය පෙන්වා සිටී. එම විගණක විමසුමට අදාළව නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි DPP දික්වැල්ල මහතා විසින් ඉදිරිපත් කර ඇති පිළිතුරු ලිපිය. දැන් ඒ අංක 2 ප්‍රශ්නයට උත්තරය විදිහට ඔබ විසින් පත්කරපු නියෝජ්‍ය අධ්‍යක්ෂක මොනවද දීලා තියෙන පිළිතුරු ?

පි: සභාපතිතුමාගේ දැනුම් දීම හා නිර්දේශ මත එම පිත්තල ප්‍රමාණය නිකුත් කරලා තියෙනවා. මාස 9කට ආසන්න කාලයක් සඳහා මෙම ප්‍රමාණය නිකුත් කර ඇත.

ප්‍ර: දැන් ඒ අනුව ඔබ පිළිගන්නවද සභාපතිතුමා කියලා කියන්නේ මේ කාල වකවානුවේදී සභාපති විදිහට හිටියේ කවුද?

පි: මම ස්වාමීනි

ප්‍ර: ඒ අනුව මේ ඔබේ අනුමැතිය මතයි ඒ අදාළ ප්‍රමාණය තඹ පිත්තල ලබාදීලා තියෙන්නේ කියලා සටහන් කරලා තිබෙනවද?

පි: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ බව ඔබ පිළිගන්නවද?

පි: පිළිගන්නවා.

ප්‍ර: දැන් සාක්ෂිකරුගේ අවධානය C- 762 ලේඛනයේ අංක 3 කෙරෙහි යොමු කරනවා. දැන් මහත්මයා මේ අංක 3 මොකක්ද මේ අභ්‍යන්තර විගණක විමසා සිටින්නේ ?

පි: 24.1.18, 22.2.18 යන දිනයන් වලින් මසකට අඩු කාලයක් තුල 25000kg ක් සහ 25000ක් මාසික අමුද්‍රව්‍ය සීමාවන් ඉක්මවා එකම කර්මාන්තකරුවෙකුට පිත්තල නිකුත් කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම.

ප්‍ර: දැන් නැවත ඒ විගණක විමසුමට නියෝජ්‍ය අධ්‍යක්ෂක අලෙවි විසින් ලබා දී ඇති පිළිතුරු ලිපිය C- 763 සාක්ෂිකරුට පෙන්වා සිටී. එහි අංක 3 ට පිළිතුරු වශයෙන් කුමක්ද ලබාදීලා තියෙන්නේ ?

පි: අදාළ කර්මාන්ත ස්ථානය කමිටුව විසින් නිරීක්ෂණය කිරීමේ දී පිත්තල නිෂ්පාදන කිරීමේ ධාරිතාවය. තඹ මම මේක කියවන්න ද ස්වාමීනි

ප්‍ර: කියවන්න. අංක 3 විතරයි අහන්නේ

පි: තඹ නිෂ්පාදන කිරීමේ ධාරිතාව සමාන ලෙස නිරීක්ෂණය වුවත් කර්මාන්තකරු විසින් අයදුම්පත්‍රයේ සඳහන් කර තිබූ මසකට පිත්තල 15000ක් පමණ නිර්දේශ කරන ලදී. එහෙත් කර්මාන්තකරු

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සභාපතිතුමා විසින් කරන ලද ඉල්ලීමට අනුමැතිය ඇතිව ප්‍රමාණය ලබාදී ඇත කියලා ලියලා තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ පිළිතුරු ලිපියේ සටහන් වී තිබෙනවා අයඳුම් පත්‍රයේ සඳහන් කරලා තිබිච්ච කර්මාන්තකරු අයඳුම්පත්‍රයේ සඳහන් කර තිබූ මසකට 15000kg ක් පමණක් නිර්දේශ කරා. ඒත් කර්මාන්තකරු සභාපතිතුමාගෙන් කරන ලද ඉල්ලීම් වලට අනුමැතිය සහිතව මෙම ප්‍රමාණය ලබා දුන්නයි කියලා. එවකට සභාපති වශයෙන් කටයුතු කළේ කවුද?

පි: මම ස්වාමීනි

ප්‍ර: ඒ කියන්නේ ඔබේ අනුමැතිය මතයි මේ වැඩිදුර ප්‍රමාණය ලබාදුන්නේ කියලා සටහන් වෙලා තිබෙනවා ඔබ ඒක පිළිගන්නවද?

පි: සටහන් වෙලා තිබෙන බව පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: සටහන් වීම පමණක් නෙවෙයි ලබා දුන්නයි කියලා ඔබ පිළිගන්නවද?

පි: මට පිළිගන්න බැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් අර DPP කියලා ලේඛන වගයක් ඔබට පෙන්නුවානේ?

පි: ඒ පරීක්ෂා කර බලා මට පිළිගන්න සිදු වෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් මොකක්ද මහත්මයාට ඕනි පරීක්ෂා කර බලන්න ලේඛන?

පි: 2017 වර්ෂයේ එම ආයතනයට නිර්දේශ කරන ලද ගණන 2018ට එම ආයතනයට නිර්දේශ කරන ලද ගණන බලන්න ඕනි application 2

සාක්ෂිකරු මේ අවස්ථාවේදී ඉල්ලා සිටින කොලෝසස් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කර ඇති 2017 වර්ෂයේ අයඳුම්පත C- 758 සහ 2018 වර්ෂයට අදාළ අයඳුම්පත්‍රය C- 760 සාක්ෂිකරුට පෙන්වා සිටී.

පි: මෙම 2018 වර්ෂයේ මෙම අයඳුම්කරුට මසකට මෙට්‍රික් ටොන් 100ක් දීමට නිර්දේශ කරලා තියෙනවා. මෙයින් දී තිබෙන්නේ 25 ගානේ නෙවෙයි 50ක් පමණයි. මම එහි වරදක් දකින්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: කොහෙද 50ක් දීලා තියෙන්නේ ?

පි: කර්මාන්තකරු වෙත 24.1 දින 25000kgක්ද

ප්‍ර: 3 වන ප්‍රශ්නය කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්නේ 3 ප්‍රශ්නයට

පි: 24.1.18 දින පිත්තල 25000kg ක්ද 28.2.22 දෙදින 25000kg ක් ද ලබාදී තිබුණි. 25 යි 25යි කියන්නේ 50000යි. මෙතන මෙට්‍රික් ටොන් 100ක් කියන්නේ 100000kg යි.

ප්‍ර: මෙතන කියලා මොකක්ද ඔබ පෙන්වන්නේ ලේඛනය?

පි: මේ අයඳුම්පත ස්වාමීනි.

ප්‍ර: ඔබ සඳහන් කරන්නේ C- 760 කියන ලේඛනයේ කර්මාන්තකරු තමන්ගේ ධාරිතාව වශයෙන් ඉදිරිපත් කරලා තිබෙන මේ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 100 කියලා ඔබ සඳහන් කරන්නේ ඔබ එම ප්‍රමාණය?

FAIR COMMENT BY JEZEEM

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: දැන් කර්මාන්තකරු දැන් කෙසේ සටහන් කරත් පරීක්ෂා කරලා බලලා නිලධාරීන් විසින් නේද තීරණය කරන්නේ කොච්චර ප්‍රමාණයක් ද නිර්දේශ කරන්නේ කියලා?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: කොපමණ ප්‍රමාණයක් ද නිර්දේශ කර තිබෙන්නේ ?

පි: මම දන්නා පරිදි ස්වාමීනි මේ සඳහා කමිටුවක් පත් කර ඉංජිනේරුවරුන් ITI Industrial Technological තාක්ෂණික ITI කියන ආයතනයේ ඉංජිනේරුවරයෙකු අප කර්මාන්ත වාත්තු අංශයේ අමාත්‍යාංශයේ ඉංජිනේරුවරුන්ගෙන් සමන්විත කණ්ඩායමක් ගිහිල්ලා පරීක්ෂා කරලා බලලා නිර්දේශ කරලා තියෙනවා ඒ ප්‍රමාණය දෙන්න ස්වාමිනි.

ප්‍ර: දැන් නැවතත් ඔබෙන් අහන්නේ ඔබ කියන්නේ C- 760 කියන ලේඛනය අනුව මසකට පිත්තල දැන් මේ 2018 වර්ෂයේ අයදුම්ත්‍රය අනුව පිත්තල කොපමණ ප්‍රමාණයක් නිර්දේශ කර තිබුණේ නිකුත් කරන්න?

පි: මෙට්‍රික් ටොන් 100ක් නොහොත් 100000kgක් ස්වාමීනි.

ප්‍ර: දැන් මේ අභ්‍යන්ත විගණකගේ ප්‍රශ්නය වෙන්නේ ඔබ කිව්ව විදිහටම කර්මාන්ත ස්ථානයේ මේ කමිටුවක් ගිහිල්ලා නිරීක්ෂණය කරලා තියෙනවා?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: නිරීක්ෂණය කරලා පිත්තල නිෂ්පාදනය කිරීමේ ධාරිතාවය තඹ නිෂ්පාදනය කිරීමේ ධාරිතාවට සමාන ලෙස නිරීක්ෂණය වුවත් පිත්තල නිකුත් කිරීමේ ධාරිතාවය තඹ නිෂ්පාදනය කිරීමේ ධාරිතාවයට සමාන ලෙස නිරීක්ෂණය වුණත් පිත්තල නිකුත් කිරීමේ ධාරිතාවය තඹ නිෂ්පාදන කිරීමේ ධාරිතාවයට සමාන ලෙස නිරීක්ෂණය වුණත් කර්මාන්තකරු විසින් අයදුම්පත්‍රයේ සඳහන් කිරීමේ ධාරිතාවට සමාන ලෙස නිරීක්ෂණය වුවත් කර්මාන්තකරු විසින් අයදුම්පත්‍රයේ සඳහන් කර තිබූ මසකට පිත්තල 15000kgක් පමණක් නිර්දේශ කරලා තිබෙනවා. නමුත් කර්මාන්තකරු සභාපතිතුමාගෙන් කරන ලද ඉල්ලීමවලට අනුමැතියට යටත්ව තමයි මේ 25000kgක ප්‍රමාණයක් ලබා දීලා තිබෙන්නේ . ඒ කියන්නේ නිර්දේශිත මාසික අමුද්‍රව්‍ය ප්‍රමාණය ඉක්මවා ලබාදීලා තියෙන්නේ. ඒ ගැන ඔබට මොකක්ද කියන්න තියෙන්නේ ?

පි: එහෙම නිර්දේශයක් මම දැකලා නැහැ ස්වාමීනි.

ප්‍ර: කොහොම නිර්දේශයක් ද දැකලා නැත්තේ?

පි: ඔය කිව්ව කමිටුවක් විසින් ගිහිල්ලා බලලා ඉවර වෙලා සම නිෂ්පාදන සමාගම 15000kgක් දෙන්න කියලා නිර්දේශයක් කරලා තියෙනවා කියලා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මම සඳහන් කරන්නේ මේ අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරලා තියෙන ලේඛනය මත මහත්මයා ඒක පිළිගන්නවද? පිළිගන්නේ නැත්නම් ඒක කියන්න

පි: පිළිගන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: එසේම මේ තවත් ප්‍රශ්නයක් අහලා තියෙනවා C- 762 අනුව කර්මාන්තකරුවන් සඳහා අබලි නිකුත් කිරීම ලැයිස්තුගත කරන අනුපිළිවෙළට සිදු කරන බවට සටහන් වෙන නමුත් 2017 අගෝස්තු මස අලෙවි අංශයේ ලියාපදිංචි කර ඇති ඉහත කොලෝසස් පුද්ගලික සමාගමට කෙටි කාලයක් තුළ අනිකුත් කර්මාන්තකරුවන් අභිබවා පිත්තල නිකුත් කිරීමේ ක්‍රමවේදය කුමක්ද කියලා ප්‍රශ්නයක් අහලා තියෙනවා විගණක විමසුමෙන්? ඔබ විසින් පත් කළ නියෝජ්‍ය අධ්‍යක්ෂ අලෙවි DPP දික්වැල්ල මහත්මයා විසින් සඳහන් කර තිබෙන්නේ ව්‍යාපෘතිය ඒ කොලොසියස් ආයතනයට සභාපතිතුමාගේ දැනුම් දීම හා අනුමැතිය අනුව තමයි නැවතත් ඒ අමුද්‍රව්‍ය ලබාදීලා තියෙන්නේ කියලා. ඒ ගැන ඔබ මොකද කියන්නේ ?

පි: ස්වාමීනි සමහර විට සඳහන් කරනවා ඇත්තේ අර ඉහත සඳහන් ලිපි වල ලබා ගත්ත අනුමැතිය.

ප්‍ර: ඒ කියන්නේ ඔබ අනුමැතිය ලබා දුන්න නිසා තමයි ඒ අනුව පිත්තල නිකුත් කර තිබෙන්නේ කියන එක ඔබ පිළි ගන්නවද?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ දන්නවද මේ අභ්‍යන්තර විගණක විසින් මේ විගණක පරීක්ෂණයට අමතරව කොලෝසස් පුද්ගලික ආයතනයට ගිහිල්ලා ක්ෂේත්‍ර පරීක්ෂණයක් කරලා වැඩි දුරටත් විගණක කටයුතු සිදු කර ඇති බවට ඔබේ සේවා කාලය තුල දී සිදු කරන ලද්දක්?

පි: මම දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැනටමත් C- 779 (A) වශයෙන් ලකුණු කර ඇති 2018.07.05 වන දින විගණක ස්ථාන පරීක්ෂණ වාර්තාවක් සාක්ෂිකරුට පෙන්වා සිටී. මහත්මයා මෙම ලේඛනය පරීක්ෂා කරලා බලන්න. මෙම ඔබ කියෙව්වද අදාළ ලේඛනය?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: දැන් එහි නිර්දේශ recommendations කියලා අන්තිමට වාක්‍යයක් තියෙනවා නේද?

පි: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: මොකක් ද එහි සටහන් වෙලා තියෙන්නේ ?

පි: මෙම අබලි ද්‍රව්‍ය විකිණීම් ක්‍රියාවලියේ දී bullet cups (සාක්ෂිකරු ලේඛනය ඉංග්‍රීසි බසින් කියවයි)

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මේ අභ්‍යන්තර විගණක ස්ථාන පරීක්ෂණ වාර්තාවෙනුත් එක කර්මාන්තකරුවෙක් වෙනුවෙන් මේ කොලොසියස් පුද්ගලික සමාගමට එම වසරේ මුළු අබලි ලෝහ බෙදා හැරීමේ ප්‍රමාණයෙන් 30%ක ප්‍රමාණයක් එක පුද්ගලයෙක්ට ලබදීම සම්බන්ධයෙන් මේකේ සටහන් වෙලා තිබෙනවා නේද?

පි: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: මොකක්ද ඒ ගැන නිරීක්ෂණය කරලා තියෙන්නේ ?

පි: මෙම බෙදා හැරීමේදී diverse industries ගැන හිතන්න කියලා තියෙනවා. ඒ කියන්නේ විවිධ කර්මාන්තකරුවන් විමසා බලන්න කියලා තියෙනවා. ඒ අනුව බෙදන්න කියලා තියෙනවා. ඒ අනුව බලනකොට register වෙලා ඉන්න කට්ටිය අතරින් මෙයාට 30%ක් දීලා ධාරිතාව අනුව දීලා තියෙනවා. ඉතින් හැබැයි

ප්‍ර: ඒ දුන්නම මොකක්ද වෙනවා කියලා දීලා තියෙන්නේ ?

පි: සමහර විට ආයතනයේ කිර්තී නාමයට කැළැළක් වෙන්න පුළුවන් කියලා හිතනවා මොකද මෙතන මුලින් මුලින් දූෂිත ගොඩක් හිටිය නිසා වෙන්න ඇති.

ප්‍ර: මම ඔබට යෝජනා කරනවා එහි නිරීක්ෂණ වලින් ගම්‍ය වෙන්නේ එක් කර්මාන්තකරුවෙකුට කොලොසස් පුද්ගලික සමාගමට මුළු ධාරිතාවෙන් 30%ක් ප්‍රමාණයක් ලබා දුන්නම ඒ අවස්ථාවේ මේ සුළු කාලීනව මුදල් ලබා ගැනීම පමණක් ගැන හිතලා එයින් ඒ ආකාරයට ක්‍රියාකරාම එයින් අනිකුත් කර්මාන්තකරුවන්ට අසාධාරණයක් සිදු වෙන අතර එය කාර්මික සංවර්ධන මණ්ඩලයේ කීර්ති නාමයට එකේ පැවැත්මට අහිතකර බලපෑමක් සිද්ධ වෙනවා කියලා නිරීක්ෂණය කරලා තියෙනවා. ඒක පිළිගන්නවද මේ වාර්තාව අනුව?

පි: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: දැන් මේ අනිකුත් කර්මාන්තකරුවන්ගෙන් විරෝධතාවයක් ආවද මේ එක කර්මාන්තකරුවෙකුට මෙසේ ලබාදීම සම්බන්ධයෙන්?

පි: මා දන්නා තරමින් නැත ස්වාමීනි.

ප්‍ර: දැන් මේ කිරිබත්ගොඩ ප්‍රදේශයේ පිත්තල කර්මාන්තකරුවන් කිහිප දෙනෙක් මේ අමාත්‍යාංශයට ගිහිල්ලා මේ ඔබේ ස්ථානයේ මේ ආකාරයට විරුද්ධත්වයක් පළ කරලා තිබ්බායි කියලා මම කිව්වොත් ඔබ ඒක පිළිගන්නවද?

පි: මම දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: කර්මාන්තකරුවන් වාණිජ කර්මාන්ත අමාත්‍යාංශයට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් පැමිණිලි කරලා කර්මාන්තකරුවන් සමඟ සාකච්ඡාමය සම්බන්ධයෙන් පැවැත්වුවා යැයි කියන දේ මහත්මයා මම කිව්වොත් පිළිගන්නවද?

පි: මමත් ඒ සාකච්ඡාවට සම්බන්ධ වෙලා තියෙනවා කියන එකද

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: පවත්වලා තියෙනවා කියන එක ඉස්සෙල්ලාම පිළිගන්නවද?

පි: මම දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබ සහභාගී වෙලා තිබෙනවද මේ කර්මාන්තකරුවන් විසින් පවත්වන ලද සාකච්ඡා වලට?

පි: මම දන්න තරමින් නැහැ ස්වාමීනි.

ප්‍ර: මම ඔබට අවසාන වශයෙන් යෝජනා කරනවා මේ මාර්ග උපදේශක සංග්‍රහයෙන් පරිබාහිරව යමින් කොලොසස් ආයතනයට අබලි ලෝභ වැඩි ප්‍රමාණ වලින් ලබාදීමෙන් ඔබ අනිකුත් කර්මාන්තකරුවන්ට අසාධාරණයක් වෙන අයුරින් කටයුතු කරලා තියෙනවායි කියලා?

පි: කිසිසේත්ම නැත ස්වාමීනි.

ප්‍ර: එසේම ඔබ කැබිනට් අමාත්‍ය තීරණයක් මත නිකුත් කරන ලද 2013 මාර්ග උපදේශක සංග්‍රහයෙන් පරිබාහිරව අනීතිකව කටයුතු කරලා තියෙනවා කියලත් මම ඔබට යෝජනා කරනවා.

පි: නැත ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරිවරයා කවුද?

පි: අධ්‍යක්ෂක ජනරාල් තනතුරක් තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර: ප්‍රධාන විධායක නිලධාරී අධ්‍යක්ෂක තනතුරක් කියන්නේ එදිනෙදා කටයුතු අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් තීරණය ගැනීමේ හැකියාව තියෙන්නේ අධ්‍යක්ෂක ජනරාල්වරයාට නේද?

පි: අධ්‍යක්ෂක ජනරාල් තනතුරු 2ක් තිබෙනවා ස්වාමීනි. පරිපාලන සහ Operations කියලා 2ක් අපේ එක පුරප්පාඩුවයි පුරවලා තිබුණේ. අනිත් එක පුරවලා තිබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: හරි මම මෙහෙම අහන්නම්කෝ කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරිවරයා එහි සභාපතිද?

පි: නැත ස්වාමීනි.

**********

**<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>**

ප්‍ර: ජිනසේන මහත්මයා දැන් ඔබ සාක්ෂි දෙන අවස්ථාවේ දී සඳහන් කරා දූෂිත නිලධාරීන් හිටියායි කියලා කාර්මික සංවර්ධන මණ්ඩලයේ. කියන්න බලන්න ඒගොල්ලෝ ගැන විස්තර ටිකක්. කවුද මේ දූෂිත නිලධාරීන් කවුද කොහොමද මේ අය දූෂිත වැඩ කරලා තිබුණේ?

පි: ස්වාමීනි මගේ කාලයේ තුල දී එවැන්නන්ට විනය පරීක්ෂණ පවත්වලා තියෙනවා. ස්වාමීනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කොයි ආකාරයේ දූෂිත වැඩද කරලා තියෙන්නේ ඒගොල්ලෝ?

පි: මුදල් සොරකම් කිරීම් ප්‍රවාහනයේ දී අයුතු ලෙස මුදල් ලබා ගැනීම ප්‍රවාහනය සම්බන්ධව. සොරකම් සම්බන්ධව ඒවගේ තමයි.

ප්‍ර: ඒ ඇරෙන්න දැන් මේ වගේ අමුද්‍රව්‍ය බෙදා හැරීම අබලි ද්‍රව්‍ය බෙදා හැරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදීත් ඒවා එක් එක් අයට දෙන්න මෙවැනි දූෂිත නිලධාරීන් සම්බන්ධ වී තිබුණු බවක් ඔබට වැටහුණාද තිබුණද අවබෝධයක්?

පි: ඇත්ත වශයෙන් මම බැඳෙන අවස්ථාවේ දී මුළු මණ්ඩලයේම තිබුණු කතාව ඒක තමයි ස්වාමීනි.

ප්‍ර: මොකක්ද විස්තර කරන්න බලන්න We want to know the facts we are trying to collect the details so let us know about

පි: හොඳයි ස්වාමීනි But I followed AR and FR to the word sir. කර්මාන්තපුර වල ඉඩම් ලබාදීමේදී කර්මාන්තකරුවන්ට සහ කර්මාන්තකරුවෙක්ගේ කර්මාන්තපුරයෙන් ඒ ඉඩම ලබාගෙන නැවත වෙන කෙනෙකුට සන්තක කරන අවස්ථාවේ දී අයථා ගනුදෙනු සිද්ධ වෙලා තියෙනවායි කියලා දැන ගැනීමට තියෙනවා ස්වාමීනි. පෙළක් ඒවා direct කතා කරලා මට කතා කරලා මම නවත්වලා ඒවා හරි ක්‍රමයට කරලා දීලා තියෙනවා ස්වාමීනි. මේ scrap එක සම්බන්ධව නම් හුඟාක් ඔය පෙළක් අවස්ථාවල දී අපි හිතමු රත්නපුරේ තියෙන භාණ්ඩ ඒ ගැනුම්කරුට රත්නපුරයටම ගිහිල්ලා මුදල් ගෙවලා එවැනි අවස්ථාවල දී ගන්න පුළුවන් එතනින්ම ඔය කිරීම් වලදී අරවා මෙවා හුඟාක් ප්‍රශ්න ඇති වෙන බව දැනගෙන තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: එකකොට මේ දූෂිත නිලධාරීන් එවැනි දූෂිත වැඩ කරනකොට ඔබ කියන්නේ ඔබ ඒවා නවත්වන්න කටයුතු කරා කියලාද ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ නිලධාරීන් ඔබට විරුද්ධව ගියාද?

පි: විරුද්ධවත් ගියා ස්වාමීනි.

ප්‍ර: කොයි වගේ අවස්ථාවන් වලදීද?

පි: ඔවුන්ට විනයානුකූලව පියවර ගත් අවස්ථාවලදී ස්වාමීනි.

ප්‍ර: ඒ අයගේ නම් කියන්න පුළුවන්ද ඔබට මතක නැද්ද?

පි: මතක නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට කියන්න පුළුවන් ද යම් යම් අවස්ථාවන් වලදී මේ පිත්තල සුළු කර්මාන්තකරුවන් අරගෙන ගිහිල්ලා ඒගොල්ලෝ නැවත වැඩි ගාණට විකුණපු අවස්ථා තිබුණද?

පි: ඒ ප්‍රශ්නය ඉතාමත්ම දැවෙන ප්‍රශ්නයක් වශයෙන් අපේ මණ්ඩලයට තිබුණා ස්වාමීනි.

ප්‍ර: ඒක විස්තර කරන්න බලන්න.

FAIR COMMENT BY JEZEEM

පි: සුළු සහ කුඩා විශේෂයෙන්ම කර්මාන්තකරුවන් ඔවුන්ගේ ධාරිතාවන් පරීක්ෂා කරලා බලලා අපේ නැවත Register වෙනවා. Register වුණායින් පස්සේ අපෙන් ඒවා ලබාගෙන වෙනත් මාර්ග හරහා ඔය මධ්‍ය පරිමාණ ආයතන වලට වැඩි මිලකට විකුණනවා.

ප්‍ර: එතකොට එවැනි විකිණීම් ඔබට දැන ගැනීමට ලැබුණද මේ කොලොසස් ආයතනයටම විකුණලා තිබුණා කියලා?

පි: එහෙම මට දැන ගන්න ලැබුණේ නැහැ. නමුත් ඒක පොදුවේ විකුණන බවට පිත්තල විතරක් නෙමේ තඹ, යකඩ, ටීනවිවට්ටි ඒ වගේ දේවලුත් ඒකයි මට නවත්වන්න ඕනි වෙලා තිබුණේ.

ප්‍ර: ඔබ නැවැත්වුවාද?

පි: 100%ක් නවත්වන්න බැරිවුණා ස්වාමීනි.

ප්‍ර: ඒ තත්වය ඔබ පාලනය කරා?

පි: පාලනය කරා ස්වාමීනි.

ප්‍ර: දැන් හමුදාවෙන් ඔබට දැනුම් දුන්නේ මේ පිත්තල විශාල වශයෙන් තියෙනවා ගෙනියන්න කියලද එහෙම නැත්නම් ඒ අයගෙන් ඔබ ඉල්ලුවාද මේවා තියෙනවානම් අපට දෙන්න කියලා?

පි: ඇත්ත වශයෙන්ම ස්වාමීනි මෙය අප වෙත මුලින්ම යොමු කරන්නේ එවකට ගරු අග්‍රමාත්‍ය කාර්ලයේ පිහිටි ආර්ථික සංවර්ධන කමිටුව විසින්. එවිට ටොන් 200ක් පමණ ප්‍රමාණයක් මාතලේ පදිංචි වෙද මහත්තයෙකු විසින් ඉල්ලා තිබෙනවා. පිත්තල ඔරු සෑදීම පිණිස. පිළිකා නිවාරණය කිරීම පිණිස බව පවසා. එම අවස්ථාවේ දී ඔවුන් මෙම පාස්කරලිංගම් මහත්මයාගේ ප්‍රධානත්වයෙන් තමයි මේ කමිටුව තිබුණේ. එයට භාණ්ඩාගාර නිලධාරීන් සහ අනිකුත් සෑම නිලධාරියෙක්ම සහභාගී වෙනවා. අපි කාර්මික සංවර්ධන මණ්ඩලය කැඳවා මේ පිළිබඳව අපෙන් විමසුවා. මේ භාණ්ඩ ගන්න කැමති ද සහ මෙයාට දෙන්න කැමති ද කියලා?

ප්‍ර: අපි ඒ අවස්ථාවේ කියා සිටියා අපේ භාණ්ඩ නිකුත් කිරීමෙන් අපි ගන්න කැමැතියි පළවෙනියෙන්ම. අපි තමයි එකම ආයතනය මේවා ලබා ගැනීමට සුදුසු ආයතනය සහ මේගොල්ලෝ දෙන ක්‍රියාපටිපාටිය අනුගමනය කරලා මේච්චර ප්‍රමාණයක් අපි අපිට ගැරන්ටි කරන්න බැහැ. නමුත් දෙන්න පුළුවන් කියලා කිව්වා ස්වාමීනි. ඒ අනුව මම නාවින්න ආයුර්වේද රෝහලෙන් හිටියා එහි අධ්‍යක්ෂකවරුන්/ වරියන් සහ අපේ දිස්ත්‍රික්ක අධ්‍යක්ෂකවරුන්ගෙන් සමන්විත කණ්ඩායමක් ඒ වෙද මහත්තමයාගේ ස්ථානයට ගොස් පරීක්ෂා කර බලා වාර්තා ගෙනවා. ඒ සම්පූර්ණම ඒ කියන්නේ මේ සම්පූර්ණම බොරු වාර්තාවක් වුණා ස්වාමීනි. ඔහු ඉල්ලා තිබුණු දේ සම්පූර්ණම මේ උපදෙස් ලැබිලා තිබුණා එම කමිටුව මඟින්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ ඒ අය ඉල්ලා තියෙන්නේ ඒ අය ව්‍යාපාරයක් කරන්න කියලද ඔබ අදහස් කරන්නේ ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඊට පස්සේ ඔබ තීරණය කරා මේවා ඔබේ ආයතනය අරගෙන අදාල අයට බෙදලා දෙන්න එහෙමද කළේ?

පි: මෙම ක්‍රියාවලිය නිසා ස්වාමීනි අපිට මේවා මුලින් ගන්න කියලා මෙම පරීක්ෂණය ඉවර වෙනකම් අඩුම ගානේ මං හිතන්නේ මාස 3ක් විතර නිකන් කාලය ගෙවී ගියා.

ප්‍ර: දැන් ඔබ කියන ආකාරයට උදයසිරි මහත්මයා සහ දික්වැල්ල මහත්මයා අතර හිත්නොහඳ කමක් තිබුණද? මේ දෙන්නා මේ තරඟයට වගේ වැඩකරපු බවක්?

පි: ස්වාමීනි දික්වැල්ල මහත්මයා මම හිතන්නේ අවුරුදු 26ක් පමණ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සේවය කරලා තියෙනවා. එයින් අවුරුදු 4ක් පමණ අලෙවි අංශය හෝ ප්‍රවර්ධන අංශය ඒ වැඩ කරලා තියෙනවා ස්වාමීනි. උදයසිරි මහත්මයාගේ පුරප්පාඩුව පිරවුයේ මම සභාපති වුණායින් පස්සේ ස්වාමීනි. මම හිතන්නේ මම ඔහුගේ අර ස්ථාන මාරුවත් සමඟම යම්කිසි යටිහිත් වල මොකක් හරි තිබුණද කියලා කියන්න බැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ උදයසිරි මහත්මයාව තනතුරට පත්කරේ ඔහු නියමිත සුදුසුකම් සපුරා තිබුණ නිසාද?

පි: ඒ පරීක්ෂා කර බැලීමට තිබුණේ අපගේ මානව සම්පත් අංශයෙන්. එහි නිලධාරීන් ඔහුගේ සහතික පත්‍ර සම්මුඛ පරීක්ෂණයට සුදුසු පුද්ගලයෙක් වශයෙන් සපයා තිබුණා ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව තමයි සුදුසුකම් අනුව ඔබ ඔහුව පත් කරන්න තීරණය කෙරුවේ?

පි: interview board එකම.

ප්‍ර: දැන් ඔහුගේ අර අබලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඉවත් කිරීම කළේ?

පි: කාරණා කිහිපයක් තිබුණා ස්වාමීනි. ඒ සඳහා යම්කිසි ලිඛිත පත්‍රිකාවක් ඔබතුමලා අතර තියෙනවා මම කැඳවපු පත්‍රිකා. අපගේ සාමාන්‍යයෙන් මාසිකව රැස්වීම් 3ක් තියෙනවා. අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම. අංශ ප්‍රධානීන්ගේ රැස්වීම සහ විගණක සහ management රැස්වීම. ඒ රැස්වීම් වල වාර්තා අපේ රැස්වීම් වල සෑම අංශයකම ප්‍රගතිය සභාකයන්ට දීලා තියෙන target නිරීක්ෂණය කරනවා. ඉතින් marketing department එක යටතේ ඒ 2015 සිට මොහු ඒ තනතුරින් නැහැ මේ ඒ කාර්යය dedication of duties වෙනස් කරන වේලාව දක්වා අපි අධ්‍යනය කළොත් මුළු අධ්‍යක්ෂක මණ්ඩලයත් මමත් සහ අනිත් මීටිමේත් ඔහුගේ performance සම්බන්ධව ගොඩක් recommend කරලා තියෙනවා.

ප්‍ර: එතකොට තනි තීරණයක් නොවේ කියලා ඔබ කියන්නේ ?

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

පි: අනිවාර්යයෙන් තනි තීරණයක් නොවේ.

ප්‍ර: දැන් ඔබ මේ එක කොටසකට එක්තරා කණ්ඩායමකට හෝ එක්තරා සමාගමකට හෝ මේ විදිහට විශාල ප්‍රමාණයක් තඹ සහ පිත්තල ලබාදුන්නා කියලා නැගෙන චෝදනාව සම්බන්ධයෙන් ඔබට මොනවද කියන්න තියෙන්නේ අපිට?

පි: ස්වාමීනි මටත් කර්මාන්තශාලාවක් තියෙනවා. මමත් වෘත්තිය වශයෙන් ඉංජිනේරුවරයෙක්. එතකොට මට සේවක සංඛ්‍යාවක් ඉන්නවා. 120ක් 180ක් පමණ ස්වාමීනි. එතකොට ව්‍යාපාර විඥාණය Business acumen ඉතාමත්ම භාණ්ඩාගාරයට බරක් වෙලා පාඩු ලබමින් තිබෙන ආයතනයක් නම් මේ මගේ පළවෙනි public job එක ස්වාමීනි. මගේ ව්‍යාපාරික ඥානය පාවිච්චි කරලා මට අවශ්‍ය වුණේ මේක ආදායම වැඩිකරන ගමන් ඉතිරි කර්මාන්තකරුවන්ටත් සාධාරණව මෙය බෙදා දීම. ඉතින් ඒ චෝදනාව සම්බන්ධයෙන් මම ඉතාමත් කණගාටු වෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ඔබේ උත්සාහ හරි ගියා කියලා ඔබ හිතනවද නැත්නම් උත්සාහය වැරදුණාද?

පි: මගේ උත්සාහය හරි ගියා ස්වාමීනි.

ප්‍ර: දැන් මගේ අවසාන ප්‍රශ්නය දැන් ඔබව පත්කළේ ඔබ සාක්ෂි දෙනකොට සඳහන් කරා ඊයේ අගමැතිතුමා කියලා ඒක හරිද?

පි: දැන් නෛතිකව වශයෙන් මෙතුමිය ඇහුව විදිහට ඇමතිතුමා විසින් පත් කරන්න ඇති නමුත් එම නිර්දේශය නොලැබුණා නම් ඔහු මාව පත් නොකරන්න තිබුණා ස්වාමීනි.

ප්‍ර: නිර්දේශ කළේ අගමැතිතුමා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: නමුත් පත් කළේ රිෂාද් බදියුර්දීන් ඇමතිතුමා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කොයියම්ම හෝ අවස්ථාවක මේ තඹ සහ පිත්තල ගනුදෙනු සම්බන්ධයෙන් රිෂාඩ් බදියුර්දීන් ඇමතිවරයාගේ උපදෙස් නියෝග හෝ ඉල්ලීම් සලකා බැලුවද?

පි: කිසිසේත්ම නැහැ ස්වාමීනි.

ප්‍ර: කිසිම අවස්ථාවක ?

පි: කිසිම අවස්ථාවක නැහැ ස්වාමීනි.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු ඔබ සභාපති ධුරයෙන් ඉවත් වුණේ කවදද?

පි: ස්වාමීනි අර මම ඉවත් වුණෙත් නැහැ.

ප්‍ර: තමන් අතඇරලා ගියා වගේ ?

FAIR COMMENT BY JEZEEM

පි: අස්වුණෙත් නැහැ ස්වාමීනි. දින 52ක කාලය තුලදී මම ප්‍රතිපත්තියක් වශයෙන් සේවයට වාර්තා කළේ නැහැ. නමුත් නැවත තිබුණු ආණ්ඩුවම පත්වූ පසු එම ඇමතිවරයා විසින් වෙන කෙනෙක් පත් කරපු

ප්‍ර: ඒක තමයි ඔබ සේවයට එන්නේ නැතිව ඉන්න අවස්ථාවේ දී අමාත්‍යවරයා කවුද? ඒ කියන්නේ ඔක්තෝබර් 26 පසු?

පි: ඇමතිවරයෙක් පත් කළේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඊට පසුව?

පි: ඊට පසුව නැවතත් රිෂාඩ් බදියුර්දීන් මහතා.

ප්‍ර: ඒ මහතා ඔබ නැවතත් සභාපති ධුරයට පත්කරාද?

පි: නැත ස්වාමීනි.

**********

<u>**ගරු විනිසුරු අදිකාරි මැතිනිය**</u>

ප්‍ර: Mr. ජිනසේන දැන් ඔය ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂක ජනරාල් Mr.රත්නමලලනේ ?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් ඔබ සභාපති හැටියට සිටින අවස්ථාවක අර organizational structure සංවිධාන ව්‍යුහක් කියලා එකක් මේ ආයතනයට තියෙනවානේ ?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ පෞද්ගලි අංශයෙත් ව්‍යවසාකයෙක්නේ ව්‍යාපාරිකයෙක්නේ. ඔබගේ පෞද්ගලික සමාගමේ සංවිධාන ව්‍යුහයක් තියෙනවද?

පි: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් සංවිධාන ව්‍යුහයක් තියෙන්නේ මොකටද ආයතනයක?

පි: ඒ තමන්ගේ වැඩ රාජකාරි නියමිත පරිදි ගලා යෑම පිණිස.

ප්‍ර: එතකොට දැන් මෙම ඔබ සභාපති සහ Board management එක උඩින්ම ඉන්න කොට රත්නමල්ල මහත්මයා ප්‍රධාන විධායක නිලධාරියා. එතකොට ඊට පල්ලහායින් ඉන්නවා නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්ලා දෙදෙනෙක් නේද?

පි: එම තනතුරු පිහිටුවා තිබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබ ඉන්න කාලයේ තිබුණේ නැද්ද ඒවා දෙකෙන් එකක්වත්?

පි: නැහැ ස්වාමීනි.

ප්‍ර: එතකොට හිටියේ මේ directors කණ්ඩායමද ?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: director generalට ජනරාල්ට යටින් හිටියේ Directors ටික?

පි: කෙළින්ම directorsලා ටික.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: directorsලාට යටින් තමයි මේ diputy directors Assistant directorsලා ඔක්කෝමලා ඉන්නේ ?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ සභාපතිවරයා ලෙස අර channel of communication එක තියෙනවානේ මේ organizational structure එකේ පෙන්වලා ඒක අනුව ඔබට කෙළින්ම පුළුවන්ද මේ සහකාර අධ්‍යක්ෂක ඔය දික්වැල්ල මහත්මයාත් එක්ක මෙම ඔබ කරපු ආකාරයේ රාජකාරි කටයුතු කරන්න ඔබට ලියුමක් එනවා. ඔබ ඒ ලියුමට සටහනක් දාලා සහකාර අධ්‍යක්ෂකට යවනවා. එතකොට දැන් මේ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා රත්නමල්ල මහතා ඔබ රත්නමල්ල මහතාත් එක්ක මේ ලියුම් පිළිබඳව කතාවත් කළේ නැද්ද?

පි: මම මුලින් කිව්වා පරිදි ස්වාමිනි නිතරම රැස්වීම් තියෙනවා. මේ වගේ ලියුම් රත්නමල්ල මහතා ගාවටත් යොමු වෙලා මා ගාවටත් එනවා. ඔහු සමහර විට තීරණයක් ගන්නේ නැතිකොට මට තීරණයක් ගන්න වෙන අවස්ථා තිබෙන්න ඇති ස්වාමීනි.

ප්‍ර: ඔහු සාමාන්‍යයෙන් එහෙම තීරණ ගන්න නැති නිලධාරියෙක්ද?

පි: කවදාකවත් තීරණ ගන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒක නිසාද ඔබට සිද්ධ වුණේ මේ සහකාර අධ්‍යක්ෂක සමඟ වැඩ කරන්න?

පි: මුළු කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේම ප්‍රගතියට ඔහුගේ තීරණ ගැනීම මේ ප්‍රමාදයෙන් බව බලපෑවා ස්වාමීනි.

ප්‍ර: ඔබ දැන් මේ අධ්‍යක්ෂක marketingනුත් ඒවාගේ පුද්ගලයෙක්ද දැන් ඔබ marketing අධ්‍යක්ෂගෙන් මේ ව්‍යාපෘතිය අයින් කරානේ මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය?

පි: අනිවාර්යයෙන්ම ඒවගේ පුද්ගලයෙක් ස්වාමීනි.

ප්‍ර: ඔබ කියන්නේ ඒවා සනාථ කිරීමට කරුණු තිබෙනවද ඔහු පිළිබඳව ?

පි: සෑම Board Meetingමකම සෑම Auditor management meetingමකම සෑම, HOD meetingමකම marketing ශීර්ෂය යටතේ එම meeting වාර්තා කියවලා බැලුවොත් ඔප්පු වෙනවා ස්වාමීනි.

ප්‍ර: එහෙමනම් ඇයි ඔබ ඔහුව director marketing තනතුරෙන් අයින් කරලා දැම්මේ නැත්තේ? ඔහු පිළිබඳව ඒ තරම් ඔහුගේ ගැටලු තිබුණානම් HOD meetings වලම, Board Meeting වලම , And it and management committee meeting වලම කතා කරානම් director marketing ඇයි ඔබ ඔහුව එතන තියලා ඔහුගෙන් අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය විතරක් අයින් කරලා සහකාර අධ්‍යක්ෂකට දුන්නේ ඇයි ඔබට සභාපතිවරයා හැටියට Board of management එකට දාලා මොහුව මේ තනතුරෙන් අයින් කරන්න බැරි වුණේ ?

FAIR COMMENT
BY JEZEEM

පි: ඇත්ත වශයෙන්ම ස්වාමීනි මෙම තනතුරෙන් මම අදහස් කළේ නැහැ ඔහුව අධ්‍යක්ෂක තනතුරෙන් අයින් කරන්න. නමුත් මෙම විෂය පමණයි භාර දුන්නේ. ඔහුව අධ්‍යක්ෂක නෙවෙයි. නමුත් ඔහුව minutes තියෙනවා. අනිත් 9ක් අපේ industrial state, engineering division ඒ වගේ divisions 9 ප්‍රවර්ධනය කරන්න කියලා. විශේෂයෙන්ම කිව්වා මොකද ඒවාට ඉතාමත්ම තව අදායමක් ලබා ගන්න හැකියාව තියෙද්දී අපි ප්‍රවර්ධනය නැති හින්දා ලැබෙන්නේ නැහැ. ඒ පිළිබඳව වැඩිය අවධානයක් යොමු කරන්න කියලා කිව්වා. ඒ සමඟම 2015න් පස්සේ 2016 දී තමයි අපට දැන ගන්නට ලැබුණේ මෙම ඔහුට ඒ තිබිය යුතු සුදුසුකම් නැහැ කියලා. ඒ 2016සිට මොහුට වැටුප් වර්ධකයක් ලබා දීම අත්හිටවලා තියෙනවා සහ ඔහු තාමත් අනියම් සේවකයෙක්

ප්‍ර: ඔහුට සුදුසුකම් නැත්නම් ඔහුගේ පත්වීම් ලිපියේ ඊයේ මං හිතන්නේ ගරු සභාපතිතුමාට ඔබට ඒ පිළිබඳව ඔබට ඒ පිළිබඳව අවධානය යොමු කරා. මොහු සම්බන්ධයෙන් කටයුතු කළ හැකි ආකාරය ලියලා තියෙනවානේ. ඔහුට සුදුසුකම් ඒ කියන්නේ ඔහු නියම සුදුසුකම් නිවැරදිව අනාවරණය නොකර පත්වීම ගත්තානම් ඔහුට සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරන්න තිබුණා. ඔහුගේ වරදක් නොවී ඔබ සඳහන් කර පරිදි මානව සම්පත් අධ්‍යක්ෂකවරයා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට මොහුට සුදුසුකම් තියෙනවා කියලා කරන ලද තොරතුරු ලබාදීම මත ඔබත් හිටියානේ මේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නේද?

පි: එහෙමයි.

ප්‍ර: අමාත්‍යාංශයේ නිලධාරියෙකුත් ඉන්න ඇති?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: මුදල් අමාත්‍යාංශයෙනුත් එක්කෙනෙක් එනවානේ?

පි: එහෙමයි ස්වාමිනී.

ප්‍ර: එතකොට එහෙම මේ විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් ඉන්න සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකින් මේ නිලධාරියාව තෝරන අවස්ථාවේදී වැරද්ද කරලා තියෙන්නේ HRනම් ඔබ සභාපතිවරයා ලෙස 2016 දී මේක හෙළිවුණාම HRගෙන් මේකට නිදහසට කරුණු විමසුවද?

පි: අනිවාර්යෙන්ම විමසලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබ ඒවා වගකීමෙන් නේද කියන්නේ තියෙනවා තියෙනවා කියන ඒවා දැන් ඔක්කොම ඉදිරිපත් කරන්න වෙයි ඔබට ?

පි: තියෙනවා ස්වාමීනි. අපි HR director personalට අපි කියලා තියෙනවා වහාම මෙයාට විනය ක්‍රියාමාර්ග ගන්න කියලා.

ප්‍ර: ඉතින් ඔහු තාමත් ඉන්නවානේ මේ තනතුරේ director marketing තනතුරේ දැන් මේ 2020 දීත් ඉන්නවානේ ?

Project Search Copy
FAIR COMMENT BY JEZEEM

පි: මම හිතන්නේ ඔහු එතෙක් මෙතෙක් ඔහුගේ සුදුසුකම් ලබාගෙන තියෙනවා දැන්. මම දන්නේ නැහැ දැන් මම හිතන්නේ ඔහු appeal එකක් කරලා තියෙනවා කියලා මට අරාංචියි ස්වාමීනි.

ප්‍ර: මෙම තනතුරේ ඉන්න තව දුරටත්?

පි: එසේයි ස්වාමීනි.

**********

දැන් වේලාව: ප.ව.8.50
මෙතැන් සිට ල/ලේ: චන්දිමා මෙනෙවිය

වේලාව:ප.ව.8.50
පෙර සටහන්:නිල්මිණි.
මෙතැන් සිට:චන්දිමා

**<u>ගරු අදිකාරිය මැතිණිය</u>**

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ ඔබට කියන්න පුළුවන්ද ආරක්ෂක අමාත්‍යාංශයෙන් කවදාද මේ පිත්තල අබලි ද්‍රව්‍යයක් ලෙස ඔබලාගේ ආයතනයට ලබා දීමේ අර ඔබ සඳහන් කරානේ අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් තියෙන ආර්ථික කමිටු රැස්වීමේදී තමයි ඔය මේ කතාව ආවේ කියලා අර කොහේද ඉන්න වෙද මහත්මයකුට පිත්තල ඔරු හදන්න කියලා ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඊට පස්සේ ඔබ කිව්වානේ කණ්ඩයමක් යවලා ඒක නතර වුනා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඊට පස්සේ මේ පිත්තල ගන්න ආයේ වැඩේ පටන් ගත්තේ කොයි කාලේද?

පි: අපිට මං හිතන්නේ කර්මාන්ත අමාත්‍යාංශ යේ මීට අදාළ වීමේ ලිපිය ලැබුනේ 2017 වර්ෂයේ මැද භාගේ.

ප්‍ර: ඒ කියන්නේ කර්මාන්ත අමාත්‍යාංශයේ දැන් ඔබ සභාපතිවරයා ලෙස ගිහිල්ලා රැස්වීම් පවත්වලා ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිලධාරීන් ගෙනැල්ලා එහෙම ඉල්ලීමක් කරලා ද මේක ලැබුණේ?

පි; නෑ ස්වාමීනි.

ප්‍ර: ඔබ දන්නා පරිදි කොහොමද ආරක්ෂක අමාත්‍යාංශයේ එක පාරටම මෙම ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට මේ පිත්තල ලබා දීමේ තීරණය අරන් තියෙන්නේ?

පි: එය කැබිනට් තීරණයක් ලෙස සඳහන් කර තිබෙනවා ඒවා තිබූ ලිපියේ ස්වාමීනි.

ප්‍ර: කැබිනට් තීරණයක් කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ කැබිනට් තීරණය කොහේද තියෙන්නේ ඔබලා ගේ ආයතනයේ නැතිව ඇති නේද?

පි: ඒක අපේ ආයතනයේ නෑ ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් මේ මොන අවුරුද්දේද ඒ 2017 අවුරුද්දේදී?

පි: 2017 ස්වාමීනි.

ප්‍ර: එතකොට මේ 2017 මොන මාසේද කියලා ඔබට මතකද?

පි: මට මතක හැටියට ජූලි මාසේ ස්වාමීනි.

ප්‍ර: ජූලි?

පි: ජූලි 7 වෙනි මාසේ.

ප්‍ර: ආරක්ෂක අමාත්‍යාංශයේ පිත්තල ද්‍රව්‍ය ලබා දෙන එක?

පි: එහෙමයි ස්වාමීනි මට මතක හැටිටට.

ප්‍ර: එතකොට මේ කොලෝසස් පුද්ගලික සමාගම ඔබලාගේ ආයතනයේ මේ අබලි ද්‍රව්‍ය මිලලදී ගැනීම සඳහා සුදුසු කම් ඉල්ලූ අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරලා තියෙන්නේ 2017 නේද?

පි: එහෙමයි ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ආගෝස්තු මාසේ?

පි: අගෝස්තු මාසේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ මේ සහකාර අධ්‍යක්ෂකට අධ්‍යක්ෂක මාකර්ටින්ගේන ඔහුගේ මේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය අයින් කරලා දෙනවානේ සහකාර අධ්‍යක්ෂක ඒක සිදුවෙන්නේ කොයි කාලේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒක සිදුවෙන්නේ කොයි කාලේද?

පි: ඊට කලින් ස්වාමීනි.

ප්‍ර: කලින් කියන්නේ කවදද? 2016.05 වෙනි මාසේ කියලා කිව්වොත් හරිද?

පි: වෙන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබට නිකම් සභාපතිවරයා හැටියට හිතෙන්නේ නැද්ද මේ ආරක්ෂ අමාත්‍යාංශයෙන් අබලි ද්‍රව්‍ය දෙන එකයි කොලෝසස් පුද්ගලික සමාගම ඔබ ආයතනයේ ලියාපදිංචි වෙනවා මේ පිත්තල අබලි ද්‍රව්‍ය සඳහා ඉල්ලුම් කිරීමෙන් සහ මෙහි සහකාර අධ්‍යක්ෂකවරයාට අධ්‍යක්ෂක වරයාගෙන් මෙය මාරු කරලා ලබා දීමයි අතරේ කිසියම් හෝ සම්බන්ධතාවයක් තියෙනවා වගේ කියලා ඔබට පෙනෙනවද?

පි: නෑ ස්වාමීනි එපමණයි.

ප්‍ර: ඔබ දැන් සඳහන් කරා මෙම කොමිෂම හමුවේදී ඔය කොලොසස් සමාගමට විශාල ප්‍රමාණයක් දුන්නානේ ඒකට ඔය ITI ආයතනය ඔබගේ ආයතනේ ඉන්ජිනේරුවෝ තව කවුද ඔබ කිව්වේ එම ටීම් එක?

පි: අධ්‍යක්ෂක කොළඹ දිස්ත්‍රික් අධ්‍යක්ෂක කාර්යාලයේ ස්වාමීනි.

ප්‍ර: එහෙම කණ්ඩායමක් විසින් ගිහිල්ලා පරික්ෂා කර බලලා දීපු නිර්දේශයක් තිබුණා කියලා විශාල ප්‍රමාණයක් දෙන්න?

පි; එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අනුමැතිය කොහේද තියෙන්නේ දැන්? ඒක තියෙනවද ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි: මේ ඇප්ලිකේෂන් එක තියෙනවා ස්වාමීනි.

ප්‍ර: නෑ නෑ ඇප්ලිකේෂන් එකේ තියෙන්නේ ඒ වෙලාවේ එයා ඉල්ලන ප්‍රමාණය අනුමත කිරීමනේ

පි: ඔව්.

ප්‍ර: නමුත් ඔබ මං හිතන්නේ සභාපතිවරයා විදියට අර මාසෙන් මාසටය එනවානේ ලියුමක් කොලෝසස් පුද්ලික සමාගමෙන් එකේ සභාපති හැටියට ඔබ සටහන් දානවා සමහර අවස්ථාවලදී අධ්‍යක්ෂක ජනරාල් දානවා.නැත්නම් සහකාර අධ්‍යක්ෂක ඔබට සටහන් දානවා. ඒවා කරන්නට නේද ඔබ කියන්නේ කමිටුවක් පත්කරලා තීරණයක් ගත්තා කියලා මේ සමාගම වැඩි පුර දෙන්න?

පි: එහෙමයි ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර; ඒ තීරණය කොහෙද තියෙන්නේ ඒ කමිටු තීරණ?

පි: අර දික් වැල්ල මහතා යටතේ තියෙන්න ඕනේ.

ප්‍ර: දික්වැල්ල මහත්තාය ලඟ?

පි: එහෙමයි ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු එක පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි කාර්මික සංවර්ධන මණ්ඩලයට අදාලව පනතක් තියෙනවා නේද?

පි; එහෙමයි ස්වාමීනි.

ප්‍ර: සරත් උදයසිරි මහත්මයා අංශ ප්‍රධානියෙක් වශයෙන්ද අධ්‍යක්ෂක අලෙවි විදියට හිටියේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: හෙඩ් ඔප් ඩිවිෂන් ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: අංශ ප්‍රධානියා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: කාර්මික සංවර්ධන මණ්ඩල පනතේ 43 වගන්තියට අනුව අංශ ප්‍රධානියෙක්ගෙන් කාර්යන් වීම තීරණය කිරීමේ බලය තියෙන්නේ අධ්‍යක්ෂක මණ්ඩලයට නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: යම් කිසි අවස්ථාවක ඔබ ට මෙම කොමිෂන් සභාවට සරත් උදය සිරි මහතාගේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය අහක් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය තීරණයක් ඉදිරිපත් කරන්න බැරිවුනොත් ඔබ විසින් ගත්තු ක්‍රියාමාර්ගය මේ පනතට පටහැනියි නේද?

පි: මට අනිවාර්යෙන් ඉදිරිපත් කරන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: නෑ මං ..

පි: පටහැනියි ස්වාමීනි.

**********

**<u>ජ්‍යෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>**

ප්‍ර: මහත්මයා ඔබ සඳහන් කරා ජී.එල් සරත් උදය සිරි මහතා ගෙන් අබලි ලෝහ ව්‍යාපෘතිය ඉවත් කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් ගෙන තිබුණායි කියලා. ඒ මතයි මේ ඔබේ තනි තීරණයක් නෙමේ අධ්‍යක්ෂකක මණ්ඩලය තිරණයක් මතයි ඒ මහතාගේ අබලි ලෝහ කළමණාකරන කියලා ඔබ සඳහන් කරා?

පි: අධ්‍යක්ෂක මණ්ඩලය තීරණයක් අරන් තියෙනවා මාකටින් ඩිවිෂන් එක අලෙවි සහ ප්‍රවර්ධන කියලා වෙන් කරන්න සහ අලෙවි කිරීමේ සඳහා වෙනම පුද්ලයෝ පත් කරන්නත් ප්‍රවර්ධනය සඳහා වෙනම පුද්ගයෝ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පත් කරන්නත් කියලා තියෙනවා.ඒ පුද්ගලයා කියලා නැහැ එම අංශය වෙන් කරන්න අධ්‍යක්ෂක මණ්ඩලය තීරණයක් අරන් තියෙනවා.

ප්‍ර: මම ඔබට යෝජනා කරනවා ඔබ කලින් සඳහන් කරේ මේ සරත් උදය සිරි මහත්මයා අබලි ලෝහ ව්‍යාපෘතිය කලමණාකරණ ඒකකයෙන් අයින් කරලා එම අංශය වැඩ කටයුතු සඳහා ඩී.පී.පී. දික්වැල්ල මහතා පත්කිරීම සිදු කරේ සම්බන්ධයෙන් ඔබ මීට පෙර සාක්ෂි දෙන අවස්ථාවේදී ප්‍රකාශ කරා අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් මතයි කියලා?

පි: කියලා තියෙනවා නම් මං නිවැරදි කරන්න ඕනේ එය අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කරන්නේ අපේ මේ Administrate consultant කෙනෙක් හිටියා. ඒ අවස්ථාවේදි ඒ නිරීක්ෂණ ඔක්කොමත් එක්ක දුන්න කමන්ඩේෂන් එකත් එක්ක අලෙවි ඒ කියන්නේ විකිණීම් එතකොට අබලි ද්‍රව්‍ය කෙලින්ම විකුණනවා. ඊට අමතරව උපකොන්ත්‍රාත්තුව අපි ගන්නවා ඒකත් විකිණිමක් සහ ලක්කම් කියලා අපේ ඉස්සරහා තියෙනවා ප්‍රදර්ශනාගාරයක් එය වෙනම කට්ටියට භාර දෙනවා ප්‍රවර්ධනය වෙනම දෙන්නත් තමයි තීරණය කර තිබෙන්නේ.

ප්‍ර: ඒ අනුව දැන් ඔබ පිළිගන්නනවද සරත් උදයසිරි මහත්මයා ඒ අබලි ලෝහ ව්‍යාපෘතියෙන් ඉවත් කරේ අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් මත නොවේ ඔබේ තනි තීරණයක් මත කියලා?

පි: ස්වාමීනි දැන් ගත්ත තීරණයත් මත මේ සරත් උදයසිරි මහත්මයාගේ මේ වැඩවල තිබෙන දුර්වලතාවය සහ performance හුගාක් හේතුවුනා. ආදයම් වල බැලුවොත් එහෙම පරස්පර සමානයි වර්ෂයට අදාළව අනෙක් වර්ෂවලට හුගාක් මේවා වුනා.

මේ අවස්ථාවේ සාක්ෂිකරුට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙනුවට **ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලිපි ශීර්ෂය සහිතව අත්සනකින් යුත්තව 2020.06.19 දින දරන මෙම ගරු කොමිෂන් සභාවේ ලේකම් එච්.එම්.බි.පි හේරත් මයා වෙත ඉදිරිපත් කර ඇති ලිපිය සාක්ෂිකරුට පෙන්වා සිටිනවා.**

**ප්‍ර:** සාක්ෂික කරු මේ ලිපිය අනුව මේ ලිපියේ අංක 02 අනුව සරත් උදයසිරි මහතා ඉවත් කිරීම සහ දික්වැල්ල මහතා අබලි ලෝහ ව්‍යාපෘතියේ වගකිව යුතු ප්‍රධාන නිලධාරියා වශයෙන් පත් කිරීමට අදාලව අධ්‍යක්ෂක මණ්ඩලයක් තීරණයක් ගෙන නොමැති බවට සටහන් වී තිබෙනවද?

පි: මේ 2019 නිකුත් කර තිබෙන ලියුමක්. එහෙම ලියලා තියෙනවා ස්වාමීනි

ප්‍ර: ඒ අනුව ඔබ පිලිගන්නව ද මේ සරත් උදයසිරි මහත්මයා අයින් කරලා දික් වැල්ල මහතාට අබලි ලෝහ ව්‍යාපෘතියේ වගක කිවයුතු නිලධාරියා වශයෙන් පත්කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් නැහැ කියන කාරණය?

පි: අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් තියෙනවා ස්වාමීනි. මේ අංශ දෙක වෙන් කරන්න.

FAIR COMMENT BY JEZEEM

**මේ අවස්ථාවේදී 2020.06.19 දින දරණ කාර්මික ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලපි ශීර්ෂය සහිතව මෙම ලිපිය C790 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.**

**ප්‍ර:** ඒ අනුව මම ඔබට යෝජනා කරනවා 2013 මාර්ගෝපදේශක සංග්‍රහයේ ඇති ප්‍රතිපාදනවලට පටහැනිව තමයි ඔබ ඒ දික් වැල්ල මහතාට අබලි ලෝහ කළමණාකරනණ ඒකකයේ රාජකාරි ආවරණය කිරීමට පත්කිරීම සිදුකර තිබෙන්නේ කියලා?

පි: පිළි ගන්නේ නැහැ ස්වාමීනි. තවද දික්වැල්ල මහත්මයා පමණක් නොව එම අංශයේවැඩකරපු ධම්මික රත්නායක නමැති අවුරුදු 20 ක් පමණ පළපුරුද්දක් තිබනෙ අබලි සම්බන්ධව පුද්ගලයත් මේ සමහම සමහාම්ව පත්කරලා තියෙනවා ස්වාමීනි.

**සාක්ෂිකරුට C770 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටීයි**

ප්‍ර: ඒ ලිපිය ඔබ විසින් අත්සන් කර තිබෙන ලිපියක්ද?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: එය ඔබ සරත් උදයසිරි මහතාගේ සේවය අගය කරමින් ඔබේ අත්සනින් නිකුත් කරනලද ලද ලිපියක් වශයෙන් ඔබ පිළිගන්නවද?

පි: පිළිගන්නවා ස්වාමීනි. මෙම ලිපිය මොහුට පමණක් නෙමේ මේ සම්මන්ත්‍රණය සහ ප්‍රදර්ශනය වෙනුවෙන් මහන්සිවුනු සෑම කෙනෙකුටම නිකුත් කරා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ඒ නිලධාරියාගේ සේවය අගය කිරීමක් කරන්නේ නැත්නම් ඔබට අවශ්‍ය නම් මේ විදියේ ලිපියක් එහෙම නම් නොදී ඉන්න හැකියාවක් තිබුණානේ?

පි: ඔහු දක්ෂ දේ කරලා තියෙනවා එකට ඇගයීමක් කරලා තියෙනවා ස්වාමීනි

ප්‍ර: සාක්ෂිකරුට C 769 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් පෙන්වා සිටියි දැන් මේ ලේඛනය සරත් උදයසිරි මහතාගේ පත්වීමේ ලිපි වශයෙන් ඔබ හඳුන ගන්නවද ඔබේ අත්සන තිබෙනවද?

පි: හඳුන ගන්නවා ස්වාමීනි.

ප්‍ර: දැන් මෙම ඔබ ගරු කොමසාරිස්වරුන්ගේ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් සටහන් කරා මේ නිලධාරියා පත්වීම ලබන කොට ඒ සුදුසුකම් තිබුණේ නැහැයි කියලා පදනමක් මත ඔහු කටයුතු කරනවායි කියලා.? ඒ කියන්නේ සේවය ස්තීර කිරිම ආදියත් කරේ නැහැ මේ නිලධාරියාට සුදුසුකම් තිබුණේ නැහැයි කියලා?

පි: එසේය ස්වාමීනි.

ප්‍ර: දැන් මේ ලේඛණයේ 16 වගන්තියේ අනුව මේ තනතුර ලබාගන්න සුදුසුකම් පලපුරුදු ආදිය සම්බන්ධයෙන් අසත්‍ය කරුණක් ඉදිරිපත් කර තියෙනවා නම් වසන් කරලා තියෙනවා නම් අධ්‍යක්ෂක මණ්ඩලයට මේ බව කොයි අවස්ථාවකදී හෝ වැටහී ගියොත් ඔහු වාහම සේවයෙන්

FAIR COMMENT BY JEZEEM

පහකිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට බලය තිබෙන බවට සටහන් වී තිබෙනවා. දැන් ඔබ කියන ආකාරයට සුදුසුකම් තිබුණේ නැත්නම් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවා නම් මේ ඔබ විසින්ම අත්සන් කරලා දුන්නු මේ ලිපිය ප්‍රකාරව කටයුතු කරලා ඒ නිලධාරියාව ඒ ඔහුව සේවයෙන් පහකිරීමට හැකියාවක් තිබුණානේ?

පි: එසේය ස්වාමීනි

ප්‍ර: නමුත් එසේ ක්‍රියාකරලා නැහැ කියලා දැන් ඔබ පිළිගන්නවද?අවශ්‍ය නම් එහෙම ක්‍රියාකරන්න ප්‍රතිපාදන තිබියදීත් එසේ ක්‍රියාකරලා නැහැ එසේ ක්‍රියාකරලා නැත්තේ ඔබ කියන ආකාරයට සුදුසුකම් තිබුණේ නැති ප්‍රශ්නයක් සුදුසුකම් තිබුණේ නැහැයි කියලා කරුණු ඉදිරිපත් වෙලා තිබුනු නැති නිසායි කියලාත් මම ඔබට යෝජනා කරනවා?

පි: මම පිළිගන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබ ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්නේ අසත්‍යයක් කියලා මම වැඩිදුරටත් යෝජනවා කරනවා?

පි; මම පිළිගන්නේ නැහැ ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

**සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් ශාන්ත දික්වැල්ල නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥ වරයාට ලබා දෙමි . දික්වැල්ල මහතා වෙනුවෙන් ප්‍රශ්න අසන්නේ නැති බව උගත් නීතිඥවරයා දන්වයි.**

**මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න උගත් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් ඕමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් අසමි නැත යනුවෙන් ප්‍රකාශ කරයි . මේ අවස්ථාවේ සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ඔහු වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍ර තිස්ස මහතාට ලබාදෙයි.**

**********

**<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා</u>**

ප්‍ර: මහින්ද ජීනසේන මහත්මයා ඔබතුමා තමන්ගේ ප්‍රධාන සාක්ෂියේදී සඳහන් කෙරුවා මෙම ගරු කොමිෂම හමුවේ තමන්ව ඔය පත්වීමට නිර්දේශ කෙරුවේ හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්මයා කියලා?

පි: එසේය ස්වාමීනි.

ප්‍ර: තමන්ට 2015 වසරේදී තමයි මේ පත්වීම ලැබුණේ?

පි: එසේය ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: තමන්ට 2015 වසරේ කිසිම ආශ්‍රයක් දැන හැඳුනුම්කමක් පුද්ගලික කුලුපගවීමක් තිබුණාද රිසාඩ් බදුරුදීන් කියන පුද්ගලයාත් එක්ක?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: තමන්ට තමන්ගේ තමන් අශෝක ග්ලාස් කියන සමූහ ව්‍යාපාරයේ සභාපති?

පි: එසේය ස්වාමීනි.

ප්‍ර: ඒක කොච්චර පරණ ව්‍යාපාරයක්ද?

පි: අවුරුදු 76 ක් පරණයි ස්වාමීනි.

ප්‍ර: අවුරුදු?

පි: අවුරුදු 76 පරණයි ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් තමන් ඔය දූර කටයුතු වලට සහ තමන්ගේ සමාගමේ දූර කටයුතුවලට නිල කටයුතුවලට සහභාගි වෙන්නේ කොයි වයසේ ඉඳලදි?

පි: මගේ පුද්ගලික ව්‍යාපාර.

ප්‍ර: එහෙමයි?

පි: 1985 සිට ස්වාමීනි

ප්‍ර: එතකොට තමන් මීට ඉස්සෙල්ලා කිසිම අවස්ථාවක මේ රාජ්‍ය ක්ෂේත්‍රයේ පත්වීමක් ලබා ගෙන තිබෙනවාද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: මේ පළවෙනි අවස්ථාවද?

පි: පළවෙනි අවස්ථාව ස්වාමීනි.

ප්‍ර: තමන් පැහැදිලිව සඳහන් කරා ගරු සභාපතිතුමා අහපු ප්‍රශ්නයකට තමන්ව නිර්දේශ කෙරුවේ රනිල් වික්‍රමසිංහ මහත්මයා පත්කිරීම සිදුකරනු ලැබුවේ රිසාඩ් බදුරුදීන් මහත්මයා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒක තමයි රජය අනුගමනය කරන ක්‍රමවේදය කියලා මහත්මයා දන්නවද?

පි: ඔව්

ප්‍ර: දන්නවද?

පි: දන්නවා ස්වාමීනි.

ප්‍ර: තමන් මේ දුරයෙන් අයින් වෙන්න තමන්ට සිදුවුනා අයින්වුනා 2018 අවසන් කාලේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අර දවස් 52 ආණ්ඩුවෙන් පස්සේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඊට පස්සේ තමන් වෙනුවෙන් නැවත පත්කිරීමක් රිසාඩ් බදුරුදීන් තමන්ව කෙරුවේ නැහැ?

පි: නැහැ ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: වෙනත් පුද්ගලයෙකු පත්කරා නලින් අදිකාරම් කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කාල පරිවේදය තුලදි කොලෝසස් සමාගමට යම් කිසි පිත්තල විකිණිමක් සිදුවෙලා තියෙනවා කියලා මහත්මයා දන්නවද?

පි: මම දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් මහත්මයාගේ ළඟ තියෙනවාද 2018 මහත්මයාගේ annual report කියලා තියෙනවානේ ඔය ආයතනයේ?

පි: තියෙනව ස්වාමීනි.

ප්‍ර: මහත්මයාගේ ඒක ගරු කොමිෂන් සභාව හමුවට ගෙනැල්ලා තියෙනවාද දැන්?

පි: ගෙනත් තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒකේ කරුණාකරලා බලන්න පිටු අංක 74?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ පිටු අංක 74 රේ තමන් සඳහන් කරපු අර උදයසිරි මහත්මයාගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඒ කියන්නේ සුදුසුකම් නොතිබිම සම්බන්ධයෙන් වාර්තා වෙලා තියෙනවද?

පි: වාර්ථා වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් මහත්මයා කිව්වා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා සම්පත් මානව අංශයට කිව්වයි කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ වගේම තමන් සඳහන් කෙරුවා උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥතුමිය ඇසු ප්‍රශ්නයකට මේ තාමත් උදය සිරි මහත්මයා රස්සාවේ ඉන්නවා මොකද මහත්යා දන්න විදියට උදය සිරි මහත්මයා සුදුසුකම් පසුව ලබාගෙන ඒ වගේම අභියාචනයක් Appeal එක ගැනත් මහත්මයා සඳහන් කෙරුවා හරි?

පි: එසේය ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් 2015 මේ ආයතනයට එන කොට තමන් රිසාඩ් බදුරුදින් හදුනන්නේ නැහැ?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: 2015 ඉඳලා 2018 තමන් අයින් වුනායි කිව්වානේ?

පි: එහෙමයි ස්වාමීනි. කොයි අකාරයෙන්ද තමන්ට විස්තර කරන්න පුළුවන්? කුළු කබ යාලුකමක්ද? සමීප ඇසුරක්ද? කොයි වගේ සම්බන්ධයක් ද ?

පි: එහෙම දෙයක් නැහැ කාර්යාලීය ඇසුරක් පමණයි ස්වාමීනි.

ප්‍ර: මාසයකට කීපාරක් විතර හම්බුනාද?

පි: මාස දෙකකට සැරයක් විතර ස්වාමීනි

ප්‍ර: කොහේදිද හම්බුනේ? අමාත්‍යාංශ රැස්වීම්වලදිද?

FAIR COMMENT BY JEZEEM

පි: අමාත්‍යාංශ රැස්වීම්වලදි හම්බුණා තවත් වරක් අපි සෑම නිලධාරියෙක්ම ඔහුගේ නිවසට කැඳෙව්වා ඒ අවස්ථාවේදී හම්බුනා උදේ වරුවේ .

ප්‍ර: දැන් මහත්මයා මේ ස්ථානය භාරගත්තේ මේ වැඩකටයුතු භාරගත්තේ සභාපතිවරයා විදියට පුද්ගලික කේෂ්ත්‍රයේ ඉඳලා ඉඳලා ඇවිල්ලා පුද්ගලික අංශයේ ඉඳලා ඇවිල්ලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයා පිළිගන්නවද? මේ පනත යටතේ IDB යටතේ මූලිකම පරමාර්ථයක් තමයි සුළු පරිමාණ,කුඩා පරිමාණ සහ මධ්‍ය පරිමාණ, ව්‍යවසායකයන්ට ඒ අවශ්‍ය අබලි ලෝහ ලබා දීම?

පි: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: ඒක කරන්නේ ඒ ව්‍යාපාර කර්මාන්ත නහාසිටුවීමට කියලා කිව්වොත් පිළිගන්නවාද?

පි: අනිවාර්යෙන් පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර: දැන් මහත්මයා වැඩ කටයුතු භාර ගන්නකොට IDB එකේ දැන් ඔබතුමා දන්නවා මුදල් අමාත්‍යාංශයේ Treasury එකෙන් එක්ක සලකන කොට මුදල් අමාත්‍යාංශයෙන් ආධාර ලබන ආයතනය තියෙනවා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: අධාර නොලබන ස්වාධින ආයතන තියෙනවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකක්ද IDB එකේ තත්ත්වය තමන් වැඩ පටන් ගන්න කොට?

පි: IDB එක පූර්ණ කාලීනව භාණ්ඩාගාරය මත යැපෙන ආයතනයක් බවට පත්වෙලා තිබුණා පාඩු ලබන ආයතනයක් බවට පත්වෙලා තිබුණා.

ප්‍ර; මහත්මයා ඔතනින් අයින් වෙනකොට?

පි: එය පාඩු නොලබන ලාභත් නොලබන ආයතනයක් බවට පත්වෙලා තිබුණා ස්වාමීනි.

ප්‍ර: එතකොට පාඩුත් නොලබන ලභාගත් නොලබන ආයතනයක් ඒ කියන්නේ උඩට ඇවිල්ලානේ තියෙන්නේ?

පි: no loss no profit sir

ප්‍ර: ඒ කියන්නේ පාඩු ලබමින් සිටි ආයතනයක් වෙලා පාඩු නොලබන තත්තවයකට ආවා?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට මහත්මයා පිළිගන්නවද ඔය පිත්තල විකිණීම තමන්ගේ ආයතනයට විශාල මුදලක් ලබා දුන්න ව්‍යාපෘතියක්?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ පිත්තල විකිණීමේ අවස්ථාව තමන්ලාට හම්බවෙන්නේ කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් මතනේ?

පි: එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ අමාත්‍ය මණ්ඩල තීරණය ගන්නේ ආරක්ෂක අමාත්‍යාංශය තුලින්නේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර; එතකොට මහත්මයා දන්නවද ඒ වෙනකොට මේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් තමන්ට යොමු කෙරුවා ඉල්ලීමක් පුළුවන් ඉක්මන්ට මේ පිත්ල ටික ඉවත් කර ගන්න කියලා?

පි: එහෙමයි ස්වාමීනි

ප්‍ර: ඒක ඉවත් කර ගත්තේ විටින් විට?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට එහෙම දැන් ඒ ඉවත් නොකෙරුවා නම් අද මේ කොමිෂන් සභාවත් නැහැනේ කොමිෂන් සභාව තියෙනවා නමුත් ඔබතුමාට එන්න වෙන්නේ නැනේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර; හරිද?

පි: එහෙමයි.

ප්‍ර: ඒ පිත්තල ඉවත් නොකෙරුවා නම් යුධ හමුදාවට වාරණයක් නැනේ ඒක පුද්ගලික අංශයට විකුණන්න?

පි; නෑ ස්වාමීනි.

ප්‍ර; එහෙම නම් ඒ පිත්තල යන්නේ පුද්ගලික අංශයට හරිනේ ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට පුද්ලික අංශයත් රජයත් අතර ඔය අබලි ලෝහ මිලදී ගැනීම සම්බන්ධයෙන් ඉතා විශාල තරඟයක් පැවතුනා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: අබලි ලෝහ මලදි ගන්න පුළුන් එකම ආයතය වශයෙන් නිතිමය වශයෙන් සංස්ථාපනය කරලා තියෙන්නේ IDB එක?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒක තමයි යුධ හමුදාව තමන්ගෙන් ඒ සම්බන්ධයෙන් විපරම් කෙරුවේ කියලා කිව්වොත් එක පිළිගන්නවද මහත්මයා?

පි: පිළිගන්නවා ස්වාමීනි.

ප්‍ර; එතකොට ඒ මත තමයි මේ පිත්තල විකිණීමේ ව්‍යාපෘතිය තමන්ලාගේ ආයතනයට ලැබෙන්න කියලා කිව්වොත් ඒක පිළිගන්නවද?

පි: එහෙමයි ස්වාමීනි

ප්‍ර; මහත්මයා කරුණාකරලා ගරු කොමිෂන් සභාවට ප්‍රකාශ කරන්න මේ පිත්තල විකණිමට අදාලව දෛනික කටයුතු සම්බන්ධයෙන් කවුද සහභාගි වුනේ?

පි: අලෙවි අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා සහ සහකාර අධ්‍යක්ෂවරයා සහ එහි කාර්ය මණ්ඩලය ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබතුමා ගරු කොමසාරිස්තුමිය ඇසු ප්‍රශ්නයකට පිළිතුරක් දෙමින් කියා සිටියා තමන්ගේ ආයතනයේ ප්‍රධාන විදායක එහෙම තමයි ඩිරෙක්ටර් ජනරාල් එහෙම අධ්‍යක්ෂක ජනරාල්තුමා?

පි: එහෙමයි ස්වාමීනි

ප්‍ර: එහෙමයි?

ප්‍ර: දැන් ඔබතුමාට රජය නියෝජනය කරමින් උගත් රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරිය ඉදිරිපත් කෙරුවා ලේඛන කිහිපයක් DPP 03,10,08,06,07,04,05.කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ලේඛන වලින් සමහර ලේඛන තමන්ට පැමිණෙන්නේ ඒ තමන් දැක්කා තමන් ප්‍රකාශ කෙරුවා ඒ ලේඛන කොලෝසස් සමාගමෙන් ආමන්ත්‍රණය කරලා තියෙන්නේ අධ්‍යක්ෂක ජනරාල්ට?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයා සඳහා කෙරුවා අධ්‍යක්ෂක ජනරාල් ඇතැම් අවස්ථා වලදී කෙරුවාද අධ්‍යක්ෂක ජෙනරාල් ඇතැම් අවස්ථාවලදි ඒ ලේඛන ඉදිරිපත් කරනවායි කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට මේ අනුමැතියන් ලබා දීම තුළින් මේ අනුමැතියන් ලබාදීමේදී තමන් සලකා බැලූ කාරණා මොනවද කියලා ගරු කොමිෂන් සභාවට කියන්න?

පි: පළවෙනියෙන්ම ස්වාමීනි සැපයුම් කරු විසින් ඉතා කෙටිකාලින වානිජමය කාල පරාසයක් තුළ මෙම ටික ඉවත් කර ගැනීමට අපිට බලපෑම් කර තිබුණා එම කාරණය. ඒ අනුව වෙළඳ පොළ ගත් කල අපගේ වෙළඳ පොල කුඩයි සාම්ප්‍රදායික වෙළඳ පොල එතකොට වෙළඳ පොළ මේ තොගයත් එක්ක බලන කොට ලොකු වෙළඳපොළකට විකුණන් සිද්ද වෙනවා ඒ කාල පරාසය තුල සහ මණ්ඩයට ලැබෙන ආදායම එමගින් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ලැබෙන ප්‍රතිලාභ බෝනස් වගේ ඒ කාලය පාඩු ලබන ආයතනයකට වඩා ලොකු තැනකට එනවා. ඒ වගේ දේවල් තමයි මා සලකලා බැලුවේ ස්වාමීනි

ප්‍ර: ඔව් දැන් පිත්තලයි තඹයි කියන්නේ අවස්ථා දෙකකදී තමන්ගේ කාල පරිච්ඡේදය තුලදි විකිණිම සඳහා තමන්ට ලැබුණු දෙයක්නේ?

පි; එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට මහත්මයා ඒ සම්බන්ධයෙන් සාක්ෂියක් දුන්නා ගරු කොමෂාරිස් ඉස්සරහා මේ ගරු කොමිෂම හමුවේ?හරිද?

පි; එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයාගෙන් ඇහුවා රජය නියෝජනය කරමින් උගත් රජයේ ජ්‍යෙෂ්ඨ අධි නීතිඥවරිය පිත්තල විකිණිමේදී සමතුලිත භාවයේ ප්‍රශ්නයක් තියෙනවද විශාල ප්‍රමාණයක් එක පුද්ගලයෙකුටත් අනෙක්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඉතිරි ප්‍රමාණය ප්‍රතශතයක් වශයෙන් ගත්තාම අනෙක් කට්ටියටත් බෙදා දීම සම්බන්ධයෙන් එහෙම ප්‍රශ්නයක් ඇහුවානේ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මම මහත්මයාගෙන් අහන්නේ ඔය කාලය තුල දී දිස්ත්‍රික් කමිටුවලින් දිස්ත්‍රික් කාර්යාල වලින් නිර්දේශ කරපු පිත්තල ප්‍රමාණයට වඩා අඩුවෙන් පිත්තල යම් යම් සුළු පරිමාණ, කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ අනෙකුත් ව්‍යාපාරිකයන්ට ලැබුණායි කියලා තමන්ට වාර්තා වෙලා තියෙනවද?

පි; නැත ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් මහත්මයා පිත්තල කිරණ තැනට යනවද? නැනේ යනවද?

පි; නෑ ස්වාමීනි.

ප්‍ර: එතකොට තමන් පනාගොඩට ගිහිල්ලා පිත්තල අරං එනවද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: හිඟුරක්ගොඩින් පිත්තල අරන් එනවද?

පි: නැත .

ප්‍ර: පිත්තල උණ්ඩ?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: එතකොට මේ ඒකට වෙනම නිලධාරින් කොටසක් ඉන්නවද?

පි; එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට තමන්ලාගේ ආයතනයේ ඇතුලේ තියෙනවද යම් යම් කරුණු පල්ලෙහා ඉඳලා උඩට නිර්දේශ කරන ක්‍රමයක්?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒක ඔය අලෙවි අංශයට විතරක් අදාළ වෙන්නේ අනෙක් අංශවලටත් අදාල වෙනවද?

පි; අනිත් අංශවලටත් අදාල වෙනවා ස්වාමීනි

ප්‍ර: දැන් තමන්ගේ ඔය නිල කාලය තුළ දී ජිනසේන මහත්මයා තමන්ගේ ඔය අලෙවි අංශය තුළින් විශාල ආදයමක් ලැබුණායි කියලා මහත්මයාත් කිව්වා ඊට ඉස්සෙල්ලා ආපු දික්වැල්ල මහත්මයාත් කිව්වා. ඊට අමතරව තමන්ලාගේ ආයතනය ප්‍රවර්ධනය කරන්න තමන් ගත්ත පියවරවල් තියෙනවා නම් ගරු කොමෂාරිස්වරුන්ට කියන්න?

පි: center of excellence robotic application ලංකාවේ පළවෙනි වරට ස්වාමීනි රොබෝ තාක්ෂණය පිළිබඳව අධ්‍යනය කිරීමට මධ්‍යස්ථානයක් පිහිටෙව්වා. මිලියන 381 ක් පමණ මුදලක් වැයකරලා ඊට අමතරව. ස්වාමීනි ලංකාවට සතොසින් හෝ වෙනත් ආයතන වලින් ගෙන්වන අහාර භාන්ඩ සාම්පල වෙක් කර බැලීම සඳහා සහ ප්‍රධාන ඕඩරය ලැබීමෙන් පස්සේ සාම්පල් සමහර ඒවා මේ ලැබිච්ච තොග සමාන ද කියලා බැලීම සඳහා පුඩ් ග්‍රේඩ් food grade විද්‍යාගාරයක් හැදුවා. SGS ආයතනය ප්‍රංශයේ SGS ආයතනයත් සමඟ පුර්ණ Accreditation . එකත් එක්ක සමකරලා ඊට අමතරව අපි ලෝහ වාස්තු අංශයට අවශ්‍ය

Parliament Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

තිබුණු ටෙස්ට් කිරීමේ උපකරණ මේ හැම Railway Department එකෙන්, ගමනා ගමන මණ්ඩලයෙන් සහ පුද්ගලික අංශයේ වාස්තු කාර්මාන්ත වලින් අපිට ගෙනත් තමයි ඒවා ටෙස්ට් කරගන්ගේ එයට ඉතාමත් අධික මිලක් අපි වැය කෙරුවා ඒ අංශය පාඩු ලබමින් තිබෙන අංශයක් එය දැන් ලාභ ලබන අංශයක් වෙලා තිබෙනවා ස්වාමීනි. කර්මාන්ත පුරවල්වල පාරවල් කවදාකවත් හදලා තිබුණ් නැහැ ස්වාමීනි. පල්ල කැලේ මාතලේ ඒ හැම දිස්ත්‍රික්කයේ තිබුණා කර්මාන්ත ප්‍රවර්ධන ප්‍රශ්න නිරාකරණය කරලා ඒවායේ පාරල් කොන්ක්‍රීට් හෝ තාර දාලා solar power lighting systems දාලා ඉවර වෙලා කර්මාන්තකරුවන්ට හුගක් පහසුකම් සැපයුවා ස්වාමීනි.

ප්‍ර: ඒ ඔක්කෝම කෙරුවේ 2015 න් පස්සේද?

පි: නඩු තීන්දුවකින් පක්ෂව අපේ හිටපු EPM enterprise promotion managers ට එය ක්‍රියාත්මක කරන්නේ නැතිව අපේ හිටපු නිලධාරියෝ හිටියා ආයතනයේ හිටපු මානව සම්පත් මම ඒ නියෝජනය DMS ට Department of management service ලෙසට ගෙනිහිල්ලා ඔන්න කතා කරලා ඔවුන්ට ඒ නිසි තැන ලබා දුන්නා. නඩු තීන්දුවක් අවාත් ඒ තීන්දුවත් ක්‍රියාත්මක කරන්නේ නැහැ අපේ කට්ටිය අධ්‍යක්ෂක ජෙනරාල්තුමා සහ පහල කට්ටිය ඒ වගේ දේවල් මම කරා ස්වාමීනි.

ප්‍ර: දැන් තමන් මහත්මයා කතා කරපු ප්‍රවර්ධන කටයුතු කෙරුවේ 2015 න් පස්සේද?

පි; එහෙමයි ස්වාවමිනි.

ප්‍ර: තමන් සභාපති කාලේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් මේ කරුණාකරලා ජිනසේන මහත්මයා ගරු කොමසාරිස් තුමාට පැහැදිලිව කියන්න මේ පිත්තල ගනුදෙනුව තුලින් මේ පිත්තල විකිණීම තුලින් ගනුදෙනුවක් නෙමේ විකිණීම තුලින් මහත්මයා පිළිගන්නවද මං ඉදිරිපත් කරපු ස්ථාවරය මේ මිලදි ගැනිම යොමු වුනේ යුද හමුදාවෙන් කියන එක?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට මහත්මයාට ඒ යම් කිසි අවස්ථාවක අමාත්‍යාං මණ්ඩල තීරණයක් අනුව තමන්ලාගේ ආයතනවලට මේ පිත්තල මිලදි ගන්නෙයි කියලා ඉල්ලිමක් නියෝගයක් Direction එකක් ආවානේ?

පි; එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ Direction එක අනුව තමන්ලාගේ ආයතනය මේ මිලදි ගැනිම සිදුකෙරුවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අවස්ථා කීපයකදි තමයි එය කෙරුවේ?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දත්තයන් කිහිපයක් සලකා බලනවා කියලා මං කිව්වොත් මහත්මයා පිළිගන්නවද ඒ එක් එක් අවස්ථාවලදි පිත්තල නිකුත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බව ?

පි; එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයා මේ පිත්තල IDB එක හරහා පිත්තල විකිණීම තුලින් මහත්මයා කිසිම පුද්ගලික ප්‍රතිලාභයක් ලබලා තියෙනවද?

පි; නැත ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු ඔබගෙන් ගරු උගත් ජනාධිපති නීතිඥවරයා ප්‍රශ්න අසන විට ඔබ කිව්වා රිසාඩ් බදුරුදීන්ගේ මහතාගේ ගෙදරට උදේ ගියා කියලා මොකක්ද ඔබ එයින් අදහස් කෙරේ?

පි: අප මණ්ඩලයේ ඉහල නිලධාරින් සහ ඔහුගේ ඔහුට අයත්ව තිබුණු 36 ක පමණ ආයතන වල නිලධාරින් ඔහු කැඳවා තිබුණා පාන්දර 07 පමණ ස්වාමනි.

ප්‍ර: ඒ කියන්නේ එක දවසකද?

පි: එක දවසක .

ප්‍ර: ඔබගේ සේවා කාලය තුළ ඔබ රිසාඩ් බදුරුදීන් ඇමතිවරයා සමඟ දුරකථනයෙන් කොපමණ අවස්ථාවල සම්බන්ධ වෙලා තියෙනවද?

පි: එක වරක් හෝ දෙවරක් ස්වාමීනි.

ප්‍ර: එකවරක් හෝ දෙවරක් පමණයි ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ කිව්ව හැටියට ඔබ ඔබගේ දුර කාලය තුළ ඔහුට හමුවෙලා තියෙන්නේ අවස්ථා දෙකකදි පමණයිද?

පි: මාස දෙකකට සැරයක් පමණ කියලා මං කිව්වේ ස්වාමීනි.

ප්‍ර: මාස දෙකකට සැරයක් ?

පි: දළ වශයෙන්.

ප්‍ර: දළ වශයෙන් එපමණයි ඔබ සහ ඇමතිවරයා අතර තිබ්බ රාජකාරිමය සම්බන්ධතා?

පි: අනිවාර්යෙන්ම ස්වාමීනි.

**********

**<u>ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා</u>**

ප්‍ර: ඔබතුමාට කිසිම චකිතයක් තියෙනවාද 2015 ඉදලා තමන් ඔය IIB එකෙන් අයින් වෙනකම් අවශ නම් ගරු කොමිෂන් සභාවට හරි ඕනෑම දෙපාර්ත මේන්තුවකට හරි තමන්ගේ ජංගම දුරකතනය ඉදිරිපත්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කරන්න ඔයව තමන් දුරකථනයෙන් සම්බන්ධ වීම සම්බන්ධයෙන් කටයුතු හොයලා බලන්න?

පි; කිසි චකිතයක් නැහැ ස්වාමීනි.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>**

ප්‍ර: දැන් ඔබෙන් ගරු ජනාධිපති නීතිඥවරයා ඇහුවා හමුදාවෙන් ඉවත් කරන මේ පිත්තල කොපු ඔබ ලබා ගත්තේ නැත්නම් පෞද්ගලික අංශයට විකුණන්න හැකියාවක් තියෙනවා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් මම තමාට යෝජනා කරනවා නමුත් කර්මාන්ත සංවර්ධන මණ්ඩලයෙන් ලබා දෙන්නේ ඒ පෞද්ගලික අංශයට නිකුත් කරනවාට වඩා සහන දායි මිලකට කියලා?

පි: ඔව් මිල කමිටුවකින් තීරණය කරලා දෙන්නේ ස්වාමීනි.

ප්‍ර: ඒක පෞද්ගලිකව මිලිදී ගන්නවා නම් ඊට වඩා වැඩි මිලක් ඒ පිත්තල සඳහාම කර්මාන්ත කරු විසින් ගෙවිය යුතු වෙනවා හමුදාවෙන් කෙලින්ම ලබා ගන්නවා නම්?

පි: ඒක තීරණය වෙන්නේ ඒ වෙලාවේ වෙළඳ පොල අගය අනුව ස්වාමීනි. london metal exchange

ප්‍ර: එසේම ඔබ සඳහන් කරා මේ විශාල ප්‍රමාණයෙන් පිත්තල කොලොසස් පුද්ගලික සමාගමට ලබා දීමේදී ඔබ සලකා බැලුවේ වාණිජමය පැත්ත වැඩියෙන් ආදයමක් එක වර ලබා ගන්න පුළුවන් සහ කාර්ය මණ්ලය ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් කියලා?

පි: කාරණා 4 ක් පමණ කිව්වා ස්වාමීනි.

ප්‍ර: ඒ කාරණා අතරින් ඔබ මේ කාරණාවත් සටහන් කරා?

පි: ඔව් කිව්වා.

ප්‍ර: මම ඔබට යෝජනා කරනවා මේ කාර්මික සංවර්ධන පනතේ සහ 2013 මාර්ගෝපදේශක අරමුණ උනේ කාර්මික සංවර්ධන මණ්ඩලයට ආදායම වැඩිකරගන්න එකවත් කාර්මික මණ්ඩලය ප්‍රතිලාභ ලබා දෙන එකවත් නෙමේ සුළු මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත කරුවන්ට ප්‍රවර්ධනය කිරීම ඒ අයගේ කර්මාන්ත පවත්වාගෙන යෑම අතහිත ලබාදීම කියලා? ඒ අනුව ඔබ ඒ කාර්මික සංවර්ධන පනතේ සහ මාර්ග 2103 මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන වලට පටහැනිවයි සභාපති වශයෙන් කටයුතු කරලා තියෙන්නේ කියලා?

පි: නැත ස්වාමීනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි සාක්ෂිකරු මුදා හරිමි .කොලෝසස් පුද්ගලික සමාගම වෙත මෙම කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලබා දුන් අබලි ද්‍රව්‍ය පිළිබඳ මේ කොමිෂම කරන විමර්ශනය සහ පරීක්ෂණය අවසන් නොමැති බවත් ඒ සම්බන්ධයෙන් සාක්ෂි ලබා දෙන තවත් සාක්ෂිකරුවන් සිටින බවත් උගත් ජනාධිපති නීතිඥවරයාට සහ දික් වැල්ල මහතා වෙනුවෙන් පෙනි සිටින උගත් නීතිඥවරයාට දන්වයි එකී සාක්ෂිකරුවන් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබාදීමට නියමිත දින ඔවුන්ට දන්නවා ඔවුන්ට අවශ්‍ය නම් මෙම සාක්ෂි කරුවන්ගෙනුත් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් ඇති බව සටහන් කර තබමි කොමිෂන් සභාවේ කටයුතු අද දින අවසන් කරමි.

කොමිෂන් සභාවේ කටයුතු හෙට උදෑසන 10. 00 තෙක් කල් තබනවා.

දැන් වේලාව: ප.ව.9.50

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

**2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.**

දිනය: 2020.07.04 වේලාව:ප.ව.03.00 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

**පෙනී සිටීම:-**

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනි සිටී.
* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනි සිටීමට අවසර දෙන ලදී.

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

| | | |
|---|---|---|
| **නම** | : | **විජේසිංහ පතිරණලාගේ සනත් ධම්මික විජේසිංහ** |
| **වයස** | : | **අවුරුදු 52** |
| **ආගම** | : | **බෞද්ධ** |
| **රැකියාව** | : | **ප්‍රධාන පොලිස් පරීක්ෂක** |
| **සේවා ස්ථානය** | : | **පොලිස් මූලස්ථානය, අපරාධ කොට්ඨාශය.** |

**සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.**

**<u>රජයේ අධිනීතිඥ දිලන්ත එස්.කළුදුරුවගේ මහතා</u>**

ප්‍ර : මහත්මයා අධ්‍යාපනය ලැබුවේ කුමන පාසලකද?

පි : මම කිරිදිවැල මධ්‍යම මහා විද්‍යාලයෙන් වාණිජ අංශයෙන් අ.පො.ස උසස් පෙළ සමත් වන තෙක් අධ්‍යාපනය ලැබුවා ස්වාමිනි.

ප්‍ර : මහත්මයා වාණිජ අංශයෙන් තමයි අධ්‍යාපනය ලැබුවේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඉන් අනතුරුව මහත්මයා ශ්‍රී ලංකාවේ පොලිසිය සම්බන්ධ වුණේ කුමන වර්ෂයකද කුමන තනතුරකටද?

පි : 1990 උප පොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් ශ්‍රී ලංකා පොලිසියට බැඳුණා ස්වාමිනි.

ප්‍ර : මේ පොලිසියට සම්බන්ධ වීමෙන් අනතුරුව මහත්මයා මූලික පුහුණුවක් ලැබුවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ පුහුණුවෙන් අනතුරුව මහත්මයා කුමන පොලිස් ස්ථානවලටද සේවයට වාර්තා කළේ?

පි : ප්‍රථමයෙන් ස්වාමිනි මා වව්නියාව කොට්ඨාශය, ඉන් අනතුරුව කැළණිය පැළියගොඩ පොලිස් ස්ථානය, නැවත ත්‍රස්වාදී විමර්ශන කොට්ඨාශයේ විමර්ශකයෙකු ලෙසද ඉන් අනතුරුව නැවත පැළියගොඩ පොලිස් ස්ථානය, ඉන් පසුව නැවතත් කැලණි පොලිස් කොට්ඨාශය, ඉන් අනතුරුව අල්ලස් කොමිෂමේ විමර්ශකයෙකු වශයෙන් අනුයුක්ත වීම සහ ඉන් අනතුරුව ත්‍රස්වාදී විමර්ශන කොට්ඨාශයේ විමර්ශකයෙකු වශයෙන් සේවයට බැඳුණා. ඉන් අනතුරුව ස්වාමිනි 2006 වර්ෂයේදී මා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාම සාධක බටයෙක් ලෙස නැගෙනහිර ටිමෝරේ වේ රාජකාරී කළා. නැවත එම රාජකාරියෙන් පසු පොලිස් මූලස්ථානයට අනුයුක්තව රාජකාරී කළා. නැවත 2012 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නැගෙනහිර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දකුණු සූඩානයේ සාම සාධක හමුදාවේ සේවය කළා. ඉන් අනතුරුව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ විමර්ශකයෙකු ලෙස එහි ඒකක හතෙහි

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ස්ථානාධිපතිවරයා වශයෙන් අවසන් වශයෙන් කටයුතු කළා ස්වාමිනි.

ප : මහත්මයා පොලිස් මූලාා අපරාධ කොට්ඨාශයට සම්බන්ධ වුණේ කුමන වර්ෂයකද?

පි : මා මූලාා අපරාධ විමර්ශන කොට්ඨාශයට සම්බන්ධ වුණේ ස්වාමිනි 2016 වර්ෂයේ.

ප : ඉන් අනතුරුව එහි කොපමණ කලක් මහත්මයා සේවය කළාද?

පි : වසර හතරකට ආසන්න කාලයක් සේවය කළා ස්වාමිනි.

ප : වසර හතරකට ආසන්න කාලයක් සේවය කළා?

පි : ඔව්.

ප : ඒ පොලිස් මූලාා අපරාධ කොට්ඨාශයේ සේවය කිරීමේදී මහත්මයාට යම් යම් මූලාා විමර්ශනවලට සහභාගි වෙන්න අවස්ථාව ලැබුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ අනුව මහත්මයාට මූලාා කටයුතු සහ මූලාා ගනුදෙනු සම්බන්ධයෙන් වන විමර්ශනයන්ට සහභාගි වී ඒ සඳහා සහභාගි වීමෙන් ලබා ගත් අත්දැකීම් මහත්මයාට තිබෙනවා?

පි : නිවැරදි ස්වාමිනි.

ප : මහත්මයා පොලිසියට සම්බන්ධ වුණේ උප පොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් කියලා ප්‍රකාශ කළා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඉන් අනතුරුව මහත්මයා උසස්වීම් ලබා ගත්තා නම් ඒ උසස්වීම් ලබා ගත් උසස්වීම සහ ලබා ගත් වර්ෂය මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න?

පි : මා 2006 වර්ෂයේදී පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන්ද නැවත 2019 වර්ෂයේදී ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන්ද උසස්වීම් ලැබුවා ස්වාමිනි.

ප : ඉන් අනතුරුව මහත්මයාට යම් අවස්ථාවක මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ රාජකාරී කිරීම සඳහා අවස්ථාවක් ලැබුණද?

පි : එහෙමයි ස්වාමිනි. 2020 පෙබරවාරි මාසේ සිට එම අවස්ථාව ලැබුණා ස්වාමිනි.

ප : ඒ අනුව මහත්මයා ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට සම්බන්ධ වෙලා මේ සම්බන්ධ වීමේ මහත්මයාගේ මූලිකම රාජකාරීය වුණේ කුමක්ද කෙටියෙන් කොමිෂන් සභාවට පැහැදිලි කරන්න?

පි : ස්වාමිනි මගේ මූලික රාජකාරීය ලෙස මට කිරීමට උපදෙස් ලබා දුන්නේ 2019/04/21 වන දින ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් මිය ගිය ත්‍රස්තවාදීන්ගේ බැංකු ගිණුම් සම්බන්ධයෙන් සහ මීට අමතරව

FAIR COMMENT BY JEZEEM

කාත්තන්කුඩි ප්‍රදේශයේදී මිය ගිය මෙම පුද්ගලයන්ගේ බැංකු ගිණුම් සහ මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට.

ප්‍ර : දැන් ඔය මහත්මයා මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ බැංකු ගිණුම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී ඒ මූලික ලේඛනයක් වශයෙන් යම් කිසි ලේඛනයක් පාවිච්චි කරලා තිබෙනවද? එම විමර්ශනය ආරම්භ කිරීම සඳහා යම් කිසි ලේඛනයක් භාවිතා කරනවාද?

පි : එහෙමයි ස්වාමිනි. මූලික වශයෙන් අපි සිදු කරන්නේ මෙම ත්‍රස්තවාදීන්ගේ තොරතුරු ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවලට ඉදිරිපත් කරලා ඔවුන් ලබා දෙන තොරතුරු අනුව මෙම ත්‍රස්තවාදීන් ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල පවත්වාගෙන ගිය බැංකු ගිණුම් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම.

ප්‍ර : තොරතුරු ලබා ගැනීම. ඒ බැංකුවලින් ලැබෙන තොරතුරුවලට අමතරව මහත්මයා මේ විමර්ශනයේදී යම් කිසි වෙනත් විමර්ශන ආයතනවලින් ලබා ගත් විමර්ශන ද්‍රව්‍ය මහත්මයාගේ විමර්ශනයට භාවිතා කරලා තිබෙනවාද?

පි : එහෙමයි ස්වාමිනි. විශේෂයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයෙන් තොරතුරු ලබා ගන්නවා. ඊට අමතරව සමාගම් රෙජිසිට්‍රාර් දෙපාර්තමේන්තුවෙන්ද මීට අවශ්‍ය තොරතුරු ලබා ගන්නවා ස්වාමිනි.

ප්‍ර : දැන් මහත්මයාගේ ඔය විමර්ශන කාර්ය භාරයේදී මේ කොලෝසස් කියලා තඹ කර්මාන්ත ශාලාවක හිමිකරුගෙන් සහ එම කර්මාන්ත ශාලාවෙහි නාමයෙන් පවත්වාගෙන ගිය ගිණුම් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිද්ධ කරලා තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි. 2019/04/21 වන දින මිය ගිය ත්‍රස්තවාදීන්ගේ ජාතික හැඳුනුම්පත් මූල්‍ය ආයතනවලට ලබා දීලා එයින් ලැබුණු තොරතුරු අනුව මෙම විමර්ශන ඉදිරියට කර ගෙන ගියා. එහිදී ඉන්ෂාෆ් අහමඩ් යන බෝම්බකරුවා කොලෝසස් ප්‍රයිවඩ් ලිමිටඩ් සමාගම නමින් සමාගමකින් ආරම්භ කරන ලද ගිණුම් පවත්වාගෙන යනවා කියලා තොරතුරු ලැබුණා. ඊට අමතරව ස්වාමිනි මෙම පුද්ගලයා ඔහුගේ පුද්ගලික ගිණුම් වශයෙන් ගිණුම් කිහිපයක් ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල පවත්වාගෙන ගොස් තියෙනවා කියලා අනාවරණය වුණා.

ප්‍ර : දැන් ඔය ඉන්ෂාෆ් අහමඩ් කියන තැනැත්තාගේ සම්පූර්ණ නම මහත්මයාට අනාවරණය වුණාද විමර්ශනයේදී?

පි : එහෙමයි ස්වාමනි. ඔහුගේ නම මොහොමඩ් සම්පූර්ණ නම ස්වාමිනි මොහොමඩ් ඊබ්‍රහීම් ඉන්ෂාෆ් අහමඩ් ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය 831260645 V.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔය ඉන්ෂාෆ් අහමඩ් කියන තැනැත්තා මොහොමඩ් ඊබ්‍රහීම් ඉන්ෂාෆ් අහමඩ් කියන තැනැත්තා මරාගෙන මැරෙන බෝම්බකරු තමන්ගේ පෞද්ගලික නාමයෙන් ලංකාවේ බැංකු කීයක ගිණුම් පවත්වාගෙන ගොස් තිබුණද?

පි : ස්වාමිනි මොහොමඩ් ඊබ්‍රහීම් ඉන්ෂාෆ් අහමඩ් යන පුද්ගලයා අමානා බැංකුවේ ගිණුම් එකක්, කොමර්ෂල් බැංකුවේ ගිණුම් හතරක් සහ නේසන් ට්‍රස්ට් බැංකුවේ ගිණුමක් පවත්වාගෙන ගොස් තියෙනවා. ඊට අදාළ සාරාංශයක් මම සකස් කරලා තියෙනවා ස්වාමිනි. තවදුරටත් ස්වාමිනි මෙම පුද්ගලයා කොටස්කරුවෙකු සහ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් කටයුතු කරන කොලොසස් සමාගමේ ගිණුම් දෙකක් සම්බන්ධයෙනුත් තොරතුරු ලබා ගත්තා.

ප්‍ර : මහත්මයා දැන් මහත්මයා කිව්වා මේ තැනැත්තා ලංකාවේ වාණිජ බැංකු කිහිපයක තමන්ගේ පෞද්ගලික නාමයෙන් ගිණුම් පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම බැංකු අතුරින් කුමන බැංකුවලද මේ බැංකු ගිණුම් පවත්වාගෙන ගිහිල්ලා තියෙන්නේ?

පි : ස්වාමිනි කොමර්ෂල් බැංකුවේ ගිණුම් හතරක් පවත්වාගෙන ගිහිල්ලා තියෙනවා. අමානා බැංකුවේ එක ගිණුමයි. නේසන් ට්‍රස්ට් බැංකුවේ එක ගිණුමක් සහ නේසන් ට්‍රස්ට් බැංකුවේ තවත් ඔහුට අයත් ක්‍රෙඩිට් කාඩ්පතක් පාවිච්චි කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : දැන් ඔය මහත්මයා කියපු දැන් අපි එක් එක් බැංකුවේ ගිණුම් විස්තර සම්බන්ධයෙන් සාරාංශ සටහනක් ගරු අධිකරණයට සංෂිප්තව ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනවා ගරු මැතිතුමනි. ඒ අනුව ඔය අමානා බැංකුවේ පවත්වාගෙන ගිය ගිණුම් එක ගිණුමක්නේ පවත්වාගෙන ගියා කිව්වේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ ගිණුම් අංකය කුමක්ද?

පි : ගිණුම් අංකය 8100003054

ප්‍ර : නැවත නිවැරදිව කියන්න එය නෙවේ ගිණුම් අංකය නැවත නිවැරදිව බලලා කියන්න?

පි : 0010301920001 ස්වාමිනි.

ප්‍ර : නැවත එම ගිණුම් අංකය ගරු අධිකරණයට ඉදිරිපත් කරන්න? නැවත කියන්න ගරු අධිකරණය?

පි : 0010301920001

ප්‍ර : මෙම ගිණුම කුමන ශාඛාවකද පවත්වාගෙන ගොස් තිබෙන්නේ?

පි : මෙම ගිණුම ස්වාමිනි එම ගිණුමට අදාළ mandate පත්‍රයට අනුව මෙම ගිණුම අමානා බැංකුවේ ආරම්භ කර තිබෙන්නේ 2017/08/09 වන දින.

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහත්මයා ඔබට යම් බාධා කිරීමක් කරනවා මේ අවස්ථාවේදී. මහත්මයා දැන් අර අමානා බැංකුවේ පවත්වාගෙන ගිය ගිණුමක මුල්ම අවස්ථාවේදී යම් කිසි ගිණුම් අංකයක් ප්‍රකාශ කළා නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එය නිවැරදි නැහැ නේද ඒ ගිණුම් අංකය මුල්ම අවස්ථාවේ කියපු ගිණුම් අංකය. ඒ අනුව මහත්මයා දෙවෙනි අවස්ථාවේ නේද එම ගිණුම් අංකය නිවැරදිව ප්‍රකාශ කළේ ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ දෙවෙනිය ප්‍රකාශ කළ ගිණුම් අංකය ආපහු කියන්න?

පි : 0010301920001

ප්‍ර : ස්තූතියි. ඒ අනුව මෙම ගිණුම කුමන ස්වභාවයේ ගිණුමක්ද මහත්මයා? මෙය ඉතිරි කිරීමේ ගිණුමක්ද නැත්නම් ජංගම ගිණුමක්ද?

පි : මෙම ගිණුම ස්වාමිනි ඉතිරි කිරීමේ ගිණුමක්.

ප්‍ර : ඒ වගේම මෙහි ගිණුම ආරම්භ කිරීමේ අරමුණ වශයෙන් දක්වා තිබෙන්නේ කුමක්ද?

පි : ස්වාමිනි business transaction වශයෙන් සඳහන් වෙනවා. ව්‍යාපාරික ගනුදෙනු කිරීම සඳහා.

ප්‍ර : ඒ ආකාරයෙන් තමයි පවත්වාගෙන ගිහිල්ලා තිබෙන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඉන් අනතුරුව මහත්මයා මෙම මරාගෙන මැරෙන බෝම්බකරු විසින් නේසන් ට්‍රස්ට් බැංකුවේ පවත්වාගෙන ගිය ගිණුම් දෙකක් පවත්වාගෙන ගිය බව කිව්වා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ ගිණුම් දෙක සම්බන්ධයෙන් ගිණුම් අංක සහ ඔය මුලින් සඳහන් කළ විස්තර මේ ගරු අධිකරණයට සඳහන් කර සිටින්න?

පි : ස්වාමිනි මෙම ගිණුමෙන් තොරතුරු අපි ලබා ගත්තා විමර්ශනය සඳහා. ඒකේ එක් ගිණුමක් නේසන් ට්‍රස්ට් බැංකුවේ අංකය 8100003054. මෙම ගිණුමේ 2007 වර්ෂයේ සිට ගනුදෙනු සිදු වී නැහැ කියලා අදාළ බැංකුව වාර්තා කරලා තියෙනවා ස්වාමිනි. ඊට අමතරව මෙම බැංකුවේම ක්‍රෙඩිට් කාඩ්පතක් මෙම පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත අනුව පාවිච්චි කරන බව තොරතුරු තියෙනවා ස්වාමිනි. එම ක්‍රෙඩිට් කාඩ්පතේ අංකය 376657954910033 මෙම බැංකුවෙන් ලබා ගත් තොරතුරු වලට අනුව ස්වාමිනි මෙම ප්‍රධාන කාඩ්පත නිකුත් කරලා තියෙන්නේ ඉන්ෂාෆ් අහමඩ් යන අයගේ පියාට. පියාගේ නම මොහොමඩ් ඊබ්‍රහීම් කියලා සඳහන් වෙනවා. මෙම පුද්ගලයා මේ පාවිච්චි කරලා තියෙන්නේ බැංකුවෙන් ලබා දුන් අමතර කාඩ්පත. එම ක්‍රෙඩිට් කාඩ්පතට අදාළ ලේඛන ලබා ගෙන අපි පරීක්ෂා කළා ස්වාමිනි විශාල වශයෙන් මෙම ක්‍රෙඩිට්

FAIR COMMENT BY JEZEEM

කාඩ්පත පාවිච්චි කරලා ගනුදෙනු සිදු කරලා නැහැ කියලා අනාවරණය වුණා ස්වාමිනි.

ප්‍ර : ඉන් අනතුරුව මේ තැනැත්තා කොමර්ෂල් බැංකුවේ ගිණුම් හතරක් පවත්වාගෙන ගිය බවට මහත්මයා දැනටමත් සාක්ෂි ලබා දීලා තිබෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම ගිණුම් සම්බන්ධයෙන් සංෂිප්ත විස්තරයක් ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න?

පි : කොමර්ෂල් බැංකුවේ ඉන්ෂාෆ් අහමඩ් ගිණුමක් ආරම්භ කරලා තියෙනවා ස්වාමිනි. එහි අංකය පළවෙනි ගිණුම 8240004772. මේ ගිණුම ආරම්භ කරලා තියෙන්නේ 2004/11 /24. ගිණුම 2015/06/04 වන දින වසා දමා තිබෙනවා. එම ගිණුම ඉතිරි කිරීමේ ගිණුමක්. දෙවෙනි ගිණුම ස්වාමිනි කොමර්ෂල් බැංකුවේ එය ජංගම ගිණුමක්. එහි අංකය 1240010760. ගිණුම ආරම්භ කරලා තියෙන්නේ 2010/03/16. මේ අවස්ථාව වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය මඟින් මෙම ගිණුම අත්හිටුවා තිබෙනවා. ගිණුම පරීක්ෂා කිරීමේදීත් සැක කටයුතු ගනුදෙනු වාර්තා වෙලා නැහැ ස්වාමිනි. තුන්වෙනි ගිණුම කොමර්ෂල් බැංකුවෙමයි. කොමර්ෂල් බැංකුවේ පෙටා ශාඛාවේ පිට කොටුවේ ශාඛාවේ එම ගිණුම අංකය 1240010761. ජංගම ගිණුමක්. මෙම ගිණුම මුස්තාෆා මොහොමඩ් යන පුද්ගලයා සමඟ සම්බන්ධ වී joint account එකක් වශයෙන් පවත්වාගෙන ගිහිල්ලා තියෙනවා. ගිණුම ආරම්භ කරලා තියෙන්නේ 2010/03/16 එම ගිණුම ස්වාමිනි 2010/12/31 වෙනි දින වසා දමා තියෙනවා. කොමර්ෂල් බැංකුවේ අවසන් ගිණුම පිට කොටුව ශාඛාවේ පවත්වාගෙන ගිහිල්ලා තියෙනවා. ජංගම ගිණුමක්. අංක 1240015770 මෙම ගිණුම ආරම්භ කරලා තියෙන්නේ 2016/03/31. මේ අවස්ථාව වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශය විසින් මෙම ගිණුමත් අත්හිටුවලා තියෙනවා. ගිණුම පරීක්ෂා කිරීමේදීත් සැලකිය යුතු ගනුදෙනු වාර්තා වෙලා නැහැ ස්වාමිනි.

**ඒ අනුව ගරු මැතිතුමනි දැනටමත් සාක්ෂිකරු විසින් සාක්ෂි ලබා දෙන ලද එම ගිණුම්වල විස්තර ඇතුළත් සාක්ෂිකරු විසින් පිළියෙල කරන ලද සංෂිප්ත වාර්තාවක් C 791 වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.**

ප්‍ර : දැන් ඔය මහත්මයා මේ ප්‍රකාශ කළේ මේ මරාගෙන මැරෙන බෝම්බකරුවෙක් වෙච්ච ඉන්ෂාෆ් අහමඩ් කියන අය තමන්ගේ පෞද්ගලික නාමයෙන් ශ්‍රී ලංකාවේ පිළිගත් මූල්‍ය ආයතනවල පවත්වාගෙන ගිය ගිණුම් සම්බන්ධයෙන් විස්තරයක්?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මේ තැනැත්තා යම් කිසි ව්‍යාපාරයක හිමිකරුවෙක් වෙලා තිබෙනවා කියලා මහත්මයාගේ විමර්ශනයේදී අනාවරණය වෙලා තියෙනවාද?

පි : එහෙමයි ස්වාමිනි. මෙම පුද්ගලයා කොලොසස් ප්‍රයිවේට් ලිමිටඩ් PV 78667 එම සමාගම ආරම්භ කරලා තියෙන්නේ 2011/05/05 වෙනි දින. එකේ ලිපිනයන් දෙකක් තියෙනවා ස්වාමිනි. පළවෙනි ලිපිනය 104, නිවුමුවර් ස්ට්‍රීට් , කොළඹ 12. එම ලිපිනය 2016/01/16 වෙනි දින වෙනස් වෙලා තියෙනවා. ඊට පස්සේ පාවිච්චි කරලා තියෙන්නේ නොම්බර් 37, ඕල්ඩ්මුවර් ස්ට්‍රීට්, කොළඹ 12 කියන ලිපිනය ස්වාමිනි. මෙම සමාගමේ අධ්‍යක්ෂකවරයෙක් සහ කොටස්කරුවෙක් ලෙස ඉන්ෂාෆ් අහමඩ් කටයුතු කරලා තියෙනවා. 2019/03/27 වන දින මෙම සමාගමේ කොටස් හිමිකාරත්වය පවරා දීලා තියෙනවා ස්වාමිනි. ඒ පවරා දීලා තියෙන්නේ මොහොමඩ් යුෂුෆ් මොහොමඩ් ඊබ්‍රහීම් කියන පුද්ගලයාට. ඒ පුද්ගලයා මේ ඉන්ෂාෆ් අහමඩ්ගේ පියා. අනිත් එක්කෙනා ස්වාමිනි ඉන්ෂාෆ් අහමඩ්ගේ බිරිඳ ෆාතිමා සිෆ්කා ඉන්ෂාෆ් අහමඩ්. මෙම සමාගමේ තවදුරටත් පරීක්ෂා කිරීමේදී auditors විගණකයන් වශයෙන් දණසිංහ සහ සමාගම කටයුතු කරලා තියෙනවා. ලේකම්වරුන් ලෙස VS corporate solution private limited නොම්බර් 17, Temple road, මහරගම ලිපිනයේ පදිංචි ආයතනයක් කටයුතු කරලා තියෙනවා ස්වාමිනි. මෙම සමාගමට pin number එකක් තියෙනවා tax Identification Number එකක්.

ප්‍ර : ඒ අනුව ඔවුන් නිසි පරිදි එම ඒ බදු ගෙවීම් ආදීය සිද්ධ කරලා තිබෙන බව විමර්ශනයේදී අනාවරණය වෙලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් මෙම ඔය කොලොසස් සමාගම වෙනුවෙන් යම් කිසි ගිණුම් පවත්වාගෙන යාමක් සිද්ධ වෙලා තිබෙනවාද ලංකාවේ වාණිජ බැංකුවල?

පි : එහෙමයි ස්වාමිනි. මෙම සමාගම විසින්

ප්‍ර : පවත්වාගෙන යාමක් සිද්ධ වෙලා තිබෙනවාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ගිණුම් කීයක් පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවාද මහත්මයා?

පි : ප්‍රධාන ගිණුම් 02 ක් පවත්වාගෙන ගිහිල්ලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : ඒ කුමන බැංකුවලද පවත්වාගෙන ගිහිල්ලා තිබෙන්නේ?

පි : කොමර්ෂල් බැංකුවේ පිට කොටුවේ ශාඛාවේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහි මුල් ගිණුමෙහි එම ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වන mandate පත්‍ර මහත්මයාගේ විමර්ශනයේදී ලබා ගැනීමට හැකි වෙලා තිබෙනවාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව එම mandate පත්‍ර බැංකුවලින් ලබා ගැනීමෙන් අනතුරුව එම ගිණුම්වල ගිණුම් අංක අනාවරණය වීමක් සිද්ධ වුණාද?

පි : එහෙමයි ස්වාමිනි. එක ගිණුමක් තියෙනවා මේ ගිණුම ආරම්භ කරලා තියෙන්නේ 2014/07/03 වන දින. එම ගිණුමේ අංකය 1010003330 මේ ගිණුම ඇමරිකානු ඩොලර් ගිණුමක් ස්වාමිනි. එය ජංගම ගිණුමක්.

ප්‍ර : කුමන ශාඛාවකද පවත්වාගෙන ගොස් තිබෙන්නේ?

පි : පිට කොටුව ශාඛාව කොමර්ෂල් බැංකුව.

ප්‍ර : එහි ආරම්භක දිනය වශයෙන් සඳහන් වන්නේ කවදාද ගිණුමේ?

පි : 2014/07/03 වෙනිදා .

ප්‍ර : මෙම ගිණුම ආරම්භ කිරීමෙහි අරමුණ වශයෙන් කුමක්ද දක්වා තිබෙන්නේ? Purpose of opening?

පි : මෙහි සඳහන් වෙනවා ස්වාමිනි Business ඉංග්‍රීසියෙන් තියෙනවා purpose for opening the account of and the usage business transaction කියලා සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : මෙහි ගිණුම විවෘත කරන අවස්ථාවේදී මේ ව්‍යාපාරයේ ස්වභාවය කොයි ආකාරයෙන්ද කියලා විස්තර කරලා තිබෙනවද එම mandate පත්‍රයේ?

පි : එහෙමයි ස්වාමිනි. ඒක ඉංග්‍රීසියෙන් තියෙනවා Nature of business සඳහන් කරලා තියෙනවා export of copper and aluminium

**ගරු මැතිතුමනි මේ අවස්ථාවේදී ඉන්ෂාෆ් අහමඩ් යන අය විසින් කොළඹ කොටුව පෙටා ශාඛාවෙහි පවත්වාගෙන යන ලද ගිණුම් අංක 1010003330 දරන ගිණුමෙහි mandate පත්‍රය C 792 වශයෙන් සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.**

ප්‍ර : දැන් ඔය ගිණුම් වලින් සිදු වුණු මූල්‍ය ගනුදෙනුවල ස්වභාවය සම්බන්ධයෙන් මහත්මයාට සංෂිප්ත විස්තරයක් ගරු අධිකරණයට ඉදිරිපත් කරන්න පුළුවන්ද ඒ කියන්නේ ආරම්භ කළ වර්ෂයේ සිට මෙම ප්‍රහාරය සිදු වෙච්ච 2019 වර්ෂය සඳහා ඒ එක් එක් වර්ෂයේ සිදු වන ගනුදෙනුවල දළ විස්තරයක් මහත්මයාට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමිනි. මෙම ඇමරිකානු ඩොලර් ගිණුම විශ්ලේෂණය කිරීමේදී 2014 සිට 2019 දක්වා මෙම ගිණුමට ලැබූ ඇමරිකානු

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඩොලර් ප්‍රමාණය සම්බන්ධයෙන් සාරාංශ ගත කිරීමක් කළා. ඒ අනුව 2014 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් මිලියන 2.6 ක්, 2015 වර්ෂයේදී 62719 ක්, 2016 වර්ෂයේදී 550248 ක්, 2017 වර්ෂයේදී 615278 ක්, 2018 වර්ෂයේදී 2843181 ක්, 2019 වර්ෂයේදී 2046219 ක් ආදී වශයෙන් 2014 සිට 2019 දක්වා මෙම එක් ගිණුමට ඇමරිකානු ඩොලර් මිලියන 8.7 කට ආසන්න ප්‍රමාණයක් ලැබිලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : ඒ සියළුම මුදල් ලැබීම සිද්ධ වෙලා තිබෙන්නේ ඇමරිකානු ඩොලර්වලින් තමයි ඒ මුදල් ලැබිලා තියෙන්නේ?

පි : එහෙමයි ස්වාමිනි. මෙම ඩොලර් විශේෂයෙන් මේ මුදල් ලැබිලා තියෙන්නේ තඹ අපනයනය කිරීමෙන් බව පැහැදිලි වෙනවා අපිට ලබා ගත්ත ලේඛන අනුව. ඉන්දියාවෙන් තමයි ස්වාමිනි මේ මුදල් ලැබිලා තියෙන්නේ. ඉන්දියාවේ සමාගම් ප්‍රමාණය සඳහන් වෙලා තියෙනවා ස්වාමිනි සාමාන්‍යයෙන් 50 කට වැඩි. ඒ සම්බන්ධයෙනුත් සාරාංශයක් සකස් කරලා තියෙනවා ස්වාමිනි.

**ගරු මැතිතුමනි සාක්ෂිකරු විසින් දැනටමත් සාක්ෂි ඉදිරිපත් කර තිබෙන ඉන්ෂාෆ් අහමඩ් යන අය විසින් පවත්වාගෙන යන ලද ගිණුම් අංක 1010003330 දරන ගිණුම සම්බන්ධයෙන් 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වන මූල්‍ය ගනුදෙනුවල සාරාංශය දැක්වෙන සටහනක් C 793 වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.**

ප්‍ර : දැන් මහත්මයා මේ ගරු අධිකරණයට සාක්ෂි ලබා දුන්නා මේ ගනුදෙනු ව්‍යාපාරය සිදු කිරීමේදී මේ තඹ අපනයනයෙන් ලැබුණු ආදායම් වශයෙන් ගිණුමට ලැබුණු මුදල් කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : සහ ඒ සම්බන්ධයෙන් මුදල් එක් එක් වර්ෂවල ලැබීම සංෂිප්තව ලබා දුන්න සටහනකුත් මහත්මයා ඉදිරිපත් කරන බවට සාක්ෂි ලබා දුන්නා?

පි : නිවැරදි ස්වාමිනි.

**ගරු මැතිතුමනි මේ අවස්ථාවේදී එම ගිණුම සම්බන්ධයෙන් මුදල් ලැබීම්වල විස්තරය දැක්වෙන සාරාංශ ගත සටහනක් ගරු අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා. ගරු මැතිතුමනි මෙම සම්පූර්ණ කාල සීමාව මුළුල්ලේම මෙම ගිණුමට මුදල් ලැබීම සම්බන්ධයෙන් වන සාරාංශ ගත සටහන C 794 වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.**

ප්‍ර : දැන් මහත්මයා මේ ගිණුමවලට මුදල් ලැබුණු ආකාරය ගැන වැඩිදුරටත් විමර්ශනය කිරීමේදී මේ එක් එක් ආයතනවලින් ලැබුණු මුදල් කොයි ආකාරයෙන්ද බැංකුවලට ලැබී ඇත්තේ සහ

Fair Comment by Jezeem

ඒ සම්බන්ධයෙන් හරස් විමසීමක් සිදු කිරීම සඳහා වන යම් කිසි ලේඛනයක් පරීක්ෂා කරලා බැලුවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම ලේඛනය හඳුන්වන නම කුමක්ද සාමාන්‍යයෙන් බැංකු ව්‍යවහාරයේදී කුමන නමින්ද එම ලේඛනය හඳුන්වන්නේ?

පි : ස්වාමිනි අහඹු ලෙස මේ මුදල් එන රටවල් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට අවශ්‍යයි. ඒක හඳුන්වන්නේ swift messages එකක් කියලා.

ප්‍ර : නැවත කියන්න ගරු අධිකරණයට එම නම?

පි : swift messages

ප්‍ර : කොහොමද ඒක pronounce වෙන්නේ?

පි : SWIFT.

ප්‍ර : swift message එක විදිහට තමයි හඳුන්වන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව මහත්මයාට මේ එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් වන ඒ swift පත්‍ර ලබා ගැනීමට හැකියාව ලැබුණද?

පි : එහෙමයි ස්වාමිනි. විමර්ශනය සඳහා එම ලේඛන ලබා ගත්තා අදාළ බැංකුවෙන්.

**ගරු මැතිතුමනි මේ අවස්ථාවේදී මෙම සාක්ෂිකරු විසින් එම ලබා ගත් විශාල ප්‍රමාණයක් වන swift පත්‍ර අතුරින් කිහිපයක් මෙම ගරු අධිකරණයේ ගෞරවනීය පරිශීලනය සඳහා මේ අවස්ථාවේදී ලකුණු කොට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනවා.**

ප්‍ර : දැන් ඔය කියන ගිණුම්වල වර්තමාන තත්ත්වය කුමක්ද මහත්මයා මේ ගිණුම් තවමත් ක්‍රියාකාරී තත්ත්වයේ පවතිනවාද එහෙම නැත්නම් කුමක්ද දැන් මේ ගිණුම්වලට සිදු වී තිබෙන්නේ?

පි : ස්වාමිනි මෙම ගිණුම් මේ වන විට අත්හිටුවා තිබෙනවා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය මඟින්.

ප්‍ර : මේ ගිණුම දැනට සඳහන් කරලා තිබෙන ගිණුම අත්හිටුවා තිබෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් මහත්මයා පෙර සඳහන් කළා මෙම බෝම්බකරු විසින් කොමර්ෂල් බැංකුවේ තවත් ගිණුමක් කොලොසස් ආයතනය නමින් පවත්වාගෙන යනවයි කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම ගිණුම් අංකය කුමක්ද මහත්මයා?

පි : එම ගිණුම් අංකය 1240011707

ප්‍ර : 1240011707 ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : එම ගිණුම පවත්වාගෙන ගොස් තිබෙන්නේ කුමන නමකින්ද? Name of the accounts වශයෙන් හැඳින්වෙන්නේ කුමක්ද?

පි : ඒකත් කොලොසස් ප්‍රයිවඩ් ලිමිටඩ් නමින් තමයි ස්වාමිනි ආරම්භ කරලා තියෙන්නේ.

ප්‍ර : කුමන ශාඛාවකද එය පවත්වාගෙන ගොස් තිබෙන්නේ?

පි : කොමර්ෂල් බැංකුව පිටකොටුව ශාඛාව.

ප්‍ර : එම ගිණුමෙහි ස්වභාවය කුමක්ද? Type of account වශයෙන් දක්වා තිබෙන්නේ?

පි : ස්වාමිනි මෙම ගිණුම ශ්‍රී ලංකාවේ රුපියල් ගිණුමක් ලෙස තමයි පවත්වාගෙන ගිහිල්ලා තියෙන්නේ.

ප්‍ර : මම ගිණුම කවදද ආරම්භ කරලා තිබෙන්නේ?

පි : ගිණුම ආරම්භ කරලා තිබෙන්නේ 2011/05/31 ස්වාමිනි ජංගම ගිණුමක්.

ප්‍ර : ජංගම ගිණුමක් හැටියට තමයි පවත්වාගෙන ගොස් තිබෙන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මෙම ගිණුම ආරම්භ කිරීමේ අරමුණ වශයෙන් දක්වා තිබෙන්නේ?

පි : මෙහි අරමුණත් ස්වාමිනි Business transaction ලෙස සඳහන් වෙනවා. ව්‍යාපාරික කටයුතු සඳහා.

ප්‍ර : ව්‍යාපාරික කටයුතු සඳහා. එහි ව්‍යාපාරයේ ස්වභාවය දක්වා තිබෙනවාද?

පි : ස්වාභවය දක්වා තිබෙනවා manufacturing brass and copper

**ඒ අනුව ගරු මැතිතුමනි සාක්ෂිකරු විසින් දැනටමත් සාක්ෂි ලබා දී ඉදිරිපත් කරන ලද අංක 1240011707 දරන ගිණුමේ mandate පත්‍රය C 795 වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.**

ප්‍ර : දැන් ඔය ගිණුමෙත් මහත්මයා විමර්ශන කටයුතුවලදී අනාවරණය වුණාද එක් එක් වර්ෂයන් වල කොයි ආකාරයෙන්ද මේ ගනුදෙනු සිද්ධ වෙලා තිබෙන්නේ කියලා?

පි : එහෙමයි ස්වාමිනි. මෙම ජංගම ගිණුමේ විශාල ගනුදෙනු ප්‍රමාණයක් සිදු වෙලා තියෙනවා. 2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සාරාංශ ගත කර විශ්ලේෂණය කිරීමේදී මෙම ගිණුමට ලැබිලා තියෙනවා රුපියල් මිලියන 5414 කට ආසන්න ප්‍රමාණයක්. ඒක ගිණුමට ක්‍රෙඩිට් වශයෙන් ලැබිලා තියෙනවා. ගිණුමෙන් ඉවත් කර ගෙන තියෙනවා මිලියන 5406 ක ප්‍රමාණයක්. මේ අවස්ථාවේදී කිව යුතුයි ස්වාමිනි මෙම ගිණුම සම්බන්ධයෙන් විමර්ශන කිරීමේදී මම ඉහතින් සඳහන් කළ ඇමරිකානු ඩොලර් ගිණුමට මුදල් ලැබුණට පස්සේ එම ගිණුමෙන්

FAIR COMMENT BY JEZEEM

මොවුන් කෙළින්ම මෙම 707 කියන ශ්‍රී ලංකා රුපියල් ගිණුමට ඇමරිකානු ඩොලර් යොමු කරනු ලබනවා.

ප්‍ර : නැවත එම පැහැදිලි කිරීම ගරු කොමසාරිස්වරුන්ගේ පහසුව සඳහා වඩාත් සවිස්තරව ඉදිරිපත් කරන්න කුමක්ද මේ ඩොලර් ගිණුම සහ ශ්‍රී ලංකන් ගිණුම අතරෙහි පවතින මේ සම්බන්ධතාවය එහෙම නැත්නම් මේ link එක කුමක්ද කියලා මේ කොමසාරිස්වරුන්ට පැහැදිලි කරන්න?

පි : ස්වාමිනි තඹ අපනයනයෙන් ඉන්දියාවෙන් ඇමරිකානු ඉන්දියාවෙන් ලැබිය යුතු අදාළ සමාගමින් ලැබිය යුතු මුදල් ඇමරිකානු ඩොලර් වශයෙන් තමයි මම ඉහතින් සඳහන් කළ ඉන්ෂාෆ් අහමඩ් එහෙම නැත්නම් කොලොසස් සමාගමට අයත් 1010003330 දරන ඇමරිකානු ඩොලර් ගිණුමට ලැබෙන්නේ. ඒ ලැබුණාට පස්සේ ස්වාමිනි එම ගිණුමෙන් ඇමරිකානු ඩොලර් ඉවත් කිරීමට අවස්ථාවක් නොමැති නිසා එම සල්ලි රුපියල් ගිණුමට අංක 1240011707 දරන ශී ලංකා රුපියල් ගිණුමට ඔවුන් මාරු කරනු ලබනවා. එසේ මාරු කර එම ගිණුමෙන් රුපියල් ලෙස මුදල් ඉවත් කර ගැනීම් සිදු කරනවා ස්වාමිනි.

ප්‍ර : ඒ රුපියල් හැටියට තමයි අවසානයේදී මුදල් ඉවත් කර ගැනීම සිද්ධ කරන්නේ?

පි : එහෙමයි ස්වාමිනි. මම සඳහන් කළ ආකාරයට ඒ රුපියල් ගිණුමේ සාරාංශයක් තමයි මම සඳහන් කළේ. රුපියල් ගිණුමේ සාරාංශය සම්පූර්ණයෙන්ම 2011 සිට 2019 දක්වා සඳහන් කළොත් මිලියන 5414 ක් පමණ රුපියල් වශයෙන් ලැබිලා තියෙන බව පෙනී යනවා ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ මිලියන 5000 කට වඩා වැඩි මුදලක් ලැබී තිබෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

**ගරු මැතිතුමනි මෙම 1240011707 දරන ගිණුම සම්බන්ධයෙන් 2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වන මුදල් ගනුදෙනුවල සාරාංශය දැක්වෙන සටහනක් C 796 වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.**

ප්‍ර : මේ සංෂිප්ත සටහන මහත්මයා විසින් තමයි පිළියෙල කරනු ලැබුවේ?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔය ගිණුම්වල සිදු වෙච්ච ගනුදෙනු විශ්ලේෂණය කර ගෙන යාමේදී යම් අවස්ථාවක ඔය දැනටමත් අපි කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා තිබෙන 1240011707 දරන ගිණුමෙන් යම් කිසි සැක සහිත ගනුදෙනුවක් සිදු වූ බවට කරුණු අනාවරණය වීමක් සිද්ධ වෙලා තිබෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි මෙම ගිණුම විශ්ලේෂණය කිරීමේදී මූලික වශයෙන් 2019 අප්‍රේල් 09 ඉඳලා 2019 අප්‍රේල් 18 දක්වා කාලය තුළ මෙම බැංකුවෙන් මිලියන 77 කට ආසන්න සංඛ්‍යාවක් ඉවත් කර ගෙන තියෙනවා.

ප්‍ර : ඒ මිලියන 77 කට ආසන්න සංඛ්‍යාවක් මුදල් ප්‍රමාණයක් ඉවත් කර ගෙන තිබෙනවා යැයි කරුණු අනාවරණය වෙලා තිබෙන්නේ කවුරු විසින්ද?

පි : ස්වාමිනි මූලික වශයෙන් 2019 අප්‍රේල් 18 වෙනිදා චෙක්පතක් මඟින් මිලියන 5 ක මුදලක් ඉවත් කර ගෙන තියෙනවා. මේ සම්බන්ධයෙන් සොයා බැලීමේදී

ප්‍ර : ඒ චෙක්පත් අංකය කුමක්ද මහත්මයා?

පි : චෙක්පත් අංකය ස්වාමිනි 891788

ප්‍ර : චෙක්පත් අංකය 891

පි : 891788 ස්වාමිනි.

ප්‍ර : 788. ඒ කොපමණ මුදල් ප්‍රමාණයක්ද ලබා ගෙන තිබෙන්නේ?

පි : මිලියන පහක් ස්වාමිනි.

ප්‍ර : ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් මහත්මයාගේ විමර්ශනයේදී අනාවරණ වෙච්චි කරුණු මොනවද?

පි : ස්වාමිනි මෙම චෙක්පත් අදාළ කොලොසස් සමාගමේ ගිණුම් තබන්නාගේ ප්‍රකාශ සටහන් කිරීමේදී ඔහු කිව්වේ මෙම මුදල් සැකකරුගේ මාමා වන අලවුදීන් යන අයගෙන් ලබා ගත් අතමාරුවක් සඳහා ගෙවීම් කළා කියලා ස්වාමිනි.

ප්‍ර : අතමාරුවක් සඳහා ගෙවීම් කළා කියලා. ඔය දැන් කියපු ගනුදෙනුව සිද්ධ වෙලා තියෙන්නේ 2019 අප්‍රේල් මාසේ 18 වෙනි දින?

පි : 2019 අප්‍රේල් 18 වෙනිදා තමා ස්වාමිනි චෙක්පත නිකුත් කරලා තියෙන්නේ බැංකුවෙන් මුදල් කර ගෙන තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර : මුදල් කර ගෙන තිබෙන්නේ . ඊට අමතරව මහත්මයා 2019 අප්‍රේල් 17 වෙනි දින යම් කිසි චෙක්පත් නිකුත් කිරීමක් සහ ඒ ආශ්‍රිත ගනුදෙනුවක් සිදු වී තිබෙනවාද?

පි : එහෙමයි ස්වාමිනි. 2019 අප්‍රේල් 17 වෙනිදා අංක 891789 දරන චෙක්පත මඟින් මුදල් ඉවත් කර ගෙන තිබෙනවා බැංකුවෙන්. එහි වටිනාකම මිලියන 34 ක් ස්වාමිනි.

ප්‍ර : රුපියල් මිලියන 34 ක්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ චෙක්පත ලියා ඇත්තේ කවුරු විසින්ද සහ ඒ බැංකුවට ඉදිරිපත් කිරීම කරලා තිබෙන්නේ කවුරුන් විසින්ද කියන එක මහත්මයාගේ විමර්ශනයේදී අනාවරණය වුණාද?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි. මෙම බැංකුවේ චෙක්පත්වලට අත්සන යෙදීමට බලය තියෙන්නේ ඉන්ෂාෆ් අහමඩ්ට. ඉන්ෂාෆ් අහමඩ විසින් තමයි මෙම චෙක්පත ලියලා ඔහුගේ ගිණුම් තබන්නට දීලා තියෙන්නේ. ඔහු තමයි බැංකුවෙන් එමම චෙක්පත මාරුකර ගෙන ඇවිල්ලා තියෙන්නේ. මාරුකර ගෙන ඇවිල්ලා එම මුදල් ඉන්ෂාෆ් අහමඩ්ට ලබා දුන් බව ඔහු සඳහන් කළා ස්වාමිනි.

ප්‍ර : ඔය ගිණුම් තබන්නා වශයෙන් මහත්මයා සඳහන් කරපු තැනැත්තාගේ නම විමර්ශනයේදී අනාවරණය වෙලා තිබෙනවද?

පි : ඉෂාක් අහමඩ්.

ප්‍ර : ඉෂාක් අහමඩ්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඉන් අනතුරුව මහත්මයා 2019 අප්‍රේල් මස 18 වෙනි දින තවත් යම් කිසි චෙක්පතු තැන්පතුවක් හෝ ආශ්‍රිත ගනුදෙනුවක් සිදු වී තිබෙනවාද?

පි : ස්වාමිනි 2019 අප්‍රේල් 18 වෙනි දින තවත් චෙක්පතක් බැංකුවට දීලා මුදල් ලබා ගෙන තියෙනවා. එම චෙක්පතේ වටිනාකම මිලියන 5.4 ක්.

ප්‍ර : මිලියන 5.4 ක්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ ආකාරයෙන් තමයි ඔය මහත්මයා දැනටමත් සඳහන් කරපු මේ සැකකටයුතු ගනුදෙනු සිදු වී ඇතැයි මහත්මයා ප්‍රකාශ කරන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් මේ ගනුදෙනු සියල්ලම සමස්තයක් වශයෙන් අරගත්තාම මේ ගනුදෙනු සිද්ධ වෙලා තියෙන්නේ මොන ක්‍රමානුගත පිළිවෙල මහත්මයා මේ ගරු අධිකරණයට ප්‍රකාශ කරන්න මහත්මයාගේ විමර්ශනයේදී අනාවරණය වෙච්ච ආකාරය. දැන් අපි ගනුදෙනු තුනක් සම්බන්ධයෙන් සඳහන් කළා. මෙය නිකම් මෙය කොයි ආකාරයෙන්ද සිද්ධ වෙලා තියෙන්නේ කියලා සම්පූර්ණ පින්තූරය මේ ගරු කොමසාරිස්වරුන්ට චිත්‍රනය කර ගැනීම සඳහා එය ඉදිරිපත් කරන්න කොයි ආකාරයෙන්ද සිද්ධ වෙලා තියෙන්නේ කියලා?

පි : එහෙමයි ස්වාමිනි. ඊට අදාළ සාරාංශය ගත කිරීමක් සිදු කළා. ඊට අදාළ ලේඛනයක් ඉදිරිපත් කරන්න ස්වාමිනි ඉදිරිපත් කිරීමට හැකියාව තියෙනවා අවධානය සඳහා.

**ඒ අනුව ගරු මැතිතුමනි මෙම සාක්ෂිකරු විසින් දැනටමත් සාක්ෂි ලබා දෙමින් ඉදිරිපත් කර ලද ගනුදෙනුවල විස්තර දැක්වෙන සාරාංශගත සටහනක් C 797 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කිරීම සඳහා ගෞරවයෙන් අවසර ලැබෙනවා.**

FAIR COMMENT BY JEZEEM

ප : දැන් මහත්මයාට මං කියා සිටියේ මේ සම්පූර්ණ ගනුදෙනු සිදු වෙච්ච ආකාරය like story tell it කොහොමද වුණේ කියන එක මේ ගරු කොමසාරිස්වරුන්ට කියන්න කොයි ආකාරයෙන්ද මෙම සිදු වීම සිදු වුණේ කියලා?

පි : සැක කටයුතු ගනුදෙනු සම්බන්ධයෙන් සඳහන් කරනවා නම් ස්වාමිනි අර මම සඳහන් කළ මිලියන 34 2019/04/17 වෙනි දින ඉන්ෂාෆ් අහමඩ් චෙක්පත් දෙකක් ලියලා තියෙනවා ස්වාමිනි. එක චෙක්පතක වටිනාකම මිලියන 5 යි. අනිත් එක මිලියන 34 යි. සාමාවෙන්න ස්වාමිනි එක් චෙක්පතක් මිලියන 34 යි. අනික් චෙක්පත මිලියන 5.4 යි. ගිණුම් ලිපිකරුවා මෙම චෙක්පත ඇරගෙන බැංකුවට ගිහිල්ලා මාරු කර ගෙන තියෙන්නේ මිලියන 34 චෙක්පත පමණයි. එදා බැංකුවේ මුදල් නොමැති බව සඳහන් කරනවා ඔහුගේ ප්‍රකාශයේ. ඊට පස්සේ ඒ චෙක්පතෙන් මිලියන 34 අරගෙන ඇවිල්ලා ස්වාමිනි ඒ මුදල්වලින් ඉන්ෂාෆ් අහමඩ්ගේ උපදෙස් පරිදි මිලියන 5.4 ක් මොහුගේ සහෝදරයා ඉෆ්ලාල් අහමඩ්ගේ ගිණුමට බැර කරන්න ඔහු උපදෙස් දීලා තියෙනවා. එතකොට මිලියන 34 න් ස්වාමිනි 5.4 ක් බැංකුවේ තැන්පත් කළාට පස්සේ ඉතුරු මුදල්වලින් මිලියන 1.1 ක් සේප්පුවේ දාන්න කියලා ඔහුට උපදෙස් දීලා තියෙනවා ගිණුම් ලිපිකරුට. ඉතුරු 27.5 ඉන්ෂාෆ් අහමඩ් ලබා ගෙන තියෙනවා ස්වාමිනි. ඉන් අනතුරුව 2019/04/18 දින චෙක්පත ස්වාමිනි අර මීට ඉහතදී බැංකුවේ මුදල් නොමැති නිසා මාරු කිරීමට නොහැකි වූ මිලියන 5.4 චෙක්පත 2018 නැවත මුදල් කර ගෙන තියෙනවා.

ප : 2018 දිනය කියන්න?

පි : 2019/04/18 වන දින එසේ මුදල් කර ගෙන 5.4 යි ඊට පස්සේ ස්වාමිනි ඉන්ෂාෆ් අහමඩ් ළඟ තව 27.5 ක් තියෙනවා. සේප්පුවේ දාන්න කිව්වා 1.1 ක් ඔක්කොම මිලියන 34 ක් මොහුගේ ප්‍රකාශයෙන් අනාවරණය වුණේ ස්වාමිනි ඉන්ෂාෆ් අහමඩ් කාර්යාලයට ඇවිල්ලා එදා කළු බෑග් එකක් අරගෙන ඇවිල්ලා තියෙනවා. මේස උඩ බෑග් එක තියලා ඔහුටම කියලා තියෙනවා බෑග් එකේ ඔහුම දැකලා තියෙනවා ගිණුම් ලිපිකරු දැකලා තියෙනවා බෑග් එකේ දුඹුරු පාට කලිසමක් සහ කැප් එකක් තියෙනවා. ඊට පස්සේ ඒක බවත් කරලා අර සල්ලි කළු පාට බෑග් එකට දැම්මට පස්සේ ඉන්ෂාෆ් අහමඩ් බෑග් එක කරේ දාලා කරේ අරගෙන ඉවත් වෙලා තියෙනවා කාර්යාලයෙන් ස්වාමිනි.

ප : දැන් ඔය කියපු ආකාරයෙන් තමයි මේ අවසාන භාගයේදී 2019 වර්ෂයේ අප්‍රේල් මස 17 සහ 18 වන දිනවල්වල සිදු වුණු ගනුදෙනු සිදු වී තිබෙන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

**ගරු මැතිතුමනි මේ අවස්ථාවේදී මෙම ගනුදෙනු සිදු වූ ආකාරය දැක්වෙන බැංකුවලින් ලබා ගත් බැංකු ප්‍රකාශ ඉදිරිපත් කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා. ඒ අනුව ගිණුම් අංක 1240011707 දරන ගිණුම සම්බන්ධයෙන් ලබා ගත් බැංකු විස්තර C 798 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා. මෙය ගරු මැතිතුමනි පිටු 04 කින් සමන්විත ලේඛනයක් බවත් ගෞරවයෙන් සැලකර සිටිනවා.**

**********

දැන් වේලාව : ප.ව.03.55 යි.
මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව.03.55
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

ප්‍ර: සාක්ෂිකරු මෙම කොමිෂන් සභාවට අනුයුක්ත වෙලා සිටි විමර්ශන කාල සීමාව තුළ නොයෙකුත් විමර්ශන වලට සහභාගි වුණාද?

උ: එහෙමයි ස්වාමීනි .

ප්‍ර: ඔබගේ විමර්ශන දැනටමත් පොලිස් සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ යම් යම් දේශපානඥයින් සම්බන්ධ සිදු කරන ලද විමර්ශන ද?

උ: නිවැරදි ස්වාමීනි .

**මේ අවස්ථාවේ දී මෙම සාක්ෂිකරු මෙම කොමිෂන් සභාව තුළ සිදු කරන විමර්ශන සහ කොමිෂන් සභාවේ ලබාදී ඇති සාක්ෂි හේතුවෙන් අනාගතයේ දී ඔහුගේ යම් රාජකාරී කටයුත්තක් සම්බන්ධයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් ඔහුට බලපෑමක් හෝ තර්ජනයක් ඇති විය හැකි බව කොමිෂන් සභාවට හැඟියන හෙයින් සාක්ෂිකරුවන් සහ වින්දිතයන්හට පහසුකම් සැලසීමේ ආරක්ෂාව ලබාදීමේ 2015 අංක 04 දරණ පනතේ 25 (4) අප වගන්තිය ප්‍රකාරව මෙම සාක්ෂිකරුට හිමිවිය යුතු සියළු වරප්‍රසාද සහ අයිතින් මෙම සාක්ෂිකරුට ලබාදෙන ලෙස සාක්ෂිකරුට සහ වින්දිතයන් හට ආරක්ෂාව සැපයීමේ සහ පහසුකම් සැපයීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.**

ප්‍ර: සාක්ෂිකරු ඔබ මේ කොමිසමට ඉදිරිපත් කරපු මේ කොලෝසස් පුද්ගලික සමාගමේ තියෙන ගිණුම් ආශ්‍රිතව සලකා බැලුවොත් ඒ කොලෝසස් පුද්ගලික සමාගමට වැඩිම පිරිවැටුමක් ලැබී තිබෙන වර්ෂ මොනවද?

උ: ස්වාමීනි 2018 වර්ෂයේ තමයි වැඩිම පිරිවැටුමක් ලැබිලා තිබෙන බව පෙන්නුම් කරන්නේ. මිලියන 2.8 ක් අමරිකානු ඩොලර්.

ප්‍ර: එතකොට ඔබගේ විමර්ශන වලදී අනාවරණය වුණා ද එම වැඩිම පිරිවැටුම ලැබීමට ප්‍රධාන වශයෙන් දායක වුණේ මොකද්ද කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද?

උ: ප්‍රධාන වශයෙන් දායක වෙලා තියෙන්නේ තඹ සහ ආශ්‍රිත ලෝහ වර්ග විදේශගත කිරීමෙන් ස්වාමීනි .

ප්‍ර: 2018 වසරට පසුව ඉන්පසුව වැඩිම පිරිවැටුමක් ලැබෙන්නේ මොන වසරේද?

උ: 2018 ට පසුව ස්වාමීනි වැඩිම පිරිවැටුමක් ලැබිලා තිබෙනවා ස්වාමීනි 2014 වර්ෂයේ දී. 2.6 ක් කියලා පෙන්නුම් කරනවා ස්වාමීනි .

FAIR COMMENT BY JEZEEM
President's Secretary's Copy

ප්‍ර: එම පිරිවැටුම ලැබීමට ප්‍රධාන වශයෙන් දායකවුණේ මොකද්ද කියලා ඔබ දන්නව ද?

උ: එම පිරිවැටුමටත් දායක වී තියෙන්නේ ස්වාමීනි තඹ සහ ඊට ආශ්‍රිත ලෝහ වර්ග විදේශගත කිරීමෙන් ලැබෙන ආදායමෙන්.

ප්‍ර: 2014 ට පෙර ඔය ගිණුම් ඔක්කොම අරින්නේ 2011 නේ.

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: 2014 පෙර ඔවැනි විශාල පිරිවැටුමක් ඔය සමාගමට ලැබිලා තියෙනව ද?

උ: ගිණුම විශ්ලේෂණය කිරීමේ දී එවැන්නක් පෙන්නුම් කරන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබගේ විමර්ශන වලදී අනාවරණය වුණා ද මේ ඔබ කිව්වනේ මේ මොනවද අපනයනය කෙරුවේ?

උ: තඹ සහ පිත්තල ස්වාමීනි . තඹ සහ ඇලුමිනියම් කියලා තමයි අදාළ ලේඛනයේ සඳහන් වෙන්නේ.

ප්‍ර: 2014 පෙර තඹ සහ ඇලුමිනියන් අපනයනයක් කිරීමක් ගැන විමර්ශනයේ සඳහන් වෙනව ද?

උ: ස්වාමීනි බැංකු වලින් ලබාදුන්න තොරතුරු අනුව තමයි මේක සකස් කළේ. අපිට දුන්නු තොරතුරු ප්‍රථමයෙන් ලබාදුන්නේ ස්වාමීනි 2014/07/21 වැනි දින සිට තමයි මෙම ගිණුම් අපිට ලබාදුන්නේ ස්වාමීනි .

ප්‍ර: ඊට කලින් ඒවා ලබාදුන්නේ නැද්ද?

උ: ඔවුන්ගේ පරිගණකගතවීම් නැහැ කියලා තමා කිව්වේ.

ප්‍ර: ඔබගේ විමර්ශනයේ දී අනාවරණය වුණා ද මේ කොලෝසස් සමාගම පිත්තල අපනයනය කිරීමක් සම්බන්ධයෙන්?

උ: ස්වාමීනි මීට අදාළව මෙම භාණ්ඩ අපනයන කිරීම සම්බන්ධයෙන් අපි රේගුවෙන් තොරතුරු ලබාගත්තා .ඊට අමතරව සමාගමේ ගිණුම් තබන්නාගෙන් ප්‍රකාශ සටහන් කළා. මේ ලේඛන අනුව නම් ස්වාමීනි තඹ අපනයනයෙන් කියා තමා විශේෂයෙන් සඳහන් වෙලා තියෙන්නේ.

ප්‍ර: බැංකුවේ තිබෙන ලේඛන ආශ්‍රයෙන් පිත්තල අපනයනය කිරීමක් සම්බන්ධයෙන් සොයාගන්න බැරි වුණාද?

උ: තඹ සහ පිත්තල ලෙස.

ප්‍ර: තඹ සහ පිත්තල ලෙස දෙකම ද සඳහන් වෙන්නේ?

උ: එහෙමයි ස්වාමීනි . තඹ සහ පිත්තල ලෙස.

**********

**<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>**

ප්‍ර: සාක්ෂිකරු ඔබ සඳහන් කරානේද අප්‍රේල් 18 වැනිදා වෙක් එක මාරු කරලා ලක්ෂ 50 මුදලක් අරන් තියෙනවා කියලා. ඒක එයාගේ ඥාතියකු වන අලවුදීන්ට අත හුවමාරුවකට දෙන්න කියලා?

උ: එහෙමයි ස්වාමීනි .

ප්‍ර: ඒ සල්ලි දුන්නේ කවදද කියලා කිව්ව ද?

Parliament's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ස්වාමීනි ඔහුගෙන් අපි ප්‍රකාශයක් සටහන් කරා. අපි ඇහුවා මුදලක් ණයට ලබාදීම සම්බන්ධයෙන් මොකක් හරි ලේඛනයක් පවත්වාගෙන ගිහිල්ලා තියෙනව ද කියලා ඔහු කිවවා ලේඛනයක් පවත්වාගෙන ගිහිල්ලා නැහැ. ප්‍රශ්න කරා ස්වාමීනි මට නිවැරදිම මේ අවස්ථාවේදී කීමටම මතක නැහැ ප්‍රකාශය බැලීමට අවශ්‍යයි.

ප්‍ර: ඔබ අලවුදීන්ගෙනුත් ප්‍රකාශයක් සටහන් කරගත්ත ද?

උ: එහෙමයි ස්වාමීනි .

ප්‍ර: අලවුදීන්ට සල්ලි ලැබිලද අතට?

උ: ඔහු පිළිගත්තා ස්වාමීනි සල්ලි ලැබුණා කියලා.

ප්‍ර: ලක්ෂ 50 ලැබුණා කියලා?

උ: ලැබුණා කියලා ස්වාමීනි.

ප්‍ර: කවදද ඒ ලැබුණේ?

උ: මේ මියයන්ට පෙර ලැබුණු බව තමයි ස්වාමීනි.

ප්‍ර: හරියටම නිශ්චිත දිනයක් හැටියට ඇහුවේ නැද්ද ඒක?

උ: ප්‍රකාශය සටහන් කරා ස්වාමීනි මට ඒක

ප්‍ර: ඒක නැද්ද?

උ: මේ අවස්ථාවේ නැහැ.

ප්‍ර: මෙහෙමනෙ 18 සල්ලි ගත්තා .

උ: ඔව්.

ප්‍ර: එතකොට ඒ සල්ලි තිබුණේ අර කළමණාකාර තැනැත්තා අතේ නේද?

උ: එහෙමයි ස්වාමීනි .

ප්‍ර: කළමණාකරවරයා අලවුදීන්ට සල්ලි දුන්නේ කවදද කියන එකයි මට දැනගන්න ඕන. ඒක මතක නැද්ද කියන්න?

උ: ප්‍රකාශය සඳහා අවධානය යොමු කළ යුතුයි ස්වාමීනි.

ප්‍ර: ප්‍රකාශය තියෙනව ද?

උ: මේ අවස්ථාවේ දී නැහැ ස්වාමීනි .

**********

**<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.</u>**

ප්‍ර: විජයතුංග මහත්මයා දැන් මේ පුද්ගලයගේ පුද්ගලික ගිණුමට විදේශ මුදල් එහෙමය බැර වෙලා තිබෙනව ද?

උ: පරීක්ෂා කරා ස්වාමීනි . මොහුගේ පුද්ගලික ගිණුමට විදේශයෙන් මුලද් ලැබිලා නැහැ ස්වාමීනි . පුද්ගලික ගිණුම් වලට.

ප්‍ර: එතකොට මොහු පුද්ගලික ගිණුමෙන් කොච්චර මුදලක් with draw කරලා තියෙනව ද?

උ: පුද්ගලික ගිණුම් සම්බන්ධයෙන් තොරතුරු ලබාගත්තා ස්වාමීනි විශේෂයෙන් විශාල වශයෙන් ස්වාමීනි මිලියනයට වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු සිදුවෙලා නැහැ ස්වාමීනි පුද්ගලික ගිණුම් වල.

ප්‍ර: එතකොට Nation trust බැංකුවේ අවසාන වශයෙන් ගිණුමේ කොච්චර තිබිලා තියෙනව ද? මේක ක්‍රියාත්මක නොවෙන කාලේ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඌ: Nation trust බැංකුවේ ස්වාමීනි ගිණුම් සාරාංශයක් මේ අවස්ථාවේ දී මට ඉදිරිපත් කිරීමට සුදානම් වුණේ නැහැ ස්වාමීනි . නමුත් ඉදිරිපත් කළ හැකියි ස්වාමීනි

ප්‍ර: දැන් අවසාන වශයෙන් කෝමෂල් බැංකුවේ ජංගම ගිණුමේ කොච්චර තියෙනවද?

ඌ: ඉදිරිපත් කරන්න පුළුවන් ස්වාමීනි සියළුම ගිණුම් ලබාගෙන තිබෙන්නේ. කෝමෂල් බැංකුවේ මෙම පුද්ගලයා ගිණුම් 04 ක් පවත්වාගෙන ගිහිල්ලා තියෙනවා. අවසාන වශයෙන් 770 අවසානයට තියෙන ගිණුම 2016/03/31 ගිණුම ආරම්භ කරලා තියෙන්නේ. නමුත් මේ වන කොට ස්වාමීනි ගිණුම් අත්හිටුවලා තියෙන්නේ. මං පරික්ෂා කරා මගේ මතකය හැටියට සැකකටයුතු ගනුදෙනු වාර්තාවෙලා නැහැ ස්වාමීනි.

**********

**<u>ගරු අදිකාරි මැතිණිය.</u>**

ප්‍ර: ඔබ පරීක්ෂා කර බැලුවද HS code එක කොහොම ද තියෙන්නේ කියලා Custom එකේ මේ අපනයනය සඳහා මේ කෝපර් සහ brass ? දෙකටම තියෙන්නේ එකම HS code එකක්ද නැත්නම් දෙකක් ද?

ඌ: ස්වාමීනි එය ඊට අදාළව මං ගැඹුරින් විමර්ශනය කළේ නැහැ ස්වාමීනි. මොවුන් අපනයන කළ තඹ අපි මේ පුද්ගලයන්ට ශ්‍රී ලංකා රේගුව විසින් ටැක්ස් Identification නම්බර්යක් නිකුත් කරලා තිබුණා. ඒක ලබාදුන්නට පස්සේ ඔවුන්ගේ දතත් ගබඩාවේ තියෙන සියළුම තොරතුරු අපිට ලැබුණා ස්වාමීනි. HS code එක සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කළේ නැහැ ස්වාමීනි . දීර්ඝ ලෙස.

ප්‍ර: මොකද මම හිතනවා Value addition එකක් 35% ක් 35 ක දැන් මේවා අපනයනය කරන්න මේ scrap වලින් හදන තඹ සහ පිත්තල අපනයනය කිරීමේ දී මෙම සමාගම විසින් විවිධ අර්ධනිමි භාණ්ඩ වර්ග හදනවානේ වයර් එකක් බටයක් ඒ වගේ. ඒවට ඔබට බලන්න බැරිව ගියා නේද HS code දිලා තියෙනව ද කියලා තඹ වලට වෙනමයි පිත්තල වලට වෙනමයි?

ඌ: තවදුරටත් දීර්ඝ විමර්ශනයක් කරලා තොරුතුරු දීමට හැකියි ස්වාමීනි .

ප්‍ර: ඒ අනුව ඔහු ප්‍රකාශ කළා 2018 නේ වැඩියෙන්ම මේ ගොල්ලෝ turnover එකක් පිරිවැටුමක් ?

ඌ: එහෙමයි ස්වාමීනි .

ප්‍ර: 2014 ත් තිබුණා කිව්ව නේද? 2018 ත් වඩා වැඩියෙන්? එහෙම වැඩිවෙලා තියෙන්නේ volume එකද value එක නිසාද? 2014 විදේශ විනිමය ශ්‍රී ලංකා රුපියලට සමානුපාතිකව ගලපන කොට ඒක නිසා වැඩිවෙච්ච වැඩිවීමක් ද ඔය 2014 තියෙන්නේ. එහෙම නැත්නම් ඒ ගොල්ලෝ ඇත්තටම ලොකු volume එකකින් export කරලා තියෙනවද?

FAIR COMMENT BY JEZEEM

උ: කෙසේ වෙතත් ස්වාමීනි මුදල් ඩොලර් වලින් තමයි මේ Account එකට ලැබෙන්නේ.

ප්‍ර: පේන්නේ නැහැ වොලියුම් එක නේ?

උ: volume එක තියෙනවා ස්වාමීනි 2014 කොච්චර සංඛ්‍යාවක් ඇවිල්ලා තියෙනව ද ඊට පස්සේ 15 ඇවිල්ලා තියෙනව ද.

ප්‍ර: මුදල් නෙවෙයි. ප්‍රමාණයන් අපි හිතමුකෝ ටොන් මෙක්ට්‍රික් ටොන් මෙච්චරක් ඇරියා කියලා. එහෙම තියෙනව ද 2014 ?

උ: ඒ සම්බන්ධයෙනුත් තොරතුරු ලබාගත හැකි ස්වාමීනි.

ප්‍ර: Custom එකෙන් ගන්න ඕන නේද?

උ: Custom අදාළ ලබාගන්න පුළුවන්. මෙම අපනයනයට අදාළ.

ප්‍ර: ඔබ පරීක්ෂා කරලා බලන්න එහෙම නම් Custom එකෙන් මේ HS code එකක් Custom එකෙන් දෙනවා මේ සමාගම් වලට value addition එකක් කරලා යවන නිසා නෙවෙයි සාමාන්‍යයෙන් දෙනවා HS code එකක්.

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: පිත්තල වලටයි තඹ වලටයි එකට HS code එකද දීලා තියෙන්නේ නැත්නම් දෙකක් දීලා තියෙනව ද කියන එක සහ ඒ අනුව බලන්න පුළුවන් අපිට පිත්තල මේ ගොල්ලෝ කොච්චරක් යවලා තියෙනව ද කියලා?

උ: පරීක්ෂා කර බලා වර්තා කරන්නම් ස්වාමීනි.

ප්‍ර: විශේෂයෙන්ම 2018 පිත්තල?

උ: එහෙමයි ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍ය නොවන බව අති උතුම් මැල්කන් කාදිනල් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරිය ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු මුදා හරී.

වේලාව:ප.ව.04.10

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශයේ නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

## 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.07.04 වේලාව: ප.ව. 04.10

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

**පෙනී සිටීම:-**

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ චමත් ප්‍රනාන්දු මහතා සමඟ ජනාධිපති නීතිඥ ශ්‍රමිල් පෙරේරා මහතා පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

| | | |
|---|---|---|
| **නම** | : | **අකලංක සමේන්ද්‍ර අලුත්ගෙදර** |
| **වයස** | : | **අවු 45** |
| **ජාතිය** | : | **සිංහල** |
| **ආගම** | : | **බුද්ධාගම** |
| **දැනට දරණ තනතුර** | : | **ප්‍රධාන පොලිස් පරීක්ෂක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන මූලස්ථානය.** |

**ප්‍රතිඥා දී කැඳවයි.**

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>**

ප්‍ර: මහත්මයා ඔබ දැනට මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට අනුයුක්තව සේවය කරනු ලබනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: අද සාක්ෂි දෙන සිද්ධියට අදාළව ඔබට රාජකාරීමය වශයෙන් නියම වුණා ද කොලෝසස් තඹ කර්මාන්තශාලාව සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීමට?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එකී කර්මාන්ශාලාව සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීමට හේතු වුණේ එම කර්මාන්තශාලාවේ අයිතිකරුව සිටි එම්.අයි. ඉන්සාෆ් අහමඩ් යන අය 2014 අප්‍රේල් 21 වැනි දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී ස්වයං ඝාතකයෙක් බෝම්බයක් පුපුරුවාගෙන මරණයට පත්වීමට අදාළ සිද්ධියට අදාළව ආනුශාංගිකව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ මේ කොලෝසස් තඹ කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කිරීමේ දී ඔබ මේ කොලෝසස් තඹ කර්මාන්ත ශාලාව පිහිටි ස්ථානය සම්බන්ධයෙන් මුලින්ම සොයලා බැලුවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ තඹ කර්මාන්තශාලාව පිහිටීම සම්බන්ධයෙන් ඔබ එතැන්ට ගිහිල්ලා බැලුව ද පරීක්ෂා කරලා ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව ඔබට සැකවින් විස්තර කරන්න පුළුවන් ද ඔබට මේ ගරු කොමිෂන් මේ කොලෝසස් තඹ කර්මාන්ශාලාව පිහිටියේ කොහේ ද සහ එහි ඇතුළත පිහිටීම සම්බන්ධයෙන්?

උ: ස්වාමීනි මේ කර්මාන්ත ශාලාව පිහිටලා තියෙන්නේ අංක 111 A 06 අවිස්සාවේල්ල පාර වැල්ලම්පිටිය කියන ලිපිනය දරන ස්ථානයේ. මෙය කොළඹ අවිස්සාවේල්ල මාර්ගයේ වැල්ලම්පිටිය ප්‍රදේශයේ කළුපාලම නැමැති ස්ථානයෙන් දකුණට ඇති මාර්ගයේ මීටර් 70 ක් පමණ යනවිට වම්පස තාප්පය අඩි 15 ක් පමණ උස තාප්ප යොදා ඉදිකරන ලද

FAIR COMMENT BY JEZEEM

ගොඩනැගිල්ලක් ස්වාමීනි. මේ පර්චස් 45 ක් පමණ වෙනවා මේක ගොඩනැගිල්ල. මේක මහල් 03 කින් යුතු ගොඩනැගිල්ලක්. ඒ තුළ තමයි තඹ කර්මාන්තශාලාව පවත්වාගෙන ගියේ. ඒ තුළ කාර්යාලයක් ඊට අමතරව තඹ උණු කරන්න ගන්න කෝච හයි කරලා තියෙනවා ඒ මැෂින් සවිකරලා තියෙනවා. ඊට පස්සේ සේවකයන්ට නවතින්න වෙනම නවාතැන් පලක් එහෙම හදලා තිබෙනවා. ඊට අමතරව ගෙනැල්ල තිබ්බ තඹ කම්බි ඉතුරු වෙලා තිබ්බා. දැනට මේ තඹ කර්මාන්තශාලාව වහලා තිබ්බ මම යන වේලාවේ දී. එතැන මුරකරුවෙක් ඉන්නවා සමාගමෙන් දාපු එක්කෙනෙක්. දැනට මෙතැන කිසිම කර්මාන්ත කටයුත්තක් සිදුවෙන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: මේ තඹ කර්මාන්තශාලාව පිහිටි භූමිය කොපමණ වපසරියකින් යුත්ත භූමියක් ද?

උ: පර්චස් 40 ක් 45 ක්.

ප්‍ර: පර්චස් 33 වගේ නෙමේ ද?

උ: 33 ක් පමණ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ මේ කර්මාන්තශාලාව පිහිටි භූමිය වටා තාප්පයක් තිබ්බයි කියලා සඳහන් කරා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: සාමාන්‍යයෙන් කොච්චර විතර උසක ප්‍රමාණයේ තාප්පයක් ද?

උ: සාමාන්‍යයෙන් අඩි 15 ක් පමණ.

ප්‍ර: ඒ කියන්නේ පිටත ඉදලා ඇතුළත කෙනෙකුට සිද්ධ වෙන දේ පේන උසක් ද ඊට වැඩිය උසක් ද?

උ: පෙන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ කර්මාන්තශාලා පිහිටි භූමිය වටේම තාප්පයක් තිබුණ ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ අදාළ ස්ථානය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔබේ විමර්ශනයේ දී මේ කොලෝසස් තඹ කර්මාන්ශාලාව පිහිටි භූමියේ අයිතිය සම්බන්ධයෙන් ඉඩමේ අයිතිව සහ ඒ ගොඩනැගිලි අයිතිය සම්බන්ධයෙන් ඔබ විමර්ශනකය කරලා බැලුව ද?

උ: එහමෙයි ස්වාමීනි. මේ සම්බන්ධව මං විමර්ශනයේ දී මේ කොලෝසස් පුද්ගලික සමාගමේ කළමණාකරු වශයෙන් සේවය කරන ලද සනුන් මොහොමඩ් ඉෂාඩ් නැමැති අයගෙන් ප්‍රකාශයක් සටහන් කරා ස්වාමීනි. ඒ ප්‍රකාශයේ දී මේ ඉඩම තඹ කර්මාන්තශාලවේ ඉඩමේ හිමිකාරීත්වය සම්බන්ධයෙන් මා විමසීමක් කරා ඒ අවස්ථාවේ දී ඔහු ප්‍රකාශ කරා මෙම තඹ කර්මාන්තශාලාවේ ඉඩම ඉන්ෂාෆ් අහමඩ් විසින් ඔහුගේ දරුවන් 04 දෙනාට ලියාපවරා ඇති බව. එහි ඔප්පුවේ පිටපතක් ඔහු මා වෙත ඉදිරිපත් කරා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ඒ ඉඩමේ අයිතිය මුලින් තිබුණේ එම්.අයි. ඉන්ෂාෆ් අහමඩ් කියන අයට ඔහු ඉන් පසුව පසු අවස්ථාවකදී ඔහුගේ දරුවන් 04 දෙනාට

Present Secretary's Copy
LAW COMMENT BY JEZEEM

තැගි ඔප්පුවක් ඒ මගින් අයිතිය බැහැර කර ඇති බවට ඔබට විමර්ශනයේ දී අනාවරණය වුණා ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ තැගි ඔප්පුව කවදද ලියලා සහතික කර තියෙන්නේ?

උ: 2019 අප්‍රේල් 04.

ප්‍ර: ඒ ඔප්පුව ලියලා තිබෙන්නේ කවර නොතාරිස්වරයෙකු විසින් ද?

උ: ඒ.ඩබ්ලිව්. රම්සින්.

ප්‍ර: ඒ ඔප්පුවේ අංකය කුමක්ද?

උ: අංක 12664.

ප්‍ර: දැන් ඔබ විමර්ශනයේ දී එකී ඔප්පුවේ පිටපතක් ඔබ භාරයට ගත්ත ද?

උ: එහෙමයි ස්වාමීනි.

**මේ අවස්ථාවේ දී සාක්ෂිකරු විසින් විමර්ශනයේ දී භාරයට ගන්නා ලද ඒ.ඩබ්ලිව්. රම්සින් ප්‍රසිද්ධ නොතාරිස් සහ නීතිඥ විසින් 2019 අප්‍රේල් 04 වැනි දින කොළඹ දී ලියා සහතික කරන ලද අංක 12664 දරණ තැගි ඔප්පුව C 799 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.**

ප්‍ර: මහත්මයා මෙම කොලෝසස් තඹ කර්මාන්තශාලාව පෞද්ගලික සමාගමක් වශයෙන් ලියාපදිංචි කරලා තිබෙනව ද කියලා ඔබ විමර්ශනයේ දී හොයලා බැලුව ද?

උ: එහෙමයි ස්වාමීනි. මා ඒ සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙතින් වාර්තාවක් කැඳවීම් කරා ස්වාමීනි. එහි සංවර්ධන නිලධාරී දන්දෙණි ආරච්චිලාගේ තුෂාර අරුණශාන්ත විසින් ඒ සම්බන්ධව ලියවිලි ඉදිරිපත් කරා ස්වාමීනි.

**දැනටමත් C 757 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටී.**

ප්‍ර: දැන් පෙන්වන ලේඛනය ඔබ විමර්ශනයේ දී භාරයට ගන්නා ලද පිටපතක් බවට ඔබ අඳුරගන්නව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව කොලෝසස් පුද්ගලික සමාගම 2011 මැයි 06 වන දින සමාගම් අංක PV 78667 යටතේ පෞද්ගලික සමාගමක් වශයෙන් ලියාපදිංචි වී ඇති බවට තහවුරු වුණාද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් මෙම සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයක් ඉන්නව ද නැත්නම් එක අධ්‍යක්ෂක පුද්ගලයෙක්ද එහි අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළේ යන්න සම්බන්ධයෙන් ඔබ හොයලා බැලුව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොනව ද ඔබට අනාවරණය වුණේ?

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ඌ: මෙම කර්මාන්තශාලා ආරම්භ කරන අවස්ථාවේ දී එක් අධ්‍යක්ෂකවරයෙක් සිටී. ඔහු මොහොමඩ් ඊබ්‍රාහීම් ඉන්සාෆ් අහමඩ් යන පුද්ගලයා.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් ඔබ ලේඛන ඔබ විමර්ශනයේ දී භාරයට ගත්ත ද?

ඌ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ලේඛනය මේ අවස්ථාවේ දී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තියෙනව ද?

ඌ: එහෙමයි ස්වාමීනි.

**ඒ අනුව කොලෝසස් පුද්ගලික සමාගම ලිපිනය වශයෙන් සඳහන් වෙන්නේ නොම්බර 104 පරණ යොන් වීදිය කොළඹ 12 ලිපිනය සඳහන්ව තිබෙනවා. එහි අධ්‍යක්ෂක වශයෙන් මොහොමඩ් ඊබ්‍රාහීම් ඉන්සාෆ් අහමඩ් වශයෙන් සඳහන් වී තිබෙනවා. එම ලේඛනය C 800 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.**

ප්‍ර: දැන් ඔබට විමර්ශනයේ දී යම් අවස්ථාවකදී අනාවරණය වුණා ද මේ මුලින් ආයතනයේ කාර්යාලයේ ලිපිනය වශයෙන් තිබිච්ච ලිපිනයක් වෙනස් කරලා නැවත ලිපිනයක් ලියාපදිංචි කර ඇති බවට?

ඌ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙනුත් ඔබ ලේඛන ලබාගත්ත ද?

ඌ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එය මේ අවස්ථාවේ දි ඔබට ඉදිරිපත් කරන්න හැකියාවක් තියෙනව ද?

ඌ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව 2016 /01 වැනි මාසේ 07 වැනි දින නව ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය වශයෙන් නොම්බර 37 පරණ යොන් වීදිය කොළඹ 12 වශයෙන් නැවත ලියාපදිංචි වී ඇති බවට අනාවරණය වුණා ද?

ඌ: නිවැරදි ස්වාමීනි.

**නැවත ලියාපදිංචිය සම්බන්ධයෙන් ෆෝම් 13 වශයෙන් සඳහන් ඒ ලේඛනය සම්බන්ධයෙන් ලේඛනය C 801 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.**

ප්‍ර: මහත්මයා ඔබට විමර්ශනයේ දී යම් අවස්ථාවකදී මේ කොලෝසස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනස් කර නැවත ලියාපදිංචි කිරීමක් සම්බන්ධයෙන් කරුණු අනාවරණය කිරීමක් සිදු වුණාද?

ඌ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් ඔබ අදාළ ලේඛන විමර්ශනයේ දී ඔබ භාරයට ගත්ත ද?

ඌ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එය නැවත ඔබට ඉදිරිපත් කරන්න පුළුවන් ද?

ඌ: එහෙමයි ස්වාමීනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එය පරීක්ෂා කර බලා කවදද මොන ආකාරයට ද ඒ අධ්‍යක්ෂවරුන්ගේ වෙනස්වීම සිදු කර තිබෙන්නේ කියලා වැඩිදුර සාක්ෂි ලබාදෙන්න පුළුවන් ද?

උ: එහෙමයි ස්වාමීනි. නව අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් ඇරව්ගෙදර මොහොමඩ් යුෂූෆ් මොහොමඩ් ඊබ්‍රාහීම් යන පුද්ගලයා සහ ෆාතිමා රිෆ්කා ඉන්සාෆ් අහමඩ් යන දෙදෙනා නව අධ්‍යක්ෂකවරු වශයෙන් මෙම සමාගමට ඇතුළත් කර තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ නව අධ්‍යක්ෂකවරුන් වශයෙන් ඇතුළත් කරපු අය එම්.අයි ඉන්ෂාෆ් යන අයගේ ඥාතීත්වය කුමක්ද කියලා ඔබට විමර්ශනයේ දී අනාවරණය වුණා ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: කවුද ඒ?

උ: ඇරව්ගෙදර මොහොමඩ් යුෂූෆ් මොහොමඩ් ඊබ්‍රාහීම් කියන්නේ ඉන්ෂාෆ් අහමඩ්ගේ පියා. ෆාතිමා රිෂ්ෆ්කා ඉන්සාෆ් අහමඩ් කියන්නේ ඉන්සාෆ්ගේ බිරිඳ.

ප්‍ර: කවදද ඒ අයව නව අධ්‍යක්ෂක මණ්ඩලයේ ඇතුළත් කර තිබෙන්නේ?

උ: 2019/03/27 වැනි දින.

**ඒ නව අධ්‍යක්ෂක මණ්ඩලයේ නම ඇතුළත් කර ලියාපදිංචි කරන ලද ෆෝම් 20 යන ලේඛනය සහ ෆෝම් 18 යන ලේඛන යටතේ එක් එක් අධ්‍යක්ෂකවරුන්ගේ වෙන වෙනම විස්තර ඇතුළත් කර තියෙනවා. මෙයින් ෆෝම් 20 යටතේ අධ්‍යක්ෂකවරු වෙනස් කිරීමට අදාළ මුල් ලේඛනය C 802 වශයෙනුත් එක් එක් අධ්‍යක්ෂකවරුන්ගේ විස්තර වෙන වෙනම ඇති ලේඛන 02 ක පිළිවෙලින් C 802 A සහ C 802 B වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.**

**C 802 A වශයෙන් ලකුණු කරනු ලැබුවේ නව අධ්‍යක්ෂක ෆාතිමා රිෆ්කා යන අයගේ විස්තර ඇතුළත් ලේඛනය වන අතර C 802 B වශයෙන් ලකුණු කරනු ලැබුවේ මොහොමඩ් යුෂූෆ් මොහොමඩ් ඊබ්‍රාහීම් වශයෙන් ඇතුළත් කරන ලද නව අධ්‍යක්ෂකවරයාගේ විස්තර ඇතුළත් ලේඛනයයි.**

ප්‍ර: මහත්මයා ඔබ මෙම විමර්ශන ඔබේ මේ කරුණට අදාළ විමර්ශනයේ දී කොලෝසස් තඹ කර්මාන්තශාලාවේ මේ 2019 /04/21 වන දින බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ විවිධ විමර්ශන කණ්ඩායම් විසින් අදාළ ස්ථානය පරීක්ෂා කර බලා විමර්ශන සිදු කර ඇති බවට අනාවරණය වුණාද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව ඔබ ඒ එක් එක් විමර්ශන කණ්ඩායම් විසින් සිදුකර ඇති විමර්ශනයන් සම්බන්ධයෙන් මෙම ගරු කොමිෂන් සභාවේ ලේකම්වරයා මාර්ගයෙන් වාර්තා කැඳවීමට පියවර ගත්ත ද ?

උ: නිවැරදි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ ඒ අනුව මුලින්ම වාර්තාවක් කැඳෙව්වේ කුමන විමර්ශන ඒකකයට අදාළව ද?

උ: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉන්න කොට.

ප්‍ර: ඒ අදාළ ලේඛනය ඔබට මේ අවස්ථාවේ දී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබට තව දුරටත් දැන ගන්න ලැබුණ ද මෙම සිද්ධියට අදාළව විමර්ශන කටයුතු තවදුරටත් කෙරී ගෙන යන බවට. තඹ කර්මාන්තශාලාව සහ එයින් එම සිද්දියට අදාළ පුද්ගලියන් සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණ පවත්වගෙන යන බව?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කවර ආයතන වලින්ද?

උ: ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයෙන් ස්වාමීනි.

ප්‍ර: සහ ?

උ: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මත.

ප්‍ර: දැන් ඔබ කිව්වා මේ ගරු කොමිෂන් සභාවට ඔබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මේ වැල්ලම්පිටිය තඹ කම්හල සෝදිසි කිරීම සම්බන්ධව වාර්තාවක් කැඳෙව්වයි කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ලේඛනය මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරන්න හැකියාවක් තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ලේඛනය 2020/03/03 වැනි දින දරණ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වික්‍රමාරච්චිගේ තිලකරත්න යන නිලධාරියා විසින් අත්සන් කර එකී වාර්තාව මෙම ගරු කොමිෂන් සභාවේ ලේකම් වෙත එවා ඇති බවට වාර්තා වෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම වාර්තාව අනුව මොකද්ද ඒ අවස්ථාව වන කොට අනාවරණය වෙලා තිබුණේ?

උ: මෙම බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසු ඒ ආසන්න දිනයක දී අපරාධ පරීක්ෂණ නිලධාරීන් විසින් මෙම කර්මාන්තශාලාව පරීක්ෂා කරලා තියෙනවා. එය පරීක්ෂා කිරීමේ දී කිසිදු සැකකටයුතු දේපලත් පුපුරන ද්‍රව්‍යය හෝ රසායන ද්‍රව්‍යයත් අංක 111 A 06 අවිස්සාවේල්ල පාර වැල්ලම්පිටිය ලිපිනයේ පිහිටි කොලෝසස් තඹ කර්මාන්තශාලාව සෝදිසි කිරීම සම්බන්ධව. 2020/02/19 වැනි දින ඔබතුමා විසින් යොමු කරන ලද ලිපිය හා බැඳේ. සෝදිසි කිරීම හෝ සැකකටයුතු දේපළ හෝ බෝම්බ සකස් කරීම සඳහා උපයෝගී කර ගන්නා ලද රසායනික ද්‍රව්‍යය හෝ වෙනත් අමුද්‍රව්‍යයන් කිසිවක් අත්අඩංගුවට ගෙන නොමැත. ඒ අවස්ථාවේ කර්මාන්තශාලාවේ තිබූ දේපල ඡායාරූප ගත කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම ගරු කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත එවා ඇති එකී ලිපිය C 803 වශයෙන් ලකුනු කර ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: එසේම ඔබ මේ කරුණට අදාලවම එනම් මේ කොලෝසස් පුද්ගලික සමාගමේ තඹ කර්මාන්තශාලාව සම්බන්ධයෙන් විශේෂ කාර්ය බලකාය ශ්‍රී ලංකා පොලිසියේ වාර්තාවක් මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා මාර්ගයෙන් කැඳවීමට පියවර ගත්තද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම ලිපිය මේ අවස්ථාවේ දී ඔබට ඉදිරිපත් කිරීමේ හැකියාවක් තිබෙනවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වාර්තාව අනුව මොකද්ද අනාවරණය වුණේ?

උ: විශේෂ කාර්ය බලකායේ බෝම්බ නිෂ්ක්‍රීය අංශය විසින් මෙම ස්ථානය සෝදිසියට ලක් කර නොමැති බව වාර්තා කරලා තියෙනවා ස්වාමීනි.
මෙම වාර්තාව ස්වාමීනි 2020 /02/29 වන දින විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරී ලයනල් ගුණතිලක නියෝජ්‍යය පොලිස්පති විසින් මෙම ගරු කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත එවා ඇති වාර්තාවක්. එම වාර්තාව C 804 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: ඊට අමතරව ඔබ මෙම තඹ කර්මාන්තශාලාව පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාශයෙනුත් මෙම ගරු කොමිෂන් සභාවේ ලේකම්වරයා මාර්ගයෙන් විමර්ශන වාර්තාවක් කැදවනු ලැබුවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම වාර්තාවත් ඔබට මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වාර්තාව අනුව මොනව ද අනාවරණය වුණේ?

උ: එම පරීක්ෂා කිරීමේ දී මෙම ස්ථානයෙන් බෝම්බ පීඩාකාරී ආයුධ නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා රසායනික ද්‍රව්‍යය හෝ වෙනයම් ද්‍රව්‍යයක් සොයාගෙන නඩු භාණ්ඩ ලෙස භාරයට ගෙන නොමැති බව වාර්තා වෙලා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: එම වාර්තාව 2020/03/04 දිනැතිව කොළඹ අපරාධ කොට්ඨාශයේ අධ්‍යක්ෂ විසින් අත්සන් කර මෙම ගරු කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත එවා ඇති වාර්තාව බව පෙනී යනව ද?

උ: එහෙමයි ස්වාමීනි.
එම වාර්තාව C 805 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් විමර්ශනයේ දී ඔබ මෙම සිද්ධියට අදාළව මේ තඹ කර්මාන්තශාලාව සම්බන්ධයෙන් සහ එහි සේවය කරන ලද පුද්ගලයින් සම්බන්දයෙන් ශ්‍රී ලංකා පොලීසියේ විශේෂ ඒකකයක් මගින් මේ වන විටත් වැඩිදුර පරීක්ෂණ කටයුතු කරගෙන යන බවට ඔබට අනාවරණය වුණාද?

FAIR COMMENT BY JEZEEM

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කුමන ආයතනය මගින්ද?

උ: ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය මගින්.

ප්‍ර: මෙතෙක් සිදුකරන ලද විමර්ශනයට අදාළව අනාවරණය වී ඇති කරුණු සම්බන්ධයෙන් පමණක් ඒ අනුව මෙම ගරු කොමිෂන් සභාව වෙත වාර්තාවක් ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් එවා තිබෙනව ද? ඔබ කැඳවා ගැනීමට පියවර ගත්ත ද?

උ: කර්මාන්තශාලාව පරීක්ෂා කිරීම සම්බන්ධව වාර්තාවක් කැඳවා ගත්තා ස්වාමීනි.

ප්‍ර: එකී වාර්තාවේ පිටපතක් මේ අවස්ථාවේ දී ඔබට මෙම ගරු කොමිසන් සභාවට ඉදිරිපත් කිරීමේ හැකියාව තියෙන ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වාර්තාව අධ්‍යක්ෂ ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශයේ ප්‍රසන්නද අල්විස් මහතා විසින් 2020/03/03 වන දින මෙම ගරු කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත එවා ඇති වාර්තාව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එකී වාර්තාවෙන් මොනව ද අනාවරණය වුණේ?

උ: ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් මෙම කර්මාන්ශාලාව පිහිටි භූමිය පරීක්ෂා කිරීමක් සිදුකර නැති බව වාර්තා කරනවා ස්වාමීනි.
මෙම වාර්තාව C 806 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් ඔබට අනාවරණය වුණා ද ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය මගින් මෙම කොලෝසස් තඹ කර්මාන්තශාලාවේ සේවය කරන ලද පුද්ගලයන් සහ ඊට අදාළ කරුණු සම්බන්ධයෙන් විමර්ශන අවසන් නොමැති බවත් වැඩිදුරටත් විමර්ශන කටයුතු කරන බවටත්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ සොයලා බැලුව ද මෙම කොලෝසස් තඹ කර්මාන්තශාලාව පිහිටි ස්ථානය වෙත මුලින්ම විමර්ශන කණ්ඩායමක් ළඟා වෙලා තිබෙන්නේ කවදද ඒ කවර විමර්ශන කණ්ඩායමක් විසින් ද කියලා?

උ: 2019 අප්‍රේල් 21 වැනි දින කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් සහ ස්ථානාධිපති වැල්ලම්පිටිය ඇතුළු නිලධාරීන් කණ්ඩායමක්.

ප්‍ර: කොළඹ අපරාධ කොට්ඨාශයේ කවර නිලධාරියෙකුද මෙම නිලධාරී කණ්ඩායම මෙහෙයවනු ලැබ තිබෙන්නේ?

උ: එවකට අධ්‍යක්ෂක සිටි උදය හේමන්ත පොලිස් අධිකාරී මහතා ඇතුළු කණ්ඩායමක් විසින්.

ප්‍ර: ඒ කියන්නේ මේ බෝම්බ ප්‍රහාරයෙන් සිදු වෙච්ච දවසම තමයි මේ තඹ කර්මාන්තශාලාව මුලින්ම පොලිස් විමර්ශන ඒකකයක් පරීක්ෂාවට ලක්කර තිබෙන්නේ කිව්වොත් ඒක නිවැරදිද?

උ: නිවැරදි ස්වාමීනි.

ප්‍ර: එදින රාත්‍රියේ ද?

FAIR COMMENT BY JEZEEM

උ: එහෙමයි ස්වාමීනි. රාත්‍රී 08.30 ට පමණ.

ප්‍ර: මේ සම්බන්ධයෙන් මුලින්ම ඒ තොරතුර ලැබී තිබෙන්නේ කොයි ආකාරයට ද කියලා ඔබට විමර්ශනයේ දී අනාවරණය වුණාද?

උ: එහෙමයි ස්වාමීනි. මෙහි මුල් තොරතුර ලැබී තිබෙන්නේ කොළඹ අපරාධ කොට්ඨාශය වෙත. ඉන්පසුව කොළඹ අපරාධ කොට්ඨාශයේ අධ්‍යක්ෂතුමා විසින් වැල්ලම්පිටිය ස්ථානාධිපතිතුමා දුරකථනය මඟින් අමතලා ඉවර වෙලා ඔබගේ බල ප්‍රදේශය තුළ කොලෝසස් කර්මාන්තශාලාවක් තියෙනවා තඹ factory එකක් ඒ ගැන සොයලා බලලා වාර්තා කරන්න කියලා. ඒ අවස්ථාවේ දී එහෙම factory එකක් තියෙනව ද කියලා ස්ථානාධිපති වැල්ලම්පිටිය දැනගෙන හිටියේ නැහැ. ඊට පස්සේ නිලධාරීන් යොමු කරලා පරීක්ෂා කිරීම් වලින් පසුව එම තඹ factory ය තියෙන තැන අනාවරණය වුණා. ඉන්පසු තමයි කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් එම ස්ථානයට පැමිණියේ.

ප්‍ර: දැන් කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් මුල් වරට එම ස්ථානයට යන අවස්ථාවේ දී එහි සේවකයන් වශයෙන් ඉඳපු අය කී දෙනෙක් සිටි බවට වාර්තා වෙනව ද?

උ: විදේශීය ජාතිකයන් 23 ක් පමණ, ලාංකික කම්කරුවන් 15 ක් 20 පමණ ඉඳලා තියෙනවා.

ප්‍ර: දැන් ඒ අවස්ථාවේ දී කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් සහ ස්ථානාධිපති වැල්ලම්පිටිය මගින් සිද්ධියට අදාළව ප්‍රශ්න කිරීම සඳහා එම ස්ථානයේ සිටි පුද්ගලයින් කී දෙනෙක් පොලීසිය භාරයට ගෙන තිබෙනව ද?

උ: 10 දෙනෙකු ස්වාමීනි.

ප්‍ර: එම 10 දෙනා එම කාර්මාන්තශාලාවේ ඒ අවස්ථාවේ දී සේවකයන් ලෙස සිටි අය ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම පුද්ගලයන් පොලිසිය අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ පුද්ගලයන් කවර මහේස්ත්‍රාත් අධිකරණයකට කුමන නඩු අංකයක් යටතේ ද ඉදිරිපත් කර තිබෙන්නේ?

උ: අලුත් කඩේ අංක 02ක මහේස්ත්‍රාත් අධිකරණය වෙත. ස්ථානාධිපති වැල්ලම්පිටිය මගින් විසින් ඉදිරිපත් කර තිබෙනවා නඩු අංකය B 10242/02/19

ප්‍ර: එම පුද්ගලයන් සම්බන්ධයෙන් මුල් බී වාර්තාව කවුරුන් විසින් ද ඉදිරිපත් කර තිබෙන්නේ?

උ: ස්ථානාධිපති වැල්ලම්පිටිය විසින් .

ප්‍ර: කවදද ඉදිරිපත් කර තිබෙන්නේ?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ: 2019 අප්‍රේල් 22 දින.

ප්‍ර: ඉන් අනතුරුව එම ඉදිරිපත් කරන ලද සැකකරුවන් 10 දෙනා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ ගරු මහේස්ත්‍රාත්තුමා විසින් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමක් කර තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඉන්පසුව පසු අවස්ථාවකදී එම පුද්ගලයන්ට ඇප ලබාදීමක් සිදු කර තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කවදද?

උ: 2019/05 වැනි මස 06 වන දින.

ප්‍ර: නමුත් එම පුද්ගලයන් සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන කටයුතු සිදුකරගෙන යන බවටත් එම අය සම්බන්ධයෙන් පොලිස් වාර්තා පෙර වැරදි වාර්තා සහ අපරාධ නිෂ්කාශන වාර්තා කැඳවීමට පොලීසිය පියවරගෙන තිබෙනව ද කියලා ඔබ හොයලා බැලුව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොනවද අනාවරණය වුණේ?

උ: පොලීසිය කරනු ලබන වාර්තාවල මෙතෙක් සිදුකරන ලද විමර්ශන වලදී ඔවුන් සම්බන්ධ පෙර වැරදී හෝ වෙනත් වැරදි සම්බන්ධයෙන් වාර්තා වීමක් සිදුවී නැත ස්වාමීනි.

ප්‍ර: නමුත් තව දුරටත් විමර්ශන කටයුතු කරගෙන යනවද?

උ: ඔව්. එදින ඇප ලාබාදුන්නේ සැකකරුවන් 10 දෙනාගෙන් සැකකරුවන් 09 දෙනෙකුට පමණයි. දැනටත් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය මගින් මේ සැකකරුවන් සම්බන්ධව තවදුරටත් විමර්ශන වීම් සිදුවෙමින් පවතිනවා.

ප්‍ර: දැන් ඔබ විමර්ශනය සිදු කරන අවස්ථාව වන විට අදාළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගොනු වී තිබෙන ලේඛන ඇතුළත්ව එකී මහේස්ත්‍රාත් අධිකරණ නඩු තීන්දුවේ සහතික පිටපතක් විමර්ශනය කරන අතර තුළ කැඳවාගනු ලැබුව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ ලබාගත්ත එකී වාර්තාව ලබාගත්තේ කවදද?

උ: 2020 ජනවාරී 18 වැනි දින දක්වා.

ප්‍ර: වැඩිදුරට පැහැදිලි කරගන්න නැවත ඔබෙන් ඇහුවොතින් මෙම වැල්ම්පිටියේ තඹ කර්මාන්තශාලාවේ සිටි පුද්ගලයන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට අදාළ මහේස්ත්‍රාත් අධිකරණ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක 10242/2/19 දරණ නඩු වාර්තාවේ 2019 /05 වැනි මාසේ 08 වැනිදා දක්වා ගොනු වී ඇති ලේඛන ඇතුළත් පිටු 01 සිට පිටු 109 දක්වා සටහන් වී ඇති මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු ගොනුවේ සහතික කරන ලද පිටපතක් ඔබට මේ අවස්ථාවේ දී ඒ අනුව ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

Presidential Secretariat's Copy
LAW COMMENT BY JEZEEM

**C 807 වශයෙන් ලකුණු කරන ඉදිරිපත් කර සිටිනවා.**

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්මා මැතිතුමා.</u>**

ප්‍ර: සාක්ෂිකරු ඔබ මෙම කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට අනුයුක්ත වුණායින් පසුව දැනට සේවයේ යෙදී සිටින පොලිස් නිලධාරීන් සහ දේශපාලඥයින් සම්බන්ධයෙන් යම් විමර්ශන වලට සහභාගී වුණේ?

උ: පැහැදිලි නැත ස්වාමීනි.

ප්‍ර: ඔබ මේ කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට අනුයුක්ත වුනායින් පස්සේ විමර්ශන කටයුතු අතර තුළදී මේක ගැන විතරක් නෙවෙයි මං අහන්නේ විමර්ශන කටයුතු අතර තුළදී දැනට සේවයේ යෙදී සිටින පොලිස් නිලධාරීන් සහ දේශපාලඥයින්ගෙන් විමර්ශන කටයුතු වලට සහභාගි වුණා ද?

උ: සහභාගි වුණා ස්වාමීනි.

**මෙම සාක්ෂිකරු විසින් කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට අනුයුක්තව සිදුකළ රාජකාරී හා කොමිෂන් සභාව ඉදිරියේ ලබාදෙන සාක්ෂි හේතුවෙන් මෙම සාක්ෂිකරුට 2015 අංක 4 දරණ සාක්ෂිකරුවන් හා වින්දිතයන්හට ආරක්ෂාව සැලසීමේ සහ පහසුකම් සැලසීමේ පනතේ 25 (4) උපවගන්තිය ප්‍රකාරව ඔහුට හිමිවිය යුතු වරප්‍රසාද සඳහා අයිතීන් ලබාදෙන ලෙසට සාක්ෂිකරු හා වින්දිතයන්හට පහසුකම් සැලසීමේ හා ආරක්ෂාව ලබාදීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි. එසේ නියෝග කරනු ලබන්නේ ඔහු මේ කොමිෂමේ සිදුකරන ලද විමර්ශන රාජකාරී හේතුවෙන් ඔහුගේ රාජකාරී මට්ටමෙන් යම් තර්ජනයක් හෝ අවධානමක් සිදුවිය හැකි බවට කොමිෂන් සභාවට හැඟී යන හෙයින් බව සටහන් කර තබමි.**

**********

**<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.</u>**

ප්‍ර: අලුත්ගෙදර මහත්මයා දැන් මේ කර්මාන්තශාලාව පිහිටි ප්‍රදේශයේ ජනගහනය කොහොම ද? ඒ හරිය residential ප්‍රදේශයක් ද?

උ: කර්මාන්තශාලාව පිහිටි ප්‍රදේශය ඇවිල්ලා වෙනත් තවත් කර්මාන්තශාලා තියෙනවා එයින් පිටුපසට වෙන්න මිනිසුන් පදිංචි වී සිටිනවා.

ප්‍ර: මේකේ අපද්‍රව්‍යය යන්න කොහේ හරි තියෙනව ද අපද්‍රව්‍ය ගලාගෙන යන ස්ථානයක්?

උ: කර්මාන්තශාලාව පිටුපස තිබෙනවා පොඩි ඇලක්.

ප්‍ර: ඒ ඇලටයි අපද්‍රව්‍යය ගලාගෙන යන්නේ?

උ: මම ස්වාමීනි එච්චරම ඒක නිරීක්ෂණය කරේ නැහැ ස්වාමීනි.

**********

FAIR COMMENT BY JEZEEM

**<u>ගරු අදිකාරි මැතිණිය.</u>**

ප්‍ර: ඔබ එම ක්ෂේත්‍රයේ බලන්නට ගියේ කවදාද? කර්මාන්තශාලා ?

උ: 2020 ජනවාරී මස 17.

ප්‍ර: ඒ අවස්ථාව වන විට නම් මං හිතන්නේ මේකේ තිබුණ ද අමුද්‍රව්‍යය විදියට Stores තිබුණ ද දැන් raw inaterial ගෙනවනේ මේගොල්ලන් ඒවා ගබඩා කිරීමේ ස්ථාන තිබුණ ද? ඊට ප්සසේ නිමි භාණ්ඩ Export කරනකම් කොහේ හරි ගබඩා කරන්න ඕනනේ. එහෙම තිබුණ ද එම කර්මාන්ත ශාලාවේ?

උ: ගබඩාකිරීමේ පහසුකම් කර්මාන්තශාලාවේ තිබුණා ස්වාමීනි.

ප්‍ර: ප්‍රමාණවත් තරම් තිබුණා අර කියන විදියට?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ට්‍රාන්ස්ෆෝමර් වගයක් ඒ ගොල්ලෝ ගේනවනේ අර එකේ තියෙන තඹ කම්බිය ගන්න. ඒ ට්‍රාන්ස්ෆෝමර් එහෙමත් තිබුණ ද එතැන නිකන්?

උ: නැහැ ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්මා මැතිතුමා.</u>**

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අතිඋතුම් මැල්කල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට අවශ්‍යදැයි අසමි. අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු මුදාහරී.

වේලාව: ප.ව. 04.50

නැවත කොමිෂන් සභාව ජූලි මස 06 වැනි දින ප.ව.12 පසුවී විනාඩි 30 රැස්වේ.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශයේ නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

## 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.06 වේලාව: ප.ව. 1. 15

සටහන් කළේ - යමුනා දසනායක

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

**පෙනී සිටීම**

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ රවිශානි පීරිස් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

Resident Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නම- මොහොමඩ් හෆීස් මාසෝ
වැඩිදුර සාක්ෂි සඳහා නැවත කැඳවා සහතික වෙයි.

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය</u>**

ප්‍ර විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති මාසෝ මහත්මයා ඔබ පසුගිය අවස්ථාවේදි මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා C 4 B ලේඛණයේ සඳහන් තොරතුරු බුද්ධි තොරතුරු වන බවට?

උ ඒ කියන්නේ ඔය ඉන්දියාවෙන් ආපු තොරතුර . ඔව් ස්වාමිනි ඒක නිශ්චිත බුද්ධි තොරතුරක් .

ප්‍ර ඔබට පුළුවන්ද පැහැදිලි කරන්නට ගරු කොමිෂන් සභාවට hard intelligence කියන්නේ මොකක්ද කියලා ?

උ ස්වාමිනි hard intelligence කියන්නේ ඉතාමත් නිශ්චිත ඉතාමත්ම නිශ්චිත 100% ක් , නැත්නම් 99% ක් ,98% ක් 95 ක් වාගේ නිශ්චිත තොරතුරු තමයි hard intelligence කියන්නේ.

ප්‍ර එතකොට agent information කියන්නේ මොකක්ද ?

උ ස්වාමිනි agent කියන්නේ යම්කිසි සංවිධානයක් තුල බුද්ධි අංශයක් විසින් පවත්වාගෙන යන තොරතුරුකරුවෙක්. එතකොට ඒ සංවිධානයේ තොරතුරු අනිවාර්යයෙන් දෙන තොරතුරු hard intelligence වශයෙන් තමයි අපි වර්ගිකරණය කරන්නේ. ස්වාමිනි එතකොට මේ තොරතුරු ලැබිලා තියෙන්නේ ප්‍රශ්ණ කිරිමෙන්.

ප්‍ර ප්‍රශ්ණ කිරිමෙන් ?

උ ප්‍රශ්ණ කිරිමෙන් ලත් තොරතුරු තමයි මේ . සමහර විට ඊට අමතරව ඒ ගොල්ලෝ වෙනත් ක්‍රමයකුත් මේක confirm කරලා ඇති.

ප්‍ර ඇයි ඔබ එහෙම කියන්නේ ?

උ දැන් සාමාන්‍යයෙන් බුද්ධි අංශ වල අර වගේ ඒජන්තවරු ඒ කියන්නේ සංවිධානයක් ඇතුලේ ඉඳන් තොරතුරු කරුවන් හසුරුවනවා. ඒ ගොල්ලන්ගෙන් ලැබෙන තොරතුරු අපි පිලිගන්නේ hard intelligence හැටියට තමයි වර්ගිකරණය කරන්නේ.

ප්‍ර සිංහලෙන් මොකක්ද කියන්නේ hard intelligence වලට ?

උ නිශ්චිත තොරතුරු.

ප්‍ර එතකොට C 4 B ලේඛණයේ අඩංගු තොරතුරු නිශ්චිත තොරතුරු බවට තමයි ඔබ වර්ගීකරණය කරන්නේ ?

උ එහෙමයි ස්වාමිනි. ඊලඟට ඔය සැකකරුවන් ගෙන් ලබා ගන්නා ප්‍රශ්ණ කිරීම් --වලින් සමහරවිට බුද්ධි අංශයක් යනවා මේ වගේ අවස්ථාවක විශේෂයෙන් ජාතික ආරක්ෂාවට සම්බන්ධ ප්‍රශ්ණයක් ආපුහාම ඒ ගොල්ලන්ටත් අවස්ථාව දෙනවා විමර්ෂණ අංශ බුද්ධි වු වටිනාකමක් ගන්න ඒකෙන් .

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එතකොට වගේ ප්‍රකාශ කලොත් ඒවත් නිශ්චිත තොරතුරු වෙනවා . අනිත් එක ස්වාමිනි ඒවා සාක්ෂි හැටියට ගන්න බැහැ. ඒවා හුදෙක් තොරතුරු පමණයි ඒ තොරතුරු මත තමයි ක්‍රියාත්මක වෙන්න ඕනේ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

සාක්ෂිකරු කියපු විදියට අත් අඩංගුවේ ඉන්න පුද්ගලයින්ට බුද්ධි අංශ වල නිළධාරින් ප්‍රශ්ණ කිරිමට අවස්ථාවක් සලසා දිම සහ ඔවුන්ගෙන් ලබා ගන්නා තොරතුරු වර්ගිකරණයක් පිළිබඳ සාක්ෂිකරු මේ අවස්ථාවේදි ප්‍රකාශ කෙරුවා ඒ කොටස ප්‍රසිද්ධ කරන්න එපා කියලා. මොකද ඒක විමර්ෂණවලදී භාවිතා කරන ක්‍රමවේදයක් හින්දා ඒ කොටස විතරක්

උ ඒ කොටස විතරක්

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>**

ප්‍ර එතකොට මාසෝ මහත්මයා දැන් ඔබ ඔය සඳහන් කරපු ක්‍රමවේදය ඕනෑම රටක ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයක් ?

උ ඕනෑම රටක මේ ක්‍රමවේදය ක්‍රියාත්මක වෙනවා.

ප්‍ර දැන් මේ C 4 B ලේඛණයේ සඳහන් තොරතුරු ලැබුනට පස්සේ කල යුතු දේවල් පිළිබඳව ඔබ පසුගිය අවස්ථාවේදි ගරු කොමිෂන් සභාවට සඳහන් කරනු ලැබුවා?

උ ඔව් ස්වාමිනි.

ප්‍ර අද දින මගේ ඉදිරි ප්‍රශ්ණවලට ප්‍රවිෂ්ඨයක් විදියට ඔබට නැවත කෙටියෙන් පුළුවන්ද මේ C4 B ලේඛණයේ තියෙන තොරතුරු ලැබුනට පස්සේ රාජ්ය බුද්ධි අංශය විසින් සිදු කල යුතුව තිබුනේ මොකක්ද කියන කරුණ පිළිබඳව කරුණු හෙලි කරන්න ?

උ ඔව් ස්වාමිනි මේක when කියන එක මෙතන නැහැ shortly කියලා තියෙන්නේ . අනිත් ඔක්කෝම මෙතන තියෙනවා මම හිතන්නේ අවශ්‍ය කරුණු මෙතන තියෙනවා එතකොට මේ ගොල්ලන්ට තවදුරටත් මේක සම්බන්ධයෙන් තවදුරටත් මේ ගොල්ලන්ට මේක නිශ්චිත වශයෙන් මේ ගොල්ලන්ට confirm කරන්න ඕනේ නම් ඒ ගොල්ලන්ට තිබුනා ඒ ගොල්ලන්ගේ තියෙන resources පාවිච්චි කරන්න. ඒකක් අපි දන්නවා ලංකාව පුරාම මේවගේ ඒකක තියෙනවා . ඒ ක්‍රියාකාරී සාමාජිකයෝ ඉන්නවා ඒවායැ. එතකොට මේ බුද්ධි තොරතුර යම් යම් කරුණු තියෙනවා .මේ කරුණු අපිට පුළුවන් ජාතික බුද්ධි සේවයේ තොරතුරු ජාලයක් තියෙනවා . ඒ ජාලය එක්ක සංසන්දනය කරලා බලන්න පුළුවන් මේක යම් යම් දේවල් එනවාද කියලා මේ නම් ටික

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තියෙනවා . එතකොට ඊට අමතරව අපි ඉන්නවා වෙන්නයි වල උප මහ කොමසාරිස් කාර්යාලයේ නිළධාරියෙක් ඒ නිළධාරියා ගෙන් විමසන්න තිබ්බා ඊට අමතරව මෙහෙම දිගටම මේ සම්බන්ධයෙන් පරික්ෂණ කරගෙන යනකොට තවත් තවත් දේවල් මතුවෙනවා තවත් කරුනු අනාවරණය වෙනවා . ටෙලිෆෝන් නොම්මරය වෙන්න පුළුවන් , එතකොට පුද්ගලයෝ වෙන්න පුළුවන්. එතකොට ඒ ඔස්සේ තවත් අපිට පුළුවන් රහසිගත විමර්ෂණය කරන්න . එතකොට ඒ තුලිනුත් තොරතුරු හම්බ වෙනවා . එතකොට මේ ඔක්කෝම කැටි කර ගත්තාම අපිට යම්කිසි ප්‍රවේශයක් එනවා මේකට යම්කිසි වටිනාකමක් තියෙනවා නම් ඒ වටිනාකම තවදුරටත් දෙන්න .ඒ එක අවස්ථාවක් . ඊලඟ අවස්ථාව තමයි අපි දන්නවා මේකට හම්බ වෙන පූර්ව සිද්ධීන් කිහිපයක් තිබ්බා . එකක් තමයි මාවනැල්ල සිද්ධිය දෙවනි එක තමයි වනාතවිල්ලුවේ සිද්ධිය.තුන්වෙනි එක තමයි බෝම්බයක් හදන්න ගිහිල්ලා පුපුරුවා ගත්ත එක. මේ සම්බන්ධ සියල්ල තොරතුරු තිබ්බා. ඉතින් මේ තොරතුරු ඔක්කෝම අරගෙන මේකත් එක්ක සසඳලා මම කියන්නේ 100% ක් නෙවේ 200% ක හොඳ special වාර්තාවක් දෙන්න තිබුනා 100% ක් මේ තොරතුරේ නිශ්චිත භාවය ප්‍රකාශ කරන්න.

ප්‍ර ඔබ මේ ගරු කොමිෂන් සභාවට කියන්නේ C 4 B ලේඛණයේ තියෙන තොරතුරු තව වැඩිදුරටත් තහවුරු කර ගැනීමේ අවශ්‍යතාවයක් රාජ්‍ය බුද්ධි අංශය වෙත ඇති වෙලා තිබුනානම් ඔවුන් විසින් සිදු කල යුතුව තිබුන දේ ?

උ අනිවාර්යයෙන්ම එය සිදු කල යුතුයි. ඔවුන්ට ප්‍රශ්නයක් තිබුනොත් අනිවාර්යයෙන්ම සිදු කල යුතුයි මේක අහක දාන්න බැහැ මේ තොරතුරු අපි දන්නවා ඔය ආපු තොරතුර ඒ කට්ටිය විශ්වාසදායක තොරතුරු තමයි එන්නේ. කවදාක්වත් අපි ඒ වගේ තොරතුරු අඩු තක්සේරු කරන්නේ නැහැ මම මගේ පලපුරුද්දෙන් මම කියන්නේ එතකොට යම්කිසි අවශ්‍යතාවයක් තිබ්බානම් ඒ ගැන අපිට නැවත පරික්ෂණය කරලා යම් යම් දේවල් අඩුපාඩු අපිට මකා ගන්න තිබුනයි කියලා තමයි මං විශ්වාශ කරන්නේ.

ප්‍ර යම් හෙයකින් මේ C 4 B ලේඛණය ලැබුනේ 2019/04/04 වෙනිදා නම් එතකොට ඒ පිළිබඳව ජාතික බුද්ධි ප්‍රධානීව ඒ ක්ෂණයෙන්ම දැනුවත් කල යුතුව තිබුනාද ?

උ අනිවාර්යයෙන්ම දැනුවත් කල යුතුව තිබ්බා.

ප්‍ර ආරක්ෂක ලේකම්වරයාව ඒ ක්ෂණයෙන්ම දැනුවත් කලයුතුව තිබුනාද ?

උ අනිවාර්යයෙන්ම දැනුවත් කල යුතුව තිබුනා.

ප්‍ර අපි හිතමු යම් හෙයකින් රාජ්‍ය බුද්ධි සේවාවට මේ තොරතුර ඔවුන්ට ලැබුන දෙයක් නිසා ඔවුන්ට අවශ්‍ය වෙනවා මේ පිළිබඳව තහවුරු කර ගන්නට ?

FAIR COMMENT
BY JEZEEM

උ එහෙමයි ස්වාමිනි සැකයක් තිබ්බොත්.

ප්‍ර සැකයක් තිබ්බොත් ?

උ අපැහැදිලි කමක් තිබ්බොත්.

ප්‍ර ඇපැහැදිලි කමක් හෝ සැකයක් හෝ තිබුනානම් එතකොට ඒ ගැන තවදුරටත් තහවුරු කර ගන්න අවශ්‍ය වෙනවානේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර නමුත් ඒ තහවුරු කර ගන්නා තෙක් රාජ්‍ය බුද්ධි සේවාවට යුතුකමක් හා රාජකාරියක් වගකීමක් වගවීමක් තියෙනවාද මේ තොරතුර පිළිබඳව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ ජාතික බුද්ධි ප්‍රධානි වෙත දැනුම් දෙන්නට ?

උ ඔව් ස්වාමිනි. අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාවට තිබුනා ලැබු සැනින් මේ පිළිතුර ලබා දෙන්න ඒ ලබා දෙන අතරෙදි එයාට තිබුනා මේක interim report ඒ කියන්නේ අතුරු වාර්තාවක් හැටියට මේක යවන්න තිබ්බා මේ සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණය කරනවා කියලා එතකොට නොපමාව මම කිව්ව ක්‍රමවේදය සකස් කරලා අඩුම ගානේ දවස් දෙකක් තුනක් ඇතුලත සම්පූර්ණ වාර්තාව දෙන්න තිබ්බා . ඒක එයාට කරන්න පුළුවන්.

ප්‍ර ඒ ඔබ කියන්නේ අතුරු වාර්තාව ලබා දීලා දවස් දෙකක් තුනක් අතර ඔබ අද දින සඳහන් කරන ලද ක්‍රමවේදය අනුගමනය කරමින් තවදුරටත් වැඩිදුර තොරතුරු සොයාගෙන මේ C 4 B ලේඛණයේ තියෙන තොරතුරු තහවුරු කර ගැනීම රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂකවරයාගේ වගකීම වූ බවද?

උ ඔව්. ස්වාමිනි.

ප්‍ර දැන් අපි හිතමු . මෙහෙම අවස්ථාවක් උදාවුනොත් ඒ තමයි මේ පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂකවරයා විසින් ජාතික බුද්ධි ප්‍රධානි වෙත දැනුම් දෙනවා මේ ඇවිල්ලා උපකල්පනයක් උප කල්පිත අවස්ථාවක් ගැන මම ඔබෙන් අහන්නේ . ඒ උප කල්පිත අවස්ථාව අනුව ජාතික බුද්ධි ප්‍රධානි මේ පිළිබඳව නිසි උනන්දුවක් හෝ අවධානයක් දක්වන්නේ නැහැ. ඒ අවස්ථාවේදි රාජ්‍ය බුද්ධි ප්‍රධානිට වගකීමක් පැවරෙනවාද පළමුවෙන්ම ? දෙවනුව එසේ පැවරෙනවා නම් ඒ පැවරෙන්නේ ඇයි ඒ වගේ වගකීමක් තුන්වෙනුව ඔහු විසින් කලයුත්තේ කුමක්ද ?

උ ඔව් ස්වාමිනි අනිවාර්යයෙන්ම ඒ දැනුම් දිම ලිඛිතව කරයි කියලා එයාගේ රාජකාරිය එතනින් අවසන් වෙන්නේ නැහැ . එතකොට ඔය කිව්වා වගේ ජාතික බුද්ධි ප්‍රධානි ඒ සම්බන්ධයෙන් කිසිම තැකීමක් කරන්නේ නැත්නම් අනිවාර්යයෙන්ම අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාවට අනිවාර්යයෙන්ම මේ ගැන එයාට නැවත නැවතත් පැහැදිලි කරලා මෙයාට මේක impress warning මේක සම්පූර්ණයෙන්ම එයාට මේක දැනෙන විදියට අනිවාර්යයෙන්ම එයා කල යුතුමයි.

Fair Comment by Jezeem

ප්‍ර රාජ්‍ය බුද්ධි ප්‍රධානි විසින් ජාතික බුද්ධි ප්‍රධානි වෙත මෙය ඔහුට හොඳින්ම හිතට ධාරණය වන ආකාරයට අවබෝධ කල යුතුයි කියලාද ඔබ මේ කියන්නේ ?

උ ඔව් ස්වාමිනි.

ප්‍ර එතකොට නැවතත් මා කල්පිත අවස්ථාවක් පිළිබඳව ඔබගෙන් ප්‍රශ්ණ අහන්නේ අපි හිතමු කල්පිත අවස්ථාවක් ඇති වෙනවා රාජ්‍ය බුද්ධි ප්‍රධානි විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මෙම තොරතුර ලබා දෙනවා . මා ඔබෙන් මේ ප්‍රශ්ණ කරන අවස්ථාවල්වලදී හැම තිස්සේම ඔබේ අවධානය යොමු කරන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයාගේ කාර්ය භාරය වෙතයි.

එතකොට රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා විසින් මම මේ කියන කල්පිත අවස්ථාව යටතේ උපකල්පනය කරනවා අපි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට මේ පිළිබඳව දැනුවත් කරනවා . මේ තොරතුරේ එහි තියෙන වැදගත්කම පිළිබඳව දැනුවත් කරනවා නමුත් ඒ උපකල්පිත අවස්ථාව යටතේ ආරක්ෂක ලේකම්වරයා ඒ පිළිබඳව කිසිදු උනන්දුවක් දක්වන්නේ නැහැ . එහෙම වුනා නම් එතකොට අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි ප්‍රධානිහට ඒ අවස්ථාවේ යම් වගකීමක් පැවරෙනවාද ? පැවරෙනවා නම් ඒ වගකීම එසේ පැවරෙන්නේ ඇයි ?මොකක්ද පැවරෙන වගකීම? ඔහු විසින් කලයුතුව තිබුනේ කුමක්ද ?

උ ඔය කියන්නේ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවයද නැත්නම් ජාතික බුද්ධි ප්‍රධානීද?

ප්‍ර දැන් මං ඉන්නේ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි ?

උ අර මං කියපු ආකාරයට රාජ්‍ය බුද්ධි ප්‍රධානිට කියන දේම මෙයාටත් එයා පැවසිය යුතුමයි. එයාට අවබෝධ කර දිය යුතුමයි. ඒ දේ ඒ දෙකම එයාට පැවරෙනවා. රාජ්‍ය බුද්ධි ප්‍රධානි සහ ආරක්ෂක ලේකම් දෙකම පැවරෙනවා.

ප්‍ර දැන් නැවතත් මම තුන්වෙනුවත් ඔබෙන් අහන්නේ උපකල්පනය කරනු ලබන අවස්ථාවක් පිළිබඳව . රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයාටත්, ජාතික බුද්ධි ප්‍රධානිටත් මේ තොරතුර පිළිබඳව එහි තියෙන වැදගත් කම පිළිබඳව දැනුවත් කලාට ඔවුන් විසින් සහ කොතරම් කරුණු කිව්වාත් ඔවුන් විසින් ඒ පිළිබඳව නිසි අවධානයක් යොමු කරන්නේ නැති බව. රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයාට වැටහෙනවා.

මේ කල්පිත අවස්ථාවක් ඒ අවස්ථාවේදි ඔහුට පුළුවන්ද, මම මගේ රාජකාරිය කෙරුවා මාව අධික්ෂණය කරනු ලබන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා කිසි පියවරක් ගන්නේ නැහැ මට මුකුත් කරන්න බැහැ ජාතික බුද්ධි ප්‍රධානි මේ හැම ත්‍රිවිධ හමුදාව සහ පොලිසියත් හැම අංශයක්ම සම්බන්ධීකරණය කරනවා ඔහුත් යම්

FAIR COMMENT BY JEZEEM

පියවරක් ගන්නේ නැහැ. මට ඉතින් කරන්න දෙයක් නැහැ කියලා නිකම් ඉන්න පුළුවන්ද ?

උ එහෙම ඉන්න බැහැ ස්වාමිනි.

ප්‍ර එහෙමනම් ඔහු විසින් කල යුත්තේ කුමක්ද කියලා ඔබට කියන්න පුළුවන්ද ?

උ ඔහු විසින් කල යුත්තේ එතකොට නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයෙක් ඉන්නවා නම් ඔහුට පුළුවන් ඔහුට දැනුම් දෙන්න .

ප්‍ර ඒ කියන්නේ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි විසින් නියෝජ්‍ය රාජ්‍ය ඇමතිට දැනුම් දෙන්න ඕනේ ?

උ එයාට දැනුම් දෙන්න පුළුවන් එහෙමත් නැත්නම් ඒ ලියුම අතිගරු ජනාධිපතිතුමාට දැනුම් දෙන්න පුළුවන්. ඒකට ඒ අවකාශය එයාට අනිවාර්යයෙන්ම තියෙන්න ඕනේ ඒක තියෙන බව අපි දන්නවා.

ප්‍ර ඇයි ඔබ කියන්නේ කාට දැනුම් දෙන්න ද අවකාශය තියෙන්නේ ?

උ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවය විසින් අතිගරු ජනාධිපතිතුමාට.

ප්‍ර ඇයි ඔබ එහෙම කියන්නේ ?

උ ඒ අතිගරු ජනාධිපතිතුමා තමයි ඔහු තමයි මේ සම්පූර්ණ සේනා විධායකයා ඔක්කෝම බුද්ධි අංශ ඔක්කොම තියෙන්නේ ඒ යටතේ. ත්‍රිවිධ හමුදාවේ බුද්ධි අංශයක්ම. අනිත් එක එයා තොරතුරක් අනිවාර්යයෙන්ම දැන ගත යුතුමයි ඒක සාමාන්‍ය සම්ප්‍රදාය නෙවෙයි . ඒක තමයි principle එක. අපි කියන්නේ මූලධර්ම. අපි දිගටම කරන්නේ එහෙම තමයි බුද්ධි තොරතුරු සේවාව.

ප්‍ර එතකොට ඔබ හිතනවාද මේ C 4 B ලේඛණයේ තිබුන තොරතුර සේනාධිනායක විදියට එවකට කටයුතු කරපු අතිගරු ජනාධිපතිතුමා විසින් දැනගත යුතුව තිබුනාය කියලා ?

උ අනිවාර්යයෙන්ම.

ප්‍ර එතකොට දැන් එහෙමනම් එතුමා යම් රැස්වීමකට මම කියන්නේ අතිගරු ජනාධිපති තුමා යම් රැස්වීමකට සහභාගී වීමට පෙර කැදවනු ලබන බුද්ධි වාර්තාවේ ඒ පිළිබඳව සඳහන් වෙන්නට ඕනැද ?

උ අනිවාර්යයෙන්ම සඳහන් විය යුතුයි ඔය කියන්නේ මන් හිතන්නේ තත්වාරක්ෂක වාර්තාව threat assessment අනිවාර්යයෙන්ම සඳහන් විය යුතුමයි.

ප්‍ර ඒ පිළිබඳව සඳහන් වෙන්නට ඕනේ කියලා ඔබ කියන්නේ ?

මා ඔබේ අවධානයට යොමු කරන්නට කැමතියි x 97 වශයෙන් ලකුනු කරන ලද ලේඛණයක් ස්වාමිනි සාක්ෂිකරුගේ අවධානයට යොමු කිරීමට අවසර පතනවා මේ x 97 ලේඛණය ජනාධිපති ආරක්ෂක දිසාවේ නියෝජ්‍ය පොලිස්පති වරයා වෙත රාජ්‍ය බුද්ධි සේවාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් නිකුත් කරන ලද වාර්තාව ?

Present Secretary's Copy
LEARN COMMENT BY JEZEEM

උ එහෙමයි ස්වාමිනි.

ප ඒ වාර්තාවේ මා ඔබේ අවධානය යොමු කරන්නට කැමතියි පලවෙනි පිටුවේ X 97 A වශයෙන් ලකුනු කරලා ඉදිරිපත් කරලා තියෙන තක්සේරුව කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න
තමන් විසින් සිදු කරන ලද ආරක්ෂක තත්වය පිළිබඳ සලකා බැලීමේදි මොකක්ද රාජ්‍ය බුද්ධි සේවාව ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව ගැන කියන්නේ මේ සංචාරයට සහභාගි වීමෙන් ?

උ ඔව් ස්වාමිනි. තක්සේරුව කියන අනු මාතෘකාව යටතේ යම් නිර්දේශයක් දාලා තියෙනවා එයා කියනවා අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවාව කියනවා අතිගරු ජනාධිපතිතුමාට හෝ එම සංචාරයේ ත්‍රස්තවාදී අන්තවාදී හෝ වෙනත් කණ්ඩායම් විසින් රජයට පවසන නිශ්චිත තොරතුරු මෙතෙක් වාර්තා වී නොමැති වුවද,පහත සඳහන් කරුණුකෙරෙහි අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.ඒකරලා කියනවා විවිධ දේශපාලන මත දරණ කණ්ඩායම් නොසන්සුන් කාරී තත්වයක් ඇති කරයි කියලා කියනවා .ඒකේ ඊලඟට කියනවා IS ත්‍රස්තවාදීන් Islamic states ඉස්ලාමික ත්‍රස්තවාදී සංවිධානයට ලැදි පුද්ගලයාට මුස්ලිම් අන්තවාදී ක්‍රියාකාරකම් පිළිබඳව මෙන්න මෙතන ලොකු ප්‍රශ්නයක් තියෙනවා.

ප ඇයි ඒ ?

උ අපි එතකොටත් මං හිතන්නේ මේ තොරතුර ඇවිල්ලා තියෙනවා .

ප ඒ කියන්නේ C 4 B ලේඛණය තියන තොරතුර ලැබිලා තියෙනවා.

උ ඔව්.
එතකොට එයා යම්කිසි නිරීක්ෂණයක් කරනවා ඒ නිරීක්ෂණය අනුව එයාගේ පැහැදිලියි එයා රෙකමදාරුවක් කල යුතුව තිබෙනවා.

ප වෙන මොනවද ඒ තක්සේරුව යටතේ කියන්නේ ?

උ ඊට පස්සේ තවදුරටත් කියනවා විදේශයේ ජීවත්වන දෙමල විසිරෙන එල්.ටි. ටි. ඊ කට්ටිය ගැනත් කියනවා .එල්. ටි. ටි. ඊ කාර්ඩර්ස් ගැනත් කියනවා එතකොට ආගමික සහ සමාජ ගැටළු ගැන මගින් පැවති බලපෑම් සම්බන්ධයෙන් කියනවා.ඊට පස්සේ තියනවා එබැවින් අතිගරු ජනාධිපතිතුමා ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ ක්‍රමවේදයක් අනුගමනය කිරීම සහ එතුමාට දර්ශණය වන සීමාව තුල ආසන්නයේ පැමිණෙන පුද්ගලයන් මනා පරීක්ෂාවට ලක් කිරීම යුතුයි කියලා කියන්නේ. එතකොට දැන් කියන්නේ ගියත් ප්‍රශ්නයක් නැහැ කියන එක තමයි මේකෙන් අදහස් කරන්නේ.

ප දැන් ඔබේ අවධානය මම ඒ X 97 වාර්තාවේ පලවෙනි පිටුව කරෙහි යොමු කරනවා එහි ආරම්භයේම සඳහන් වෙනවා නේද මෙම ගරු ජනාධිපතිතුමා සහභාගි වීමට නියමිත රැස්වීම මඩකලපුවේ වෙබර් ක්‍රීඩාංගනයේ පැවැත්විමට තිබුන එකක් කියලා ?

FAIR COMMENT BY JEZEEM

උ 2019/04/12 වෙනි දින පැය 10 ට මඩකලපුව වෙබර් ක්‍රීඩාංගනයේ පැවැත්වෙන රට වෙනුවෙන් එක්වෙමු , එක්ව නැගිටිමු. මඩකලපුව දිස්ත්‍රික් වැඩ සටහනේ සමාප්ති උත්සවය සඳහා අතිගරු ජනාධිපතිතුමා සහභාගි වීමට නියමිතව ඇත.

ප්‍ර එතකොට දැන් පැහැදිලිවම සඳහන් වෙනවා නේද රාජ්‍ය බුද්ධි සේවාවේ දැනුම තුල තිබුනාය කියලා 2019/04/12 වෙනිදා පැවැත්වීමට නියමිත වූ මෙම රැස්වීම තිබුනේ මඩකලපුවේ කියලා ?

උ පැහැදිලිව තිබුනා ස්වාමිනි.

ප්‍ර ඒවගේම ඔබ කියනවා X 97 ලේඛණයේ සඳහන් වෙනවාය කියලා තක්සේරුව කියන ශිර්ෂය යටතේ X 97A තක්සේරුව ශිර්ෂය යටතේ Is තුස්තවාදි සංවිධානයට ලැදි පුද්ගලයින් සහ මුස්ලිම් අන්තවාදී ක්‍රියාකාරකම් පිළිබඳව අවධානය යොමු කිරීම යෝග්‍යයයි කියලා ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඊලඟට දැන් කොහේවත් මේ වාර්තාවේ සඳහන් කරනවාද මේ වාර්තාවේ නමුත් අර වචනතිව් පොලිස් නිළධාරීන් ඝාතනය පිළිබඳව සඳහන් වෙනවාද ?

උ එල්. ටී. ටී. ඊ.සංවිධානය පිළිබඳ අනු මාතෘකාව යටතේ මෙම වචනතිව් සිද්ධිය ගැන සඳහන් වෙනවා හැබැයි මෙය එල්. ටී. ටී. ඊ එකෙන් කරා වගේ තමයි මේකේ සඳහන් වෙලා තියෙන්නේ.

ප්‍ර ඒ කියන්නේ මේ 10 වෙනිදා 2019 /04/10 වෙනිදා රාජ්‍ය බුද්ධි සේවාව විසින් ඉදිරිපත් කරනු ලබන මේ වාර්තාවේ ඒ වෙනකොටත් වචනතිව් සිද්ධිය එල්. ටී. ටී. ඊ. හිතවාදීන් ගේ ගිණුමට තමයි බැර වෙලා තියෙන්නේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එය මුළු වාර්තාවේම ඒ කියන්නේ X 97 වාර්තාවේ කොහේහරි සඳහන් වෙනවාද අර C 4 B ලේඛණයේ මඟින් රාජ්‍ය බුද්ධි සේවාව වෙත ලැබී තිබෙන තොරතුර පිළිබඳව අයි. එස් . ගැන සඳහන් වෙලා තියනවා කිව්වානේ කොහේ හරි සඳහන් වෙනවාද ? දැන් මේ ජනාධිපතිතුමා මඩකලපුවට යන්නට ඉස්සර වෙලා දෙන ආරක්ෂක තත්වය පිළිබඳ තක්සේරු වාර්තාවනේ මේක කොහේ හරි සඳහන් වෙනවාද ?

උ එහෙම ප්‍රහාරයක් ගැන කොහේවත් සඳහන් වෙන්නේ නැහැ හැබැයි ISIS මතවාදය .

ප්‍ර ප්‍රහාරයක් නෙවෙයි ප්‍රහාරයක් වෙන්න පුළුවන්නේ ?

උ ඔව් ප්‍රහාරයක් වීම ගැනත් සඳහනක් නැහැ නමුත් IS මතවාදය ගැන විතරයි සඳහන් වෙන්නේ.

ප්‍ර සඳහන් වෙන්නේ ? එතකොට 2019/04/04 වෙනිදා ඔය C 4 B කියන ලේඛණයේ සඳහන් තොරතුර රාජ්‍ය බුද්ධි සේවයට ලැබිලා තිබුනා නම්

FAIR COMMENT BY JEZEEM

ඔබේ මතය අනුව මේ ක්ෂේත්‍රයේ අත්දැකීම් ලත් පුද්ගලයෙක් විදියට නිළධාරියෙක් විදියට මොකක්ද ඔබ මේ ගරු කොමිෂන් සභාවට කියන්නේ ?2019/04/10 වෙනිදා රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා ගරු ජනාධිපතිතුමා වෙනුවෙන් ඉදිරිපත් කරන මේ ආරක්ෂිත තක්සේරු වාර්තාව ඉදිරිපත් කරන කොට ඒ C 4 B ලේඛණයේ තියෙන කරුණු සොයලා බලලා යම් තහවුරු කිරීමක් කරගෙන එය ඇතුලත් කල යුතුව තිබුනාද නැද්ද ?

උ අනිවාර්යයෙන්ම ස්වාමිනි එය ඇතුලත් කල යුතුව තිබ්බා.

ප්‍ර ඇයි ඔබ එහෙම කියන්නේ ?

උ මම එතකොට මේ තොරතුර හම්බ වෙලා තියෙන්නේ ඉන්දිය ඔත්තු සේවාවෙන් අප්‍රේල් 4 වෙනිදා මං හිතන්නේ. එතකොට මේ වාර්තාව සකස් කරන්නේ අප්‍රේල් 09 වෙනිදා එතකොට දවස් 05 ක් තිස්සේ අපි මේ තොරතුර ගැන දන්නවා . එතකොට මේකේ යම් ක්‍රියාකාරීන් කව්ද කියලාත් තියෙනවා එතකොට මේකේ තියනවා කොයි විදියටද මේ පහරදීම් සිදු වෙන්න පුළුවන් තියෙන ප්‍රවනතාවයත් තියෙනවා එතකොට මේ යන්නේ රටේ ප්‍රධානියා ජනාධිපතිතුමා යන්නේ මේකේ. එතකොට IS මතවාදය ගැනත් අපි දන්නවා IS මතවාදය කියන්නේ Islamic states කියන්නේ මුස්ලිම් නොවන සෑම පුද්ගලයෙක්ම ඝාතනය කිරීම තමයි ඒ ගොල්ලන්ගේ තියෙන ideology එක. එතකොට ඒ තියෙද්දි මේකඅනිවාර්යයෙන්ම මේ වාර්තාවට අනිවාර්යයෙන්ම මේවා ඉදිරිපත් කරන්න තිබුනා. තක්සේරු වාර්තාවට.

ප්‍ර එය ඔහුගේ යුතුකම වුනාද රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයාගේ එම වාර්තාව ඉදිරිපත් කිරීම ?ඒ පිළිබඳව සඳහන් කිරීම.

උ අනිවාර්යයෙන්ම ඔහුගේ යුතුකමක්.

ප්‍ර පසුගිය අවස්ථාවේදී සාක්ෂි දෙන විට ඔබ මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කෙරුවා C 4 A ලේඛණයේ මාතෘකාව වන formation of an alleged plan of attack යන ශීර්ෂයේ allege කියන වචනය යෙදීමෙන් එහි දක්වා ඇති තොරතුරේ තියෙන වටිනාකම හෑල්ලුවකට ලක්වීමක් සිද්ධ වෙලා තියෙනවාය කියලා ?

උ එහෙමයි ස්වාමිනි මං එහෙම ප්‍රකාශ කලා

ප්‍ර දැන් මං ඔබේ අවධානයට යොමු කරන්න කැමතියි ලේඛණයක් .
( ස්වාමිනි ලේඛණයක් පෙන්වයි සාක්ෂිකරුට ) රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා විසින් ජාතික බුද්ධි ප්‍රධානි වෙත 2019/04/07 වෙනිදා යවලා තියෙන මේ ලියුම මං ඔබේ අවධානයට යොමු කරනවා ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එහි මාතෘකාව මොකක්ද ?

උ මාතෘකාව වශයෙන් දක්වලා තියෙනවා ස්වාමිනි information of an alleged plan off attack .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ කියන්නේ මොකක්ද?

උ ඒ කියන්නේ යම්කිසි ප්‍රහාර දීමක් සම්බන්ධයෙන් සැලසුම් සිදුවිය හැකි සැලසුමක් .

ප්‍ර ඒක තමයි මාතෘකාව වශයෙන් සඳහන් කරන්නේ ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර ඔබ කිව්වානේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයාගේ අත්සන ඔබට හුරුපුරුදුයි කියලා ?

උ හොඳට හුරුපුරුදුයි.

ප්‍ර දැන් මම ඔබට පෙන්වනවා යම් ස්ථානයක් ඒ senior deputy general inspector state Intelligence service කියන ඒ වචන වලට උඩින් තියෙන අත්සන . ඒ අත්සන අඳුනනවාද ?

උ අඳුනනවා ස්වාමිනි.

ප්‍ර කාගෙද ඒ අත්සන ?

උ ඒක හිටපු රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකතුමාගේ .

ප්‍ර නම ?

උ නිලන්ත ජයවර්ධන මහත්මයාගේ.

ප්‍ර ඔබ දැන් කිව්වානේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක වරයාගේ අත්සනය කියලා මේ ඔබ මෙතන හඳුනාගත්තේ ?ඔහුගේ අත්සන හඳුනාගැනීමට ඔබට හැකියාව ලැබෙන්නේ ඇයි ?

උ මං ඔහුත් එක්ක මං හිතන්නේ අවුරුදු 10ක් 12 ක් එකට සේවය කළා.අපි දෙන්නා එකම ශ්‍රේණියේ හිටියේ.

ප්‍ර ඔව් ඒ රාජකාරි කටයුතු තුලදී ඔහු ඇසුරු කිරීමේදි ඔබ ඔහුගේ අත්සන දැකලා තියෙනවාද ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර එය ඔබට හුරුපුරුදුද ?

උ හුරුපුරුදුයි.

ප්‍ර ඒ අනුවද අද දින මේ අත්සන ඔබ අඳුනාගත්තේ?

උ එහෙමයි ස්වාමිනි.

ස්වාමිනි 2019/04 වන මස 07 වෙනි දින රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතා විසින් ජාතික බුද්ධි ප්‍රධානි සිසිර මෙන්ඩිස් මහතා වෙත යවා ඇති ලිපිය X 113 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

ප්‍ර දැන් ඒ ලිපියේ අන්තර්ගතය බැලුවාම ඔබට කියන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට එමගින් මොනවද රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා ජාතික බුද්ධි ප්‍රධානි වෙත දැනුම් දිලා තියෙන්නේ කියලා ?ඔබ කිව්වානේ යෝජිත සැලසුමක් පිළිබඳව කියලා ප්‍රහාරයක් ගැන මාතෘකාව. ඊට යටින් මොනවද කියන්නේ ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ඊට යටින් තියනවා ස්වාමිනී Attached here with an information received from a foreign counterpart ඒ කියන්නේ විදේශ ආයතනයකින් එවපු තොරතුර මේ සමඟ ඉදිරිපත් කරමි. for information and instructions please ඔබේ දැන ගැනීම සහ උපදෙස් පතා ඉදිරිපත් කරමි.

ප එතකොට ඒ සමඟ එවලා කරලා තියෙන ඇමුණුම දැක්වෙනවාද ?

උ ඔව් ස්වාමිනි.

ප ඒ ඇමුණුමත් C 4 B ලේඛණයත් සැසඳෙනවාද ?

උ සැසඳෙනවා යම් යම් තැන්වල ඒ අනුව ඒ අවශ්‍යතාවය අනුව ආමන්ත්‍රණය කිරීම මාරුවෙලා තිබ්බත් නමුත් ඒ විදියටම හුඟක් දුරට සැසඳෙනවා.

උ ඒ උත්තරය වැරදි ස්වාමිනි. වැරදි ලේඛණයක් ස්වාමිනි.සැසඳෙනවා ස්වාමිනි දෙකම.

ප ඒ එකම ලේඛණය නේද?

උ එකම ලේඛණය .

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

මේ අවස්ථාවේදී සාක්ෂිකරු දැන් සාක්ෂි ලබා දෙන්නේ C 4 B ලේඛණය පරීක්ෂා කිරීමෙන් පසුව බවත් මීට පෙර ඔහු සාක්ෂි ලබා දුන්නේ C 4 A ලේඛණය සසඳා බැලීමෙන් බවත් සටහන් කර තබමි.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය</u>**

ප එතකොට එහෙමනම් ඊලඟට බලන්න C 4 A ලේඛණයෙත් ඔබ දැන් X 113 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරන ලද ලේඛණයේත් ඒ දෙකේම alleged කියන වචනය සඳහන් වෙනවාද මාතෘකාවේ ?

උ ඔව් ස්වාමිනි alleged කියන වචන දෙකම සඳහන් වෙනවා .

ප ප්‍රථමයෙන්ම alleged කියන වචනය කව්ද ලියලා තියෙන්නේ ? මොන ලියුමේද ?

උ ප්‍රථමයෙන්ම alleged කියන වචනය ලියලා තියෙන්නේ නිලන්ත ජයවර්ධන මහත්මයා මේ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාව .

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>**

ප සාක්ෂිකරු alleged කියන වචනය සාමාන්‍යයෙන් යොදනවාද ?

උ සාමාන්‍යයෙන් යොදනවා ස්වාමිනි ඒ තොරතුර ගැන යම්කිසි අපහැදිලිතාවයක් තියෙනවා නම් විතරයි යොදන්නේ පැහැදිලිතාවයක්

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තියෙනවා නම් කවදාකවත් ඒ වචනය පාවිච්චි කරන්නේ නැහැ . alleged කියන වචනය පාවිච්චි කල සැනින්ම මගේ පලපුරුද්ද හැටියට ඒක ඒ තොරතුර නිශ්චිත නැති බව යම්කිසි අපි හැඟීමක් දෙනවා . යම්කිසි ප්‍රවේශයක් දෙනවා ඒකට.

ප්‍ර සාක්ෂිකරු පොලිස් නිළධාරින්ගේ පාඨමාලාවලදි මෙම වචනවල අර්ථ නිරූපනය කිරීම සම්බන්ධයෙන් පොලිස් නිළධාරීන්ට පාඨමාලා වලින් දැනුම ලබා දීලා තියෙනවාද ?

උ අනිවාර්යයෙන්ම බුද්ධි නිළධාරීන් වශයෙන් විශේෂයෙන්ම වාර්තා ලිවීමේදි විශේෂයෙන්ම තොරතුරු සම්බන්ධයෙන් වාර්තා ලිවීමේදි බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් ඒ වචන අපි හරියට ඒ හැසිරවිය යුතුයි වචනය .

ප්‍ර ඒ වචන හැසිරවිය යුතු අන්දම නියෝජ්‍ය පොලිස්පති වරුන්ට සහ එයට පහළ ඉන්න උසස් නිළධාරින්ටත් දැනුම ලබා දී තිබෙනවාද ?

උ එහෙමයි ස්වාමිනි.වාර්තා ලිවීම සම්බන්ධයෙන් විශේෂ වෙනම පාඨමාලා තියෙනවා. බුද්ධි තොරතුරු වාර්තා ලිවීම , තොරතුරු වාර්තා ලිවීම,විශේෂ වාර්තා ලිවීම සම්බන්ධයෙන් වෙනම report writing කියලා වෙනම පාඨමාලා තියෙනවා.

ප්‍ර ඒ අනුව කොමිෂන් සභාවට දැන ගන්න ඕනේ නියෝජ්‍ය පොලිස්පති වරුන්ටත් ඒ අනිකුත් ඉහළ නිළධාරින්ටත් බුද්ධි අංශයේ නොවන අනිත් නිළධාරින්ටත් එම වචන තේරුම් ගැනීමේ හැකියාව ලබා දී තිබෙනවාද?

උ ඔව් ස්වාමිනි විශේෂයෙන්ම අපි නීති ක්ෂේත්‍රයන් එක්ක අපි වැඩ කරන්නේ එතකොට ඒ වචන සම්බන්ධයෙන් නීති කේෂ්ත්‍රයේ තාක්ෂණික දේවල් තියෙනවා ඉතින් පොලිස් නිළධාරින් වශයෙන් ඒ දැන ගත යුතුයි ඒ කෙසේ වෙතත් ඒවා අපි උසස් පාඨමාලා දෙන කොට සාමාන්‍ය පාඨමාලා දෙන කොට ඒවා අපිට කියලා දෙනවා.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය</u>**

ප්‍ර මීලඟට මම ඔබෙන් ප්‍රශ්ණ කරන්නේ යම් ආකාරයක ප්‍රහාරයක් පිළිබඳව isthishhad මොකක්ද ඒ ප්‍රහාරය ඒක ගැන ඔබට විස්තර කරන්න පුළුවන්ද ?

උ ස්වාමිනි මේක ඉස්සෙල්ලාම ISIS ඉස්ලාම් මූලධර්මවාදීන් පාවිච්චි කරන වචනයක් මේකත් අර ජිහාඩ් වගේ එල්. ටී.ටී.ඊ සංවිධානයක් තියෙන කොට ඔය පාවිච්චි කරනවා Martyrdom කියලා .ඒ කියන්නේ තමන්ගේ සටන වෙනුවෙන් තමන් දිවිනසා ගත්තොත් ඒ සම්බන්ධයෙන් attain Martyrdom ඒ Martyrdom කියන අරාබි භාෂාවේ තේරුම තමයි ඔය තේරුම.

ප්‍ර මාසෝ මහත්මයා ඔබ විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති වරයෙක් නේ ?

උ එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එහෙමනම් ඔබට කියන්නට පුළුවන්ද මේ තොරතුර ඒ කියන්නේ C 4 A?

උ ඔව් ස්වාමිනි.

ප්‍ර ලේඛණයේ පොලිස්පතිවරයා වෙත යැවුණු ඒ තොරතුර ගැනයි මං දැන් ඔබෙන් ප්‍රශ්ණ කරන්නේ .
එය යවලා තියෙන්නේ ජාතික බුද්ධි ප්‍රධානීන්නේ .?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඒ වගේ අවස්ථාවකදි පොලිස්පතිවරයා ගේ දැනුම තුලට පැමිණෙන මේ තොරතුර සලකලා බලලා ඔහුට සිදු කල හැකිව තිබු දේවල් මොනවාද ?

උ ස්වාමිනි මෙතන පොලිස්පති තුමා FNA කියලා එකට ගහපු එක සුදුසු කටයුතු සදහා හැබැයි පොලිස්පති වරයෙක් වශයෙන් එතුමාට කලයුතුව තිබුනේ මේ සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතාව කැඳවලා මේ සම්බන්ධව සාකච්ඡා කරන්න මේ තොරතුර ජාතික ආරක්ෂාවට බලපාන තොරතුරක් සාකච්ඡා කරලා පැහැදිලි කර ගන්න අනිවාර්යයෙන්ම එයාට තිබුනා මේ පිටසන ගහන්න කලින්. ඒ දේ පොලිස්පතිතුමාට කල යුතුව තිබුනා කියලායි මගේ අදහස.

ප්‍ර දැන් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයාව අධික්ෂණය කරන්නේ පොලිස්පතිතුමා නෙවෙයිනේ ?

උ නැහැ.

ප්‍ර එහෙමනම් තමන් අධීක්ෂණය නොකරනු ලබන නිළධාරියෙක්ව කැඳවලා පොලිස්පතිතුමාට පුළුවන් ද ඔහුගෙන් ප්‍රශ්ණ කරන්නට ?

උ පොලිස්පතිතුමාට ඒ මං කියන්නේ නැහැ බලයක් කියලා පොලිස්පතිතුමාට ඒ අවකාශය තියෙන්න ඕනේ .මේ වැඩ කරන කොට සම්බන්ධීකරණය ඇතුව තමයි වැඩ කරන්න ඕනේ . ඉතින් අනිවාර්යයෙන්ම එතුමාට ඒ ඉල්ලීම කරන්න තිබ්බා ඒ කැඳවීමක් සිදු කරන්න තිබ්බා ඒක මම හිතන්නේ නැහැ එච්චර දුරට protocol එක මෙතන පාවිච්චි කරන්න අවශ්‍යයයි කියලා මම නම් හිතන්නේ නැහැ ඇයි මේ තොරතුර ඇවිල්ලා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් බෙහෙවින්ම තුඩු දෙන ප්‍රශ්ණයක් මේක.

ප්‍ර දැන් එහෙම කරුණු විමසීම හැරෙන්නට අපි හිතමු යම් හෙයකින් සුදුසු කටයුතු සඳහා එතුමා පොලිස්පතිතුමා විසින් යම් යම් පාර්ශවයන්ට නිළධාරින්ට මේක යොමු කරලා තිබුනානේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එතකොට හැකියාවක් තිබුනද , පොලිස් නිළධාරින්ව ස්ථානගත කරන්නට නිල ඇඳුමෙන් අදාල ප්‍රදේශ වල ?

උ ඔව් එතුමාට ඒ දේත් කරන්න තිබුනා.

ප්‍ර දැන් එහෙම නිළධාරින්ව හැම තැනකම ස්ථානගත කලාම නිල ඇඳුම්වලින් රටේ සාමාන්‍ය ජනතාව කලබලයට පත්වෙන් නැද්ද

Provisional Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

මොකද මේ වෙනදා වගේ නෙවෙයි අද පොලිසි හැම තැනම දාලා කියලා සාමාන්‍ය කරුණු නොදත් ජනතාව කලබලයට පත්වෙන්නේ නැද්ද එතකොට ?

උ සාමාන්‍යයෙන් ඒක තක්සේරු කර ගන්න ඕනේ පොලිස්පතිතුමා මේ කොයි විදියටද මේක කරන්නේ කියලා . එතකොට ඒ තක්සේරුව අනුව ඒ මහජනයා මම හිතන්නේ නැහැ ඔය විදියට කැළඹීමක් වෙයි කියලා යම්කිසි දෙයක් වෙනවා කියලා මහජනයාට සමහර විට හැඟී යන්න පුළුවන් නමුත් මම හිතන්නේ ඒක මහජනයාට කලබල වෙන්න තරම් ලොකු ප්‍රශ්ණයක් වෙයි කියලා මේක ඒක සැලසුම් කරන කොට ඒවා ලස්සනට ඒ ගොල්ලෝ හොඳට හිතලා බලලා හොඳට ඒ ගැන සැලසුම් කරලා සැලසුම් සහගතව ඒක කරන්න ඕනේ සැලසුම් සහගතව කලොත් ඕක හුඟක් දුරට ඔය කියන මහජන කැළඹීම කියන එක අවම කරන්න පුළුවන් ඒක සාකච්ඡා මාර්ගයෙන් මේක දීර්ඝව සාකච්ඡා කරලා කරන්න ඕනේ එක පාරටම නිකම් මිනිසුන්ව ගිහිල්ලා අතඅරින්න බැහැ.

ප එතකොට ඔබ කියන්නේ C 4 A ලේඛණය පොලිස්පතිතුමාට ලැබිලා තියෙන්නේ ජාතික බුද්ධි ප්‍රධානිගෙන් 2019/04/09 වෙනිදා ?

උ එහෙමයි ස්වාමිනි.

ප ඒ 09 වෙනිදා ඉදලා ප්‍රමාණවත් කාලයක් තිබුනා සැලසුම් කරලා අවශ්‍ය වූ අවස්ථාවල්වලදී ඒ සැලසුම් ක්‍රියාත්මක කරන්න කරන්නට කියලාද ඔබ කියන්නේ ?

උ එහෙම අවස්ථාව තිබුණා පොලිස්පතිවරයාට අවස්ථාව තිබ්බා.

ප එසේ සැලසුම් සහගතව කටයුතු කලොත් ඔබ කියන ආකාරයට අර ජනතාව අනවශ්‍ය භීතියකට පත් වීමක් සිදු කරන්නේ නැතුව ඔවුන්ගේ ආරක්ෂාව සැලසීමේ හැකියාව තිබුනා කියලද ඔබ කියන්නේ ?

උ අනිවාර්යයෙන්ම ඒ හැකියාව තිබුනා.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ප සාක්ෂිකරු මෙවැනි බුද්ධිමය තොරතුරක් ලැබුනාම ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන අයුරින් පොලිස්පති තුමාට එවැනි ප්‍රහාර වැළැක්වීම සඳහා තනි තීරණයක් ගැනීමේ හැකියාවක් තිබෙනවාද නියෝග පනවලා .?

උ ඒක බලපවත්වන්නේ එයා මේ තොරතුර ගැන බලන තක්සේරු කරන එයාගේ දැනුමයි දැන් සාමාන්‍යයෙන් ඒ පොලිස්පතිතුමා බුද්ධි නිළධාරියෙක් නම් මීට වඩා එයාට පැහැදිලි වෙනවා මේ තොරතුරු දැක්කාම . එහෙම නැත්නම් සාමාන්‍ය පොලිස් නිළධාරියෙක් වුනොත් එයාට පුළුවන් ඒක කරන්න බැරිකමක් නැහැ හැබැයි ඉතින් සාමාන්‍යයෙන් කරන්නේ එහෙම කරන්නේ නෑ තනියම කරන්න

FAIR COMMENT BY JEZEEM

බැහැ සාමාන්‍යයෙන් උසස් නිළධාරියෙක් කැඳවලා ඒ ගොල්ලන් එක්ක සාකච්ඡා කරලා සැලසුම් ඔක්කෝම සකස් කරලා තමයි මේක කරන්න ඕනේ අනිවාර්යයෙන්ම කල් තිබ්බා.

ප්‍ර මම ඇහුවේ පොලිස්පතිතුමාට ගන්න එහෙම තීරණයක් නෙවෙයි මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඊට වඩා ඉහළ පාර්ශවයනේගත් සහභාගිත්වයෙන් තීරණ ගැනීමට අවශ්‍ය නේද කියන එක ?

උ ඒකත් එතුමාට ගන්න තිබ්බා.

ප්‍ර ඒ කියන්නේ මොකක්ද ?

උ එතුමාට දැන් එයාට ආරක්ෂක ලේකම් ඉන්නේ පොලිස්පතිතුමාට උඩින් ඔහුට කථා කරන්න තිබ්බා . සර් මං කියන්න තිබ්බා මේ තොරතුර ගැන මට යම්කිසි තියෙනවා මේක යම්කිසි කුකුසක් තියෙනවා .මේකේ යම්කිසි දෙයක් මෙතන වෙනවා කියලා තියෙනවා ඒ හින්දා සර් අපි මෙහෙම යොදමු කියලා එයාට පුළුවන් දැනුවත් කිරීම කරන්න තිබ්බා.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය</u>**

ප්‍ර ඔය C 4 B ලේඛණය ලැබුනේ ඔබ වෙත නම් ඔබ මොනවද එහෙමනම් එය ලැබුණු අවස්ථාවේ පටන් ගනු ලබන පියවර ?

උ ස්වාමිනි මේ ලේඛණය මා අතට පැමිණියත් මම විශේෂයෙන් මේ සම්බන්ධයෙන් මං විසින්ම තක්සේරුවක් කරනවා . එතකොට මේකේ යම්කිසි අපැහැදිලි තාවයක් තියෙනවා නම් මම කරන්නේ මගේ තියෙන සම්පත් මම පාවිච්චි කරලා මේ තොරතුරට වැඩි යමක් වටිනාකමක් දෙන්න පුළුවන් නම් ඒ වටිනාකම දෙනවා .දීලා ඊට පස්සේ මේ සම්බන්ධයෙන් මම යම්කිසි විදියකින් ආරක්ෂක ලේකම්ට හෝ රාජ්‍ය බුද්ධි ප්‍රධානිට මම I will say in no uncertain terms මේක අපේ තොරතුරකිනුත් මේක සනාථ වෙනවා ඒක හින්දා මේකට වහාම අපි ක්‍රියාත්මක වෙන්න ඕනේ. අපි මේකට මෙහෙයුම් කරන්න ඕනේ. මෙන්න මේ අපි අඳුනාගත්ත කට්ටිය මෙන්න මෙහෙම ඉක්මනටම මේගොල්ලන්ව අපිව අත්අඩංගුවට ගන්න අපිට අත්අඩංගුවට ගතයුතු වෙනවා කියන එක සම්පූර්ණයෙන්ම ඒක පැහැදිලි කරන්න පුළුවන් .

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර සාක්ෂිකරු ඔබ C4, C 4 A,C 4 B, සහ C 4 C ලේඛණ බලන්න ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර රාජ්‍ය බුද්ධි සේවාව තුල ඔය ලේඛණවලට පෙර දත්තයන් තිබ්බා නම් සහරාන් හෂිමිගේ ක්‍රියාකාරකම් ඒ කියන්නේ අන්තවාදී දේශණ , IS මතවාදය අනුමත කරන කථා සහ IS මතවාදයට අනුව ක්‍රියා කරන්න කියලා තමන්ගේ අනුගාමිකයන්ව උසි ගැන්වීම මුස්ලිම් නොවන

FAIR COMMENT
BY JEZEEM

තැනැත්තන් සාතනය කිරීම නිවැරදි බව ආදී ඔය කරුණු ඔය C 4 ඉඳලා C4C දරණ ලේඛණ රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙන්න ඉස්සෙල්ලා දත්ත ගබඩාවේ තියෙනවා නම් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක ඔය ලේඛණ මත ක්‍රියාකරලා වෙනත් නිළධාරින්ට යවන ලේඛණවල ඒ කලින් තිබ්බ දත්ත සම්බන්ධයෙන් සඳහන් කිරීම අනිවාර්ය ද නැද්ද ?

උ අනිවාර්යයයි.

ප ඇයි ඔබ කියන්නේ අනිවාර්යයයි කියලා ?

උ එතකොට ස්වාමිනි, දැන් යම්කිසි කණ්ඩායමක් එක පාරටම සාහසික ක්‍රියා- -වලට ඒ ගොල්ලන් නතු වෙන්නේ නැහැ මම ස්වාමිනිට කියන්නම් මම එක්තරා අවස්ථාවක ඒ සේවය කරන කොට මම ගියා ඔය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ බුද්ධි සමාලෝචන රැස්වීමට. එදා අධ්‍යක්ෂකතුමා ගියේ නැහැ ඒ වෙනුවට ගියේ, මම. සාමාන්‍යයෙන් මං නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා හිටියත් අතිරේක අධ්‍යක්ෂකවරයා විදියට මම තමයි ඔවුන් නැති කාලයේ ගියේ . සමහර එව්වාට මමම යනවා . සමහර රැස්වීම්වලට එතන අධ්‍යක්ෂකතුමා ඒකට යා යුතු නැහැ . එතකොට මට මතකයි මේ ගැන මා ප්‍රකාශ කලා යුද්ධය අවසාන වෙන්නේ 2009 මැයි මාසේ 19 වෙනිදා . 2010 වගේ කාලයේදි මට හරියට මතක නැහැ 2010 වසරේ . මම මේ ප්‍රවනතාවය දැක්කා. නමුත් නමුත් මම දැක්කා ඒ කියන්නේ මම briefings වලට යනකොට අනිවාර්යයෙන්ම කිව යුතුයි මම හැම කිෂේත්‍රයක් ගැනම මම එතෙන්ට කියන්න වෙනවා මගේ ක්ෂේත්‍රය හැරෙන්න. එතකොට මම ඒ ප්‍රවනතාවය දැක්කා. එතකොට ඒ ප්‍රවනතාවය දැකලා මම ඔය ගැන ඒ කාලේ 2010 මම ඔය ගැන යම්කිසි ප්‍රකාශයක් යම්කිසි ප්‍රකාශයක් කලා තව්හිද් ජමාත් කියන එක විතරයි මම කථා කලේ අනිත්වා කථා කලේ නැහැ . මේ ප්‍රවනතාවය තිබ්බා ඒ අභාෂය ආවේ සවුදි අරාබියේ වහාබිසම් අභාෂය ඇවිල්ලා තිබ්බේ. ඉතින් ඒ යම්කිසි සඳහනක් කලා. ඒ සඳහනේ එදා ඉඳන් ආපු ප්‍රවනතාවයන් තමයි මේ අන්තිමට වෙනකම් ගියේ.එතකොට අපි බුද්ධි නිළධාරින් වශයෙන් අපි දැන ගෙන ඉන්න ඕනේ. ඉස්සෙල්ලාම වෙන්නේ මූලධර්ම අදහස් ඒ ගොල්ලන්ගේ ඇති වෙනවා . ඊට පස්සේ radicalization ඊට පස්සේ extremism කියන තත්වයට එනවා. ඊලගට ආයුධ සන්නද්ධ වෙනවා . මේ නෛතික ක්‍රියාදාමය ඕනෑම බුද්ධි නිළධාරියෙක් දැන ගන්න ඕනේ. එතකොට ස්වාමිනි කිව්වා වගේ ඔය මතවාදය ගැන කථා කරනවා එතකොට මුස්ලිම් නොවන කට්ටිය සාතනය කරන්න ඕනේ කියලා තමයි ඒක තමයි IS IS මත වාදය එහෙම තියනකොට එතකොට කවද්ද මේවා ක්‍රියාත්මක වෙන්නේ ඉතින් අපි දැක්කා වනාතවිල්ලුවේ ඒක. ඒ තත්වයට ඇවිල්ලා හිටියේ ඒ ගොල්ලෝ එතකොට එහෙම වෙනකොට අනිවාර්යයෙන්ම බුද්ධි නිළධාරියෙක් හැටියට මේවා ඇත්ත

FAIR COMMENT BY JEZEEM

වශයෙන්ම එයාගේ මේකේ ගොනු වෙන්න ඕනේ. එයාගේම සටහන් වල ගොනු වෙන්න ඕනේ. බුද්ධි නිළධාරියෙක් කියන්නේ හැම තිස්සේම එයා යථාවත් වෙන්න ඕනේ. තොරතුරුත් එක්ක සන්නද්ධ වෙන්න ඕනේ . කියවන්න ඕනේ. මම කියන්න ඕනේ බුද්ධි නිළධාරියෙක් කියන්නේ දේශිය වශයෙන් කලාපිය වශයෙන්, ගෝලිය වශයෙන් එයා මේ තොරතුරුත් එක්ක සන්නද්ධ වෙලා ඉන්න ඕනේ. එතකොට තමයිහොඳ තක්සේරුවක් දෙන්න පුළුවන්. එහෙම නැත්නම් කවදාකවත් මේ පුද්ගලයට තක්සේරුවක් දෙන්න බැහැ. you got to read read read and read apart from what you get from the operatives ඒ බුද්ධි නිළධාරින්ගේ තොරතුරු වලට අමතරව මේ අනිවාර්යයෙන්ම ඒ උසස් නිළධාරින් මේවා සන්නද්ධ වෙන්න ඕනේ තොරතුරු වලින් .

ප්‍ර දැන් ඔබ පසුගිය දිනයේදී *සාක්ෂි* දෙමින් ප්‍රකාශ කලා C 4 ඉඳලා C4 C දරණ ලේඛණ වල අඩංගු බුද්ධි තොරතුරු ආවේ එන්න ඇතැයි ඔබ අදහස් කරන්නේ ඉන්දියානු බුද්ධි අංශයක් මගින් කියලා ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ යෙදී සිටි කාලය තුල බුද්ධි තොරතුරු එම අංශයෙන් ලැබුනාද ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර රාජ්‍ය බුද්ධි සේවාව ඔය කියන ඉන්දියානු බුද්ධි අංශයෙන් ලැබෙන තොරතුරු වලට භාවිතා කරපු grading එක මොකක්ද ? මම ඒකෙන් අදහස් කලේ එම මූලාශ්‍රයෙන් ලැබෙන තොරතුරු කොයිතරම් විශ්වාසවන්ත විදියටද ඔබ රාජ්‍ය බුද්ධි සේවය ඒ වකවානුවේ සැලකුවේ?

උ ඉහලම වර්ගීකරණයක් දුන්නා අපි ඔවුන්ට.

ප්‍ර ඉහලම වර්ගීකරණයක් කියන්නේ විශ්වාසවන්ත කල හැකි ඉහලම වර්ගය ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඒකද ඔබ ඔය අදහස් කලේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එහෙමනම් ඔය C 4 ඉඳලා C 4 C දරණ බුද්ධි තොරතුරු ඔබ ප්‍රකාශ කරපු ඒ ඉන්දියානු බුද්ධි අංශයෙන් ලැබුනානම් සහ මම කියපු විදියට සහරාන් හෂිම්- -ගේ පෙර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඒ කියන්නේ අන්තවාදී දේශණ , මුස්ලිම් නොවන අය මරන්න ඕනේ, ISIS මතවාදයට අනුගත වෙලා කථා කරනවා , අනුගාමිකයන්ට ISIS මතවාදය පතුරවන්න හදනවා , ඒ කරුණු දෙකම සලකා බැලුවහොත් X 113 කියන ලේඛණයේ alleged කියන වචනය ඔබ පාවිච්චි කරනවාද ?

උ නෑ. මම පාවිච්චි කරන්නේ නැහැ කිසි අවස්ථාවක පාවිච්චි කරන්නේ නැහැ.

මෙතැන් පටන් සටහන් ගැනීම ල/ලේ ඉන්ද්‍රාණි මිය

Present Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 2.15 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

**ගරු සභාපතිතුමා :**

ප : ඔබ කියන්නේ ඒ කරුණු දෙක සළකලා බැලුවොත්, ඒ කියන්නේ තොරතුරු ලැබෙන මූලාශ්‍රයේ විශ්වාසවන්තභාවය, ඊට අමතරව ඔය C-4 ඉඳලා C-4(c) ලේඛනවලට කලින් රාජ්‍ය බුද්ධි සේවාවේ තියෙන දත්තවල සහරාන් හෂීම්ගේ ක්‍රියාකාරකම් ගැන තිබ්බ සියළු කරුණු සළකා බැලුවා නම් X-113 කියන ලේඛනයේ Alledged කියන වචනය කොහෙත්ම පාවිච්චි කරන එක නුසුදුසුයි?

පි : පාවිච්චි කෙරුවොත් නුසුදුසුයි. කිසි කෙනෙක් කළයුතු දෙයක් නෙමෙයි ඒක.

ප : ඔබ අද කියපු උත්තරය යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ඔබ කිව්වා 2010 වසරේදී ඔබ මේ තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධයෙන් යම්කිසි අනාවරණයක් සිදු කෙරුවා කියලා. මොකද්ද ඒ විදියට ඔබට ඒ අනාවරණය කිරීමට පාදක වුණු කරුණු?

පි : පාදක වුණේ ස්වාමීනි විශේෂයෙන්ම අපේ නැගෙනහිර පළාතේ තියෙන බුද්ධි ඒකකවලින් තමයි ඔය තොරතුරු ලැබුණේ. ඊට පස්සේ සමහර තැන්වල ලැබුණා මාවනැල්ල වගේ එතකොට මාතලේ වගේ. ඒ තැන්වලින් තොරතුරු ලැබුණා, මේගොල්ලෝ මේ වගේ අන්තවාදී දේශන පවත්වනවා කියලා. ඒ මුස්ලිම් ජනතාව නැඹුරු කරන්න අන්තවාදී අදහස් ඔය ISIS කියන එක ආවේ නැහැ එතකොට. අන්තවාදී අදහස් පවත්වනවා කියන්නේ දේශනාව. ඒ එදා ඉඳන් ආපු ප්‍රවණතාවය තමයි මම දකින්නේ. සමහරවිට ඊට කලින් ආවද දන්නෙත් නැහැ. මම දැන ගත්තේ මේක 2010 වර්ෂයේ තමයි මම මේක.

ප : ඔබ කියන පරිදි අන්තවාදී දේශනවලින් මොකද්ද ඔබ අදහස් කරන්නේ? මොකද්ද ඒ අන්තවාදී දේශන කියලා ඔබ?

පි : අන්තවාදී දේශනය කියන්නේ ඒ අන්තවාදීන් විසින් ඒගොල්ලන්ගේ මතවාදයක් තියෙනවා. ඒ මතවාදය හුහාක් දුරට ඒක පැහැදිලි වෙන්නේ පස්සේ ගියහම තමයි. ඔය කාලයේ අන්තවාදී දේශනය කිව්වේ සමහරවිට ඒගොල්ලන්ගේ හුදෙක්ම ආගම ධර්මය කෙරෙහි වෙන්න පුළුවන්. නමුත් පසුකාලීනව තමයි මේවා පැතිරිලා ගියේ. විශේෂයෙන්ම ඔය මාතලේ සිද්ධියක්

Fair Comment by Jezeem

වුණා. මම හිතන්නේ නිලාම් කියන මුස්ලිම් පුද්ගලයෙක් පවුලත් එක්කම මම හිතන්නේ සිරියාවට ගියා. ඒ වගේ තොරතුරක් හම්බ වුණා. එතනින් එයා මරණයට පත් වුණා. එතකොට එතන තමයි ඇත්ත වශයෙන්ම මේක ඉස්මතු වෙලා ආවේ. ඒකෙන් තමයි හරියට ඉස්මතු වෙලා ආවේ. එතකොට තමයි මේ බුද්ධි අංශ ක්‍රියාත්මක වුණේ ඒ සිද්ධියත් එක්කම IS හරහා. ඕක ඇත්ත වශයෙන්ම ස්වාමීනි ඕක ආවේ ඉරාකයෙයි, සිරියාවෙයි තියෙන පසුබෑම මත තමයි ඕක ආවේ. ඕක භූ දේශපාලනයක් තියෙනවා, මම ඒ ගැන කථා කරන්නේ නැහැ ස්වාමීනි. ඕකට භූ දේශපාලනය අයිති වෙනවා. ඉතිං ඒක හින්දා තමයි මේක පටන් ගත්තේ ඒ මතවාදය. එතකොට ඉරාකයේ සුන්නි මුස්ලිම්වරුන්ට අහිමි වුණා. ඉරාකය ඇවිල්ලා ජනතාව බහුතර ඇවිල්ලා ෂියා මුස්ලිම්වරු. නමුත් ඒක පාලනය කළේ සදාම් හුසේන්. ඒ ඇවිල්ලා සුන්නි මුස්ලිම්වරයෙක්. එතකොට ඔහුගේ අනුගාමිකයින් හිටියා. එතකෙට තමයි මම ISIS, ඒක සිරියන් ඉරාක් කියලා එන්නේ, States කියලා එන්නේ ඒක. එතකොට සිරියාවටත් ඔය ප්‍රශ්නයම තිබුණා. ඉතිං ඕක හින්දා තමයි මතවාදය ආවේ ඇත්ත වශයෙන්ම. එතකොට අල්කයිඩා, එතකොට ඊළඟට අනිත් එක, තව එකක් තිබ්බා අල්කයිඩයි, ඒ ඉරාකකාරයෝ පල්ලෙහාට ගියා. පල්ලෙහාට ගියා මේගොල්ලෝ උලුප්පලා ආවා උඩට. ඕකෙන් තමයි වුණේ. මේ සිරියාවයි, ඉරාකයයි පසුබෑම මත තමයි මේක, එතකොට ස්වාමීනි දැන් ඔය මුස්ලිම් ත්‍රස්තවාදය ඒ ඉස්ලාමීය ත්‍රස්තවාදය කියනකොට 99% ක් ඉන්නේ සුන්නි මුස්ලිම්වරුන්ගේ ළමයි. ෂියා මුස්ලිම්වරුන් ඉන්නේ එක කණ්ඩායමයි. ඒ හිස්බුල්ලා. ඒ ලෙබන් හිස්බුල්ලා. ත්‍රස්තවාදියෙක්. ගරිල්ලා කියලා කියන්නේ. ඒගොල්ලෝ තමයි ෂියා එකේ එකම ත්‍රස්තවාදී කණ්ඩායම මරාගෙන මැරෙන. අනිත් ඔක්කොම සුන්නි නිකායට අයත් ත්‍රස්තවාදී කණ්ඩායමක් තමයි තියෙන්නේ.

ප්‍ර : ඔබ කිව්වා අර අන්තවාදී දේශනවලට තමයි ඔබගේ අවධානය යොමු වුණේ කියලා. එම අන්තවාදී දේශන පැවැත්වුවේ ලංකාවේ පුද්ගලයින්ද නැත්නම් පිටරටින් ආපු පුද්ගලයින්ද?

පි : ලංකාවේ පුද්ගලයිනුත් පැවැත්වුවා. ඊට පස්සේ පිටරටිනුත් ආවා පුද්ගලයෝ. මම හිතන්නේ ඉන්දියාවෙන් ආවා ජෙයිනුලාබ්දීන් කියලා. ඒක රජය මම හිතන්නේ තහනමුත් කරව්වා ඕක මට මතක හැටියට. මම ඔය ස්වාමීනි ගන්නේ මම දැන ගත්තු තොරතුරු. මගේ විෂය නෙමෙයි ඕක. මම දැන ගත්තු තොරතුරු තමයි මෙතන ප්‍රකාශ කරන්නේ ස්වාමීනි. ඒ විෂය කරපු

FAIR COMMENT BY JEZEEM

එක්කෙනා මට වඩා මේ ගැන හොඳ පැහැදිලි කිරීමක් එයාට දෙන්න පුළුවන් කියලා තමයි මගේ විශ්වාසය.

ප්‍ර : ඔබට හැකිද ඒ විෂය කරපු පුද්ගලයාගේ නම කියන්න එපා. නම අපි කඩදාසියක් ලබා දුන්නොත් එය ලියලා දෙන්න?

පි : පුළුවන් ස්වාමීනි. ASP – Wickramaarachchi, M.P. Bandara.

(සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුර සාක්ෂිකරු ලේඛනයක ලියා කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. එය සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් ලෙසට සටහන් කර ගන්නා ලෙසට ලසුලේඛිකාව වෙත නියෝග කරමි)

ප්‍ර : ඔබට යම්කිසි අදහසක් තියෙනවද තවුහිද් ජමාත් සංවිධානයට අමතරව ලංකාව තුළ අන්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් ඔබ විශ්‍රාම යනවිට, අන්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාවේ අවධානය යොමු වෙලා තිබ්බ සංවිධාන මොනවාද කියලා?

පි : ඔව් ස්වාමීනි. ඉස්සරලම තවුහිද් ජමාත් කියන්නේ තනි සංවිධානයක්. පස්සේ මේගොල්ලන්ගේ අතරේ මතභේද ඇති වුණා. ඊට පස්සේ මම දන්න තරමට ඒක හතරට කැඩුණා. එකක් තමයි National Thawheeth Jamath , ඊට පස්සේ ශ්‍රී ලංකා තවුහිද් ජමාත්, තව දෙකක් හෝ තුනක් තිබ්බා. එතකොට මම ඉන්න කාලයේ ඔය ටික තමයි තිබුණේ. ඒ කට්ටිය එකට හිටියා. ඊට පස්සේ තමයි කැඩියා ගියේ යම් යම් මතවාද නිසා. ඉතිං මේකේ ප්‍රශ්න තිබ්බා. බෙරුවල ප්‍රශ්න තිබ්බා මේවායේ. ඉතිං ඒගොල්ලෝ සාමාන්‍යයෙන් තවුහිද් ජමාත් කියන සංවිධානය ඒගොල්ලෝ දැන් අපි කතෝලික කට්ටිය ශාන්තුවරු අදහනවනේ. දැන් ඒගොල්ලන්ට ශාන්තුවරු අදහන්න බැහැ. එතකොට ඒගොල්ලෝ අර දාන දෙනවනේ අපි. ඒගොල්ලෝ ඒවාට විරුද්ධයි. නොයෙක් නොයෙක් විරුද්ධ මත ඒගොල්ලෝ ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම කියනවා නම් හුහාක් වෙලාවට මම දන්න තරමින් මේගොල්ලෝ අල් කුරානයේත් යම් යම් වෙනස්කිරීම් කරලා තියෙනවා. එහෙමත් කරනවා. ඉතිං ඒ කරලා තියෙන්නේ ඒ අන්තවාදය මූලධර්මවාදය පැතිරවීමේ අදහසින් තමයි කරලා තියෙන්නේ. එතකොට මෙතන ජමෙයිතුල් උලමා කියලා සංවිධානයක් තියෙනවා. ඉතිං ඒ සංවිධානවලත් ඇතැම් ජමෙයිතුල් උලමා කියන්නේ පොදු සංවිධානයක්. ඉතිං ඒවායේත් සමහරවිට මත දරන කට්ටිය ඇති ඔතන. ඒක සම්ප්‍රදායික මුස්ලිම්වරුන් විතරක් නෙමෙයි ඉන්නේ. සම්ප්‍රදායික මුස්ලිම්වරු කියන්නේ තබ්ලික් ජමාත්, තවුහිද් ජමාත්. අනිත් කට්ටියත් ඉන්නවා ඇති.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ කියපු තවුහිත් ජමාත් සංවිධානවලට අමතරව වෙනත් සංවිධානයක් කෙරෙහි අවධානය යොමු වෙලා තිබුණේ නැද්ද අන්තවාදී ක්‍රියා ...?

පි : නැහැ. තවුහිද් ජමාත් යටතේ තමයි මම දන්න තරමින් අනිත් සංවිධාන තවුහිද් ජමාත්, National Thawheeth Jamath, එතකොට ශ්‍රී ලංකා තවුහිද් ජමාත්, තව දෙකක් තියෙනවා. මට මතක නැහැ ඒ නම් දෙක.

ස්තුතියි.

**********

**ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :**

ප්‍ර : මාසෝ මහත්මයා, ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ වැඩ බලන අධ්‍යක්ෂවරයා හැටියට කොපමණ කලක් සේවය කරලා තියෙනවද?

පි : ස්වාමීනි මම හිතන්නේ මාස 2 ½ ක් පමණ. මාස 2 ½ ක් 3 ක් අතර.

ප්‍ර : ඒ කියන්නේ ඔබ මේ ඉහළම තනතුරේ අඩුම වශයෙන් කෙටි කාලයක් හෝ වැඩ කරලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබට ඒ අත්දැකීම් මතකයි නේද?

පි : මතකයි ස්වාමීනි.

ප්‍ර : ඔබට මතකද ඒ කාලේ තිබිච්ච ඒ බුද්ධි තොරතුරු ආවහම ඒවා විශ්ලේෂණය කිරීම සඳහා සහ ඒවා පිළිබඳ වාර්තා පිළියෙල කිරීම සඳහා විශේෂ අංශයක් තිබුණා?

පි : ස්වාමීනි ඒ කලින් තිබ්බ අංශය. ඒකට අපි කියන්නේ Intelligence Analysis ....,

**********

**ගරු සභාපතිතුමා :**

සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුර ඔහු විසින් ලේඛනයක ලියා ලබා දෙයි. එහි සඳහන් පිළිතුර සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් ලෙස ලියා ගන්නා ලෙසට ලඝුලේඛිකාවට නියෝග කරමි.

පි : Intelligence Analyst Centre (IAC)

**********

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :**

ප : දැන් මහත්මයා මේ අංශය ඔය බුද්ධි තොරතුරු පිළිබඳව ඊළඟ ක්‍රියාමාර්ග ගැනීම සඳහා මහහු මෙහෙවරක් ඉටු කළා නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප : එතකොට ඒ කියන්නේ ලැබෙන තොරතුර විශ්ලේෂණය කරලා, එය බෙදාහැරලා, සම්බන්ධීකරණය කරලා අනිත් අයත් එක්ක සහයෝගයෙන් කටයුතු කළහම එහි ප්‍රතිඵලය මොකද්ද?

පි : හුඟාක් දුරට ප්‍රතිඵලය තමයි ඉස්සරලාම රජයේ ඒ කියන්නේ රටේ ප්‍රධානියාට මේක යනවා. ඔහු දැනුවත් වෙනවා. ඊළඟට එයා සම්බන්ධව අපිට, අපි කියනවා Strategic and Tactically Intelligence කියලා දෙකක්. Strategic තමයි හුඟාක් වෙලාවට ඒවා තමයි ප්‍රතිපත්ති තීරණ හැදෙන්නේ ඒවායින්. එතකොට Tactical Intelligence කියන්නේ අපි ක්‍රියාත්මක වියයුතු දැන් මේ සම්බන්ධයෙන් වගේ. ක්‍රියාත්මක වියයුතු බුද්ධි තොරතුරු. ඉතිං ඔය විදියට දෙකට බෙදෙනවා. ඒවා තමයි බොහොම අපි ඒක දෙන්නේ බොහොම සංක්ෂිප්තව දෙන්නේ. වැඩිදුර තියෙනවා නම් සමහරවිට අඩ ගැහුවොත් අපි සම්පූර්ණ විස්තර දෙනවා. සාමාන්‍යයෙන් ඒ විශ්ලේෂණ ඇවිල්ලා බොහොම පැහැදිලිව කෙටියෙන් තමයි දෙන්නේ අපි.

ප : දැන් ඔය ක්‍රමය තිබුණේ කොයි කාලයේ වගේද?

පි : ඔය ක්‍රමය තිබුණේ 2002 වගේ මම හිතන්නේ තිබුණේ.

ප : ඒ ක්‍රමය නතර වුණේ, ඇණ හිටියේ කොයි කාලයේ වගේද?

පි : ඒ ක්‍රමය අවුරුදු තුනකින් වගේ පස්සේ වගේ ඇණ හිටියා ඒක.

ප : ඔබ හිතනවාද ඒ ක්‍රමය පැවතුණා නම් පසුගිය කාලයේ මෙවැනි අත්දැකීමකට, මෙවැනි බෝම්බ පිපිරීමේ අත්දැකීමකට අපට මුහුණ දෙන්න වෙන එකක් නැහැ කියලා?

පි : මම හිතනවා. මගේ විශ්වාසයක් තිබ්බා.

ප : එතකොට එවැනි ක්‍රමයක් නැවත ස්ථාපනය කරනවා නම් ඒක වටිනවා කියලා ඔබට හිතෙනවද?

පි : ඔව්. අනිවාර්යයෙන් මට මගේ ප්‍රකාශය කරනකොට Think Tank කියලා එකක් Mention කරලා තිබ්බා. එතකොට ඔය Think Tank එක තමයි ඕක.

ප : මා ඔබෙන් මගේ අවසාන ප්‍රශ්නය අහනවා. ඔබට මතකද මීට දින කිහිපයකට පෙර බ්‍රිතාන්‍යයේදී ඉෆියා ඉයිඩ් කියලා කාන්තාවක් බ්‍රිතාන්‍ය ජාතික, මුස්ලිම් අන්තවාදී කාන්තාවක් බෝම්බ පුපුරවන්න කටයුතු කරන්න උත්සාහ කරන්න සූදානම් වෙනකොට බ්‍රිතාන්‍ය රහස් ඔත්තු සේවය විසින් අත් අඩංගුවට

FAIR COMMENT BY JEZEEM

ගත්තා. දැන් ඒ අය ලංකාවේ ක්‍රමය ඒ කියන්නේ ඒ තැනැත්තිය ලංකාවට ඇවිල්ලා, ලංකාවේ ක්‍රමය හොඳට බලලා, ඒ ගැන අධ්‍යයනය කරලා මේ ක්‍රියා පිළිවෙල අනුගමනය කරන්න උත්සාහ දරලා තියෙන්නේ. දැන් බ්‍රිතාන්‍යයේ තියෙන බුද්ධි සේවාවන්වල කාර්යක්ෂමභාවය නිසා ඇයව අත් අඩංගුවට ගන්න ඔවුන්ට හැකි වුණා. දැන් ඔබට මතකද ලංකාවේ බුද්ධි සේවාවලත් එවැනි කාර්යක්ෂමභාවයක් යම් කාලයකට ඉස්සරලා තිබුණා කියලා?

පි : තිබුණා ස්වාමීනි. ඒවා ඒක කාර්යක්ෂමව පැවතුණා. නමුත් යම්කිසි පසුබෑමක් වුණා. ඒ පසුබෑම වුණේ ඒක එහෙම කොහොමද වුණේ කියන එක මට ඒක හරියටම ප්‍රකාශ කරන්න බැහැ. දැන් ඔය කියන ස්වාමීනි කියපු අර බුද්ධි බ්‍රිතාන්‍යයේ බුද්ධි සේවයේ ඒ තොරතුර සම්බන්ධයෙන් මට යමක් කියන්න තියෙනවා. දැන් ඔය විශේෂයෙන්ම ඔය සංවර්ධන රටවල්, අධි තාක්ෂණික රටවල්. ඒගොල්ලෝ ඒගොල්ලන්ගේ බුද්ධි සේවාව හුඟාක් දුරට ප්‍රචලිත කරනවා ඒ තාක්ෂණයෙන්. ඒ තාක්ෂණය තිබුණා සෑහෙන්න. දැන් ඒ තාක්ෂණය මත තමයි හුඟාක් දුරට බුද්ධි තොරතුරු එන්නේ ඒ තාක්ෂණය මත. They depend on technical intelligence whereas we mostly depend on Human Intelligence. We call it Human Int. ඔය ප්‍රශ්නය තියෙනවා අපිට. ඉතිං අපි තාක්ෂණ වශයෙන් අපේ ලංකාවේ බුද්ධි සේවාව තාක්ෂණය වශයෙන් මීට වඩා අපි ඉදිරියට එන්න ඕන කියන එකයි. ඔය හුඟාක් පිටරටවල්වල හුඟාක් ඒගොල්ලෝ ත්‍රස්තවාදී කණ්ඩායම් අරවා මේවා තාක්ෂණ කණ්ඩායම් මගින් තමයි ඒගොල්ලන්ගේ හුඟාක් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නේ.

ප්‍ර : එතකොට මහත්මයා දැන් අපිටත් බුද්ධි තොරතුර ලැබිලා තිබුණානේ. අපිට ඒ පිළිබඳ Technical නොතිබුණා වුණත් තොරතුර ලැබිලා තිබුණනේ. එතකොට බ්‍රිතාන්‍ය බුද්ධි සේවයටත් තොරතුර ලැබිලා ඒගොල්ලොත් අපේ අය වගේ නිකම්ම හිටියා නම් බෝම්බ පුපුරයිනේ එහෙත් නේද. එහෙනම් ඔබට තේරෙනවද අපිට තොරතුර ලැබුණා වුණත් ඒ තොරතුර මත ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම කා සතුවද තියෙන්නේ?

පි : රාජ්‍ය බුද්ධි සේවය සතුව තමයි තියෙන්නේ සහ ඒ බලධාරීන් සතුව.

ප්‍ර : එතකොට රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා ඇත්ත වශයෙන්ම මේ පිළිබඳව ඒ මොහොතේදීම මුලින්ම දැනුවත් කිරීම කළ යුතුව තිබුණේ කවුරුන්ටද කියලා ඔබ හිතන්නේ මේ වෙලාවේ?

FAIR COMMENT
BY JEZEEM

පි : මුලින්ම දැනුවත් කළයුතුව තිබුණේ ඇත්ත වශෆයන්ම රාජ්‍ය බුද්ධි ප්‍රධානී.

ප්‍ර : ඔව්. බුද්ධි ප්‍රධානියා. Next?

පි : ඊට පස්සේ ආරක්ෂක ලේකම්. ඊට පස්සේ ජනාධිපතිතුමා.

ප්‍ර : දැන් එවැනි වාර්තා කිරීමක් කරලා, ඒ පිළිබඳ නිසි පියවර ගත්තා නම් එංගලන්තයේ මෑතදී සිද්ධ වුණා වගේ අපේ රටේ සිද්ධ වෙච්ච මේ දැවැන්ත ප්‍රහාරය නතර කර ගන්නට අපිට ඉඩක් තිබුණා නේද?

පි : මම හිතනවා එහෙම අපිට ඉඩක් තිබ්බා කියලා මම විශ්වාස කරනවා.

ප්‍ර : එහෙනම් ඉදිරි කාලයේවත් මෙවැන්නක් සිද්ධ නොවෙන්න වග බලා ගන්න අපේ ක්‍රමය යම් ආකාරයට ප්‍රති සංවිධානය කරන්න?

පි : එහෙමයි ස්වාමීනි. ප්‍රති සංවිධානය විය යුතුමයි.

Thank You.

**********

**ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :**

ප්‍ර : සාක්ෂිකරු තමන් බුද්ධි අංශයේ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ දීර්ඝ කාලයක් සේවය කරපු නිලධාරියෙක් හැටියට තමන්ට කිව හැකිද මෙවැනි අන්තවාදී සංවිධාන හා ත්‍රස්තවාදී සංවිධාන සඳහා මුදල් ලැබුණේ කොහෙන්ද කියලා?

පි : ස්වාමීනි මටනම් ඒක කියන්න බැහැ. කිසිම තොරතුරක් බුද්ධි තොරතුරක් නැතුව. මට එකක් කියන්න පුළුවන්. මේ කිසිම ත්‍රස්තවාදී සංවිධානයක මුදල් නැතුව ඒගොල්ලන්ගේ සංවිධානය පවත්වාගෙන යන්න බැහැ. ඒගොල්ලන්ට මුදල් අනිවාර්යයෙන්ම දේශීය වශයෙන් හෝ විදේශීය වශයෙන් ලැබෙන්න ඕන. ඒ කොහෙන් ලැබුණද කියන එක ඇත්ත වශයෙන්ම ස්වාමීනි මට ඒක ප්‍රකාශ කරන්න බැහැ මට ඒ සම්බන්ධයෙන් තොරතුරු නැති හින්දා.

ප්‍ර : තමන් බුද්ධි අංශයේ ඉන්න කාලසීමාවේදී එවැනි තොරතුරු හෙළි වුණේ නැද්ද?

පි : විශේෂයෙන් මම තමයි රාජ්‍ය බුද්ධි සේවයේ L.T.T.E. අංශය භාරව වැඩ කළේ. මට එතකොට තොරතුරු සෑහෙන්න ලැබෙනවා. ඔය මුදල් එන විදිය සෑහෙන්න ලැබිලා තියෙනවා. එය අපි වාර්තා කරලත් තියෙනවා.

ප්‍ර : ඒ L.T.T.E. එකට මුදල් ලැබුණු අන්දම?

පි : ඔව් ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඊට වෙනත් අන්තවාදී කණ්ඩායම් සඳහා තමන්ගේ කාලයේදී ...?

පි : නැහැ ස්වාමීනි. මගේ විෂය නෙමෙයි ඕක ඒකයි මම කියන්නේ. එතකොට ඔය ප්‍රාථමික යුගයේ තමයි ඔය තිබුණේ. එතකොට මුදල් ඇවිල්ලා ඇති. නැහැ කියන්න බැහැ. සමහරවිට ඇවිල්ලා ඇති. අපිට ඒක බැහැර කරන්න බැහැ. ඒ කාලයේ මුදල් ඇවිල්ලා ඇති. නමුත් මේකේ අවධානය යොමු වුණේ ISIS මතවාදය උඩට ආවම තමයි මේ සම්පූර්ණයෙන් මේ ඇත්ත වශයෙන්ම මේ ගැන වැඩි අවධානයක් යොමු කළේ.

ප්‍ර : සාක්ෂිකරු ඔබට කිව හැකිද මෙවැනි සංවිධාන සඳහා ශ්‍රී ලංකාවේ දේශපාලන වාතාවරණය සහ දේශපාලන නායකයින්ගේ ආධාර අනුබල දීම් ලැබී තිබෙන අවස්ථා තමන්ට කිව හැකිද කියලා?

පි : ඒක වෙන්න පුළුවන් ස්වාමීනි. ඒක වෙන්න පුළුවන්. මම මේ සිද්ධිය සම්බන්ධයෙන් මම ගැඹුරට අධ්‍යයනය කළේ නැහැ. මම ක්‍රමවේදය විතරයි මම මෙතන ප්‍රකාශ කළේ. නමුත් යම් යම් තොරතුරු මගින් මට පැහැදිලි වෙනවා අනවශ්‍ය මැදිහත්වීම් මෙතන සිදුවෙලා තියෙනවා කියලා. එතකොට ඒ තොරතුරු මත යම්කිසි නිගමනයකට එන්න පුළුවන් ඇයි මේ අනවශ්‍ය විදියට මේ වගේ මැදිහත්වීම් සිදු කළේ. එහෙම නොකළ යුතුව තිබුණා. ඉතිං එහෙම තිබුණා නම් එතන පිටිපස්සෙන් මොනවා හරි ප්‍රශ්නයක් තියෙනවා.

ප්‍ර : ඔබට මැදිහත්වීම් සම්බන්ධව ඔබ දැන ගන්න ලැබුණා කිව්ව නිසා, එම මැදිහත්වීම් සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙන්න පුළුවන්ද අපිට?

පි : ස්වාමීනි මම මේ විවෘත ආරංචි මාර්ගයෙන් තමයි මේ ඔක්කෝම මම දැන ගත්තේ. මට එහෙම තොරතුරු දෙන්න බැහැ. දැන් මම තොරතුරුකරුවෝ පවත්වාගෙන යන්නෙත් නැහැ.

ප්‍ර : තමන්ට ලැබුණු ආරංචි පමණයි තමන් දන්නේ?

පි : එහෙමයි ස්වාමීනි. මට මේ විවෘත ආරංචි මගින් තමයි, ඔය රූපවාහිනිය මගින්, එතකොට පුවත්පත් මගින්, එතකොට Website මගින් ඔය කියවන තොරතුරු තමයි මම දන්නේ.

ප්‍ර : එක් එක් දේශපාලන වශයෙන් යම් අනුග්‍රහයක් නොලබා මෙවැනි සංවිධානවලට තමන්ගේ ඉලක්කයන් කරා යාම සඳහා පහසුකම් ලැබෙනවද නැද්ද?

පි : එහෙම දේශපාලන අනුග්‍රහය නොමැති වෙන්නත් පුළුවන්. ඇතුවත් වෙන්න පුළුවන්. ඒ දෙකම වෙන්න පුළුවන්. ඒ දෙපැත්තම වෙන්න පුළුවන්.

ප්‍ර : දැන් තමන් බුද්ධි අංශයේ වැඩ කරන නිලධාරියෙක් හැටියට කිව හැකිද සමහර විදේශීය බුද්ධි අංශ තමන්ගේ දේශපාලන මති

FAIR COMMENT
BY JEZEEM

මතාන්තරවලට අනුව කටයුතු කරමින් යම් යම් වාතාවරණයන් ඇති කරනවා?

පි : ස්වාමීනි අද ලෝක දේශපාලනය බැලුවහම ඕක තමයි තත්ත්වය. ඒක තමයි මම කිව්වේ භූ දේශපාලනය කියලා. ඉතිං ඒ වගේ තත්ත්වයන් ඇති වෙන්න පුළුවන්. අපිට ඒක බැහැර කරන්න බැහැ. අද ඒක තමයි ජාත්‍යන්තර ප්‍රවණතාවය.

ප්‍ර : එවැනි අවස්ථාවල යම් යම් තොරතුරු සැඟවීම්, තොරතුරු හෙළි නොකිරීම්, තොරතුරු වැරදි විදියට පෙන්වා දීම් ආදිය මගින් ඒ අරමුණු ඉටු කර ගැනීමට හැකියාවක් තියෙනවද?

පි : ඔව් ඉතිං බුද්ධි අංශය ඒවාගේ වැඩ කරනවා. ඒක තමයි කියන්නේ Espionage කියලා ඉංග්‍රීසිවලින් කියන්නේ.

ප්‍ර : ඒක විදේශවලත් කෙරෙනවද? හැමතැනම කෙරෙන දෙයක්ද?

පි : ස්වාමීනි ඒවා කෙරෙනවා. කොටින්ම කියනවා නම් ස්වාමීනි සමහර රටවල්වල දේශපාලනයටත් ඒගොල්ලෝ අයථා ක්‍රමයෙන් වක්‍රව උදව් කරනවා. දැන් අපි දන්නවා විශේෂයෙන්ම රටවල් හුඟාක් වෙලාවට බලයට ගේන්න කොච්චර රටවල් දඟලනවද කියලා ඒ කට්ටිය. ඕක ප්‍රසිද්ධ රහසක් අපි ඔක්කෝටම.

**********

**ගරු බන්දුල අතපත්තු මැතිතුමා :**

ප්‍ර : මාසෝ මහත්මයා ඔබ බුද්ධි අංශයේ කටයුතු කරනකොට තුර්කියේ FETO සංවිධානය සම්බන්ධයෙන් ඔබට දැන ගන්නට ලැබුණද?

පි : ඔව්. මම ඒ සංවිධානය ගැන අහලා තියෙනවා තුර්කියේ FETO සංවිධානය ගැන.

ප්‍ර : ඒ සංවිධානය මෙහේ ඇවිල්ලා ආයෝජන කලාපයේ ආයෝජනයන් කරපු බව දන්නවද?

පි : ස්වාමීනි ඒ ගැන මම දන්නේ නැහැ. මම ඒ සංවිධානය ගැන අහලා තියෙනවා.

ප්‍ර : වෙන මොනවද ඔබ FETO සංවිධානය ගැන දන්නේ?

පි : ඒ අන්තවාදී සංවිධානයක් කියලා දන්නවා. ඒගොල්ලෝ තුර්කියේ ඔතන තියෙනවානේ ප්‍රශ්නයක්. වෙනම රාජ්‍යයක සංකල්පයක් තියෙනවනේ ඔතන ඔය කුර්දිවරුන්ගේ. අන්න ඒ සංකල්පයේ තමයි ඒගොල්ලෝ ඉන්නේ.

ප්‍ර : ඒගොල්ලන් ලංකාවට ඇවිල්ලා හිටන් ලංකාවෙන් පිටව ගියා කියලා ඔබට දැන ගන්න ලැබුණද?

පි : නැහැ ස්වාමීනි. මට ඒ ගැන තොරතුරු නැහැ.

Proofed Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

**********

**ගරු අදිකාරී මැතිණිය :**

ප : මිස්ට මාසෝ, මෙම කොමසාරිස්තුමාගේ අවසාන ප්‍රශ්නයත් එක්ක පොඩි සම්බන්ධ එකක් මම අහන්නම් ඉස්සරලාම. Geo political situation එක යටතේ යම් යම් දේවල් වෙන්නට පුළුවන් කියලා ඔබ ප්‍රකාශ කළානේ. දැන් අතිගරු ජනාධිපතිතුමා 2019 අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව එවකට සිටි මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමා මාධ්‍යයට ප්‍රකාශ කරලා තිබුණා මෙම ප්‍රහාරය පසුපස කුමන්ත්‍රණයක් තිබෙනවාද යන්න සොයා බැලිය යුතුයි කියලා. ඔබ බුද්ධි නිලධාරියෙක් ලෙස ඔබට හැකිද කියන්නට කුමන්ත්‍රණ ලෙස මෙවැනි ප්‍රහාරයන් සිදු වෙලා තිබෙනවාද ලෝකයේ රටවල්වල කුමන්ත්‍රණ ලෙස?

පි : එහෙම ප්‍රහාරවල් සිදුවෙලා තියෙනවා. මට මේ ගැන නම්, මේ ප්‍රහාරය ගැන නම් මට කියන්න දෙයක් නැහැ. එහෙම සිදුවෙලා තියෙනවා ඕන තරම් රටවල්වල.

ප : උදාහරණයක් කියන්න පුළුවන්ද එහෙම රටවල්වල කුමන්ත්‍රණ ලෙස ප්‍රහාර වෙලා තියෙන?

පි : විශේෂයෙන්ම ඉරාකය. ඉරාකය ආක්‍රමණය කළේ. ඉරාකයේ බුද්ධි තොරතුරක් ලැබුණා ඉරාකයේ සමූල ඝාතන අවි තියෙනවා කියලා. ඒ යම්කිසි බුද්ධි අංශයකින් තමයි දුන්නේ තව බුද්ධි අංශයකට. ඒක පාදක කරගෙන තමයි ඒගොල්ලෝ ඒ සිද්ධිය කළේ. නමුත් බලනකොට ඒ මොකුත් තිබුණේ නැහැ. ඕක තමයි දෙන්න පුළුවන් හොඳම උදාහරණය.

ප : ඔබ ප්‍රකාශ කළා අපගේ නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරිනියගේ ප්‍රශ්නයකට Istishhad Attack එකක් කියන්නේ ISIS වචනයක් කියලා. ඒ එක්කම ඔබ ප්‍රකාශ කළා Martyrdom කියන්නේ අරාබි වචනයක් කියලා?

පි : නැහැ නැහැ. Martyrdom කියන්නේ ඉංග්‍රීසි වචනයක්. අරාබි වචනය තමයි Istishhad කියන එක. Martyrdom කියන්නේ ඉංග්‍රීසි වචනයක්. ඒ කියන්නේ ඒගොල්ලෝ අර L.T.T.E. එකෙත් තිබ්බනේ. ඒගොල්ලෝ එහෙම ඒගොල්ලන්ගේ සංවිධාන වෙනුවෙන් ජීවිත පූජා කළොත් ....,

ප : ඔව් ඒගොල්ලන්ව එහෙම හඳුන්වනවා දෙවියන් වෙනුවෙන් දිවි පිදූ අය ලෙස?

පි : දෙවියන් නෙමෙයි සංවිධානය වෙනුවෙන්.

ප : සංවිධානය වෙනුවෙන්. හරි. එතකොට ඔය Istishhad කියන්නේ අරාබි වචනයක්?

FAIR COMMENT — BY JEZEEM

පි : අරාබි වචනයක්.

ප්‍ර : ඔබ සඳහන් කළ මේ Martyrdam කියන වචනයට සමාන වචනයක් ශුද්ධ වූ කුරානයේ තියෙනවද?

පි : ශුද්ධ වූ කුරානයේ දැන් ඔය ජිහාද් කියලා කියනවා. නමුත් ඇත්ත වශයෙන්ම මම නම් ඔය සමාවෙන්න ස්වාමීනි, මම මුස්ලිම් භක්තිකයෙක් වුණාට මම මුස්ලිම් ආගම සියයට සීයක් අදහන්නේ නැහැ.

ප්‍ර : එහෙම නම් මට ඔබගෙන් ඒ ප්‍රශ්න ටිකක් අහන්න ....?

පි : ඔව්. නමුත් මම සාමාන්‍ය දන්න දේවල් තමයි මම ඔය කිව්වේ මුස්ලිම් ආගම ගැන.

ප්‍ර : ඒ වගේම ඔබ සඳහන් කළා මම කැමතියි මේ ප්‍රශ්නය ඔබ ආගම අදහන්නේ නැත්නම් දන්නේ නැහැ කියලා කිව්වාට ....?

පි : අදහන්නේ නෙමෙයි, ආගමට ගෞරවයක් තියෙනවා ස්වාමීනි. උසස්ම ගෞරවය තියෙනවා. නමුත් ඇඳහිල්ලේ පොඩි ප්‍රශ්නයක් තියෙනවා. මම සියයට සීයක් අදහන්නේ නැහැ.

ප්‍ර : ඒ වගේම ඔබ ප්‍රකාශ කළා අන්‍ය ආගමිකයන් මරා දැමිය යුතුයි කියන එකත් IS මතයක් කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : අන්‍ය ආගමිකයන් මරා දැමිය යුතුයි කියන එක ශුද්ධ වූ කුරානයේ තියෙන ආගමික මතයක්ද?

පි : මම හිතන්නේ නැහැ එහෙම තියෙනවා කියලා.

ප්‍ර : නැහැ. මම උත්සාහ කළේ අහන්නට දැන් ISIS මතයක් නිසා ලංකාවේ ඉස්ලාම් අන්තවාදීන් ඉස්ලාම් රාජ්‍යයක් කරා යාම හෝ ඉස්ලාම් අන්තවාදී ක්‍රියාකාරකම් ලංකාවේ ඇති වුණා කියන එක පමණක්මද? එහෙම නැත්නම් කුරානයේ තිබෙන යම් යම් දේවල් වහබ්වාදයේ බලපෑම නිසා වෙනස් ආකාරයකට අර්ථකථනය කරමින් මේ කණ්ඩායම අන්තවාදය කරා ගමනක් ගියාද කියන එක අහන්නට. මොකද IS සංවිධානය ඇති වෙලා සෑහෙන කාලයක්නේ ලෝකයේ. 2014 කැලිෆට් එක Declare කළාට සෑහෙන අතීතයක් තියෙන සංවිධානයක් තමයි IS සංවිධානය. එතකොට ඒ සංවිධානයේ මතවාදය ගෙනියනවද ලංකාවේ මේ ඉස්ලාම් ආගමික කණ්ඩායම. එහෙම නැත්නම් මේ කුරානයේ තියෙන යම් යම් දේවල් වහබ්වාදයේ බලපෑම නිසා අන්තවාදයක් කරා ගිහිල්ලා මේ සංවිධාන අපේ රටේ ව්‍යාප්ත වෙලා අවසානයේ ඔවුන්ව IS එකත් සම්බන්ධ කරගෙන ඉස්ලාම් රාජ්‍යයක් කරා යන එකක්ද සිද්ධ වෙන්නේ කියලා?

පි : මම කියන්නේ ඔය දෙකම තියෙනවා ඔතන.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දෙකම තියෙනවා?

පි : දෙකම තියෙනවා.

ප්‍ර : එතකොට ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ දීර්ඝකාලීන අත්දැකීම් තියෙන පුද්ගලයෙක් මෙන්ම මැලේ වුවත් ඔබ ඉස්ලාම් කියලා මේකේ සඳහන් වෙනවා ආගම. ඉස්ලාම් ආගමිකයෙකු ලෙස ඔබට කියන්නට තියෙන පණිවිඩයක් තියෙනවද විශේෂයෙන්ම මුස්ලිම් ඉස්ලාම් ආගම අදහන ජනතාවට මේ ISIS මතවාදය හෝ මේ ඉස්ලාම් ආගමේ තියෙන වහබ්වාදය අන්තවාදී සංකල්පනාවන් එකතු කරගෙන මේ යන්න හදන්නේ වැරදි ගමනක්ද? එහෙම නැත්නම් මේ ගමන යන්නට එපා, මේ ඉස්ලාම් රාජ්‍යය පිහිටුවා ගන්න එක සිහිනයක් පමණයි ජීවිත විනාශ වෙනවා. එවැනි අදහසක් ඔබට කියන්නට තියෙනවද ඉස්ලාම් තරුණයින්ට?

පි : ඔව් ස්වාමීනි. සෑම ආගමකම, හැම ආගම් නායකවරයෙක්ම, නබිතුමා හෝ වේවා එතකොට බුදු හාමුදුරුවෝ වේවා ජේසුස් වහන්සේ වේවා කියලා තියෙන්නේ එකම දේ. එකම දේ තමයි කියලා තියෙන්නේ. එකම දේ තමයි ප්‍රචාරය කරලා තියෙන්නේ. ඒ කියන්නේ අවිහිංසාවාදය, අපරාධ කරන්න එපා කියලා. තමන්ට ධර්මානුකූලව ජීවත් වෙන්න කියලා. ඉතිං ඕක තමයි එකම දේ. ඉතිං මේ ආගමක් ගෙනල්ලා මෙතන මේ වගේ මූලධර්මවාදය, අන්තවාදය පතුරන එක ඇත්ත වශයෙන්ම ඒ ආගමික නායකයෝ කරපු දෙයක් නෙමෙයි මේ. ඉතිං ඒ හැම කුරානයේ සඳහන් වෙලා තියෙනවා ඒ කියන්නේ හොඳ දේවල් කරන්න කියලා. කවදාකවත් කොහේ ආගමකවත් මම හිතන්නේ නැහැ ඕක තියෙනවා කියලා. මේ මතවාදයක් හදා ගත්ත දෙයක් ඔය ඔක්කෝම මම දන්න තරමින්. එතකොට අපි මොන ආගම අපි හැදෑරුවත් අපි කරන්නේ මනුස්සයෝ විදියට ජීවත් වෙන එකයි අපේ තියෙන්නේ. එච්චරයි. වෙන මේ දේවල්වලින් ඇත්ත වශයෙන්ම මෙතන හුඟාක් දේවල් තියෙන්නේ ස්වාමීනි මම දන්න තරමින් මේ අද තියෙන්නේ මේ ලෝක දේශපාලනය. යම්කිසි ප්‍රශ්නයක් තියෙනවා මෙතන. මම නැහැ කියන්නේ නැහැ. ලෝක දේශපාලනය, එතකොට අන්තවාදය මේ ඔක්කොම බලනකොට මේ ගැඹුරු, ඔක්කොම බලනකොට ඔක්කොම අන්තර්ගතයි මේ ඇතුළේ. මේවායේ ඇතුළේ අපි ඕක නොදැක්කට ඇතුළේ යම් යම් දේවල් තියෙනවා මෙච්චර. මම ඒක බැහැර කරන්නේ නැහැ. මේවායේ හැම රටම බලන්නේ තමන් සශ්‍රීක වෙන්න. ඉස්සරලාම ආරක්ෂාව වශයෙන් සන්නද්ධ වෙන්න. ඊළඟට ආර්ථිකව සන්නද්ධ වෙන්න. ඉතිං එතකොට ස්වාමීනි ජාතික ආරක්ෂාව කියන්නේ කුළුණු තුනක්. දේශපාලන,

FAIR COMMENT
BY JEZEEM

සමාජ, ආර්ථිකය. මේ කුළුණු තුන සමබරව එකට ශක්තිමත් වෙන්න ඕන. ඒ තුළින් තමයි ජාතික ආරක්ෂාව තහවුරු වෙන්නේ. මේ කුළුණු තුනෙන් එක කුළුණක් ගියොත් ජාතික ආරක්ෂාවට ලොකු බලපෑමක් ඇති වෙනවා. එතකොට ජාතික ආරක්ෂාව කියන්නේ මේ තුන තමයි. සමාජ, දේශපාලනය සහ ආර්ථිකය.

ප : මිස්ට මාසෝ ඔබ ප්‍රකාශ කළා උසස් නිලධාරීන් තොරතුරුවලින් සන්නද්ධ කිරීමට අවශ්‍ය පහසුකම් තිබිය යුතුයි කියලා. ඒ කියන්නේ දැන් මේ ලෝකයේ තියෙන ප්‍රවණතාවයන්. දැන් මේ ගෝලීය ත්‍රස්තවාදය කියන එකේ ප්‍රවණතාවයන් වැනි දේවල් පිළිබඳව උසස් විශේෂයෙන්ම බුද්ධි නිලධාරීන් තොරතුරුවලින් සන්නද්ධ කිරීම අවශ්‍යයි කියලා ඔබ ප්‍රකාශ කළා. ඔබගේ අත්දැකීම් අනුව රාජ්‍ය බුද්ධි සේවාව තුළ මෙවැනි ඔබ ප්‍රකාශ කරන ලද විදියට තොරතුරුවලින් සන්නද්ධ කිරීමට අවශ්‍ය පහසුකම් තියෙනවද එහෙම නැත්නම් වැඩසටහන් තියෙනවද රාජ්‍ය බුද්ධි සේවාව තුළ?

පි : ස්වාමීනි වැඩසටහන් නැත්තෙම නැහැ වැඩසටහන් තියෙනවා. හැබැයි මේක ඉතිං තමන්ගේ ආකල්පය. දැන් යම්කිසි බුද්ධි නිලධාරියෙකු ඔක්කොම හැන්දෙන් පොවන්න බැහැ. ඒගොල්ලෝ ඒ තනතුර ඒගොල්ලන් ඒ තත්ත්වයට, ඒගොල්ලන් ඒකට ආකර්ෂණය You must have the passion ඒ වෘත්තිය සම්බන්ධයෙන්. තමන්ට ඒ මම දන්නේ නැහැ සිංහලෙන් මොනවද කියලා Passion එක කියලා. ඒ ආශාව, ඒ ආකර්ෂණය තියෙන්න ඕන. එතකොට ආකර්ෂණය මත තමන් ගොඩ නගා ගන්නවා තමන්ගේ අනන්‍යතාවයක්. ඒ අනන්‍යතාවය ගොඩ නගාගෙන තමන් යන්න ඕන. එතකොට තමන්ට සෑහෙන දුරට තමන් කියවන්න ඕන. තමන් තොරතුරු සන්නද්ධ වෙන්න ඕන. එතකොට තමන් පාඨමාලා හදාරන්න ඕන. ඒ පාඨමාලා තුළින් තමන් යම් යම් දේවල් වෙනකොට ඒවා තමන්ගේ දැනුමට එකතු කරන්න ඕන. ඉතිං මේක එක රෑයෙන් එන්නේ නැහැ. මේක කාලයක් යාමෙන් බොහොම හිමිහිට ප්‍රවර්ධනය වෙන දෙයක් බුද්ධි නිලධාරියෙක්. බුද්ධි නිලධාරියෙක් වෙන්න සාමාන්‍ය හොඳ බුද්ධි නිලධාරියෙක් වෙන්න අඩු ගාණේ අවුරුදු පහක් හයක් වත් එක දිගට වැඩ කරන්න ඕන. අවුරුදු දහයක් වැඩ කළොත් හරියට ආකල්පමය වශයෙන් වැඩ කළොත් ඔවුන්ට හොඳ බුද්ධි නිලධාරියෙක් වෙන්න පුළුවන්. හැබැයි මේ බුද්ධි නිලධාරීන්ට වගකීම් දෙනවා නම් මේ වගේ බුද්ධි නිලධාරීන්ට තමයි ඇත්ත වශයෙන්ම ඒ තැන දෙන්න ඕන.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ මෙම කොමිසම හමුවේ ලබාදෙන ලද ප්‍රකාශයේ තියෙනවා ඉස්ලාම් ධර්මයෙහි ඉතිහාසය හා කලාපීය මොවුන්ගේ පැතිරීම සම්බන්ධයෙන් මනා දැනුමක් ඇති තෝරා ගත් මුස්ලිම් නිලධාරීන් මේ සඳහා, මෙම බුද්ධි තොරතුරු පිළිබඳව පුහුණු කරන්න ඕනෙයි කියලා. ඔබ ඇයි ඔබ දැන් L.T.T.E. ත්‍රස්තවාදය තියෙන සමයේදී ඇත්තටම මුස්ලිම් නිලධාරීන් තමයි හුඟාක්ම බුද්ධි තොරතුරු සොයා බැලීමේ කටයුතුවල නිරත වුණේ. දැන් මෙම වර්තමාන ඉස්ලාම් ආගමික අන්තවාදය කියන එක L.T.T.E. ත්‍රස්තවාදයම වැනි දෙයක් නොවන බව මෙම කොමිසම හමුවේදී කරුණු ඉදිරිපත් කළ බොහෝ බුද්ධි නිලධාරීන් වගේම විශේෂඥ දැනුම ඇති අය පවා ප්‍රකාශ කළා. එවැනි තත්ත්වයක් යටතේ ඔබ හිතනවාද මුස්ලිම් නිලධාරීන් මෙම බුද්ධි තොරතුරු මෙම සංවිධානවල පිළිබඳ සොයා බැලීම සඳහා මුස්ලිම් නිලධාරීන් පමණක් යොමු කිරීම ප්‍රමාණවත්. ඇයි දෙමළ නිලධාරීන්, දෙමළ භාෂාව කථා කරන අයට ඉක්මණටම ඉස්ලාම් ධර්මය උගන්වන්නට අපහසුයිද? දෙමළ නිලධාරීන්ව මේ වැඩයට යෙදවීම වඩාත් සාර්ථක විය නොහැකිද? ඒ වගේම මේ ඉස්ලාම් ආගමික අන්තවාදීන් මේ දෙවියන් අල්ලාහ් දෙවියන් සමඟ කරන්නා වූ එක්තරා ආකාරයක කැපවීමක් සහ බැඳීමක් තමයි මෙම අන්තවාදී සංවිධානවල තිබෙන බව මෙම කොමිසම හමුවට කරුණු ඉදිරිපත් වුණේ. එතකොට එවැනි කණ්ඩායමක් පිළිබඳව ඉස්ලාම් ආගම අදහන තවත් පුද්ගලයෙකු සෙවීම හෝ ඔවුන්ව අල්ලා දීම පිළිබඳව කටයුතු කරන්නට පුළුවන් යැයි ඔබ සිතනවාද?

පි : ස්වාමීනි මම මේකට උදාහරණයක් ගේන්නම්.

**********

**ගරු සභාපතිතුමා :**

මේ අවස්ථාවේදී කෙටි වේලාවකට සාක්ෂිකරුගෙන් ඉතුරු සාක්ෂි ලබා ගැනීම මාධ්‍ය නොමැතිව ලබා ගන්නා බව ප්‍රකාශ කරමි. මාධ්‍යය ශාලාවෙන් පිටත් කරයි.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අවසන් වූ පසු ඊළඟ සාක්ෂිකරු ටික වෙලාවකින් ගන්නා බව සඳහන් කරමි.

ඒ අන්තිමට අහපු ප්‍රශ්නය ලියන්න එපා. වාර්තාගත කරන්න එපා.

පි : ස්වාමීනි මම මේකට උදාහරණයක් ගේන්නම්. අපි දන්නවා 1963 මැලේසියාවේ තිබුණා කොමියුනිස්ට්වාදය. ඒගොල්ලෝ කැරලි කරා ඒ ආණ්ඩුවට විරුද්ධව. ඒ කට්ටිය තනිකර චීන ජාතිකයෝ ඒ

FAIR COMMENT BY JEZEEM

හිටියේ. එතකොට ඒ ආණ්ඩුව විසින් මට මම හිතන්නේ තුන්කුලද්‍රසා තමයි ඒ කාලයේ හිටිය අගමැතිතුමා. මේක මෙහෙයවන්න දැම්මේ, මේ තනිකරම මේක මෙහෙව්වේ චීන ජාතිකයෙක්. එතකොට මේ ප්‍රශ්නයේදී මම කියන්නේ නැහැ ඔක්කෝම මුස්ලිම්වරුන්ට මේක දාන්න ඕන කියලා. මුස්ලිම්වරුන්ගෙත් යම් යම් ඒගොල්ලන්ගේ යම් යම් දේවල් තියෙනවා. සමහර මුස්ලිම්වරු හුඟාක් වෙලාවට ඔය කියන විදියට අපෙන් ඒගොල්ලන්ගෙන් ඒ බලාපොරොත්තු වෙන සාර්ථක ප්‍රතිඵල ලැබෙන්නේ නැති වෙන්න පුළුවන් ඒගොල්ලන්ගේ ආගම හින්දා. නමුත් මේ අතරේ ඉන්නවා හරියට රාජකාරී කරන මුස්ලිම්වරුන්. අන්න ඒගොල්ලන්ව තෝරා ගන්න ඕන. ඒ බලධාරීන්ගේ තියෙන වගකීම ඒක. මේකට මුස්ලිම්ද, සිංහලද, දෙමළද කියලා ප්‍රශ්නයක් නෙමෙයි. ඒගොල්ලන්ට ඒ භූමියේ දැනුම් තේරුම්කම් තියෙන්න ඕන. ඒ ආගමේ සංස්කෘතිය, ආගම ගැන යම්කිසි දැනුමක් තියෙන්න ඕන. එතකොට විශේෂයෙන්ම ඒගොල්ලන්ට දෙමළ කථා කරන්න පුළුවන් වෙන්න ඕන. මේ වගේ නිලධාරින් තමයි අවශ්‍ය වෙන්නේ. නැතුව දෙමළ කථා කරන්නවත් බැරි, ඒ සංස්කෘතියක් දන්නේ නැති, ආගමක් දන්නේ නැති, ඒ වටපිටාවක් දන්නේ නැති, භූමිය දන්නේ නැති කට්ටිය යොදලා වැඩක් නැහැ මේකට. ඉතිං ඒ නිලධාරීන් තෝරලා හරි නිලධාරීන් ඒ රාජකාරියට යොදන එක තමයි ඒ බලධාරීන්ගේ වගකීම. ඉතිං කිව්වා වගේම අපි දැන ගන්න ඕන අපි කවුද යොදන්නේ කියලා. හරි මනුස්සයාව හරි දේට යොමු කරන්න ඕන. ඒක බුද්ධි බලධාරීන්ගේ යුතුකමක්, වගකීමක් ඒක.

**********

**ගරු අදිකාරී මැතිණිය :**

ප්‍ර : මිස්ට මාසෝ 2019 අප්‍රේල් 21 වෙන ත්‍රස්ත ප්‍රහාරයට සම්බන්ධ වූ ත්‍රස්තවාදීන් පස් දෙනෙක් පිළිබඳව 2015 වසරේ සිට බුද්ධි අංශ ආවේක්ෂණය කරලා තිබෙන බව මෙම කොමිසම හමුවේ කරුණු ඉදිරිපත් වුණා. එම ත්‍රස්තවාදීන් 2015 වසරේ ඉඳලම IS සංවිධානයත් සමඟ සබඳතා ඇති IS මතවාදය ඔස්සේ යන සංවිධානයක් කියලත් වාර්තා වෙලා තියෙනවා. එතකොට එම ත්‍රස්තවාදීන් පස් දෙනා ආවේක්ෂණය කිරීමේදී ඇති වූ කිසියම් ප්‍රශ්නයක් නිසාද ඔවුන් මෙම ප්‍රහාරය කරනකම්ම ලංකාවේ බුද්ධි සේවාවන්වලට ඔවුන් ප්‍රහාරයකට සූදානම් වෙන බව සොයා ගැනීමට බැරි වුණේ? මොකද ඉන්දියානු බුද්ධි සේවාව මෙම ත්‍රස්තවාදීන්ගේ නම් පවා එවා තිබුණා. ඔබට මතයක් ප්‍රකාශ කරන්නට පුළුවන්ද ඇත්තටම ලංකාවේ ඇයි එවැනි දෙයක් සිද්ධ

FAIR COMMENT BY JEZEEM

වුණේ 2015 ඉඳලාම ISIS ත්‍රස්තවාදයට සම්බන්ධ පිරිසක් ලෙස ආවේක්ෂණය කරපු අය මෙම ප්‍රහාරය කරන එක සොයා ගැනීමට නොහැකි වීම ගැන?

පි : ඔව් ස්වාමීනි. ආවේක්ෂණය අපේ ආවේක්ෂණය කරන්න යම්කිසි ඒකට කරුණු තියෙන්න ඕන මොකටද ආවේක්ෂණය කරන්නේ කියලා. දැන් ඒගොල්ලෝ ක්‍රියාකාරකම් කරනවා කියලා ආවේක්ෂණය කරන එක, එක දෙයක්. එතකොට යම්කිසි ක්‍රියාවක් කරනවා කියලා සම්බන්ධයෙන් ආවේක්ෂණය කරන එක තව දෙයක්. දැන් සාමාන්‍යයෙන් ආවේක්ෂණය කරනවා කියලා සාමාන්‍යයෙන් පොලීසිය ගත්තහම, පොලීස් රාජකාරී ගත්තහම අපි කියනවා IR Supervision කියලා. අපි IR Supervision කියලා අපි ඒක Grade කරනවා. IRC, RC කියලා Grade කරනවා. ඒ Grade කරලා සාමාන්‍යයෙන් ඒකට නිලධාරියෙක් දානවා. ඒ නිලධාරියාගේ තමයි එයාව Monitor කරලා ඒ සටහන දාන එක දැක්කද නැද්ද ඒ වගේ. ඉතිං ඒ වගේ ආවේක්ෂණයක්ද මම දන්නේ නැහැ. නමුත් ආවේක්ෂණය කළා කියලා ප්‍රතිඵලය මොකද්ද. මොකද්ද ප්‍රතිඵලය. එහි ප්‍රතිඵලයක් තියෙන්න ඕන. ඉතිං ප්‍රතිඵල රහිතව ආවේක්ෂණය කරලා වැඩක් නැහැ. ප්‍රතිඵල සහිතව නම් විතරයි. එතකොට ඒ ආවේක්ෂණ තුළින් අපි යම්කිසි බුද්ධි තොරතුරක් ලබා ගත්තද. ලබා ගත්තා නම් මොනවද ඒ බුද්ධි තොරතුර. එතකොට අපි දිගටම ආවේක්ෂණය කරනවද නැද්ද. එතකොට මොකද්ද මේකේ තියෙන පරමාර්ථය. දැන් ආවේක්ෂණය කරන පළියට ආවේක්ෂණය කරන්නේ නැහැ. යම්කිසි ආවේක්ෂණය කරනවා නම් යම්කිසි පදනමක් මත තමයි ආවේක්ෂණය කරන්න ඕන. අන්න අර IRC වගේ නම් Right මම දැක්කා මෙයාව නැහැ මෙයා ඉන්නවා ඒ වගේ. දැන් මොකද්ද පදනම ආවේක්ෂණය කරන පදනම. අන්න ඒ පදනම තමයි අපි දැන ගන්න ඕන මොකද්ද මොන පදනම යටතේද මේ ආවේක්ෂණය වුණේ. එතකොට දැන් ආවේක්ෂණය වුණත් එක්කම බුද්ධි තොරතුරුත් එන්න ඕන. නිකම් ආවේක්ෂණය වැඩක් නැහැ. It has to done with diligence. ආවේක්ෂණය තුළ තව බුද්ධි තොරතුරු මොනවද. එතකොට ආවේක්ෂණය කරලා තියෙනවා නම් අපි දැන ගන්න ඕන මෙයා ඉන්නේ කොහේද. එයා පාවිච්චි කරන වාහන තියෙනවද. එයා පාවිච්චි කරන ටෙලිෆෝන් එක තියෙනවාද, අරවා තියෙනවද, මේවා තියෙනවද, ඕවා ඔක්කෝම අපි දැන ගන්න ඕන. එතකොට අඩු තරමින් අපිට කියන්න පුළුවන් ටක් ගාලා මෙන්න මෙයාව අවශ්‍ය වෙන්නේ. මෙයාව Arrest කරන්න

FAIR COMMENT BY JEZEEM

කියලා. ඉතිං ඒ ආවේක්ෂණය යම් පදනමක් තියෙන්න ඕන. ඒ ආවේක්ෂණය තුළින් මොනවද ගත්ත තොරතුරු. ඒ තොරතුරු තියෙනවද. එතකොට ඒ තොරතුරු මෙන්න මේ වගේ තොරතුරක් ආපුවාම ඒකේ වැදගත්කම මොකද්ද. ඉතිං ආවේක්ෂණය කියන්නේ එන්න ඒකයි. අපි තොරතුරු රැස් කරනවා, ඉන්න තැන දැන ගන්නවා, එයා කොයි තැනද සැරි සරන්නේ කියලා දැන ගන්නවා. ඒ ඔක්කොම තොරතුරු. මේ තොරතුරු අපි ගාව තියෙන්න ඕන. එතකොට මේ වගේ තොරතුරක් ආපුවහම අපි ඒ සැණින් අපි දන්නවා ඒ මනුස්සයා කොහේද ඉන්නේ කියලා. ඒ යම්කිසි පදනමක් තියෙන්න ඕන ආවේක්ෂණයට. ආවේක්ෂණය කළා කියලා නිකම් නෙමෙයි ඒ තොරතුරු අපි ගාව රැස් කරලා තියා ගන්න ඕන.

ප : ඔබගේ දීර්ඝ කාලීන බුද්ධි නිලධාරියෙකුගේ අත්දැකීම් මත ඔබට ප්‍රකාශ කරන්නට පුළුවන්ද ඉන්දීය බුද්ධි සේවාව මොන වගේ Technique එකක් පාවිච්චි කරලාද මෙම තොරතුර මෙතරම් නිවැරදිව දැන ගැනීමට හැකි වුණේ. ඔවුන් කිසියම් නිලධාරියෙක් Infiltrate කළාද කණ්ඩායමක්. එක්කෝ අඛණ්ඩව ඔබ පවසන ආකාරයට ඔබ දැන් දීර්ඝ වශයෙන් පැවසූ ආකාරයට ආවේක්ෂණයක් සිද්ධ කළාද ඔබට කියන්නට පුළුවන්ද ඔබ හිතන දේ සියයට සීයක් නිවැරදි නොවුණත් ඔබගේ දීර්ඝකාලීන අත්දැකීම් මත?

පි : ඔව් ස්වාමීනි. මේ තොරතුර පදනම් වෙලා තියෙන්නේ සියයට අනූවක්ම අර 2018 සැප්තැම්බර් 01 වෙනිදා කොයිම්බතූර් නගරයේ NIA, ජාතික විමර්ශන ඒජන්සිය විසින් අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි. ඒක හොඳටම පැහැදිලියි. එතකොට ඒ තොරතුරු ඒ ප්‍රශ්න කිරීම් මත ලැබුණ තොරතුරු තවදුරටත් ඒගොල්ලෝ අර මම කිව්ව විදියට තවදුරටත් වැඩි දියුණු කරලා තියෙනවා. Telephone Numbers අරගෙන, අරවා මේවා රහස් ඔත්තු සේවයට දීලා ඇති. ඒගොල්ලෝ තවදුරටත් මේක ප්‍රගුන කරලා ඇති. දැන් සාමාන්‍යයෙන් ස්වාමීනි ඔය වගේ ආයතනයක් ඒ කියන්නේ ජාතික විමර්ශන ඒජන්සිය NIA මම කලිනුත් කිව්ව මේ NIA ආවේ අපේ TID එක වගේ. ඒගොල්ලෝ කරන්නේ තනිකරම ත්‍රස්ත අපරාධ ක්‍රියා සම්බන්ධයෙන් තමයි ඒගොල්ලෝ විමර්ශනය කරන්නේ. අපේ TID එක වගේ. හේතුව ඊට කලින් කළේ CBI එක. Central Investigation Bureau CBI. Central Bureau of Investigation කියන එක. ඒක CID එක වගේ. එතකොට ඉන්දියාවට තේරුණා ඉන්දියාව තමයි එකම රටක් සෑහෙන ත්‍රස්තවාදීන් කණ්ඩායමක්

FAIR COMMENT BY JEZEEM

ඉන්න රටක් ඉන්දියාව. විශේෂයෙන්ම මුස්ලිම් ත්‍රස්තවාදීන්. මේ ජම්බු කාශ්මීර්වල 1947 ඉඳන් එන ප්‍රශ්නයක් මේක. ජම්බු කාශ්මීර්වලින් ආපු ප්‍රශ්නයක් මේක. ඊට අමතරව කොමියුනිස්ට්ලා වෙනම ඉන්නවා. ශීක්ස්ලා වෙනම ඉන්නවා. එතනත් ප්‍රාන්ත කිහිපයක් තියෙනවා වෙනම රාජ්‍යයන් සම්බන්ධයෙන් සටන් කරන. එතකොට බැලුවම මේගොල්ලන්ට මේක වැඩියි දෙන්න බැහැ. ඒක තමයි මේක 2008 වුණේ. මුම්බායි 2008.11.26 Mumbai incident එකෙන් පස්සේ තමයි මේගොල්ලෝ මේක ස්ථාපිත කළේ. එතකොට ඒක ඒගොල්ලොන්ට කෙළින්ම SIS එක්ක ගණුදෙනු කරන්න බැහැ රාජ්‍ය බුද්ධි සේවයක් එක්ක ගණුදෙනු කරන්න බැහැ. ඒගොල්ලො දෙන්නේ මේක RAW එකට. RAW එකත් තවත් තියෙනවා නම්, තවත් දුරටත් මේක තියෙනවා නම් ඒගොල්ලෝ තවදුරටත් මේක ප්‍රගුණ කරලා තමයි රාජ්‍ය තාන්ත්‍රික මාර්ගයෙන් තමයි මෙහෙට එන්නේ. එහෙම තමයි ඔය බුද්ධි තොරතුර ඇවිල්ලා තියෙන්නේ. ඉතිං සියයට අනූවක් අසූවක් වගේ ඇවිල්ලා තියෙන්නේ ප්‍රශ්න කිරීම් තුළින්. ඊට පස්සේ ප්‍රශ්න කිරීම් තුළින් කරුණු අනාවරණය වෙලා යම් යම් දේවලුත් ඇවිල්ලා ඇති.

ප : අර ඉන්දියානු බුද්ධි NIA ද?

පි : NIA.

ප : ඇයි අපේ රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානියාට එම ආයතනයේ ප්‍රධානියාත් සමඟ සෘජු සබඳතා පවත්වන්නට බැරි?

පි : සාමාන්‍යයෙන් Protocolwise ඒ අනුව ක්‍රමවේදයක් තියෙනවා. සාමාන්‍යයෙන් අපි පවත්වන්නේ ඒ රටේ ප්‍රධාන බුද්ධි සේවයත් එක්ක තමයි පවත්වන්නේ. බාධාවක් නැහැ. එහෙම පවත්වන්න බාධාවක් නැහැ. එහෙම පවත්වාගෙන යනවා. ඉතිං ඒ ඇවිල්ලා ඒ අධ්‍යක්ෂවරයා කොච්චර කාර්යක්ෂමද ඒ අනුව තමයි ඒක රඳා පවතින්නේ. තමන්ගේ Personal Contacts අපි කියනවා Personal Contacts කියලා. එහෙම කරන්නත් පුළුවන්. නමුත් සාමාන්‍යයෙන් ක්‍රියා පටිපාටිය නීත්‍යානුකූල ක්‍රියා පටිපාටිය වෙන්නේ ඒ රටේ ප්‍රධාන බුද්ධි අංගත් එක්ක අපේ මේ ප්‍රධාන බුද්ධි අංශ සම්බන්ධවීමයි.

ප : දැන් ඒ අනුව ඔබ ප්‍රකාශ කරන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානියා 2019 අප්‍රේල් 04 වෙනි දින මෙම බුද්ධි තොරතුර ඉන්දියානු RAW ඔත්තු සේවාවෙන් ඔහුට ලැබුණු අවස්ථාවේදී ඔහු නිරන්තරයෙන්ම RAW ඔත්තු සේවාවත් එක්ක කටයුතු කළා නම් මෙම ප්‍රහාරය වැළැක්වීම කෙසේ වුවත් දවස්

FAIR COMMENT — BY JEZEEM —

විස්සක් වගේ, දවස් දාහතක විතර කාලයක් තුළ මෙහෙයුම් යොදා මොවුන්ව අල්ලා ගැනීමට, අත් අඩංගුවට ගැනීම වැනි කටයුතු කිරීමට හැකියාව තිබුණයි කියලද?

පි : තිබුණා. දැන් මෙතෙක් පැවති දේවලින් මට නිරීක්ෂණය වුණේ මුලින්ම මේ තොරතුරු ආපුවහම අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි සේවයේ එයාගේ මේ තොරතුරු සම්බන්ධයෙන් අපැහැදිලිතාවයක් තිබ්බා. ඒක හොඳට පැහැදිලි වෙනවා. එහෙම නම් ඒ අපැහැදිලිතාවය මඟ හරවගන්න සම්බන්ධකම් පවත්වන්න තිබුණා. මම අර කියපු අර බුද්ධි ක්‍රමවේදය තියෙන්නේ තවදුරටත් ඒ තොරතුරු තහවුරු කරන්න කියන එක. ඊට අමතරව අර සම්බන්ධකම් පවත්වන්නත් තිබ්බා අනිවාර්යයෙන්ම.

ප්‍ර : ඔහු සම්බන්ධතා පවත්වලා ඇතියි කියලා ඔබ හිතනවද? නැත්නම් සම්බන්ධතා පවත්වා නැතුව ඇති කියලා හිතනවද?

පි : ස්වාමීනි ඒක මට හරියට කියන්න දන්නේ නැහැ.

හොඳයි. බොහොම ස්තුතියි.

**********

**ගරු සභාපතිතුමා :**

උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනෙවිය තවත් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ඉල්ලයි. ලබා දෙයි.

ස්තුතියි ස්වාමීනි.

**********

**අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :**

ප්‍ර : මාසෝ මහත්මයා ඔබට කියන්නට පුළුවන්ද Dry Run එකක් කියන්නේ මොකද්ද කියලා?

පි : Dry Run එකක් කියන්නේ ඉස්සරලම ස්වාමීනි අපි යම්කිසි ක්‍රියාවක් අපි හෝ ඕනම කණ්ඩායමක් යම්කිසි ක්‍රියාවක් කරනකොට ඉස්සරලාම අපි කරන්න ඕන ඒ ක්‍රියාව සම්බන්ධයෙන් වටපිටාවේ තොරතුරු දැන ගැනීම. තොරතුරු එක්රැස් කිරිම. තොරතුරු එක්රැස් කිරීමට පස්සේ තමයි ඔය Dry Run එක එන්නේ. ඒ Dry Run එක යම්කිසි ක්‍රියාවක් කිරීමට පෙර ඒ අත්හදා බැලීමක් තමයි Dry Run එක කියන්නේ. ඊට පස්සේ තමයි ක්‍රියාව කරන්නේ. ඒකයි Dry Run කියන්නේ. ඒක ඊට කලින් අපි තොරතුරු හොයා ගන්න ඕන ඒ භූමිය සම්බන්ධයෙන් හරි ප්‍රදේශය සම්බන්ධයෙන් හරි මොනවා හරි. එතකොට තොරතුරුවලින්, ඒ තොරතුරු මත අපි සැළසුම් හදන්න ඕන. ඒ

FAIR COMMENT BY JEZEEM

සැළසුම Dry Run එක තුළින් අපි ක්‍රියාත්මක කරනවා. ඒ Dry Run එක සාර්ථක නම් අපි ඒ ක්‍රියාන්විතය කරනවා.

ප්‍ර : එතකොට Dry Run එකක් ක්‍රියාත්මක කිරීමකදී තමන් විසින් අපේක්ෂිත ඉලක්කය සාර්ථකව ඉටු කරගත හැකිද? ඒ දැනට තියෙන සැළසුමේ යම් අඩුපාඩු තියෙනවද? තමන් මේ ඉදිරිපත් වෙලා තියෙන අවස්ථානුගත කරුණු යටතේ ඒ සැළසුම් තවදුරටත් ව්‍යාප්ත කළයුතුද? වැඩි දියුණු කළ යුතුද කියන කරුණු පිළිබඳව අවබෝධයක් ලැබෙනවද?

පි : අනිවාර්යයෙන්ම අවබෝධයක් ලැබෙනවා. ඒකෙන් අඩුපාඩු මඟහරවා ගන්නවා.

ප්‍ර : සකස් කර ගන්නට පුළුවන්?

පි : සකස් කර ගන්නවා.

ප්‍ර : එතකොට ඔබට කියන්නට පුළුවන්ද ඒ Dry Run කියන වචන කුමන ක්ෂේත්‍රයක භාවිතා වන වචනද කියලා?

පි : ඒක බුද්ධි අංශයේත් භාවිතා වෙනවා. සන්නද්ධ මෙහෙයුම්වලත් ඒක භාවිතා වෙනවා. ඒක සාමාන්‍ය වචනයක් Dry Run කියන එක. අපි කියන්නේ Reconnaissance කියන්නෙත් ඒකට තමයි.

ප්‍ර : Reconnaissance කියන්නෙත් ඒකමයි?

පි : ඒකට තමයි. අපි හරි වචනයක් පාවිච්චි කරනවා නම්, හරි නීතියට අනුකූලව යම්කිසි කෙනෙක් කරනවා නම් rechersals වගේ.

That's all. Thank You.

**********

**ගරු සභාපතිතුමා :**

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතීඥවරියට අවශ්‍ය දැයි විමසමි. අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු මෙම කොමිසම ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් මෙම කොමිෂන් සභාවේ කාර්යභාරය වෙත දැක් වූ සහයෝගය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ ස්තුතිය සාක්ෂිකරුට පළ කරනවා.

දැන් වේලාව : ප.ව. 3.05 යි.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව**

දිනය :- 2020.07.06 වේලාව :- ප.ව. 3.09

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

**ගරු විනිසුරු මඩුල්ල :-**

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

**පෙනී සිටීම :-**

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ රවිශානි පිරිස් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංක : 305

| | | | |
|---|---|---|---|
| 01. | සම්පූර්ණ නම | : | මොහන්දිරම්ලාගේ ගෙදර පකීර් මොහිදීන් මොහොමඩ් ජෙසූලි |
| 02. | වයස | : | අවුරුදු 54 යි |
| 03. | ජාතිය | : | මුස්ලිම් |
| 04. | ආගම | : | ඉස්ලාම් |
| 05. | තනතුර | : | උප පොලිස් පරීක්ෂක (පොලිස් ස්ථානය - වවුනතිව්) |

**(සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි)**

**රජයේ අධිනීතීඥ චතුරංග බණ්ඩාර මහතා :**

ප්‍ර : ජෙසුලි මහත්මයා, ඔබ ශ්‍රී ලංකා පොලිසිය සමඟ සම්බන්ධ වුණේ කුමන වකවානුවේදීද?

පි : ස්වාමීනි 1986.06.21 වෙනි දින.

ප්‍ර : කුමන නිලයකින්ද ඔබ සම්බන්ධ වුණේ?

පි : පොලිස් කොස්තාපල් 6528 - මොහොමඩ් ජෙසුලි.

ප්‍ර : ඔබ ශ්‍රී ලංකා පොලීසිය සමඟ සම්බන්ධ වෙලා මූලික පුහුණුවක් ලැබුවද?

පි : එසේමයි ස්වාමීනි.

ප්‍ර : ඒ මූලික පුහුණුවෙන් අනතුරුව ඔබ සාමාන්‍ය සේවයට සම්බන්ධ වුණාද?

පි : එසේමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ විශේෂ කාර්ය බලකාය සමඟ සම්බන්ධ වෙන්නේ කුමන වකවානුවේද?

පි : ස්වාමීනි 1989.10.01 දින සිට විශේෂ කාර්ය බලකායේ.

ප්‍ර : ඔබ විශේෂ කාර්ය බලකායේ අවුරුදු කීයක් රාජකාරී කරලා තියෙනවද?

පි : වසර 25 ක් පමණ කාලයක්.

ප්‍ර : ඔබ කුමන කඳවුරුවල රාජකාරී කළාද? කුමන ප්‍රදේශයේ රාජකාරී කළාද කියලා කෙටියෙන් මේ කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : ස්වාමීනි මම වැඩිම කාලයක් ක්‍රියාන්විත ප්‍රදේශයේ රාජකාරී කළේ. අවසාන වශයෙන් බුද්ධි අංශයට අනුයුක්තව රාජකාරී කරමින් සිටියේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : උතුරු නැගෙනහිර පළාත්වල වැඩි කාලයක් ඔබ රාජකාරී කරලා තියෙනවා කිව්වොත් නිවැරදිද?

පි : එසේමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ බුද්ධි අංශයක් ගැන සඳහන් කළා. කුමන ආයතනයක බුද්ධි අංශයකද ඔබ රාජකාරී කළේ.

පි : ස්වාමීනි විශේෂ කාර්ය බලකායේ බුද්ධි අංශයට අනුයුක්තව.

ප්‍ර : කොච්චර කාලයක් ඔබ විශේෂ කාර්ය බලකායේ බුද්ධි අංශයට අනුයුක්තව රාජකාරී සිද්ධ කළාද?

පි : වසර 07 ක් පමණ ස්වාමීනි.

ප්‍ර : ඔබ ඉන් අනතුරුව විශේෂ කාර්ය බලකායෙන් ඉවත් වෙලා සාමාන්‍ය පොලිසිය සමඟ සම්බන්ධ වෙනවාද?

පි : එසේමයි ස්වාමීනි.

ප්‍ර : කොයි වකවානුවේදීද?

පි : 2014.11.25 වෙනි දින සිට.

ප්‍ර : ඉන් අනතුරුව ඔබ කුමන පොලිස් ස්ථානවලද රාජකාරී කරන්නේ?

පි : ගරු ස්වාමීනි මහනුවර කොට්ඨාශයේ, කටුගස්තොට පොලිස් ස්ථානයේ, දූෂණ මර්ධන ස්ථානාධිපති වශයෙන් රාජකාරී කරනවා. අවුරුදු හතරක පමණ කාලයක් සේවය කිරීමෙන් පසු පොලිස්පතිතුමාගේ නියෝග අනුව 2019.01.15 වන දින මම මඩකලපු කොට්ඨාශයේ ස්ථාන මාරුවීම් ලබා පැමිණෙනවා.

ප්‍ර : ඔබ මඩකලපුව කොට්ඨාශයට අනුයුක්තව මුලින්ම රාජකාරී වාර්තා කරන්නේ කාටද?

පි : ස්වාමීනි මුලින්ම වාර්තා කරන්නේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, මඩකලපුව තුමාට. ඉන් පස්සේ එදිනම මම රාජකාරී වාර්තා කරනවා කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ රාජකාරියට වාර්තා කරනවා.

ප්‍ර : ඔබ කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ කවදා ඉඳන් කවදා දක්වා රාජකාරී කළාද?

පි : ස්වාමීනි 2019 ජනවාරි 15 වෙනිදා ඉඳලා 2020 මාර්තු මාසය වෙනකම් මම කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ රාජකාරී කළා.

ප්‍ර : ඒ වෙනකොට ඔබට තිබ්බ නිලය මොකද්ද?

පි : ස්වාමීනි උප පොලිස් පරීක්ෂක නිලයේ ස්ථානාධිපති, අපරාධ වශයෙන් රාජකාරී කළේ.

ප්‍ර : එතකොට මේ කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ ඔබ සිදු කරපු රාජකාරීවලින් ඔබට කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ කුමන අංශයද භාරව තිබුණේ?

Presidential Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමීනි අපරාධ අංශය.

ප්‍ර : ඔබ ඒ රාජකාරී කළ කාල පරිච්ඡේදය තුළම රාජකාරී කළේ අපරාධ අංශයේ කිව්වොත් නිවැරදිද?

පි : ස්වාමීනි මුල් කාලයේ මම දූෂණ මර්ධන අංශයෙත් පසුව අපරාධ අංශයෙත් රාජකාරී කළේ.

ප්‍ර : දැන් මහත්මයා කාත්තන්කුඩි පොලිස් ස්ථානයට 2019.04.16 වෙනිදා සිදු වූ යම්කිසි පිපිරීමක් සම්බන්ධයෙන් තොරතුරු වාර්තා වීමක් වෙනවද?

පි : එසේමයි ස්වාමීනි.

දැන් වේලාව : ප.ව. 3.15 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව. 3.15 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

**<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>**

ප්‍ර : කවද්ද මේ තොරතුර වාර්තා වෙන්නේ?

පි : ස්වාමිණි 2019 අප්‍රේල් මාසේ 17 වන දින පැය 22 ට තමයි ස්වාමිණි මේ පැමිණිල්ල ලැබෙන්නේ කාත්තන්කුඩි පොලිස් ස්ථානයට.

ප්‍ර : ඒ කියන්නේ රෑ 10 ට විතර ?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : කවුද මේ පැමිණිල්ල දාන්නේ?

පි : ස්වාමිණි මේ පැමිණිල්ල දාන්නේ මොහොමදු මුස්තාපා හස්නුල් බස්රි කියලා පුද්ගලයෙක් ස්වාමිනි.

ප්‍ර : ඔහු කොහේ පදිංචි පුද්ගලයෙක්ද?

පි : ස්වාමිණි ඔහු කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙක් ස්වාමිණි.

ප්‍ර : ඔහුගේ ලිපිනය ඔබට සඳහන් කරන්න පුළුවන්ද මේ කොමිෂන් සභාවට?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ලිපිනය?

පි : 144, ප්‍රධාන පාර, කාත්තන්කුඩි.

ප්‍ර : දැන් මේ මොහොමඩ් මුස්තාපා හස්නුල් බස්රි කියන පුද්ගලයා 17 වෙනිදා රාත්‍රියේ පොලිස් ස්ථානයට ඇවිල්ලා කුමක් සම්බන්ධයෙන්ද පැමිණිල්ල සිද්ධ කළේ?

පි : ස්වාමිණි ඔහුට අයත් පාලමුනෙයි ඉඩමක් තියෙනවා ස්වාමිනි ඒ ඉඩම තුළ යතුරු පැදියක් පුපුරා විනාශ වී ගොස් ඇති බවට තමයි මේ පැමිණිල්ල ලැබෙන්නේ.

ප්‍ර : මේ පාලමුනෙයි ප්‍රදේශය කියන්නේ කොයි පළාතේ ප්‍රදේශයක්ද?

පි : ස්වාමිණි නැගෙනහිර පළාතේ කාත්තන්කුඩි පොලිස් බල ප්‍රදේශයේ ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව මේ පාලමුනෙයි කියන ප්‍රදේශයේ මේ අදාල ඉඩම තියෙන්නේ sea side එකට වෙන්නටද, මුහුදු පැත්තට වෙන්නටද නැත්නම් ගොඩබිම පැත්තට වෙන්නටද?

පි : මුහුදු පැත්තට වෙන්නට ස්වාමිණි.

ප්‍ර : දැන් හස්නුල් බස්රි කියන පුද්ගලයා ඇවිල්ලා කිව්වේ මේ ඉඩමේ කුමක් සිද්ධවෙලා කියල ද?

Provisional Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : යතුරු පැදියක් කැඩී විසිරිලා ගොස් ඇති බවට තමයි පැමිණිල්ල සඳහන් කලේ ස්වාමිණි.

ප්‍ර : ඔහු ඒ ස්ථානයට ගිහිල්ලා තිබ්බද ඊට කලින්?

පි : එහෙමයි ස්වාමිණි. ඔහුගේ ඉඩම ඔහු ගිහිල්ලා පරීක්ෂා කරන වෙලාවේ තමයි මේක දැකලා තියෙන්නේ ස්වාමිණි.

ප්‍ර : ඒ ඉඩම බලා ගන්න පුද්ගලයා වශයෙන්ද ඔහු පෙනී සිටියේ නැත්නම් ඒ ඉඩමේ අයිතිකරු වශයෙන්ද?

පි : ස්වාමිණි අයිතිකරු වෙනුවෙන්.

ප්‍ර : ඒක කොච්චර විතර වටක් ප්‍රමාණයක ඉඩමක් කියලද ඔබලට සඳහන් කලේ?

පි : ස්වාමිණි අක්කර 43 ක භූමි ප්‍රමාණයක්.

ප්‍ර : ඊට අනතුරුව ඔහු සඳහන් කළාද යම්කිසි හානියක් වෙලා තියෙනවා කියලා ඔහුගේ ඉඩමට?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඒ හානිය කියලා ඔහු සඳහන් කළේ?

පි : ඔහු එම ඉඩම අක්කර 1, 2 වශයෙන් කොටස් කරලා කොන්ක්‍රිට් කණු හිටවලා ඒකේ තහඩු සවිකර තිබුණා. ඒවට අනර්ථයක් සිදු වූ බවට තමයි ඔහුගේ පැමිණිල්ලෙන් සඳහන් වෙන්නේ ස්වාමිණි.

ප්‍ර : ඔබ එම පුද්ගලයාගෙන් විමසීමක් කරලා බැලුවද නැත්නම් මේ මුල් පැමිණිලිකරුගෙන් විමසීමක් කරලා බැලුවද ඔහු එම ස්ථානයට ගියේ කීයට විතරද කියලා?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව ඔබට අනාවරණය වුණේ ඔහු කීයට විතර එම ස්ථානයට ගියා කියලද?

පි : ඔහු නිවසේ ඉදලා ගිහිල්ලා තියෙන්නේ ස්වාමිණි 5 ට පමණ.

ප්‍ර : සවස 5 ට පමණ?

පි : එසේමයි ස්වාමිනි.

ප්‍ර : ඔහු එම ස්ථානයට යන්න හේතුවක් ඔබ විමසා බැලුවද ඇයි මේ ඉඩමට ඔහුට යන්න හිතිලා තියෙන්නේ කියලා?

පි : ස්වාමිණි එම ඉඩම ඔහු වැඩි දියුණු කිරීම සඳහා කොටස් කරලා මාර්ගයක් සදමින් තමයි තිබුණේ ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව ඔහු නිකම් ඒ ස්ථානයට ගියාද නැත්නම් මෙහි පිපිරීමක් ගැන හෝ සද්දයක් ගැන අනාවරණය වෙලා ඔහු එය පරීක්ෂා කරලා බලන්න එම ස්ථානයට ගියාද?

පි : නැහැ ස්වාමිණි ඔහු කිව්වේ ඔහුගේ ඉඩමට නිකම් ඔහු යන විදියට ගියා කියලා ස්වාමිණි.

ප්‍ර : එහෙම තමයි ඔබට සඳහන් කළේ?

පි : එසේමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මෙසේ පිපිරීමක් ගැන මුල් පැමිණිල්ලක් ලැබුණයින් පස්සේ කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විදියට ඔබ ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද?

පි : ස්වාමිණි ඒ සම්බන්ධයෙන් ස්ථානාධිපති දැනුවත් කරලා ස්ථානාධිපති තුමත් එක්ක සිදු වූ ස්ථානයට ගියා ස්වාමිණි.

ප්‍ර : ස්ථානාධිපති විදියට මෙම සිදුවීම සිද්ධ වෙන කොට කවුද හිටියේ?

පි : එවකට හිටියේ පොලිස් පරීක්ෂක නිශාන්ත ප්‍රභාත් කස්තුරිආරච්චි මහත්තයා ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව ඔබ මෙම ස්ථානයට යන්න පිටත් වුණේ කස්තුරිආරච්චි මහත්තයත් සමඟද?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : කවුරු කවුරුද මේ ස්ථානයට ගියේ?

පි : ස්වාමිණි ස්ථානාධිපතිතුමයි, මමයි, පො.කො. 88841 සින්දුජන්, 7200 රූබන්, 79586 මොහොමඩ්, 76424 ෆයිරුස් යන නිලධාරීන් සමඟ තමයි ස්වාමිණි ගියේ.

ප්‍ර : මෙම ස්ථානයට ගියේ ඔබලා මෝටර් රථයකින්ද?

පි : ජීප් රථයකින් ගියේ ස්වාමිණි.

ප්‍ර : සාමාන්‍යයෙන් මෙම ස්ථානයට යන කොට කී විතර වුණාද වෙලාව?

පි : ස්වාමිණි එම අවස්ථාවේදි එම ස්ථානයට යන කොට ස්වාමිණි 10.40, 10.50 විතර වගේ වුණා ස්වාමිණි.

ප්‍ර : 10.40, 10.50 විතර වගේ වුණා කියලා තමයි ඔබ සඳහන් කරන්නේ?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ඒ වෙලාවේ රාත්‍රී අන්ධකාරය?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව ඔබ මොනවද එම ස්ථානයට ගිහිල්ලා නිරීක්ෂණය කළේ?

පි : ස්වාමිණි පැමිණිලිකරු කිව්ව විදියට ඉඩමට ගොස් ස්වාමිණි මම යන කොට නිලධාරීන් සියළු දෙනාම වගේ අරන් ගියා විදුලි පන්දම්. ඒ විදුලි පන්දම් එළියෙන් තමයි ස්වාමිණි එම ස්ථානය නිරීක්ෂණය කළේ. එයින් පෙනී ගියා ස්වාමිණි කුඩා යතුරුපැදියක් යම් පුපුරණ ද්‍රව්‍යයක් යොදාගෙන පුපුරා හැර ඇති බවට නිරීක්ෂණය වුණා ස්වාමිණි.

ප්‍ර : ඒ නිරීක්ෂණයත් සමඟ ඔබ මොකක්ද සිද්ධ කළේ?

පි : ස්වාමිණි එතන ඒ සම්බන්ධයෙන් ස්ථානාධිපතිතුමාට දැනුවත් කළා මෙතන පිපිරීමක් සිද්ධ වෙලා තිබෙන්නේ කියලා. ස්ථානාධිපතිතුමා විසින් එම ස්ථානයේ ඉදලම ඉහළ නිලධාරීන් දැනුවත් කළා ස්වාමිණි. රාත්‍රී කාලයේ හින්දා විමර්ශනය තවදුරටත් කරන්න බැරි නිසා එතන ආරක්ෂාවක් හැදුවා ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප : ඔබ සඳහන් කළා මෙම ස්ථානයේ ආරක්ෂාවට නිලධාරීන් 2 ක් දැම්මා කියලා?

පි : එසේමයි ස්වාමිණි.

ප : කවුද ඒ නිලධාරීන් දෙදෙනා?

පි : 76624 යි, 79586 යි.

ප : දැන් මහත්මයා මුල් වරටම විදුලි පන්දම් ආධාරයෙන් මෙය පරීක්ෂා කරලා බැලුවාට පස්සේ ඔබට හිතුනේ මේක කුමන ආකාරයේ පිපිරී යාමක් කියලද, ඒ කියන්නේ සාමාන්‍යයෙන් බයිසිකලයක් ගිණි ගෙන ඇති ස්වභාවයක්ද, කුමක් කියලද ඔබට හිතුනේ?

පි : ස්වාමිණි මේක පුපුරණ ද්‍රව්‍යයක් යොදාගෙන පිපිරීමක් බවට මම තහවුරු කර ගත්තා ස්වාමිණි.

ප : ඔබ කොහොමද එහෙම තහවුරු කර ගත්තේ?

පි : ස්වාමිණි මම අවුරුදු 25 ක් පමණ විශේෂ කාර්යය බලකායේ රාජකාරී කළා. මූලික පුහුණුවේදිත් පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දෙනවා. නැගෙනහිර පළාතේ දීර්ඝ කාලයක් සේවය කිරීම තුළ හමු වුණු අපි සොයා ගත් බෝම්බ වලින් සම්බන්ධයෙන් ඒ දැනුමින් මම හිතුවා මේක අනිවාර්යයෙන් පුපුරණ ද්‍රව්‍යයක් භාවිතා කරමින් සිදු වූ පිපිරීමක් කියලා ස්වාමිණි.

ප : ඔබ සඳහන් කළා මේ රාත්‍රියේම ඔබගේ ස්ථානාධිපතිවරයා ඉහළ නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කළා කියලා?

පි : එසේමයි ස්වාමිණි.

ප : ඒ කියන්නේ මේ 17 වෙනිදා රාත්‍රියේ?

පි : එසේමයි ස්වාමිණි.

ප : ඔබට කියන්න පුළුවන්ද ඒ නිලධාරීන් කවුද කියලා?

පි : ස්වාමිණි මගේ මතකයේ හැටියට එවකට අපිව රාජකාරී භාරව හිටිය සහකාර පොලිස් අධිකාරී

ප : සහකාර පොලිස් අධිකාරී තුමාගේ නමත් සඳහන් කරන්න මහත්මයා?

පි : ස්වාමිණි මට මතකයේ හැටියට කුමාරසිරි මහත්තයා තමයි හිටියේ. එතකොට පොලිස් අධිකාරීතුමා හැටියට හිටියේ මෙන්ඩිස් මහත්මයා, ඒ දෙදෙනත් නියෝජ්‍ය පොලිස්පතිතුමාත්..

ප : නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ නම මතකද ඔබට?

පි : එසේමයි ස්වාමිණි අයේෂ කරුණාරත්න මහත්තයත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කපිල ජයසේකර මහත්මයත්.

ප : ඒ හතර දෙනාම ඔබලා 17 වෙනිදා දැනුවත් කළා කිව්වොත් නිවැරදිද?

පි : ස්වාමිණි මම නෙමෙයි දැනුවත් කළේ ස්ථානාධිපති කස්තුරිආරච්චි මහත්තයා තමයි දැනුවත් කළේ මම එතන හිටියා ස්වාමිණි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ සඳහන් කළා එම ස්ථානයේ ආරක්ෂාවට නිලධාරීන් එම අවස්ථාවේ දැම්මා කියලා?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : ඉන් අනතුරුව ඔබලා නැවතත් එම ස්ථානයට යන්නේ කීයටද?

පි : උදේ වරුවේ ස්වාමිණි.

ප්‍ර : ඔබ දැන් මෙම ස්ථානයට තමන්ගේ පොලිස් ස්ථානයේ ඉදලා යන හැටි සහ එම ස්ථානයේ ස්වභාවය ගැන යම්කිසි දළ සටහනක් නිර්මාණය කළාද?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : ඔබ මේ සටහන ඇන්දේ පරිමාණයකට අනුවද නැත්නම් කොමිෂන් සභාවට සහයෝගයක් දැක්වීම පිණිසද?

පි : නැහැ ස්වාමිණි මේක සාමාන්‍යයෙන් අපරාධ සිදුවීමක් සිදු වූ අවස්ථාවකදි අධිකරණයේ සාක්ෂි ලබාදීම සඳහා මෙම දළ සටහනක් ඇඳ දක්වනවා ස්වාමිණි.

**(සාක්ෂිකරුට ප්‍රදර්ශනය කිරීම සඳහා යම් ලේඛනයක් තිරයේ දිස්වීමට සලස්වයි)**

ප්‍ර : මහත්මයා මෙම ලේඛනය පරික්ෂා කරන්න?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබට මෙම ලේඛනය හඳුනා ගන්න පුළුවන්ද? හඳුනා ගන්න පුළුවන් නම් කුමක් හැටියටද ඔබ හඳුනා ගන්නේ?

පි : ස්වාමිණි මෙම පිපිරීම සම්බන්ධයෙන් මා විසින් යොදන ලද දළ සටහනක්.

**<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද දළ සටහන C808 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.</u>**

ප්‍ර : මහත්මයාට කියන්න පුළුවන්ද මේ C808 ඇඳලා තියෙන්නේ පරිමාණයකටද නැත්නම් පරිමාණයකට නොවේද?

පි : පරිමාණයකට නොවෙයි ස්වාමිණි.

ප්‍ර : ඔබට පුළුවන්ද මේ සටහන අනුව, C808 අනුව පැහැදිලි කරන්න මේ පොලිස් ස්ථානය තියෙන්නේ කොහේද කියලා?

පි : A ලෙස සඳහන් කර තියෙන්නේ ස්වාමිණි පොලිස් ස්ථානයයි.

ප්‍ර : ඒ අනුව පිපිරුම් ස්ථානය ලෙස ඔබ සඳහන් කරලා තියෙන්නේ කොහේද මොන අක්ෂරයකින්ද ඔබ දක්වන්නේ?

පි : ස්වාමිණි රතුපාට කතිරයක් ගහලා තියෙන්නේ අන්න ඒ ස්ථානයේ ස්වාමිණි.

ප්‍ර : B අක්ෂරයෙන් ඔබ කුමක්ද දක්වලා තියෙන්නේ?

පි : කිරිතෝන පාර ස්වාමිණි. ඒ ඉඩමට යන පාර.

ප්‍ර : C වශයෙන් ඔබ සඳහන් කරලා තියෙන්නේ මොකක්ද?

Proof Interpreter's Copy

FAIR COMMENT BY JEZEEM

පි : එතන තියෙනවා ස්වාමිණි කිරිතෝන වත්තේ ඉදලා ඉඩමට ඇතුල් වෙන තැන පොඩි පාළමක් තියෙනවා. ඒ පාළම තමයි ස්වාමිණි C ලෙස සලකුණු කරලා තියෙන්නේ.

ප්‍ර : දැන් ඔබ සඳහන් කරපු මේ A වශයෙන් දැක්වෙන පොලිස් ස්ථානයේ ඉදලා X වශයෙන් දැක්වෙන පිපිරුම් ස්ථානයට කෙතරම් දුරක් තියෙනවද?

පි : ස්වාමිණි දළ වශයෙන් කිලෝ මීටර් 7 ක් හෝ 6 යි 800 ක් පමණ තියෙනවා ස්වාමිණි.

ප්‍ර : මෙම පිපිරුම් ස්ථානයට පොලිස් ස්ථානයේ ඉදන් යන කොට කාත්තන්කුඩි නගරය පහුකර ගෙන යා යුතුයිද?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : මෙය මඩකලපු - කල්මුණේ පාරේ ඉදලා කෙතරම් දුරකින්ද මේ පිපිරුම් ස්ථානය තියෙන්නේ ඔබට දළ වශයෙන් කියන්න පුළුවන්ද?

පි : ස්වාමිණි කිලෝ මීටර් 3 යි 800 ක් හෝ 4 ක් පමණ ඇති.

ප්‍ර : ඒ කියන්නේ ප්‍රධාන පාරෙන් හැරියා?

පි : එසේමයි ස්වාමිණි .

ප්‍ර : කුමන පාරටද ප්‍රධාන පාරෙන් හැරෙන්නේ?

පි : පාලමුනෙ පාරට හැරෙන්නේ.

ප්‍ර : එතකොට මෙම පිපිරීම සිදු වෙච්ච ප්‍රදේශයට කියන්නේ කුමන ප්‍රදේශය කියලද

පි : ප්‍රධාන ගම්මානය කියන්නේ ස්වාමිණි පාලමුනෙ. ඉඩමට කියන්නේ කිරිතෝන වත්ත.

ප්‍ර : පිපිරීම සිදු වෙච්ච ඉඩමට?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ මේ අක්කර 43 ක භූමි ප්‍රදේශයට කියන්නේ කිරිතෝන වත්ත කියලද?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : දැන් මෙම රූප සටහනේ මහත්මයාට පෙන්නුම් කරන්න පුළුවන්ද මෙහි සඳහන් වෙනවා පාළමුනෙ මුහුදු පාර කියලා?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : ඒ මුහුදු පාර කියන්නේ කොයි හරියද?

පි : ස්වාමිණි මෙම ඉඩමට ප්‍රධාන මාර්ගයේ ඉදලා පාලමුනෙ පාරේ ගිහිල්ලා මුහුදු අයිනටම ගිහිල්ලා එතනින් දකුණට හැරෙනවා මුහුදු පාර, මුහුදු අයින දිගේ දිවෙන මාර්ගයක් කොන්ක්‍රීට් මාර්ගයක් ස්වාමිණි. ඒ මාර්ගයෙන් ගිහිල්ලා තමයි අර ඉඩමට ඇතුල් විය හැක්කේ.

ප්‍ර : ඒ කියන්නේ මේ පාලමුනෙ මුහුදු පාරට ඔබ්බෙන් මේ දැක්වෙන ප්‍රදේශයේ තියෙන්නේ මුහුණ කියලා කිව්වොත් නිවැරදි ද?

Provincial Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

පි : ඔය ප්‍රදේශය මුහුදු ස්වාමිණි.

ප්‍ර : මුහුදු තියෙන්නේ?

පි : මුහුදු තියෙන්නේ ස්වාමිණි.

ප්‍ර : දැන් ඒ අනුව මේ ප්‍රදේශය දැන් ඔබ මේ සඳහන් කරන කිරිතෝණ වත්ත කියන ඉඩමේ මායිම්වල තියෙන්නේ මොනවද?

**(එම ඉඩමේ මායිම් පෙන්වීමට ඡායාරූපයක් සාක්ෂිකරුට තිරයේ දර්ශනය වීමට සලස්වා දෙයි)**

පි : ස්වාමිණි මෙන්න මේ ප්‍රදේශයේ තියෙන්නේ මුහුදු ප්‍රදේශය. මෙන්න මේ ප්‍රදේශයේ තියෙනවා හින්දු කෝවිලක් නරසිංහ කෝවිල කියලා. මේ පැත්තේ තියෙනවා ස්වාමිණි යුධ හමුදා කඳවුර සිංහ රෙජිමේන්තුවේ. මෙතන තියෙනවා ස්වාමිණි පේෂ කර්මාන්ත ගොඩනැගිල්ලක්.

ප්‍ර : දැන් මහත්මයා මෙම කිරිතෝන වත්ත කියන ඒ ඉඩම ආසන්නයේ නිවාස එහෙම තියෙනවද?

පි : ස්වාමිණි මෙන්න මේ ප්‍රදේශයේ නිවාස කිහිපයක් තියෙනවා.

ප්‍ර : පිපිරුම් ස්ථානයේ ඉදලා කොච්චර විතර දුරින්ද, සරල රේඛීව කොච්චර විතර දුරකින්ද නිවෙස් දක්නට ලැබෙන්නේ?

පි : ස්වාමිණි සරල රේඛාවෙන් නම් මීටර් 500 ක් 600 ක් පමණ දුරින් තමයි නිවාස පිහිටලා තියෙන්නේ.

ප්‍ර : ගම්මානයක් තිබෙනවද ඊට ආශ්‍රිතව ඔය නිවාස ආශ්‍රිතව?

පි : නැහැ ස්වාමිණි ඇතින් ඇතින් ගෙවල් කිහිපයක් තිබෙනවා.

ප්‍ර : සාමාන්‍යයෙන් මේ පාලමුනෙ කියන ඔබ සඳහන් කරන මේ ප්‍රදේශය මුස්ලිම් ජනතාව වැඩිපුර ජීවත් වන ප්‍රදේශයක්ද, දමිල ජනතාව වැඩිපුර ජීවත් වෙන ප්‍රදේශයක්ද?

පි : මුස්ලිම් ජනතාව වැඩිපුර ජීවත් වෙන ප්‍රදේශයක්.

ප්‍ර : මේ ප්‍රදේශයේ සාමාන්‍යයෙන් ඔබ රාත්‍රියෙත් ගියා කිව්වානේ?

පි : එසෙයි ස්වාමිනි.

ප්‍ර : විදුලි ආලෝකය එහෙම ලබා දීලා තියෙනවද, සාමාන්‍යයෙන් බැලුවාම පේනවද ඒ ප්‍රදේශය?

පි : ස්වාමිණි මෙම ඉඩමට විදුලි ආලෝකය නැහැ. එහා පැත්තේ දෙමල කෝවිලට විදුලි ආලෝකය නැහැ, යුධ හමුදා කඳවුරට ඒ ප්‍රදේශයේ විදුලි ආලෝකය තියෙනවා ස්වාමිණි.

ප්‍ර : සාමාන්‍යයෙන් පිපිරුම් ස්ථානයේ ඉදලා ඔබ සඳහන් කළා සිංහ රෙජිමේන්තුවේ යුධ හමුදා කඳවුරක් තියෙනවා කියලා?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර : ඒ කඳවුර පිපිරුම් ස්ථානයේ ඉදලා සරල රේඛීව ගත්තාම කොච්චර විතර දුරකින්ද මේ කඳවුර පිහිටලා තියෙන්නේ?

පි : මීටර් 300 ක් 400 ක් දුරින්.

ප්‍ර : විතර දුර ඔබ හිතනවා?

FAIR COMMENT BY JEZEEM

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : මහත්මයා ඔබ දැන් සඳහන් කළා රාත්‍රියේ ගියාට පස්සේ ඉන් පසුදින උදෑසනත් මෙම කිරිතෝන වත්තේ ඉඩමට ඔබලා නැවත විමර්ශනය සඳහා ගියා කියලා?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : කීයට විතරද ඔබලා ගියේ?

පි : 8.30 ට පමණ.

ප්‍ර : ඔබලා එම ඉඩමට උදෑසන ගිහිල්ලා සිදු කරපු විමර්ශන කටයුතු මොනවද?

පි : ස්වාමිණි එම ස්ථානයට සොකෝ කණ්ඩායම, ඇඟිලි සලකුණු කණ්ඩායම ඒ සියළු නිලධාරීන් ගෙන්වා ගත්තා. ගෙන්වා ගෙන විමර්ශනය කිරීමේදි එම සුන්බුන් අතර තිබූ යතුරු පැදියේ කොටස්වල තිබුණු වැසි අංකය ස්වාමිණි සොයා ගන්ටත් හැකියාවක් ලැබුණා.

ප්‍ර : දැන් ඔබ කිව්වානේ සොකේ නිලධාරීන් සහ ඡායාරූප ශිල්පීන් උදේ පැමිණියා කියලා?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : දැන් මෙම ස්ථානයේ ඔබලා ඡායාරූප ලබා ගත්තද කවුරු හරි නිලධාරීන් විසින්?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : එම ලබා ගත් ඡායාරූප කිහිපයක් ඔබට පෙන්වා සිටියොත් ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : එසේමයි ස්වාමිණි.

**(ස්වාමිණි සාක්ෂිකරුට ඡායාරූපයක් පෙන්වීමට ගෞරවයෙන් අවසර පතනවා)**

ප්‍ර : මහත්මයා මේ ඡායාරූපය පරීක්ෂා කරන්න, මේ ඡායා රූපය කුමක්ද? ඔබට කුමක් හැටියටද එය හඳුනා ගන්න පුළුවන්?

පි : ස්වාමිණි යතුරුපැදි බෝම්බය පුපුරා ගිය කිරිතෝන වත්තට ඇතුල් වෙන මාර්ගය. එහි වම් පැත්තේ හේත්තු කරලා තියෙන්නේ ඒ ඉඩමට දාලා තිබිච්ච ගේට්ටු 2 ස්වාමිණි.

**<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද කිරිතෝන වත්තට ඇතුල් වන මාර්ගය දැක්වෙන ඡායාරූපය C809 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.</u>**

ප්‍ර : දැන් මහත්මයා මෙම කිරිතෝන වත්ත කියන එක ඔබ සඳහන් කළා පෞද්ගලික පුද්ගලයෙකුට අයත් ඉඩමක් නේ?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : මේ ඉඩම වට කරලා තාප්ප හෝ ගේට්ටු දාලා නැද්ද?

පි : නැහැ ස්වාමිණි කොන්ක්‍රීට් කණු හිටවලා අර පෙනෙන ආකාරයට තහඩු ගහලා තමයි ස්වාමිණි තියෙන්නේ.

ප්‍ර : ගේට්ටුවක් තිබුණද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ගේට්ටුවක් තිබුණා ස්වාමිණි මේ ගේට්ටු දෙක අර මාර්ගයේ සංවර්ධන කටයුතු පිංතූරයෙන් පේනවා ස්වාමිණි ඒ මාර්ග සංවර්ධන කටයුතු සඳහා ඒ ගේට්ටු පලු දෙක ගලවලා අන්න අර ආකාරයට තමයි හේත්තු කර තියෙන්නේ.

**(සාක්ෂිකරු ගේට්ටු පලු දෙක පෙන්වා සිටී)**

ප්‍ර : ඒ අනුව ඕනම පුද්ගලයෙකුට මේ වත්තට ඇතුල් වීමේ හැකියාව තිබෙනවද ඔබ යන අවස්ථාව වෙන කොට?

පි : එසේමයි ස්වාමිණි.

**(ස්වාමිණි සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වීමට ගෞරවයෙන් අවසර පතනවා.)**

ප්‍ර : මහත්මයා මෙම ඡායාරූපය පරික්ෂා කරලා බලන්න මෙම ඡායාරූපය ඔබට හඳුනා ගැනීමට හැකියාවක් තියෙනවද? තියෙනවා නම් කුමක් හැටියටද හඳුනා ගන්නේ?

පි : ස්වාමිණි මේ කිරිතෝන වත්තේ ඔය කොටස් කරපු ඉඩමට යන මාර්ගය. ඒත් එක්කම බයිසිකලය තිබිලා පුපුරා ගිය ස්ථානය ස්වාමිණි.

**<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C810 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.</u>**

ප්‍ර : මහත්මයා C810 ඡායාරූපයේ දැක්වෙනවා මෙහි යම්කිසි ටකරන් සහ කොන්ක්‍රීට් කණු දිස්වෙනවා. ඒ මොනවද ටකරන් සහ කොන්ක්‍රීට් කණු?

පි : ස්වාමිණි මේ අක්කර 43 ඉඩම අයිතිකරු විසින් අක්කරය, අක්කර 2 වශයෙන් කොටස් කරලා ඔය කණු හිටවලා තහඩු ගහලා තියෙන්නේ ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ block out නැත්නම් කැබලි කරලා?

පි : එසේමයි ස්වාමිණි කැබලි කරලා තියෙන්නේ.

ප්‍ර : දැන් මහත්මයා දැන් සාමාන්‍යයෙන් ඔබ දැකලා තියෙනවා ඉඩම් block out කරන්න නැත්නම් කැබලි කරන කොට සාමාන්‍යයෙන් මේ වගේ ටකරන් සහ කොන්ක්‍රීට් කණු ගහලා කැබලි කිරීම් කරන්නේ නැහැනේ, කොළඹ සහ අනෙකුත් තදාසන්න පළාත්වල?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : ඇයි මෙසේ ටකරන් යොදා ගෙන නිකම් ස්ථිරසාර විදියට කැබලි කිරීම සිද්ධ කරලා තියෙන්නේ කියලා ඔබ හොයලා බැලුවද?

පි : නැහැ ස්වාමිණි ඔහුගෙන් මම විමසීමක් කළා ඉඩමේ අයිතිකරුගෙන්. ඔහු විකිණීම සඳහා මෙම කොටස් කළ බවට තමයි ඔහු සඳහන් කලේ ගරු ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM
President Secretariat's Copy

**(ස්වාමිණි සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටීමට ගෞරවයෙන් අවසර පතනවා)**

ප්‍ර : මෙම ඡායාරූපය පරීක්ෂා කරලා බලන්න මහත්මයා. මේ ඡායාරූපය ඔබට හඳුනා ගන්න පුළුවන්ද ? හඳුනා ගන්න පුළුවන් නම් කුමක් හැටියටද හඳුනා ගන්නේ?

පි : ස්වාමිණි එහි දිස්වෙන්නේ යතුරුපැදි බෝම්බය පුපුරා ගියාට පසු ඉතුරු වෙච්චි යතුරුපැදියේ ඉස්සරහා ටයර් කොටසයි හැඬල් එකේ කොටසයි ස්වාමිණි ඔය දිස්වෙන්නේ.

ප්‍ර : ඔබ එම ස්ථානයට 17 වෙනිදා ගියාම නිරීක්ෂණය වුණ දෙයක් හැටියට ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි : ඔව් ස්වාමිණි.

**<u>සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C811 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.</u>**

ප්‍ර : මහත්මයා මේ ඔබට පරීක්ෂා කරලා බලලා කියන්න පුළුවන්ද මේ දැක්වෙන්නේ මොකක්ද කියලා?

පි : ස්වාමිණි ඒ පුපුරා ගිය බයිසිකලයේ ඉතිරි කැබලි.

ප්‍ර : ඊට අමතරව මහත්මයා මෙහි තියෙනවා තහඩු ඇද වෙලා වගේ ඒ කුමක් නිසාද? ඔබ දන්නවද?

පි : ඒ පිපිරීමෙන් ඇති වුණ අලාභ හානි ස්වාමිණි.

ප්‍ර : කියලා තමයි ඔබ නිරීක්ෂණය කලේ?

පි : එසේමයි.

**<u>ස්වාමිණි සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙනවා සිටීමට ගෞරවයෙන් අවසර පතනවා</u>**

ප්‍ර : මේ ඡායාරූපය පරීක්ෂා කර බලන්න, ඔබට මෙය හඳුනා ගන්න පුළුවන්ද?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : කුමක් හැටියටද ඔබ හඳුනා ගන්නේ?

පි : ස්වාමිණි අර පෙර තිබිච්චි යතුරුපැදිය පුපුරා ගිය යතුරුපැදියේ කොටස් මේ සොකේ නිලධාරීන් විසින් පරීක්ෂා කරන අවස්ථාවේ දි තමයි මේ පින්තූරය.

**<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය c812 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.</u>**

ප්‍ර : මහත්මයා මෙම දැක්වෙන පිළිස්සී ගිය යතුරුපැදියේ කොටස්වල වැසි අංකය සාමාන්‍යයෙන් කොහේද සඳහන් වෙන්නේ?

පි : ස්වාමිණි මෙන්න මේ කොටසේ තමයි ස්වාමිණි ඒ වැසි අංකය තිබුනේ.

(සාක්ෂිකරු විසින් ඡායාරූපයේ යම් ස්ථානයක් පෙන්වා සිටී)

Present Parliament's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : චැසි අංකය නිවැරදිව බලා ගතහැකි ආකාරයට තිබුණද ඒ අවස්ථාව වෙන කොට?

පි : ස්වාමිණි පිච්චිලා වගේ තිබුණේ ඒකේ අපි සොකෝ නිලධාරින්ගේ සහායත් ඇතිව එය පරික්ෂා කිරිමට පුළුවන් ක්‍රමානුකූලව සහ විද්‍යානුකූලව තමයි පරික්ෂා කලේ.

ප්‍ර : පරික්ෂා කරලා අනාවරණය කර ගත්තා?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද ඒ අනාවරණය කර ගත් චැසි අංකය කුමක්ද කියලා?

පි : ස්වාමිණි හෑෂ් ME4JF396FR8007612 හෑෂ්

**(ස්වාමිණි තවත් ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වීමට අවසර පතනවා.)**

ප්‍ර : මහත්මයා නැවත වතාවක් ඔබට කියන්න පුළුවන්ද චැසි අංකය නිවැරදිව? ඔබ හෑෂ් වශයෙන් සඳහන් කලානේ ඒ හෑෂ් වශයෙන් සඳහන් කලේ මොකක්ද?

පි : ස්වාමිණි ෆෝන් එකේ තියෙන හෑෂ් සලකුණ.

ප්‍ර : තරු සලකුණ නෙමෙයි අනික් සලකුණ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : නැවත ඔබට පුළුවන්ද චැසි අංකය ගරු කොමිෂන් සභාවේ වාර්තා ගත කිරීම සඳහා නැවත කියන්න?

පි : එසේමයි ස්වාමිණි #ME4JF396FF8007612#

ප්‍ර : නැවතත් පැහැදිලිව ඔබගේ සටහන් පරික්ෂා කරලා බලලා ඔබට කියන්න පුළුවන්ද මෙම පිළිස්සී ගිය යතුරු පැදියේ ඔබලා අනාවරණය කර ගත්ත චැසි අංකය මොකක්ද කියලා?

පි : #ME4JF396FF8007612#

ප්‍ර : හෑෂ් ලකුණ අවසානයට පමණද තියෙන්නේ මුලිනුත් හෑෂ් ලකුණ තියෙනවද?

පි : ස්වාමිණි මුලිනුත් තියෙනවා අවසානයටත් තියෙනවා.

ප්‍ර : මේ තිරයේ දැක්වෙන අංකය නිවැරදි ද මහත්මයා පරික්ෂා කරලා බලලා කියන්න?

පි : හරි ස්වාමිණි. #ME4JF396FF8007612#

**(සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටීමට ගෞරවයෙන් අවසර පතනවා.)**

ප්‍ර : මෙම ඡායාරූපය පරික්ෂා කරලා බලන්න මහත්මයා මෙම ඡායාරූපය ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවාද?

පි : එසේමයි ස්වාමිණි.

**<u>ස්වාමිනි සාක්ෂණිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C813 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා</u>**.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහත්මයා මේ C813 ඡායාරූපයේ ඔබට පෙන්වා දෙන්න පුළුවන්ද මේ පිළිස්සීමට ලක් වුණු යතුරුපැදිය තිබූ ස්ථානය?
(සාක්ෂිකරු යතුරුපැදිය තිබූ ස්ථානය පෙන්වා සිටී)

ප්‍ර : ඒ ආශ්‍රිතව ඔබට නිරීක්ෂණය කරන්න පුළුවන්ද මොනවද සිදු වෙලා තියෙන හානි මොනවද කියලා?

පි : ස්වාමිණි පිපිරීමෙන් ඒ හදලා තිබුණු කොන්ක්‍රීට් වැට යකඩ තහඩු ඔක්කොම විනාශ වෙලා තිබුනේ.

ප්‍ර : දැන් ඔබ එම ස්ථානයට ගිහිල්ලා පරීක්ෂා කළානේ. ඔබට අනාවරණය වුණාද මේ පිපිරුම් ස්ථානයේ ඉදලා කොච්චර දුරකට මේ පිපිරීමේ impact එක නැත්නම් බලපෑම කොතරම් දුරකට ගිහිල්ලා තියෙනවද කියලා?

පි : ස්වාමිණි බයිසිකලය නවත්වලා තිබුණ ආකාරයෙන් දෙපැති ඒ කියන්නේ වමයි දකුණයි ඔය පාරේ ස්වාමිණි බයිසිකලය තිබුණ තැන ඉදලා මෙන්න මෙතන වම් පැත්තයි දකුණු පැත්තයි මීටර් 25 ක පමණ මේ බෝම්බය නිසා විහිදිලා ගිහිල්ලා.

ප්‍ර : බලපෑම?

පි : පළලට තමයි විහිදිලා තිබුනේ මේ පිපිරිම නිසා.

ප්‍ර : ඒ කියන්නේ පිපිරුම් ලක්ෂයේ ඉදලා මීටර් 25 ක් දුරකට පමණ බලපෑමක් තිබුණා කියලා ඔබ නිරීක්ෂණය කලා කිව්වොත් නිවැරදිද?

පි : එසේමයි ස්වාමිණි නිවැරදියි.

**(තවත් ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වා සිටී.)**

ප්‍ර : මහත්මයා මෙම ඡායාරූපය බලන්න මේ ඡායාරූපය ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : එසේමයි ස්වාමිණි.

**<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් මෙම හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C814 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා</u>**.

ප්‍ර : මහත්මයා මේ C814 න් දැක්වෙන්නේ කුමන ප්‍රදේශයද, ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : එසේමයි ස්වාමිණි මේ කිරිතෝන වත්තේ මෙන්න මෙතන තමයි ස්වාමිණි පිපිරීම සිද්ධ වුණේ. මෙන්න මේ කළුපාට තියෙන තැන තමයි පිපිරීම සිද්ධ වුනේ. (සාක්ෂිකරු අදාල ස්ථාන පෙන්වා සිටී)

ප්‍ර : ඒ අනුව මහත්මයා දැන් මුහුද තියෙන්නේ මොන පැත්තේ ද?

පි : මුහුද තියෙන්නේ මේ පැත්තේ අර පේන්නේ මුහුද. නැහැ ස්වාමිණි ඉඩමේ මේ පැත්තේ තමයි මුහුද තියෙන්නේ.

ප්‍ර : ඒ කියන්නේ මේ ඡායාරූපය අරගෙන තියෙන්නේ මුහුදු පැත්තේ ඉදලා.?

පි : මුහුදු පැත්තේ ඉදලා ස්වාමිණි.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහත්මයා ඔබ අර කලින් සඳහන් කලානේ ගේට්ටුවක් ?

පි : එසේමයි ස්වාමිනි.

ප්‍ර : ඒ ගේට්ටුව ඇරෙන්න මේ ඉඩමට මේ කිරිතෝන වත්ත කියන අක්කර 42 ක වටප්‍රමාණය ඇති ඉඩමට ඇතුළු වන වෙන මාර්ග තිබුනද?

පි : නැහැ ස්වාමිනි යුධ හමුදා කඳවුර පැත්තෙන් එක ගේට්ටුවක් තිබුණා ඇතුල් වෙන්න ඒක ලොක් කරලා තිබුණේ. මේ ගේට්ටු 2 විතරයි ස්වාමිණි විවෘත කර තිබුනේ.

ප්‍ර : ඒ කියන්නේ සාමාන්‍ය මහජනතාවට ඇතුළු වෙන්න පුළුවන් ඔබ ඔය ඡායාරූපයෙන් පෙන්වන හඳුනා ගත්ත ගේට්ටුවෙන් පමණයි?

පි : එහෙමයි ස්වාමිණි.

**ස්වාමිණි තවත් ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වීමට අවසර පතනවා.**

ප්‍ර : මේ ඡායාරූපය පරික්ෂා කරන්න ඔබට මෙය හඳුනා ගන්න පුළුවන්ද?

පි : එසේමයි ස්වාමිණි.

**<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද එම ඡායාරූපය C815 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.</u>**

ප්‍ර : මහත්මයා මේ C815 ඡායාරූපයෙන් දැක්වෙන්නේ මොනවද?

පි : ස්වාමිණි මේ සොකෝ නිලධාරීන් විසින් අංකය යොදලා විමර්ශනය කරපු ඒ සටහන් සහ පිපිරීම් ස්ථානයේ තිබුණු යතුරුපැදියේ කොටස් ස්වාමිණි ඒ පින්තූරයේ දැක්වෙන්නේ.

**ස්වාමිණි සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටීමට අවසර පතනවා.**

ප්‍ර : මෙම ඡායාරූපය පරික්ෂා කරන්න මහත්මයා, මෙය ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි : එසේමයි ස්වාමිණි.

**<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C816 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා</u>**.

ප්‍ර : මහත්මයා C816 පරික්ෂා කරලා බලලා කියන්න මොකක්ද මෙයින් දැක්වෙන්නේ?

පි : ස්වාමිණි පුපුරා ගියා බයිසිකලයේ ප්ලාස්ටික් කොටස් තමයි ලා කොළපාටට පෙනෙන්නේ

ප්‍ර : මේ ලා කොළ පැහැති බයික් රථයක්ද මෙතනට ඇවිල්ලා තියෙන්නේ කියලා ඔබට අනාවරණය වුණාද?

පි : එසේමයි ස්වාමිණි විමර්ශනයේදි අනාවරණය වුණා ලා කොළ පාට යතුරුපැදියක් බවට.

ප්‍ර : එහි කොටස් වියහැකි?

පි : වියහැකියි ස්වාමිණි.

Prosecutor's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබලා 18 වෙනිදා උදේ ඔබලට මුල් පැමිණිල්ල හම්බ වෙන්නේ අප්‍රේල් 17. 18 වන දින උදෑසන තමයි මේ නිරීක්ෂණයන්, ඡායාරූප ගැනීම් සිද්ධ කලේ කියලා කිව්වොත් නිවැරදි ද?

පි : එසේමයි ස්වාමිණි.

ප්‍ර : දැන් මේ සම්බන්ධයෙන් ඔබලා උදෑසන තව කාටද දැනුම් දීමක් සිද්ධ කලේ මේ ඔබලගේ විමර්ශනවලින් අනාවරණය වූ කාරණා ගැන?

පි : ස්වාමිණි ඒ සම්බන්ධයෙන් 18 වන දින 12 ත් 2 ත් අතර කාලය තුලදී ස්ථානාධිපතිතුමාගේ සහාය ඇතුව මේ යතුරුපැදිය සම්බන්ධයෙන් හොයාගෙන යාමේදී තොරතුරු ලැබුණා මෙන්න මේ පිපිරීම මෙගොල්ලන් විසින් සිදු කරන්න ඇත්තේ කියලා.

ප්‍ර : මම එතනට එන්න කලින් ඔබගෙන් අහන්නේ මේ අපරාධ ස්ථානයටම ඇවිල්ලා ඒ කියන්නේ කිරිතෝන වත්ත කියන ස්ථානයට ම ඇවිල්ලා අපරාධ ස්ථානය 18 වෙනිදා නිරීක්ෂණය කරපු ඉහළ නිලධාරීන් ඉන්නවද,හිටියද?

පි : හිටියා ස්වාමිණි.

ප්‍ර : කවුද?

පි : ස්වාමිණි NIB එකේ, බුද්ධි අංශයේ නිලධාරීන් ඇවිල්ලා හිටිය.

ප්‍ර : රාජ්‍ය බුද්ධි අංශයේ නිලධාරීන් ඇවිල්ලා හිටියටද උදෑසන?

පි : ඇවිල්ලා හිටියා ස්වාමිණි.

ප්‍ර : කවුද ආවේ එම ස්ථානයට?

පි : එතනට සහකාර පොලිස් අධිකාරී තිසේරා මහත්තයත්, තිගේරා හරි සිගේරා හරි.

ප්‍ර : ඊට අමතරව Military Intelligence නැත්නම් යුධ හමුදා බුද්ධි අංශයේ නිලධාරීන් ඇවිල්ලා හිටියද?

පි : ඇවිල්ලා හිටියා ස්වාමිණි.

ප්‍ර : ඔබ සමඟ කතා කළාද?

පි නැහැ අනික් කට්ටියත් එක්ක කතා කරමින් හිටියා මම සටහන් යොද යොදා හිටියේ.

ප්‍ර ඊට අමතරව පොලිස් විශේෂ කාර්යාංශය නැත්නම් Special Branch නිලධාරීන් ඇවිල්ලා හිටියද?

පි එසේමයි ස්වාමිණි Special Branch එකෙන් හිටියා, STF එකෙන් ඇවිල්ලා හිටියා සියළුම බුද්ධි අංශ ඇවිල්ලා හිටියා.

ප්‍ර ඔවුනුත් ඔබලා සමඟ මේවා නිරීක්ෂණය කිරීම සිද්ධ කළා?

පි එසේමයි ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් මහත්මයා සඳහන් කළා කලින් සාක්ෂි දීමේදී සොකෝ නිලධාරීන් සමඟ එකතු වෙලා මෙහි වැසි අංකය ඔබලා අනාවරණය කර ගත්තා කියලා?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර දැන් ඒ අනුව කාත්තන්කුඩි පොලිස් ස්ථානය විදියට ඔබලා වැඩිදුර විමර්ශන සිද්ධ කළාද?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර ඒ විමර්ශනවලින් මොනවද අනාවරණය වුණේ?

පි ස්වාමිණි මෙම අංකය අරගෙන මෝටර් රථ කොමසාරිස්තුමාගෙන් එතනින් අහගන්න කොට මෙම යතුරුපැදිය WPBCQ 0304 ස්කූටි වර්ගයේ යතුරුපැදියක් බවට හඳුනා ගත්තා.

ප්‍ර ඔබලා මුලින්ම වැසි අංකය කොහාටද ඉදිරිපත් කළේ?

පි මෝටර් රථ කොමාසාරිස්වරයාට.

ප්‍ර RMV නැත්නම් Registration of Motor Vehicle Department ඉදිරිපත් කළා?

පි එහෙමයි ස්වාමිණි.

ප්‍ර ඒ අනුව අනාවරණය වූ මෝටර් බයික් එකේ අංකය මොකක්ද? හිමිහිට කියන්න මේක සටහන් කර ගන්න?

පි WPBCQ 0304

ප්‍ර ඊට අමතරව ඔබලා සොයා ගත්තද මේ යතුරුපැදිය කුමන වර්ගයේ යතුරුපැදියක්ද කියලා?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර කුමන වර්ගයේ යතුරුපැදියක්ද?

පි ස්කූටි වර්ගයේ යතුරුපැදියක්.

ප්‍ර හොණ්ඩා ඩියෝ වර්ගයේ යතුරුපැදියක් කිව්වොත් නිවැරදි ද?

පි නිවැරදියි ස්වාමිණි.

ප්‍ර එහි වර්ණය කුමක් හැටියට ද ඔබ අනාවරණය කර ගත්තේ?

පි ලා කොළපාට.

ප්‍ර වර්ණය කියලා. ඉන් අනතුරුව ඔබලා හොයලා බැලීමක් කළාද මේ පුපුරා ගිය බයිසිකලයේ ලියාපදිංචි අයිතිකරු කවුද කියලා?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර කවුද ඒ ලියාපදිංචි අයිතිකරු? ඔබලට මොනවද ඒ සම්බන්ධයෙන් අනාවරණය වුණේ?

පි ස්වාමිණි ඒ සම්බන්ධයෙන් තොරතුරු හොයාගෙන යාමේදී පලවෙනි යතුරුපැදියේ අයිතිකරු අංක 122, නවම්පිටිය පාර, කැළණියේ පදිංචි කෝට්ටගේ නිල්මිණි ජයකොඩි.

ප්‍ර නිල්මිණි ජයකොඩි යන අය තමයි ලියාපදිංචි අයිතිකරු විදියට අනාවරණය වුණේ?

පි එසේමයි ස්වාමිණි.

Proof Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඇය ලියාපදිංචි අයිතිකරු විදියට සඳහන් වෙන්නේ කවද දවසද?

පි ස්වාමිණි එය සඳහන් කරලා නැහැ ස්වාමිණි.

ප්‍ර ඔබ ඊට පස්සේ හොයගෙන ගියාද මේ බයිසිකලයේ වර්ථමාන අයිතිකරු කවුද කියලා?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර කොහොමද හොයාගෙන ගියේ? නිල්මිණි ජයකොඩිගෙන් විමසීමක් කරලා බැලුවද?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර එතකොට මොකක්ද අනාවරණය වුණේ?

පි එම යතුරුපැදිය නිල්මිණි ජයකොඩි කියන එක්කෙනා එයාගේ යාළුවෙක් මාර්ගයෙන් යාළුවා කියන්නේ තුෂාර ප්‍රියන්ත පෙරේරා මාර්ගයෙන් අනුර වික්‍රමසේකර කියන පුද්ගලයට විකුණලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර යාළුවාගේ නම කියන්න? අදිකාරිගේ තුෂාර ප්‍රියන්ත කිව්වොත් නිවැරදි ද?

පි එසේමයි.

ප්‍ර මේ විකුණපු යාළුවාගේ නම මොකක්ද?

පි අනුර වික්‍රමසේකර.

ප්‍ර ඔහු මොනවා කරන කෙනෙක්ද?

පි ඔහු යතුරුපැදි ව්‍යාපාරිකයෙක්.

ප්‍ර ඔබලා ඉන්පසුව මේ අනුර වික්‍රමසේකර මහත්මයා සම්බන්ධ කරගෙන කරුණු සොයලා බැලුවද?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර එසේ විමර්ශනය කිරීමේදි ඔබට මොනවද අනාවරණය වුණේ?

පි ස්වාමිණි අනාවරණය වුනේ ඇතිගේ ජෙරාඩ් යස්ති ද සිල්වා කියන මහත්මයාගේ Identicard එකක් භාර දීලා තමයි මේ යතුරුපැදිය අරන් තියෙන්නේ මෙම අරුණ වික්‍රමසේකර කියන මහත්මයාගෙන්.

ප්‍ර ඒ කියන්නේ මිලදී ගත්ත පුද්ගලයාගේ නම හැටියට සඳහන් වෙන්නේ ඇතිගේ ජෙරාඩ් යස්ති ද සිල්වා කියන අයයි?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර ඒ අනුව ඔබ හොයලා බැලුවද ඇතිගේ ජෙරාඩ් යස්ති ද සිල්වා කියන පුද්ගලයා සම්බන්ධ කරගෙන මේ යතුරුපැදියට මොකක්ද වෙලා තියෙන්නේ කියලා?

පි එසේමයි ස්වාමිණි ඒ සම්බන්ධයෙන්

ප්‍ර ඔබලාට මොනවද අනාවරණය වුනේ?

පි අනාවරණය වුනේ ස්වාමිණි මෙම පුද්ගලයින්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමේදි ජෙරාඩ් කියන මහත්මයාගේ මුදල් පසුම්බිය නැති වෙලා තියෙනවා කාලෙකට පෙර. එහි තිබිලා තිබෙනවා ඒ මහත්තයගේ

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජාතික හැදුණුම් පත. ඒක අවභාවිතා කරමින් සිම්පත් ලබාගෙන තිබෙනවාය කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ජෙරාඩ් සිල්වා කියන මහත්මයා ප්‍රකාශයක් ලබා දෙන්න ගිහිල්ලා තියෙනවා. ඒ අවස්ථාවේදි තමයි එතන මුස්ලිම් තරුණයන් දෙදෙනෙක් ඉදලා ඒ නිලධාරින් පෙන්නලා තියෙනවා මේගොල්ලන් අඳුරනවද කියලා. ඊට පස්සේ තමයි කියලා තියෙන්නේ මෙන්න මේ සහරාන් කියන කට්ටියගේ තමයි මෙයා Identicard එක අරගෙන අවභාවිතා කරමින් සිටින්නේ කියලා ස්වාමිණි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>**

ප්‍ර ඔබ දැන් සඳහන් කරපු තොරතුරු ඔබගේ අවධානයට යොමු වුණේ ඔබ කරන විමර්ශනය අතරතුරදී ද?

පි ස්වාමිණි පොලිස් කණ්ඩායමක් ගියා ස්වාමිණි කොළඹට ඒ ප්‍රකාශ සටහන් කර ගන්න.

ප්‍ර හරි හරි නමුත් ඒ ඔබගේ විමර්ශන කටයුතු අතරතුරදී ද කියලා අහන්නේ?

පි එසේමයි ස්වාමිණි.

**********

**<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>**:

ප්‍ර ඒ අනුව මහත්මයා 2019 අප්‍රේල් 18 වෙනිදා දවල් වෙන කොටම ඔබලාගේ විමර්ශන ඒකකයට මෙම යතුරුපැදි බෝම්බය පිපිරවීමට සහරාන් ඇතුළු කණ්ඩායමක් සම්බන්ධ බව අනාවරණය වුණා කිව්වොත් නිවැරදි ද?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර ඔබ ඊට ප්‍රථම 2019.04.18 උදෑසන මේ සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කිරීමක් සිද්ධ කළාද?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර කුමන අධිකරණයක, කුමන නඩු අංකයක් යටතේ ද මේ සම්බන්ධයෙන් කරුණු වාර්තා කලේ?

පි මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයේ B 397/19 මට මතක හැටියට යටතේ කරුණු වාර්තා කළා.

ප්‍ර ඔබට ඒ අනුව ඔබලාගේ පොලිස් ස්ථානය විසින් කාත්තන්කුඩි පොලිස් ස්ථානය විසින් B වාර්තාවක් මුලින්ම ගොනු කළා කිව්වොත් නිවැරදි ද?

පි එසේමයි ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එම B වාර්තාව නැවත දැක්කොත් ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි එසේමයි ස්වාමිණි.

**ස්වාමිණි සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටි.**

පි : එසේමයි ස්වාමිණි.

**<u>ස්වාමිණි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංකය B 397/19 යන නඩුවේ නඩු වාර්තාව C817 ලෙසත්,</u>**

**<u>එහි ඔවුන්ගේ පොලිස් ස්ථානය විසින් ගොනු කරන ලද මුල් B වාර්තාව 2019.04.18 දිනැති මුල් බී වාර්තාව C817(A) වශයෙන් ලකුණු කිරීමටත් ගෞරවයෙන් අවසර පතනවා.</u>**

**<u>ස්වාමිණි ඊට අමතරව B 397/19 නඩු වාර්තාවේ භාෂා පරිවර්ථක විසින් සිදු කරන ලද සිංහල පරිවර්ථනයට අදාල ලේඛනය C817(B) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට ගෞරවයෙන් අවසර පතනවා</u>**.

ප්‍ර ඔබලා මීට අමතරව මේ සම්බන්ධයෙන් දැන් 18 දවල් වෙන කොටම ඒ සම්බන්ධයෙන් ඒ ප්‍රදේශයේ තියෙන CCTV කැමරා ආශ්‍රිතව විමර්ශන කරලා බැලුවද මේ පුපුරවා හැරීමට කවුද ආවේ? කොහොමද ආවේ කියලා ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරලා බැලුවද?

පි එසේමයි ස්වාමිණි කිසිම..

ප්‍ර මොනවද අනාවරණය වුනේ?

පි කිසි දෙයක් අනාවරණය කර ගැනීමට නොහැකි වුණා ස්වාමිණි.

ප්‍ර ඔබලා විසින් මෙම විමර්ශනය දිගටම කරගෙන ගියාද නැත්නම් එය අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට වැඩිදුර විමර්ශනය සඳහා භාර දීමක් සිද්ධ කළාද?

පි ස්වාමිණි මෙම විමර්ශනය 2019.04.26 වන දින පොලිස්පතිතුමාගේ නියෝග අනුව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට විමර්ශනය බාර දුන්නා ස්වාමිණි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**:

ප්‍ර සාක්ෂිකරු ඔබ විශේෂ කාර්ය බලකායේ අවුරුදු 25 ක් සේවය කළා කියලා කිව්වා?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර නැගෙනහිර පළාතේ කොපමණ කලායක් සේවය කෙරුවද? කුමන කාලසීමාවේද?

Provisional Copy
FAIR COMMENT BY JEZEEM

පි ස්වාමිණි වැඩිම කාලයක් මට කාලසීමාව මතක නැහැ වැඩිම කාලයක් සේවය කලේ නැගෙනහිර පළාතේ.

ප්‍ර සාමාන්‍යයෙන් කොයි වසරවල ද?

පි මුල්ම කාලේ 89 පුහුණු වුණාට පස්සේ මම අම්පාර කොට්ඨාශයේ තිරික්කෝවිල් කඳවුරේ සේවය කළා. එහි සේවය කරලා ආපහු මම මඩකලපුව කොට්ඨාශයේ කොක්අඩිවෝලේ කැම්ප් එකේ වැඩ කළා. ආයෙත් අම්පාර කොට්ඨාශයේ කංචිකුඩිආරු කැම්ප් එකේ වැඩ කළා. ආයි සුරිකල්මුණේ කැම්ප් එකේ වැඩ කලා. දීර්ඝ කාලයක් නැගෙනහිර පළාතේමයි ස්වාමිණි සේවය කලේ.

ප්‍ර විශේෂ කාර්ය බලකායේ බුද්ධි අංශයේ ඔබ වැඩ කළා කිව්වානේ අවුරුදු 7 ක් විතර?

පි එසේමයි ස්වාමිණි අවසන් කාලයේ.

ප්‍ර දැන් ඔබගේ ඔය සේවා කාලය තුලදී නැගෙනහිර පළාතේ අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් ඔබට තොරතුරු ලැබුණද?

පි නැහැ ස්වාමිණි. මම බුද්ධි අංශයේ සේවය කලේ කොළඹ ප්‍රදේශයේ. නැගෙනහිර ප්‍රදේශයේ Uniform රාජකාරී තමයි කලේ Intelligence නෙමෙයි කලේ.

ප්‍ර ඒ නිළ ඇඳුමෙන් නැගෙනහිර පළාතේ සේවය කරන කාල සීමාවලදී යම් යම් අන්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න වුණාද?

පි නැහැ ස්වාමිණි ඒ කාලයේදි LTTE ත්‍රස්තවාදය සම්බන්ධයෙන් රාජකාරී කෙරුවේ. මේ වගේ අන්තවාදී සම්බන්ධයෙන් ඒ කාලේ තොරතුරක් ලැබුන් නැහැ ස්වාමිණි.

ප්‍ර ඔබ කාත්තන්කුඩි ප්‍රදේශයේ සේවයේ යෙදුනේ නැද්ද?

පි නැහැ ස්වාමිණි.

ප්‍ර මඩකලපුව ප්‍රදේශයේ ඉන්න කොට?

පි නැහැ ස්වාමිණි මම එතකොට දෙමල ප්‍රදේශයේ කොක්අඩිවෝලේ ඒ වගේ ප්‍රදේශවල තමයි මම සේවය කලේ. කාත්තන්කුඩි ප්‍රදේශයේ සේවය කලේ නැහැ

**********

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>:

ප්‍ර මහත්මයා ඔබට මතකද ඔය පිපිරීම සිදු වූ ස්ථානය ආසන්නයේම හමුදා අනු කණ්ඩයක් තිබුණා?

පි එසේමයි ස්වාමිණි.

ප්‍ර ඒ හමුදා අනුකණ්ඩයේ හිටපු භටයන්ට සහ නිලධාරීන්ට මේ පිපිරීම පිළිබඳ සද්දය ඇහිලා ඒගොල්ලෝ ඒ ගැන අවධානය යොමු වුණා කියලා ඔබට ඒ අවස්ථාවේදි දැන ගන්න ලැබුණද?

FAIR COMMENT — BY JEZEEM

පි නැහැ ස්වාමිණි මම එගොල්ලන්ගෙන් විමසීමක් කරන්න ගියා, මම යන අවස්ථාවේ ඒගොල්ලන්ගේ උසස් නිලධාරින්ගේ අනුමැතියක් නැතිව යන්න දෙන්න බැහැයි කිව්වා. ඒ සම්බන්ධයෙන් මම විමසීමක් කරන්න පසුව යන්න පුළුවන් කමක් තිබුණේ නැහැ ස්වාමිණි.

ප්‍ර අඩුම ගානේ පිපිරීමේ සද්දෙට එතන ඉන්න හටයෝ එළියට ඇවිල්ලා මේ පැත්ත බලන්නවත් ආවේ නැද්ද?

පි නැහැ ස්වාමිණි. අපි යනකොටවත් ඒගොල්ලොන්ට ඒ දැනුමක් තිබුණේ නැහැ. ස්වාමිණි ඒ ඉඩම කන්ද උඩ තමයි තියෙන්නේ යුධ හමුදා කඳවුර. පිපිරීම වෙන කොට ස්වාමිණි දෙපැත්තට තමයි සද්දේ ගිහිල්ලා තියෙන්නේ අනික් පැත්ත මුහුදු නිසා ඒ හින්දා ඇහෙන් නැතුව ඇතියි කියලා හිතනවා ස්වාමිණි. නමුත් ඒගොල්ලොනුත් දන්නේ ඊලඟ දවසේ අපි ගිය වෙලාවේ තමයි දන්නේ ස්වාමිණි.

ප්‍ර ඒක විශ්වාස කරන්න පුළුවන්ද ඔබ STF එකෙත් වැඩ කරලා තියෙනවා නම් ඔය යුධ කලාපයෙත් සෑහෙන කාලයක් සේවය කලා නම් බෝම්බයක් පුපුරණ කොට අර බයිසිකලේ කෑලි ගිහිල්ලා තියෙන විදිය දැක්කාම ඔය කියපු කතාව විශ්වාස කරන්න ඔබට පුළුවන්ද පොලිස් නිලධාරියෙක් හැටියට?

පි බැහැ ස්වාමිණි.

ප්‍ර එහෙම නම් ඔබට හිතෙන්නේ ඇයි මේ තොරතුර වහන් වුණේ?

පි විශ්වාස කරන්න බැහැ ස්වාමිණි. මට ඒ සම්බන්ධයෙන් හිතන්න අමාරුයි ස්වාමිණි.

ප්‍ර ඒක තමයි මට දැන ගන්න ඕනේ ඇයි ඔබට හිතෙන විදියට ඇයි ඒ තොරතුර එළියට ආවේ නැත්තේ ඒ මොහොතේදී ?

පි දන්නේ නැහැ ස්වාමිණි.

**********

<u>**ගරු බන්දුල අතපත්තු මැතිතුමා:**</u>

ප්‍ර මහත්මයා ඔබ නැගෙනහිර පළාතේ සේවය කරන කොට මේ සහරාන් ගැන දැන ගන්න ලැබුනේ නැද්ද?

පි නැහැ ස්වාමිණි.

ප්‍ර කිසිම තොරතුරක් නැහැ?

පි නැහැ ස්වාමිණි මම සහරාන් සම්බන්ධයෙන් කටයුතු කරන්න ගියේ 2019 ජනවාරී මාසේ 15 වෙනිදා තමයි කාත්තන්කුඩි පොලිසියට යන්නේ. ඊට ඉස්සර මම විශේෂ කාර්ය බලකායට අනුයුක්තව රාජකාරී කරන කොට දෙමල ප්‍රදේශවල තමයි රාජකාරී කලේ. කාත්තන්කුඩි මුස්ලිම් ප්‍රදේශවල රාජකාරියේ සිටියේ නැහැ.

FAIR COMMENT
BY JEZEEM

**********

**<u>ගරු අදිකාරී මැතිනිය:</u>**

ප්‍ර සාක්ෂිකරු මෙම පාලමුනෙ කිරිකෝනා ඉඩම ඒ මොකක්ද පාලමුනෙ කියන්නේ කිරිකෝනා කියන්නේ සිංහල භාෂාවේ තියෙන ව්‍යවහාරේ තියෙන නමක්ද නැත්නම් ද්‍රවිඩ භාෂාවේ ව්‍යවහාරේ තිබෙන නමක්ද?

පි ද්‍රවිඩ ව්‍යවහාරේ තිබෙන නමක්. ඒ ඉඩමට කියන්නේ කිරිකෝන වත්ත.

ප්‍ර මොකක්ද දෙමල භාෂාවෙන් කිරිකෝන කියන්නේ? මට නිකම් මේක බැලුවාම සිංහල වචනයක්ද කියලා හිතුනා. ඒකයි මම ඔබගෙන් පැහැදිලි කර ගන්න අහන්නේ?

පි කිරිතෝන වත්ත කියලා තමයි ස්වාමිණි ආමන්ත්‍රණය කරන්නේ.

ප්‍ර ඔබට දෙමල භාෂාවෙන් කියන තේරුම කියන්න බැරිද මේ කිරිකෝනා කියන එකේ?

පි නැහැ ස්වාමිණි මට තේරුම කියන්න බැහැ.

ප්‍ර ඒක තමයි මට බැලු බැල්මටම හිතුනා මේක සිංහල භාෂාවේ ව්‍යවහාරයේ තියෙන වචනයක්ද කියලා ඒකයි. ඔබ දැන් මේක දෙමල භාෂාවේ තියෙන වචනයක් කිව්වාම මම කැමති වුනේ තේරුම මොකක්ද කියලා දැන ගන්න. කමක් නැහැ.
මෙම ඉඩමේ මොහොමදු මුස්තාපා හසනුල් බස්රි කියන එක්කෙනාට ඉස්සෙල්ලා කාටද මේ ඉඩමේ අයිතිය තිබුණේ?

පි මම ඒ සම්බන්ධයෙන් විමර්ශනය කලේ නැහැ ස්වාමිණි. මෙයාගේ ඉඩමට මෙයා තමයි පැමිණිලිකාරයා. මම ඊට එහා විමර්ශනයක් කරන්න ගියේ නැහැ.

ප්‍ර හිස්බුල්ලා කියලා ඒ ප්‍රදේශයේ හිටපු දේශපාලනඥයෙකුට මෙම ඉඩම කිසියම් කාලයක අයිති වෙලා තිබුණා කියලා ඔබට තොරතුරු ලැබුණද?

පි ඔව් දැන ගන්න තිබුණා.

ප්‍ර මොනවද තිබුණ තොරතුරු?

පි හිස්බුල්ලා මහත්මයාට ඒ ඉඩම තිබිලා ඉඩම සුදු මහත්තයෙකුට විකුණන්න යන්න යන අවස්ථාවේදි තමයි මේ බස්රි ඉඩම දෙන්නේ නැතුව මේ ඉඩම බස්රි ගත්තා කියලා තමයි තොරතුර තියෙන්නේ.

ප්‍ර ඒ වගේම මෙම ප්‍රදේශයේ ඉඩම් සුනාමියට පෙර ද්‍රවිඩ ජනතාවට අයිති වෙලා තිබ්බිච ඉඩම් සුනාමියෙන් පසුව හෝ යුධ කාලයේදි ද්‍රවිඩ ජනතාව මෙම ඉඩම් අතහැර ගියාට පසුව ඔවුන්ගේ ඉඩම් මේ මුස්ලිම් පිරිස් විසින් අයිති කරගෙන තිබෙන බවට තොරතුරු තියෙනවද?

පි නැහැ ස්වාමිනි එහෙම නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර හිස්බුල්ලට කොහොමද මේක රජයේ ඉඩමක්ද පෞද්ගලික කෙනෙක්ගේ ඉඩමක් හිස්බුල්ලා කියන දේශපාලඥයා මිලදි අරගෙනද කොහොමද එයාට මේක ලැබුණේ?

පි ස්වාමිනි මම ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කලේ නැහැ.

ප්‍ර නැහැ නැහැ විමර්ශනයට අදාලවම නෙමෙයි මම මේ වෙන තොරතුරු ටිකක් ඔබගෙන් දැන ගන්න උත්සාහ කරන්නේ. අපේ කොමිසමට තියෙනවා පොඩි එහෙම බලතලයකුත් මේ ජනාවාස කිරිමක් වෙනවද ඒ පිළිබඳව සොයා බලන්න අලුතින්?

පි නැහැ ස්වාමිණි එතන ඉඩමේ නම් ජනාවාස නැහැ. ඒ ඉඩමට ඇතින් තමා ගෙවල් 7 විතර තියෙන්නේ. ඒ තියෙන්නෙත් ද්‍රවිඩ ජනතාවට. මුස්ලිම් ජනතාව නෙමෙයි ඒ හරියේ පදිංචි වෙලා ඉන්නේ. එහෙම ජනාවාසයක් ඇති කිරීමේ තත්ත්වයක් දැනට නැහැ ස්වාමිණි. Inquiry කරන කාලෙත් නැහැ, දැනටත් නැහැ කියලා තමයි හිතන්නේ.

ප්‍ර දැන් මෙම ඉඩම පිළිබඳව රජයේ අධිනීතිඥ මහතා ඔබගෙන් ඇසුව ප්‍රශ්නය මම නැවත වරක් අහන්නම්. මේ ඉඩමේ අසාමාන්‍ය විදියට තමයි ලොකු අක්කර 43 ක ඉඩමක අර අමුතුම ආකාරයේ තාප්පයක් වගේ එකක්නේ දාලා තියෙන්නේ?

පි ඔව්.

ප්‍ර එම ස්ථානය ආවරණය කරලා මෙතන වෙන දේවල් සිද්ධ වෙලා තියෙන බව ඔබ සොයා බැලුවද පුහුණු කඳවුරු පවත්වලා තියෙනවද මේක සම්පූර්ණයෙන්ම ආවරණය කරලා?

පි හොඳට විමර්හනය කරලා බැලුවා එතන ඒ ඉඩම කොටස් කරලා තියෙන්නේ විකුණන්න තමයි සුදානම් කරලා තියෙන්නේ. මොකද තහඩු ගහන කම්පැනියක් තියෙනවානේ පාලමුනෙ හරියේමයි. ඒ හින්දා ලාබෙට ගන්න පුළුවන් හින්දා එහෙම ස්ථාපිත කලාද දන්නේ නැහැ. නමුත් පුහුණු කඳවුරක් තිබ්බාය කියන්නේ ස්වාමිණි එහා පැත්තේ ප්‍රදේශයේ.

දැන් වේලාව : ප.ව. 4.15 යි

මෙතැන් සිට ල/ලේ :- යමුණා දසනායක මිය විසින්ය.

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් ල/ලේ දම්මිකා.
සටහහන් ගැනිම යමුනා දසනායක.
වෙලාව 4.15

**<u>ගරු විනිසුරු අදිකාරි මැතිණිය.</u>**

ප්‍ර කොතනද?

උ පාලමුණ නෙමේ ඔල්ලු කුලම් කියලා .

ප්‍ර කාගේ පුහුණු කඳවුරක්ද

උ සහරාන්ලගේ පුහුණු කඳවුරක්. තිබුනා කියලා සි. අයි ඩි එකෙන් ඇවිල්ලා බඩු වගයක් හොයාගෙන ගියානේ ස්වාමිනි අන්න ඒ හින්දා තමයි ස්වාමිනි තියෙන්න ඇති කියලා ඒකේ සාධාරණ සැකයකුත් තියෙනවා අපි සාමාන්‍යයෙන් යුද්ධ කාලේ අපි ගහනවා නිරීක්ෂණ මුරකුටි කියලා ඒ වගේ දේකුත් තියෙනවා ඒ හින්දා එහෙම හිතන්න පුළුවන් කියලා සාමාන්‍ය දැනුමෙන් හිතන්න පුලුවන්.

ප්‍ර මෙම ප්‍රදේශවල ඉඩම් කොටස්කරලා විකුණනවා නම් ලොකුවට තාප්පයක් ගහනවද තාප්පයක් වගේ එකක් ?

උ නැහැ සාමාන්‍ය ඉඩම් වල ඒ තහඩු ගහලා තියෙනවා පොඩි පොඩි ඉඩම් වල මේ ලොකු ඉඩම් වලට ගහලා නැහැ කම්බි වැටයි කොන්ක්‍රිට් කණු දාලා කම්බි වැටක් ගහන්නේ.

ප්‍ර මට තව පොඩි ප්‍රශ්නයක් තියෙනවා ඔබ නැවත කියන්න එපා මම පරික්ෂා කරේ අර බෝම්බය විතරයි කියලා මේක මම මේ ඉතිහාසය ගැන ගොඩක් ආසාවෙන් ඉන්න නිසා ඔබේ නමේ තියෙන මොහොම්දිරම්ලාගේ ගෙදර කියන එක ඓතිහාසිකව සිංහල සහ මුස්ලිම් අය අතර තිබිච්ච ඓතිහාසික තාවය පෙන්වීමට සාක්ෂියක් ද කියලා මන් අහන්න කැමතියි.

ප්‍ර ස්වාමිනි ඉතිහාසයේ ස්වාමිනි මරක්කල කියලා වචනයක් පාවිච්චි කරලා තියෙනවානේ ඒ මරක්කල කියන වචනය හරහා තමයි තිබෙන්නේ ඒ මගේ දැනුම අනුව නම් ස්වාමිනි දෙවනි රාජසිංහ රජතුමා නුවර ප්‍රදේශය පාවා දිලා රජතුමා දුවලා ගිහිල්ලා ගස් බෙනයක හැංගෙනවා එතකොට පිටිපස්සෙන් ආපු සුද්දොයි ශ්‍රී ලංකාවේ කට්ටියයි කියනවා මෙතන රජතුමා ආවා දුවගෙන ආවාට පස්සේ කියනවා කෝ රජතුමා කියලා මුස්ලිම් ගැහැණු කෙනෙක් මිදුල අතුගගා ඉන්නවා ඊට පස්සේ පිරිවර ඒ ගැහැණු කෙනා කපලා මරණවා නමුත් ගස්බෙනේ ඉඳලා රජතුමා බලාගෙන ඉන්නවා මේ ගැහැණු කෙනා ඒක පාවා දෙන්නේ නැහැයි කියලා එයා ගේ බෙල්ල කපලා මරනවා එතකොට රජතුමා කියනවා මාව රැක්ක ලේ ඒක මරක්කල වෙලා ඒ අනුව අපිට මේ සිංහල වාසගම රජකමෙන් හම්බ වෙච්ච එකක් කියලා තමයි මුස්ලිම් ජන වහරේ තියෙන්නේ

**********

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.**

ප ඔබ කිව්වා නේ 2019 ජනවාරි 15 සිට ඔබ කාතන්කුඩි පොලිසියේ සේවයේ යෙදී සිටියා කියලා ?

උ එසේය ස්වාමිනි.

ප දැන් 2019 ජනවාරි 15 ඉඳලා 2019 අප්‍රේල් 21 වෙනකල් ඔබ කොයි අංශයේද සේවය කලේ ?

උ අපරාධ අංශයේ.

ප ඒ කාලය තුලදී ඔබ ට දැනුවත් කිරිමක් කරේ නැද්ද මේ පොලිස් ස්ථානයේ නිළධාරින් මෙම මොහොමඩ් සහරාන් නැමැත්තාව සොයනවා කියලා ?

උ නැහැ ස්වාමිනි එක දවසක් සැබෑම ස්වාමිනි එක දවසක් වරෙන්තු මෙහෙයවුමකට ගියා ස්වාමිනි එතකොට මට වරෙන්තු කරපු 15468 ඉහලගම නිළධාරියායි 88840 සින්දුජන් යන නිළධාරියයි මට සහරාන් ගේ පල්ලිය ලග බයිසිකලය නවත්වලා සර් මේ පල්ලිය හොඳට බලා ගන්න කියලා කිව්වා මම කිව්වා ඇයි කියලා සර්ට කවදාහරි හැකි ඉක්මනින් හරි කවදා හරි මෙතෙන්ට එන්න වෙයි අපි ගියේ නැති දවසක හරි මේ තැන පොඩ්ඩක් බලා ගන්න එන්න පාර බලා ගන්න කියලා කිව්වා එහෙම කිව්වට සර් මම එහෙම ස්වාමිනි මම ඒතරම් ලොකුවට හිතුවේ නැහැ එහෙම නිකම් විහිලුවට වගේ කිව්වා කවදහරි තනියෙන් එන්න වෙයි කියලා පොඩ්ඩක් බලා ගන්නකිව්වා විහිලුවට වගේ

ප ඔබ ඇහුනේ නැද්ද එහෙම ඇයි කියන්න හේතුව කියලා ?

උ නැහැ එහෙම මුකුත් විහිලුවට වගේ කිව්වේ පස්සේ තමයි මේ සිදුවීම වුනේ.

ප ඔබ වරෙන්තුව නිකුත් කිරීමේ භාරව හිටිය නිළධාරිද ?

උ මම අපරාධ අංශයේ ස්ථානාධිපති .

ප එහෙමනම් ඔබ අපරාධ අංශයේ ස්ථානාධිපති වෙලා මාස 3 ක් හිටියා

උ එසේමයි.

ප ඒ වෙනකොටත් ඔබ දැනුවත් විමක් එදා සිදු වුනේ නැද්ද මොහොමඩ් සහරාන්ට විරුද්ධව නඩු කටයුතු සඳහා ඔහු හොයනවා කියලා දින වරෙන්තු තියෙනවා ඔහු සෙවිමක් කරනවා කියලා ?

උ දන්නවා ස්වාමිනි.

ප ඒ කියන්නේ ඔබ දැනගෙන හිටියාද ?

උ එහෙමයි ස්වාමිනි.

ප එතකොට අර පල්ලිය ගාව නවත්වලා අරකථාව කිව්වේ ?

උ සහරාන්ගේ වරෙන්තුවක් තිබුනානේ ස්වාමිනි ඒ හන්දා වෙන්න ඇති ඒ නිළධාරින් එහෙම කිව්වේ.

ප සහරාන්ට වරෙන්තුවක් තියෙන බව ඔබ 2019 ජනවාරි 15 ඉඳලා දැනගෙන හිටියාද ?

FAIR COMMENT BY JEZEEM

උ 15 න් පස්සේ මම අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් වාර්තා කිරීමේ පසුව අපරාධ අංශයේ ස්ථානාධිපති ස්වාමිනි වරෙන්තු සිතාසි ඒ සියල්ලක්ම භාරව තියෙන්නේ ඒ වෙන කොට දැන ගෙන හිටියා . මම භාර ගත්තාට පස්සේ මම දැන ගෙන හිටියා මෙහෙම වරෙන්තුවක් තියෙනවා මෙහෙම නඩුවකුත් තියෙනවා කියලා ස්වාමිනි.

ප ඔබ අංශය භාර ගත්තාට පස්සේ ඒ අංශයෙන් නිකුත් වෙන වරෙන්තු ගැන ඔබ දැනුවත් වෙනවානේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප එතකොට ඔය සහරාන්ට විරුද්ධව නිකුත්වෙලා තිබ්බා දින වරෙන්තුව අනෙක් වරෙන්තු කරුවන් හා සමානවම එකම තත්වයේ විදියටද පොලිසිය සලකලා තිබ්බේ.

උ එහෙමයි මම එනකොටත් ඒ විදියටමයි ඒ ගොල්ලෝ ගිහිල්ලා බලලා තියෙනවා තිබිච්ච ලිපිනයට බලලා තියෙනවා ඊට පස්සේ ඔහු කුලියට

ප සහරාන්ට විරුද්ධව තිබිච්ච වරෙන්තුව විශේෂ වරෙන්තුවක් විදියට තිබිච්ච එකක් වශයෙන් සලකලා තිබ්බේ නැහැ ?

උ නැහැ ස්වාමිනි.

ප ඒ සහරාන්ව අල්ලා ගන්න අරගෙන තිබුනු ක්‍රියා මාර්ග මොනවාද ?

උ ඒ ගොල්ලන් ගිහිල්ලා තියෙන හිටපු නිවස ඒ ගොල්ලන් කුලියට හිටපු නිවාස ඒ ගොලල්න්ගේ දෙමව්පියන් හිටපු නිවාස එයාගේ මල්ලි රිල්වාන් හිටපු නිවාස එයාගේ හැම දෙයක්ම පරික්ෂා කරලා සටහන් දාලා තියෙනවා නමුත් කොහේවත් සහරාන් හිටියා කියලා තහවුරු වුනේ නැහැ ස්වාමිනි .

ප දැන් ඔබ 2019 ජනවාරි 15 ඉඳලා පාස්කු ප්‍රහාරය වෙනකල් ඔබ කාන්තන්කුඩි පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් සිටපු කාලය තුලදි ඔබව යම් කිසි දැනුවත් විමක් කෙරුවද සහරාන් ගේ දුරකථනය ඔළුවිල් ප්‍රදේශයේදි යම්කිසි අවස්ථාවක ක්‍රියාකාරිව තිබ්බා කියලා ?

උ නැහැ.

ප කිසිම අවස්ථාවක දැනුවත් කිරිමක් නැහැ ?

උ නැහැ ස්වාමිනි.

ප ඔබ කිව්වනේ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් යම්කිසි පුහුණු කඳවුරක් ලෙස භාවිතා කලැයි සැක කරන ස්ථානයක් සොයා ගත්තා කියලා ?

උ එසේමයි ස්වාමිනි.

ප එම ස්ථානය තිබෙන්නේ කාත්තන්කුඩි පොලිස් ස්ථානය පොලිස් බල ප්‍රදේශය තුලද ?

උ එසේමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ සම්බන්ධයෙන් ඔබලාට තොරතුරක් ලැබිලා තිබුනේ නැද්ද අපරාධ අංශයේ ඉන්න කාලේ ?

උ නැහැ ස්වාමිනි ලැබිලා තිබුනේ නැහැ.

මෙම සාක්ෂිකරු ගෙන් ප්‍රශ්න ඇසිමට අවස්ථාවක් අති උතුම් මැල්කම් රන්ජත් හිමිපානන් වෙනුවෙන් පෙනි සිටින උගත් නීතිඥ වරියට අවශ්‍ය දැයි විමසමි නැත යනුවෙන් ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු මුදා හරිමි.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා තේරුම් ගෙන මෙම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

**2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව**

දිනය 2020-07- 6 වේලාව - ප.ව. 05.30
(සටහන් කලේ යමුනා දසනායක විසිනි )

ගරු විනිසුරු මඩුල්ල -
01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් දසිල්වා මැතිතුමා - සභාපති

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. -සාමාජික

.03 හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. සාමාජික -

.04 හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් - ආර් අදිකාරි මහත්මිය .එම් .එම් . සාමාජික

පෙනි සිටීම
අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය . ,ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ චතුරාංග බංඩාර මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ නයනා සෙනවිරත්න මහත්මිය , රජයේ අධිනිතිඥ නිමේෂාද අල්විස් මෙනවිය , රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර ,රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ සහ රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ පෙනි සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ඉල්ලීම සලකාබැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නිති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ෂමීල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනි සිටීමට අවසර ලබා දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරු කැඳවයි.
සම්පූර්ණ නම- ඇන්තනි රංජිත් අබේ ද සිල්වා.
වයස- අවු. 80 යි.
ජාතිය- සිංහල
ආගම බෞද්ධ.
ලිපිනය- 20/08 ,දෙල්ගහවත්ත, වදුරාමුල්ල, පානදුර.
ප්‍රතිඥා වෙයි.

**<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය</u>.**

ප්‍ර රංජිත් මහත්මයා ඔබ දැනට පදිංචිව සිටිනවා යැයි පැවසුවේ පානදුර ප්‍රදේශයේ ?

උ පානදුරේ දැනට පදිංචිය.

ප්‍ර ඔබ විශ්‍රාමික නිළධාරියෙක් කිව්වොත් නිවැරදිද?

උ ලංගම මැනේජර් කෙනෙක් වෙලා ඉඳලා විශ්‍රාම ගියා. 2001 .

ප්‍ර ඔබ 2001 විශ්‍රාම ලබා ගත්තා.?

උ ඔව්

ප්‍ර ඔබ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවය කළා කිව්වොත් නිවැරදිද ?

උ ඔව්.

ප්‍ර ඔබගේ සේවා කාලය තුල ඔබ මොනවගේ ස්ථාන වලද සේවය කරලා තියෙන්නේ ?

උ මම මුලින්ම වැඩ කළා ප්‍රධාන කාර්යාලය නාරාහේන්පිට ඊට පස්සේ පොළොන්නරුවේ අවුරුදු 6 ක් වැඩ කළා. ඊට පස්සේ අම්බලන්ගොඩ වැඩ කළා අවුරුදු 3 ක් පානදුරේ වැඩ කරා අවුරුදු දෙකක්. ඊට පස්සේ කල්මුණේ, අම්පාරේ. මඩකලපුවේ ඒ ප්‍රදේශවල තමයි වැඩ කළේ. ඊට පස්සේ ත්‍රස්තවාදි කරදර වෙච්ච වෙලාවේ 86 එහේ ඉන්න බැහැ ඊට පස්සේ ගාල්ලට වාර්තා කලා සේවය . ඊට පස්සේ දිගටම එහේ ඉඳලා තමයි 2001 පැන්ෂන් ගියේ.

ප්‍ර දැන් ඔබ කල්මුණේ ප්‍රදේශයේ සේවය කරන කොට ඔබ එහි පදිංචිව සිටියාද ?

උ ඔව්. එහි පදිංචි වෙලාම හිටියා 81 ස්ථිරවුනාට පස්සේ මම රජයේ ඉඩමක් අරගෙන මම ගෙයක් හදා ගෙන එහෙන්ම හිටියා.

ප්‍ර ඔබ කුමන අවුරුද්දකද කල්මුණේ ප්‍රදේශයේ පදිංචියට ගියේ ?

උ කල්මුණේ ඉඩම හම්බවුනේ 81 ඒහේ ගියා ඊට ඉස්සරලා මගේ අයියත් හිටියේ එහේ 1965 ඉදලා වී අලෙවි මණ්ඩලයේ ඒ තැන තමයි මම 77 න් පස්සේ හිටියේ.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර 1981 ඉඳලා කුමන වර්ෂය වෙනකල් ඔබ කල්මුණේ ප්‍රදේශයේ හිටියාද?

උ පවුලත් එක්කම හිටියේ 86 වෙනකල් විතරයි.

ප්‍ර ඔබගේ පවුලේ සාමාජිකයන් සමඟම එබ කල්මුණේ ප්‍රදේශයේ වාසය කළා.?

උ ඔව් නැවතිලා .

ප්‍ර කල්මුණේ ප්‍රදේශයේ ඔබට හිමි නිවසකද ඔබ පදිංචිව හිටියේ ?

උ මගේ නිවසෙත් හිටියා අයියලාගේ ගෙදර හිටියා දෙකේම හිටියා.

ප්‍ර ඔබට ගරු කොමිෂම් සභාවට සඳහන් කරන්න පුලුවන්ද ඔබ කල්මුණේ කුමන ප්‍රදේශයකද වාසය කලේ කියලා ?

උ අමාන් කෝවිල් පාරේ ඔය අෂ්රොෆ් මහත්මයාගේ ගෙවල් කිට්ටුවම.

ප්‍ර ඔබ කල්මුණේ ප්‍රදේශයේ ලෙස පදිංචිව සිටින විට ඔබ යම් සංවිධානයක සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළාද ?

උ මම සිංහල බෞද්ධ සංවිධානයේ සංවිධානයක වශයෙන් කල්මුණේ හිටියා ඒක සමස්ත ලංකා බෞද්ධ සංවිධානයේ ප්‍රධාන ශාඛාවේ ප්‍රධාන සංවිධානයේ ශාඛාවක් වශයෙන් තමයි කල්මුණේ තිබුනේ ඒකේ මං තමයි ප්‍රධාන සංවිධායක විදියට කල්මුණේ .

ප්‍ර සිංහල බෞද්ධ සංවිධානය කියන සංවිධානය පිහිටුවලා තිබුනේ කවදාද ?

උ පිහිටුවලා තිබ්බේ ඒක 1960 ගණන් වල හිටන් තිබුනා .මෙහි දෙහිවල බෞද්ධ මන්දිරයේ තමයි ඒක තිබුනේ ඒකේ අපි අයයලා තමයි ඉස්සෙල්ලා සභාපති වශයෙන් හිටියේ අයියා පැන්ෂන් ගියාට පස්සේ මම සංවිධායක කම ගත්තා.

ප්‍ර දැන් එය සිංහල බෞද්ධ සංවිධානය කියන සංවිධානයේ මොනවද කරේ?

උ අපි කරේ සිංහල මිනිසුන්ගේ ප්‍රශ්ණ තිබුනා ඒවා බලන්න සොයන්න කව්රුත් හිටියේ නැහැ ඒවා නියෝජනය කරේ මුස්ලිම් ඇමතිවරු සහ ද්‍රවිඩ ඇමතිවරු මන්ත්‍රිවරු පළාත් සභා ඒවාගේ කාණ්ඩය ඒක නිසා අපි අපේ ප්‍රශ්ණ අපේ දිසාපතිතුමාට ප්‍රාදේශිය ලේකම්තුමාට රාජ්‍ය නිළධාරින් දැනුවත් කරලා අපි ඒ මිනිසුන්ට සහන අරන් දෙන්න පුලුවන් තරම් වැඩ කලා.

ප්‍ර දැන් ඔබ ඔය සඳහන් කරන්නේ මුස්ලිම් මන්ත්‍රීවරු දෙමළ මන්ත්‍රීවරු සිටියයි කියලා කුමන ප්‍රදේශයකද ?

උ දැන් සමන්තුරේ, පොතුවිල් අකකරපත්තුවේ ,කල්මුණේ ඒ ප්‍රදේශවල හිටියේ සේරම මුස්ලිම්වරු දෙමළ කාණ්ඩය හිටියා අර ජනගහනය අනුව ඒ ගොල්ලන්ට ආසන්න ආසන ගණනක්

Proof Copy
FAIR COMMENT BY JEZEEM

ඡන්දෙත් හම්බ වුන නිසා දෙන්නෙක් විතර පත් වුනා අර ගොල්ලෝ තමයි 09 දෙනෙක් විතර හිටියා මුස්ලිස් කාණ්ඩය.

ප දැන් මහත්මයා ඔබ සිංහල බෞද්ධ සංවිධානයේ සංවිධායක විදියට කල්මුණේ ප්‍රදේශයේ ඔබට මොනවද පැවරී තිබුණු වැඩ ඒ සංවිධානයට අදාළව කරන්න ?

උ අපි ඒ සංවිධානයේ වැඩ කරේ සාමාන්‍යයෙන් මාස 3 කට විතර දිසාපති කාර්යාලයේ රැස්වීමක් ඒ දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි රැස්වීම තියන්නේ ඒ නැවත සංවිධානවල කාණ්ඩෙත් එනවා. ඉතින් අපිත් ගිහිල්ලා අපි දිසාපතිතුමාට කියනවා අපට මේ මේ ප්‍රශ්ණ තියෙනවා අපට මේ විසඳලා දෙන්න කියලා අපි ඉතින් පුලුවන් දේවල් කරලා දෙනවා.

ප දැන් ඔබ ඔය සඳහන් කරන ආකාරයට ඔය කියන ප්‍රශ්ණ හෝ ගැටලු ඇති වෙලා තියෙන්නේ ඒ කල්මුණේ ප්‍රදේශයේ පදිංචි සිංහල ජනතාවට.?

උ ඔව් .

ප ඔබ අවුරුදු 05 ක් පමණ කල්මුණේ ප්‍රදේශයේ පදිංචිව හිටියානේ?

උ ස්ථිරවම හිටියා.

ප ඔබට මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුලුවන්ද ? ඒ කාලයේදි කල්මුණේ ප්‍රදේශයේ ජන සංයුතිය මොන ආකාරයෙන්ද තිබ්බේ. සිංහල මිනිස්සු සාමාන්‍යයෙන් කී දෙනෙක් විතර හිටියාද මුස්ලිම් ජනගහනය කි දෙනෙක් විතර හිටියාද දෙමළ ජනගහනය කී දෙනෙක් හිටියාද?

උ ඒ කාලේ වෙන කොට මුස්ලිම් ජනගහනය 33000 ක් විතර හිටියා ඡන්ද දායකයෝ 12000 ක් ද්‍රවිඩ කාණ්ඩය. සිංහල කාණ්ඩය 3000 කට ආසන්න ගානක් හිටියා.4% ක් තමයි හිටියේ.

ප දැන් මහත්මයා ඔය සඳහන් කරානේ සංඛ්‍යා ලේඛණ වගයක්?

උ ඔව්.

ප ඒ මොන අවුරුද්දට අදාලවද ?

උ 1983.

ප එමෙන්ම මහත්මයා ඔබට මෙම ගරු කොමිෂන් සභාව දැනුවත් කරන්න පුලුවන්ද ඔබ කල්මුණේ ප්‍රදේශයේ ජීවත් වෙන කොට 1981 සිට 198 6 දක්වා කාලයේදි ඒ කාලය තුල මුස්ලිම් ජනගහනය සහ සිංහල ජනගහනය ඒ මුස්ලිම් මිනිස්සුත් සිංහල මිනිස්සුත් අතර තිබුණු සම්බන්ධය මොන වාගේද?

උ ඒ මුල් අවදිය කාලයේදි 60 ගණන් වල හිටන් කිසිම බේදයක් තිබුනේ නැහැ සිංහල , මුස්ලිම් , ද්‍රවිඩ කිසිම බේදයක් තිබුනේ නැහැ.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර නැහැ මම මහත්මයා ඇහුවේ ඔබ පදිංචිව සිටියනේ 1981 ඉඳන් 86 වෙනකල් ඒ කාලේ ඔබට නිරීක්ෂණය වුනේ මොන වගේ සම්බන්ධයක් තියෙනවාද කියලා ?

උ ඒ කාලේ එහෙම හිටියා ඉන්නකොට අෂ්රොෆ් කියලා මහත්තයැන් කෙනෙක් මේ නීතිඥයෙක් කල්මුණේ උසාවියේ වැඩ කරන්න පටන් ගත්තා. ඒ වැඩ කරන්න ගත්තාම අපේ ගෙවල් පාරෙම තමයි එයාගේ පදිංචිය තිබුනේ ඊට පසසේ එයා මේ මුස්ලිම් තරුණ කොටසුයි පක්ෂ කාණ්ඩෙයි ඒ කාණ්ඩෙත් එක්ක බොහොම සම්බන්ධතාවයක් තිබුනා එහෙම තිබිලා ඒ කාලෙදි ත්‍රස්තාවාදී විදියට ජිහාඩ් සංවිධානය තමයි තිබුනේ .

ප්‍ර මොකක්ද සංවිධානය ?

උ ජිහාඩ් සංවිධානය.

ප්‍ර ජිහාඩ් සංවිධානය?

උ තිබුනේ ඒ දවස්වල ඒ පැතිරිලා ගියා ඒ දවස්ල අෂ්රොෆ් මහත්මයා ජිහාඩ් සංවිධාන කාරයෙක්ය කියන එක නිකම් ඇත්තද නැත්තද කියලා දන්නේ නැහැ නිකම් ප්‍රචාරයක් තිබුනා කොහොමත් මුස්ලිම් තරුණ කොටසුත් එයා එක්ක සම්බන්ධයක් තිබුනා.

ප්‍ර දැන් ඔබ සඳහන් කරන්නට යෙදුනු අෂ්රොෆ් කියන මහත්මයා දේශපාලනය සම්බන්ධයෙන් කටයුතු කලාද ඒ කාලේ . ?

උ එයා දේශපාලනයට ආවේ මේ රැස්වීම් තියලා ඊට පස්සේ 1983 මේ කල්මුණේ රජයේ තානායමේ .

ප්‍ර මහත්මයා මම එතනට එන්නම් මම අහන්නේ අෂ්රොෆ් මහත්මයා දේශපාලනය වැඩ කළාද ඒ කාලේ?

උ දේශපාලනේ වැඩ කලා එයා එතකොට පක්ෂයක් නියමාකාරයෙන් තිබුනේ නැහැ.

ප්‍ර නියමාකාරව තිබුනේ නැත්නම් ඔබගේ දැනුම අනුව අෂ්රෝෆ් මහතා යම් පක්ෂයක් පිහිටුවා ගත්තාද ?

උ පස්සේ පක්ෂය පිහිටුවා ගත්තා මුස්ලිම් කොන්ග්‍රස් කියලා පක්ෂයක් පිහිටුවා ගත්තා. එයා තමයි එකේ නිර්මාතa

ප්‍ර දැන් ඔබ දැන් මොහොතකට කලින් සඳහන් කලා කල්මුණේ තානායමේ සිදුවූ යම් සිදුවිමක් සම්බන්ධයෙන්. මේක කොයි කාල වකවානුවේද සිද්ධ වුනේ ?

උ 83.

ප්‍ර 1983 දි?

උ 83 පෙසොන් දවසේ තමයි ඒ සමුළුව තිබ්බේ.

ප්‍ර 1983 පොසොන් දවසේ .

උ 83.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඔබට කොහොමද දැන් ඔතන ඔය මොකක්ද තියන්න සැලසුම් කරලා තිබුනේ ?

උ මට ඒ තානායම් භාරකරු හිටියේ ජා ඇල ප්‍රනාන්දු මහත්මයා කියලා එක් කෙනෙක් එයායි අපි සිංහල බෞද්ධ බොහොම සම්බන්ධතාවයක් තිබුනා. ඉතින් මගේ ධීවර යාත්‍රාවකුත් තිබුනා ඒ වැල්ල අද්දර තමයි තිබුනේ තානායම තිබුනේ වැල්ල අද්දර අපි නිකම් ඉන්න වෙලාවටත් කතා බතා කර කර ඉන්නෙ සුහදතාවයෙන් කතා කලා එහෙම ගිහිල්ලා ඉන්න අවස්ථාවේ තමයි කිව්වේ මේ මුස්ලිම් සමුළුවක් තියෙනවා එදාට කිසිම බුක් කිරිමක් කරන්න එපා කිසිම ගෙන්වීමක් කරන්න එපා මේ කියලා ඒ කියන්නේ මුන්ගේ මොකක් හරි ලොකු මේව එකක් තියෙනවා කෑමත් ලෑස්ති කරන්න කිව්වා 400 කට විතර ඒක නිසා මොකක් හරි තියෙනවා පුලුවන් නම් ඔයත් එන්න කියලා . මම කිව්වා ඉතින් ඇයි පිටස්තර මිනිහෙක් එන්නේ කියලා මට ඒක හරි නැහැ නේද කියලා නැහැ ඔයා වේටර් කෙනෙක් හරි කුස්සියේ අත් උදව්වට වගේ එනනෙයි කිව්වා එහෙම කිව්වා ඉතින් මොකද මාත් උදේ හත හාමර වෙන කොට ගියා.

ප්‍ර දැන් එය යම් සමුළුවක් සම්බන්ධයෙන් තමයි මහත්මයට කිව්වේදැන් එය ප්‍රනාන්දු කියන කළමණාකරු තානායමේ කළමණාකරුනේ ඔබ සඳහන් කලේ එහෙම නේද?

උ ප්‍රනාන්දු.

ප්‍ර ප්‍රනාන්දු කියන තැනැත්තා ඇයි ඔබටම කිව්වේ මේ තොරතුර මෙහෙම මේ මුස්ලිම් සුමුළුවක් තියන්න යනවා පොහොය දවසේ තානායමේ කියලා ඔබට ඒ තොරතුර ලබා දෙන්න හේතුවුනේ මොනවාද?

උ ඒ කිව්වේ මම බෞද්ධ සංවිධානයේ සංවිධායකයෙක් නිසත් මම සිංහල මිනිස්සු ගැන අපේ පවුලේ හුහක් කාණ්ඩෙ හිටියේ නැගෙනහිර ප්‍රදේශයේ තමයි මඩකලපුව පොලිසිය ඉස්සරහ ඊස්ට් ටා සර්විස් කියලා ලොකු කොම්පැනියක් තිබුනා ඒකේ අපේ මස්සිනා තමයි හිටියේ
අපේ තාත්තා ධීවර ව්‍යාපාරිකයෙක්. මඩකලපුව , පොතුවිල් යනකල් දිගටම මේ ධීවර කටයුතු වල යෙදි සිටිය එක්කෙනෙක් ඒක නිසා අපි සිංහල මිනිසුන්ට සාමාන්‍යයෙන් ඒ පළාතේ පදිංචි කාණ්ඩය ගැන සොයා බලනවා. ඉතින් ඒවා කතා කරන නිසා තමයි ප්‍රනාන්දු මට මෙහෙම කිව්වේ.

ප්‍ර දැන් ඔබ සඳහන් කලා මේ සමුළුව 1983 පොසොන් දවසේ තමයි තියෙන්න තිබුනේ කියලා ?

උ ඔව්

ප්‍ර ඔබට දිනය මතකයක් තියෙනවාද ?

FAIR COMMENT BY JEZEEM

ඌ දිනය මතක නැහැ පොසොන් දවසේ තමයි මතක තියෙන්නේ.

ප්‍ර දැන් මහත්මයාට පෙන්වා සිටියොත් 1983 කැලැන්ඩරය දින දර්ශණය ඔබට එයින් පොසොන් දවස කවදද යෙදිලා තියෙන්නේ කියලා සඳහන් කරන්න පුලුවන්ද ?

ඌ මේකනේ 24 තියෙන්නේ වෙන්න පුලුවන් අපි එදාට නිවාඩුයිනේ.

ප්‍ර මොන මාසේ 24 ද?

ඌ ජුනි.

ප්‍ර ජුනි මාසේ 24 ?

ඌ ඔව්.

**මේ අවස්ථාවේදි 1983 වර්ෂයේ දින දර්ශකය වශයෙන් සාක්ෂිකරු විසින් හඳුනාගන්නට යෙදූ ලේඛණය C 818 වශයෙන් ලකුණු කිරීමට ගේරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.**

ප්‍ර මහත්මයා ඒ අවස්ථාව වෙන කොට කොහේ හරි ස්ථානයක වැඩ කරමින්ද හිටියේ?

ඌ ඔව් ඉතින් තානායමේ සාමාන්‍යයෙන් අර පිහන් අරව මේව ගෙනියන්න.

ප්‍ර නැහැ නැහැ මම අහන්නේ ඒ වෙන කොට මහත්මයාගේ රස්සාව මොකක්ද ?

ඌ නැගෙනහිර ප්‍රාදේශිය ගමනා ගමන මණ්ඩලයේ සහකාර සම්පාදක නිළධාරියෙක් විදියට තමයි හිටියේ.

ප්‍ර දැන් පොසොන් පොහොය දවසේ මහත්මයාට නිවාඩු ?

ඌ නිවාඩු.

ප්‍ර ඒ අනුව ඔබ පොසොන් පොහොය දවසේ ඔය ප්‍රනාන්දු කියන කෙනා කියපු ආරන්චිය අනුව තානායමට ගියාද?

ඌ ගියා.

ප්‍ර ඔය කල්මුණේ තානායම කියන්නේ රජය විසින් පවත්වාගෙන යනු ලබන තානායම කිව්වොත් හරිද?

ඌ රජය විසින් පවත්වාගෙන යන තානායමක් තමයි ඒක.

ප්‍ර එදා රන්ජිත් මහත්මයා මොන විදියටද එතන තානායමට ගියේ එතන සේවකයෙකු විදියටද ගියේ?

ඌ ඔව් සේවකයකු විදියට තමයි මං ගියේ.

ප්‍ර කීයට විතර මහත්මයා තානායමට ගියේ ?

ඌ මං හත හමාර වෙන කොට ගියා. සුමුළුව කාණ්ඩය 09 වෙන කොට තමයි ආවේ.

ප්‍ර ඒ කියන්නේ සමුළුවට සහභාගි වෙන පිරිස ආවේ 09 ට පමණ ඒ අනුව ඔබ දුටුවාද ඒ පැමිණෙන පිරිස් කවුද කියලා ?

ඌ ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප ඔබට ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න පුලුවන්ද කවුද ඔය සමුළුවට ආවේ කියලා ?

උ ඒකේ සංවිධානය කරලා තියෙන්නේ ඒ.එම්.අෂ්රොෆ් මහත්මයා තමයි සංවිධානය කරේ. ඒ පාර ඒකේ සුමුළුවේ මුල් ආසනයේ හිටියේ ඒ දවස්වල ප්‍රවාහන අමාත්‍ය එම්. එස්. මොහොමඩ් මහත්මයා විදේශ අමාත්‍ය අමීඩ් මහත්මයා එයා අකුරැස්සේ හිටියේ එයා දැන් නැහැ අමීර් මහත්මයා හිටියා . ඒ. ආර්. එම්. මන්සුර් මහත්මයා හිටියා කල්මුණේ මන්ත්‍රී හිටියා තවත් මුස්ලිම් මං නම් වශයෙන් හරියට දන්නේ නැහැ සාමාන්‍යයෙන් 350 කට 400 ක් වගේ හිටියා සේරම. පේලි 4 කට මේසේ වටේ පුටු තිබුනා.

ප ඔය සමුළුව තානායමේ කොහේද පැවැත්තුවේ ?

උ ඒ තානායම තුල ලොකු කොරිඩෝවක් තිබුනා ඒකේ තමයි ලොකු මේසයක් තිබුනා ඒකේ තමයි මේස තියාගෙන හරිගස්සලා තිබ්බා මේ සමුළුව.

ප මහත්මයාට දමිළ භාෂාව තේරෙනවාද ?

උ මට ටික ටික තේරෙනවා මං ඉතින් මං සිංහලම නිසා දෙමළ මිනිසන්ට සිංහල ඉගැන්නුවා මිසක් දෙමළෙන් දෙමළ මන් ඉගෙන ගත්තේ නැහැ.

ප ඔබට දෙමළ තේරුම් ගැනීමේ හැකියාවක් තියෙනවාද ?

උ තේරෙනවා කියන දේ තේරෙනවා කතා කිරීමේ ප්‍රවනතාවයක් නැහැ.

ප දැන් සමුළුව උදේ 09 ට පටන් ගත්තේ කිව්වානේ?

උ ඔව්.

ප ඒ සමුළුව තියෙන තැනට ඔබ ගියාද ?

උ ඔව් ඔව් ගිහින් ඒ වටේට මාත් යනවා ගිහිල්ලා ඉඳගෙන තව තුන්දෙනෙක් හිටියා සිංහල කාණ්ඩයේ ඒ ගොල්ලන්ට හොඳට දෙමළ පුළුවන් . ඒ තානායමේ වැඩ කරන .

ප කව්ද ඒ 3 දෙනා ?

උ තුන්දෙනෙක් හිටියා සිංහල.

ප සිංහල 3 දෙනා මොනවාද කලේ?

අ ඒ ගොල්ලන් තමයි තානායමේ ස්ථිර සේවකයෝ .

ප ඔය සමුළුවේ ප්‍රථමයෙන්ම මොනවද වුනේ කියලා මහත්මයට මතකයක් තියෙනවාද ?

උ මතකයි එතකොට මම බලගෙන හිටියා මොකක්ද වෙන්නේ කියලා එතකොට තමයි ඒ අෂ්රොෆ් මහත්මයා තමයි නැගිටලා කිව්වේ මේ සමුළුව පවත්වන්න හේතුව දැන් උතුරේ හමුදා නිළධාරින් 13 දෙනෙක් බිම් බෝම්බයකට අහුවෙලා මිය ගිහිල්ලා තියෙනවා දැන් උතුරේ ද්‍රවිඩ තරුණයන් ආයුධ සන්නද්ධව අරගල පටන් අරන් තියෙනවා අපේ තරුණ කොටස් කියනවා මේ නැගෙනහිර ප්‍රදේශයෙත් ආයුධ සන්නද්ධව අපි කැරැල්ලක් ගහලා මේ නැගෙනහිර ප්‍රදේශය මේ

FAIR COMMENT BY JEZEEM

රජයෙන් කඩා ගන්න ඕනේ කියන මතයක් තියෙනවා ඒකට තමයිමේ මුස්ලිම් නායකයෝ සේරම ගෙනල්ලා මේ සමුළුවක් තියලා මේකේ තීරණයක් ගන්න අවස්ථාවක් සැලසුවේ මේ කල්මුනේ තානායමේ ගෙනල්ල එයා පහදලා දුන්නා.

ප්‍ර දැන් ඔබ ඔබේ පිළිතුරේ ඔබ සඳහන් කලා ඔබ ලබා දුන් පිළිතුරේ ඔබ සඳහන් කලා අපේ තරුණයන් අතර කතා බහක් ඇති වෙනවා කියලා. අපේ තරුණයන් කියලා අෂරෆ් මහත්මයා අදහස් කලේ කාවද ?

උ ඒ මුස්ලිම් තරුණයන් තමයි.

ප්‍ර දැන් ඊට පස්සේ අෂ්රොෆ් මහතාගේ කතාව සම්පූර්ණ වශයෙන් ඔබ අහගෙන හිටියාද ?

උ අෂ්රොෆ් මහත්මයා කතා කලා එයා කතා කලේ දැන් මේ වර්තමාන දේශපාලන මේවා කතා කළා. දැන් මේ අපේ මිනිස්සු දැන් ඒ දවස්වල තිබුනේ එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්දේ ඉල්ලුවේ ඒ. ආර්. එම්. මන්සුර් මහත්මයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉල්ලුවේ අහමඩ් මහත්මයා. ඔය දෙපැත්තට තමයි ඡන්දේ දුන්නේ. මුස්ලිම් කොන්ග්‍රස් එකක් තිබුනේ නැහැ. එතකොට මේ පක්ෂ දෙකට තමයි මුස්ලිම් ජනතාව ඡන්දේ දුන්නේ ඒ ගොල්ලන් සිංහල මිනිස්සුත් ඡන්දේ දුන්නා දෙමළ මිනිස්සුත් කොටසක් ඡන්දේ දුන්නා ඒක වර්ග බේදයක් තිබුනේ නැහැ ඒකයි ඒ විදියට තමයි තිබුනේ ඒකයි වුනේ මේ අෂ්රොෆ් මහත්මයා ඇවිල්ලා දැන් ඒ පාර ප්‍රකාශ කලේ දැන් අපේ ඡන්දෙ අරගෙන ගිහිල්ලා අපේ පක්ෂ නියෝජනය කරාට අපේ ආගමට අපේ ජාතියට අපේ ප්‍රදේශයට කිසිම සේවයක් වෙන්නේ නැහැ ඒක නිසා අපි අපේ පක්ෂයක් හදාගෙන මුස්ලිම් පක්ෂයක් හදාගෙන අපි ආසන 10 ක් හරි 15 ක් අරගෙන අපි කේවල් කරලා අපි ඇමතිකන් අරගෙන අපේ මේ ප්‍රජාව දියුණු කරමු. ඒ දියුණු කරන්න ඕනේ. ඒ දියුණු කරලා තමයි අපි මේ සටන් වලට යන්න ඕනේ. ඒ සටන් වලට යාමට මං අර දැම්මා ඒ කතා කරපුවා ඒ පුලුවන් තරම් අපේ තරුණ එයා කිව්වා අපේ තරුණ පිරිස් සේරම වෙළඳාම කරන්නේ .

ප්‍ර දැන් මහත්මයා කිව්වේ අෂ්රොෆ් මහත්මයා කියපු දේවල් තමයි දැන් ඔබ පිළිතුරේ සඳහන් කලේ ?

උ ඔව්.

ප්‍ර අෂ්රොෆ් මහත්මයා කතා කලාට පසුව ඊලඟට කවිද කතා කළේ ?

උ එම්. එච්. මොහොමඩ් මහත්මයත් කතා කලා.

ප්‍ර එතකොට එයා එම්. එච්. මොහොමමඩ් මහත්මයා කතා කරලා ඒ පාර තරුණයෝ ප්‍රශ්ණ අහන්න පටන් ගත්තා ප්‍රශ්ණ දාන්න පටන් ගත්තා ප්‍රශ්ණවලට උත්තර තමයි ඒ පාර දුන්නේ . දැන් මේ වෙලාවේදි අපි රජයට විරුද්ධව ආයුධ අරගෙන සටන් කිරීම අනුවණ කමක් ඒක නිසා

FAIR COMMENT BY JEZEEM

අපි ඉස්සෙල්ලා අපි පසුබිම හදාගන්න ඕනේ ඉස්සෙල්ලා ඒ පසුබිම තමයි

ප හරි දැන් මහත්මයා කියන්නේ එම්. එච්. මොහොමඩ් මහත්මයා කතාව පටන් ගත්තායින් පස්සේ එතන රැස්ව සිටි පිරිස් ප්‍රශ්ණ ඇසුවා ?

උ ඔව්.

ප ඒ ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් එම්. එච්. මොහොමඩ් මහතා යම් කරුණු දැක්වීමක් සිදු කලා . දැන් ඔය කරුණු දැක්වීම සිදු වෙන අවස්ථාවේ ඔබ එතන හිටියාද?

උ ඔව් ඔව් හිටියා.

ප ඔබ එතන දිගටම හිටියාද ?

උ මමත් හිටියා පාල මල්ලිත් හිටියා .සමහර වෙලාවට මම නැති වෙලාවට අර මිනිසුන්ගෙන් අහලා අපි ඊට පස්සේ දවස් දෙකකයට විතර පස්සේ මේ කතා කරපු සියල්ලක්ම අපි සටහන් කර ගත්තා මොනවද කතා කරේ කියලා

ප අර මිනිස්සු කියන්නේ කව්ද ? දැන් ඔබ කිව්වා අර මිනිස්සුත් එක්ක මම කතා කරලා දවස් දෙක තුනකට පස්සේ කරුණු ටික ගොනු කර ගත්තා කියලා අර මිනිස්සු කියන එකෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

උ සිංහල මිනිස්සු 3 දෙනෙක් හිටියානේ එතකොට අපේ ප්‍රනාන්දු රෙස්ට් හවුස් keeperරුත් හිටියානේ . අපි රෙස්ට් හවුස් එකට ගිහිල්ලා සාකච්ඡා කරා දැන් මොනවද කරලා තියෙන්නේ කියලා

ප ඒ කියන්නෙ මහත්මයා ඔබ සහ එතන තානායමේ සිටි සිංහල සේවකයින් මෙම රැස්වීමට වරින්වර ගොස් තොරතුරු එක්රැස් කරලා ඒ ටික ගොනු කර ගත්තා.

උ ගොනු කර ගත්තා.

ප දැන් ඔබ සහ අනෙක් සේවකයින් රැස්වෙලා ගොනු කර ගත්ත ඒ කරුණු ඔබට ඒ මෙම ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න පුලුවන්ද?

උ සමුලුවේ ගොනු කර ගත්තා සංක්ෂිප්ත වාර්තාවක්.

ප ඒ වාර්තාවට අනුව කියන්න ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න මොනවද එම්. එච්. මොහොමඩ් මහතා එදින මුස්ලිම් තරුණයන්ගේ ප්‍රශ්ණවලට පිලිතුරු දෙමින් කිව්වේ කියලා ?

උ එම්. එච් මොහොමඩ් මහත්මයත් සඳහන් කලා අමීර් මහත්මයත් සඳහන් කලා ඒ ගොල්ලෝ සාකච්ඡාවේදි එක එක්කනා කිව්වාම මේක ගත්තා එකක් තමයි දැන් රාජ්‍ය සේවයේ සේවය කරන්නේ දෙමළ මිනිස්සුයි සිංහල මිනිස්සුයි විතරයි මේ ප්‍රදේශවල අපේ මුස්ලිම් තරුණයෝ නැහැ .

ප මේ ප්‍රදේශවල කියන එකෙන් ඔබ අදහස් කරන්නේ මොකක්ද ? මේ ප්‍රදේශය කියන්නේ ?

FAIR COMMENT BY JEZEEM

උ මේ ප්‍රදේශය කියන්නේ නැගෙනහිර ප්‍රදේශය. ඔව් කාර්යාල වල ඉන්නේ මොකද මමත් 1965 ඉඳන් 67 වෙනකම් මඩකලපුව දිසාපති කාර්යාලයේ සහකාර ලේඛණ නිළධාරි වශයෙන් වැඩකලා. එතකොට ඉතින් ඒ දිසාපති කාර්යාලයේ එක මුස්ලිම් ඩ්‍රයිවර් කෙනෙක් විතරයි සේරම හිටියේ දෙමළයි සිංහලයි කාණ්ඩේ දැන් 95% ක් විතරම මුස්ලිම් 5% ක් තමයි දෙමළ සිංහල ඇත්තේම නැහැ.

ප දැන් ඔබ සඳහන් කලේ කොයි කාලෙද ?

උ ගිය අවුරුද්දට ඉස්සෙල්ලා අවුරුද්දේ මම මඩකලපුව කච්චේරියට ගියා ඒ ගියාම දැක්කා ඉතින්.

ප ඒ අනුව ඔතන සමුළුවේදි ඔය රාජ්‍ය සේවය සම්බන්ධයෙන් මෙනවාද සඳහන් වුනේ ?

උ රාජ්‍ය සේවය කියන්නේ දැන් අපේ මිනිස්සු හුඟක් කරන්නේ බිස්නස් . ගොවිතැන. දැන් ඒවත් අතහැරලා . ඒවත් කරන ගමන් අපේ ළමයින්ට පුලුවන් තරම් අධ්‍යාපනය දෙන්න ඕනේ අධ්‍යාපනය දීලා රජයේ රැකියාවලට යන්න ඕනේ ආරක්ෂක සේවාවට යවන්න ඕනේ. ඒකට කරන්න තියෙන්නේ පාසැල් දියුණු කරන්න ඕනේ . පුළුවන් තරම් පාසැල් වල පුස්තකාල හැම ගමකම ඇති කරන්න ඕනේ ඉතින් ඒවා රජයෙන් අපි ප්‍රතිපාදන අරගෙන ඒවා කරන්න ඕනේ ඒවා කරලා මුලිකව ඒවා පටන් ගන්න ඕනේ එකකොට ඒක එකක්. ඒ පාර කිව්වා .වී මෝල් කාරයෝ කිව්වා දැන් මහවැලි සංවර්ධන මේව එක ආවයින් පස්සේ දැන් අපි තමයි ඒකාධිකාරය කරේ හාල් බිස්නස් එක දැන් මහවැලි පටන් ගත්තායින් පස්සේ ඒක යනවා සිංහල මිනිසුන්ට තමයි දැන් ඒ ගොල්ලෝ තමයි ඒකාධිකාරය පටන් අරන් තියෙන්නේ ඒ ගොල්ලෝ තමයි බිස්නස් කරන්නේ ඒක නිසා අපි දැන් මොකක්ද මේකට කරන්න ඕනේ කියලා ඉවරවෙලා ඒ පාර අමීර් මහත්මයා කිව්වා ඕකට කලබල වෙන්න ඕනේ නැහැ අපි දැන් සිංහල මිනිහෙක් වී බුසලක් රුපියලකට කොටනවා ඒ දවස් වල රුපියලකට කොටනවා නම් අපේ මුස්ලිම් මෝලක් දාලා කුඩා මෝලක් සිංහල මිනිස්සුත් එක්ක හොඳට ආශ්‍රය කරගෙන කුඩා මෝලක් දාලා ශත හැත්තැපහක් කරන්න. එතකොට ඒ පාර මිනිස්සු ඇහුවා එහෙම එතකොට අපිට පාඩුයිනේ කියලා ඒ පාර කිව්වා නැහැ පාඩු වෙන්නේ නැහැ මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශයෙන් දෙනවයි කිව්වා පල්ලිවලට මුදල් ඒ මුදල් වලින් ඒ ශත විසිපහේ ප්‍රතිපාදන ඕගොල්ලන්ට හම්බ වෙනවා කිව්වා ඒ ගොල්ලන්ට රුපියලක් හම්බ වෙනවා කිව්වා ඒක හන්දා ඒක ඕගොල්ලෝ කරගෙන යන්න කිව්වා එතකොට සිංහල මිනිස්සු මුස්ලිම් කාණ්ඩෙ ලඟට යනවයි කිව්වා සිංහල මිනිහා ලඟට යන්නේ නැතැයි කිව්වා ඊට පස්සේ මෝල වැහෙනවයි කිව්වා එතකොට ඕගොල්ලෝ ඩිංග ඩිංග මහා පරිමාණයෙන් කර ගෙන යන්න කිව්වා.ඒක ප්‍රශ්නයක් කරගන්න එපයි කිව්වා. ඒ ඒක . ඒ පාර කිව්වා දැන් සටන් කරලා මට

FAIR COMMENT BY JEZEEM

නෙවේ අපි ක්‍රම කීපයකදී මේ සටන දියත් කරන්න ඕනේ එකක් තමයි අපේ ජනගහනය වර්ධනය කිරීම දැන් ඒ දවස් වෙන කොට පුංචි පවුල රත්තරන් කියලා ලොකු ප්‍රචාරයක් තිබුනා ඒ ප්‍රචාරණය අනුව ඒ ප්‍රචාරය අනුව සිංහල පවුල් වලට එක්කනයි දෙන්නයි තුන්දෙනයි තවම වැඩි වුනේ .

ප කව්ද එක්කෙනෙක් දෙන්නෙක් ?

උ සිංහල මිනිස්සු.

ප එක්කෙනෙක් දෙන්නෙක් කියන්නේ කව්ද ?

උ ළමයි ළමයි එක්කෙනෙක් දෙන්නෙක් තමයි ඒ පාර හිටියේ. පිරිමිත් වඳ කරගත්තා ගැහැණු කාණ්ඩෙත් වඳ කර ගත්තා රුපියල් 500 ක් දුන්නා ඒකෙන් මේවා වුනා. අර ගොල්ලෝ කවුරුත් කර ගත්තේ නැහැ මුස්ලිම් කාණ්ඩේ . ඒකේදි ජනගහනය වැඩිවුනා . අනිත් එක පල්ලියෙන් මුස්ලිම් නීතිය අනුව ස්ත්‍රීන් කිහිප දෙනෙක් කසාද බඳින්න පුලුවන් දැන් මම වැඩ කර තැන කියන්නේ ගමනා ගමන මණ්ඩලයේ ලේඛර කෙනෙක් හිටියා කාසිම් කියලා එයාට ගැහැණු 5 දෙනෙක් හිටියා. මම කිව්වා මටත් රුපියල් 450 යි හම්බ වෙන්නේ මාසෙකට ඒ දවස්වල මේ මං ළමයි දෙන්නෙක් ඉන්නවා හරි අමාරුවෙන් ජීවත් වෙන්නේ උඹ කොහොමද මේ ළමයි පස් දෙනෙක් හය දෙනෙක් මේ ජීවත් වෙන්නේ කියලා. නැහැ මහත්තයෝ කාටවත් කියන්න එපැයි කිව්වා මේ අපටත් මුස්ලිම් පල්ලියෙන් දෙනවයි කිව්වා ආධාර ඒ වගේ ආධාර දෙන නිසා ඒ ජනගහනය වැඩි වෙනවා . ඉතින් ඒක ඒ විදියට පුලුවන් තරම් ජනගහනය වැඩිකර ගන්න කිව්වා. එතකොට අපට සටන් කරන්න ඕනේ නැතෙයි කිව්වා පාර්ලිමේන්තුවට පත්වෙන නියෝජිතයෝ සංඛ්‍යාව වැඩිවෙනවා කිව්වා මුළු ලංකාවේම අපි ඒක ක්‍රියාත්මක කරනවා කිව්වා දැන් එතකොට ඒ වෙන කොට අපිට අවුරුදු 50 ක් 60 ක් යනකොට දෙපැත්ත එක සමාන වෙනවයි කිව්වා ඊට පස්සේ අපි ද්‍රවිඩ මිනිසුත් එක්කාසු කරගෙන අපි පාර්ලිමේන්තුව පිහිටුවා ගෙන අපි බලය පවත්වනවයි කිව්වා. සටන් කරන්න තුවක්කුව අරන් සටන් කරන්න ඕනේ නැහැයි කියලා කිව්වා ඒ ඒක. අනිත් එක තමයි සිංහල ගම්මාන වල ඉන්න දුප්පත් ස්ත්‍රීන් පුලුවන් තරම් යහළු කරගෙන කසාද බැඳගන්න කිව්වා. කසාද බැඳගෙන මේ ආගමට හරවා ගන්න කිව්වා. ඒ අනුව ඒ ජනගහනය අඩුවෙයි කිව්වා අපේ ජනගහනය වැඩිවෙයි කිව්වා අනිත් එක තමයි අපි පුලුවන් තරම් සිංහල මිනිසුන්ගේ ඉඩම් මුදලට ගන්නෙයි කිව්වා . විශේෂයෙන්ම නාගරික බද පාසැල් ලඟ ඒ ගන්නෙයි කිව්වා ඉඩම් සල්ලි වලට. ඒ ඉඩම් ඉඩම් ගත්තාම ඕගොල්ලන්ට ඕගොල්ලොන්ගේ දරුවෝ ඒ ඉස්කෝලවලට දාගන්න පුලුවන් තත්වයක් එනවැයි කිව්වා. ඉතින් ඒක අනුව ඒ ගොල්ලන්ට උසස් අධ්‍යාපනය දෙන්න පුලුවන් කිව්වා ඒ පාර අෂ්රොෆ් මහත්මයා කිව්වා දැන් මේ කතාව සංක්ෂිප්තව කිව්වේ දැනට ලෝකයේ කිව්වා මේ

FAIR COMMENT BY JEZEEM

ඉන්දියාව හැර අනිත් රටවල් කියන්නේ දකුණු ආසියාවේ ජාවා , සුමාත්‍රා , බෝර්නියෝ , මැලේෂියා ඒ රටවල් ඉස්සර ස්වජාතිකයන් ඒ ස්වජාතිකයින් දැන් සේරම වඳවෙලා ගිහිල්ලා කිව්වා මුස්ලිම් මිනිස්සු මේවා වෙලා මුස්ලිම් මිනිස්සු ඇවිල්ලා මුස්ලිම් ආගමට ඇවිල්ලා දැන් ඒ ගොල්ලන් මුස්ලිම් වෙලයි තියෙන්නේ කිව්වා අපිට ලංකාවයි ඉන්දියාවයි කිව්වා ඉන්දියාවේ ජනගහනය විශාලයි කිව්වා පදිංචි වෙන්න බැහැයි කිව්වා අපි ලංකාව අවුරුදු 60 ක් 70 ක් යනකොට අපි අයිතිකර ගන්නවා කිව්වා ඒක ප්‍රශ්ණයක් වෙන්නේ නැහැයි කිව්වා ජනගහනයෙන්ම. එහෙම කිවවා. ඉතින් ඒක නිසාවෙන් මුස්ලිම් තරුණයන් ටිකත් ඒක පිලි අරගෙන නැහැ ඒක තේරුම් අරගෙන කෑ කෝ ගහලා අරහෙන් මෙහෙන් කරා ඉතින් ඒ ගොල්ලෝ පහදා දුන්නා මේ තත්වය කියන එක.

ප දැන් මහත්මයා ඔය සඳහන් කරපු කාරණා තමයි මූලික වශයෙන් ?

උ මූලික වශයෙන් තියෙන්නේ.

ප මුලික වශයෙන් සමුලුවේදි සාකච්ඡාවට ලක් වෙලා තිබුනේ ?

උ ඔව්.

ප ඔබ විසින් ඔය කරුණු දක්වලා යම් පුවත්පත් ලිපියක් ලිව්වාද ?

උ ඔව් මම ලිපි ලිව්වා ඒ දවස්වල ලිව්වා .

ප ඔබ දැන් ගරු කොමිෂන් සභාවට කරුණු දැක්වුවානේ මේ සමුලුවේ සිදුවෙච්ච සාකච්ඡාව කියලා ?

උ ඔව්.

ප ඒ සාකච්ඡා වෙච්ච කරුණු ඇතුලත් කරල ඔබ යම් ලිපියක් ලිව්වාද ?

උ ඔව්. ලිව්වා ලිව්වා.

ප මොන පුවත්පතේද ඒ ලිපිය පල වුනේ ?

උ ශ්‍රී ලංකාදීපේ ඉරිදා ලංකාදීප තක්ෂිලා .

ප ඉරිදා ලංකාදීපයේ කවදාද දිනය ඒක පල වෙච්ච දිනය ?

උ ඒක 18 මැයි මාසේ 20 වෙනි ඉරිදා.

ප 2018 මැයි මස 20 වෙනිදා ?

උ 20 වෙනිදා

ගෞරවයෙන් ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදි සාක්ෂිකරු විසින් ලියා තිබෙන මුස්ලිම් ජනයා දෙස වපර ඇසින් බලන හේතු මෙන්න යනුවෙන් සඳහන් ලංකාදීප පුවත් පතේ 2018 මැයි මස 20 වෙනි දින එල වී තිබෙන ලිපිය C 819 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා .

ප දැන් මහත්මයා මේ C 819 වශයෙන් ලකුණු කරන්නට යෙදුණු පුවත්පත් ලිපියේ ඔබ ඔය සඳහන් කරපු කාරණා සියල්ලක්ම ඇතුලත් කරලා තියෙනවාද? ඔබ ඔය දැන් ලියලා තියෙන ලිපියේ C 819 කියලා ලකුණු කරපු ලිපියේ ඔබ දැන් මේ කොමිෂන් සභාවට සඳහන් කරන්නට යෙදුණු සියලුම කාරණා ඇතුලත් කරලා තියෙනවාද?

FAIR COMMENT BY JEZEEM

උ ඇතුලත් කරලා තියෙනවා .

ප්‍ර දැන් මහත්මයා මේ 1983 නේ මේ සමුළුව පැවැත්තුනේ ඒ කාලය තුලදී ඔබ යම් නිළධාරියෙකුට බලයලත් නිළධාරියෙකුට මේ සමුළුවේ සාකච්ඡා වෙච්ච කරුණු ගිහිල්ලා දැනුම් දුන්නාද කාටද දැනුම් දුන්නේ.?

උ ඔව් ඒ කාලේ හිටිය ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහත්මයාට දැනුම් දුන්නා .

ප්‍ර කොහොමද දැනුම් දුන්නේ ජනාධිපතිතුමාට ?

උ ලිඛිතව දුන්නා . රෙජිස්ටර් කරලා ලියුම් යැව්වා . එතකොට ප්‍රේමදාස මහත්මයාට ලියුම් දැම්මා. ප්‍රේමදාස මහත්මයාගේ පුද්ගලික ලේකම් හිටියේ බාලසුරිය මහත්මයා කච්චේරියේ අපේ ඒ. ඕ මහත්මයා මඩකලපුවේ එයා පුද්ගලිකව හම්බ වෙලා මම එහාටත් ලියුමක් දුන්නා.කිසි දේකට කිසිම උත්තරයක්වත් එව්වේ නැහැ කව්රුවත්.

ප්‍ර දැන් 1983 කාලයේදිම කල්මුණේ ප්‍රදේශයේ යම් බලයලත් නිළධාරියෙකුට යම් ඔබ ඔය සම්බන්ධයෙන් දැනුවත් කලාද?

උ ඔව් දිසාපතිතුමාට අපි දැනුවත් කලා මෙන්න මෙහෙම මේ ප්‍රශ්ණ තියෙනවයි කියලා ඉතින් ඒ ගොල්ලෝ සියල්ල .

ප්‍ර පොලිසියට කිව්වේ නැද්ද ඒ සම්බන්ධයෙන් පොලිසිය දැනුවත් කලේ නැද්ද ?

උ පොලිසිය දැනුවත් කලා එතකොට හිටියේ ක්‍රිස්තියානි මහත්තැන් කෙනෙක් ඕ. අයි. සි. මහත්මයා .මං ගියා ගිහිල්ලා කිව්වාම ඔකුන්ගේ හැමදාම රැස්වීම් තියෙනවා ඕවා ගණන් ගන්න එපයි කියලා මම කිව්වා නැහැ මහත්තයෝ මෙන්න මෙහෙම මෙහෙම තියෙනවා කියලා මම සිංහල බෞද්ධ සංවිධානයේ සංවිධායක කිව්වා. ඔය සිංහල බෞද්ධ සංවිධායක තමයි රට කන්නේ යනවා යනවා කියලා කිව්වා ඒ පාර මං ආවා මම කියන්න ගියේ නැහැ.

ප්‍ර දැන් මහත්මයා කිව්වානේ ගරු කොමිෂන් සභාවට කල්මුණේ ප්‍රදේශයේ ඔබ 1981 ඉඳලා 1986 වෙනකල් ජීවත් වුනා කියලා ඔබේ පවුලේ සාමාජිකයින් සමඟ. ගරු කොමිෂන් සභාව දැනුවත් කරන්න පුළුවන්ද ඒ කාලයේ ඒ කල්මුණේ ප්‍රදේශයේ ජීවත් වුන මුස්ලිම් කාන්තාවන් මොන වගේ ඇඳුම් ඇඳලාද හිටියේ?

උ ඒ මුස්ලිම් කාන්තාවන් හිටියේ අපේ ආච්චිලා මෙහෙම සාරිය දාලා පාට පාට එක මෙහෙම ඔළුවේ දාගෙන තමයි හිටියේ .මුස්ලිම් ඒ කාණ්ඩෙත් මුස්ලිම් තරුණියන් හිටියෙත් මේ සාමාන්‍ය චීත්ත ගවුම් අරව මේව ඇඳලා තමයි අර පාට පාට මල් මල් තියෙන එකක් ඔළුවේ බැඳගෙන තමයි හිටියේ.මුස්ලිම් පිරිමි පක්ෂයෙත් දැන් වගේ අර ලොකු කබා වගේ අරව මේවා නැහැ සාමාන්‍යයෙන් සරම ෂර්ට් එක එහෙම දාලා තමයි හිටියේ පටිය බැඳලා පරණ මිනිස්සු සුදු පටිය බැඳලා එහෙම හිටියා. ඊට පස්සේ මැතකදි තමයි දැන් වයසක කාණ්ඩෙත් දැන් අර තලු පාට උඩ ඉදන්ම දාගෙන ඉන්න මුස්ලිම් කාණ්ඩේ සේරම දාගෙන

FAIR COMMENT BY JEZEEM

ඉන්න ඒ දැන් කියන්නේ ඒ ගොල්ලන්ගේ සංස්කෘතිය සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා තියෙනවා

ප්‍ර දැන් මෑතකදී තියෙන සංස්කෘතිය ඔබට පේන්න ඔබ ලඟකදි ගියාද ඒ කල්මුණේ ප්‍රදේශයට ?

උ මගේ ඉඩමක් තිබුනා මාර්කට් එක ඉස්සරහ . ඒ මාර්කට් එක ලඟ කලින් ගත්ත ඉඩමක් ඒක බලපත්‍රයක් තියෙනවා මම 86 එනකොට ඒක රජයට පැවරුවා මම නැවත පදිංචියට එනතුරු රජයට නමුත් මම 98 ගියා ඒකේ අත්තිවාරම දාලා විනාශ කරපු එක හරිගස්සන්න ගිය වෙලාවේදි මුස්ලිම් මිනිහෙක් කිව්වා මේක මගේ ඉඩම මට බලපත්‍රයක් තියෙනවා කියලා පස්සේ මං පොලිසියට පැමිණිලි කලා පොලිසියට පැමිණිලි කලාම කිව්වා විභාග කරලා මේක මේ මුස්ලිම් එක්කනාට තමයි අයිති කියලා ඒ පාර මම ඒක ඉහළට දැන්නුවාට පස්සේ 2015 තමයි මගේ පරික්ෂණය කලේ ඉඩම ගැන ඒකෙදි තහවුරු වුනා මට ඉඩම අයිතියි කියලා එතකොට අර මුස්ලිම් එක්කනා තට්ටු 3ක ගොඩනැගිල්ලක් ගහලා ඒ පාර කිව්වා මේ තට්ටු 3 ම ගොඩනැගිල්ල කඩලා ඔයාටම මේ ඉඩම දෙන්න බැහැ ඔයා කොහෙන් හරි ඉඩමක් ගන්න කියලා මං කිව්වා කොහෙන්ද කියලා ඒ පාර කිව්වා කොහෙන්හරි ගන්න කිව්වා. ඒ පාර මං කිව්වා කැලෙන් අලි කොටින් එක්ක කැලේ මට ඉන්න බැහැ නගරය දැන් වටිනවා කියලා කෝටි එක හමාරක් විතර මේ ඉඩම මට දෙන්නයි කියලා එහෙනම් විකල්ප ඉඩමක් ගන්න කිව්වා ඒ පාර මං විකල්ප ඉඩමක් පොතුවිල් පැත්තෙන් ඉල්ලුවා 2013 ඉඳන් ලියුම් යැව්වා රෙජිස්ටර් ලියුම් දැම්මා ගියා එක දවසකටවත් තවම නැහැ උත්තරයක් එව්වේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන්

ප්‍ර ඒ කියන්නේ මහත්මයා ඔය සඳහන් කරන්නට යෙදුනු වැඩේට වර්තමානයේදිත් කල්මුණේ ප්‍රදේශයට යනවා ?

උ යනවා කිසි කෙනෙක් සිංහල මිනිසුන්ගේ ප්‍රශ්ණ අහන්නෙත් නැහැ, බලන්නෙත් නැහැ, සොයන්නෙත් නැහැ දේශපාලකයොත් එහෙමයි රාජ්‍ය නිළධාරිනුත් එහෙමයි සේරමත් එහෙමයි ඒක නිසා කල්මුණේ හිටියා 154 ක් පවුල් 154 න් 53 දෙනෙක්ම අතහැරලා දැම්මා මම තමයි අදත් යන්නේ ලබනමාසෙත් යනවා කල්මුණේ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

ප්‍ර සාක්ෂිකරු ඔබ මේ කොමිෂන් සභාවට කීවා 1983 ජුනි මාසේ තිබ්බ රැස්වීමක් ගැන ?

උ කිව්වා ස්වාමීනි.

ප්‍ර සාක්ෂිකරු ඔබ කියන හැටියට ඒ රැස්වීම සම්බන්ධයෙන් ඔබ කිව්වා ඔබ එවකට හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාට ලිඛිතව දැනුම් දීමක් කලා

FAIR COMMENT BY JEZEEM

කියලා ?

උ එහෙමයි දැනුම් දුන්නා.

ප එම ලිපියේ පිටපතක් ඔබ ගාව තියෙනවාද ?

උ මේකයි විනිසුරුතුමනි මම ත්‍රස්තවාදය කරුණු වලින් පස්සේ මම අපේ ගම පැලෑනියේ තමයි තිබ්බේ කෝච්චිය පෙරලුනේ සුනාමියේ අපේ ගේ ඉස්සරහ . මගේ ගේ සේරම මුහුදට ගහගෙන ගියා. අපිත් බොහොම අමාරුවෙන් තමයි බේරුනේ ඒ ලියකියවිලි සියල්ලක්ම 2004 න් ඉස්සර මම අද ඔප්පු කරනවා මෙතන සේරම ලියකියවිලි සේරම ලියකියවිලි මුහුදේ ගහගෙන ගියා 2004 න් පස්සේ තමයි මේමගේ ලඟ තියෙන්නේ.

ප ඔබ එතකොට කිව්වා ඊට පස්සේ හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමටත් ඔබ ලිඛිතව දුන්නා කියලා ?

උ ඔව්. කිව්වා නමුත් කවදාකවත් කැඳවුයේ නැහැ. මේ වර්තමානයේ.

ප ඊට පස්සේ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරණතුංග මැතිණියට කිව්වාද ?

උ ඔව් දැම්මා දැම්මා. එයා තමයි කිසිම වැඩක් නැති වරායක් තමයි ඔළුවිල් වරාය ඒ වරාය ආරම්භ කලේ අෂ්රොෆ් මහත්මයා අර ජිහාඩ් සංවිධානයේ බලපෑම මත ඒ කියන්නේ ආයුධ පිටරටින් ගේනකොට ඒ ගොල්ලන්ට වරායක් නැහැ සුරක්ෂිතව බාගන්න ඒක නිසා ඒ ගොල්ලෝ අෂ්රොෆ් මහත්මයා ඔළුවිල් වරාය හැදුවා ආයුධ ගේන්න ඉස්සරහට වෙන තව අවුරුදු ගණනකට වෙන විප්ලවයට ආයුධ ගේන්න තමයි ඒක හැදුවේ ඒක අපි දන්නවා නැත්නම් අද කිසිම වැඩක් නැහැ නිකම් වහලා තියෙනවා ධීවර වරායක් බෝට්ටු කිපයක් නවත්වලා තියෙනවා .

ප ඊට පස්සේ ජනාධිපති වුණු මහින්ද රාජපක්ෂ මැතිතුමාට ලිව්වාද ?

උ ලිව්වා ලිව්වා මගේ ලඟ සේරම ලියුම් තියෙනවා කවදාකවත් උත්තරයක් වත් එවන්නේ නැහැ බැසිල් රාජපක්ෂ මහත්මයාටත් ෆැක්ස් කරා ඇරියා උත්තරයක් වත් නැහැ. මගෙත් ධීවර බෝට්ටුවක් නැතිවුනා දැන් ලක්ෂ 40 ක් විතර වෙනවා මට කිසිම වන්දියක් දුන්නේ නැහැ.

ප 1983 ජුනි මාසේ 24 වෙනිදා තිබ්බා කිව්ව රැස්වීම ගැන ?

උ එතකොට ඒ රැස්වීම පිළිබඳව මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා දැනුවත් කෙරුවාද ?

උ දුන්නු එකේ පිටපතක් යැව්වා.පාර්ලිමේන්තුවේ හැමෝටමත් යැව්වා.

ප එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට යවපු ලිපියේ පිටපතක් තියෙනවාද ?

උ ඒකේ තමයි මම ගහලා දැම්මේ මම ෆැක්ස් කරපු ඒවා නම් තියෙනවා මං ගෙනාවේ නැහැ ඕනේ නම් ගෙනල්ලා දෙන්නම්ෆැක්ස් කරපුවා.

ප ලිපියේ පිටපතක් නැහැ ?

FAIR COMMENT BY JEZEEM

උ මේ පිටපත් තමයි සේරටම යැව්වේ .

ප්‍ර රටේ ජනාධිපතිවරයාට ලියුමක් ලියනවා නම් ජනාධිපති වරයාගේ නම දාලා ලියන්න එපායැ ?

උ ගාමිනි සෙනරත් මහත්මයටත් යැව්වා. යවපුවා මගේ ලඟ තියෙනවා මට කිව්වා නම් මම ඕනේ නම් ඉදිරිපත් කරනවා මම තැපැල් කන්තෝරුවෙන් තමයි යැව්වේ ඒකට රිසිට් එකක් දිලා තියෙනවා ඒ රිසිට් එක අලවලා තියෙනවා .

ප්‍ර දැන් 2015 දී වෙනත් ජනාධිපතිවරයෙක් පත්වුනාම මෛත්‍රී පාල සිරිසේන කියන ජනාධිපතිතුමාටත් ඇරියාද ?

උ ඔව් මේ මම හොඳට දන්නවා කිසිම වැඩක් නැහැ.කිව්වට මම මෙහෙම පත්තරයට දැම්මා ලියුමක් අපි කාටත් සමානව සලකනවා කිව්වා එච්චර තමයි.

ප්‍ර යවපු ලිපියේ පිටපතක් තියෙනවාද ?

උ එයා දාලා තියෙනවා වෙබ් ඒකේ දැම්මා කියලා ඒ කෙන් උත්තරයක් ඒවි කියලා වෙබ් එකේ දාලා තියෙනවා කියලා.

ප්‍ර තමන්ට ලියුමක් එව්වාද ?

උ එව්වා එච්චර තමයි ස්වාමිනි.

ප්‍ර ඒ ලේඛණ කොහේද තියෙන්නේ ?ඔබ කියන්නේ මේ සම්බන්ධයෙන් එම ලේඛණ මේ කොමිෂමේ විමර්ශන ඒකකයට බාර දුන්නා කියලාද ?

උ නැහැ නැහැ ඉල්ලුවේ නැහැ ඒවා මගේ ලඟ.

ප්‍ර ඒ ලිපි යවපු බවට තමාගේ ගෙදර සාක්ෂි තියෙනවාද ?

උ ගෙදර තියෙනවා . මේ ජනාධිපතිතුමාට යවපු ලිපි හැම එකකටම උත්තර එනවා .

ප්‍ර කොයි ජනාධිපතිද ? මේ කියන්නේ ?

උ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා පත්වුනාට පස්සේ අපිට ලියුමක් යැව්වාම අපිට මාසෙන් හරි උත්තරයක් එනවා .

**********

**<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මහතා.</u>**

ප්‍ර රංජිත් මහත්මයා දැන් ඔබ 1981 නේ කල්මුණේට ගියේ ?

උ ඔව්. 1981 තමයි ස්ථිරවට ගියේ . 77 හිටන් හිටියට ඉඩමක් මොකවත් නැහැ මම අයියලා ගෙදර ඉදන් තමයි රස්සාව අරගෙ මෙහේ කලේ. ස්ථිර වශයෙන්ම පදිංචි වෙලා හිටියා 1981 ඉඳන් තමයි ඉඩම් බලපත්‍රය අරන් ගේ හදාගෙන හිටියේ.

ප්‍ර ඊට පස්සේ කල්මුණේ දාලා ආවේ කොයි කාලෙද ?

උ 86 ආවේ ත්‍රස්තවාදි කලබල වලින් අපේ ගේ ඉස්සරහ තමයි ආමි එකේ 13 දෙනෙක් මරලා දැම්මා ඒ නිසා ඉන්න බැහැනේ ආවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර තමුන් කියනවානේ තමුන්ගේ ගෙදර ඉස්සරහ හමුදාවේ 13 ක් මැරුවා කියලා ?

උ එහෙමයි.

ප්‍ර ඒ කවදාද ?

උ 1986 මට දිනය මතක නම් නැහැ.

ප්‍ර එතකොට තමුන්ගේ ගේ වටේ හිටියේ සිංහල අයද නැත්නම් මුස්ලිම් අයද නැත්නම් දෙමළ අයද ?

උ ඒ හිටියේ අපේ සිංහල කාණ්ඩේ තමයි ඒ කොළණි දිගටම පන්සල පාරේ දිගටම හිටියේ සිංහල මිනිස්සු .

ප්‍ර ඒ පන්සලට මොකද වුනේ ඊට පස්සේ ?

උ පන්සලත් අතහැරලාදාලා දැන් හාමුදුරුකෙනෙක් ඉන්නවා.

ප්‍ර කොයි පාරෙද ඕක තියෙන්නේ ?

උ ඒකට කියන්නේ මාර්කට් එක ලඟ පන්සල පාර කියලා කියන්නේ . ටවුන් එකේම.

ප්‍ර කල්මුණේම?

උ ඔව්.

ප්‍ර දැන් තමුන් එහෙන් ආවට පස්සේ 1986 ඊට පස්සේ පලවෙනි වතාවට කල්මුණේ බලන්න ගියේ කොයි කාලේ වගේද ?

උ මම දිනය නම් මතක නැහැ ඉන්දියන් හමුදාව ආවනේ ඉන්දියන් හමුදාව ගෙනාපු දවස්වල මං ගියා අම්පාරට ගිහිල්ලා කල්මුණේටත් ගියා. ඒ පාර අපේ අක්කලාගේ කඩවල් බලන්න මඩකලපුවටත් ගියා. අපට ඒ දවස්වල සාම සාකච්ඡා නිසා අර තාඩන පීඩනයක් වුනේ නැහැ ඒක නිසා ගිහිල්ලා ආවා. එතකොට මඩකලපුව පන්සලේබෝධිය ගිනි තියලා තිබ්බා බුදුරූපයේ ඔළුව කඩාදාලා තිබ්බා මඩකලපුව පන්සලේ. කල්මුණේ පන්සලෙත් අලාභහානි කරලා තිබ්බා.

මින්පසු සටහන් ගැනිම ල/ලේ ඉන්ද්‍රානි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 6.10 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

**ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :**

ප : කල්මුණේ නගරයට තමුන් ඔය සාම සාධක හමුදාව ආපු කාලයේ බලන්න යනකොට තමුන් දැකපු වෙනස්කම් මොනවද ඒ කාලය වෙනකොට?

පි : කල්මුණේ දැක්ක වෙනස්කම් තමයි ටවුන් එකේ මැද්දෙම තිබුණා කඩයක L.T.T.E. සංවිධානයෙන් තුවක්කු අරගෙන ඒගොල්ලොන්ගේ කාර්යාලයක් පිහිටුවලා. ඒ කාර්යාලයේ දෙමළ මිනිස්සුන්ගේ යම් යම් ප්‍රශ්න ඒගොල්ලෝ පොත්වල ලියාගෙන ඒවා මේවා කරනවා. ශ්‍රී ලංකා හමුදාවවත්, පොලීසියවත් ඒවා නැහැ මොකුත්. සාම සාධක හමුදා තියෙන කාලයේ.

ප : ඒ පාර ගිහිල්ලා තමුන් කරදරයක් නැතුව බේරිලා ආපහු ආවනේ ගමට?

පි : ආවා.

ප : ඒ එනකොට දැන් තමුන්ගේ එහේ තිබිච්ච ඒ ඉඩකඩම්, දේපළ එහෙම ආරක්ෂා වෙලා තිබුණද තමුන් දකිනකොට?

පි : එතකොට මේ මොකුත් වෙලා තිබුණේ නැහැ. කඩා බිඳ දාපු විදියටම තිබුණා. කවුරුවත් අල්ලලාවත් නැහැ. මුස්ලිම් මිනිස්සු අල්ලලා නැහැ එතකොට.

ප : හරි. දැන් ඒ ඇවිල්ලා නැවත වතාවක් ආයෙමත් ගියේ කොයි කාලයේ වගේද?

පි : අපෝ මම අවුරුද්දකට අඩු ගාණේ එක දවසක් හරි, අවුරුද්දකට එක පාරක් හරි ගිහිල්ලා අම්පාරේ තමයි මගේ නෑදෑයොත් ඉන්නවා, යාළුවොත් ඉන්නවා. මම සතියක් දෙකක් නැවතිලා ඉඳගෙන උදේට ඇවිල්ලා කල්මුණේ හවසට යනවා ටිකක් ඔය AG Office අරෙහේ මෙහේ ගිහිල්ලා, ඉඩම් බලලා, මිනිස්සුත් එක්ක කථා කරලා යනවා.

ප : දැන් තමුන්ට තේරෙන විදියට ඒ කාලයේ දෙමළ මිනිස්සුනේ වැඩිපුර හිටියයි කියන්නේ?

පි : ඔව්. දෙමළ මිනිස්සු.

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මුස්ලිම් ජාතිකයන් ....?

පි : මුස්ලිම් කාණ්ඩෙත් හිටියා. මම අතිරේක ප්‍රශ්නයක් කියන්නේ. මුස්ලිම් කාණ්ඩේ හමුදාවටත් ඔත්තු දෙනවා. කොටින්ටත් ඔත්තු දෙනවා. එහෙම දෙපැත්තෙන්ම ඒගොල්ලෝ වාසි ගත්තා.

ප්‍ර : දැන් මුස්ලිම් කාණ්ඩය ඒ පැත්තේ, ඒ පළාතේ වැඩි වුණාය කියලා තමුන් දැක්කේ කොයි කාලයේ ඉඳලද?

පි : ඒකේ දින වකවානුවක් හොයන්න බැහැ. හැම වර්ෂයේම ඩිංග ඩිංග ඩිංග වැඩිවෙලා දැන් හැම කාර්යාලයකම මුස්ලිම් තමයි ඉන්නේ.

ප්‍ර : තමුන්ට මතකද කාත්තන්කුඩි නගරය?

පි : කාත්තන්කුඩි මතකයි.

ප්‍ර : ඒ කාලයේ දැන් ඔය ඉස්සරලම දැන් ඔය 1980 ගණන්වල යනකොට කාත්තන්කුඩි නගරය තිබුණේ කොයි වගේද?

පි : කාත්තන්කුඩිය දැන් තියෙන තත්ත්වයේ නෙමෙයි. බොහොම දුප්පත් ගමක්. ඒ කියන්නේ කඩ තිබුණා. පල්ලිය තිබුණා. ඔය මේවා ගස් අරවා මේවා ඔය ඉදි ගස් අරවා මේවා මොකුත් තිබුණේ නැහැ. රෙදි සාප්පු කඩ ඒ වගේ තිබුණා. එතකොට මම දැක්කා සඟරාවක තියෙනවා ආසියාවේ වැඩිම උත්පත්ති ලබන විනාඩියකට එක ළමයෙක් කාත්තන්කුඩියේ හම්බ වෙනවා කියලා පත්තරයක තිබුණා. මම දන්නේ නැහැ ඇත්ත බොරුද කියන්න එහෙම තිබුණා. ඒක ඇතුළේ ගෙයක් ගෙයක් අල්ලලා තියෙනවා මේගොල්ලෝ. මේ ජනගහණය ඉන්න තැනක් නැහැ. කොහේ හරි ඉන්නවා. ඒක තමයි ඔය අල්ලගෙන අල්ලගෙන යන්නේ. දැන් මම අතිරේක ප්‍රශ්නයක් කියන්නම් මම ගියා මඩකලපුවේ ඉඳලා ත්‍රිකුණාමලයට අළුතින් පාරක් හදලා තියෙනවා ත්‍රිකෝණමඩුවේ ඉඳලා බොහොම ළඟයි හැතැප්ම 46 ක් තමයි ත්‍රිකෝණමඩුවේ ඉඳලා තියෙන්නේ. ඒ පාර දෙපැත්තෙම මහා විශාල ගස් තිබුණේ ඉස්සර. ඒ ගස් මොකක්වත් නැහැ දැන්. දැන් සේරම මුස්ලිම් මිනිස්සු පදිංචි වෙලා ඉන්නේ දිගටම. කවුරු දුන්නද දන්නේ නැහැ ඉඩම්.

ප්‍ර : දැන් ඔය තමුන් ඒ කාලයේ ඔය 80 ගණන්වල කාත්තන්කුඩි යනකොට කාත්තන්කුඩියේ මුස්ලිම් පල්ලි කීයක් තිබුණාද?

පි : මම කාත්තන්කුඩියත් එක්ක වැඩිය සම්බන්ධ නැහැ මුස්ලිම් මිනිස්සු හිටිය නිසා. පාරේ යනකොට නම් ඉතිං මුස්ලිම් පල්ලි තුනක් විතර තියෙනවා. මම දැක්කා. ඒ සම්බන්ධයක් නැහැ.

ප්‍ර : දැන් මෑතදී තමුන් කාත්තන්කුඩි යනකෙට මුස්ලිම් පල්ලි කීයක් විතර දැක්කද?

FAIR COMMENT BY JEZEEM

පි : හැමතැනම වගේ තියෙනවා එක එක පල්ලි තියෙනවා. ඒක ගාණක් මම හරියට ගණන් කළේ නැහැ. හැබැයි වැඩියි.

ප්‍ර : තමුන්ට තේරෙනවද ඒ කාලයේ ඉඳලා මේ දක්වා ඒ මුස්ලිම් ජනතාව ශීඝ්‍රයෙන් වැඩිවෙලා තියෙන බවක්?

පි : ඔව්. වැඩිවීමක් වෙනවා අනිවාර්යයෙන්ම.

ප්‍ර : එතකොට දෙමළ මිනිස්සු අඩුවෙලා ඒ පළාතේ?

පි : දෙමළ මිනිස්සුත් අඩු වීමකුත් නැහැ. සාමාන්‍යයෙන් පවත්වාගෙන යනවා. ඒගොල්ලෝ වැඩි හරියක් ඉන්නේ ඕස්ට්‍රේලියාව, කැනඩාව අරෙහේ මෙහේ රටවල්වලට ගියානේ දේශපාලන යුද්දෙන් අනාථ වෙලයි කියලා ඒගොල්ලෝ බොරු දාලා, ඒගොල්ලෝ ගිහිල්ලා හොඳට හම්බ කර ගත්තා. ඒගොල්ලෝ සල්ලි එවනවා. සාමාන්‍ය ගාණක් සුළු ගාණක් තමයි අඩු වුණේ. ඒගොල්ලොන්ගෙත් ජනගහණය වැඩි වෙනවා. සිංහල මිනිස්සු තමයි නැත්තේ.

ප්‍ර : දැන් තමුන්ට මතක ඇති කාලයක මේ මුස්ලිම් අය අන්තවාදී විදියට හැසිරෙන්න පටන් ගත්තේ කොයි කාලයේ වගේ ඉඳලද ඔය කල්මුණේ කාත්තන්කුඩි පළාතේ?

පි : මම ඒක වැඩි සැළකීමක් නැති නිසා මම හරියට නිශ්චිතව දන්නේ නැහැ. නමුත් අර සමුළුවේ අර මම කියන්නේ මේ පොරොන්දු ඉෂ්ඨ නොවෙනකොට අර විප්ලවකාරී තරුණ පිරිස් යම් යම් තීරණ ගන්න ඇතියි කියලා හිතනවා. ඒ තීරණය ගත්ත පිරිසක් තමයි ඔය පාස්කු ප්‍රහාරයත් එල්ල කරන්න ඇත්තේ කියලා මම හිතනවා.

හොඳයි. බොහොම ස්තුතියි.

**********

**ගරු බන්දුල අතපත්තු මැතිතුමා :**

ප්‍ර : මහත්මයා දැන් අර මේ කල්මුණේ නගරයේ තිබ්බා නේද ලොකු බෝධියක්?

පි : ඔව්. බෝධියක් තිබුණා.

ප්‍ර : ඒ බෝධිය කපලා දැම්මද?

පි : කපලා දැම්මා.

ප්‍ර : ඒකට ඕගොල්ලන් විරුද්ධතාවයක් දැක්වුවේ නැද්ද?

පි : විරුද්ධතාවයක් දැක්වුවා.

ප්‍ර : ඒකේ ප්‍රතිඵලයක් ඇති වුණේ නැහැ?

පි : ප්‍රතිඵලය ඒ පාර අම්පාර දිසාපතිතුමා ආරියරත්න මහත්මයා කියලා එක්කෙනෙක් හිටියේ. ඒ මහත්මයා ඒ පාර පරීක්ෂණයක් පැවැත්වුවා. ASP මහත්මයා - කල්මුණේ එයත් ගෙන්නුවා.

FAIR COMMENT BY JEZEEM

එතකොට හිටියේ ලක්ෂ්මන් ජයකොඩි කියලා ඇමතිතුමෙක් තමයි හිටියේ. ඒ ඇමතිතුමත් ආවා අම්පාරට, අපි ගෙන්නුවා. ඒ පාර පස්සේ ASP මහත්මයා කිව්වා නවරත්න රාජා මහත්මයා කිව්වා මේ බෝධිය මම SI කාලයේ හිටන් තිබ්බ්ව එකක්. සිංහල මිනිස්සු නෙමෙයි, දෙමළ මිනිස්සුත් වන්දනා මාන කරනවා කියලා. මට වඩා මම අවුරුදු හතළිස් ගණන්වලදී මට පැරණි එක්කෙනෙක් කිව්වේ ඒ බෝධිය ඇවිල්ලා අවුරුදු දෙසිය පනහක් විතර පරණයි කියලා එයා කිව්වා. එතකොට බෝධිය කපලා නැහැ. මේ බෝධිය දෙසිය පනහක් විතර පනිනවා කිව්වා අවුරුදු ඒ එයා කියනකොට. ඒ බෝධිය ඒ පාර පස්සේ මේගොල්ලෝ රාත්‍රියේ කපලා තිබුණා. අපි දන්නේ නැහැ.

ප්‍ර : ඒක කපන්න හේතුව මොකද්ද?

පි : ඒගොල්ලෝ කිව්වා නගර සභාවෙන් කිව්වා පාර අවහිරතාවය නිසා කපලා දැම්මයි කියලා.

ප්‍ර : ඇත්ත වශයෙන්ම අවහිරතාවයක් තිබ්බද?

පි : නැහැ නැහැ නැහැ. අවහිරතාවයක් නැහැ. ඊට පස්සේ ඒකේ දැන් මේ L.T.T.E. වල කරදරය ඉවර වුණයින් පස්සේ මේක උඩ මේ බෝධිය මුල සම්පූර්ණයෙන්ම මේවා කරලා අපි ඒකේ අත්තිවාරමක් දැම්මා බෝධිය අත්තිවාරමක්. ඒ අත්තිවාරම උඩ මේගොල්ලෝ සපත්තු කඩයක් දාන්න බලපත්‍රයක් දීලා තිබ්බා නගර සභාවෙන්. ඒ පාර මම ගිහිල්ලා ධර්මපාල මාවතේ තිබුණා පොලීසියක් තිබුණා ආගමික ගැටළු නිරාකරණය කිරීම කියලා 4 වෙනි තට්ටුවේ. මම ගිහිල්ලා ඒකට ඇන්ට්‍රියක් දැම්මා, පැමිණිල්ලක් දැම්මා. ඒ පැමිණිල්ල විභාග කරාට පස්සේ සපත්තු කඩය අයින් කළා. ශිලා ලිපියක් අඩි තුන හමාරක විතර පළාත් සභාවෙන් දැම්මා මේක පූජා භූමියක් ස්ථානයක් කියලා. දැන් ඒ ශිලා ලිපියේ තියෙන්නේ නිකම් කළු ලෑල්ලක් විතරයි. අර අකුරු මකලා සේරම.

ප්‍ර : ඔබලා උත්සාහ කළේ නැද්ද නැවත බෝධියක් රෝපණය කරන්න එහෙම?

පි : බෝධියක් උත්සාහ කරන්නේ කොහොමද මේගොල්ලෝ මුල ඉඳන්ම, බුදු පිළිමයක් තියන්න මම මේවා කළා අවසරයත් ඉල්ලුවා ආණ්ඩුකාරයාගෙන්. මගේ ළඟ ලියුම් තියෙනවා ඒවා. උත්තරයක්වත් එව්වේ නැහැ.

ප්‍ර : කවුද ආණ්ඩුකාරයා ඒ කාලයේ?

පි : එතකොට රෝහිත බෝගොල්ලාගම.

හොඳයි. බොහොම ස්තුතියි.

FAIR COMMENT BY JEZEEM

**********

**ගරු අදිකාරී මැතිණිය :**

ප : සාක්ෂිකරු ඔබ සඳහන් කළා කල්මුණේ ප්‍රදේශයේ සිංහල පවුල් 150 ක් සිටියා කියලා?

පි : ඔව් 54 ක්.

ප : ඒ 154 පවුල් තමන්ගේ රැකියාව ලෙස මොනවාද කළේ?

පි : වෙළඳාම කළා. මාර්කට් එකේ වෙළඳාම. ඊට පස්සේ ධීවර කාර්මිකයෝ වශයෙන් වැඩ කළා. සමහරක් හිටියා පෙදරේරුවෝ, වඩුවෝ, මෝටර් මැකානික්ලා තමයි හිටියේ.

ප : රජයේ සේවකයොත් හිටියද?

පි : රයේ සේවකයොත් වැඩිය හිටියේ නැහැ. රජයේ සේවකයෝ 15 ක් 20 ක් වගේ හිටියා.

ප : දැන් ඒ සිංහල පවුල් 150 දරුවෝ කොහේද ඉස්කෝලේ ගියේ?

පි : සිංහල මහා විද්‍යාලය කියලා කල්මුණේ තිබුණා සිංහල මහා විද්‍යාලයක්.

ප : දැන් ඔබ 83 න් පස්සේ යනකොට ඒ සිංහල මහා විද්‍යාලය තිබුණද?

පි : සිංහල මහා විද්‍යාලය තිබුණා 86 වෙනකම්.

ප : දැන් තියෙනවාද ඒ සිංහල මහා විද්‍යාලය?

පි : දැන් නැහැ.

ප : දැන් කවුද ඒ සිංහල මහා විද්‍යාලයේ ඉස්කෝලයක් හැටියට පාවිච්චි කරන්නේ?

පි : විද්‍යාලයේ අර අපි පෙත්සම් ගහලා අරෙහේ මෙහේ විදුහල්පති කෙනෙක් කියලා ඉන්නවා. ළමයි නැහැ. නිකම් තියෙනවා. ඒක වටේටම මුස්ලිම් මිනිස්සු ඉඩම කොටස් අල්ලගෙන. මම ඇහුවා ඒ මිනිස්සුන්ගෙන් ඕගොල්ලෝ කොහේද කියලා. අපි වාලච්චේන කිව්වා. සුනාමියට අහුවෙලා අපිට ඉඩම් නැති නිසා මෙහේ පදිංචි වෙන්න කියලා ප්‍රාදේශීය ලේකම් කිව්වයි කිව්වා.

ප : ඔබ කියන්නේ වෙනත් ප්‍රදේශවලින් මුස්ලිම් අය ගෙනල්ලා එම ප්‍රදේශයේ පදිංචි කරවනවද?

පි : ඔව්. පදිංචි කරවනවා. දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කය වෙනස්.

ප : දැන් ඔබ සඳහන් කළා ඔබ ධීවර යාත්‍රාවක් තිබුණා කියලා?

පි : තිබුණා.

ප : මොකද්ද තිබිච්ච යාත්‍රාවේ වර්ගය?

පි : ඒක ඇවිල්ලා සීනෝර්. සීනෝර් පර්ගියුෂන් ඇන්ජින් එක තියෙන්නේ. ඒ දවස්වල රුපියල් ලක්ෂ තුන හමාරයි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එක් දින ධීවර යාත්‍රාවක්ද?

පි : ඔව්. එක් දින ධීවර යාත්‍රාවක්.

ප්‍ර : දැන් ඔබට ධීවර කර්මාන්තය කර ගන්නට, මොකද යාත්‍රාවට මොකද වුණේ?

පි : ඒ යාත්‍රාව මිනිස්සුත් එක්කම නැති වුණා.

ප්‍ර : ඒ කියන්නේ ත්‍රස්තවාදීන් අල්ලා ගත්තා?

පි : ත්‍රස්තවාදීන් මිනිස්සු මරා දාලා බෝට්ටුව ගෙනිහිල්ලා.

ප්‍ර : මොන ත්‍රස්තවාදීන්ද?

පි : කොටි ත්‍රස්තවාදීන්.

ප්‍ර : ඔබ ඒ ගැන පැමිණිල්ලක් කළාද ධීවර අමාත්‍යාංශයට?

පි : දැනුත් පැමිණිලි කරනවා මට ඒ යාත්‍රාවක් ලබා දෙන්න කියලා. ඒගොල්ලෝ කියනවා ඔයා බැංකුවෙන් දේපළ උගස් තියලා යාත්‍රාවට ණයක් ගන්නෙයි කියලා. ඒ පාර දේපළ උගස් තිබ්බත් ඔයාට යාත්‍රාවක් ගන්න බැහැ කිව්වා දැන් ඔයාට වයස පැනලයි කිව්වා දැන් ඉතිං දෙන්නේ නැහැ කිව්වා කොහොමටත්.

ප්‍ර : දැන් ඔබ කිව්වනේ අර 83 අවුරුද්දේ පොසොන් පොහොය දවසේ තිබුණා කියලා සමුළුවක්?

පි : ඔව්. සමුළුවක් තිබුණා.

ප්‍ර : ඒ සමුළුවේදී ඔලුවිල් ප්‍රකාශනය කියලා එකක් ගැන අත්සන් කළාද?

පි : ඒවා නම් මම දන්නේ නැහැ. අත්සන් කරපු ඒවා මම ළඟට ගියේ නැහැනේ. අපි පිටින් ඉඳන් බලාගෙන හිටියා මිසක් ළඟට ගියේ නැහැ. අත්සන් බත්සන් කරන ඒවාට යන්නේ නැහැ. ඒවාට කිට්ටු කරන්න දෙන්නේ නැහැ.

ප්‍ර : ඔබ අහලා තියෙනවද ඔලුවිල් ප්‍රකාශනය කියලා එකක්?

පි : මම නම් ඒක දන්නේ නැහැ.

ප්‍ර : ඔබ සඳහන් කළානේ අම්පාරේ එවකට හිටපු දිසාපතිතුමා ආරියරත්න කියලා?

පි : ආරියරත්න ඔව්.

ප්‍ර : ආරියරත්න හේවගේ කියලා එක්කෙනෙක්ද?

පි : මම දන්නේ නැහැ. ආරියරත්න මහත්මයා කියලයි අපි කියන්නේ.

ප්‍ර : එවකට මඩකලපුවේ සිටිය දිසාපති කවුද?

පි : මඩකලපුවේ ඉන්නේ මට කල්පනාවක් නැහැ.

ප්‍ර : බ්‍රැඩ්මන් වීරකෝන් කියලා මහත්මයෙක්ද?

පි : බ්‍රැඩ්මන් වීරකෝන් මහත්මයා හොඳට හඳුනනවා.

ප්‍ර : බ්‍රැඩ්මන් වීරකෝන් මහත්මයා කොයි කාලයේද හිටියේ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එයා හිටියේ අර චන්ද්‍රිකා බණ්ඩාරනායක නෝනා පත් වුණාට පස්සේ එයා දැම්මා මඩකලපුවට දිසාපති කරලා.

හොඳයි. බොහොම ස්තූතියි.

**********

**ගරු සභාපතිතුමා :**

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතීඥවරයාට අවශ්‍ය දැයි විමසමි. ඔව් යනුවෙන් ප්‍රකාශ කරයි. අවස්ථාව ලබා දෙමි.

**********

**සාක්ෂිකරු :** ගෙදරින් කෑ ගැහුවා යන්න එපා. ඔයාට රට ජාතිය වෙනුවෙන් මොකද්ද තියෙන මේවා එක. ඔයා අද හෙට මැරිලා යන මිනිහනේ. ඒ වුණාට මම ....,

**********

**ජනාධිපති නීතීඥ ශාමිල් පෙරේරා මහතා :**

ප්‍ර : ඔබතුමා කල්මුණේ නගරයේ කොපමණ කාලයක් සිට පදිංචි වෙලා ඉන්නවද?

පි : මම ඉතිහාසයක් කියන්නම්. 1952 අපේ අක්කව කසාද බන්දලා මඩකලපුවේ ව්‍යාපාරිකයෙක්. පොලීසිය ඉස්සරහා ඊස්ටන් රේඩියෝ සර්විස් කොම්පැණියේ එයා. ඒ එදා ඉඳන් මම එතකොට පස්වෙනි පන්තියේ. අපි කෝච්චියේ යනවා. නිවාඩු කාලයට එහේ තමයි ඉන්නේ. අපේ තාත්තත් ඉතිං ධීවර ව්‍යාපාරිකයෙක් නිසා එහේ යනවා. දෙමළ මිනිස්සුත් එක්කත් බොහෝම සම්බන්ධයි වැල්ල අද්දර. අපිට දෙයියන් වහන්සේට වගේ සළකන්නේ දෙමළ මිනිස්සු. බොහොම සම්බන්ධයි අපිත් එක්ක. තාත්තට දෙයියන්ට වගේ සළකන්නේ. තාත්තා රුපියල් දෙකක් ඒ දවස්වල ගන්න හැටියට ඒ වගේ දෙනවා. අපට හික්කඩුවේ ඉඳලා කෝච්චියේ රුපියල් 14 යි මඩකලපුවටම. ඉස්සර ටිකට් එක ගන්නේ. මට හාගෙට රුපියල් 7 යි. ඉතිං මේ ඒ විදියට තමයි වැඩ කළේ. ඒ පාර අපේ එදා ඉඳන්ම අපේ ලොකු අයියා සමන්තුරේ වැඩ කළේ වී අලෙවි මණ්ඩලයේ Store Keeper විදියට. අපේ අනිත් අයියා වැඩ කළෙත් මඩකලපුවේ ඒත් වෙළඳ ව්‍යාපාරිකයෙක් විදියට.

ප්‍ර : ඒ කියන්නේ දැන් අවුරුදු 40 ක් 50 ක් පමණ. එහෙම නේද?

පි : ඔව්. අපේ පරම්පරාව ඉන්නවා.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මේ කල්මුණේ නගරයේ කතෝලික බැතිමතුන් විශාල සංඛ්‍යාවක් සිටිනවා කිව්වොත් හරිද?

පි : ඉන්නවා ඉන්නවා.

ප්‍ර : විශාල කතෝලික පල්ලියකුත් තිබෙනවා?

පි : තියෙනවා තියෙනවා.

ප්‍ර : දැන් තල්ලකුඩා කියන්නේ කල්මුණේ නගරයට ළඟ නගරයක්ද?

පි : තල්ලකුඩා තියෙන්නේ මඩකලපු දිස්ත්‍රික්කයේ.

ප්‍ර : දන්නවද ඔබ?

පි : තල්ලකුඩා ඉතිං අපි මුහුදේ නානවා අරවා මේවා කරනවා.

ප්‍ර : දැන් තමා මේ ගරු කොමිෂන් සභාව බලලා සාක්ෂි දෙන්න. තමා මේ කල්කුඩාවේ සිටින කාලයේදී, සොරි කල්මුණේ සිටින කාලයේදී කතෝලික බැතිමතුන් සහ මුස්ලිම් ජනතාව අතර යම් යම් ගැටුම් තිබුණාද?

පි : ඒගොල්ලොන්ගේ ආගම වශයෙන් ඒගොල්ලෝ සම්බන්ධතාවයක් නැහැ.

ප්‍ර : ඒගොල්ලෝ කියන්නේ?

පි : ඒ කියන්නේ මුස්ලිම් මිනිස්සුයි, කතෝලිකයොයි සම්බන්ධතාවයක් තිබුණේ නැහැ. සිංහල මිනිස්සුයි, දෙමළ මිනිස්සුයි සම්බන්ධතාවයක් තිබුණා. ඒගොල්ලොත් බුදුන් වඳිනවා. අපිත් දෙවියෝ වඳිනවා. ඒක නිසා ආගම වශයෙන් සම්බන්ධතාවයක් තිබුණා. අරගොල්ලෝ මොනම සම්බන්ධතාවයක් වත් තිබුණේ නැහැ. සිංහල මිනිස්සුත් එක්ක අපිත් එක්කම තමයි තිබුණේ අපෙන් මොකක් හරි වැඩක් ගන්න මොකක් හරි එහෙම එකකට උදව්වක් ගන්න තමයි එහෙම හිටියේ.

ප්‍ර : නැහැ දැන් මගේ ප්‍රශ්නය යම් යම් ගැටුම් තිබුණද තමා දන්න හැටියට?

පි : එහෙම තදබල ගැටුමක් තිබුණේ නැහැ. දෙමළයි මුස්ලිම් අතරේ හැමදාම අවුරුද්දකට පාරක් කෝලහලයක් යනවා කල්මුණේ ටවුන් එකේ. එදාට කඩ කඩාගෙන මේවා කරනවා. ඒක මම දන්නේ නැහැ කතෝලිකද මොනවද කියන එක.

**********

**ගරු අදිකාරී මැතිණිය :**

ප්‍ර : සාක්ෂිකරු ඔබ ධීවර අමාත්‍යාංශයට ආවද ඔබගේ ධීවර යාත්‍රාවක් ඉල්ලගෙන?

පි : ආවා.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අන්තිමටම ආවේ මොන අවුරුද්දෙද?

පි : මේ ආණ්ඩුව, 2019 ආවා. මේ ආණ්ඩුව පිහිටුවන්න ඉස්සරලා.

ප්‍ර : ඊට ඉස්සරලා ධීවර අමාත්‍යාංශයට ආවද?

පි : ඔව්. ආවා ආවා. ලියුම් තියෙනවා මෙච්චර විතර තියෙනවා.

ප්‍ර : අවුරුදු කියන්න, අවුරුදු වශයෙන් කියන්න ළඟදී 2015 න් පස්සේ?

පි : හැම අවුරුද්දෙම සාමාන්‍යයෙන් දෙතුන් පාරකට යනවා මම. මහින්ද අමරවීර මහත්මයාත් හම්බ වුණා. එයත් කිවයුතු දේ නැහැ මෙහෙමයි ඇමතිවරුන් කියනවා මේක ලබා දෙන්නෙයි කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයාත් ලියුමක් ගහලා තිබ්බා මෙයා ත්‍රස්තවාදී කරදරවලට මුහුණ පාලා, මෙයාට කිසිම ආදායමක් නැහැ, ඒක නිසා මේ ධීවර යාත්‍රාව දෙන්න කියලා ගහලා තිබුණා තමයි. නමුත් ධීවර දෙපාර්තමේන්තුවේ ධීවර අධ්‍යක්ෂ කියනවා කාටත් නීතිය පොදුයි. ඔයාටයි කියලා අපිට වෙනස් කරන්න බැහැ, ඔය ත්‍රස්තවාදී අරවා මේවා බැහැ. ලංකා බැංකුවේ තියෙනවා ධීවරයින්ට දෙන ණය යෝජනා ක්‍රමයක්. ඒ ණය යෝජනා ක්‍රමය අනුව ඔයා ඔයාගේ දේපළ උගස් තියන්න. දැන් ඔයාට ලක්ෂ හතළිහක බෝට්ටුව ගන්නවා නම් ලක්ෂ අසූවක දේපළ උගස් තියන්න. මම කිව්වා මට සතයක්වත් නැහැ. මට ඇත්තෙත් නැහැ. දැන් සේරම විනාශ වෙලා කියලා. එහෙනම් ඉතිං කරන්න දෙයක් නැහැ කිව්වා අපට. අපි නීතියට කරන්නේ කිව්වා.

ප්‍ර : ඔබ ධීවර අමාත්‍යාංශයට ගිහිල්ලා ඉල්ලුවේ බහු දින යාත්‍රාත්වක්ද?

පි : ඔව්. මම මොකක් හරි යාත්‍රාවක් ඉල්ලුවා, මගේ නැති වෙච්ච යාත්‍රාව හරි බහු දින යාත්‍රාවක් හරි මොකක් හරි.

ප්‍ර : ඔබට දරුවන් කී දෙනෙක් ඉන්නවද?

පි : හතර දෙනෙක් ඉන්නවා.

ප්‍ර : කවුද ගැහැණු දරුවෝ, පිරිමි දරුවෝ?

පි : ගැහැණු දරුවෝ එක්කෙනයි, පිරිමි තුන් දෙනයි.

ප්‍ර : ඒ දරුවෝ ඉන්නේ දැන් කොහේද?

පි : දෙන්නෙක් ඉන්නේ පානදුරේ. එක්කෙනෙක් ඉන්නේ හොරණ, එක්කෙනෙක් ඉන්නේ ගම්පහ.

ප්‍ර : දැන් ඔබ කිව්වනේ මේ කොමිසම හමුවේදී දෙමළ අයයි, මුස්ලිම් අයයි නිතරම රණ්ඩු වුණා කියලා කල්මුණේ නගරයට ඇවිල්ලා?

පි : ඔව්.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද කල්මුණේ ඔබ ජීවත් වෙච්ච කාලයේදී සිංහල ජනතාවයි, දෙමළ ජනතාවයි, මුස්ලිම් අයයි සමඟියෙන් හිටියද කියලා?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : දෙමළ ජනතාවයි, සිංහල ජනතාවයි, මුස්ලිම් ජනතාවයි ඔය 81 න් ඉස්සරලා කිසිම ගැටුමක් මොකුත් වුණේ නැහැ. අර දෙමළයි, අර මුස්ලිම් අතරේ තිබුණා වෙළඳාම සම්බන්ධයෙන් ගැටුමක් හිත හොඳ නැති කමක් තිබුණා. ඒකනිසා අවුරුද්දකට පාරක් විතර ඔය ටවුන් එකේ කෝලාහලයක් යනවා. දැන් ඒ කියන්නේ එක ප්‍රදේශයක්, දෙමළ මිනිස්සු හිටපු ප්‍රදේශයක්ම දැන් මුස්ලිම් මිනිස්සු අයිති කරගෙන තියෙන්නේ. දෙමළ මිනිස්සු ටික ටික ටික මඩකලපුව පැත්තට යනවා. අරගොල්ලෝ අර පැත්තේ ඉඳලා මේ පැත්තට එනවා මුස්ලිම් කාණ්ඩය. එහෙමයි වෙලා තියෙන්නේ. දැන් සිංහල කඩත් තිබුණා. දෙමළ කඩත් තිබුණා. මුස්ලිම් කඩත් තියෙනවා. දැන් සේරම මුස්ලිම් වෙලා.

ප : ඒක සිද්ධ වුණේ අර L.T.T.E. යුද්ධයෙන් පස්සෙද?

පි : ඒ සිද්ධ වුණේ අර L.T.T.E. එක කාලයේදී දෙමළ මිනිස්සුන්ට කරදරයක් වුණේ නැහැ. මොකද ඒ කරදරය වුණා නම් L.T.T.E. න් ඇවිල්ලා වෙඩි තියලා දාලා යනවා. හොඳම එකක් තමයි ප්‍රාදේශීය ලේකම් දුන්නා දැන් අපේ ඉඩම් ගත්තා ප්‍රාදේශීය ලේකම් මුස්ලිම් මිනිස්සුන්ට අපේ ඉඩම් පෝමිට් දුන්නා සේරම මුස්ලිම් මිනිස්සුන්ට. ඒ වගේ සිංහල මිනිස්සුන්ගේ ඒවා දීලා ඉවර වුණාට පස්සේ දෙමළ මිනිස්සුන්ගේ ඒවාත් දෙන්න ගත්තා මුස්ලිම් මිනිස්සුන්ට. ඊට පස්සේ දෙමළ මිනිස්සු ගිහිල්ලා L.T.T.E. එකට කිව්වා. ඒක වුණේ 2005 නැත්නම් 6. ගිහිල්ලා ඒ පාර L.T.T.E. එකට කිව්වහම L.T.T.E. එකෙන් ආවා. ඇවිල්ලා කිව්වා මෙහෙම කරලා තියෙනවා කියලා. වෙඩි තියලා දැම්මා ටක් ටක් ටක් ගාලා ඔළුවට. මැරුවා.

ප : දැන් ඔබ ඉතිහාසයක් හොඳ තියෙන එක්කෙනෙක්නේ ශ්‍රී ලාංකිකයෙක්නේ. කියන්නකෝ බලන්න සිංහල, දෙමළ, මුස්ලිම් මිනිස්සු කොහොමද මේ රටේ සමඟියෙන් ආයේ ඉන්නේ කියලා?

පි : මේකයි කරන්න තියෙන්නේ. මේ දේශපාලනඥයොන්ගේ ක්‍රියා නිසා තමයි මේ සේරම වෙලා තියෙන්නේ. මගේ අදහස මේ දේශපාලනඥයෝ තමයි මිනිස්සු භේද භින්න කරලා ඒගොල්ලොන්ගේ වාසියට ඒගොල්ලෝ දේශපාලන පක්ෂ මේවා කරගෙන ඒගොල්ලෝ වරදාන වරප්‍රසාද ලබා ගන්නවා. දුප්පත් මිනිස්සුන්ට වෙන දෙයක් නැහැ. කොයි පක්ෂයෙන් එහෙම තමයි. දෙමළ මිනිස්සු, දැන් දෙමළ මිනිස්සු ඒ මිනිස්සුන්ට මොනවා මොනවා හරි පෙන්නලා ඒගොල්ලෝ වරප්‍රසාද ගන්නවා. සිංහල මිනිස්සුන්ටත් ඒවා පෙන්නලා ගන්නවා. මුස්ලිම් මිනිස්සුන්ටත් ඒ විදියට ගන්නවා. ඔය දේශපාලනය නිසා තමයි සේරම වුණේ. මම නම් කියන්නේ නැත්නම් අපි අතර ඇති ගැටුමක් නැහැ ඇත්ත

FAIR COMMENT
BY JEZEEM

වශයෙන්ම. අපි බොහොම අපේ පානදුරේ මම ඉන්න මගේ ගෙට මෙහා පැත්තේ ඉන්නේ මුස්ලිම් පවුලක් ඉන්නේ. මෙහා පැත්තේත් ඉන්නෙත් මුස්ලිම් පවුලක්. ඒ පවුල් කරදර කාලයේදී අපි ඒගොල්ලෝ ආරක්ෂා කළා. අපටත් ඒ ගෙදරින් ඉවිවහම මොනවා හරි කෑම අපට එවනවා. අපිත් ඒ වගේම තමයි. ඉතිං ඒ විදියට තමයි ඉන්නේ. හරි හොඳයි. ඒ වගේ තමයි මුළු ලංකාවේ වෙනවා නම් දෙමළ මිනිස්සු, මුස්ලිම් මිනිස්සු ඒ වගේ සේරම වෙනවා නම් මේ කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ කරන්නේ සේරම මේ දේශපාලනඥයෝ.

ප්‍ර : 2019 අප්‍රේල් 21 වෙනිදයින් පස්සේ ඔබගේ පානදුර නිවස අසළ හිටපු මුස්ලිම් අය තාමත් ඔබත් එක්ක හොඳට යාළුයිද?

පි : අපෝ හොඳින් ඉන්නවා.

ප්‍ර : ඔබත් ඉන්නවද ඒ අයත් එක්ක හොඳින් ඒ වගේම?

පි : අපොයි ඉන්නවා ඉන්නවා ඉන්නවා.

හොඳයි. බොහොම ස්තුතියි.

**********

**ගරු සභාපතිතුමා :**

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යභාරය සම්බන්ධයෙන් දැක් වූ සහයෝගයට සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තූතිය පළ කරනවා.

**සාක්ෂිකරු :** මාත් ස්තූතිවන්ත වෙනවා. මටත් මේ අවස්ථාවක් ලබාදීම ගැන මමත් බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා :** සාක්ෂිකරු මුදා හරිමි.

දැන් වේලාව ප.ව. 6.38 යි.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව**

දිනය :- 2020.07.06 වේලාව :- ප.ව. 6.38 යි

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

**ගරු විනිසුරු මඩුල්ල :-**

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

**පෙනී සිටීම :-**

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතීඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

| | | | |
|---|---|---|---|
| 01. | සම්පූර්ණ නම | : | එගොඩ ලියනගේ සූරවංශ |
| 02. | වයස | : | අවුරුදු 51 යි |
| 03. | ජාතිය | : | සිංහල |
| 04. | ආගම | : | බෞද්ධ |
| 05. | තනතුර | : | මාධ්‍ය විමර්ශන නිලධාරී<br>(ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව) |

**(සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි)**

**අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :**

ප්‍ර : සූරවංශ මහත්මයා ඔබ තමයි මේ ජනාධිපති කොමිෂන් සභාවේ මාධ්‍ය විමර්ශන නිලධාරී?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබව මෙම කොමිෂන් සභාවට අනුයුක්ත කළේ කුමන ආයතනයක ඉඳලද?

පි : රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ.

ප්‍ර : එහෙමනම් ඔබට කියන්නට පුළුවන්ද සාමාන්‍යයෙන් ඔබ මේ කොමිෂන් සභාවට ආනුශාංගිකව සිදු කරනු ලබන්නේ මොන වගේ රාජකාරිද කියලා?

පි : කොමිෂන් සභාවට අවශ්‍ය කරන ජනමාධ්‍යයන්හි පළවන වාර්තා හා ඉදිරිපත් කිරීම, මාධ්‍ය නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් සහ තොරතුරු සැපයීම.

ප්‍ර : ඒ තමයි ඔබේ සාමාන්‍ය දෛනික රාජකාරී කටයුතු?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම රාජකාරී කටයුතුවල නියැලෙන අවස්ථාවේදී ඔබට ලැබුණද යම් අවස්ථාවකදී ඊජීප්තු තානාපති කාර්යාලය විසින් නිකුත් කරලා තියෙන පුවත්පත් නිවේදනයක්?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කවදා නිකුත් කරනු ලැබූ පුවත්පත් නිවේදනයද ඔබට ලැබුණේ? ඔවුන් ඒ නිවේදනය නිකුත් කරලා තියෙන්නේ කවදද?

පි : 2020 ජූනි 15.

ප්‍ර : 2020 ජූනි මාසේ 15?

පි : 15 වෙනිදා.

ප්‍ර : එම නිවේදනය ඔබ ළඟ තිබෙනවද?

පි : තිබෙනවා ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**(ස්වාමීනි එම නිවේදනය C-820 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා)**

ප : ඊජිප්තු තානාපති කාර්යාලයට 2020 ජූනි මස 15 දින දරන මේ පුවත්පත් නිවේදනය නිකුත් කිරීමට හේතු වෙලා තියෙන්නේ මොන කරුණක්ද කියන එක ඔබට මේ ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන්ද?

පි : 2020 ජූනි 13 වන දින මෙම කොමිෂන් සභාව හමුවේ ගලගොඩඅත්තේ ඥාණසාර හිමියන් කරපු ප්‍රකාශයක් සම්බන්ධව.

ප : මොකද්ද උන් වහන්සේ කරලා තියෙන මේ ප්‍රශ්නගත ප්‍රකාශය?

පි : අල්කර්දාවී කියන මූලධර්මවාදී දේව ධර්මාචාර්යවරයා මේ ඊජිප්තුවේ රැඳී සිටිමින් වැරදි කටයුතුවල නිරත වෙනවා කියලා කියපු ප්‍රකාශය සම්බන්ධයෙන්.

ප : ඔව්. එතකොට ඒ කරුණු සාවද්‍යයි කියන්නට C-820 වශයෙන් ලකුණු කරන ලද ඔය පුවත්පත් නිවේදනයේ යම් කරුණු අන්තර්ගත වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප : මොනවද දක්වලා තියෙන හේතු? එහි සඳහන් වෙනවද ඔහු ඊජිප්තු ජාතිකයෙක් වුණාට එම පුරවැසිභාවයෙන් ඔහුව ඉවත් කරලා තියෙනවා කියලා?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප : ඒ වගේම දශක කිහිපයකට පෙර සිටන් ඔහු ඒ කියන්නේ යූසුෆ් අල්කර්දාවි කියන තැනැත්තාව ඊජිප්තුවට ඇතුල්වීම තහනම් කරලා තියෙනවා කියලා සඳහන් වෙනවද?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප : ඒ හැරෙන්නට ඒ පුවත්පත් නිවේදනයේ සඳහන් වෙනවද ඊජිප්තු අධිකරණය විසින් ඔහුට එරෙහිව ජීවිතාන්තය දක්වා වූ සිර දඩුවමක් ලබා දීලා තියෙනවයි කියලා ඔහු අනභිමුඛයේ පවත්වනු ලැබූ නඩු විභාගයකින් පසුව?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඒ වගේම එහි සඳහන් වෙනවද එම නඩු විභාගයට පාදක වූ චෝදනාවලට ඇතුළත් වුණාය කියලා ඊජිප්තු රටේ ත්‍රස්තවාදයට අදාළ ක්‍රියාවන් සිදු කරමින් ඔහු ජීවිත කිහිපයක් පුරවැසියන්ගේ නැති කිරීමට කටයුතු කරලා තිබුණාය කියලා?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප : ඒ වගේම එහි සඳහන් වෙනවද මුස්ලිම් සහෝදරත්වය කියන ඒ සංවිධානයේ ප්‍රධානීන් සමඟ එකතු වෙලා යූසුෆ් අල්කර්දාවි කියන

Presidential Secretariat
FAIR COMMENT BY JEZEEM

තැනැත්තා ත්‍රස්තවාදයට අදාළ යම් යම් ක්‍රියා සිදු කිරීමට සූදානම් වෙලා තිබුණාය කියලා?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම ටක්ෆිල් කියන අදහස් වැළඳගෙන අන්තගාමී පුද්ගලයෙක් විදියට ඔහු කටයුතු කළාය කියලා?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම ඒ චෝදනාවල අඩංගු වූ බව සඳහන් වෙනවද C-820 වශයෙන් ලකුණු කරන ලද පුවත්පත් නිවේදනයේ ඊජිප්තුවේ ජාතික ආරක්ෂාව අවතක්සේරුවට ලක් කරමින් ඊජිප්තු ජනතාවට එරෙහිව කැළඹීමක් ඇති කිරීමට කටයුතු කිරීමට මේ යූසුෆ් අල්කර්දාවි මූලික වෙලා තිබුණාය කියලා?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : තවදුරටත් එහි සඳහන් වෙනවද මේ කර්දාවි කියන තැනැත්තාගේ ඒ කියන්නේ යූසුෆ් අල්කර්දාවි ඊජිප්තුව විසින් නිකුත් කරලා තියෙන ත්‍රස්තවාදී ලැයිස්තුවේ ත්‍රස්තවාදියෙක් විදියට ලැයිස්තුගත වෙලා තියෙනවා කියලා?

පි : ලැයිස්තුගත වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔහු මොන රටේද ජීවත් වෙන බව මේ C-820 පුවත්පත් නිවේදනයේ සඳහන් කරලා තියෙන්නේ තානාපති කාර්යාලය?

පි : දැනට කුවේට් රාජ්‍යයේ කටාර්හි පදිංචි වෙනවා කියලා සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : මොන කාලයේ ඉඳලද එම තැනැත්තා කටාර් රාජ්‍යයේ ජීවත් වෙන බව තානාපති කාර්යාලය එම නිවේදනයෙන් දක්වන්නේ?

පි : 1960 සිට මේ දක්වා ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම ඔහු මේ වනවිට කටාර් රාජ්‍යයේ පුරවැසියෙක් බවට ඒ පුවත්පත් නිවේදනයේ සඳහන් වෙනවද?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : එම පුවත්පත් නිවේදනය මගින් ඊජිප්තු තානාපති කාර්යාලය කනස්සල්ල පළ කරලා තියෙනවද එවැනි හැසිරීමකින් යුතු පුද්ගලයෙක් වූ මේ යූසුෆ් අල්කර්දාවි පිළිබඳව කටාර් රාජ්‍යය සොයා බලා අවශ්‍ය පියවර ඔහුට එරෙහිව නොගැනීම සම්බන්ධයෙන්?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : යූසුෆ් අල්කර්දාවි කියන තැනැත්තා මේ පුවත්පත් නිවේදනය අනුව ඊජිප්තුව සහ අරාබි රටවල් විසින් හඳුනාගෙන තිබෙන ත්‍රස්තවාදී සංවිධාන සඳහා මුදල් සපයන කෙනෙක් විදියට හඳුනාගෙන තියෙනවද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : හඳුනාගෙන තියෙනවා ස්වාමීනි.

ප්‍ර : එතකොට දැන් මේ C-820 කියන පුවත්පත් නිවේදනය මගින් මොන කරුණුද ප්‍රධාන වශයෙන්ම ඊජීප්තු තානාපති කාර්යාලය විසින් හුවා දක්වන්නට කටයුතු කරලා තියෙන්නේ? සමස්තයක් වශයෙන් ගත්තහම යූසුෆ් අල්කර්දාවිගේ හැසිරීම සම්බන්ධයෙන් ඔවුන් ඔවුන්ගේ නොසතුට, අසන්තෝෂය ප්‍රකාශ කරලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම තමන්ගේ රටින් පිටුවහල් කරන ලද මෙවැනි පුද්ගලයෙක් හට කටාර් රාජ්‍යයේ සෙවන ලබා දීම සම්බන්ධයෙන් ඔවුන්ගේ නොසතුට සහ කනස්සල්ල පළ කරලා තියෙනවද?

පි : පළ කරලා තියෙනවා.

ප්‍ර : ඒ වගේම ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය මැඩලීම සඳහා තමන්ට දිය හැකි සහයෝගය ලබා දෙන බවට ඊජීප්තු තානාපති කාර්යාලය එම රජය වෙනුවෙන් මේ පුවත්පත් නිවේදනය මගින් කරුණු උලුප්පා දක්වලා තියෙනවද?

පි : දක්වලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ මෙම කොමිෂන් සභාවේ මාධ්‍ය අංශයට අදාළව රාජකාරී කටයුතු කරන අවස්ථාවේදී ඔබට දැන ගන්නට ලැබුණද යූසුෆ් අල්කර්දාවිට අදාළව මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ ගරුතර ගලගොඩඅත්තේ ඥාණසාර ස්වාමීන් වහන්සේ විසින් ඔය ප්‍රශ්නගත සාක්ෂිය දෙන්නට පෙර සහ පසුව යම් යම් සාක්ෂි ඉදිරිපත් වෙලා තියෙනවද කියලා වෙනත් සාක්ෂිකරුවන්ගෙන්?

පි : ඉදිරිපත් වෙලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : කී දෙනෙක්ගෙන් ඉදිරිපත් වෙලා තියෙනවද?

පි : තුන් දෙනෙක්ගෙන්.

ප්‍ර : පළවෙනි එක්කෙනා කවදාද සාක්ෂි දීලා තියෙන්නේ?

පි : මාර්තු මස 07 වෙනි දින මෙම කොමිෂන් සභාව හමුවේ දිවුරුම් මත සාක්ෂි ලබා දීලා තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ 2020 මාර්තු 07 වෙනිදා?

පි : 07 වෙනි දින. එහෙමයි.

ප්‍ර : ඒ සාක්ෂිකරු දිවුම්රු මත මොනවද මේ ගරු කොමිෂන් සභාවට යූසුෆ් අල්කර්දාවි ගැන කියලා තියෙන්නේ?

පි : යූසුෆ් අල්කර්දාවි කටාර් රාජ්‍යයේ දැනට ජීවත් වෙනවා. ඊට අමතරව එයා විසින් ෆත්වා නිකුත් කරනවා. ජමාතේ අල් හසනාත් සඟරාවට ලිපි සකස් කරනවා කියලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ මුස්ලිම් සහෝදරත්වය කියන සංවිධානයට යූසුෆ් අල්කර්දාවි විසින් සහාය ලබාදෙන බව ඔහු මේ සාක්ෂියේදී කියලා තියෙනවා නේද?

පි : කියලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම මුස්ලිම් සහෝදරත්වයේ මතවාදය ඉදිරියට ගෙන යනු ලබන ජමාතේ ඉස්ලාමී සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අල්හසනාත් සඟරාවේ මේ යූසුෆ් අල්කර්දාවි පිළිබඳව යම් ලිපි පළ වෙලා තිබෙන බවත් ඔහු ඔහුගේ සාක්ෂියේදී කියලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ පළවෙනි සාක්ෂිකරු?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දෙවෙනි සාක්ෂිකරු කවදද සාක්ෂි දීලා තියෙන්නේ?

පි : 2020.06.08 වෙනි දින.

ප්‍ර : ඔහු මොනවද කියලා තියෙන්නේ?

පි : මෙරට 13 වසරේ ඉගෙනුම ලබන ඉස්ලාම් සිසුන්ගේ පෙළ පොත්හි අල්කර්දාවි පිළිබඳ අධ්‍යයනය කිරීමට සැලැස්වීම සහ සදොස් බව පවසා සිටිනවා.

ප්‍ර : එහෙම දරුවන්ට ඒ යූසුෆ් අල්කර්දාවි කියන මුස්ලිම් සහෝදරත්වය පිළිබඳව වූ මතවාද ඉදිරියට ගෙන යන මේ පුද්ගලයා ගැන අධ්‍යාපනය ලබා ගන්නට, කරුණු අනාවරණය කර ගන්නට දීලා තියෙන ඉඩ ප්‍රස්ථාවේ තියෙන සදොස්භාවය ඔහු විසින් උලුප්පා දක්වලා තියෙනවා ඔහුගේ සාක්ෂියේදී?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : වෙන මොනවද ඔහු කියලා තියෙන්නේ?

පි : අල්කර්දාවි විසින් ස්වයංඝාතන කටයුතුවලට අනුමත කරලා තියෙනවා.

ප්‍ර : ඔව්. ඒ කියන්නේ කර්දාවි කියන්නේ ස්වයංඝාතන කටයුතු සඳහා සහාය දක්වන්නෙක් කියලා කියන්නේ?

පි : එහෙමයි ස්වාමීනි. ඊජිප්තු රජය පෙරළා දැමීමට කටයුතු කිරීම, මුස්ලිම් බ්‍රදර් අනුගමනය කරන අනුගාමිකයින් එහි ආධ්‍යාත්මික නායකයා වශයෙන් අල්කර්දාවි පිළිගැනීම.

ප්‍ර : පිළිගන්නවා කියන එක පිළිබඳවත් ඔහු කියලා තියෙනවා?

පි : ඔව්. අල්කර්දාවි සහ බිලාල් පිලිප්ස් යන පුද්ගලයින් කටාර් රාජ්‍යයේ ජීවත්වන බව පවසලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔව්. එතකොට ඔහුගේ සාක්ෂියේදී මේ ගරු කොමිෂන් සභාවට අනාවරණය වෙලා තියෙනවද මුල් අවස්ථාවේදී ඊජිප්තු

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජාතිකයෙක් වුණත් යූසුෆ් අල්කර්දාවි ඊජිප්තු රාජ්‍යයෙන් පිටුවහල් කළාට පස්සේ, එම රටට ඒම තහනම් කළාට පස්සේ ඔහු කටාර් රාජ්‍යයේ දිගටම ජීවත්වන බව?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එහෙමනම් ඔබට කියන්නට පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට තුන්වන අවස්ථාවේ කවර දිනකද යූසුෆ් අල්කර්දාවි කියන මේ මුස්ලිම් සහෝදරත්වය පිළිබඳ මතධාරියා පිළිබඳව සාක්ෂි අනාවරණය වෙලා තියෙන්නේ?

පි : 2020.07.04 වන දින.

ප්‍ර : මොනවද ඔහු දිවුරුම් මතද සාක්ෂි දීලා තියෙන්නේ?

පි : දිවුරුම් මත ඔව්. එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔහු මොනවද කියලා තියෙන්නේ මේ ගරු කොමිෂන් සභාවට?

පි : අල්කර්දාවි ඊජිප්තුවේ ඉපදුන බවත්, දැනට කටාර්හි ජීවත්වන බවත් පවසනවා. මුස්ලිම් සහෝදරත්වය පිළිබඳ කටයුතු කරනවා කියලා පවසනවා ස්වාමීනි. ගඩාෆි මරුමුවට පත් කිරීමට අදාළව ෆත්වා නිකුත් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : මේ යූසුෆ් අල්කර්දාවි කියන තැනැත්තා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : වෙන?

පි : ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලයේ නායක එම්.එන් අමීම් සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉනාමුල්ලා යන අය කටාර්හි ජීවත්වන අල්කර්දාවි සමඟ සාකච්ඡා කරනවා පිළිබඳවත් දැනුවත් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔහුව මුණ ගැහිලා තියෙනවා කියලා සාක්ෂි මත කියලා තියෙනවා නේද?

පි : ඔව්.

ප්‍ර : ඒ ඇරෙන්නට මේ තැනැත්තන්ව මේ යූසුෆ් අල්කර්දාවි සමඟ ඔය සඳහන් කරපු ශ්‍රී ලාංකිකයින් දෙදෙනාව යම් ඡායාරූපයක් එහෙම හඳුනාගෙන ඒ පිළිබඳව මේ ගරු කොමිෂන් සභාව දැනුවත් කරලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒක මොන ප්‍රදර්ශන භාණ්ඩය මගින්ද ඒ ගැන ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමු කරලා තියෙන්නේ?

පි : ඡායාරූපයක් මගින් ස්වාමීනි.

ප්‍ර : මා කිව්වෝතින් නිවැරදිද C-611 කියන ඡායාරූපයේ C-611(d) කියන ස්ථානයේ යූසුෆ් අල්කර්දාවි සිටින බවත්, ඒ වගේම C-

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

611(a) කියන ස්ථානයේ සිටින තැනැත්තා එන්.එම්. අමීන් වශයෙන් හඳුනාගෙන ඇති බවත්, ඒ වගේම C-611(c) කියන ස්ථානයේ සිටින තැනැත්තා අර විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කරන ඉනාමුල්ලා මහතා බවට හඳුනාග�න තියෙන බවත් මේ සාක්ෂිකරු විසින්?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : එහෙමනම් ඔබ සූරවංශ මහත්මයා මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නේ ගරු කොමිෂන් සභාව ඉදිරියේදී 2020 ජූනි මස 13 වන දින සිය සාක්ෂියේදී ගරුතර ගලගොඩඅත්තේ ඥාණසාර ස්වාමීන් වහන්සේ විසින් උන් වහන්සේගේ සාක්ෂියේදී යූසුෆ් අල්කර්දාවි ඊජිප්තුව මුල් කරගෙන ඊජිප්තුවේ ඉඳලා ක්‍රියාත්මක වන ඉතාම දරුණු නායකයෙක් කියන එක සඳහන් කෙරුවත් මේ ගරු කොමිෂන් සභාවට ප්‍රමාණවත් ආකාරයට එම දැඩි මතධාරියා මුස්ලිම් සහෝදරත්වය පිළිබඳ මතධාරියා ඊජිප්තුවේ වෙසෙන්නේ නැති බවත්, ඔහු එම රාජ්‍යයෙන් පළවා හැර ඇති බවත්, එසේම ඔහු වර්තමානයේ කටාර් රාජ්‍යයේ ඉඳලා සිය දැඩි මේ මුස්ලිම් සහෝදරත්වය පිළිබඳ මතයන් ඒ ආගමික මතය ඉදිරියට ගෙන යමින් කටයුතු කරන බවටත් ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වෙලා තියෙනවා කියලද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : හොඳයි. ඒ වගේම මම කැමතියි ඔබෙන් දැන ගන්නට 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා පාස්කු ඉරිදා ප්‍රහාරය සිදුවන අවස්ථාව වනවිට ශ්‍රී ලංකාවේ ගරු ජනාධිපති ලෙස එම තනතුර දැරූ මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා විසින් කිසියම් මාධ්‍ය නිවේදනයක් එතුමා විසින් හෝ එතුමාගේ මාධ්‍ය ඒකකය විසින් නිකුත් කරලා තියෙනවද කියලා ඔබ දන්නවද?

පි : නිකුත් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ කුමක් ගැනද?

පි : අර ලෝක මුස්ලිම් ලීගය විසින් ශ්‍රී ලංකාවට ලබා දුන් ඩොලර් මිලියන පහක් ආධාරය පිළිබඳව ස්වාමීනි.

ප්‍ර : දැන් එයට අදාළව සාක්ෂි මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ යම් අවස්ථාවකදී මෙහෙයවීමක් සිදු වුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කවදාද? මා කිව්වොතින් හරිද ඒ 2020 ජූනි මාසේ 26 වෙනිදා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එදින සඳහන් වුණ කරුණ වුණේ මොකද්ද? ඒ සාක්ෂිය? ලෝක මුස්ලිම් ලීගය කියන සංවිධානය විසින් ශ්‍රී ලංකාවට ඇමෙරිකානු ඩොලර් මිලියන පහක් ආධාර වශයෙන් ලබා දුන්නා. එම චෙක්පතෙහි අනුරුවක් එවකට ගරු ජනාධිපතිවරයා වූ මෛත්‍රිපාල සිරිසේන මැතිඳුන්ට භාර දුන්නාය කියලා නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඒ පිළිබඳවද ඔබ ඔය කියන මාධ්‍ය නිවේදනය නිකුත් වෙලා තියෙන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එය ඔබ ළඟ දැන් තියෙනවද?

පි : තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒක නිකුත් කරලා තියෙන්නේ කවදද?

පි : 2020.07.03 වෙනි දින.

ප්‍ර : 2006.07.03 වෙනි දින?

පි : 2020.07.03 වෙනිදා.

ප්‍ර : 2020.07.03 වෙනිදා?

පි : එහෙමයි.

ප්‍ර : එයට, එම මාධ්‍ය නිවේදනයට යම් ඇමුණුමක් තියෙනවද?

පි : තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ ඇමුණුම කුමකට අදාළවද නිකුත් කරලා තියෙන්නේ? මොකද්ද ඒ ඇමුණුම? කා විසින් කා හට ලියලා තියෙන එකක්ද කියලා කිව්වා නම් හරි?

පි : මුස්ලිම් ලීග් එක ඒ.ජේ.එම්. මුසාම්මිල් මහතාට යොමු කරන ලදී.

**(ස්වාමීනි මෛත්‍රිපාල සිරිසේන මැතිඳුන්ගේ මාධ්‍ය ඒකකය මඟින් නිකුත් කරනු ලැබූ බවට දැක්වෙන මෙම මාධ්‍ය නිවේදනය C-821 වශයෙනුත්, ඒ වගේම ස්වාමීනි එයට ඇති ඇමුණුම C-821(a) වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)**

ප්‍ර : ඒ C-821 කියන මෛත්‍රිපාල සිරිසේන මැතිඳුන්ගේ මාධ්‍ය ඒකකය මඟින් නිකුත් කරලා තියෙන මෙම නිවේදනය මඟින් මොකද්ද දැනුම් දීලා තියෙන්නේ?

පි : අදාළ මුදල නොලැබුණු බවත්, ඒ සඳහා ශ්‍රී ලංකාව විසින් සැපයිය යුතු කරුණු හතක් පිළිබඳව දන්වලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : මොනවද ඒ කරුණු, ඒක ඒ කියන්නේ ශ්‍රී ලංකාවෙන් එම තොරතුරු සපයලා නැද්ද මේ ලෝක මුස්ලිම් ලීගයට?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සපයලා නැහැ ස්වාමීනි.

ප්‍ර : මොනවද ඒ සපයලා නැති කරුණු?

පි : ප්‍රහාරය හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව.

ප්‍ර : ඔව් එක. දෙක?

පි : මිය ගිය අයගේ ආගම.

ප්‍ර : තුන?

පි : මිය ගිය සහ තුවාල ලැබූවන්ගේ නාම ලේඛනය.

ප්‍ර : හතරවෙනි කරුණ?

පි : ප්‍රහාරය හේතුවෙන් සහ ඊට අදාළව හානියට පත් දේපළෙහි වටිනාකම.

ප්‍ර : පහ?

පි : වැන්දඹුවන් සහ අනත්දරු සංඛ්‍යාව.

ප්‍ර : හයවන කරුණ?

පි : වෙනත් අදාළ තොරතුරු.

ප්‍ර : හත්වන කරුණ මොකද්ද?

පි : ජනාධිපති හෝ අගමැතිගේ පුණ්‍යාධාර ගිණුම් අංකය.

ප්‍ර : එම කරුණු සම්පූර්ණ කරමින් ඒ තොරතුරු ලබා දීලා නැති නිසා තවමත් ශ්‍රී ලංකා රජය වෙත ඒ ඩොලර් මිලියන පහ, ඇමෙරිකානු ඩොලර් මිලියන පහ ලබා දීලා නැති බවද එහි සඳහන් කරන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ කිව්වනේ ඒ සමඟ ඇමුණුමක් තියෙනවාය කියලා. එය ඔබ දැන් ලකුණු කරලා දැන් ඉදිරිපත් කළා C-821(a) වශයෙන් නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම ඔබ කිව්වා මේක ලෝක මුස්ලිම් ලීගයේ Secretary General is මහ ලේකම් විසින් ඒ.ජේ.එම්. මුසම්මිල් මැතිතුමා වෙත යොමු කරලා ඇති ලිපියක් නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එමගින් තහවුරු වෙනවද ශ්‍රී ලංකාව විසින් ඔබ අර C-821 හි සඳහන් කරපු කරුණු හතට අදාළ කරුණු ඔවුන් වෙත සැපයිය යුතුයි එම ඇමෙරිකානු ඩොලර් මිලියන පහක ආධාර මුදල ලබා දීමට කියලා?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : එතකොට එහෙමනම් මේ ලේඛන දෙකම බැලුවහම පෙනී යන්නේ සූරවංශ මහත්මයා ශ්‍රී ලංකාවේ එවකට ගරු ජනාධිපතිතුමා වෙත ඇමෙරිකානු රුපියල් මිලියන පහක

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වෙක්පතක අනුරුවක් ලෝක මුස්ලිම් ලීගය විසින් භාරදෙනු ලැබුවේ වුවද, ශ්‍රී ලංකාව විසින් ඔබ සඳහන් කරන්නට යෙදුණු කරුණු හතට අදාළ තොරතුරු නොසැපයීමේ හේතුවෙන් මේ වනතුරුත් එම මුදල ශ්‍රී ලංකාවට ලැබී නොමැති බවද?

පි : ලැබිලා නැහැ ස්වාමීනි.

එපමණයි ස්වාමීනි.

**********

**ගරු සභාපතිතුමා :**

සාක්ෂිකරු මුදා හරිමි.

**කොමිෂන් සභාව නැවත ජූලි මස 07 වන දින ප.ව. 12.30 ට රැස් වේ.**

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

# 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.07 වේලාව: ප.ව 1.40

සටහන් කළේ - නිල්මිණි කුමාරි විසිනි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

**පෙනී සිටීම**

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

Resident Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**<u>සාක්ෂි කැඳවීම ආරම්භ කරමි.</u>**

| | | |
|---|---|---|
| **සාක්ෂි අංකය** | : | 983 |
| **නම** | : | **දහනායක මුදියන්සේලාගේ නුවන් බණ්ඩාර නවරත්න** |
| **වයස** | : | **අවු 25යි** |
| **ජාතිය** | : | **සිංහල** |
| **ආගම** | : | **බුද්ධාගම** |
| **දැනට දරණ තනතුර** | : | **වෙළඳ සහායක** |
| **රැකියා ස්ථානය** | : | **ජයසුන්දර ටෙක්ස්ටයිල්ස්, රේනදපොල වත්ත, ගිරිඋල්ලගම, දිවුල්දෙණිය, මීරිගම.** |

**ප්‍රතිඥා දී කැඳවයි.**

**<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>**

ප්‍ර: මහත්මයා ඔබ උපත ලැබුවේ කුමන ගම් පළාතේ ද?

පි: කුරුණෑගල දිස්ත්‍රික්කයේ වතුවත්තේගම.

ප්‍ර: උසස් පෙළ යනකම් ඔබ අධ්‍යාපනය ලැබුවේ කුමන පාසලකින්ද?

පි: උසස් පෙළ අධ්‍යාපනය හැදෑරුවේ ඇහැටු වැව බණ්ඩාරනායක නවෝද්‍යා පාසලින්.

ප්‍ර: උසස් පෙළ කරලා ඉවර වුණේ කොයි කාලේද?

පි: 2010 වර්ෂයේ.

ප්‍ර: උසස් පෙළ කරාට පස්සේ නුවන් ඔයා තමන්ගේ රැකියාව විදිහට තෝරගත්තේ මොකක්ද?

පි: කැන්ඩි ආයතනයේ වෙළඳ සහායක රැකියාවක් විදිහට Kandy Textiles කිව්වොත් හරි?

පි: ඔව්.

ප්‍ර: මේ කැන්ඩි ආයතනය කොහේද තියෙන්නේ?

පි: කඩවත ප්‍රදේශයේ.

ප්‍ර: කොච්චර විතර කාලයක් නුවන් රාජකාරි කරාද?

පි: ඇවුරුදු 4ක පමණ කාලයක්

ප්‍ර: Kandy Textiles ආයතනයේ කුමන තනතුරක් ද ඔයා දැරුවේ ?

පි: වෙළඳ සහායක තනතුරක්.

ප්‍ර: Kandy Textiles ආයතනයෙන් ඉවත් වුණේ කොයි කාලේ ද?

පි: 2016 වර්ෂයේදී.

ප්‍ර: ඉන් පසුව ඔබ වෙනත් පෞද්ලික ආයතනයක් සමඟ සම්බන්ධ වෙනවද?

පි: සම්බන්ධ වෙනවා.

ප්‍ර: මොකක්ද ඒ ආයතනය?

පි: Max Beverageආයතනය

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ Max Beverage ආයතනයේ කොච්චර කල් වැඩ කරනවද?

පි: එකේ මාස 9ක් පමණ කාලයක්.

ප්‍ර: ඊට පස්සේ කුමන ආයතනයට ද යන්නේ ?

පි: 2017 වර්ෂයේදී මං Jayasundara Textiles ආයතනයට.

ප්‍ර: Jayasundara Textiles ආයතනයට 2017 වර්ෂයේ කොයි කාලේද සම්බන්ධ වෙන්නේ ?

පි: 2017 වර්ෂයේ

ප්‍ර: 2017 වර්ෂයේ කොයි කාලේ ද ඔබ සම්බන්ධ වෙන්නේ ?

පි: මාර්තු මුලම.

ප්‍ර: දැන් 2017 මාර්තු ඉඳලා මේ වෙනකම් ඔබ ඔය Jayasundara Textiles කියන ආයතනයේ රැකියාව කරනවා කිව්වොත් නිවැරදිද ?

පි: නිවැරදියි ස්වාමීනි.

ප්‍ර: නුවන්ට කියන්න පුළුවන් ද ඔබ සම්බන්ධ වුණේ කුමන තනතුරකින්ද කියලා මේ Jayasundara Textiles ආයතනයට?

පි: අංශ ප්‍රධානී තනතුරට.

ප්‍ර: එතකොට මේ Jayasundara Textiles කියන ආයතනයේ හිමිකරු කවුද?

පි: ජගත් ජයසුන්දර මහත්මයා.

ප්‍ර: මේ Jayasundara Textiles කියන්නේ කුමන ආකාරයේ ව්‍යාපාරයක්ද?

පි: රෙදිපිළි ආයතනයක්.

ප්‍ර: රෙදිපිළි විකිණීම සිද්ධ කරනවද?

පි: ඔව්.

ප්‍ර: මිලදී ගැනීම සහ විකිණීම කරන ආයතනයක්?

පි: ඔව්.

ප්‍ර: මේ Jayasundara Textiles ආයතනය කොහේද පිහිටලා තියෙන්නේ ?

පි: ගිරිඋල්ල ප්‍රදේශයේ.

ප්‍ර: ගිරිඋල්ල ප්‍රදේශය කියන්නේ හරියටම ස්ථානය ඔබට කියන්න පුළුවන්ද මොන පාරට මුහුණලාද පිහිටලා තියෙන්නේ කියලා?

පි: අංක 5 කොළඹ පාරේ, ගිරිඋල්ල නගරයේ මෙහායින් තියෙන්නේ. ඒ කියන්නේ මෙහායින් පාලමට

ප්‍ර: ඒ කියන්නේ කොළඹ , කුරුණෑගල ප්‍රධාන මාර්ගයට මුහුණලා ද මේ Jayasundara Textiles කියන ආයතනය පිහිටලා තියෙන්නේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට මේ Jayasundara Textiles කියන ආයතනය ගිරිඋල්ල නගරයට එන්නට කළින්ද නැත්නම් ගිරිඋල්ල නගරය පැත්තට ප්‍රථමව කොළඹ දෙසට වෙන්නද තියෙන්නේ ?

පි: ගිරිඋල්ල නගරයට ප්‍රථමව කොළඹ දෙසට වෙන්න.

ප්‍ර: මේ Jayasundara Textiles ආයතනය ඒ කියන්නේ ගම්පහ දිස්ත්‍රික්කයට අයිති වෙනවා කිව්වොත් හරිද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව් ගම්පහ දිස්ත්‍රික්කයට අයිති වෙන්නේ.

ප්‍ර: පොලිස්බල ප්‍රදේශ එහෙම දන්නවද ඒ අයත් වෙන?

පි: මීරිගම බල ප්‍රදේශය.

ප්‍ර: මේ Jayasundara Textiles කියන රෙදිපිළි ආයතනය මහල් කීයකින් විතර ගොඩනැඟිල්ලක් ද මෙහි තියෙන්නේ ?

පි: මහල් 4කින් යුක්ත වෙනවා.

ප්‍ර: මහල් 4ක්?

පි: මහල් 4ක්

ප්‍ර: බිම් මහලේම මොනවද සිද්ධ වෙන්නේ ?

පි: බිම් මහලේම මුදල් අයකැමි යන්ත්‍රය තියෙනවා. ඒවාගේම cosmetic ඒ අංශයේ තියෙනවා. Toys Item ඒ අංශයේ තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ සෙල්ලම් බඩු විකුණනවා , මුදල් අයකැමි ඉන්නවා සහ තව?

පි: cosmetics

ප්‍ර: cosmetic Items විකුණනවා?

පි: ඔව්.

ප්‍ර: බිම් මහලට උඩ මහලේ ඒ කියන්නේ 1st floor පළමු මහලේ මොනවද තියෙන්නේ?

පි: කාන්තා ඇඳුම් අංශය.

ප්‍ර: කොච්චර විතර ඇඳුම් Variety එකක් ඒ කියන්නේ කුඩා ළමයින්ගේ ඒවාත් ඔය අස්සේම ද තියෙන්නේ කාන්තා ඇඳුම් අංශයේම ද නැත්නම් ඒවා වෙනමද තියෙන්නේ ?

පි: ඒවා වෙනම අංශයක.

ප්‍ර: කුඩා ළමුන්ගේ ඇඳුම් තියෙන්නේ මොන මහලේද?

පි: දෙවැනි මහලේ.

ප්‍ර: එතකොට 3 වෙනි මහලේ තියෙන්නේ මොනවද තියෙන්නේ මහත්මයා?

පි: කාර්යාල අංශයයි. ගබඩා අංශයයි.

ප්‍ර: එතකොට 3 වෙනි මහලට සාමාන්‍ය අයට යන්න බැහැ. වැඩ කරන කට්ටිය පමණයි ද යන්න පුළුවන්?

පි: Supplyලට යන්න පුළුවන්. ඊට අමතරව වෙන පුද්ගලයින්ට යන්න බැහැ.

ප්‍ර: සාමාන්‍යයෙන් ඇඳුම් මිලදී ගන්න පුද්ගලයින් ඔය 3 වෙනි මහලට යන්නේ නැහැ කිව්වොත් නිවැරදිද?

පි: ඔව්.

ප්‍ර: සාමාන්‍යයෙන් මේ Jayasundara Textiles කියන ආයතනය උදේ විවෘත කරන්නේ කීයට විතරද?

පි: උදෑසන 9ට.

ප්‍ර: හවස කීය වෙනකම් වැඩකරනවද?

පි: රාත්‍රී 9 පමණ වෙනකම්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: රාත්‍රී 9 විතර වෙනකම් ඇරලා තියෙනවා?

පි: ඔව්.

ප්‍ර: දැන් අපි හිතමු අවුරුදු සීසන් කාලයක් කියලා එතකොට නුවන් මේක කෙව්චර විතර වෙලාවක් යනකම් විවෘතව තියෙනවද?

පි: ඒක පාන්දර සමහර විට 12ත් 1ත් ඒවගේ වෙලාව විතර වෙනකම් තියෙනවා.

ප්‍ර: 2019 අප්‍රේල් 19 විතර වෙනකොට ඒ දිනය වෙනකොට Jayasundara Textiles ආයතනයට අනුබද්ධව ඔයාට පැවරිලා තිබ්බ රාජකාරි මොනවද නුවන්?

පි: කාන්තා ඇඳුම් අංශයේ අංශ ප්‍රධානි තනතුර.

ප්‍ර: නැවත කියන්න.

පි: කාන්තා ඇඳුම් අංශයේ ප්‍රධානි

ප්‍ර: ඒ කියන්නේ ඔබ දැන් විස්තර කරානේ පළවෙන් මහලේ තමයි මේ කාන්තා ඇඳුම් තියෙන්නේ කියලා Jayasundara Textiles ආයතනයේ?

පි: ඔව්

ප්‍ර: එතකොට ඒ පළවෙනි මහල භාරව සිටියේ ඔබ ද?

පි: ඔව්.

ප්‍ර: ඔබ යටතේ තව කවුද හිටියේ රාජකාරි කරන්න. කවුරුහරි හිටියද?

පි: සේවකයෝ 7 දෙනෙක් පමණ හිටියා.

ප්‍ර: 2019 අප්‍රේල් 19 වෙනිදින ඔබට මතකද හවස්වරුවේ යම්කිසි මුස්ලිම් ජාතික කාන්තාවන් කිහිප දෙනෙක් සහ තවත් පුද්ගලයෙක් ඔබලාගේ රෙදිපිළි ආයතනයට ආවා ඇඳුම් මිලදී ගැනීම සඳහා?

පි: මතකයි.

ප්‍ර: ඔබට ඔවුන්ගේ ස්වභාවය පොඩ්ඩක් රූප පැහැදිලි කරන්න පුළුවන්ද?

පි: ගැහැණු කට්ටිය 3 දෙනෙක් ආවා. ඒ 3දෙනා අබායා ඒ කියන්නේ මුහුණු ආවරණයත් සමඟම මේ ඇතුළු වුණේ. ඊට අමතරව පිරිමි පුද්ගලයෙක් ආවා. කුඩා ළමයෙකුත් හිටියා එයා අතේ. සුදු පාට කළු පාට ඉරි ටී-ෂර්ට් එකකුයි සරමක් ඇඳලා හිටියා නිකන් නිල් පාටට හුරු.

ප්‍ර: ඒ වගේ තමයි ඔබට මතක දැන් මේ Jayasundara Textiles ආයතනයේ CCTV කැමරා පද්ධතියක් තියෙනවද නුවන්?

පි: තිබෙනවා.

ප්‍ර: ඒ CCTV කැමරා පද්ධතිය සාමාන්‍යයෙන් නිරන්තරයෙන්ම වීඩියෝ record වෙමින්ද පවතින්නේ ?

පි: සති 2ක පමණ ඒවා ගන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව ඒ CCTV record එකෙන් ගත්ත ඔබලාගේ ආයතනයේ තියෙන CCTV දර්ශනයක් පෙන්නුවොත් ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තිබෙනවද?

පි: පුළුවන්.

FAIR COMMENT BY JEZEEM

ස්වාමීනි සාක්ෂිකරුට CCTV දර්ශනයක් පෙන්වා සිටීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර: හරි මහත්මයා මේ දැනට තිරයේ දැක්වෙන දර්ශනය හොඳන් නිරීක්ෂණය කරන්න. මේ තිරයේ දැක්වෙන්නේ ඔබගේ ආයතනයේ CCTVපද්ධතියෙන් ලබාගත් CCTV දර්ශනයක් යැයි ඔබට හඳුනා ගැනීමට හැකියාවක් තිබෙනවද?

පි: තිබෙනවා.

**ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම CCTV දර්ශන අඩංගු දර්ශන තැටිය C – 822 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.**

ප්‍ර: මහත්මයා මේ තිරය පරීක්ෂා කරලා බලන්න.මේ තිරයේ මේ කහ පාට ගොඩනැඟිල්ලක් කහපාට කණුවක් වගේ දැක්වෙනවා?

පි: දැක්වෙනවා.

ප්‍ර: ඒ දැක්වෙන්නෙත් ඔබ ගේ ආයතනයමද?

පි: ඔව් අපේ ආයතනයේ බෑග් කවුන්ටර්

ප්‍ර: මේ ආයතනය දිගටම තියෙනවද ඒ කොනටම යනකම් නැත්නම් කොතෙන්ට එනකම් ආයතනය තියෙනවද?

පි: ඒ කහපාට බෑග් කවුන්ටර් එක තියෙන තැන යනකම් ආයතනයේ පාර.

ප්‍ර: මේ කැමරා එක තියෙන්නේ ඒ කොනේමද?

පි: ඔව් ආයතනයේ මෙහා කෙළවරේ.

ප්‍ර: අනිත් කෙළවරේ. ඒ අනුව දැන් ඊට වම්පසින් දැක්වෙනවා තිරයේ පාරක්. ඒ මොකක්ද ඒ පාර මහත්මයා?

පි: ඒ කොළඹ කුරුණෑගල අංක 5 ප්‍රධාන මාර්ගය.

ප්‍ර: A5 කියන ප්‍රධාන මාර්ගය කිව්වොත් නිවැරදිද?

පි: නිවැරදියි.

ප්‍ර: දැන් මේ තිරයේ මහත්මයා උඩ කොනේ දැක්වෙනවා දිනයක් ඒ කීයද? කවද්ද කියලා ද දැක්වෙන්නේ? පේනවද ඔයාට?

පි: ඔව්. 4.19

ප්‍ර: 2019.04.19 ලෙස තිරයේ සඳහන් වෙනවා. වේලාව වශයෙන් සඳහන් වෙන්නේ කීයට විතර ද?

පි: 18.32

ප්‍ර: 18.34 කිව්වොත් නිවැරදිද?

පි: ඔව්.

ප්‍ර: දැන් මහත්මයාට නිරීක්ෂණය වුණා ද සිදු පැහැකි වෑන් රථයක් පැමිණියා?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ මොකක්ද නිරීක්ෂණය වුණේ. මේ දොරක් ඇරගෙන පුද්ගලයෙක් එළියට බහිනවා නේද?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඔබට ඒක නිරීක්ෂණය කරන්න පුළුවන් ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්

ප්‍ර: ඉන් පස්සේ මොකක්ද වෙන්නේ ?

පි: එයා ගිහිල්ලා ඒ පැත්තේ දොර අරිනවා.

ස්වාමිනි C- 822 වශයෙන් ලකුණු කරපු CD තැටියේම ඇති තවත් වීඩියෝ දර්ශනයක් සාක්ෂිකරුට පෙන්වීමට අවසර පතනවා.

ප්‍ර: දැන් මහත්මයාට මොකක්ද නිරීක්ෂණ වෙන්නේ මේ තිරයේ ?

පි: වාහනයෙන් පැමිණි පිරිසක් සහ මුස්ලිම් කාන්තාවන්.

ප්‍ර: කීදෙනෙක්?

පි: එතන 3දෙනෙක්.

ප්‍ර: දැන් ඔවුන් මේ කොයි දෙසටද ඇවිදගෙන යන්නේ ඔබට පෙනුනානේ දැන් ඔවුන් ඇතුළට වගේ යනවා? කොයි දෙසට යන්නේ?

පි: අපේ ආයතනයේ ප්‍රධාන දොරටුව ගාවට.

ප්‍ර: ඔබලාගේ Jayasundara Textiles ආයතනයේ ප්‍රධාන දොරටුව තියෙන්නේ එම ස්ථානයේද?

පි: ඔව්.

ප්‍ර: කාන්තාවන් කීදෙනෙක් ඇතුළුට ගියාද?

පි: තිදෙනෙක්

ප්‍ර: ඔවුන්ගේ ඇඳුමේ යම්කිසි විශේෂත්වයක් තිබෙනවද?

පි: සම්පූර්ණම ආවරණය කරලා තියෙන්නේ.

ප්‍ර: සම්පූර්ණම කළු පැහැති ඇඳුමක් ඇඳගෙන ගියා කියලා කිව්වොත් නිවැරදියි?

පි: අබායක්.

ප්‍ර: අබායක් ඇඳගෙන යනවා කියලා ඔබ කියන්නේ ?

පි: ඔව්

ප්‍ර: ඔවුන් මුහුණත් ආවරණය කරගෙන මුහුණත් පෙන්නේ නැති විදිහට ආව කිව්වොත් හරිද?

පි: නිවැරදියි.

ස්වාමීනි තවත් එම C- 822ක CD තැටිය තුලම ඇති තවත් දර්ශනයක් සාක්ෂිකරුට පෙන්වා සිටී.

ප්‍ර: දැන් මහත්මයා මේ දර්ශනය මේ කොහේද මේ දර්ශනය දැක්වෙන්නේ?

පි: ආයතනයේ පළමු මහලට ඇතුළු වෙන පඩිපෙළ.

ප්‍ර: ඒ කියන්නේ ඔබ ඔය කළින් සඳහන් කරපු කාන්තා නිමි ඇඳුම් තියෙන මහලද?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: මේ පඩිපෙළෙන් එන්නේ ඔය එනවා නිරීක්ෂණය වෙන්නේ කවුරුන්ද?

පි: වාහනයේ රියදුරු මහතා.

ප්‍ර: ඔහු සමඟ තව කවුද මේ පැමිණෙන්නේ?

පි: වාහනයේ ආපු මුස්ලිම් කාන්තාවන් තුන්දෙනා.

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: දැන් මේ එක කාන්තාවක් මේ කාන්තාව ගැන ඔබට මොකක්ද නිරීක්ෂණය කරන්න පුළුවන්? අර පසුපසින් යන කාන්තාව?

පි: කුඩා දරුවෙක් අතේ තියාගෙන

ප්‍ර: කුඩා දරුවෙකුත් වඩාගෙන තමයි එන්නේ. දැන් මේ අවස්ථාවේදී මේ පුද්ගලයින් එනකොට ඔබ රාජකාරි කරමින් හිටියේ කුමන මහලේද?

පි: පළමු මහලේ.

ප්‍ර: නුවන් දැන් මේ පුද්ගලයෝ ආවාට පස්සේ ඔබලාගෙන් මුලින් මොනවාහරි ඇහුවද මේ ඇඳුම් තියෙන්නේ කොහේද හරි යම්කිසි කතා බහක් ඇතිවුණාද?

පි: එහෙම ඇතිවීමක් වුණේ නැහැ.

ප්‍ර: මොකක් ද ඔවුන් ආපු ගමන්ම මුලින්ම කළේ?

පි: සුදු ඇඳුම් අලුතින් රැක් වලට දමා දමා හිටපුside එකට ආවා.

ප්‍ර: ඒ කියන්නේ දැන් මේ කාන්තා ඇඳුම් අංශයනේ. ඔවුන් ඊට කළින් වෙන කොහොවත් නැවතුණේ නැද්ද?

පි: මගේ මතකයේ හැටියනම් නැහැ.

ප්‍ර: කෙළින්ම ආවා මේ කාන්තා ඇඳුම් අංශයට?

පි: ඔව්

ප්‍ර: එහිත් ඊට පස්සේවත් ඔබලාගේ වෙළඳ සහායකගෙන්වත් ඔබගෙන්වත් කිසිම කතාබහක් ඇති වුනේ නැහැ නේද?

පි: නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔහුන් කොහාද මුලින්ම ගියේ?මහත්මයා මෙම වීඩියෝව පරීක්ෂා කරන්න. මෙම වීඩියෝව කොහේද තියෙන්නේ? මේ CCTV දර්ශනය

පි: අපේ අංශයේ දෙවැනි මහලට නඟින පඩිපෙල ගාව.

ප්‍ර: මේතියෙන්නේ පළවෙනි මහලේ ඉඳලා ඒ කියන්නේ කාන්තා නිමි ඇඳුම් අංශයේ ඉඳලා දෙවන මහළට යන පඩිපෙළ. ඒ කියන්නේ මේ තවම පළවෙනි මහලේ CCTV දර්ශනයක් තමයි අපිට දැන් මේ පෙන්නේ?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: දැන් මහත්මයාට මොනවද නිරීක්ෂණය වෙන්නේ තිරයේ ?

පි: එම කාන්තාවන් ඇවිල්ලා අපේ ළමයි ඇවිල්ලා මේ සාමාන්‍යයෙන් අලුතින් අංශයට දමනු ලබන Item තියෙනවා සුදු ඇඳුම්. ඒ කියන්නේ වෙසක් සතිය හින්දා. ඒ දමන අවස්ථාවේ එතන මේ ටැග් ගසමින් ඉන්න තැනට ඇවිල්ලා තෝරා ගන්නා ඒ කියන්නේ මේ Item වලිනුත් ඇවිල්ලා.

ප්‍ර: දැන් ඔබලා මේ ඇයි එකපාරටම ඇඳුම් දැන් අපිට නිරීක්ෂණය වෙනවා එල්ලලා තියෙන ස්ථාන තියෙනවා. මේ ඇඳුම් ඇයි එක තැනක ගොඩ ගහලා තියෙන්නේ? කුමන හේතුවක් නිසාද?

පි: ඒ කියන්නේ ටැග් ගැසීම සඳහා. ඒ කියන්නේ උඩින් අලුතින් ගේන Item ඒ කියන්නේ Stock අංශයෙන් ගේන Item..

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මේ ඇත්තටම ඇයි මේ Stock එකෙන් සුදු පාට Stock එකක් ඔයගොල්ලෝ ගෙනවාවේ?

පි: වෙසක් සතිය ළඟ එන හින්දා.

ප්‍ර: වෙසක් උත්සවය සඳහා ද මේ සුදුපාට ඇඳුම් ගෙනාවේ විකුණන්න?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: එතකොට මේවා ටැග් කරලාවත් නැද්ද මේ වෙනකොට?

පි: ටැග් ගසලා නැහැ. ඒ කියන්නේ ආරක්ෂිත ටැග් එක සවිකරලා නැහැ.

ප්‍ර: ඒ වෙනකොට ටැග් කරලාවත් නැහැ. ඔබලා තාම ඇඳුම් දාපු තැනම තමයි තිබ්බේ කිව්වොත් හරිද?

පි: නිවැරදියි.

ප්‍ර: මහත්මයා මේ පුද්ගලයින් විමසීමක් කරේ නැද්ද ඔබගෙන් හෝ ඔබගේ යටතේ ඉන්න තව සේවකයින්ගෙන් මුස්ලිම් ජාතිකයන් සාමාන්‍යයෙන් මුස්ලිම් කාන්තාවන් අඳින සාම්ප්‍රදායික ඇඳුම් ගන්න තියෙනවද ඒවා කොහේද ගන්න තියෙන්නේ කියන එක සම්බන්ධයෙන් විමසීමක් කරේ නැද්ද?

පි: එහෙම විමසීමක් කළේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔවුන් කෙළින්ම ආවේ මෙම ස්ථානයට.

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: දැන් සාමාන්‍යයෙන් ඔබලාගේ ඔය Jayasundara Textiles කියන ආයතනයට මුස්ලිම් කාන්තාවන් ඇඳුම් ගන්න එහෙම මිලදී ගන්න එනවද?

පි: සමහර විට පැමිණෙනවා.මොකද එම ප්‍රදේශයෙත් ඉන්නවා මුස්ලම් ජාතිකයෝ.

ප්‍ර: මුස්ලිම් ජාතිකයෝ ඉන්නවද ඔය ගිරිඋල්ල ප්‍රදේශයේ?

පි: බම්මන්න, නාරම්මල ඒවගේ ප්‍රදේශවල ඉන්නවා.

ප්‍ර: මුස්ලිම් ජනතාව ඉන්නවා.?

පි: ඔව්.

ප්‍ර: ඒ අනුව සාමාන්‍යයෙන් මුස්ලිම් කාන්තාවන් පැමිණෙනවද?

පි: පැමිණෙනවා.

ප්‍ර: දැන් ඒ අනුව මුස්ලිම් ජනාතවටම මුස්ලිම් ජාතිකයන්ටම අනන්‍ය වූ ඔවුන්ගේ ඇඳුම් තියෙන ප්‍රදේශයක් තියෙනව ද මේ ඔබලාගේ පළවෙනි මහල තුළ?

පි: වෙනම අංශයක් ස්ථාපනය කරලා නැහැ. නමුත් අර Item තියෙන තැන් වලම දමලා තියෙනවා ඒවා ගෙනියන්න.

ප්‍ර: ඒ කියන්නේ මොනවගේ Item ද තියෙන්නේ?

පි: අබායා, පංජාබ් , ලෙගින්ස් ඒවගේ එක තියෙනවා. එයාලා මේ අඳින්න ගන්නවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මුස්ලිම් ජනතාව මිලදී ගන්නවා. දැන් මේ පින්තූරය අනුව ඔබට කියන්න පුළුවන්ද සාමාන්‍යයෙන් කොයි පැත්තේ විතර ද තිබ්බේ කියලා?

පි: මෙම ස්ථානයේ නෙමෙයි තියෙන්නේ.

ප්‍ර: පෙන්නේ නැහැ. හරි

ප්‍ර: දැන් මෙම ස්ථානයේ ද දැන් මම ඔබගෙන් ඇහුවේ කළින් ඔබ සඳහන් කරානේ මුස්ලිම් ජනතාවටම ආවේණික වූ ඇඳුම් තියෙන ප්‍රදේශයක් තියෙනවා කියලා. මේ Jayasundara Textiles ආයතනය ඇතුලේ ?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒ ස්ථානය ඒ මුස්ලිම් ජනාතවට අනන්‍ය වූ ඇඳුම් තියෙන ස්ථානය මෙම වීඩියෝ දර්ශනයෙන් පේනවද කියලා මම ඔබෙන් ඇහුවේ?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: ස්වාමීනි තවත් වීඩියෝ දර්ශනයක් සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර පතනවා. මේ කොහේද මේ මහත්මයා දැක්වෙන්නේ ?

පි: පළමු මහලේ Fit-on rooms

ප්‍ර: ඔබට දැන් කුමක්ද නිරීක්ෂණය වෙන්නේ ?

පි: ඒ කියන්නේ තෝරා ගත්ත ඇඳුම් ටික අරගෙන එයාල Fit-onකරන්න බලන්න Fit-on rooms වලට අරගෙන යනවා.

ප්‍ර: ඒ ආපු කී දෙනෙක් Fit-on rooms ඇතුළට ගියාද දැන්?

පි: තිදෙනෙක්.

ප්‍ර: තිදෙනෙක් Fit-on rooms දෙකකට ගියාද?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඔවුන් Fit-on room එකට යනවිට මොනවද මහත්මයා අතේ තියාගෙන යන්නේ ?

පි: සුදු ඇඳුම්

ප්‍ර: මෙම වීඩියෝවෙනුත් ඔබට පේනවද මුස්ලිම් ජනතාවටම ආවේණික වූ ඇඳුම් තියෙන ස්ථානය පේනවද?

පි: නැත

ප්‍ර: මේ කොහේද මහත්මයා මේ කැමරා දර්ශනයෙන් ? (ස්වාමීනි සාක්ෂිකරුට තවත් CCTV දර්ශනයක් පෙන්වා සිටිනවා) මහත්මයා මේ දර්ශනයෙන් කොහේද පෙන්නේ ?

පි: අපේ අංශයේ සුදු ඇඳුම් දමලා තිබෙන ස්ථානය සහ ඊට එහා ප්‍රදේශය.

ප්‍ර: ඔබට පෙන්වන්න පුළුවන්ද මේ අංශයෙන් මුස්ලිම් ජනතාවටම ආවේණික වූ ඔබ සඳහන් කළ පරිදි අබායා සහ ඊට අදාළ ලෙගින්ස් සහ ඒ ඇඳුම් තියෙන ප්‍රදේශය මෙතනින් පෙන්වන්න පුළුවන්ද?

පි: එකේ එහා කෙළවරට වෙන්න වගේ තියෙන්නේ.

ප්‍ර: ඒ කියන්නේ මේ ඩොට් එක තියෙන හරියෙන් වාගේ?

පි: ඔව් ඒ ඩොට් එක ගාව ඒ පැත්තට වෙන්න. ඒ කියන්නේ පංජාබි එහෙම

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ ප්‍රදේශයේ තමයි තියෙන්නේ?

පි: ඒ ප්‍රදේශයේ තියෙන්නේ

ප්‍ර: දැන් මොවුන් ඇඳුම් තෝරාගත්ත ප්‍රදේශය කොහේද තියෙන්නේ?

පි: ඒ මෙතන සුදු ඇඳුම් දමන ස්ථානයේ.

ප්‍ර: මේ ඩොට් එක තියෙන ස්ථානයේ කිව්වොත් ?

පි: නිවැරදියි.

ප්‍ර: ඔවුන් ඒ කියන්නේ මුස්ලිම් ජාතිකයන්ටම ආවේණික වූ ඇඳුම් තියෙන ප්‍රදේශයට ගියෙවත් නැහැ කියලා කිව්වොත් හරිද?

පි: නිවැරදියි.

ප්‍ර: මේ ආපු කාන්තාවන් තිදෙනාගෙන් එක් අයෙක් හරි ඔබත් සමඟ කතා බහක යෙදුණද හෝ ඔබගේ කාර්ය මණ්ඩලයේ කවුරුහරි සමඟ කතාබහක යෙදෙනවා ඔබ දැක්කද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: දැන් මහත්මයා ඔබ සඳහන් කරානේ සුදු ඇඳුම් මිළට ගත්තේ සුදු ඇඳුම් මොවුන් අතට ගත්තේ මෙන්න මේ දැනට දැක්වෙන ස්ථානයේදී කියලා?

පි: එසේයි.

ප්‍ර: එම ස්ථානයේ ඉඳලා බැලුවම සාමාන්‍යයෙන් පෙන්න තියෙනවද මුස්ලිම් ජාතිකයන්ට ආවේණික වූ අබාය , පංජාබි වගේ ඇඳුම් තියෙන ස්ථාන පෙන්න තියෙනවද?

පි: වීඩියෝ දර්ශනයේ කෙළවරට වෙන්න තියෙන තැනින් වම් පැත්තට වෙන්න වගේ තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ පේනවද බැලුවම සාමාන්‍යයෙන්?

පි: එතන පෙනෙන්නේ නැහැ සර්.

ප්‍ර: හැබැයි කාගෙන්වත් අහලා නැහැ මේ මුස්ලිම් ජනතාවට ආවේණික වූ ඇඳුම් තියෙවද කොහෙන්ද ගන්න පුළුවන් කියලා ඇහුවේවත් නැහැනේ?

පි: නැත.

ප්‍ර: මේ මුස්ලිම් ජාතක කාන්තාවන් තිදෙනා ඔබ සමඟ කතා නොකරට අර පිරිමි පුද්ගලයා ඒ වෙලාවේ ඔබ සමඟ කතා කරාද?

පි: මම ඇහුවා එයාගෙන් මේ එයාලා ඇඳුම් තෝර ගත්තුවා ඒවා දමා ගන්න බෑග් එකක් දෙන්න ද කියලා ඇහුවා.

ප්‍ර: දැන් මහත්මයා සඳහන් කරා ඔබ එම ආපු පිරිමි පුද්ගලයාගේ කාන්තාවෝ තිදෙනාත් සමඟ ආපු පිරිමි පුද්ගලයාගෙන් යම්කිසි විමසීමක් කරා කියලා මොකක්ද ඒ ඔබලා දෙදෙනනා අතර ඇති වෙච්ච කතාබහ මොකක්ද ?

පි: එයලා තෝරා ගත්ත ඇඳුම් දමා ගැනීමට බෑග්යක් දෙන්නද කියලා ඇහුවා මම.

ප්‍ර: ඔබ ඒ පිරිමි පුද්ගලයාගෙන් ඇහුවා?

පි: ඔව්.

ප්‍ර: එතකොට මොකක්ද ඔහු කිව්වේ?

FAIR COMMENT BY JEZEEM

පි: සාමාන්‍යයෙන් එයා කැඩිච්ච සිංහලෙන් වගේ කතා කරලා කිව්වා මම නෙමේ ඇඳුම් තෝර ගන්නේ අර කට්ටිය තෝර ගන්නේ කියලා ඉවර වෙලා.

ප්‍ර: ඒ කියන්නේ ඔහුට හොඳට සිංහල කතා කරන්න බැරි බවක් පෙන්නුම් කරාද?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඊට පස්සේ ඔබ මොකක්ද කළේ? ඇඳුම් බෑග් එක කාට හරි දුන්නද?

පි: නැහැ මම කිව්වා එහෙනම් තෝර ගත්ත ඇඳුම් අතේ ගොඩක් තියෙන හින්දා මම කිව්වා අපේ තියෙනවාඑතන වීදුරු මේසයක් වගේ අපේ ළමයි අර ටැග් ගසන තැන. එතනින් තියන්න කියලා කිව්වා අනිත් ටික තෝර ගන්නකම්.

ප්‍ර: ඊට පස්සේ මොකද කළේ?

පි: ඊට පස්සේ එයාලා අර ආවා මුස්ලිම් කට්ටියත් ගිහිල්ලා. දැන් අතනින් ඇඳුම් තෝර ගත්තානේ. ඒවාත් අරගෙන ඊට පස්සේ අපේ Section එකේ අපේ අර ටැග් ගහලා නැති ඇඳුම් වලට අපේ ළමයි ටිකට ටැග් ගසලා දෙන්න කියලා ඒ ටික. ටැග් ගසලා දුන්නා පස්සේ අරගෙන Fit-on rooms එකට ගියා.

ප්‍ර: දැන් Fit-on කිරීමෙන් අනතුරුව ඔවුන් මෙම ඇඳුම් මිලදී ගන්න කොහාට ද ගියේ?

පි: බිම් මහලට අරන් ගියා. ඒ කියන්නේ මුදල් අයකැමි අංශයට අරන් ගියා.

ප්‍ර: ඒ අනුව ඔවුන් කොපමණ වටිනාකමක් තියෙන ඇඳුම් ප්‍රමාණයක් මිලදී ගෙන තියෙනවද ඔබට මතකද?

පි: මතක හැටියට රුපියල් විසිනවදහස් ගාණක වගේ වෙනවා.

ප්‍ර: ඔබලා ඒ අනුව සාමාන්‍යයෙන් බිලක් නිකුත් කරනවද?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: එවැනි ඒ අවස්ථාවේ නිකුත් කරන බිල්පත්‍රයක් නැවත දැක්කොත් හඳුනා ගන්න පුළුවන්ද?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: ස්වාමීනි සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටිනවා. පරීක්ෂා කරලා බලන්න. මෙම ලේඛනය මොකක්ද?

පි: බිල්පතේ copyක් තියෙන්නේ.

ප්‍ර: බිල්පතේ copyක් තියෙන්නේ ?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඔබට හඳුනා ගන්න පුළුවන්?

පි: පුළුවනි.

**ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද Jayasundara Textiles ආයතනය විසින් නිකුත් කරන ලද recite පත් අංක 00000215 C -823 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.**

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මේ C -823 කියන ලේඛනය පරීක්ෂා කරලා බලලා නුවන්ට කියන්න පුළුවන්ද මොනවද ඔවුන් මිලදී ගෙන ඇති භාණ්ඩ වර්ග මොනවද කියලා?

පි: Blouse Item 9ක් තිබුණා.

ප්‍ර: Blouse වර්ග 9ක් අරන් තියෙනවා?

පි: ඔව්

ප්‍ර: එහි ප්‍රමාණය කොච්චර එකෙන්ද අරන් තියෙන්නේ? කෙතරම් ප්‍රමාණයෙන්ද?

පි: 4XL, 5XL ඒවගේ.

ප්‍ර: 4XL, 5XL වගේ විශාල ඇඳුම් තමයි අරන් තියෙන්නේ Blouse?

පි: එසේය.

ප්‍ර: Blouse වලට අමතරව තව මොනවද අරන් තියෙන්නේ ?

පි: Bra Item 3ක් අරගෙන තියෙනවා.

ප්‍ර: මොනවද අරන් තියෙන්නේ?

පි: Bra Item 3ක් අරන් තියෙනවා.

ප්‍ර: ඊට අමතරව තව මොනවද අරන් තියෙන්නේ Skirts අරන් තියෙනවද?

පි: ඔව්

ප්‍ර: කීයක් අරන් තියෙනවද?

පි: 9ක් තියෙනවා.

ප්‍ර: ඊට අමතරව යම්කිසි තවත් මොනවත් අරන් තියෙනවද?

පි: මෙතන toys Item 3කුත් තියෙනවා.

ප්‍ර: ඒ අනුව සම්පූර්ණ බිල වශයෙන් කීයක් සඳහන් වෙනවද?

පි: Items 24යි.

ප්‍ර: ඒකට සම්පූර්ණ මුදල වශයෙන් total එක?

පි: රුපියල් 29020.00ක මුදලක්.

ප්‍ර: දැන් ඔබ ඒ පුද්ගලයෝ නිරීක්ෂණය කරානේ ඔබ ඒ පුද්ගලයෝ ඔබ ඇස් දෙකෙන් දැක්කානේ ?

පි: ඔව්.

ප්‍ර: ඒ අනුව ඔවුන්ට මේ 4XL, 5XL වගේ ඒවා ඔවුන්ට අඳින්න ගැලපෙනවද ඔබගේ අත්දැකීම අනුව?

පි: පැමිණි කාන්තාවන් නම් L size ප්‍රමාණය වගේ ඇඳුම් අඳින අය.

ප්‍ර: ඒ කියන්නේ XL ඔවුන්ට ඉතා අතිවිශාලයිද?

පි: විශාලයි.

ප්‍ර: ඔවුන්ට ගැලපෙන්නේ නැහැ ඔවුන්ට සාමාන්‍යයෙන් අඳින්න?

පි: ගැලපෙන්නේ නැහැ.

ප්‍ර: දැන් නුවන් අවුරුදු 4කට විතර ආසන්න කාලයක් කඩවත කැන්ඩි ආයතනයේ වැඩ කරලා තියෙනවා. ඊට පස්සේ 2017 ඉඳන් මේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වෙනකම් ඔබ වැඩකරලා තියෙනවා Jayasundara Textiles ආයතනයේ. දැන් ඔබට විශාල අත්දැකීම් සම්භාරයක් ඇති මේ වැඩ කිරීම තුළින්. ඔබට කියන්න පුළුවන් ද දැන් ඒ පුද්ගලයින්ව ඔබ ඒ අවස්ථාවේ නිරීක්ෂණය කරානේ. ඒ ඔවුන් මිලදී ගත්ත ඇඳුම් ඒ ඒ මිලදී ගත් කාන්තාවන්ගේ ශරීර ප්‍රමාණයට ගැළපෙන ඇඳුම් ද? නැත්නම් ඊට වඩා විශාල ප්‍රමාණයේ ඇඳුම්ද?

පි: ඊට වඩා ටිකක් විශාල ප්‍රමාණයේ ඇඳුම්.

ප්‍ර: සහ ඔබට දැන් අත්දැකීම් තියෙනවා ඔබ කාලයක් තිස්සේම ඔය Jayasundara Textiles ආයතනයේම වැඩ කරනවා කිව්වා.සාමාන්‍ය ඒ පැත්තේ ඉන්න මුස්ලිම් ගම්මාන වල පුද්ගලයින් මෙම කඩේට එනවා යනවා කිව්වා. ඔබ දැකලා තියෙනවද ඔය මිලදී ගත්ත ආකාරයේ ඇඳුම් සාමාන්‍යයෙන් මුස්ලිම් කාන්තාවන් අඳිනවා එදිනෙදා කටයුතු වලට?

පි: ගොඩාක් දුරට එහෙම මිලදී ගන්න එහෙම එන්නේ නැහැ. නමුත් අර වයසක කට්ටිය වගේ ආවොත් තමයි ඔය Blouse එකක් , පංජාබ් එකක් වගේ තෝර ගන්න එනවා.

ප්‍ර: පංජාබ් වගේ ඇඳුම් තමයි ඔවුන් තෝර ගන්න එන්නේ?

පි: ඔව්

ස්වාමීනි සාක්ෂිකරුට C -822 CD තැටියෙහි ඇති තවත් CCTV දර්ශනයක් පෙන්වා සිටිනවා.

ප්‍ර: මහත්මයා දැන් ඒ අනුව වෙලාව කීයට විතර ද මේ දැක්වෙන්නේ?

පි: පැහැදිලි නැහැ.

ප්‍ර: 19.36 කියලා කිව්වොත් නිවැරදිද?

පි: නිවැරදියි ස්වාමීනි.

ප්‍ර: දිනය වශයෙන් සඳහන් වෙන්නේ?

පි: 2019.04.19

ප්‍ර: දැන් මහත්මයට මොනවද නිරීක්ෂණය වෙන්නේ ?

පි: මේ මිලදී ගත් භාණ්ඩත් රැගෙන ඔවුන් පිටත් වෙන්ඩ යන්නේ.

ප්‍ර: ඔවුන් පිටත්ව යනවා ඔබට පේනවා?

පි: ඔව්.

ස්වාමීනි මීට අමතරව තවත් ඡායාරූපයක් විමර්ශන අංශ වලින් සොයා ගන්නා ලද තවත් ඡායාරූප කිහිපයක් සාක්ෂිකරුට මේ අවස්ථාවේ දී පෙන්වීමට අවසර පතනවා.

ප්‍ර: මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න. මේ ඡායාරූපයේ කුමක්ද දැක්වෙන්නේ ?

පි: අපේ වෙළඳ ආයතනයේ ඒ කියන්නේ Customersලට ලබා දෙන බෑග් එක රෙදි දමා දෙන එක.

ප්‍ර: ඔබගේ ආයතනයෙන් ලබා දෙන බෑග් එකක් කියලා ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: මේ Sizes 2ක් තියෙන්නේ මොනවද මහත්මයා?

පි: අපේ Sizes5කට, 6කට විතර එනවා බෑග්. ඕකේ ඔතන තියෙන්නේ Small Size ඒවායි Large Size ඒවායි.

ප්‍ර: ඔබ කොහොමද මේ බෑග් එක හඳුනා ගන්නේ ? ඔබලාගේ ආයතනයෙන් දුන්නා කියලා නම සඳහන් වෙනවද?

පි: නම සඳහන් වෙනවා. Jayasundara Textiles

**ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද Jayasundara Textiles යන ආයතනයේ විවිධ ප්‍රමාණ දෙකකින් වූ ඇති ටියුලිප් බෑග් 2ක් දැක්වෙන ඡායාරූපය C -824 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.**

ප්‍ර: තවත් ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වීමට අවසර පතනවා. මහත්මයා මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න. මහත්මයා මෙය ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි: ඔව්.

ප්‍ර: කුමක් විදිහටද මෙය ඔබ හඳුනා ගන්නේ?

පි: අප ආයතනයේ රැක් වල දමා ඇති සුදු Item එකක් වශයෙන්.

ප්‍ර: ඔබලාගේ ආයතනය විසින් 2019.04.19 වෙනිදින අර මිලදී ගත් Item වලින් එක Item එකක් මෙය විය හැකිද?

පි: පුළුවන්.

ප්‍ර: ඒ විදිහට හඳුනා ගන්න පුළුවන් ඔබට?

පි: ඔව්

**ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C- 825 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.**

ප්‍ර: සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටිනවා ස්වාමීනි. මෙය පරීක්ෂා කරන්න මහත්මයා. මෙය ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: කුමක් වශයෙන් ද ඔබ හඳුනා ගන්නේ ?

පි: මේත් අප ආයතනයේම අලෙවි කිරීමට තිබෙන Blouse එකක්.

ප්‍ර: අලෙවි කිරීමට වර්ගයේ තිබුණු Blouse එකක්?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: 2019.04.19 වෙනිදා දැන් අපි කලින් සාක්ෂියේදී සඳහන් කරපු පුද්ගලයින් මිලදී ගත්තේ මෙවැනි Blouse එකකුත් මිලදී ගත්තා කිව්වොත් නිවැරදිද?

පි: නිවැරදියි ස්වාමීනි.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C -826 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.**

ප්‍ර: සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා සිටිනවා. මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න මහත්මයා. මේ ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: කුමක් හැටියටද ඔබ හඳුනා ගන්නේ ?

පි: Skirts විකුණන්න දාලා තිබුණු Item එකක්.

ප්‍ර: කොහේද කොහේ දාපු Items ද?

පි: අප ආයතනයේ විකිණීමට තිබෙන SkirtsItems එකක්.

ප්‍ර: Jayasundara Textiles ආයතනයේ විකිණීමට තිබුණු වර්ගයේ Item කියලා තමයි ඔබ කියන්නේ ?

පි: ඔව් ස්වාමීනි.

**ස්වාමීනි මේ ඡායාරූපය C- 827 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.**

ප්‍ර: තවත් ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වීමට අවසර පතනවා. මෙය පරීක්ෂා කරන්න මහත්මයා. ඔබට මෙය හඳුනා ගැනීමට හැකියාවක් තිබෙනවද?

පි: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: කුමක් හැටියටද ඔබ මෙය හඳුනා ගන්නේ ?

පි: එයත් අප ආයතනයේ අලෙවි කිරීමට තියෙන Blouse Items

**ස්වාමීනි මෙම සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C- 828 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.**

ප්‍ර: මහත්මයා ඔබ දැන් සාක්ෂි දෙමින් සඳහන් කරා. ඔබගේ රාජකාරි කරපු Jayasundara Textiles ආයතනයට පිරිමි පුද්ගලයෙක් සහ සම්පූර්ණයෙන්නම කළු පැහැති ඇඳුමකින් ශරීරය ආවරණය කර ගත්ත කාන්තාවන් තිදෙනෙකුත් ඔවුන්ගේ අත ළමයෙකුත් සහ තවත් පිරිමි පුද්ගලයෙකුත් Jayasundara Textiles ආයතනයට 2019.04.19 වෙනිදා පැමිණියා කියලා ඔබ සඳහන් කරානේ?

පි: එසේය

ප්‍ර: ඒ ආපු පිරිසෙන් ඒ ආපු පිරිමි පුද්ගලයා ඔබට නැවත දැක්කොත් හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: සාක්ෂිකරුට ඡායාරූපයක් පෙන්වා සිටිනවා. මහත්මයා මේ තිරයේ දැක්වෙන ඡායාරූපය පරීක්ෂා කරන්න. ඔබට මේ ඡායාරූපයේ දැක්වෙන පුද්ගලයා හඳුනා ගන්න පුළුවන්ද?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: කවුරු හැටියටද ඔබ හඳුනා ගන්නේ ?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එදා ඒ පැමිණි ඒ මුස්ලිම් ජාතිකයා විදිහටම .

ප්‍ර: කවදා පැමිණි මුස්ලිම් ජාතිකයාද?

පි: 2019 අප්‍රේල් 19වෙනිදා.

ප්‍ර: ඔබලාගේ ආයතනයට ආපු මුස්ලිම් ජාතිකයා විදිහට. ඔහු කවුරුත් එක්කද ආවේ ?

පි: තව කාන්තාවන් තිදෙනෙක් සහ දරුවෙක් එක්ක.

**ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපය C- 829 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.**

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: ඔය පිරිස ඇවිල්ලා අපි දැක්කානේ මේ ඇඳුම් වගයක් අරගෙන ගිහිල්ලා අර Fit-on rooms වලට යනවා?

පි: එසේය ස්වාමීනි.

ප්‍ර: ඒ වගේ කීපාරක් පල්ලහාට ඇවිල්ලා ඇඳුම් ගෙනිච්චාද නැත්නම් එක පාරම ගෙනිච්ච ඇඳුම් තෝර ගත්තද?

පි: එක පාරින් ගෙනියපු ඇඳුම් තෝර ගත්තා.

**********

**<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු දැන් සාමාන්‍යයෙන් තමුන්ගේ ආයතනයට බඩු ගන්න කාන්තාවෝ ආවාම ඒ අය තමන්ගේ ශරීරයේ ප්‍රමාණයටනේ බොහෝ වෙලාවට ඇඳුම් ගන්නේ?

පි: එසේය ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට දැනුණද මේගොල්ලෝ මේ විශාල ඇඳුම් ගන්නවා 4XL, 5XL ඒවගේ විශාල ඇඳුම් ගන්නවා දැනුණානේ ?

පි: එසේයි

ප්‍ර: දැන් ඔබට හිතුණේ නැද්ද අහන්න ඔබට ද ගන්නේ තව කාටවත්ද ගන්නේ ඇයි කියලා?

පි: ඒ වේලාවේ එච්චර ඒ ගැන අවධානයක් යොමු කළේ නැත්තේ නිකන් අර අවුරුදු ඉවර වෙලා තිබ්බ හින්දා. අපි නිකන් සාමාන්‍යයෙන් මුස්ලිම් අයගේ යාළුවෝ ඉන්න සිංහල අය කතෝලික අය එහෙම ඉන්න හින්දා තෑගි දෙන්න වගේ කියලා ඒ හින්දා වැඩිය අවධානයක් යොමු කලේ නැහැ ඒ ගැන.

ප්‍ර: ඒකයි?

පි: එසේය

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නැත්නම් මේ මුස්ලිම් ජාතික කාන්තාවෝ සුදු ඇඳුම් ගන්නවා ඔබ දැකලා තියෙනවද?

පි: එහෙම මකයක් නැහැ.

හොඳයි බොහොම ස්තුතියි.

**********

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ වසර 4ක් Kandy කියන shopඑකේ වැඩ කරානේද? ඒක කොහේද තියෙන්නේ ?

පි: කඩවත

ප්‍ර: ඊට පස්සේ ඔබ දැන් මේ Jayasundara Textiles කියන සාප්පු සංකීර්ණයෙත් මාස ගාණක් වැඩ කරානේද?

පි: ඔව්

ප්‍ර: අවුරුදු 3ක්?

පි: ඔව්

ප්‍ර: ඔබ කිව්වා නාරම්මල සහ තවත් ගමක මෙම සාප්පු සංකීර්ණයට ආසන්නව මුස්ලිම් අය ජීවත් වෙනවා කියලා මොකක්ද අනිත් ගම?

පි: බම්මන්න ප්‍රදේශයේ.

ප්‍ර: දැන් ඔබගේ අර අවුරුදු 7කවගේ දීර්ඝ කාලයක් කඩවත Kandy Garmentsවලයි, ඔබගේ මේ Jayasundara කියන ප්‍රදර්ශනාගාරටයි මුස්ලිම් අය එනකොට විශේෂයෙන් ඔය වගේ කළු ලෝගුවක් ඇඳලා ඇස් දෙකත් විතරක් පෙනෙන්ට සිදුරක් තබලා එවැනි ඇඳුම් ඇඳගෙන එනවා ඔබට දකින්නට ලැබෙනවද නිතරම වගේ ?

පි: නිතරම නෙවේ යම් යම් අවස්ථාවල පැමිණෙන සිටිනවා.

ප්‍ර: කොතනදී ඔබ දැක්කේ කුරුණෑගල තියෙන ඔය Jayasundaraකියන Stores එකට එන මුස්ලිම් අයද?

පි: දෙකේම දැකලා තියෙනවා. ඒ කියන්නේ කඩවත Kandy එකෙනුත් දැකලා තියෙනවා. සාමාන්‍යයෙන් හැම වේලාවේ නැහැ. නිතරම නැහැ. යම්තාක් දුරට එනවා.

ප්‍ර: ඒ කියන්නේ හුඟාක් මුස්ලිම් අය එහෙම එනවද ටික දෙනෙක්ද එහෙම එන්නේ ?

පි: හුඟාක් අයඑහෙම පැමිණෙන්නේ නැහැ. එහෙම අනිත් අය ඔය පංජාබ් වගේ ඇඳගෙන එහෙම එන අය තමයි ගොඩක් පැමිණෙන්නේ.

**********

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසයි. නොමැති බව දන්වයි.

සාක්ෂිකරු මුදා හරිමි.

මෙම සාක්ෂිකරුට නීතියට අනුව හිමිවිය යුතු දීමනාව ගෙවන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කාර්ය සම්බන්ධයෙන් දැක්වූ සහයෝගයට කොමිෂන් සභාවේ ස්තුතිය පළ කරනවා.

දැන් වේලාව: ප.ව.2.40

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretarys Copy

FAIR COMMENT
BY JEZEEM

**2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව**

දිනය :- 2020.7.7 වේලාව :- ප.ව. 2.40

සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි

**ගරු විනිසුරු මඩුල්ල :-**

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

**පෙනී සිටීම:-**

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතීඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අඟරදඟුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් කෞෂි සෙල්වනායගම් කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

FAIR COMMENT BY JEZEEM

| | |
|---|---|
| සම්පූර්ණ නම | : රන්හවඩිගේ ලයනල් සමරවීර |
| වයස | : අවුරුදු 45 |
| ජාතිය | : සිංහල |
| ආගම | : බෞද්ධ |
| රැකියාව | : ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| සේවා ස්ථානය | :ස්ථානාධිපති අපරාධ ස්ථාන පරීක්ෂණාගාරය ,මොනරාගල. |

ප්‍රතිඥා පිට කැඳවයි.

**<u>රජයේ අධි නීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>**

ස්වාමිනි ඉතාමත් ගෞරවයෙන් කොමිෂන් සභාවේ අවධානය යොමු කරන්නට කැමතියි. මෙම සාක්ෂිකරු සමස්ථ විමර්ශනයකට අදාල වම අම්පාර සො.කෝ නිලධාරියා වශයෙන් ඉතාමත් ගැඹුරු විමර්ශන රාශියක් සිද්ධි කරලා තියෙනවා ස්වාමිනි. නමුත් මේ අවස්ථාවේදී මා ප්‍රශ්න කිරීමට බලපොරොත්තු වන්නේ අපි අද සාකච්ඡා කරන කාරණය වන සුදු ඇඳුම් සොයා ගැනීම සහ ඒ ආශ්‍රිත කාරණා සම්බන්ධයෙන් පමණක් බව ඉතාමත් ගෞරවයෙන් කොමිෂන් සභාවට දැනුම් දෙමි.

ප්‍ර: සමරවීර මහත්මයා ඔබ ශ්‍රී ලංකා පොලිසිය සමඟ සම්බන්ධ වෙන්නේ කොයි වකවානුවේදීද?

පි: 1999.07.20 ස්වාමිනි.

ප්‍ර: ඔබ සම්බන්ධ වෙන්නේ කුමන නිලයකින්ද?

පි: උපසේවා උප පොලිස්පතිවරයෙකු ලෙස

ප්‍ර: උපසේවා උප පොලිස්පතිවරයෙක් ලෙස සම්බන්ධ වෙලා දිවයිනේ ඔබ කුමන ප්‍රදේශවල ඔබ රාජකාරි සිද්ධ කරලා තියෙනවද?

පි: ස්වාමිනි ඇලිපිටිය ,වවුනියාව, තලෙයි මන්නාරම, පොලිස් මත්ද්‍රව්‍යනාහක කාර්යාංශය, මොනරාගල ,ත්‍රිකුණාමලය, අම්පාර යන පොලිස් කොට්ඨාශවලට අනුයුක්තව සේවය කළා.

ප්‍ර: ඔබ නිත්‍ය සේවයට මුලින්ම අන්තර්ග්‍රහනය කරන්නේ කොයි කාලේද?

පි: ස්වාමිනි 2006 .02.01 සිට ස්වාමිනි.

ප්‍ර: ඉන්පසු ඔබට මුල්මම උසස් වීම ලැබෙන්නේ කුමන නිලයකටද?

පි: ස්වාමිනි පොලිස් පරීක්ෂක නිලයට.

ප්‍ර: ඉන් පසු ඔබ ප්‍රධාන පොලිස් පරීක්ෂක වරයෙක් බවට පත් වෙන්නේ කවද්ද?

පි: 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි.

ප්‍ර: ඔබ තමන්ගේ පොලිස් ජීවිතයේ ලබන පුහුණුව අතරේ අපරාධ ස්ථානයක් විද්‍යාත්මක පරීක්ෂණය කිරීම සම්බන්ධයෙන් පුහුණුවක් ලැබුවද?

පි: එහෙමයි ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කොයි කාලයේ ද ලැබුවේ?

පි: ස්වාමිනි 2012 වර්ෂයේ මාර්තු මස සිට මාස තුන හමාරක කාලයක් පුහුණුවක් ලැබුවා.

ප්‍ර: ඒ පාඨමාලාවෙන් පස්සේ ඔබ කුමන ක්ෂේත්‍රයකට අනුයුක්තවද තමන්ගේ පොලිස් රාජකාරි සිද්ධ කරේ?

පි: ස්වාමිනි අපරාධ ස්ථානය පරීක්ෂණ නිලධාරියෙකු වශයෙන් එදා සිට මේ දක්වා රාජකාරියේ නියතුවෙනවා.

ප්‍ර: 2012 සිට මේ දක්වා ඔබ රාජකාරි කරන්නේ අපරාධ ස්ථානයක් විද්‍යාත්මකව පරීක්ෂා කිරීම සම්බන්ධව කිව්වොත් හරිද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ අනුව මේ අපරාධ ස්ථාන පරීක්ෂණය සම්බන්ධයෙන් ඔබ කුමන ප්‍රදේශවල රාජකාරි කරලා තියෙනවද?

පි: ස්වාමිනි බදුල්ල කොට්ඨාශ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේත්, අම්පාර කොට්ඨාශ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයෙත් වර්තමානයේ මොනරාගල කොට්ඨාශ ස්ථානපරීක්ෂණාගාරයෙත් රාජකාරියේ නියුතු වෙනවා.

ප්‍ර: ඔබ අම්පාර කොට්ඨාශ අපිරාධ ස්ථානා පරීක්ෂණාගාරයේ රාජකාරි කල කාල පරාසය මේ කොමිෂන් සභාවට කියන්න?

පි: 2018.01.15 වන දින සිට 2020.01.18 දින දක්වා රාජකාරියේ නියුතු වෙනවා ස්වාමිනි.

ප්‍ර: ඔබ එසේ රාජකාරි කලේ කුමන තනතුරකින්ද?

පි: ස්වාමිනි පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස ස්ථානාධිපති අපරාධ ස්ථාන පරීක්ෂණාගාරය අම්පාර ලෙස.

ප්‍ර: ඒ අනුව ඔබ ස්ථානාධිපති වශයෙන් ඔබගේ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ අනුයුක්ත ඔබට නිලධාරින් කොච්චර විතර හිටියද?

පි: ස්වාමිනි පොලිස් පරික්ෂක එවකට පොලිස් පරීක්ෂක මම සමඟ උප පොලිස් පරික්ෂකවරුන් දෙදෙනෙක්, පොලිස් සැරයන්වරු දෙදෙනෙක්, පොලිස් කොස්තාපල් වරුන් තිදෙනෙක් සහ කාන්තා පොලිස් කොස්තාපල්වරියක් රාජකාරියේ නිරත වුණා.

ප්‍ර: සාමාන්‍යයෙන් ඔබට අපරාධ ස්ථානයක් පරීක්ෂා කරන්න යන්නට අදාල නියෝග ලැබෙන්නේ කාගෙන්ද?

පි: ස්වාමිනි කොට්ඨාශ භාර නිලධාරී තුමාගෙන්.

ප්‍ර: දැන් මහත්මයා 2019.04.28 වෙනිදා විමර්ශනයකට ඔබ යම් කිසි අපරාධ ස්ථානයක් පරීක්ෂා කරන්න යනවද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ යන අපරාධ ස්ථානයේ ලිපිනය ඔබ සඳහන් කරන්න මේ ගරු කොමිෂන් සභාවට?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: කල්මුණ ,පොලිස් වසමේ සයින්ද මරුදු 09 ,බොලුවේරියන් ග්‍රාමය නො. 183/බී, ලිපිනයෙහි පිහිටි අබ්දුල් මජීත් ආදම්බාවා යන අයට අයත් සිදුවීමට සම්බන්ධ නිවස ස්වාමිනි.

ප්‍ර: එම නිවසට ඔබට යන්නේ කීයට විතරද?

පි: ස්වාමිනි පැය 6.50 ට මම අදාල පරීක්ෂණාගාරයෙන් පිටත් වෙනවා ස්ථානයේ පරීක්ෂණ කටයුතු ආරම්භ කරනවා පැය. 8.40 ට පමණ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරානේ මේ බොලිවේරියෙන් නිවාස සංකීර්ණයේ තියෙන අංක B/183, නිවස ඔබ පරීක්ෂා කරා කියලා 28 වෙනිදා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එසේ යන්නට හේතුව කුමක්ද පරීක්ෂා කරන්නට යන්න සිදු වුනේ ඇයි?

පි: ස්වාමිනි පෙර දින

ප්‍ර: කෙටියෙන් කියන්නකෝ මොකක් හොයා ගන්නද ගියේ කියලා?

පි: ස්වාමිනි රජයේ රස පරීක්ෂක තුමාගෙන් සහ විශේෂඥ අධිකරණ වෛද්‍යතුමාගෙන්ද බුද්ධි නිලධාරි නිලධාරින්ගෙන්ද ලද තොරතුරු මත නැවත එම ස්ථානය පරීක්ෂා කිරීමට යොමු වෙනවා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ එසේ ස්ථානය පරීක්ෂා කිරීමේදී ඔබ මොනවද හොයා ගත්තු නඩු භාණ්ඩ?

පි: ස්වාමිනි ..

ප්‍ර: ඔබ 2019 .04.28 වෙනිදා මෙම අංක B/183 කියන නිවස ආශ්‍රිත තිබූ අපරාධ ස්ථානය පරීක්ෂා කලානේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් එම ස්ථානයේ දී සොයා ගත් නඩු භාණ්ඩ අතරේ ඇඳුම් බෑගයක් සහ ගිරිඋල්ල ටෙක්ස්ටයිල් සම්බන්ධ බෑග් කීපයක් ඔබ සොයා ගත්තාද?

පි: එහෙමයි ස්වාමිනි ගිරිඋල්ල ජයසුන්දර ටෙක්ස්ටයිල්ස් ලෙස සඳහන් ටියුලිප් ලෙස ව්‍යාවහාරයේ හඳුන්වන ප්‍රමාණ දෙකකින් යුත් බෑග් දෙකක් සහ.

ප්‍ර: බෑග් දෙකක් සොයා ගත්තා.

පි: ඔව්.

ප්‍ර: ඒ බෑග් දෙකේ ඡායාරූපයක් දැක්කොත් ඔබට නැවත හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවාද?

ප්‍ර: එහෙමයි ස්වාමිනි.

**ස්වාමිනි සාක්ෂිකරු C 824 වශයෙන් දැනටමත් ලකුණු කර ඇති ඡායාරූපය ඔබට පෙන්වා සිටීමට ගෞරවයෙන් අවසර පතනවා.**

**ප්‍ර**: මෙම ඡායාරූපය පරීක්ෂා කරලා බලන්න මහත්මයා ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි: එහෙමයි.

ප්‍ර: කුමක් වශයෙන් ද ඔබ හඳුනා ගන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි: ස්වාමිනි එහි නාමය සඳහන් වෙනවා එමෙන්ම මා සමඟ සිටි නිලධාරීයෙක් ලබා ගත්තු ඡායාරූපයක් බවට එහි පසු බිමට අදාලවත් මට හඳුනා ගැනීමට හැකියාව තියෙනවා.

ප්‍ර: පසු බිමට අදාලව කියලා ඔබ කිව්වේ?

පි: ස්වාමිනි අතුරා ඇති ඇතිරිල්ල සහ ඒ භූමිය හරි.

ප්‍ර: හරි ඒ කියන්නේ ඔබ සමඟ ගියපු කණ්ඩායම මෙන් ලබා ගත් ඡායාරූපයක් වශයෙන් ඔබට මේක හඳුනා ගන්න පුළුවන්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඊට අමතරව මේ බෑග් මේ ජයසුන්දර ටෙක්ස්ටයිල්ස් හඳුනා ගත්ත බෑග් දෙක ඇතුලේ මොනවද තිබුණේ?

පි: ස්වාමිනි ඉදිරිපස විවෘත බොත්තම් පහකින් යුත් බ්ලවුස් තුනක් සහ ඉදිරිපස විවෘත නැති බ්ලවුස් දෙකක් ද

ප්‍ර: ඔබලා සොයා ගත්තා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ අනුව ඉදිරිපස විවෘත කරන්න පුළුවන් බ්ලවුස් තුකත් විවෘත නැති බ්ලවුස් දෙකකත් ඡායාරූපයක් දැක්කොත් ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි: එහෙමයි ස්වාමිනි

**සාක්ෂිකරුට C 828 වශයෙන් ලකුණු කරන ලද ඡායාරූපය පෙන්වා සිටිනවා.**

ප්‍ර: මෙය පරීක්ෂා කරන්න මේ ඡායාරූපය හඳුනා ගන්න පුළුවන්ද? හඳුනා ගන්න පුළුවන් නම් කුමක් හැටියට ද ඔබ හඳුනා ගන්නේ?

පි: ස්වාමිනි හඳුනා ගැනීමට හැකියාවක් තියෙනවා. මා පරීක්ෂණ කණ්ඩායම විසින් මාගේ අධික්ෂණය යටතේ ලබා ගත් ඡායාරූපයක් ස්වාමිනි.

ප්‍ර: ඔබගේ අධික්ෂණය යටතේ ලබා ගත් ඡායාරූපයක්ද?

පි; එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මෙහි කුමක්ද දැක්වෙන්නේ?

පි: ස්වාමිනි ඉදිරිපස විවෘත නොකල බ්ලවුස් දෙකක් සහ ඉදිරිපස විවෘත කල බ්ලවුස් තුනක් අතුරණයක් මත තබා ඡායාරූපයක් .

ප්‍ර: ඊට අමතරව තවත් ඔබට මොනවද ජයසුන්දර ටෙක්ස්ටයිල් වශයෙන් සඳහන් කරපු බෑග් දෙක තුල තිබිලා අනාරවරණය වුනේ?

පි: ස්වාමිනි සුදු පැහැදිලි සුදු සහ අවර්ණ සුදු ලෙස සායවල් 05ක් skirt 05 සොයා ගනු ලැබුවා ස්වාමිනි.

ප්‍ර: ඔබ එහි ඡායාරූපගත කිරීමක් සිද්ධ කරාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එය නැවත දැක්කොත් හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි: එහෙමයි ස්වාමිනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**සාක්ෂිකරුට C 827 වශයෙන් දැනටමත් ලකුණු කර ඇති ඡායාරූපය පෙන්වා සිටීමට අවසර පතනවා.**

ප්‍ර: මෙය පරීක්ෂා කරන්න මහත්මයා මෙහි කුමක්ද දැක්වෙන්නේ?

පි: ස්වාමිනි සුදු ආවර්ණ සායවල් තුනක් සහ සුදු සාය වල් දෙකක් අතුරණුවක් මත තබා ඡායාරූප ලබා ගැනීමක් සිද්ධ කරලා තියෙනවා ස්වාමිනි. එය මා පරීක්ෂණ කණ්ඩායම විසින් කරන ලද රාජකාරියක්.

ප්‍ර: දැන් මහත්මයා ඔබ මේ සොයා ගත්ත ඇඳුම් නිරීක්ෂණය කිරීමේදී ඔබට ඔබගේ අත්දැකීම් අනුව තේරුණේ මේ ඇඳුම් පාවිච්චි කරපු ඇඳුම් විදියටද නැත්නම් අලුතෙන්ම පාවිච්චි නොකරපු තත්ත්වයේ තිබෙන ඇඳුම් හැටියටද?

පි: ස්වාමිනි මෙම ඇඳුම් පාවිච්චි කර තිබුණේද යන්න DNA සාම්පල් අපේක්ෂාවෙන් මා පරීක්ෂාවට ලක් කර මෙහි . ඒ අනුව ස්වාමිනි නැවුම් ඇඳුමක තියෙන ස්වරූපය අනුව පාවිච්චියට ඇති පාවිච්චි නොකල ඇඳුම් ලෙස තමයි මට නිරීක්ෂණය වුනේ ස්වාමිනි.

**ස්වාමිනි ඉතාමත් ගෞරවයෙන් කොමිෂන් සභාවට වෙත සැල කර සිටින්නේ සයින්දර්මරුදු සිදු වූ පිපිරිම සම්බන්ධයෙන් මේ කොමිෂන් සභා විමර්ශන ඒකකය සම්පූර්ණ විමර්ශනය අවසන් වූ විට නැවත මේ සාක්ෂිකරු කැඳවා ඔහුගේ සම්පූර්ණ සාක්ෂිය ලබා ගන්නා බවට කොමිෂන් සභාවට ගෞරවයෙන් දන්වා සිටිනවා.**

**********

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

**මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවශ්‍ය දැයි අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපානන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසයි. නොමැති බව දන්වයි.**

**සාක්ෂිකරු නැවත මෙම කොමිෂන් සභාවට පසු දිනයකදි කැඳවන බව සාක්ෂිකරුට දන්වයි. අද දිනට සාක්ෂිකරු මුදා හරියි.**

**දැන්වේලාව: ප.ව. 3.00**

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

# 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.07.08 වේලාව: පෙ.ව. 10.45

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

**පෙනී සිටීම:-**

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ රවිෂානි පීරිස් මහත්මිය පෙනී සිටී.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**නම** : **කපිල ගාමිණී හෙන්දවිතාරණ.**
**වයස** : **අවු 68**
**ජාතිය** : **සිංහල**
**ආගම** : **බුද්ධාගම**
**දැනට දරණ තනතුර** : **මං හිටපු තනතුර විශ්‍රාමික ජාතික බුද්ධි ප්‍රධානී.**

**ප්‍රතිඥා දී කැඳවයි.**

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>**

ප්‍ර: මහත්මයා ඔබ කියා සිටියා ඔබ විශ්‍රාමික ජාතික බුද්ධි ප්‍රධානී බව?
උ: එහෙමයි ස්වාමීනි.
ප්‍ර: වර්තමානයේ ඔබ කිසියම් හෝ රැකියාවක් කරනවද?
උ: මම දැනට රැකියාවක් කරනවා. Perinial International Development, Singapore කම්පැනි එකක තාම එකේ වැඩ පටන් අරන් නැහැ.
ප්‍ර: කවුරු වශයෙන් ද සේවය කරන්නේ?
උ: උපදේශකවරයෙක් වශයෙන්. Consultant
ප්‍ර: ඔබතුමා ජාතික බුද්ධි ප්‍රධානී විමට පෙර රැකියාවක් කරාද? එහෙනම් මොකද ඒක?
උ: දිගටම හමුදාවේ මං සේවය කළේ ස්වාමීනි. 1973 බැඳුණේ. 2006 වෙනකන් වැඩ කරා.
ප්‍ර: ඔබ ශ්‍රී ලංකා යුධ හමුදාවේ තමයි සේවය කළේ?
උ: එහෙමයි ස්වාමීනි.
ප්‍ර: මොන අවුරුද්දේ ද ශ්‍රී ලංකා යුධ හමුදාවට සම්බන්ධ වුණේ?
උ: 1973 ස්වාමීනි.
ප්‍ර: නිලය කුමක්ද?
උ: Cadet නිලධාරී කෙනෙක් වශයෙන් බැඳුණේ.
ප්‍ර: ඔබ කොපමණ කාලයක් Cadet නිලධාරීවරයෙකු වශයෙන් බැඳිලා පුහුණුව ලැබුව ද?
උ: අවුරුදු 1 ½ ක් 2 ක් අතර ප්‍රමාණය.
ප්‍ර: එසේ පුහුණු වීමෙන් අනතුරුව ඔබ ශ්‍රී ලංකා යුධ හමුදාවට අනුයුක්ත වුණේ කුමන නිලයක් යටතේ ද?
උ: දෙවන ලුතිනල් වශයෙන්.
ප්‍ර: යුධ හමුදා සේවා කාලය තුළ ඔබ උසස්වීම් ලබන්න ඇතිනේ? මතක ද ඒ ලබපු උසස් වීම් සහ වර්ෂයන්?
උ: ස්වාමීනි උප ලුතිනල් කෙනෙක් සිට ලුතිනල් දක්වා අවුරුදු 1 ½ ක් automatic promotion එකක් හම්බ වෙනවා. එතකොට ලුතිනල් සිට කපිතාන් දක්වා අවුරුදු 03 කින් කපිතාන් සිට මේජර් දක්වා අවුරුදු 4 ½

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කින් මේජර් සිට ලුතිනල් කර්නල් දක්වා cardre එකේ vacancies තියෙන අනුව අවුරුදු 06 කින් එතැන් සිට අවුරුදු 08 කින් බ්‍රිගේඩියර් වශයෙන් සහ අවසාන වශයෙන් මේජර් ජනරාල් කෙනෙක් වශයෙන් මං විශ්‍රාම ලැබුවා.

ප්‍ර: ඔබතුමා විශ්‍රාම ගියේ මේජර් ජෙනරල්වරයෙක් වශයෙන්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ මොන වර්ෂයේ ද?

උ: අපිට නියමිතයි අවුරුදු 55 යෙන් විශ්‍රාම යන්න. 2006 වර්ෂයේ දී මං විශ්‍රාම ගියා ස්වාමීනි.

ප්‍ර: ඔබ ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවය ආරම්භ කරන විට ශ්‍රී ලංකා යුධ හමුදාවට අනුයුක්තව බුද්ධි ඒකකයක් තිබුණා ද?

උ: උප ලුතිනල් කෙනෙක් වශයෙන් මට එහෙම මතකයක් නැහැ අපිට ඒ තරම් දැනීමක් තිබ්බේ නැහැ. සම්පූර්ණ හමුදාවේ කෙළින්ම පාසලින් හමුදාවට බැඳුණේ. ඒ වගේම ටික කලක් යන කොට කපිතාන් නිලය ලුතිනල් නිලය වෙනකොට මං දැනගත්තා බුද්ධි අංශයක් සුළු වශයෙන් පවත්වාගෙන ගියා.

ප්‍ර: මෙම යුධ හමුදාවේ පැවති බුද්ධි අංශයට ඔබතුමා සම්බන්ධ වුණා ද?

උ: එහෙමයි ස්වාමීනි. 1983 සම්බන්ධ වුණා.

ප්‍ර: එසේ සම්බන්ධ වීමේ දී ඔබගේ නිලය යුධ හමුදාවේ කපිතන් නිලය තමයි ඔබතුමා දැරුවේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: යුධ හමුදා බුද්ධි මං කියන්නේ ඒකකයට ඔබ සම්බන්ධ වුණේ එම ඒකකයේ කිසියම් තනතුරක් යටතේ ද?

උ: පළමුවෙන්ම මම යුධ හමුදා සේවා බලකායට අනුයුක්ත වුණේ. එතැන් සිට 83 මං එතැනින් 76 Commission වෙලා 83 වර්ෂයේ දී මම බුද්ධි අංශයට සම්බන්ධ වුණා. එතැන් සිට දිගටම බුද්ධි අංශයේ හිටියේ.

ප්‍ර: ඒ කියන්නේ ඔබතුමා යුධ හමුදාවෙන් මේජර් ජනරාල් කෙනෙක් වශයෙන් විශ්‍රාම යනකම්ම ඔබ සිටියේ බුද්ධි අංශයේ තමයි ඔබ සිටියේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ බුද්ධි නිලධාරීවරයෙකු වශයෙන් කටයුතු කිරීමේ දී යුධ හමුදාවේ ඊට අමතරව ජාතික බුද්ධි කටයුතු සම්බන්ධයෙන් වෙනම ඒකකයක් තිබ්බ ද පිහිටලා?

උ: මම විශ්‍රාම යන කොට ජාතික බුද්ධි ප්‍රධානී කියලා සංස්ථාපිත.

ප්‍ර: නැහැ මං අහන්නේ ඔබතුමාගෙන් ඔබ 1983 යුධ හමුදා බුද්ධි කොට්ඨාශයට සම්බන්ධ වන විට රාජ්‍යය බුද්ධි කටයුතු සම්බන්ධයෙන් වෙනම ආයතනයක් පවත්වාගෙන යමින් තිබුණ ද ලංකාව තුළ?

උ: එහෙමයි ස්වාමීනි. ඒක තිබුණේ ISD කියලා. Intelligence Service Division කියලා පොලීසිය යටතේ.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ISD Intelligence Service Division වශයෙන් කෙළින්ම පොලිස්පතිතුමා යටතේ?

උ: පොලිස්පතිතුමා යටතේ.

ප්‍ර: ඔබට දැනීමක් තියේ ද මෙම ISD වශයෙන් තිබුණු රජයේ බුද්ධි ඒකකය පසුව වෙනත් ආකාරයකට වර්ධනය වුණා ද නැද්ද කියන්න?

උ: එහෙමයි ස්වාමීනි. 83 මම හමුදා බුද්ධි අංශයේ සේවය කරන කාලේ යාපනයේ රාජකාරී කරන කාලයේ 84 නොවැම්බර් 01 වැනිදා එහෙම නැත්නම් 84 දෙසැම්බර් 01 වැනිදා ජාතික බුද්ධි කාර්යාංශය කියලා NIB කියලා form කරා. එතකොට එම අවස්ථාවේ දී පොලීසියේ අය පමණක් නෙවෙයි හමුදාවේ හිටපු අයත් ඒකට බඳවා ගත්තා ඒ බුද්ධි රාජකාරී සඳහා.

ප්‍ර: එතකොට NIB එකේ ප්‍රධානියා හැදින්වුයේ අධ්‍යක්ෂක වශයෙන් ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් 1994 දී NIB එක පිහිටවන කොට කවුද එහි ප්‍රථම අධ්‍යක්ෂක වුණේ කියලා ඔබට මතකයක් තියෙනව ද?

උ: මිස්ටර් සර්නි විජේසූරිය .

ප්‍ර: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සර්නි විජේසූරිය?

උ: ඔව්.

ප්‍ර: මෙම NIB කියන ආයතනයට ඔබ සම්බන්ධ වූ බව කියා සිටියා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ මොන වකවානුවේ ද ?

උ: NIB එක පටන් ජාතික බුද්ධි කාර්යාංශය පටන් ගන්න කොටම ලිඛිතව හමුදා බුද්ධි සේවයේ හිටපු සියළු දෙනාම සම්බන්ධ කරගත්තා. NIB එකට නමුත් අපි හමුදාවේ NIB එකටත් සේවය කරමින් උතුරු පළාතේම දිගටම ඒ විදියට සේවය කරා.

ප්‍ර: ඒ කියන්නේ එතැන දී ද්විත්ව ක්‍රියාකාරීත්වයක් ඔබගේ තිබුණේ? ඔබගෙන් යුධ හමුදාවට සහ ඒ වගේම NIB ජාතික බුද්ධි කාර්යංශයේ වෙනත් ඔබ සේවය කරා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ සේවය සැපවුවා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: NIB නැත්නම් ජාතික බුද්ධි කාර්යාංශයේ ඔබ කොපමණ කාලයක් සේවය කරාද?

උ: ක්‍රියාන්විත රාජකාරියේ යාපනයේ ඉඳලා කෙළින්ම NIB එකට ගියේ මම 1986. එතකන් යාපනයේ දිගටම රාජකාරී කළේ. එතැන් සිට අවුරුදු 11 ක් 95 දක්වා ජාතික බුද්ධි කාර්යාංශයේ රාජකාරී කරා ස්වාමීනි.

ප්‍ර: ඔබ ජාතික බුද්ධි කාර්යාංශයෙන් ඉවත් වුණේ 1995 වර්ෂයේ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: එහෙමයි.

ප්‍ර: දැන් ඔබතුමා කියා සිටියා NIB එක 1984 පිහිටුවා කියලා. දැන් ඒ පිහිටුවීමේ දී ඔබ පෙර කී ISD කියන පොලිස්පතිතුමා යටතේ තිබූ ඒකකයට මොකද්ද වුණේ?

උ: ඒ විදියටම Function වුණා. රාජකාරී කරගෙන ගියා නමුත් නම විතරයි වෙනස් වුණේ. ඊට අමතරව පොලීසියේ අය පමණක් නෙවේ හමුදාවේ අයත් ඒ කාර්යාංශයට අනුයුක්තව රාජකාරී කරා.

ප්‍ර: එතකොට මෙම නිලධාරීන් මේ කාර්යාංශයේ සේවය කරපු නිලධාරීන් රිපෝර්තු කළේ Report කළේ කාටද?

උ: අධ්‍යක්ෂකතුමාට.

ප්‍ර: කාර්යාංශයේ අධ්‍යක්ෂකතුමාට?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: සාමාන්‍යයෙන් ඔබ ප්‍රථමයෙන් මෙම කාර්යාංශයට සම්බන්ධ වන විට නිලධාරීන් කොපමණ පමණ සිටිය ද දළ වශයෙන්?

උ: මං හිතන විදියට ඒ දවස් වලම තුන් හාරසියක් පමණ සිටින්න ඇති මගේ මතකයේ හැටියට. මට හරියටම ගාණ කියන්න අමාරුයි මේ වේලාවේ.

ප්‍ර: යුධ හමුදා සහ පොලිස් නිලධාරීන් පමණක් ද නැත්නම් ගුවන් හමුදාවේ සහ නාවික හමුදාවේ නිලධාරීනුත් මෙම ඒකකයට සම්බන්ධ කර ගන්නට යෙදුණ ද?

උ: මං ඉන්න කාලේ හිටියේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබතුමා කියා සිටියා NIB සේවය කරන විට ඔබලාගේ සේවය ඔබලාගේ යුධ හමුදා බුද්ධි අංශය වෙතත් සපයන්නට යෙදුණා?

උ: නැහැ ස්වාමීනි ඒක වැරදි වැටහීමක්. මම කියන්නේ යාපනයේ ඉන්න කාලයේ එතකොට ඉඳුරාම මම NIB එකට සම්බන්ධ වුණේ නැති කාලේ. ඒ කාලේ හමුදා බුද්ධි අංශයටත් තොරතුරු හුවමාරු කර ගැනීම කරා. නමුත් ජාතික බුද්ධි කාර්යාංශයයට Physically ගියාට පස්සේ ඒ හමුදා බුද්ධි අංශයත් එක්ක මගේ ගනුදෙනුවක් තිබ්බේ නැහැ. නමුත් සම්බන්ඳතා තිබ්බා ස්වාමීනි

ප්‍ර: 1983 ඔබතුමා යුධ හමුදාවේ බුද්ධි ඒකකයට සම්බන්ධ වුණ බව කියා සිටියා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වන කොට ඔබ සේවය කරමින් සිටි ප්‍රදේශය මොකද්ද?

උ: උතුරු ප්‍රදේශයේ.

ප්‍ර: ඔබ මේ බුද්ධි අංශයට සම්බන්ධ වුණාට පසුව යුධ හමුදා බුද්ධි අංශයට සම්බන්ධ වුණාට පසුව ඔබ ඒ උතුරු ප්‍රදේශයෙන් මාරු වීමක් ලැබුව ද නැත්නම් ඔබගේ රාජකාරිය උතුරු ප්‍රදේශයේම ක්‍රියාත්මක කරාද?

FAIR COMMENT BY JEZEEM

උ: දිගටම උතුරු ප්‍රදේශයේ ක්‍රියකරේ. නමුත් මාරුවීම ලැබුවේ මං හිතන විදියට 86 .

ප්‍ර: දැන් ඔබ යුධ හමුදාවේ බුද්ධි අංශයට සම්බන්ධ වෙලා උතුරුකරයේ රාජකාරී කරන විට ඒ ලබාගන්නා වූ බුද්ධි තොරතුරු ඔබ ජාතික බුද්ධි කාර්යාල සමඟත් හුවමාරු කරගත්ත ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම හුවමාරු කර ගැනීම සිදුවුයේ ඔබගේ ප්‍රධාන සේවා ආයතනය වූ යුධ හමුදාව හරහා ද නැත්නම් කෙළින්ම ඔබ NIB වෙත එම තොරතුරු සැපවුවද?

උ: නැහැ යාපනයෙන් යනකම් කෙළින්ම මං සම්බන්ධීකරණ කළේ හිටියා එතකොට Chief of Military Intelligence කියලා. හමුදා සංස්ථාවට අනුව ස්ථාපිත ප්‍රධානියා. එතුමා තමා අවශ්‍යය විදියට අවශ්‍ය නම් ජාතික බුද්ධි කාර්යාංශයටත් තොරතුරු හුවමාරු කරා එහෙම නැත්නම් අපේ පුද්ගලික හැඳුනුම්කම් මත අපි තොරුතරු හුවමාරු කර ගත්තා අවශ්‍යතාවය මත.

ප්‍ර: ඔබතුමා මීට පෙර ගරු කොමිෂන් සභාවට කියා සිටියා NIB ඒ කියන්නේ ජාතික බුද්ධි කාර්යාංශය පිහිටුවේ 1984 දී යුධ හමුදා බුද්ධි අංශයේ සිටි සියළුම නිලධාරින් ඒ NIB එකට අනුයුක්ත කරන්න යෙදුණු බව?

උ: එහෙමයි ස්වාමීනි. සමහර අය අනුයුක්ත කළේ නැහැ. කිහිපදෙනෙක් යාපනය ප්‍රදේශය විතරක් නම් නොවේ වවුනියා ත්‍රිකුණාමලේ ප්‍රදේශ වල සේවය කළ බුද්ධි නිලධාරීනුත් ලිඛිතව අනුයුක්ත වුණා.

ප්‍ර: ලිඛිතව අනුයුක්ත වුණු ඒ 1984

උ: 84.

ප්‍ර: එසේ ලිඛිතව අනුයුක්ත වුණත් ඔබ උතුරේ සේවය කරන කාලයේ දී ඔබ කියන්නේ එහෙනම් ඒ අවශ්‍ය තොරතුරු NIB එක වෙත සැපවුවේ යුධ හමුදාවේ බුද්ධි ප්‍රධානියා මාර්ගයෙන් කියලද?

උ: එහෙමත් වුණා. කලිනුත් තොරතුරු සැපයුවා. සමහර විට NIB එකෙනුත් අපෙන් විපරම් කරනවා සර් යම්කිසි තොරතුරු සම්බන්ධයෙන් . එතකොට ඒ කිසි ප්‍රශ්නයක් තිබ්බේ නැහැ. අපි එහෙම තොරතුරු හුවමාරු කර ගත්තා.

ප්‍ර: එතකොට ඔබලගේ වේතන වැටුප් ගෙවීම සිදු කළේ යුධ හමුදාවෙන් ද නැත්නම් ශ්‍රී ලංකා පොලිසියෙන් ද කොහොම ද?

උ: යුධ හමුදාවෙන්.

ප්‍ර: ඒ අනුව ඔබටත් ඔබව ජාතික බුද්ධි කාර්යාංශය වෙත අනුයුක්ත කර බවට ලිඛිතව ලේඛනයක් ලැබුණ ද?

උ: මාගාව නම් නැහැ ස්වාමීනි . මට මතක නැහැ ලිඛිතව හම්බවුණා ද කියලා. කොහොමහරි It was announced. It was notified

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: එය මොන වර්ෂයේ ද?

උ: 84 නොවැම්බර් හෝ දෙසැම්බර් ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ 1984 උතුරේ රාජකාරී අවසන් කරාට පසුව ඔබ කියා සිටියා පූර්ණ කාලීනව ජාතික බුද්ධි කාර්යංශයට ඔබව සම්බන්ධ වුණා කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මේ ජාතික බුද්ධි කාර්යාංශයේ අධ්‍යක්ෂකවරයා තමයි ප්‍රධානියා ලෙස ඔබ සඳහන් කරන්න යෙදුණේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ජාතික බුද්ධි කාර්යාංශයේ ප්‍රධානියා වාර්තා කළේ ඉහළට එහෙම නැත්නම් ඔහුව අධීක්ෂණයට ලක් කළේ පොලිස්පතිවරයා ද එතකොටත්?

උ: පොලිස්පතිවරයා.

ප්‍ර: මෙම කාර්යාංශයේ වැඩකටයුතු සිදුකිරීමේ දී අධ්‍යක්ෂකවරයාට අමතරව ඊට පහළින් නිලධාරීන් හිටිය ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොන වගේ නිලයන් ද තිබ්බේ?

උ: ස්වාමීනි අධ්‍යක්ෂ ජාතික බුද්ධි කාර්යාංශය. ඊට අමතරව Deputy Director Structure එකක් තිබ්බා. මං හිතන්නේ තුන් හතර දෙනෙක් එක්කෙනෙක් administration නියෝජ්‍යය අධ්‍යක්ෂ කෙනෙක් හිටියා. ඊට පස්සේ සහකාර අධ්‍යක්ෂකවරු .

ප්‍ර: සහකාර අධ්‍යක්ෂකවරු කී දෙනෙක් පමණක් හිටිය ද?

උ: මට හරියටම කියන්න බැහැ ස්වාමීනි.

ප්‍ර: දළ වශයෙන් ?

උ: දළ වශයෙන් 10 ක් පමණ සිටින්න ඇති ඒ කාලේ.

ප්‍ර: අධ්‍යක්ෂක, නියෝජ්‍යය අධ්‍යක්ෂකවරුන් ඉන්පසු සහකාර අධ්‍යක්ෂකවරුන්. එතැනින් පල්ලෙහාට සිටි නිලධාරින් සිටියද එසේනම් ඔවුන්?

උ: එතැනින් පල්ලෙහාට හිටියා desk Officers ලා කියලා. එතකොට IP Rank එකේ එහෙම නැත්නම් Chief inspector Rank එකේ ඒ විදියට තමයි Structure එක හැදිලා තිබ්බේ.

ප්‍ර: එක එක අංශයන් තිබ්බා.ඒකද ඔබතුමා desk වශයෙන් හඳුන්වන්නේ?

උ: නැහැ desk වශයෙන් හඳුන්වන්නේ හැම අංශයකම තිබුණා විෂය භාර අංශයන්. ඒ විෂය භාර අංශයන් වල හිටියා නිලධාරීන් සෑහෙන්න ප්‍රමාණයක්.

ප්‍ර: ඒ කියන්නේ මේ කාර්යාංශයේ එක් එක් අංශ කිහිපයකට වෙන් කරලා තිබුණා. එම අංශ වල කෙරෙන බුද්ධි රාජකාරී වලදී ඒ එක් එක් විෂයන් සඳහා වෙනම නිලධාරින් අනුයුක්ත කර තිබුණා කියලා කිව්වොත් හරිද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: හරි ස්වාමීනි.

ප්‍ර: මා ඔබ NIB එකට සම්බන්ද වෙන කාලේ ගැන අහන්නේ. එම කලේ අංශ කියක් තිබ්බ ද කියලා ඔබට මතකද මතකනම් ඒ අංශ මොනව ද කියලා මේ ගරු සභාවට පැහැදිලි කරන්න?

උ: මම හිටියේ ස්වාමීනි Counter terrorism desk එකේ සහකාර අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් මං කපිතාන් නිලයේ ඉස්සෙල්ලම කපිතාන් නැත්නම් මේජර් නිලයේ සම්බන්ධ වුණේ. සහකාර අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් Counter terrorism desk අංශයේ. ඊට පස්සේ නොයෙකුත් නියෝජ්‍යය අධ්‍යක්ෂකවරු යටතේ නොයෙකුත් විෂය පථයන් යටතේ තව ස්ථාපිත කරලා තිබුණා අංශයන්.

ප්‍ර: මෙම කාලවකවානුවේ ආගමික අන්තවාදය සම්බන්ධයෙන් අංශයක් හෝ විෂයක් වශයෙන් වූ කොටසක් තිබ්බ ද?

උ: මට මතක නැහැ ස්වාමීනි. මොකද මට විෂය පථයට සම්බන්ධ නැහැ අනෙක් අංශ.

ප්‍ර: මේ ඔබ පෙර කී නියෝජ්‍යය අධ්‍යක්ෂක නිලයන් යුධ හමුදාවේ නිලධාරීනුත් හෙබෙව්ව ද නැත්නම් පොලිස් නිලධාරින් පමණ ද?

උ: යුධ හමුදාවේ නිලධාරී දෙදෙනෙක් හිටියා. නියෝජ්‍ය අධ්‍යක්ෂක ධූරය දැරුවා.

ප්‍ර: ඔබතුමා එකේ සහකාර අධ්‍යක්ෂකවරයෙක් වශයෙන්

උ: මුලින්ම ඔය පසුව නියෝජ්‍යය අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් පසුකාලේ Counter terrorism desk එකේ රාජකාරී කරා අවසාන වශයෙන්.

ප්‍ර: 1995 වර්ෂයේ දී ඔබ NIB ජාතික බුද්ධි කාර්යංශයෙන් ඉවත් වුණු බව කියා සිටියා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එයට හේතුවක් තිබුණ ද?

උ: එය පුද්ගලික හේතුවක් මත මං නැවතත් හමුදා බුද්ධි අංශයට බැඳුණා.

ප්‍ර: ඒක පුද්ගලික හේතුවක් මත?

උ: එහෙමයි.

ප්‍ර: That is was in 1995?

උ: yes sir.

ප්‍ර: NIB හි ඔබගේ සේවා කාලය තුළ ආසන්න වශයෙන් වසර 11 පමණ අධ්‍යක්ෂකවරුන් කී දෙනෙක් පමණ සිටිය ද?

උ: මම ඉන්න කාලේ අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙක් පමණ තමයි.

ප්‍ර: ඔබ කියා සිටියේ විජේසූරිය

උ: සර්නි විජේසූරිය, මං හිතන්නේ පුන්ය ද සිල්වා සිල්වා පැමිණියා. මට කාලයනම් අමතකයි මං යන්න ඔන්න මෙන්න තියෙද්දී තමයි එතුමා පැමිණියේ. මගේ මතකය හැටියට පළවන අධ්‍යක්ෂක වුයේ ජොෂ්ඨ

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පොලිස් අධිකාරී මෙරිල් ගුණරත්න. ඔහුට පසුව ජේ.පො.අධිකාරී ශර්නි විජේසූරිය. මා බුද්ධි කාර්යාංශයෙන් ඉවත් වෙන්න ආසන්න කාලයේ දී අධ්‍යක්ෂක ලෙස පත්වුයේ මගේ මතකය හැටියට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පුන්ය ද සිල්වා. එහෙමයි ස්වාමීනි මං හිතන්නේ ඊට අමතරව පොලිස්පතිතුමයි ජාතික බුද්ධි කාර්යංඔයේ අධ්‍යක්ෂකතුමයි අතරේ තව පුද්ගලයෙක් හිටියා. Director General intelligent service කියලා. එහෙත් පොලීසියේ නිලධාරීයෙක් හිටියේ. Mr සිරිල් හේරත් ඒ තනතුර හෙබෙවුවා. ඊට පස්සේ Mr මෙරිල් ගුණරත්න හෙබෙවුවා ඒ තනතුර. කෙළින්ම රපෝර්තු කළේ ඒ විදියට. ඒ හරහා තමයි රපොර්තු කළේ ස්වාමීනි.

ප්‍ර: 1995 අවුරුද්දේ ඔබ නැවත යුධ හමුදා බුද්ධි අංශයට සම්බන්ධ වුණ බව ඔබ කියා සිටියා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ශ්‍රී ලංකා යුධ හමුදාවේ බුද්ධි අංශයේ ප්‍රධානියා හඳුන්වන්නේ අධ්‍යක්ෂක බුද්ධි වශයෙන් කිව්වොත් හරිද?

උ: එහෙමයි ස්වාමීනි. අධ්‍යක්ෂක හමුදා බුද්ධි.

ප්‍ර: යුධ හමුදා බුද්ධි කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයා සාමාන්‍යයෙන් කුමන නිලයක නිලධාරීවරයෙක් ද?

උ: බ්‍රිගේඩියර් නිලයේ.

ප්‍ර: ඔබ කිසියම් හෝ අවස්ථාවකදී යුධ හමුදා බුද්ධිහි අධ්‍යක්ෂක යුධ හමුදා බුද්ධි වශයෙන් පත්වුවා ද?

උ: එහෙමයි ස්වාමීනි. 2000 වර්ෂයේ 1999 වර්ෂයේ මම වැඩ බලන බුද්ධි අධ්‍යක්ෂක තමයි හිටියේ.එතකොට මගේ Rank එක කර්නල් හින්දා. ඊට පස්සේ මං බ්‍රිගේඩියර් වුණා හින්දා ඇත්ත වශයෙන්ම මම ඒ තනතුරේ ස්ථිර කරලා 2000 වර්ෂය වන කොට මම නිවැරදි නම් මම හමුදා බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් පත්වුණා.

ප්‍ර: හමුදා බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් ඔබ කොපමණ කාලයක් සේවය කරාද?

උ: අවුරුදු 06 ක් පමණ. 1999 ඉඳන් 2005 විතර වෙනකන්ම මම හිටියා July වෙනකම්. දිගටම ඊට පස්සේ මම promote වුණා මේජර් ජනරාල් නිලයට. ඊට පස්සේ මම හිතන්නේ රාජකාරීමය එවකට සිටි ජනාධිපතිතුමිය විසින් මට වෙනම .posting එකක් දුන්නා කලාපිය බුද්ධි ආවරණය කරන්න තායිලන්තයට.

ප්‍ර: මොන අවුරුද්දේ විතර ද ඔබ ඔය ඒ තායිලන්ත කාලාපිය බුද්ධි ආවරණය සඳහා

උ: බොහෝම ටික කාලයක් ස්වාමීනි. මොකද ආපහු 2005 එවකට සිටිය ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ලේකම් වුණ ගමන් මට කතා කරා නැවත එන්න කියලා. බුද්ධි අංශයට ඇවිල්ලා එයත් එක්ක

FAIR COMMENT BY JEZEEM

බුද්ධි රාජකාරී වලට සම්බන්ධ වෙන්න කියලා. මං ඒ එක්කම ජනවාරී මාසයේම 2006 ජනවාරී වල පැමිණිලා එතුමත් එක්ක ඉඳුරාම වැඩ කරා.

ප්‍ර: ඔබ යුධ හමුදාවේ බුද්ධි අධ්‍යක්ෂක තනතුර වසර 06 ක් පමණ හෙබ වූ බව ඔබ කියා සිටියා? මෙම කාල වකවානුව තුළ ඔබට කීමට හැකියාවක් තියෙනව ද ආගමික අන්තවාදය සම්බන්ධයෙන් යුධ හමුදා බුද්ධි වෙත තොරතුරු ලැබුණා ද නැද්ද කියලා?

උ: ස්වාමීනි එහෙම විශේෂයෙන් තොරතුරු ලැබිලා තිබ්බේ නැහැ. නමුත් අපි සම්පූර්ණයෙන්ම අපේ අවධානය යොමු කරලා තිබ්බේ LTTE ත්‍රස්තවාදය කොහොමද අපි මේක පරාජය කරන්නේ ඊට අවශ්‍යය සියළුම තොරතුරු රැස්කිරීම සහ ලබාදීම තමයි මගේ ප්‍රධාන කාර්යය වුණේ.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා 2005 අවුරුද්දේ දී ඔබව කලාපීය බුද්ධි කටයුතු සඳහා තායිලන්තය වෙත ඔබව යොමු කරා කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එසේ යොමු කරත් ඔබ නැවත 2006 ජනවාරී මාසේ පමණ නැවත ලංකාවට පැමිණි බව කියා සිටියා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ 2006 ලංකාවට පැමිණෙන කොට ඔබ යුධ හමුදාවේ සක්‍රීය සේවයේ ද හිටියේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එසේ 2006 අවුරුද්දේ ලංකාවට ආවට පසුව ඔබ නැවත යුධ හමුදා බුද්ධි වෙත සම්බන්ධ වුණාද නැත්නම් ඔබ වෙනත් රාජකාරියක් ද සිදු කළේ?

උ: යුධ හමුදා බුද්ධි අංශයට සම්බන්ධ වුණේ නැහැ. නමුත් ආරක්ෂක අමාත්‍යාංශයේ බුද්ධි උපදේශක කෙනෙක් වශයෙන් එවකට සිටි ආරක්ෂක ලේකම්තුමත් එක්ක රාජකාරී කරා. මොකද ඊට අමතරව තව මේජර් ජනරල් කෙනෙක් ඉහළින් සිටියා. මං එන කොට ඒ අවස්ථාව වන කොට ජාතික ආරක්ෂක අමාත්‍යාංශයේ.

ප්‍ර: ඒ කියන්නේ ඔබ නැවත ස්වක්‍රීය සේවයට 2006 ජනවාරී වල ඇවිල්ලා ඔබ කළේ ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශකවරයෙකු වශයෙන් කටයුතු කිරීම ?

උ: එහෙමයි ස්වාමීනි. ඒකේ තනතුර තිබ්බේ උපදේශක රාජ්‍යය ආරක්ෂක ආමාත්‍යවරයාගේ කියලා.

ප්‍ර: දැන් ඔබතුමා විශ්‍රාම ගියේ කවද්ද?

උ: 2006 ඔක්තොම්බර් 03 වැනිදා.

ප්‍ර: එසේ විශ්‍රාම ගියාට පසුව ඔබ දිගටම උපදේශකයෙක් වශයෙන් කටයුතු කරාද රාජ්‍යය ආරක්ෂක ඇමතිවරයාගේ?

උ: ස්වාමීනි මං විශ්‍රාම යන විට එවකට සිටි ආරක්ෂක ලේකම්තුමා මට කිව්වා හමුදාවේ අපිට තිබුණා pay and pension ක්‍රමයක්. ඒ කියන්නේ pension එකයි pay එකයි දෙකම හම්බුවෙනවා. ඇවිල්ලා දිගටම තවත්

FAIR COMMENT BY JEZEEM

රාජකාරී මට්ටමෙන් කරන්න කියලා. එතකොට ඒ තියෙන facilities මේජර් ජනරල් කෙනෙක්ගේ facilities මට ලැබෙන හින්දා. නමුත් මං ඒකට එකග වුණේ නැහැ. මං කිව්වා මං විශ්‍රාම යනව නම් විශ්‍රාම යනවා. ඒක හින්දා මට ආයේ හමුදාවට සම්බන්ධවීමට අවශ්‍යය නැහැ. ඔබතුමාට මාව තියාගන්න ඕනනම් රාජකාරී කරන්න මාව වෙන විදියකට අමාත්‍යාංශයට අනුයුක්ත කර ගන්න කියලා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ජාතික බුද්ධි ප්‍රධානී වුණේ කවද්ද?

උ: ඒක back date කරලා හම්බ වුණේ. මං විශ්‍රාම ගියපු දවසේ සිටන්.

ප්‍ර: මේ ජාතික බුද්ධි ප්‍රධානී කියන තනතුර පිහිටෙව්වේ කවද්ද කියලා ඔබට කීමට හැකියාවක් තියෙනවද?

උ: ලිඛිතව ඒක 2006 ඔක්තෝම්බර් 03 වැනිදා සිට. නමුත් ඒක . back date කරලා හම්බ වුණේ.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා ආරක්ෂක ලේකම්වරයා විසින් ඔබට කියා සිටියා කියලා pay and pension?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: යන ක්‍රමවේදය යටතේ විශ්‍රාම වැටුප ලබාගනිමින් ඊට අමතරව මේජර් ජනරාල්වරයෙකුට ලැබෙන වැටුප සහ වරප්‍රසාදයන් ලබමින් ඔබගේ කටයුතු පවත්වාගෙන යන්න කියලා? ඔබ කියා සිටියා ඔබ එය ප්‍රතික්ෂේප කරා කියලා? ඇයි ඒ?

උ: මට වුවමනාවක් වුණේ නැහැ නැවතත් හමුදාවත් එක්ක සම්බන්ධ වෙන්න. විශ්‍රාම ගියානම් මං හිතුවේ මගේ තත්ත්වය තියාගෙන මං මේජර් ජනරාල්වරයෙක් විදියට Retire වුණා. ඒක මගේ පුද්ගලික මතයක් ස්වාමීනි. මං හිතුණා ඒක හොඳයි කියලා. විශ්‍රාම ගිහල්ලා විශ්‍රාමික මේජර් ජනරාල් කෙනෙක් විදියට සේවය කරන්න. මං එතුමාගෙන් ඉල්ලා සිටියේ මට අවසාන වශයෙන් ගත්ත මම පඩිය මේජර් ජෙනලේ කෙනෙක් වශයෙන් ගත්ත පඩිය ලැබෙන්න සලස්වන්න කියලා.

**********

**<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>**

ප්‍ර: හේනදාවිතාරණ මහත්මයා ඔබට ඇයි කළකිරීමක් හිතුණ ද ඔබ එහෙම තීරණයක් ගන්න?

උ: නැහැ එහෙම කිසිම කළකිරීමක් තිබ්බේ නැහැ.

ප්‍ර: ඇයි ඔබ එහෙම හිතුවේ ?

උ: ඒක මගේ මතය. මට හිතුණා එහෙම වෙන්න ඕන කියලා. මොකද සාමාන්‍යයෙන් විශ්‍රාම එක්කෙනෙක් ආපහු නැවත සේවය කරනව නම් ඒක ටිකක් මට හිතුණා මදිකමක් කියලා. ඒ කියන්නේ.

ප්‍ර: මදිකමක් කියලා හිතන්නේ ඔබට යම්?

FAIR COMMENT BY JEZEEM

උ: ඒ කියන්නේ අනිත් අය සාමාන්‍යයෙන් කැමති වෙන්නේ නැහැ මේ විශ්‍රාම කෙනෙක් ගිහිල්ලා ආපහු ඇවිල්ලා මේ තවත් ඒ විදියට එහෙම ඉන්නවා දකින්න. කොහොමටත් මට ඒක දැනුවත් වුණේ නැහැ. මට ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ. මම දිගටම යුනිෆෝම් ඇන්දේ නෑ මං දිගටම සිවිල් ඇඳුමෙන් හිටපු හින්දා. නමුත් මගේ පුද්ගලික මතය ස්වාමීනි ඒක.

ප්‍ර: ඔබ හිතන විදියට අනිත් නිලධාරින්ගෙන් යම් ආකාරයක බලපෑමක් ?

උ: නැහැ එහෙම බලපෑමක් තිබ්බේ නෑ. එහෙම බලපෑමක් වෙච්ච නැති හින්දයි මං ඒ තීරණය ගත්තේ ස්වාමීනි.

**********

**<u>ගරු අදිකාරී මැතිණිය.</u>**

ප්‍ර: Mr. හෙන්දාවිතාරණ ඔබ හිතුවාද ඔබ විශ්‍රාම ගිහිල්ලා තවදුරටත් යුධ හමුදාවේ මේජර් ජෙනරාල් තනතුරක සේවය කිරීම තුළින් ඔබට පහළින් සිටින නිලධාරීන්ට උසස්වීම් තිබීමේ අවශ්‍යතාවය නැතුව යනවා කියලා?

උ: ඒක බලපාන්නේ නැහැ ස්වාමීනි. මොකද ඒක Cardre එකට බලපාන්නේ නැහැ. මේ scheme එකේ ආවාට.

ප්‍ර: Cardre එකේ තනතුරක් නෙවෙයි මේජර් ජනරාල්?

උ: නැහැ. Cardre එකේ තනතුරක් නෙවෙයි. Over and above the Cardre.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>**

ප්‍ර: දැන් 2006 ඔක්තෝම්බර් මස 03 වැනිදා සිට ඔබ කියා සිටියා CNI ජාතික බුද්ධි ප්‍රධානී තනතුර පිහිටෙවුවා කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මේ ජාතික බුද්ධි ප්‍රධානී තනතුර පිහිටවලා ඒ සඳහා ඔබට එහි ප්‍රථම ජාතික බුද්ධි ප්‍රධානියා වුණේ ඔබ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් මේ ජාතික බුද්ධි ප්‍රධානී කියන තනතුර කාර්යාලයක් සහිතව පවත්වාගෙන යන තැනක් ද නැත්නම් තනි පුද්ගලයෙකු විසින් කරනු ලබන කාර්යක්ද?

උ: කාර්යාලයක් සහිතව පවත්වාගෙන යන තැනක් ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ජාතික බුද්ධි ප්‍රධානී වශයෙන් පත්වුණාට පසුව ඔබට ඔබගේ කාර්ය මණ්ඩලයේ කී දෙනෙකු පමණ සේවය කරාද?

උ: මට අමතරව නිලධාරීන් 06 ,07 දෙනෙක් විතර සිටියා ස්වාමීනි. ඊට අමතරව අනිත් clerical staff එක සිටියා.

ප්‍ර: ඒ කියන්නේ ලිපිකරු සේවයේ අයත් සිටියා?

උ: එහෙමයි ස්වාමීනි.

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ජාතික බුද්ධි ප්‍රධානීන්ගේ සිටිය නිලධාරීන් ඔවුන් ඒ සිටි නිලධාරීන් කුමන පසුබිමක් සහිත නිලධාරීන්ද සිටියේ?

උ: සියළු දෙනාම බුද්ධි රාජකාරියට සම්බන්ධ අය. හමුදා බුද්ධි අංශයෙන් සියළු දෙනාම මාත් එක්ක වැඩකර සියළු දෙනාම තුන්දෙනෙක් ඇරෙන්න හමුදා බුද්ධි අංශයට ඉඳුරාම සම්බන්ධ අය අනිත් අය Cyber intelligence වලට අපි බඳවාගත්ත signals corps එකේ නිලධාරීන්. සංඥා බලකායේ නිලධාරීන් තිදෙනෙක්.

ප්‍ර: ලිපිකාර සේවයේ සිටි පුද්ගලයන් ඒ ගොල්ලෝ කුමන ආයතන වලින් ද ඔබ ලබාගත්තේ?

උ: ඒ ගොල්ලොත් හමුදා බුද්ධි ඒකකයෙන් අනුයුක්ත කරගත්ත අය ස්වාමීනි.

ප්‍ර: මේ ජාතික බුද්ධි ප්‍රධානී කියන මේ තනතුර පිහිටුවලා ඔහුට පැවරිච්ච වගකීම් මොකද්ද?

උ: ස්වාමීනි ප්‍රධානම රාජකාරිය වුයේ ජාතින බුද්ධි ප්‍රධානීගේ බුද්ධි කටයුතු සම්බන්ධීකරණය කිරීම තමා ප්‍රධාන කාර්යය.

ප්‍ර: බුද්ධි කටයුතු සම්බන්ධීකරණය කිරීම තමයි ප්‍රධාන කාර්යය?

උ: ප්‍රධාන කාර්යය.

ප්‍ර: පැහැදිලි කරන්න මේ බුද්ධි කටයුතු සම්බන්ධීකරණය අපි සාමාන්‍යය පුද්ගලයෝ. සාමාන්‍යය පුද්ගලයන්ට වැටහෙන ආකාරයට ඔබට හැකියාවක් තියෙනව ද බුද්ධි සම්බන්ධීකරණය කියන්නේ මොකද්ද කියලා පැහැදිලි කරන්න

උ: ස්වාමීනි බුද්ධි අංශ කිහිපයක් ලංකාවේ පවත්වාගෙන යනවා. උදාහරණයක් විදියට යුධ හමුදා බුද්ධි අංශය , ගුවන් හමුදා බුද්ධි අංශය ,නාවික හමුදා බුද්ධි අංශය ඊට අමතරව රාජ්‍යය බුද්ධි සේවාව. SIS එක. පොලිස් විශේෂ කාර්යාංශය. එතකොට western province Intelligence බස්නාහිර පළාත් බුද්ධි ඒකකය පොලීසිය යටතේ. මේවා තමයි ප්‍රධාන බුද්ධි අංශ වලට තිබ්බේ. ඊට අමතර CID, TID STF ඒ සියළු දෙනා එක්කත් සම්බන්ධීකරණය කරා. ඒ ගොල්ලන්ගේ අවශ්‍යතාවයන් වලට බුද්ධි සම්බන්ධීකරණය කිරීමේ අවශ්‍යතාවය මත.

ප්‍ර: ඔබ කියා සිටියා ප්‍රධාන කාර්යය වුයේ ජාතික බුද්ධි ප්‍රධානීගේ බුද්ධි සම්බන්ධීකරණය?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ඒ සම්බන්ධයෙන් ඔබ කියා සිටියා සම්බන්ධ වන ආයතනය?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද සම්බන්ධීකරණයේ දී සිදු කළේ?

උ: මෙතැන්දී විශේෂයෙන්ම සිදුකරනු ලැබුවේ අපි සම්පූර්ණම මුල වර්ෂවල ස්වාමීනි අපි අපේ අවධානය යොමු කළේ LTTE ත්‍රස්තවාදය පරාජය

FAIR COMMENT — BY JEZEEM

කරන්න කොහොමද ඊට සම්බන්ධ යුද්ධයට අපි දන්නවා යුද්ධයක් එනවා කියලා දන්නවා LTTE එක ක්‍රියාකාරී වශයෙන් ඒ ගොල්ලෝ අවසාන වශයෙන් යුද්ධයට ලෑස්ති වෙනවා කියලා. ඒක මං හමුදාව බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් ඉන්න කොටත් මං ඒක පැහැදිලිව ම කිව්වා එවකට හිටපු සියළුම නිලධාරීන්ට මේ සටන් විරාමය හරියන එකක් නෙමේ. මේක මේ ගොල්ලොන්ට තාවකාලික විශ්‍රාම යාමක් එතැනින් කරලා තියෙන්නේ. ඒ ගොල්ලොන්ට re-group වෙන්න ඕන.නැත්නම් නැවත එක්කාසු වෙන්න ඕන. මුදල් රැස් කරගන්න ඕන. අන්තර් ජාතික සැලැස්ම එවකට බිඳී ගොස් තිබුණා. 09/11 attack එකත් එක්ක. ඒවා නැවත හරිගස්ස ගන්න ඕන. එතකොට සෑහෙන්න Cardersලා කොටි ත්‍රස්තවාදී සෑහෙන්න ප්‍රමාණයක් මිය ගිහිල්ලා හිටියා. එතකොට අවි ආයුධ තිබුණේ නැහැ අපේ හමුදාව එක්ක යුද්ධ කරන්න. ඒක හින්දා තමයි මේ සටන් විරාමයක් 2001 දෙසැම්බර් 24 වැනිදා ප්‍රභාකරන් declare කරේ. Unilateral ceasefire ඉතිං ඒක declare කරාම මම ඒ අවස්ථාවේ දී පැහැදිලි කරලා දුන්නා මේක හරියන්නේ නැහැ මේක බොරුවක් කරන්නේ මං හිතන්නේ ඒකට නිසි අවධානයක් යොමු කළේ නැහැ. ඒ අවස්ථාවල ස්වාමීනි ඔබ ඇහු ප්‍රශ්නයට කෙළින් පිළිතුරු දෙනවනම් අපි ගොඩක් යොමු කළේ යුද්ධය අවසන් වෙනකම්ම වගේ අපේ ප්‍රධාන අවධානය යොමු වුණේ LTTE ත්‍රස්තවාදිය මෙරට සහ අන්තර්ජාතික වශයෙන්.

ප්‍ර: අන්තර්ජාතික වශයෙන් ඒ කියන්නේ LTTE ත්‍රස්තවාදිය පරාජය කිරීමේ බුද්ධි තොරතුරු සම්බන්ධිකරණයි?

උ: එහෙමයි.

ප්‍ර: එහිදී අන්තර්ජාතික වශයනුත් ඔබලා බුද්ධි තොරතුරු බුද්ධි සම්බන්ධීකරණයක් කරාද?

උ: එහෙමයි ස්වාමීනි. ඒක ඉතාමත් වැදගත් මොකද අපේ රටට ඉදුරාම යුද්ධයට බලපාන සියළු රාජකාරී සිද්ධ වුණේ ගොඩාක් දේවල් පිටරට. ඒ කියන්නේ මුදල් එකතු කිරීම යුද්ධයට අවශ්‍ය අවි ආයුධ ගැනීම. එතකොට ප්‍රචාරක කටයුතු ඒ සියළු දේම අපේ රට ඉතින් විරුද්ධව හමුදාවට විරුද්ධව සියළු දේම සිද්ධ වුණේ පිට රටට. අපි ඒ සම්බන්ධයෙන් විශේෂ දැනීමක් ඇති කරගෙන අපි සියළු සම්බන්ධිකරණය කරගෙන ගියා.

ප්‍ර: එතකොට මේ විදේශයන් සමඟ බුද්ධි සම්බන්ධීකරණය කොහොමද ඔබ ක්‍රියාත්මක කළේ කියලා අපිට රහස්‍යය තොරතුරු අවශයය නැහැ සාමාන්‍යය ක්‍රියාත්මක කරන ක්‍රමවේදය පැහැදිලි කරන්න පුළුවන් ද?

උ: ස්වාමීනි අපි රටවල් වලට අපේ නිලධාරින් යොදවලා තිබුණා. ඊට අමතරව ඒ රටවල්වල බුද්ධි අංශ සමඟ අපි ඉදුරාම සම්බන්ධ වුණා. ඊට

FAIR COMMENT — BY JEZEEM

අමතරව ඒ සමඟ නොයෙකුත් අපිට අවශ්‍යය රටවල්වල මෙහි තනාපති වල ඉන්න බුද්ධි නිලධාරීන් සමඟ ඒ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා. ඊට අමතරව විශේෂයෙන්ම අපිට අවශ්‍යය රටවල ඉදුරාම බුද්ධි අංශ වල ප්‍රධානීන් සමඟ සම්බන්ධීකරණයක් තිබ්බා.

ප්‍ර: ඔබට උදාහරණයක් හෝ උදාහරණ කිහිපයක් දක්වන්න පුළුවන් ද ඔබ ජාතික බුද්ධි ප්‍රධානී වශයනේ කටයුතු කිරීමේ දී LTTE ත්‍රස්ත වාදය පරාජය කිරීම සඳහා සම්බන්ධ කරගත් විදෙස් බුද්ධි අංශ එහෙම නැත්නම් රටක් වශයෙන් ඔබට ඉදිරිපත් කිරීමේ හැකියාවක් තියෙනවද?

උ: ස්වාමීනි මං රටක් වශයෙන් නම් කරන්නෙ නැතුව ඉන්නම් උදාහරණයක් විදියට අපි LTTE අවි ආයුධ ගන්නවා.අපි දන්නවා යම් කිසි ස්ථානයකින් අවි ආයුධ ගන්නවා යුද්දෙට හරියන්න නැවකට හරියන්න අවි ආයුධ ගේන්න නැවක් පිටින් ලෑස්ති කරලා තිබ්බා ගේන්න. ඒ අවස්ථාවේ දී අපි ඒ නැව සම්පූර්ණයෙන්ම ඒ නැව ඒ harbour එකේම අත්අඩංගුවට ගන්න සැලැස්සුවා. ඒ එකක් පමණයි ස්වාමීනි.

ප්‍ර: දැන් මේ බුද්ධි සම්බන්ධීකරණ කටයුතු ඔබ සිදු කළේ කොහොම ද?

උ: ස්වාමීනි මම ඉස්සෙල්ලා කිව්ව විදියට අපිත් එක්ක ඉ දුරාම සම්බන්ධ වුණා ඒ රටවල් වල බුද්ධි අංශ ප්‍රධානීන්.

ප්‍ර: නැහැ නැහ මං කියන්නේ සම්බන්ධීකරණ ක්‍රියාවලියේ දී මේ බුද්ධි තොරතුරුනේ ඔබ සම්බන්ධීකරණය කරන්නේ. බුද්ධි ආයතන ඔබ සම්බන්ධීකරණය කරා.

උ: එහෙමයි ස්වාමීනි

ප්‍ර: එමගින් සිදු වුණේ බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමක් ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙම බුද්ධි තොරතුරු හුවමාරු කිරීම දේශීයව ලැබෙන බුද්ධි තොරතුරුද නැත්නම් විදේශයෙන් ලැබෙන බුද්ධි තොරතුරුද? එහෙම නැත්නම් ඒ දෙකම ද?

උ: ස්වාමීනි ඒ දෙකම. මං ඉස්සෙල්ලා මම කතා කළේ විදේශීයව ලැබෙන තොරතුරු සම්බන්ධයෙන් ඉස්සෙල්ලා කතා කළේ. දේශිය සම්බන්ධයෙන් අපේ රට ඇතුළත තිබ්බ බුද්ධි අංශ වල බොහෝම සම්බන්ධතා ළඟ සම්බන්ධීකරණයක් සිද්ධ වුණා.

ප්‍ර: ඒ සම්බන්ධීකරණ ක්‍රියාවලිය සිදු කළේ? ඒ කියන්නේ රැස්වීම් පවත්වලාද නැත්නම් මොන ආකාරයට ද කියලා ඔබට පැහැදිලි කිරීමේ හැකියාවක් තියෙනව ද?

උ: පුළුවන් ස්වාමීනි.

**කොමිෂන් සභාව කටයුතු ඉතා සුළු මොහොතකට කල් තබමි.**
**නැවත රැස්වේ.**

FAIR COMMENT BY JEZEEM

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>**

ප්‍ර: දැන් මේ බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම ලංකාවේ තිබෙන බුද්ධි ආයතන සමඟ කොහොම ද සිදු කළේ. රැස්වීම් මාර්ගයෙන්ද නැත්නම් දුරකථන මාර්ගයෙන්ද නැත්නම් සියළු දෙනාම එකම මෙසයකට ගෙනැල්ලා පවත්වපු සාකච්ඡාවකින්ද කියලා ඔබට පැහැදිලි කරන්න පුළුවන් ද?

උ: පුළුවන් ස්වාමීනි. අපි ජාතික බුද්ධි ප්‍රධානීන් වශයෙන් පත්වුණාට පස්සේ සෑම අගහරුවාදාකම ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් බුද්ධි සම්බන්ධීකරණ සාකච්ඡාවක් පවත්වනවා. ඒකට බුද්ධි අංශ ප්‍රධානීන් සියළු දෙනාම පැමිණියා. ඒ එක්කම පොලිස්පතිතුමා පසුකාලීනව හමුදාපතිවරුත් සියළු දෙනාමත් පැමිණෙනවා. ඊට අමතරව CID, TID, STF ප්‍රධානීනුත් පැමිණෙනවා.

ප්‍ර: දැන් ඔවුන් මෙම ඔබ සඳහන් කරන්නට යෙදුණු ලංකාව තුළ ක්‍රියාත්මක වන රජයට සම්බන්ධ බුද්ධි ආයතන සියල්ලම මෙම රැස්වීම සඳහා පැමිණිය යුතුයි කියල ද ඔබ කියන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඊට අමතරව පොලිස්පතිතුමාත් CID,TID,STF හි ප්‍රධානීනුත් පැමිණිය යුතු බව ඔබ කියා සිටියා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙම තැනැත්තන් අනිවාර්යෙන්ම පැමිණිය යුතුද?

උ: අනිවාර්යෙන්ම පැමිණිය යුතුයි.

ප්‍ර: එසේ අනිවාර්යෙන්ම ඔවුන් පැමිණිය යුතු බවට ලිඛිත වශයෙන් කිසියම් නීතියක් හරි රෙගුලාසියක් හරි සකස් කරලා තියෙනව ද?

උ: ඒක සම්ප්‍රදායක් වශයෙන් පැවතුණා නමුත් ඒක නීතියක් වශයෙන් දන්වලා නැහැ. ආරක්ෂක ලේකම්තුමා පැහැදිලිවම Instruction උපදෙස් දීලා තියෙනවා. මේවා හැමදාම සතියේ සෑම සතියකම සෑම අඟහරුවාදාකම මෙම ආරක්ෂක සම්බන්ධීකරණ බුද්ධි සම්බන්ධීකරණ සාකච්ඡාව පවත්වන්න ඕනෙයි කියලා. එතුමා නැති දවසට ඒ සාකච්ඡාව මම කරගෙන ගියා ස්වාමීනි.

ප්‍ර: දැන් මෙම ජාතික බුද්ධි ප්‍රධානී කියන තනතුර ස්ථාපිත කිරීමේ දී කැබිනට් මණ්ඩල අනුමැතියක් ලබාගන්නට යෙදුණ ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහි දී ජාතික බුද්ධි ප්‍රධානීන්ගේ කාර්ය භාර්ය සම්බන්ධයෙන් අමාත්‍යය මණ්ඩල සංදේශයක් සකස් කරාද නැද්ද කියන්න ඔබට දැනීමක් තියෙනව ද?

උ: සකස් කර තිබුණා ස්වාමීනි.

ප්‍ර: ඔබට මතක ද එහි දිනය අවම වශයෙන් කාලවකවානුව?

FAIR COMMENT BY JEZEEM

උ: මම හිතන්නේ මම ඒක කොමිෂමට භාර දුන්නා. සාක්ෂි සටහන් දෙන වෙලාවේ.

**මේ අවස්ථාවේ දී 2007 ජනවාරී මස 31 දිනැති අමාත්‍යය මණ්ඩල සංදේශය සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා. පරීක්ෂා කර බලයි. ජාතික බුද්ධි ප්‍රධානී කියන මෙම අමාත්‍යය මණ්ඩල සංදේශය C 834 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.**

එසේම මෙම තනතුර ජාතික බුද්ධි ප්‍රධානී තනතුර ඇති කිරීම සහ එය අනුමත කිරීම සම්බන්ධයෙන් වන කළමනාකරණ සේවා දොපාර්තමේන්තුවේ 2007/01/16 දිනැති ලේඛනය සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා. එම ලේඛනය මේ අවස්ථාවේ දී **C 835 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.**

ප්‍ර: දැන් ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානයෙන් පැවැත්වෙච්ච අගහරුවාදා දින පැවැත්වෙච්ච රැස්වීම සම්බන්ධයෙන් ලිඛිතව ඒ සඳහා සහභාගි වන ආයතන සහ පුද්ගලයින්ට ලිඛිතව දැනුම් දීමක් කරාද?

උ: අනිවාර්යෙන්ම කරනවා ස්වාමීනි. ඒක මගේ කාර්යාලයේ වෙනම නිලධාරීනියක් සිටියා ඒ කාලේ එයා තමයි ඔක්කොම දැනුම් දෙන්නේ අහවල් දවසේ අහවල් වෙලාවට තියෙනවා කියලා. හැබැයි පසුකාලීනව අපි දැනුම් දුන්නේ නැහැ නැත්නම් විතරක් කියනවා. නැත්නම් අනිවාර්යෙන්ම සහභාගී විමක් අවශ්‍යය හින්දා.

ප්‍ර: ඒ අනුව මෙම රැස්වීම අඛණ්ඩව පවත්වාගෙන යන්නට යෙදුණ ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙම රැස්වීමට ඔබ කියා සිටියා රජයට සම්බන්ධ බුද්ධි අංශ සහභාගි වෙනවා කියලා. එම බුද්ධි අංශ වල කුමන තනතුරු දරණ නිලධාරීන්ද ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමට සහභාගී වුනේ ?

උ: උසස්ම නිලධාරීන්. උදාහරණයක් විදියට ජාතික බුද්ධි සේවාව බැලුවාහම SIS එකේ director. එන්නම ඕන.

වේලාව: පෙ.ව.11.45
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

FAIR COMMENT BY JEZEEM

දැන් වේලාව : පෙ.ව.11.45
පෙර සටහන් ල/ලේ : සචිනි මෙනවිය.
මෙතැන් සිට ල/ලේ : නිල්මිණි.

**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා**

ප්‍ර: DIM එක බැලුවොත් ?

පි: Director එන්නම ඕනි.

ප්‍ර: එම අංශ වල ප්‍රධානීන් පැමිණීම අනිවාර්යමයි?

පි: පැමිණීම අනිවාර්යයි.

ප්‍ර: ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ වගේ CID, TID,STF යන ආයතනත් මෙම සම්බන්ධීකරණ රැස්වීමට සහභාගී වූ බව ඔබ කියා සිටියා?

පි: අනිවාර්යයෙන්ම සහභාගී වුණා.

ප්‍ර: දැන් එම ආයතන නියෝජය කරමින් මෙම රැස්වීමට සහභාගී වුණේ මොන නිලයේ නිලධාරීන්ද?

පි: CID Senior DIG, එහෙම නැත්නම් DIG හිටියොත් DIG නැත්නම් CID Directorටත් එනවා.

ප්‍ර: ඒ කියන්නේ Senior DIG සහ DIGසහ Director

පි: Senior DIG and Director CID

ප්‍ර: CID එකේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ අධ්‍යක්ෂක ඒ සඳහා වෙනවා. දැන් TID ත්‍රස්ත මර්දන විමර්ශන කොට්ඨාශය දැන් TID එක වෙනුවෙන් කවුද මේ සම්න්ධීකරණ රැස්වීම?

පි: DIG,TID නියෝජ්‍ය පොලිස්පති ත්‍රස්ත විමර්ශන ඒකකය.

ප්‍ර: STF එක වෙනුවෙන් කවුද?

පි: Commandant STF

ප්‍ර: ආඥාපති STF. දැන් ඔබ කී මෙම ප්‍රධානීන්ට හැකියාවක් තිබ්බද ඔවුන් වෙනුවෙන් represented නැතුව ඔවුන්ගේ නියෝජිතයන් ඒ කියන්නේ නිලයෙන් අඩු ප්‍රධාන නිලධාරීන් මෙම සම්බන්ධීකරණ රැස්වීම සඳහා සහභාගී කරවන්න?

පි: නැත ස්වාමීනි මම හිතන්නේ ඒක රාජකාරිමය මට්ටමෙන් ඒ අවශ්‍ය උසස්ම නිලධාරියා රාජකාරි මත එක්කෝ පිටරට ගිහිල්ලා එක්කෝ කොහෙට හරි ගිහිල්ලා තියෙනවා නම් පමණයි ඊළඟ නිලධාරියා පැමිණෙන්නේ. නැත්නම් අනිවාර්යයෙන්ම උසස් නිලධාරියාම පැමිණෙනවා ඒක අනිවාර්යයි.

ප්‍ර: එතකොට දැන් ඔබ කී ආයතන වල ප්‍රධානීන් වෙත අභිමතයක් ලබාදී තිබුණද මෙම රැස්වීමට සහභාගී වෙනවද නැද්ද යන්න සම්බන්ධයෙන් ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: අනිවාර්යයෙන්ම පැමිණිය යුතුයි.

ප්‍ර: ඒ වගේම මෙම ආයතන හෝ ප්‍රධාන නිලධාරින්ට හැකියාව තිබ්බද මෙම රැස්වීමට සහභාගී නොවී ආරක්ෂක ලේකම්ට කරුණු ඉදිරිපත් කර ඒ කියන්නේ ඔවුන්ගේ තොරතුරු ඉදිරිපත් කර මෙම ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමට සහභාගී වීම වැළැකී සිටීම?

පි: ස්වාමීනි ඉන් අදහස් කරන්නේ ආරක්ෂක ලේකම්තුමාට දැනුම් දීලා

ප්‍ර: නැහැ රැස්වීමට පෙර ආරක්ෂක ලේකම්තුමා හමු වෙලා කිසියම් දෙයක් ප්‍රකාශ කරලා උදාහරණයක් ලෙස තමන් විසින් කරනු ලබන විමර්ශනයන් හෝ පරීක්ෂණයන් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට හැකියාවක් නැහැ කියලා යන යන තත්ත්වයේ ඉදිරිපත් කරලා එම රැස්වීමෙන් සහභාගී නොවී නික්ම යන්න?

පි: ස්වාමීනි එහෙම තත්ත්වයක් මගේ කාලයේ තිබ්බේ නැහැ. හැමදේම මම දැනගෙන හිටියා. හැමදේකටම මම සහභාගී වුණා. මගෙන් පිට කොහෙටක්වත් ඉඳුරාම සම්බන්ධවීමක් තිබ්බේ නැහැ. එහෙම අවශ්‍යතාවයක් තිබ්බනම් ඒ අවශ්‍ය ආයතනයේ ප්‍රධානීයායි මමයි දෙන්නම ගිහිල්ලා ඒක ඉදිරිපත් කරනවා. එහෙම අවශ්‍යතාවයක් තියෙනවානම්. ඒත් යම් කිසි කාලයකට පමණයි need to know basis එක යන්නේ. ඊට පස්සේ We have to share that information in one stage.

ප්‍ර: හරි දැන් ඔබ කියා සිටියා මෙම ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම සෑම අඟහරුවාදාම පවත්වනවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙම ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමේදී ඔය රාජ්‍ය බුද්ධි අංශයත් හමුදා සහ රාජ්‍ය බුද්ධි සේවාව දැන් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය එහෙම නැත්නම් ඔවුන් මෙම රැස්වීමේ දී කරන කාර්ය කුමක්ද?

පි: ස්වාමීනි රැස්වීම පැවැත්වීමේ අදහස තොරතුරු හුවමාරු කර ගැනීම. මොනවාහරි යම්කිසි දෙයක් තියෙනවානම් එක ආයතනයකට විතරක් කරන්න බැරි හුවමාරු අපි කරගෙන අපි අනිත් ආයතන සහභාගීත්වයෙන් ඒ තොරතුරු වලට අදාළව තොරතුරු තව දුරටත් විමර්ශනය කිරීමට අවශ්‍ය නම් අපි කරලා යනවා. Share කරන්න ඕන්නම් තව දුරටත් Share කරලා ඒ විදිහට අපිට අවශ්‍ය ක්‍රියාන්විතයන්ට, අවශ්‍යනම් ක්‍රියාන්විත වලට අවශ්‍ය තොරතුරු එහෙම නැත්නම් අත්අඩංගුවට ගැනීමට අවශ්‍යනම් ඒවාට අවශ්‍ය තොරුතුරු ඒ ඒ ආයතන වලට අපි පැහැදිලිව උපදෙස් දෙනවා.

ප්‍ර: අපි ලෙස ඔබ අදහස් කරන්නේ ?

පි: අපි ලෙස අදහස් කළේ ස්වාමීනි ආරක්ෂක ලේකම්තුමා සහ මම.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මේ තොරතුරු හුවමාරුව ඒ කියන්නේ රාජ්‍ය ආරක්ෂාවට ඉතා වැදගත් තොරතුරක් හුවමාරු නොකර සිටීමේ හැකියාවක් බුද්ධි අංශ හෝ ඔබ සඳහන් කරපු අනිත් ඒකක ආයතන වලට තිබ්බද?

පි: ස්වාමීනි ඒ හුවමාරු නොකර කොහොමද එතනින් ඉස්සරහාට යන්නේ.

ප්‍ර: ඇයි?

පි: මට හිතාගන්න අමාරුයි. ඒක යම්කිසි action plan එකකට අවශ්‍ය තොරතුරු share කර ගන්නම ඕනි.

ප්‍ර: මොකක්ද ඒකේ ඇයි බුද්ධි ඒකකයට තොරතුරු තියෙනවා. ඉතින් ඔවුන්ට ඒ සම්බන්ධයෙන් ඔවුන්ට ඒ අදාළ බුද්ධි ආයතනයට උදාහරණයක් ගත්තොත් SIS ජාතික බුද්ධි සේවාවට ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරලා ඒ තමන්ගේ තොරතුරු මත ඉදිරි ක්‍රියාමාර්ග ගන්න පුළුවන් නේද?

පි: මම හිතන්නේ ඒක තනිකර තනියෙන් කරන ක්‍රියාවක්. ඒක තමයි ස්වාමීනි 2006 ජාතික බුද්ධි ප්‍රධානි වශයෙන් කෙනෙක් පැමිණෙන්ට පෙර ආරක්ෂක ලේකම්තුමාට පෙර පැමිණෙන් තිබු තත්ත්වය ඔය. ඒක තමා අසාර්ථකත්වය. අපේ සාර්ථකත්වය අපි ඔක්කෝම එකතු වෙලා එක තැන ඔක්කෝම සාකච්ඡා කරලා මොනවද කරන්න ඕන කියලා decide කරලා action plan එකකට ගියපු එක අපේ සාර්ථකත්වය. මේ 2015ට පෙර මං හිතන්නේ එහි පැවසෙන්නේ 2015ට පෙර තිබිච්චි තත්වයක් මට පේන විදිහට.

ප්‍ර: ඔව් මම ඔබෙන් අසන්නේ ඔබගේ කාල සීමාව සම්බන්ධයෙන් ?

පි: මගේ කාල සීමාව තිබ්බේ නැහැ ස්වාමීනි.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු ඒ 2015ට පසුද පෙරද ඒ තත්වය?

පි: මේ හුවමාරු කර නොගත්තේ 2015ට පසු. එතකොට අර water tight compartment වල තමයි Intelligence agencies වැඩ කළෙත්. එක එක්කනා වෙන වෙනම.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: 2015ද 2005 ද?

පි: 2005 ට පෙර ස්වාමිනි සමාවෙන්න. වැරදීමක් ස්වාමීනි.

**********

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා**

ප්‍ර: දැන් මේ ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමේ දී දැන් ඔබ කියා සිටියා තොරතුරු හුවමාරු කර ගැනීම සිදු වෙනවා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් එම තොරතුරු හුවමාරු කර ගැනීම සිදු වීමේදී ජාතික ආරක්ෂාවට සිදුවිය හැකි තර්ජනයක් හඳුනා ගැනීමක් කරනවද?

පි: අනිවාර්යයෙන්ම ස්වාමීනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් එහෙම නැත්නම් යම් තොරතුරක වැදගත්කම අනුව ඊට ගතයුතු ක්‍රියාමාර්ගයක් ගන්න ඕනිනම් ඒ ක්‍රියාමාර්ගය ගැනීම සිදු කරන්නේ කොයි අවස්ථාවේද?

පි: ඒක මුල ඉඳන්මයි ක්‍රියාත්මක වෙන්න ඕනි ස්වාමීනි. තොරතුරු හුවමාරු කර ගැනීමේ තොරතුරු මත. මොන ක්‍රමයේ තොරතුරක්ද දෙන්නේ කියන එක මත තමයි ඒක decide වෙන්නේ.

ප්‍ර: හරි. දැන් ඒ තොරතුර මත ගත යුතු ක්‍රියාමාර්ගය හෝ ක්‍රියාමර්ග මොනවාද යන්න තීරණය කරලා එය ක්‍රියාත්මක කරන්නේ කවුරු විසින් ද?

පි: ඒ ආයතන වලට අපි භාර දෙනවා. Law enforcement එකට.

ප්‍ර: දැන් ඒ ආයතනවලට එම directive එක, එම උපදේශය, එම නියෝග කවුරු විසින් ද ලබා දෙන්නේ ?

පි: ආරක්ෂක ලේකම්තුමා ඒ වෙලාවේම දෙනවා. එහෙම නැත්නම් මම දෙනවා.

ප්‍ර: ආරක්ෂක ලේකම්තුමා එවේලෙම දෙනවා නැත්නම් ඔබ දෙනවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ලබා දෙන්නේ ආරක්ෂක ලේකම් නොමැති අවස්ථාවේදී ද නැත්නම් ද අවස්ථානෝචිත පරිදිද?

පි: නොමැති අවස්ථාවෙත් දෙනවා. ඉන්න අවස්ථාවලත් මම දීලා මම ආරක්ෂක අමාත්‍යතුමා දැනුවත් කරනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ජාතික බුද්ධි ප්‍රධානි වශයෙන් ලබාදෙන උපදෙස් ලිඛිතව ලබාදෙනවද නැත්තනම් වාචිකව දෙන directives ද නැත්නම් වාචිකව ලබා දෙන ලද නියෝගයන්ද?

පි: නැහැ අපි සම්බන්ධීකරණ කරන අවස්ථාවේ දී ඒ conference එකේදී සාකච්ඡා වලදී එතන ඔක්කෝම Minutes වෙනවා. එතන action plan එක යනවා කාටද මොනවද කරන්නේ කියලා කියලා තියෙන්නේ කියලා. එතකොට ඒක ආපහු ඒක අපේ Minutes බෙදා හරිනවා ඒ ආයතන ප්‍රධානීන්ට. එතකොට ඒගොල්ලෝ දන්නවා මේ මේ රාජකාරි කරන්න එන්න ඕනි මේ මේ සැරේ සාකච්ඡාවට සම්බන්ධ වෙනකොට. ඊට අමතරව ඔය පොලිසියට දේවල් අවශ්‍යනම් ඒ කියන්නේ arrest කිරීමක්

FAIR COMMENT BY JEZEEM

recover කරන්න දෙයක් එහෙම තියෙනවා නම් අපි පොලිසියට, TID එකට එහෙම නැත්නම් CID එකට ඒ අවශ්‍ය තොරතුරු දීලා ඒක අපි follow-up කරනවා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියා සිටියේ ඒ රැස්වීමේ සිදුවෙන සියලු කරුණු සටහන් කර ගන්නවා කියලා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ සටහන් කර ගත්ත කරුණු ඒ එක් එක් ආයතනයට අවශ්‍ය බලපාන ඒ Minutes ඒ තොරතුරු ඔබලා ජාතික බුද්ධි ප්‍රධානි විසින් ඒ අදාළ ආයතන වෙත ලබාදෙනවා?

පි: ඒ අදාළ තොරුතුරු පමණක් නෙවෙයි ස්වාමීනි. ඒකට සම්පූර්ණ conference Minute යනවා. ඒ Minute එකේ දකුණු පැත්තෙන් යනවා action කරන්න ඕනේ කාටද කියලා. මොකද සාකච්ඡා කරන කොටත් ඒගොල්ලෝ හිටියා. ඉතින් ඒක හින්දා වෙන වෙනම උපදෙස් දීමක් අවශ්‍ය වෙන්නේ නැහැ ඒ බුද්ධි අංශ වලට.

ප්‍ර: ඒ කියන්නේ මෙම ජාතික ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම සතිපතා තියෙන එම රැස්වීමේ වෙන දේ එතනදී ලේඛන ගත කරනවා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ලේඛන ගත කරලා ඒ දෙන ලද තොරතුරු වලට අදාළව action plan ගතයුතු පියවර එහි තවත් තීරුවක සටහන් වෙනවා මේ ලේඛන ගත කිරීමේ දී?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මේ සියලු ලේඛන ගත කරන ලද කරුණු ඇතුලත් ලේඛනය මෙම රැස්වීමට සහභාගී වූ පාර්ශවයන් වෙත ලබා දෙනවා?

පි: සම්බන්ධ වීමට පෙර ලබා දෙනවා. මේ අඟහරුවාදා තිබ්බ නම් අපි බදාදා වෙනකොට බදාදා උදේ minute ගිහිල්ලා ඉවරයි ඒ ආයතන වලට. එහෙම නැත්නම් අඟහරුවාදා හවසම minute යනවා.

ප්‍ර: ඒ ලබාදීම කොහොමද සිදු කරන්නේ ?

පි: personally Deliver කරනවා ස්වාමීනි.

ප්‍ර: කවුරු විසින්ද?

පි: Dispatch rider අතේ

ප්‍ර: ඒ කියන්නේ ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලයේ සිටින බෙදා හැරීම් නිලධාරි මාර්ගයෙන් අදාළ ආයතන වෙත ප්‍රධානින්ට ලැබෙන්න සලස්වනවා?

පි: ප්‍රධානීන්ට ලැබෙන්න සලස්වනවා.

ප්‍ර: දැන් එහෙම මොකක්ද වෙච්ච තොරතුර action plan ගත යුතු පියවර මෙහි සඳහන් වෙන බව ඔබ කියා සිටියා. දැන් ඊළඟ සතියේ පවත්වනු ලබන සම්බන්ධීකරණ රැස්වීමේ දී ඊට පෙර සතියේදී සාකච්ඡා කරපු දේ

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

හරි එහෙම නැත්නම් action plan එක හරි එහෙම නැත්නම් action plan එකේ ප්‍රගතිය සම්බන්ධයෙන් හරි සාකච්ඡා කිරීමක් සිදු වෙනවද?

පි: එහෙම සිද්ධ වෙනවා ස්වාමීනි.

ප්‍ර: කවද්ද ඒ?

පි: සාකච්ඡා පටන් ගැනීමට පෙර.

ප්‍ර: සාකච්ඡාව පටන් ගැනීමට පෙර?

පි: දැන් උතුමාණෙනි අපි ගිය සතියේ දී අපි conference meeting ගියාම මේ සතියේ අඟහරුවාදා පටන් ගන්නකොට ඉස්සෙල්ලාම සාකච්ඡා කරන්නේ ප්‍රගති සමාලෝචනයක් කරනවා අපි.

ප්‍ර: ඒ ප්‍රගති සමාලෝචනයේ කවුද ?

පි: ඒක මම ඉදිරිපත් කරනවා. එතකොට ආරක්ෂක ලේකම්තුමාත් ඉන්නවා. එතුමාටත් අවශ්‍ය දේවල් එතුමා ඒ වෙලාවේ කියනවා. මේක කරලා නැත්නම් ඒකට හේතු දක්වන්න ඕනි. එහෙනම් ඉතින් ඒකට සාධාරණ හේතු තියෙනවා. ඒක ඒ වේලාවේම ඒකට උත්තර දෙන්න බැරි. එහෙම වුණත් ඒක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ ඉතින්.

ප්‍ර: ඒ කියන්නේ යම් දිනයක ගනු ලබන action plan එම කරුණ අවසන් වනතුරු ඒ ප්‍රගතිය දිගින් දිගටම සලකා බැලීම සිදු කරාද?

පි: කරා ස්වාමීනි. අවසානයක් දක්වාම කරා ස්වාමීනි.

ප්‍ර: දැන් මෙම ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමේ දී ගනු ලබන තීරණ එහෙම නැත්නම් action plan මේ සම්බන්ධයෙන් ආරක්ෂක ඇමතිවරයාව දැනුවත් කරනවද?

පි: අපි අඟහරුවාදා බුද්ධි රාජකාරි සම්බන්ධයෙන් රැස්වීම තියලා බදදා අනිවාර්යයෙන්ම National Security Council ආරක්ෂක මණ්ඩලය රැස්වෙනවා. අනිවාර්යයෙන්ම රැස්වෙනවා. එතන දී වැදගත් දේවල් කතා කරලා තව උපදෙස් ගන්න තියෙනවානම් ගන්නවා නැත්නම් අපි තව දුරටත් ක්‍රියාකාරීත්වයේ යෙදෙන්න තියෙන අවශ්‍ය දේ පමණක් එතනදී කියනවා. නැත්නම් සාමාන්‍යයෙන් ජාතික ආරක්ෂාවට බලපාන කරුණුක් නම් එය අනිවාර්යයෙන්ම සාකච්ඡාවට භාජනය වෙනවා.

ප්‍ර: දැන් ආරක්ෂක මණ්ඩලයේ කවුද සහභාගී වන්නේ ?

පි: ආරක්ෂක මණ්ඩලයට සහභාගී වෙන්නේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අගමැතිතුමා, ජනාධිපති ලේකම් තුමා, ආරක්ෂක ලේකම්තුමා CDS Chief of Defense Staff, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, (Army Commander, Navy Commander, Air force Commander) යුධ හමුදාපති, ගුවන් හමුදාපති, නාවික හමුදාපති, පොලිස්පති, ජාතික බුද්ධි ප්‍රධානි මුලට සහභාගී වෙනවා පසුව SIS ජාතික බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක සහභාගී වුණා. ඊට අමතරව හමුදා බුද්ධි අධ්‍යක්ෂකත් සහභාගී වුණා අවසාන කාලයේ වෙනකොට.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ

පි: සමාවෙන්න මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, විදේශ අමාත්‍යාංශයේ ලේකම්තුමාත් පැමිණියා.

ප්‍ර: එතකොට CID එක භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති TID එක භාර අධ්‍යක්ෂක හෝ නියෝජ්‍ය පොලිස්පති මෙම ආරක්ෂක මණ්ඩල රැස්වීමට සහභාගී වෙනවද නැද්ද?

පි: මම ඉන්න කාලයේ නම් සහභාගී වෙන්නේ නැහැ ස්වාමීනි. මොකද පොලිස්පතිතුමා සහභාගී වෙනවා.

ප්‍ර: එතකොට මෙම රැස්වීමට අගමැතිතුමාගේ ලේකම් සහභාගී වෙනවද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ මේ නම් සඳහන් කරපු පුද්ගලයෝ අනිවාර්යයෙන්ම ආරක්ෂක මණ්ඩල රැස්වීමට සහභාගී වෙනවද?

පි: සහභාගී වෙනවා ස්වාමීනි.

ප්‍ර: අගමැතිතුමා පවා?

පි: සහභාගී වෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබ මේ ජාතික බුද්ධි ප්‍රධානි වශයෙන් කටයුතු කරපු කාලයේ ආරක්ෂක ඇමතිවරයාට අමතරව රාජ්‍ය ආරක්ෂක ඇමතිවරයෙක් හිටියද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: එහෙම නැත්නම් නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයෙක් ?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා ආරක්ෂක ලේකම් හරි ඔබ හරි නියෝගයන් ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමට සහභාගී වන අයවලුන් වෙත ලබාදෙනවා කියලා?

පි: නැවත වරක් කියන්න ස්වාමීනි.

ප්‍ර: ඔබ කියා සිටියා ඔබ මීට පෙර මා ප්‍රශ්න කිරීමේ දී ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමට සහභාගී වන ඒ ප්‍රධානීන් සහ බුද්ධි අංශ වෙත උපදෙස් ආරක්ෂක ලේකම්තුමා හෝ ජාතක බුද්ධි ප්‍රධානීන් විසින් ලබාදෙන බව ?

පි: ඔව්.

ප්‍ර: දැන් මෙම උපදෙස් ලබා දුන්නම ඒ උපදෙස් ලබාදෙන ලද්දේ ජාතික බුද්ධි ප්‍රධානී විසින් පොලිස්පතිවරයාට හෝ හමුදාපතිවරයාට නම් ඔවුන්ට හැකියාව තිබෙනවද ජාතික බුද්ධි ප්‍රධානි විසින් ලබාදෙන උපදෙසක් නොසළකා එහෙම නැත්නම් අවතක්සේරුවට ලක් කරලා ඒ සම්බන්ධයෙන් ක්‍රියා නොකර සිටින්නට?

පි: එහෙම තත්වයක් නම් තිබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ඔබ ජාතික බුද්ධි ප්‍රධානි වශයෙන් ඒ බුද්ධි අංශයකට හෝ පොලිස්පතිවරයාට එහෙම නැත්නම් Senior DIG ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති CID හරි නියෝජ්‍ය පොලිස්පති TID වෙත ලබාදෙන

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උපදෙසක් ඔවුන් විසින් ක්‍රියා නොකර සිටීමේ තත්වයක් තිබුණේ නැහැ කියලද ඔබ කියා සිටින්නේ? ඔබගේ කාලය තුල

පි: එහෙම ක්‍රියා නොකර ඉන්නේ නැහැ. අනිවාර්යෙන් ක්‍රියාවේ යෙදවෙනවා.

ප්‍ර: යම් අවස්ථාවකදී ඔබගේ සේවා කාලය තුළ ජාතික බුද්ධි ප්‍රධානි වශයෙන් ඔබගේ සේවා කාලය තුළ බුද්ධි තොරතුරු පොලිස්පතිතුමා වෙත ලිඛිතව ඔබ විසින් ලබාදී තිබෙනවද?

පි: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ බුද්ධි තොරතුරු ඔබ විසින් ලබා දීමේදී එවැනි බුද්ධි තොරතුරක් වෙනත් පාර්ශවයන් සමඟ ඒ කියන්නේ ඔබ විසින් ලබාදෙන ලද ලේඛනය වෙනත් පාර්ශවයන් සමඟ හුවමාරු කරගන්න එපා කියලා ඔබ සඳහන් කිරීමක් එහෙම කරනවද?

පි: නැත ස්වාමීනි.

ප්‍ර: මම මෙහෙම අහන්නම්. ඔබ දන්නවද ඔබගේ සේවා කාලය තුල සහ ඔබගේ බුද්ධි පළපුරුද්ද තුල මේ Eyes Only , Top Secret , Urgent , Confidential මේ වචන භාවිතා වෙනවද නැද්ද?

පි: භාවිතා වෙනවා ස්වාමීනි ඒක Security Classification එකක් කියලා තියෙනවා. මේ හැම ඒක භාවිතා වෙන දෙයක්. ඒ කියන්නේ Top Secret, Secret, Confidential, restricted ඔය 4.

ප්‍ර: නැවත කියන්න.

පි: Eyes Only කියලා ඒක එහෙම Classification එකක් නැහැ.

ප්‍ර: නැවත කියන්න ඔබතුමා කියපු ඒ කොටස් ටික?

පි: Restricted, Confidential, Secret, Top Secret

ප්‍ර: ඔබට මේ එක් එක් කොටස් පැහැදිලි කරන්න පුළුවන්ද?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: Restricted කියන මේ යන්නෙන් අදහස් කරන්නේ ?

පි: ඒකෙන් අදහස් ඒක ඕනිම කෙනෙක් එක්ක හුවමාරු කර ගන්න පුළුවන්. Intelligence එහෙම තියෙන ඒවා.

ප්‍ර: ඒ බුද්ධි තොරුතුරු ඕනෑම කෙනෙක් එකක් හුවමාරු කර ගන්න පුළුවන්?

පි: පුළුවන්.

ප්‍ර: Confidential කියන්නේ මොකක්ද ?

පි: ඒක අදාළ අයට පමණක් හුවමාරු කර ගැනීම පුළුවන්.

ප්‍ර: තවදුරටත් පැහැදිලි කළොත් අදාළ අයට කියලා කියන්නේ ?

පි: අපි හිතමු දැන් ඒකෙන් තව කාට හරි අපිට share කරන්න ඕනිනම් ඒක ඒ Information එක ඒක අපිට share කරන්න පුළුවන්. දැන් මට ආවානම් Confidential ලියුමක් ඒක මට අනිත් අයත් එක්ක share කර ගන්න පුළුවන්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: Secret?

පි: Secret ඒක සීමා සහිතයි.

ප්‍ර: පැහැදිලි කළොත් තව දුරටත් ?

පි: ඒක හුවමාරු කර ගන්න පුළුවන් අන්තර්ගතයන්. නමුත් ආවේ කාගෙන්ද කොහොන්ද ආවේ කියන එක අපි සඳහන් කරන්නේ නැහැ.

ප්‍ර: Top Secret?

පි: සාමාන්‍යයෙන් Top Secret කියලා අපි සඳහන් කරන්නේ මගේ භාවිතයට නම් මම සඳහන් කරන්නේ Top Secret කියලා සඳහන් කළේ source file.

ප්‍ර: ඒ කියන්නේ ?

පි: ඔත්තුකරු සෑහෙන හොඳ ඔත්තුකරුවෙක් ඉන්නවානම් අපි ඒක Top Secret file එකක් විදිහ දාලා කාටවත් පෙන්නේ නැති විදිහට මා ගාවම තියා ගන්නවා. ඒවාගේම document එකක් යන්නත් පුළුවන් Top Secret කියලා. නමුත් ජාතික ආරක්ෂාවට බලපාන document එකක් Top Secret එකකට ගියොත් එහෙම ඒක ආපහු කාගෙවත් එක්ක share කර ගන්න බැහැ ස්වාමීනි. අන්තර්ගතයන් ඕනිනම් අවශ්‍ය පුද්ගලයාට ඒක කර ගන්න පුළුවන් ස්වාමීනි. අන්තර්ගතයන් කියලා තමන්ට අවශ්‍ය .. දැන් මට ආවානම් Top Secret එකක්. මම ඒක ඒ ලියුම කාටවත් දෙන්නේ නැතුව ඒකේ අන්තර්ගතයන් බලලා ඒක share කරගන්න ඕනි පුද්ගලයෙක් ඉන්නවාම් one to one basis එකෙන් ඒක share කර ගන්න පුළුවන්.

ප්‍ර: දැන් මම මෙහෙම අහන්නම්. Restricted කියන වචනය සහිතව බුද්ධි තොරතුරක් ලේඛනයක් වශයෙන් ඔබට ලැබුනම ඒ බුද්ධි තොරතුරේ Restricted සහිත වචනය සහිත ලැබෙන ඒ ලේඛනය එම ලේඛනයම ඔබට වෙනත් අයත් සමඟ හුවමාරු කර ගන්න පුළුවන්ද?

පි: සාමාන්‍යයෙන් කරන්නේ නැහැ ස්වාමීනි එහෙම. අපේ භාවිතයට නම් කරන්නේ නැහැ. අන්තර්ගතයන් පමණයි සාමාන්‍යයෙන් කරන්නේ.

ප්‍ර: එතකොට Confidential, Secret සහ Top Secret වශයෙන් ඔබ සඳහන් කරපු ඒ වචනයන් සහිතව ලැබෙන ලේඛනයක් එම ලේඛනයේ පිටපතක් හෝ පිටපත් ලබාගෙන පහළ සිටින නිලධාරීන් වෙත බෙදා හැරීමේ හැකියාවක් තියෙනවද?

පි: එහෙම සාමාන්‍යයෙන් සාම්ප්‍රදානුකූලව එහෙම වෙන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: මොකේ සම්ප්‍රදායට අනුවද ඒ?

පි: අපේ රාජකාරි අනුව දැන් මම ජාතික බුද්ධි ප්‍රධානි වශයෙන් ඉන්නවානම් Top Secret ලියුමක් ආවානම් මම ඒක අතහරින්නේ නැහැ. මම එකේ අන්තර්ගතයෙන් ගන්නවා මොනවද ඒ කියලා. ඒකේ අවශ්‍යතාවය අනුව

FAIR COMMENT BY JEZEEM

ඒකට ක්‍රියාකාරී කරනවා අනිවාර්යයෙන්ම. ඒ ලියුමේ බෙදා හරින්න අවශ්‍යතාවක් වෙන්නේ නැහැ. නමුත් අවශ්‍ය වෙන්නේ තොරතුරු බෙදා හැරීමයි. අවශ්‍යතාවය මත.

ප්‍ර: මහත්මයා දැන් ඒ බුද්ධි නිලධාරිවරයෙකු වෙත ලැබෙන ලිපියක් යම් හෙයකින් යම් තොරතුරුක් Top Secret ගණයට වැටෙනවා නම් එය රාජ්‍ය තාන්ත්‍රික හෝ වෙනත් පරිපාලන නිලධාරිවරයෙකු සමඟ බෙදා හැරීම කරන කොට එය සිදු කරන්නේ කොහොමද ජාතික බුද්ධි ප්‍රධානි වශයෙන්?

පි: ස්වාමීනි සාමාන්‍යයෙන් Top Secret ලියුමක් මම ඉන්න කාලෙත් සෑහෙන ප්‍රමාණයක් ලැබුණා අපිට විදේශ තොරතුරු අනුව. නමුත් අපි ඒ විදේශ තොරතුරු ඒ විදිහටම Top Secret ලියුම පිටින් අරින්නේ නැහැ ආයතන වලට.

ප්‍ර: මගේ ප්‍රශ්නය ඔබ ජාතික බුද්ධි ප්‍රධානි වශයෙන් බුද්ධි දැනුමක් නැති (බුද්ධිය නැහැ කියන එක නෙවෙයි) පුද්ගලයෙකු වෙත මේ Top Secret Information එකක් ලිඛිතව ලබාදීමේ දී ඒ ඔබ අනුගමනය කරන ක්‍රමය මොකක්ද ?

පි: මෙතන ස්වාමීනි මට ප්‍රශ්නය වැඩිය පැහැදිලි නැහැ. බුද්ධි දැනීමක් නැති නිලධාරියෙක්ට මේ තොරතුරු යන්නේ ඇයි කියන එක.

ප්‍ර: රාජතාන්ත්‍රික රටේ උදාහරණයක් ලෙස විදේශ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත එම ලිපිය ඔබට යැවීමට අවශ්‍යතාවයක් තිබෙනවා. ඒ අනුව මේ Top Secret ඔහු පරිපාලන නිලධාරියෙක් නිවැරදිද?

පි: නැවැරදියි.

ප්‍ර: නමුත් බුද්ධි භාෂාවේ තිබෙන Top Secret, Confidential, Restricted, Secret මේ වචන එවැනි නිලධාරියෙකුට වැටහීමක් නැහැයි එහි තිබෙන බරපතලකම ගැන. ඉතින් එහෙම තොරතුරක් කොහොමද ඔබ ඒ අදාළ පාර්ශවය වෙත හුවමාරු කරන්නේ ?

පි: පැහැදිලියි ස්වාමීනි. එවැනි තොරතුරුක් අපි ලබාදෙන්නේ Top Secret ලියුම අපි අරන්නේ නැහැනේ විදේශ අමාත්‍යාංශයේ ලේකම් තුමාට. අපි අරන්නේ එකේ අන්තර්ගතයක් අවශ්‍ය දෙයක් තියෙනවානම් දැනුවත් කරන්න. එහෙම නැත්නම් අපිට ඒගොල්ලෝ යම්කිසි දෙයක් ලබාගන්න තියෙනවානම් ඒ අවශ්‍යතාවයක් තියෙනවාම් පමණයි ඒ අන්තර්ගතයෙනුත් පරිපාලන නිලධාරීන් සමඟ අපි හුවමාරු කර ගන්නේ.

ප්‍ර: දැන් ඔබ විසින් විදේශ අමාත්‍යංශයේ ලේකම්ට සපයන එම තොරතුර ඔබ බලාපොරොත්තු වෙනවා ඔහු විසින් එම තොරතුරු හුවමාරු කර නොගත යුතුයි කියලා. ඒක ඔහුගේ ඔහු පමණක් දැනුවත් වෙන්න ඕනි. ඔහුත් ඔබ කළ ආකාරයට ඔබ එය නැවත සකස් කරලා බෙදා හැරීමේ

FAIR COMMENT BY JEZEEM

හැකියාව ඔහුට තියෙනවානම් එය ඔහුට ඔබ convey ඔහුට දැනුම් දෙන්න කොහොමද කියලා මම අහන්නේ ?

පි: මම හිතන්නේ ඒ වගේ විශේෂිතම දෙයක් තියෙනවාම් ඒවගේ ලියුම් ගනුදෙනු කරන්නේ නැතුව personally ගිහිල්ලා හම්බවෙලා කතා කරලා ඒක කියන එක තමයි සුදුසුමකම.

ප්‍ර: ජාතික බුද්ධි ප්‍රධානි වශයෙන් ඔබට එය ඔබගේ කාල සීමාව තුළ විදේශ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත එය දැනුම් දීමට approach කරන්න ඔහු මුණ ගැසීමට අවකාශය සහ අවසරය තිබුණද?

පි: ඔව් තිබුණා ස්වාමීනි. මට එහෙම අවශ්‍යතාවයක් වුණේ නැහැ හුවමාරු කර ගැනීමට. නමුත් මට ඕනි වේලාවක විදේශ අමාත්‍යාංශයේ ලේකම්තුමා හම්බ වෙන්න හැකියාවක් තිබුණා. ළඟ සම්බන්ධතාවක් තිබ්බා.

ප්‍ර: ඔබ සහ ආරක්ෂක ලේකම් අතර තිබුණේ ඔබගේ කාල වකවානුවේ රාජකාරිමය වශයෙන් මොනවගේ සම්බන්ධතාවයක්ද?

පි: මං හිතන්නේ ආරක්ෂක ලේකම්තුමාට බුද්ධි රාජකාරිමය වශයෙන් කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ ජාතික බුද්ධි ප්‍රධානි ඉන්නකම්. ඒ කියන්නේ අවශ්‍ය සියලු දේම ජාතික බුද්ධි ප්‍රධානි විසින් ඉටු කරා. ස්වාමීනි මට ඕනි වෙලාවක ඕනෑම වේලාකවක ඕනෑම අවස්ථාවක මට එක්කෝ telephone එකෙන් කතා කරන්න පුළුවන්. නැත්නම් ගිහිල්ලා හම්වෙන්න පුළුවන් රාජකාරි එහෙම නැත්නම් රාජකාරි නැති අවස්ථාවලදීත් අපි නිතරම telephone එකෙන් කතා කරනවා අවශ්‍යතාවයන් මත වේලාවල් නොබලා.

ප්‍ර: හරි. එතකොට ආරක්ෂක ඇමතිවරයා සමඟ ඔබගේ කොයි ආකාරයේ සම්බන්ධතාවයක් ද තිබ්බේ?

පි: ජනාධිපතිතුමා සමඟ අපි සාමාන්‍යයෙන් සම්බන්ධ වෙන්නේ ආරක්ෂක කවුන්සලයේදී. එහෙම නැත්නම් ආරක්ෂක ලේකම්තුමා මට කිව්වොත් එහෙම ජනාධිපතිතුමා දැනුවත් කරන්න කියලා යම්කිසි අවස්ථාවක එහෙම අවස්ථා කිහිපයක් සිද්ධ වුණා මං ගිහිල්ලා දැනුවත් කරලා තියෙනවා පුද්ගලිකව.

ප්‍ර: ඔබට ජාතික බුද්ධි ප්‍රධානියාට ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වෙන යම් තොරතුරු බුද්ධි තොරතුරු ලැබුණු විටක ඒ ආරක්ෂක ලේකම් වෙත ඔබගේ කාල පරිච්ඡේදයේ දී එය ලබාදෙන්නේ වාචිකව ද නැත්නම් වහා වහාද නැත්නම් ලියුමක් ටයිප් කරලා ඒකේ හරි වැරදි බලලා යවනවද මොකක්ද ගත්ත ක්‍රියා පිළිවෙත?

පි: ස්වාමීනි එහෙම බුද්ධි තොරතුරක් ලැබුණාම මම ඒක ඒ විදිහටම ඉදිරිපත් කරන්නේ නැහැ මොනම ආයතනයකටවත්. එහෙම නැත්නම් ආරක්ෂක ලේකම් තුමාවත් , ආරක්ෂක කවුසන්ලයටවත් ඉදිරිපත්

FAIR COMMENT — BY JEZEEM

කරන්නේ නැහැ. ඒක මගේ රාජකාරියක් තිබ්බා මගේ මට තොරතුරු analyse කරලා බලන්න. මේ ලැබිච්ච තොරතුරු සාධාරණීයකරණය කරන්න. මේ සත්‍ය තොරතුරුද එහෙම නැත්නම් මේ තොරතුරු විශ්ලේෂණයක් කරලා තියෙනවද මේ තොරතුරුට අදාළ වෙනත් තොරතුරු කළින් තිබිලා තියෙනවද ඒ කියන්නේ ඒ වගේ විශ්ලේෂණයක් අනිවාර්යයෙන්ම කරනවා ස්වාමීනි. ඊට පස්සේ තමයි දැනුවත්ව කරන්නේ.

ප්‍ර: දැන් ජාතික බුද්ධි ප්‍රධානි කියන්නේ 2006 අවුරුද්දේ ස්ථාපනය කරපු ආයතනයක් නැත්නම් තනතුරක් ?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ජාතික බුද්ධි ප්‍රධානියාට කොහෙන්ද මේ ලැබෙන බුද්ධි තොරතුරක මේ සම්බන්ධයෙන් එවන පෙර තොරතුරු සම්බන්ධයෙන් දත්තයන් කොහේද තියෙන්නේ ?

පි: අනිවාර්යයෙන්ම මගේ experience අනුව අවුරුදු 32ක්ම බුද්ධි රාජකාරි කළේ. LTTE පිපිදීම සහ නැතිවීම දිගටම ඇස් දෙකෙන් දැක්ක කෙනෙක් ස්වාමීනි මම. ඉතින් ඒවගේම මේකෙන් මට තොරතුරක් ලැබෙනකොට මම දන්නවා මේක කවුරුත් එක්ක share කරලා මේකේ හරි වැරදිතාවය සොයාගැනීම මගේ යුතුකමක්. මගේ රාජකාරියක්.

ප්‍ර: ඔබේ හරිවැරදි භාවය ඒකේ තොරතුරේ නිරවද්‍යතාවය ඔබ සොය ගන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ සහ DMI එක කියන ආයතන වල සහභාගීත්වයෙන්ද?

පි: ඒ අයගෙත් අපි උදාහරණයක් විදිහට අපි ස්වාමීන් ජාතික බුද්ධි කාර්යාංශය මට ජාතික බුද්ධි සේවාවෙන් මට තොරතුරක් ලැබුණොතින් ඒ තොරතුරු සත්‍ය තොරතුක්ද කියලා බලන්න අපි බලනවා ඊට ඉස්සෙල්ලා මේකට සම්බන්ධ මොනවාරි තොරතුරු අපිට ලැබිලා තිබෙනවද කියලා. ඒ ලැබිලා තිබෙනවානම් ඒ ලැබිච්ච තොරතුරු කොහොවත් අන්තර්ගත වෙලා තියෙනවද ඊට ඉස්සෙල්ලා ඒ ලැබිච්චි තොරතුරු සාකච්ඡා කරලා තියෙනවද මේ බුද්ධි සමාලෝචන සාකච්ඡාවේ දී එහෙම වුණානම් ඒක මාව නිකන්ම දැනුවත් වෙනවා යම්කිසි තොරතුරක් මට ලැබුණානම් මම දැනුවත් වෙනවා මීට පෙර ඇවිල්ලා තියෙනවා කියලා මේකට සම්බන්ධ වෙන්න පුළුවන් කියන තොරතුරු ඉතින් ඒක අර දිගටම කරගෙන යනකොට පැහැදිලි වීමක් ඇති වෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ජාතික බුද්ධි ප්‍රධානි විසින් ගබඩාවක් බුද්ධි තොරතුරු සම්බන්ධ ගබඩාවක් පවත්වාගෙන යනවද?

පි: නැහැ මගේ එහෙම ගබඩාවක් කියලා නැහැ. Database එකක් මා ගාව තියෙනවා.නමුත් එහෙම මම ගොඩාක් depend වෙන්නේ අනිත් agency

FAIR COMMENT BY JEZEEM

වලින්. ඒ කියන්නේ DMI විශේෂයෙන්ම DMI එකෙන්. ඊට පස්සේ මගේ කාලේ. ඊට පස්සේ SIS එකෙන්. අනිත් බුද්ධි අංශවලත් එක්ක ඒ තොරතුරු තියෙනවද කියලා මම බලනවා. ඒගොල්ලන්ගෙනුත් අහලා බලනවා. මේ තොරතුරු ඔයගොල්ලෝ ගාව තියෙනවද එහෙම නැත්නම් මේකට අදාළ තොරතුරු මොනවද කියලා ස්වාමීනි.

ප්‍ර: දැන් SIS එක විසින් ජාතික ආරක්ෂාවට සෘජු බලපෑමක් තියෙන තොරතුරක් CNI එක වෙත ලබා දුන්නේ ඔබගේ ධුර කාලය තුල කොයි ආකාරයටද ?

පි: වාචිකව දැනුම් දෙන්න පුළුවන්. ලිඛිතව දැනුම් දෙන්න පුළුවන්. එහෙම නැත්නම් බුද්ධි සමාලෝචන සාකච්ඡාවේ දී දැනුම් දෙන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: දැන් මෙය ජාතික ආරක්ෂාවට සෘජුවම සහ ඉතාමත් ආසන්න කාලයකදී වෙන තර්ජනයක් ගැන වෙන බුද්ධි තොරතුරක් ගැන SIS අධ්‍යක්ෂක විසින් CNI වෙත ලබාදීම ඔහු විසින් පෞද්ගලිකව CNI වෙත පැමිණිලා ලබා දෙනවද?

පි: අනිවාර්යයෙන්ම ඒ වගේ අවශ්‍යතා තියෙනවානම් ඇවිල්ලා සාකච්ඡා කරන්න ඕනි. මේ වගේ තොරතුරක් තියෙනවා මොකක්ද මේකට කරන්න ඕනි කියලා.

ප්‍ර: කවුරු කවුරු සමඟද සාකච්ඡා කරන්නේ ?

පි: ජාතික බුද්ධි කාර්යාංශයේ SIS Director and CNI

ප්‍ර: කවුරු කා ගාවට ද යන්නේ එහිදී SIS CNI වෙතද පැමිණෙන්නේ ?

පි: අනිවාර්යයෙන්ම.

ප්‍ර: දැන් එවැනි තොරතුරක් සම්බන්ධයෙන් SIS Director CNI දැනුවත් කිරීම අනිවාර්යයද?

පි: අනිවාර්යයි.

ප්‍ර: ඇයි ඔබ එහෙම කියන්නේ ?

පි: එතනින් එහාට ගමනක් නැහැනේ ස්වාමීනි.

ප්‍ර: SIS Director ට පුළුවන්ද මම දැන් යන්නේ ජාතික ආරක්ෂාවට තිබෙන imminent threat එකක් ගැන, තිබෙන සෘජු තර්ජනයක් ගැන CNI වෙත දැනුම් දෙන ගමන්ම පොලිස්පතිටත් ඒ ගැන දැනුම් දීමක් ඔබගේ කාලවකවානුවේදී සිදු වුණාද?

පි: එහෙම සිද්ධ වුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: එහෙම සිදු කිරීම වරදක්ද එහෙම නැද්ද?

පි: ඔබතුමා අවස්ථාවක් කිව්වොත් මට ඒකට සෘජුව උත්තර දෙන්න පුළුවන්.

ප්‍ර: Director SIS ට එවැනි තොරතුරුක් ජාතික ආරක්ෂාවට තියෙන සෘජු තර්ජනයක් සම්බන්ධයෙන් තියෙන තොරතුරක් පොලිස්පතිතුමා සමඟ හුවමාරු කරගැනීමට බාධාවක් තියෙනවද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: බාධාවක් නැහැ ස්වාමීනි. නමුත් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් තොරතුරක් තිබෙනවානම් අනිවාර්යයෙන්ම සාකච්ඡාවට භාජනය විය යුතුයි අනිත් ආයතනයත් සම්බන්ධයෙන්.

ප්‍ර: උදාහරණයක් ලෙස ගතහොත්?

පි: උදාහරණක් ගත හොත් පාස්කු ප්‍රහාරය. ජාතික ආරක්ෂාවට බලපානවා. ඒක හින්දා ඒක සමාලෝචනයට භාජනය විය යුතුම කාරණයක් ස්වාමීනි.

ප්‍ර: ඇයි ඔබ ඒක ජාතික ආරක්ෂාවට බලපෑමක් සිදු වෙනවා කියන්නේ ?

පි: ස්වාමීනි ඒක ජාතික ආරක්ෂාවට නෙවෙයි ද යන්න ප්‍රශ්නයක් මට. ඒක පාස්කු ප්‍රහාරයට තොරතුරුක් ලැබිලා ඒක ක්‍රියාවට යෙදුවේ නැත්නම් ඒක ලොකු ප්‍රශ්නයක්. කොහේ හරි හිස්තැනක් තියෙනවා ස්වාමීනි මට පේන විදිහට. අඩුපාඩුවක් තියෙනවා කොහේ හරි.

ප්‍ර: එතකොට පුද්ගලයන් කිහිපදෙනෙකු මරාදැමීම ජාතික ආරක්ෂාවට තර්ජනයක්ද ඔබට අනුව?

පි: මේක පුද්ගලිකම මැරීම නෙමෙයි නේ ස්වාමීනි තියෙන්නේ. පුද්ගලයන් මැරුණේ ඒක incident එකක්. නමුත් එකෙන් වෙන repercussion ඒක ජාතික රටට වෙන බලපෑමක්. ඒක ජාත්‍යන්තර වශයෙන් වෙන බලපෑම්. එතකොට අපේ මේ ආර්ථිකයට වෙන බලපෑම්. එතකොට අපේ සංස්කෘතියට වෙන බලපෑම්. අපේ ජාතික සංහිඳියාවට වෙන බලපෑම්. ඒක ගොඩක් සිද්ධ වෙනවා ඒ ක්‍රියාවෙන්.

ප්‍ර: ඒ හින්දා තමයි ඔබ කියන්නේ ජාතික ආරක්ෂාවට සෘජුව සම්බන්ධයි කියලා ?

පි: අනිවාර්යයෙන්ම ත්‍රස්තවාදී ප්‍රහාරයක් ජාතික ආරක්ෂාවට බලපානවා ස්වාමීනි. මේක ත්‍රස්තවාදී ප්‍රහාරයක් ස්වාමීනි.

ප්‍ර: ඔබ දැන් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් කතා කළේ එතකොට ජාතික ආරක්ෂාව සම්බන්ධව වගකීම කාටද තියෙන්නේ වගකීම සහ වගවීම?

පි: අනිවාර්යයෙන්ම ජාතික ආරක්ෂාවේ වගකීම ජාතියේ නායකයාට භාරයි ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ?

පි: ජනාධිපතිතුමාට.

ප්‍ර: වගවීම එතකොට කාටද තියෙන්නේ ? Accountability

පි: ආරක්ෂක ලේකම්

ප්‍ර: ඇයි ඔබ එහෙම කියන්නේ ?

පි: ඉතින් බුද්ධි තොරතුරු හරියට ජනාධිපතිතුමාට දුන්නේ නැත්නම් CNI ගේ වරදක් Accountability එකට එනකොට CNIට ඇවිල්ලා CNI ඒක දුන්නේ නැත්නම් එහෙම නැත්නම් CNI ආරක්ෂක ලේකම්තුමාට කියලා ආරක්ෂක ලේකම්තුමා ජනාධිපති තුමා දැනුවත් කළේ නැත්නම් ඒක

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ලොකු ප්‍රශ්නයක් තියෙනවා එතන. එහෙම අනිවාර්යයෙන්ම සිද්ධ විය යුතු දෙයක් ඒක. මොකද මේ අපි ප්‍රධාන අරමුණ වන්නෙත් සිදුවීම වළක්වා ගැනීම්. ඒ ක්‍රියාමර්ගයට යන්නනම් මේ දැනුවත් කිරීම් ඒවාගේම ගතයුතු ක්‍රියාමාර්ග වලට අවශ්‍ය උපදෙස් අනිවාර්යයෙන්ම අවශ්‍යයි. ඒ උපදෙස් දෙන්නේ කවුද කියන එක එතන මම දන්නේ නැහැ මේ අවස්ථාවේදී කොහොමද වෙලා තියෙන එක මට පැහැදීමක් නැහැ හරියට. වුණේ කොහොමද කියන එක ස්වාමීනි.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු ජාතික රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂකවරයා විසින් සෘජුව වාර්තා කිරීමක් කරන්නේ රාජ්‍ය ජනාධිපතිවරයාට වාර්තා කරනවද ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට වාර්තා කරනවද?

පි: සාමාන්‍යයෙන් මගේ කාලයේ මාව දැනුවත් කරනවා රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් නැත්නම් වෙන දේවල් වලට සම්බන්ධ අවශ්‍යතාවයන් තියෙනවානම් ජනාධිපතිතුමාට වගේම අගමැතිතුමාට සම්බන්ධයෙන් ඒ අවශ්‍යතාවය අනුව රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකතුමාට ගිහිල්ලා ඒ අවස්ථාව කියන්න පුළුවන්. නමුත් අනිවාර්යයෙන්ම එතුමා රාජ්‍ය ආරක්ෂක ලේකම්තුමා යටතේ ඉන්නේ ස්වාමීනි. ඒක හින්දා ආරක්ෂක ලේකම්තුමා දැනුවත් කිරීම අනිවාර්යයි.

ප්‍ර: ආරක්ෂක ලේකම්තුමා දැනුවත් කිරීම?

පි: SIS directly comes under Secretary Defense ආරක්ෂක අමාත්‍යාංශ යටතේ.

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා තමන්ට තොරතුරක් ලැබුණාම ජාතික බුද්ධි ප්‍රධානියාට ඒ දැනුවත් කිරීමට ප්‍රථම අනිකුත් බුද්ධි අංශ සමඟ එය බෙදා ගැනීමක් කළ හැකිද ?

පි: මගේ කාලයේ එහෙම වුණේ නැහැ ස්වාමීනි.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා</u>**

ප්‍ර: එතකොට ජාතික ආරක්ෂාවේ වගකීම සහ වගවීම ගැන ඔබ කියා සිටියා කවුද එයට අදාළ පුද්ගලයා. එතකොට ඒ එසේ වගවීම සහ වගකීම යන කාරණා වලදී අර ඔබ පෙර කියපු ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම සහ ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම නිතිපතා ඒ කියන්නේ සතිපතා තිබීම හා කොයි ආකාරයටද සම්බන්ධ වෙන්නේ ?

පි: ඒක ආරක්ෂක කවුන්සිලයේ summon කරන්නේ ආරක්ෂක ලේකම්තුමා. එයා තමයි දිනය දන්නවා. වේලාවල් දෙන්නේ

FAIR COMMENT BY JEZEEM

ජනාධිපතිතුමාත් එක්ක කතාකරගෙන වේලාවල් දෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලේකම්තුමාගේ Office එකෙන්.

ප්‍ර: මගේ ප්‍රශ්නය වෙන්නේ දැන් මේ ජාතික ආරක්ෂාවට බලපාන තොරතුරකට අදාළව ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමේ සහ ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම පැවැත්වීමේ වටිනාකම ?

පි: ස්වාමීනි දැන් යුද්ධ කාලයේ දී ඒක කියන්න අවශ්‍ය නැහැනේ අපිට එකේ තිබිච්චි අවශ්‍යතාවය Security Council දැනුවත් කිරීම සහ අපේ බුද්ධි අංශ සමාලෝචන සම්බන්ධයෙන් කිරීම ඉතාමත් වැදගත් කාර්යක් විදිහට තමයි සියලු දෙනාම සැළකුවේ. මොකද එතනදීත් යුද්ධ කාලෙත් ජනාධිපතිතුමා දැනුවත් කළ යුතු සියලු දේම දැනුවත් කළා. ඒ කියන්නේ operation, Intelligence and operation arms එතකොට යුද්දේ progress එක ඒ හැම දෙයක්ම ජනාධිපතිතුමා දැනුවත් කරා. ඒ එක්කම බුද්ධි තොරතුරුත් ජනාධිපතිතුමා දැනුවත් කරා. ඒ රැස්වීම මං ඉස්සෙල්ලා කිව්වා වගේ සම්බන්ධීකරණය කරන්නේ ආරක්ෂක ලේකම්තුමාගේ කාලේ.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා මේ යුද්ධය පැවැති සමයේ සතිපතා ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම සහ ආරක්ෂක මණ්ඩල රැස්වීම පැවැත්වුවා කියලා ?

පි: ඔව් බුද්ධි රැස්වීම සහ ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම.

ප්‍ර: 2009 අවුරුද්දේ දී මේ යුද්ධය අවසන් වුණා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඉන් අනතුරුව මෙම බුද්ධි ඔබ කියනවා මේ සතිපතා පවත්වපු බුද්ධි රැස්වීම සතිපතා පැවැත්වුවාද නැද්ද?

පි: පැවැත්වුවා ස්වාමීනි. 2015 වෙනකම් පැවැත්වුවා 2009 ඉඳන් යුද්ධයේ අවසානයේ ඉඳන්.

ප්‍ර: ආරක්ෂක මණ්ඩලය ඒ රැස්වීම මේ යුද්ධය අවසන් වුණාට පසුව 2009 අවුරුද්දේ දී ඔබ කී ලෙසට යුද්ධය තිබ්බ කාලයේ දී තිබ්බ විදිහට සතිපතා පැවැත්වුවාද නැද්ද?

පි: පැවැත්වුවා.

ප්‍ර: මේ රැස්වීම් 2ම ඔබ සතිපතා පැවැත්වුවා කියලා කියන්නේ ඔබ ඒ සඳහා ඔබ සහභාගී වුණාද?

පි: සහභාගී වුණා ස්වාමීනි.

ප්‍ර: ඒ රැස්වීම පවත්වන බවට වන දැනුම්දීම් ඒ ලිඛිතව හෝ වාචික දැනුම් දීම් සිදු කරාද?

පි: ස්වාමීනි ඒක අපි දන්නවා Security Council එක හැම බදාදාම තියෙනවා කියලා. ඒක නැත්නම් විතරයි දැනුම් දෙන්නේ. නැත්නම් ඒක 10ට 10.30ට ඒ වේලාවල් දැනුම් දෙනවා හැම සතියේම. නමුත් බදාදාට ජාතික

FAIR COMMENT BY JEZEEM

ආරක්ෂක කවුන්සිලය තියෙනවා කියන එක ඒක හැමදාම පැවැත්වෙන එකක්.

ප්‍ර: එතකොට යුද්ධය අවසන් වුණාට පසුව දැන් යුද්ධයක් නැහැනේ. දැන් මේ බුද්ධි සමාලෝචන රැස්වීම පැවැත්වීමේ අරමුණ වුණේ මොකක්ද?

පි: ස්වාමීනි යුද්ධය අවසන් වුණයි කියලා අපිට ඒ වෙන කොටත් තොරතුරු ලැබිලා තිබුණා. අපි යම්කිසි අරමුණක් මත තමයි බුද්ධි සමාලෝචන සාකච්ඡාව අරගෙන ගියේ. එහෙම නැත්නම් බුද්ධි අංශ අපි දැනුවත් කරලා තිබ්බේ. ඒ කියන්නේ අපි යුද්දේ LTTE එක්ක යුද්ධය අවසන් කරා වුණාට පස්සේ අපි බැලුවා ඊළඟට වෙන්න පුළුවන් threat perception මොනවද කියලා. තර්ජන මොනවද කියලා අපේ ජාතික ආරක්ෂාවට. අපි ඒ මත අපි බුද්ධි තොරතුරු, බුද්ධි අංශ, ඒකක අංශ ඒක අපි එක්රැස් කරලා අපි ඒ ගැන සාකච්ඡා කරා. උදාහරණයක් වශයෙන් අපි යුද්ධය ඉවර වුණ ගමන්ම අපි දැනන් හිටියා LTTE නැවත පිපිදීමක් වෙනවා කියලා. වෙන්න පුළුවන් කියලා. ඉතින් අපි ඒකට ලෑස්ති වුණා ස්වාමීනි. කොහොමද මේක එන්න පුළුවන්ද, කොහොමද එන්නේ, කොයි විදිහටද වෙන්නේ, කවුද ඒකට සම්බන්ධ වෙන්නේ, කොහෙන්ද ඒක සම්බන්ධීකරණය වෙන්නේ, මොන රටවල් වලින්ද ඒකට ආධාර එනවද එහෙම නැත්නම් ආධාර දෙන්න පුළුවන්ද ඒ ඔක්කෝම අපේ රාජකාරියක් වුණා අපිට ඒක සොයා බලන්න. මොකද ආරක්ෂක ලේකම්තුමා නිතරම කියන්නේ මේ LTTEය නැවත පිපිදීමක් අපි අනිවාර්යයෙන්ම නැවතිය විය යුතුයි කියන මතය. මොකද ඒ අවස්ථාව වෙනකොට අපි LTTE භාර වෙච්චි අය හිටියා අපේ අතේ. ඒ පාර භාරවෙලා ආපහු නැවත පුනුරුත්ථාපනය වෙලා ගියපු අය ඉන්නවා. අපි මේ අය ගැන සොයා බැලීමක් කරන්න අවශ්‍යයි. මොකද එනවානම් ආපහු ඒගොල්ලෝ මතින් තමයි එන්නේ. ඊට අමතරව ස්වාමීනි LTTE භාර වෙච්ච නොවුණ LTTE ක්‍රියාකරුවන් ඉන්නවායි කියලාත් අපි දැනන් සිටියා. ඊට අමතරව LTTE එකෙන් සියලුම උපකරණ යුද්ධයකට හෝ වෙනත් ක්‍රියාකාරී කරන්න උපකරණ බෝම්බ එතකොට, improvised exclusive devices එතකොට weapons බිම් බෝම්බ ඒ සියලුම අවි ආයුධ සඟවපු තැන් සඟවලා තිබ්බා. ඒක අපි දැනන් හිටියා. ඉතින් නැවත පිපිදීම ප්‍රධාන වශයෙන්ම අපි ඒක වළක්වාගන්න ඕනි කියන මතය අපි හිටියා. ආරක්ෂක ලේකම්තුමා ඒකට සෑහෙන උපදෙස් දුන්නා. ඒකට මම සෘජුවම එකතු වෙලා ඒකට ඒ බුද්ධි අංශ ඒවාට මෙහෙයුව්වා. ඊළඟට අපි බැලුවා මේ පිපිදීම අපි ඇස් පිටින් දුටුවා. 3වතාවක් අපිට ඒවා නැති කරන්න පුළුවන් වුණා. 3වතාවක්ම. ඒ 3 වතාවෙන්ම පිටරටින් තමයි සහයෝගය ලැබුණේ මුදල් ලැබුණේ. ඒගොල්ලෝ දියත් කළේ

FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලෝ ක්‍රියාකාරී කළේ පිටරට වල ඉඳන්. 3 වෙනි එක තමයි දරුණුම පිපිදීම ඇතිවුණේ. ඒකට සම්බන්ධ වුණ අය අපි දැනන් හිටියා. ඒකට අපිට විදේශයෙන් මට කෙළින්ම ඒ තොරතුරු ලැබුණා. මම ඒක ආරක්ෂක ලේකම්තුමා දැනුවත් කරලා අපි ඒකට ලොකු ක්‍රියාන්විතයක් යෙදුවා. ඒක අපිට පුළුවන් වුණා. ඒකට උදව් කරන ක්‍රියාකරුවන් සියලුදෙනාම මේ මර්ධනය කරන්න. නමුත් ඒගොල්ලෝ අල්ල ගන්න බැරි වුණා. නමුත් ඒගොල්ලෝ they were shot at during the condem the search operation ඊට පස්සෙත් අපි focus කරේ transnational crimesවලට. ඒ කියන්නේ drug trafficking, human smuggling ඒ ක්‍රියාත්මක වෙමින් පැවතියා. නමුත් අපිට ඒකෙන් අයින් වෙන්න බැහැ ස්වාමීනි. අපි ඒවාටත් සිත යෙදෙව්වා. ඊට පස්සේ අපි දැම්මා extremism ඒ කාලේ වෙනකොට ආගමික අන්තවාදීන්ගේ යම්කිසි දැනුවත් වීමක් අපිට ආවා පිපිදිමක්. ඒ කියන්නේ ලොකුවට නෙවෙයි බොහොම සුළු වශයෙන්. අපි හිතුවා මේක කවදාහරි මේක බලපෑමක් වෙන්න පුළුවන් වෙයි කියලා මේ රටට. ලේකම්තුමා කෙළින්ම කිව්වේ මේවා සම්පූර්ණයෙන් මර්ධනය කරලා හොයලා බලලා මේවා කොහොමද කරන්න ඕනි කියන එක එතුමා දැනුවත්ව කරා. මම හිතන්නේ ඒ අයට ඒ සම්බන්ධ අයට අපි උපදෙස් දීලා ගෙන්වලා කතා කරලා ඒ ඔක්කෝම ඒ ක්‍රියාන්විතත් කරා. ඊට පස්සේ cyber crimes ඒවාට අවශ්‍ය උපදෙස් දුන්නා. කොහොමද කරන්න ඕනේ කියලා.

ප්‍ර: කාටද මේ උපදෙස දීම සිදු කරන්නේ ?

පි: බුද්ධි අංශ වලට. විශේෂයෙන් හමුදා බුද්ධි අංශයට. එතකොට සාමාන්‍යයෙන් ගොඩාක් අපිට ළඟින් වැඩ කළේ හමුදා බුද්ධි අංශය. ඒක හින්දා ඒගොල්ලොන්ට හැකියාවක් තිබ්බා. අවශ්‍ය නිලධාරින් හිටියා දැනීමක් තියෙන. ඉතින් ඒ අයට දැනුම් දුන්නා. ඊට පස්සේ තමයි මේ Geographical realities භූදේශපාලනික අවශ්‍ය දේවල්. දැන් ඇවිල්ලා තියෙන දේවල් මේ අවස්ථාවේ ස්වාමිනි MCC එක. එතකොට ඒ වගේ ඒවා එනවානම් ඒවා සම්බන්ධයෙන් අපි ඒ දවස්වලම අපි මේවාට plan කරලා තිබ්බේ.

ප්‍ර: හරි. දැන් ඔබ කියන හැටියට යුද්ධය අවසන් වුණාට පසුව බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේ අංක 1ට වශයෙන් තිබුණේ LTTE එක නැවත පිපිදීම. 2 වැන්න transnational ඒ කියන්නේ අන්තර්ජාතික හා ජාතික වශයෙන් සිදු වෙන අපරාධ

පි: ඒ කියන්නේ drug trafficking and Human Smuggling

ප්‍ර: ඊළඟට අංක 3 වශයෙන් ඔබ කියා සිටියා ආගමික අන්තවාදය ?

FAIR COMMENT BY JEZEEM

පි: හැබැයි අපි ඒක ඉස්සරහාට ගත්තා අපි පහු කාලයේදී ඒක අන්තිම දවස් වල.

ප්‍ර: මෙම පිළිවෙල කිසියම් අවස්ථාවක වෙනස් වුණාද?

පි: වෙනස් වුණා ස්වාමීනි.

ප්‍ර: ඒ කොයි කාලේ වගේද?

පි: ඒ කියන්නේ අපි දැක්කා දැන් දාර්ගා ටවුන් Incident එක. ඒ වෙනකොට ඉස්සෙල්ලාම පටන් ගත්තා හලාල් Incident එකෙන්. මම දන්නේ නැහැ ඒ Incident එක එනකොට අපි ඒගොල්ලෝ සමඟ සාකච්ඡා කරලා ආරක්ෂක අමාත්‍යාංශයට ගෙන්වලා මේ මොනවද කොහොමද මේක වෙන්නේ දෙපාර්ශවයම ගෙන්වලා කතා කරලා ඒකට පිළියම් යෙදුවා අපි. එතකොට ඒකත් එක්ක අපි හිතුවා මේක තව ඉස්සරාහට කොයි විදිහට එයිද දන්නැහැ කියලා. නමුත් ඒකට ප්‍රමුඛත්වයක් දුන්නා. 2015 වෙනකොට. 2015 වෙනකොට ඒකට ප්‍රමුඛත්වයක් දීලා තිබ්බේ ස්වාමීනි.

ප්‍ර: ඔබ සේවය අවසන් වුණේ 2015 බව ඔබ කියා සිටියා?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ප්‍රමුඛත්වය මෙම ආගමික අන්තවාදය සම්බන්ධයෙන් ලබා දුන්නා කියලා කියා සිටියා ?

පි: ඔව්

ප්‍ර: දැන් ඒ ප්‍රමුඛත්වය ලබා දෙනකොට දැන් ප්‍රමුඛත්වය ලබා දුන්නේ තොරතුරු සොයාගැනීම සම්බන්ධයෙන්ද නැත්නම් මේ ව්‍යුහය ශක්තිමත් කරන්න ඒ කියන්නේ බුද්ධි තාක්ෂණයන් නවීකරණය කරන්න කොයි ආකාරයටද කළේ කියලා ඔබට කීමට හැකියාවක් තිබෙද මේ ගරු කොමිෂන් සභාවට?

පි: ස්වාමීනි පියවර කිහිපයකින්ම සිද්ධ වුණා. ඒකට අවශ්‍ය අඩිතාලම සියල්ලම යොදවලා තිබ්බා. ඒක ආරක්ෂක ලේකම්තුමා සෘජුවම අදහස් වුණා. ඒකට අවශ්‍ය විදේශීය සම්බන්ධීකරණයක් කරා. ඒකට අවශ්‍ය පුහුණුව ලබා දුන්නා. විශේෂයෙන් මේ open source analysisවලට වෙනම ඒකකයක් ඒ කියන්නේ වෙනම හමුදා බුද්ධි ඒකකයක් යටතේ බුද්ධි අංශය යටතේ පැවැත්වුවා. ඉතින් ඒ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීමට වෙනම විශේෂ නිලධාරීන් කිහිපයක් යොදවලා තිබ්බා. මේ ගැන සොයා බලනකොට සොයා බැලීමේ කාර්යේ යෙදීලා හිටියා 2015 වෙනකොට ස්වාමීනි.

*********

දැන් වේලාව : ප.ව.12.45

මෙතැන් සිට ල/ලේ : චන්දිමා මෙනවිය

Project Secretary Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව 12.45.
පෙර සටහන් :නිල්මිණි කුමාරි
මෙතැන් සිට:චන්දිමා දිල්හානි.

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>**

ප්‍ර: එතකොට මං අහන්නේ හරි දැන් මෙම ආගමික අන්තාවදය සම්බන්ධ කරන විමර්ශනයන්හි ද ගවේෂණයන් වලදී මේ භාෂාවක් ඉගනීම හෝ භාෂා දැනුම එක භාෂාවකට පමණක් සීමා වීම නොවිය යුතු ද විය යුතුද යන්න ගැන අවබෝධයක් ඔබලා ලබා ගෙන තිබුණාද?

පි: විදේශ භාෂා පුහුණුවක් ලබා දුන්නා.

ප්‍ර: එසේම ඔබ විදේශය පුහුණුව සඳහා නිලධාරිවරයන් හෝ වරයෙක් යොමු කරාද?

පි: මං හිතන්නේ ඒකට ආරක්ෂක ලේකම්තුමා වෙනම යොමු කරලා තිබ්බා නිලධාරියෙක්.

ප්‍ර: දැන් ඔබ 2015 කවදා දින දක්වා CNI වශයෙන් සිටියද?

පි: with the change of government

ප්‍ර: ඒ කියන්නේ ඔබ ඉවත් වුනේ කවද්ද? ජාතික බුද්ධි ප්‍රධානී වශයෙන්

පි: ජනවාරි 08.

ප්‍ර: 2015.01.08?

පි: ඒ කියන්නේ ජනාධිපති තරඟයෙන් ඉවර වෙච්ච දවසේ ඡන්දය ඉවර වුන දවසේම.

ප්‍ර: ඡන්දේ ඉවර වුන දවසේද? ප්‍රතිඵල ප්‍රකාශ වුණ දවසේද?

පි: ප්‍රතිඵල ඉවර වුන දවසේ.

ප්‍ර: ජනවාරි 09?

පි: 09 I gave my resignation ස්වාමිනි.

**********

**<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>**

ප්‍ර: what was the reason ?කවුද කවුරු හරි ඔබට ඒ සම්බන්ධයෙන් බලපෑම් කරාද? ඇයි ඔබ ඒ සම්බන්ධයෙන් එහෙම කරේ හදිසියේ?

පි: ස්වාමිනි එහෙම කිසි බලපෑමක් කරේ නැහැ. මට experience තිබ්බා ඒ එන්න ඉන්න අයත් සමඟ වැඩකරන්න බෑ කියන මතයේ හිටියා මොකද 2001 තිබිච්ච experience අනුව මේ මං දැනගත්තා තවදුරටත් මේක තේරුමක් නැහැ මෙතන ඉන්න එක කියලා වැඩ කරන්න බැරිනම් තේරුමක් නැහැනේ ස්වාමිනි එතන රාජකාරි කරලා.

**********

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**ජ්‍යෝෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා**

ප්‍ර: ඔබ වසර 10 ක පමණ කාලයක් ජාතික බුද්ධි ප්‍රධානි වශයෙන් සිටියා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මේ ජාතික බුද්ධි ප්‍රධානී කියන තනතුර හොබවන්න හැකියාව තියෙනවද බුද්ධි ජාතික බුද්ධි intelligence සම්බන්ධව හොඳ දැනුමක් නොතිබෙන පුද්ගලයින්?

පි: එහෙම පවත්වාගෙන යන්න බැහැ ස්වාමිනි.

ප්‍ර: sorry ?

පි: පවත්වාගෙන යන්න අමාරුයි ස්වාමිනි එහෙම

ප්‍ර: ඇයි ඔබ එහෙම කියන්නේ?

පි: ජාතික බුද්ධි ප්‍රධානියෙක් වශයෙන් බුද්ධි දැනුමක් නැති නිලධාරියෙක් ඇවිල්ලා කරගෙන යාම මං හිතන්නේ ඒක පැහැදිලි ස්වාමිනි ඒක අමාරුයි කියන එක.

ප්‍ර: ඔබ මෙම කොමිෂන් සභාවට ප්‍රකාශ කරා සිටියා යුද්ධය 2009 වර්ෂයේ යුද්ධය නිමා කරාට පසුව බුද්ධි මෙහෙයුම් වල සිදු වූ වෙනස එසේම ඔබ කියා සිටියා ආගමික අන්තවාදය මුල් තැනට පැමිණි බව?

පි: එහෙමයි ස්වාමිනි.ත

ප්‍ර: මොනවද ඔබලා විසින් අන්තවාදි ක්‍රියාකාරකම් ලංකාව තුල සිදුවෙනවද කියලා හඳුනාගන්නට යෙදුනාද?

පි: ස්වාමිනි අපි දැනන් හිටියා. මේ සිරියාවට කණ්ඩායමක් ගිහිල්ලා තියෙනවා එයින් එක්කෙනෙක් මරණයට පත් වුනත් කියලා අපි දැනන් හිටියා ඒ අතර තුර ඒ ඔක්කෝම ඒකට අවශ්‍ය කවුද ගියේ ඒ ඔක්කෝම ඒ ගොල්ලන්ට අවශ්‍ය තොරතුරු ඒ ගොල්ලන්ට සම්බන්ධ වූ අයගේ තොරතුරු ඒවා රැස්කරගැනීම තමයි ඒ කාලය වෙන කොට අපි හිටියේ.

ප්‍ර: මෙම විදේශ ගත සිරියාවට ගියපු ඒ පුද්ගලයන්ට අමතරව ලංකාව තුල අන්තවාදි ආගමික සංවිධාන හෝ පුද්ගලයන් පිළිබඳව ජාතික බුද්ධි ප්‍රධානීන් වශයෙන් ඔබට අනාවරණය වෙලා තිබ්බාද?

පි: ස්වාමිනි අපිට තොරතුරු ලැබිලා තිබ්බා පිටරට සිට එන දේශකයන් preachers සම්බන්ධයෙන් ඒ ගොල්ලෝ අන්තවාදී අදහස් සාකච්ඡා කරනවා දේශන පවත්වනවා කියලා එතකොටත් ඒ වෙනකොටත් අපි කීප දෙනෙක්ම අපි සාකච්ඡා කරා දිර්ඝ වශයෙන් ආරක්ෂක ලේකම්තුමාගේ උපදෙස් මත අපි ඒ ඔක්කෝම බුද්ධි අංශවලට දැනුම් දීලා හමුදා බුද්ධි අංශයටත් දීලා ඒ එන preachers කවුද කියලා අපි ඒ ගොල්ලෝ කොහේද යන්නේ කොහේද එන්නේ කියන එක පළමුවෙන්ම ඉන්න අයගේ හොයලා බැලුවා ඊට පස්සේ තොරතුරු ලැබුණාම ඒ එන අය නැවතීමට පියවර ගත්තා ඒ අවස්ථාව වෙන කොට මන් හිතන්නේ එකසිය ගාණක් ඇවිල්ලා තිබුණා අපි ඒ එකසිය ගානම

FAIR COMMENT BY JEZEEM

පිටුවහල් කරා ස්වාමිනි.ඒක අපිට immigration එකත් අපි බොහොම ළඟ සම්බන්ධීකරණයෙන් අපි කටයුතු කරා.ඒ දවස්වල.

ප්‍ර: මොනවද ඔබලා ගත්ත දැන් මෙම foreign preachers ඒ කියන්නේ විදේශිය ආගමික දේශකවරු විදේශිය වලින් ඉතින් ඔවුන් සම්බන්ධයෙන් ගත්ත පියවර මොකක්ද ?ධනාත්මක ක්‍රියාකාරකම්

පි: පිටුවහල් කිරීම.

ප්‍ර: ඒ කියන්නේ ඔවුන්ව ලංකාවෙන් පිටුවහල් කරනවා?

පි: පිටුවහල් කරනවා.

ප්‍ර: ඒ විතරක් නෙමේ අපි ඊට පස්සේ ගත්තා මේ අය නැවත පැමිණෙනවානම් කවුරු හරි ස්වාමිනි ඒකට මොකක්ද කරන්න ඕනේ mechanism එක කියලා ඒ කියන්නේ යම් කිසි ආයතනයක ඒ ගොල්ලන්ගේ ඒ ආගමික ස්ථාන ආයතනයට ගිහිල්ලා එතැනින් අවසරය ගත්තොතින් මෙන්න මේ ගොල්ලෝ එන්නේ මේ ස්ථාන වලට මේ ගොල්ලෝ යන්නේ මෙන් මේ වගේ ස්ථානවල ඒ ගොල්ලෝ දේශන පවත්වන්නේ කියලා ඒ ගොල්ලෝ අපිට දැනුම් දුන්නාට පස්සේ සිමිත සංඛ්‍යාවකට අපි ඉඩ දීලා තිබුණා මොකද ඒ අවස්ථාව වෙන කොට මේ ත්‍රස්තවාදි ප්‍රහාරයකට එනවායි කියලා ඒක ඇගයුමක් අපේ ඒ අවස්ථාව වෙන කොට එහෙම බුද්ධි තොරතුරු තිබුණේ නැති වුනත් අපි ක්‍රියාකාරියේ යෙදුනා මේ වගේ අය මේ වගේ දේශන පැවැත්තුවොත් මේ අය Brain wash කරන්න පුළුවන් කියලා. ඒ ගොල්ලෝ ඒ දේශන වලට ඇවිල්ලා එවැනි දේවල් කතා කරලා තිබ්බේ නැහැ ස්වාමිනි. මොකද ඒ හැම තැනම අපි බුද්ධි අංශ යොදවලා ඒ ගොල්ලන්ගේ සියලු දේම cover කරා.

ප්‍ර: දැන් මෙම පුද්ගලයන් මේ ආගමික දේශකයන් ඇවිල්ලා තිබ්බේ මොන වර්ගයේ visa යටතේද? ඔබට මතක

පි: ඒක මට හරියටම කියන්න අමාරුයි මං හිතන විදියට tourist visa වෙන්න ඇති ස්වාමිනි. ඒ ගැන මට පැහැදිමක් නැහැ ස්වාමිනි.

ප්‍ර: එසේ පැමිණිමෙන් ආපු තැනැත්තන් පිටවහල් කර බව කියා සිටියානේ බොහෝ ගනණක් ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔවුන් කුමන ජාතිකයන්ද ඒ පිටුවහලට ලක්වෙච්ච?

පි: ඉන්දියානු ජාතිකයන් .

ප්‍ර: දැන් මෙම පුද්ගලයන් ?

පි: මගේ මතකය හැටියට ඉන්දියානු ජාතිකයන් ගොඩාක් දෙනෙක් මට මතක නැහැ වෙනත් ජාතිකයන් හිටියද කියන එක දැනට අමතකයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ජෙනුල් ආබ්දීන් කියන පුද්ගලයාත් ඔබගේ කාලයේ දී පිටුවහල් කරන්ට යෙදුනු ඉන්දියානුවෙක් ද නැද්ද කියලා මතකයක් තියෙනවද? හරි දැන් මෙම ආගමික දේශකයන් ගෙන්වා ගැනීම සඳහා කටයුතු කරලා තිබුණු ලංකාවේ කටයුතු කරලා තිබ්බ යම් විශේෂිත ආයතනයක් හරි පුද්ගල කොට්ඨාශයක් හරි හඳුනා ගන්නට පුළුවන් වුනාද?

පි: මං හිතන්නේ පසු කාලිනව හඳුනා ගන්න තිබ්බා මගේ මතකයේ හැටියට.

ප්‍ර: ඔබේ කාලයේ?

පි: මාගේ කාලයේ එහෙම විශේෂයෙන් සඳහන් කරන්න අපහසු වෙනවා.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**
**කොමිෂන් සභාවේ කටයුතු දිවා ආහාරය සඳහා පස්වරු 1 පසු වී විනාඩි 45 වන තෙක් කල් තබනවා**
**දැන් වේලාව ප.ව.12.55**

**********

**දැන් වේලාව ප.ව.1.55**
**දිවා විවේකයෙන් පසු සාක්ෂිකරු නැවත ප්‍රතිඥා දී කැදවයි.**

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>**
**X113 ලෙස ලකුණු කර ඇති ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටී**

ප්‍ර: පරීක්ෂා කර බලයි කියවා බලයි. X113 කියන ලේඛනය අධ්‍යක්ෂක SIS විසින් CNI වෙත යොමු කරන ලද ලිපියක්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මෙම ලිපියේ සඳහන් මුද්‍රාවක් තබලා තිබෙනවා top secret එසේම මේ දෙවනි පිටුවේත් පිටු දෙකකින් තියෙන ලේඛනයේ දෙවනි පිටුවේ top secret කියන මුද්‍රාව ස්ථාන දෙකක තබලා තියෙනවා?

පි; එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මෙවැනි මුද්‍රාවක් සහිතව ලේඛනයක් යොමු කිරීමේදී ඔබ පෙර සඳහන් කර ආකාරයට මෙම X 113 ලබන්නා විසින් එහි අඩංගු කරුණු ඇතුලත් කරලා තොරතුරු හුවමාරු කර ගැනීමේ හැකියාවක් තියෙනවා?

පි: ස්වාමිනි මේක තොරතුරු හුවමාරු කිරීම පමණක් නොවේ මෙවැනි information එකක් ලැබුනා නම් මේකේ කියනවා පැහැදිලිවම attack එකක් කරන්න යනවා කියලා ළඟදීම අපි ආපහු අහන්න ඕනේ එහෙම නම් මේකට තියෙන background to the incident whether this is

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

possible ඒ අනිත් එක මෙකේ මම දකින දෙයක් තමයි මේකේ කිසිම අපි සමාන්‍යයෙන් information එකක් ලැබුණාම ස්වාමිනි අපි ඒක grading එකක් තියෙනවා ඒ කියන්නේ reliability of the information and credibility of informant, whether we have received any information prior to this regard to any attack as plan or and also whether there were any incident previously reported with regarded to this type of attack by this particular Muslims
සමාවෙන්න ස්වාමිනි මෙවැනි තොරතුරක් අපිට ලැබුණාම අපි ඉස්සෙල්ලාම බලන්නේ මේ ලැබිච්ච තොරතුරේ විශ්වාසනියත්ව භාවය ඒ කියන්නේ top secret එකක් එනවා නම්, කොහොම හරි top secret, secret, confidential මොන විදියකට හරි ලැබුණා නම් මේකේ අපි ඉස්සෙල්ලාම බලන්න ඕනේ මේ තොරතුරේ විශ්වාස බාවය ඒ කියන්නේ ග්‍රේඩින් එකක් තියෙන්න ඕනේ මේ information එකට එහෙම නැත්නම් කටින් හරි ඇවිල්ලා කියන්න ඕනේ. මෙවැනි තොරතුරක් මං හිතන්නේ අතින් භාර දෙන මේල් එකේ වෙන්න ඕනේ නැහැ මුලම කාරණාව ඇවිල්ලා personally හම්බෙලා මේ ගැන කතා කරන්න ඕනේ යුතු දෙයක් මේක ඒ වෙලාවේ අතින් භාර දෙන්න තිබ්බා මේ ලියුම මං දන්නේ නැහැ කොහොම සිද්ධ වුනාද කියන එක.

ප්‍ර: කවුරු විසින් අතින් භාර දියුයුතු කියලාද ඔබ කියා සිටින්නේ ?

පි: අධ්‍යක්ෂකතුමා SIS

ප්‍ර; ඔහු විසින් කාටද අතින් භාර දිය යුතු වන්නේ?

පි: CNI ට

ප්‍ර: CNI හරි ඔබ කියා සිටියා මෙම X 113 ට grading එකක් ලබා දීලා නැහැ කියලා? දැන් මෙහි classification යන කොටසේ මෙම X113 පළවන පිටුවේ classification යන කොටසේ ගහලා තියෙනවා top secret කියලා

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ කියන grading එක එමගින් නිරූපනය වන්නේ නැද්ද?

පි: ග්‍රේඩින් එක නෙමේ මේ තියෙන්නේ security තියෙන්නේ ස්වාමිනි. මම කියන්නේ information එකේ grading එක ඒ කියන්නේ විශ්වාසනීයත්ව භාවය තොරතුරක් විශ්වාසනිය තොරතුරුකරුවෙක් විසින් දුන්නා ද කියන එක අපි ඒක grading කරනවා A1 , A2, B1, B2,B,3 ඒ වගේ A 2 E යනවා. ඒ වගේ E නම් අපි ගනන් ගන්නේම නැහැ. A1 නම් අපි සම්පුර්ණයෙන්ම ඒ ගැන ක්‍රියාත්මක වෙනවා. ඒ කියන්නේ Credibility of the informant and reliability of the information

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ තොරතුරු සපයන්නාගේ තියෙන විශ්වාසවන්ත භාවය?

පි: විශ්වාසනියත්ව භාවය තොරතුරේ විශ්වාස භාව ස්ඛාවය.

ප්‍ර: දැන් එම grading ඔබ කියන පෙරකි grading එක් කොතන දැමිය යුතු වන්නේ මේ X 113 කියන ලේඛනය?

පි: මේකේ දාන්නමත් අවශ්‍යතාව නැහැ. නමුත් මං හිතන්නේ අධ්‍යක්ෂක තුමා CNI එක හම්බෙලා ඒක කිව්වා නම් මෙන්න මේකට මේ තොරතුරු ලැබුනේ මේ ආයතනයේ reliable credible information එකක් තියෙන්නේ. ඒක හින්දා මේකට අපි පියවරක් ගත යුතුයි කියන එක අනිවර්යෙන්ම කියලා තියෙන්න ඕනේ .

ප්‍ර: දැන් මේ වගේ ලිපියක් CNI වෙත ලැබුණාම මෙවැනි තොරතුරක් ඔහු ගත යුතු පියවර ඔබට අනුව මොකක්ද?

පි: මම ගන්න පියවර වන්නේ කියන්න පුළුවන් ස්වාමිනි. මම නැති කාලේ CNI ගත්ත පියවරක් මම දන්නේ නැහැ මට ඒකට උත්තර දෙන්න අමාරුයි මම. නම් කරන්නේ ගත්ත ගමන් මං අනිත් අය වහාම කැඳවනවා ඔක්කෝම බුද්ධි අංශ ටික කැඳවලා මේ ගැන සාකච්ඡා කරනවා. එතකොට එක එක බුද්ධි අංශවලින් ස්වාමිනි මම අහනවා මේකට සම්බන්ධ වෙනත් තොරතුරු තියෙනවද මීට ඉස්සෙල්ලා ඒවා රපෝර්තු කරලා තියෙනවාද ඒවා කොහොමද රපෝර්තු කරලා තියෙන්නේ කවුද රපෝර්තු කරලා තියෙනේ මොන ආයතනයෙන්ද එහෙම නම් ඒවාගේ විශ්වාසවන්ත භාවය කොහොමද ඒ තොරුතුරු වල දැන් උදාහරණයක් වශයෙන් මේ attack එක සම්බන්ධයෙන් කථා කරන කොට මීට ඉස්සර යොමුවෙච්ච සිද්ධින් කිහිපයක් තිබ්බා. වනාතවිල්ලුවේ incident දැන් recovery එක මෝටර් සයිකල් එකේ පිපිරිම එතකොට මාවනැල්ල බුදුපිළිම කැඩිම ඒ වගේ ගොඩාක් ලයිනප් වෙලා තිබ්බා මේකට සම්බන්ධව ඒවා ගැන analysis එකක් කරාද කියන එක මම දන්නේ නැහැ ස්වාමිනි. මට හම්බුනා නම් කරන්නේ ඒ විදියට ස්වාමිනි.

ප්‍ර: මොටර් සයිකල් බෝම්බය සිදුවුනේ මෙම ලිපියේ දිනය 2019.04.07 ඉන් පසුව තමයි ඔබ කියන මෝටර් සයිකල් පිපිරිම සිදුවුයේ?

පි: අඩුගානේ ඒවාගේ incident වුනානම් ඊට ඉස්සෙල්ලා හෝ පසුව මං හිතන්නේ ඒ ගැන අපේ බුද්ධි සමාලෝචන සකච්ඡා වලින් සම්බන්ධ විය යුතු දේවල් මේ.

ප්‍ර: ඔබ කියා සිටියා බුද්ධි සමාලෝචනයේදී ඔබ මෙය සකච්ඡා කල යුතු වෙනවා කියලා?

පි: එහෙමයි ස්වාමිනි. මේක ස්වාමිනි විශේෂයෙන් කැදවීමක් කරලා සාකාච්ඡා කරන්න ඕනි දෙයක් අහහරුවාදා වෙනකම් ඉන්න අවශ්‍ය නැහැ මේකට

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඇයි ඒ ?

පි: අපි අවශ්‍යතාවය අනුව තියෙන තොරතුරේ බරපතල කම අනුව අපි හම්බෙලා සාකච්ඡා කල යුතුයි මේවැනි දෙයක් සිදුවෙන්න පුළුවන්ද නැද්ද කියන එක ඒකට අපි බල බල ඉන්න බැහැ අහහරුවාදා වෙනකම් ඉන්න බැහැ. අපි එවැනි දේවල් තමයි ඉස්සර කරේ.

**මා ඔබට C4 A ලෙස ලකුණු කරලා තියෙන ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටියි**

ප්‍ර: ඔබගේ මතයට අනුව නැහැ මා ඔබට කියා සිටියොත් මෙම **C4 A** පිළිවෙල කර තිබෙන්නේ CNI විසින් ඔහු වෙත මෙම X 113 ලද තොරතුරෙන් මත කියලා ඒක පිළිගන්නවා.?

පි: පිළිගන්නවා.

ප්‍ර: පෙනි යන ආකාරය මත පිළිගන්නවා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබගේ මතයට අනුව CNI විසින් තමා වෙත ලද X113 සම්බන්ධයෙන් **C4 A** කියන ලේඛනය පිළියෙල කරලා ඒක පොලිස්පතිවරයා වෙත යොමු කිරීම මෙම තොරතුරට අනුව ප්‍රමාණවත් ද නැද්ද?

පි: ප්‍රමාණවත් නැහැ ස්වාමිනි.

ප්‍ර: ඇයි ඒ ?

පි: මොකද පළමුවෙන්ම මේ ලියුම හම්බෙලා තියෙන්නේ 07 වෙනිදා අප්‍රේල් මාසේ 07 වෙනිදා SIS එකෙන් CNI එකට එයාට information එක ලැබුණ එක මෙතන වැදගත් මෙතෙන්ට

ප්‍ර: එහාට කොහෙන්ද information ලැබුනේ SIS ට?

පි: SISට එයා දවස් කීයක් එයා එතන information එක තියා ගත්තද මෙච්චර imminent attack එකක් වෙනවා නම් ඒක ඉස්සෙල්ලාම බලන්න ඕනේ. ඊට පස්සේ මෙයා 09 වෙනිදා ලියනවා IG ට එතකොට 07 වෙනිදා ඉදන් 09 වෙනිදා වෙනකම් ආරක්ෂක ලේකම්තුමා දැනුවත් කරාද?

ප්‍ර: කවුරු විසින් ද ආරක්ෂක ලේකම්තුමා ?

පි: CNI.

ප්‍ර: CNI?

පි: ඊට පස්සේ මේකෙන් ගත්ත ක්‍රියාමාර්ගය මොනවද ? බුද්ධි සමාලෝචන සාකච්ඡා ගෙනල්ලා කතා කරාද මෙකේදි එයා නැත්නම් අඩු ගානේ SIS ඩිරෙක්ටර්වත් මේ ගැන ගෙන්නලා කතා කරාද මේ බුද්ධි සමාලෝචන සාකාච්ඡා වලදී අනිවාර්යෙන්ම ඒක සාකච්ඡා කල යුතු එකක් Top secret කියලා ඇතුලේ දාන් ඉන්න බැහැනේ ස්වාමිනි.මේ වගේ එකක් share කරන්න ඕනේනේ එහෙම sharing එකක් වුනාද මෙතන එහෙම

FAIR COMMENT BY JEZEEM

තමයි ඒක තමයි මෙතන වැදගත් වන්නේ මෙතන මම දන්නේ නැහැ sharing එකක් වෙලා ද නැද්ද කියලා මම දන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබ කියා සිටියා මෙවැනි අවස්ථාවක මෙවැනි තොරතුරුක් ලැබුණම බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමක් නොපමාව කැඳවීම කලයුතුව තිබුණා කියලා?

පි; අනිවාර්‍යෙන්ම එපමණක් නොවේ. අඩුගානේ ආරක්ෂකට ලේකම්තුමාට කෙලින්ම දන්නලා පොලිස්පතිතුමා සහ අනික් හමුදාපතිවරුත් ඔක්කෝම කැඳවන්න ඕනේ කාරණාවක් මේක.

ප්‍ර: එම සම්බන්ධීකරණ රැස්වීම කැඳවීමේ වගකීම තිබෙන්නේ කාටද? ඔබට අනුව

පි: මම හිටියා නම් මම ගන්නවා ඒ වගකීම.

ප්‍ර: ඔබ ගන්නවා රැස්වීමේ කැඳවීම?

පි: මම ගන්නවා ස්වාමිනි.

ප්‍ර: දැන් එසේ නැත්නම් සම්බන්ධීකරණ රැස්වීම බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම ඔබට අනුව කැඳවන්නේ ආරක්ෂක ලේකම්වරයා?

පි: නෑ මම අනිවාර්යෙන්ම ආරක්ෂ ලේකම් තුමා දැනුවත් කරලා එතුමා අනිවාර්යෙනම කියනවා ඔක්කෝම කැඳවන්න කියලා. ඒ නොකිව්වත් මම යෝජනවා කරනවා කැඳවලා අපි මේක සාකච්ඡා කරන්න ඕනේ කියන එක ඒක කියන එක අවශ්‍යතාවයක් නැහැ මේ ගොල්ලන්ට ඒක ඒක ක්‍රියාමාර්ගයන් මං හොඳින් දන්නවා ඒක අනිවාර්යෙන් වෙන දෙයක්.

ප්‍ර: දැන් මෙම X 113 තිබෙන තොරතුර ආරක්ෂක මණ්ඩලයේ වෙත ඉදිරිපත් කල යුතු තොරතුරක් ද නැද්ද? ඔබගේ මතයට අනුව?

පි: අනිවාර්යෙන් ම තොරතුරු ආරක්ෂක මණ්ඩලයේ රැස්වුනා නම් මේ දවස් වල ඒක අනිවාර්යෙන්ම ගන්න ඕනේ. එහෙම නැත්නම් විශේෂ රැස්වීමක් කරලා හරි එහෙම නැත්නම් ජනාධිපතිතුමා දැනුවත් කරන්න ඕනේ ආරක්ෂක ලේකම් තුමා.

ප්‍ර: ඇයි ජනාධිපතිතුමාව දැනුවත් කරන්න ඕනේ ආරක්ෂක ලේකම්තුමා විසින් ?

පි: රටේ ජනාධිපති.සන්නද්ධ සේනා විධායක එතකොට රටේ ආරක්ෂාව තියෙන්නේ වගකීම තියෙන්නේ ජනාධිපති යටතේ.

ප්‍ර: මෙවැනි තොරතුරක් ජනාධිපතිතුමාට පැවසිය යුතුද ?

පි: අනිවාර්යෙන්ම . පැවසිය යුතුයි ස්වාමිනි.

ප්‍ර: යම් අවස්ථාවක මෙම තොරතුර මේ ඔබ ඉදිරියේ තිබෙන X113 ඉහත සඳහන් තොරතුර ජනාධිපතිතුමා වෙත දන්වා නොමැති නම් ජනාධිපතිතුමාට ඒ සම්බන්ධයෙන් අවබෝධයක් නැත්නම් ඔබගේ මතය අනුව ඒකේ වගකීම කාටද පැවරිය යුතු වන්නේ?

පි: පැහැදිලි නැහැ ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ජනාධිපතිවරයාට ඔබ ඉදිරියේ තිබෙන X113 ලේඛණයේ සඳහන් ඒ බුද්ධි තොරතුර දැනුම් දීමක් සිදු කරලා නැත්නම් එම දැනුම් නොදීම සම්බන්ධයෙන් වග කිවයුතු වන්නේ කවුරුද? ඔබට අනුව?

පි: මම හිතන්නේ දෙයාකාරයකින්ම සිද්ධ වෙන්න පුළුවන් ස්වාමිනි.

ප්‍ර: පැහැදිලි කරන්න කරුණාකරලා?

පි': එකේ ආරක්ෂක ලේකම්තුමා දැනුවත් වෙන්න ඕනේ.ආරක්ෂක ලේකම්තුමා මාර්ගයෙන් දැනුවත් කරන්න පුළුවන්. එහෙම නැත්නම් CNI මා පුළුවන් එක ජනාධිපතිතුමා දැනුවත් කරන්න එහෙම නැත්නම SIS director පුළුවන් ජනාධිපතිතුමා දැනුවත් කරන්න නමුත් අපේ කාලයේ ඒ සිද්ධ වුනේ එහෙම නෙමේ ඒක හරි මාර්ගයෙන් ගියා ඔක්කෝම තොරතුරු බෙදා හැරීම සහ ක්‍රියාන්විතයන් ඔක්කෝම ඒ කියන්නේ CNI ට දන්නනවා ආරක්ෂක ලේකම්තුමාට දන්නවා ජනාධිපතිතුමාට දන්නනවා අවශ්‍ය පියවර ගන්නවා ඒ mechanism එකක් තිබ්බා ස්වාමිනි.

ප්‍ර: ඔබගේ කාල වකවානුවේදී ඒ කියන්නේ ඔබ CNI වශයෙන් සේවය කරන කාලයේදී යේදී director SIS එකේ අධ්‍යක්ෂකවරයාට ජනාධිපතිතුමා කෙලින්ම ආමතන්ත්‍රණය කරන්න දුරකථන hotline එකක් පහසුකමක් තිබ්බද නැද්ද කියන්න ඔබ දන්නවාද?

පි: මං හිතන්නේ hotline එකක් තිබ්බා.මම දන්න කාලේ. මම ඉන්න කාලේ තිබ්බා hotline එකක් මම දන්නේ නැහැ දැන් තියෙනවා ද කියලා.

ප්‍ර: ඔබගේ අවබෝධයට අනුව නැත්නම් ඔබගේ මතයට අනුව මේ X 113 සඳහන් ඒ බුද්ධි තොරතුර ඔබ කියාපු ජනාධිපතිතුමා රටේ ආරක්ෂව වගේම සේනාධිනායකයා වන ජනාධිපතිතුමාට දැනුම් දීමේ වගකීමක් SIS එකේ අධ්‍යක්ෂකවරයාට තිබුණා ද නැද්ද?

පි: මම දන්නේ නැහැ මේ කාලේ කොහොමද වගකීමක් තිබුණා ද නැද්ද කියලා අනිවාර්යෙන්ම වගකීමක් තියෙනවා අනිවාර්යෙන් වගකීම පැහැර හරින්න බැහැ දැනුම් දෙන්න ඕනේ අනිවාර්යෙන්ම ආරක්ෂක ලේකම්තුමා මාර්ගයෙන් හරි දැනුම් දෙන්න ඕනේ.

ප්‍ර: ඔබට වැටහීමක් තියෙනවද අධ්‍යක්ෂක SIS ගේ කාර්ය ප්‍රධාන කාර්ය කුමක්ද කියලා?

පි: ඒක ලොකු පරාසයක තියෙන රාජකාරියක් .

ප්‍ර: ප්‍රධානම අරමුණ ?

පි: ජාතික ආරක්ෂාව.

ප්‍ර: ඔබට අනුව මෙම X 113 සඳහන් තොරතුර ජාතික ආරක්ෂාවට සෘජු සම්බන්ධතාවයක් සෘජු බලපෑමක් සෘජු බලපෑමක් සිදුවිය හැකියි සිදුවන බවට තොරතුරක් ද නැද්ද?

FAIR COMMENT BY JEZEEM

පි: සිදුවන බවට තොරතුරක්.

ප්‍ර: එවන් අවස්ථාවකදී ඔබප hotline එකක් SIS දුරකථන කිරීම කෙලින්ම ජනාධිපතිතුමා සම්බන්ධවීම සඳහා වන දුරකථන පහසුකමක් අධ්‍යක්ෂක SIS වෙත තිබුණා නම් ඔබගේ මතයට අනුව ඔහු විසින් එය අනිවාර්යෙන්ම ජනාධිපතිතුමාට දැනුම් දිය යුතුද නැද්ද?

පි: ස්වාමිනි මේ hotline කියන එක ඒ තරම් දෙයක් නෙමේ ස්වාමිනි මොකද දැන් mobile phone තියෙනවා දැන්. අපි දන්නේ නැහැ ජනාධිපතිතුමා කාර්යාලයේ ඉන්නවාද නැද්ද කියලා ජනාධිපතිතුමා කාර්යාලයේ නැත්නම් හොඳම වැඩේ මොබයිල් ෆෝන් එකෙන් කතා කරන එක ඒක කතා කරන්න පුළුවන් රටේ ඕනම තැනක හිටියත් එහෙම නැත්නම් පිටරට හිටියත් කියන්න පුළුවන් ස්වාමිනි.

ප්‍ර: පිටරට හිටියත් කියන්න අවශ්‍යතාවයක් තියෙනවද? එතුමා පිට රට ඉන්න කොට ලංකාවේ වෙන දෙයක් ගැන..?

පි: ජනාධිපති දැනගතයුතු දේවල් තියෙනවා ස්වාමිනි. රටේ ජාතික ආරක්ෂාවට බලපාන දේවල් තියෙනවා.

**X 112 සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා.**

ප්‍ර: X 112 ත් අධ්‍යක්ෂක SIS විසින් CNI. වෙත ලබා දෙන ලද තොරතුරක් කිව්වොත් නිවැරදිද? (කියවා බලයි) මෙම X 112 මගින් කියා සිටින්නේ කෙටියෙන් ගතහොත් සහරාන් කියන පුද්ගලයා විසින් ප්‍රකාශ කර තිබෙනවා suicide attack මරාගෙන මැරෙන ප්‍රහාරයන් අල්ලාහ් දෙවියන්ට අනුව සාධාරණයි කියලා ඒ වගේම එම නිසා අල්ලාහ් දෙවියන් අනුගමනය කරන අනුගාමිකයන්ට හැකියාව තියෙනවා කාෆිර්වරු ඒ කියන්නේ එතුමාව අනුගමනය නොකරන අයව මරා දැමීමට පුළුවන් කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ මාරා දැමීමේදී පුපුරවා හැරීම් මඟින් ඉස්ලාමිය රාජ්‍යයක් පිහිටුවීම හැකියාව ඇති බවත් ඒ වගේම සහරාන් ආරාධනා කර තිබෙනවා ඔහුගේ අනුගාමිකයන්ට පොදු ස්ථානවලදී ඉස්ලාම් ධර්මය පිළිනොගන්නා අයව මරාගෙන මැරෙන ප්‍රහාරයකින් විනාශ කරන්න කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එය තමයි මේ X 112 කෙටි සාරාංශය මගේ ප්‍රශ්නය වන්නේ X 112 සහ X 113 යන ලේඛන සම්බන්ධයෙන් CNI වශයෙන් ඔබ වෙත ලැබී තිබුණා නම් මොක ද X 112 දිනය 2019 පෙබරවාරි 02 X 113 දිනය 2019 පෙබරවාරි 07 මෙන්න මේ තොරතුරු CNI. වශයෙන් ඔබ වෙත ලැබුණා නම් ඔබ මෙම X 113 තිබෙන තොරතුර ඒ කියන්නේ සිදුවිය

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

හැකි මරාගෙන මැරෙන ප්‍රහාරය සම්බන්ධයෙන් වන තොරතුර ඔබ සලකන්නේ ?

පි: අනිවාර්යෙන්ම සලකනවා ස්වාමිනි.

ප්‍ර: මොන ආකාරයේ වැදගත්කමක් සත්‍යතාවයක් තියෙන ලේඛනයක් වශයෙන්?

පි: මේක අනිවාර්යෙන්ම සැලකිය යුතුයි මේක ලයින් අප් කරලා තියෙනවා මෙවැනි තොරතුරු මේවා එකක් වෙන්න පුළුවන් කියන එක මේ ගොල්ලන්ගේ ideology එක කියන එක ගැන පැහැදිලිව කියලා තියෙනවා.

ප්‍ර: මොකක්ද ඒ X 112 ?

පි: මොකක්ද ඒ X 112 ideology එකේ කියලා තියෙනවා නමුත් මෙකේ X 112 දීලා තියෙන්නේ මේකේ ස්වාමිනි පෙබරවාරි දෙවනිදා පෙබරවාරි 02 වෙනිදා මේක ලැබුණා ට පස්සේ මොකක්ද කරේ කියන එක තමයි අපැහැදිලියි එහෙම පැහැදිලි කරපු නිසා මෙවැනි තොරතුරක් ලැබිලා මේක share කරගත්තාද මේ ගැන තවදුරටත් information මේ ගැන ඒක දුන්න එක්කෙනත් එක්ක ඒ පාර්ශවයෙන් මේ ගැන සොයලා බැලුවාද තවදුරටත් information දෙන්න පුළුවන්ද කියලා මං හිතන්නේ එකයි වැදගත් වන්නේ.

(2019 පෙබරවාරි මාසේ 06 වෙනිදා අධ්‍යක්ෂක SIS විසින් CNI. වෙත යොමු කරන ලද ලිපියක් සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා ස්වාමිනි.)

ප්‍ර: දැන් මා ඔබතුමාට X 112 ලේඛනය පෙන්වා සිටියා. මා ඔබට කියා සිටියොත් මේ X 112ට පෙර සහරාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් CNI. වෙත මේ X 112 වැනි තොරතුරු ඉදිරිපත් වෙලා තිබුණා නම් සහ මේ X 112 න් පසුව තවදුරටත් මුස්ලිම් නොවන පුද්ගලයන් මරාදැමිය යුතු බවට සහරාන් ප්‍රකාශ කරන බවට CNI. වෙත අවස්ථා කීපයකදී තොරතුරු ඉදිරිපත් වෙලා තිබුණා නම් ඔබ CNI වශයෙන් සිටියා නම් මේ X 113 සම්බන්ධයෙන් ගන්නා වූ පියවර අර කොයි ආකාරයට ද පෙළ ගස්වන්නේ?

පි: ස්වාමිනි මෙතන පැහැදිලිවම කියවෙනවා මේ යම් කිසි operation එකකට ක්‍රියාන්විත විතයකට පැහැදිලිව යොමුවෙනවා කියන එක මෙතනින් ඒ ගොල්ලෝ පෙල ගස්වනවා කියලා මෙතනින් පැහැදිලි වෙනවා එතකොට මේකේ දන්නලා තියෙනවා මේකේ සහභාගී වෙච්ච අයගෙන් නම් සඳහන් කරලා නැති වුනත් ඒක මං හිතන්නේ සාකච්ඡා මාර්ගයකින් විසඳගන්න තිබිච්ච හොඳම මං හිතන්නේ මං හිටියා නම් මං කරන්නේ ස්වාමිනි. නැවත් මේ ගැන බුද්ධි අධ්‍යක්ෂක SIS director ගෙනල්ලා ඉදලා මේ ගැන අනිත් බුද්ධි අංශත් ගෙනල්ලා අනිවාර්යෙන්ම සාකච්ඡා කරලා ඒ අයගෙනුත් තොරතුරු අරගෙන ඒ

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

අයටත් තොරතරු අරගෙන තොරතුරු බෙදලා දීලා ඒ අයගෙත් තව ඉස්සරහට වෙන්න තිබ්බ තොරතුරු අරගෙන ඒවාගේ ක්‍රියාමාර්ගයක් ගන්නනවා.

ප්‍ර: කාත් සමඟ ද ක්‍රියාමර්ග ගන්නේ?

පි: සියලුදෙනාම සම්බන්ධයෙන් කතා කරලා ඒක පැහැදිලිව උඩට ඉදිරිපත් කරනවා .

ප්‍ර: කාත් එක්ක ද ඔබතුමාට නම් කරන්න පුළුවන් ද ඒ ආයතනයන් හා පුද්ගලයන් ඔබ විසින් ?

පි: SIS director DMI හමුදා බුද්ධි, එතකොට ගුවන් හමුදා නාවික හමුදා බුද්ධි අංශ නිලධාරීන් එතකොට Special Branch, Western Province, Intelligence, එතකොට අපි සමහර විට අපි ගෙන්නවා ඒ වගේ වෙලාවට east එකේ හිටපු හමුදා බුද්ධි නිලධාරීන් එහෙම නැත්නම් SIS එකෙන් ඒ ගත්ත තොරතුර ලැබුණා නම් ඒ පැත්තෙන් ඒ එක්කෙනාවත් ගෙන්න ගන්න හැකියාවක් තිබුණා එතකොට SIS ඩිරෙක්ටර් ඉන්නවා. ඒ බුද්ධි තොරතුරු ගත්ත එක්කෙනා ඉන්නවා.එතකොට අනිත් ආයතන එතකොට පොලිසිය පොලිස්පතිතුමා ඉන්නවා , TID, DIG ඉන්නවා CID DIG ඉන්නවා ඩිරෙක්ටර් CID ඉන්වා STF ඉන්වා මොකද මේ east එකේ STF ත් ප්‍රධාන කර්තවයක් කරපු කට්ටියක් ඉතින් ඒ අය සියලු දෙනාම ගෙන්නලා මේ තොරතුරු සමාලෝචනයක් කරන්න තිබ්බා.

ප්‍ර: ඊට පස්සේ බුද්ධි සමාලෝචනය ඉහළට ඒ කියන්නේ?

පි: අනිවාර්යෙන්ම ඉහළට ආරක්ෂක ලේකම්තුමාට දන්නවා සමහර වෙලාවට ආරක්ෂක ලේකම්තුමා ඉන්න මීටිමෙන් මේක වෙන්න පුළුවන්.

ප්‍ර: මගේ අවසාන ප්‍රශ්න දෙක ඔබ කියන මේ ආරක්ෂක බුද්ධි රැස්වීම සහ ආරක්ෂක මණ්ඩලය රැස්වීම නිසි පරිදි පැවැත්වුවේ නැත්නම් එහි වගකීම කාවෙත ද පැවරෙන්නේ ඔබට අනුව?

පි: මම හිතන්නේ ස්වාමිනි පළමුවෙන්ම රටේ ජනාධිපතිතුමාට අවශ්‍යතාවයක් තියෙන්න ඕනේ රටේ ජාතික ආරක්ෂාවට බලපාන තොරතුරු තියෙනවා නම් ඒ ගැන විශේෂ තොරතුරු දැනුමක් තිබිලා විශේෂ කාර්යක් වශයෙන් ආරක්ෂක මණ්ඩලය රැස් කර ගන්නේ එහෙම නැත්නම් ආරක්ෂක ලේකම්තුමා දන්නවානම් මේ මෙවැනි තොරතුරු තියෙනවා නම් දැනුම් දිය යුතු share කරගතයුතු ආරක්ෂිත කවුන්සිලයට දැනුම් දිය යුතු ඒවා තියෙනවා නම් ඒක ආරක්ෂක ලේකම්තුමාගේ වකිමක්.

ප්‍ර: යම් හෙයකින් මෙම ආරක්ෂක මණ්ඩල රැස්වීම සහ බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම් පවත්වපු අවස්ථාවකදි ආරක්ෂක ඇමැතිතුමා

FAIR COMMENT BY JEZEEM

වන ජනාධිපතිතුමටා ප්‍රකාශ කරන්න පුළුවන්ද ඒ මා පෙර සඳහන් කර රැස්වීමේදී නියම ආකාරයට සති පතා පැවැත්තුවා නම් ඔබ X 113 සඳහන් තොරතුරු ඔහු වෙත ලැබුණේ නැති බව පැහැදිලිද ප්‍රශ්නය. යම් හෙයකින් ආරක්ෂක මණ්ඩල රැස්වීම සහ බුද්ධි සම්බන්ධිකරණ රැස්වීම් සතිපතා ක්‍රමාණුකූල පැවැත්වූ අවස්ථාවකදී ජනාධිපතිවරයාට හැකියාවක් තියෙනවාද ආරක්ෂක ඇමති වශයෙන් ප්‍රකාශ කරන්න ඔහුට මෙම X 113 සඳහන් තොරතුර ලැබුණේ නැහැ කියලා?

පි: ස්වාමිනි ඒ සාකච්ඡාවේදී මේක ඉදිරිපත් කරා නම් ඒකෙන් ගැලවෙන්න බැහැ ඉදිරිපත් කරේ නැහැ කියලා.

ප්‍ර: ජනාධිපතිවරයාගේ සාකච්ඡාවේදී මෙම තොරතුර ඉදිරිපත් කිරීමේ වගකීම කාටද තියෙන්නේ?

පි: අනිවාර්යෙන්ම මෙතන වගකීම තියෙන්නේ SIS ඩිරෙක්ටර්ට?

ප්‍ර: SIS අධ්‍යක්ෂකවරයා වෙත තියෙන්නේ?

පි: එයාගේ මේ information එක එහෙම නැත්නම් CNI inform කරන්න ඕනේ ජනාධිපතිතුමාට ආරක්ෂක කවුන්සිලයේදී.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු ඔබ කිව්වා ඔබ 2015 විශ්‍රාම යන්න ඉස්සෙල්ලා ආගමික අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් යම් යම් තොරතුරු ලැබුණා කියලා ජාතික බුද්ධි ප්‍රධානියා වශයෙන්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එවැනි තොරතුරු ඔබට ලැබෙන්න පටන්ගත්ත කාල සීමාව මොකක්ද?

පි: මං හිතන්නේ 2017 වසරේ අන්තිම වගේ ස්වාමිනි ලොකු attack වගේ දේවල් නෙමේ අපි ඒ ගොල්ලන් ගැන මේ සිරියන් එක ගැන තමයි ඉස්සෙල්ලාම ආවේ සිරියාවේ incident එක දිනය මතක නැහැ ස්වාමිනි. ඊට පස්සේ ඒක හමුදාවේ බුද්ධි අධ්‍යක්ෂකවරයාට භාර දුන්නා එතැනින් එහාට ඒ වැඩකටයුතු කරගෙන යන්න කියලා .

ප්‍ර; ඒක 2014 අවසානයේ ද ඊට පෙරද? පොඩ්ඩක් මතක් කරලා කියන්න මොකද මේ කොමිෂම ඉදිරියේ වෙනත් සාක්ෂි මෙහෙයවලා තියෙනවා එකයි ඔබගෙන් ඇහුවේ?

පි: එහෙමයි ස්වාමිනි. හරියටම මතකයක් නැහැ ස්වාමිනි.

ප්‍ර: මෙම කොමිෂම ඉදිරියේ සාක්ෂික මෙහෙයවලා තබ්බානම් ඒ අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම තොරතුරු ලැබෙන්නේ 2013,2012 වර්ෂවලදි කියලා කිව්වොත් ඒක පිළිගන්නවද? මං අහන්නේ ආගමික අන්තවාදය ත්‍රස්තවාදී කටයුතු සම්බන්ධව නෙමේ?

පි: අපි ආගමික අන්තවාදය කිව්වා ම ස්වාමිනි අපි දරුණු විදියට හැඩගැස්වීමක් එතන අපි දැක්කේ නැහැ එතන සුළු වශයෙන් හැඩ

ගැස්වීමක් පමණයි අපි හලාල් ප්‍රශ්නය දැක්කා අපි එතකොට එතැනින් එහාට.

ප්‍ර: මම දරුණු කියලා පාවිච්චි කරේ නැහැ ඒක හින්දා මං ඒ ප්‍රශ්නය අහන්නේ ආගමික අන්තවාදව සම්බන්ධයෙන් යම් තොරතුරු ලැබෙන්න පටන් ගත්තු කාල සීමාව ?

පි: කාල සීමාව ස්වාමිනි.මට ඒක හරියටම මුකුත් document එකක් නැතිව කියන්න අමාරුයි ස්වාමිනි.

ප්‍ර: හරි මෙහෙම කිව්වොත් නිවැරදිද කියන්න එවැනි තොරුතුරු ලැබුණායින් පස්සේ පසු යම් අවස්ථාවක දී ඒ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යම් නිලධාරියෙක් එක් තරා අවස්ථාවක පත්කරා කිව්වොත් ඒක ඔබ පිළිගන්නවාද?

පි: පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ නිලධාරියා දන්නවා නේද හරියටම මේ වකවානුව මොකක්ද කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබට මතකයක් නැතිවෙන්න පුළුවන්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ලැබුණු තොරතුරු සම්බන්ධයෙන් ගත්තු පියවර කුමක්ද?

පි: කෙලින්ම හමුදාවේ බුද්ධි අධ්‍යක්ෂතුමාට පැහැදිලිවම කියලා දුන්නා මේ සම්බන්ධයෙන් දිගටම සොයා බැලීම් කරන්න එතකොට ඒ තැන්වලට මොනවාහරි ඒ ගොල්ලන් trade craft.

ප්‍ර: කමක් නැහැ ඒ වචනය පාවිච්චි කරන්න?

පි: Trade craft එක යොදවලා කොහොම ද ඒ තැන්වලින් තොරතුරු හරි තොරතුරු ලබා ගන්නේ ඒ එක්කම ඒවා සමාලෝචනය කරන විදිය ඊට පස්සේ යම් කිසි භාෂා පිළිබඳ දැනිමක් අවශ්‍ය නම් කොහොමද ඒවාට කරන්න ඕනේ එතකොට අනිත් රටවලින් මේ සම්බන්ධයෙන් තියෙන තොරතුරු මොනවද ඒවා තොරතුරු ලබා ගන්න විදිය ඒවාත් එක්ක සම්බන්ධීකරණය කරන්නේ කොහොමද කියලා ඒ වගේ උපදෙස් මාලාවක් ඒ ලබා දීලා තිබ්බා ස්වාමිනි.

ප්‍ර: ඒ ආගමික අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු ලැබෙන්න පටන්ගත්තම එම තොරතුරු එක්තරා ආගමකට සිමා වුනාද නැත්නම් ආගම් කීපයක් සම්බන්ධයෙන්ද?

පි: ආගම් කීපයක් සම්බන්ධයෙන්.

ප්‍ර; මොකක් ආගම් සම්බන්ධයෙන්ද?

පි: අපේ ඒ කියන්නේ අන්තවාදී ස්වාමිනි අදහස් කරන්නේ අන්තවාදී ?

ප්‍ර: ඔව්?

පි: ඒක එක ආගමක්

ප්‍ර: මොකක්ද ඒ ආගම?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: මුස්ලිම්.ඉස්ලාම්.

ප්‍ර: එතකොට ඔබ 2015 විශ්‍රාම යන තෙක් ලැබුණෙ තොරතුරු ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් විතරද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: බොදුබල සේනාව සම්බන්ධයෙන් යම් පැමිණිලි ලැබුණාද?

පි: බොදුබල සේනාවෙන් මං ඉස්සෙල්ලා කිව්වානේ ස්වාමිනි බොදුබල සේනාවේ මුස්ලිම් අතරේ ගැටුමක් ඇතිවෙනකොට අපි ඒකටත් අපි පියවරක් ගත්තා කොහොමද ඒ සම්බන්ධයෙන් ඒවා මේ මර්ධනය කරන්නේ කියලා අපි ඒ දෙගොල්ලෝම ගෙන්නුවා මුස්ලිම් අයත් බොදුබල සේනාවේ කට්ටියත් එකම මේසයකට ගෙනත්ලා සාකච්ඡා කරා.

ප්‍ර: එතකොට ඒ කියන්නේ ඒ අවස්ථාව වෙන විට බොදු බල සේනාවත් යම් අන්තවාදී ක්‍රියාකාරකම් වල යෙදුනා කියලා නිරීක්ෂණය වුණාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; දැන් කොමිෂම ඉදිරියේ ඉදිරිපත් වෙලා තියෙන සාක්ෂි අනුව සහරාන් හෂීම් මේ ප්‍රහාරය එල්ලකරන්න ඉස්සෙල්ලා ප්‍රකාශයක් කරනවා මේ ප්‍රහාරය එල්ල කිරීමට එක හේතුවක් බොදුබල සේනාවේ ඥානසාර ස්වාමිනි වහන්සේගේ ක්‍රියාකාරකම් කියලා. මං මේ කියන්නේ කියලා තියෙන දේ ඒ සම්බන්ධයෙන් ඔබ මොකක්ද කියන්නේ?

පි: මං හිත්නනේ ස්වාමිනි ඥානසාර හාමුදුරුවෝ ඉදිරිපත්කරපු දේවල් සත්‍යයි ඒ කියන්නේ extremism එකකට නෙමේ, එයා facts ඉදිරිපත් කරේ. කාරණා ඉදිරිපත් කරා ඒ ඉදිරිපත් කර කාරණා සාධාරණයි මොකද ඒ ගොල්ලොන්ගේ තියෙන ක්‍රියාකාරි ගැන එයා එකින් එකට පැහැදිලි කරා නමුත් ඒක මේකට සාධකයක් කර ගන්න බැහැ මේ සහරාන්ට මේ එයා කරන්නේ මේක හින්දයි කියලා නමුත් එයාගේ අනිත් ක්‍රියාකාරකම් බලන කොට එයාගේ විඩියෝ පට බලන කොට එයාගේ මිනිස්සු හැසිරීම් සම්බන්ධයෙන් බලන කොට ඒක පැහැදිලිවම පේනවා මේකට සම්බන්ධයක් නැහැ නමුත් මේක ඒ ගොල්ලන්ගේ එක මතකය යන කණ්ඩායමක් කියලා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ කියන හැටියට ඒ ඥානසාර ස්වාමිනි වහන්සේගේ ඒ දක්වපු අදහස් නිවැරදි කියලා ඔබ කියනවාද?

පි: සමහර ඒවා නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: දැන් ඒ විදියට එම කරුණු ස්වාමීන් වහන්සේ නමක් මාර්ගයෙන් මේක සමාජ ගත වෙන්න තිබ්බ අවශ්‍යතාවය මොකක්ද නීතිමය නිතිය ක්‍රියාත්මක කරන අංශවලින් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණේ නැද්ද?

පි: ස්වාමිනි 2015 පෙරද

ප්‍ර: ඔව්?

FAIR COMMENT BY JEZEEM

පි: 2015 පෙර ඒ තොරතුරු ලැබිලා තමයි මේ අපි දෙගොල්ලෝම ගෙන්නුවේ මොකද අපිට තොරතුරු තිබ්බා ස්වාමිනි ඒ තොරතුරු තිබ්බායි කියලා කියන්නේ විශේෂ තොරතුරු තිබ්බේ නැහැ මේ හලාල් ප්‍රශ්නේ විතරයි අපිට ඒ දවස්වල පටන් ගත්තේ ඒ හලාල් ප්‍රශ්නේ තොරතුරු එනකොට අපි සොයලා බලලා ඒකට තමයි ඉස්සෙල්ලාම පිළියම කරේ. ඒ පාර තමයි ඒ ගොල්ලෝ දෙගොල්ලෝ ගෙන ප්‍රශ්න මොනවද මොනවද ඒ ගොල්ලන්ගේ ඉදිරියට යන්නේ ඒ කොහොමද අපි ප්‍රශ්න විසඳගන්නේ ඒ ගොල්ලෝ සාකාච්ඡා කරලා ඒක බොහෝම සාමකාමී විසඳ ගත්තා ස්වාමිනි.

ප්‍ර: ඔබ තුමාට මං කිව්ව ප්‍රශ්න සමහර විට ඔබතුමාට පැහැදිලි නොවෙන්න ඇති මං ආපහු පැහැදිලි කරන්නම් ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන අංශ තියෙනවානේ ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; ඔබතුමා හිටියේ රාජ්‍ය බුද්ධි සේවයේ ඉහළම ස්ථානයේනේ එතෙන්නට හැම නීතිය කඩකිරිමක් සම්බන්ධයෙන් එතැන්ට යන්නේ නැහැනේ?

පි: නෑ ස්වාමිනි .

ප්‍ර: මං දැන් අහන්නේ දැන් ඔය ඥානසාර ස්වාමින් වහන්සේ කියපු යම් කරුණු ඔබ තුමා කිව්වා ඒක නිවැරදියි කියලා එකේ සත්‍ය කරුණු ඉදිරිපත් කෙරුවා කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එම කරුණු සම්බන්ධයෙන් අර නීතිය ක්‍රියාත්මක කරන අංශ ක්‍රියාත්මක වුනේ නැද්ද?

පි: සමහර දේවල් ක්‍රියාත්මක වුනා ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ සමහරක් සටහන්?

පි: ඒ කියන්නේ ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග නීතිය වශයෙන් කීප දෙයක් කරලා තියෙනවා ස්වාමිනි. මට දැන් විස්තරය එකින් එකට විස්තර කරන්න එහෙම මතකයක් නැහැ නමුත් අනිවාර්යෙන්ම ඒ ගැන ක්‍රියාකාරි කරා.

ප්‍ර: ඒ කියන්නේ ඥානසාර හාමුදුරුවෝ කිව්වේ මේ කොමිෂම ඉස්සරහ උන්වහස්සේ විසින් විවිධ පැමිණිලි කෙරුවා කියලා මේ අකටයුතු සම්බන්ධයෙන් එතකොට ඒ සම්බන්ධයෙන් පොලිසිය ක්‍රියාත්මක වුනා කියලාද ඔබ තුමා කියන්නේ?

පි: සමහර දේවල්වලට ක්‍රියාත්මක වුනා ස්වාමිනි. ඒ කියන්නේ අත්අඩංගුවට ගැනීමට සිදුවුනා .

ප්‍ර: දැන් ඔය බුද්ධි සේවාවන්වල තොරතුරුකරුවන් පවත්වාගෙන යනවානේ?

පි: එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: දැන් ඒ තොරතුරුකරුවන් පවත්වාගෙන යාම ඉහළ නිලධාරීන්ටත් තියා ගන්න පුළුවන් බිම් මට්ටමේ නිලධාරින්ටත් තියා ගන්න පුළුවන්නේ?

පි: පුළුවන් ස්වාමිනි.

ප්‍ර: එවැනි තොරතුරකරුවන් පවත්වාගෙන යනවා නම් ඒ තොරතුරුකරුවන් පවත්වාගෙන යන නිලධාරීන් එම ආයතනයේ ඉහළ නිලධාරියෙකුට ඒ පිළිබඳව තොරතුරු ලබාදීලා වාර්තා ගත කරලා තියෙන්න ඕනේ නේද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එවැනි වාර්තා ගතකිරීමක් නොකර තොරතුරු කාරයෙක් පවත්වාගෙනයාම පුළුවන්ද?

පි; ඒක කොයි විදියට මොන තොරතුරුකරුවෙක්ද කියන ප්‍රශ්නය මත තමයි ඒක බලපාන්නේ casual source එකක් නම්.

ප්‍ර: හරි ඔය උත්තරයම අපිට තවත් සාක්ෂිකාරයෙක් දුන්නානේ මං උදාහරණයක් දෙන්නනම් ?

පි: හොදමයි.

ප්‍ර: අපි හිතමු එක්තරා පුද්ගලයකුව මේ ආරක්ෂක අංශවලින් හොයනවා ?

පි: එහෙමයි ස්වාමිනි

ප්‍ර; එම පුද්ගලයා සමඟ සම්බන්ධතාවයක් තිබිය හැකි පුද්ගලයෙක් මේ බුද්ධි අංශ වල යම් නිලධාරියෙක් සමඟ සම්බන්ධ වීමක් වෙනවා?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒක දවසකට දෙකකට නෙමේ යම්කිසි කාලසීමාවක් තුළ තිබෙන සම්බන්ධතාවක්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; එවැනි අවස්ථාවක ඒ තොරතුරුකරුව මං ඉස්සෙල්ලා කියපු පරිදි ඉහළ අංශවලට දැනුවත් කිරීමක් කරලා තියෙන්න ඕනිද?

පි: ලැබෙන තොරතුර අනුව අනිවාර්යෙන්ම දැනුවත් කිරීමක් වෙන්න ඕනේ තොරතුරු සත්‍ය අසත්‍යතාවය අනුව ස්වාමිනි.

දැන්වේලාව: ප.ව. 2.45
මෙතැන් සිට: මුතුමාලි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව.02.45 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර : එවැනි අවස්ථාවක ඒ තොරතුරුකරුව අර මං ඉස්සෙල්ලා කියපු පරිදි ඉහළ අංශවලට දැනුවත් කිරීමක් සිදු කරලා තියෙන්න ඕනේද?

පි : ලැබෙන තොරතුරු අනුව අනිවාර්යෙන්ම දැනුවත් කිරීමක් වෙන්න ඕනේ තොරතුරේ සත්‍ය අසත්‍යතාවය අනුව ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ තොරතුර ගැන නෙවේ මම අහන්නේ. අර මං දැන් අහන්නේ තොරතුරුකරුවව

පි : ලේඛන ගත කිරීම

ප්‍ර : ලේඛන ගත කිරීම?

පි : සාමාන්‍යයෙන් ඒක සිදු විය යුතු දෙයක්. Payment එකක් කරලා තියෙනවා නම් අනිවාර්යෙන්ම සිදු විය යුතුයි.

ප්‍ර : payment එකක් කරනවා නම් සිදුවිය යුතුයි?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : payment එකක් කරන්නේ නැත්නම් සිදු වෙන්න ඕනේ නැද්ද?

පි : අවශ්‍ය නැත්නම් ඒ තරම් තොරතුරුකරුගේ ස්වභාවය අනුව තමයි ස්වාමිනි මං කියන්නේ අර මං කිව්වේ credibility of the informant and reliable of the information ඒ දෙක අනුව තමයි A1, A2, B1, B2, C1, C2, D, E වෙන කොට ඒවා ගණන් ගන්නේ නෑ.

ප්‍ර : දැන් මේ කොමිෂන් සභාවට ලබා දුන්නු සාක්ෂිවලට අනුව එක්තරා නමක් කියවෙනවා අබ්දුල් රාසික් කියන තැනැත්තා සම්බන්ධව. අබ්දුල් රාසික් කියන තැනැත්තා සම්බන්ධයෙන් යම් දැනුම් දීමක් ඔබ බුද්ධි අංශ ප්‍රධානියා හැටියට ඉන්න කොට ලැබෙනවද?

පි : ඔව් ලැබෙනවා එයා මේ එක එක මුස්ලිම් සමහර පහරදීම් මරදානේ. ඒක මම හිතන්නේ අර පන්සල ළඟ පන්සලක් තිබිලා යම් කිසි Incident එකක් වුණා. ඒ පහරදීම් වලට සම්බන්ධව එයා ගොඩක් රැඩිකල් පැත්තට තමයි රාසික් හිටියේ. සාමාන්‍යයෙන් රැඩිකල් පැත්තට හිටිය එක්කෙනෙක්.

ප්‍ර : එතකොට ඒ අවස්ථාවේදී බුද්ධි අංශවල අවධානය රාසික් සම්බන්ධයෙන් යොමු වීමක් තිබ්බද?

පි : යොමු වෙලා තිබ්බා ස්වාමිනි.

Proof Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ ඔබ කියන්නේ 2015 ට ප්‍රථම?

පි : ඔව්. ප්‍රථම එතකොට එයා රැඩිකල් පැත්තටම තමයි එයා හිටියේ.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ග මොකක්ද?

පි : අපි ගෙනල්ලා කතා කරලා තියෙනවා. සාකච්ඡා කරලා තියෙනවා මොනවද කරන්නේ කියලා පස්සේ එයාට warning දීලා තියෙනවා එයාගේ අය තමයි මං කිව්ව පෙර පරිදි ඉස්සෙල්ලා සඳහන් කළේ ස්වාමිනි මේ preachers ලා ගෙන්නුවා කියලා දේශනවලට. ඒ ගෙන්වීමේ එක් කෙනෙක් තමයි එයාත් සම්බන්ධ වුණා සමහර preachers ලා ගෙන්වන්න. අපි ඒ ගොල්ලො ඔක්කොම තහනම් කළා ස්වාමිනි.

ප්‍ර : ඔබ 2015 ට පෙර සහරාන්ගේ නම බුද්ධි අංශවලට අනාවරණය වීමක් සිදු වෙනවද?

පි : නෑ ස්වාමිනි මට මතකත් නෑ මම නම් ඉන්න කාලේ එහෙම සම්බන්ධ වීමක් තිබ්බේ නෑ. සඳහන් වීමක් තිබ්බේ නෑ.

ප්‍ර : ඔබගේ මතකයට අනුව ආමී මොහෙදීන් යන තැනැත්තෙක් බුද්ධි අංශවල තොරතුරුකරුවෙක් හැටියට ක්‍රියාත්මක වුණාද ඒ කාලේ?

පි : ස්වාමිනි ඒක මම හිතන්නේ හමුදා බුද්ධි අධ්‍යෂකගෙන් තමයි අහන්න ඕනේ. මම CNI විදිහට අහන්න යන්නේ නෑ එක එක ආයතනවලින්

ප්‍ර : ඒ තොරතුරු ඔබට ලැබෙන්නේ නෑ?

පි : තොරතුරු ඒක මට අවශ්‍යතාවයක් නෑ ස්වාමිනි.

ප්‍ර : ඒක ඔබට ලැබෙන්නේ නෑ?

පි : ලැබෙන්නේ නෑ.

ප්‍ර : ඒක ලැබෙනවා නම් ලැබෙන්න ඕනේ DMIඒකට?

පි : ඒක ආයතනයේ ප්‍රධානියාට.

**********

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : හෙන්දවිතාරණ මහත්මයා දැන් ඔබ දීර්ඝ කාලීන අත්දැකීම් සහිත බුද්ධි අංශය පිළිබඳ හසල දැනුමක් තියෙන ජ්‍යෂ්ඨ නිලධාරීයෙක් වෙලා සේවය කරලා තිබුණා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබට කියන්න පුළුවන්ද 1984 ඔබ NIB Director general වෙලා හිටියා ?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : නැද්ද?

පි : නෑ. NIB සම්බන්ධ වුණා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සම්බන්ධ වුණා. Sorry එතකොට ඔබ සම්බන්ධ වෙලා වැඩ කටයුතු කරන කාලේ ඔබට NIB එක සම්බන්ධයෙන් හොඳ දැනුමක් තිබුණනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කාලේ NIB එකේ පැවැති ඒ වැඩ කරගෙන ගිය ක්‍රමයත් ඉන් අනතුරුව 2007 න් පස්සේ CNI එකේ තොරතුරු කර ගෙන ගිය ආකාරයත් සන්සන්දනාත්මකව බලන කොට ඔබට කියන්න පුළුවන්ද ඒ දෙකේ වෙනසක් තිබුණද?

පි : මම NIB එකේ ඉන්න කොට මම එක්තරා අංශයක පමණයි රාජකාරී කළේ. ඒ කියන්නේ counter terrorism desk එකේ. ඉතින් අනිත් ඒවාට මම සම්බන්ධ වෙන්නේ නෑ. මම ඒවා හොයන්න යන්නෙත් නෑ. මට counter terrorism වලට අවශ්‍ය ඒ පරාසය ඇතුළත තමයි මගේ රාජකාරිය තිබුණේ ස්වාමිනි. CNI වුණාට පස්සේ මට NIB එක විතරක් නෙවෙයි අනිත් ආයතන සම්බන්ධීකරණය කරන්න හැකියාවක් ලැබුණා.

ප්‍ර : එතකොට ඒ අනුව බලන කොට CNI එකේ ගත කළ කාලය තුළ ඔබ වඩා හොඳ අත්දැකීම් ලැබුවා මේ බුද්ධි අංශයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන්?

පි : එහෙමයි ස්වාමිනි. සම්බන්ධීකරණයෙන් එහෙමයි. අනෙක් බුද්ධි හමුදා බුද්ධි අධ්‍යක්ෂකගෙන් මම ගොඩක් අත්දැකීම් ලැබුවා අවුරුදු 6 ක්.

ප්‍ර : දැන් ඔබ කියන විදිහට CNI ආයතනයත් SIS ආයතනයත් අතර superior කවුද වඩා ඉහළින් ඉන්නේ කවුද?

පි : CNI.

ප්‍ර : CNI. එතකොට වැඩි අවධානයක් යොමු විය යුත්තේ CNI ප්‍රධානියා පත් කිරීමේදී නේද ඔබට දැනෙන විදිහට. CNI ප්‍රධානියාව පත් කිරීමේදී වැඩි අවධානයක් යොමු කරලා වැඩි පළපුරුද්දක් තියෙන බුද්ධි අංශ පිළිබඳ වැඩි අවබෝධයක් තියෙන කෙනෙක් CNI ප්‍රධානියා හැටියට පත් කිරීම නේද සුදුසු වෙන්නේ?

පි : එහෙමයි ස්වාමිනි ඒක ආරක්ෂක ලේකම්තුමා management department එකට ඒක පැහැදිලිවම ලියලා තියෙනවා ඒක. ඒකේ මෙච්චර service එකක් තියෙන්න ඕනේ. මං හිතන්නේ මං නිවැරදි නම් ඒකේ කිව්වා ලියලා තිබ්බා major general rank එකේ එක් කෙනෙක් ඉන්න ඕනේ කියන එක. මට එහෙම ලියුමක් මා ගාව නෑ. නමුත් management services වලින් බලන්න පුළුවන් නම් ඒ ලියුම ගෙන්ව ගෙන එහෙම නැත්නම්

FAIR COMMENT BY JEZEEM

ආරක්ෂක අමාත්‍යාංශයෙන් ගියපු ලියුමේ ඒක තියෙනවා නම් ඒ ගැන බලන්න පුළුවන්.

ප්‍ර : හරි එතකොට මහත්මයා ඔබට මතකද 1999 ඉඳලා 2005 දක්වා කාලය තුළ ඔබ මේ Director

පි : DMI

ප්‍ර : ඔව් DMI හැටියට සේවය කළානේ. දැන් ඒ කාලයේදී ඔබ මේ LTTE ත්‍රස්තවාදීන් සම්බන්ධයෙන් විශේෂයෙන් බුද්ධි තොරතුරු රැස් කරලා ඒවා ක්‍රියාත්මක කිරීම සිදු කළා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඒ කාලේ මේ හමුදාව බුද්ධිමය වශයෙන් බලවත් වෙලා හිටියනේ?

පි : එහෙමයි ස්වාමිනි. හමුදාව බලවත් වෙලා හිටියේ නෑ ඒ කාලේ. හමුදාව සම්පූර්ණයෙන් හමුදාවට කිසිම රාජකාරියක් කරන්න දුන්නේ නෑ ඒ කාලේ. මොකද unilateral ceasefire එකක් දාලා ඒ ඔක්කොම අඩපණ කළා. නමුත් බුද්ධි අංශය අඩපණ වුණේ නෑ.

ප්‍ර : ආ.... ඒකයි බුද්ධි අංශය හොඳට ක්‍රියාත්මකව තිබුණානේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට බුද්ධි අංශය ක්‍රියාත්මකව පැවතුණා වුනත් ඒ කාලේ ඒ බුද්ධි අංශය දෙන තොරතුරු අනුව ඉදිරි පියවර ගැනීම නිසි ලෙස සිද්ධ වුණේ නෑ කියලා කිව්වොත් හරිද? බුද්ධි අංශ විසින් ලබා දෙන තොරතුරු අනුව ක්‍රියාකාරී ආකාරයට එය ක්‍රියාවේ යෙදෙව්වේ නෑ කිව්වොත් ?

පි : නෑ එහෙම දැන් Government policy එකක් තිබුණනේ ස්වාමිනි ceasefire කියලා

ප්‍ර : ඔව් ceasefire කියලා

පි : ceasefire. කියලා එතකොට එතනින් එහාට අපිට යන්න බෑ. එතකොට නමුත් බුද්ධි තොරතුරු රැස් කරන කොට අපි ඒ අනුව ඒකට අනුව තමයි අපි රාජකාරී කළ යුත්තේ. නමුත් අපිට කරන්න ගොඩක් කරන්න හමුදා බුද්ධි අංශයට කරන්න ගොඩක් දේවල් තිබ්බා ඒ අතරතුර. එකක් තමයි මම ඉස්සෙල්ලා කිව්වා වගේ ස්වාමිනි අපි යුද්ධෙට ලැස්ති වෙන්න ඕනේ. යුද්ධෙට ලැස්ති වෙනවා නම් අපිට මොනවද අවශ්‍ය වෙන්නේ. අපිට අපේ දේවල් අලුතෙන් රැස් කර ගන්න ඕනේ. බුද්ධි තොරතුරු රැස් කර ගන්න ඕනේ. සතුරා ගැන හොඳ දැනීමක් තියෙන්න ඕනේ. සතුරාගේ ස්ථාන අපි දැන ගන්න ඕනේ. එතකොට ඒ වගේ ගොඩාක් පරාසයක වැඩ කරන්න ඕනේ. ඒ විතරක් නෙවෙයි අපි tactical to strategic intelligence අපි ගිහිල්ලා තිබුණා ඒ කාලේ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

වෙනකොට. අපි යුද්ධෙ එනකොට යුද්ධෙට ලෑස්ති වෙලා හිටියේ ස්වාමිනි බුද්ධි අංශ. ඔක්කොම ලැස්ති වෙලා තිබ්බේ.

ප : එතකොට 2005 ට පෙර මේ බුද්ධි අංශ අතර තොරතුරු හුවමාරු කර ගත්තේ නෑ කියන එක ඔබ පිළිගන්නවද?

පි : එතකොට මං කිව්වේ ඒ දවස්වල watertight compartment වල තමයි වැඩ කළේ. share කිරීමක් තිබ්බේ නෑ ඒ දවස්වල. අවශ්‍ය නම් අපි දැනුම් දෙනවා. එහෙම නැත්නම් එහෙම 2006 ඉඳන් තිබිච්ච ක්‍රියා පටිපාටියක් වුණේ නෑ ඒ දවස්වල.

ප : දැන් ඔබ ඒ කාලේ මේ බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් ඔබට තිබිච්චි ඒ සුවිශේෂී දැනුම පාවිච්චි කරලා එකල සිටි අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්මයාව දැනුවත් කළා කියලා මතකද ඔබට එහෙම ඔබ කළා කියලා?

පි : මතකයි ස්වාමිනි.

ප : එතකොට ඔබ සඳහන් කරලා තියෙනවා ඔහු ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළේ නෑ කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඉතින් ඔබ බුද්ධි අංශයේ ලොක්කෙක් හැටියට ඔබට පුළුවන්කමක් තිබුණේ නැද්ද ඒ අවස්ථාවේදී හිටපු ඒ රනිල් වික්‍රමසිංහ මහත්මයාව ඒ සම්බන්ධයෙන් පෙළඹවීමක් කරන්න මේ වගේ වටිනාකම කියලා දීලා?

පි : ස්වාමිනි you can take the horse to water, you can't make horse to drink water

ප : Thank you. මහත්මයා ඔබ එක් අවස්ථාවකදී සඳහන් කළා need to know basis කියන එක පිළිබඳව. ඒක බුද්ධි අංශයේ ක්‍රියාත්මක වන්නා වූ යම් කිසි වාක්‍ය කණ්ඩයක්නේ? මම අහන්නේ මේ need to know basis කියන එක තීරණය කරන්නේ කවුද?

පි : ඒක තොරතුරු ලබා ගන්න එක්කෙනා තමයි එක decide කරන්න ඕනේ ස්වාමිනි.

ප : එතකොට ඒ තොරතුර යම් කිසි කෙනෙක්ට දිය යුතුය කියලා එයා හිතුවොත් හොඳයි කියලා ඒ තීරණය වැරදි නම් ඒකෙන් මුළු සියළු දෙනාම ඒ වගකීමට බැඳෙන්න ඕනේ නේද?

පි : පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද ස්වාමිනි.

ප : උදාහරණයක් ගත්තොත් තීරණය ගන්නේ ඔබ නම් ඔබ හිතනවා මේ තොරතුර ඔබට පල්ලෙහයින් ඉන්න නිලධාරීන්ට දීමට අවශ්‍ය නෑ කියලා?

පි : එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට ඉහළින් ඉන්න නිලධාරීන්ට පමණක් දීම සුදුසුයි කියලා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට ඔබ විසින් තනිව තීරණ කරලා එවැනි වැඩක් කළොත් ඔබ එලෙස ක්‍රියා කළොත් ඒ වගකීම ඔබ දැරිය යුතුයි නේද?

පි : අනිවාර්යෙන්ම.

ප්‍ර : අප්‍රේල් 21 ක සිදු වෙච්ච බෝම්බ ප්‍රහාරය පිළිබඳව කරුණු අධ්‍යනය කරන කොට ඒකට පසුබිම් වෙච්චි හේතු ඔබ බොහොම ඉතාම පරීක්ෂාකාරීව හොඳට ළං වෙලා බලන කොට ඔබට හිතෙන් නැද්ද ඒ පිළිබඳ තොරතුරු ලබා ගත්ත නිලධාරීන් ඉහළම නිලධාරීන් අදාළ තොරතුරු නිසි ආකාරයට නිසි වේලාවට නිසි පුද්ගලයන්ට ලබා දීමක් සිදු කළේ නෑ කියලා?

පි : මං හිතන්නේ තොරතුරු ලබා දීමේ කියන්නේ ස්වාමිනි කවුරුවත් post master කෙනෙක් විදිහට ඉන්න බෑ. ඒ කියන්නේ ලියුම් මෙහෙම ආවා. මේ පැත්තෙන් ලියුම අරින එක නෙවේ වැඩේ තියෙන්නේ. ඒකට action plan එකක් ගන්නේ මොකක්ද? මොකක්ද ඒකෙන් ගත යුතු ක්‍රියාමාර්ගය මොනවද කියන එකත් ඒකත් follow up කරන්න ඕනේ තොරතුරු දෙන එක්කෙනා ස්වාමිනි.

ප්‍ර : ඒකත් බුද්ධි අංශයේ අයගේ රාජකාරියක්ද?

පි : අනිවාර්යෙන්ම රාජකාරියක්.

ප්‍ර : ඒ ක්‍රියාදාමය සිදු වුණේ නෑ කියන එක ඔබට වැටහෙනවද?

පි : ඔව් මට වැටහෙනවා.

ප්‍ර : එතකොට එහෙම නම් ඒ වගකීම දැරිය යුතුයි නේද බුද්ධි අංශ ප්‍රධානීන්?

පි : ඔව් මට මෙතන ප්‍රශ්නයක් තියෙනවා ස්වාමිනි. දැන් CNI, IG ට ලියුම අරිනවා. මෙහෙම ප්‍රහාරයන් වෙනවා කියලා. IG මොකක්ද කළේ කියන එක මම දන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබගේ දැනීම සහ ඔබගේ අත්දැකීම් අනුව ඒ ලියුම යොමු කිරීමම ප්‍රමාණවත් නෑ කියන එක ඔබ පිළිගන්නවද?

පි : ප්‍රමාණවත් නෑ ස්වාමිනි. පෙබරවාරි මාසේ 09 වෙනිදා ඒ ලියුම යන්නේ. මම නිවැරදි නම්.

ප්‍ර : අප්‍රේල් 09?

පි : sorry අප්‍රේල් මාසේ.

ප්‍ර : එතකොට ඒ ආකාරයට කළ යුතු පියවරත් අධ්‍යනය කරලා සාකච්ඡා කරලා ඒ පිළිබඳව දැනුම් දුන්නා නම් නේද නිවැරදි ක්‍රමය?

පි : එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙම කළේ නෑ කියන්නේ?

පි : තොරතුරු දෙන එක්කෙනාත් ඒක කරන්න තිබ්බා. තොරතුරු ආපහු උඩට අරින එක්කෙනත් ඒක කරන්න තිබ්බා ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ ඒක හරි හැටි කළේ නෑ කියන්නේ ඔවුන් තමන්ගේ රාජකාරිය නිසි පරිදි ඉටු කරලා නෑ කියන එක නේද?

පි : එහෙමයි ස්වාමිනි.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>**

ප්‍ර : සාක්ෂිකරු ඔබ හමුදා බුද්ධි අංශ ප්‍රධානියෙක් වශයෙන් යම් කාලයක් කටයුතු කළා නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද හමුදා බුද්ධි අංශ විසින් මෙම පාස්කු ප්‍රහාරයට පෙර ස්වයං ඝාතනය සිදු කරනු ලැබූ පුද්ගලයින් පස් දෙනෙකු පිළිබඳව තොරතුරු වර්ෂ කීපයක සිට දැන සිටියදීත් ඔවුන්ගේ නිවෙස් පවා දැන සිටියදීත් ඔවුන්ගේ පසුබිම පසු ක්‍රියාකාරකම් එනම් මෙම ප්‍රහාරයට සුදානම් වීම පිළිබඳව සැලසුම් පිළිබඳ සොයා ගන්න බැරි වීම සම්බන්ධව ඔබට යමක් කිව හැකිද?

පි : ස්වාමිනි මා හමුදා බුද්ධි අංශයෙන් අයින් වුණේ දෙදාස්

ප්‍ර : නෑ නෑ ඔබගේ කාලයේ නෙවේ. ඒ මේ කතා කරන්නේ ඔබගේ කාලයේ නෙවෙයි. ඊට පසු ඔබගෙන් පසු?

පි : 2015 න් පස්සේ

ප්‍ර : 2015 න් පසුව?

පි : ස්වාමිනි නැවත සමාවෙන්න ඉදිරිපත් කරන්න.

ප්‍ර : 2015 පසුව 2016, 2017 ?

පි : එහෙමයි.

ප්‍ර : ස්වයං ඝාතකයන් පස් දෙනෙකුගේ තොරතුරු නම් සහ ඔහුගේ නිවෙස් පවා හමුදා බුද්ධි අංශය ආවේෂණය කරලා තියෙද්දී ඔවුන් එය එම තොරතුරු වෙනත් බුද්ධි අංශ සමඟ හුවමාරු කර ගෙන මෙම ප්‍රහාරය පිළිබඳ සැලසුම් කිරීම දක්වා ආවේෂණය කිරීමට බැරි වීමට හේතු කියත හැකිද?

පි : ආවේෂණය කරලා නැති එකක ස්වාමිනි

ප්‍ර : ඔව්.

පි : ඒකත් වරදක්. අනිවාර්යෙන්ම එක්කෝ හමුදා බුද්ධි අංශය මඟින් ඒ ක්‍රියාමාර්ගය ගන්න ඕනේ. ඒ ගොල්ලො arrest කරන්න බෑ හමුදාවට. මොකද ඒ දවස්වල emergency තිබ්බේ නෑ. ඉතින් අනිවාර්යෙන් පොලිසියත් සමඟ සම්බන්ධ වෙලා එහෙම නැත්නම්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

TID එක විශේෂයෙන්ම TID එකත් එක්ක සම්බන්ධ වෙලා අවශ්‍ය ඒ ගොල්ලෝ arrest කරලා ඉදිරි කටයුතු කර ගෙන යන්න තිබ්බා ස්වාමිනි.

ප්‍ර : ඔවුන් ප්‍රහාරයකට ඉතා යම් කිසි දරුණු ක්‍රියාවක් කිරීමට ළං වෙන අවස්ථාව දක්වා ඔවුන් අත්අඩංගුවට ගැනීම පසු කිරීමක් නිවැරදිද? ඒ කියන්නේ ඔවුන් යම් කිසි බරපතල අනතුරක් සිදු කිරීම දක්වා ඔහු ආවේෂණය කර ඒ අනතුර කිට්ටුවම ඉන්න ඔහු අත්අඩංගුවට ගැනීම කිරීම සාධාරණද?

පි : මම හිතන්නේ ඒක එච්චර පරක්කු වෙන්න ඕනේ නෑ ස්වාමිනි. තොරතුරු ලැබුණු දිනයේ පටන් දින කිහිපයක් ඇතුළත ඒක සිද්ධ විය යුතු කාරණාවක්.

ප්‍ර : ඒ කියන්නේ?

පි : මොකද තොරතුරේ විශ්වාසනීයවන්තභාවය සහ ක්‍රියාකරන්න යන ක්‍රියාවේ බරපතලකම අනුව. අන්තිම ක්‍රියාදාමය වෙනකල් ඉඳලා ඒක කරන එක තේරුමක් නෑ ස්වාමිනි. මම හිතන්නේ ඒ දවස්වලම තිබ්බා නම් වැඩේ ඉවර කරන්න we have to nip it at the bud

ප්‍ර : ඒ කියන්නේ ඔබගේ මතය වන්නේ මුල් අවස්ථාවේදීම ඔවුන්ව නතර කිරීම සඳහා ක්‍රියා කළ යුතු බවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ කිව්වා ජාතික බුද්ධි අංශ ප්‍රධානියා වශයෙන් දැනුමක් නොමැති පුද්ගලයෙකු පත් කිරීම දැනුමක් තියෙන පුද්ගලයෙක් පත් කළ යුතුයි කියලා? එම ජාතික බුද්ධි ප්‍රධානියා වශයෙන් යම් කිසි දැනුමක් නැති පුද්ගලයෙක් පත් කළා නම් එයට වගකිව යුත්තේ කවුද?

පි : පත් කළ පුද්ගලයා ස්වාමිනි.

ප්‍ර : කවුද?

පි : මම දන්නේ නෑ කවුද පත් කළේ කියලා ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ සාමාන්‍යයෙන් ජාතික බුද්ධි ප්‍රධානියා පත් කරන්නේ කවුද?

පි : මම දන්නේ නෑ ජනාධිපතිතුමාද ආරක්ෂක ලේකම්තුමාද කියන එක මම දන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : කවුරු හෝ පත් කරපු පුද්ගලයා වගකිව යුතුයි?

පි : වගකිව යුතුයි. මං හිතන්නේ දැන් හිටපු සාධාරණීයකරකණයක් කරනවා නම් හිටපු ජාතික බුද්ධි ප්‍රධානීට එයාට Investigation ගැන හොඳ දැනීමක් තිබ්බා. Investigation CID officer කෙනෙක් එයා. එයා හොඳ දැනීමක් තිබ්බා. නමුත් බුද්ධි රාජකාරී ගැනත්

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එයාට සාමාන්‍ය දැනීමක් තිබ්බා මම දන්නේ නෑ එයාගේ ක්‍රියාකාරකම් කොහොම සිද්ධ වුණාද කියන එක office එකෙන් කොහොම function වුණාද කියන එක දන්නේ නෑ ස්වාමිනි.

ප : රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානීයාට මෙම ප්‍රහාරය පිළිබඳ තොරතුර අප්‍රේල් 04 වෙනිදා ලැබිලා එය සම්බන්ධයෙන් අප්‍රේල් 09 වෙනිදා දක්වා එම තොරතුර තමා ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් ඔබට කිව හැක්කේ කුමක්ද?

පි : එතන කාරණා දෙකක් තියෙනවා ස්වාමිනි. මම පළමුවෙන් ඉදිරිපත් කළා වගේ අප්‍රේල් 07 වෙනිදා තමයි ඒ ලියුම එන්නේ SIS එකෙන් මම නිවැරදි නම් අප්‍රේල් 07 වෙනිදා ලියුම එන්නේ SIS එකෙන් CNI අයට. CNI එකෙන් ලියුම යන්නේ IG ට අප්‍රේල් 09 වෙනිදා. එතකොට CNI ට SIS එකට තොරතුරු ලැබුණේ කවදද කියන එක මම දන්නේ නෑ. එහෙම නම් එච්චර කලක් එයා ඒ ලියුමත් එක්ක ලියුම තියාගෙන හිටියේ ඇයිද කියන එක මම දන්නේ නෑ එහෙම නම්. එතකොට එතනත් පරාසයක් තියෙනවා. මෙතනත් දවස් දෙකක වෙනසක් තියෙනවා. ඊට පස්සේ IG ට ඇරියට පස්සේ මම දන්නේ නෑ එතනින් එහාට මොනවා වුණාද කියලා.

ප : එවැනි තොරතුරක් ලැබුණ වහාම පැය 24 ක් ඇතුළත ක්‍රියාත්මක විය යුතුද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : අනිවාර්යෙන්ම ක්‍රියාත්මක විය යුතුයි?

පි : එහෙමයි ස්වාමිනි.

**********

<u>**ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා**</u>

ප : හෙන්දවිතාරණ මහත්මයා දැන් ලංකාවේ හමුදා පිළිබඳව මේ ඩයස් පෝරාවයි තව එක් එක් ආයත විසින් විදේශවල ලොකු අසත්‍ය ප්‍රචාරයන් පතුරලා අරිනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : එතකොට බුද්ධි අංශ මගින් ඒ විදිහට ඒවට මොකක්වත් ගන්න පියවරක් නැද්ද ඒවා නැවැත්වීමට?

පි : ස්වාමිනි යුද්ධය අවසන් වුණාට පස්සේ අපිට තිබුණා මේ ලොකු පරාසයක වැඩ කරන්න. එකක් තමයි මේ ගොල්ලො අරන් ගියේ ප්‍රචාරක කටයුතු. LTTE යේ ඩයස් පෝරාව මගින් අරන් ගිය ප්‍රචාරක කටයුතු අසත්‍ය ප්‍රචාර එතකොට ඒ ගොල්ලොන්ගේ අනිත් සම්බන්ධීකරණ දේවල් සියළුදේම අපි ඒවා අපිට ඒවා

FAIR COMMENT BY JEZEEM

සම්බන්ධයෙන් involve වෙන්න වුණා CNI විදිහට ඒ අදාළ ආයතන සමඟ කටයුතු කිරීමේ විදේශ අමාත්‍යාංශය එතකොට හමුදා බුද්ධි අංශය විශේෂයෙන් එතකොට CNI office එක ඒ ඔක්කොම එකතු වෙලා සෑහෙන වැඩ ප්‍රමාණයක් කළා මේ ප්‍රමාණයට. ඒ විතරක් නෙවෙයි ස්වාමිනි Human right council allegations වලට ඔක්කොම උත්තර සැපයුවෙත් අපි. මේ office එකෙන් අනිත් අයත් එක්ක සම්බන්ධීකරණය. එතකොට listing once forget the number ඒකත් අපි කළේ. මම Al-Qaeda and Taliban එකේ competent authority ආරක්ෂක ලේකම්තුමා Local organizations වලට competent authority හිටියේ by virtue of appointment

ප : දැන් මෙහේ බොහෝ වේලාවට LTTE ත්‍රස්තවාදීන් විසින් මරලා දාපු පුද්ගලයින් පිළිබඳව ඒක හමුදාව පිට දාලා හිටන් මේ ඡායාරූපත් ගහලා ප්‍රචාරය කළා. එතකොට ඒ වගේ දේවල් වලට ප්‍රති කරුණක් ඉදිරිපත් කරන්න තිබුණේ නැද්ද බැරි වුණේ ?

පි : ස්වාමිනි නැවත කියන්න.

ප : දැන් මෙහේ LTTE විසින් මරපු පුද්ගලයෝ සම්බන්ධයෙන්

පි : LTTE විසින් හමුදාවේ මරපු

ප : හමුදාවේ හරි අනිත් පුද්ගලයෝ හරි මරලා මේ අහිංසක මිනිස්සු මැරුවා හමුදාව විසින් මැරුවා කියලා හිටන් photo ගහලා ඒවා ප්‍රචාරය කරනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒක නවත්තන්න ක්‍රමයක් තිබුණේ නැද්ද?

පි : අපි අනිවාර්යෙන් අපි ගොඩක් පියවරවල් ගත්තා. අපි සෑහෙන දුරට ගියා. ඒ විතරක් නෙවෙයි අපි මේ වෙනුවෙන් වෙනම පොතක් හරි ගැස්සුවා ස්වාමිනි. ඒ කියන්නේ අපි කොහොමද මේ මානුෂික මෙහෙයුම කරේ කොහොමද ඇයි කරේ කියන එකට factual analysis, humanitarian operations factual analysis කියලා පොතක් ගැහුවා. අපි ministry එකෙන්. ආරක්ෂක ලේකම්තුමාගේ අධීක්ෂණය යටතේ මම තමයි කෙළින්ම සම්බන්ධ වුණේ. අපි ඒ වෙනම report එකක් හදලා අපි හැමතැනටම embassies වලට රටවල් වලට සිවිල් පුළුවන් හැම තැනටම ඇරියා. නමුත් ඒකේ පැහැදිලි කරන්නේ අපි උත්තර දුන්නේ accountability එකට. අපිට එක allegation එකනේ ස්වාමිනි මේ accountability එක. අපි මෙච්චර හමුදාව විසින් මෙච්චර මිනිස්සු මරලා තියෙනවා සිවිල් මිනිස්සු මරලා තියෙනවා

FAIR COMMENT BY JEZEEM

කියලා අපි ඒක පැහැදිලිවම කරලා දුන්නා කොහොමද කොහොමද තර්කානුකූලව with figures we have analyse that.

**********

**<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>**

ප්‍ර : මිස්ටර් හෙන්දවිතාරණ මට ප්‍රශ්න කිහිපයක් තියෙනවා.

පි : එහෙමයි.

ප්‍ර : මම පළවෙනි ප්‍රශ්නේ හැටියට මගේ මේ ආසන්නයේම දකුණු අත පසින් සිටින කොමසාරිස්තුමා අහපු ප්‍රශ්නෙක දිගුවක් ලෙස පොඩි කරුණක් ඉදිරිපත් කරන්නට කැමතියි. 2015 වසරේ සිටම යුධ හමුදා බුද්ධි Directorate of military intelligence එක ඒක ආවේක්ෂණය කරලා තිබෙනවා 2019 අප්‍රේල් 21 ත්‍රස්ත ප්‍රහාරයට ස්වයං ඝාතක බෝම්බකරුවන් ලෙස සහභාගි වූ පස් දෙනෙක්. එතකොට ඔබ එහි අධ්‍යක්ෂකවරයා ලෙස දීර්ඝ කාලයක් වැඩ කරලා තිබෙනවා. මෙය ඔබගේ යුගයේ සිදු වෙච්චි දෙයක් නෙවෙයි.

පි : එහෙමයි.

ප්‍ර : ඔබ කියන්න මෙම කොමිෂමට ඔබ Director හැටියට Directorate of military intelligence වල සිටින අවදියකදී ඔබගේ විවිධ ඒකක වල සිටින නිලධාරීන් විසින් IS ත්‍රස්තවාදයට සම්බන්ධ යැයි සඳහන් කරමින් ආවේක්ෂණය කරන ලද ඉස්ලාම් ආගමික අන්තවාදීන් පිළිබඳව අධ්‍යක්ෂක ලෙස ඔබට වාර්තා කළ යුතුයිද?

පි : වාර්තා කරන්නේ කවුද ස්වාමිනි.

ප්‍ර : දැන් අර ඒකක තියෙනවනේ ඔබලාගේ අර තියෙන්නේ බුද්ධි තොරතුරු unit 3 , one eight

පි : පැහැදිලි ස්වාමිනි.

ප්‍ර : අපි හිතමුකෝ unit එකකින් තමයි මෙයාලව ආවේක්ෂණය කරන්නේ. එතකොට නමුත් 2015 ආරම්භයේ ඉඳලම ඒ ආවේෂණය කරන unit එක දන්නවා මේ පිරිස IS ත්‍රස්තවාදය හා සබඳතා පවත්වන කණ්ඩායමක් කියලා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට එහෙම වෙන අවස්ථාවකදී අධ්‍යක්ෂකවරයා ලෙස ඔබට එම තොරතුර වාර්තා විය යුතුද?

පි : අනිවාර්යෙන්ම.

ප්‍ර : අනිවාර්යෙන්ව වාර්තා විය යුතුයි.

පි : විය යුතුයි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට එම තොරතුරු වාර්තා වෙච්චි අවස්ථාවකදී ඔබ ඔබගේ ප්‍රධානියා වෙන්නේ යුධ හමුදාපතිනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ යුධ හමුදාපතිට එම තොරතුරු දැන්විය යුතුද?

පි : අනිවාර්යෙන්ම දැන්විය යුතුයි.

ප්‍ර : එයිට අමතරව ඔබ ඔබ සහභාගි වෙනවනේ සම්බන්ධීකරණ රැස්වීම්වලට අමාත්‍යාංශයේ තියෙන?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහිදිත් ඔබ අවස්ථාවක් කර ගන්නවද මේ IS සබඳතාවය තියෙන කණ්ඩායමක් ආරම්භ වෙලා තියෙනවා කියන එක ආරක්ෂක ලේකම්ට දැනුම් දෙන්නට?

පි : එහෙමයි ස්වාමිනි. ඒක දැනුවත් කරන්න ඕනේ.

ප්‍ර : ඔබ යන්නේ නෑ ජාතික අර national security council එකට යන්නේ නෑ නේද Director Military Intelligence හැටියට?

පි : පහු කාලයේදී ගියා දැන් නෑ මං හිතන්නේ.

ප්‍ර : නෑ නෑ ඔබ ඉන්න කාලේදී මං මේ උපකල්පනය කරන්න කියන්නේ ඔබ ඉන්න කොට නම් මේ දේ වුණේ?

පි : සමහර ඒවට මම summon කළා. සමහර දේවල්වලට මං summon කළේ නෑ. අවශ්‍යතාවය මත summon කරනවා.

ප්‍ර : ඔබ එහෙම ගිය අවස්ථාවකදී දැන් ඔබ ඔබ කතා කරන්න අවශ්‍ය නෑනේ ආරක්ෂක ලේකම් ඉන්නවා නම්?

පි : එහෙමයි.

ප්‍ර : නමුත් ලේකම්ගේ අතිනුත් මෙම තොරතුරු කියන්නට අමතක වෙනවා වගේ දැනෙනවා නම් ඔබ එම රැස්වීමේදී කියනවද මෙහෙම සංවිධානාත්මකව IS සම්බන්ධතා තියෙන කණ්ඩායමක් මගේ නිලධාරීන්ගේ ආවේක්ෂණයට යොමු වෙලා තියෙනවයි කියන එක?

පි : ස්වාමිනි ඉස්සෙල්ලාම හමුදාපති කියන්න ඕනේ ඒක මම හමුදා බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් ඉන්නවා නම් . හමුදාපති කිව්වේ නැත්නම් අනිවාර්යෙන්ම කියනවා.

ප්‍ර : මම ඒ පිළිබඳව වෙන අහන්නේ නෑ. මෙතුමා ඒ ප්‍රශ්නේ සම්පූර්ණයෙන්ම ඇහුවා. මට ඕනේ වුණේ ඔබ හිටියා නම් ඒ යුගයේදී ඔබ මොකක්ද කරන්නේ කියන එක සන්සන්දනාත්මකව සිතන්නට මෙම කාලයේදී ඇයි එහෙම වුණේ කියලා . මම කැමති ඔබගෙන් දැන ගන්නට ඔබ 2015 විශ්‍රාම ගිය අවදියෙදීම ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක හැටියටනේ කටයුතු කළේ advisor sorry 2005 න් පස්සේ

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි 2006.

ප්‍ර : 2006. ඒ එක්කම ඔබට කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවෙන් තනතුරක් ඇති කරලා ඔබව පත් කරන්නේ CNI තනතුරට. මම ඒ ලේඛනය බැලුවා මම හිතන්නේ අතිරේක ලේකම්ට සමාන තනතුරක් තමයි මේ CNI කියලා create කරලා තියෙන්නේ?

පි : එහෙමයි .

ප්‍ර : ඒකට හේතුවක් වුණාද ඔබ උපදේශකවරයෙකු ලෙස කටයුතු කිරීමේදී ඔබගේ රාජකාරී බලතල පාවිච්චි කිරීමට උපදේශකවරයෙකුට හැකියාවක් නොතිබීම සහ ඔබ අමාත්‍යාංශයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ අතිරේක ලේකම් තනතුරක රාජකාරී කිරීමේදී ඔබට ඔබගේ රාජකාරී බලතල ක්‍රියාත්මක කිරීමට හැකි වුණාද? ඒ නිසාද මේ තනතුර ඇති කළේ?

පි : කොහේවත් බලතල සඳහන් කරලා නෑ ස්වාමිනි. මොනවද තියෙන බලතලය කියන එක. මගේ රාජකාරීය මම හරියට කළා ස්වාමිනි. ඒක මම දැනන් හිටියා මොනවද වෙන්න ඕනේ ඒක මං දැනන් හිටියා. ඒ හරි දේ හරි තැන හරි වේලාවට මං කළා ස්වාමිනි. ඒක බලතලයක් භාර අරගෙන වැඩක් කළා නෙවේ ස්වාමිනි.

ප්‍ර : නමුත් මේ අමාත්‍ය මණ්ඩල සංදේශයේ තියෙනවා ටිකක් කියලා ඔබ කියන ආකාරයේ සම්බන්ධීකරණය ගැන. නමුත් මෙම තනතුරට මෙන්න මේ සුදුසුකම් තියෙන එක්කෙනෙක් පත් කළ යුතුයි කියලා එහෙම තිබුණාද ? මේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවපු ලියුම් වල?

පි : මම හිතන්නේ තිබ්බා. ඒ ලියුම මං හිතන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ඇති.

ප්‍ර : ඒ අනුව ඔය තනතුරට ඔබගෙන් පසුව හෝ බඳවා ගත යුත්තේ එම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කරන ලද බඳවා ගැනීමේ සුදුසුකම් වලට තියෙන පුද්ගලයෙක් නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව CNI එකට ඔබගෙන් පස්සේ පත් කරන්න ඇත්තෙත් සුදුසුකම් තියෙන පුද්ගලයෙන් වෙන්න ඇති scheme of recruitment එකට අනුව?

පි : වෙන්න ඇති ස්වාමිනි.

ප්‍ර : ඔබට කියන්නට පුළුවන්ද ඔබ සඳහන් කළා SIS එකේ ප්‍රධානියාගේ තනතුරු නාමය අධ්‍යක්ෂක කියලා. එතකොට CNI එකේ ප්‍රධානියා CNI. තනතුරු නාමයක් නෑ CNI කියලා තමයි කියන්නේ නමුත් ඔබ කියන ආකාරයට පෙනී යනවා ඔහු අතිරේක

FAIR COMMENT BY JEZEEM

ලේකම්වරයෙකුට සමාන තනතුරක් දරන්නේ කියලා අමාත්‍යාංශයක?

පි : CNI

ප්‍ර : ඔව් CNI?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මේ SIS එකේ Director තනතුර සමාන වෙන්නේ ආයතන ප්‍රධානියෙකුටද?

පි : ඒ SIS එකේ ආයතන ප්‍රධානියා Director.

ප්‍ර : Director?

පි : එහෙමයි ස්වාමිනි. ඒක මම හිතන්නේ ඉස්සර ඉඳන්ම ආපු

ප්‍ර : තනතුරු නාමයක්?

පි : තනතුරු නාමයක්.

ප්‍ර : ඒක වෙනස් කරන්න

පි : ISD ඉන්න කාලේ ඉඳන්ම ආපු නාමයක්. පොලිසිය භාරයේ තියෙන කොටත් ඒ විදිහට තිබ්බේ.

ප්‍ර : ඒක සමහර විට ජාත්‍යන්තර මට්ටමේ

පි : නෑ සාමාන්‍යයෙන් ඕනේම රටකත්

ප්‍ර : රටක් තියෙන්නේ

පි : රටක තියෙන්නෙත් Director

ප්‍ර : Director. ඒක නිසා වෙන්න ඇති කියලා හිතන්නට පුළුවන්.

පි : අනිකුත් රටවල් වලත් ඒ විදිහට තියෙන්නේ Director.

ප්‍ර : නමුත් මේ දැන් ඔබ කිව්වනේ මේ දෙදෙනාම report කරන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට කියලා රාජකාරීය පිළිබඳව වාර්තා කරන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ටනේ නේද SIS එකේ Director?

පි : දැන්ද ස්වාමිනි.

ප්‍ර : ඔබ හිටපු යුගයේ?

පි : මං කාලේ මං CNI ඉන්න කාලේ කෙළින්ම බුද්ධි රාජකාරී සම්බන්ධයෙන් කරන ඒවා මං තමයි සම්බන්ධීකරණය ඔක්කොම.

ප්‍ර : නෑ නෑ මම කියන්නේ ඔබ රාජකාරීමය වශයෙන් වාර්තා කරන්නේ අමාත්‍යාංශයේ ලේකම්ටනේ?

පි : ලේකම්තුමාට.

ප්‍ර : එතකොට මේ SIS එකේ Director වාර්තා කරන්නෙත් අමාත්‍යාංශයේ ලේකම්ටද?

පි : ලේකම්ටත් දන්වන්නත් පුළුවන් ස්වභාවය අනුව සාමාන්‍යයෙන් බුද්ධි ඒ කියන්නේ ජාතික ආරක්ෂාවට බලපාන දෙයක් නම් කෙළින්ම ඉදුරාම මට දන්වනවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ආ.... ඔබටත් දන්වනවා?

පි : අනිවාර්යෙන්ම. එකෙන් බැහැරව ගියේ නෑ. කෙළින්ම ඒ හරහා තමයි ඔක්කොම දේවල් සිද්ධ වුණේ .

ප්‍ර : ඒ කියන්නේ විශේෂ වූ අවස්ථාවල්වල නැති නම් සාමාන්‍යයෙන් day today රාජකාරී කරනවා නම් SIS එකේ Director ඔබට තමයි ඉස්සෙල්ලම වාර්තා කරන්නේ?

පි : සාමාන්‍යයෙන් හැම ඒක depend වෙනවා. අපි හිතමු ආරක්ෂක ලේකම්තුමා මොනවා හරි රාජකාරියක් භාර දීලා තියෙනවා නම් SIS Director ට. ඒක එයා ඒ රාජකාරී කරලා ඒක ආරක්ෂක ලේකම්තුමාට භාර දෙයි.

ප්‍ර : ඔබ සඳහන් කළා 2015 වසරේදී ඔබ රාජකාරී කරන අවදියේදී තොරතුරු ලැබුණා කියලා මේ ඉස්ලාම් ආගමික අන්තවාදය පිළිබඳව. ඒ එක්කම ලැබුණා කියලා කිව්වනේ ඔබ ඉස්ලාම් ආගමික අන්තවාදය පිළිබඳව ඔබ රාජකාරී කරද්දී 2015 දී?

පි : යම් කිසි පිබිදීමක් ඇති වුණා කියලා.

ප්‍ර : ඒ තොරතුරු අනුව ඔබ සඳහන් කළා එකසිය ගණනක් වූ විදේශ රටවල්වලින් පැමිණි ඉස්ලාම් ආගමික දේශකවරුන්වත් ආපහු පිටුවහල් කරලා ඇරියා කියලා? එම කටයුත්ත කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් රජය ගත්තද? මම අදහස් කරන්නේ කැබිනට් සංදේශයකින් කරුණු ඉදිරිපත් කරලා එතකොට මේ පිළිබඳව ඉස්ලාම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව එවැනි ආයතනවලටත් දන්වලා මේක කළාද ඒ කියන්නේ ප්‍රතිපත්තිමය තීරණයක් කියන එකෙන් අදහස් වෙන්නේ එහෙම තීරණයක් ගත්තාම ඒක ක්‍රියාත්මක කරන්න ඕනේ රාජ්‍ය ආයතන. එතකොට ආයේ හදිස්සියේම අතර මඟ මේ කට්ටිය ඇරියට පස්සේ ආයේ කණ්ඩායමක් ඇවිල්ලා අන්තවාදී දේශන පැවැත්වීම කරන්න අපහසුයි. එහෙම තීරණයක් ගත්තද නැත්නම් මේ කරුණ නිසා මේ කට්ටියව පිටුවහල් කළාද?

පි : නෑ මං හිතන්නේ එහෙම අවශ්‍යතාවයක් තිබුණ් නෑ. එහෙම සියළු දෙනාම දැනුවත් කරන්න. මොකද immigration එක තිබ්බෙත් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ. එතකොට අපි දන්නවා එතකොට මේ preachers ලා ඇවිල්ලා මොනවද කරන්නේ කියලා. සමහර අය genuine අය හිටියා එතන preachers ලා. නමුත් අපි පොදුවේ ස්ථාවරයක් ගත්තා කතා කරලා ආරක්ෂක ලේකම්තුමා මේක ජාතික ආරක්ෂාවට බලපාන්න පුවළුන් අපි හින්දා ඒක හින්දා මේ සියළු දෙනාම පිටුවහල් කරමු කියලා. ඊට පස්සේ ඊළඟට එන අයට තමයි අර අපි ක්‍රියාමාර්ගයක් යෙදෙව්වේ කොහොමද ඒ

FAIR COMMENT BY JEZEEM

ගොල්ලො එන්නේ අපිට කලින් දන්වලා කොහේටද යන්නේ මොනවද කරන්නේ මොනවද දේශනය වෙන්නේ කොයි පල්ලිවලටද යන්නේ ඒ විදිහට එතකොට මේකේ අර ජමෙයිතුල් උලමා එකෙන් අවසරය ගන්නවද ඒ ඔක්කොම අවසරය අරගෙන ඒ විදිහට තමයි ඊට පස්සේ කරේ. මම දන්නේ නෑ 2015 න් පස්සේ කොහොමද සිද්ධ වුණේ කියන එක මට කියන්න බෑ ස්වාමිනි.

ප : ඔබට අදහස් නෑ 2015 න් පසුව මෙම ඉස්ලාම් ආගමික අන්තවාදී දේශනා පවත්වන විදේශීය දේශකයන් ලංකාවේ ඇවිල්ලා සුපුරුදු පරිදි ඔවුන් දේශනා පැවැත්තුවද කියන එක පිළිබඳව අදහසක් ඔබට දෙන්න බෑනේ?

පි : මට එහෙම අදහසක් නෑ ස්වාමිනි.

ප : නෑ ඔබට මේ ගැන මම අහන්නේ ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙනවා නම් එය අඛණ්ඩව ඉදිරියට යනවා දැන් ඔබලාගේ අවදියේදී තීරණයක් අරගෙන යැව්වා. ඊට පස්සේ කණ්ඩායමක් එන අය මෙවැනි දෙයක් කළාද කියන ඒවා පිළිබඳ නිසි අවබෝධයක් නැතුව ගියාම අර වගේ කණ්ඩායමකට ලේසියෙන්ම එන්න පුළුවන් රට ඇතුළතට. ඇවිල්ලා ආයෙත් ඒ ගොල්ලන්ගේ වැඩ සටහනේ යන්න පුළුවන්. ඒක නිසා තමයි මම ඔබගෙන් ඇහුවේ?

පි : එතකොට ස්වාමිනි බුද්ධි අංශ මොනවද කරන්නේ. එහෙම අය ඇවිල්ලා ඉන්නවා නම් බුද්ධි අංශවලට අඩු ගාණේ දැනුවත් වෙන්න ඕනේ.

ප : කොයි කාලේ බුද්ධි අංශද?

පි : 2015 න් පස්සේ තමයි එහෙම අන්තවාදී විදිහට දේශනා කරන preachers ලා ඇවිල්ලා ඉන්නවා නම් ඒක බුද්ධි අංශවල වගකීමක් වෙනවා එයාලා trace කරන්න. ඉතින් එහෙම නම් අර ස්වාමිනි කියන විදිහට ප්‍රතිපත්තිමය මේකක් කියලා ඒක මට ඒක ඒ තරම්ම පැහැදීමක් නෑ. නමුත් මොකද ඒ විදිහට බුද්ධි අංශ ක්‍රියාකාරී වෙලා තිබ්බා නම් ආරක්ෂක ලේකම්තුමා හරි ජනාධිපතිතුමා හරි අවශ්‍ය ඇමතිවරයා හරි ඒක දන්නවා නම් මේක ජාතික ආරක්ෂාවට බලපානවා කියලා අරින්න පුළුවන්. මොකද ඒ ගොල්ලො tourist visa වලින්නේ එන්නේ.

ප : දැන් බුද්ධි අංශවල ක්‍රියාකාරීත්වය පිළිබඳව යම් ප්‍රශ්නයක් මෙතුමාත් ඇසුවා. එම extension එකකට මමත් ගියා 2015 ඉඳලා මේ ආගමික මතවාදී දේශනාවල් කරන පිරිසට වඩා දරුණු කණ්ඩායමක් පිළිබඳව ආවේක්ෂණය කරලත් ඒ ප්‍රහාරය දක්වාම සොයා ගැනීමට නොහැකි වුණානේ ඉතින් ඔබට මම හිතන්නේ

FAIR COMMENT BY JEZEEM

පැහැදිලි ඇති බුද්ධි අංශයේ තිබිච්ච තත්ත්වය මොකක්ද කියලා මගෙන් ප්‍රශ්නයක් අහනවට වඩා?

පි : එතනදී මම හිතන්නේ ඒක from bottom to top responsibility එක ගන්න ඕනේ ඒක. ඒක හමුදාපතිවරයා පවා ගන්න ඕනේ ඒ වගකීම ඒ කාලේ හිටපු.

ප්‍ර : ඔබ 2015 දී ඔබට දැන ගැනීමට ලැබුණු විදිහට මේ ඉස්ලාම් ආගමික අන්තවාදී ව්‍යාපාරයක් ලංකාවේ ආරම්භ වෙලා තියෙනවා කියලා. ඔබගේ අමාත්‍යාංශය යටතේ තියෙන බුද්ධි තොරතුරු රැස් කිරීමේ ආයතන ඉස්ලාම් ආගමික අන්තවාදයේ තවත් නොයෙක් දේවල් සිද්ධ වෙමින් තිබුණු බව හොයා ගෙන තිබුණද ඔය මද්‍රසා පාසල්, වහබ්වාදයත් එක්ක යන මතවාදයක් දරුණු ලෙස ලංකාවේ ව්‍යාප්ත වෙමින් පැවතීම විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ ඉතාමත් දරුණු අන්දමට ව්‍යාප්ත වීම සහ සමස්තයක් ලෙස ලංකාව පුරාම ඔය තවුහිද් කියන මතවාදය ඔස්සේ යන ආගමික කණ්ඩායම් සිටින බව. විශේෂයෙන් මවුලවිවරුන් දේශීය මවුලවිවරුන් එවැනි තොරතුරු ඔබගේ බුද්ධි නිලධාරීන්ගේ බුද්ධි තොරතුරු විමර්ශනය කිරීම්වලදී හෙළි වුණාද ඔබ සිටපු කාලයේදී?

පි : එහෙම විශේෂයෙන් කියන්න තරම් දෙයක් තිබ්බේ නෑ ස්වාමිනි.

ප්‍ර : තොරතුරු තිබුණේ නෑ.

පි : ඔව් යම් කිසි පොඩි සුළු සුළු තොරතුරු ආවත් ඒ ගැන මං හිතන්නේ බුද්ධි අංශ මඟින් ඒ ගැන ක්‍රියා කරන්න උපදෙස් දීලා තමයි තිබ්බේ.

ප්‍ර : දැන් අල්කයිඩා සහ ISIS වැනි ගෝලීය ත්‍රස්තවාදයේ බලපෑම ශ්‍රී ලංකාව තුළට ප්‍රවිෂ්ට වී තිබෙනවා කියන එක ඔබ ආරක්ෂක අමාත්‍යාංශයේ රාජකාරී කරපු කාලයේදී වාර්තා වුණාද?

පි : මම පළමුවෙන් කිව්වා වගේ සිරියන් Connection එක තමයි ඉස්සෙල්ලාම ආවේ. සිරියාවට ගිහිල්ලා තියෙනවා කියලා ISIS training වලට.

ප්‍ර : එම වාර්තා වුණේ මොන වසරේද කියලා ඔබට මතකද?

පි : මට හරියට මතක නෑ ස්වාමිනි .

**********

FAIR COMMENT BY JEZEEM

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර : සාක්ෂිකරු එක පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥතුමා ඔබගෙන් ඇහුවාම අර බුද්ධි තොරතුරක් ඔබට CNI වශයෙන් ලැබුණාම ඔබ මොකක්ද කරන්නේ කියලා ඔබ කිව්වා ඒක ඉස්සෙල්ලාම ඔබ විශ්ලේෂණයකට ලක් කරනවා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබට පෙර මේ කොමිෂන් සභාවට සාක්ෂි ලබා දුන් එක් සාක්ෂිකරුවෙක් ප්‍රකාශ කර සිටියේ CNI කාර්යාලයේ එවැනි විශ්ලේෂණ ක්‍රියාවලියක් කිරීම සඳහා සම්පත් නැති බවයි. දැන් උදාහරණයක් ලෙස අපි දන්නවා රාජ්‍ය බුද්ධි සේවාවේ යම් යම් දත්තයන් තියෙනවා. DMI එකෙත් ඒ විදිහට තියෙනවා. නමුත් මේ කොමිෂන් සභාවට ප්‍රකාශ කරපු හැටියට CNI කාර්යාලයේ ඉන්නේ සේවකයින් පිරිස් කුඩා ප්‍රමාණයක් ඔවුන් කරන්නේ සම්බන්ධීකරණ ක්‍රියාවලියක් කියලා. ඒ සම්බන්ධයෙන් මොකක්ද ඔබට දක්වන්න පුළුවන් ප්‍රතිචාරය?

පි : ස්වාමිනි සම්පත් කියන එක මට ඒ තරම් සම්පතක් එහෙම සම්පත් කියලා දේවල් අවශ්‍ය වෙන්නේ නෑ. අපිට කාර්ය කරන්න රාජකාරී කරන්න අවශ්‍ය පුද්ගලයන් නිලධාරීන් සෙසු නිලයන් ඉන්නවා නම් අපි මේ information එකක් ආපු ගමන්ම අපි ඒ අවශ්‍ය file එක ගෙන්ව ගන්නවා මම. ඒ file එක ගේන එක ඕන එක්කෙනෙකුට Clerk කෙනෙකුටත් කරන්න පුළුවන් මම අහවල් file එක ගෙන්න කිව්වා නම් එයා කියනවා මට ඒ file එක එක බැලුවා නම් මට තියෙනවා ඔක්කොම line up වෙච්චි දේවල්. එතකොට වෙන විශේෂයෙන් සම්පත් අවශ්‍ය නෑ ඒකට ස්වාමිනි. මම දන්නේ නෑ මොනවද සම්පත් කියලා අදහස් කරේ මොකක්ද ඒ කියන එක මට එතරම් පැහැදිලියක් නෑ.

ප්‍ර : මම හිතන්නේ ඒ අදහස් වුණේ තාක්ෂණික වශයෙන් ඔය දත්ත ගබඩාවන් එහෙම නැති බවයි?

පි : එහෙම අවශ්‍යතාවයක් නෑ ස්වාමිනි. මොකද ඒක සාමාන්‍ය දැනීමක් තියෙන පුද්ගලයෙකුට කරන්න පුළුවන් ඒක file එක ගෙනල්ලා බලන එක විතරයි තියෙන්නේ ටික වේලාවක් යයි.

ප්‍ර : දැන් ඔබ මේ කොමිෂන් සභාවට ලබා දුන් තොරතුරුවලට අනුව පෙනී යන්නේ අර බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීම්වල

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : තියෙන කරුණු වාර්තා ගත කිරීමක් වෙනවා. ඊට පස්සේ ඒක සම්බන්ධයෙන් ක්‍රියා කරන්න ඕන අංශ හඳුනා ගැනීමක් වෙනවා

FAIR COMMENT BY JEZEEM

දකුණු පැත්ත අවසාන තීරුවෙන්. ඊට පස්සේ ඒක නොනවත්වාම නැවත නැවත update වීමක් තමයි වෙන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ වාර්තාවක් ගෙන්නව ගන්නවා කියන එකෙන් අදහස් කරන්නේ එවැනි ගොනුවක්ද?

පි : නැත ස්වාමිනි. සමහර විට ඒකෙනුත් බලන්න පුළුවන් අපි සාකච්ජා කරලා මොකද එතකොට අපේ මගේ තව officers ලා ඉන්නවා. ඒකට සහභාගි වෙනවා conference එකට මම විතරක් නෙවේ. මගේ office එකේ තව එක්කෙනෙක් එනවා. එයා තමයි ඔක්කොම minutes ගන්නේ. එතකොට එයා දන්නවා අනිවාර්යෙන්ම මෙහෙම එකක් කලින් කතා කරාද නැද්ද කියලා මමත් දන්නවා. එතකොට මට කියන්න පුළුවන් minutes වලට තියෙන එක ගෙන්න. එහෙම නැත්නම් මේ Intelligence අහවල් ආයතනයෙන් හම්බ වුණා නම් ඒ file එක ගේන්නයි කියලා.

ප්‍ර : ආ... ඒක තමයි දැන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වෙන්නේ. ඒ කියන්නේ ඔය බුද්ධි සමාලෝචන රැස්වීම්වල minutes වලට අමතරව DMI එකෙනුයි SIS එකෙනුයි ඔබට CNI කාර්යාලයට දිනපතා නැත්නම් සතිපතා යම් යම් වාර්තා ලැබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එක් එක් මාතෘකා සම්බන්ධයෙන් වාර්තා ලැබෙනවා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ අදහස් කළේ එවැනි ගොනුවක්?

පි : එහෙමයි ස්වාමිනි.

**මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැලකම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනි සිටින උගත් නීතිඥවරියගෙන් අසයි. අවශ්‍ය බව ප්‍රකාශ කරයි. අවස්ථාව ලබා දෙමි.**

**********

**<u>අති උතුම් මැලකම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනි සිටින නීතිඥ රවිෂානි පීරිස්</u>**

ප්‍ර : සාක්ෂිකරු ඔබ පැවසු ආකාරයට මේ බුද්ධි තොරතුර ඔබ කිව්වා මේ කොහොමද ඉහළ නිලධාරීන්ට දැනුවත් කරන විදිහ ආකාරය පිළිබඳව. එතකොට ඔබ කාදිනල්තුමාට මේ පිළිබඳව දැනුවත් කරනවද එහෙම කරනවා නම් කුමන වේලාවක එහෙම දැනුවත් කරනවද?

පි : මං හිතන්නේ ස්වාමිනි කාදිනල්තුමාට දැනුවත් කරන්න ඕනේ. SIS director. එහෙම නැත්නම් CNI දැනුවත් කළ යුතුමයි මොකද

FAIR COMMENT BY JEZEEM

මේක පල්ලි සම්බන්ධයෙන් දීලා තියෙන හින්දා. අඩුගාණේ ආරක්ෂක ලේකම්තුමා කියනවා ගිහිල්ලා අඩු ගාණේ මං හිටියා නම් මට ගිහිල්ලා explain කරලා ගිහිල්ලා කියන්නේ ඒක මෙහෙම. අනිවාර්යෙන්ම ඒක සිද්ධ වෙනවා.

ප : එතකොට ඔබ පැවසුවා 2013, 2014 වසරවල් වලදී අන්තවාදී ඉස්ලාම් අන්තවාදීන් පිළිබඳව ඔබ දැනුවත් වුණා කියලා. එතකොට ඒ අවස්ථාවේදී කාදිනල්තුමා ඇතුළුව අනිකුත් ආගමික නායකයින්ට කොහොමද දැනුවත් කිරීමක් අවශ්‍ය වුණේ නැද්ද ඇයි එහෙම ?

පි : එහෙම ඉස්ලාම් අන්තවාදීන් සම්බන්ධයෙන් මේ ආගම්වාදීන් වශයෙන් ගිහිල්ලා මෙහෙම ප්‍රහරවල් දෙනවා කියලා තොරතුරු ලැබිලා තිබ්බේ නෑ ඒ කාලේ 2015 ට පෙර. එහෙම අවශ්‍යතාවයක් වුණේ නෑ එහෙම කාදිනල්තුමා දැනුවත් කරන්න මොකද ඒ වගේ තොරතුරු ලැබිලා තිබුණේ නෑ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

**ප්‍රශ්න එපමණ බව දන්වයි.**

**කොමිෂන් සභාවට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්ය සම්බන්ධයෙන් දැක්වූ සහයෝගයට කොමිෂන් සභාවේ ස්තූතිය සාක්ෂිකරුට ප්‍රකාශ කරනවා.**

**සාක්ෂිකරු මුදා හරිමි.**

දැන් වේලාව : ප.ව.03.25 යි.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

## 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

**දිනය: 2020.07.09** **වෙලාව:- පෙ.ව.10.50**

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

**ගරු විනිසුරු මඩුල්ල:-**

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - **සභාපති**

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - **සාමාජික**

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණ නැත) - **සාමාජික**

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - **සාමාජික**

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - **සාමාජික**

**<u>පෙනී සිටීම:</u>**

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර, දිලන්ත එස්.කළුදුරුවගේ සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගරු අතිටතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**<u>සාක්ෂි අංක 914 සාක්ෂියට කැඳවයි.</u>**

**සම්පූර්ණ නම : ඉස්මාලෙබ්බේ මොහොමඩ් ජිෆ්රි,**
**වයස : අවුරුදු 40 යි,**
**ජාතිය : මුස්ලිම්,**
**ආගම : ඉස්ලාම්,**
**රැකියාව : ත්‍රීවිල් රථ රියදුරු.**
**පදිංචි ලිපිනය : නො. 97, හිජ්රා මාවත, කඳුරුවෙල, පොළොන්නරුව.**

**මා කියන සාක්ෂිය සැබෑය, සම්පූර්ණ සැබෑය, සැබෑවක් මිස අන් කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දෙමි.**
**(සාක්ෂිකරු ද්‍රවිඩ බසින් ප්‍රතිඥා දෙයි)**

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:</u>**

ප්‍ර : සාක්ෂිකරු තමන් අද කොහේ ඉදලද ආවේ?
පි : මම කඳුරුවෙල.
ප්‍ර තමන්ට සිංහලෙන් අද සාක්ෂි දෙන්න හැකියාවක් තියෙනවද?
පි සිංහලෙන් 100% ක් බැහැ, කියන එකට පුළුවන්.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>**

ප්‍ර තේරෙන්නේ නැත්නම් කියන්න
පි හරි සර්.
ප්‍ර ප්‍රශ්නේ ඉවර වෙන කල් ඉන්න ප්‍රශ්නේ අහලා ඉවර වෙලා ඊට පස්සේ ඒකට උත්තර දෙන්න
පි : හරි සර්.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:</u>**

ප්‍ර : දැන් සාක්ෂිකරු තමන් කිව්වා අද ආවේ කඳුරුවෙල ඉඳලා කියලා?
පි ඔව්.
ප්‍ර කඳුරුවෙල, අංක 97, හිජ්රා මාවත මුස්ලිම් කොළණියේ කියන ලිපිනයේ ඉදලද ආවේ අද?
පි ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් ඔය කියපු ලිපිනයේ කොච්චර කාලෙක ඉඳලා තමන් පදිංචි වෙලා ඉන්නවද?

පි අවුරුදු 21 ක්.

ප්‍ර ඒ කියන්නේ මොන අවුරුද්දෙ ද කියලා මතකයක් තියෙනවද?

පි 1999 මම කසාද බැන්දේ. එතන ඉඳන් එහේ තමයි මම ඉන්නේ.

ප්‍ර ඒ කියන්නේ තමන්ගේ බිරිඳගේ නිවසද මේ අංක 97, හිජ්‍රා මාවත කියන ලිපිනය?

පි ඔව්.

ප්‍ර මොකක්ද තමන්ගේ බිරිඳගේ නම?

පි වයි.බී.ලතීෆා.

ප්‍ර දැන් තමන් කිව්වා රැකියාව විදියට ත්‍රීරෝද රථ රියදුරෙක් විදියට කටයුතු කරනවා කියලා?

පි ඔව්.

ප්‍ර කොහේද තමන් ත්‍රීරෝද රථ පැදවීම කරන්නේ?

පි ත්‍රීරෝද මට පාක් එකක් නැහැ. ගෙදර තියාගෙන කෝල් හයර් එක තමයි මම දුවාගෙන ඉන්නේ.

ප්‍ර දැන් විවාහයට කලින් කොහේද පදිංචි වෙලා හිටියේ?

පි මානික්කම්පිටිය අම්මාගේ ගෙදර.

ප්‍ර ඒ ගෙදර ලිපිනය කියන්න පුළුවන්ද?

පි නො. 4/4, මානික්කම්පිටිය.

ප්‍ර ඒ කියන්නේ මේ මානික්කම්පිටිය කියන්නේ කොහේද ප්‍රදේශය?

පි මානික්කම්පිටිය කියන්නේ පොළොන්නරුව ප්‍රදේශයේ.

ප්‍ර කඳුරුවෙලම කිව්වොත් හරිද?

පි කඳුරුවෙල කිව්වොත් හරි.

ප්‍ර දැන් තමන් ඉස්කෝලේ කොච්චර ඉගෙන ගෙන තියෙනවද?

පි 9 වෙන කල්.

ප්‍ර 9 වසරට යන කල් ඉගෙන ගෙන තියෙනවා?

පි ඔව්.

ප්‍ර දැන් ඉස්කෝලේ ගිහිල්ලා ඉවර වුණාට පස්සේ මොනවද කලේ?

පි ඉස්කෝලේ ගිහිල්ලා ඉවර වුණාට පස්සේ කඩවල වැඩ කළා ගොඩක්.

ප්‍ර මොන කඩවලද? කොයි කාලවල් වලදී ද වැඩ කලේ කියලා පොඩ්ඩක් කියන්න බලන්න?

පි කාලේ නම් හරියට මතක නැහැ. ඉස්සෙල්ලම වැඩ කලේ අබ්දුල් කාදර් හාඩ්වෙයාර් කියලා

ප්‍ර ඒකේ මොනවද කලේ?

Presidents Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි එහේ Helper. ඊට පස්සේ මහනුවර මෝටර්ස් කියලා කඩයක්. ඒකේ ටිකක් කල් වැඩ කලා. ඊට පස්සේ සාරා ගෝල්ඩ් හවුස් කියලා කඩයක්.

ප්‍ර ඒකේ මොනවද කළේ?

පි ඒකත් Helper තමා. ඊට පස්සේ තමයි ඊස්ට් වෙස්ට් මාකටින් එකේ වැඩ කලේ.

ප්‍ර ඒ කඩේ මොනවද කලේ?

පි එහේ Helper. ලොරියේ Helper වැඩට යනවා.

ප්‍ර ඊස්ට් වෙස්ට් මාකටින් කියලා?

පි ඔව්.

ප්‍ර ඊස්ට් වෙස්ට් මාකටින් කියලා කියන්නේ මොකක්ද? මොන කඩයක්ද?

පි ඒක ඇවිල්ලා ඒජන්සි එකක් අරගෙන කලේ එයා.

ප්‍ර ඒක කාට අයිති කඩයක්ද මේ ඊස්ට් වෙස්ට් මාකටින් කියන්නේ?

පි ඒක යාසිම් බාවා අබ්දුල් රවුෆ්ගේ කඩයක්.

ප්‍ර යාසිම් බාවා අබ්දුල් රවුක්?

පි ඔව්. ඒජන්සිය එක.

ප්‍ර ඊස්ට් වෙස්ට් මාකටින් ඒජන්සිය කොහේද තියෙන්නේ?

පි එහේ කදුරුවෙල ගමේ ඇතුලේ. මුස්ලිම් කොළණි ගමේ ඇතුලේ.

ප්‍ර දැන් මොනවද ඒ ඒජන්සියෙන් කරන්නේ?

පි ඒජන්සියෙන් කඩවල Sale කරනවා බඩු අරගෙන.

ප්‍ර මොන වගේ බඩුද කඩවලට සේල් කරන්නේ?

පි පොල්තෙල්, ෂැම්පෝ, මිල්ග්‍රෝ මිල්ක් පැකට් ඒ වගේ.

ප්‍ර : දැන් මේ යාසිම් බාවා අබ්දුල් රවුෆ්ව තමන් හඳුනන්නේ කොහොමද?

පි : යාසිම් බාවා අබ්දුල් රවුෆ් කියන එක්කෙනා මගේ wife ගේ තාත්තගේ පලවෙනි කසාදේ ඉන්න එක්කෙනා තමයි රවුෆ්.

ප්‍ර 1 වෙනි කසාදේ ඉන්න එක්කෙනා කිව්වේ? 1 වෙනි කසාදේ දරුවෙක්ද?

පි ඔව්.

ප්‍ර : තමන්ගේ බිරිඳගේ පියාගේ පළවෙනි කසාදේ දරුවෙක්?

පි : දරුවෙක්.

ප්‍ර : යාසිම් බාවා අබ්දුල් රවුෆ් කියලා කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන්නේ නෑකමට තමන්ගේ කවුද එයා? මස්සිනා කෙනෙක් වෙනවා කිව්වොත් හරිද?

පි : ඔව් මස්සිනා කියලා කියන්න පුළුවන්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කොහොමද එයාට සාමාන්‍යයෙන් තමන් කතා කරන්නේ?

පි : මම මස්සිනා කියලා තමයි කියන්නේ එයාට.

ප්‍ර : එයා කොහොමද කතා කරන්නේ?

පි : එයාත් මචං කියලා කියනවා.

ප්‍ර : දැන් මේ අබ්දුල් රවුෆ් කොහේද පදිංචි වෙලා ඉන්නේ?

පි : එයා පදිංචි වෙලා හිටියේ කාත්තන්කුඩි.

ප්‍ර : දැන් තමන් කිව්වානේ මේ අබ්දුල් රවුෆ්ට ඊස්ට් වෙස්ට් මාකටින් කියලා ඒජන්සියක් තිබ්බයි කියලා?

පි : ඔව්.

ප්‍ර : ඊට අමතරව එයා රැකියාව විදියට වෙන මොනවද කළේ?

පි : ඒ දවස්වල මොනවත් නැහැ, කඩේ විතරයි.

ප්‍ර : ඒ දවස්වල කියලා කියන්නේ ඔය ඊස්ට් වෙස්ට් මාකටින් ඒජන්සිය පැවැත්තුවේ කොයි කාල වකවානුවේදී ද?

පි : 2008 වගේ. මම මාස 6 ක් විතර වැඩ කළා එයාගේ ඒජන්සි එකේ.

ප්‍ර : තමන් කවුරු විදියටද සේවය කළේ?

පි : Helper විදියට.

ප්‍ර : දැන් මම තමන්ගෙන් ඇහුවේ දැන් ඔය ඒජන්සියට අමතරව තමන් කිව්වානේ මෙයා කාත්තන්කුඩියේ කියලා, කාත්තන්කුඩි ප්‍රදේශයේ කියලා?

පි : ඔව්.

ප්‍ර : ඊට අමතරව එයා වෙන මොනවද රැකියාවක් විදියට, ආදායමක් විදියට උපයා ගන්න වෙන මොනවද එයා කළේ?

පි : නැහැ ඒ දවස්වල හරියට..

ප්‍ර : ඊට පස්සේ 2008 න් පස්සේ මොනවා හරි තව එයා රැකියාවක් විදියට කලා කියලා තමන් දන්නවද?

පි : ඔව්. 2008 න් පස්සේ එයා ආරංචි වුණා ෆාම් එකක් කරනවා කියලා, කුකුළ් මස් ෆාම් එකක් කරනවා කියලා.

ප්‍ර : ඒ ෆාම් එකක් කරන්න ඔහුට ඉඩමක් ප්‍රදේශයේ තියෙන්න ඇති?

පි : ඔව්.

ප්‍ර : ඒ කොයි ප්‍රදේශයේද ඉඩම තිබුණේ?

පි : ඒක ඔල්ලිකුලම්.

ප්‍ර : ඔල්ලිකුලම් ප්‍රදේශයේ?

පි : ඔව් ඔල්ලිකුලම් ප්‍රදේශයේ.

ප්‍ර : දැන් තමන් කිව්වා මේ 2008 වර්ෂයේදී විතර

(නැවත ප්‍රශ්නය වෙනස් කිරීමට අවසර පතයි)

ඔය ඔල්ලිකුලම් ප්‍රදේශයේ ඔය ෆාම් එක තිබ්බිච්ච තැනට තමන් ගිහිං තියෙනවද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : නැහැ සර් කවදාවත් ගිහිං නැහැ.

ප්‍ර : ගිහිල්ලා නැහැ?

පි : නැහැ.

ප්‍ර : දැන් යාසිම් බාවා අබ්දුල් රහුෆ් දැනට ලංකාවේ ඉන්නවද?

පි : ඔව් ලංකාවේ ඉන්නවා. Arrest කරලා තියෙනවා කියලා ආරංචියි කොහේද ඉන්නවද කියලා දන්නේ නැහැ හරියට.

ප්‍ර : Arrest කරලා තමන් කිව්වේ මොකක් සම්බන්ධයෙන්ද?

පි : ඒක සහරාන්ගේ අර බෝම්බ ප්‍රහාරයෙන් Arrest කරලා තියෙනවා කිව්වා. එයා කොහේද කියලා දන්නේ නැහැ හිරේ.

ප්‍ර : දැන් තමන් කිව්වා ඔය 2008 වර්ෂයේ කාලයේ තමයි යාසිම් බාවා අබ්දුල් රහුෆ්ගේ ඊස්ට් වෙස්ට් මාකටින් කියන ඒජන්සියේ Helper කෙනෙක් විදියට තමන් වැඩ කළේ කියලා?

පි : ඔව්.

ප්‍ර : දැන් තමන් දුරකථනයක් පාවිච්චි කරනවාද?

පි : මමද

ප්‍ර : ඔව් දැන් පාවිච්චි කරනවද දුරකථනයක්?

පි : ඔව් මම පාවිච්චි කරනවා.

ප්‍ර : මොන සමාගමෙන්ද මේ සිම් පත්‍රය ලබාගෙන තියෙන්නේ?

පි : ඩයලොග් එකෙන්.

ප්‍ර : දැන් පාවිච්චි කරන දුරකථන අංකය කියන්න පුළුවන්ද?

පි : 076-5660578.

ප්‍ර : දැන් තමන් මේ ඩයලොග් ආයතනයෙන් මීට කලින් ඔය දැන් පාවිච්චි කරන එකට කලින් සිම්පත් ලබාගෙන තියෙනවද?

පි : ඔව් පැකේජ එකක් අරන් තියෙන්නේ.

ප්‍ර : ඒ කොයි අවුරුද්දේ ද?

පි : 2008.

ප්‍ර : ඒකේ අංකය තමන්ට කියන්න පුළුවන්ද?

පි : ඔව්.

ප්‍ර : කියන්න?

පි : 077-8469250

ප්‍ර : ඒ දුරකථන අංකයට අදාල සිම්පත තමන් කවදද, කොහෙන්ද ලබා ගත්තේ?

පි : කඳුරුවෙල branch එකෙන්. ඩයලොග් branch එකෙන්.

ප්‍ර : දිනය තමන්ට මතකයක් තියෙනවද?

පි : අවුරුද්ද මතකයි දිනය හරියට මතක නැහැ.

ප්‍ර : අවුරුද්ද මතකයි?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප : මොකක්ද අවුරුද්ද?

පි : 2008

ප : දැන් තමන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය මොකක්ද?

පි : පරණ නොම්මරය මතකයි. අළුත් නම්බර් එක 198032600982

**********

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

ප : පරණ නම්බර් එක අමතකයිද?

පි : ඔව්.

ප : තියෙනවද?

පි : මතකයි, ඔව්.

ප : කියන්න?

පි : 803260982 V

**********

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>:

ප : දැන් තමන්ට තමන්ගේ නම ඉංග්‍රීසියෙන් දැක්කොත් කියවන්න පුළුවන්ද?

පි : ඔව් පුළුවන්.

**මේ අවස්ථාවේදි සාක්ෂිකරුට ඩයලොග් දුරකථන ග්‍රාහක විස්තර සහිත ලේඛනයක් පෙන්වා සිටි.**

ප : දැන් තමන්ට පෙන්වන මේ ලේඛනයේ ඔය document එකේ තමන්ගේ නම තියෙනවද?

පි : ඔව් මගේ නම තියෙනවා.

ප : කොහොමද තමන්ගේ නම තියෙන්නේ?

පි : ජිෆ්රි මොහොමඩ්. එම්. ජිෆ්රි කියලා දාලා තියෙන්නේ.

ප : ඕකේ තියෙන විදියට කියන්න කෝ?

පි : ජිෆ්රි අයි. එම්. කියලා.

ප : දැන් තමන්ගේ ඔය කියපු අළුත් සහ පරණ ජාතික හැඳුණුම්පත් අංක සටහන් වෙලා තියෙනවද?

පි : ඔව්.

ප : දැන් මොහොතකට කලින් තමන් කියපු අළුත් ජාතික හැඳුණුම් පත් අංකය: 198032600982 වශයෙනුත් තමන්ගේ පරණ ජාතික හැඳුණුම් පත් අංකය 803260982 V වශයෙනුත් සටහන් වෙලා තියෙනවද?

පි : ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : දැන් තමන් කිව්වා තමන් ඒ ලබා ගත්ත දුරකථන අංකයත් ඕකේ සටහන් වෙලා තියෙනවද?

පි : ඔව්.

ප : මොකක්ද තියෙන දුරකථන අංකය?

පි : 077-8469250

ප : නැවත බලලා කියන්න?

පි : 077-8469250

ප : දැන් මේ ලේඛනය අනුව මේක, මේ සිම්පත තමන් ලබාගෙන තිබෙන දිනය සටහන් වෙලා තියෙනවානේ, තමන් කිව්වා 2008 දිනය මතක නැහැ කියලා, දිනය ඕකේ සටහන් වෙලා තියෙනවද?

පි : ආ.. ඔව් සටහන් වෙලා තියෙනවා.

ප : කවදද දිනය?

පි : 2008.12.12

ප : දැන් තමන්ට මේ ලේඛනය හඳුනා ගන්න පුළුවන්ද තමන් ඩයලොග් ආයතනයෙන් 2008.12.12 වෙනිදා 778469250 කියන දුරකථන අංකය ලබා ගැනීමට අදාල ලේඛනයක් කියලා හඳුනා ගන්න පුළුවන්ද?

පි : ඔව් පුළුවන්.

**<u>මෙම ලේඛනය C837 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.</u>**

ප : දැන් ඔය තමන් ගත්ත දුරකථන අංකය තමන් කොච්චර කාලයක් පාවිච්චි කළාද?

පි : විනාඩියක්වත් පාවිච්චි කරලා නැහැ.

ප : ඇයි ඒ?

පි : ඒක මගේ මස්සිනාට අරන් දීපු සිම් එක තමයි ඕක.

ප : කවුද මස්සිනා?

පි : වයි.බී.ඒ අබ්දුල් රවුෆ්.

ප : වයි.බී.ඒ කියන්නේ මොකක්ද, සම්පූර්ණ නම හරියට කියන්න?

පි : යාසිම් බාවා අබ්දුල් රවුෆ්.

ප : ඇයි තමන්ගේ ජාතික හැඳුණුම්පත ඉදිරිපත් කරලා තමන් ගත්ත සිම්පත වෙන කෙනෙකුට දුන්නේ?

පි : ඒ wife ගේ අයියා. wife ගේ අයියා කියන්නේ එයා ගාව already package සිම් එකක් තිබ්බා. තියෙන කොට තමයි 2008 Promotion එකක් ආවා 1000 minutes free එකක්. ඒ දවස්වල සිම් 2 ක් දෙන්න බැහැ කියලා මගේ අයිඩින්ටිය අරන් ගිහිල්ලා සිම් එකක් ගත්තා.

ප : සිම් එක ගන්න තැනට තමන් ගියේ නැද්ද?

පි : නැහැ මම ගියා. මමත්, එයාත් තමයි ගියේ.

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අරගෙන මොකද කළේ? එතනින් සිම් එක අරගෙන තමන්ද ගත්තේ?

පි : ඔව්.

ප්‍ර : අරගෙන?

පි : එයා ගත්තා සිම් එක. Identicard එක මට දුන්නා.

ප්‍ර : දැන් ඒ ගත්ත සිම්පතට අදාලව මේක පෙරගෙවීම් පැකේජයක්ද නැත්නම් පසුගෙවීම් පැකේජයක්ද?

පි : ඒක මාසෙන් මාසේ ගෙවන පැකේජයක්. Promotion එකක්. 1000 minutes free එකක්.

ප්‍ර : ඒ කියන්නේ මේකේ බිල පස්සේ ගෙදරට එනවා ඇති?

පි : ඔව්, මාසෙන් මාසෙට මට ගෙදරට බිල එනවා.

ප්‍ර : තමන්ගේ ලිපිනයටද, තමන්ගේ නමටද ඒ අනුව ඒ බිල ආවේ?

පි : ඔව්.

ප්‍ර : ගෙවීම් කලේ කවුද? ඒ බිලට අදාල දුරකථන බිලෙහි මුදල ගෙව්වේ කවුද?

පි : ගෙව්වේ රවුෆ්. මාසෙන් මාසේ බිල් ගෙවන්නේ රවුෆ්.

ප්‍ර : තමන්ගේ නිවසට එහෙම ආපු බිලක් හරි ලිපියක් හරි මේ අවස්ථාවේදි මේ ගරු කොමිෂමට තමන්ට ඉදිරිපත් කරන්න හැකියාවක් තියෙනවද?

පි : ඔව් පුළුවන්.

ප්‍ර : ඒ කවදා ආපු බිලක්ද නැත්නම් ලියුමක්ද?

පි : ඒක ඇවිල්ලා බිලක්. ලියුමකුත් තියෙනවා අන්තිමට ආපු.

ප්‍ර : ඒ කවදා ආපු ලියුමක්ද?

(සාක්ෂිකරු අදාල ලේඛනයට අවධානය යොමු කරයි)

පි : 2018.03.17

ප්‍ර : කවුද එවලා තියෙන්නේ?

පි : ඒක එවලා තියෙන්නේ, සිංහල නම් කියවන්න දන්නේ නැහැ.

ප්‍ර : පස්සේ තමන් මේ ලියුමේ තියෙන්නේ මොනවද කියලා පස්සේ දැන ගත්තද?

පි : ඔව් පස්සේ තමයි මේ ලියුම ආවට පසසේ තමයි දැන ගත්තේ බිල arrears එක තියෙනවා කියලා.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**:

මේ අවස්ථාවේදි කොමිෂන් සභාවට සහාය වන භාෂා පරිවර්ථක විසින් අදාල ලේඛනය දමිල භාෂාවෙන් පරිවර්ථනය කර සාක්ෂිකරුට විස්තර කරයි.

**********

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:</u>**

ප්‍ර : දැන් තමන් දැන ගත්තද මොකක් ද ඒ ලියුමේ අඩංගු වෙලා තමන්ගේ නමට ආපු ඩයලොග් ආයතනයෙන් 2018 තුන්වෙනි මාසේ 17 වෙනිදා ඒ ආපු ලියුමේ මොනවද තියෙන්නේ කියලා?

පි : ඔව්. දැන ගත්තා.

ප්‍ර : මොකක්ද තියෙන්නේ?

පි : ඒක බිල arrears වෙලා තියෙනවා මෙහෙමයි අර සති 3 කින් ගෙවලා දාන්න කියලා.

ප්‍ර : රු 5053 යි ශත 67 ක මුදලක් ගෙවන්න තිබෙනවා ඒක ගෙවලා නැවත සක්‍රීය කර ගන්න අවස්ථාව හිමි වෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : තමන් මේ ලියුම ආවට පස්සේ අබ්දුල් රවුෆ්ට දැනුම් දුන්නද?

පි : ඔව් දැනුම් දුන්නා.

ප්‍ර : කොහොමද දැනුම් දුන්නේ?

පි : දැනුම් දුන්නා කියන්නේ එයාගේ wife ට කිව්වා. කෝල් අරගෙන wife ට කිව්වා මෙහෙම සිම් එක, ඒ දවස්වල මේ සිම් එක වැඩ නැහැ. ඒ දවස්වල එයාගේ wife ට කෝල් කරලා කිව්වා මෙහෙම ලියුම ඇවිල්ලා තියෙනවා නඩු දාලා තියෙනවලු ඒක කොහොම හරි clear කරලා දාන්න කියලා. ඊට පස්සේ එයා කියලා තිබ්බලු clear කරන්නම් ප්‍රශ්නයක් නැහැ කියලා. ඊට පස්සේ මොනවත් නැහැ.

ප්‍ර : දැන් තමන් ඔය 778469250 කියන දුරකථන අංකයෙන් යාසිම් බාවා අබ්දුල් රවුෆ්ට කතා කරලා තියෙනවද? ඒ දුරකථන අංකය ඔහු පාවිච්චි කරන කොට ඔහුට ඔහු අමතන්න තමන් මේ නම්බර් එකට කතා කරලා තියෙනවද?

පි : අර 250 අංකය, ඒ දවස්වල මම කතා කරලා තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ ඔහු තමයි මේ දුරකථනය පාවිච්චි කලේ කියලා තමන් ඒ අනුව දන්නවද?

පි : ඔව් දන්නවා.

ප්‍ර : දැන් තමන් අර කියපු ලියුම බිල ගෙව්වේ නැත්නම් disconnect කරනවා , බිල රුපියල් 5053 යි ශත 67 ක මුදලක් ගෙවන්න කියලා ආපු ලියුම මේ අවස්ථාවේදී මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද තමන්ට?

පි : ඉදිරිපත් කරන්න පුළුවන්.

**<u>එම අදාල ලේඛනය 2018.03.17 දින දරන කළමනාකරු ඩයලොග් ආයතනය වෙතින් මෙම සාක්ෂිකරු වෙතට එවා ඇති</u>**

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**<u>එකී ලිපිය IMJ 1 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනු ලබනවා.</u>**

ප්‍ර : ජිෆ්රි නැවත තමන්ගේ ලේඛනය බලලා කියන්න තමන් 2008.12.12. වෙනිදා ඒ ඩයලොග් ආයතනයෙන් ලබා ගත්ත දුරකථන අංකය කොලේ බලලා කියන්න? බින්දුත් එක්ක කියන්න?

පි : 077-8469250.

**********

**<u>ගරු බන්දුල අතපත්තු මැතිතුමා:</u>**

ප්‍ර : තමුන් කලවංචිකුඩි ගිහිල්ලා තියෙනවද?

පි : කලවංචිකුඩිද සර්.

ප්‍ර : කාත්තන්කුඩි?

පි : කාත්තන්කුඩි ගිහිල්ලා තියෙනවා සර් ගොඩක්. හයර් එක ගිහිල්ලා තියෙන්නේ ගොඩක්.

ප්‍ර : කොච්චර දුරද තමුන්ගේ කඳුරුවෙල ඉදලා?

පි : කඳුරුවෙල ඉදලා සර් දන්නේ නැහැ සර් හරියට කියන්න. දන්නේ නැහැ.

ප්‍ර : කොච්චර වෙලා යනවද?

පි : පැය 2 ½ ක් 3 කින් විතර යන්න පුළුවන් සර්.

ප්‍ර : එතකොට දැන් එහේ තමුන්ගේ නෑදෑයෝ ඉන්නවද?

පි : ඔව් සර්.

ප්‍ර : කවුද ඉන්නේ නෑදෑයෝ?

පි : නෑදෑයෝ ඉන්නේ රවුෆ් තමා.

ප්‍ර : රවුෆ්ගේ පවුලේ කට්ටිය ඉන්නවද එහේ?

පි : ඔව් පවුලේ කට්ටිය ඉන්නවා.

ප්‍ර : දැන් රවුෆ් කොහේද ගියාද දන්නේ නැති වුණාට පස්සේ පවුලේ කට්ටිය ඊට පස්සේ ගියේ නැද්ද කොහේවත් එයාව බලන්න?

පි : එයාලා ගිහිල්ලා ඇති සර්, මම ගියේ නැහැ ඊට පස්සේ එයාගේ ගෙදර ගියේ නැහැ මම.

ප්‍ර : දැන් ඒ කඩේ කවුද කරන්නේ?

පි : කඩේ දැන් නැහැ සර්. ඒ දවස්වලම වහලා කඩේ. 2008 ම, මාස 6 ක් විතර වැඩ කළා. ඊට පස්සේ අවුරුදු 2 කින්ද, 1 ½ කින්ද පස්සේ එයාලා ඒජන්සිය වහගෙන ගියා.

**********

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>**

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අවශ්‍යද යන්න අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසමි. අවශ්‍ය නොමැති බව දන්වයි.

මෙම සාක්ෂිකරු කඳුරුවෙල සිට මෙම කොමිෂන් සභාවේ සාක්ෂි ලබාදීම සඳහා පැමිණ ඇති බව දන්වා ඇති හෙයින් නීතියට අනුව ඔහුට ගෙවිය යුතු දීමනාව ගෙවන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් දැක් වූ සහයෝගයට සාක්ෂිකරුට ස්තූති කරමි.

සාක්ෂිකරු මුදා හරිමි.

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය:</u>**

මේ අවස්ථාවේදී ගෞරවයෙන් සැළකර සිටින්නේ 2020.06.19 වන දින පොලිස් පරීක්ෂක නිශාන්ත ප්‍රභාත් කස්තුරිආරච්චි යන නිලධාරියා සාක්ෂි ලබා දීමේදී බෝම්බයක් පරීක්ෂා කිරීමට, අත්හදා බැලීමට යන අවස්ථාවේදී එය පිපිරී යන අවස්ථාවේදී එම පුද්ගලයාව අරගෙන යන්නේ ඔල්ලිකුලම්හි මේ රවුල් කියන පුද්ගලයාගේ ඉඩමට වශයෙන් සාක්ෂි ලබා දී ඇති බවට ගරු කොමිෂන් සභාවේ අවධානයට ලක් කර සිටිනවා.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

## 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

**දිනය: 2020.07.09** **වෙලාව:- පෙ.ව.11.15**

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

**ගරු විනිසුරු මඩුල්ල:-**

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - **සභාපති**

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - **සාමාජික**

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - **සාමාජික**

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - **සාමාජික**

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - **සාමාජික**

**<u>පෙනී සිටීම:</u>**

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, දිලන්ත එස්. කළුදුරුවගේ,චතුරංග බණ්ඩාර සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>**

මෙම සාක්ෂිකරුද බුද්ධි අංශයේ ක්‍රියාවේ නියැලී සිටින සාක්ෂිකරුවෙක් බැවින් ඔහුගේ නම අනාවරණය නොකරන ලෙසට කොමිෂන් සභාවේ මාධ්‍යයට ඉල්ලීමක් කරනවා.

**සම්පූර්ණ නම : සුබසිංහ ආරච්චිගේ ජිනෙත් කමිල සුබසිංහ**
**වයස : අවුරුදු 43 යි,**
**ජාතිය : සිංහල,**
**ආගම : බෞද්ධ,**
**තනතුර :දැනට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙක් වශයෙන් කටයුතු කරනවා. ශ්‍රී ලංකා යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ.**

**<u>ප්‍රතිඥා දී කැඳවයි.</u>**

**<u>අතිරේක සොලිසිටර් ජනරාල්,ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>**

ප්‍ර : සුබසිංහ මහත්මයා ඔබ යුධ හමුදාවට බැඳුනේ කවදාද?
පි : මම 1999 වර්ෂයේ යුධ හමුදාවට බැඳුනා ස්වාමිණි.
ප්‍ර : මොන තනතුරකටද?
පි : කැඩේට් නිලධාරී වශයෙන් බැඳිලා, ඊට පස්සේ 2001 දී අධිකාරී ලැබුවා 2 වන ලුතිනල් ධුරයට ස්වාමිණි.
ප්‍ර : ඔබ මේ වන විට සේවය කරන්නේ මොන තනතුරකද?
පි : දැනට මගේ නිළය මේජර් තනතුරේ තමයි තියෙන්නේ ස්වාමිණි. දැනට ශ්‍රී ලංකා යුද්ධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරියකු වශයෙන් කටයුතු කරනවා ස්වාමිණි.
ප්‍ර : ඒ කවදා ඉදලද?
පි : යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරියකු වශයෙන් 2020 ජනවාරී මස 05 වෙනිදා සිට සේවය කරනවා ස්වාමිණි.
ප්‍ර : ඔබ යුධ හමුදාවේ බුද්ධි අංශයට බැඳුනේ කවදා ඉදලද?
පි : යුධ හමුදා බුද්ධි අංශයට බැඳුනේ 2001 දෙසැම්බර් මාසේ 05 තමයි මම එම සන්නද්ධ හමුදා බුද්ධි බලකායට බැඳුනේ ස්වාමිණි. නමුත් මම commission වුනෙත් ඉඳුරාම සන්නද්ධ හමුදා බුද්ධි බලකායට තමයි මම 2001 ජුනි මස 30 වෙනිදා මාව අධිකාරයට පත් කළේ ස්වාමිණි.
ප්‍ර : එහෙම නම් ඔබට දේශිය පුහුණුව ලැබෙන්න ඇති එම ක්ෂේත්‍රයේ?
පි : එසේය ස්වාමිණි.
ප්‍ර : මොන වගේ පුහුණුවක්ද ඔබට ලැබුණේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මම බුද්ධි අංශයේ නිලධාරියකු වශයෙන් මගේ මූලික බුද්ධි පුහුණු පාඨමාලාව සහ අනෙකුත් අදාල බුද්ධි පුහුණු පාඨමාලා මම දේශීය වශයෙන් හදාරලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර : විදේශීය වශයෙන්?

පි : විදේශීය වශයෙනුත් මම පාඨමාලා කිහිපයකට සහභාගී වෙලා තියෙනවා ස්වාමිණි. විශේෂයෙන්ම පකිස්ථානයේ තිබ්බා Counteract Terrorism පාඨමාලාවට සහභාගී වෙලා තියෙනවා. අනිත් එක පකිස්ථානයේ තිබ්බ විදේශ උසස් බුද්ධි පාඨමාලාවලටද ස්වාමිණි මම සහභාගී වෙලා තියෙනවා. ඊට අමතරව චීනයෙත් මම බුද්ධි පාඨමාලවකට සහභාගී වෙලා තියෙනවා ස්වාමිණි.

ප්‍ර : ඔබ එතකොට ගරු කොමිෂන් සභාවට සඳහන් කළා මේ වන විට ඔබ සම්බන්ධ වෙලා ඉන්නවයි කියලා ජාතික බුද්ධි ප්‍රධානීන්ගේ කාර්යාලයට නේද?

පි : මම ජාතික බුද්ධි ප්‍රධානී කාර්යාලයට සේවයට ගියේ 2017 වර්ෂයේ අගෝස්තු මාසේ මට මතක හැටියට 3 වෙනිදා. එසේ සිට මම 2019 අගෝස්තු මාසේ 5 වෙනිදා දක්වා අවුරුදු 2 ක් ඉඳුරාම ජාතික බුද්ධි ප්‍රධානී කාර්යාලයේ මාණ්ඩලික නිලධාරියෙක් වශයෙන් සේවය කළා ස්වාමිණි.

ප්‍ර : 2019 කවදා වෙන කල්ද?

පි : 2019 අගෝස්තු 5 වෙන කල්. ඒ කියන්නේ ස්වාමිණි මම පකිස්ථානයේ තිබ්බ උසස් පාඨමාලාවට යන්න ඉස්සෙල්ලා ඒ අවුරුදු 2 සේවය කළා.

ප්‍ර : ඊට පස්සේ මොකද වුණේ?

පි : ඊට පස්සේ මම පකිස්ථානයේ School of Military Intelligence වල තියෙන උසස් බුද්ධි පාඨමාලවක් මාස 5 ක් හැදෑරුවා. ඊට පස්සේ තමයි මම නැවත දැනට සේවය කරන බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරියකු වශයෙන් සේවය කරන්නේ ස්වාමිණි.

ප්‍ර : ඒ ආකාරයට හොඳයි, දැන් ඔබ ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලයට අනුයුක්ත වෙලා සිටි අවදියේදී කර්නල් මහතන්තිල ඔබත් සමඟ එහි සේවය කළාද?

පි : එසේයි ස්වාමිණි.

ප්‍ර : ඔබට එහිදී පැවරිලා තිබුණේ මොන වගේ රාජකාරි ද?

පි : මට සාමාන්‍යයෙන් බොහොම විශේෂ රාජකාරී කිහිපයක් විෂයන් වශයෙන් මට පැවරිලා තිබුණා ස්වාමිණි.

ප්‍ර : මොනවද ඒ විෂයන්?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඉදිරිපත් කරන්නම්. මට විශේෂ රාජකාරි කිහිපයක් මට පැවරිලා තිබුණා ස්වාමිණි. ඒකෙන් පළවෙනි එක තමයි National Border Management Committee එක. ජාතික පත්‍යන්ත කළමනාකරණ මණ්ඩලයේ ඒ සියළුම අපේ තියෙන ජාතික බුද්ධි ප්‍රධානී වෙනුවෙන් මට සම්බන්ධීකරණය කිරීමට හේතුව තමයි ඒ කමිටුවේ සභාපති හැටියට ඉන්නේ ජාතික ආරක්ෂක ලේකම්තුමා. ඒක පලවෙනි එක ස්වාමිණි.

දෙවෙනි එක තමයි National Civil Aviation Security Committee එක. ජාතික සිවිල් ගුවන් සේවා ආරක්ෂක මණ්ඩලයේ ඒ සියළුම දේවල් මට සම්බන්ධීකරණය කරන්න මට භාරදීලා තිබුණා ස්වාමිණි. ඒකෙත් සභාපති හැටියට ඉන්නේ ආරක්ෂක ලේකම්තුමා ස්වාමිණි.

තුන්වෙනි එක එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කමිටු සම්මුති 1267, 1373, 1540,1718, 2233 අන්න ඒ Regulation ලංකාවේ නැත්නම් ඒ ප්‍රඥප්ති ලංකාවේ ක්‍රියාත්මක කිරීමට නම් ස්වාමිණි ඒකේ නිසි බලධාරියා වශයෙන් පත් කරලා තියෙන්නේ ආරක්ෂක ලේකම්තුමා. ඉතින් ඒ ආරක්ෂක ලේකම්තුමා ඒ වගකීම් ජාතික බුද්ධි ප්‍රධානීතුමාට බාර දීලා තිබ්බා. ඒ අනුව ඒ සියළුම දේවල් Coordinate කරන්න නැත්නම් සම්බන්ධීකරණය කරන්න ස්වාමිණි මට පැවරිලා තිබ්බා.

ඊලඟ එක තමයි BIMSTEC Bay of Bengal Initiative for Multi Sectorial Technical and Economic Corporation කියන එක. ඒ සම්මේලනයේ ලංකාව වෙනුවෙන් මම කටයුතු කළා ස්වාමිනි.

ඊට අමතරව එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිෂම සම්බන්ධයෙනුත් ඒ දෙක අපිට භාර දීලා තිබ්බා ස්වාමිණි ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලයට. ඒකෙත් මම සේවය කළා.

ඊට අමතරව විශේෂයෙන්ම අපි අඟහරුවාදා පැවැත්වෙනවා ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැත්වෙනවා සතිපතා බුද්ධි සමාලෝචන වාර්තාව. Weekly Intelligence Coordinating Meeting. ඒකේ සියළුම දේවල් කියන්නේ ඒකේ Minutes ගන්න එක, එත් එක්කම ප්‍රචාරය කිරීම, බෙදා හැරීම, සහ ඒගොල්ලන්ට අදාල stakeholders ට එන්න කියන එක වශයෙන් ඒ රාජකාරී ටික මට පැවරිලා තිබ්බා.

ප්‍ර : ඔබ දුන්න පිළිතුර අනුව පෙනී යනවා ඔබට වගකීම් සම්භාරයක් පැවරිලා තිබුණ බව?

පි : එසේය ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් අපේ අවධානය අපි යොමු කෙරුවොත් අර බුද්ධි සමාලෝචන රැස්වීම් පිළිබඳව?

පි : ස්වාමිණි මම අවසරය පතනවා ඒක විස්තරාත්මකව යම්කිසි වෙලාවක ඉදිරිපත් කරන්න. ඒක ස්වාමිණි සෑම අඟහරුවාදාවකම ගරු ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැත්වෙනවා. එතකොට මේකේ ඉන්නවා ජාතික ආරක්ෂාවට ඉඳුරාම බලපාන stakeholders ලා.

ප්‍ර : ඒ කවුද?

පි : පළවෙනි එක්කෙනා තමයි ස්වාමිණි ගරු ආරක්ෂක ලේකම්තුමා. ඊට පස්සේ Chief of National ඒ කියන්නේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිතුමා. ඊට පස්සේ යුද්ධ හමුදාපතිතුමා, ඊට පස්සේ ගුවන් හමුදාපතිතුමා, නාවික හමුදාපතිතුමා ඊට පස්සේ ගරු පොලිස්පතිතුමා, ඊට පස්සේ ජාතික බුද්ධි ප්‍රධානී Chief of National Intelligence ඊට අමතරව ස්වාමිණි ආරක්ෂක ලේකම්තුමාගේ උපදෙස් මත අපි CID Director, TID Director යම් අවස්ථාවක STF Director සහ ඊට අමතරව ස්වාමිණි අපි ගුවන් අංශයේ ගුවන් Intelligence Director ඒත් එක්කම Naval Intelligence Director කියන අන්න ඔය stakeholders ටික අනිවාර්යයෙන් ම අඟහරුවාදා ආරක්ෂක අමාත්‍යාංශයේ එක්රැස් වෙනවා උදේ 10 ට.

ප්‍ර : මගේ අවධානයෙන් ගිලිහුනාද දන්නේ නැහැ ඔබ සඳහන් කෙරුවා ද එම රැස්වීමට සහභාගී වෙනවද කියලා රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා?

පි : එසේයි. ඒක මට එතන මඟහැරුනා ස්වාමිණි. අනිවාර්යයෙන්ම ජාතික බුද්ධි SIS එකේ Director. ඒත් එක්කම DMI ඒ දෙන්නා අනිවාර්යයෙන්ම මේකට සහභාගී වෙනවා ස්වාමිණි.

ප්‍ර : එතකොට දැන් ඔය රැස්වීමට මොන වගේ වැදගත්කමක්ද ලැබෙන්නේ ඔබේ රාජකාරී කටයුතු තුළදී?

පි : ස්වාමිණි මේක ඉතාමත්ම වැදගත් රැස්වීමක්. හේතුව මේක දෙවෙනි වෙන්නේ National Security Council එකට විතරයි ස්වාමිණි මගේ දැනුමේ හැටියට.

ප්‍ර : ජාතික ආරක්ෂක මණ්ඩලයට?

පි : ජාතික ආරක්ෂක මණ්ඩලයට විතරයි දෙවෙනි වෙන්නේ. හේතුව මෙතන නැත්තේ අතිගරු ජනාධිපතිතුමා හා ගරු අගමැතිතුමා විතරයි ස්වාමිණි මෙතන නැත්තේ මගේ දැනුමේ හැටියට. ඉතින් මේක ඉතාමත්ම වැදගත් රැස්වීමක් සම්පූර්ණ ජාතික ආරක්ෂාවේ කටයුතු මේකෙන් ඉදිරිපත් වෙන්න නියමිතයි ස්වාමිණි මෙතන

FAIR COMMENT BY JEZEEM

සාකච්ජා කරලා ජාතික ආරක්ෂක කවුන්සලයට තමයි බොහෝ වෙලාවට මේ කරුණු project වෙන්නේ නැත්නම් ඉදිරිපත් කිරීමට නියමිත වෙන්නේ. එම නිසා මම මේක ඉතාමත් ම වැදගත් සාකච්ජාවක් ලෙස සලකනවා ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ ඉතාම දැඩි බරක් ඔබේ පිළිතුරේ යෙදුවා මේ රැස්වීමේ තියෙන වටිනාකම ගැන හඟවන්න?

පි : එසේයි ස්වාමිණි.

ප්‍ර : එහෙම නම් යම් විධිමත් විදියකට වෙන්න ඕනනේ ඔය රැස්වීම පවත්වන්නේ?

පි : එසේයි ස්වාමිණි.

ප්‍ර : සාමාන්‍යයෙන් රැස්වීමක කරන විදියට එතකොට ඔය බුද්ධි සමාලෝචන රැස්වීමේදීත් ඒ සඳහා න්‍යාය පත්‍රයක් සකස් වෙනවද?

පි : එසේයි ස්වාමිණි. මේ න්‍යාය පත්‍රය ඉතාමත්ම වැදගත් ස්වාමිණි. මේ න්‍යාය පත්‍රය සකස් කෙරෙන්නේ අපිට එනවා එක එක බුද්ධි වාර්තා ස්වාමිණි.

ප්‍ර : කාගෙන්ද ලැබෙන්නේ?

පි : අපිට ලැබෙනවා ජාතික State Intelligence Service එකෙන්. ඒත් එක්කම අනෙකුත් බුද්ධි ආයතනවලින් අපිට රහස්‍ය වාර්තා ලැබෙනවා. ඒක පලවෙනි එක. දෙවෙනි එක ස්වාමිණි ඒ සාකච්ජාව අපි හිතමුකෝ කලින් සතියේ සාකච්ජාවේදි එක එක කරුණු මතු වෙනවා. ඒ කරුණුත් අපි සමාලෝචනය කිරීමට අවශ්‍යයි. අන්න ඔය කියන කරුණු දෙක මත්තේ ස්වාමිණි මේකේ Agenda එක නැත්නම් අපි මේක කරන්නේ කොහොමද කියන එක සකස් කරනවා ස්වාමිණි.

ප්‍ර : දැන් එහෙම සකස් කරන කොට ඔබ කිව්වා ඔබලා වෙත ලැබිලා තියෙන තොරතුරු තමයි ඒ සඳහා උපයෝගී කර ගන්නේ කියලා?

පි : එසේයි ස්වාමිණි.

ප්‍ර : ඒ හැරෙන්නට ඔබ විසින් සඳහන් කරනු ලැබූ ඔය බුද්ධි සමාලෝචන රැස්වීමට සහභාගී වන කිසියම් හෝ පාර්ශවයකට රැස්වීමට පුර්වයෙන් පුළුවනකම තියෙනවද යම් විශේෂ කරුණක් ඔවුන් හිතනවා නම් වැදගත් කියලා සාකච්ජා කරන්නට මේ රැස්වීමේදී ඒ සම්බන්ධයෙන් න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සඳහා ඔබලා වෙත දැනුම් දෙන්නට?

පි : එසේයි ස්වාමිණි. ඒකට කිසිම බාධාවක් නැහැ, මොනවා හරි බුද්ධි අංශයක් හිතනවා නම් මෙන්න මේ කාරණය මෙන්න මේ රැස්වීමේ සාකච්ජා කරන්න පුළුවන් කියලා ඒක ඉදුරාම ජාතික බුද්ධි ප්‍රධානී තුමා වෙත දැනුම් දුන්නොත් ඒක Agenda එකට ඇතුලත් කිරීමේ සම්පුර්ණ හැකියාව තිබ්බා ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මේ න්‍යාය පත්‍රය පිළියෙල කිරීමේදී ඔබට දැඩි කාර්යය භාරයක් පැවරිලා තිබුණා කියලා මා කීවතින් නිවැරදි ද?

පි : එසේයි ස්වාමිණි.

ප්‍ර : ඔබගේ එම කටයුතු අධීක්ෂණය කිරීම කර්නල් මහතන්තිල මහතාගෙන් සිදු වුණාද?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඒ න්‍යාය පත්‍රය පිළියෙල කරන කොට ජාතික බුද්ධි ප්‍රධානීගේ උපදෙස් ලබා ගැනීමත් සිදු වෙනවද?

පි : එසේයි ස්වාමිණි. ඒක මම Draft එකක් හැටියට ඒක පිළියෙල කියන්නේ කෙටුම් පතක් හැටියට ස්වාමිණි ඒක පිළියෙල කරලා මම එතන මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වශයෙන් කටයුතු කරපු නිලධාරීට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එතුමා ඒක ජාතික බුද්ධි ප්‍රධානීතුමා වෙතට ඉදිරිපත් කරනවා කෙටුම්පත. ඉන් අනතුරුව ජාතික බුද්ධි ප්‍රධානීතුමා බොහෝ අවස්ථාවල ඒක ගරු ආරක්ෂක ලේකම්තුමා වෙතට ඉදිරිපත් කිරීමෙන් අනුව අවසරය ලබා ගැනීමෙන් පසු අපි ඒක අවසන් Agenda එක හැටියට ස්වාමිණි ඒක Finalize කරනවා ස්වාමිණි.

ප්‍ර : ඔබ 2017 ඉදලා 2019 දක්වා මෙම කාර්යාලයේ රාජකාරී කරන කොට ජාතික බුද්ධි ප්‍රධානී විදියට කටයුතු කළේ කුමන නිලධාරියෙක්ද?

පි : සිසිර මෙන්ඩිස් මහත්මයා.

ප්‍ර : ඔබට ඔහු සමඟ සමීපව කටයුතු කරන්න අවස්ථාව ලැබුණද?

පි : එසේය ස්වාමිණි. ඉතා සමීපව කටයුතු කරන්න අවස්ථාව ලැබුණා.

ප්‍ර : ඒ අවස්ථාවේදි ඔහු සමඟ යමක් සාකච්ඡා කරලා ඔහුට කරුණු අවබෝධ කරදීමේ හැකියාවක් තිබුණද නැද්ද කියන එක ඔබ පෞද්ගලිකව නිරීක්ෂණය කරලා තියෙනවද?

පි : එසේය ස්වාමිණි. මම මගේ කැඩේට් නිලධාරී කාලය හැර ස්වාමිණි වසර 20 ක් මම සන්නද්ධ බුද්ධි බලකායේ විවිධ මට්ටම්වල බලසේනාවක බුද්ධි නිලධාරී, සේනාංක බුද්ධි නිලධාරී, ඒත් එක්කම බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ බුද්ධි නිලධාරී වශයෙන් මම විවිධ තැන්වල ඉඳුරාම ground එකේ නැත්නම් භූමියේ සේවය කර තිබෙනවා ස්වාමිණි. ඒක නිසා මට ඉතාම පහසුවක් වුණා එතුමාට ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් කරුණු එතුමාගේ තියෙන අත්දැකීම් අනුව එතුමට ඉදිරිපත් කිරීමට ස්වාමිණි..

ප්‍ර : නමුත් සිසිර මෙන්ඩිස් මහත්මයා ඒ කියන්නේ නියෝජ්‍ය පොලිස්පතිතුමාට බුද්ධි අංශය පිළිබඳව කිසියම් අත්දැකීමක්

Presidential Secretariat's Copy
LEAK COMMENT BY JEZEEM

තිබුණද නැද්ද කියන කරුණ පිළිබඳව ඔබට අවබෝධයක් ලැබුණද ඒ රාජකාරී කාලය තුළ?

පි : ස්වාමිණි මම ඇත්තවශයෙන්ම සිසිර මෙන්ඩිස් මහතා යටතේ ප්‍රකාශ කළා වගේ අවුරුදු 2 ක කාලයක් ඉදුරාම සේවය කළා. ඉතින් එතුමා මම දැකපු පුද්ගලිකව ස්වාමිණි ඉතා විශිෂ්ඨ ගනයේ ඉතාම හොඳ නිලධාරියෙක් ඒක පළවෙනි එක. දෙවෙනි එක තමයි ස්වාමිණි මම ඉදිරිපත් කරන කරුණු එතුමාගේ මම හිතන්නේ අවුරුදු 30 ට හෝ 35 ට වැඩි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක දක්වා සේවය කිරීමෙන් ඉතා විශාල අත්දැකීම් සම්භාරයක් තිබුණා. විශේෂයෙන්ම ස්වාමිණි දැන් අපි හමුදා නිලධාරියෙක් වශයෙන් අපි ගොඩක් වෙලා නීති සම්බන්ධයෙන් අපි ගැටෙන්නේ නැහැ විශේෂයෙන්ම උසාවි වගේ දේවල් වලට ස්වාමිනි. ඉතින් ඒවත් එක්ක එතුමාගේ මට බොහෝ වෙලාවට අවවාද ලැබුණා මේ දේවල් සාකච්ජා කරන්න හා ඉදිරිපත් කරන්න. එතුමාගේ තිබ්බ පරිචය ඉතා විශාලයි කියලා මට නිසැකවම කියන්න පුළුවන් ස්වාමිණි.

ප්‍ර : දැන් මම අදහස් කලේ මගේ ප්‍රශ්නයෙන් බුද්ධි කටයුතු කියලා කියන්නේ ඔබ පුහුණුව දේශිය සහ විදේශියව පුහුණුව ලබලා තියෙනවා. එතකොට බුද්ධි කටයුතු වලදි ඒක වෙනම විෂය ක්ෂේත්‍රයක් විදියට අරගෙන හැදෑරීමක් කලයුතු දෙයක් නේ?

පි : එසේයි ස්වාමිණි.

ප්‍ර : අන්න ඒ පුහුණුව, ඒ පරිචය, ඒ පුරුද්ද නියෝජ්‍ය පොලිස්පති සිසිර මෙන්ඩිස් මහත්තයට තිබුනේ නැහැනේ නේද ඔබට තරමටම තිබුණද?

පි : ඔව් ස්වාමිණි, Intelligence මම හිතන්නේ මෙතන ආපු ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් බහුතරයක් සහභාගී වුණු බවට මම මාධ්‍යවලින් දැක්කා ස්වාමිණි. ඉතින් මම හිතන්නේ ඔබතුමාලට ඒ නිලධාරින්ගෙන් බොහෝ කරුණු බුද්ධි අංශයක් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා මම හිතන්නේ ඉදිරිපත් වෙන්න ඇති. එතකොට අහපු ප්‍රශ්නෙට ස්වාමිණි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන්නේ යම්කිසි දෙයක් වුණාට පස්සේ. Investigation නමුත් බුද්ධි අංශයක් කියන්නේ Intelligence. එතකොට බුද්ධි අංශයක තිබෙන ප්‍රධාන කාර්යය භාරය තමයි අණ දෙන්නාට හෝ එතන ප්‍රධානියාගේ සැකය ඇති කිරීම. එතකොට ඒක තියෙන්න ඕනේ සිද්ධියක් වෙන්න කලින්. එතන ඇත්ත වශයෙන් ස්වාමිණි එතන වෙනසක් තිබෙනවා. නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වසර 35 ක සේවා කාලයක් කරපු නිසා මට බොහෝ වෙලාවට ස්වාමිණි මට

FAIR COMMENT BY JEZEEM

හැඟීගියා එතුමට විශාල පරිවයක් තිබ්බා අපෙන් අපි විශේෂයෙන් බුද්ධි නිලධාරී වශයෙන් මේක මෙහෙයවගෙන අපෙනුත් ඒ දේවල් අහගෙන කරගෙන යන්න කියන හැඟීම තමයි ස්වාමිණි මට තියෙන්නේ.

ප්‍ර : ඒකෙන් ඔබ අදහස් කරනවද නියෝජ්‍ය පොලිස්පති සිසිර මෙන්ඩිස් මහත්මයා එවකට ජාතික බුද්ධි ප්‍රධානී ඔහුට බුද්ධි කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදි උපදෙස් දීමට ඔබලාට හැකියාව තිබුණා කියලා?

පි : එසේයි ස්වාමිණි.

ප්‍ර : ඔබලා දුන්න උපදෙස් ඔහු විසින් භාර ගත්තද?

පි : එසේයි ස්වාමිණි.

ප්‍ර : භාර අරගෙන ඔහු ඒවා ක්‍රියාත්මක කෙරුවද?

පි : එසේයි ස්වාමිණි.

ප්‍ර : ඔය කියන්නේ ඔබේ අත්දැකීමද?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඔබලා යම් අවස්ථාවකදී ජාතික බුද්ධි ප්‍රධානී ලෙස කටයුතු කරපු සිසිර මෙන්ඩිස් මහත්මයට උපදෙස් දුන්නද?

පි : බොහෝ අවස්ථාවල ස්වාමිණි.

ප්‍ර : උපදෙස් දුන්නද ඔබ සඳහන් කරපු සතියකට වරක් පැවැත්වෙන බුද්ධි සමාලෝචන රැස්වීමේ ඒ නියමිත දිනය හරි වෙලාවට හරි පෙර ආරක්ෂක ලේකම්වරයා සමඟ යම් යම් කරුණු පිළිබඳව පෞද්ගලිකව සාකච්ඡා කරන්න කියලා?

පි : එසේය ස්වාමිණි. අපි බුද්ධි නිලධාරීන් වශයෙන් ස්වාමිණි අපිට බොහෝ තොරතුරු ඒ ජාතික බුද්ධි Service එකෙන් සහ හමුදා බුද්ධි අංශයෙන් සහ අනෙකුත් බුද්ධි අංශයෙන් ලැබෙනවා ස්වාමිණි. මෙවා අධීක්ෂණය කරලා නිරීක්ෂණය කරලා අපි ජාතික බුද්ධි ප්‍රධානීතුමා වෙත අපගේ අදහස් සහ යෝජනා මෙන්න මේ කියන කාරණය වැදගත් ඉදිරිපත් කරන්නේ කියන එක ස්වාමිණි අපි එතුමාට ඉදිරිපත් කර මෙන්න මේ කියන කාරණය අපි ජාතික මෙතන තියෙන Weekly Intelligence Coordinating Conference එකේ සාකච්ඡා කළා ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ අනුව එතුමාට කාලය ලබා ගන්න පුළුවන් වුණාද ආරක්ෂක ලේකම්වරුන්ගෙන් මේ ආකාරයට නියමිත රැස්වීම් වාරයට පෙර මේ කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න? ඔබ දන්නවද ඒ ගැන?

පි : ස්වාමිණි එතන විශාල ප්‍රශ්නයක් තිබ්බා ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ප්‍රශ්නය?

FAIR COMMENT BY JEZEEM

පි : අපි දැක්කා මේ බුද්ධි, අපි රාජකාරී කරපු හැටියට ස්වාමිනි මේ කරුණු අපි ඉදිරිපත් කරන කරුණු ගරු ආරක්ෂක ලේකම්තුමාට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් එතන විශාල ගැප් එකක් නැත්නම් හිඩැසක් තිබ්බා ස්වාමිනි. මේ සම්බන්ධයෙන් අපි එතන මාණ්ඩලික නිලධාරීන් වශයෙන් බොහෝ අවස්ථාවල විශේෂයෙන්ම මම ස්වාමිණි මට පුද්ගලිකව කියන්න පුළුවන් බොහෝ අවස්ථාවලදී අපි ජාතික බුද්ධි ප්‍රධානීතුමාව press කළා නැත්නම් පීඩනයකට ලක් කළා සර් මේ ටික ඉදිරිපත් කරන්න, මෙන්න මේ ටික ඉතාම අවශ්‍යයි ඉදිරිපත් කරන්න කියලා.

ප්‍ර : ඔහු ඔබලාගේ උපදෙස් පිළිගත්තද?

පි : එසේයි ස්වාමිණි, බොහෝ වෙලාවට එතුමා ඒ අපි දුන්න ඒ files ටික නැත්නම් ඒ තොරතුරු හදාගෙන බොහෝ අවස්ථාවල එතුමා ගරු ආරක්ෂක ලේකම්තුමාන්ලා හම්බ වෙන්න ගියා. නමුත් මම ප්‍රායෝගිකව දුටුවා ස්වාමිණි යම් තිබ්බ කාර්යය භාරයන් සහ එතුමන්ලා පැවති වගකීම් ඇතුලතදී මෙන්න මේ කියන තොරතුරු එතුමාට පුද්ගලිකව හම්බ වෙලා කතා කිරීමට අවස්ථා නොලැබුණ අවස්ථා බොහෝ තිබ්බා ස්වාමිණි. මම කරුණක් ඉදිරිපත් කිරීමට කැමතියි ස්වාමිණි මම ඇත්ත වශයෙන්ම පුද්ගලිකව යෝජනා කරලා තිබ්බා අඩුගානේ සතියකට දෙවතාවක් හෝ එක් වතාවක් අඩුගානේ පැයක හෝ පැය 1 ½ ක වගේ කාලයක් ක අපිට ජාතික බුද්ධි ප්‍රධානී කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්ට ලබා දෙන්න කියලා ජාතික බුද්ධි ප්‍රධානී තුමත් එක්ක ගිහිල්ලා පුද්ගලිකව ගරු ආරක්ෂක ලේකම්තුමාට අපගේ විශ්ලේෂණයේ අපගේ Analysis එක එතුමාට ඉදිරිපත් කරන්න ගරු ආරක්ෂක ලේකම්තුමාට. නමුත් කිසිම අවස්ථාවක මම හිටපු අවස්ථාවක ස්වාමිණි එහෙම කිසිම දෙයක් අපිට ලැබුනේ නැහැ ස්වාමිණි.

ප්‍ර : ඒ තමයි ඔබගේ අත්දැකීම?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඔබේ පිළිතුරෙහි ඔබ වරක් සඳහන් කරනු ලැබුවා ආරක්ෂක ලේකම්වරුන් කියලා?

පි : එසේය.

ප්‍ර : ඇයි ඔබ එහෙම බහු වචනයෙන් කතා කළේ?

පි : හේතුව ස්වාමිණි මගේ කාලය ඇතුලත ආරක්ෂක ලේකම්වරුන් දෙදෙනෙක් යටතේ අපි සේවය කළා ස්වාමිනි.

ප්‍ර : ඒ කවුද?

පි : එකක් තමයි කපිල වෛද්‍යරත්න මහත්මයා, ඒත් එක්කම හේමසිරි ප්‍රනාන්දු මහත්මයා ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් අපි ඡායාරූප කිහිපයක් පෙන්නුවතින් ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

ස්වාමිනි ඒ සඳහා අවසර අයැදිනවා. අපි මේක Defense web site එකෙන් ගත්තේ.

( ඡායාරූප කිහිපයක් තිරයේ දිස්වීමට සලස්වයි)

ප්‍ර : අපි මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ තියෙන තිරයේ දක්වලා තිබෙනවා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරුන්?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : ඔබ කිව්වා ඔබගේ ධුර කාලය තුළදී ඔබ කපිල වෛද්‍යරත්න ජනාධිපති නීතිඥතුමා ලේකම් ධුරය දරන කාලෙත්, ඒ වගේම හේමසිරි ප්‍රනාන්දු මැතිතුමා ලේකම් ධුරය දරන කාලෙත් සේවය කෙරුවාය කියලා. මේ තිරයේ ඔවුන්ගේ රූප දැක්වෙනවා නේද?

පි : එසේය ස්වාමිණි.

ස්වාමිණි සාක්ෂිකරු විසින් හඳුනා ගනු ලැබූ එම අදාල ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරුන්ගේ ඡායාරූප දැක්වෙන එහි මුද්‍රිත පිටපතක් ඉදිරිපත් කරනවා. එම දර්ශනය ස්වාමිණි මුද්‍රිත පිටපත C838 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර : ඒ අනුව මා කිව්වොතින් නිවැරදි ද කපිල වෛද්‍යරත්න ජනාධිපති නීතිඥ මහතා 2017.07.06 වෙනිදා ඉදලා 2018 ඔක්තෝබර් මාසේ 30 වෙනිදා දක්වාත්, හේමසිරි ප්‍රනාන්දු මැතිතුමා 2018.10.30 වෙනිදා ඉදලා 2019 අප්‍රේල් මාසේ 25 වෙනිදා දක්වාත් මේ තනතුරේ රාජකාරී කරලා තියෙනවා කියලා?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඔබට නිරීක්ෂණය කරන්නට පුළුවන් වුණාද ඔබ සඳහන් කරපු ආකාරයට ඇයි මේ ලේකම්වරුන්ගෙන් ජාතික බුද්ධි ප්‍රධානීට මේ අවශ්‍ය කරුණු රැස්වීමට පෙර සාකච්ඡා කිරීම සඳහා අවස්ථාව නොලැබුනේ කියලා? දන්නව නම් විතරක් කියන්න?

පි : ස්වාමිණි මගේ දැනුමේ හැටියට ඇත්ත වශයෙන්ම එහෙම අවස්ථාවක් දෙන්න තිබ්බා ස්වාමිණි මගේ දැනුමේ හැටියට. මොකද ජාතික බුද්ධි ප්‍රධානී කියන්නේ ඕනම රටක ප්‍රධානම බුද්ධි අංශයේ ප්‍රධානියා. එතකොට ඒ අපගේ රාජ්‍ය ආරක්ෂක විශ්ලේෂණය කරද්දි එහෙම අවස්ථා ගිහිල්ලා තිබුණා. නමුත් අහපු ප්‍රශ්නෙකට උත්තර දීමක් වශයෙන් ස්වාමිණි මම හිතන්නේ එතුමන්ලාගේ රාජකාරියේ තිබුණ බොහෝ වෙලාවට වැඩිවීම නිසා නැත්නම් වෙනත් රාජකාරීවලට ප්‍රමුඛත්වයක් දීම නිසා අන්න ඒ කියන හේතු මත කෙසේ වුවත් ස්වාමිණි මේ අපගේ ඉල්ලීමට අවස්ථාවක් නොලැබෙන්න ඇති කියලා මම විශ්වාස කරනවා.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ ඔය කිව්ව බුද්ධි සමාලෝචන රැස්වීමට ඔබට සහභාගී වෙලා තියෙනවද?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඒ ධුර කාලය තුළදී රැස්වීම්වලට සහභාගී වුණා නේද? න්‍යාය පත්‍රය හැදුවා, රැස්වීම්වලට සහභාගී වුණා එතකොට ඒ රැස්වීමේදි සටහන් ලබා ගැනීමක් සිදු කරනවද?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : කවුද කරන්නේ?

පි : ඒක කරන්නේ මම ස්වාමිනි.

ප්‍ර : ඔබ තමයි ඒ සටහන් ලබා ගනු ලැබුවේ?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : එසේ ලබා ගනු ලබන සටහන් පරිඝණක ගත කරනවද?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඒවා භාරව ඔබ හිටියද?

පි : ඒ සටහන් ලබා ගැනීම, පරිඝණක ගතකිරීම, පරිඝණක ගත කිරීමෙන් පස්සේ කෙටුම් පත මගේ ඉහළින් ඉන්න බුද්ධි නිලධාරීන්ට ඉදිරිපත් කිරීමෙන් පසුව ඒක ජාතික බුද්ධි ප්‍රධානීතුමාට ඉදිරිපත් කිරීමෙන් පසුව ඒක ආරක්ෂක ලේකම්තුමාට ඉදිරිපත් කිරීමෙන් පසුව ඒවා බෙදා හැරීම දක්වා සම්පූර්ණ ක්‍රියාවලිය ස්වාමිණි මගේ භාරයේ තිබ්බේ ස්වාමිණි.

ප්‍ර : ඒ බෙදා හැරීම කරන්නේ කා වෙතද?

පි : බෙදා හැරීම කරන්නේ ඒ අදාල පුද්ගලයාගේ නමට තමයි ස්වාමිණි අපි බෙදා හරින්නේ. උදාහරණයක් වශයෙන් කිව්වොත් ස්වාමිණි

ප්‍ර : අදාල පුද්ගලයා කියලා ඔබ අදහස් කලේ?

පි : අදහස් කලේ ඒ රැස්වීමට සහභාගි වෙච්ච පුද්ගලයා. උදාහරණයක් විදියට මම කිව්වොත් එහෙම යුද්ධ හමුදාපතිතුමා. ඒ යුද්ධ හමුදාපතිතුමා නම් අපි යුද්ධ හමුදාපතිතුමාගේ මේක ඉතාමත් ටොප් සීක්‍රට් ඩොකියුමන්ට් එකක් ස්වාමිණි. මේක අපි යුද්ධ හමුදාපති තුමාගේ නමට සකස් කරපු ලියුමක්. ඒක සියල්ල ආරක්ෂක ක්‍රම අනුගමනය කරලා අපි යුද්ධ හමුදා මූලස්ථානය වෙත ස්වාමිණි බෙදා හරිනවා යුද්ධ හමුදාපතිතුමාගේ දැන ගැනීම සදහා ස්වාමිණි.

දැන් වේලාව : පෙ.ව. 11.50 යි

මෙතැන් සිට ල/ලේ :- යමුනා දසනායක මිය.

Presidential Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වෙලාව 11.50
පෙර සටහන් ධම්මිකා මිය
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක විසිනි.

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය.</u>**

ප්‍ර එතකොට ඒ කියන්නේ ඒ රැස්වීමට සහභාගි වුනාට පස්සේ ඒ රැස්වීමට සහභාගි වුන සියලුම සාමාජිකයින්ට නැවත මතක් කිරීමක් කරනවා ඔබලා විසින් ලබා දෙනු ලබන ඒ සටහන් මඟින් මොනවද එදින සාකච්ඡා කරනු ලැබුවේ කියලා ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර යම් හෙයකින් එහි අඩුපාඩුවක් තියෙනවා නම් ඒ පිළිබඳව ඔබලාට පෙන්නුම් කිරීමටත් ඔවුන්ට ඒ අනුව ඔබට හැකියාව තියෙනවානේ නේද ?

උ එසේය ස්වාමිනි Minute එකෙන් අදහස් කරන්නේ ඒ Minute එක record කරලා බොහෝ වෙලාවට ඒ Minute එක ඔබතුමාලා පරිශීලනය කලොත් පැහැදිලිව පෙනෙයි ඒකේ තියෙනවා අනු අංකය තියෙනවා සාකච්ඡා කරපු දේ තියෙනවා ඒකට වගකියන්න ඕනේ tasking කරපු එක්කනා තියෙනවා ඒත් එක්කම ස්වාමිනි එකේ remarks යටතේ ඉදිරි ක්‍රියා මාර්ග ය මොකක්ද කියලා ස්වාමිනි පැහැදිලිව තියෙනවා එතකොට ඒක අදාල පාර්ශවවලට පරිශීලනය කරලා ලෑස්ති වෙලා ඉදිරියේදි සාකච්ඡා වුනත් සහභාගි වෙන්නත් පුලුවන් ස්වාමිනි.

ප්‍ර පුලුවන්කම තියෙනවා දැන් ඒ වාගේම ඔබ කිව්වා දැන් ඔබලාට න්‍යාය පත්‍රය පිලියෙල කිරීමේදි එතෙක් ලැබිලා තියෙන තොරතුරු සලකලා බලලා ඒවා න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමට පියවර ගනු ලබනවා කියලා ?

උ එසේය.

ප්‍ර එතකොට මේ තොරතුරු ලැබෙන්නෙත් බුද්ධි අංශ වෙතින් කියලා ඔබ කිව්වා ?

උ එසේය

ප්‍ර එසේ ලැබෙන බුද්ධි අංශ මුල් තොරතුරක් විදියටද ලැබෙන්නේ එහෙම නැත්නම් යම් කාර්යයකට භාජනය වුනාට පස්සේද ලැබෙන්නේ ? Is it the basic information that you get or is there any development in that?

උ ස්වාමිනි මට අවසරය දෙන්න කොහොමද information එකක් නැත්නම් තොරතුරක් බුද්ධි තොරතුරක් බවට ඉතාම කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්න සුලු කාලයකින් ස්වාමිනි intelligence වල

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තියෙනවා ඉතාම සුලු කාලයකින් ප්‍රධාන වශයෙන්ම කොටස් හතරක්. steps හතරක් එකක් තමයි direction එක අණදීම දෙවනි එක collection එක තොරතුරු එක් රැස්කිරීම. තුන්වෙනි එක process ඒක විශ්ලේෂණයට භාජනය කිරීම හතරවැනි එක බෙදා හැරීම dissemination එතකොට ස්වාමීනි මගේ දැනුමේ හැටියට මං ඉගෙන ගත්ත ක්‍රමවේදය අනුව ඕනෑම බුද්ධි අංශයක් ලෝකයේ ප්‍රධාන වශයෙන්ම මෙන්න මේ කියන පියවර කීපය අනුගමනය කරනවා ස්වාමිනි . එතකොට පලවෙනි එකේ සිට අන්තිම එක දක්වා සෑම step පියවරක්ම අතිශය වැදගත් නමුත් අපි හිටියේ ආරක්ෂක අමාත්‍යාංශයේ ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලයේ . එතකොට මේකට ලැබෙන්නේ ස්වාමිනි බුද්ධි අංශ වලින් ලැබෙන තොරතුරු අපි හිතමු රාජ්‍ය බුද්ධි සේවය service එක හමුදා බුද්ධි අංශය හෝ වෙනත් බුද්ධි අංශයකින් ස්වාමිනි අපිට ලැබිය යුත්තේ information නෙමේ ස්වාමිනි intelligence මොකද හේතුව ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලය තියෙන්නේ ඒක process කරන්න නෙමේ ස්වාමිනි නැත්නම් විශ්ලේෂණය කිරීමක් කරන්න නෙමේ ඒක අපි ඒකට collate කරලා නැත්නම් එකතු කරලා ඒක ගරු ආරක්ෂක ලේකම්තුමාට ඉදිරිපත් කිරීම සඳහා තමයි ස්වාමිනි නැත්නම් coordinating කිරීම තමයි මෙතන ප්‍රධාන වශයෙන්ම තියෙන්නේ.

ප්‍ර මොනවද එකතු කරන්නේ ?

උ එකතු කිරීම කියන එකෙන් මම අදහස් කලේ ස්වාමිනි ඒත් ලැබෙන තොරතුරු අපි ගමු උදාහරණයක් ලෙස අපි ගමු ස්වාමිනි මුල LTTE එකෙන් කරන වාර්ෂිකව කෙරෙන මුල්ලවෙල්ලි වයික්කාල් සමරුව ස්වාමිනි දැන් අපිට මේක උදාහරණයකට ගත්තොත් ස්වාමිනි අපිට ජාතික බුද්ධි විසින් නැත්නම් SIS එකෙන් නැත්නම් DMI එකෙන් Air Force එකෙන් Navy එකෙන් පොලිස් විශේෂ කාර්ය බලකායෙන් ඕවගේ තොරතුරු මේ subject එකට මේ විෂයට ආපුහම අපිට තේරෙනවා මේ තොරතුරු එකට කරන්න . ඒ අපට තේරෙනවා ඒවගේ තියෙන සංදර්භය මොකක්ද කියලා ස්වාමිනි. ඒ ටික අපි collate කරලා තමයි ස්වාමිනි අපි ඉදිරිපත් කිරීමට නියමිතයි ජාතික බුද්ධි ප්‍රධානිතුමා හරහා මේකේ තියෙන ජාතික ආරක්ෂාවට බලපාන්නේ කොහොමද කියන එක ඒක අපි ඉදිරිපත් කිරීමක් කරනවා ස්වාමිනි.

ප්‍ර එතකොට අර ඔබ කියන එක processing කියන තත්වය ඒ ක්‍රියාව සිද්ධ වෙන්නේ මොන පියවරේද?

උ processing කියන එක නැත්නම් analysis එක වෙන්නේ බුද්ධි චක්‍රයේ 3 වෙනි පියවර එතකොට ඕනෑම බුද්ධි ආයතනයක ස්වාමිනි

FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලෝ ස්වාමිනි තොරතුරු හම්බ වෙන්නේ informant ලාගෙන් තොරතුරු කරුවන් මාර්ගයෙන් ලැබෙන්නේ තොරතුරු ඒක ඉතාමත් වැදගත් දෙයක් ඒක තෝරා බේරාගැනීම තොරතුරු. ඒ තොරතුරු එකතු කිරීම තමයි ස්වාමිනි collection නැත්නම් දෙවනි පියවරෙන් වෙන්නේ. එතකොට තොරතුරක් intelligence බවට පත් කරන්නෙත් 3 වෙනි පියවරේදි Process එතකොට අපිට තියෙන දත්ත විශ්ලේෂණ කරලා මේක තොරතුරක් බුද්ධි තොරතුරක් බවට නැත්නම් intelligence බවට පත් කිරීම තමයි ස්වාමිනි ප්‍රශ්ණයට උත්තරය හැටියට 3 වෙනි පියවරේ දි වෙන්නේ.

ප්‍ර කවිද ඒක කරන්නේ ?

උ ඒ බුද්ධි ආයතනය තමයි ස්වාමිනි අනිවාර්යයෙන් මේක ඒ process එක කරන්න ඕනේ ඒ ගොල්ලෝ උදාහරණයක් ගත්තොත් ස්වාමීනි ඕනෑම බුද්ධි ආයතනයකට තමන් ගේ Field Headquarters නැත්නම් භූමියේ තිබෙන ආයතන තියෙනවා . ඒ ගොල්ලන් තොරතුරු කරුවන් වශයෙන් ලබා ගෙන ස්වාමීනි ඒ ගොල්ලොන්ගේ Headquarter එකට නැත්නම් මුලස්ථානයට එව්වාට පස්සේ ඒ process කරන ක්‍රියාවලිය ස්වාමීනි එතන මුලස්ථානයෙන් සිදුවිය යුතුයි.

ප්‍ර එතකොට dissemination එක වෙන්නේ කොයි අවස්ථාවේද අවසානයේ ?

උ dissemination එක ස්වාමීනි අවසාන අවස්ථාව ඒකට හේතුව ගත්තොත් එහෙම SIS එක ගත්තොත් එහෙම ඒක යම්කිසි කරුණක් ආරක්ෂක අමාත්‍යාංශයට , ගරු ආරක්ෂක ලේකම්තුමාට දැනුවත් කිරීමට අවශ්‍ය නම් ඒක 4 වෙනි පියවර හැටියට කඩිනමින් disseminate කරන එක ස්වාමීනි කරන්න අවශ්‍යයයි.

ප්‍ර එතකොට 4 වෙනි පියවර වන dissemination නැත්නම් බෙදා හැරීම ආරක්ෂක ලේකම්වරයා වෙත ඒවා ඉදිරිපත් කරන කොට එහෙම නැත්නම් ජාතික බුද්ධි ප්‍රධානි වෙත ඉදිරිපත් කරනකොට එම කුලකයට අයිති වෙනවාද ? ඒකත් dissemination එකක්ද නැත්නම් dissemination කියන්නේ ඊට වැඩිය පොඩ්ඩක් වෙනස් දෙයක්ද ?

උ ස්වාමිනි ඒක dissemination කියන්නේ එතකොට ජාතික ආරක්ෂක ලේකම් තුමාට ඉදිරිපත් කිරීමත් ස්වාමිනි dissemination ගණයට වැටෙනවා . SIS එකට ආපු තොරතුරක් CNI වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව CNI වෙතින් ගරු ආරක්ෂක ලේකම්තුමාට වෙත හෝ ඉඳුරාම ඊට වඩා calcified ජාතික ආරක්ෂාව ඊට වඩා වැඩි එකක් තියෙනවා නම් ඉඳුරාම ගරු ආරක්ෂක ලේකම්තුමාට ඉදිරිපත් කිරීම dissemination ගණයට වැටෙනවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට අර විවිධ බුද්ධි අංශ වෙතින් ලැබෙන තොරතුරු තමයි ඔබ කිව්වේ ඔබලා විසින් රැස් කරනු ලබනවා කියලා රැස්කරලා තමයි අර න්‍යාය පත්‍රය පිළියෙල කිරීමේදි සලකා බලන්නේ ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර දැන් ඒ අවස්ථාවේදිත් යම් ආකාරයක විශ්ලේෂණයක් ඔබලා කරනවාද?

උ එතන ස්වාමිනි තිබ්බ අපේ සම්පත් අනුව තිබ්බ staff එකත් එක්ක තිබ්බ විශ්ලේෂණයක් සිදු කිරීමක් වෙන්නේ නැහැ ස්වාමිනි නමුත් අපි බලනවා මේක ජාතික ආරක්ෂාවට කෙසේද බලපාන්නේ කියන එක මොකද එතන තියෙන්නේ ඉතාම සීමිත සම්පත් ප්‍රමාණයක් අපිට ස්වාමිනි ජාතික බුද්ධි ප්‍රවනතාවය තනි කොලයක් එවකට තිබ්බේ. ඒකටත් මම ඉතා කෙටිකාලයක් ඔබතුමාගෙන් ගෞරවයෙන් අපේක්ෂා කරනවා විස්තරයක් කිරීමට ස්වාමිනි අවසර ඉල්ලා සිටිනවා. අපි ස්වාමිනි මම විශේෂයෙන්ම ජතික බුද්ධි ප්‍රධානි කාර්යාලයට 2017 ගියපුහම අපි කර්නල් මහතන්තිල එක්ක අපි ජාතික බුද්ධිප්‍රධානි තුමාට ඉදිරිපත් කලා ස්වාමිනි නැත්නම් අපි කියා සිටියා ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලයේ තියෙන සම්පත් ඉතාම දුර්වලයි ස්වාමිනි මේ බුද්ධි අංශයක් වශයෙන් ඉදිරිපත් කරන්න මොකද හේතුව

ප්‍ර ඇයි ඔබ එහෙම කියන්නේ ?

උ ඒක මම එහෙම කියන්නේ ඕනෑම රටක මේ බුද්ධි තොරතුරු ඒකත් ස්වාමීනි මම ඉදිරිපත් කිරීමට කැමතියි. මට අවසරය ලැබෙනවා නම් ස්වාමීනි බුද්ධි අංශයේ තියෙනවා ප්‍රින්සිපල්ස් නැත්නම් මූලික සිද්ධාන්ත කීපයක් ඒකේ පලවෙනි එක තමයි centralized control මධ්‍යස්ථව පාලනය ඕනෑම බුද්ධි අංශයක් මධ්‍යස්ථව පාලනය වෙන්න ඕනේ නැත්නම් වැරදි interpretations ඉදිරිපත් වෙන්න පුලුවන් අණදෙන්නාට නැත්නම් එතන ප්‍රධානියාට ඒකනිසා ස්වාමිනි මේ centralized control අතිශය වැදගත් එතකොට ජාතික බුද්ධි ප්‍රධානි තුමා නමින්ම ගත්තොත් ස්වාමිනි ජාතික බුද්ධි ප්‍රධානි Chief of National Intelligence විශාල බරක් තියෙන ආයතනයක් විය යුතුයි. ඉතින් අපිට තේරෙනවා ස්වාමීන් වහන්ස මට පුද්ගලිකව තේරෙනවා අවුරුදු 20ක සේවා කාලයක් තිබුනු සේවා නිළධාරියෙක් හැටියට මේ තියෙන මට්ටම අපිට තිබ්බ සම්පත් ප්‍රමාණය සහ බලය ඒකත් ස්වාමීනි මම ඉදිරිපත් කිරීමට කැමතියි ඉතාම සුලු වේලාවකින් . මේක මම දැක්කාම ස්වාමිනි ගියපුහම තිබ්බේ adhoc attachment එකක්. ආරක්ෂක අමාත්‍යාංශයේ තිබ්බේ adhoc ඒකේ තිබ්බේ නැහැ ඒ ගොල්ලන්ගේ structure එකේ ආරක්ෂක අමාත්‍යාංශයේ structure එකේවත් නැත්නම් සංවිධාන ව්‍යුහයේ වත් අපේමේ එකේ තිබ්බේ නැහැ .

ප්‍ර CNI එක නැහැ.

FAIR COMMENT BY JEZEEM

උ CNI නැහැ ස්වාමිනි මගේ දැනුමේ හැටියට CNI එක නැහැ. ඒ නිසා තමයි ස්වාමින් වහන්ස අපි බොහෝ වේලාවට CNI ට කිව්වා ස්වාමිනි මේක මෙහෙම තිබ්බොත් විශාල ප්‍රශ්ණයක් වෙන්න පුලුවන් කියලා මම ස්වාමිනි පුද්ගලිකව කීප වතාවක්ම එතුමාට ප්‍රකාශ කරලා තියෙනවා මොකද හේතුව අපිට විශ්ලේෂණය කිරීමක් කරන්න මීට වඩා දේවල් කරන්න තිබ්බ සම්පත් ප්‍රමාණය සීමිත නිසා ස්වාමීනි.

ප්‍ර එතකොට ඔබලාගේ ඒ කියන්නේ CNI ගේ කාර්යාලයේ ඔබ කියන ආකාරයට එවැනි පහසුකම් නැති බව ඔය බුද්ධි සමාලෝචන රැස්වීමට සහභාගි වන බුද්ධි අංශ වල නියෝජිතයින් දැනගෙන හිටියාද ?

උ දැනුවත් වෙන්න පුලුවන් ස්වාමීනි මොකද බොහෝ වේලාවට අපි ඒක ජාතික බුද්ධි ප්‍රධානිතුමයි අපියි ඒ ගොල්ලොත් එක්ක අපි කතා වෙනවා ස්වාමිනි මොකද ඒගොල්ලෝ ඉතා ජ්‍යෙෂ්ඨ බුද්ධි අංශවල හිටපු ජ්‍යෙෂ්ඨ නිළධාරි ස්වාමිනි . ඉතින් මම හිතනවා අනිවාර්යයෙන්ම ඒක ඒ ගොල්ලෝ ප්‍රායෝගිකව දැන ගත යුතුයි කියලා ස්වාමිනි.

ප්‍ර එතකොට සාමාන්‍යයෙන් ඔය බුද්ධි සමාලෝචන රැස්වීමක් කොපමණ පමණ වේලාවක් පැවැත්වෙනවාද ?

උ ස්වාමිනි අනිවාර්යයෙන් අපි උදේ 10 ට තමයි ඒක පටන් ගන්නේ බොහෝ වේලාවට තියෙන්නේ ඒක සාකච්ඡාවට බඳුන් වෙන්න ආකාරය අනුව සාමාන්‍යයෙන් එක, දෙක වගේ කාලයකුත් ගියා නමුත් අඩුම ගානේ පැය දෙකක කාලයක්වත් ස්වාමිනි මේකේ තියෙනවා .

ප්‍ර දැන් ඔබ කියන්නේ ඒ අවස්ථාවේදී ඔබලාට ලැබෙන තොරතුරු අර න්‍යාය පත්‍රය ට ඇතුලත් කරලා එය සාකච්ඡා කිරීම තමයි සිදු වෙන්නේ ?

උ එසේය ස්වාමිනි .

ප්‍ර ඒවාගේම ඔබ ගරු කොමිෂන් සභාවට කියන්නේ ඔබලාට තිබුණු සීමිත සම්පත් සහ පහසුකම් සලසලා බලනකොට බුද්ධි අංශ වෙතින් මූලික තොරතුරු ඔබ වෙත ඉදිරිපත් කෙරුවොත් එය විශ්ලේෂණය කිරීමට ඔබලා ට හැකියාවක් නැහැ කියලා ?

උ එසේය ස්වාමිනි මොකද දැන් මූලික information විතරක් ආවොත් ස්වාමීනි අපිට sources නැහැ ස්වාමිනි මේක විශ්ලේෂණය කිරීමට. එතකොට අපිට අවශ්‍ය facilities සම්පත් නැහැ. ඒක නිසා අනිවාර්යයෙන්ම දැන් ගරු කොමිෂන් සභාව දන්නවා රටේ විවිධ ස්ථර තියෙනවා එතකොට අපි ඉන්නේ ආරක්ෂක අමාත්‍යාංශය තියෙන්නේ grand strategic නැත්නම් strategic level ඒකේ තියෙන ආයතනයක් . එතෙන්ට අපි අපේක්ෂා කරන්නේ process කරපු නැත්නම් information නෙවේ intelligence කියන එක තමයි මගේ අදහස ස්වාමීනි.

**********

FAIR COMMENT BY JEZEEM

**<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>**.

ප්‍ර සාක්ෂිකරු ඔබ ප්‍රකාශ කලා ජාතික බුද්ධි ප්‍රධානි ලඟට ආ යුත්තේ information නොවේ intelligence කියලා?

උ එසේය ස්වාමිනි.

ප්‍ර එතකොට intelligence කියන දැන් එක ඔබ හොඳටම දන්නවානේ නැවත ඔබලා Process_කිරීමේ අවශ්‍යතාවයක් තියෙනවාද දැන් ඔබ කිව්වා මෙම ජාතික බුද්ධි ප්‍රධානීන්ට සම්පත්, බලය, adhoc වැඩ කරනවා කියලා ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර දැන් intelligence එකක් ආවහමත් නැවත ඔබ හිතනවාද මේක පිළිබඳව පසු විපරම් කරලා බැලීමේ හැකියාවක් ඔබගේ ආයතනයට තිබිය යුතුයි කියලා ජාතික බුද්ධි ප්‍රධානීට.?

උ ස්වාමීනි ඒක එහෙම තිබ්බානම් ස්වාමින් වහන්ස වඩා හොඳයි මොකද අපි එක් ආයතනයක උදාහරණයක් ගමු මැතිණියනි එක යම්කිසි තොරතුරක් අපි හිතමු SIS එකෙන් ලැබුනොත් මේ තොරතුර අපි හිතමු අනිත් intelligence service වලින් ආවේ නැත්නම් අපි ස්වාමිනි බොහෝ වේලාවට බුද්ධි අංශවල කරන කාර්යයක් තමයි source **එ**කකින් එක තැනකින් ආපු එකක් අපි බොහෝ විට මේක කොච්චර grading **එ**ක හොඳ වුනත් ස්වාමිනි මොකද අපි එක පාරටම confirm කරගෙන තහවුරු කිරීමක් නැහැ අපිට ස්වාමිනි
එතකොට සාමාන්‍ය practice එක විය යුත්තේ ඒක බොහෝ වෙලාවට හොඳ යි මැතිනියනි අනිත් agencies වලින් මේක තහවුරු කර ගැනීමක් තියෙනවා නම් . එතකොට ඒක අපිට ස්ථිර වශයෙන්ම දන්නවා මේක උඩට මොකද මැතිනියනි අපි ඉදිරිපත් කරන්නේ ගරු ආරක්ෂක ලේකම්තුමාට වෙතින් සමහර වෙලාවට මේක එතකොට යන්න පුලුවන් ගරු ජනාධිපතිතුමාට හෝ අගමැතිතුමාට . ඉතින් ඒ තැන්වලට ගියපුහාම මේක ඉතා බරපතල තත්වයක් වෙනවා අපි මේක යම්කිසි වැරැද්දක් තිබ්බොත් ඒ නිසා වඩා හොඳයි මැතිණියනි අපිට තහවුරු කරගන්න ඒවා ගේ ක්‍රමවේදයක් තිබ්බා නම් තියන හැඟීම තමයි මගේ තියෙන්නේ.

ප්‍ර CNI ට ඔබ සඳහන් කරන ආකාරයේ intelligence බුද්ධි තොරතුරක් ලැබෙන්නේ රාජ්‍ය බුද්ධි ප්‍රධානියාගෙන් විතරක්ද කියන එක කියන්න?

උ මැතිනියනි intelligence ලැබෙන්නේ SIS Director ගෙන් පමණක් නෙවෙයි. ඒක ලැබෙනවා SIS Director ගෙන් SIS එකෙන් ඊට පස්සේ DMI Director of Intelligence යුද්ධ හමුදාවේ ඒත් එක්කම නාවික

FAIR COMMENT BY JEZEEM

හමුදාවේ ගුවන් හමුදාවේ සහ පොලිසියේ තියෙන අනිකුත් බුද්ධි අංශ වලිනුත් මැතිණියනි ඒ වගේ තොරතුරු intelligence ලැබෙනවා .

ප්‍ර විදේශ රාජ්‍යවල intelligence ආයතන වලිනුත් කෙලින්ම ලැබෙනවාද CNI ට තොරතුරු ?

උ මැතිණියනි සමහරක් අවස්ථාවන් වල දි මං දැකලා තියෙනවා ඉඳුරාම විදේශ බුද්ධි අංශ වලින් විවිධ තොරතුරු CNI ට ලැබෙනවා එහෙම නැත්නම් යම් අවස්ථාවකදි මම දැක්කා ඒ කියන්නේ ගරු ආරක්ෂක ලේකම්තුමා හරහා අපිට ආපු යම් යම් තොරතුරුත් තිබ්බා ස්වාමිනි විශේෂයෙන්ම මං අර කලින් සඳහන් කරපු අර මම handle කරපු එක්සත් ජාතික පක්ෂය ආරක්ෂක මඩල විශ්ලේෂණ යම් යම් දේවල් වල මගේ අත්දැකීම් තියෙනවා ඒ තොරතුරු එහෙම අවස්ථා තිබ්බා මැතිණියනි.

ප්‍ර ඒවගේම ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබෙන විදේශ දූත මංඩල සහ විදේශ රටවල් වල තියෙන ශ්‍රී ලංකාවේ දූත මංඩල වලිනුත් බුද්ධි තොරතුරු කෙලින්ම CNI ට ලැබෙනවා ?

උ මම දැකලා තියෙනවා ස්වාමිනි බොහෝ වෙලාවට ඇමරිකා එක්සත් ජනපදය වගේ බොහෝ අත්දැකීම් තියෙන ඇමරිකා එක්සත් ජනපදය CIA එක මම විශ්වාස කරන අන්දමට ස්වාමීනි මැතිණියනි ඒ වගේ තොරතුරු තමයි ලැබුනේ මං දැකලා තියෙන විදියට ස්වාමිනි ඒ වගේ තොරතුරු ලැබෙනවා. අනිත් තොරතුරුත් සමහර වෙලාවට ලැබෙන්න ඇති . මැතිණියනි.

ප්‍ර එවැනි තොරතුරු ලැබිච්ච අවස්ථාවකදි ඒ පිළිබඳව තවදුරටත් සොයා බැලීම සඳහා පහසුකම් නොමැති බවද ඔබ මේ සඳහන් කරන්නේ. ?

උ එසේය ස්වාමිනි ඒ වගේ තොරතුරක් ලැබුනොත් අපිට එහෙම process කිරීමේ හැකියාවක් මැතිණියනි, අපේ ඒ තිබ්බ පොඩි කාර්ය මංඩලයෙන් එහෙම අපේ ජාතික බුද්ධි ප්‍රධානිට තිබ්බ මට්ටම අඩුයි කියන එක තමයි මගේ අද්දැකීම .

ප්‍ර ඒ කියන්නේ නවීන තාක්ෂණික උපාංග නොමැති කම ගැනද ඔබ කියන්නේ ?

උ එසේය ස්වාමිනි. තාක්ෂණික උපාංග , කාර්ය මංඩලය ,හිටපු අනිත් ඒ කට්ටිය බුද්ධි නිළධාරින් ඒ තිබුනු තාම මට මතක පොඩි space එකක පොඩි කාමර දෙක තුනක වගේ තමයි ස්වාමින් වහන්ස අපේ කාර්යාලය තිබ්බේ ඉතාම අඩු පහසුකම් යටතේ.

ප්‍ර දැන් ආරක්ෂක අමාත්‍යංශයේ CNI යටතේ ඔවැනි රාජකාරි කටයුතු කරන්න ගියාම State Intelligent Services රාජ්‍ය බුද්ධි සේවයේ ඒ කාර්යාලයේ කාර්ය භාරයන් සමඟ overlap වීමක් එහෙම නැත්නම් duplicate වීමක් වැනි දෙයක් සිදුවීමට ඉඩ තිබෙනවාද ?

FAIR COMMENT BY JEZEEM

උ නැහැ මැතිනියනි එහෙම duplicate වීමක් ඇත්ත වශයෙන්ම duplicate වෙන්න බැහැ බුද්ධි අපේ මූලධර්ම අනුව ඒක කිසිසේත්ම එසේ නොවිය යුත්තක් duplicate වෙන එක මැතිණියනි නමුත් අපි විශේෂයෙන්ම අපි ඒ කාලේ තිබ්බේ මැතිණියනි මේ ලැබෙන තොරතුරු අපි හිතමු බුද්ධි තොරතුරු කියලා මේ බුද්ධි තොරතුරු එකනෙකට අතට coordinate කිරීමේ බලය තමයි මැතිණියනි ඒ කාලේ මීට කලින් අවුරුදු දෙකේ මම දැක්කේ නැත්නම් මම නිරික්ෂණය කලේ coordinate කර ගන්න එක තමයි මේ අපිට කාර්යාලයට පැවරිලා තිබ්බ බලය මැතිණියනි

ප ඔබගේ කාර්යාලයේ විෂය පථය පැහැදිලිවම තියෙනවා coordination function එකක් කියලා ඉතින් ඒ සඳහා ඔබ යෝජනා කරන ආකාරයේ විශාල සම්පත් තාක්ෂණික සම්පත් , මානව සම්පත් ,විශාල කාර්යාලයක් තිබීම , අවශ්‍ය කියන එක මං හිතන්නේ විශේෂඥයන් විසින් තීරණය කර යුතු දෙයක් නේද ?

උ එසේය මැතිණියනි. මම එහෙම අදහස් කරේ මැතිණියනි අපේ රටක් වශයෙන් මීට වඩා ජාතික ආරක්ෂාව තහවුරු කරන්න නම් ඒකයි ස්වාමිනි මැතිණියනි අපි ඉදිරිපත් කරේ මීට වඩා ජාතික බුද්ධි ප්‍රධානී කාර්යාලයට වගකීමක් , බලයක් කාර්ය මංඩලයක්, තිබුණත් අපි මීට වඩා දෙයක් කිරීමේ හැකියාව තිබ්බා විශේෂයෙන් බලයක් ගරු මැතිණියනි.එතකොට අපිට විශේෂයෙන්ම task කරන්න පුලුවන් අපිට මීට වඩා ජාතික බුද්ධි ප්‍රධානිතුමාට තිබ්බා බලයක් අන්න ඒ ටික මීට වඩා තහවුරු කිරීමේ පරමාර්ථයෙන් තමයි මැතිණියනි මමත් අපේ අනිත් මාණ්ඩලික නිළධාරිත් CNI ට කිව්වේ මීට වඩා දෙයක් තිබ්බොත් හොඳයි කියන ඒ අදහසින් කිව්වේ.

ප බලය කියන එකෙන් ඔබ මොකක්ද අදහස් කරන්නේ කිසියම් නෛතික රාමුවක්ද ඇතුලත මෙම ඒකකය.?

උ එසේය මැතිණියනි ඒ වගේ නෛතික රාමුවක් ඇතුලත Adhoc attachment එකෙන් තොරව මේක නිශ්චිත කාර්ය භාරයක් තියෙන නිශ්චිත බලතල තියෙන නිශ්චිත වගකීමක් තියෙන බලයක් තිබ්බොත් මීට වඩා ජාතික ආරක්ෂාව කෙරේ බලපෑමක් නැත්නම් යොමුවක් ඉදිරිපත් කරන්න පුලුවන් මගේ දැනුම හැටියට අනිත් රටවල් මැතිණියනි එහෙම තමයි සිදු විය යුත්තේ.

ප ඔය ඔය adhoc කියන එකෙන් නිරන්තරව ප්‍රකාශ කරන්නේ ඔය අංශය තුල කරාද බොහොම adhoc විදියට වැඩ ?

උ එහෙම නෙමේ මැතිණියනි adhoc විදියට නෙමේ නමුත් මේ අපිට තිබ්බ මැතිණියනි අපිට තිබ්බ task අපි අපේ තිබ්බ CNI office එක ඒක මේ ස්ථාපනය කරලා තිබ්බේ නැත්නම් සංස්ථාපනය කරලා තිබ්බේ

FAIR COMMENT BY JEZEEM

ඒක නිශ්චිත ක්‍රමවේදයක් නෙමේ කියන හැඟීම තමයි මැතිණියනි මට තිබ්බේ.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය.</u>**

ප්‍ර ගරු කොමසාරිස්තුමිය අසන ලද ප්‍රශ්නයකට ඔබ දුන්න පිළිතුරක් පිළිබඳව ඔබෙන් වැඩිදුරටත් මා දැන ගන්නට කැමතියි ඔබ කිව්වා ඇතැම් අවස්ථාවන්වලදි විදේශයන්ගෙන් සෘජුවම CNIට යම් තොරතුරු ලැබෙනවා කියලා ඒවගේම ඔබ මේ ගරු කොමිෂන් සභාවට කියලා තියෙනවා එවැනි යම් තොරතුරක් පමණක් ලැබුනොත් ඔබලාට එය විශ්ලේෂණය කරලා කටයුතු කිරීමේ පහසුකම් තිබුනේ නැහැයි කියලා?

උ එසේය ස්වාමිනි.

ප්‍ර එහෙමනම් විදේශයකින් තොරතුරක් ලැබුනොත් ඔබලා ඒවා සම්බන්ධයෙන් මොකක්ද ගත්ත පියවර ?

උ ඒ වගේ දේවල් ලැබුනොත් අපි ඉදුරාම ආරක්ෂක ලේකම්තුමා වෙත ජාතික බුද්ධි ප්‍රධානිතුමා වෙතින් ඉදිරිපත් කිරීමට කටයුතු කරා ස්වාමිනි.

ප්‍ර ජාතික බුද්ධි?

උ ජාතික බුද්ධි ප්‍රධානිතුමා වෙතින් ගරු ආරක්ෂක ලේකම්තුමා වෙත ඉදිරිපත් කරලා අවශ්‍ය කරන පියවර ගන්න නැත්නම් එතුමාගෙන් advices අරගෙන තමයි ස්වාමිනි කටයුතු කරේ.

ප්‍ර ඒ අනුව විශ්ලේෂණය කිසිසේත් ඔබලා කෙරුවේ නැහැ කියලයි ඔබ කියන්නේ ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර ඊලඟට මා කැමතියි ඔබෙන් දැන ගන්නට දැන් යම් කාලයක් තිස්සේ ඔබලාට තොරතුරු ලැබෙන කොට උදාහරණයක් විදියට කිව්වොත් 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා පාස්කු ප්‍රහාරයට මුලිකත්වය ගත් බවට සැලකෙන සහරාන් හෂීම් සම්බන්ධයෙන් ඔබලාට තොරතුරු යම් යම් අවස්ථාවන්වලදි ලැබිලා තියෙන්නට ඇති නේද ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර දැන් එහෙම වුනහම ඒ කියන්නේ එක රැස්වීමකට නෙවේනේ ඔක පාදක වෙන්නේ රැස්වීම් කීපයකට පාදක වෙනවා ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර එතකොට ඒවාට අදාලව මේ බුද්ධි අංශ ඔබලා වෙත CNI වෙත තොරතුරු වාර්තා කරලා තියෙන කොට ඒ තොරතුරු කොයි ආකාරයටද ඔබලා විසින් රැස්කර ගෙන තිබුනේ ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ස්වාමිනි එතෙන්දි අපි ඒ තොරතුරු අපි එක් රැස්කිරිම කරා ඒ තොරතුරු ජාතික SIS එකෙන් DMI එකෙන් අපිට ඒ සහරාන් ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් ඒ තොරතුරු අපිට ලැබුනා ඒ තොරතුරු ලැබීමෙන් පසු අධීක්ෂණයකින් පසුව තමයි අපි තීරණය කරේ මේ වගේ මොකද අපිට තේරෙනවා ස්වාමීනි ඒ ඔහුගේ ක්‍රියා කලාප විශේෂයෙන්ම online radicalization වැනි දේවල් අඛණ්ඩව දිගින් දිගටම එනවා කියන තොරතුරු තමයි අපිට ලැබුනේ ground එකේ තියෙන තොරතුරු නෙමෙයි ස්වාමිනි ඒ කියන්නේ ඔවුන්ගේ භූමියේ ක්‍රියා කලාප නොවෙයි මගේ මතකයේ හැටියට එයාට ලැබුනේ . ඉතින් ඒ ලැබුනු තොරතුරු ප්‍රශ්ණය අනුව ස්වාමිනි එකතු කිරිම කරලා අපි අපගේ ප්‍රධානම ඉදිරිපත් කිරීම තමයි weekly intelligence coordinate Conference මේකේ තමයි ස්වාමීනි ගරු ආරක්ෂක ලේකම්තුමාගේ මේකට මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් මේකට අවශ්‍ය කරන පියවර සාකච්ඡා කරන්නේ. එහෙම කරලා එකතු කරලා තමයි ස්වාමීනි අපි ඉදිරිපත් කිරීමක් කරේ Weekly Intelligence Coordinating Meetig එකට ස්වාමීනි.

ප එතකොට ඔබ කියන්නේ ඔබේ නිරීක්ෂණය අනුව ඔබලාට ලැබුණු තොරතුරු සවෘත තොරතුරු නොවෙයි නමුත් විවෘත මාධ්‍යයෙන් ලැබුණු තොරතුරු කියලා ?

උ එසේය ස්වාමිනි. විවෘත මඟින් අපි ගත්තොත් open sources ස්වාමීනි.

ප මූලාශ්‍ර වලින් ලබා ගත්තු

ප විශේෂයෙන් දැන් අපි ගත්තොත් එහෙම social media වල මෙයාගේ activities කොහොමද තිබ්බේ කියන එක ස්වාමීනි ඒවා ක්‍රියා කලාපය කොහොමද තියෙන එක ආවේ මගේ දැනුමේ හැටියට ස්වාමිනි මගේ අත්දැකිම් මගේ මතකය අනුව කිසිම අවස්ථාවක ස්වාමිනි මෙයා ගේ සහ මෙයාගේ සහ මෙයාගේ කණ්ඩායමේ භූමියේ වෙච්ච තොරතුරු ස්වාමිනි මම නම් මගේ මතකයේ හැටියට ස්වාමිනි මම දැකලා නැහැ. විශේෂයෙන්ම අපි පාස්කු ප්‍රහාරයෙන් පසුව මං හිතන්නේ අපි හැමෝම දන්නවා මෙයා training කරා මේ lectures මේ දේවල් කරා විශාල ක්‍රියාවලියක් මෙතන කරලා තිබුනා මේකට සකස්කර ගන්න ඒ වගේ තොරතුරුනම් මට බොහෝ අවස්ථාවන් වල මතකේ හැටියට එහෙම ආවේ නැහැ කියන එකයි මට කියන්න තියෙන්නේ ස්වාමීනි.

ප එවැනි තොරතුරු SIS එකෙන් ලැබිලා තිබුනේ නැද්ද ?

උ තොරතුරු ස්වාමිනි online නැත්නම් මෙයාගේ preaching මෙයා දේශනා කරපු දේවල් ස්වාමීනි SIS එකෙන් ලැබුනා.

ප ඔබ කියන්නේ ඒවා විවෘත මූලාශ්‍ර මඟින් ලබා ගත හැකි ඒවා කියලා ?

FAIR COMMENT BY JEZEEM

උ ස්වාමීනි මගේ මතකයේ හැටියට ඒවා විවෘත මූලාශ්‍ර වලින් තමයි ඒ බොහෝ තොරතුරු ලැබුනේ.

ප එතකොට DMI ගෙන් ඔය වගේ තොරතුරු ලැබුනේ නැද්ද ?

උ DMI එකෙන් ලැබුනා ස්වාමීනි ඒවත් ඒවගේ විශේෂ විවෘත මූලාශ්‍ර වලින් තිබ්බ තොරතුරු යන හැඟීම තමයි මට තිබ්බේ මතකේ හැටියට ස්වාමීනි.

ප එතකොට ඔබේ නිරීක්ෂණය තමයි මේ සවෘත තොරතුරු ඒ කියන්නේ භූමියෙන් ලබා ගන්නා වූ අර 1 to 1 contact එකෙන් ලබා ගන්නා වූ තොරතුරු ඉතාම අල්පයි කියන එක නේද ?

උ එසේය ස්වාමිනි

ප හැබැයි ඒ වුනත් මගේ ප්‍රශ්ණයට උත්තරය හම්බ වුනේ නැහැ මගේ ප්‍රශ්ණය වුනේ ඔය කාලයක් තිස්සේ ඔබලාට එකම කරුණක් සම්බන්ධයෙන් තොරතුරු ලැබෙන කොට බුද්ධි අංශ වලින් ඒවා රැස් කිරීම කලේ කොහොමද කියන එක ? How did you store the material that you had received over a particular period in relation to a particular fact or a point or a matter? Say for an instance example Zaharan. If you had received information the intelligence not information sorry intelligence from your intelligence groups of Zaharan where did you store? What did you do? How did you maintain? Was there a database? That's what I want to know? You won't take your papers just for that date or for the last week over a particular period when you were serving there from 2017 to 2019 you would have had the experience of receiving such information periodically. So what did you do?

උ ඔව් ස්වාමීනි ඒ වගේ අපිට මගේ මතකයේ හැටියට ඒ අදාල බුද්ධි ආයතනයට වෙන් වෙන් වශයෙන් ස්වාමීනි අපිට files නැත්නම් store නැත්නම් store system වශයෙන් මොකද අපිට electronic තිබ්බ ඒ තියන උපකරණ ඉතාමත් සීමිත නිසා ඒ එක් එක් බුද්ධි ආයතනවල වෙන වෙනම නැත්නම් filing system එකක් තිබ්බා . ඒ ෆයිල්ව තමයි ස්වාමීනි ඒ ලැබෙන සියලුම තොරතුරු SIS එකේ තියන එකට SIS එකට වෙනම file එකක් දාලා තිබ්බා ඒත් එක්කම ඒවගේ filing system එකක් තිබ්බා. ඒ file එකේ තමයි මේ තියන බුද්ධි ලැබෙන බුද්ධි තොරතුරු සියලු දේම ප්‍රශ්ණය හැටියට store කිරීම නැත්නම් record කිරීම කරේ ස්වාමීනි.

ප ඒ කියන්නේ අදාල බුද්ධි අංශය නමින් තිබුනා එකක් ?

උ එසේය ස්වාමිනි. අදාල බුද්ධි .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට ඔබලාට මේ පරිසණක ගත කිරීමට හැකියාව තිබුනාද ලැබෙන තොරතුරු ?

උ එහෙම පරිසණක

ප්‍ර එහෙම නැත්නම් භෞතික වශයෙන්ද ඒවා රැස් කරේ ?

උ ඔව් භෞතික වශයෙන් තමයි ඒ ටික අපි ඔක්කෝම රැස් කරේ. පරිසණක ගත කිරීමක් වුනේ ස්වාමිනි ඒක අපි හිතමු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් report එකක් වෙන තැනක යවන්න අවශ්‍ය නම් ඕනෑම තොරතුරක් වෙන report එකකට යවන්න ඕනේ වුනොත් ස්වාමිනි අපි භෞතික ලියුම නැත්නම් ඒ බුද්ධි තොරතුර බලලා ඒකත් අනුව report එකක් සකස් කිරීම කරා හැර ස්වාමිනි වෙන ඊට වඩා advance උසස් ක්‍රම තිබුනේ නැහැ ස්වාමිනි මේ දවස් වල ඒක දැන් මෙතුමිය මගෙන් ප්‍රශ්ණ ඇසුවා වගේ ස්වාමීනි ඒක store කිරීමට වෙන ක්‍රම තිබ්බේ නැහැ ස්වාමීනි.

ප්‍ර ඔබ කියන්නේ මේ දත්ත රැස් කිරීම ඔබලා පරිසණක මාර්ගයෙන් කලේ නැහැ කියලාද ? හැබැයි ලියුම් ලියන්න විතරයි පරිසණක පාවිච්චි කලේ ඒකද කියන්නේ ?

උ ඔව් බොහෝ වෙලාවට ලියුම් ඉදිරිපත් කරන්නේ මේ දත්ත වෙනත් තැන් වලට ඉදිරිපත් කිරීමට තමයි මේ අපි ස්වාමීනි කම්පියුටර් ඒ නැත්නම් පරිසණක පාවිච්චි කරේ නැතුව අර මේ වෙන තියෙන store කරන්න වගේ දේවල් වලට බොහෝ වෙලාවට එහෙම දෙයක් වුනේ නැහැ ස්වාමින් වහන්ස ප්‍රකාශ කරා වගේ physically ඒ record කරන එක තමයි කරේ ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර එතකොට ඔබ කියන හැටියට රාජ්‍ය බුද්ධි සේවයෙන් එන බුද්ධි තොරතුරු එක් ගොනුවකත් ,

උ එසේය ස්වාමීනි.

ප්‍ර බුද්ධි අධ්‍යක්ෂක මංඩලයෙන් එන බුද්ධි තොරතුරු එක් ගොනුවකත් පොලිස් විශේෂ විමර්ශන කාර්යංශයෙන් එන බුද්ධි තොරතුරු එක ගොනුවකත් ඒ විදියටද තොරතුරු ගබඩා වුනේ ?

උ එසේය ස්වාමීනි

එහෙම physically මේ file වල තමයි ස්වාමීනි record කිරීමක් කරේ.

ප්‍ර ඔබගේ මතකයට අනුව සහරාන් හෂීම් සහ ඔහුගේ කණ්ඩායම සම්බන්ධයෙන් ඒ ලැබුනු තොරතුරු වෙනම ගොනු ගත කිරීමක් සිදුවුනේ නැද්ද ?

FAIR COMMENT BY JEZEEM
President Secretary Copy

උ ස්වාමීනි මගේ දැන් එහෙම මතකයේ නැහැ. නමුත් මගේ මතකයේ හැටියට ස්වාමිනි ඒක මගේ මතකයේ හැටියට ඒක SIS ෆයිල් එකේ තමයි ස්වාමිනි ඒ ටික තිබ්බේ කියන එක මතය තමයි මගේ තියෙන්නේ. මතකේ හැටියට.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u> .**

ප්‍ර එතකොට නමුත් ඔබලාට ඒ අදාල ගොනුව බැලුවානම් ඔබලා හොයලා බලන යම් නිශ්චිත කරුණු පිළිබඳ අදාල තොරතුරු එහි අන්තර්ගත වෙලා තිබුනාද ?

උ එසේය අපිට දැන් තේරෙනවා අපිට දැන් ප්‍රායෝගිකව දන්නවා අපිට තියන threat එක මොකක්ද කියලා ලැබෙන තොරතුර අපි ඔක්කෝම කියවනවා විශේෂයෙන්ම බුද්ධි ප්‍රධානි තුමා කියවනවා එතකොට අපිට තේරෙනවා ඒකේ තියන අන්තර්ගතය මොකක්ද කියන එක . ඒ අනුව තමයි අපි විශේෂයෙන්ම මේවා ඉදිරියට ගරු ආරක්ෂක ලේකම්තුමා වෙත ඉදිරිපත් කරන්න අපි තීරණය ගන්නේ මේකේ තියෙන අවශ්‍යතාවය ජාතික ආරක්ෂාවට තියෙන බලපෑම අනුව තමයි තීරණය කරන්නේ මේක මින් ඉදිරියට නැත්නම් ඉහලින් ඉදිරිපත් කිරීමට ස්වාමීනි.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u> .**

ප්‍ර දැන් ඔබ කිව්වානේ හැම බුද්ධි සමාලෝචන රැස්වීමකටම ඔබ සහභාගි වුනාය කියලා එතකොට මා කීවොතින් නිවැරදිද ?

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u> .**

ප්‍ර දැන් ඔබට මතක හැටියට ආගමික අන්තවාදය සම්බන්ධයෙන් වෙනම ගොනු පවත්වාගෙන ගියාද?

උ ස්වාමීනි මට එහෙම මතකයක් නැහැ දැනට .

ප්‍ර ඔබ දැන් මීට ඉස්සෙල්ලා අහපු උගත් අතිරේක සොලිසිටර් ජනරාල් මෙනවිය අහපු ප්‍රශ්ණයට උත්තර දෙමින් කිව්වා සහරාන් හෂිම් ගැන තොරතුරු ලැබුනා කිව්වා මේ රාජ්‍ය බුද්ධි සේවයට ?

උ එසේය.

ප්‍ර මෙම කොමිෂන් සභාව ඉදිරියේ දැනට මෙහෙයවා ඇති සාක්ෂි අනුව යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයෙනුත් සහරාන් හෂිම් ගේ කණ්ඩායම සම්බන්ධව තොරතුරු ජාතික බුද්ධි ප්‍රධානියා වෙත ලැබුන බවයි සඳහන් වෙන්නේ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උ එසේය ස්වාමිනි.

ප්‍ර ඒක නිවැරදිද ?

උ නිවැරදියි ස්වාමිනි.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>**

What he said was Sir that from both Agencies it was only the sources that are there in the public but they didn't go to the ground level and give that. That was minimal

ප්‍ර ස්වාමීනි X 51 සාක්ෂිකරුගේ අවධානය වෙත යොමු කරනවා මා ඔබේ අවධානයට යොමු කරනවා මේ වන විට අප විසින් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන බුද්ධි සමාලෝචන රැස්වීම සම්බන්ධයෙන් 2019 ජනවාරි ඉඳලා මැයි දක්වා ?

උ එසේය.

ප්‍ර එතකොට ඔබේ ප්‍රතිචාරය වුනේ මා අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් සාකච්ඡා කිරීම සඳහා නියමිත වූ කරුණු න්‍යාය පත්‍රයට ඇතුලත් කරනු ලැබුවාය කියලා?

උ එසේය ස්වාමීනකි.

ප්‍ර එතකොට සහරාන් හෂිම් සම්බන්ධයෙන් ඔහුගේ අන්තවාදී අදහස් සම්බන්ධයෙන් යම් සමාජයට එයින් යම් බලපෑමක් ඇතිවෙයිද නැද්ද කියන කරුණ පිලිබඳව අර තොරතුර ලැබුනහම ඔබලා වෙත බුද්ධි තොරතුර ලැබුනහම ඔබලා සලකලා බැලුවාද?

උ එසේය ස්වාමීනි.

ප්‍ර එහෙම නම් ඔබට පෙන්වන X 51 ලෙඛනයේ දැක්වෙන බුද්ධි සමාලෝචන රැස්වීම්වලදී ඒ පිළිබඳව සාකච්ඡා කරලා තිබුනාද?

උ එසේය ස්වාමීනි මට ඉතාම හොඳට මතකේ හැටියට ඒ සහරාන් ගේ ක්‍රියා කලාප සම්බන්ධයෙන් අපිට SIS එකෙන් සහ DMI එකෙන් තොරතුරු ලැබුනහම මම පුද්ගලිකව ස්වාමීනි මට හොඳට මතකයි ඒ කරුණ ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව මට ස්වාමිනි හැඟීගියා. මොකද මොහුගේ ක්‍රියා කලාපය නැත්නම් online radicalization එන්න එන්න මෙයාගේ යම්කිසි තීව්‍ර මට්ටමකට එද්දී අපිට තේරුනා මෙතන යම්කිසි ජාතික ආරක්ෂාව පිළිබඳ threat එකක් නැත්නම් පවතින බවක් ස්වාමීනි.ඒ අනුව මමත් පුද්ගලිකව ස්වාමීනි ජාතික බුද්ධි ප්‍රධානි තුමා වෙත ඉදිරිපත් කිරීමක්කරා මෙන්න මේ කියන සාකච්ඡාව මේ කියන කරුණ මේ පුද්ගලයා පිළිබඳව අපි අනිවාර්යයෙන්ම weekly Intelligence Coordinating Meeting එකේ සාකච්ඡා කල යුතුයි කියලා.

ප්‍ර කවදාද?

Fair Comment by Jezeem

උ ඒ අනුව තමා ස්වාමීනි මට මතකේ හැටියට අවස්ථා දෙකකදී මේ Agenda එකේ අවස්ථා දෙකකදි නැත්නම් අනිවාර්යයෙන්ම එක් වතාවකදි හරි මට මතකයි දවසක් දෙකක් හරි ඉදිරිපත් කිරීමක් කරා මොකද Agenda එකක් හදන්නේ මම කලින් කිව්වා වගේ මමම තමයි හදන්නේ මේ අවස්ථා දෙකේදි මට මතකයි activities මොහොමොඩ් සහරාන් සහ මොහොමඩ් කාසිම් කියලා අන්න ඒක අපි ඉදිරිපත් කිරීමක් කළා Agenda එකට ස්වාමීනි.

ප්‍ර ඔබට පුලුවන්ද ගරු කොමිෂන් සභාවට කියන්නට ඒ අවස්ථා දෙක මොකක්ද කියලා 2019 අවුරුද්දේදි එය සිද්ධ වුනේ නැත්නම් ඊට පෙරද?

උ 2019 ස්වාමිනි.

මේ පාස්කු ප්‍රහාරයට පෙර 2019 මට මතකේ හැටියට මාර්තු මාසේට මේ පාස්කු ප්‍රහාරයට ඉතාම ආසන්න කාල වකවානුවක 3 වෙනි මාසේ මාර්තු මාසේ තමයි මේ අවස්ථා දෙක මගේ මතකේ හැටියට ස්වාමිනි අපි ඉදිරිපත් කිරීමක් කලේ මෙයාගේ ක්‍රියාකලාප ගැන සාකච්ඡා කල යුතුයි කියන අදහසින්.

ප්‍ර ඇයි ඔබට 2019 මාර්තු මාසේ වෙනකොට මොහෙමඩ් හෂිම් සහරාන් ගේ ක්‍රියා කලාපය පිළිබඳව බුද්ධි සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කලයුතු වැදගත් කරුණක් බවට ඒත්තු ගියේ.?

ප්‍ර ස්වාමිනි radicalization කියන එක ඇත්ත වශයෙන්ම මුස්ලිම් අන්තවාදය කියන විශේෂයෙන්ම වැදගත් කියන එක. හේතුව පුදගලිකව ස්වාමිනි මම Bandaranaike Centre for International Studies BCIS එකේ මම යම්කිසි පශ්චාත් උපාධියක් කරා. ඒ කරද්දි පවා මම මේ මුස්ලිම් අන්තවාදය ගැන ස්වාමීනි මම යම්කිසි හැදෑරීමක් කරා 2013 මම කාරුණිකව ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා විනාඩි දෙකක වගේ කාලයක් ලබා දෙන්න කියලා කෙටියෙන් ඉදිරිපත් කරන්න. මේ එතකොට මට පුද්ගලිකව ස්වාමිනි අත්දැකිමක් තියෙනවා 2013 මම ඒ තැන්වලට ගිහිල්ලා ඒ ත්‍රිකුණාමලය සහ කාත්තන්කුඩි කියන පැතිවලට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් මගේ නිබන්ධනය ඉදිරිපත් කරා. මගේ නිබන්ධනය මම හිතන්නේ මගේ සාක්ෂියේදී ඉදිරිපත් කිරීමක්.

ප්‍ර මොකක්ද ඒකේ මොකක්ද මොනවද පදනම් කර ගත්තේ ඔබේ නිබන්ධන යේදී.

ප්‍ර ඔව් නිබන්ධනයේදි topic ඒක වුනේ Problems and Prospects of Muslim Militancy and its Implication for National Security in Sri Lanka මගේ නිබන්ධන යේ මාතෘකාව වුනේ ඒකේදි මට මතකයි මම ඔය සහරාන් හෂිම් කියන පුද්ගලයාව 2013 ඔක්තෝබර් මාසේ දෙවනිදා

FAIR COMMENT BY JEZEEM

ගිහිල්ලා ඔහුගේ මුලස්ථානයේදි හම්බ වුනා. දැන් ඒ කාලේ ඉතාම පොඩියට තිබ්බේ මම ඒකේ photo පවා මේ පොතේ තියෙනවා .

ප ඇයි ඒ ?

උ හේතුව මගේ විෂය පථයට අදාලයි මේ මුස්ලිම් sects සම්බන්ධව මේ ගොල්ලන්ගේ ක්‍රියා කලාව අධ්‍යයනය කරන්න ඉතින් ස්වාමීනි මම එතන ප්‍රකාශ කරගෙන ආවේ ඒ වගේ එතකොට මම දැක්කා මම අහපු ප්‍රශ්ණයට උත්තරයක් වශයෙන් ඇයි අපි ගත්තේ කියන එක සහරාන් ගේ activities අපිට තේරුණා මගේ තියෙන පුද්ගලික අත්දැකීම් හරහා මේ පුද්ගලයා ගේ Online radicalization නැත්නම් preaching අනුව ඉතාම මේ සමාජයේ බෙදීමට නැත්නම් මෙම සමාජයට තර්ජනයක් වන ආකාරයට මෙයාමේ ජාතික සමගියට නැත්නම් ජාතික ආරක්ෂාවට බලපෑමක් ආකාරයෙන් මෙයා ප්‍රකාශ කරනවා කියන එක. ඒ අනුව තමයි ස්වාමීනි අපි තීරණය කරේ මේක අපි අනිවාර්යයෙන්ම සාකච්ඡාවට භාජනය කලයුතු යි කියන පදනමෙන් තමයි අපි මේ සාකච්ඡාව ට මේ topic එක දැම්මේ දැම්මේ ස්වාමීනි.

ප එතකොට දැන් ඔබ ඒ සාකච්ඡාව සඳහා න්‍යාය පත්‍රයට ඒ මාතෘකාව ඇතුලත් කිරීමේදී ඊට බලපෑවද ඔබ Bandaranaike Centre for International කියන ආයතනයේ ඔබේ ඒ පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනය?

උ එසේය ස්වාමීනි.

ප නිබන්ධනයේ රැස්කරන ලද කරුණු?

උ එසේය ස්වාමීනි.ඉදුරාම කියන්නේ මගේ එහෙම පසුබිමක් තියෙනවා මම පුද්ගලිකව ගිහිල්ලා මම study කරලා අධ්‍යයනය කරලා තියෙන නිසා මෙඅන්තවාදය පිළිබඳව යම්කිසි සුලු හෝ අත්දැකීමක් නැත්නම් අවධානයක් මගේ තියෙනවාස්වාමීනි ඒක නිසා තමයි තීරණය කරේ මේ විශේෂයෙන් මේ මුස්ලිම් අන්තවාදය කියන මේක ඉතාම බරපතල කාරණයක් හැටියට සැලකිය යුතු නිසා තමයි ස්වාමීනි මේක තීරණය කරේ මේක ඉදිරිපත් කරන්න.

ප ඔව්. ඒ හරෙන්නට මම ඉස්සෙල්ලා කිව්වේ පලවෙනි කරුණ ?
දෙවනි කරුණ ඔබට සහරාන් හෂීම් කියන තැනැත්තා පිළිබඳව මේ බුද්ධි අංශ වාර්තා වලින් වාර්තා වුනාම ඔබේ මතකය අවදි වුනාද ඔබ 2013 වසරේදි මේ තැනැත්තාව මුණගැහිලා තියනවා ඔහුත් සමඟ කතා කරලා යම් යම් කරුණු දැනගෙන තියනවා කියලා ?

උ එසේය ස්වාමීනි

ප එහෙමනම් ඔබට මේ නිබන්ධනය ඉදිරිපත් කරන්න පුළුවන්නේ මේ ගරු කොමිෂන් සභාවට?

උ එසේය ස්වාමීනි

FAIR COMMENT BY JEZEEM

ස්වාමිනී සාක්ෂිකරු විසින් Problems and prospects of Muslim militancy and its implications for national security in Sri Lanka යන මාතෘකාව යටතේ පිළියෙල කොට ඇති නිබන්ධනය C 839 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා .

ප්‍ර ඔබේ ඒ නිබන්ධනය අනුව පෙනී යනවා එහි කියන පාද සටහන අනුව ඔබ මව්ලවි අශේක් සහරාන් කියන තැනැත්තාව 2013 ඔක්තෝබර් මාසේ 22 පෞද්ගලිකව මුණගැහිලා තියනවා කියලා ?

උ එසේය ස්වාමිනි

ප්‍ර ඒක හරිද ?

උ එසේය ස්වාමිනි

ප්‍ර ඔබට ඔහුව මුණගැහුණේ කොහේදිද?

උ මට මතක හැටියට ඔහු මුණගැහුණේ කාත්තන්කුඩි වල ඔහුගේ නැෂනල් ජාතික තව්හිද් ජමාත් , ඒ කාලේ ඒක පොඩියට තිබ්බේ National තව්හිද් ජමාත් කියන ඔහුගේ ඒ කාර්යාලයේ තමයි මම හම්බ වුනේ.

ප්‍ර අපි ඡායාරූපයක් පෙන්නුවොත් ඔබට කියන්න පුළුවන්ද ඔබ මුණ ගැහුණු පුද්ගලයා ඔය කියන පුද්ගලයාද කියලා ? ඡායාරූපය පෙන්වන පුද්ගලයා? ඔබ මුණ ගැසුනු පුද්ගලයාද කියලා ?

**********

**<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා</u>.**

ප්‍ර මේජර් සුභසිංහ අදාල ඡායාරූපය සොයනකම් මම ඔබෙන් ප්‍රශ්ණයක් අහන්නම් දැන් ඔබ 2013/10/22 වෙනිදා කාත්තන්කුඩියේ දි සහරාන් හම්බවුනා කිව්වානේ ?

උ මම හිතන්නේ මම හම්බ වුනේ සහරාන් කියන මතයේ තමා මම ඉන්නේ . මට හිතන්නේ මගේ මතකයේ නැහැ ඒ ගොල්ලන්ගේ ස්වාමීනි මම රෙකෝඩ් කරේ ඉතාම රහසිගතව කරේ ඒවාගේ පුද්ගලයාගේ ඡායාරූපයක් ගන්න තිබ්බේ නැහැ ඔක්කෝම ඒ කාලේ බොහෝම රහසිගතව තමයි ඒ ප්‍රදේශයේ කාන්තාවන් ගේ තියන ඔය කියන Headquarters බොහොම රහසිගතව තමයි මම ඡායාරූපගත කලේ ස්වාමිනි. ඒ නිසා මං හිතන්නේ මම විශ්වාස කරනවා ස්වාමීනි මම හම්බ වුනේ මේ සහරාන් කියන එක්කනාව කියලා.

ප්‍ර ඔබ සහරාන් එක්ක කතා කරන කොට සහරාන් දැනන් හිටියාද ඔබ මේ බුද්ධි අංශයේ ඉහළ නිලයක් හොබවන බව?

උ නැහැ ස්වාමීනි එහෙම නැහැ මම ඒ under cover ගියේ ස්වාමීනි

ප්‍ර ඔබත් එක්ක තවත් කව්රුත් හිටියාද ඒ අවස්ථාවේ?

උ එසේය ස්වාමිනි අපේ ඒ කියන්නේ බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ එක මුස්ලිම් කොමිෂන් නොලත් නිළධාරියෙක් හිටියා. එයා තමයි මොකද

FAIR COMMENT BY JEZEEM

සූදානම් කලේ නැත්නම් අපිට එහෙම පල්ලි වලට ඒගොල්ලන් කිසිසේත්ම ඒ ගොල්ලෝ ගන්නේ නැහැ එයාගේ උදව්වෙන් තමයි මම එයත් එක්ක ගිහිල්ලා මෙහෙම research එකක් කරනවා කියලා ඉදිරිපත් කරලා යම්කිසි දැනුවත් කරලා මම මගේ දත්ත ලබා ගැනීමක් කලේ ස්වාමීනි.

ප්‍ර කොයි වෙලාවේ වගේද හමු වුනේ?

උ මගේ මතකේ හැටියට හවස වගේ ස්වාමීනි.

ප්‍ර කොච්චර වෙලාවක් ඔහු සමඟ කතා කලාද ?

උ ඒ පුද්ගලයා සමඟ ස්වාමිනි පැය දෙකක වගේ කාලයක් කතා කලා.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>**.

ප්‍ර ස්වාමීනි සාක්ෂිකරුගේ අවධානයට ඡායාරූපයක් යොමු කරනවා මෙයාව දැකලා තියෙනවාද කිලන්?

උ එහෙම මතකයක් නැහැ එදා හම්බ වුනේ වසර ගණනකට ඉස්සෙල්ලා මේ පුද්ගලයාමද කියන එක නමුත් ඒතන ප්‍රධානියා කියන හැටියට තමයි මට ඒ පුද්ගලයා මට ජාතික තව්හිද් ජමාත් එකේ ප්‍රධානියා කියන එක හැටියට තමයි මට හඳුන්වා දුන්නේ. මම හිතන්නේ එයා වෙන්න ඕනේ.

ප්‍ර එහෙම හඳුන්වලා දුන්නේ කව්ද ?

උ හඳුන්වලා දුන්නේ ස්වාමීනි මගෙත් එක්ක

ප්‍ර මතකයක් නැද්ද ?

උ එහෙම මට මතයක් නැහැ.

ප්‍ර ඔබට හඳුන්වලා දුන්නේ කව්ද එයා තමයි ඔබ කතා කරපු පුද්ගලයා තමයි මේ ජාතික තව්හිද් ජමාත් සංවිධානයේ නායකයා කියලා කව්ද හඳුන්වලා දුන්නේ?

ඔබට ප්‍රසිද්ධියේ සඳහන් කරන්නට බැරියමක් තියෙනවා නම් ඒක ලියලා ඉදිරිපත් කරන්න පුලුවන්.

උ මම මෙහෙම කිව්වොත් එතන මං සමඟ ගිය හමුදා බුද්ධි අංශයේ මේ ගොල්ලොත් එක්ක අපි දැන් භූමියේ ඉන්න කොමිෂන් නොලත් නිළධාරියෙක් එක්ක තමා මම ස්වාමීනි එතෙන්ට ගියේ. මෙතෙන්ට විතරක් නෙවේ ස්වාමිනි අනිත් හැම තැනකටම ගියා ඒ ගොල්ලන්ගේ අදහස් ගන්න එතකොට ඒ පුද්ගලයොත් එක්ක භූමියේ දැනත් හිටියා මේ කියන කෙනා කව්ද කියලා ඒ 2013. එතකොට ඒ අනුව මෙතන විතරක් නෙමේ අනිත් තැන්වලටත් ගිහිල්ලා එතකොට ඒ විදියට තමයි මෙ ස්ථානයටත් ගියේ.

ප්‍ර ඔබ කොහේදිද ඔහුව මුණ ගැහුනේ ?

උ මට මතක හැටියට කාත්තන්කුඩිවල.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර කාත්තන්කුඩි වල එතකොට ඔබට මේ ජාතික තව්හිද් ජමාත් සංවිධානයේ නායකයා මෙන්න මේ පුද්ගලයාය කියලා හඳුන්වලා දුන්න ඔබේ නිළධාරියා කාත්තන්කුඩිය භූමිය ආශ්‍රයේද ඔහුගේ රාජකාරි කටයුතු කලේ?

උ කාත්තන්කු ඩිය මඩකලපුව කියන ස්ථන වල ස්වාමීනි.

ප්‍ර කාත්තන්කුඩිය කොතනදිද ඔබ ඔය මේ මවුලවි අශේක් සහරාන් කියන තැනැත්තා මුණ ගැහුනේ ?

උ ස්වාමීනි මං මට හරියටම කාත්තන්කුඩියේ නිශ්චිත ස්ථානය මට මතක නැහැ නමුත් ඔහුගේ එයාගේ තිබ්බා ඡායාරූපයකුත් තියෙනවා මම ගත්ත.රහසිගතව ගත්ත ඡායාරූපයක් තියෙනවා ජාතික තව්හිද් ජමාත් කියන NTJ කියන එක ඔහුගේ office එකේදි තමයි ස්වාමීනි මම ඔහුව හමුවුනේ.

ප්‍ර ඒ කියන්නේ එම කාර්යාලයේ ඡායාරූපයක් ඔබ ලබා ගත්තාද ?

උ එසේය ස්වාමීනි.
ඔය පොතේ මම දාලා තියෙන්නේ ඒක ස්වාමීනි.

ප්‍ර ස්වාමීනි සාක්ෂිකරුගේ අවධානයට ස්වාමිනි ඡායාරූපයක් නිබන්ධනය C 839 නිබන්ධනයේ පිටු අංක 134 හි තිබෙන ඡායාරූපයක් ඔහු ගේ අවධානයට යොමු කරනවා මේ ඡායාරූපය ඔබද ගත්තේ ?
මොකද photo by author කියලා ?

උ එසේය.I am the author.

ප්‍ර එතකොට මේ ඔබ ගත්තේ නම් කතෘ විදියට මේ කොහේදිද ගත්තේ මේක ?

උ මේ ගොල්ලන්ගේ ප්‍රධාන කාර්යාලය Head Quarters Of National Thauhid Jamath ඒක ඒ ගොල්ලන් ගේ ප්‍රධාන මුලස්ථානය කාත්තන්කුඩි.

ප්‍ර ඒ ස්ථානයේදිද ඔබ ඔය සහරාන් කියන තැනැත්තා මුණ ගැහුනේ ?

උ එසේය ස්වාමීනි.

ස්වාමීනි එම ඡායාරූපය 134 වෙනි පිටුවේ තිබෙන්නේ එම ඡායාරූපය ස්වාමීනි 839 A අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර ඔබ සහ සහරාන් අතර මොකක්ද කතා වුනේ ?

උ ස්වාමීනි මගේ මේ නිබන්ධනයේ අරමුණ අනුව නැත්නම් ඒ topic එක අනුව මට මගේ ගවේෂණය සොයාගන්න අවශ්‍ය කරලා තිබ්බා ශ්‍රී ලංකාවේ මුස්ලිම් අන්තවාදයක් ක්‍රියාත්මක වෙනවාද ?මේක මෙවට ආධාර ලැබෙන්නේ කොහොමද සහ මේවා ක්‍රියාත්මක වෙන ආකාරය තමයි ස්වාමීනි මගේ නිබන්ධනයේ මුලිකම අරමුණ වුනේ. ඒක අනුව තමයි ස්වාමීනි විශේෂයෙන්ම කාත්තන්කුඩිය සහ ත්‍රිකුණාමලය කියන ඒ පැතිවල විශේෂයෙන්ම මුස්ලිම් ජනතාව බහුතර ජීවත් වෙන

FAIR COMMENT BY JEZEEM

ස්ථානවල මේ තෝරා ගැනීමක් කරලා ඒ වෙලාව තියෙන අනුව තමයි මම නිරීක්ෂණය කරේ.

ප්‍ර ඔබ මවුලවි අශේක් සහරාන් ලෙස ඔබ විසින් හඳුනා ගනුලැබූ තැනැත්තා සමඟ සන්නිවේදනය කලේ කොහොමද?

උ එසේය ස්වාමිනි මට ඒක හොඳටම මතකයි ඒ ආපු මගේ අදාල මගේ උදව්කරුවාත් එක්ක ඒතැන් වලට ගිහිල්ලා ඔහුගේ office එකට ගිහිල්ලා ස්වාමීනි ඔහුත් එක්ක බිම වාඩි වෙලා එතන පැය එක හමාරක දෙකක කාලයක් ප්‍රශ්ණකිරීම් වලට ඔහු ලක් වුනා. එතකොට ඔහුගේ records තියන ඒවා මම රහසිගතව record කිරීමක් කලා පස්සේ මගේ නිබන්ධනය දාගන්න අවශ්‍ය නිසා ස්වාමීනි .

ප්‍ර මොන භාෂාවෙන්ද ?

උ ඒක කතා කලේ ඔහු කතා කලේ දෙමළ භාෂාවෙන්. මට දෙමළ භාෂාව ඉතා ව්‍යාප්තව බැරි නිසා අර කියන අපේ මුස්ලිම් commissioner වරයාත් කොමිෂන් නොලත් නිළධාරිත් එක්ක හරහා තමයි එයා interpreter කෙනෙක් හැටියට තමයි ස්වාමීනි භාවිතා කරේ.

ප්‍ර එතකොට ඔබ කිව්වානේ යම් යම් කරුණු දැන ගන්නට අවශ්‍ය වුනා මේ නිබන්ධනයට පාදක වෙන කරුණු ප්‍රධාන වශයෙන් කියලා ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර එතකොට මේ සහරාන් හෂිම් ඔබ සමඟ කතා කරන කොට මොනවද ඔහු ඒ ඔබට අවශ්‍ය තොරතුරු සැපයිම සම්බන්ධයෙන් දක්වන ලද කරුණු ?

උ ඔව් ස්වාමිනි මගේ පොතේ ඒක පැහැදිලිව සඳහන් කරලා තියෙනවා ඒක සාරාංශ ගතව. මම ඉදිරිපත් කරේ ඔහුගෙන් දැන ගන්න ස්වාමිනි මෙතන මුස්ලිම් සංස්කෘතිය කොහොමද තියෙන්නේ ඔබලාට මේ අනිත් ජාතීන්ගෙන් අසාධාරණයක් වෙනවාද ? ඔබලා ඒ සම්බන්ධයෙන් ගන්න ක්‍රියා මාර්ග මොනවාද ? ඔබලාට අනිකුත් දැන් ඔය ස්වාමිනි දැන් ඔය බොදු බල සේනා සම්බන්ධයෙන් උදාහරණයෙන් ඔබගේ අදහස කුමක්ද අනිත් එක ඒත් එක්කම විදේශ ආධාර ඔබලාගේ ආයතනවලට ලැබෙනවාද අන්න ඒ කියන කරුණු ස්වාමීනි එක පාරටම ඉදුරාම ඉදිරිපත් කිරීමකින් තොරව අබන්ඩව මොකද ඔහුත් එක්ක එහෙම ඉදිරිපත් කරන්නේ නැතිවෙයි කියන මතයේ තමයි මං හිටියේ. මොකද අපි එහෙම සූක්ෂමව ගතයුතු නිසා ඒක නිසා මම එහෙම කරුණු ඉදිරිපත් කරා එතකොට මම මේ පොතේ ස්වාමිනි සඳහන් කරලා තියෙනවා මගේ ඒ ආපු කරුණු මම අවසර පතනවා එය ප්‍රකාශ කරන්න.

ප්‍ර ඒ කියන්නේ සහරාන් හෂිම් විසින් ඔබ වෙත ඔහුගේ ප්‍රතිචාර වශයෙන් දක්වන ලද ප්‍රතිචාරය ඔබ දැන් සංක්ෂිප්තව කැටි කරලා මේ පොතේ අඩංගු කරලා තියෙනවා .

FAIR COMMENT BY JEZEEM

උ ඔහු මං විසින් ඉදිරිපත් කරන ලද ඒකරුණට අදාල දේවල් ඔහු විසින් දක්වන ලද ප්‍රධානම පිළිතුරු මගේ පොතේ ස්වාමිනි සංක්ෂිප්තව සඳහන් කරලා තියෙනවා.

ප්‍ර සාක්ෂිකරුගේ අවධානයට පිටුවක් යොමු කරනවා C 839 ,135 වෙනි පිටුව ඔබ ඔය කියන කරුණු ඔබ සංක්ෂිප්තව දක්වන්නට පටන් අරගෙන තියෙන්නේ මේ සහරාන් හෂීන් විසින් දක්වනු ලැබුවායි කියලා 135 වෙනි පිටුවේ ඉදලාද?

උ එසේය ස්වාමිනි.

ප්‍ර එය පිටු කීයක් කෙරේ දිවෙනවාද 136 ත් තියෙනවා ?

උ 136 ත් තියෙනවා.

ප්‍ර ස්වාමීනි 135 වෙනි පිටුව C 839 B වශයෙනුත් 136 වෙනි පිටුව C839 C වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර දැන් ඔබට කියන්නට පුලුවන්ද ? මොනවද ඔහු කිව්ව කරුණු ඔබ සංක්ෂිප්තව වාර්තා කරන්න ?

උ ස්වාමිනි මේකේ තියෙනවා . wishes would like to highlight the following comments made by the Maulavee Ashik Zaharan ( ඉංග්‍රිසියෙන් කියවයි ) මෙතන කියන්නේ පලවෙනි කාරණයට ඔහු දක්වා සිටියේ ලංකාවේ සිටින මුස්ලිම් ජනතාව අඛණ්ඩවම මර්ධනයට ලක්වීමක් ඔහු කියනවා කියන එක .

ප්‍ර ඒක මර්ධනයට ලක් කිරීමද **<u>හැරස්ට්</u>**?

උ හිරිහැරයට අඛණ්ඩව ලක් වෙනවා කියන එක ඔහු ඉතාම දැඩිව මෙතෙන්දි ප්‍රකාශ කලා.

ප්‍ර තව වැදගත් දෙයක් බලධාරින් විසින් යම් පියවරක් ගන්නවා ද කියලා?

උ එසේය ස්වාමිනි මම ඒක ඉදිරිපත් කරන්නම් සහ බලධාරින් විසින් මේ සම්බන්ධව කිසිම පියවරක් සාධාරණයක් කරන්න මොහු සාධාරණයක් කරේ නැහැ කියන එකත් ඒ වගේ දේවල් මොහු ප්‍රකාශ කලා.

ප්‍ර ප්‍රමාණවත් පියවරක් නොගන්නා බව ?

උ ඒකට උදාහරණයක් වශයෙන් මොහු ඉදිරිපත් කලා මියන්මාරේ මුස්ලිම් වරුන්ට දැනට අත්වෙලා තිබෙන ඉරණම රෝහිනියා මුස්ලිම් වරුන්ට අත් වෙලා තියෙන ඉරණම වශයෙන් ඔහු උදාහරණයකට ගත්තා ස්වාමිනි.

ප්‍ර වෙන මොනවාද ?

උ දෙවනි කාරණාව ඉදිරිපත් කලා ලංකාවේ මුස්ලිම්වරුන්ට මාධ්‍ය නිදහසක් නැහැ කියලා ඔවුන්ට වෙන හිරිහැර ඉදිරිපත් කරන්න.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ප්‍රකාශනයේ භාෂණයේ නිදහසක් Expressions there grievances ඔවුන්ට තියෙන හිරිහැර ප්‍රශ්ණ පිළිබඳව දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා **Media Freedom** මාධ්‍ය නිදහස. ?

උ මාධ්‍ය නිදහසක් නැහැ කියලා මේ ගොල්ලන් කිව්වේ මේක තනිකරම සිංහල කට්ටිය තමයි මේක **Dominate** කරන්නේ නැත්නම් මේක සම්පූර්ණයෙන් මාධ්‍ය කියන එක සිංහල ජනතාව මතම රඳා පවතින්නේ කියලා ප්‍රකාශ කලා ස්වාමිනි. තුන්වෙනි එක හැටියට ඔහු ප්‍රකාශ කලා ස්වාමිනි ආණ්ඩුව සිංහල අන්තවාදි කටයුතු උදාහරණයක් ලෙස බොදු බල සේනා සහ රාවණ බලය කියන දේවල් පාලනය කිරීමකට නැත්නම් මර්ධනය කිරීමකට ලක් කරන්න කටයුතු කරන්නේ නැහැ කියලා ඔහු ඉදුරාම ප්‍රකාශ කලා. ඊලඟ එක මෙයා ඉල්ලිමක් ඉදිරිපත් කලා මෙයා හිටපු ගරු අමාත්‍ය පාඨලි චම්පික රණවක මහතා ලියපු මේ මුස්ලිම් අන්තවාදි සම්බන්ධව ලියපු පොතක් මේක මේ තර්ජනයක් කියලා තහනම් කිරීමට අවශ්‍යයයි කියන එකත් මොහු ඉදිරිපත් කරා.

ප්‍ර මොකක්ද ඒ පොත?

උ ස්වාමිනි මට එහෙම මතක නැහැ දැන්.මම හිතන්නේ ඒක තහනම් කිරීමට ගත යුතුයි කියලා මොහු කිව්වා.ඊලඟට ස්වාමිනි මේක තමයි ස්වාමිනි මම දකින ප්‍රධාන වශයෙන්ම දෙක ස්වාමීනි එයා කියනවා ස්වාමීනි මුස්ලිම් ජාතියට අවශ්‍ය නැහැ කියලා අනික් සංස්කෘතිත් එක්ක එකතු වීමක් බද්ද වීමක් කරන්න කිසිම අවශ්‍යතාවයක් නැහැ හේතුව ඒකෙන් මුස්ලිම් සංස්කෘතියට හානියට පත් වෙන්න පුලුවන් කියලා කිව්වා. ස්වාමීනි. ඊලඟ එක විශේෂයෙන්ම මුස්ලිම්වරුන්ට අවශ්‍යයයි කියලා හෝලි කුරාන් සහ ෂරියා නීතිය මේ ඒක අනිවාර්යයෙන්ම මේ ගොල්ලන්ගේ ඒක සංස්කෘතික අංශයක් වශයෙන් මේක මේවගේ දේවල්ෂරියා නීතිය සහ අල්කුරානය පරිහරණය කිරීම සහ භාවිතා කිරීමට අනිවාර්යයෙන්ම කිව යුතුයි කියන එක ප්‍රකාශ කලා ස්වාමිණි.

ප්‍ර ඒවා තමයි ඔහු විසින් සදහන් කලේ ?

උ ඊට අමතරව කිව්වා දැන් මම එතෙන්දි ඇහුවා ඔබ සදහන් කරනවා බොදු බල සේනා රාවණ බලය වගේ දේවල් වල එහෙම තර්ජනයක් තියෙනවා මම ඇහුවා එතකොට මීට අවුරුදු කිපයකට දශයකට කලින් වගේ එහෙම මම මගේ දැනුමේ හැටියට බොදු බල සේනා හෝ රාවණ බලය කියන සංවිධාන ලංකාවේ තිබ්බේ නැහැ ඉතින් එහෙම නම් ඔයා කියන විදියට ඒ තත්වය මොකක්ද කියලා නැවත පෙරලා ප්‍රශ්ණ කිරීමක් කරා. නමුත් ඒ වෙලාවේ ඔහු එහෙම ඒකට නිශ්චිත පිලිතුරක් දීමෙන් මහ අරින ලක්ෂණයක් තමයි ස්වාමිනි මම ඔහුගෙන් දැක්කේ.

ප්‍ර ඔබ එතකොට කුමන අධ්‍යයන වර්ෂය සඳහා ද ඔබේ නිබන්ධනය C839 ලෙස ලකුණු කරන ලද නිබන්ධනය ඉදිරිපත් කෙරුවේ

FAIR COMMENT BY JEZEEM

උ 2012/ 2013 කියන වර්ෂවල තමයි අධ්‍යයන වර්ෂවල .

ප්‍ර එතකොට ඔබේ පිළිතුර අනුව පේනවා ඔබ මේ නිබන්ධනය සඳහා විෂයයන් කීපයක් හදාරලා ක්ෂේත්‍ර කීපයක කරුණු එකතු කරමින් විවිධ පුද්ගලයින් මුණ ගැහෙමින් විවිධ මූලාශ්‍ර මගින් ඒ තොරතුරු එකතුකර ගනිමින් කටයුතු කරලා තියෙනවා කියලා ?

උ එසේය.

ප්‍ර ඔබ කිව්වා 2019 මාර්තු මාසේ බුද්ධි සමාලෝචන රැස්වීම් වල න්‍යාය පත්‍රයට ඔබ විසින් ඇතුලත් කරනු ලැබුවාය කියලා සහරාන් හෂිම් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම ?

උ එසේය.

ප්‍ර එතකොට ඔබ මේ 2012/2013 අධ්‍යයන වර්ෂවල ඒ සම්බන්ධයෙන් ඔබේ ඉදිරිපත් කරපු පශ්චාත් උපාධියට ඉදිරිපත් කරපු ඒ නිබන්ධනයේ රැස්කරපු කරුණුත් ඔබට යම් ආකාරයකට පිටුබලයක් ලබාදුන්නාද ඔය තීරණය ගන්නට.

උ එසේය ස්වාමිනි අනිවාර්යයෙන් මේ කරුණු කෙරෙහි අපි විශාල මගේ පුද්ගලිකවත් අවධානයක් තියෙනවා මම මේවට ගිහිල්ලා මේ සාකච්ඡාවට ගිහිල්ලා කතා කරපුවහ ම මට තේරුනා කොතනද අපේ ලංකාව මේ මුස්ලිම් අන්තවාදය කෙරේ තර්ජනයක් තියෙන එක 2013 ස්වාමිනි මගේ වැටහීම අනුව ඉතාම ලොකු තර්ජනයක් තියෙනවා කියලා මේ මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් ඇයි ඒකට හේතු විශේෂයෙන්ම ඇයි මේගොල්ලෝ කැමති නැත්තේ අන්තවාදීන් මේ අනිකුත් ජනතාවත් එක්ක විශේෂයෙන් බද්ද වීමට විශේෂයෙන්ම ස්වාමිනි මට මෙ වෙලාවේකියන්න අවශ්‍යයයි මේ ගොල්ලෝ සෑම විටම කිව්වේ They want to have a Independent Ideology . ස්වාධීන අනන්‍යතාවයක් කියන එක සෑම විටම කරා ඒක බද්ද වීමක් මේගොල්ලෝ කිසිසේත්ම මං පොත ඉදිරිපත් කරලා තියෙන්නේ ස්වාමිනි කිසිසේත්ම ස්වාමිනි අපේක්ෂා කරන්නේ නැහැ අනිත් මහ ජාතින් එක්ක අන්‍ය ජාතින් එක්ක සුමටව බද්ද විමකට මේ ගොල්ලෝ අපේක්ෂා කරන්නේ නැහැ. ඒක හේතුව හැටියට දක්වන්නේ එහෙම වුනොත් ඒ ගොල්ලන්ගේ **Identity** එක නැති වෙයි කියන එක ඒක තමයි ස්වාමීනි මම දීර්ඝව ස්වාමීනි

ප්‍ර ඒ කියන්නේ ශ්‍රී ලාංකියෝ විදියට පෙනී සිටීම ප්‍රතික්ෂේප කරනවාද ?

උ එසේය ස්වාමිනි මේ ගොල්ලෝ ශ්‍රී ලාංකිකයෝ හැටියට පෙනී සිටීම නෙමෙයි මේ ගොල්ලන්ගේ alliance තියෙන්නේ විශේෂයෙන් සවුදි අරාබියත් එක්ක. ඉතින් මං මෙතෙන්දි පොතේ දීර්ඝව කරුණු විස්තර කිරීමක් කරනවා ස්වාමිනි මගේ නිරීක්ෂන මේ ගොල්ලන්ගේ සෑම විටකම ඒ කියන්නේ මේ ගොල්ලන්ට විශේෂයෙන්ම funds හම්බ වෙන්නේ මුල්‍ය ආධාර ලැබෙන්නේ විශේෂයෙන්ම සවුදි අරාබි සහ

FAIR COMMENT BY JEZEEM

ඉරානයකියන රටවලින් තමයි මට එතෙන්දි හැඟි ගියේ මේ ගොල්ලන්ගේ Appellation එහෙම නැත්නම්මේ ගොල්ලන් ගේ බද්ද තාවය තිබ්බේ ලාංකිකයෝ කියලා එකට වඩා මේ ගොල්ලන්ගේ වෙනම අනන්‍යතාවයක් කියන එකතමයි මේ ගොල්ලන්ගේ විශේෂ අවධානයක් තිබ්බේ ස්වාමීනි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

ප්‍ර දැන් ඔබ දන්නවා නේද අන්තවාදය extremism violent extremism ඒ ක්‍රියා කාරකම් terrorism දක්වා වර්ධනය වෙන යම්කිසි ක්‍රමවේදයක් තියෙනවා කියලා ඔබ දන්නවා නේද ?

උ එසේය.

ප්‍ර ඒ විදියේ යම් ක්‍රියාකාරකම් ත්‍රස්තවාදය දක්වා වර්ධනය වීමේ තියන ක්‍රමවේදයේ එක් අවස්ථාවක් නේද exclusivism කියන සංකල්පය ?

උ අනිවාර්යයෙන්ම .

ප්‍ර එතකොට exclusivism කියන සංකල්පයෙන් අදහස් කරන්නේ යම්කිසි ජන කොට්ඨාශයක් රටේ අනිත් ජන කොට්ඨාශ වලින් වෙන්ව විශේෂ **<u>අයිඩන්ටියක්</u>** අනන්‍යතාවයක් ඇති කර ගැනිමටනේද ?

උ එසේය.

ප්‍ර මෙතන සහරාන් කතා කරන්නේ ඒ ගැන නේද ?

උ එසේය ස්වාමිනි මම ඒකරූප සටහන් ආකාරයෙන් පෙන්නුම් කිරිමක් කලා

මෙතැන් සිට ල/ලේ ඉන්ද්‍රාණි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 12.50 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

**ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :**

ප්‍ර : මේජර් සුභසිංහ දැන් ඔබ සිංහල කෙනෙක් බව කථා කරන වෙලාවේදී සහරාන් දැනන් හිටියා නේද?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ උත්සාහ කළේ නැද්ද සුහදව, නමුත් තර්කානුකූලව ඇයි සහරාන් ඔබ මෙහෙම කියන්නේ, ඇයි ඔබ ස්වාධීන අනන්‍යතාවයක් ඉල්ලන්නේ, ඔබත් ශ්‍රී ලාංකිකයෙක් නේද කියලා ඒ විදියට ඔබ තර්කානුකූලව ඔහු සමඟ කරුණු සාකච්ඡා කළේ නැද්ද?

පි : ස්වාමීනි මම එහෙම තර්කානුකූලව, ඒ කියන්නේ එහෙම දේවල් සාකච්ඡා කළා. ඉතිං එතනදී ඔහුගෙන් ලැබුණ පිළිතුර තමයි අපි එහෙම බද්ධවීමක් වුණොත්, ශ්‍රී ලාංකිකයෝ හැටියට අපි ජීවත් වුණොත් අපගේ අනන්‍යතාවය අපිට නැති වෙනවා කියන තර්කය තමයි ස්වාමීනි දිගින් දිගටම දිගින් දිගටම මොහු ප්‍රකාශ කිරීමට ලක් කළේ. ඒ කියන්නේ අර එහෙම නැති වුණොත් ඒගොල්ලොන්ට ජීවත් වෙන්න බැහැ කියලා. ඒ නිසා ඒගොල්ලොන්ට අවශ්‍ය කරනවා මේ වෙනම Identityයක් හැටියට තියාගෙන ජීවත් වෙන්න කියන එක තමයි ඔහු තරයේ ස්වාමීනි මෙතනදී ප්‍රකාශ කළේ.

ප්‍ර : එතකොට ඔහු සඳහන් කළානේ ඔහු මුස්ලිම් ජාතිකයන්, ඉස්ලාම් ජාතිකයන් හැටියට ඔවුන්ට මුස්ලිම් ජාතිකයන් හැටියට යම් යම් හිරිහැර සිද්ධ වෙනවා කියලා?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : ඉතිං ඒවා ගැන ඔබ ප්‍රති පිළිතුරු හැටියට කරුණු ඉදිරිපත් කළාද?

පි : ස්වාමීනි මම බොහෝ කරුණු ඉදිරිපත් කළා. ඒ කියන්නේ එහෙම නෙමෙයි මේක ඉතාම මේ අපි උදාහරණයක් හැටියට දැන් බොදු බල සේනා රාවණා බලය කියන්නේ ඉතාම සිංහල මහා ජාතීන් ඉතාම පොඩි පොඩි කොටසක් ඉන්නේ. විශේෂයෙන්ම ස්වාමීනි මම මගේ පුද්ගලික උදාහරණයක් හැටියට මම මහනුවර දිස්ත්‍රික්කයේ තමයි මම හැදී වැඩුණේ. මගේ ඇඳුම් පවා මම පොඩි කාලයේ ඉඳන්ම මහ ගත්තේ මුස්ලිම් ජාතිකයොන්ගෙන්. සපත්තු පවා මිලදී ගත්තේ මුස්ලිම් ජාතිකයන්ගෙන්. අපි ඉතාම සමීපව කටයුතු කරනවා. මම කවදාකවත් ඒ කාලයේ මට හැඟී ගියේ

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නැහැ මේගොල්ලෝ වෙනම ජාතියක්, වෙනම ආගමක් කිසිසේත්ම එහෙම ස්වාමීනි ඇදුමකින්වත් මට එහෙම හැඟීමක් ආවේ නැහැ. අන්න ඒවා ස්වාමීනි මම උදාහරණ දක්වමින් මම මොහුට කියන්න හැදුවා මෙන්න මෙහෙම නේද විය යුත්තේ කියන එක. නමුත් ඔහු කියන්නේ ....,

ප්‍ර : ඔහුගේ ප්‍රතිචාරය කොහොමද?

පි : ඔහුගේ ස්වාමීනි නැහැ ඒක ලොකු වැරැද්දක් කියන එක කිව්වා ස්වාමීනි. එහෙම කරන එක අතිශය දරුණු වැරැද්දක්. ඒක කිසිසේත්ම විය යුත්තක් නෙමෙයි. ඒක ඔහු එකහෙළාම ස්වාමීනි ඒක බැහැර කළා. ඒක වැරදි දෙයක් හැටියට ස්වාමීනි.

ප්‍ර : ඔබට තේරුණානේ ඔහු ඒ වනවිටත් අන්තවාදයේ මුදුනට ඇවිල්ලා හිටියයි කියලා?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබ ඔබලාගේ ඔය කරුණු දැක්වීම්වලදී ඔහුගේ මේ හැසිරීම් පිළිබඳව ලිඛිතව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට කරුණු ඉදිරිපත් කළාද?

පි : ස්වාමීනි එහෙම ලිඛිතව ඉදිරිපත් කිරීමක් කළේ නැහැ. මම හිතනවා ඔබගෙන් අවසරය ලබනවා මට උදාහරණයක් දෙන්න. ස්වාමීනි මට ඇත්ත වශයෙන්ම අවශ්‍ය කළා මේ පොත ග්‍රන්ථයක් හැටියට ස්වාමීනි 2015 න්, ඒ කියන්නේ ඒ කාලය වෙද්දී මේක මම හදලා ඉවර වෙද්දී 2014 වගේ වුණා Compare කරලා ඉවර කරද්දී. ඒක ඉදිරිපත් කරන්න ග්‍රන්ථයක් වශයෙන්. නමුත් මම මේකට මම බුද්ධි අංශයේ සාමාජිකයෙක්, හමුදා බුද්ධි අංශයේ සාමාජිකයෙක් වශයෙන් මම මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන්, යම් යම් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් මම Advise එකක් ගත්තා මේක මම කරන්නද කියන එක. මොකද මේක ඉතාම Sensitive, සංවේදී කාරණා තියෙන නිසා. විශේෂයෙන්ම 2015 න් පස්සේ ස්වාමීනි. ඉතිං එතනදී ස්වාමීනි මම කියන්න කැමතියි මට හම්බ වුණ උපදෙස තමයි ස්වාමීනි ඔබතුමා අහපු ප්‍රශ්නයට එතනදී කිව්වා මේක ඉදිරිපත් කළොත් ඔබට යුධ හමුදාවෙන් පවා යන්න වෙයි කියලා, ඔබේ රැකියාව පවා අහිමි වේවි. ඊට වඩා හොඳයි ඔයා ඕක තියාගෙන ඉන්න කියන එක තමයි මට හම්බ වුණ Advise එක. අද දක්වාම ස්වාමීනි මේක මම ඉදිරිපත් කළේ නැහැ. මම හිතුවා මේ අවස්ථාව හොඳයි මේක අඩු ගාණේ යම්කිසි මේ කොමිෂන් එකට මේක ඇයි මේක තියෙන්නේ මේ ප්‍රශ්නේ තියෙන්නේ Contextual නැත්නම් මේකේ තියෙන අන්තර්ගතය මොකද්ද කියන එක යම්කිසි හෝ උදව්වක් ගන්න පුළුවන් කියන අදහසින්

FAIR COMMENT BY JEZEEM

තමයි ස්වාමීනි මම මේක ඉදිරිපත් කළේ. ඉතිං ඒ අනුව ඔබතුමා අහපු ප්‍රශ්නය එහෙම ස්වාමීනි එහෙම ඒ කාලයේ එතනදී එහෙම තත්ත්වයක් තිබ්බෙ නැහැ ස්වාමීනි. මොකද ඒ කාලයේ යොමුව ඒ කියන්නේ ඒ කාලයේ යොමුවෙලා තිබ්බේ මේ Radicalization ගැන සොයා බැලීමකට නැත්නම් ඒ වගේ ජාතික මේ වගේ දේවලට නෙමෙයි ස්වාමීනි ඒ කාලයේ 2015 න් පස්සේ ඒ ආණ්ඩුවේ Focus එක තිබ්බේ. ඒක මම, මම හිතන්නේ ඒක මම කිවයුතුයි කියලා මට හිතෙනවා. මොකද ස්වාමීනි ඒ කාලයේ තිබ්බේ Reconciliation නැත්නම් අන්න ඒ වගේ සහජීවනය කියන Focus එක තමයි නැත්නම් යොමුව තමයි තිබ්බේ. බොහොම රාජකාරී වුණා. ඒකනිසා මේ වගේ දේවල් වලට තිබ්බ අවධානය ස්වාමීනි ඉතාම අඩුයි. ඉතිං මම කියන්න කැමතියි SIS එකේ Director, DMI බොහෝ අවස්ථාවලදී කියන්න උත්සාහ කළා ස්වාමීනි. මම ඒකත් කිව යුතුයි. මේක මෙන්න මෙහෙම දේවල් තර්ජන තියෙනවා කියලා. මේක විතරක් නෙමෙයි ඔය L.T.T.E. ක්‍රියාකාරකම් පවා ස්වාමීනි. නමුත් තිබ්බ අවධානය මේකට තිබ්බ මොකද මම කිව්වේ ස්වාමීනි අර Intelligence Process එකේ එකක් තිබ්බා Directions කියන එක. ඒ Directions එකේදී ඉතාම වැදගත්. ඒ Directions එකක් නැතුව ස්වාමීනි බුද්ධි අංශය ක්‍රියා කළ යුතුයි. නමුත් ඒ Directions මොකද ආණ්ඩුවේ Policy එකත් එක්ක, ප්‍රතිපත්තිත් එක්ක තමයි ස්වාමීනි Directions එක ලැබෙන්නේ. එහෙම Directions එකක් ස්වාමීනි මම නම් එහෙම ඔය විශේෂයෙන්ම L.T.T.E. මහා විරු සැමරුම්වලදී පවා ඒ කියන්නේ මම Ground එකේ හිටපු නිසා ස්වාමීනි මම එහෙම දෙයක් නම් එහෙම දැක්කේ නැහැ. ඉතිං ඒක නිසා ඒ වගේ දේවල් ස්වාමීනි ඉතාම මේවාට යොමු වෙන්න තිබුණ අවධානය ඉතාම අඩුයි ස්වාමීනි ඒ කාලයේ.

**********

**ගරු අදිකාරී මැතිණිය :**

ප්‍ර : මේජර් සුභසිංහ ඔබ 2013 වසරේ ඔක්තෝම්බර් මාසයෙන් ඔය සහරාන් කියන පුද්ගලයාව කාත්තන්කුඩි ප්‍රදේශයේදී හමු වුණේ?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : ඔහුව සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන අවස්ථාවේදී ඔහු ඔබට පවසන ලද මුස්ලිම් ජාතිකයන්ටම වූ අනන්‍යතාවය, එය ඔබ කාත්තන්කුඩි ප්‍රදේශයට යනවිටත් එය සිදු වී තිබුණු බව ඔබට නිරීක්ෂණය වුණාද එම පරිසරය බැලීමේදී?

FAIR COMMENT BY JEZEEM

පි : අනිවාර්යයෙන් මැතිණිය. මේ මගේ පොතේ ඡායාරූප වශයෙන් තියෙනවා. විශේෂයෙන්ම ඔහු ගොඩාක් කරුණු තිබ්බා මැතිණියනි. පළවෙනි එක තමයි මම දැක්කා පාර මැද රටඉඳි ගස්. රටඉඳි කියන්නේ මේ ලංකාවේ කිසිම වැවෙන අනන්‍ය වූ ගහක් නෙමෙයි. නමුත් පාර මැද කෙළින්ම රටඉඳි ගස්. ඒක මම Marked කරලා ඒකේ මම ඡායාරූප පවා මේ මගේ පොතේ තියෙනවා. දෙක මැතිණියනි මේ වෙනම Arches නැත්නම් අර තොරණ් වගේ. තොරණ් වගේ දාලා තියෙන හැම තැනම තොරණ්. ඒකෙන් මම අදහස් කළේ දැන් තොරණක් කියන්නේ මැතිණියනි යම්කිසි Boundary එකක්. මේගොල්ලොන්ට පැහැදිලිව ඕන කළා මෙන්න This is our boundary කියන එක ඉදිරිපත් කරන්න ඕන කියන එක. ඒත් එක්කම පොඩි ළමයි පවා මැතිණියනි, මේ බුර්කාව කියන චූටි ළමයි, ඔය කාන්තාවෝ එහෙම ඉතාම ඒවාගේ තමයි ඇඳන් හිටියේ. ඊට අමතරව හැමතැනම ආගමික Symbols නැත්නම් ඒවා සකසා තිබ්බා. ඉතිං මම පැහැදිලිවම දැක්කා Separate Identity කියන එක 2013 පවා කොපමණ වේගයකින් මේගොල්ලෝ එනවද කියන එක. දැන් මට වුණත් මැතිණියනි ඉතාම දැන් ඡායාරූප මට ඒක මගේ අර තිබ්බ කොමිෂන් නිලධාරී කිව්වා සර් බොහොම හොරෙන් Photograph ගන්න. මොකද ඊට වඩා ගත්තොත් එහෙම අපි දෙන්නටම මේ ප්‍රශ්නයක් වෙයි කියන එක. ඉතිං ඒ නිසා මම ඡායාරූප පවා මැතිණියනි ඉතාම රහසිගතව තමයි ගත්තේ ස්වාමීනි. ඒක තමයි ඒ කාලයේ 2013 පවා මැතිණියණි තිබ්බ තත්ත්වය. ඉතිං ඒක පුදුමයක් නෙමෙයි.

ප : ඔබ දුටුවද අරාබි භාෂාවේ අකුරු එහෙම නාම පුවරු එහෙම?

පි : එසේය මැතිණියනි. ඒ කියන්නේ එකක් නෙමෙයි විශාල ප්‍රමාණයක් දුටුවා මැතිණියනි.

ප : මගේ ප්‍රශ්නය ඔබගේ නිබන්ධනය පිළිබඳව. ඔබ රජයේ මුදල්වලින්ද ඔබ ඔය BCIS එකේ පාඨමාලාව කළේ. නැත්නම් ඔබගේ ....?

පි : මේකෙන් මැතිණියනි අපිට ඒ කියන්නේ ....,

ප : දීපු පුහුණුවක්?

පි : ඔව්. මේක පුහුණුවක්. එතකොට අපිට ඒ කියන්නේ හමුදා පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයෙනුත් අපිට මේකෙන් යම්කිසි ගාණක් හම්බ වෙනවා පුහුණුවක් නිසා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔබ මෙම නිබන්ධනය කරන අවස්ථාවේදී සහ එම නිබන්ධනය අවසන් කරන අවස්ථාවේදී හිටියේ යුධ හමුදා බුද්ධි ඒකකයේ කාර්ය මණ්ඩලයේද?

පි : එසේයි මැතිණියනි. මම එතකොට දිගටම මම මැතිණියනි යුධ හමුදා බුද්ධි අංශයේ තමයි හිටියේ.

ප්‍ර : එතකොට ඔබගේ ප්‍රධානියාට ඔබ මෙම නිබන්ධනය ඔබ පාඨමාලාව අවසන් කළා කියලා ඔබ මෙම නිබන්ධනයේ පිටපතක් දෙන්නට අවශ්‍ය නැද්ද ඔබගේ ආයතනයේ ප්‍රධානියාට?

පි : නැහැ. එහෙම අවශ්‍යතාවයක් නැහැ මැතිණියනි. ඉතිං මම අපේක්ෂා කළ මම අර කලින් ප්‍රකාශ කළා වගේ මේක පොතක් වශයෙන් Publish කරන්න තමයි මගේ අරමුණ වුණේ. නමුත් අර මේකේ තියෙන මම හිතුවා මේකේ තියෙන විශේෂයෙන්ම මේ දැන් මේ ආණ්ඩු පෙරළීමත් එක්කම මේ ඇති වුණු සංදර්භය නිසා මම Advise එකක් ගත්තා මගේ යම් යම් ජ්යෙෂ්ඨ නිලධාරීන්ගෙන් මේක විශාල පොතක් නිසා මැතිණියනි. ඉතිං ඒක නිසා ඉතිං ඒගොල්ලෝ දුන්න මතය තමයි මැතිණියනි, මේකේ ඔබ Publish කළොත් ඔබට වෘත්තිමය වශයෙන් පවා යම්කිසි බලපෑමක් එල්ල වෙන්න පුළුවන් කියන කාරණය මැතිණියනි.

ප්‍ර : දැන් Director of Military Intelligence කියන ආයතනයේ තියෙනවද පුස්තකාලයක්?

පි : එසේයි මැතිණියනි.

ප්‍ර : ඔබ මෙම පොත එම පුස්තකාලයේ පරිහරණය සඳහා, පුස්තකාලය විසින් පරිහරණය සඳහා තැබිය යුතුයි කියලා ඔබ ඉල්ලීමක් කළාද මෙම පොත ඔබගේ ආයතනයේ පුස්තකාලයට දැමීම සඳහා?

පි : එහෙම මැතිණියනි මම ඉල්ලීමක් ඉදිරිපත් කළේ නැහැ. මොකද අර මට පළමුවෙන්ම හම්බ වුණ අවවාදය අනුව මට තේරුණා යම්කිසි ඒ කියන්නේ මගේ ආයතනයට වුණත් මේක ප්‍රශ්නයක් වෙන්න පුළුවන් කියන එක ඒ තිබ්බ දේශපාලන තත්ත්වය මත.

ප්‍ර : බය වුණා. ඔබට ඒ අවවාදය ලැබුණේ මොන වසරේදීද? ඔය පොත දැම්මොත් ඔබගේ රැකියාවත් නැතුව යයි එහෙම කියලා?

පි : 2015 න් පස්සේ.

ප්‍ර : 2015 ඔය රජය පත් වුණාට පස්සේ?

පි : 2015 අග විතර වගේ මැතිණියනි. ඒ වගේ තමයි.

**********

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

**ගරු බන්දුල අතපත්තු මැතිතුමා :**

ප්‍ර : මේජර සුභසිංහ දැන් ඔබ සහරාන් හම්බ වෙන්න ගියානේ?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : කාත්තන්කුඩියට?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ වගේ අදහස් තියෙන වෙන කවුරුවක්වත් හම්බ වුණාද එහේදී?

පි : ස්වාමීනි මම මේ පොතේ ඒ කියන්නේ එහෙම කිහිප දෙනෙක්ම හම්බ වුණා ඒ වගේ මට මේ පොතේ තියෙනවා එක එක ඒ කියන්නේ මම විශේෂයෙන්ම ගියා ස්වාමීනි මද්‍රසාස්වලට. මට ඒක නිරීක්ෂණය කරන්න මට අවශ්‍යතාවයක් තිබ්බා මේ මද්‍රසා කොහොමද පාලනය වෙන්නේ කියන එක. මද්‍රසාවල ක්‍රියාකාරිත්වය. එතකොට ඒ මද්‍රසාවල ඉන්න ප්‍රධානීන් ඒ විදුහල්පති එහෙම මම හම්බ වුණා ස්වාමීනි.

ප්‍ර : ඒ සාකච්ඡා කරනකොට ඒගොල්ලන්ගේ තිබුණේ අර විදියේම අන්තවාදී අදහස්ද?

පි : ඔව් ස්වාමීනි. විශේෂයෙන්ම ඒගොල්ලෝ අන්තවාදී අදහස්වලට වඩා ස්වාමීනි විශේෂයෙන්ම මේ මද්‍රසා මම ඇහැව්වා මේ මද්‍රසා පාලනය කිරීමේ මම නිරීක්ෂණය කළා තියෙන ක්‍රමවේදයන් කොහොමද කියන එක. ඒ කියන්නේ ඒක ඉතාම සංවෘතයි. ඉතාම දැන් ඒ දැඩි පාලනයකින් මේ තියෙනවා. විශාල Funds හම්බ වෙනවා. ඒ කියන්නේ උදාහරණයක් හැටියට ස්වාමීනි ගම දුප්පත්. නමුත් පල්ලිය ඉතාම පොහොසත්. පල්ලි විශාල පල්ලියක් තියෙනවා. මම ළඟ Photograph වශයෙනුත් ස්වාමීනි මම ඉදිරිපත් කළා. ඉතිං එතකොට ඒගොල්ලොන්ගෙත් මම දැකපු ප්‍රධානම කාරණය තමයි අන්තවාදයට අමතරව මේගොල්ලොන්ගේ තියෙන අර Separate Identity. මේක තමයි ස්වාමීනි සෑම කෙනෙක්ගෙම බොහෝ තැන්වල තිබ්බේ ස්වාමීනි.

හොඳයි. බොහොම ස්තුතියි.

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

**********

**ගරු සභාපතිතුමා :**

**කොමිෂන් සභාවේ කටයුතු දිවා ආහාරය සඳහා**

**ප.ව. 1.45 වනතෙක් කල් තබයි.**

දැන් වේලාව ප.ව. 1.05 යි.

**********

FAIR COMMENT BY JEZEEM

දැන් වේලාව : ප.ව. 2.35 යි
(මෙතැන් සිට සටහන් කළේ එච්.එම්. ඉන්ද්‍රානි හේරත්)

**නැවත දිවා ආහාරයට පෙර සාක්ෂි ලබා දෙමින් සිටි සාක්ෂිකරුව කැඳවයි.**
**සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි**

**අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :**

ප්‍ර : ඔබ දිවා විවේකයට පෙර ගරු කොමිෂන් සභාවට C-839 වශයෙන් ලකුණු කරලා ඔබේ නිබන්ධනය ඉදිරිපත් කෙරුවනේ?

පි : එසේයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබ කිව්වා 2012, 2013 අධ්‍යයන වර්ෂය සඳහා ඔබ මේ නිබන්ධනය ඉදිරිපත් කෙරුවා කියලා?

පි : එසේයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔය නිබන්ධනයට එහෙමනම් පාදක වුණේ මේ මුස්ලිම් ජන කොට්ඨාශයට අදාළව තිබෙන යම් ප්‍රශ්නයක්නේ?

පි : එසේයි ස්වාමීනි.

ප්‍ර : ඔබට ඒ වස්තු බීජය ලැබුණේ කොහොමද?

පි : මම හිතුවා ස්වාමීනි මේ ප්‍රශ්නය ඒ කාලයේ අපිත් දැක්කා, මමත් බුද්ධි අංශයේ නිලධාරියෙක් වශයෙන් කටයුතු කරද්දී. මේක යම්කිසි රටට තර්ජනයක් ඉදිරියේදී තර්ජනයක් වෙන්න පුළුවන් ප්‍රශ්නයක් කියලා. අපි ප්‍රවෘත්ති මාර්ගයෙන් ඒ වගේ දේවල් අනුගමනය කරලා බලද්දී. ඉතිං මට තේරුණා මේක හොඳ වස්තු බීජයක්, හොඳ මෙතන තියෙනවා අපට විශ්ලේෂණය කරන්න, විශේෂයෙන්ම මම ඉන්න Field එක අනුව මේක හොඳ Topic එකක් නැත්නම් හොඳ මාතෘකාවක් කියන එක. ඒ අනුව තමයි ස්වාමීනි මම මේක තෝරා ගත්තේ මගේ නිබන්ධනයේ මාතෘකාව හැටියට ස්වාමීනි.

ප්‍ර : එතකොට නිබන්ධනයක් පිළියෙල කරනකොට එය සාරගර්භ වෙන්න ඕන, ගවේෂණාත්මක වෙන්න ඕන, තොරතුරු එහි අඩංගු වෙන්න ඕන නේ?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : එතකොට එහෙමනම් ඔබ කියන්නේ සිංහල ජන කොට්ඨාශයට, ද්‍රවිඩ ජන කොට්ඨාශය ආශ්‍රිතව තියෙන කිසිම ප්‍රශ්නයක් තෝරා නොගෙන 2012, 2013 වසරවලදී ඔබේ මනස යොමු වුණේ මේ මුස්ලිම් ආගමික අන්තවාදීන් පිළිබඳව වූ මේ කරුණට?

පි : එසේය ස්වාමීනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හොඳයි. එහෙමනම් ඔබට කියන්නට පුළුවන්ද අන්ත ආගමික මුසල්මානුකරණයක් කොයි ආකාරයටද ශ්‍රී ලංකාවේ ස්ථාවර රජයකට බලපාන්නේ කියලා?

පි : ඔව් ස්වාමීනි. ස්ථාවර රජයක් කියන එක ඕනම රටකට ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වන සාධකයක්. එතකොට අපේ රටේ ස්වාමීනි ඉතාමත්ම පැහැදිලිව පෙනී ගියා විශේෂයෙන්ම 1977 න් පස්සේ මේ අපේ සාමාන්‍ය සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් අභිබවා මේ තවුහිද් නැත්නම් වහාබි කියන මුස්ලිම් මේ සංකල්ප බොහෝ වෙලාවට අපගේ සමහර මුස්ලිම් සාම්ප්‍රදායික මුස්ලිම් සමාජයට රිංගන්න පටන් ගත්තා. ඒක පැහැදිලිව පෙනී යනවා ස්වාමීනි විශේෂයෙන්ම 1977 ආර්ථිකය විවෘත කළාට පස්සේ විදේශ රටවල්වල විශේෂයෙන්ම මැද පෙරදිග අපට රස්සාවල් හම්බ වෙනවා. එතකොට අපේ තියෙන මේ ඉන්න අපේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සහ අනෙක් ජන කොටසක් යනවා සෞදි අරාබියට. නමුත් මේගොල්ලෝ ගිහිල්ලා ස්වාමීනි නැවත ආවේ ඒ තිබ්බ රටවල්වල සංස්කෘතියත් එක්ක. මම හිතන්නේ කොමිසම පැහැදිලිව අපට පේනවා උදාහරණයක් විදියට 1977 ට පෙර ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තාවන් විශේෂයෙන්ම ඔය කියන සෞදි අරාබියේ තියෙන ඔය අබායා නැත්නම් නිකාබ් ඒවා පාවිච්චි කළේ නැහැ. උදාහරණයක් විදියට මම එහෙම දැකලම නැහැ මගේ පොඩි කාලයේ. ඒක එක. දෙවෙනි කාරණය තමයි ස්වාමීනි මම හිතන්නේ මේ තිබ්බ විශේෂයෙන්ම දේශපාලනය කියන එක. විශේෂයෙන්ම 1987 මේ සමානුපාතික ඡන්ද ක්‍රමයත් ආවට පස්සේ මේ විශේෂයෙන්ම මේ අනෙක් ජන කොටස්වලට ඒ කියන්නේ සිංහල හැර අනෙක් ජන කොටස්වලට විශාල දේශපාලන බලයක් ආවා. එතකොට අර අහපු ප්‍රශ්නයට උත්තර වශයෙන් ස්වාමීනි ස්ථාවර රජයක් බිහි කරන්න අනිවාර්යයෙන්ම මේගොල්ලොන්ගේ සහයෝගය කියන එක අවශ්‍ය වුණා. එතකොට එක පැත්තකින් අර ලංකාවේ සාම්ප්‍රදායික මුස්ලිම් තියෙන ඒ කියන්නේ සංකල්ප අභිබවා මේක එනවා. ඒත් එක්කම දේශපාලන බලයක් එනවා. එතකොට මෙන්න මේක නිසා අපිට පැහැදිලිව පෙනී ගියා මේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් අභිබවා යම්කිසි විශාල විශේෂයෙන්ම සෞදි අරාබි සංස්කෘතිය අපේ රටට එන්න පටන් ගත්තා. ඉතිං මේක නිසා විශාල ගැටුමකට වස්තු බීජය ක්‍රමයෙන් ක්‍රමයෙන් හට ගත්තා කියන එක ස්වාමීනි මගේ මේ Research එක නැත්නම් ගවේෂණය කරද්දී මට පෙනී ගියා. ඒක තමයි මම විශාල වශයෙන්ම මෙතනදී පෙන්නුම් කරන්න අදහස් කළේ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ ඔබේ මේ නිබන්ධනය මගින් ඔබ විශෙෂයෙන්ම එහෙනම් අවධානය යොමු කරලා තියෙනවා නේද සාම්ප්‍රදායිකත්වය අභිබවා විදේශිකරණය වුණ ජන සමාජයක පැවැත්මට මොකද්ද වෙන්නේ කියන කරුණ පිළිබඳව?

පි : එසේයි ස්වාමීනි.

ප්‍ර : ඔබ ඔබේ පිළිතුරේදී සඳහන් කළා මේ ඇඳුම පිළිබඳව. ඒ ඇඳුමේ බලපෑම කොයි ආකාරයටද රටක පැවැත්මට ඉවහල් වෙන්නේ?

පි : එසේය ස්වාමීනි. ඒක ඉතාමත්ම වැදගත් ප්‍රශ්නයක් කියලා මම හිතනවා. යමෙකුට හිතන්න පුළුවන් මේ ඇඳුම ප්‍රශ්නයක් නැහැ නේද කියලා. ඒගොල්ලොන්ගේ සංස්කෘතිය මේ ගැටුම, ඇයි ඇයි අපි මේක ලොකුවට ගණන් ගන්නේ කියලා. නමුත් ස්වාමීනි....,

ප්‍ර : මම ඒ ප්‍රහ්නය ඇහුවේ මොකද ශ්‍රී ලංකාව ඇවිල්ලා බහු වාර්ගික, බහු ආගමික රටක්?

පි : එහෙමයි.

ප්‍ර : ඉතිං අපි හැමෝටම සමානාත්මතාවය ගැන කථා කරනවා. හැමෝටම එක විදියේ තම තමන්ගේ නිදහසේ තමන්ගේ ආගම අදහගෙන, තමන්ගේ භාෂාව කථා කරගෙන ඉන්නට පුළුවන් කියලා. දැන් ඒ වගේ පසුබිමකදී ඇයි ඔබ ඔවුන්ගේ ඇඳුම ප්‍රශ්නයක් කරලා ගත්තේ?

පි : එසේය ස්වාමීනි. මම ඒ ඇඳුම විශේෂයෙන්ම මම මෙතන මම ඔය ඇඳුම වශයෙන් ඒක වෙනම Topic එකක් වශයෙන් මේ පොතට දාලා තියෙනවා ස්වාමීනි. ඇඳුම කියන්නේ තමන්ගේ Identity එක නැත්නම් අනන්‍යතාවය තහවුරු කරන මාධ්‍යයක් විදියට තමයි මම දකින්නේ. එතකොට මේ 1977 ට ඉස්සරලා නොතිබ්බ දෙයක් ඇයි දැන් හිටිහැටියේ විශේෂයෙන්ම මේ ආර්ථිකයත් එක්කම අපේ මේ සාමාන්‍ය මුස්ලිම් සමාජයට ආවේ කොහොමද කියන එක. එහෙනම් මේක එහෙනම් 1977 ඒ කාලයට කලින් තියෙන්න ඕන. නමුත් මගේ දැනුමේ හැටියට, මගේ නිරීක්ෂණය හැටියට එහෙම දෙයක් අපේ සමාජයේ තිබ්බේ නැහැ. ඒගොල්ලෝ අර සාමාන්‍ය පර්දාව කියන එක දැම්මා. ඒත් එක්කම නැත්නම් සල්වා කමිස් කියන එක ඇන්දා. නමුත් ඇයි ආවේ එහෙනම්. එහෙනම් මෙතන යම්කිසි ගැටළුවක් තියෙන්න ඕන. ඒ ආවේ ස්වාමීනි මම හිතන්නේ තනිකර අර සෞදි අරාබියේ තිබ්බ සංස්කෘතිය එහෙම්පිටින්ම ආරෝපණය කර ගත්තා තමන්ගේ අර මම කලින් සඳහන් කළා වාගේ තියෙන අනන්‍යතාවය පෙන්නුම් කරන්න. ඉතිං ඒක ප්‍රශ්නය වුණේ ස්වාමීනි මම දකින්නේ ඒක අර සාමාන්‍ය අනිත් සංස්කෘතියත් එක්ක බද්ධවීමකින් තොරව

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පෙන්නුම් කරන්න ඕන. ඒ ඇඳුමෙන් පවා අපි ඔබලාට වෙනස්. අපේ තියෙනවා වෙනම අනන්‍යතාවයක් කියන එක තමයි ස්වාමීනි මේගොල්ලෝ ඉදිරිපත් කරන අදහස. නමුත් මම හිතන හැටියට කිසිම අවස්ථාවක දෙමළ ජනතාව හෝ නැත්නම් ක්‍රිස්තියානි ජනතාව හෝ එහෙම ප්‍රශ්නයක් මගේ දැනුමේ හැටියට එහෙම විශාල ප්‍රශ්න අනිත්, දැන් Major Culture එකත් එක්ක නැහැ. ඒගොල්ලෝ යම්කිසි බද්ධවීමක් වෙනවා. දැන් උදාහරණයක් හැටියට ස්වාමීනි අපි දන්නවා පන්සල ගාවම කෝවිලක් තියෙනවා. නමුත් මම හිතන්නේ නැහැ සිංහල සමාජයේ කාටවත් ගැටළුක් තියෙයි කියලා කෝවිලට යන්න. ඒ වගේම තමයි ක්‍රිස්තියානි පල්ලියත්. මම හිතනනේ නැහැ කාටවත් එහෙම ප්‍රශ්නයක් තියෙයි කියලා. නමුත් මම හිතන ආකාරයට පැහැදිලිව මේකේ ප්‍රශ්නයක් තියෙනවා මුස්ලිම් සමාජයත් එක්ක. මෙතුමිය ඇහුවා වගේම අර ඒ ඇඳුම කියන එක පෙන්නුම් කළා මේක අපේ තියෙනවා වෙනම Identityයක් කියන එක. ඉතිං ඒක බද්ධවීමකට කොච්චර උචිතද කියන එක මොකද අනෙක් සමාජයට පේන්නේ මේගොල්ලෝ හැම වෙලේම සෑම ක්‍රියා කලාපයකින්ම අපගේ Identity එක ප්‍රදර්ශනය කරන්න උත්සාහ කරනවා මිස ඒගොල්ලොන්ගේ පැවැත්මට ඒගොල්ලෝ ගොඩක් කරුණු කාරණා තියෙනවා ස්වාමීනි විශේෂයෙන්ම දේශපාලන කාරණා. නමුත් ඒකෙන් පැහැදිලිව මට පෙනී ගිය එක තමයි සාමාන්‍ය සමාජයේ සාමයට මේක බලපෑමක් වුණා කියන එක තමයි ස්වාමීනි මගේ හැඟීම.

ප : ඔබ යම් කාල වකවානුවක් මෙහිදී හුවා දක්වනවනේ. ඒ තමයි 1977 අවුරුද්ද. 1977 අවුරුද්දේ නේද ශ්‍රී ලංකාවට විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දෙනු ලැබුවේ?

පි : එසේයි ස්වාමීනි.

ප : එකලට ගරු ජනාධිපති වුණ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමන් විසින්?

පි : එසේයි ස්වාමීනි.

ප : එතකොට ඔබ හිතනවද ඒ විවෘත ආර්ථිකයේ ප්‍රතිඵලයක් විදියට තමයි විදේශවලට ජනතාවට ගිහිල්ල ඔවුන්ගේ ඉපයීම් කරන්නට පුළුවන් වුණේ, ආදායම් ලබා ගන්නට පුළුවන් වුණේ?

පි : එසේයි ස්වාමීනි.

ප : එතකොට දැන් ඒකෙන් වෙන්නේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වීමනේ?

පි : එසේයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : විදේශ මුදල් ඉපයීමක් වුණහම ලංකාවේ ආර්ථිකයට එය යම් ආකාරයකට ඒක රුකුලක් වෙනවා, ඉමහත් රුකුලක් වෙනවා නේද?

පි : එසේයි ස්වාමීනි.

ප්‍ර : පසුගිය කෝවිඩ් 19 කාලයේදී ප්‍රශ්නයක් ඇති වුණානේ විදේශවලින් ලැබෙන මුදල් අඩුවෙලා ශ්‍රී ලංකා ආර්ථිකයට. ඉතිං එතකොට ඒ වගේ අවස්ථාවකදී 1977 වගේ කාලයකදීම ඔබ සඳහන් කරන මේ ඇඳුමේ අර්බුදය, මුස්ලිම් ජන කොටියාශයේ ඇඳුමේ අර්බුදය ආරම්භ වුණාද? එහෙම නැත්නම් ඒ කොයි ආකාරයටද ඔය ඇඳුම පිළිබඳව මුස්ලිම් ජන කොටියාශයේ ඇතැම් කොටස් විශේෂ උනන්දුවක් දක්වනු ලැබුවේ කියලා ඔබේ ඔය ගවේෂණයේදී නිබන්ධනය සඳහා වූ ඒ කරුණු සොයා ගැනීමේදී ඔබට දැන ගන්නට ලැබුණද?

පි : එසේයි ස්වාමීනි. මම පැහැදිලිවම මේ මම කාත්තන්කුඩි සහ ත්‍රිකුණාමලය ප්‍රදේශයේදී මම ඒ ඇඳුම සම්බන්ධයෙන් ගන්නේ කාන්තාවන් පවා ස්වාමීනි මම හමු වුණා යම් යම් මුස්ලිම් කාන්තාවන්. ඉතිං මම ඇහුවා ඔබලාගේ මේ ඇඳුම සම්බන්ධයෙන් ඔබලා මොකද්ද හිතන්නේ. මේක ඕගොල්ලොන්ට අපහසුවක් නෙමෙයිද. ශ්‍රී ලංකාව වගේ රස්නේ රටක මේක ඇඳන් ඉන්න අපහසුවක් නෙමෙයිද කියලා. මේක ප්‍රශ්නයක්ද. ඕගොල්ලෝ කැමතියිද මේක ඇඳන් ඉන්න කියලා ඇහුවා. ඒගොල්ලෝ කැමතියි කියලා කිව්වා. මම ඇහුවා ස්වාමීනි ඇයි කියලා. අපි මේ ඇඳුමෙන් අයින් වුණොත් අපි අපගේ මේ තියෙන සමාජයෙන් කොන්වීමකට භාජනය වෙන්න පුළුවන්. ඉතිං ඒක නිසා කොච්චර අපහසුවෙන් වුණත් මේක අපි ඇඳන් ඉන්න අපි කැමතියි කියන එක තමයි ස්වාමීනි ඒ කාන්තාවන් මට ප්‍රකාශ කරලා තිබ්බේ. ඉතිං එකෙන් පැහැදිලිව පේනවා මේ සමාජයේ අපි ඉන්න ඕන ස්වාමීනි පුළුවන් තරම් මම හිතන ආකාරයට විවිධ බහු ජාතික මෙතුමිය ප්‍රකාශ කළා බහු ජාතික, බහු ආගමික රටක ඉද්දී නමුත් අපි පැහැදිලිව තේරුම් ගන්න ඕන ස්වාමීනි අපගේ Major Culture එක තමයි සිංහල බෞද්ධ සංස්කෘතිය. ඒකට බද්ධවීමකින් තොරව ස්වාමීනි යමකිසි කවුරුන් හෝ කටයුතු කරනවා නම් මම හිතන්නේ නැහැ ලංකාවේ දිගින් දිගටම සමාජයේ පැවැත්මක් තියෙයි කියලා. ඒක තමයි ස්වාමීන් වහන්ස මම Interview කරපු ඒ සහරාන් කිව්වේ අපිට බද්ධවීමක් අවශ්‍ය වෙන්නේ නැහැ කියලා. මොකද බද්ධ වුණ ගමන් ස්වාමීනි මොකද වෙන්නේ ඒගොල්ලොන්ට

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලොන්ගේ අරමුණ ඉටු කරන්න බැරි වෙනවා. ඒක තමයි ස්වාමීනි මම හිතන්නේ L.T.T.E. එකත් කළේ මොකද්ද හැම වෙලේම Indoctrinate කළේ මොකද්ද බද්ධවීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. සිංහල ජනතාව ඕගොල්ලොන්ගේ වැඩ තමයි විශේෂයෙන්ම ඔය Suicide දේවල් ඒගොල්ලොන්ගේ ඇඟට දැම්මේ. ඉතිං ඕක මම හිතන්නේ ඔන්න ඔතන තමයි ස්වාමීනි ප්‍රශ්නය තියෙන්නේ.

**********

**ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :**

ප : සාක්ෂිකරු ඔය යම්කිසි පුද්ගලයෙකුට තමන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමට හා ඕනෑම ඇඳුමක් ඇඳීමට ආරක්ෂාවට තර්ජනයක් වෙන්නේ නැත්නම් මූලික අයිතිවාසිකමක් නැද්ද?

පි : ස්වාමීනි ඒක තනිකර අයිතිවාසිකමක්. නමුත් අපි තේරුම් ගන්න ඕන යම්කිසි අවස්ථාවක මේක තර්ජනයක් වෙන්න පුළුවන්. නමුත් අපි දැන් හැමෝම දන්නවා අබායා වගේ ඇඳුමක් ඇන්දොත්, මුහුණ වැහුවොත් එහෙම කාටවත් එයාව හඳුනා ගැනීමේ අපහසුතාවයක් තියෙනවා. ඉතිං ඒක කිසා අපි විශේෂයෙන්ම මුස්ලිම් සමාජයේ නායකයෝ කළ යුත්තේ, මගේ දැක්ම තමයි මුස්ලිම් සමාජයේ නායකයෝ කළ යුත්තේ පුළුවන් තරම් මේ Major Culture එක නැත්නම් සම්පූර්ණ සංස්කෘතියත් එක්ක බද්ධවීමකින් ගමන් කරන එක තමයි ස්වාමීනි මම හිතන්නේ. එතකොට තමයි ඒගොල්ලොන්ටත් ස්වාමීනි ආරක්ෂාව තියෙන්නේ මේ මහා සමාජයත් එක්ක බද්ධ වුණොත් පමණයි. ඒකෙන් වියුක්ත වුණොත් නෙමෙයි කියන එක ස්වාමීනි.

ප : එතකොට සිංහල සමාජය, බෞද්ධ සමාජය තමන්ගේ ජාතික ඇඳුම නැතිව වෙනත් ඇඳුම් ඇඳීම සම්බන්ධයෙන් ඔබගේ මතය මොකද්ද?

පි : ඔව් ස්වාමීනි. ඒක තමන්ගේ පුද්ගලික කැමැත්තක් තියෙනවා. නමුත් අපි ජීවත් වෙද්දී ඒ රටේ සංස්කෘතිය කියන එක වටහා ගැනීම ඉතාම අවශ්‍යයි. මම හිතන්නේ මම මෙහිදී මතක් කළ යුතුයි, ගරු කාදිනල්තුමා මම හිතන්නේ විශේෂයෙන් ප්‍රකාශ කිහිපයක් කරලා තිබ්බා. මේ සංස්කෘතියත් මේ එක්ක යාමේ අවශ්‍යතාවය. මම ඒක ඉතාමත්ම අගය කරනවා ඒ ප්‍රකාශය ඒ කියන්නේ මේ Research එක කරලා තියෙන නිසා ස්වාමීනි. ගරු කාදිනල්තුමා කිව්වා මේ මහා සිංහල, බෞද්ධ සංස්කෘතියත් එක්ක තමයි අපිට ගමනක් තියෙන්නේ. එහෙම නැති වුණොත් කියන

FAIR COMMENT BY JEZEEM

එක එතකොට ස්වාමීනි සමාජය අතර විශේෂයෙන්ම සැකය කියන එක මම ඒකත් මට මතක නැහැ මේ පොතේ තියෙනවා සැකය කියන එක එන්න එන්න මෝදු වෙනවා මේගොල්ලෝ අපිට තර්ජනයක් වෙයිද කියන හැඟීම. ඉතිං ඒවා නැති වෙනවා ස්වාමීනි මේ හැමෝම බද්ධවීමකින් යුක්තව එකිනෙකා සමඟ ඒ සම්බන්ධතාවයෙන් යුක්තව ජීවත් වීම. නමුත් සහරාන් වගේ, මේ වගේ මිනිස්සුන්ට හැමදාම ඕන කළේ නැත්නම් ස්වාමීනි මේගොල්ලොන්ට වෙන් වූ සංස්කෘතියක් හදුනා ගන්න බැරිනම් Indoctrinate කරන්න බැහැ. Radicalization එකට බැහැ යන්න කියන එක තමයි ස්වාමීනි මගේ හැඟීම.

**********

**අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :**

ප්‍ර : ඔබගේ ඒ පිළිතුරේ හරය වන්නේ එහෙමනම් පවතින සමාජයෙන් තම ජන කොට්ඨාශය වෙන් කර ගැනීමේ එක උපාය මාර්ගයක් තමයි මේ ඇඳුම කියන එක?

පි : එසේයි ස්වාමීනි.

ප්‍ර : ඒ ඔබ විසින් සම්මුඛ සාකච්ඡාවන්වලට භාජනය කරන ලද ඒ කාන්තා පාර්ශවය විසින් ඔබට දෙන ලද හේතුව තමයි මොන අපහසුව තිබුණත් අපි ඒක ඇඳගෙන ඉන්නට ඕන. මොකද නැත්නම් අපිව පිළිගැනෙන්නේ නැහැ සමාජයේ කියන කරුණ.

පි : එසේය ස්වාමීනි.

දැන වේලාව : ප.ව. 2.50 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව. 2.50
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මහත්මිය:</u>**

ප්‍ර: ඔබේ නිබන්ධනයේදි සලකලා බැලුවද මොන මොන විදියේ ඇඳුම් ද කාන්තා පාර්ශවය අඳින්නේ කියලා?

පි: එසේ ස්වාමිණි මම අපේ අන්තර් ජාලය හරහා බැලුවා මේ මුස්ලිම් සමාජයේ තියෙන සම්පූර්ණ අඳින ඇඳුම් කොහොමද කියන එක. ඉතින් ඒක මගේ නිබන්ධනයේ සම්පූර්ණ ඇඳුම වැසීමේ සිට සාමාන්‍ය සල්වාර් එක දක්වා කොහොමද කියන එක ගැන මම අධීක්ෂණය කලා. ඒත් එක්කම මම කාත්තන්කුඩියේ කරපු ඒ ගවේෂණයේදී මම බැලුවා එකිනෙක කට්ටිය ඇඳන් ඉන්නේ කොහොමද කියන එක.

ප්‍ර: දැන් මම ඔබෙන් අහන්නේ ඒක පිළිබඳව. ඔබ නිකාබය කියන ඇඳුම ඇඳන් ඉන්න අයව නිරීක්ෂණය කෙරුවද?

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: ඒ පිළිබඳව ඡායාරූප ගත්තද?

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: එය ඔබේ නිබන්ධනයේ අඩංගු වෙනවද?

පි: එසේය ස්වාමිනි.

**ස්වාමිණි 42 වන පිටුවේ, C839 යේ 42 වන පිටුවෙහි තිබෙන ඡායාරූපයක් සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා.**

ප්‍ර: මේ ඡායාරූපය ඔබ මොන අවස්ථාවේදී ද ගත්තේ?

පි: මේ ඡායාරූපයේ ස්වාමිණි පැහැදිලිව පේනවා ඉතා තරුණ වයසේ සිටින ළමයි, ඇත්ත වශයෙන්ම තරුණ කාන්තාවන් තරුණයන් පිරිසක් පාරේ ගමන් කරනවා. ඉතින් මේක මම රහසිගතව ගත්තේ නැවත වතාවක්. එතකොට ස්වාමිණි මෙතන පැහැදිලිව පේනවා මේගොල්ලෝ සල්වාර් කියන ඇඳුමට සාමාන්‍යයෙන් අර ළමයින් අඳින සල්වාර් කමිසයට උඩින් දාගෙන තියෙනවා සම්පූර්ණයෙන් මුහුණ වැහෙන්න කළුපාට ඒ වැසිම. ඉතින් ස්වාමිනි මෙතන පැහැදිලිව පෙන්නන්නේ මොකක්ද මේ වැසීමකින් තොරව මේගොල්ලෝ කුඩා ළමයි මේගොල්ලොන්ගේ දෙමව්පියෝ ඉදිරිපත් කරන්නේ මේගොල්ලොන්ව. ඉතින් ඒකෙන් පේන්නේ මම දැක්ක දේ තමයි කුඩා කල් ඉදන්ම මේගොල්ලෝ යොමු කරනවා මේ තියෙන සංස්කෘතියත් එක්කම ගමන් කරන්න. එතනින් තමයි ස්වාමිණි මම තීරණය කළේ මේවා

FAIR COMMENT BY JEZEEM

දිගින් දිගටම මහා සංස්කෘතියත් එක්ක බද්ධවීමකින් තොරව ගමන් කිරීමට තමයි මේක අවශ්‍ය කරන්නේ කියන එක.

**<u>ස්වාමිණි එම 42 වන, නිකාබය ඇදි ළමුන් පෙන්වන ඡායාරූපයේ අඩංගු 42 වන පිටුව C839D වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.</u>**

ප්‍ර: මීලඟට ඔබට ඒ ඔබේ ගවේශණයේදී දැක ගන්න ලැබුණද අබායා ඇඳලා ඉන්න කාන්තාවන්?

පි: එසේය ස්වාමිණි.

**ස්වාමිණි C839 ලේඛනයේ 44 වන පිටුව සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා.**

ප්‍ර: මේ ඡායාරූපය ඔබ ගත්තේ කොයි අවස්ථාවේදී ද?

පි: මේක ඡායාරූපයේ පෙනෙන්නේ මේ අබායා කියන ඇඳුමක් මුස්ලිම් කාන්තාවක් කාත්තන්කුඩි නගරයේ එයාගේ මේ කුඩා ළමයත් එක්ක ගමන් කරන අවස්ථාවකදී එතකොට පැහැදිලිව පේනවා ස්වාමිණි මුහුණ පමණයි පේන්නේ සම්පූර්ණයෙන් ඇඳුම එයාගේ මුහුණ පමණක් නිරාවරණය වෙලා සම්පූර්ණයෙන් ඇඳුම කළුපාට ඇඳුමක් ඇඳන් ඉන්නවා අබායා කියන ඇඳුම ස්වාමිණි.

ප්‍ර: ඒ කියන්නේ අබායා අඳින කොට ඒක හැම තිස්සෙම ඔබ දැකලා තිබ්බේ කළුපාටින් අඳිනවද?

පි: එසේය ස්වාමිණි. කාන්තාවන් අඳින්නේ ස්වාමිණි හැමවිටම කළුපාටින්.

**<u>ස්වාමිණි C839 ලේඛනයේ 44 වන පිටුව C839E අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.</u>**

ප්‍ර: බර්කා කියන ඇඳුම ඔබ දැක්කද ඔබේ සංචාරයේදී?

පි: ඒකත් දැක්කා ස්වාමිණි.

ප්‍ර: ඒක කොයි වගේ ද?

පි: ඒක සම්පූර්ණයෙන්ම ඒ කියන්නේ එයාගේ මුහුණ පවා ආවරණය වෙන්න තමයි ස්වාමිණි ඒ ඇඳුම ඒගොල්ලෝ අඳින්නේ.

**ස්වාමිණි 45 වන පිටුව සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා.**

පි: ස්වාමිණි මේක ඇත්ත වශයෙන්ම මේක තමයි ප්‍රධානම එක සම්පූර්ණයෙන්ම මුස්ලිම් කාන්තාවක් ආවරණය වෙන ඇඳුම. මේකේ ඇස් පවා සම්පූර්ණයෙන්ම වැහිලා තියෙන්නේ. නිකම් දැල් වගේ එකක් තමයි තියෙන්නේ මේගොල්ලොන්ට එළිය බලන්න ස්වාමිණි. ඉතින් මේක ඉතාම ඇත්ත වශයෙන්ම මේක මම ඇෆ්ගනිස්ථානය වගේ තලෙයිබාන් පාලනයේදි තියෙන ඉතා දැඩි කාන්තාවන් පාලනය කරන්න තියෙන ඇඳුමක් මේක. ඉතින් මේ ඇඳුම තමයි මම මේ ඡායාරූපයේ දක්වලා තියෙන්නේ ස්වාමිණි.

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ කිව්වේ ඔබ ශ්‍රී ලංකාවෙත් මෙවැනි ඇඳුම් ඇඳපු අය දැකලා තියෙනවද?

පි: එසේය

**<u>ස්වාමිණි 45 වන පිටුව C839F අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා</u>**.

ප්‍ර: අබායා සහ නිකාබ් යන දෙකම ඇඳපු අවස්ථාවන් ඔබට දකින්න ලැබුණද?

පි: එසේයි ස්වාමිණි. ඔය කියන ඔය ඇඳුම් සියල්ලම මම කාත්තන්කුඩියේදි නිරීක්ෂණය කළා ස්වාමිණි. ඒකත් දැක්කා ස්වාමිණි.

**ස්වාමිණි සාක්ෂිකරුගේ අවධානයට 43 වන පිටුව යොමු කරනවා.**

පි: ඡායාරූප 2 ක් තියෙනවා ස්වාමිණි. එතකොට 12 කියන්නේ මේ නිකාබ් කියන එක සල්වා කමිසෙකට උඩින් දාගෙන සම්පුර්ණයෙන් එයාගේ ඇස වහගෙන ඉන්න තරුණ ගැහැණු ළමයින් යන ඡායාරූපයක් තියෙන්නේ කාත්තන්කුඩියේදී ස්වාමිණි. ඒත් එක්කම ඡායාරූප 13 කියන එක ඒක සම්පුර්ණම ඉතාමත්ම කුඩා තරුණ ගැහැණු ළමයින් කිහිපයක් දෙනෙක් කාත්තන්කුඩිවලදි සම්පුර්ණයෙන්ම ඇඳුම කියන්නේ සම්පුර්ණයෙන්ම නිකාබ් ඇඳුම ඇඳන් සිටිනවා තමයි මම ඡායාරූප ගත කළේ ස්වාමිණි.

**<u>ස්වාමිණි 43 වන පිටුව C839 G වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.</u>**

ප්‍ර: දැන් ඔබ කාන්තාවන් ගැන නේ මෙච්චර වෙලා කතා කළේ, එතකොට පුරුෂයින්ගේ ඇඳුම සම්බන්ධයෙන් ඔබ යම් නිරීක්ෂණයක් කෙරුවද?

පි: එසේය ස්වාමිණි පුරුෂයන්ගේ ඇඳුම සම්බන්ධයෙන් මම ඡායාරූප දක්වලා තියෙනවා. ඒගොල්ලොන්ගේ නිකම් ජුබ්බා කියලා අඳිනවා ස්වාමිණි තනිකරම සරමත් එක්ක සම්පුර්ණයෙන්ම කියන්නේ මුහුණ පමණක් ඉතුරු වෙන්න සම්පුර්ණයෙන් දිගට අඳින ඇඳුමක් තමයි ඒගොල්ලෝ ඇන්දේ ඔය කාත්තන්කුඩියේ ස්වාමිණි.

**ස්වාමිණි 36 වන පිටුව සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා.**

ප්‍ර: මෙවැනි ඇඳුම් ඔබ කාන්තන්කුඩියේදි දැකලා තියෙනවද?

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: එයට කියන්නේ මොකක්ද?

පි: මේකට මම දැක්කේ ජුබ්බා කියලා ස්වාමිණි ඒගොල්ලෝ මට කිව්වේ. මේක තනිකර කළුපාට ඇඳුමක් වෙන්නත් පුළුවන් නැත්නම් සරමක් එක්ක ඇඳපු උඩින් අර ලෝගුවක් වගේ එකක්

FAIR COMMENT BY JEZEEM

වෙන්නත් පුළුවන්, නැත්නම් ඒ ලෝගුවත් දිගට තියෙන උඩ ෂර්ට් එක දිග ෂර්ට් එකත් එක්ක ඇෆ්ගනිස්ථානයේ අඳින අර නිකම් පකිස්ථානයේ අඳිනවා වගේ ඇඳුමකුත් ස්වාමිණි මේගොල්ලෝ අඳිනවා මම දැක්කා.

ප්‍ර: මේ 36 වන පිටුවේ තියෙන්නේ ඔබ අන්තර්ජාලයෙන් ලබා ගන්නා ලද රූපයක් ද?

පි: එසේය.

ප්‍ර; එතකොට කාත්තන්කුඩියේදි ඔබ දැක්කද ඒ වගේ ජුබ්බා ඇඳපු පිරිමි පාර්ශවය?

පි: එසේය ස්වාමිනි. කාත්තන්කුඩියේදි ඒ වගේ ඔය මම කියපු ජුබ්බා ඇඳුම ඇඳගත්ත දැක්කා. ඒත් එක්කම කළුපාට ඇඳ ගත්ත පුද්ගලයොත් දැක්කා. නමුත් මට මතක හැටියට මට ඒක ඡායාරූප ගත කරන්න අවස්ථාවක් තිබ්බේ නැහැ, තිබ්බ තත්ත්වයත් අනුව. නමුත් ඒ ජුබ්බ කියන ඇඳුම තමයි ස්වාමිණි මේගොල්ලෝ ඇඳගෙන හිටියේ.

ප්‍ර: **මා ඔබේ අවධානයට 37 වන පිටුව යොමු කරනවා,**
එහි යම් ඡායාරූපයක් තියෙනවද පිරිමි පාර්ශවය ජුබ්බා ඇඳලා?

පි: එසේය. ඒගොල්ලෝ දිගටම සම්පූර්ණයෙන් උඩ සිට වැහෙන්න ලෝගුවක් වගේ එකක් තමයි ස්වාමිණි ඒගොල්ලෝ ඇඳගෙන හිටියේ.

ප්‍ර: ඔබ මේ 37 වන පිටුවේ තියෙන පිංතූර ලබා ගත්තේ කාත්තන්කුඩියේදිද?

පි: එසේය ස්වාමිණි.

**<u>ස්වාමිණි 36 වන පිටුව C839H වශයෙනුත්,</u>**

**<u>37 වන පිටුව C839 I වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.</u>**

ප්‍ර: දැන් ඒ ඇඳුම් හැරෙන්නට ඔබ ඔබේ නිබන්ධනයේ තවත් මේ කාත්තා පක්ෂය විසින් අඳින ඇඳුම් පිළිබඳවත් සඳහන් කරලා තියෙනවා නේද?

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: අල්අමීරා කියලා ඇඳුමක් ඔබේ නිබන්ධනයේදි ඔබ ඊට ඇතුලත් කරලා තියෙනවා නේද 46 වන පිටුවේ.

**46 වන පිටුව ඔබේ අවධානයට යොමු කරනවා.**

පි: එසේ ස්වාමිණි. මම මීට ඉස්සෙල්ලම භූමියේ ගවේෂණය කරන්න ඉස්සෙල්ලා මම ඉන්ටනෙට් එකේ ඒ කියන්නේ අන්තර්ජාලයේ බැලුවා විශේෂයෙන්ම BBC කියන හොඳ Web site වලින් මොනවද මුස්ලිම් ඒගොල්ලන්ගේ විශ්ලේෂණය කොහොමද මුස්ලිම් කාන්තාවන් අඳින ලෝකයේ අඳින ඇඳුම. ඒකට

FAIR COMMENT BY JEZEEM

නිදර්ශනයක් හැටියට භූමියට යන්න ඉස්සෙල්ලා ස්වාමිණි මම මේ ඇඳුම් ටික තමයි නිදර්ශනයක් වශයෙන් දාලා තියෙන්නේ ඒ දක්වලා තියෙන ඇඳුම් ටික.

ප්‍ර: එතකොට ඔබ දැක්කද ලංකාවේ අල්අමීරා ඇඳුම් ඇඳලා කවුරු හරි ඉන්නවා?

පි: එසේය ස්වාමිණි. ඒ හා සමාන ඇඳුම් මම දැක්කා කාත්තන්කුඩියේදී.

**<u>ස්වාමිණි 46 වන පිටුව C839J වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා</u>**.

ප්‍ර: ඒ හැරෙන්නට ඔබ මොනවද වෙන ඇඳුම් දැකලා තියෙන්නේ, මේ මුස්ලිම් ජන කොට්ඨාශයේ කාන්තා පක්ෂය අඳින?

පි: ස්වාමිණි ඇත්ත වශයෙන්ම මම මේ BBC Net එකෙන් ගත්තේ ඒ සියළුම ඇඳුම් ස්වාමිණි, මම කාත්තන්කුඩියේදි විවිධ ආකාරයෙන් විවිධ කාන්තාවන් ඇඳන් ඉන්නවා නිරීක්ෂණයට ලක් කළා ස්වාමිණි.

ප්‍ර: එහෙනම් 47 වන පිටුවේ ඔබ කොයි විදියට අඳින එකක් ගැනද සඳහන් කලේ?

පි: මෙතනදී ශාලාව කියලා තමයි BBC Net එකේ දාලා තියෙන්නේ. මීට හා සමාන ඇඳුම් මම දැක්කා කාත්තන්කුඩියේ කාන්තාවන් ඇඳන් ඉන්නවා.

**<u>ස්වාමිණි 47 වන පිටුව C839 K අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.</u>**

ප්‍ර: 49 වන පිටුවේ එහි දැක්වෙන ඇඳුම ඔබ දැකලා තියෙනවද ලංකාවේ කාත්තා කොට්ඨාශය අඳිනවා?

පි: එසේය ස්වාමිණි මම කාන්තන්කුඩියේ සංචාරයේදි මේ ඇඳුමත් මම දැක්කා ඒගොල්ලෝ ඇඳන් ඉන්නවා.

ප්‍ර: ඒකේ නම් මොකක්ද?

පි: ඒක කෂ්මී කියලා තමයි කිව්වේ. කියන්නේ BBC Net එකේ තිබ්බේ මේ නම කමීස්, කෂ්මි කියන නම් තමා තිබ්බේ.

**<u>ස්වාමිණි ඒ 49 වන පිටුව C839 L වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.</u>**

**********

**<u>ගරු අදිකාරී මැතිනිය:</u>**

ප්‍ර: ඔබ දැන් BBC ගිහිල්ලා තොරතුරු හොයාගෙන මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම් ගැන ප්‍රකාශ කළානේ?

පි: එසේය.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ කිව්වා විවෘත ආර්ථිකයෙන් පසු තමයි මේ අරාබිකරණයට ශ්‍රී ලංකාවේ ජනතාව මුස්ලිම් ජනතාව භාජනය වීම ආරම්භ වුනේ කියලා?

පි එසේමයි.

ප්‍ර: ඔබට හැකියාවක් තිබුණද 77 ට පෙර ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මුස්ලිම් කාන්තාවක් ඇඳපු ඇඳුමක් පිළිබඳව ඡායාරූපයක් ඔබේ පොතට ඇතුල් කරන්නට?

පි: මෙතනදී ස්වාමිනි මට හැකියාවක් තිබ්බේ නැහැ, නමුත් මට හොඳට මතකයි මැතිනියනි මම Inter net එක Search කරද්දි මම දැක්කා එක්තරා කළු සුදු ඡායාරූපයක් තිබ්බා එක්තරා කාන්තාවෝ පිරිසක් කියන්නේ කිහිපයක්ම තිබ්බා නිකම් අපේ සාරියට සමාන ඇඳුමක් අර උඩින් හිස විතරක් cover කරලා ආවරණය කරලා ඇඳන් හිටියා. ඒත් එක්කම එහෙම නැති ඒවත් තිබ්බා. එහෙමමත් අධ්‍යයන කිහිපයක් කළා. එතකොට මම දැක්කා විශේෂයෙන්ම ඒ කාලයේ ඒ කියන්නේ නිදහසින් පස්සේ එහෙම තත්ත්වයක් තිබ්බේ නැහැ, මේගොල්ලෝ එහෙම ඔය අබායා නැත්නම් ඒවගේ දේවල් වලට ලක්වීමක් දැක්කේ නැහැ කියන එක තමයි මැතිනියනි මම නිරීක්ෂණය කලේ.

ප්‍ර: එහෙම අඳින සාරියක් ඇඳලා ඒකෙන් ඔළුව වහන කාන්තාවක් ඔබගේ මේ නිබන්ධනය කරන කාලේදී ඔබ කාන්තන්කුඩියේදී දුටුවාද? එකම කාන්තාවක් හෝ?

පි: ඔව් මැතිනියනි මම දැක්කා හැබැයි ඒවා ඇඳන් හිටියේ වයසක කට්ටිය. මම දැක්කේ විශේෂයෙන්ම කියන්නේ අවුරුදු 65 ට වැඩි කාන්තාවන් තමයි මම දුටුවේ. ඒකෙන් මම නිරීක්ෂණය කලේ ඒගොල්ලෝ කියන්නේ ඒ සංස්කෘතියත් දැකලා තියෙනවා. මම හිතුවේ 1977 ට කලින් තිබුණ සංස්කෘතියේ දි ඒ කාන්තාවෝ දැක්කා. එතකොට ඒගොල්ලෝ අනික් සංස්කෘතියත් එක්ක බද්ධ වෙලා හිටපු කාන්තාවෝ වෙන්න ඇති. ඒකයි ඒගොල්ලෝ එහෙම ඇඳන් ඉන්නේ. නමුත් විශේෂයෙන්ම මැතිනියනි තරුණ කාන්තාවෝ ඒ අවුරුදු 50 ට වඩා අඩු කට්ටිය බොහෝ 99% ක්ම ඇඳන් හිටියේ මෙන්න මේ මම දැකපු ඇඳුම් තමා මැතිනියනි මම දැක්කේ.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල්, ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>**

ප්‍ර: ඔබේ නිබන්ධනයේදි මේ හලාල් හරාම් කියන ප්‍රශ්නෙ, හලාල් හරාම් කියන ඒ බෙදීම පිළිබඳව ඔබේ අවධානයට යොමු වුණාද?

පි: එසේය ස්වාමිණි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒක එමගින්, ඒ කියන්නේ හලාල් හරාම් කියන මේ බෙදීම යම් ආකාරයකට ශ්‍රී ලංකා සංස්කෘතියට, ශ්‍රී ලංකා ආර්ථිකයට සහ ලෝක ආර්ථිකයට බලපානවද නැද්ද කියන කරුණ ගැන ඔබේ අවධානය යොමු වුණාද?

පි: එසේය ස්වාමිණි මම සාකච්ජා කළා ලෝකේ මේක බැලුවේ කොහොමද කියන්නේ විශේෂයෙන්ම අන්තර්ජාලය හරහා ලෝකේ මේ හලාල් කියන සම්බන්ධයෙන් එක එක කට්ටිය ලියලා තිබ්බ මාතෘකා කොහොමද, සහ මම ලංකාවේ දැකපු නිරීක්ෂණ මොකක්ද කියන එක යම්කිසි සාකච්ජාවක් මම මගේ ග්‍රන්ථයට ඇතුලත් කලා ස්වාමිණි.

ප්‍ර: ඔබ කිව්වානේ ලෝකයේ ඉන්න අය ඒ ගැන කියන දේ ඔබේ ඔය නිබන්ධනයට ඇතුලත් කරා කියලා නේද?

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: ඔබ එහිදි සලකලා බැලුවද එන්ස්පෙරී කියන ඉතාලි ජාතික ලන්ඩනයේ ජීවත් වන ලේඛිකාවක් ඇය මොනවද මේක ගැන කියලා තියෙන්නේ කියලා?

පි: එසේ ස්වාමිණි දැන් මේ ඡායාරූපයේ ඉතා පැහැදිලිව පේනවා.

**ස්වාමිණි මේ අවස්ථාවේදී ගරු කොමසාරිස්තුමිය විසින් මුස්ලිම් කාන්තාවන් අතීතයේ ඇදි ඇඳුමක් පිළිබඳව ප්‍රශ්න කරනු ලැබුවා සාක්ෂිකරුගෙන්. එය පාදක කොටගෙන ස්වාමිණි සාක්ෂිකරුගේ අවධානයට RGG34B වශයෙන් ලකුණු කොට ඇති ලේඛනය පෙන්වා සිටිනවා. එය ඡායාරූපයක් ස්වාමිණි.**

පි : ස්වාමිණි දැන් අපි මේ ඡායාරූපය අධ්‍යයනය කලොත් ඉතා පැහැදිලිව පේනවා මේ යම්කිසි මැදි වයසක් ඉක්මවූ මුස්ලිම් කාන්තාවක් සාරියට වගේ සමාන ඇඳුමක් ඇඳගෙන හිස පමණක් ආවරණය කරමින් ඉන්න ඡායාරූපයක් කුඩා ළමයින් දෙන්නෙක් එක්ක. නමුත් මේ කාන්තාව කිසිම අවස්ථාවක අබායා වගේ ඇඳුමක් සම්පූර්ණයෙන් කළුපාටක් වගේ ඇඳුමක් ඇඳගෙන සිටීමේ එකක් මෙතන දක්නට ලැබෙන්නේ නැහැ. ඉතින් මේ නිරීක්ෂණයෙන් මම දැක්කා කාත්තන්කුඩියේදීත් මේ විශේෂයෙන්ම අවුරුදු 60, 65 මුහුකුරා කාන්තාවන් බොහෝ වෙලාවට අබායාවලින් තොරව මෙන්න මේ වගේ ඇඳුමක් තමයි ස්වාමිනි ඇඳගෙන හිටියේ.

ප්‍ර: දැන් මම ඔබේ අවධානය මා කලින් අසන ලද ප්‍රශ්නය කෙරෙහි යොමු කරනවා. ඒ තමයි අර පුවත්පත් කලාවේදිනිය ඉතාලි ජාතික, ලන්ඩනය පදනම් කරගෙන ජීවත් වෙන පුවත්පත් කලාවේදිනිය මොකක්ද මේ ගැන කියලා තියෙන්නේ මේ හලාල් හරාම් පදනම පිළිබඳව?

FAIR COMMENT BY JEZEEM

පි: ඇත්තට මම මේකේ හලාල් ගැන ඇත්ත වශයෙන්ම ස්වාමිණි යම් අධ්‍යයනයක් කලා ඉන්ටනෙට් හරහා අන්තර්ජාලය හරහා ලෝකයේ අත්දැකීම් කෙසේද කියලා අධ්‍යයනය කරන්න. එතනදී මට හම්බ වුණා මේ එන්ස්පෙරී කියන ඉතාලි ජාතික මාධ්‍යවේදිනිය දක්වපු අදහස්. මෙයා එතන එයාගේ Topic එකට ලියලා තිබ්බේ හලාල් A test of Terror කියන එක තමයි ස්වාමිණි එතන තිබ්බේ. එයා පැහැදිලිව කියලා තිබ්බා විශේෂයෙන්ම Islamic Brotherhood කියන එක කොහොමද මේ හලාල් කියන මේ දේ හරහා විශේෂයෙන්ම ඉපයීම් කරන්නේ කියලා. ඒ Tax හරහා කොහොමද ඉපයීම් කරන්නේ. මේක කොච්චර ලෝකයේ මේගොල්ලෝ විශාල ආදායමක් ගන්නවද කියන එක මේ එන්ස්පෙරී කියන කාන්තාව මෙතනදී කියලා තිබ්බා. ඊට පස්සේ මම හිතුවා එහෙනම් මේ ලංකාවේ කොහොමද මේක වෙනවා ඇත්තේ කියලා. ඒ අනුව තමයි මගේ අත්දැකීම් අනුව මම කරපු ගවේශනයන් අනුව මට තේරුම් ගියේ මේකේ ලංකාවෙනුත් මේ හලාල් සහතිකය දෙන්නේ යම්කිසි Tax එකක් කවුරු හරි අය කරන්න ඕන නේද කියලා. ඉතින් මම හිතුවා බලද්දි ඔල්සිලෝන් ජමාතේ උලමා කියන එක මේ කෙරෙහි ඒකාධිකාරයක් මේක පාවිච්චි කරනවා කියන ගවේශනය තමයි මට ලැබුණේ ස්වාමිණි. ඉතින් එතකොට තේරෙනවා මේක විශාල මේ කියන අපේ වෙළඳ පලේ මුස්ලිම් ජනතාවට ඉදිරිපත් කරන්න නම් හලාල් කියන එක අත්‍යාවශයයි. නැත්නම් මේගොල්ලෝ පාවිච්චි කරන්නේ නැහැ. එතකොට එහෙනම් අනික් සමාගමනුත් මුස්ලිම් නොවන සමාගමනුත් මේ හලාල් සහතික ගන්න ඒගොල්ලෝ යම්කිසි වියදමක් දරන්න ඕන. එතකොට විශාල ආදායමක් මේගොල්ලෝ නොමිලේම ලැබෙනවා. ඉතින් ඒක කොතරම් රටකට ආර්ථිකයට කෙසේ වෙතත් මේ ජාතික ආරක්ෂාවට මේගොල්ලොන්ට කොහොමද ඒක බලපාන්නේ. විශේෂයෙන් ම මේගොල්ලොන්ට එහෙම අය කලහැකිද, මේ වගේ ඔල්සිලෝන් ජමතේ උලමා වගේ එකකට අයකල හැකිද කියන තර්කය මට පැන නැඟුනා ස්වාමිනි.

ප්‍ර: හොඳයි ඔබ දිවා විවේකයට පෙර ගරු කොමසාරිස්තුමෙකු විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙන ගමන් මදසා පාසැල් පිළිබඳව කිව්වා?

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: ඒ වගේම ඔබ කිව්වා මේ පල්ලි ගොඩනැගිලා තිබෙන ආකාරය පිළිබඳව. දැන් ආර්ථික තත්ත්වයයි, පල්ලිවල තියෙන තත්ත්වයි

FAIR COMMENT BY JEZEEM

සලකලා බලන කොට ඒවා අතර යම් ගැලපීමක් තියෙනවද නැත්නම් අහසට පොළව වගේ විෂමතාවයක් තියෙනවද, මොනවද ඔබ නිරීක්ෂණය කෙරුවේ මේ ආර්ථික තත්ත්වය බලන කොට?

පි: ඕව් ඒක මම ඉතාමත් වැදගත් ප්‍රශ්නයක් ලෙස ස්වාමිණි සලකනවා. ඉතින් මම ගවේශනය කරද්දි මම දැක්කා විශේෂයෙන්ම ඔය රිදීතැන්න කියන පැත්තේ බලද්දි ස්වාමිණි ඒ ගම ඉතාම දුප්පත්. ගමේ කටුමැටි ගහලා, ටකරන් වහල ඒ වගේ ගෙවල් තමා තිබුනේ. නමුත් පල්ලිය ගත්තාම ස්වාමිණි ඉතාම සුඛෝපභෝගී ඒක ලේසියෙන් හදන්න බැහැ. ඉතින් මම ඇහුවා කොහොමද මම ඇහුවා එතන මවුලවිගෙන් ඔබට කොහොමද මේකට Funds ආවේ කියන එක. නමුත් සෑම අවස්ථාවකදීම ස්වාමිණි මේගොල්ලෝ මේ Funds මොකද මගේ research එකේ එක පැත්තක් තමයි මේ Funding කොහොමද කියන එක නැත්නම් මූල්‍ය කොහොමද ලැබෙන්නේ කියන එක. මේගොල්ලෝ ඉතා සූක්ෂමව මේ මම අහන ප්‍රශ්නය මඟ හැරියා. මම ඇහුවා මොන රටෙන්ද ආවේ කියන එක. ඒකත් ඒගොල්ලෝ මඟහැරියා. සමහර කට්ටියක් නම් කිව්වා අපිට සෞදි අරාබියෙන් ආව කියන එකත් කිව්වා. නමුත් මම පැහැදිලිව අහපු ප්‍රශ්නයට උත්තරයක් වශයෙන් මට කියන්න තියෙන්නේ ගම දුප්පත් පල්ලිය පොහොසත්. නමුත් ස්වාමිණි අපි දන්නවා අපේ ගම දුප්පත් නම් පන්සලත් දුප්පත්. මගේ අදහස් හැටියට මගේ නිරීක්ෂණ අනුව කවදාවත් ගම දුප්පත් වෙලා පන්සල පොහොසත් වුනේ නැහැ ස්වාමිණි. කෝවිලත් එහෙමයි. ඒ වගෙත් මම යාපනයේ රාජකාරී කරලා තියෙන නිසා මගේ අත්දැකීම් අනුව ස්වාමිණි. ඒත් මේගොල්ලොන්ට එහෙම දෙයක් නැහැ විශාල ඉදිකිරීම් වලට විශාල මූල්‍යාධාර ලැබෙනවා. ඉතින් ඒක මගේ නිරීක්ෂණයට ලක් කලා ඒවා කොහෙන්ද එන්නේ, පාලනය වීමක් නැහැ කියන එක ස්වාමිණි මම 2013 ත් දැක්කා මේක. ඉතා විශාල ප්‍රශ්නයක් බවට පත් වෙන්න පුළුවන් කියන එක ස්වාමිණි. **<u>ස්වාමිණි ඊට අදාලව ඔහුගේ නිබන්ධනයේ තිබෙන පිටු අංක 105 ඒ කියන්නේ නිවාස පෙන්නුම් කරන රූපරාමු තිබෙන පිටුව තමයි 105. එය C839M වශයෙනුත්,</u>**

**<u>එය රිදීතැන්නේ ස්වාමිණි. රිදීතැන්නේ අබුබක්කා සිද්දික් පුම්මා මොස්ක් යන පල්ලියේ තිබෙන ඡායාරූපයේ අඩංගු පිටු අංක 104, C839N වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කරනවා.</u>**

ප්‍ර: දැන් ඔබෙන් ප්‍රශ්න කරනු ලැබුවානේ මේ මද්‍රසා පාසැල් පිළිබඳව?

FAIR COMMENT BY JEZEEM

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: එතකොට ඔබට කියන්නට පුළුවන්ද ඔබ ඒ මද්‍රසා පාසැල්වලට ගියාද?

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: ඔබ මොනවද නිරීක්ෂණය කරේ ඒවයේ තියෙන සම්පත් පිළිබඳව, ඒ වගේම ඒවායේ අධ්‍යාපනය ලබන ළමුන් පිළිබඳව?

පි: ඔව් ස්වාමිණි ඒකත් ඉතාම මම හිතන්නේ වැදගත් දෙයක් ලෙස මම සලකනවා ස්වාමිණි. ඒවට මට යන්න හම්බ වුනේ මගේ අර මගේ මුස්ලිම් ජාතික අපේ කමිෂන් නිලධාරිත් එක්ක තමයි මට ඇතුලට යන්න හම්බ වුනේ ප්‍රථම වශයෙන් ම. නැත්නම් කිසිසේත්ම ඒගොල්ලෝ ඇතුලට ගන්නේ නැහැ පලවෙනි එක. දෙවෙනි එක මම දැක්කා ස්වාමිණි විශාල සම්පත් මේගොල්ලන්ට තියෙනවා එක. දෙක තමයි ස්වාමිණි මේක ඉන්ටනෙට් පහසුකම් තිබ්බට ඒවා පුදුම විදියට කියන්නේ පාලනය කරලා තියෙන්නේ. සමහරක් ඒවට ඉන්ටනෙට් පහසුකම් නැහැ. සහ ඉතාම well drill ඒ කියන්නේ හරිම විනයක් යුක්තව තමයි මේ පාසැල කරන්නේ. තනිකරම ඒ ආගමේ දේවල් විතරයි මේගොල්ලන්ට හදාරන්න ඉඩ දෙන්නේ. ඉතින් මම දැක්කේ මේගොල්ලෝ හරිම කියන්නේ දැඩි විනයකින් යුක්තව තමයි මේකේ කටයුතු කරන්නේ ඒක එක. දෙවෙනි එක තමයි මේ ආධාර ලැබෙන විදිය. ඒකත් ස්වාමිණි මේගොල්ලන් කිව්වා විශේෂයෙන්ම මැළිකමක් දක්වනවා කොහොමද මේ ආධාර කියන එක හෙළිකරන්න මැළිකමක් දක්වනවා. ඉතින් මම අපේ Informant හරහා විශේෂයෙන් මගේ හරහා ගත්තා ඉතා සූක්ෂමව ගත්තා මේකේ මට මතක හැටියට කරන්ට් බිලක් එහෙම ගත්තා. ඉතා විශාල කරන්ට් බිලක්. නමුත් ස්වාමිණි නැවත වතාවක් ගම දුප්පත්.

ප්‍ර: රිදීතැන්න කොහේද තියෙන්නේ?

පි: රිදීතැන්න තියෙන්නේ ස්වාමිණි වැලිකන්ද ආශ්‍රිතවය ස්වාමිණි. ඉතින් මම හිතුවේ ස්වාමිණි මේ කොහොමද මේ ගම දුප්පත් වෙලා දුප්පත් මිනිස්සුන්ට කොහොමද මෙච්චර බිලක් මේ දෙමාපියන්ට පුළුවන්ද මෙච්චර බිලක් දෙන්න මේ ළමයින්ට. මම නැවතත් තේරුම් ගත්තේ ස්වාමිණි එහෙනම් අනිවාර්යෙන්ම මේකට කොහෙන් හරි ආධාර ලැබෙන්න ඕන කියන එක තමයි මම ස්වාමිණි තීරණය කලේ. එතකොට ඒකේ Source එක මොකක්ද නැත්නම් ඒ ආධාර ලැබුණ ක්‍රමය පිළිබඳව මේගොල්ලෝ විශාල මේ ඉන්න මවුලවිතුමාලා විශාල මැළිකමක් දක්වනවා මේ ආධාර ලැබුණු ක්‍රමය හෙලි කිරීමට ස්වාමිණි.

**********

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

**<u>ගරු අදිකාරී මැතිනිය:</u>**

ප්‍ර: ඔබ සඳහන් කලානේ රිදීතැන්න තියෙන්නේ වැලිකන්ද ප්‍රදේශයේ කියලා, වැලිකන්දෙ කොහේද? වැලිකන්ද කියන්නේ මනම්පිටිය මඩකලපුවට යන කොට තියෙන

පි: එසේය මැතිනියණි.

ප්‍ර: ඒ වැලිකන්ද ප්‍රදේශයේ අලුතෙන් මුස්ලිම් ජනාවාසකරණයක් සිදු වෙලා තිබෙනවයි කියලා ඔබට නිරීක්ෂනය වුනාද ඔය වැලිකන්ද ප්‍රදේශයේ?

පි: එසේය මැතිනියණි. ඉතාම මම පැහැදිලිව දැක්කා ක්‍රමයෙන් ක්‍රමයෙන් ඒ මුස්ලිම් ජනාවාස කියන එක ඉතා විශාල වශයෙන් වෙනවා කියන එක මැතිනියනි. මම හිතන්නේ ඒක අපි සැඟවීමට දෙයක් නෙමෙයි. ඒක මම හිතන්නේ කලිනුත් සාකච්ඡා කරන්න ඇතැයි කියලා මම විශ්වාස කරනවා මැතිනියනි. ඉතා සූක්ෂමව ඉඩම් අත්පත් කරගෙන මේ ජනාවාස ව්‍යාප්ත කිරීම මැතිනියණි මම එතනදි නිරීක්ෂණය කලා. මොකද මට මතක හැටියට මගේ research එකෙත් දක්වලා තියෙනවා මේ රිදීතැන්න කියන්නේ පරණ සිංහල ගම්මානයක්. එතකොට මේගොල්ලෝ කොහොමද මේවගේ මුස්ලිම් ගම්මාන වුණේ. ඉතින් ඒකට මැතිනියනි මම මෙතනදි ප්‍රකාශ කරන්න කැමතියි මම හිතන්නේ මේගොල්ලන්ට ඒ කියන්නේ මේකේ තියෙන තර්ජන දෙකයි තියෙන්නේ. එකක් තමයි අපි ගත්තොත් සිංහල මම ඇත්ත වශයෙන්ම ප්‍රකාශ හැටියට මැතිනියනි මේ තියෙන ජන සංඛ්‍යාව මම මෙතනදි මගේ research එකේදිත් දැක්කා මුස්ලිම් පවුල්වල අවම වශයෙන් තමයි අඩුම සංඛ්‍යාව තමයි 4 ක් කියන එක. 4 කියන එක සාමාජිකයන් අඩුම ගාන. නමුත් ඊට වැඩිය විශාල වශයෙන් ඉන්නවා. ඒත් එක්කම මැතිනියණි මම ප්‍රකාශ කරන්න කැමතියි ඒක එක. එතකොට ජනගහනය පිළිබඳව මේගොල්ලෝ විශාල උනන්දුවක් දක්වනවා. නමුත් අනික් ජන කොටස් ස්වාමිනි සිංහල හෝ දෙමල හෝ නැත්නම් ක්‍රිස්තියානි දෙමල හෝ එහෙම තත්ත්වයක් නැහැ ඒක එක. දෙවෙනි එක තමයි මැතිනියණි ලංකාව කියන්නේ ඉතා කුඩා රටක්. ඉතින් මේගොල්ලෝ උපරිම උත්සාහ කරනවා, මෙන්න මේ අන්තවාදීන් උපරිම උත්සාහ කළා මේ ඉඩම් අල්ලා ගැනීම කියන එක එකත් මැතිනියනි මම පිළිතුරක් හැටියට සඳහන් කරන්නේ රිදීතැන්නේ ඒ ක්‍රමයෙන් ක්‍රමයෙන් දැක්කා ඒ ඉඩම් අල්ලා ගැනීම කියන තත්ත්වය මැතිනියණි.

**********

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

**<u>අතිරේක සොලිසිටර් ජනරාල්, ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>**

ප්‍ර : ඔබ ගරු කොමසාරිස්තුමිය අසන ලද ප්‍රශ්නයකට මේ මුස්ලිම් ජනතාවගේ ජනගහනය වැඩි වන ආකාරය පිළිබඳව කරපු නිරීක්ෂණය ගැන කිව්වානේ?

පි: එසේමයි.

ප්‍ර: එතකොට ඔබට පැහැදිලි කරන්නට පුළුවන්ද ද්‍රවිඩ, සිංහල, බර්ගර් යන ජන කොට්ඨාශයි මුස්ලිම් ජන කොට්ඨාශයයි සලකලා බැලුවාම ඔවුන් එකිනෙකා අතර සංකලනය වීමක් වෙනවද, එහෙම නැත්නම් මුස්ලිම් ජන කොට්ඨාශය අනෙකුත් ජන කොට්ඨාශවලින් විස්තාරණය වීමක් වෙනවද කියලා?

පි: ඔව් ස්වාමිණි මට ඉතා පැහැදිලිව පේන දේ තමයි මේ රැඩිකල් කණ්ඩායම ඒක දේශපාලනයේ තියෙන්න පුළුවන්, වෙන තත්ත්වයක් තියෙන්න පුළුවන් ස්වාමිණි. මේගොල්ලෝ උපරිම උත්සාහ කරනවා මේගොල්ලෝ කියන්නේ ස්වාධිනව අනික් කණ්ඩායමකින් තොරව විස්තාරණය වීමක් මම මෙතනදී දැක්කා. මම හිතන්නේ මගේ research එකේ ස්වාමිණි මම graphic සටහනක් ආකාරයෙන් දැක්කා එතකොට මේගොල්ලෝ මම දැක්කා පැහැදිලිව විශාල වශයෙන් මේගොල්ලොන්ගේ ජනගහණය ස්වාමිණි එන්න එන්නම වර්ධනය වෙනවා. එතකොට අර Traditional spaces, නැත්නම් සාම්ප්‍රදායික අනිත් සිංහල සහ දෙමළ සමාජයේ තියෙන සාම්ප්‍රදායික කොටස් තල්ලුවීමක් වෙනවා ස්වාමිණි. දැන් හොඳට මම කාන්තන්කුඩියේ දැක්කා ස්වාමිනි පෙර තිබුණේ ඔක්කොම දෙමල තමයි ඒ කාලවල Batticaloa තිබ්බේ. නමුත් මේගොල්ලන් ක්‍රම ක්‍රමයෙන් ජනගහනය වැඩි වීමත් එක්කම ස්වාමිණි අර සාම්ප්‍රදායික දෙමළ සමාජය හා ගැටුම් ඇති වෙනවා. ඉතින් එතකොට අනිවාර්යයෙන්ම මේ ජාතික ආරක්ෂාවට මේක බලපෑමක් වෙන්න පුළුවන් කියන එක තමයි ස්වාමිණි මෙතනදි අර මගේ graphic සටහනින් මම පෙන්නන්න උත්සාහ කලේ.

ප්‍ර: එතකොට එහෙම නම් ඔබේ නිබන්ධනයේදි ඔබේ අවධානය යොමු වුණාද ප්‍රචණ්ඩත්වය කොයි ආකාරයටද සිද්ධ වෙන්නේ කියලා මේ වගේ අනිත් ජන කොට්ඨාශවලින් විස්තාරණය වුනාම යම් ජන කොට්ඨාශයක්?

පි: ස්වාමිණි මට මතක හැටියට මම එක graphic සටහනක් ආකාරයෙන් ද පෙන්නුම් කිරීමක් කලා. ඒ කියන්නේ කොහොමද Radicalize වෙලා අන්තිමටම හිංසනය දක්වාම මේක වර්ධනය වෙන්නේ කියන එක. ඒක මම දැක්කේ ඇත්ත වශයෙන්ම මේක

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ත්‍රිකෝණයක් කියන එක තමයි මම එතනදි අපේක්ෂා කලේ. ත්‍රිකෝණයේ අපි දන්නවා යටම එක ඉතාම sharp. උඩ එක එහෙම sharp නැහැ ඒ ත්‍රිකෝණයේ edge එක. ඒක නිසා මම මෙතනදි පෙන්නුවා ක්‍රමයෙන් මේ Radicalization දක්වා extremism වලට ගමන් කිරීමේ පියවරයන් ටික මගේ research එකේ දැක්වුවා ස්වාමිණි.

ප්‍ර: එතකොට ආරම්භ වෙන්නේ මොකෙන්ද?

(එම පොතෙහි අදාල කොටස සාක්ෂිකරුට පෙන්වයි)

පි: ස්වාමිණි මෙතන 27 චිත්‍රය යටතේ මම දක්වා තිබෙනවා Factors leading for Violence. ඒ කියන්නේ කොහොමද මේ කාරණා ගැටුමක් දක්වා වර්ධනය වෙන්නේ කියලා ස්වාමිනි. ප්‍රථමයෙන්ම මම දැක්ක දේ තමයි Stick Observation of Religion . ඒ කියන්නේ මේ ආගම කියන එක ඉතා දැඩිව භාවිතා කිරීම. නැත්නම් එකට යොමුවීම. දෙක තමයි Fundamentalism and Radicalization දැන් ඒකෙන් පස්සේ කෙනෙක්ව යොමු වෙන්න පුළුවන් මේ අන්තවාදී බවට පත් වෙන්න පුළුවන්. දෙවෙනි පියවර. තුන්වෙනි පියවර හැටියට ස්වාමිණි යන්න පුළුවන් extremism වලට. කියන්නේ එතනින් ඔබ්බට ගිහිල්ලා දැන් එයා තනිකර තමාගේ දේ විතරයි තමන්ට පේන්න පටන් ගන්නේ. එයා සමාජයෙන් ඈත් වෙලා. ඒ extremism වලට. ඒ extremism අන්තිම එක තමයි ස්වාමිනි Violence. Once the Violence begin the phone for Flexibility and compromise diminish ඒකෙන් මම කියන්නේ ස්වාමිණි මේ Violence වලට ගියපුවාම අනික් කෙනෙක්ගේ අදහසක් අහන එක අනික් සමාජයේ බලන එක කෙලින්ම ස්වාමිනි එතනින් ඒක තුරන් වෙලා යනවා ඒ පුද්ගලයින්ගෙන්. ඊට පස්සේ අන්තිමට වෙන්නේ ඒක නිසා අන්තිම පියවර හැටියට Violence වල ගියපු මේගොල්ලෝ කිසිම අවස්ථාවක Flexibility නැත්නම් නම්‍යතාවයක් දක්වන්නේ නැහැ අනික් සමාජයේ මිනිස්සුන් එක්ක ජීවත් වන්න. මේගොල්ලන්ට පේන්නෙම තනිකරම ඒ මේගොල්ලෝ අදහන දේ. නැත්නම් මේගොල්ලෝ දකින දේ තමයි සෑම විටම හරියි කියලා පේන්න පටන් ගන්නේ. ඉතින් එතනින් ගියපුවාම අන්තිමේදි ක්‍රමයෙන් දැන් සහරාන්ගේ වගේ ඒගොල්ලෝ Violence වලට යෑම නැත්නම් ගැටුම්වලට යාම වලක්වන්න බැහැ කියලා තමයි ස්වාමිණි මගේ නිරීක්ෂණයට මම ලක් කලේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට බෙදුම් වාදය තමයි යම් ආකාරයකට එහෙම නම් ඒකට හේතු සාධක වෙන්නේ?

පි: එසේයි ස්වාමිණි.

ප්‍ර ඔබේ ඔය නිබන්ධනයේදී ඔබේ අවධානය යොමු වුණාද ඔලුවිල් ප්‍රකාශනය කෙරෙහි?

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: ඔලුවිල් Declaration

පි: මට මතක හැටියට දැක්වීමක් කලා.

ප්‍ර: ඒ ඔලුවිල් ප්‍රකාශනය බිහි වුණේ මොන හේතුවක් නිසාද? එමගින් මේ මුස්ලිම් ජන කොට්ඨාශය ලබා ගන්නට උත්සාහ කරලා තියෙන්නේ මොනවද කියන එක පිළිබඳව ඔබට මේ ගරු කොමිෂන් සභාව දැනුවත් කරන්න පුළුවන්ද ඔබ අධ්‍යයනය කරපු ආකාරයට?

පි : ස්වාමිණි මේක මං පිටු අංක 144 දී දක්වලා තියෙනවා Muslim Perspective on Sri Lankan conflict කියන ඒ මාතෘකාව යටතේ, ඒ ඔලුවිල් ප්‍රකාශය මගින් 2003 ජනවාරී මාසේ 29 වෙනිදා ඔලුවිල් ඩෙක්ලරේෂන් එක යටතේ මේගොල්ලොන්ට ඕන කරලා තියෙනවා අර LTTE දැක්වුවා වගේ ස්වයං පාලන කලාපයක් කියන එක. Autonomous Muslim homeland in the east කියන එක. ඉතින් එතනදි මේ මුස්ලිම් ශිෂ්‍යයන් කියන්නේ අග්නිදිග විශ්ව විද්‍යාලයේ එක 2003 ජනවාරි මාසේ 29 අග්නිදිග විශ්ව විද්‍යාලයේ ළමයින් පිරිසක්, සිසුන් පිරිසක් මෙතනදි කියනවා Clearly inspired by the Tamil Nationalist වඩුක්කොඩෙයි. මම හිතන්නේ අපි හැමෝම දන්නවා වඩුක්කොඩෙයි ගිවිසුම මොකක්ද, ඒකෙන් මොකක්ද ලංකාවේ LTTE ප්‍රශ්නය ආරම්භ කරන්න වුනේ එතනදි ඒගොල්ලෝ වඩුක්කොඩෙයි 1970 ප්‍රකාශනයේ පැහැදිලිව කියනවා දෙමල ජනතාවට වෙනම මව් බිමක් අවශ්‍යයි කියලා. ඒ වගේම තමයි මෙතනදි මේගොල්ලෝ කියනවා ඒගොල්ලන්ටත් මව් බිමක් අවශ්‍යයි කියලා. එතකොට එතනින් ඒගොල්ලෝ urge කරනවා ප්‍රකාශයට දක්වනවා මෙන්න මේ කරුණු ටික. එකක් තමයි separate Identity. කියන්නේ ඒගොල්ලොන්ට තියෙනවා වෙනම අනන්‍ය වූ අනන්‍යතාවයක්. අනිත් එක Traditional home land on Easton Couse . එහෙනම් ඒගොල්ලන්ට අවශ්‍යයි ඊසාන දිග අර LTTE වගේ ඒගොල්ලන්ටම මව් බිමක්.

ප්‍ර: නැගෙනහිර?

FAIR COMMENT BY JEZEEM

පි: නැගෙනහිර. විශේෂයෙන්ම ඊලඟට right to self determination පැහැදිලිව පේනවා LTTE ත් කලේ මේ හා සමානව. Right to Self Determination කියන එක හැම වෙලාවේම මේගොල්ලෝ තාමත් ඒක තමයි කියන්නේ මේගොල්ලොටම ඕනේ මේගොල්ලන්ගේම දේවල් පාලනය කර ගන්න. 4 වන එක ස්වාමිණි Right to have territorial Predominantly in habit by muslim demarcated and Protected in any long term political solution ඉතින් ඒක නිසා එතකොට ඒ මුස්ලිම්වරුන්ට අවශ්‍ය කරලා තියෙනවා කියනවා මේ දේශපාලන වශයෙන් මෙගොල්ලන්ගේ අරමුණු ඉටු කර ගන්න. ඉතින් එතකොට පැහැදිලි පේනවා ස්වාමිනි එතකොට මොකක්ද වෙනස ඔලුවිල් ප්‍රකාශනයේ සහ 1970 වඩුකුඩෙයි ප්‍රකාශනය. එතකොට පැහැදිලි පේනවා මේක යම්කිසි සුළු හෝ උත්සාහයක් තියෙනවා මේගොල්ලන්ට අන්‍ය වූ ජාතියක්, කියන්නේ මහ ජාතියෙන් වෙන් වූ වෙනම ජාතිකත්වයක් තියෙන බව ප්‍රකාශ කරන්න. ඉතින් එතකොට මේ වගේ නම් ideology එක තියෙන්නේ ස්වාමිනි මම හිතන්නේ නැහැ සහරාන්ලා වගේ කට්ටිය බිහිවෙන එක කිසිසේත්ම අරුමයක් නෙමෙයි කියන එක තමයි මම ප්‍රකාශ කරන්න කැමතියි ස්වාමිණි.

**********

**<u>ගරු අදිකාරී මැතිනිය:</u>**

ප්‍ර: ඔබට කියන්න පුළුවන්ද මේ කොමිසමට ඔලුවිල් ප්‍රකාශයේ නිර්මාතෘ කවුද කියලා? ඒ නමත් එක්කම කියනවා නම් හොඳයි?

පි: මෙතන මැතිණියනි මට මතක හැටියට මගේ research එකේ දාලා තියෙන්නේ මේ මුස්ලිම් ශිෂ්‍යයන් පිරිසක් අග්නිදිග විශ්ව විද්‍යාලයේ මුස්ලිම් ශිෂ්‍යයන් පිරිසක් තමයි මැතිණිය මේ ඔලුවිල් ප්‍රකාශනය කියන එක ඉදිරිපත් කලේ. මැතිණියනි මගේ research එකේ දාලා තියෙනවා.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජීනසේන මෙනවිය:</u>**

ප්‍ර: මීට පෙර හලාල් සහ හරාම් පිළිබඳ ඒ නිබඳනය ගැන කතා කරන කොට සඳහන් කරනු ලැබුවා ජමතුල් උලමා සංවිධානය විසින් මෙයට මූලිකව කටයුතු කරනවාය කියලා, ඒ වගේම එමගින් ආදායම් ලබනවාය කියලා, එහෙම කිව්වද?

පි: එසෙයි ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඔය මුස්ලිම් ජන කොටියාශ ආශ්‍රිතව පාලනයන් සිදු වෙන්නේ කුමන සංවිධාන මගින්ද කියලා ඔබේ අවධානය යොමු වුණාද?

පි: ස්වාමිණි මම විශ්වාස කලේ මගේ research එකේ මම දැක්කා නිරීක්ෂණයේදි මේ සිලොන් ජමතුල් උලමා කියන ආයතනය මුස්ලිම් වියතුන්ගේ සංගමය කියන එක තමයි ප්‍රධාන වශයෙන්ම මේ මුස්ලිම් සමාජය මෙහෙයවීමක් කරන්නේ. ඉතින් ඒගොල්ලෝ සියළුම දේවල් ඒගොල්ලොන්ගේ ආගමික කටයුතු, වෙන කටයුතු ඒගොල්ලොන්ගේ පාලනය යටතේ තියෙනවා කියන එක තමයි ස්වාමිණි දැක්කේ. නමුත් අපි දැක්කා නමුත් මේගොල්ලෝ සෑම විටම එහෙම කිව්වට නමුත් යම් යම් කණ්ඩායම් මේගොල්ලන්ගේ පාලනයක් කර ගන්න බැරි මට්ටමක ස්වාමිණි එහෙමත් තියෙනවා. මගේ නිරීක්ෂණයේ ඒ දවස්වල තිබ්බා ඒ කියන්නේ යම්කිසි ප්‍රශ්නයක් ආපුවාම මේ පාලනයකින් තොරයි කියන එක. ඒත් එක්කම ස්වාමිනි මම අපි දන්නවා ලංකාවේ ඉන්නවා සුන්නි සහ ශියා කියලා කණ්ඩායමකුත් ඉන්නවා නැගෙනහිර කලාපයේ ස්වාමිණි. නමුත් ඒගොල්ලෝ ශියා කියන කණ්ඩායම මගේ දැනුමේ හැටියට ඕල්සිලෝන් ජමෙතෙයි උලමා එකට සම්බන්ධ කරගෙන නැහැ. වෙන යම් යම් සාම්ප්‍රදායික කොටසුත් මේකට සම්බන්ධ කරගෙන නැහැ. එතකොට කොහොමද වෙන්නේ මේ කියන සංවිධානය සමස්ථ මුස්ලිම් සමාජයම නියෝජනයක් වෙන්නේ කෙසේද කියන එක මට ප්‍රශ්නයක් ආවා. ඒගොල්ලෝ ඒක බලහත්කාරයෙන් අයිතිකර ගෙන තියෙනවද කියන එකත් ස්වාමිනි ගැටළුවක් ආවා, විශේෂයෙන් ම මේ වගේ රැඩිකල් දේවල් මුස්ලිම් වියතුන්ගේ සංගමය නම් මේ වගේ සෙපරේට් අයිඩෙන්ටියක් හදා ගන්න කවුරු හරි කෙනෙකුන් උත්සාහ කරනවා නම් එහෙනම් ඒගොල්ලන්ගේ වගකීම විය යුතුතේ කියලා මම කල්පනා මේවගේ දේවල් අවම කිරීමට. ඒකට ඒගොල්ලන්ගේ කොපමණ දායකත්වයක්ද තියෙනවාද කියන එකත් මට ස්වාමිණි මේකේදි ගැටළු සහගත තත්ත්වයක් ආවා.

ප්‍ර: දැන් මේ පල්ලි පාලනය කිරීම සම්බන්ධයෙන් ඔබ අධ්‍යයනයක් කලාද මුස්ලිම් පල්ලි?

පි: එසේයි.

ප්‍ර: ඒ අවස්ථාවේදි ඔබට පෙනුනද ඒ මුස්ලිම් පල්ලි පාලනය ඒ ඒ පල්ලිය අයත් වන නිකාය අනුව වෙනස් වෙනවා කියලා?

පි: එසේයි ස්වාමිණි. එතකොට ඒ මුස්ලිම් පල්ලිය අයත් නිකාය අනුව තමයි ගොඩක් sets තියෙනවා ඒ sets අනුව තමයි ස්වාමිණි

FAIR COMMENT BY JEZEEM

මේ මුස්ලිම් පල්ලි සියළු ක්‍රියාත්මක දේවල් වෙන්නේ. බොහෝ වෙලාවලට අනික් set එක යන්නේ නැහැ මේ කණ්ඩායම ඊලඟ පල්ලියට යාමක් වෙන්නේ නැහැ. ඉතින් මට මතක හැටියට මගේ නිබන්දනයේ තියෙනවා 2007 වෙච්ච බේරුවල වෙච්ච සිද්ධිය. විශාල ගැටුමක් වුණා ඒ සෙට් දෙකක් අතර. ඉතින් මම පස්සේ කල්පනා කලා මේ වගේම ගැටුමක් නේද 2017 දි සහරාන් සහ අනෙක් කණ්ඩායම් අතර වුනේ කියන එක. ඒ ගැටුම අඛණ්ඩව දිගින් දිගටම තිබ්බා ස්වාමිණි.

ප්‍ර: ඒකෙන් ඔබ අදහස් කරන්නේ වරින්වර මේ ගැටුම් හිස උසවනවා කියලා මේ එකම ජන කොට්ඨාශය අතර නමුත් විවිධ ආගමික මතමතාන්දර නිසා?

පි: එසේයි.

ප්‍ර: හොඳයි ඔබට එහෙනම් කියන්නට පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට ඔබේ අධ්‍යයනයේදී හෙලිවුණ ඒ නිකායන් නැත්නම් sets මොනවද කියලා?

පි: sets ස්වාමිණි කිහිපයක්ම තිබ්බා. ඒ කාලේ මම අධ්‍යයනය කරපු දේ ස්වාමිණි මේකේ තබ්ලික් ජමාත්, ඊට පස්සේ ජමෙයිතු ඉස්ලාම් නැත්නම් JI ඊට පස්සේ තවුහිද් ජමාත්, ජමාතේ මුසල්මින්, එන්වාහු මුසල්මින් සහ තරීකා කියන ප්‍රධාන sets ටික තමයි ස්වාමිණි නැත්නම් කණ්ඩායම් මුස්ලිම් කොටස් ටික තමයි මගේ දැනිමේ හැටියට මගේ නිරීක්ෂණයට ලක් වුනේ.

ප්‍ර: 2013 ත් ඒවා තිබුණයි කියලා තමයි ඔබ කියන්නේ?

පි: අනිවාර්යයෙන්ම.

ප්‍ර: එතකොට ඒ හැරෙන්නට තව පොඩි පොඩි නිකායන් පිළිබඳව ඔබ නිරීක්ෂණය කෙරුවද?

පි: ඊට අමතරව පොඩි නිකායන් හැටියට මම දැක්වුවා ස්වාමිණි. දැන් ඔය ස්පින්ට ගෘප් නැත්නම් ඒකෙන් වෙන් වෙලා ගිය කණ්ඩායම්, දැන් ඔය ජීහාඩ් ඊට පස්සේ Former Defense Force Members , ඊට පස්සේ තරුණ කණ්ඩායම්, ඊට පස්සේ විශේෂයෙන්ම විවිධ මුස්ලිම් දේශපාලන පක්ෂවලට දක්වන කණ්ඩායම් වගේ දේවල් ස්වාමිනි මම ජමාතුල් උලමා කවුන්සිල් එක ඒ වගේ පරිපාලනය කරන කණ්ඩායම්. ඒ වගේ විශාල විභේදන මම නිරික්ෂණය කලා මුස්ලිම් සමාජයේ.

ප්‍ර; දැන් ඒ විභේදන හේතු කරගෙන එකම ජන කොට්ඨාශය අතර විවිධ ප්‍රශ්න පැන නැගිලා ඒක ආර්ථික වශයෙන්, සාමාජීය වශයෙන් බලපාන ප්‍රශ්න වෙලා ජාතික ආරක්ෂාවට එමගින් හානියක් සිද්ධ වෙනවද?

FAIR COMMENT
BY JEZEEM

පි: අනිවාර්යයෙන්ම ස්වාමිණි මම හිතනවා මොකද මේගොල්ලෝ උත්සාහ කරනවා තමාගේ set එක තමාගේ නිකාය අභිබවා වර්ධනය කිරීමක් කරන්න. අනිත් එක අභිබවා මූල්‍යාධාර ලබා ගන්න විවිධ රටවලින්. අනික් කණ්ඩායම් අභිබවා මේකේ මිනිස් බලය තහවුරු කර ගන්න. එතකොට අනිවාර්යයෙන්ම මම හිතනවා ස්වාමිනි මේ ගැටුම් තියෙන විවිධ විශාල තියෙන විභේදන ලංකාවේ ජාතික ආරක්ෂාවට ඉතාම තර්ජනයක් වෙන්න පුළුවන් මේක හරියට මේ මුස්ලිම් සමාජය විසින්ම පාලනය කිරීමක් කරලා නැත්නම් යම්කිසි control එකක් කලේ නැත්නම් මේක තර්ජනයක් වෙන්න පුළුවන් කියන එක ස්වාමිණි.

ප්‍ර: ඉතින් ඔබ ඒ සම්බන්ධයෙන් යම් නිර්දේශයන් කරනවද?

පි: එසේයි ස්වාමිණි.

ප්‍ර: මොනවද ඒ නිර්දේශ? ඔබේ නිබන්දනයේ ඒ නිර්දේශ පිළිබඳ සඳහන් වෙනවද?

පි: එසේ ස්වාමිනි. මම බැලුවා මේකට එහෙනම් අපිට ප්‍රායෝගිකව කරන්න පුළුවන් මොන වගේ නිර්දේශද මෙතන තියෙන්නේ කියලා. නිර්දේශ කිහිපයක් ස්වාමිණි මම ඉදිරිපත් කරනවා. එකක් තමයි Establishment of new mixed multinational school in targeted areas කියන්නේ විශේෂයෙන්ම මේ වගේ තැන්වල විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ඒ වගේ පැති වල මේ සියළුම ළමයින් එකට තියෙන පාසැල් ඉදිකරන්න කියන එක. දැන් මේක මුස්ලිම් පාසැල් සිංහල පාසැල්, බෞද්ධ පාසැල් දෙමල පාසැල් තොරව මේ සියළුම සංස්කෘතින් පොඩි කාලේ ඉදන්ම මොකද වඩා වැදගත් වෙන්නේ ස්වාමිනි කුඩා කලසිටම එකිනෙකා අතර දැන ගැනිම. එතකොට කිසි වෙලාවක අවිශ්වාසයක් කියන එක ඇති වෙන්නේ නැහැ. එහෙම තත්ත්වයක් අපේ ලංකාවේ දැනට ඉතාම අඩුයි කියන එක තමයි mix වුණ ගමන්ම ස්වාමිණි අපි පුද්ගලිකව එකිනෙකා හඳුනා ගන්නවා. ඒක මම මෙතනදි දැක්වුවා.

ප්‍ර: මේ අවස්ථාවේදි මට ඔබට මදක් බාධා කරන්න වෙනවා, දැන් ඔබ ඒ මතය දරනවා නම් ඉල්හාම් ඊබ්‍රාහිම් ඔහු තමයි ෂැංග්‍රිලා හෝටලයේ එක් ප්‍රහාරකයෙක්. ඉන්ෂාෆ් ඊබ්‍රාහිම් ඔහු තමයි සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ ප්‍රහාරකයෙක්. මේ දෙදෙනාම සිංහල විද්‍යාලයක, සිංහල බෞද්ධ ළමයින් වැඩියෙන් ඉන්න විද්‍යාලයක අධ්‍යාපනය ලබපු අයනේ. එතකොට එහෙනම් ඔවුන් ඔය අනිත් අයත් එක්ක, අනිත් ජන කොට්ඨාශයන් එක්ක මුළු අධ්‍යාපන කාලය තුළදීම හැසිරිලා තිබුණනේ. ඔවුන් සමඟ එකට කටයුතු

FAIR COMMENT BY JEZEEM

කරලා තිබ්බනේ. එතකොට ඔබ ඔය කරන නිර්දේශය සමහර විට මම ඔය ඒ දෙන එක ව්‍යතිරේකයක් වන්නට පුළුවන් ඔබ ඔය කියන දේට. නමුත් එවැනි තත්ත්වයනුත් ඇති වෙනවා නම් ඔබේ ඔය නිර්දේශය සාර්ථකව ක්‍රියාත්මක කරන්න පුළුවන්ද?

පි: නමුත් ස්වාමිණි මැතිනිය පැහැදිලිව ප්‍රකාශ කලා වගේ එහෙම ව්‍යතිරේක තියෙන්න පුළුවන්. නමුත් අපි බහුතරයක් එහෙම එකිනෙකාගේ සංස්කෘතිය හඳුන ගත්ත ගමන් ස්වාමිනි අපිට පුද්ගලික contact ඇති වෙනවා. personal contact. ඉතින් මේක අපේ වගේ රටක ඉතාමත්ම වැදගත්. එතකොට අපි සැකයෙන් බැලීම කියන එක මහ හැරෙනවා. අපි අනිත් එක්කෙනාගේ සංස්කෘතිය ගරු කරන්නේ නැත්නම්, අදුරන් නැත්නම් ඒක කුඩා කල සිටම මම ප්‍රකාශ කලා වගේ ඒ වගේ ව්‍යතිරේකයන් ඇති වෙන්න පුළුවන් සමාජයේ වෙන බාහිර බලපෑම් මත පසුකාලීනව. නමුත් ප්‍රධාන වශයෙන්ම මේ වගේ දේවල්වලට මේ Radicalization එකට යෑමක් නැති වෙන්න පුළුවන් අනික් එක එක්කෙනාගේ ආහාෂය ලැබෙනවා ස්වාමිණි. අනික් එක්කෙනාගේ සංස්කෘතිය දකිනවා, අනික් එක්කෙනාගේ ගෙදරට යනවා, එතකොට ඒ පුද්ගලික සම්බන්ධතා ඇති වෙනවා, අවාහා විවාහ වෙන්න පුළුවන්, එතකොට යම්කිසි මම හිතනවා යම්කිසි මට්ටමකට පාලනය කිරීමක් කරන්න පුළුවන් කියන එක. ඒක පලවෙනි එක. එතකොට දෙවෙනි එක මම දැක්ක Discourage unskilled labor going to Middle East. ඒ කියන්නේ මැදපෙරදිග කලාපවලට මේ skill එකක් නැති නුපුහුණු කාන්තාවන් නැත්නම් පිරිමින් යවන එක වලක්වන්න කියලා. ඉතින් මොකද මේගොල්ලෝ ගියපුවාම මේගොල්ලන්ගේ අධ්‍යාපන මට්ටම් අඩුයි, මේගොල්ලෝ ඕනම දේකට ස්වාමිනි මේ Radicalize නැත්නම් වහබි කියන විශේෂයෙන්ම දැඩි මතධාරීන්වලට ලක් වෙන්න පුළුවන්. ඉතින් මේකත් අපි අවම කිරීම් ජාතික ප්‍රතිපත්තියක් හැටියට කළයුතුයි කියලා ස්වාමිණි මම හිතුවා. ඊලඟ එක තමා Promote tourism in the Eastern Province. ඉතින් මේ සංචාරය කිරීම ස්වාමිනි ඒක හේතුකොට ගෙන අනික් පැතිවල ඉන්න මිනිස්සු විදේශිකයන් සහ දේශිකයන් මේ කලාපවලට යනවා. එතකොට ඒගොල්ලොත් එක්ක මිශ්‍රවීමක් වෙනවා. එතකොටත් අර සංස්කෘතික මිශ්‍රවීමක් වෙනවා කියන හැඟීම මට ආවා. තුන්වෙනි එක Security forces to administrative certain historical places and forest ඉතින් මේ අපි ඔක්කොම දන්නවා මේ ලංකාවේ සංස්කෘතියේ

FAIR COMMENT BY JEZEEM

අනන්‍යතාවයක් තමයි ඓතිහාසික ස්ථාන. ඉතින් මේවා පාලනයට විශේෂ ක්‍රමවේදයක් අවශ්‍යයි කියන එක ස්වාමිණි මම 2013 ත් දැක්කා. නැත්නම් මේවා නැති කරපු ගමන් කාට හරි ඒ පැත්ත. උදාහරනයක් විදියට අපි Eastern පැත්තේ නැගෙනහිර පැත්තේ යම්කිසි පන්සලක් තිබ්බොත් ඓතිහාසික මේක නැති කරපු ගමන් ඕන කෙනෙකුට කියන්න පුළුවන් නැහැ මෙහෙම දෙයක් තිබ්බේ නැහැ කියලා. ඉතින් ඒකත් මගේ නිර්දේශයට මම ඇතුලත් කලේ ස්වාමිණි ඒකයි. අනික් එක Relocate Prisons and other major development major government programs wich involve people and Institutio කියන්නේ රටේ අනික් ආයතන හිතමුකෝ prisons නැත්නම් ඒවගේ දේවල් ප්‍රධාන ආයතනත් ඒ පැතිවල locate කලොත් ස්වාමිණි mix වීමක් වෙනවා කියන එක.

**********

<u>**ගරු බන්දුල අතපත්තු මැතිතුමා:**</u>

ප්‍ර: මිස්ටර් සුබසිංහ දැන් ඔබගේ සොයා බැලීම් අනුව තාමත් වැඩි Traditional මුස්ලිම්ලද නැත්නම් ඔය Extreme ideology තියෙන මුස්ලිම්ලද?

පි: ස්වාමිනි මම දැනටත් විශ්වාස කරන්නේ සාම්ප්‍රදායික මුස්ලිම්වරු ලංකාවේ වැඩියි කියන එක. නමුත් අර වහබ්වාදය අනුගමනය කරන පිරිස් අතර දැන් තියෙනවා දේශපාලන බලයක් තියෙන්න පුළුවන් ස්වාමිනි. සහ විශේෂයෙන්ම ආර්ථික බලයක් තියෙන්න පුළුවන්. මම ඒකත් graphic සටහනක් ආකාරයෙන් දැක්වුවා කොහොමද මේ සාමාන්‍ය community එකෙන් වෙන්නේ කියන එක. මම හිතන්නේ වැඩිපුරම සාමාන්‍ය මුස්ලිම් ජනතාව තමයි සාම්ප්‍රදායිකව ලංකාවේ වැඩි නමුත් අරගොල්ලන්ගේ තියෙන බලය කියන්නේ දේශපාලන වශයෙන් වේවා ආර්ථික වශයෙන් වේවා මම හිතනවා විශ්වාස කරනවා වැඩි අරගොල්ලන්ට තියෙන හැකියාව නැත්නම් අරගොල්ලන්ට තියෙන යොමුව අඩුවීමකට ලක් වෙන්න පුළුවන් කියන එක ස්වාමිණි මම විශ්වාස කරනවා.

ප්‍ර: දැන් මේ Extreme ideology තියෙන දේශපාලඥයෝ කවුද?

පි: සමාවෙන්න මට මෙතනදි ප්‍රකාශ කිරීමට අපහසුයි ස්වාමිනි එහෙම Extremes ideology කියන එක. නමුත් මම මෙතන ප්‍රකාශ කරන්න කැමතියි මෙන්න මෙහෙම ඒ කියන්නේ මම දැක්ක දේ තමයි ස්වාමිණි මේ මුස්ලිම් සමාජයේ අපි කවුරුත් දන්නවා දේශපාලනයෙන් තමයි නායකත්වයක් ඉදිරිපත් වෙන්නේ. ඒක සාමාන්‍ය දේ. නමුත් මේගොල්ලන් කොතරම් උත්සාහ කරනවද

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

මේ මුස්ලිම්වරු සාමාන්‍ය අනික් සමාජයේ දෙමල හා සිංහල කියන සමාජයට බද්ධ කිරීමට කොපමණ උත්සායක් කරනවද කියන එක නම් මගේ මේ research එක අනුව කියන්නේ මම දැක්ක ඒ කාලේ දැක්ම අනුව මට ප්‍රශ්නයක් ආවා. එතන මට ගැටලුවක් තියෙනවා කියලා මම ප්‍රකාශ කරන්න කැමතියි.

ප්‍ර: දැන් එහෙම ඒ විදියේ දේශපාලඥයෝද වැඩි දැන් මේ මුස්ලිම් ජන සමාජය අනුව බලපුවාම?

පි: මගේ අවබෝධය හැටියට ස්වාමීණි එහෙම දෙයක් මම දකින්නේ නැහැ. එහෙම තමයි මම ඔබතුමාගේ එකට එකඟ වෙනවා. ඒගොල්ලෝ තනිකර තමන්ගේ අයිඩින්ටි එක මුස්ලිම් කියන අයිඩින්ටි එක ප්‍රකාශ කරනවා හැර මම නම් දැක්කේ නැහැ බොහෝ අවස්ථාවක අර ගරු කාදිනල් තුමා ප්‍රකාශ කලා වගේ අපි ඔක්කොම එකට ඉමු කියලා ක්‍රියාවෙන් අපිට ඕන වචනවලින් කියන්න පුළුවන් ස්වාමීණි නමුත් මේ සමස්ථ සමාජයම mobilize කරන්න ඕනේ ඒකට. නමුත් එහෙම කරනවාද කොපමණ දෙයක් තියෙනවාද යන්න සැකයක්. ඒක නිසා තමයි ස්වාමිනි සහරාන්ලා වගේ කට්ටියට පුද්ගලයින්ට ලේසියෙන්ම මේ සමාජයේ පැවැත්මක් තියෙන්නේ. මොකද එහෙම කරනවා නම් මේ වගේ පුද්ගලයින්ගේ ක්‍රියාකලාප මෙහෙම විශාල ව්‍යාපෘති. මේ වගේ ප්‍රහාරයක් ඒවා ඉදිරිපත් වෙන්න තිබ්බා. නමුත් එහෙම දෙයක් නැහැ කියන එක තමයි මගේ හැඟීම.

ප්‍ර: නමුත් ඔබ කිව්වේ දැන් ඒගොල්ලන්ට දේශපාලන බලය වැඩියි කියලා?

පි: මගේ හැඟීම මම හිතන්නේ ඒ දේශපාලන බලය වැඩි වෙන්න පුළුවන් කියන එක නැත්නම් මේ වගේ දේවල් කොහොමද වෙන්නේ කියන එක තමයි ස්වාමිනි මට කියන්න තියෙන්නේ. මට කියන්න facts නැහැ පුද්ගලයන් වශයෙන් දක්වන්න මගේ research එකේ ඒ කාලේ වගේ facts තිබ්බේ නැහැ මෙයා මෙයා කියලා එහෙම දක්වන්න. නමුත් මට හිතුනේ ස්වාමීණි කොහොමද අර සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ගෙන් අයින් වෙලා මේ වහබි කියන culture එක නැත්නම් වහබි කියන සංස්කෘතිය ආපුවාම දේශපාලන බලය හා ආර්ථික බලය ආපුවාම අර සමාජයෙන් ඇදලා අරගෙන අනන්‍යතාවයක් බිහි කරන්න පහසුවක් වෙන්න පුළුවන් කියන එක මගේ දැක්ම.

**********

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>**

ප්‍ර: බොහොම ස්තූතියි ඔබ ඒ කරන ලද සියළුම පැහැදිලි කිරීම්වලට. ඔබ කිව්වා බුද්ධි සමාලෝචන මණ්ඩලයේ රැස්වීම් වලට සහභාගි වන අය විසින් න්‍යාය පත්‍රයේ තියෙන කරුණු සාකච්ඡා කරනවයි කියලා?

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: දැන් එහෙම සාකච්ඡා කලාට පස්සේ ඒ පිළිබඳව සටහනුත් ඔබ ලබා ගන්නවා කිව්වානේ. තවදුරටත් ඔබ පැහැදිලි කලා එසේ ලබා ගනු ලබන සටහන් ඒ රැස්වීමට සහභාගී වූ අය අතර නැවත සංසරණය කිරීමක් කරනවාය කියලා?

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: ඒ සංසරණය කිරීමේදි යම් යම් පුද්ගලයින්ට යම් යම් අංශවලට ඉදිරියට කලයුතු වැඩ පිළිබඳව ලේකම්තුමා විසින් ආරක්ෂක ලේකම්තුමා විසින් යම් නියම කිරීමක් මඟ පෙන්වීමක් කරනවද?

පි: එසේයි ස්වාමිණි ඒ note එකේ දානවා කවුරු හරි ඇහුවොත් SIS එකට රාජ්‍ය බුද්ධි සේවයට task කලා නම් ඒකේ දානවා වගකීම යටතේ දානවා මේක රාජ්‍ය බුද්ධි සේවයෙන් කරන්න ඕන කියන එක. ඉතින් ඒක ලේකම්තුමාගේ අණ පරිදි නැත්නම් නියෝගය පරිදි සිදුකල යුතුයි ස්වාමිණි.

ප්‍ර එතකොට ඒවා ඉටු කරලා නැවත වාර්තා කරන්නට ඕන?

පි: අනිවාර්යයෙන් ස්වාමිනි අපි බුද්ධි මූලධර්මවල එකක් තියෙනවා continues reviews ඒ කියන්නේ ඒක දෙයක් වුනාට පස්සේ ඒක අඛණ්ඩව නිරීක්ෂණයට ලක් කිරීමක් කරන්න ඕන. එක වතාවක් කරලා එහෙම නතර කරන්න බැහැ බුද්ධි අංශවල කටයුතු කරද්දි. ඒක අඛණ්ඩව මේ ගැටළුව සමථයට පත් වෙන කල්ම නිරීක්ෂණයට ලක් කරන්න ඕන. ඉතින් එතකොට අනිවාර්යයෙන්ම ඒ කටයුතු ඉදුරාම ආරක්ෂක ලේකම්තුමාට හෝ නැත්නම් ජාතික බුද්ධි ප්‍රධානීතුමා හරහා report කලයුතුයි කියන එක තමයි මගේ හැඟීම ස්වාමිණි.

ප්‍ර: දැන් එහෙම ඔබ අත් දැකලා තියෙනවද අවස්ථාවන් බුද්ධි සමාලෝචන රැස්වීමලට සහභාගී වෙනවා. ඉන් අනතුරුව ඒ ඒ පාර්ශවයන් සිදු කලයුතු කටයුතු පිළිබඳව රාජකාරී පිළිබඳව Follow- up කරනවා. ඔබව දැනුවත් කරනවා, අර සංසරණයේදි ඒ අදාල සටහන් නමුත් ඒ අය නැවත පෙරළා ඒ පිළිබඳව ගත්ත පියවර ගැන වාර්තා කරන්නේ නැහැ ඒ වගේ තත්ත්වයන් ඔබ අත්දැකලා තියෙනවද?

Prosecutor's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව් එසේයි ස්වාමිණි. බොහෝ අවස්ථා එහෙම මම දැකලා තියෙනවා අපි දැන් මේවා සාකච්ඡා කලාට ඒකේ feed back එකක් නැත්නම් ඔබතුමිය ප්‍රකාශ කලා වගේ නැවත අපි හිතමුකේ මොකක් හරි task කලා කියලා යම් කරුණක් සම්බන්ධව ඒකට ගත්ත පියවර සම්බන්ධයෙන් නැවත පසු කථනයක් ලබා දීම නැත්නම් Debrief එකක් කිරීමත් එහෙම මම බොහෝ අවස්ථා දැක තියෙනවා ස්වාමිනි මේ අවුරුදු 2 ක කාලය ඇතුලත වුන් නැති අවස්ථාවන් බොහෝ මම නිරික්ෂණය කර තිබෙනවා

ප්‍ර එතකොට ඒ අවස්ථාවේදි මොකක්ද ආරක්ෂක ලේකම්වරයා විසින් ගනු ලබන පියවර? ඒ වගේම ඒ සම්බන්ධයෙන් ජාතික බුද්ධි ප්‍රධානී කිසියම් පියවරක් ගන්නවද?

පි: එතකොට කරන්නේ ස්වාමිනි අනිවාර්යයෙන් අපේ Agenda එක ස්වාමිනි ඉස්සෙල්ලාම අපි බලන්නේ ඉස්සෙල්ලාම කරන්නේ පසුගිය සතියේ සාකච්ඡා කිරීම තමයි Agenda එකේ පලවෙනියෙන්ම කරන්නේ. ඒ කියන්නේ අපි ගිය සතියේ සාකච්ඡා කරපු Minute එක අපි දානවා ගරු ආරක්ෂක ලේකම්තුමාට. ගරු ආරක්ෂක ලේකම් තුමා ඒ Minute එක එකින් එක කියවලා බලනවා මේකට ගත්ත ක්‍රියාමාර්ග තියෙනවද කියන එක. එතකොට යම්කිසි ක්‍රියාමාර්ගයක් කලේ නැත්නම් නැවත ගරු ආරක්ෂක ලේකම්තුමා ඒ සම්බන්ධයෙන් අදාල පාර්ශවයෙන් විමසීමක් කරනවා. එතකොට ඒක පරක්කු වුණා නම් නැත්නම් තියෙන ප්‍රායෝගික තත්ත්වයක් මත යම්කිසි ඉදිරිපත් කිරීමක් ඒ අදාල ආයතනවලින් ස්වාමිනි ප්‍රකාශ කරනවා.

ප්‍ර: දැන් ඔබ අද ඔබේ නිබන්දනය ගැන කතා කරන කොට මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කෙරුවා මද්‍රසා පාසැල් පිළිබඳව.

පි: එසේය ස්වාමිණි.

ප්‍ර: ඔබේ අත්දැකීම් අනුව පිටරටින් ලංකාවේ ඉගැන්වීම සඳහා යම් යම් පුද්ගලයින් පැමිණෙනවද?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඒක ආගමික වශයෙන්ද ඒ ඉගැන්වීම සිදු කරන්නේ කියලාද ඔබ නිරික්ෂණය කෙරුවේ එහෙම නැත්නම් යම් විෂය බද්ධ කරුනු සම්බන්ධයෙන්ද?

පි: ඔව් මගේ නිරික්ෂණයේදි මද්‍රසාවලට ඒගොල්ලෝ එන්නේ ඒ ආගමික ඉගැන්වීම් කරන්න තමයි ස්වාමිනි ඒගොල්ලෝ පිටරට ඉදලා ලංකාවට පැමිණෙන්නේ. මීට කලිනුත් ප්‍රකාශ කරලා තිබ්බා ඒකට විශේෂයෙන්ම මම එන්නත් ඉස්සෙල්ලා ජාතික බුද්ධි ප්‍රධානී කාර්යාලයෙන් මේක සමහරක් කට්ටිය විශාල වශයෙන්

FAIR COMMENT BY JEZEEM

සීමාවකින් තොරව ඒම නිසා මෙක යම්කිසි Regulation නැත්නම් පාලනයකට ලක් කරන්න විශේෂ ක්‍රමවේදයක් ස්වාමිනි ඔක්කොම මුස්ලිම් ආගමට විතරක් නෙමෙයි සියළුම ආගම්වලට අනවශ්‍ය පුද්ගලයන් ලංකාවට අනවශ්‍ය විදියට අනවශ්‍ය තැන්වලට යාම වලක්වන්න යම්කිසි විශේෂ ක්‍රමවේදයක් ස්වාමිණි එතන සකසලා තිබ්බා. ඒ ක්‍රමය දිගටම අපි ඒක අඛණ්ඩවම කරගෙන ගියා ස්වාමිනි මම ඉන්න කාලේදී

දැන් වේලාව : ප.ව. 3.50 යි.
මෙතැන් සිට ල/ලේ :- යමුනා දසනායක මිය විසින්ය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව 3.50
පෙර සටහන් ල/ලේ දම්මිකා.
සටහන් ගැනිම යමුනා දසනායක විසිනි.

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය</u>**

ප්‍ර එතකොට දැන් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන කොට එවකට පැවති නීතිය ඒ කියන්නේ මේ සාකච්ඡාව ඔබේ 2017 සිට 2019 කාලයේදි පැවති නෛතික රාමුව එවැනි පුද්ගලයින් සම්බන්ධයෙන් ප්‍රමාණවත්ද ? විදේශවල ත්‍රස්තවාදි කටයුතුවල යෙදිලා ලංකාවට කවුරුහරි එනවනම් ඔවුන් සම්බන්ධයෙන් ක්‍රි යාත්මක වීම සඳහා එවකට පැවති නෛතික රාමුව ප්‍රමාණවත්ද ? කියන මේ කරුණු ඔය බුද්ධි සමාලෝචන රැස්වීම්වලදි ඔබේ අවධානයට යොමු වුණාද ?ඔබේ අදහස කියලා මම අදහස් කරන්නේ ඒ මණ්ඩලයේ අදහස.

උ ඔව් ස්වාමිනි මට හොඳින් මතක හැටියට කීප වතාවක්ම මේ විශේෂයෙන්ම Foreign terrorist Fighters ලා නැත්නම් මෙතුමිය ප්‍රකාශ කළා වගේ විදේශ සටන්කාමී විශේෂයෙන්ම සිරියාව වගේ මේ ගරු කොමිෂම දන්නවා ලංකාවෙන් කීප දෙනෙක්ම ගියා සිරියාවට එතනදි මිය ගියා. සමහරක් කට්ටිය ආවා.

උ ඉතින් ඒ වගේ දේවල් අපි විසින් සාකච්ඡාවට ලක් කලා . ඒක හින්දා අපිට තේරුනා මේ වගේ returnees returning of foreign terrorist fighters ලංකාවට විතරක් නෙමේ ලෝකෙටම ප්‍රශ්ණයක් වුණා. ඉතින් එතෙන්දි මට මතකයි විශේෂයෙන්ම මට හොඳට මතකයි .ඒපොතේ ලියුම පවා draft කලේ මම විශේෂයෙන්ම 2017 නොවැම්බර්මාසේ draft කරලා ජාතික බුද්ධි ප්‍රධානි විසින් අපි පොලිස්පතිතුමා හට මේක සාකච්ඡා වුන පරිදි අපි ලියුමක් යැව්වා මෙන්න මෙහෙම foreign terrorist fighters ලංකාවට ඒමට possibility හැකියාවක් තියෙනවා ඒක නිසා ඒකටම ආවේනිකව වු තියෙනවා ආරක්ෂක මණ්ඩලයේ regulations ඒ අනුව ක්‍රියා කරන්න කියලා. නමුත් මට හොඳට මතක හැටියට ස්වාමීනි ඒකට අවුරුද්දක් යනකල් වත් ඒකට උත්තරයක් ආවේ නැහැ ස්වාමිනි. ඊට පස්සේ ඒක විශේෂයෙන්ම මම මේ subject එක විෂය handle කරන නිසා නැවත ස්වාමීනි මම පුද්ගලිකව නැවත මතක් කරලා ජාතික බුද්ධි ප්‍රධානිට මතක් කරලා නැවත 2018 ත් මට මතක හැටියට 2018 ත් අපි මේකට අපි මෙන්න මෙහෙම එකක් අපි දාලා මේකට වහාම පියවරක් ගන්න ඕනේ කියලා කියන එක එතුමාට යොමු කරා . ඉතින් මම හිතන්නේ නමුත් මේවා බුද්ධි සාකච්ඡාවේදි කතා වුණාට කොපමණ මේවා

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

නීතිමය වශයෙන් ක්‍රියාත්මක වුණාද කියන එක නම් ස්වාමීනි විශාල ගැටලුවක් තියෙනවා.

ස්වාමීනි .C 831 ලේඛණය සාක්ෂිකරුගේ අවධානයට යොමු කිරීමට අවසර ඉල්ලා සිටිනවා C832 , C831, 2017/11/ 27 වෙනිදා.

ප්‍ර දැන් ඔය වෙනකොට ඔබ ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලයේ සේවය සඳහා වාර්තා කරලා නේ ඉන්නේ ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර ඔබ දැන් කලින් කිව්වානේ යම් යම් අවස්ථාවල්වලදි මතක් කිරීම් කරන්න සිදු වුණාය කියලා ?

උ එසේය.

ප්‍ර පොලිස්පතිතුමාටත් ඒ වගේ මතක් කිරීම් කරානේ?

උ එසේය.

ප්‍ර දැන් මා ඔබට ඔයපෙන්වන C 831 ඔබ කලින් දුන්න පිළිතුරට කිසියම් අදාලත්වයක් තියෙනවාද?

උ ඔව් ස්වාමීනි.

මේක මට මේ ලියුම ඉතා මතකයි ස්වාමිනි මොකද මේ ලියුම මමම තමයි මේක පුද්ගලිකව draft කරේ. මගේ පරිසණකයෙන්ම තමයි මම මේක draft කලේ මොකද අපේ මොකද මේක සාකච්ඡාවේදි තියෙනවා Internal Conference 2017/11/21 මේක සාකච්ඡා කරා කියලා.ඉතින් මේකේ පැහැදිලිව ස්වාමිනි මේකේ තියෙනවා මේ මොකක්ද මේකෙ තියෙන තර්ජනය මොකක්ද කියලා. ISIS එකේ තර්ජනය මොකක්ද එන්න පුලුවන් සහ මේකේ තියෙන ආරක්ෂක මණ්ඩල සම්මුති මොනවද කියලා විශේෂයෙන්ම 2253 කියන එක යටතේ අපිට යම් යම් ක්‍රියාමාර්ග ගන්න පුලුවන් කියන එක එතකොට අපිට මොනවද ගන්න පුලුවන් ක්‍රියා මාර්ග කියන එකේදි කීප වතාවක්ම මාර්ග කියන එක ඒකේදි කීප වතාවක්ම සාකච්ඡා කලා ස්වාමිනි මේ ගොල්ලන් බැරිවෙලාවත් ලංකාවට ආවොත් එහෙම මොනවගේ දෙයක්ද අපි කරන්නේ කියන එක ඒකට තමයි ස්වාමිනි මේ 2017 අපි මේක ගරු පොලිස්පතිතුමාට යොමු කලේ.

ප්‍ර එහෙම නම් ඊලඟට මම ඔබේ අවධානය යොමු කරනවා C 832 ලේඛණය කෙරෙහි ඒ 2018 පෙබරවාරි මාසේ 09 වෙනිදා දින දරණ?

උ මේකත් මට පැහැදිලිවම මතකයි මේකත් මමම තමයි draft කරේ. එතකොට මේකෙන් ඇත්ත වශයෙන්ම පැහැදිලිව පේනවා මේක 2017 නොවැම්බර් මාසේ 27 අපි සාකච්ඡා කරේ නමුත් මේක ලියන්නේ 2018 පෙබරවාරි මාසේ 09 ඉතා විශාල කාල පරාසයක් මෙතෙන්දි ගිහිල්ලා ඉතින් ඒක නිසා නැවත විශේෂයෙන්ම පොලිස්පතිතුමාට තමයි මේ

FAIR COMMENT BY JEZEEM

කාලේ සාමය පවතින තත්වයක තමයි එතුමාට තමයි මේකේ බලතල ඔක්කොම තියෙන්නේ මේ සම්බන්ධව කටයුතු කරන්න . ඉතින් අපි තීරණය කරා නැවත වරක් එතුමාට මේක අපි ලිඛිතව දැනුම් දීමක් කරොත් හොඳයි කියලා ජාතික ආරක්ෂාව මේකත් ස්වාමිනි කිප වතාවකම සාකච්ඡා වුන නිසා.

ප්‍ර සාකච්ඡා වුණා දැන් ඔය ලියුම් දෙකේම බුද්ධි ප්‍රධානි විදියට යමෙක් අත්සන් කරලා තියෙනවානේ ?

උ එසේය.

ප්‍ර එම අත්සන ඔහු අදුරනවාද?

උ එසේය ස්වාමිනි පැහැදිලිව අදුරනවා.

ප්‍ර කාගේ අත්සන විදියටද ?

උ මේක සිසිර මෙන්ඩිස් මහත්මයාගේ අත්සන.

ප්‍ර ඇයි ඔබ කියන්නේ ඔහුගේ අත්සනය කියලා ඔය අත්සන් දෙකම? How have you got familiarize with his signature?

උ ස්වාමීනි මම අවුරුදු දෙකක් මෙම කාර්යාලය යටතේ සේවය කලා ඉතින් එතකොට විශේෂයෙන්ම මම ලියුමක් draft කරලා මේ මම ඕනෑම ලියුමක් මම draft කරලා හැදුවානම් ස්වාමිනි මම පුද්ගලිකව එතන හිටපු ජ්‍යෂ්ඨ නිළධාරින්ටත් පෙන්වලා ඒක අවසරය අරගෙන ඊට පස්සේ නැවත බොහෝ වෙලාවට මමම තමයි මේක CNI ගාවට මේක ඉක්මනට යවන්න ඕනේ නිසා මොකක්හරි ඒක අත්සන් කරන්න යන නිසා මේ මෙතුමාගේ අත්සන ඉතාම හුරුපුරුදුයි.

ප්‍ර ඔබ මෙතෙක් කිව්වානේ සමහර අවස්ථාවල්වලදි යම් පාර්ශයන් තමන්ට පවරපු රාජකාරිය නොකරන නිසා ඇයි මේ ආකාරයට නැවත සිහිගැන්වීම් කරන්නට සිදු වුණේ කියලා ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර හැබැයි තව අවස්ථාවල් තිබුනේ නැද්ද? එතන හිටපු ඒ සාකච්ඡා වලට සහභාගි වුන ඒ බුද්ධි අංශ කියපු වේලාවල් සර් මේක සර්ට කියලා වැඩක් නැහැනේ කියලා ආරක්ෂක ලේකම්වරයාට කියපු අවස්ථාවල් තිබ්බාද?

උ ඒක ස්වාමිනි මම අනන්තවත් දැකලා තිබ්බා ස්වාමිනි.

ප්‍ර කව්ද එහෙම කිව්වේ ?

උ විශේෂයෙන්ම රාජ්‍ය බුද්ධි අංශයේ ප්‍රධානියා හැටියට සේවය කරපු නිලන්ත ජයවර්ධන මහතා ඒත් ඒක්කම විශේෂයෙන්ම බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ සේවය කරපු බ්‍රිගේඩියර් කොඩිතුවක්කු සර්. මේ ගොල්ලෝ මේ විශේෂයෙන්ම මේ අපි හිතමු LTTE සැමරුම් වගේ දේවල් ජාතික ආරක්ෂාවට බලපාන. ඒත් එක්කම මේ වගේ දේවල් brief එකේදි විශේෂයෙන්ම මේ ආයතන දෙක තමයි ලංකාවේ ප්‍රධාන

FAIR COMMENT — BY JEZEEM —

වශයෙන්ම බුද්ධි අංශ හැටියට කටයුතු කරන ප්‍රධාන ආයතන දෙක ඒකයි අප ඒ ගොල්ලන්ට briefing එකේදි ප්‍රධාන පලවෙනි සහ දෙවනි briefing එක දීලා තියෙන්නේ ඉතින් ඒ ගොල්ලෝ ස්වාමිනි මම දැක්කා බොහෝ අවස්ථාවලදි මේක යම්කිසි දේවල් මේ තියෙන threat මොකද මං නැවත කියනවා ස්වාමීනි බුද්ධි ආයතනයේ කාර්ය භාරය තමයි තියෙන threat එක ඉදිරිපත් කිරීම. රටකට තියෙන තර්ජනය මොකක්ද කියන එක පැහැදිලිව ආරක්ෂක ලේකම්තුමාට දැන්විමට ඉහළට කටයුතු කරන්න . එතෙන්දි මේ ගොල්ලෝ බොහෝ අවස්ථාවල කිව්වා ඉතින් නමුත් ස්වාමීනි ඒ තිබ්බ තත්වයේදී මම දැක්කේ නම් නැහැ එහෙම මේකට මොකද ස්වාමිනි දැන් බුද්ධි අංශවල එන්නේ ගලා යාමක් තියෙනවා ඒ කියන්නේ භූමියේ තියෙන පල්ලහා ඉන්න කට්ටිය මේ බුද්ධි තොරතුරු එකතු කරනවා . එතකොට informerලා task කරලා තොරතුරුකරුවන් task කරලා එකතු කරනවා ඉතින් එතකොට ස්වාමිනි දිගින් දිගටම අපි මේවා chain එකෙන් උඩට අපි ගලාගෙන එද්දි ආයතන ප්‍රධානියා දක්වා ගලාගෙන එනකොට විශාල ක්‍රියාවලියක් කරන්න ඕනේ. ඒ කියන්නේ ඔබතුමන්ලාව දන්නවා මං හිතන්නේ අනිත් ජ්‍යෙෂ්ඨ නිළධාරිනුත් කියන්න ඇති පැහැදිලිව මට වඩා .මේක පහසු කටයුත්තක් නෙමේ අනන්‍යතාවය තහවුරු කර ගන්න ඕනේ රැක ගන්න ඕනේ විශාල කාර්ය භාර විශාල කැපවීමකින් තමයි තොරතුරක් බුද්ධි තොරතුරක් හැටියට පත් කරලා ඉදිරිපත් කරන්නේ. ඉතින් එතකොට මේකට ground එකේ ඉන්න කට්ටියට ස්වාමිනි motivation එකක් නැත්නම් ඒ ගොල්ලන්ට උද්දීපනය වෙන්නේ මේ යම්කිසි දෙයක් report කලාට පස්සේ ජාතික ආරක්ෂක ක්‍රියා කාරකමක් තිබ්බොත් තමයි ඒ කියන්නේ මේකට මොකක්හරි රජයෙන් මේක උඩට ගිහිල්ලා කතා කරලා මේකට විසඳුමක් තිබ්බොත් නමුත් එහෙම ඒ ගොල්ලෝ පවා ස්වාමිනි මම දැක්කා පැහැදිලිව ඉතාම දුර්මුඛ වෙන අවස්ථා තිබ්බා මොකද එහෙම දෙයක් ඒ කාලෙදි මගේ අවුරුදු දෙකේදි දැක්කේ නැහැ ඉතින් විශේෂයෙන් මෙතුමිය අහපු ප්‍රශ්ණයට උත්තර දුන්නොත් නැවත වතාවක් බොහෝ අවස්ථාවලදි කියලා තිබ්බා ඉතින් මේ වැඩක් නැහැ කියලා මොකද හේතුව මේ ඒක නිලන්ත ජයවර්ධන මහත්මයා මට හොඳටම ඇහුනා ඒක කියලා වැඩක් නැහැ කියන එක මොකද කිසිම ඒකට reply එකක් නැත්නම් ප්‍රතිකර්මයක් හම්බ වුනේ නෑ ඒ ප්‍රශ්ණයට ස්වාමීනි.

**********

FAIR COMMENT BY JEZEEM

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

ප්‍ර කාට කියල වැඩක් නෑ කියලද කිව්වේ ?

උ එතෙන්දි කිව්වේ නිලන්ත ජයවර්ධන මහත්තයා ඒ කියන්නේ මේ ප්‍රකාශය කරලා අපි මේක කියල ස්වාමිනි මේක ඉදිරිපත් කරලා විසඳුමක් හම්බවෙන්නේ නැහැ කියල තමයි එතුමා අදහස් කරේ

ප්‍ර කාගෙන් විසඳුමක් හම්බවෙන්නේ නැහැ කියලද ?

උ ඒතුමාට හම්බවෙන්න ඕනේ ආරක්ෂක ලේකම්තුමා ගෙන්නේ ඊට පස්සේ ආර්කෂක ලේකම් තුමා බැරිනම් ඒක ගරු ජනාධිපති තුමාගෙන් සහ අගමැතිතුමාගෙන් ජාතික ආරක්ෂක කවුන්සිලයෙන් පිළිතුරක් ලැබෙන්න ඕනේ. ඉතින් එහෙම දිගින් දිගටම ලැබෙන් නැත්නම් ස්වාමිනි එතනදි තමයි රටේ තියන බුද්ධ ආයතන ඉතාම පැහැදිළිව දුර් මුඛභාවයට පත්වන්නේ නැත්නම් demotivate බවට පත්වෙනවා ඒක තමයි මන් හිතන්නේ එතුමා එතන්දි කියන්න ඇත්තේ කියල මන් අදහස් කරනවා ස්වාමිනි.

ප්‍ර ඒ ප්‍රකාශය කෙරුවේ බුද්ධි සමාලෝචන රැස්වීම අතරතුරද ?

උ අනිවාර්යෙන්ම එයාගේ briefing අතර තුර දිගින් දිගටම යම් යම් දේවල් කියද්දී ඒවට උත්තරයක් හම්බවුනේ නැති නිසා මට පැහැදිළිව දෙයක් කියලා නිලන්ත ජයවර්ධන මහත්තයා කිව්වා අපි මේක කලිනුත් සර් මේක කියල තියනවා නමුත් උත්තරයක් නැහැ කියන එක

ප්‍ර ඒ කියන්නේ ඔහු ඒ ප්‍රකාශය යෙමු කෙරුවේ ආරක්ෂක ලේකම් වෙනද ?

උ එසේය ස්වාමිනි

ප්‍ර ආරක්ෂක ලේකම් තුමා තමයි එතන ගරු රාජ්ය ඇමති තුමා නැත්නම් එතන ප්‍රධානත්වය දක්වන්නේ ආරක්ෂක ලේකම් තුමා

ප්‍ර ඒ ප්‍රකාශය යොමු කරපු ආරක්ෂක ලේකම්වරයාගේ නම මොකක්ද ?

උ ඒක ස්වාමීනි මගේ කාලෙදි මං තැන්දෙකකම දැක්කා විශේෂයෙන්ම ගරු හේමසිරි ප්‍රනාන්දු මහත්මයා ඉන්න කොටත් ඒ වගේ දේවල් කියනවා මට ඇහිලා තියෙනවා ඒත් එක්කම කපිල වෙදාරත්න මැතිතුමා ඉන්න කාලෙදිත් ඒ වගේ අත්දැකිම් දැකලා තියනවා ස්වාමීනි.

ප්‍ර ඒ ඉස්මතු කරපු කාරණය LTTE එක ගැනද නැත්නම් ඉස්ලාම් අන්තවාදය සම්බන්ධවද කතා කලේ ?

උ සෑම දෙයක්ම සම්බන්ධව ස්වාමීනි. LTTE එක ගැන වෙන්න පුලුවන් මොකද අපි දැක්කා සෑම දෙයක්ම මේ ගොල්ලෝ ඉදිරිපත් කිරීමක් කරා ස්වාමීනි.මේ බුද්ධි අංශ රටේ තියන යම් යම් තර්ජන සහ කියන්න උත්සාහ ගත්තා නමුත් එකම දේ ඒවට කොපමණ ප්‍රායෝගික වශයෙන් විසඳුමක් හම්බ වුණාද කියන එක ඒ ගොල්ලෝ මන්දෝත්සාහ වීමක් මම එතෙන්දි නිරීක්ෂණය කරා ස්වාමීනි සටහන් කරගන්න පුද්ගලයා වශයෙන්.

**********

FAIR COMMENT BY JEZEEM

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය.</u>**

ප්‍ර මා මීළඟට ඔබේ අවධානය යොමු කරන්න කැමතියි නැවතත් අර ආගම් ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් ලංකාවට පැමිණි විදේශිකයන් පිළිබඳව යොමු කෙරුවොතින් එය නියාමනය කරන්නට යම් ආකරයක උත්සාහයක් ගත්තා නේද ජාතික බුද්ධි ප්‍රධානී විසින් ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර CNI විසින් යම් කටයුත්තක් කෙරුවා . ඔබට මතකද ඒ සම්බන්ධයෙන් යම් යම් විධි විධාන ගෙන ඒමට කටයුතු කරනු ලැබුවා. ඒ අවස්ථාවේදි ඔවුන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වෙලා ඒ වගේම මේ අදාල මද්‍රාසා වැනි තොරතුරු ආගම් උගන්වන ස්ථාන පිළිබඳව තොරතුරු රැස් කරලා ඒ විතරක් නෙවේ කතෝලික, බෞද්ධ වගේ ආගම් සම්බන්ධයෙනුත් යම් යම් විවිධ දේශකයෝ පැමිණියානේ ? එතකොට මේ හැමෝම ලංකාවට පැමිණිලා මේ ආකාරයට ආගමේ නාමයෙන් යම් යම් තත්වයන් ශ්‍රී ලංකාවේ ඇති කිරීම පිළිබඳව සලකා බලමින් ඔවුන් ඒ කියන්නේ අහිතකර තත්වයන් සමනය කිරීම සඳහාත් රටේ ආරක්ෂාව ඇති කිරීම සඳහාත් මෙසේ පැමිණෙන ආගමික මතවාද හෝ අගමේ මුවාවෙන් ලංකාවට පැමිණෙන අය නියාමනය කිරීම සඳහා යම් ක්‍රමවේදයන් භාවිතා කරා නේද?

උ එසේය ස්වාමිනි මේක මං එන්නත් ඉස්සරලා ඉතා පැහැදිලිව මේ කියන තර්ජනය අඳුනාගෙන තිබ්බා මීට කලින්. මොකද මේ එන preaches ලා මේ ගොල්ලෝ කිසිම සොයා බැලීමකින් තොරව විශේෂයෙන් මැද පෙරදිග සහ ඒ වගේ බරපතල තත්වයන් තියෙන රට රටවල් වලින් ඇවිල්ලා කිසිම ඒ ගොල්ලෝ කොතෙන්ටද යන්නේ මොනවද උගන්වන්නේ මොනවගේ කාටද audience එක මොකක්ද කියන ඒවගේ තර්ජනයක් තියෙන නිසා තමයි ස්වාමිනි මේ ක්‍රමවේදය හඳුන්වා දුන්නේ. ඉතින් මට දැනගන්න ලැබුනා මම එන්න ඉස්සෙල්ලා මම ආවාට පස්සේ ස්වාමිනි මීට කලින් මේ ක්‍රමය හඳුනාගන්න දෙන්න ඉස්සෙල්ලා විශාල ප්‍රමාණයක් අසිමාන්තිකව ඕනේ ඕනේ විදියට ආවා කිව්වා නමුත් මේ ක්‍රමය හඳුන්වා දුන්නාට පස්සේ ඒක විශාල වශයෙන්ම යම්කිසි විශාල පාලනයකට ලක්වුණා මොකද හේතුව මේ ගොල්ලෝ එන්න ඉස්සෙල්ලා ඒ ගොල්ලන් ගේ වීසා මේ ගොල්ලන් කොතෙන්ටද යන්නේ ඒක බාරගන්න කට්ටියගෙන් ඒ වගකීමේ සහතිකයක් නැත්නම් ඒ ගොල්ලන්ගෙන් කොතෙන්ටද යන්නේ කියන එක අන්න ඒ විස්තර ඔක්කෝම ජාතික SIS එක හරහා මේවා නිරීක්ෂණයට ලක් වුණා. ඒ නිසා ඒක විශාල පාලනයට ලක්වුණා කියන එක මම එතෙන්දි නිරීක්ෂණය කලා ස්වාමිනි

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ ආකාරයකට පාලනයකට නතු වුණාට පස්සේ එමගින් යම් කොටියාශයක් එයින් අතෘප්තියට පත්වුණාද ? ඒ පාලනය කිරීමේ හේතුවෙන් ?

උ වෙන්න පුලුවන් ස්වාමිනි මොකද ඉතින් එතකොට තමන්ට කැමති විදියට එහෙම ලංකාවට ඒමේ හැකියාවක් නැති වෙනවා මම විශ්වාස කරනවා එතකොට යම් යම් පුද්ගලයෝ අනිවාර්යයෙන්ම අතෘප්තිකර මට්ටමකට මේ යෑමේ හැකියාවක් තියෙනවා දැන් උදාහරණයක් හැටියට ස්වාමිනි මට කියන්න පුලුවන් අසාද් සාලි මහතා එතුමා ගරු ආණ්ඩුකාරතුමා වශයෙන් පත්වීමෙන් එදා දවස මට හොඳට මතකයි අසාද් සාලි මහතා ආණ්ඩුකාර ධුරයට පත්වුණ දවසේම මට මතකයි එතුමා සහ ඕල් සිලෝන් ජමෙයිතුල් උලමා එකේ ඒ ප්‍රධානිතුමා ඇතුලු කණ්ඩායම ක් CNI හරහා ඇවිල්ලා ආරක්ෂක ලේකම්තුමා හම්බ වුණා මේ සම්බන්ධයෙන් ස්වාමිනි.ඉතින් එතකොට CNI මාත් එක්ක ගියා එතෙන්ට ස්වාමිනි. ඉතින් එතෙන්දි ඒ ගොල්ලෝ කිව්වේ මෙහෙම තත්වයක් තියෙනවා ඒ ගොල්ලෝ සාම්ප්‍රදායික මුස්ලිම්වරු ඒක නිසා මේක නිසා මේ ගොල්ලන්ට අර ප්‍රශ්ණ එනවා කියලා මේ වගේ දැඩි පාලනයක් තියන නිසා ඒ ගොල්ලන්ගේ ආගමික කට්ටිය මෙතෙන්ට උගන්වන්න ගේන්න . ඉතින් ඒ ගොල්ලෝ මේකට සහනයක් ඉල්ලා සිටියා මෙහෙම ක්‍රමවේදයකින් තොරව මේ ගොල්ලෝ සාම්ප්‍රදායික මුස්ලිම්වරු නිසා රැගෙන එන්න. ඉතින් එතෙන්දි ආරක්ෂක ලේකම්තුමා CNI ගෙන් ඇහුවා මේ සම්බන්ධ අපිට මොකක්ද කරන්න පුලුවන් කියලා . ඉතින් ඒ වෙලාවේ ඒ මම ප්‍රකාශ කර සිටියා කියලා මට හොඳට මතකයි මම කිව්වා ආරක්ෂක ලේකම්තුමාට සර් මේක කිසිසේත්ම එහෙම favouration කරන්න බැහැ මම නම් ඒකට සම්පුර්ණයෙන්ම විරුද්ධයි මොකද හැමෝටම තියෙන පොදු ක්‍රමයක් මේක එහෙම කරන්න බැහැ අපේ තියෙනවා මේ ක්‍රමය හැමෝටම තියෙන්න ඕනේ. නැත්නම් මේ ක්‍රමය නැතුව තියෙන්න ඕනේ කියන එක ස්වාමිනිඅද වගේ මතකයි ස්වාමිනි මම ඒක ප්‍රකාශයට පත් කලා . මම උදාහරණයක් ඔබතුමිය දක්වපු ප්‍රශ්ණයට ඉතින් ඒ වගේ දේවල් තියෙන්න පුලුවන් ස්වාමිනි නමුත් මේ වගේ ක්‍රමයක් තිබීම ඉතාමත්ම වැදගත් කියලා මම හිතනවා ස්වාමිනි

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වාමැතිතුමා</u>**

ප්‍ර එවැනි අර විදේශිය ආගමික දේශකයින් ලංකාවට පැමිණීම මර්දනය කිරීම සඳහා යොදා තිබූ නියාමනයන් වෙනස් කිරීමට මැදිහත් වීමක් කෙරුවේ ඔබ සඳහන්කල දේශපාලඥයා විතරද ?

FAIR COMMENT BY JEZEEM

උ ස්වාමිනි මගේ දැනීමේ හැටියට එහෙම එතුමා ඒ කියන්නේ මැදිහත්වීමක් මට එතුමා අතෘප්තියට පත්වීමක් ඇති යම්කිසි ඉදිරිපත් වීමක් කරන්න ඇති නමුත් ඉන් ඉදිරියට නම් මගේ අත්දැකීම් අනුව එහෙම කව්රුත් එහෙම මේක වෙනස් කිරීමට උත්සාහ දැරීමක් මගේ ප්‍රායෝගික අත්දැකීමේ නැහැ නමුත් ස්වාමිනි මෙතුමිය ප්‍රකාශ කලා වගේ මේක නිසා අතෘප්තිකර පාර්ශව ඕනේ තරම් සිටීමට හැකියාවක් තියෙන්න පුලුවන් ස්වාමිනි.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය .</u>**

ප්‍ර ඔබේ අවධානයට මා යොමු කරන්නේ 2019 ජනවාරි මස සිට 2019 මැයි මස දක්වා වූ බුද්ධි සමාලෝචන රැස්වීම් පැවති අවස්ථාවන් පිළිබඳව? ඒ දින පිළිබඳව නේද ?

උ එසේය .

ප්‍ර ඒක මං ඔබේ අවධානයට නැවතත් යොමු කරනවා දැන් ඔබ සඳහන් කෙරුවනේ අර අසාද් සාලි මහතා ඇවිල්ලා එවකට පැවති විදේශීය ආගමික දේශකයින් පැමිණීම පිළිබඳව වූ නියාමනය කිරීමේ ක්‍රමවේදය පිළිබඳ ඔවුන්ගේ නොසතුට එල කරාය කියලා ජමෙයිතුල් උලමා සංවිධානයේ අයත් සමඟ .ඔබට මතකද ඔය මොන වකවානුවේද කියලා ?

උ ස්වාමීනි හොඳට මට මතක හැටියට එතුමා බස්නාහිර පළාත් ආණ්ඩුකාර ධුරය දරපු දවසේ හෝ ඉන්පසු දවස පැහැදිලිව . මට මතක එතුමා මම හිතන්නේ 2019 විය යුතුයි එතුමා බස්නාහිර පලාත් ආණ්ඩුකාර ධුරය ලබපු දවසේ හෝ ඊට පසුදා තමයි මම බොහෝ විට විශ්වාස කරන්නේ ලබපු දවසේ කියලා තමයි මට මගේ මතකය හිටියට තියෙන්නේ ස්වාමිනි.2019 විය යුතුයි කියලා මතය තමයි මගේ තියෙන්නේ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

ප්‍ර එම රැස්වීමට ඔබ සහභාගි වුණාද ?

උ ඒසේය ස්වාමිනි මං සහභාගි වුණා.CNI එක්ක.

ප්‍ර එම රැස්වීමේදි අර මාවනැල්ල බුද්ධ ප්‍රතිමා කැඩීම සම්බන්ධයෙන් යම් කරුණක් ඉස්මතු කෙරුවද ?

උ නැහැ ස්වාමිනි එහෙම දේවල් ප්‍රකාශයට පත් වුනේ නැහැ.

ප්‍ර ඒ රැස්වීමේ ප්‍රකාශයට පත් වුනේ නැහැ ?

උ නැහැ ස්වාමිනි

මේ කතා කරේ අර පිවර්ස්ලා එන එක සම්බන්ධව ගැටළුව තමයි සාකච්ඡා වුනේ.

FAIR COMMENT — BY JEZEEM

**********

**<u>ගරු විනිසුරු අදිකාරි මතිණිය</u> .**

ප්‍ර සාක්ෂිකරු දැන් ඔබ රාජකාරි කරපු කාලේ ද දන්නේ නැහැ 2015ට ප්‍රථම එවකට ආරක්ෂක ඇමතිවරයාව සිටි වර්තමාන ජනාධිපති තුමන්ගේ කාලයේදි ආරක්ෂක ලේකම් විදේශ රටවලින් එන අන්තවාදි ආගමික පුජක වරුන් එකසිය ගණනක් පිටුවහල් කරපු බව දන්නවාද?

උ මං අහලා තියෙනවා මැතිණියනි ඔෆිස් එකේදි ඒ ගොල්ලෝ කිව්වා මේ ක්‍රමවේදය නිසා විශාල පාඩු වකට ලක් වුණා ඒ ගොල්ලෝ අනවශ්‍ය කට්ටිය ඔක්කෝම ලංකාවෙන් පිටුවහල් කරා කියලා මට කලින් හිටපු ස්ටාෆ් ඔෆිසස්ලා මේ මාණ්ඩලික නිලධාරින් මැතිණියනි මට ප්‍රකාශ කරා ඒක හරියට ඒ ක්‍රමවේදය නිසියාකාරව වුණා කියන එක තමයි ස්වාමිනි එතෙන්දි කිව්වේ.

ප්‍ර එම කාලයේදි අසාඩ් සාලි සහ ජමෙයිතුල් උලමා වරු ඇවිල්ලා එහෙම විදේශිය ආගමික මවුලවි වරුන් දේශකයන් පිටුවහල් කිරීම සම්බන්ධයෙන් විරෝධතාවයන් ඉදිරිපත් කරයි කියලා ඔබටආරන්චි වෙලා තිබෙනවාද ?

උ ඒක මැතිණියනි දැනට මගේ මතකයක් නැහැ මැතිණියනි. එහෙම දෙයක් කරාද කියන එක.

**********

**<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය.</u>**

ප්‍ර ඔබ කිව්වා 2019 මාර්තු මාසයේදි සහරාන් හෂිම් සම්බන්ධයෙන් අවස්ථා දෙකකදි ඔබ විසින් පිලියෙල කරන ලද න්‍යාය පත්‍රයට බුද්ධි සමාලෝචන මණ්ඩලයේදී ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට ඒ අවස්ථාව කර ගත්තා කියලා?

උ එසේය ස්වාමිනි.

ප්‍ර ඔබට කියන්නට පුලුවන්ද ඒ කුමන දිනවලද කියලා ?2019 මාර්තු මොන දවස්වලද?

උ ස්වාමිනි මට මතක හැටියට මට මාර්තු මාසේ කියන එක මට හොඳට මතකයි නමුත් ඒක ගරු කොමිසම අර අපේ Agendas තියන එක කොපියක් ගත්තොත් ඒක සටහන් කරගන්න පුලුවන් මට ඒක හරියටම exact date මතක නැහැ.

ප්‍ර මා ඔබේ අවධානයට ලේඛණයක් යොමු කරනවා ?

උ ස්වාමිනි 2019 මාර්තු මාසේ 19 මම හිතන්නේ ඒක අනු අංක 3 යටතේ ඒ යටතේ පැහැදිලිව දාලා තියෙනවා activities of Mohamed Cassim, Mohamed Zaharan, the Leader of National Thawheed Jamath (NTJ) කියන එක. සාකච්ඡාවට භාජනය කිරීමට යොමු කරා ස්වාමිනි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර එතකොට ඔබ මේ පරීක්ෂා කරන්නේ ඔය පිළිතුර දෙන ගමන් 2019 මාර්තු මාසේ 19 වෙනිදා පවත්වන ලද බුද්ධි සමාලෝචන රැස්වීමේ න්‍යාය පත්‍රයද ?

උ එසේය ස්වාමීනි.

ස්වාමීනි එම න්‍යාය පත්‍රය C840 වහයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර ඔබ කිව්වා සහරාන් හෂිම් ගේ ක්‍රියා කාරකම් පිළිබඳව අංක 3 යටතේ මේ න්‍යාය පත්‍රයේ සාකච්ඡා කිරීම සඳහා නියමිතව තිබුනාය කියලා ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර එය සාකච්ඡා කළාද ?

උ එය සාකච්ඡා කරා ස්වාමිනි මට මතක හැටියට එය සාකච්ඡා කරා.

ප්‍ර එතකොට අයි. එස් හිතවාදින් ශ්‍රී ලංකාවට පැමිණීම පිළිබඳවත් එහි සාකච්ඡා කිරීමට නියමිතව තිබුනාද ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර ඊලඟට ඔබ කියනවා නම් ඒක සාකච්ඡා කලාය කියලා එහෙනම් එදින ඔබ විසින් ගන්නා ලද සටහන් වල තියෙන්න ඕනේනේ?

උ අනිවාර්යයෙන්ම ස්වාමිනි.

ප්‍ර ඔබ ලඟ ඒ සටහන් හරි ඒ සටහන් වල කෙටි සටහන් හරි තිබෙනවාද ?

උ ස්වාමිනි මෙතන පැහැදිලිව තියෙනවා 2019 මාර්තු මාසේ 19 වෙනිදා දැක්වූ සටහන ඒකේ serial අංක No. 2 ඒකේ දක්වලා තියෙනවා පලමුවෙනියෙන්ම අහපු ප්‍රශ්නයට අනුව activities of Mohamed Cassim, Mohamed Zaharan, Leader of National Thawheed Jamath broadly were discussed. එතකොට DMI stated that he may have fled to India DMI ඇහුවා මට මතකයි ගරු ආරක්ෂක ලේකම්තුමා මෙයාගේ ක්‍රියා කලාපය කොහොමද කියලා එතකොට DMI යුධ හමුදා බුද්ධි අංශයේ අධ්‍යක්ෂකතුමා ප්‍රකාශ කරා දැනට තියෙන තොරතුරු අනුව මෙයා ඉන්දියාවේ සැඟවී සිටීමේ හැකියාවක් තියෙනවා කියලා. එතකොට නමුත් ඔක්කෝම සාකච්ඡා කලාට පස්සේ ඒ ඔක්කෝම ඒජන්සි in this context Head of Intelligence's requirement is to permanent strategy to undermine the any possibility of Muslim Radicalization එතෙන්දි ඒ ගොල්ලෝ සාකච්ඡා කලා මේක තර්ජනයක් තියෙන බව ඒ ගොල්ලෝ පිලිගත්තා . මේ තියෙන ඔහුගේ ක්‍රියා කලාප සහ ඒ ඒ පරිච්ඡේදයේ තියෙන දේවල් ඉතින් මේ ගොල්ලන් ඔක්කෝම එකඟ වුණා මේ තියෙන ක්‍රියා කලාප සබැඳිව යම්කිසි ක්‍රියා මාර්ගයක් ගත යුතුයි කියන මතයේ තමයි ඒ ගොල්ලෝ හිටියේ. ඒකයි මං මෙතන මේ සටහන් කරේ ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට ISIS සංවිධානයට බැඳිලා නැවත ලංකාවට පෙරලා එන අයත් ගැනත් එහිදි සාකච්ඡා වෙන්න නියමිතව තිබුණානේ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර ඒ පිළිබඳවත් සාකච්ඡා කරාද?

උ එසේය ස්වාමිනි.මම හිතන්නේ පලවෙනි සටහන හැටියට දක්වලා තියෙන්නේ matters of ISIS in Sri Lanka was discussed CNI suggest කලා CID to interrogate ඒ එන කට්ටිය CID එක මාර්ගයෙන් එන කට්ටිය Airport එක මේ ගොල්ලෝ interrogate කරන්න අවශ්‍යයයි කියන එක ඊට පස්සේ ඉතින් ආරක්ෂක ලේකම්තුමා මං හිතන්නේ Defence Secretary directed IGP to analyze the local legal framework and suggest any recommendations on this matter. මේකට මොනවද තියෙන ලංකාවේ මට හැඟී ගියා ස්වාමිනි මේක ඇත්තටම ලංකාවේ නීතිමය තත්වයක් නැහැයි කියන එක මේ සම්බන්ධයෙන් ඉතින් එතකොට Secretary/Defence task කරා නැත්නම් නියෝග කරා IGP ගරු පොලිස්පතිතුමාට මේ සම්බන්ධයෙන් යම් නීතිමය තත්වය මොනවද කියන එක සලකා බලලා නිර්දේශ කරන්න කියන එක ස්වාමිනි.

ප්‍ර එතකොට මේ 2019 මාර්තු මාසේ 19 වෙනිදා මේ ISIS හිතවාදින් එහි පුහුණුව ලබපු අය නැවත ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ ප්‍රශ්ණයත් ඒවගේම මොහොමඩ් සහරාන් ගේ ක්‍රියාකාරකම් පිළිබඳව වූ ඒ ප්‍රශ්ණයත් සාකච්ඡා කරන අවස්ථාවේදි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විදියට එතන හිටියේ කව්ද ඒ රැස්වීමේ.?

උ මං හිතන්නේ ගරු හේමසිරි ප්‍රනාන්දු මහත්මයා තමයි මට මතක හැටියට එතුමා තමයි හිටියේ.

ප්‍ර ස්වාමිනි 2019 මාර්තු මස 19 වෙනි දි න Gist of Weekly Intelligence coordinating Meeting යනුවෙන් තිබෙන මෙම පත්‍රිකාව C 841 වශයෙන් ලකුණු කරනවා.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u> .**

ප්‍ර සාක්ෂිකරු ඔය සතිපතා නිබ්බ බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීම් වලදි ඔබ කවද්ද ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලයෙන් ඉවත් වුනේ ?

උ ස්වාමිනී 2019 අගොස්තු මාසේ 05 .

ප්‍ර ඒ සතිපතා නිබ්බ බුද්ධි සමාලෝචන රැස්වීම් වලදි වචනතිව් පොලිස් නිළධාරීන් දෙදෙනාගේ ඝාතනය සම්බන්ධයෙන් සාකච්ඡා වුණාද ?

උ මට මතක හැටියට ස්වාමිනි සාකච්ඡා වුණා.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර එම අවස්ථාවේදි ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා එම රැස්වීමේ හිටියාද?

උ මතකේ හැටියට ස්වාමිනි එතුමා ඉන්න ඇති.

ප්‍ර ලේකම් නැතුව රැස්වීමක් තියෙන්නේ නැහැ?

උ ලේකම් නැතුව රැස්වීමක් තියන්නේ නැහැ ස්වාමිනි අනිවාර්යයෙන් එතුමා ඉන්න ඕනේ.

ප්‍ර එතකොට බුද්ධි සමාලෝචන රැස්වීමකදී හෝ රැස්වීම්වල මාවනැල්ල බුද්ධි ප්‍රතිමා වලට හානි වීම සම්බන්ධයෙන් සාකච්ඡා වුණාද?

උ ඒකත් ස්වාමිනි සාකච්ඡා වුණා.

ප්‍ර සාකචඡා වුණා?

උ එසේය ස්වාමිනි.

ප්‍ර බුද්ධි සමාලෝචන රැස්වීමකදී වනාතවිල්ලුව අවිආයුධ සොයා ගැනිම සම්බන්ධයෙන් සාකච්ඡා වුණාද?

උ ඒකත් ස්වාමිනි සාකච්ඡා වුණා.

ප්‍ර ඔය අවස්ථා තුනේදිම හේමසිරි ප්‍රනාන්දු මහතා සිටින්න ඕනේනේද ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර ඒ බුද්ධි සමාලෝචන රැස්වීම්වලට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින් සහභාගි වුණා කියලා මතකයක් තියෙනවාද ?

උ ස්වාමිනි බෝහෝඅවස්ථාවලදි ආරක්ෂක ලේකම්තුමාගේ උපදෙස් අනුව මේ අපේ තියෙන conference එකට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහ TID තුස්ත විමර්ෂණ ඒකකයේ ප්‍රධානිතුමා මේකට අනිවාර්යයෙන්ම සහභාගි වෙනවා ස්වාමිනි. ඒ ප්‍රධානියා නැත්නම් ඔහුගේ නියෝජිතයෙක් හෝ මේකට සහභාගි කරවනවා.

ප්‍ර දැන් ඔබට යම් මතකයක් තියෙනවාද මේ වනාත විල්ලුව ආයුධ සොයා ගැනිම සම්බන්ධයෙන් පරික්ෂණ කටයුතු අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවෙන් කරමින් සිටිය බවට ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර ඒ වනාතවිල්ලුව අවි ආයුධ සොයා ගැනිම සම්බන්ධයෙන් එවකට අත් අඩංගුවට ගත් පුද්ගලයින්ගෙන් ප්‍රශ්ණ කිරිමට අවස්ථාවක් යම් බුද්ධි අංශයක් විසින් ඉල්ලිමක් කෙරුවාද ?

උ ස්වාමිනි ඒක මං ප්‍රකාශ කිරිමට අවස්ථාවක් කර ගන්නවා . මම දුටු නිරික්ෂණය තමයි ස්වාමිනි මේ ඉස්සෙල්ලාම මාවනැල්ල ප්‍රශ්ණය වුණා ඊට පස්සේ වවිනතිවි ප්‍රශ්ණය වුණා . ඊට පස්සේ බුදු පිළිම කැඩීමක්වුණා ඊට පස්සේ වනාතවිල්ලුව අවි ආයුධ එකතුවිමක් වුණා අන්තිමටම අර ගොල්ලොන්ගේ බයිසිකල් බෝම්බ ප්‍රහාරය ඒක අත්හදා බැලිමක් වුණා. ඒ අවස්ථාවේ සෑම විටම ස්වාමිනි එතෙන්දි සාකච්ඡා කරා මට මතකේ හැටියට ගරු ආරක්ෂක ලේකම් තුමා මේ

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ගැන මෙතෙන්දි මට මතකේ හැටියට ඉදිරිපත් කිරිමක් මේ ගොල්ලොන්ට මොකද ඉදිරිපත් කිරිමක් කරන්න තියනවා ඒ තිබ්බ තත්වයන් අනුව.

ප්‍ර කාටද ඉ දිරිපත් කිරිමක් කරන්න තියෙන්නේ ?

උ ස්වාමිනි අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට සහ ත්‍රස්ත විමර්ශණ ඒකකයේ ප්‍රධානීන්ට මේකට සම්බන්ධ ඉදිරිපත් කිරිමක් මොකද ඒ ගොල්ලෝ ස්වාමිනි මෙතන කැදවන්න හේතුවක් නැහැ ඒ ගොල්ලෝ intelligence නෙවේනේ ස්වාමිනි මේ ගොල්ලෝ intelligence රාජකාරි නෙමේ කරන්නේ. නමුත් මේ ගොල්ලො මේ කියන ආයතන ප්‍රධානින් කැදවන්න හේතුව තමයි මේ investigation part එක කරන්නේ මෙන්න මේ කියන ආයතන එතකොට මේ investigation වලට මොකද වෙන්නේ කියනඑක ස්වාමිනි අනිත් බුද්ධි අංශ දැන ගත්තොත් ඒ ගොල්ලන්ට ලේසියි ස්වාමිනි ඒ ගොල්ලන්ගේ බුද්ධි කටයුතු ක්‍රියාත්මක කරන්න නමුත් මම දැක්ක දේ තමා ස්වාමිනි මේ ගොල්ලෝ එහෙම විශාල හෙළිදරව් කර ගැනිමක් සිමාවන් තියෙන්න පුලුවන් ස්වාමීනි ඒක අපි තේරුම් ගන්න ඕනේ.නමුත් මෙතෙන්දි හෙළිදරව් කිරීමකට එහෙම මෙතෙන්දි යොමු වුනේ නැහැ . ඉතින් මට මතකේ හැටියට ස්වාමිනි මේ බුද්ධි අධ්‍යක්ෂතුමා යුද හමුදාවේ බුද්ධි අධ්‍යක්ෂතුමා මේක ආරක්ෂක ලේකම්තුමාට ඒ conference වලත් කීප වතාවක්ම කියලා තියෙනවා මේ අපගේ හමුදා බුද්ධි අංශයේ මේ නිලදරුවන්ටත් මේ අත්අඩංගුවට ගත්ත කට්ටියව interrogate නැත්නම් ඒ ගොල්ලන්ට ප්‍රශ්ණ කරන්න ඉඩ ප්‍රස්ථාවක් ලබා දෙන්න කියලා මොකද හේතුව යුද්ධ හමුදා බුද්ධි අංශයට බොහෝ උතුරු නැගෙනහිර ක්‍රියා කලාප සම්බන්ධයෙන් ඉතා විශාල වසර 25 කටත් වඩා වැඩි අත්දැකිම් සහ දක්ෂ නිළධාරින් ඉන්න නිසා නමුත් මගේ මතකයේ හැටියට ස්වාමිනි මේක මංහිතන්නේ ලිඛිතවත් ඉලලිමක් කලා කියන හැඟීම තමයි මගේ තියෙන්නේ නමුත් ඒ කිසිම අවස්ථාවක මගේ මතකේ හැටියට ඒ කියන්නේ හොඳ මට්ටමේ පිලිතුරක් හෝ නැත්නම් ඒක අඛණ්ඩව වෙන තත්වයක් ස්වාමිනි මම දුටුවේ නැහැ කියන එක ප්‍රකාශයට පත් කරන්න කැමතියි ස්වාමිනි.

ප්‍ර දැන් අර 2019 මාර්තු මස 19 වෙනිදා තිබ්බා නේද බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීමක්,

උ එසේය ස්වාමිනි.

ප්‍ර එම රැස්වීමේදි රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වරයා සහරාන් සිටින තැනක් සම්බන්ධයෙන් යම් ප්‍රකාශයක් කෙරුවාද ?සිටිය හැකි තැනක් සම්බන්ධයෙන් ?

FAIR COMMENT BY JEZEEM
President's Secretary's Copy

උ ස්වාමිනි මගේ මතකයේ හැටියට එහෙම ප්‍රකාශයක් කරේ නැහැ . මොකද එතන හමුදා බුද්ධි අංශයේ බ්‍රි ගේඩියර් චුලාකොඩිතුවක්කු සර් තමයි එතෙන්දි කිව්වේ ඒ ගොල්ලෝන්ගේ දැනුම හැටියට මෙයා ඉන්දියාවට පැන ගොස් සිටීමේ හැකියාව තියෙනවා කියලා . ඒකයි ස්වාමිනි මගේ නෝට් එකේ ප්‍රකාශයට පත් කරේ එයා දැන් ඉන්දියාවේ ඉන්න පුලුවන් කියන එක නමුත් රාජ්‍යබුද්ධි අංශයේ නිලන්ත ජයවර්ධන මහතා කිව්වා කියලා නිශ්චිත වශයෙන් ප්‍රකාශ කිරීමක් මෙතෙන්දි වුන් නැහැ මොකද එහෙම දෙයක් කරා නම් මිට වඩා තොරතුරක් එතුමා ප්‍රකාශයට පත් කරා නම් ඒ කියන්නේ මේකේ මොනවද තියෙන්නේ මේකේ අන්තර්ගතය මොකක්ද කියන විශාල දීර්ඝ කිරීම ක්වුණානම් මම මෙතන්දි දාන්නත් තිබ්බා නමුත් මට මතකේ හැටියට එහෙම දෙයක් වුනේ නැහැ කියන හැඟීම තමා ස්වාමිනි මගේ තියෙන්නේ.

ප්‍ර එතකොට අර ඔබ කිව්ව හැටියට හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ ප්‍රධානියා කිව්වා සහරාන් ඉන්දියාවට පැනලා යන්න ඇති කියලා ?

උ එසේය ස්වාමිනි.

ප්‍ර ඒ අවස්ථාවේදි ඔහු ප්‍රකාශ කෙරුවද ඔහුට ලැබුණු තොරතුරු අනුව ඒ සඳහා යම්කිසි පුද්ගලයෙක් උපකාර කෙරුවා කියලා ?

උ එහෙම සඳහන් කිරීමක් කරේ නැහැ ස්වාමිනි මෙතනේදි කරේ තියෙන තොරතුරුවලට අනුව එයා ඉන්දියාවට පැන යාමේ හැකියාවක් පැන යන්න ඇති කියලා හමුදා බුද්ධි අංශ විශ්වාස කරන්නේ කියන එක තමයි ප්‍රකාශ කරේ.

ප්‍ර ඒකට සහයෝගය දැක්වූ කවුරුත් දන්නවාද?

උ එහෙම ප්‍රකාශ කලේ නැහැ.

ප්‍ර රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වරයා ජාතික බුද්ධි ප්‍රධානියා හමුවීමට කාර්යාලයට පැමිණෙනවා ඔබ දැකලා තියෙනවාද ?

උ එහෙම ස්වාමිනි මම

ප්‍ර බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීම් වලට අමතරව?

උ නැත ස්වාමිනි එහෙම මම එතුමා ඇවිල්ලා සාකච්ඡා කරනවා දැක්කේ නැහැ. අනිත් බුද්ධි ආයතන වල කට්ටිය ඇවිල්ලා විටින් විට සාකච්ඡා කරන මට්ටම මම දැක්කා ස්වාමිනි.

ප්‍ර එවකට ජාතික බුද්ධි ප්‍රධානියා වශයෙන් හිටපු සිසිර මෙන්ඩිස් මහතා කොයි වගේ පුද්ගලයෙක්ද ?

උ ස්වාමිනි මම ඇත්ත වශයෙන්ම මම ප්‍රකාශයට පත් කරන්න කැමතියි මම දැකපු ඉතාම ඒ කියන්නේ දක්ෂ නිළධාරියෙක් කියන එකයි. ඉතින් මම මෙතෙන්දි අවස්ථාවක් කර ගන්නවා කියන්න එතුමා මේ අපි දිගින් දිගටම මගෙත් එක්ක විශේෂයෙන්ම පුද්ගලිකව පවා අදහස් හුවමාරු කරගෙන තියෙනවා එතුමාගේ ඒ අත්දැකීම් මගෙත් එක්ක

FAIR COMMENT
BY JEZEEM

විශේෂයෙන්ම තියෙනවා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙක් වශයෙන් මට ඒ අත්දැකීම් කියලා දුන්නා. ඉතින් එතුමා නමුත් බොහෝ වෙලාවට අපි වගේ ම ඉතාම frustrated නැත්නම් ඉතාම මේ රාජකාරි කරද්දි ඉතාම දුර්මුඛ බවටපත් වුණා මට එකක් කියන්න කැමතියි ස්වාමිනි . හරියටම මේ සිද්ධිය වෙන්න මාසෙකට ඉස්සෙල්ලා මෙතුමා මගෙත් එක්ක සාකච්ඡාවක් කලා ඉතින් මම පැහැදිලිව කිව්වා හරියටම මාසෙකට කලින් ස්වාමිනි සර් අපිට දැන් පේනවා මෙතන දේවල් වෙන්නේ නැහැ කියන එක ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලයේ කිසිම දෙයක් හරියට අපිට project කරගන්න බැහැ. අපේ ground කේ ඉන්න අපේ කට්ටිය ඇහුවම කියන්න උත්තරයක් නැහැ. ඒ නිසා සර් ගිහිල්ලා මේක Defence Secretaryට කියන්න මේ තියන තත්වය පස්සේ සෑහෙන්න තර්ජනයක් තියෙනවා කිව්වා මගේ අත්දැකීම් අනුව කිව්වා තව දුරටත් මේක කරන්න බැහැ කියන එතකොට සර් මට කිව්වා මතකයි පැහැදිලිවම ස්වාමිනි ජිනේද්‍රජීත් ඔයා මට කියන්නේ මොකක්ද කරන්නේ කියලා ඔයා මට මොකක්ද මම කිව්වා සර් එහෙම කියලා හරි යන්නේ නැහැ සර් නේ CNI කියලා සර් ගිහිල්ලා මෙතන කියන්න ඒත් මං ඔයා කියන හන්දා පුලුවන් තරම් යනවා මට ඒ මිනිස්සුත් එක්ක ගහගන්න බැහැ මං ගිහිල්ලා මට මතකයි ස්වාමීනි මෙතුමා 2018 දෙසැම්බර් මාසේ හර්දය රෝගි තත්වයට පත් වුණා එතුමා ඉතාම අපහසුවෙන් තමයි ඇවිදගෙන ආවේ. ඉතින් මං ඇහුවා සර් එහෙමනම් හොදම දේ මේ අපි මෙතනින් යන එක ස්වාමිනි. ඉතින් කවදාවත් මට එතුමා කවදාකවත් මට එතුමා කෑගහලා නැහැ නමුත් මට ජිනෙත් කරන්න දෙයක් නැහැ ඔයා කියන්නේ මම එහෙමනම් මෙතනින් යන්නම් කියලා එතුමා වේගයෙන් ආවේගයෙන් නැගිට්ටා ඉතින් මම හිතුවේ නැහැ මෙතුමා හරි එහෙම දෙයත් මටත් ඉතාම ඒ වෙලාවේ ඉතාම emotional වුණා මට ඇත්ත වශයෙන්ම මම ඉතාම ඒ කියන්නෙ කනගාටු වුණා මම හිතුවේ නැහැ එතුමා මට එහෙම කියයි කියලා. ඉතින් ඊට පස්සේ අපි දෙන්නා ඊට පස්සේ ඒක අමතක කරා. නමුත් ස්වාමිනි ඒක තමයි තිබ් මට්ටමක තමා ස්වාමිනි මේ හිටියේ කියන එක මං කියන්න කැමතියි . එතුමා සහ අපි ඉතාම ඒකියන්නෙ අපිට දෙයක් කර ගන්න බැරි මට්ටමක තමා ස්වාමිනි මේ හිටියේ කියන එක මං කියන්න කැමතියි .

**********

FAIR COMMENT
BY JEZEEM

**<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මහතා</u>**

ප්‍ර මේජර් සුභසිංහ ඔබ නවත්වපු තැනින් මම ප්‍රශ්නය අහන්නම්?

උ දැන් ඔබ කියන විදියට දැන්ඒ අවස්ථාවේදි මෙන්ඩිස් මහත්මයා කියනවා අපි ගිහිල්ලා කිව්වට වැඩක් නැහැ හම්බ වෙන්නේ නැහැ, කියන දේ අහන්නේ නැහැ එහෙම කියලා ?

උ එසේය.

ප්‍ර දැන් මේ තත්වය එතනින් උඩට වාර්තා කරන්න මෙන්ඩිස් මහතා හෝ ඔබගේ අංශය කිසිම පියවරක් ගත්තේ නැද්ද ?

උ ස්වාමිනි අපි රාජ්‍ය සේවකයෙන් හැටියට අපේ chain of command එක මොකක්ද කියන ඉතාම පැහැදිලිව අපි අඳුරාගන්න අවශ්‍යයයි. එතකොට ස්වාමිනි උදාහරණයක් මම වගකියන්නේ ජාතික බුද්ධි ප්‍රධානි තුමාට. එතකොට එතුමා වග කියන්නේ ආරක්ෂක ලේකම්තුමාට ඉතින් ස්වාමිනි ආරක්ෂක ලේකම්තුමා තමයි ස්වාමිනි මේක ජාතික ආරක්ෂක කවුන්සලයට යොමු වෙන්න ඕනේ. නමුත් විශේෂයෙන්ම මං හිතන්නේ ජාතික ආරක්ෂක කවුන්සිලයත් ගැන කියනකොට ස්වාමිනි මට විශේෂයෙන්ම දින 52 තිබ්බ දේශපාලන ගැටුමෙන් පස්සේ මේක කිසිම අවස්ථාවක මේක මේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් තීරණ ගන්න ස්ථානය මේක. ඉතින් මම නම් ස්වාමිනි මම නම් දැක්කේ නැහැ ස්වාමිනි ඒ වගේ බොහෝ මගේ Minutes වල මතකයි තියෙනවා මේක ජාතික ආරක්ෂක කවුන්සලයේ සාකච්ඡා කල යුතුයි කියලා නමුත් මටවත් ස්වාමිනි ඇවිල්ලා අපි ජිනෙත් මෙහෙම කතා කලා මෙහෙම කතා කලා මෙහෙම තීරණ ගත්තා කියලා කොහේවත් නැහැ ඒත් එක්කමඒක එක. දෙක ස්වාමිනි කිසිම අවස්ථාවක ජාතික ආරක්ෂක මණ්ඩලය කියන එක මේ කාලේ වෙද්දි ඒක නිකම් තනිකර adhoc තමයි කැමති නම් තියනවා නැත්නම් නැහැ ගරු ජනාධිපතිතුමාට ඕනේ නම් ඒක තියෙනවා ඒක කියන්නෙත් උදේ කියන්නේ එතකොට හවස වෙද්දි හැන්දෑවේ තියෙනවා ඔය වගේ හරිම මම හිතන්නේ ප්‍රකාශ කරාට වැරැද්දක් නැහැ මම ඉතාම දුර්වල මට්ටමක තිබ්බේ කියන එක ස්වාමිනි මං ප්‍රකාශ කරනවා ඒ වගේ තත්වයක් ඇතුලත මේ වගේ දෙයක් වෙන එකකිසිසේත්ම ස්වාමිනි බුද්ධි අංශයට සාමාජිකයෙක් වශයෙන් මම නම් කිසිසේත්ම පුදුමයට පත් වෙන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර දැන්ඔබ දකින විදියට ජාතික ආරක්ෂක කවුන්සිලයේ මිටින් තිබ්බේ නැත්තේ දේශපාලනමය වශයෙන් දෙපැත්තේ කඹ ඇදිල්ල නිසාද ?

උ පැහැදිලිව ස්වාමිනි ඒක ඉතාම පැහැදිලිව පෙනී ගියා ඉතින් මම කිව්වට වරදක් නැහැ කියන එක මම කියන්න කැමතියි මොකද බොහෝ වෙලාවට ජාතික ආරක්ෂක කවුන්සලය ස්වාමිනි විශේෂයෙන්ම ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලංකාවේ නැත්නම් අපි දන්නවා දැන් කවුන්සල් එකක් තියෙනවා කියලා මම ඒක කිව්ව එක වරදක් නැහැ

FAIR COMMENT BY JEZEEM

කියන එක මං‘ පිලිගන්නවා. මොකද අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා පිටරට ගියානම් අපි දන්නවා අනිවාර්යයෙන්ම කවුන්සිල් එකක් තියෙනවා කියලා ඒකෙන් ස්වාමිනි අපි ගන්න ඕන දේ තමයි ස්වාමිනි අපි මේ දේශපාලන බෙදීම නිසා මේ ඉහළ නිළධාරින් සමඟ කිව්වා ස්වාමිනි direction එක ඉතාමත් වැදගත් අපි කතා කරන එක අපි කතා කරන්නේ intelligence failure එකක් ගැන කතා කරන්නේ වෙන මොනවත් නෙමේ . intelligence failure එකක්. මෙච්චර අත්දැකීම් තියෙන මෙච්චර තොරතුරු තිබිලා මෙච්චර දේවල් තිබිලා මේක පාලනය කර ගන්න වලක්වාගන්න බැරිවුන එක intelligence failure. එහෙම වුනේ ස්වාමිනි මගේ දැනුමේ හැටියට අවුරුදු 20 ක සේවා කාලය දැනුමේ හැටියට මේ තිබ්බ දේහපාලන ඒ ගොල්ලන් කිසිම directionඑකක් දෙන්න මේක ස්වාමිනි Agenda එකටමම දැම්මේ හේතුවක් මත. මම දැක්ක විදියට එහෙම නම් මේක ඉහළට සාකච්ඡා කරලා මේක නැෂනල් ජාතික කවුන්සිල් ඕන තරම් මේව වෙලා තිබ්බා මට මාසෙක කාලයක් තිබ්බනේ ස්වාමිනි මේක දාලා සාකච්ඡා කරලා මේකට ගතයුතු ක්‍රියාමාර්ග හොයන්න තිබ්බා. ඒ පුද්ගලයා කව්ද කින්ද මන්ද කියන එක සොයා ගන්න තිබ්බා. නමුත් ඒ කිසිම දෙයක් නොවී දේශපාලන කඹ ඇදීම් නිසා කියන එක තමයි ස්වාමිනි මං හිතන්නේ ඊට අමතරව ස්වාමිනි මං මේකත් කියන්න කැමතියි මේ සහරාන් කියන පුද්ගලයා මේ ප්‍රහාරය සිදු කලේ නැත්නම් අද වෙනකනුත් ස්වාමිනි කිසිම කෙනෙක් විශ්වාස කරන්නේ නැහැ ලංකාවේ මුස්ලිම් අන්තවාදය තියෙනවා කියලා. කිසිම කෙනෙක් මම විශ්වාශ කරන්නේ නැහැ ස්වාමිනි මෙ සහරාන්ට මේ මියගිය තුන්සිය ගානකට ආසන්න සංඛ්‍යාවක් සෑම දාම ජාතික වීරයන් වශයෙන් සලන්න ඕනේ ඒ මිනිස්සු තමන් ගේ ජීවිත පරිත්‍යාගයෙන් පෙන්නුම් කරා ලංකාවේ මුස්ලිම් අන්තවාදයක් තියෙනවා සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට ඉඩ දෙන්නේ නැහැ මේ වගේ වහාබ් වාදය තියෙනවා සහ මේකට දේශපාලනය බොහෝ විට ගෑවෙන්න පුලුවන් හේතුව ස්වාමිනි කෙනෙක් පරිසරය හදනවා කියන එකත් ඒක සාමාන්‍යයෙන් ඉදුරාම මේ එක්කෙනෙකුට අන්තවාදයට උදව් කිරීමක් නෙමේ. නමුත් අර self-identity නැත්නම් own identity ය හදා ගැනීම තමයි ස්වාමිනි මං 2013 පැහැදිලිව දැක්ක දේ තමයි මං හිතන්නේ එතෙන්දි වුනේ ඒක ඉතාම වගකීමෙන් මට ප්‍රකාශ කරන්න පුලුවන් ස්වාමිනි.

ප්‍ර අවසාන වශයෙන්මං අහන්නම් දැන් මේ බෝම්බය අප්‍රේල් 21 පුපරා ගිය නිසා ඇත්තටම ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් ඇස් ඇරීම සිද්ධ වුණා කිව්වොත් හරිද ?

FAIR COMMENT BY JEZEEM

ඉතාම හරි ස්වාමිනි ඒක නිසාම තමයි ඉස්ලාම් අන්තවාදය පිළිබඳ ඇස් ඇරීමක් ආවේ. ඒක මං නැවත ප්‍රකාශ කරන්න කැමතියි එහෙම වෙන්නේ නැහැ මම නැවත කිව්වොතින් 2015/16 ස්වාමිනි මම කිලිනොච්චියේ බුද්ධි අංශයේ සේවය කලේ 4 වෙනි සන්නද්ධ බුද්ධි බලකායේ . මට හොඳට මතකයි ස්වාමිනි ඒ මම ඉස්සෙල්ලාම මට මතකයි LTTE සොහොන් තිබ්බා ඒ LTTE සොහොන් ඉස්සරහ ආරක්ෂක හමුදාව හිටියා ඉතින් නමුත් මේ ආණ්ඩුව බලයට පත්වීමත් සමඟ ඒවායේ සම්පුර්ණයෙන්ම ඉඩම් දීම ඒ වගේ එම නිසා මේ ආරක්ෂක හමුදාව අයින් කලා. ඉතින් එතකොට මට අද වගේ මතකයි ස්වාමින්වහන්ස කොහොමද කලේ ඉස්සෙල්ලාම ආවා ස්වාමිනි ඇවිල්ලා යම්කිසි විමර්ශනය කරලා ගියා ආයෙත් ආවා ඊට පස්සේ ඉඩම ශුද්ධකලා ප්‍රහ්ණයක් නැහැනේ ආයේ ගියා ආයේ ඇවිල්ලා ඒකේ බැම්මක් බැන්දා ඔන්න ඔහොම ඔහොමම ස්වාමීන් වහන්ස LTTE කොඩිය හැර ඒගොල්ලනගේ මහවිරු දේවල් සමරද්දි LTTE කොඩිය හැර අනිත් සියලුම දේවල් සොහොන් පවා තාවකාලිකව ඉදි කරලා කරන මට්ටමකට වැටුනා අපි ස්වාමිනි මම ground එකේ ඉන්න බුද්ධි නිළධාරියෙක් වශයෙන් මම මගේ ඒකකය හරහා මේක DMI ට මං රිපෝට් කරා ඉතින් එතකොට මේවා මං දැක්කා 2017 ත් මේවා කතා වුණා නමුත් ගත්ත action එක මොකක්ද ඒකයි ස්වාමිනි මම විශේෂයෙන්ම කියන්න කැමති කාලය ඉතාමත් කෙටියෙන් වුනත් ස්වාමීන් වහන්ස CRW Counter Revolution Warfare ඒ කියන්නේ ප්‍රතිවිප්ලවයේ සටන් ස්වාමිනි ඒකේ තියෙනවා මුලධර්ම කීපයක් තියෙනවා ස්වාමිනි මම ඒක ඉදිරිපත් කරන්න කැමතියි ගරු කොමිසමටම ඒකේ පලවෙනි එක තමයි ස්වාමිනි 1. Political Primacy 2. Co-ordinated Government Machinery 3. Intelligence and Information 4. Separating the Insurgent form of Support 5. Neutralizing the Insurgent 6. Long Term Pose Insurgency Plan ඒක ස්වාමිනි මම කෙටියෙන් ඉදිරිපත් කලොත් political primacy කිසිම යුද්ධයක් ස්වාමිනි ජයග්‍රහනය කරන්න බැහැ මේ දේශපාලන මැදිහත්වීමේ අරමුණකින් තොරව ඒක ඉතාම පැහැදිලව 2009 ඒ යුද්ධය පෙන්නුම් කරා ඉතින් නායකත්වය කියන එක මේ මොකක්ද කියන එක තේරුම් ගැනීම අවශ්‍යයයි. ඉතින් පැහැදිලිව ස්වාමිනි ඊලග එක තියෙනවා Co-ordinated Government Machinery බුද්ධි ආයතන කියන එව්වා එකට වැඩ කරන්න තියෙනවා ඒකට තමයි ස්වාමිනි කිවවේ ස්වාමිනි මම කිව්වේ ජාතික බුද්ධි ප්‍රධානි කාර්යාලය ශක්තිමත් කරන්න ඕනේ කියන එක එතකොට එයා ට වැඩි බලතල තියෙන්න ඕනේ. එයා මේ මට හොඳට මතකයි සිසිර මෙන්ඩිස්

FAIR COMMENT BY JEZEEM

මහත්මයා හිටියේ Additional Secretary level එකේ තමයි හිටියේ Additional Secretary, Additional Secretary මට්ටමේ ඉන්නවා නම් ස්වාමිනි ජාතික බුද්ධි ප්‍රධානි මං හිතන්නේ එතනින් එහාට කතා කිරීමක් අවශ්‍ය වෙන්නේ නැහැ ඊට ඉහත මට්ටමේ power එකක් එතුමාට ලබා දෙන්න ඕනේ කියන එක තමයි මගේ හැඟීම ආවෙත් ඊලඟ එක Intelligence and Information ඇයි මේක දාලා තියෙන්නේ ස්වාමීනි මේ intelligence එකක තියෙන වැදගත් කම ඒක කව්රු හරි ස්වාමිනි තම තමන්ගෙ තියෙන දේශපාලන අභිමතාර්ථ මත ඒක අයින් කර ගන්නවා නම් ඕනේ කෙනකුට ඒක තියෙන්න පුලුවන් ඒක. ප්‍රශ්ණයක් නෙමෙයි. නමුත් රටේ ජාතික ආරක්ෂාව කියන එක තිබ්බොත් තමයි ස්වාමිනි වෙන ඕනෑම දෙයක් කරන්න පුලුවන් ඉතින් මං පැහැදිලිව ප්‍රකාශ කරන්න කැමතියි මේ මං හිටපු අවුරුදු දෙකේ කාලෙදි එහෙම දේවල් ස්වාමිනි ජාතික ආරක්ෂාවට යොමු කිරීමක් වුන් නැහැ ඒත් එක්කම මම පැහැදිලිම දැක්කා ස්වාමිනි මේ විශේෂයෙන්ම හමුදා බුද්ධි අංශ සාමාජිකයන්ට මේ interrogation වලට බොහෝ . CID එකට අරන් ගියා ඉතින් කවුරු හරි මගෙන් ප්‍රශ්ණයක් අහන්න පුලුවන් එහෙමනම් හමුදා සාමාජිකයන්ට නීතිය අදාල නැහැ ඒ ගොල්ලන්ට නීතිය සියයට දාහක් අදාලයි නමුත් කෙනෙක්ව වරද කාරයෙක් කරනකන් මොකද ස්වාමිනි අපි හැමවෙලේම අපි ඉන්නේ under cover ඉන්නේ ඒකනේ අපේ හැඳුනුම්කම මොකක්ද කියලා හෙළිවුනොත් ආයේ මට රාජකාරි කරන්න බැහැ.ඒක තේරුම් ගැනිමකින් තොරව රාජකාරි කිරිම නිසා මම දැක්කා ඒ කාලේ හමුදා සාමාජිකයන් තොරතුරු එක් රැස් කිරිමට නෙමෙයි මේ යොමු වෙලා හිටියේ. කොයි වෙලාවේ මට ප්‍රශ්ණයකට මුහුණ දෙන්න වෙයිද කියලා මට ඉතාම මානසික දුර්වල මට්ටමක හිටියේ . ඉතින් මට තව මතකයි එක මන්ත්‍රී වරයෙක් කිව්වා නැහැ ඉතින් එක්කෙනෙක් දෙන්නෙක්ට එහෙම කරාට මේ අතින් කට්ටිය ප්‍රශ්ණයක් වුනේ නැහැ කියලා. ඉතින් ඒ වගේ ප්‍රකාශ ඇත්ත වශයෙන්ම මං ඉතා බැහැර කිරීමට කැමතිය මොකද මම බුද්ධි අංශේ ඉන්න සාමාජිකයෙක් හින්දා. එහෙම වෙන්නේ නැහැ ඒක නිසා මේක අනිවාර්යයෙන් Intelligence failure එකක් හැටියට තමයි ස්වාමිනි මම මෙතෙන්දි දකින්නේ ඉතාම පැහැදිලිව වලක්වන්න තිබ්බා මේ Intelligence cycle එක මොකක්ද කියන එක අඳුරගෙන කරා නම් ඉතා පැහැදිලිව වළක්වන්න තිබ්බා කියන එක තමයි මට අවසාන වශයෙන් කියන්න තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර ඔබෙන් මම අවසාන වශයෙන් එක දෙයක් අහන්නම් ඔබ බොහොම හෘද සාක්ෂියට එකඟව සාක්ෂි දෙන සාක්ෂිකරුවෙක් වගේ මට දැනෙන

FAIR COMMENT BY JEZEEM

නිසා ඔබට තේරෙන විදියට සහ ඔබට හැගෙන විදියට දැන් මෙච්චර ලොකු විනාශයක් සිද්ධ වෙන්න කව්ද වග කියන්න ඕනේ එහෙමනම්?

උ අනිවාර්යයෙන්ම ස්වාමිනි මේක ගරු ජනාධිපතිතුමා වග කියන්න ඕනේ එතුමට මේකෙන් කිසිසේත්ම ගැලවෙන්න හම්බ වෙන්නේ නැහැ ස්වාමිනි මොකද එතුමා රාජ්‍ය සන්නද්ධ හමුදාවල ප්‍රධානියා බුද්ධි අංශ මොකද එස්.අයි. එස් එකත් ස්වාමිනි ඉඳුරාම රිපෝට් කරන්නේ එතුමාට ඒක ඕන රටකම එහෙම තමයි . එතකොට එතුමා කියනවා නම් මන්දන්නේ නැහැකියලා කියනවා නම් ඒවගේ ඒක කරන්න බැහැ. ඊට අමතරව ස්වාමිනි ගරු අගමැතිතුමත් අනිවාර්යයෙන්ම මේකට වග කිව යුතුයි මොකද මේ ගොල්ලෝ බුද්ධි අංශ වලට යොමු කිරීමක් අර ඩයරෙක්ෂන් එකක් කරේ නැහැ දෙපැත්තට කඔ ඇද ඇද හිටියා මිසක් මොකද කිසිම රාජ්‍ය අංශයකට මට කියන්න බැහැනේ ස්වාමිනි මේ ගොල්ලෝ අදක්ෂ නිළධාරින් කියලා නමුත් මිට වඩා යොමු වීමක් ජාතික ආරක්ෂාව වෙන් කරලා තියන්න ඕනේ අනිත් රාජකාරි වලින් ඉතින් ඒ වෙන්කල නොතිබීමේ ප්‍රතිඵල තමයි ස්වාමිනි තුන්සිය ගානකට තමන්ගේ ජීවිත අහිමි වුනේ . නැවත වතාවක් මං කියනවා ස්වාමිනි අනිවාර්ය යෙන්ම හිටපු ජනාධිපතිතුමා ගරු අගමැතිතුමා මේකට වග කියන්න ඕනේ කියලා.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u> .**

ප්‍ර දැන් සාක්ෂිකරු ඔබ කිව්වා පෙර සිටි එවකට සිටි ජනාධිපතිතුමා සහ අගමැති තුමා වග කියන්න ඕනේ කියලා ? මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් එම ප්‍රහාරය සම්බන්ධ තොරතුරු අගමැතිතුමාට හෝ ජනාධිපතිවරයාට දැනුම් දීමක් බුද්ධි අංශ විසින් කරනැත්නම් එවැනි අවස්ථාවක ඔවුන් වගකිව යුතුද?

උ ස්වාමිනි එහෙම බුද්ධි අංශ වලින් කිව්වේ නැත්නම් කියන එක ස්වාමිනි මට පේන්නේ ඒ ගොල්ලන්ගේ commandant control කමාඩන් කන්ට්‍රෝල් එකේ තියෙන ප්‍රශ්ණයක් එහෙම වෙන්න බැහැ මම කිව්වේ නැත්නම් කියන එක ඒ තත්වයට පත් වෙන්න බැහැ. ඒකට තමයි රාජ්‍ය ආරක්ෂක ලේකම්වරයෙක් ඉන්නේ රාජ්‍ය ආරක්ෂක ඇමතිවරයෙක් ඉන්නේ . මම දන්නේ නැහැ මම කිව්වේ නැත්නම් එහෙමනම් කිව්වේ නැහැ කියන්නේ ඒ ගොල්ලන්ගේ control එක නෙවෙයි එහෙම නම් මේ බුද්ධි අංශ තියෙන්නේ එහෙම මට්ටමකට යොමු වෙන්න බැහැ මට පැහැදිලිව පේනවා දැන් මට ස්වාමිනි මම කණ්ෂ්ඨ නිළධාරියෙක් හැටියට මට තේරෙනවා නම් 2013 යම් මම දෙයක් දැක්කා නම් එතකොට ඊට පස්සේ මම මේ රිපෝට් අනුව දැක්කා නම් ඒ ගොල්ලන්ට එහෙම පේන්නේ නැතුව තියෙන්න බැහැ ස්වාමිනි

FAIR COMMENT — BY JEZEEM

එතකොට ඒක නිසා ඔබතුමාගේ පිළිතුරට මම කියන්නේ එහෙම බුද්ධි අංශ රිපෝට් කිරීමක් වෙන්නේ නැති වේන්න බැහැ ස්වාමිනි. ඉතින් මම හිතනවා එහෙම තත්වයකට ප්‍රශ්ණයක් ඇත්ත වශයෙන්ම ඒක ප්‍රශ්ණයක් විය යුතු නැහැ කියන එක ස්වාමිනි.

**********

**ගරු විනිසුරු අදිකාරි මැතිණිය.**

ප්‍ර ඔබ කිව්වනේ ජනාධිපතිතුමා මේ Security Council Meeting එකක් තියෙනවයි කියලා එවකට සිටි අගමැති රනිල් වික්‍රමසිංහ ලංකාවේ නැත්නම්?

උ එසේය ස්වාමිනි.

ප්‍ර එම සිදුවීම ආරම්භ වුණේ 2015 යහපාලන ආණ්ඩුව බලයට පත්වූ මුල් වකවානුවේද එහෙම නැතිනම් පසුකාලයකද?

උ විශේෂයෙන්ම මම දැක්කේ මැතිණියනි මම ආවේ 2017 විශේෂයෙන්ම අර මේ දින 52 ගැටුමෙන් පස්සේ තමයි මැතිණියනි මේක ඉතාම මේ විභේදනය කියන එක දැක්කේ ඉතින් එතකොට අතිගරු ජනාධිපති තුමා වෙනම තමයි එතුමාගේ නිල නිවසේ පැජට් පාරේ තමයි බොහෝ වෙලාවට මේ රැස්වීම් තිබ්බේ ඉතින් එතකොට මම දැක්කා මේ මෙතෙන්දි ගරු අගමැතිතුමාට එන්න කිව්වේ නැහැ මට හොඳට මතකයි පොලිස්පතිතුමාටත් මේ එන්න එපා කියලා මෙතෙන්දි අපට ගරු ආරක්ෂක ලේකම්තුමා හරහා දැනුම්දීමක් කරා ඉතින් එතකොට පැහැදිලිව පේනවා මැතිණියනි මේ තිබ්බ ව්‍යාකුල තත්වය.

ප්‍ර දැන් 2019 අප්‍රේල් 21 දින ත්‍රස්තවාදී ප්‍රහාරය සිදුවන අවස්ථාවේ දී එවකට සිටි ජනාධිපති ගරු මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ශ්‍රී ලංකාවේ හිටියේ නැහැනේ.?

උ එසේය මැතිණියනි.

ප්‍ර එවකට අගමැතිවරයාව සිටි රනිල් වික්‍රමසිංහ මහතා ආරක්ෂක ප්‍රධානින් කැඳවා රැස්වීමක් සුදානම් කරපු අවස්ථාවේදි ඔබ ආරක්ෂක අමාත්‍යාංශයේ සේවය කරා නේද ?

උ එසේය මැතිණියනි.

ප්‍ර මොකද වුණේ ඒ රැස්වීම පැවැත්වීම පිළිබඳ තත්වය ?

උ ඒක මැතිණියනි ආරක්ෂක අමාත්‍යාංශයේ නෙමෙයි තිබ්බේ මට මතක හැටියට ඒක මට මතක හැටියට Presidential Secretariat එකේ තමයි මට මතක හැටියට තිබ්බේ අපි ඒකට සහභාගි වුණේ නැහැ මැතිණියනි මම පුද්ගලිකව සහභාගි වුනේ නැහැ.

ප්‍ර එම රැස්වීමට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහභාගි වුණාද ?

FAIR COMMENT BY JEZEEM

උ සහභාගි වෙන්න ඇති මැතිණිය අනිවාර්යයෙන්ම සහභාගි වෙන්න ඇති ආරක්ෂක ලේකම්තුමා සහභාගි වෙන්න ඕනේ මේ වගේ බරපතල දෙයක් වුණාම.

ප්‍ර දැන් තවත් ප්‍රශ්නයක් තියෙනවා ඔබ ප්‍රකාශ කලා Chief of National intelligence කියන්නේ අමාත්‍යාංශයක අතිරේක ලේකම්වරයෙකුට සමාන තනතුරක් කියලා මෙම කොමිසම හමුවේ ඊයේ සාක්ෂි ලබා දුන් බ්‍රිගේඩියර් කපිල හෙන්දාවිතාරණ මහතා 2005 වසරේදි ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක යෙකු ලෙස තමයි විශ්‍රාම යාමෙන් පසු සේවය ආරම්භ කරලා තිබ්බේ ?

උ එසේය.

ප්‍ර එම වසරේ මුදල් අමාත්‍යාංශයේ කළමණාකරණ සේවා දෙපාර්තමෙන්තුවේ අනුමැතියකින් අතිරේක ලේකම් තනතුරක් එතුමා වෙනුවෙන් අලුතෙන් ඇති කරලා අතිරේක ලේකම් තනතුරකට තමයි මේ CNI කියන එක්කනාව අනුමත කාර්ය මණ්ඩලය ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයේ තියන තනතුරක්

උ එසේය.

ප්‍ර අතිරේක ලේකම් තනතුරක් කියන්නේ එසේ මෙසේ සුලු තනතුරක් නෙමේ අමාත්‍යාංශයක ලේකම්වරයාට පසුව සිටින organization structure එකේ ඔබ කිව්වානේ Commander එකේ ඉන්න දෙවනියා එතකොට අතිරේක ලේකම්වරයෙකුට ඇයි බැරි මොකද වෙන තනතුරක් එතුමා වෙනුවෙන් අමාත්‍යාංශය create කරන්න බැහැ මේකද Advisor කියන තනතුර අතිරේක ලේකම් වගේ මේ බලය ක්‍රියාත්මක කරන්න පුලුවන් තනතුරක් නෙවෙයි. ?

උ එසේය.

ප්‍ර අතිරේක ලේකම්ට ලේකම් වෙනුවට ලේකම් ගේ වැඩත් කරන්නත් පුලුවන් එහෙම තනතුරක ඉඳගෙන ඇයි ඔබ කියන්නේ එතුමාට බැරිවුණා කපිල හෙන්දාවිතාරණ මහතා කිව්වා එතුමා රාජකාරි ඉතාම හොඳින් කලා කියලා එම තනතුරේ.?

උ ඔව් මැතිනියනි ඒක විශේෂයෙන්ම ලක්කොට සඳහන් කරන්න කැමතියි හේතුව මැතිණියනි මම හිතන්නේ 2015 ට ඉස්සෙල්ලා ඒ ආරක්ෂක ලේකම්තුමන්ලා මේ ජාතික ආරක්ෂාව මොකක්ද මේකේ තියෙන වැදගත්කම මොකක්ද කියන එක අවබෝධ කරගෙන ඒ මේ CNI ට ජාතික බුද්ධි ප්‍රධානිතුමාට තමන්ගේ උපරිම blessings ශක්තිය ලබා දුන්නා ඒක පැහැදිලිව මැතිණියනි ඒක රේඛාවක් වශයෙන් වෙන් කරන්න පුලුවන් අපිට. නමුත් මම දැක්කා ස්වාමිනි සිසිර මෙන්ඩිස් මහතා ඉද්දි එහෙම දෙයක් එතුමාට blessings නැත්නම් ඒ අර තනිකර ඒක අවධානය යොමු කරලා ඒකයි මම මැතිණියනි කිව්වේ අපිට පැය

FAIR COMMENT BY JEZEEM

දෙකක් දෙන්න කියලා සතියකට brief කරන්න මේක එහෙම එතුමාට හැකියාවක් තිබ්බේ නැහැ ඒ briefing එක ගන්න. ඉතින් මට එතන පැහැදිලිව පේනවා මැතිණිය කිව්වා වගේ එහෙම අතිරේක ලේකම් කම තිබ්බාට ප්‍රායෝගිකව කොතනද CNI හිටියේ කියන එක මැතිණියනි කිසිම දෙයක් implement වුණේ නැහැ කියන එක තමයි මැතිණියනි මට ප්‍රකාශ කරන්න තියෙන්නේ.

මින් පසු සටහන් ගැනීම ඉන්ද්‍රාණි

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 4.50 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

**ගරු අදිකාරී මැතිණිය :**

ප්‍ර : එතකොට දැන් ඔබ සඳහන් කළානේ ඔබත් නිතරම සිසිර මෙන්ඩිස් මහතාව අභිප්‍රේරණය කළා ගිහිල්ලා මේක ලේකම්ට කියන්න මෙහෙම බැහැ, මෙහෙම බැහැ හම්බ වෙන්න කියලා. සාමාන්‍යයෙන් ලේකම්වරයෙක් රාජකාරී කරනකොට ලේකම්ට ඉන්නවනේ ඔය සම්බන්ධීකරණ ලේකම් කියලා තනතුරක් ඔය Telephone Calls සම්බන්ධ කරන, Meetings arrange කරලා දෙන, ඇතුළේ නිලධාරියෙක් Call එකක් දීලා දැන් සර් ගාව කවුරු හරි ඉන්නවද මට හම්බ වෙන්න ඕන එහෙම කියලා එනවනේ හම්බ වෙන්න. එහෙම සංස්කෘතියක් මේ අමාත්‍යාංශයේ ඔය කාලයේදී තිබුණේ නැද්ද? අතිරේක ලේකම්වරයෙකුට දුරකථන Internal Phone එකෙන් කථා කරලා සර්ව මම දැන් හම්බ වෙන්න එනවා කියලා හම්බ වෙන්න පුළුවන්කමක් තිබුණේ නැද්ද?

පි : එහෙම තනතුරක් තිබ්බා මට මතකයි. එක්තරා මහත්මයෙක් ඒ වගේ ඒක සම්බන්ධීකරණය කරන්න හිටියා. නමුත් මැතිණියනි මේකට වෙලාවක් දීම කොපමණ ප්‍රායෝගික වුණාද කියන එක මම දැක්කේ නැහැ. ඒ කියන්නේ Brief කරලා මේ වගේ දේවල් හරියට ප්‍රකාශ මොකද දැන් ඇත්ත වශයෙන්ම ආරක්ෂක ලේකම්තුමා කියන්නේ ආරක්ෂක ලේකම්. එතකොට ඇත්ත වශයෙන්ම මම හිතන්නේ මෙතුමාගේ පළවෙනි වගකීම වෙන්න ඕන මම හිතන හැටියට මැතිණිය ජාතික ආරක්ෂාවට තර්ජනයක් තියෙන්න් මොනවද කියලා හරිම Specifically දැන ගැනීම. එක, දෙක, තුන කියන හැටියට.

ප්‍ර : ඔය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට උදේ 8.00 යි හවස 4.00 යි රාජකාරී කාලයක් නෙමෙයිනේ තියෙන්නේ?

පි : එසේයි මැතිණිය.

ප්‍ර : ඇ 12.00 ට වුණත් රාජකාරියක් තියෙනවා නම් සිටිය යුතුයිනේ. එතකොට මේ අතිරේක ලේකම්, මේ CNI සිසිර මෙන්ඩිස් මහතාට ඇ 12.00 ට හෝ කාර්යාලයේදී හමුවීමට තරම් කාර්යාල වැඩසටහනක් තිබුණේ නැද්ද මේ ආරක්ෂක අමාත්‍යාංශයේ

FAIR COMMENT BY JEZEEM

ලේකම්ගේ. ලේකම්වරයා සාමාන්‍යයෙන් කාර්යාලයේ හිටියේ උදේ 8.00 යි හවස 4.00 යි වෙනකම්ද?

පි : නැහැ මැතිණියනි. එහෙම වුණේ නැහැ. ඔය කියන නිලධාරී මහත්වරු දෙන්නම එහෙම කාල වේලාවක් තිබ්බේ නැහැ. ඒක අඛණ්ඩව රැඳී සිටියා. නමුත් මැතිණියනි මම නිරීක්ෂණය කරපු දේ තමයි කෙසේ වුවත් අපිට අවස්ථාවක් ලැබුණේ නැහැ ගිහිල්ලා මේවා ඉදිරිපත් කරන්න කියන එක තමයි මැතිණියනි මම නිරීක්ෂණය කළේ.

ප්‍ර : එතකොට දැන් මේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන් ගොඩක් හිටියනේ?

පි : එසේයි.

ප්‍ර : අනිත් අයටත් මේ CNI ට තිබ්බිච්ච ප්‍රශ්නයම තිබුණාද ඒ ලේකම්වරයාව හමු වෙන්න බැරි ප්‍රශ්නය?

පි : නමුත් මැතිණියනි තිබ්බ රාජකාරී අනුව එක පුද්ගලයෙක් ගිහිල්ලා එළියට එන්න එක එක රාජකාරී මත විශාල වෙලාවක් මැතිණියනි එක එක රාජකාරී අනුව ගත කළා. නමුත් මම දැක්ක දේ තමයි මැතිණිය මේ Intelligenceවලට දුන්න Priority එක මොකද්ද කියන එක, වැදගත්කම මොකද්ද කියන එක. මොකද මේ මහත්වරු දෙන්නම මම ආශ්‍රය කරලා තියෙනවා. ඒ කියන්නේ සාකච්ඡාවලදී. ඉතිං මම දැක්ක ඉතාම හොඳ ඒ කියන්නේ හොඳ මහත්වරු. නමුත් මේ Intelligenceවලට කොපමණ දායකත්වයක් ලබා දෙන්න තිබ්බද සහ Priorityයක් තිබ්බද කියලා ප්‍රශ්නයක් ආවා. නමුත් මැතිණියනි ඒක බොහෝ වෙලාවට වෙන්න ඇත්තේ ආණ්ඩුවේ තියෙන දැක්ම මොකද්ද කියන එක මත තමයි. මොකද ඒගොල්ලොත් රාජ්‍ය සේවකයෝ. ඒගොල්ලොත් ආණ්ඩුවේ තියෙන දැක්ම අනිවාර්යයෙන්ම යොමුවෙලා සිටින්න අවශ්‍යයි. එතකොට ආණ්ඩුව හිතනවා නම් Reconciliations කියන දැක්මේ ඉන්න ඕන නැහැ Intelligence කියන එක ඕන නැහැ කියලා. මේ ඔක්කොමලා වැටෙන්නේ මැතිණිය ඒ කියන මට්ටමට. ඉතිං ඒ අනුව තමයි මැතිණියනි මම හිතන්නේ ඔක්කොම කාර්යයන් සිදු වුණේ කියන එක තමයි මගේ හැඟීම.

ප්‍ර : ඔබට මතකයක් තියෙනවද ඔබ රාජකාරි කරපු කාලය තුළදී ඔය ආගමික අන්තවාදය පිළිබඳව ලැබුණ තොරතුරු ආරක්ෂක ලේකම්වරයා විසින් අතිගරු ජනාධිපතිතුමාට ඔය ආරක්ෂක කමිටු රැස්වීම්වලදී ඉදිරිපත් කරනවා කියලා ඔබගේ ප්‍රධානියා CNI ඔබට කියනවද එහෙම. අද මේක දැම්මා, අද හොඳ දවසක්,

FAIR COMMENT BY JEZEEM

ජනාධිපතිතුමාව දැනුවත් කළා එහෙම ඔබට තොරතුරු ලැබෙනවද?

පි : මගේ අත්දැකීම නම් මැතිණිය CNI මට මොනවා හරි කිව්වේ, එහෙම දේවල් හරියට ඒ කියන්නේ බොහෝ වෙලාවට මේ ආරක්ෂක ලේකම්තුමා සහ විශේෂයෙන්ම ආරක්ෂක ලේකම්තුමා නැතත් ඒ කියන්නේ බුද්ධි අංශයේ ඉන්න ඒ කියන්නේ ජාතික බුද්ධි අංශ ප්‍රධානීතුමා සහ හමුදා බුද්ධි අංශයට අනිවාර්යයෙන්ම මේ කරුණු ඉදිරිපත් කරන්න ඇති කියන හැඟීම මට තියෙනවා. මොකද ඒගොල්ලෝ කවදාකවත් ඒක ඉදිරිපත් නොකර ඉන්නේ නැහැ මැතිණියනි. නමුත් ඒකට ලැබුණු උත්තරය මොකද්ද කියන එක මම අහපුවාම CNI එකෙන් මැතිණියනි හම්බ වුණේ ඒවට ඉතිං නිකම් අන්තිමට මැතිණියනි ඒ ආරක්ෂක කවුන්සිලය කථා පෙට්ටියක් බවට පමණක් වුණා කියන එක තමයි මගේ හැඟීම.

ප්‍ර : දැන් මෙහෙම තත්ත්වයක් යටතේ දැන් CNI ට, ජාතික බුද්ධි ප්‍රධානී ලෙස සිසිර මෙන්ඩිස් මහතා යුධ හමුදාපති සහ Directorate of Military Intelligence එකේ ප්‍රධානියාව මොකද ආරක්ෂාව පිළිබඳ ලොකු වගකීමක් තියෙනවනේ බුද්ධි තොරතුරු රැස් කිරීමේ ආයතන ලෙස සහ SIS එකේ ප්‍රධානියාව ලෙස තමන්ගේ කාර්යාලයට කැඳවලා මේ වෙන්න යන අකරතැබ්බය හෝ වින්නැහිය වළක්වා ගැනීම සඳහා අපි කණ්ඩායම හෝ එකතු වෙලා කිසියම් දෙයක් කරමුද කියලා හෝ සාකච්ඡා කළාද? දැන් මේ අයනේ විශාල වශයෙන්ම වග කියන්න ඕන බුද්ධි තොරතුරු රැස් කිරීමේ ආයතන සහ මේකට පොලිස්පතිතුමාද එකතු කරගෙන. පොලිස්පතිතුමා, යුධ යමුදාපතිතුමා, Director, Military Intelligence එකේ ප්‍රධානියා සහ SIS එකේ Director මේ හතර දෙනා කැඳවලා CNI එකේ සිසිර මෙන්ඩිස් මහතා රැස්වීම් පවත්වලා මේ අවාසනාවන්ත තත්ත්වයෙන් රට බේරා ගැනීම සඳහා ඔවුන් විසින් කිසියම් වැඩසටහනක් සාකච්ඡා කළාද? ඔවුන් එය ජනාධිපති ලේකම් මගින් හෝ ජනාධිපතිවරයාට ඒත්තු ගන්වන්නට උත්සාහ කළාද? එවැනි දේවල් සිද්ධ වුණාද?

පි : මැතිණියනි එහෙම දෙයක් මම නිරීක්ෂණයට ලක් කළේ නැහැ. මොකද හේතුව ඇත්ත වශයෙන්ම අපිට හොඳ Platform එකක් නැත්නම් වේදිකාවක් තියෙනවා අහහරුවාදා තියෙන මේ Conference එක. ඉතිං එතනදී මොකද ඇත්ත වශයෙන්ම දැන් මේක අපි කොච්චර කථා කළත් වැඩක් නැහැ ආරක්ෂක ලේකම්තුමා මේක Direction එකක් දුන්නේ නැත්නම් මෙන්න මෙහෙම කරන්න කියන එක. මොකද එතුමා ඒ අණ දීම

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කරන්නේ ගරු ජනාධිපතිතුමා වෙනුවෙන් කියන එක තමයි මගේ හැඟීම මැතිණියනි. ඉතිං එතකොට ඕන තරම් මැතිණියනි කථා කරන්න පුළුවන්. නමුත් අර අතනදී ඒ වගේ Platform එකක් තියාගෙන එතනදීවත් මේවා ප්‍රායෝගික වුණේ නැත්නම් මම හිතනනේ නැහැ මැතිණියනි අපි කොච්චර CNI Office එකත් එක්ක සාකච්ඡා කළත් මේක ප්‍රායෝගික වෙයි කියලා.

ප්‍ර : ඒ ඔබ සඳහන් කරන්නේ බුද්ධි ආයතන ලෙස සියළු තොරතුරු තිබිලා, කරුණු ඉදිරිපත් කළත් බිම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා තීන්දු තීරණ ගතයුතු ඉහළම ප්‍රධානියා විසින් ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා නොදීම ගැනද ඔබ මේ කියන්නේ?

පි : එසේය මැතිණියනි. මොකද ඒක අපි ප්‍රායෝගිකව සිදු කළ යුතුයි. දැන් අපි හිතමු මැතිණියනි L.T.T.E. සමරුවක් කියලා. දැන් මේගොල්ලෝ සමරනවා මේක රතු කොඩි දාලා, කෑ ගහලා ඒක සමරනවා. මේකට බුද්ධි අංශ මැතිණිය Report කරනවා. ඉතිං එතකොට අපි Security Councilයෙන් මේක ජනාධිපතිතුමාට කියනවා. ඒ ජනාධිපතිතුමා මැතිණිය එතකොට එහෙනම් කරන්න ඕන Right එහෙනම් ගරු පොලිස්පතිතුමාට කියන්න එහෙනම් මෙහෙම කරන්න. මේ වගේ මොකක් හරි Direction එකක් මේ තියෙන තර්ජනය නැති කරන්න. නමුත් ඉතිං එහෙම දෙයක් වුණාද කියන එක මැතිණිය මට ගැටළුවක් තියෙනවා මේ අවුරුදු දෙක. එහෙම මම දැක්කේ නැහැ මැතිණියනි.

ප්‍ර : ඒ අනුව ඔබ මේ සම්බන්ධයෙන් උත්තරයකුත් දුන්නා. 2019 අප්‍රේල් 21 ප්‍රහාරය පිළිබඳව විදේශීය බුද්ධි ආයතනයක් විසින් SIS එකේ නිලන්ත ජයවර්ධන මහතාට ලබා දුන් බුද්ධි තොරතුර එතුමා අතිගරු ජනාධිපතිතුමා වෙත දන්වා තිබුණා නම්, එම බුද්ධි තොරතුරුවල තිබෙන්නා වූ වැදගත්කම සැළකිල්ලට ගෙන රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව රටේ ප්‍රධානියා ලෙසත්, ත්‍රිවිධ සන්නද්ධ හමුදාවල ප්‍රධානියා ලෙසත් එවකට සිටි අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා විසින් වහාම රැස්වීමක් කැඳවා ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්, පොලිස්පතිවරයාට උපදෙස් ලබා දිය යුතුයිද මේ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුත්තේ කෙසේද කියන එක පිළිබඳව?

පි : අනිවාර්යයෙන් මැතිණියනි. එහෙම දැනුවත් කළා නම් අනිවාර්යයෙන්ම සිදු කළ යුතුයි. ඒක සාමාන්‍ය දේ මැතිණියනි. ඒ කියන්නේ සාමාන්‍ය දේ තමයි අනිවාර්යයෙන්ම මේ සම්බන්ධව මේ වගේ මොකද මැතිණියනි මම අර කිව්වා වගේ දැන් මම නම් Informer නැත්නම් තොරතුරුකරුවාව Handle කරන්නේ,

FAIR COMMENT BY JEZEEM

නැත්නම් මම Handle කරන්නේ මැතිණිය මම තමයි දන්නේ තොරතුරුකරුවා කියන වේගය නැත්නම් තොරතුරුකරුවාගේ මුහුණේ Expression පවා මම තමයි දන්නේ. ඒ කියන්නේ කොපමණ මෙයා කියනවද කියන එක. එතකොට නිලන්ත ජයවර්ධන මහත්මයා තමයි දන්නේ මේ විදේශ බුද්ධි අංශයෙන් දුන්නහම මේ තොරතුරේ තියෙන බරපතලකම නැත්නම් ඒකේ තියෙන Weight එක මොකද්ද කියන එක. ඉතිං එතකොට එතුමා මට මතක හැටියට ඒකේ නිකම් Covering Letter එකක් විතරයි මැතිණිය එතන ගහලා ලියුමක් එව්වේ. ඇත්ත වශයෙන්ම මම ඔය ලියුම දැක්කේ නැහැ මම ඒ එද්දී. මම ඒක පස්සේ තමයි මම දැක්කේ මේ ප්‍රහාරයෙන් පසුව. ස්වාමීනි මම අවංකවම කිව්වොත් එහෙම මට වුණත් මේ ලියුම මැතිණිය එදා කලින් දවසේ හම්බ වුණා නම් තිබ්බ දේශපාලන වාතාවරණය මත සහ මේක Weight එකක් මොකද එයාගේ Comment එකක් එතන මැතිණිය මම දැක්කේ නැහැ. මොකද නැත්නම් කළ යුත්තේ බුද්ධි චක්‍රය අනුව එයාට මොකද මේ වෙද්දී සිදුවීම් හතරක් වෙලා තිබ්බා. ඒ ඔක්කොම දන්නවා. ඉතිං එහෙනම් ඒ Comment එකත් එක්ක එන්න ඕන. ඉතිං එහෙම දෙයක් වුණේ නැහැ. ඉතිං කෙසේ වෙතත් ඔබ මැතිණිය අහපු ප්‍රශ්නයට උත්තරය තමයි අනිවාර්යයෙන්ම සිදු කළ යුතුයි මෙහෙම දෙයක් මොකද විදේශීය බුද්ධි අංශයක් නිකම් කියන්නෙත් නැහැ මේක. ඒගොල්ලොන්ට මොනවා හරි, ඒගොල්ලොත් ගවේෂණය කරලා බුද්ධි තොරතුරක් තමයි දෙන්නේ. එහෙමනම් අපට තිබ්බේ අපේ තියෙන Source අනුව ඒක කරලා කරන්න. නමුත් එහෙම දෙයක් වුණා නම් අනිවාර්යයෙන්ම මේක ජනාධිපතිතුමා කියන්න තිබ්බා එතුමා පිටරට හිටියත් ගරු ආරක්ෂක ලේකම්තුමාට කියන්න තිබ්බා මේක දැන් හදිසි රැස්වීමක් කථා කරලා, මේ සම්බන්ධයෙන් පරීක්ෂා කරලා විශේෂයෙන් මැතිණිය අන් බුද්ධි ආයතන සහ හමුදා අතර මේක බෙදා ගන්න කියලා. එහෙම දෙයක් වුණා නම් කිසිසේත් මැතිණිය මේක වෙන්නේ නැහැ කියලා තමයි මගේ හැඟීම.

ප : දැන් ඔබට මෙම කොමිසමට ප්‍රකාශ කරන්නට පුළුවන්ද ඔය රාජ්‍ය බුද්ධි ප්‍රධානී SIS Director නිලන්ත ජයවර්ධන මහතා ඔබ සඳහන් කළා Covering Letter එකක් ගහලා නිකම් මේ තොරතුරු ටික එව්වා කියලා. ඔහු මේ රටේ ඉන්න අංක එකේ බුද්ධි අයතනයේ ප්‍රධානි?

පි : එසේය ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට කියන්නට පුළුවන්ද ඇයි එවැනි වගකීමක් ඇති නිලධාරියෙකු මේ වගේ සැහැල්ලු ලියුමක් ලියලා මේ තොරතුරු එවලා තිබුණානේ CNI එකට නේද?

පි : එසේය ස්වාමීනි.

ප්‍ර : ඔහු ආරක්ෂක ලේකම්ටවත් ලියලා තිබුණේ නැහැනේ නේද?

පි : CNI ට එව්වේ.

ප්‍ර : CNI ට තමයි එව්වේ. ඇයි එයා එහෙම කළේ?

පි : මැතිණිය ඇත්ත වශයෙන්ම මමත් ඕක දැන් එදා සිද්ධිය වුණ දා ඉඳන්ම කල්පනා කරනවා. ඒක මටත් විශාල ප්‍රහේළිකාවක්. ඒක ඇයි මේ වගේ මොකද අපේ තියෙන අංක එකේ ආයතනය තමයි SIS එක. ඒකේ ඉන්න බුද්ධි ප්‍රධානී මේක Covering Letter එකක් විතරක් ගහලා එව්වේ. දැන් අපි මැතිණියනි කියමු ඒක එව්වා කියලා. ඊට පස්සේ දැන් අපි මාධ්‍යවලින් දැක්කා එතුමාට තව බුද්ධි අංශවලින් කියලා තිබ්බා මේකේ Development එක නැත්නම් වර්ධනය කොහොමද කියලා. ඉතිං ඒක කිසිම වෙන බුදුධි ආයතන සමඟ Share කරලා නැහැ. ඉතිං එතුමාගේ විශාල වගකීමක් තියෙනවා රාජ්‍ය බුදධි අංශයේ ප්‍රධානියා හැටියට. ඒත් එක්කම මේ Source එක Control නැත්නම් මේ තොරතුර ලැබුණ පුද්ගලයා හැටියට මේක අනිවාර්යයෙන්ම යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න මේක Threat එක Seriously හිතලා. නමුත් මට දැක්ක දේ තමයි මේක ඇයි එතුමා මේක එහෙම දෙයක් කළේ කියන එක අදටත් මැතිණිය මටත් විශාල ප්‍රශ්නයක් බුද්ධි අංශයේ සාමාජිකයෙක් වශයෙන්.

ප්‍ර : අවසාන ප්‍රශ්නය මගේ. ඔබ සඳහන් කළා Foreign Fighters ලා හැටියට සිරියාවට ලංකාවේ මුස්ලිම් තරුණ පිරිස් ගිහිල්ලා ලංකාවේදී ඒගොල්ලන් ආපහු ආපුවාම Airport එකේදී අත් අඩංගුවට අරගෙන ඒගොල්ලන්ගෙන් ප්‍රශ්න කරන්න අවශ්‍යයි කියලා සහ හමුදාවල්වලට ඒගොල්ලන්ගෙන් ප්‍රශ්න කරන්නට අවස්ථාව ලබා දෙන්න කියලත් ඉල්ලීම් කළා කියලා. ඒ එක්කම ඔබ සඳහන් කළා ලංකාවේ එවකට තිබෙන්නා වූ නීති පද්ධතිය තුළ මෙවැනි කණ්ඩායම් සම්බන්ධයෙන් නීතිමය වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැති බවත්?

පි : එසේය මැතිණියනි.

ප්‍ර : ඒ එක්කම ඔබ සඳහන් කළා හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතාට කිව්වා කියලා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් යෝජනා කර ස්ථිර කර ඇති යෝජනාවල මෙවැනි

FAIR COMMENT BY JEZEEM

ත්‍රස්තවාදී පිරිස් සම්බන්ධයෙන් කටයුතු කිරීමට නීතිමය ප්‍රතිපාදන තිබෙනවාද කියලා බලන්නට කියලා?

පි : එසේයි මැතිණියනි.

ප්‍ර : ඔබ මෙම කොමිසම හමුවේදී ආරම්භයේදීම ප්‍රකාශ කළා ඔබගේ රාජකාරීවලින් එකක් තමයි එය කියලා. ඔබට කියන්නට පුළුවන්ද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කමිටුවේ සම්මුති 1267 කියන්නේ මොකද්ද කියලා?

පි : මැතිණියනි, 1267 කියලා කියන්නේ එක්සත් ජාතීන්ගේ තියෙනවා මේ ඒ කියන්නේ විශේෂයෙන්ම ISIS, අල්කයිඩා අන්න ඒ සංවිධානයේ සාමාජිකයන්ව අපිට පුළුවන් මැතිණිය ඒගොල්ලන්ව List කරන්න නැත්නම් Blacklist කරන්න මේ සංවිධාන මේගොල්ලෝ ත්‍රස්තවාදීන්ට සම්බන්ධයි කියලා. විශේෂයෙන්ම 1267 තියෙන්නේ අල්කයිඩා, ISIS, තලේබාන් කියන සටන්කාමීන් ත්‍රස්තවාදීන් මේක වර්ගීකරණය කර නැත. ඒගොල්ලෝ නම් කරන්න තමයි මේක තියෙන්නේ. ඒක රටවල් අතර බෙදාහැරීමක් කරපුවාම මේගොල්ලන්ට සම්බාධක පනවන්න පුළුවන් මැතිණිය ඒ කියන්නේ රටවල්වලට පැමිණීම ඒ රටට ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් මේ ....,

ප්‍ර : මේ සම්මුතියේ පාර්ශවකරුවෙක්ද ශ්‍රී ලංකාව?

පි : මේ සම්මුතියේ පාර්ශවකරුවෙක්.

ප්‍ර : පාර්ශවකරුවෙක් නේද?

පි : එසේයි මැතිණිය. මොකද ආරක්ෂක ලේකම් මම අර කලින් සඳහන් කරපු ඒ සම්මුති පහටම ලංකාව මොකද ඒ කියන්නේ ලංකාව ආරක්ෂක මණ්ඩලය එක්සත් ජාතීන් ඉන්න නිසා ආරක්ෂක මණ්ඩලයේ තියෙන සම්මුතීන්වලට එකඟත්වයට පත් කරන්න වෙනවා. ඒත් එක්කම විශේෂයෙන්ම මේවා ක්‍රියාත්මක කරන්න නිසි බලධාරියා වශයෙන් හිටියේ මැතිණිය ගරු ආරක්ෂක ලේකම්තුමා. ඒක තමයි ගරු ආරක්ෂක ලේකම්තුමා අපිට ....,

ප්‍ර : ඔබට කෙටියෙන් කියන්න පුළුවන්ද 1373 කියන්නේ මොකද්ද කියලා?

පි : එසේයි මැතිණියනි. 1373 කියලා කියන්නේ විශේෂයෙන්ම ලංකාවේ ඒ කියන්නේ දේශීයව ඉන්න මොනවා හරි ත්‍රස්තවාදීන්ගේ වත්කම් තහනම් කරන්න ගන්න පුළුවන් ක්‍රියාමාර්ග තමයි ඒකේ තියෙන්නේ. දැන් අපි විශේෂයෙන්ම ....,

ප්‍ර : ඒ කියන්නේ ලංකාවේ ඉන්න විදේශීය ත්‍රස්තවාදීන්ද?

පි : නැත මැතිණියනි. ලංකාවේ ඉන්න ත්‍රස්තවාදීන් ලංකාවට තර්ජනයක් වෙන්න පුළුවන්. ත්‍රස්තවාදීන්ගේ වත්කම් තහනම්

FAIR COMMENT BY JEZEEM

කරන්න තමයි අපි ඒක පාවිච්චි කරන්නේ. විශේෂයෙන්ම අපි L.T.T.E. සංවිධානයේ හිටපු සාමාජිකයන්ගේ වත්කම් තහනම් කරන්න ....,

ප්‍ර : ඒක හඳුන්වන්නේ මොන නමින්ද 1373?

පි : ඒක 1373 කියලා.

ප්‍ර : 1540?

පි : ඒක මැතිණිය තියෙන්නේ Proliferation of weapons of mass destruction ඒ කියන්නේ විශාල විනාශයක් කරන්න පුළුවන් විනාශකාරී අවි වැළැක්වීමේ පනතක් මැතිණිය.

ප්‍ර : 1718 කියන්නේ?

පි : 1718 කියන්නේ මට මතක හැටියට උතුරු කොරියාව සම්බන්ධයෙන් තියෙන ආරක්ෂක පනත. එතකොට අනිත් එක මැතිණියනි ....,

ප්‍ර : 3231?

පි : ඉරානය සම්බන්ධයෙන් තියෙන ආරක්ෂක සම්මුතිය.

ප්‍ර : ඒ අනුව ඔබට කියන්නට පුළුවන්ද මේ කොමිසමට 1267 තියෙන ප්‍රතිපාදන භාවිතා කරලා ලංකාවේ IS සංවිධානය තහනම් කරන්න පුළුවන්ද කියලා?

පි : ඔව් මැතිණියනි. දැන් විශේෂයෙන්ම මීටත් වඩා මැතිණිය අපි යෝජනා කළේ ආරක්ෂක සම්මුතීන් තියෙනවා 2253 කියන එක. ඒක තමයි අපේ ආරක්ෂක CNI දැනුම් දුන්නේ. මීට වඩා තව මේ ගැනම ඒ කියන්නේ Foreign Terrorist Fighters ලා සම්බන්ධයෙන්ම තියෙන Resolution තියෙනවා මැතිණිය. ඒක තමයි අපි යෝජනා කළේ මෙන්න මේ කියන Resolution එක බලලා යම්කිසි ලංකාවේ මේගොල්ලෝ ආවොත් එහෙම ලංකාවේ ක්‍රියාත්මක වෙනවා නීති ක්‍රමවේදයක් අධ්‍යයනය කරන්න සුදුසුයි කියන එක තමයි මැතිණියනි අපි යෝජනා කළේ. ඉතිං එතකොට කළ යුතුව තිබ්බේ ....,

ප්‍ර : 2253 ගැන ඔබ මේකේ සඳහන් කරන්නේ නැත්තේ ඇයි?

පි : මැතිණියනි 2253 කියන එකේ නිසි බලධාරියා හැටියට ලංකාවේ ආරක්ෂක ලේකම්තුමා පත් කරලා නැහැ.

ප්‍ර : කවුද මේකේ නිසි බලධාරියා 2253?

පි : ලංකාවේ මැතිණිය එහෙම නිසි බලධාරියෙක් හැටයට පත් කරලා නැහැ මැතිණියනි.

ප්‍ර : නමුත් ලංකාව මේ 22.53 ට Ratify වෙලා තියෙනවනේ නේද?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව් මැතිණියනි. දැන් ආරක්ෂක කවුන්සිලයේ වෙන ඒවා අපිටත් අදාළ වෙනවා මැතිණියනි. නමුත් මේ කියන සම්මුති පහ ලංකාවේ ක්‍රියාත්මක කරන්න නිසි බලධාරියා වශයෙන් මැතිණිය ලංකාවේ ආරක්ෂක ලේකම්තුමා තමයි පත් කරලා තියෙන්නේ.

ප්‍ර : එතකොට මේකේ නිසි බලධාරියා විය යුත්තේ කවුරුන් කියලද ඔබ හිතන්නේ මේ 2253. නිති බලධාරියෙක් නැත්නම් මේක ඉතිං ක්‍රියාත්මක කරන්න අපහසුයිද?

පි : නැහැ එහෙම දෙයක් නැහැ මැතිණිය. නමුත් මේක ලංකාවේ ආරක්ෂාවට මේ Resolution ටික බලපාන නිසා තමයි නිසි බලධාරියෙක් හැටියට මේකේ පත් කරලා තියෙන්නේ. ඉතිං අපිට කැමති විදියට මැතිණිය ලංකාවේ ක්‍රියාත්මක කරන්න අපිට ඒවා පත් කර ගන්න පුළුවන්. ඒක ඉතිං රජයේ තියෙන දැක්ම අනුව තමයි මැතිණියනි. එහෙම නැතත් ලංකාවේ පුළුවන් නීති අංශවලට මේකේ තියෙන බලපතලකම සාකච්ඡා කරලා, මොකද අපි යෝජනා කළේ අපිට දැක්ක විදියට අපේ තියෙන දැනුම මට්ටම අනුව අපි තේරුම් ගත්තේ මේ ලංකාවේ මේ සම්බන්ධයෙන් Foreign Terrorist Fighters ලා ආවොත් එහෙම අපිට තරම් නීත්‍යානුකූල තත්ත්වයක් නැහැ කියන එක. මොකද ලංකාවේ ඉඳන් ගිහිල්ලා Fight කරලා ලංකාවට ආවොත් මැතිණිය එයාට අපි මොකද කරන්නේ කියන එක. ඒක තමයි අපි හුවා දක්වන්න උත්සාහ කළේ.

ප්‍ර : ඔබ ආරක්ෂක අමාත්‍යාංශයේ රාජකාරී කරපු කාලයේදී CNIගේ අංශයේ කථාවට සාකච්ඡාවට භාජනය වුණාද මේ IS ගෝලීය ත්‍රස්තවාදයේ බලපෑම ලංකාවට එමින් තිබුණ නිසා IS සංවිධානය තහනම් කිරීම සුදුසුයි කියලා වගේ සාකච්ඡාවක් සිද්ධ වුණාද?

පි : සාකච්ඡා වුණා මැතිණිය. ඒකත් අර Weekly Intelligence Coordination Meeting එකේදී සාකච්ඡා කළා. මොකද මගේ දැනුමේ හැටියට එහෙම ISIS සංවිධානය ලංකාවේ තහනම් නැහැ මගේ දැනුමේ හැටියට විතරයි මැතිණියනි මම කියන්නේ. ඒ කාලයේ මට මතක හැටියට එහෙම තහනම් කරලා තිබ්බේ නැහැ. ඉතිං එතකොට මේ වගේ ගෝලීය ත්‍රස්තවාදී සංවිධානයක් ඇයි අපි තහනම් කරන්නේ නැත්තේ කියන එක. ඉතිං ඒවා නිතරම මැතිණිය සාකච්ඡා කළා මේකෙදී. ඒකයි මම Topic එකක් වශයෙන් පවා දැම්මේ මේවා ඉහළට කථා කරලා මේවට අවශ්‍ය කරන සාකච්ඡාවෙන් පස්සේ මොකද්ද අපි කරන්නේ කියන එක අපි ප්‍රායෝගිකව සිදු කළ යුතුයි. මේකට අවශ්‍ය කරන ප්‍රතිපාදන ගැනීම සඳහා තමයි මැතිණිය.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබගේ රාජ්‍ය සේවයේ වයසින් මුහුකුරා නොගිය කෙනෙක් බව පෙනී යනවා. නමුත් මෙම කොමිසම හමුවේ ඔබ ඉදිරිපත් කළ කුරුණු අනුව ඔබ දැනුමෙන් මෙම විෂය පිළිබඳව මේ ඉස්ලාම් ආගමික අන්තවාදී සහ IS සංවිධානය පිළිබඳව විෂය අතින් ඔබ ඉතාම දැනුමින් ඉහළ මට්ටමක ඉන්න බව පෙනී යන නිසා මම කැමතියි ඔබගෙන් අහන්න ඔබ යෝජනා කරනවාද මේ කොමිෂන් සභාවට ශ්‍රී ලංකාවේ IS සංවිධානය තහනම් කළ යුතුයි කියලා?

පි : අනිවාර්යයෙන් මැතිණිය. ඒ ලංකාවේ අල්කයිඩා, ISIS සංවිධානය ලංකාවේ තහනම් කළ යුතුයි. ඒක මම හිතන්නේ ඒක අනිවාර්යයෙන්ම සිදු කළයුතු දෙයක් මැතිණිය.

ප්‍ර : එහි තියෙන අවාසිදායක තත්ත්වයන් ඔබ සැළකිල්ලට අරගෙන නේද මේ කියන්නේ. දැන් තහනම් කළොත් මොකද වෙන්නේ එවැනි දේවල්?

පි : එසේයි මැතිණිය.

ප්‍ර : තහනම් කිරීමෙන් ලැබෙන වාසිය තහනම් කිරීමෙන් ලැබෙන අවාසිය අභිබවා යනවයි කියලා ඔබ හිතනවද?

පි : එසේයි මැතිණියනි.

ප්‍ර : මගේ අවසාන ප්‍රශ්නය. මේක ඔබට කරන මම යෝජනාවක්. ඔබගේ අර Academic Exercise එකේදී ඔබ ඇත්තටම තියෙන ප්‍රාථමික දත්තවලින්නේ ඔබගේ මෙම නිබන්ධනය කළේ. ඔබ අවස්ථාවක් කර ගත්තාද ශුද්ධ වූ කුරානය කියවීම සඳහා විශේෂයෙන්ම මෙම ඇඳුම පිළිබඳව ඔබගේ අදහස් මෙම පොතට ඇතුල් කිරීමේදී. ඔබ කියවෙව්වද මේ ශුද්ධ වූ කුරානයේ තියෙන දෙයක්ද මේ ඇඳුම කියලා?

පි : ඔව් මැතිණිය. මම හිතනවා මට මතකයි ඒක මට මතකයි ඒ කියන්නේ ශුද්ධ වූ කුරානයේ මේ ඇඳුම සම්බන්ධයෙන් තියෙන විශේෂයෙන්ම කාන්තාවන්ට සැළකීම ඒ කියන්නේ විශේෂයෙන්ම මේකේ තියෙන්නේ මම දැක්ක විදියට හොඳ දේවල් මොනවද විශේෂයෙන්ම කාන්තාව සම්බන්ධයෙන් තියෙන. ඒත් එක්කම මම දැක්ක විදියට ඒ කුරානය අධ්‍යයනය කිරීමෙන් ඒකේ වැරදි දේවල් මොනවද කියන එකත් මම එතනින් යම්කිසි පිටු දෙකක සඳහන් කිරීමක් කළා මැතිණිය.

ප්‍ර : ඒක තමයි අපේ කොමිසමට ලබා දීලා තියෙන ජමෙයිතු උලමාවරුන්ගේ අල්කුරාන් අර්ථ සංග්‍රහය. මම ඔබට යෝජනා කරනවා එහි සුරා 24, 30, 31 සහ එහි Foot Notes ත් එක්ක බලන්න සුරා 24, 30, 31 ත්, සුරා 33 – 59 ත් ඒක බලන්න.

FAIR COMMENT BY JEZEEM

එතකොට ඔබට අවබෝධයක් ගන්න පුළුවන් ඔය ඇඳුම කුරානයේ සඳහන් වන ඇඳුමක්ද එහෙම නැත්නම් අර මැද පෙරදිගින් ඔබ අදහස් ප්‍රකාශ කළා වගේ මැද පෙරදිග සංස්කෘතිය අපේ රටට ආපු නිසා අඳින ඇඳුමක්ද කියලා. ඒක මම ඔබට යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

**********

**ගරු සභාපතිතුමා :**

ප්‍ර : එක ප්‍රශ්නයක් විතරක් තිබෙනවා අහන්න නැවතත්. බුද්ධි සමාලෝචන මණ්ඩලය කිසිවක සහරාන් හෂීම් ඔහුගේ කණ්ඩායම ආයුධ පුහුණුවක් සම්බන්ධයෙන් යෙදෙනවා කියලා වාර්තා කෙරුවද?

පි : ස්වාමීනි එහෙම කිසිම දෙයක් Ground එකේ මේගොල්ලෝ Training කරනවා සම්බන්ධයෙන් හෝ ආයුධ එකතු කරනවා සම්බන්ධයෙන් හෝ වෙනයම් දෙයක් ඒ කියන්නේ විශේෂයෙන්ම Preaching නැත්නම් Radicalization දේශනා කරනවා සම්බන්ධයෙන් එහෙම දෙයක් කථා වුණේ නැහැ කියන එක තමයි මගේ නිරීක්ෂණය.

මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතීඥවරියගෙන් අසයි. අවශ්‍ය බව ප්‍රකාශ කරයි. අවසර ලබා දෙනවා.

**********

**අති උතුම් මැල්කම් කාදිනල් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය :**

ප්‍ර : සාක්ෂිකරු ඔබ පවසා සිටියා CNI ට සහරාන් ගැන තොරතුරු SIS එකෙන් හා DMI එකෙන් ලබා දුන්නා කියලා. ඔබට කියන්න පුළුවන්ද ඒ මොන කාල වකවානුවේද මුලින්ම එහෙම ලැබුණේ කවදාද කියලා?

පි : ස්වාමීනි මට එහෙම කාල වකවානුවක් කියන්න අමාරුයි. නමුත් මම දැක්කා, දැන් මේ සිද්ධිය වුණේ 2019. නමුත් 2018 අවණ්ඩවම මෙයාගේ තිබ්බ Online Radicalization සම්බන්ධයෙන් තිබ්බ තොරතුරු රාජ්‍ය බුද්ධි සේවයෙන් හා හමුදා බුද්ධි අංශයෙන් CNI Office එකට ලැබුණා ස්වාමීනි.

ප්‍ර : දැන් ආරක්ෂක කවුන්සිලයේදී සහරාන් පිළිබඳව තොරතුරු ඔබලා සාකච්ඡාවට භාජනය කරලා තියෙද්දිත් ඊට පස්සේ දැන් ඔබටත් ලැබුණෙන් සහරාන් පිළිබඳව තොරතුරු. ඔබත් පෞද්ගලිකව හරි

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ආරක්ෂක ලේකම්තුමාව හම්බ වෙලා ඒ කියන්නේ පෞද්ගලිකව වෙනම හම්බ වෙලා නෙමෙයි ඒ වගේ Meeting එක වෙලාවෙදි හරි තනියම ඔබ ආරක්ෂක ලේකම්තුමාට මේ පිළිබඳව දැනුම් දෙන්න උත්සාහ කළේ නැද්ද?

පි : ස්වාමීනි මම ආරක්ෂක ඒ කියන්නේ අපිත් එක්ක Weekly Intelligence Coordinating Meeting වලට සහභාගී වෙන්නේ CNI Office එකේ මේක සටහන් කර ගැනීමට පමණයි ස්වාමීනි. මොකද නමුත් මම ඒකේ Stake Holder කෙනෙක් සාමාජිකයෙක් නෙමෙයි. මම සහ කර්නල් මහතන්ත්‍රී සහභාගී වුණේ. ඒක CNI වෙනුවෙන් සටහන් ලබා ගැනීමට පමණයි. ඒ කියන්නේ මේකෙන් නිරීකෂණයට ලක් කරන්න පමණයි. නමුත් මම සාමාජිකයෙක් නොවන නිසා මට එතනදී මට කොච්චර මේවා සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමට අත්දැකීම් තිබුණත් නැත්නම් ඒක ප්‍රකාශ කරන්න වුවමනාව තිබ්බත් මට එතනදී ප්‍රකාශයට පත් කරන්න බැහැ. මොකද මම ඒකේ සාමාජිකයෙක් නොවන නිසා ස්වාමීනි.

ප්‍ර : CNI දැන් මේ සහරාන් පිළිබඳව, සහරාන්ගේ ප්‍රහාරයන් පිළිබඳව තොරතුරු දැන ගත්තට පස්සේ දැන් ආරක්ෂක කවුන්සලයේදීත් ඒ පිළිබඳව දැනුම් දීලා කිසිම ප්‍රයෝජනයක් ලැබුණේ නැති බව ඔබ ප්‍රකාශ කළා. ඊට පස්සේ CNI ඒ පිළිබඳව වැඩිදුර සොයා බැලීමක් කළාද එහෙම නැත්නම් ඒ සොයා බැලීමත් නතර කළාද?

පි : ස්වාමීනි අපිට තිබුණ තොරතුරු අපිට තේරුණා අපිට Threat එකක් තියෙනවයි කියන එක. ඒකයි ස්වාමීනි අපි ඉදිරිපත් කළේ මේක ආරක්ෂක කවුන්සිලයට මේක සාකච්ඡා කරන්න සුදුසු මට්ටමකට වර්ධනය කර ගන්න. ඉතිං මම දැක්කා ඉතිං එතනදී ඒක සාකච්ඡාවලට ලක් වුණා මිස මම හිතන්නේ අර බුද්ධි තොරතුරුත්, මේ Ground එකේ බුද්ධි තොරතුරුත් හරියට තිබ්බේ නැති නිසා දැන් මම හිතන්නේ පැහැදිලිව පේනවා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයත් දැනගෙන හිටියා මෙයා ලංකාවේ නැහැ කියන එක. ඉතිං එතකොට ඉන් එහාට මේකෙන් ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ කියන එක තමයි ස්වාමීනි මගේ හැඟීම.

ප්‍ර : ඔබ සහරාන්ව මුණ ගැහිච්ච අවස්ථාව සම්බන්ධව මගේ ඊළඟ ප්‍රශ්නය. එවිට ඔබ ඔහුගෙන් අන්‍ය ආගමිකයන් පිළිබඳව තියෙන අදහස් ඔබ සටහන් කරගෙන තියෙනවද? ඔබේ නිබන්ධනයේ ඒ පිළිබඳව සටහන් කරලා තියෙනවාද?

පි : ස්වාමීනි අන්‍ය ආගමිකයන් සම්බන්ධව මගේ දැන් මතකයේ හැටියට මම ඇහුවේ විශේෂයෙන්ම මේ අන්‍ය ආගමිකයන් සහ

FAIR COMMENT BY JEZEEM

සාමයෙන් ජීවත්වීමට ඔබගේ යොමුව මොකද්ද කියන එක. මේ මුස්ලිම්වරුන්ගේ යොමුව මොකද්ද කියන එක. අප කළ යුත්තේ මොනවද කියන එක. එයා විටින්විටම ප්‍රකාශ කළේ පළවෙනි එක අපිට මහා ජාතීන් නැත්නම් සිංහල ජනතාවගෙන් විශාල අසාධාරණ වෙනවා. විශේෂයෙන්ම බොදු බල සේනාව වගේ දේවල් අඛණ්ඩ අපිව Arrest කරනවා. ඒක එක. ඒක නිසා නම් ඒකට දෙවෙනි එක ඒ කිසිම ක්‍රියාමාර්ගයක් කවුරුත් ගන්නේ නැහැ කියන එක. තුන්වෙනි එක තමයි නමුත් අපි මේ මුස්ලිම් ජාතියක් වශයෙන් මේකේ ඉදිරියට යන්න නම් අනිවාර්යයෙන් අපිට වෙනස් වූ අනන්‍යතාවයක් තිබිය යුතුයි කියන කරුණු තුන තමයි ස්වාමීනි මෙයා ප්‍රධාන වශයෙන්ම දක්වා සිටියේ.

ප්‍ර : දැන් ඔබ මේ පිළිබඳව මේ ඔබගේ නිබන්ධනයට පමණක්ද සොයා බැලීමක් සිදු කළේ. ඔබ දැනටත් ඒ පිළිබඳව ඔබ සොයා බලමින් සිටිනවද? ඔබ ඒ පිළිබඳව සැළකිලිමත්ද මේ මුස්ලිම් අන්තවාදය පිළිබඳව?

පි : එසේයි ස්වාමීනි. අපි බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් දැනට අපි රටක් වශයෙන් ලබපු විශාල පරාජයක් කිව්වෝතින් ඒක නිවැරදියි. 2019 අප්‍රේල් 21 ලබපු මේ පරාජය නිසා. දැන් අපි විශාල වශයෙන් එහෙම නැවතත් එවැනි සිදුවීමක් නොවෙන්න ස්වාමීනි අපි විශාල වශයෙන් ඒකට වෙනම Desk එකක් නැත්නම් වෙනම කාර්ය මණ්ඩලයක් ඉන්නවා. ඒකට වෙනම අපි ඒවා ඒ අපේ ඒක නැවත මෙම සිදුවීමක් නොවෙන්න සියළු අවශ්‍ය කරන ක්‍රියාමාර්ග අරගෙන තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර : මගේ ඊළඟ ප්‍රශ්නය වන්නේ එතකොට දැන් මේ සහරාන් වගේ අන්තවාදී නායකයෙක් දැන් බෝම්බ ප්‍රහාරයෙන් මිය ගියා. දැන් එතකොට එයාගේ අනුගාමිකයිනුත් ඉන්නවනේ. දැන් ඒ වගේ එහෙම එයාගේ අනුගාමිකයන් ගැන ඔබට වාර්තා වෙලා තිබුණද? මේ වගේ අන්තවාදී රැස්වීම් පවත්වලා, තව එයාගේ පැත්තට නැඹුරු කරවා ගන්න තව පුද්ගලයන්ව එහෙම අය?

පි : ස්වාමීනි මගේ දැනුමේ හැටියට එහෙම අනුගාමිකයන් වශයෙන් ඒ කියන්නේ මේ ප්‍රහාරය වෙන්න ඉස්සරලා මම හිතන්නේ ඔබ අහන්නේ ඒක වෙන්න...,

ප්‍ර : ඔබගේ මද්‍රසා පාසල් සම්බන්ධව ඔබ කරපු නිරීක්ෂණයේදී එම පාසල් පෞද්ගලික පාසල් ගණයටද වැටෙන්නේ?

පි : එසේයි ස්වාමීනි. ඒවා පල්ලිවලින් පාලනය වන පුද්ගලික මද්‍රසා.

ප්‍ර : එතකොට එම පාසල්වලට ගුරුවරන්ගේ වැටුප් ගෙවීම සිදු කරන්නෙත් එයට අදාළ මුස්ලිම් පල්ලියෙන්?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. මම හිතන්නේ එහෙම තමයි මුස්ලිම් පල්ලියෙන් තමයි අවශ්‍ය කරන වැටුප් ගෙවන්නේ.

ප්‍ර : ළමුන්ගෙන් මුදල් අය කිරීමක් සිදු කරනවද?

පි : අය කිරීමක් සිදුවිය හැකියි ස්වාමීනි. ඒ කියන්නේ පාසලේ යම් යම් නඩත්තු කිරීම්වලට යම්කිසි අය කිරීමක් වෙන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර : ඔබගේ නිබන්ධනය සම්බන්ධව, ඔබගේ නිබන්ධනය කිරීමෙන් ඔබ බලාපොරොත්තු වුණේ ඔබගේ විභාගය පාස් කිරීම විතරක් නෙමෙයි කියලා මම හිතනවා?

පි : ඔව් ස්වාමීනි. විභාගය පාස් කරන්න එච්චර ලොකු නිබන්ධනයක් ඇත්ත වශයෙන්ම එතනදී අවශ්‍ය කරන්නෙත් නැහැ. නමුත් මෙතනදී මට අවශ්‍ය කළා මේක ඇත්ත වශයෙන්ම මම බුද්ධි අංශයේ සාමාජිකයෙක් වශයෙන් මෙහෙම ප්‍රශ්නයක් තියෙනවාද. ඇත්ත වශයෙන්ම මම උපකල්පනය කළා එහෙම ප්‍රශ්නයක් තියෙනවා කියන එක ලංකාවේ එහෙම ප්‍රශ්නයක් තියෙනවා, නැතිවෙන්න බැහැයි කියන එක. ඒ කියන්නේ මම දැනන් හිටිය විදියට. ඒක ස්ථිර කර ගන්න තමයි ස්වාමීනි මේක මම විශේෂයෙන්ම ඒ කියන්නේ Online විතරක් නෙමෙයි. ඒ කියන්නේ පන්තියට සීමාවීමෙන් යුක්තව නැතුව ඒ පැතිවලට ගිහිල්ලා, සාකච්ඡා කරලා. ඒ මිනිස්සුත් එක්ක ඉඳලා, දවස් ගණන් ඉඳලා කථා කරලා මේක මට ඕන කළේ මෙහෙම ප්‍රශ්නයක් තියෙනවාද කියන එක තහවුරු කර ගැනීම තමයි ස්වාමීනි ඒ තරම් දීර්ඝව කළේ කියන එක තමයි හැඟීම ස්වාමීනි.

ප්‍ර : ඉන් ඔබ බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලැබී තිබෙනවා කියලා ඔබට සෑහීමකට පත් වෙන්න පුළුවන්ද නිබන්ධනය කිරීමෙන්?

පි : ඔව් ස්වාමීනි. මම හිතනවා මම නිබන්ධනය කිරීමෙන් මම හිතන්නේ ඒක ඇත්ත වශයෙන්ම මේ වර්තමානය වෙදදී ඒක ඉතාම ඔප්පු වෙලා තියෙනවා මම කියපු දේවල්. ඒ කියන්නේ මම දැකපු දේවල් ස්වාමීනි. නමුත් අවාසනාවට මේක මට Publish කර ගන්න බැරි වුණ එක තමයි ස්වාමීනි මට තියෙන එකම කණගාටුව.

ප්‍ර : මම හිතනවා එය හොඳ අදහසක් කියලා. ඔබ එය ප්‍රසිද්ධ කළ යුතුයි.

**********

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**ගරු සභාපතිතුමා :**

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් දැක් වූ දායකත්වයට සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තුතිය පළ කරනවා.

සාක්ෂිකරු මුදා හරිමි.

**කොමිෂන් සභාව නැවත ජූලි 14 වන දින**
**ප.ව. 12.30 දක්වා කල් තබනු ලබයි.**

දැන් වේලාව : ප.ව. 5.30 යි.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

**2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව**

දිනය :- 2020.07.09 වේලාව :- ප.ව. 2.05

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

**ගරු විනිසුරු මඩුල්ල :-**

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

**පෙනී සිටීම :-**

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතීඥ ශමිල් පරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**ගරු සභාපතිතුමා :**

**මේ අවස්ථාවේදී දිවා ආහාරයට පෙර සාක්ෂි ලබා දෙමින් සිටි සාක්ෂිකරුගේ සාක්ෂිය පසුව ලබා ගන්නා අතර, ඊට පෙර එක් සාක්ෂිකාරියක් සාක්ෂි වශයෙන් මෙහෙයවන බව සටහන් කර තබමි.**

| | | | |
|---|---|---|---|
| 01. | සම්පූර්ණ නම | : | ජානකී සුනේත්‍රා විජේවීර |
| 02. | වයස | : | අවුරුදු 61 යි |
| 03. | ජාතිය | : | සිංහල |
| 04. | ආගම | : | කතෝලික |
| 05. | විවාහක/අවිවාහක බව | : | විවාහකයි |
| 06. | ස්වාමියාගේ නම | : | සුරේෂ් ජෙයනායගම් |
| 07. | පදිංචි ලිපිනය | : | 66/17, ධම්මාලංකාර මාවත, හිල් වීදිය, දෙහිවල |

**(සාක්ෂිකාරිය ප්‍රතිඥාව ලබා දෙයි)**

**රජයේ අධිනීතීඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා :**

ප්‍ර : මහත්මිය විවාහක තැනැත්තියක්?

පි : ඔව්.

ප්‍ර : මහත්මියගේ ස්වාමි පුරුෂයාගේ නම කුමක්ද?

පි : සුරේෂ් ජෙයනායගම්.

ප්‍ර : මහත්මිය ස්වාමි පුරුෂයත් සමඟ විවාහයට ඇතුළත්වීමට පෙර බෞද්ධාගමික කාන්තාවක් කිව්වොත් ඒක නිවැරදිද?

පි : ඔව්.

ප්‍ර : ඉන් අනතුරුව මහත්මිය ස්ව කැමැත්තෙන්ම කතෝලික දහම අදහන බැතිමතියක් බවට පත් වෙනවා?

පි : ඔව්.

ප්‍ර : ඉන් අනතුරුව මහත්මිය කතෝලික ආගමේ තිබෙන පල්ලිවලට සම්බන්ධව යම් යම් සමාජ සුභසාධන ආදී වැඩ කටයුතු කරලා තිබෙනවද?

පි : ඔව්.

ප්‍ර : ඒ මොනවද සාමාන්‍යයෙන් මහත්මිය ඒ විදියට කටයුතු කළේ?

පි : මායිම් ගම්මානවල වැඩ කරලා තියෙනවා. එතකොට පිළිකා ඉස්පිරිතාලයට වැඩ කරලා තියෙනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සමාජ සුභසාධන කටයුතුවල නිරත වුණා කිව්වොත් පිළිගන්න පුළුවන්ද?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔය මහත්මිය කතෝලික ආගම වැළඳ ගැනීමෙන් පසුව යම්කිසි විශේෂිත පල්ලියක් මූලික කරගෙන ඔය ආගමික වැඩ කටයුතුවල නිරත වුණාද?

පි : ඔව්. දෙහිවල ශාන්ත මරියා දේවස්ථානයට.

ප්‍ර : ඔය දේවස්ථානයේ ප්‍රධාන පූජකතුමන් වශයෙන් කටයුතු කරන්නේ කවුද?

පි : දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි.

ප්‍ර : දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි කියන ගරු පියතුමන් තමයි කටයුතු කරන්නේ?

පි : ඔව්.

ප්‍ර : දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි කියන පියතුමන්ට 2019 අප්‍රේල් මාසේ වන කාලසීමාව වනවිටත් ඔය දේවස්ථානයේ ප්‍රධාන පූජකවරයා දරමින් කටයුතු කළේ?

පි : ඔව්.

ප්‍ර : දැන් මේ දේවස්ථානයේ සාමාන්‍යයෙන් දේව මෙහෙයන් පැවැත්වෙනවා නේද?

පි : ඔව්.

ප්‍ර : ඒ දේව මෙහෙයන් අතරේ යම්කිසි ප්‍රධාන දේව මෙහෙයන් තිබෙනවාද?

පි : ඒ කියන්නේ.

ප්‍ර : ඒ කියන්නේ සතියේ පැවැත්වෙන දේව මෙහෙයන් අතරින් යම්කිසි දේව මෙහෙයක් ප්‍රධානයිද? ඉරිදා දිනයේදී ප්‍රධාන දේව මෙහෙයන් පැවැත්වෙනවා නේද උදෑසන කාලයේ?

පි : හැම පූජාවම එක වගේ.

ප්‍ර : එක වගේ?

පි : ඔව්.

ප්‍ර : දැන් දේවස්ථානයේ කටයුතු කිරීමේදී මහත්මිය හඳුනා ගන්නවද යම්කිසි වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන දේව මෙහෙයන් පැවැත්වෙනවා ඔය පල්ලියේ?

පි : ඔව්. පල්ලියේ

ප්‍ර : මොනවද ඒ ප්‍රධාන දේව මෙහෙයන්?

පි : පෙබරවාරී මාසයේ, ජනවාරී අන්තිමට වගේ අපේ පල්ලියේ මංගල්‍යය තියෙනවා. පෙබරවාරී මුල සතියේ.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හරි. ඉන් අනතුරුව?

පි : ඉන් අනතුරුව පාස්කු මංගල්‍යය තියෙනවා. ඊට පස්සේ තියෙනවා නත්තල් මංගල්‍යය.

ප්‍ර : ඊට පෙර මම මහත්මියට යෝජනා කළොත් ජූලි, අගෝස්තු මාසවල දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය තිබෙනවයි කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව ප්‍රධාන වශයෙන් දේව මෙහෙයන් වාර්ෂික ප්‍රධාන දේව මෙහෙයන් හතරක් තිබෙනවා?

පි : ඔව්.

ප්‍ර : හොඳයි. සාමාන්‍යයෙන් මේ ඔය වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන දේව මෙහෙයන්ට කතෝලික බැතිමතුන් කොයි තරම් ප්‍රමාණයක් දළ වශයෙන් සහභාගී වෙනවද?

පි : ගොඩාක් සහභාගී වෙනවා.

ප්‍ර : ඉලක්කමකින් කිව්වොත් හාර පන්සියක්. ඊටත් වැඩියි?

පි : සමහරවිට ඊටත් වැඩියි.

ප්‍ර : ඊටත් වැඩිපුර?

පි : ඔව්. පන්සීයක්, හයසීයක් විතර.

ප්‍ර : පන්සීයක්, හයසීයක් විතර සහභාගී වෙනවා?

පි : ඔව්.

ප්‍ර : හොඳයි. දැන් ඔය මහත්මිය දෙහිවල ශාන්ත මරියා දේවස්ථානයේ දායක සභාවක් තිබෙනවද?

පි : ඔව් තිබෙනවා.

ප්‍ර : දායක සභාවක් තිබෙනවා?

පි : ඔව්.

ප්‍ර : යම් අවස්ථාවක මහත්මියත් එහි සාමාජිකාවක් වශයෙන් කටයුතු කරලා තිබෙනවද?

පි : ඔව්.

ප්‍ර : කටයුතු කරලා තිබෙනවා?

පි : ඔව්.

ප්‍ර : මේ දායක සභාවට අමතරව මහත්මිය යම්කිසි තනතුරු දරන වෙනත් සමාජ සුභසාධක ආයතනයක්, ඔය පල්ලි ආශ්‍රිතව පිහිටුවලා තිබෙනවද?

පි : ඔව්.

ප්‍ර : ඒ මොනවද?

පි : එකක් තමයි දෙහිවල මීසමම කොටස් දොළහකට බෙදලා තියෙනවා. පල්ලි දෙකක් තියෙනවා. ඒකේ එක කොටියාගයේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නායිකාවක් තමයි මම. මට උදව් කරන තව දෙන්නෙක් ඉන්නවා. ඒ ඇරෙන්න Human Development Justice and Peace Society කියන එකේ Secretary විදියට දැන් කටයුතු කරනවා.

ප : දැන් ඔය ඒ කියන්නේ මානව සම්පත් සංවර්ධන සමිතිය කිව්වොත් සිංහල භාෂාවෙන් නිවැරදිද?

පි : ඔව්.

ප : දැන් මම මහත්මියගේ මතකය අවදි කරන්න සූදානම් වෙන්නේ මේ 2019 වර්ෂයේ අප්‍රේල් මාසයේ පැවතිච්ච පාස්කු මංගල්‍යය සම්බන්ධයෙන්. ඔය 2019 වර්ෂයේ අප්‍රේල් මාසයේ පැවතිච්ච පාස්කු කාලයේදී දේව මෙහෙයන් කීයක් පැවැත්වුණාද ප්‍රධාන වශයෙන්? යම්කිසි දිනවල දේව මෙහෙයන් පැවැත්වුණාද සහ ඒ දින මොනවාද?

පි : බ්‍රහස්පතින්දා මෙහෙයක් තියෙනවා. අනිත් දවසටත් තියෙනවා. ඒ කියන්නේ උදේ සතියේ දින උදේ 6.00 පූජාව තියෙනවා. ඊට පස්සේ හවසට 6.30 පූජාව තියෙනවා. මහා බ්‍රහස්පතින්දා පූජාව ටිකක් කලින් එදා පූජාව තිබුණා. ඊට පස්සේ ඒ කියන්නේ ටිකක් විශේෂ පූජාවක් ඒක. ඊට පස්සේ ....,

ප : මහත්මියට ඒ දිනය මතකද?

පි : ඒ කියන්නේ.

ප : දිනය, අප්‍රේල් මාසේ මෙන්න මෙදා. 1, 2, 3, 4, 5 ආදී වශයෙන් දින සඳහන් වෙනවනේ?

පි : 19 ඉඳලා ආපස්සට ආවොත් 16, 17 වගේ මම හිතන්නේ මහා බ්‍රහස්පතින්දා. මට දින හරියටම මතක නැහැ.

ප : මම මහත්මියට යෝජනා කළොත් 2019.04.18 වෙනිදා ඉඳලා 2019.04.21 වෙනිදා වෙනකම් මේ දිව්‍ය පූජාවන් සහ ප්‍රධාන ආගමික වතාවත් පැවැත්වුණා කියලා පල්ලියේ පිළිගන්න පුළුවන්ද?

පි : ඔව්.

ප : පුළුවන්?

පි : ඔව්.

ප : මේ දවස් අතුරින් මහත්මිය මොන දවස්වලද සහභාගී වුණේ ඔය පූජාවන්වලට?

පි : මහා බ්‍රහස්පතින්දා ගියා විශේෂ දවසක් හින්දා. එතකොට සිකුරාදා ගියා මහා සිකුරාදා. උදෙත් ගියා. උදේ තිබුණා එළියේ වේල් පෙරහැර. ඒක තිබුණා. ඊට පස්සෙ හවස තිබුණා, ඒකටත් ගියා. ඊට පස්සේ සෙනසුරාදා ගියේ නැහැ රෑ පූජාවට ගියේ නැහැ. හවස ගියේ නැහැ.

FAIR COMMENT BY JEZEEM
Presidential Secretariat Copy

ප්‍ර : පාස්කු ඉරිදා දින පූජාවන්වලට සහභාගී වුණාද? මහත්මියට හැකියාවක් ලැබුණද පාස්කු ඉරිදා දින පූජාවට සහභාගී වෙන්නට?

පි : නැහැ. මම පාස්කු ඉරිදා පූජාවට ගියේ නැහැ.

ප්‍ර : පාස්කු ඉරිදා පුජාවට සහභාගී වුණේ නැහැ?

පි : ඔව්. නැහැ.

ප්‍ර : හොඳයි. දැන් ඔය 2019 අප්‍රේල් මාසේ පාස්කු ඉරිදා දිනයේදී දිවයින පුරාම යම්කිසි දේවස්ථානවල යම්කිසි සිදුවීමක් සිදු වුණා කියලා මහත්මියට දැන ගන්න ලැබුණද?

පි : ඔව්.

ප්‍ර : ඒ කුමක්ද සිද්ධ වුණේ මහත්මිය. විශේෂ සිදුවීමක් සිදු වුණා නේද පාස්කු ඉරිදා?

පි : ඔව්. ඒ කියන්නේ කටුවාපිටිය පල්ලියේ බෝම්බ පිපිරුණ සිද්ධියයි, කොච්චිකඩේ පල්ලියේ ඒ සිද්ධියයි, දෙහිවල අර ට්‍රොපිකල් ඉන් එකේ ඒ සිද්ධියයි.

ප්‍ර : ඒ ආදී වශයෙන ස්ථාන කිහිපයක කතෝලික පල්ලි කිහිපයක සහ ඊට අමතරව හෝටල් කිහිපයකත් බෝම්බ පුපුරා ගියා කිව්වොත් මහත්මියට මතකය අවදි කළොත් නිවැරදිද?

පි : ඔව්.

ප්‍ර : ඔය ආදී වශයෙන් යම් යම් ප්‍රහාර මාලාවකට දිවයිනේ කතෝලික පල්ලි ලක් වුණාට පසුව දැන් ඔය මහත්මිය මහත්මියගේ ආගමික වතාවත් ඉටු කරන දෙහිවල ශාන්ත මරියා දේවස්ථානයේ ආගමික වතාවත් නැවත ආරම්භ කළා නේද ඉන් පසුව යම් අවස්ථාවක?

පි : ඔව්.

ප්‍ර : ආරම්භ කළා?

පි : ආරම්භ කළා.

ප්‍ර : ඒ ආරම්භ කළාට පසුව ඔය පල්ලියේ ආගමික වතාවත්වලට සහභාගී වෙන බැතිමතුන්ගේ ආරක්ෂාව උදෙසා යම්කිසි පියවර ගත්තාද?

පි : ඔව්.

ප්‍ර : මොන වගේ පියවරද මහත්මිය ඒ කාලයේදී අරගත්තේ?

පි : ඒ කියන්නේ පොලීසියෙන් කියලා තිබුණා පූජාවල් නැවත පටන් ගන්න ඉස්සර වෙලා Vigilance Committee එක පටන් ගන්න කියලා.

ප්‍ර : ඒ කියන්නේ සුපරීක්ෂණ කමිටුවක් කිව්වොත් නිවැරදිද මහත්මිය? Vigilance Committee එකක්?

පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : පැහැදිලි කරන්න. මොකද්ද මේ Vigilance Committee වලින් කළේ?

පි : ඒ කියන්නේ අර අපේ කොට්ඨාශ නායිකාවයි, ඒගොල්ලන්ට මේ උදව් කරන අයටයි, වෙන වෙන සමිතිවල ඉන්න අයටයි ඇවිල්ලා කිව්වා පූජාවල් ඔක්කොම බෙදලා ඒගොල්ලන්ට ගේට්ටුව ළඟයි, මැදක් හරියෙයි, පල්ලිය ඇතුළෙයි ඉඳලා බලන්න කියලා ඉවර වෙලා. හඳුනා ගන්න කියලා එන අයව හඳුනා ගන්න කියලා.

ප්‍ර : හඳුනා ගන්න සහ ඒ ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කරන්න කියලා තමයි ඔය උපදෙස් ඔය Vigilance Committee එකේදී තීරණය කළේ?

පි : Hand bag check කරන්න.

ප්‍ර : දැන් ඔය පාස්කු ප්‍රහාරයෙන් පසුව යෙදුණු ප්‍රධානතම කතෝලික පූජෝත්සවය මොකද්ද මහත්මිය. 2019 අප්‍රේල් මාසේ පාස්කු ප්‍රහාරයෙන් පසුව, ඊට පස්සේ යෙදුණු ප්‍රධානතම පූජෝත්සවය මොකද්ද?

පි : ඊට පස්සේ තමයි ආවේ දෙසැම්බර් මාසේ Christmas Carol තිබුණා. ඒකයි, නත්තල් පූජාවයි. 31 වෙනිදා Mid night mass එකයි.

ප්‍ර : හොඳයි. ඔය දැන් ඒ දෙසැම්බර් මාසේ පැමිණීමට නියමිත ඔය නත්තල් කැරොල් සහ නත්තල් ප්‍රධාන නත්තල් දේව මෙහෙයන්ට ආරක්ෂාව සැළසිය යුතු ආකාරය සම්බන්ධයෙනුත් ඔය Vigilance Committee එකේදී අදහස් හුවමාරු කර ගැනීමක් සිද්ධ වුණාද?

පි : ඔව්.

ප්‍ර : කථා බහ කළා?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව මේ දෙසැම්බර් මාසයේ යම්කිසි දවසක 2019 දෙසැම්බර් මාසයේ නත්තලට පෙර යම්කිසි දිනයක යම් ආකාරයේ රැස්වීමක් පැවැත්වුණාද?

පි : ඔව්. දෙසැම්බර් 18 වෙනිදා මට මතක මගේ දින පොතේ තියෙන විදියට මතක විදියට.

ප්‍ර : දෙසැම්බර් මාසේ?

පි : 18 වෙනිදා.

ප්‍ර : එතකොට ඔය රැස්වීමට මහත්මියට මතක ආකාරයට කවුද සහභාගී වුණේ?

පි : පල්ලියේ අපේ ෆාදර් දයායි, Assistant ෆාදර් රජිතුයි, එතකොට ආවා පොලීසියෙන් මහත්වරු තුන් දෙනෙකුයි, තව එක්කෙනෙක් ආවා මම හිතන්නේ එයත් පොලීසියේ මහත්මයෙක් තමයි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මොකද අපේ ගෙදර අර CCTV ඒගොල්ලන් ආවා Footage එකක් ගන්න මාල කඩන් ගිය කෙනෙක්ගේ. එතකොට එයත් ආවා. හැබැයි අර සිවිල්වලින් ආවේ.

ප්‍ර : තව කවුද මහත්මිය පැමිණියේ?

පි : ඒ ඇරෙන්න ඇන්ග්ලිකන් Church එකේ ෆාදර්ත් ආවා. තව පල්ලියක ෆාස්ටර් කෙනෙක් ආවා. අපි තව පල්ලියෙන් සහභාගී වුණා හය දෙනෙක් විතර. මොකද එදා මීටිම තිබ්බේ 4.00 ට විතර. ඉතිං ඒක හින්දා එදා වැඩ කරන අය Office යන හින්දා එන්න ටිකක් අඩු වුණා. නැත්නම් වෙනදට ගොඩක් අය එනවා. ඒ තිබුණ වෙලාව අනුව ඒගොල්ලන්ට එන්න බැරි වුණා ඒ මීටිමට අනිත් අයට.

ප්‍ර : අනිත් අය කියලා කිව්වේ ඔය?

පි : ඒ කමිටුවේ ඉන්න අනිත් අයට.

ප්‍ර : ආ කමිටුවේ ඉන්න සාමාජිකයන්ට?

පි : ඔව්.

ප්‍ර : එතකොට මහත්මිය මම කිව්වොත් මහත්මියට අර සුපරීක්ෂක කමිටුවේ සාමාජිකයන් කිහිප දෙනෙකුත්, ඊට අමතරව පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකුත්, ඊට අමතරව ප්‍රධාන පූජකවරයා දරන දයා වැලිකඩආරච්චි ගරු පියතුමනුත්, සහායක පියතුමනුත්, තවත් පල්ලි දෙකක පූජක නිලයන් දරන ගරු පියතුමන්ලා දෙනමකුත් ඔය කියන රැස්වීමට පැමිණුනයි කියලා 2019.12.18 වෙනිදා තිබ්බිව රැස්වීමට.

පි : ඔව්.

ප්‍ර : එතකොට මහත්මියට මතකද ඔය රැස්වීමට එවකට ගල්කිස්ස කොට්ඨාශය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මුදිත පුස්සැල්ල මහතා සහභාගී වුණාද කියලා මහත්මියට මතකයක් තිබෙනවද?

පි : ඔව්.

ප්‍ර : ඊට අමතරව ගල්කිස්ස කොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරීවරයා වශයෙන් කටයුතු කළ සමන්ත වෙදගේ මහත්මයා පැමිණියා කියලා මතකයක් තිබෙනවද?

පි : ඔව්.

ප්‍ර : ASP මහත්මයා

පි : ඔව් ASP.

ප්‍ර : ආවා?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව කීයට විතරද මේ රැස්වීම පැවැත්වුණේ?

පි : මම හිතන්නේ 4.00 න් පස්සේ තමයි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : සවස් වරුවේ?

පි : ඔව් හවස

ප : දැන් මොනවද මේ රැස්වීමේදී එදා සාකච්ඡා කළේ ඔය පිරිස එකතු වෙලා?

පි : මම හිතන්නේ මුදිත පුස්සැල්ල මහත්මයා ටිකක් පරක්කු වෙලා ආවේ. ඊට පස්සේ Air Force Officer කෙනෙක් ආවා. එයා ඇවිල්ලා අපේ අර කරපු වැඩවල අඩුපාඩු කියෙව්වා. කියලා ඉවර වෙලා ඊට පස්සේ තමයි මේ කිව්වා මේ ඊට පස්සේ මුදිත පුස්සැල්ල ඒ මහත්මයත් ආවා. ඊට පස්සේ මට මතක විදියට කථා වුණා දැන් නත්තල් එක කොහොමද ඒක අපි සංවිධානය කරන්න ඕන කියලා. කියලා ඊට පස්සේ ඒ මහත්මයා කිව්වා එන අයට කියන්න කියලා Hand Bag ගේන්න එපා කියලා ඉවර වෙලා.

ප : Hand Bag ගේන්න එපා කියලා?

පි : ඔව්.

ප : ඔය ආදී වශයෙන් ආරක්ෂාව සම්බන්ධයෙන් වන කරුණු තමයි කථා කළේ?

පි : Identity Card එක විතරක් ගේන්න කියලා.

ප : දැන් ඔය රැස්වීම අවසානයේදී යම්කිසි මොනවා හරි තවදුරටත් දැනගත යුතු කරුණු තිබේද කියලා පොලීසිය පැමිණ සිටින අයගෙන් විමසීමක් කළාද?

පි : ප්‍රශ්න තියෙනවා නම් අහන්න කියලා කිව්වා.

ප : ඒ අවස්ථාවේදී මහත්මිය මොනවා හරි ප්‍රශ්නයක් ඇහුවද?

පි : ඔව්. කවුරුත් ඇහුවේ නැහැ. ඊට පස්සේ මම ඇහුවා ආරක්ෂක අංශවලින් කියනවා දැන් කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔක්කොම අත් අඩංගුවට අරගෙන ඉවරයි. දැන් ප්‍රශ්නයක් නැහැ කියලා. ඉතිං ජනාධිපතිතුමත් කියනවා T.V. එකේ එහෙම. ඉතිං මම ඇහුවා එහෙම කියද්දී ඇයි ඔබතුමා කියන්නේ Hand Bag ගේන්න එපා කියලා. ඒ කියන්නේ එහෙම එපා කියලා කියන්නේ මම ඇහුවා මොනවා හරි දෙයක්, මොනවා හරි ප්‍රශ්නයක් වෙන්න යනවද. ඒකට මේ පෙර සූදානමක්ද අපිව ලැහැස්ති කරන්නේ එහෙම කියලා. ඒ කියන්නේ Hand Bag ගේන්න එපා කියපු ගමන් මිනිස්සු එන්නේ නැහැ. දැන් අපි හිතනවා ඔක්කොම ඉවරයි කියලනේ.

ප : පැහැදිලියි මහත්මිය. ඒ අනුව ඔය ප්‍රශ්න ටික තමයි මහත්මිය පොලිස් නිලධාරීන්ගෙන් අහපු ඒ කියන්නේ නිරාකරණය කර ගත්තේ ඔය ආකාරයට?

පි : ඔව්.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අනුව මහත්මියට නිසැක වශයෙන්ම කියන්න පුළුවන් ඔය ආරක්ෂාව සම්බන්ධයෙන් යම්කිසි රැස්වීමක් දෙහිවල ශාන්ත මරියා දේවස්ථානයේ පැවැත්වුණා නම් ඒ පැවැත්වුණේ පාස්කු ප්‍රහාරයෙන් පසුව දවසක් වෙච්ච 2019 දෙසැම්බර් මාසේ 18 වෙනිදයි කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් මහත්මිය නිසැක වශයෙන්ම ප්‍රකාශ කරන්න යම්කිසි හේතුවක් තියෙනවද? මොනවා හරි මහත්මිය ලිඛිත සාක්ෂියක් ඒ වෙනුවෙන් තබා ගත්තද?

පි : ඔව්. මම මගේ Diary එකේ ලියලා තියෙනවා.

ප්‍ර : දැන් ඔය පාස්කු ප්‍රහාරයට පෙර ඔය වගේ Vigilance Committee එකක් හදලා තිබුණාද පාස්කු ප්‍රහාරයට කලින්?

පි : නැහැ.

ප්‍ර : ඔය ආකාරයෙන් ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ රැස්වීමක් තිබුණද එය පාස්කු ප්‍රහාරයට පෙර?

පි : නැහැ.

ප්‍ර : තිබුණේ නැහැ?

පි : නැහැ.

ප්‍ර : ඒක මහත්මියට නිසැක වශයෙන්ම කියන්න පුළුවන්?

පි : ඔව්.

ප්‍ර : ඒ වගේම දැන් මේ කොමිෂන් සභාව හමුවේ දැනටමත් සාක්ෂි ලබා දීලා තිබෙන ගල්කිස්ස එවකට ගල්කිස්ස කොට්ඨාශය භාරව කටයුතු කළ එවකට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සහ වර්තමානයේ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් වන මුදිත පුස්සැල්ල කියන මහත්මයා කොමිෂන් සභාව ඉදිරියේ දිවුරුම් පිට සාක්ෂියක් ලබා දීලා ප්‍රකාශ කරලා තියෙනවා නම් 2019.04.17 වන දින හෝ ඊට ආසන්න දිනයක දෙහිවල ශාන්ත මේරි දේවස්ථානයේ සාකච්ඡාවක් පැවැත් වූ බවත්, ඊට දායක සභාව සහභාගී වූ බවත්, රැස්වීමේ සිටි කාන්තාවක් ත්‍රස්ත ප්‍රහාරයක් ඇති වීමට ඉඩ ඇති බව සම්බන්ධයෙන් විමසීමක් කළ බවත්, කෙසේ වුවද ආරක්ෂාව සඳහා පොලිස් මුරපොළක් යොදන බව දන්වා සිටි බවත් ප්‍රකාශ කර තිබෙනවා නම් 2019.04.17 දිනට අවධානය යොමු කරමින් ඒ ගැන මහත්මියට කියන්නට තියෙන්නේ මොකද්ද?

පි : පොලිස් මුරපොළක් තිබ්බේ නැහැ පල්ලියේ. මීටිමකුත් තිබුණෙ නැහැ.

ප්‍ර : පොලිස් මුරපොළක් තිබුණෙත් නැහැ. මීටිමක් තිබුණෙත් නැහැ. ඒක තමයි මහත්මිය කියන්නේ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්. එකම දෙයක් තියෙන්නේ පොලීසිය සාමාන්‍යයෙන් මොනවා හරි පල්ලියේ තියෙනවා නම් පොලීසිය ගේට්ටුවෙන් එළියේ තමයි ඒගොල්ලන් ඉන්නේ. පල්ලිය ඇතුළට එන්නේ නැහැ. ඉතිං ඊට පස්සේ මහා බ්‍රහස්පතින්දා දවස වෙන්න ඇති මහා සිකුරාදා දවසේ හරි පොලීසිය ඒගොල්ලන් ඇතුළේ ඉන්නකොට මම එක්කෙනෙක්ගෙන් ඇහුවා එක රාළහාමි කෙනෙක්ගෙන් ඇයි පුතාලා ඇතුළේ කියලා. ඊට පස්සේ ඒගොල්ලන් කිව්වා මිස් පිට පිට කැට කැඩුවනේ. ඉතිං අපිව Security දාලා කියලා.

ප්‍ර : දැන් මහත්මිය ඔය කැට කියලා වචනයක් පාවිච්චි කළා. මොකද්ද ඔය කැට කියන එකෙන් මහත්මිය අදහස් කළේ?

පි : කැට කියන්නේ පල්ලිය ඇතුළේ මිනිස්සු පිං කැට.

ප්‍ර : පිං කැට?

පි : ඔව්. ඒවා මම හිතන්නේ Office එකේ වෙනම එකක් තියෙනවා. ඒකත් පිට පිටම කඩලා තිබුණා.

ප්‍ර : ඒ පොලිස් නිලධාරීන් ප්‍රකාශ කළේ ඒ හේතුව නිසා තමයි මේ පල්ලිය ඇතුළේ නිලධාරීන් රඳවලා ඉන්නේ කියලා?

පි : ඔව්.

**********

**ගරු සභාපතිතුමා :**

සාක්ෂිකාරියගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් ගිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතීඥවරයාගෙන් අසමි. අවශ්‍ය බව ප්‍රකාශ කර සිටියි. අවසර ලබා දෙයි.

**********

**ජනාධිපති නීතීඥ ශම්ල් පෙරේරා මහතා :**

ප්‍ර : සාක්ෂිකාරිය දැන් ඔබතුමිය මේ Vigilance Committee ඒ කියන්නේ සුපරික්ෂාකාරී කමිටුවේ සාමාජිකයෙක් කියලා කිව්වා?

පි : ඔව්.

ප්‍ර : දැන් මේ අන්දමට මේ සුපරීක්ෂාකාර කමිටුව ප්‍රථම වරට ස්ථාපනය කෙරුවේ කවදා විතරද?

පි : මම හිතන්නේ අප්‍රේල් අන්තිමට නැත්නම් මැයි මුල වගේ.

ප්‍ර : ඒ කියන්නේ බෝම්බ ප්‍රහාරයට පසුව කිව්වොත් හරිද?

පි : ඔව්. බෝම්බ ප්‍රහාරයට පසුව. පූජාවන් නැවත පටන් ගන්න ඉස්සර වෙලා.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් යම් හේතුවක් තිබුණද මේ අන්දමට මේ කමිටුවක් ස්ථාපනය කරන්න?

පි : ඔව්. මොකද පොලීසියෙන් කියලා තිබුණා පල්ලියේ ආරක්ෂාව දෙන්න ආරක්ෂක අංශවලට විතරක් තනියෙම කරන්න බැහැ කියලා. පල්ලියෙන් Vigilance Committee එකක් හදන්න කියලා එන අයව හඳුනා ගන්න. මොකද පොලීසියේ අයට දන්නේ නැහැනේ ඒගොල්ලන්ව. සැක කටයුතු අය ආවොත් දන්නේ නැහැනේ. පල්ලියේ ඉන්න අර ඔක්කොම නායකයන්ව බෙදලා පූජාවල් කොටස්වලට ඒවා තමයි ලැහැස්ති කළේ.

ප්‍ර : ඒ කියන්නේ එතකොට මේ සුපරික්ෂාකාරී කමිටුවේ සාමාජිකයන් සාමාන්‍යයෙන් ශාන්ත මේරි දේවස්ථානයට පැමිණෙන බැතිමතුන් දන්න හඳුනන කට්ටියක් කිව්වොත් හරිද?

පි : ඔව්. මොකද අර කොට්ඨාශවල අය තමයි බොහෝ දුරට පල්ලියට එන්නේ. එළියෙන් අයත් එනවා. ඒ වුණාට අර පල්ලියට තමන්ගේ කොට්ඨාශවල ඉන්න අය දන්නවනේ එන අය පල්ලියට. ඒගොල්ලන් හඳුනනවා.

ප්‍ර : දැන් ඔබතුමිය මේ සුපරික්ෂාකාර කමිටුවට හැර වෙනයම් පල්ලියේ වෙනයම් කමිටුවක සාමාජිකයෙක් වෙලා සිටියද පාස්කු ප්‍රහාරයට පෙර?

පි : ඔව්. දායක සභාවේ එකයි, මේ කොට්ඨාශ නායකයන්ගේ එකෙයි, මානව සම්පත් එකෙත් හිටියා. ඉන්නවා.

ප්‍ර : ඒ කමිටුවල රැස්වීම් තිබුණද පාස්කු ප්‍රහාරයට පෙර?

පි : ඔව්. ඒ කියන්නේ හැම මාසෙම අපි තියෙනවා ඉස්කෝලවල ඉගෙන ගන්න O/Level කරන ළමයින්ටයි, A/Level කරන ළමයින්ටයි අපි සල්ලි දෙනවා Scholarshipවලට. ඉතිං හැම මාසෙම අපි එකතු වෙලා මීටිමක් තියෙනවා අනිවාර්යයෙන්ම. මොකද ඒගොල්ලන්ට සල්ලි දාන්න ඕන හින්දත්.

ප්‍ර : එතකොට ඒ රැස්වීම්වලට සහභාගී වෙන්නේ ඒ කමිටුවේ කට්ටිය විතරක් කිව්වොත් හරිද?

පි : ඔව්. ඒ අය විතරයි සහභාගී වෙන්නේ.

ප්‍ර : පොලීසියේ අය සහභාගී වෙනවද?

පි : නැහැ නැහැ.

**********

FAIR COMMENT BY JEZEEM

**ගරු සභාපතිතුමා :**

කොමිෂන් සභාවට පැමිණ සාක්ෂි ලබා දීමෙන් දැක් වූ සහයෝගයට සාක්ෂිකාරියට කොමිෂන් සභාවේ ස්තුතිය පළ කරනවා.

සාක්ෂිකාරිය මුදා හරිනවා.

දැන් වේලාව : ප.ව. 2.35 යි.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

# 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.07.14 වේලාව: ප.ව. 01.35

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා ( පැමිණ නැත) -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

**පෙනී සිටීම:-**

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ කෞෂි සෙල්වනායගම් මහතා පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

| | | |
|---|---|---|
| **සාක්ෂි අංකය** | : | 464 |
| **නම** | : | **දසනායක මුදලිගේ දොන් ජෝසප් ටුෂන් ප්‍රියලාල්.** |
| **වයස** | : | අවු 61 |
| **ජාතිය** | : | **සිංහල** |
| **ආගම** | : | **රෝමානු කතෝලික.** |
| **දැනට දරණ තනතුර** | : | **විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති.** |
| **ලිපනය** | : | **අංක 73/A ක්ලෙමට් පෙදෙස ශාන්ත ජූඩ් පාර එඩේරමුල්ල වත්තල.** |

**ප්‍රතිඥා දී කැඳවයි.**

**<u>සාක්ෂිකරුගේ ප්‍රකාශය.</u>**

ස්වාමීනි මගේ සාක්ෂිය දීමට ප්‍රථම මට මෙම සභාවට එන්න කියලා 08 වැනිදා තමයි කඩවත පොලීසිය මාර්ගයෙන් දැනුම් දුන්නේ. ඒ අනුව පහුවදා ඒ අනුව මම 09 වැනිදා දැනුම් දුන්නා මම සේවය කරපු ස්ථානයට විශේෂ ආරක්ෂක දිසාව භාර නියෝජ්‍යය පොලිස්පතිටත් එහි අධ්‍යක්ෂකටත් අදාළ ගොනුව සහ සහතික කර උද්ධෘත ඉදිරිපත් කරන්න කියලා. පසුව ඔහු මට ලිඛිතව එවලා තියෙනවා ඒක එහෙම ඉදිරිපත් කරන්න බැහැ සභාවෙන් ලිඛිතව නොතීසි කරොත් ඇවිල්ලා ගොනුව ඉදිරිපත් කරන්න පුළුවන් කියලා. නමුත් මං ළඟ මම විශ්‍රාම යෑමට පෙර සහතික කරපුවා මං ළඟ තිබිච්ච පිටපත් මම අරගෙන ආවා ඒ අනුව මට සාක්ෂිය දෙන්න පුළුවන්. ඒ මං පළමුවෙන්ම සභාවට දැනුම් දෙමි.

**<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය.</u>**

ප්‍ර: මහත්මයා දැන් ඔබ ගරු කොමිෂන් සභාවට සඳහන් කළා ඔබ විශ්‍රාමික නියෝජ්‍යය පොලිස්පතිවරයෙකු බව?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ ශ්‍රී ලංකා පොලීසියේ සේවයට බැඳුණේ කවදද?

උ: මම 1980 ජනවාරී 28 වැනිදා ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙක් ලෙස පොලිස් සේවයට බැඳුණා.

ප්‍ර: ඔබ විශ්‍රාම ගත්තේ කවදද?

උ: මම 2019 සැප්තැම්බර් මාසයේ 21 වැනිදා විශ්‍රාම ගත්තා.

ප්‍ර: ඔබ විශ්‍රාම ලබාගන්නා විට නියෝජ්‍ය පොලිස්පති තනතුරේ සේවය කරමින් සිටි බව කිව්වොත් නිවැරදි ද ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ සේවය කරනු ලැබූ ශ්‍රී ලංකා පොලීසිය තුළ සේවය කරන ලැබූ කාලය තුළ ඔබ ලබාගෙන තිබෙන උසස් වීම් මොනව ද?

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

උ: පළමුව ස්වාමීනි මම ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙක් විදියට බැඳුණේ පොලිසියට. ඉන්පසු මම පොලිස් පරීක්ෂක තනතුරටත් ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරටත් උසස් වීම් ලැබුවා. ඒ කාලේ දී මම දිවයිනේ ස්ථානාධිපති තනතුරු සහ මූලස්ථාන පොලිස් පරීක්ෂක තනතුරු හොබවනු ලැබුවා. ඉන්පසුව මම මූලස්ථාන පොලිස් පරීක්ෂක පෑලියගොඩ ලෙස සේවය කරමින් සිටිය දී සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස්වීම් ලැබුවා. ඒ අනුව මම දිස්ත්‍රික් භාර නිලධාරී ලෙස දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි සේවය කරනු ලැබුවා. ඉන්පසුව මා පොලිස් අධිකාරී තනතුරටත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරටත් උසස් වීම් ලැබුවා. ඒ අනුව මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා ලෙස සේවය කරනු ලැබුවා. මීගමුව කොට්ඨාශ භාර නිලධාරී ලෙස සේවය කරමින් සිටියදී නියෝජ්‍යය පොලිස්පති තනතුරට මට උසස් වීම් ලැබුවා. 2017 /08/11 වැනිදා. ඉන්පසු වසරක් පෙරදාතම කරනු ලැබුවා.

ප්‍ර: දැන් මහත්මයා විශ්‍රාම ලබාගන්නට පෙර සේවය කරමින් සිටියේ කුමන දිසාවක් භාරව ද?

උ: අන්තිමට මම සේවය කරමින් සිටියේ විශේෂ ආරක්ෂක දිසාව භාරව.

ප්‍ර: විශේෂ ආරක්ෂක දිසාව භාර නියෝජ්‍යය පොලිස්පති වශයෙන් ඔබ පත්වුණේ කවදද?

උ: මම විශේෂ ආරක්ෂක දිසාව භාර නියෝජ්‍යය පොලිස්පති හැටියට 2018 ජනවාරි මස 18 වැනිදා පත්වීම ලැබුවා.

ප්‍ර: දැන් මහත්මයට පුළුවන් ද ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න විශේෂ ආරක්ෂක දිසාව යන්න මොකද්ද ඒකෙන් කෙරෙන කාර්ය භාර්ය?

උ: ස්වාමීනි විශේෂ ආරක්ෂක දිසාව කියලා හඳුන්වන්නේ කොට්ඨාශ 05 ක් අධ්‍යක්ෂකවරු 05 දෙනෙක් මාගේ යටතේ සේවය කරනු ලබනවා. මා අධීක්ෂණය කරනු ලබනවා.

ප්‍ර: කවුද ඒ කොට්ඨාශ භාර නිලධාරී 05 දෙනා. මොන කොට්ඨාශය ද ඔබ යටතේ තිබුණේ?

උ: අධ්‍යක්ෂක ඇමති ආරක්ෂක කොට්ඨාශය. එතකොට හිටියේ කිත්සිරි අපොන්සු කියලා පොලිස් අධිකාරීවරයෙක්. ඔහු සහ ඔහුගේ කාර්ය මණ්ඩලය මම මගේ කාර්යාලයේම පිහිටි ස්ථානයේම එය පිහිටලා තිබුණා ස්වාමීනි. ඊළඟට අධ්‍යක්ෂක අධිකරණ ආරක්ෂක කොට්ඨාශය. එය අධ්‍යක්ෂක අධිකරණ ආරක්ෂක කොට්ඨාශයේ අධ්‍යක්ෂක විසින් තනාපති ආරක්ෂක කොට්ඨාශයේ ඒ කාලයේ වැඩ ආවරණ කරනු ලැබුවා. ඒ සුමිත් නිස්සංක නැමැති පොලිස් අධිකාරීවරයා. තවත් කොට්ඨාශයක් තිබුණා අධ්‍යක්ෂක විශ්‍රාමික කොට්ඨාශ අංක හතර එනම්

Fair Comment by Jezeem

චන්දිකා බණ්ඩාරනායක මැතිණියගේ කොට්ඨාශය එහි අධ්‍යක්ෂකවරයෙක් හිටියා. එය වෙනම පිහිටා තිබුණේ. ඊළඟට අධ්‍යක්ෂක විශ්‍රාමික අංක 05 කොට්ඨාශයේ එනම් මහින්ද රාජපක්ෂ මහතාගේ කොට්ඨාශය. එයත් වෙනම පිහිටා තිබුණා. ඒ අනුව මා විසින් කොට්ඨාශ 05 ක් පමණක් අධීක්ෂණය කරනු ලැබුවා.

ප්‍ර: මහත්මයා පැහැදිලි කර ගැනීමට නැවතත් ඔබ යටතේ තිබුණු කොට්ඨාශ 05 ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න?

උ: ඇමති ආරක්ෂක කොට්ඨාශය, අධිකරණ ආරක්ෂක කොට්ඨාශය , ත්‍රිනාපති ආරක්ෂක කොට්ඨාශය , විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය හතර, විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය පහ , යනුවෙන් කොට්ඨාශ 05 යි.

ප්‍ර: ඔබ යටතේ ද තිබෙන්නේ ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය සහ අග්‍රාමත්‍යය ආරක්ෂක කොට්ඨාශය ?

උ: නැත ස්වාමීනි. එහි වෙනම නියෝජ්‍යය පොලිස්පතිවරු දෙන්නෙක් ඉන්නවා. එය වෙනම පාලනය වුණේ. මට අයත් වෙන්නේ නැහැ.

ප්‍ර: ඔබ විශේෂ ආරක්ෂක දිසාවේ නියෝජ්‍යය පොලිස්පති වශයෙන් ඔබ කටයුතු කිරීමේ දී ඔබගේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් සිටියේ කවුද?

උ: මගේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් කෙළින්ම පොලිස්පතිතුමා ඉස්සර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍යය පොලිස්පතිවරයෙක් හිටියා. ඊට පස්සේ එතුමා ස්ථානාමාරු ගියාට පස්සේ කෙළින්ම පොලිස්පතිතුමාට තමයි මාව අධීක්ෂණය කෙරුවේ.

ප්‍ර: 2019 අප්‍රේල් මස වන විට ඔබව අධීක්ෂණය කරනු ලැබුවේ කවුද?

උ: පොලිස්පතිතුමා.

ප්‍ර: එවක සිටි පොලිස්පතිතුමාගේ නම මොකද්ද?

උ: පූජිත් ජයසුන්දර මැතිතුමා.

ප්‍ර: දැන් මහත්මයා විශේෂ ආරක්ෂක දිසාව භාරව කටයුතු කිරීමේ දී ඔබට එල්ල විය හැකි යම් ප්‍රහාරයක් සම්බන්ධයනේ තොරතුරු ලැබුණ ද , 2019 අප්‍රේල් මාසයේ දී?

උ: ලැබුණා ස්වාමීනි.

ප්‍ර: එය මුලින්ම ඔබට ලැබුණේ කවදාද?

උ: 2019 අප්‍රේල් මාසයේ 10 වැනිදා හැන්දෑවේ 2.30 පමණ මට පොලිස්පතිතුමා විසින් අත්සන් කරන ලද එම තොරතුර අඩංගු ලිපිය ලැබුණා.

ප්‍ර: ඒ ලිපිය කොහොමද ලැබුණේ, මොන ආකාරයෙන් ද ලැබුණේ?

උ: එය රහසිගතයි කියලා ලිවුම් කවරයක බහා මං හිතන්නේ යතුරු පැදියකින් ගෙනැල්ලා මගේ පෞද්ගලික සහකාරට ගෙනැල්ලා භාරදීලා තිබුණා. මගේ පෞද්ගලික සහකාර මා වෙතට කාර්යාලයට ගෙනැත් ඉදිරිපත් කෙරුවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ ඒ ලිපි ඔබට ඒ ලිපි පුද්ගලික සහකාර ඔබගේ පුද්ගලික සහකාර විසින් ලබාදුන්නයි අනතුරුව ඔබ ඒ සම්බන්ධයෙන් මොකද්ද කර ගත්ත ක්‍රියාමර්ගය?

උ: මම එම ලිපිය විවෘත කරලා බැලුවා. එහි තිබුණේ මෙහෙම ප්‍රහාරයක් එල්ල වන විදියට එහි අත්සන් කරලා තිබුණා එවකට පොලිස්පතිතුමා විසින් එය සඳහන් කරලා තිබුණා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත සහ රථ වාහන වෙත එමෙන්ම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ හා විශේෂ කාර්ය බලකාය වෙත ඒ වගේම නියෝජ්‍ය පොලිස්පති SPR වෙත SPR කියන්නේ මම විශේෂ ආරක්ෂව දිසා වෙත . ඊළඟට අධක්ෂක ත්‍රස්වාදී කොට්ඨාශය වෙත. ඒක සඳහන් කරලා ඉංග්‍රීසියෙන් FNR කියලා සඳහන් කරලා පූජිත් ජයසුන්දර ඉංග්‍රීසියෙන් අත්සන් කරලා තිබුණා. ඉංග්‍රීසි මුද්‍රාව සහිතව.

ප්‍ර: දැන් මහත්මයා ඔය කියවන්ට යෙදුණේ ඔබට ලැබුණු ලිපියේ තිබු යම් සටහනක් කිව්වොත් නිවැරදිද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ලිපිය සකස් කරලා තිබුණේ කවුරුන් විසින් ද ?

උ: එම ලිපය සකස් කරලා තිබුණේ එවකට හිටි බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහත්මයා.

ප්‍ර: සිසර මෙන්ඩිස් මහතා විසින් කා හට යොමු කරන ලද ලිපියක් ද මේ සටහනක් සමඟ ලැබිලා තිබෙනුනේ ?

උ: පූජිත ජයසුන්දර පොලිස්පතිතුමා වෙත යොමු කරන ලද ලිපියක්.

ප්‍ර: දැන් ඒ ලිපිය ඔබට නැවත දුටුවොත් හඳුනගන්න පුළුවන්ද?

උ: පුළුවන් ස්වාමිනි.

**මේ අවස්ථාවේදී සාක්ෂිකරුට C4 A ලේඛනය පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා ස්වාමිනි.**

උ: මේ ලිපිය තමයි ස්වාමීනි මා ළඟ තියෙන්නෙත් ඒකමයි.

ප්‍ර: දැන් මහත්මයාට C 4 A ලේඛනය පමණයිද ඔය ලිපි කට්ටලයේ ලැබුණේ?

උ: නැහැ ස්වාමිනි ඒ සමඟ සිංහලයෙන් සඳහන් කරලා තිබුණා එක එක ත්‍රස්වාදියාගේ විස්තර ඇතුළත් කරලා තිබුණා. පළමුවෙන්ම කිවු ලිපිය සඳහන් වෙලා තිබුණා ප්‍රහාරයක් සිදු විය හැකි ආකාර හතරක්. ඉංග්‍රීසියෙන් සඳහන් වෙලා තිබුණේ. ඊළඟට පුද්ගලයින් හය දෙනෙකුගේ නම් සඳහන් වෙලා තිබුණා. ඒ පුද්ගලයින් හය දෙනා පිළිබඳව විස්තරත් මෙහි ඇතුළත් කරලා එවලා තිබුණා සිංහලයෙන්

ප්‍ර: ඔබට සිංහලයෙන් ඇතුළත් කරනු ලැබූ ලේඛනයක් පමණයි ද ලැබුණේ?

උ: පළමු ලිපිය ඉංග්‍රීසියෙන් තිබුණේ දෙවනි ලිපය සහ ඒකට යා කරලම තිබිච්ච කොටස සිංහලයෙන් තව අවසාන වශයෙනුත් කොටසකුත් තිබුණා ඉංග්‍රීසියෙන් සඳහන් කරලා .

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ දැන් හදුනාගන්නට යෙදුණු C 4A ලේඛනයට ඇමණුම් වශයෙන් පැමිණි ලේඛන දෙක නැවත දුටුවොත් හදුනාගන්න පුළුවන්ද?

උ: පුළුවන් ස්වාමිනි.

**මේ අවස්ථාවේදී C4B සහ C 4 C වශයෙන් ලකුණු කිඛෙන ලේඛන සාක්ෂිකරු වෙත පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා.**

ප්‍ර: C4B ලේඛනය බලලා කියන්න මහත්මයා ඔබට එය සඳහන් කල ආකරයට ලිපි කට්ටලයේ තිබුණාද කියලා?

උ: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: C4C ලේඛනය තිබුණාද?

උ: තිබුණා ස්වාමිනි.

ප්‍ර: ඒ අනුව ඔබ සඳහන් කරන්නේ C4A ,C4B, C4C, ඔබ වෙත 2019.04 වන මස 10 වන දින ඔබගේ කාර්යාලයට ලැබුණා?

උ: ලැබුණා ස්වාමිනි.

ප්‍ර: දැන් මහත්මයා සඳහන් කරා C4A ලේඛනය ඔබට ලැබුණු C4A ලේඛනයේ එවක පොලිස්පති පූජිත් ජයසුන්ද මහතා විසින් යම් සටහනක් යොදා තිබුණයි කියලා?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර ඒ සටහනේ ඔබ සඳහන් කරා ඔබගේ තනතුර එසේත් නැත්නම් SPR වශයෙන් ඔබටත් එය ආමන්ත්‍රණය කර තිබුණායි කියලා ඒ සටහන මගින්?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ සටහනේ පොලිස්පතිවරයා දක්වා තිබුණේ මොකක්ද යම් උපදෙසක් ලබා දීලා තියෙනවද?

උ: FNR කියලා ඉංග්‍රිසියෙන් අකුරු තුන ලියලා තිබුණා ස්වාමිනි.

ප්‍ර: නැවත හොදින් පරික්ෂා කර බලලා කියන්න මහත්මයා මොකක්ද?

උ: FNA for necessary action'

ප්‍ර: FNA කියන අකුරු තුන තමයි ඒ සටහනේ යොදලා තිබුණේ ?

උ: එහෙමයි.

ප්‍ර: දැන් ඔබට මෙම ලිපි කට්ටලය ලැබුණයින් පසුව ඔබ එය අධ්‍යනය කලාද?

උ: එහෙමයි ස්වාමිනි මම එම අවස්ථාවේදීම කියවලා බැලුවා කීපවරක් ඉන්පසු මම එම අවස්ථාවේම මගේ අධ්‍යක්ෂකවරුන්ට දුරකථනයෙන් කථා කරළා අධ්‍යක්ෂවරුන් 4 දෙනාට පස්දෙනෙක් හිටියාට 4 දෙනාට කථා කරලා ඉවරවෙලා කිව්වා මෙහෙම විශේෂ තර්ජනයක් පිළිබඳව ලිපියක් ලැබිලා තියෙනවා. මේ පිළිබඳව මම ඔබ වෙත ලිඛිතව එවනවා. ඔබගේ යටත් නිලධාරින්ට අදම දැනුම් දෙන්න කියලා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ සඳහන් කරානේ C4A ,C4B C4C කියන ලේඛන ලිපි කට්ටලයට ඔබ විසින් අධ්‍යනය කරයි කියලා.

උ: එහෙමයි ස්වාමිනි

ප්‍ර: ඔබ එය අධ්‍යනය කලයින් පසුව ඔබට ඒ සම්බන්ධයෙන් මොනවද ඔබට තේරුම් ගියේ ඒ ලේඛනයේ තිබුණු අන්තර්ගතය සම්බන්ධයෙන්?

උ: ඉදිරි දිනක දී ත්‍රස්වාදී ප්‍රහාරයක් එල්ල කල හැකි බව

ප්‍ර: එහි ස්ථාන අතුරින් ඔබගේ සෘජු අධීක්ෂණය යටතේ තිබෙන යම් ස්ථානයක් එහි දක්වා තිබෙනවාද ඔය ලිපි කට්ටලයේ?

උ: මගේ සෘජු අධීක්ෂණය යටතේ ස්ථානයක් සඳහන් කරලා නෑ Important Churches කියලා සඳහන් වෙලා තිබුණේ. වැදගත් දෙවස්ථාන කියන එක

ප්‍ර: වැදගත් දේවස්ථාන පමණයිද ඒ තොතුරුරේ සඳහන් වෙන්නේ?

උ: සහ ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය පිළිබඳව

ප්‍ර: දැන් ඔබ සඳහන් කරානේ විශේෂ ආරක්ෂාක දිසාව යටතේ තමයි තිබෙන්නේ තනාපති ආරක්ෂක අංශය කියලා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයට ආරක්ෂාව සපයන අංශය ඔබගේ සෘජු අධික්ෂණය යටතේ තමයි තිබෙන්නේ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ ඒ වගේම දැන් ගරු කොමිෂන් සභාවට පිළිතුරක් ලබා දුන්නා ඔබ යටතේ සිටි සියලු අධ්‍යක්ෂකවරුන්ට දුරකථනයෙන් අමතා ඔබ යම් ලිපියක් එවන බවට සඳහන් කරා කියලා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ එවැනි ලිපියක් යැව්වද ඔබේ යටතේ ඉන්න නිලධාරින්ට?

උ: එහෙමයි ස්වාමිනි. එහෙම යැව්වා ස්වාමිනි 11 වෙනිදා මං යැව්වා ලිපියක් ස්වාමිනි

ප්‍ර: ඒ ලිපිය ඔබට මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

උ: ඉදිරිපත් කරන්නට පුළුවන් ස්වාමිනි.

ප්‍ර: මේ අවස්ථාවේදී ස්වාමිනි සාක්ෂිකරු විසින් සඳහන් කරන්නට යෙදුණු 2019.04.11 වෙනි දිනැති ලිපිය C 842 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා. දැන් මහත්මයා C 842 ලේඛනයේ ඔබගේ යොමු අංකයක් සඳහන් වෙනවද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඒ යොමු අංකය?

උ: DIG /SPR/1261/04/2019

ප්‍ර: ඔබ එම ලිපිය ආමන්ත්‍රණය කර තිබෙන්නේ කාටද?

උ: අධ්‍යක්ෂ ඇමති ආරක්ෂක කොට්ඨාශය, අධ්‍යක්ෂක අධිකරණ ආරක්ෂක, අධ්‍යක්ෂ විශාමික ජනරාල් ජනාධිපති ආරක්ෂක

Project Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කොට්ඨාශය, වැඩ බලන අධ්‍යක්ෂක තනාපති ආරක්ෂක කොට්ඨාශය ,වැඩ බලන අධ්‍යක්ෂක විශ්‍රාමික හිටපු ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය 05 .

ප්‍ර: ඔබ C 842 ලේඛනය අන්තර්ගත කරලා තිබෙන්නේ මොනවද, ඉතා සංෂිප්තව ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න මොනවද ඔබ ඒ ලිපිය යටතේ සිටි නිලධාරීන්ට දැන්නුවේ කියලා?

උ: මම දැනුම් දුන්නේ පොලිස්පතිතුමාගේ ලිපිය අනුව එහි අංකය සඳහන් කරලා එහි පිටතපත් ඒ සමඟ යාකරලා ඉදිරිපත් කරනවා. ඉදිරියේදී යම් කිසි ප්‍රහාරයක් සිද්ධ වෙන්න පුළුවන්. මේ පිළිබඳව සියලුම නිලධාරීන් දැනුවත් කර ඔවුන්ගේ ආරක්ෂාව තර කර ගැනීමට කටයුතු කරන්න කියලා .

ප්‍ර: කාගේ ආරක්ෂාවද?

උ: එම අධික්ෂණය කරනු ලබන ප්‍රභූවරුන්ගේ.

ප්‍ර: ඔබ ඒ කියන්නේ ඔබ C 842 ලේඛනය ඔබ යටතේ සිටින නිලධාරීන්ට යොමු කරන විට එයට අමුණුම් වශයෙන් යම් ලේඛන ඇතුළත් කරාද?

උ: ඉදිරිපත් කලා ස්වාමිනි පොලිස්පතිතුමාගෙන් ආව එම ලිපි 4 යාකරලා ඉදිරිපත් කෙරුවා.

ප්‍ර: ඒ කියන්නේ C 4A C ,C4B C4C වශයෙන් ඔබ හඳුනා ගන්නට යෙදුණු ලේඛනද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ලේඛන තුනම ඔබ ඔබ විසින් යවනු ලැබූ C 842 ලේඛනයට අමුණා තමයි ඔබ යටතේ සිටින නිලධාරීන්ට එය?

උ: ඉදිරිපත් කළේ.

ප්‍ර: දැන් ඔබ මෙම ලිපිය ඔවුන් වෙත යැවුවායින් අනතුරුව මේ ඔබ විසින් ලබා දුන් උපදෙස් අනුව ඔබ යටතේ සිටින නිලධාරීන් ක්‍රියා කරාද යන්න සම්බන්ධයෙන් සොයා බැලීමට ඔබ මොනවද ගත්ත ක්‍රියාමාර්ගය ඒසේත් නැත් නම් Follow up action ඔබ මොනවද ගත්තේ?

උ: සෑම දිනකම මට උදේ අධ්‍යක්ෂකවරුන් පස්දෙනාම කථා කරනවා. එතකොට ඔවුන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳව අහනවා. ඒ වගේම මෙම සිද්ධිය පිළිබඳවත් මෙම ලිපිය පිළිබඳවත් නිලධාරින් දැනුවත් කළාද යන්න හැමදාම විමසුවා. ඊට අමරතව සිංහල අවුරුදු දිනයට මට කථා කරන්න අධ්‍යක්ෂකවරුන් 04 දෙනාම පැමිණියා. එවිට තේ මේසයේ දී සාකච්ඡාවක් කරලා මේ මේ දේ ක්‍රියාත්මක කාල ද ඊට ඔවුන් දැනුම් දුන්න බව දැනුම් දුන්නා ඒ පිළිබඳ තොරතුරු ලබා ගත්තා.

ප්‍ර: දැන් මහත්මයා ඔබ යම් ලේඛනයක් සකස් කරලා ඔබ යටතේ සිටින සියලු නිලධාරින් වෙත යොමු කල බව මෙම ගරු කොමිෂන් සභාවට දැන්නුවා?

FAIR COMMENT BY JEZEEM

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එසේ නමුත් C4A ලේඛනයෙන් සහ ඊට අමුණා තිබූ C4B C4C යන ලේඛන සියල්ල ගත්තාම එහි සඳහන් කර තිබුණා ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයටත් යම් ප්‍රහාරයක් සිදුවිය හැකියි යන්න?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලට ආරක්ෂාව සපයන අංශය තිබෙන්නේ ඔබගේ සෘජු අධීක්ෂණය යටතේ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් ඔබ යම් විශේෂ ක්‍රියාමාර්ගක් ගත්තාද? දැන් මේ තොරතුරෙන් නිශ්චිවම සඳහන් කර තිබෙනවා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට ප්‍රහාරයක් එල්ල විය හැකියි බව. දැන් ඔබ ඔබ යටතේ සිටින සියලු නිලධාරීන්ට යැවූ උපදෙස් විතරමද ඔබ ගත්තේ එසේත් නැත්නම් ඒ සම්බන්ධයෙන් නිශ්චිතව සඳහන් කරලා තිබෙන ස්ථානය සම්බන්ධයෙන් ඔබ විශේෂ ක්‍රියාමාර්ගයක් ගත්තාද?

උ: ඒ සඳහා අධ්‍යක්ෂක තානාපති කොට්ඨාශය මගින් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරියකු සහ තවත් නිලධාරීන් පස්දෙනෙක් පමණ වෙනම එම ස්ථානයට ජීප් රථයක් සමඟ යවනු ලැබුවා.

ප්‍ර: ඔබ සඳහන් කරන්නේ සමාන්‍යයෙන් ලබා දී තිබෙන ආරක්ෂාවට අමතරව සඳහන් කරනු ලැබූ නිලධාරීන් යැව්වායි කියලද ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබට හැකියාවක් තිබෙනවද එලෙස යොමු කරනු ලැබූ නිලධාරීන්ගේ නම් සහ නිලයන් සඳහන් කරන්නට?

උ: නැත ස්වාමිනි මා භාරයේ නැහැ.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ප්‍ර: සාක්ෂිකරු ඒක කවදා ඉඳන් ද ඇරියේ?

උ: ඒක මම දැනුම් දුන්නට පස්සේ යැවුවා කියලා අධ්‍යක්ෂක

ප්‍ර: දිනපතා ප්‍රහාරය සිදුවන කාලය දක්වාම ඒ කට්ටිය හිටියා ද ඒ කණ්ඩායම?

උ: ප්‍රහාරයේ දින දවස්වල හිටියා ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ තමන්ට ලියුම ලැබුණා දා ඉදන් ම ඒ කණ්ඩායම් තිබ්බද?

උ: ඉඳලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: පිටතින් ද ඇතුළතින්ද?

උ: අතුළතින් ස්වාමිනි. ඇතුළත ප්‍රධාන දොරටුවෙන් ඇතුළටත් යනවා එළියේ කොල්ලුපිටිය පොලිසිය මාර්ගයෙන් තමයි මං හිතන්නේ නිලධාරින් දෙන්නේ තුන්දෙනෙක් රාජකාරි යොදවලා තිබුණේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට STF එකෙනුත් ආරක්ෂාව යොදලා තිබුණද?

උ: ඒක නම් මට මතකයක් නෑ ස්වාමිනි. ඔය සිද්ධියෙන් පස්සේ තමයි මම ඒ ස්ථානයට යන කොට යොදවලා තිබුණා.

ප්‍ර: ඊට කලින් හිටියද කියලා තමන්ලට වාර්තා කරලා තිබ්බද?

උ: නැහැ ස්වාමිනි.

**********

**<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය.</u>**

ප්‍ර: ඔබට කොහොමද දැනුම් දුන්නේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට විශේෂ නිලධාරීන් කණ්ඩායමක් යොදවා තිබෙනවයි කියලා කවුද දැනුම් දුන්නේ ?

උ: මට අධ්‍යක්ෂක දැනුම් දුන්නේ.

ප්‍ර: කොහොමද දැනුම් දුන්නේ?

උ: අධ්‍යක්ෂක කථා කරන කොට දුරකථනයෙනුත් දැනුම් දුන්නා හම්බුනාමත් කිව්වා මෙහෙම යවලා තියෙන්නේ සර් කියලා.

ප්‍ර: ඊට අමතරව ඔබ විසින් වෙනත් විශේෂ ක්‍රියාමාර්ගයක් ගනු ලැබුවේ නැහැ ඒ සම්බන්ධව ?

උ: නැහැ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබට මේ සිදුවිය හැකි ප්‍රහාරයක් සම්බන්ධයෙන් ඉන් පසු දිනක හෝ පාස්කු ප්‍රහාරය සිදු වීමට පෙර ඉන් පසු දිනක ඔබට යම් තොරතුරක් ලැබුණද?

උ: නැත ස්වාමිනි.

ප්‍ර: ඔබට ලැබුණු එකම තොරතුර ලැබුණේ 2019.04.10 වන දින ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: 2019 .04.20 වන දින ඔබට යම් තොරතුරක් ලැබීමක් සිදුවුණාද?

උ: නැත ස්වාමිනි.

ප්‍ර: ඔබ 2019 අප්‍රේල් 20 වන දින විශේෂ ආරක්ෂක දිසාවේ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් කාර්යාලයට වාර්ථා කිරීම සිදු කරාද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් 2019.04.21 වෙනි දින ඔබට මේ සිදු වූ බෝම්බ ප්‍රහාර සම්බන්ධයෙන් දැනගන්නට ලැබුණේ කීයටද?

උ: මම ස්වාමිනි එදා ඉරිදා දිනක් මම නිවසේ ඉඳලා වත්තල ඉඳලා කාර්යාලයට පැමිණෙන විටදි මට දුරකථනයෙන් අමතලා කිව්වා මෙහෙම ප්‍රහාරයක් සිද්ධ වෙලා තියෙනවා කියලා මගේ කාර්යාලයෙන්.

ප්‍ර: ඒ කියන්නේ ඔබ 2019.04.21 වෙනි දින රාජකාරියට වාර්ථා කරන්නට තමයි ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: කාර්යාලයේ එනකොට ස්වාමිනි.

ප්‍ර: ඉන් අනතුරුව ඔබ යටතේ සිටි නිලධාරින්ට යම් උපදෙසක් ලබා දුන්නාද?

උ: ඔව් ස්වාමිනි. මම ඒ අවස්ථාවේදීම කොච්චිකඩේ පල්ලිය ගාවට ගියා. එතකොට මම ඒ කිට්ටුව හිටියේ ගිහිල්ලා බැලුවා එතෙන්ට යන්න විදියක් නෑ බොහෝම සෙනඟ නමුත් මම වාහනය එනතුරු පයින් ගිහින් බලලා වහාම මම කාර්යාලයට අවා එතකොට ඇවිල්ලා ඉවරවෙලා අදාළ නිලධාරින්ට දැනට මෙහෙම සිද්ධියක් සිද්ධ වෙලා තියෙනවා වහාම නැවතත් මතක් කරලා ආරක්ෂාව තර කරන්න කියලා දැනුම් දුන්නා ස්වාමිනි.

ප්‍ර: දැන් මීට අමතරව මහත්මයා ඔබ දැනුවත්ද ඔබ විසින් ඔබගේ යටතේ සිටින නිලධාරීන්ට යොමු කරන ලැබූ C 842 දෙක ලේඛනය යම් අවස්ථාවක අන්තර්ජාලය ඔස්සේ සංසරණය වූ බවට ?

උ: එහෙමයි ස්වාමිනි. මම කොච්චිකඩේ පල්ලියට ගිහිල්ලා බලලා මගේ කාර්යාලයට ආවාම මගේ නිලධාරින් කිව්වා මා විසින් අත්සන් කල අධ්‍යක්ෂකවරුන් වෙත යොමු කරන ලද ලිපිය රූපවාහිනියේ පෙන්වන බව. මගේ කාර්යාලයේ රූපවාහනිය දාලා බලනකොට මම එය දුටුවා ස්වාමිනි. ඒ මගේ අත්සන කියලා මම අඳුර ගත්තා.

ප්‍ර: ඔබට පැහැදිලි කිරීමක් කරන්නට පුළුවන්ද මෙම ගරු කොමිෂන් සභාවට ඔබ විසින් ඔබ යටතේ සිටි අධ්‍යක්ෂකවරුන් පස්දෙනා වෙත යොමු කරන ලද ලිපිය මාධ්‍ය සහ අන්තර්ජාලය හරහා සංසරණය වුණේ කොහොමද?

උ: එහෙම කියන්න බැහැ ස්වාමිනි. මම ඇරියා අධ්‍යක්ෂකවරු පස්දෙනාට තමයි ඒ අධ්‍යක්ෂකවරු පස්දෙනාගෙන් කුමන හෝ කණ්ඩායමකින් තමයි මේ මාධ්‍ය ජාලයට ගිහිල්ලා තියෙන්නේ. සමහර විට මං සැකකරනවා අධ්‍යක්ෂක ඇමති ආරක්ෂක කොට්ඨාශයේ නිලධාරින් 218 ක් පමණ සිටින නිසා ඒ ප්‍රභූවරයෙකුගේ නිලධාරියෙකුට භාරදෙන ලද ලිපියක් අන්තර්ජාලයට යොමු කරන්න ඇති කියලා ස්වාමිනි.

**********

<u>**ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**</u>

ප්‍ර: ඒ කියන්නේ තමන් කියන්නේ ඔය ප්‍රභූවරු 260 ගාණකට තමාලා ඒ ලිපිය භාර දුන්නා?

උ: ඔව් ස්වාමිනි.එහෙමයි ස්වාමිනි

ප්‍ර ඒ ලිපි භාර දීලා අත්සන් ලබා ගත්තද?

උ: ඒවා අධ්‍යක්ෂක ලග තියෙන්නේ ස්වාමිනි. උපදෙස් පත්ති පවත්වලා කුමන හෝ නිලධාරියෙක් එම කණ්ඩායමක ඉන්න ගෙනල්ලා භාර දීලා තියෙනවා හැම කෙනෙකුටම ලිපිය ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ ප්‍රභූවරුන්ගේ ආරක්ෂක නිලධාරීන්ගේ සියලු දෙනාම අත්සන් තබා භාර අරන් තියෙනවා?

උ: භාර අර ගෙන තියෙනවා. ප්‍රධාන ආරක්ෂක නිලධාරියා හෝ එතන ඉන්න වෙනත් නිලධාරීන් දෙන්නෙක් හෝ එම උපදෙස් පන්තියට සහභාගි වෙලා තියෙනවා?

ප්‍ර: සමාන්‍යයෙන් ප්‍රභූ ආරක්ෂක නිලධාරින්ට භාර දුන්නායින් පස්සේ ඒ ඇමතිවරුන්ට ඔවුන් ඒ සම්බන්ධව දන්නවා සිටිනවාද?

උ: සමහරු දැනුවත් කරනවා ස්වාමිනි ඒ අවස්ථාව අනුව සමහර ප්‍රභූවරුන්ට යම්කිසි දෙයක් දැනුම් දුන්නාම ඔවුන් බය වෙන හින්දා එහෙම දැනුම් දීමක් කරන්නේ නැහැ නමුත් ඒ නොයායුතු තැනකට වාගේ යනවානම් නම් දැනුම් දීමක් කරනවා නමුත් ආරක්ෂක නිලධාරියා එය සම්පූර්ණව දැනගෙන ඉන්නවා

ප්‍ර: දැන් ප්‍රභූවරුන් 260 ගේ ආරක්ෂක නිලධාරින්ට දැනුම් දුන්නයින් පස්සේ එක ප්‍රභූවරයෙකු හෝ දැනුවත් කිරීමක් කරලා තියෙනවද කියලා කියන්න පුළුවන්ද? දැන් 260 දෙනෙකුටනේ ප්‍රභූ ආරක්ෂක නිලධාරීන්ට දීලා තියෙනවා?

උ: මෙහමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ප්‍රභූවරුන් ඉන්න දෙසිය ගාණක් සෑහෙන ප්‍රමාණයක් ඇතිනේ ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔවුන්ගේ කිසිවකුටත් ඒ පිළිබඳව දැනුම්දීමක් කරලා නැද්ද?

උ: එහෙම කියන්න බැහැ ස්වාමිනි මට නමුත් අර බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමෙන්තු මන්ත්‍රිතුමාගේ තාත්තා කියලා තිබුණා එතන ඉන්න නිලධාරීන් කිව්වායි කියලා පල්ලියට යන්න එපා මෙහෙම සිදු වීමක් වෙන්න පුළුවන් කියලා.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු මෙම සිද්ධියෙන් පසුව ඔබ පසුවිපරමක් කෙරුවද අර ඇමති ආරක්ෂක කොට්ඨාශය MSD එකට ලබා දුන් තොරතුරු කාට කාට ද දැනුම් දුන්නේ කියලා ?

උ: එහෙමයි ස්වාමිනි අධ්‍යක්ෂකවරයා ලිඛිතව මට එවලා තියෙනවා මං මෙහෙම දැනුම් දුන්නායි කියලා උපදෙස් පන්තියක් පවත්වලා.

ප්‍ර: නෑ මගේ ප්‍රශ්නයට ඔබට වැටෙහෙන්න නැතිව ඇති උපදෙස් පන්තියේ කියපු එක නෙමේ මං අහන්නේ දැන් උපදෙස් පන්තියේදී ඒ එක් එක් ප්‍රභූවරයා භාරව ඉන්න ආරක්ෂකයින් දැනුවත් වෙලා ඇති ඔබ මේ සිද්ධියෙන් පස්සේ බැලුවද එම ආරක්ෂාවට යෙදූ නිලධාරීන්ගෙන් කී දෙනෙක් ඒ ආරක්ෂාව සපයපු ප්‍රභූවරයට එක දැනුම් දුන්නා ද නැද්ද?

උ: නැත ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඇයි නැත්තේ?

උ: මම එහෙම ඇහුවේ නැහැ අධ්‍යක්ෂවරයාගෙන් ඇහුවා මෙහෙම දැනුම් දීලද කියලා සෑම ප්‍රභූවරයෙකුගේම ආරක්ෂක නිලධාරියෙක් ගෙන්නලා ඒ අයට මේ පිළිබඳව දැනුවත් කෙරුවා ලිඛිතවත් භාර දුන්නා කියලා ඉවරවෙලා දැනුම් දුන්නා ස්වාමිනි.

ප්‍ර: ඔබ ඉන් ඊට එහායින් ගිහිල්ලා ඒක ප්‍රභූවරයාට දැනුම් දුන්නද නැද්ද කියන එක හොයලා බැලුවේ නැද්ද?

උ: බැලුවා ස්වාමිනි සමහරෙකුට දැනුම් දුන්නා කිව්වා කියනවා සමහරෙක් දැනුම් දුන්නේ නෑ කියනවා සමහරු ඒක ස්වාමිනි දැනුම් දීපු ප්‍රභූවරුත් කියලා තියෙනවා මේක අපිට දැනුම් දුන්නා කියලා සඳහන් කිරීම අවශ්‍ය වෙන්නේ නැහැ කියලා එහෙම වීම් වෙලා තියෙන හින්දා ප්‍රභූවරයා දැනුවත් කෙරුවා කියලා කවුරුත් නිලධාරීන් කියන්නේ නෑ.

ප්‍ර: කොයි වෙලාවේද කියලා තිබ්බේ අපිව දැනුවත් කෙරුව බව කියන්න ඕනේ නෑ කියලා?

උ: මෙම සිද්ධියෙන් පස්සේ තමයි කියලා තියෙන්නේ ස්වාමිනි එහෙම දෙයක් තමයි මට ආරංචි වුනේ.

ප්‍ර: කවුද ඒ ?

උ: එහෙම මට කියන්න හැකියාවක් නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබට ඒ ආරක්ෂක නිලධාරීන් කියන්න ඇතිනේ කවුද එහෙම කියන්න ඇත්තේ කියලා?

උ: මට අධ්‍යක්ෂක කිව්වේ ස්වාමිනි.

ප්‍ර: අධ්‍යක්ෂකවරයා කියන්න ඇතිනේ කීවේ කවුද කියලා?

උ: නෑ එහෙම කිව්වේ නැහැ ස්වාමිනි.

ප්‍ර: කවුද අධ්‍යක්ෂකවරයා?

උ: අධ්‍යක්ෂකවරයා එතකොට හිටියේ කිත්සිරි අපොන්සු පොලිස් අධිකාරි.

ප්‍ර: ඔහු තමා ඔබට කිව්වේ සමහරක් ප්‍රභූවරුන් ඔවුන්ගේ ආරක්ෂකවරුන්ට ආරක්ෂකයින්ට දැනුම් දුන්නා ඔවුන්ට දැනුවත් කිරීමක් කරපු බව කියන්නට එපා කියාලා

උ: කියන්න එපා කියලා දැනුම් දීලා තියෙනවා

ප්‍ර: ඔබට ඒ කිත්සිරි අපෝන්සු කියන නිලධාරියා කියපු හැටියට ඒ ප්‍රභූවරුන්ට ආරක්ෂාව සපයපු ආරක්ෂක නිලධාරීන් ඒ ප්‍රභූවරුන්ට ඒ තොරතුර දැනුම් දුන්නේ පාස්කු ප්‍රහාරයට පෙරද?

උ: පෙර වෙන්න ඕනේ ස්වාමිනි.

ප්‍ර: නිශ්චිතව ඔබට ඒක කියනන්න බැහැ?

උ: කියන්න බැහැ ස්වාමිනි

ප්‍ර: දැන් ඔබ කිත්සිරි අපොන්සු නිලධාරියාගෙන් පසුවිපරමක් කෙරුවනේ මේ තොරතුරු දැනුම් දුන්නාද නැද්ද කියන එක ආරක්ෂක නිලධාරීන්ට ?

උ: සිද්ධියට ප්‍රථම.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔව්?

උ: එහෙමයි.

ප්‍ර: එතකොට ඒ අවස්ථාවේදීද කිව්වේ මේක දැනුවත් කෙරුවා කියලා කියන්න එපා කියලා?

උ: නෑ සිද්ධියෙන් පස්සේ.

ප්‍ර: සිද්ධියෙන් පස්සේ?

උ: සිද්ධියෙන් පස්සේ.

ප්‍ර: හරි සිද්ධියට පෙර ඔබ කිස්තිසිරි අපොන්සු නිලධාරියාට කතා කරන කොට ඔබ ඔහුගෙන් විමසුවද ඒ ප්‍රභූවරුන්ට ආරක්ෂාව සපයන ආරක්ෂක නිලධාරීන් විසින් ඒ ප්‍රභූවරුන්ට ඒ තොරතුර සම්බන්ධයෙන් දැනුම් දීමක් කෙරුවද නැද්ද කියලා?

උ: නෑ මං එහෙම විමසුවේ නෑ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ ඔබගේ අංශයේ ඒ කියන්නේ ඇමති ආරක්ෂක අංශයේ යටතේ ඉන්න නිලධාරීන් හෝ විනිසුරු ආරක්ෂක අංශයේ ඉන්න නිලධාරීන්ට යම්කිසි අනතුරක් පොදුවේ සිදුවිය හැකි බව දැනුම් දුන්නායින් පස්සේ ඒක ඒ ආරක්ෂා කරන ප්‍රභූවරයාට නැත්නම් විනිශ්චයකාරවරයාට නැත්නම් තානාධිපතිවරයාට දැනුම් දීමේ ක්‍රමවේදයක් නැද්ද?

උ: නෑ දැනුම් දීම කරන අවස්ථාත් තියෙනවා නොකරන අවස්ථාත් තියෙනවා ස්වාමිනි මොකද ප්‍රභූවරයාගේ තත්ත්වය අනුව බලලා තමයි සමහර ප්‍රභූවරු ඒ වගේ දෙයක් කිව්වාම කලබල වෙනවා සමහර ප්‍රභූවරු එහෙම දෙයක් කිව්වාම ඒ අදාළ අපේ ආරක්ෂක නිලධාරියාට බැණ වදිනවා. ඒ වගේ හේතූන් නිසා අපි ඒ ආරක්ෂක නිලධාරීන් විතරයි දැනුවත් කරන්නේ ප්‍රභූවරයා යම් තැනකට යනවා නම් මේ වගේ තැනකදී ආරක්ෂාව පිළිබඳව තර කරන්නේ කියන එක

ප්‍ර: එතකොට දැන් ඔබගේ ඔබ කියන්නේ ඔබ කියන හැටියට මේ සම්පූර්ණයෙන් ප්‍රභූවරුන් 268 ක් හිටියනේ ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ 268 දෙනාම ඔබ කියන විදියට මේ තොරතුරු නොදිය යුතු තැනැත්තන් නෙවෙනේ ?

උ: එහෙම කියන්න බැහැ ස්වාමිනි.

ප්‍ර: එහෙම කියන්න බෑනේ එයින් යම් ප්‍රමාණයකට මේ තොරතුරු ලබා දෙනවා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කවුද කියන එක ඔබට හරියටම කියන්න බෑ?

උ: බෑ ස්වාමිනි.

ප්‍ර: කවුද කියලා කියන්න පුළුවන් කිත්සිරි අපොන්සු කියන නිලධාරියාට විතරද ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: අධ්‍යක්ෂකවරයාට විතරයි ඇමති ආරක්ෂක කොට්ඨාශයේ අධ්‍යක්ෂවරයාට සහ ස්ථානාධිපති.

**********

**<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>**

ප්‍ර: ප්‍රියලාල් මහත්මයා ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ මේ තොරතුර පිළිබඳව දැනුම් දුන්නට පස්සේ ඔබ කිසිම නිලධාරියෙකු සමඟ ඔය කියන්නේ ඔබගේ මට්ටමේ ඉන්න ඒ කියන්නේ DIG කෙනෙක් හෝ ඔබගේ මට්ටමට ඉහළ ඉන්න නිලධාරියකු සමඟ මේ තොරතුර පිළබඳව නැවත සාකච්ඡා කළාද ?

උ: නැත ස්වාමිනි.

ප්‍ර: ඔබ අප්‍රෙල් මාසේ 20 වෙනිදා ඒ කියන්නේ එදා සෙනසුරාදා දවස ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එදා ඔබේ කාර්යාලයේ හිටියේ නැනේ?

උ: හිටියා ස්වාමිනි

ප්‍ර: ආ... ඔබ කාර්යාලයේ හිටියා සෙනසුරාදා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට එදින පස්වරුවේ 6 න් පස්සේ වෙලාවක ඔබේ සමගාමී නිලධාරියෙක් කිසිම කෙනෙක් හෙට දින ප්‍රහාරය එල්ල වෙනවා කියන එක පිළිබඳව ඔහු ඔබව දැනුවත් කළේ නැද්ද?

උ: නැත ස්වාමිනි.

ප්‍ර: දැන් මේ 21 වෙනිදා බෝම්බය පිපිරුණාට පස්සේ ඔබ අවම වශයෙන් ඔබේ මට්ටමේ ඉන්න නිලධාරීන් හෝ ඔබට ඉහල ඉන්න නිලධාරීන්ගෙන් ඇයි මේක අපිට දැනුම් දුන්නේ නැත්තේ කියලා විමසුවේ නැද්ද?

උ: කවුරුත් විමසුවේ නැහැ ස්වාමිනි.

ප්‍ර: නෑ නෑ ඔබ විමසුවේ නැද්ද කියලා මං අහන්නේ ?

උ: නෑ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ පස්සේ හරි දැන ගත්තද අප්‍රේල් 20 වෙනිදා හවස 7 න් පස්සේ හෙට ප්‍රහාරයක් එල්ල වෙනවා කියලා තොරතුරක් ලැබී තිබුණ බව ?

උ: නැත ස්වාමිනි මට කිසි කෙනෙක් දැනුවත් කරේ නැහැ.

ප්‍ර: නෑ මං අහන්නේ ඔබ පසුව හරි දැනගත්තද?

උ: ඒ පසුව දින ගාණකට පසුව තමයි මම දැන ගත්තේ ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබට හිතුන් නැද්ද ඇයි මේ තොරතුර ඔබට විසිවෙනිදා රාත්‍රියේ නොදුන්නේ කියලා හොයන්න?

උ: නැත ස්වාමිනි මම කාටවත් කතා කරෙත් ඒ පිළිබඳව අහලා බැලුවෙත් නෑ

Registered Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඇයි එහෙම කළේ නැත්තේ ?

උ මගේ රාජකාරී රාමුව ඇතුළත මම ගත යුතු ක්‍රියාමාර්ග ඇරන් තිබුණ නිසාත් එම ප්‍රහාරය අදාළ වුයෝ මාගේ කොට්ඨාශයට ආරක්ෂාව සැපයීම අනුව නොවෙන නිසාත් මා ඒ පිළිබඳව හොයලා බැලුවේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබ කතෝලික භක්තිකයෙක් නේ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ හිතුවේ නැද්ද ඒ අවස්ථාවේදී පල්ලියේ ඉන්න ඔබ දන්නා හඳුනන කවුරු හරි පූජකවරයෙක්ට මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න මෙහෙම දෙයක් වෙන්න යනවා කියලා?

උ: දැනුවත් කරලා යම් කිසි දෙයක් සිදු වුණේ නැත්නම් ස්වාමිනි ඒකේ දෝෂාරෝපණයක් මට එනවා මගේ සහෝදරයත් ඊට යාබද දේවස්ථානයේ පූජකවරයෙක් නමුත් මම ඔහුටවත් දැනුම් දුන්නෙ නැහැ. මොකද බැරිවෙලාවත් ඔය වගේ දෙයක් උන්වහන්සේට කිව්වානම් උන්වහන්සේ කාදිනල් උන්වහන්සේට කියනවා බැරිවෙලාවක්වත් ඔය දේව මෙහෙයක් නැවතීලා ඔය වගේ සිද්ධියක් වුනේ නැත්නම් මම මහත් අපහසුතාවයකට මුහුණ දෙන්න වෙනවා.

ප්‍ර: ඒ කියන්නේ මීට කලින් එවැනි දේවල් සිද්ධවෙලා තියෙනවද ඔබ කියන විදියට?

උ: නෑ එහෙම වෙලා නැහැ ස්වාමිනි .

ප්‍ර: එහෙනම් ඔබ කොහොමද උපකල්පනය කළේ මේක සිදුනොවුනොත් මෙහෙම වෙන්න පුළුවන් කියලා.?

උ: අනිවාර්යෙන් එහෙම වෙනවනේ ස්වාමිනි. අපි සමාන්‍යයෙන් රටේ දැනගෙන තියෙන තත්ත්වය අනුව

ප්‍ර: ඒ තොරතුරේ තිබිච්ච එකේ ප්‍රහල බව ඔබ සැකයට භාජනය කළාද?

උ: භාජනය කළා ස්වාමිනි.

ප්‍ර: ඇයි ඔබට සැක හිතුනේ?

උ: මට සැක හිතුනේ මෙහෙම නම් වශයෙන්ම නම් කියලා තියෙනවා මේ වගේ ප්‍රහාරයක් සිදු විය හැකි ආකාරය කියලා තියෙනවා ඒ අනුව තමයි මම මගේ අධ්‍යක්ෂවරුන්ට මේ පිළිබඳව දැනුම් දුන්නේ මගේ රාජකාරිය ආවරණය කරන දේවස්ථාන මගේ භාරයේ නැහැ ඒ වගේ හින්දා මට අදාළ වන්නේ තානාධිපති කාර්යාලය පමණක් හින්දා විශේෂයෙන් ඔහුට දැනුම් දුන්නා අනිත් ආකාරයටත් අනිත් අධ්‍යක්ෂකවරුන්ට දැනුම් දුන්නා.

ප්‍ර: දැන් පස්සේ අප්‍රේල් 21 ට පස්සේ බෝම්බය පිපිරුනාට පස්සේ ඔබේ සහෝදරයා හරි ඔබට කිව්වද මේක ගැන මට කියලා තිබුණා නම් අඩුම ගානේ මම අනිත් අයව දැනුවත් කරන්න ?

FAIR COMMENT BY JEZEEM

උ: කිව්වා ස්වාමිනි මට කාදිනල් උන්වහන්සේත් කිව්වා. ඔව්වර ප්‍රියලාල් දැනගෙන කිව්වේ නෑ කියලා නමුත් මට එහෙම දැනුම් දීමේ හැකියාවක් නෑ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබට හිතෙනවද ඔබ එදා ඒ දැනුවත් කිරීම කළා නම් යම් ආකරයකට මේ සිද්ධ වෙච්ච විනාශය යම් ප්‍රමාණයකට හෝ අඩුකරගන්න එහෙම නැත්නම් මුළුමනින්ම නතර කර ගන්න හැකියාවක් තිබුණා කියලා?

උ: එහෙම දැනුම් දීලා එහෙම සිද්ධියක් නවත්ත ගත්තානම් හොඳයි ස්වාමිනි බැරි වෙලාවත් එහෙම එකක් වුණේ නැත්නම් මම ඊට වැඩිය දෝෂාරෝපණයකට ලක්වෙනවා ඔය කථා කරපු ඔක්කොම මට විරුද්ධව කථා කරයි ස්වාමිනි.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ප්‍ර: සාක්ෂිකරු පාර්ලිමේන්තු කථානායකතුමාටත් ආරක්ෂක අංශ ප්‍රධානියාටත් ඇරියද මේ ලිපිය ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ නිලධාරීන් කථානායකතුමා දැනුවත් කරලා නැද්ද පාර්ලිමේන්තුවේ ප්‍රධානියෙක් වශයෙන්?

උ: නැතුව ඇති ස්වාමිනි.

ප්‍ර: කවුද ඒ භාර දුන්නේ කථා නායකතුමාගේ ලිපියන්?

උ: කථානායක තුමාගේ ආරක්ෂක නිලධාරීන් ට ?

ප්‍ර: කවුද ඒ අධ්‍යක්ෂක ඇමති ආරක්ෂක කොට්ඨාශය?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔවුන් කිව්වේ නෑ මේක කිව්වද නැද්ද කියන එක කිව්වේ නෑ ?

උ: මට කිව්වේ නෑ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබගේ අංශය යටතේ ඉන්නේ තනාපති කාර්යාලයේ ඉන්දියනු තනාපති කාර්යාලයද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබට කියන්න පුළුවන්ද මම කලිනුත් ඇහුවා STF එකේ ආරක්ෂාව යොදලා තිබ්බද කියලා කොයි අවස්ථාවකවත් මෙම ප්‍රහාරයට පෙර?

උ: මට ඒක කියන්න බැහැ ස්වාමිනි. සිද්ධියෙන් පස්සේ තමයි මම එම ස්ථානයට ගියේ එතකොට නම් STF රාජකාරි යොදලා තිබුණා.

ප්‍ර: ඊට කලින් විශේෂ ආරක්ෂාවක් දාලා කියලා තමන්ට වාර්තා කිරීමක් කරලා තියෙනවද ?

උ: නෑ ස්වාමිනි.

ප්‍ර: දැන් ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයට යම්කිසි අනතුරක් සිදුවෙන අවස්ථාවලදී මෙයට කලිනුත් එවැනි අනතුරුදායක දැන්වීම් ලැබුණු

FAIR COMMENT BY JEZEEM

වෙලාවක ඒ පිළිබඳව ඉන්දියානුවන් වැඩිපුර ගැවසෙන හෝටලයක් වන ටාජ් හෝටලයට දැනුම් දීම් සිදුවෙනවා ආරක්ෂක අංශයක් මගින් හෝ ඉන්දියානු තනාපති කාර්යාලය මගින් එවැනි දැනුම් දීමක් ටාජ් හෝටලයට ලබා දීලා තිබුණද කියලා තමන්නට කියන්න පුළුවන්ද ?

උ: බෑ ස්වාමිනි. මගේ කාලෙයේදී දැනුම් දීමක් වෙලා තිබුණේ නැහැ. කවදාවත්

ප්‍ර: දැන් LTTE ප්‍රහාර සිදුවෙන කාලවලදී ?

උ : එහෙම නම් කියන්න දන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: නමුත් සාමාන්‍යයෙන් ඒ ඉන්දියානු ජාතීන් වැඩිපුර ගැවසෙන ස්ථානයකට සමාන්‍යයෙන් ඉන්දියානු කොමසාරිස් කාර්යාලය දැනුම් දීම් කරනවද?තමන්ට කියන්න පුළුවන්ද ඒ සම්බන්ධව යම් කිසි අනතුරුදායක අවස්ථාවලදී ඉන්දියානු ජාතිකයන් වැඩිපුර එන නිසා ටාජ් හෝටලය වැනි ස්ථානවලට කොමසාරිස් කාර්යාල විසින් ඒ පිළිබඳ දැනුම් දීම් කරනවද කියලා?

උ: නැහැ ස්වාමිනි.

ප්‍ර: තමන් දන් නෑ ?

උ: නැහැ.

**********

**<u>ගරු අදිකාරි මැතිණිය.</u>**

ප්‍ර: ඔබට පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා විසින් එවන ලද ලිපිය ලැබුණේ කවදද?

උ: 10 වෙනිදා හවස 2.30 පමණ (දෙකහමාරට ) පමණ ස්වාමිනි.

ප්‍ර: ඔබ එම ලිපියේ අධ්‍යක්ෂකවරුන් කියන අයට යැවේ කවදාද?

උ: 11 වෙනිදා උදේ ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ මෙම කොමිෂම හමුවේ සඳහන් කලා එම අධ්‍යක්ෂවරුන් හතර දෙනාගෙන් කිසිවකු හෝ විය හැකියි සමාජ මාධ්‍ය ජලා ඔස්සේ අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව මෙම ලිපිය මහජනතාවට දැනුවත් වන ආකාරයට මාධ්‍ය හරහා ප්‍රකාශයට පත් කලේ කියලා?

උ: අධ්‍යක්ෂකවරු නෙමේ ස්වාමීනි අධ්‍යක්ෂකවරුන් භාරදුන් ප්‍රභූවරුන්ගේ ආරක්ෂක නිලධාරියෙක් විය හැකියි ස්වාමිනි.

ප්‍ර: ප්‍රභූවරුන්ගේ ආරක්ෂක නිලධාරීන්?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ගොල්ලෝ අයිති වෙන්නේ රජයට නේද ඒ ප්‍රභූවරන්ගේ ආරක්ෂක නිලධාරිනුත් රජයේ ?

උ: රජයේ ඇමති ආරක්ෂක කොට්ඨාශයට. ඒ ගොල්ලෝ පොලිස් නිලධාරීන්

ප්‍ර: ඒ ගෝල්ලෝ පොලිස් නිලධාරින්?

පි: එහෙමයි ස්වාමිනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ මෙම ලිපියත් සමඟ අධ්‍යක්ෂවරුන් සහ පස්දෙනෙකුට යවනවානේ ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ලිපයත් සමඟ පොලිස්පතුමාගේ ලිපියත් ඇමුණුමක් හැටියට යනවද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මේ කණ්ඩායම එතකොට අමාත්‍යවරුන්ගේ ආරක්ෂ නිලධාරීන් හැටියට ඉන්න අයටත් යවලා තියෙනවාද කියලා ඔබ දන්නවද? ඔබගේ ලිපිය සමඟ පොලිස්පතිතුමාගේත් ලිපිය?

උ: පොලිස්පතිතුමාගේ ලිපියේ යවන එකක් නැහැ ස්වාමිනි මම ස්ථිරව දන්නේ නැහැ. නමුත් ඒක යවන්නේ අධ්‍යක්ෂවරුන් 4 දෙනාට පමණයි.

ප්‍ර: ඔබ සොයා බැලුවේ නැද්ද මෙම ලිපිය මෙම මාධ්‍ය හරහා යොමු කර අය සම්බන්ධයෙන් ගත හැකි විනය ක්‍රියාමාර්ගය කුමද්ද කියලා?

උ: නෑ මම හොයලා බැලුවේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඇයි ඔබගේ රාජකාරියක් නෙමේද? ඒ ඔබගේ අංශයෙන් යොමු කරන ලද ලිපියක් තමයි මෙම මාධ්‍යය හරහා ගියේ අනිත් එක මේ පොලිස්පතිතුමාගේ ලිපිය TOP SECRET ICE ONLY එවැනි දේවල් තියෙන ලිපියක්නේ ?

උ: එහෙමයි.

ප්‍ර: ඒක නිසා ඔබ ඇයි සොයා බැලුවේ නැත්තේ මෙම ලිපිය මාධ්‍යය වලට දුන්නු පුද්ගලයා කවුද කියලා?

උ: එම පොලිස්පතුමාගේ ලිපිය නෙමේ ස්වාමිනි ගිහිල්ලා තිබුණේ මා විසින් යවන ලද ලිපිය .

ප්‍ර: ඒකත් ඔබ හරියටම දන්නේ නැහැනේ තාම මාධ්‍යයෙන් තමයි මේක ගියේ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: නමුත් ඔබ අධ්‍යක්ෂවරුන්ට යවලා තියෙනවානේ පොලිස්පතුමාත් යවපු ලිපිය?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබට තාම හරියට කියන්න බෑනේ ඔබගේ අධ්‍යක්ෂකවරුන් මේක මාධ්‍යය වලට දුන්නද එහෙම නැත්නම් අධ්‍යක්ෂකවරුන් විසින් යවන ලද ප්‍රභූවරුන්ගේ ආරක්ෂකයින් දුන්නද කියන එක ?

උ: මට එහෙම කියන්න බැහැ ස්වාමිනි.

ප්‍ර: ඒක නිසා ඔබට හොයන්න තිබුණානේ මේක කවුද හරියටම දුන්නේ කියලා?

උ: ඒ පිළිබඳව සොයා බැලීමක් කෙරුවේ නැහැ ස්වාමිනි.

ප්‍ර: පොලිස්පතිතුමාගේ ලිපිය ඔබට ලැබුනේ ප්‍රහාරයට පෙරද පසුවද?

පි: පළමු ආරංචිය පිළිබඳවද .

ප්‍ර: ඔව්?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ: ප්‍රහාරයට පෙර ස්වාමීනි 10 වෙනිදානේ ලැබුණේ.

ප්‍ර: 10 වෙනිදා ?

උ: 10 වෙනිදා.

**********

**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.**

මේ අවස්ථාවේදී උගත් රජයේ අධිනීතිඥවරිය තවදුරටත් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් ඉල්ලයි. ලබා දෙමි.

**********

**රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය.**

ප්‍ර: මහත්මයා ඔබට යම් අවස්ථාවක දී දැන ගන්නට ලැබුණා ද ඔබ විසින් C 842 ලේඛනය යොමු කරනු ලැබූ අධ්‍යක්ෂකවරුන් හෝ වෙනත් ඉහළ නිලධාරියෙකු විසින් ඔවුන්ගේ පහළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දීමක් සිදු කලාය යැයි කියලා එහි අන්තර්ගත තොරතුර ඔවුන් ආරක්ෂා කරන ප්‍රභූවරුන් වෙත දැනුම් නොදෙන ලෙසට උපදෙසක් ලබා දී තිබෙනවා?

උ: නෑ එහෙම නෑ ස්වාමිනි.

ප්‍ර: එහෙම ඔබට දැනගන්නට ලැබුනේ නැහැ?

උ: නැහැ ස්වාමිනි.

**********

**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.**

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරිය ලබා දෙමි.

**********

**නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය.**

ප්‍ර: ප්‍රියලාල් මහත්මයා ඔබ මේ ගරු කොමිෂන් සභාවට කිව්වා දේවස්ථානයට දේවස්ථානවලට ආරක්ෂාව සැපයීම ඔබේ අධීක්ෂණය යටතේ නෙමේ කියලා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මම ඔබගෙන් අහන ප්‍රශ්නේ අති උතුම් කාදිනල් හිමිපාණන්ගේ නිල නිවස එනම් Bishop's house එකට ආරක්ෂාව සැපයීම ඔබගේ අධික්ෂණය යටතේද තිබෙන්නේ?

උ: නැත ස්වාමිනි.

ප්‍ර: කාගේ අධික්ෂණය යටතේ ද ?

උ: ඒ පිළිබඳව මම දන්නේ නැහැ සමහර විට මරදාන පොලිසිය වෙන්න ඕනේ ස්වාමිනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

**සාක්ෂිකරුගෙන් වෙනත් ප්‍රශ්න නොමැති බව දන්නවයි.**

**සාක්ෂිකරු මුදා හරිමි.**

වේලාව:ප.ව.02.15

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශයේ නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

**2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව**

දිනය :- 2020.07.15 වේලාව :- ප.ව. 1.00

සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි

**ගරු විනිසුරු මඩුල්ල :-**

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

**පෙනී සිටීම:-**

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතිඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ගිම්හානි ගමගේ කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

| | | |
|---|---|---|
| සාක්ෂි අංකය | :- | 419 |
| සම්පූර්ණ නම | :- | ජයලත් පේඩිලාගේ අචල දුෂ්මාන්. |
| වයස | :- | 31 |
| ජාතිය | :- | සිංහල |
| ආගම | :- | බෞද්ධ |
| රැකියාව | :- | පොලිස් කොස්තාපල්, පො.කෝ 76581 |
| රාජකාරි ලිපිනය | :- | පොලිස් මූලස්ථානය ,පොලිස්පති ලේකම් කාර්යාලය s4 කාර්යාලයට අනුයුකත්ව |

ප්‍රතිඥා පිට,

**<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය</u>**

ප්‍ර: සාක්ෂිකරු ඔබ ශ්‍රී ලංකා පොලිසියට බැඳුනේ කුමන වර්ෂයකද කුමන තනතුරකින්ද?

පි: 2008 .04.20 පොලිස් කොස්තාපල්

ප්‍ර: ඔබ ඉන් අනතුරුව පොලිස්පති ලේකම් කාර්යාලයට පළමුවෙන්ම අනුයුක්ත වුනේ කවදද?

පි: 2016.08.08.

ප්‍ර: ඔබ දැන් මෙම ගරු කොමිෂන් සභාවට සඳහන් කරා ඔබ පොලිස්පති ලේකම් කාර්යාලයේ S4 කාර්යාලයේ සේවය කරන බව ?

පි: ඔව්.

ප්‍ර: ඔබ මුල සිටම S4 කාර්යාලයේද සේවය කරන්නේ ?

පි: S2 කාර්යාලයේ මාස කීපයක් රාජකාරි කරනවා. ඊට පස්සේ තමයි 4 කාර්යාලයේ රාජකාරි කරන්නේ.

ප්‍ර: ඔබ S4 කාර්යාලයට රාජකාරි වාර්තා කරේ කවදද?

පි: කාල වකවානුවක් මතක නැහැ ස්වාමිනි.

ප්‍ර; දැන් මහත්මායා ඔය පොලිස්පති ලේකම් කාර්යාලයේ S4 කියන්නේ මොකක්ද ? ඒකෙන් අදහස් වෙන්නේ මොකක්ද ඔය S4 කාර්යාලය කියන එකෙන්?

පි: S4 කාර්යාලය කියන්නේ outward කිරිමට තියෙන්නේ ඒ කියන්නේ බුද්ධි තොරතුරු සම්පූර්ණයෙන් ලැබෙන්නේ අපිට අපි එතනින් inward කරනවා inward කරලා ඉවර වෙලා outward කරන්නේ අපේ කාර්යාලයෙන්.

ප්‍ර: බුද්ධි තොරතුරු?

පි; ඔව් විශේෂයෙන් බුද්ධි තොරතුරු.

ප්‍ර: කාට ලැබෙන බුද්ධි තොරතුරුද?

පි: පොලිස්පතිතුමාට. ගරු පොලිස්පතිතුමාට

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: පොලිස්පතිතුමාට ආමන්ත්‍රණය කරලා එවනු ලබන බුද්ධි තොරතුරු inward කිරීම සහ outward කිරීම සිදු කරන්නේ S4 කාර්යාලයෙන් ?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔබ මෙම S4 කාර්යාලයේ 2019 අප්‍රේල් මස වන විට කොපමණ කාලයක් පමණ සේවය කරලා තිබුණාද?

පි: අවුරුදු තුනක කාලයක්

ප්‍ර: මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද මොන ආයතන වලින්ද S4 කාර්යාලයට පොලිස්පතිතුමා වෙත ආමන්ත්‍රණය කරලා බුද්ධි තොරතුරු ලැබෙන්නේ?

පි: රාජ්‍ය බුද්ධි සේවාවයි පොලිස් විශේෂ කාර්යාංශය .special branch එක.

ප්‍ර; special branch ,පොලිස් විශේෂ කාර්යාංශයෙන් ඒ දෙකෙන් පමණ ද ලැබෙන්නේ?

පි: බුද්ධි තොරතුරු ඒ දෙකෙන් විතරයි.

ප්‍ර: දැන් ඔය රාජ්‍ය බුද්ධි සේවාව සහ පොලිස් විශේෂ කාර්යංශ special branch ඒ ආයතන දෙකෙන් බුද්ධි තොරතුරු ලැබෙන විට එය ප්‍රථමයෙන්ම ලැබෙන්නේ කාටද?

පි: එය ලැබෙන්නේ පියදර්ශන මහත්මයාට අපේ branch OIC මහත්මයා.

ප්‍ර: කවුද ඒ ප්‍රියදර්ශන කියන්නේ?

පි: අපේ branch එකේ OIC මහත්තයා

ප්‍ර: branch OIC කියන එකෙන් අදහස් වෙන්නේ S4 කියන කාර්යාලයේ භාරව සිටි නිලධාරියා කිවොත් නිවැරදිද?

පි: නිවැරදි ස්වාමිනි.

ප්‍ර: එය ප්‍රථමයෙන් ම ලැබෙන්නේ ප්‍රියදර්ශන මහතාට?

පි: ඇතැම් ලිපි සමහරක් විට SIS එකෙන් ගිහින් දෙනවා IG මහත්තයට දෙන ඒවත් තියෙනවා.

ප්‍ර: ඔබ සඳහන් කරන්නේ ඇතැම් ලිපි රාජ්‍ය බුද්ධි සේවාව විසින් සෘජුවම පොලිස්පතිවරයා වෙත ලබා දෙන බව ?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන් ඔබ මීට කලින් සාක්ෂියක් ලබා දෙමින් කිව්වානේ ලිපි ප්‍රියදර්ශන මහතා වෙත යොමු වෙනවායි කියලා ඒවාත් රාජ්‍ය බුද්ධි සේවාවෙන් ලැබෙන ලිපිද?

පි: ඔව් .

ප්‍ර: ඒ කියන්නේ මම මෙහෙම කිව්වොත් නිවැරදිද? රාජ්‍ය බුද්ධි සේවාවෙන් ලැබෙන ඇතැම් ලිපි සෘජුවම පොලිස්පතිවරයා වෙත යොමු වෙනවා ඇතැම් ලිපි S4 කාර්යාලය භාරව සිටින OIC හරහා පොලිස්පතිවරයා වෙත ලැබෙනවා?

පි: ඔව් නිවැරදියි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර; විශේෂ කාර්යාංශයෙන් ලැබෙන ලිපිත් ඒ ක්‍රියාපටිපාටියට අනුවමද පොලිස්පතිවරයා වෙත යන්නේ ?

පි: විශේෂ කාර්යාංශයේ ලිපි ඇතැම් අවස්ථාවල්වල අපිට භාරදෙනවා එතකොට අපි ඒවා විවෘත කරන්නේ නැහැ. ප්‍රියදර්ශන මහත්මයාට දුන්නාට පස්සේ ප්‍රියදර්ශන මහත්තයා පොලිස්පතිවරයාට ලබා දිලා අපිට අපහු ගෙනත් දෙනවා.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරානේ ඔබගේ සාක්ෂියේ ප්‍රථමයෙන්ම S4 කියන S4 කාර්යාලයෙන් සිදුකෙරෙන මූලික කාර්ය බාර්ය තමයි බුද්ධි තොරතුරු inward කිරීම සහ outward කිරීම ?

පි: නිවැරදියි .

ප්‍ර: දැන් ඔබ සඳහන් කළ ආකාරයට රාජ්‍ය බුද්ධි සේවාවෙන් යම් ලිපියක් සෘජුවම පොලිස්පතිවරයා වෙත හෝ S4 කාර්යාලය භාරව සිටි එවක භාරව සිටි ප්‍රියදර්ශන මහතා වෙත ලැබුණාම එය inward කිරීම සිදුවෙන්නේ කොහොමද ? inward කිරීම ප්‍රියදර්ශන මහතා විසින් සිදු කරනු ලබනවද?

පි: නෑ අපි inward කරන්නේ. අපිත් සමඟ..

ප්‍ර: අපි කියන්නේ ඔබ සමඟ වෙනත් නිලධාරින් ඉන්නවද S4 කාර්යාලයේ ?

පි: S4 කාර්යාලයේ නිලධාරින් 03 දෙනෙක් අනුයුක්තව සිටිනවා ඒ තුන්දෙනාගෙන් එක්කෙනෙකුට ගෙනත් දෙනවා ලිපි ටික inward කරන්න කියලා.

ප්‍ර: කවුද ගෙනත්ලා දෙන්නේ?

පි: ප්‍රියදර්ශන මහත්මයා හෝ තව ඉන්නව අපිත් එක්ක SI මහත්මයෙක් බුද්ධික සමරකෝන් කියලා ඉවරවෙලා ඒ මහත්මයට දුන්නා ට පස්සේ ඒ මහත්මයා අපිට දෙනවා මේ ටික inward කරලා අරන් එන්න කියලා.

ප්‍ර: ඒ කියන්නේ දැන් ඔබ සඳහන් කරානේ රාජ්‍ය බුද්ධි සේවාවෙන් හෝ විශේෂ කාර්යාංශයෙන් ලැබෙන ලිපි වෙත ප්‍රියදර්ශන මහතා හරහා පොලිස්පතිවරයා වෙත යොමුවෙනවා එසේ නැතිනම් සෘජුවම පොලිස්පතිවරයා වෙත යොමුවෙනවා inward කිරීමට එම ලිපි ඔබට ලැබෙන්නේ ඒවා විවෘත කරායින් අනුතුරුවද?

පි: ඔව් විවෘත කරායින් අනතුරුව තමයි අපිට ලැබෙන්නේ.

ප්‍ර: inward කිරීම යනුවෙන් අදහස් වෙන්නේ මොකක්ද?

පි අපේ අපි පවත්වගෙන යනවා ඒකේ එන්ටර් කරගන්නවා.

ප්‍ර: පැහැදිලි නැහැ මහත්මයා නැවත පිළිතුර සඳහන් කරන්න?

පි: Excel මෘදුකාංගය යටතේ අපි හදලා තියෙනවා inward එකක්. ඒ inward එකේ අපි තමා මේක Enter කරන්නේ එහි තොරතුරු. ඒ කියන්නේ එහෙන් එවන අංකය එතකොට ඒ ලිපියේ සඳහන් ශීර්ෂය ඊට අමතරව එවන දිනය. ඒ වගේ category එකක් එකේ තියෙනවා. ඒකට

FAIR COMMENT BY JEZEEM

අපි ඒ inward කරාට පස්සේ ඒකේ අංකයක් අපි ලියනවා Int කියලා උඩින් අංකයක් ලියනවා. ඒ අංකය ලියලා ඉවරවෙලා අපේ සීල් එක ගහනවා මේ date එක. ඒ ගහලා ඉවරවෙලා සර්ට ආපහු ගිහින් දෙනවා.

ප්‍ර: දැන් ඒ කියන්නේ ඔබ මෙම ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නේ ඉන්වරඩ් රෙජිට්‍රර් එකක් Excel මෘදුකාංගයෙන් ms Excel මෘදුකාංගය භාවිතා කරමින් පවත්වාගෙන යන බවත් යම් ලිපියක් ප්‍රියදර්ශන මහතා විසින් inward කිරීමට ඔබට ලැබුණාම එහි තොරතුරු මෙම ms Excel මෘදුකාංගය භාවිතා කරමින් පවත්වාගෙන යනු ලබන Register එකට ඇතුලත් කරලා එම තොරතුර මත මුද්‍රාව තබලා?

පි: ඔව් දින මුද්‍රාව.

ප්‍ර: දින මුද්‍රාව තබලා ඉන් අනතුරුව එයට S4 කාර්යාලයෙන් යම් අංකයක් ලබා දෙන බව ?

පි: ඔව් කාර්යාල අංකයක් තියෙනවා පිළිවෙලට යන

ප්‍ර: S4 කාර්යාලයෙන් ලබා දෙන අංකය ඉන්ට් එහෙමත් නැත්නම් INT යන අකුරු තුන සඳහන්ව තමයි දෙන්නේ ?

පි: S4 කාර්යාලයෙන් Int අංක දෙකක් දෙනවා Int එකට දෙන්නේ Int අංකයක් කරලා ඒක Int කියලා ගහලා ඉවර වෙලා අංකය සහ වර්ෂය සඳහන් කරනවා. ඊට අමතරව අපේ වෙනත් ලිපි ලැබෙනවා. ඒ ලිපිවලට අපි වම් අත පැත්තෙන් හරහාට ලියනවා අංකය සහ වර්ෂය .

ප්‍ර: දැන් රාජ්‍ය බුද්ධි සේවයෙන් සහ විශේෂ කාර්යාංශයෙන් ලැබෙන ලිපිවලට කොහොමද කරන්නේ?

පි: ඒකට දකුණු අත පැත්තෙන් ඉහලින් ලෙටර් හෙඩ් දෙකේම තියෙනවා ලේටර් හෙඩ් එකට සමාන්තරව අපි කට්ටියම එක පැත්තකින් ලියන්නේ දකුණු අත පැත්තෙන් ඉහලින් ලියනවා Int කියලා / ඊට පස්සේ එන අංකය ඊට පස්සේ වර්ෂය.

ප්‍ර: inward කරායින් පසුව ඒ ලිපිය සම්බන්ධයෙන් ඔබ කටයුතු කරන S4 කාර්යාලයෙන් ගන්න පියවර මොනවද?

පි: inward ඒක හදිසි ලිපියක් නම් ඒ වෙලාවේම ඒ මොහොතේම අපි ප්‍රියදර්ශන මහත්තයාට ලබා දෙන්න කටයුතු කරනවා. එතකොට ප්‍රියදර්ශන මහත්මයා ඊට අවශ්‍ය action එක පොලිස් පතිතතුමාත් සමඟ කතා කරලා ඉවර වෙලා අපිට ලබාදෙනවා. දැන් කොපියක් ගන්න ඕනේ නම් කොපි තව යවන්න ඕනේ නම් ගන්න කියලා අපිට කියනවා එහෙම අරන් දුන්නාට පස්සේ ඒකේ Endorsement එක ගහලා පොලිස්පතිතුමා අත්සනක් තැබුවාට පසු අපිට දෙනවා. ඊට පස්සේ අපි සීල් එක ගහලා outward කරලා තමයි යවන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මහත්මයා පැහැදිලි කරන්න නැවත ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න ඔබ දැන් සාක්ෂියෙන් පැහැදිලි කරන්නට යෙදුනු ආකාරයට යම් ලිපියක් ලැබුණායින් අනතුරුව එය inward කිරීමෙන් පසුව නැවතත් එය ඔබ සේවය කරන S4 කාර්යාලයේ OIC ප්‍රියදර්ශන මහතා වෙත ඔබ විසින් ලබා දෙනු ලබනවා.?

පි: නිවැරදියි.

ප්‍ර: ඉන් අනතුරුව ප්‍රියදර්ශන මහතා විසින් එය යම් වෙනත් නිලධාරියකුට එය යොමු කිරීමක් සිදුවෙනවාද ඉදිරිපත් කිරීමක් සිදුවෙනවද?

පි: වෙනත් නිලධාරියෙක් කියන්නේ පොලිස්පතිතුමාට.තමා

ප්‍ර: පොලිස්පතිතුමාට එය ඉදිරිපත් කරනු ලබනවා. ඒ කුමන හේතුවක් සඳහාද පොලිස්පතිතුමා වෙත ඉදිරිපත් කරන්නේ?

පි: ඒ ලිපිය යා යුතු තැන ඒකේ ගන්න ඕන. Action එක සම්බන්ධයෙන් තමයි ඒ පොලිස්පතිතුමා Note එක තියන්නේ.

ප්‍ර: ඔබ සඳහන් කරා Endorsement එකක්?

පි: Endorsement එකක්

ප්‍ර: Endorsement එකක් යොමු කිරීමට ඒ කියන්නේ ගත යුතු පියවර සහ එම පියවර ගත යුත්තේ කා විසින්ද කියන එක සඳහන් කරන්නට පොලිස්පතිවරයා වෙත අදාල රාජ්‍ය බුද්ධි සේවාවෙන් හෝ විශේෂ කාර්යාංශයෙන් ලැබෙන ලිපිය යොමු කරන බව ?

පි: ඔව්.

ප්‍ර: පොලිස්පතිතුමා විසින් Endorsement එකක් යෙදෙව්වායින් අනතුරුව නැවතත් එම ලිපිය S4 කාර්යාලයට පැමිණිමක් සිදු වෙනවද?

පි: ඔව් outward කරන්න අපිට ඒක ආපහු දෙනවා.

ප්‍ර: දැන් ඔය outward කියන එකෙන් මොකක්ද අදහස් වෙන්නේ?

පි: එතනදි අපි inward එකට අමතරව outward කියලා පොතක් තියෙනවා එකෙත් පිළිවෙලට යනවා අංකයක්. ඒ අංකය එතන සඳහන් කරලා ඒ outward එකට අපේ අර හෙඩින් සහ යායුතු තැන සඳහන් කරලා ඉවරවෙලා අපේ සීල් එකක් තියෙනවා ඒකේ SD/IG/out/ S4 කියලා තියෙනවා ඊට අමතරව Space එකක් තියලා 19 තියෙනවා හිස් Space එකේ අපි අර එන අංකය දානවා.

ප්‍ර: ඒ කියන්නේ අනුක්‍රමික අංකය.

පි: අනුක්‍රමික අංකය.

ප්‍ර: ඒ අනුව S4 කාර්යාලයෙන් outward වෙන්නේ ඒ ලිපිය කොහාටද?

පි: විවිධ තැන් වලට පොලිස්පතිතුමා කියලා Endorsement එක ගහලා තියෙන තැන් වලට අපි යනවා.

ප්‍ර: මහත්මයා ඔබ සඳහන් කොා දැන් පැහැදිලි කරන්නට යෙදුනා මෙම ගරු කොමිෂන් සභාවට රාජ්‍ය බුද්ධි සේවයෙන් සහ විශේෂ කාර්යාංශයෙන්

FAIR COMMENT BY JEZEEM

ලැබෙන බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් ගනු ලබන පියවර. මෙම බුද්ධි තොරතුර S4 කාර්යාලයේ යම් ස්ථානයක එහි පිටපතක් ගබඩා කිරීමක් සිදුවෙනවද?

පි: පිටපත් අපි තියාගන්නේ නැහැ ඒක PDF ආකාරයෙන් පරිගනක ගත කරලා තමයි තියාගන්නේ.

ප්‍ර: ඒ කියන්නේ එය මෘදු පිටපතක් soft copy එකක් විදියට තියාගන්නවා කිව්වොත් නිවැරදියි?

පි: නිවැරදියි.

ප්‍ර: ඒ මෘදු පිටපතකට හැරවීම සිදුවන්නේ මොන අවස්ථාවේද ?

පි: බැහැර කරන අවස්ථාවේ. ඒ කියන්නේ පොලිස්පතිතුමා විසින් Endorsement එක මේවා කරාට පස්සේ අපි සීල් එක ගහලා පොලිස්පතිතුමාගේ ඊට පස්සේ outward අංකය දාලා දැම්මයින් පස්සේ අපි අවශ්‍ය පිටපත ලබා ගන්නවා.

ප්‍ර: ඒ කියන්නේ ඒ අදාල ලේඛනයේ අදාළ බුද්ධි තොරතුර තිබෙන ලේඛනය scan කිරීමක් සිදු කරලා එය පරිගණකගි ගබඩා කිරීමක් සිදුවෙනවා?

පි: කරනවා.

ප්‍ර: දැන් මහත්මයා ඔය එහෙම විශාල ප්‍රමාණයක් බුද්ධි තොරතුරු ලැබෙනවා ඇත්තේ S4 කාර්යාලයට?

පි: ඔව්

ප්‍ර: මේ තොරතුරු ගබඩා කරන්නේ මොකක්ද ක්‍රමවේදය මෙහි යම් අවස්ථාවක මෙය නැවත ලබා ගන්නට යම් ක්‍රම වේදයක් තිබෙනවද S4 කාර්යාලයේ?

පි: අපි වෙනම Excel එකක් තියෙනවා. ඒකේ inward එකයි outward එකයි දෙකම තියෙනවා.

ප්‍ර: දැන් පැහැදිලි කරන්න ඔබ සඳහන් කරා inward රෙජිස්ටරයක් යනුවෙන් Excel මෘදුකාංගයේ යම් රෙජිස්ටරයක් පවත්වාගෙන යනවා කියලා?

පි: තියෙනවා.

ප්‍ර: Outward Register යනුවෙන් Excel මෘදුකාංගයේ වෙනම රෙජිස්ටරයක් පවත්වාගෙන යනවා?

පි: තියෙනවා.

ප්‍ර: ඔබ දැන් සාක්ෂියේදී සඳහන් කරන්නට යෙදුනේ කුමක් සම්බන්ධයෙන්ද?

පි: ඒ inward සහ outward දෙකට අමතරව තව Excel එකක් තියෙනවා ඒකේ inward එකයි Excel එකයි දෙකම සඳහන් වෙනවා. එතකොට ඊට අමතරව ඒකේ hyper link එකක් කරලා තියෙනවා අර අපි outward කරන එකේ scan කරලා ගන්න එකේ link එකක් දා ගන්න. එතකොට

FAIR COMMENT BY JEZEEM

අපි එක ලියුමක් අපිට ආවොත් ඒ ලියුම ඒකේ සම්පූර්ණ විස්තරයක් inward කිරීම සහ outward කිරීමත් ගන්න පුළුවන් එකම sheet එකෙන්. ඊට අමරතව PDF එක තියෙන තැනින් අපිට hyper link එකෙන් පෙන්වනවා.එතකොට Computer තිරයේ දිස්වෙනවා අර එබුව ගමන්ම. අපිට ඊට පස්සේ print ගන්න පුළුවන්.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරන ආකාරයට වෙනම Excel sheet එහෙමත් එකක් නැත්නම් වෙනම Excel මෘදුකාංගයේ sheet එකක් පවත්වාගෙන යනු ලබනවා මේ තොරතරු සම්බන්ධයෙන් ලැබෙන බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් දත්ත ගබඩා කරලා ?

පි: ඔව්.

ප්‍ර: ඒ Excel sheet එකට ලැබෙන සියලුම බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් ඇතුලත් කිරීමක් සිද්ධ වෙනවාද?

පි: තියෙනවා.

ප්‍ර: ඒ ඔබ සඳහන් කරන්නට යෙදෙන පොදු Excel sheet එකේ ඔබට සඳහන් කරන්නට පුළුවන්ද යම් බුද්ධි තොරතුරක මොන මොන දත්තයන්ද ඇතුලත් කරන්නේ කුමන ශීර්ෂ යටතේ ද දත්ත ඇතුලත් කරන්නේ?

පි: පළවෙනි එක තියෙනවා අපේ IN අංක S4 කාර්යාලයේ IN අංකයක් තියෙනවා.

ප්‍ර: මහත්මයා දැන් සඳහන් කරානේ ඔබේ පිළිතුරක ඔබ විසින් යම් පොදු Excel sheet එකට inward සහ outward අංක දෙකම යොදලා hyper link එකක් මාර්ගයෙන් බුද්ධි තොරතුරේ මෘදු පිටපත යා කරලා තිබෙනවා කියලා ඒ Excel sheet එකට?

පි: නිවැරදියි .

ප්‍ර: එමෙන්ම ඔබ සඳහන් කරා එහි වෙනත් තොරතුරුත් ඇතුලත් කරනවායි කියලා ඒ අදාල බුද්ධි තොරතුර හදුනා ගැනීම සඳහා?

පි; ඔව්.

ප්‍ර: දැන් එලෙස ඇතුලත් වෙන්නේ මේ පොදු Excel sheet එකට ඇතුලත් වෙන්නේ ඔබ විසින් inward කිරීමට යෙදුනු බුද්ධි තොරතුරු පමණයි ?

පි: ඔව්.

ප්‍ර: ඔබ මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් කිව්වා සමහරක් බුද්ධි තොරතුරු රාජ්‍ය බුද්ධි සේවාව මගින් සෘජුවම පොලිස්පතිතුමා වෙත යොමු කිරීමක් සිදුවෙනවායි කියලා?

පි ඒ කියන්නේ SIS එකේ කට්ටිය ලියුම් අරන් ආවයින් පස්සේ ඒ කට්ටිය අපේ ඔපිස් එක තමයි පාස් කරන් යන්න ඕනේ. එතකොට ඒ කට්ටිය කියනවා අපි එහා පැත්තට ලියුම් භාර දෙනවා කියලා ඉවරවෙලා. ඒ කරලා ඉවරවෙලා ආපහු භාර දීලා එන ගමන් කියනවා අහවල් ලියුම පොලිස්පතිතුමාට හරි ප්‍රියදර්ශන මහතාට හරි අපි භාර දුන්නා මේකේ

FAIR COMMENT BY JEZEEM

අත්සන් කරලා දෙන්න කියලා. එතකොට අපි අත්සන් කරලා දෙනවා අංකයන් බලලා ඉවර වෙලා .

ප්‍ර: ඒ කියන්නේ ඔබ මුලින්ම කිව්ව ආකාරයට සෘජුවම පොලිස්පතිවරයා වෙත රාජ්‍ය බුද්ධි සේවාවෙන් හෝ විශේෂ කාර්යාංශයෙන් යම් බුද්ධි තොරතුරක් ගියත් එය inward කිරීමක් සිදුවෙනවා S4 කාර්යාලයෙන් ?

පි: පොලිස්පතිතුමා ප්‍රියදර්ශන මහත්මයාට දුන්නාම ප්‍රියදර්ශන මහත්මයා අපිට ගෙනත් දුන්නොත් අපි inward කරනවා.

ප්‍ර: ඔබ සේවය කරන අවස්ථාවන් වලදී ඔබට මෙවැනි සිදුවීම් වලට මුහුණ දෙන්න සිදුවෙලා තියෙනවද? ඒ කියන්නේ inward වෙලා නැති යම් ලේඛණයක් ඔබට ලැබී තිබෙනවද පොලිස්පතිතුමාගෙන්? outward කිරීම සඳහා?

පි: outward කිරීමට inward කර නැති ඒවා ලැබිලා තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ S4 කාර්යාලය හරහා නොගිය ලේඛන හෝ බුද්ධි තොරතුරු පොලිස්පතිතුමාගේ අපදෙස් සමඟ outward කිරීම සඳහා ඔබගේ කාර්යාලයට ලැබිලා තිබෙනව ද?

පි: ලැබිලා තියෙනවා.

ප්‍ර: එයින් ගම්‍ය වෙන්නේ අදාළ තොරතුර සෘජුවම රාජ්‍ය බුද්ධි සේවාව හරහා පොලිස්පතිවරයා වෙත ලිය බවයි ද?

පි: ඔව්.

ප්‍ර: දැන් මහත්මයා ඔබ සඳහන් කරානේ රාජ්‍ය බුද්ධි සේවාවෙන් සහ විශේෂ කාර්යාංශයෙන් ලැබෙන තොරතුරු යම් පොදු Excel sheet එකකට යොමු කරනු ලබනවා. දත්ත ඇතුලත් කරනු ලබනවා ඊට අමතරව අදාල තොරුතුරේ මෘදු පිටපතක PDF එක ඇමුණුක් වශයෙන් hyper link එකක් මාර්ගයෙන් එම Excel sheet එකේම සඳහන් කරනු ලබනවා?

පි නිවැරදියි .

ප්‍ර: දැන් යම් අවස්ථාවක ඔබට උපදෙසක් ලැබුණොත් යම් කණ්ඩයමක් සම්බන්ධයෙන් හෝ යම් පුද්ගලයෙක් සම්බන්ධයෙන් තියෙන සියලුම බුද්ධි තොරතුරු ගොනු කර ලබා දෙන ලෙසට එය සිදුවෙන්නේ මොන ආකාරයෙන්ද? මගේ ප්‍රශ්නය තේරුණාද?

පි: තේරුණා.

ප්‍ර: (නැවත සකස් කර ප්‍රශ්නය අසයි) දැන් ඔය පොදු Excel sheet එකට ඇතුලත් කර තිබෙන දත්ත අතුරින් යම් කණ්ඩායමක් සම්බන්ධයෙන් හෝ යම් සිදු වීමක් සම්බන්ධයෙන් හෝ යම් පුද්ගලයකු සම්බන්ධයෙන් වන සියලුම තොරතුරු සොයා ගැනීමේ හැකියාවක් තියෙනවාද?

පි: තියෙනවා.

ප්‍ර: කොහොමද එය හොයා ගන්නේ?.....

FAIR COMMENT BY JEZEEM

පි: අපි වර්ෂවලට වර්ෂයෙන් වර්ෂයට කාණ්ඩ වෙනම පවත්වාගෙන යන්නේ. එතකොට අපිට දින වකවානුවක් දුන්නොත් වසර කිහිපයක් එහෙම වුනොත් 2017,2018,2019 වුනොත් එහෙම අපි 19 එක open කරලා ඉවරවෙලා 19 වර්ෂයේ Excel එක ඒකේ අපි හෙඩින් එක තියෙනවා හෙඩින් එන්ටර් කරන තැන. එතන උඩින් Filter එකක් දෙනවා අපට දෙන තොරතුර අනුව ඒ කියන්නේ අපිට සහරාන් සම්බන්ධයෙන් හොයන්න කියලා කිව්වොත් උඩින් අපි සඳහන් කරනවා සහරාන් කියලා ඒ Filter එකේ එතකොට සහරාන් සඳහන් කරලා තියෙන Heading සෙට් එක Filter වෙනවා.

ප්‍ර: ඒ කියන්නේ දැන් පොදු Excel sheet එකට හෙඩින් එක වශයෙන් ඔබ අදහස් කරේ මොකේ හෙඩින් එකද ඔය දාන්නේ?

පි: ලිපි ශීර්ෂය ලිපියේ මාතෘකාව.

ප්‍ර: ඒ කියන්නේ ලැබෙන බුද්ධි තොරතුරු සඳහන් වෙන ලිපියේ මාතෘකාව ලිපි ශීර්ෂය ?ඒක තමයි ඔබ Excel sheet එකට Enter කරන්නේ දත්ත ඇතුලත් කරන්නේ?

පි: ඔව්.

ප්‍ර: දැන් අපි උදාහරණයක් වශයෙන් ගත්තොත් සහරාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් තිබෙන සියලුම බුද්ධි තොරතුරු ලබා දෙන ලෙසට ඔබට යම් උපදෙසක් ලැබුණොත් ඔබ සඳහන් කරා Filter එකක් මාර්ගයෙන් සහරාන් යන නම ඇතුලත් කරලා එය Filter කිරීමෙන් සහරාන් යන පුද්ගලයාට අදාල සියලුම ලිපි ඔබට ලබා ගැනීමේ හැකියාවක් තිබෙන බව?

පි: තියෙනවා.

ප්‍ර; දැන් ඔබ ඒ වගේම සඳහන් කරා වර්ෂ වශයෙන් වෙන් කරලා තමයි මේ Excel sheet පවත්වාගෙන යන්නේ කියලා ?

පි: ඔව්.

ප්‍ර: අපි කලින් උදාහරණයම ගත්තොත් සහරාන් සම්බන්ධයෙන් 2019 වර්ෂයේ පමනක් නෙමේ ඊට කලින් වර්ෂවල තියෙන තොරතුරුත් ගන්න ඔන්නම් ඒක කොහොමද කරන්නේ?

පි: අපි ඒ වර්ෂයට අදාල Excel එක open කර ගන්න ඕනේ. ඊට පස්සේ අර විදියට Filter කර ගන්න ඕනේ.

ප්‍ර: ඒ ඔබ සඳහන් කරන්නේ ඔබට දින වකවානුවක් සඳහන් වෙමින් උපදෙස ලැබුණොත් ?

පි: නිවැරදියි .

ප්‍ර: දින වකවානුවක් නැතිව නම පමණක් සඳහන් වෙලා උපදෙස ලැබුණොත් කොහොමද ඒ නමට අදාල තොරතුරු හොයා ගන්නේ?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි: අපි වර්ෂයකටම අදාල දෙයක් නම් ඒ වර්ෂය විරතක් හොයනවා නැත්නම් ඒක අපේ මතකය හැටියට වර්ෂ කිහිපයක නම් අපි ඒ විදියට Filter වර්ෂ කිහිපමය බලනවා ඒ විදියට Filter කරලා ඉවරවෙලා.

ප්‍ර: දැන් ඔය පොදු Excel sheet එකේ යම් ස්ථානයක සඳහන් කරනවද පොලිස්පතිතුමා විසින් තබා තිබෙන Endorsement එක අනුව අදාල බුද්ධි තොරතුර කා හට ද නැවත යොමු කරලා තියෙන්නේ කියලා?

පි: නිවැරදියි අපි සටහන් කරලා තියෙනවා.

ප්‍ර: එහෙම සටහන් වීමක් වෙනවා. ඊට අමතරව සටහන් වෙනවා ද එම බුද්ධි තොරතුර පොලිස්පතිතුමා වෙත එවන්නේ කුමන ආයතනයකින්ද කියලා?

පි: සටහන් කරලා තියෙනවා.

ප්‍ර: දැන් ඔබට මෙහෙම සඳහන් කරොත් උදාහරණයක් වශයෙන් 2019 ජනවාරි 01 වන දින රාජ්‍ය බුද්ධි සේවාවෙන් යම් තොරතුරක් පොලිස්පතිතුමා වෙත ලැබෙනවා. එය දැනටමත් ඔබ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කල ආකාරයට S4 කාර්යාලයේ inward වුනායින් අනතුරුව නැවත outward වීමක් සිදුවෙනවා ත්‍රස්ත විමර්ශන කාර්යාංශයේ අධ්‍යක්ෂක වෙතට. එයින් එම outward වීමේදී එය outward කිරිමේදී පොලිස්පතිවරයා විසින් ඔහුගේ Endorsement එකේ සඳහන් කර තිබෙනවා. 2019 පෙබරවාරි මස 01 වන දින වන විට එම බුද්ධි තොරතුර සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙසට. ඔබට මගේ ප්‍රශ්නය පැහැදිලියිද?

පි: තේරුණා.

ප්‍ර: දැන් 2019 පෙබරවාරි මස 01 වෙනි දින ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයෙන් මා මුලින් සඳහන් කල ලිපියට අදාලව ලැබෙන ඒ වාර්තාව ලැබුණාම එය කලින් ලැබුණු SIS වාර්තාව සමඟ යා කෙරෙන්නේ කොහොමද ඔය Excel sheet එකේ?

පි: ඒ Excel sheet එකේ දෙවනි තීරුවේ තියෙනවා පෙර යොමු අංකය කියලා. ඒ පෙර යොමු අංකයට දාන්නේ අපි කලින් outward කරලා අපෙන් බැහැර වුන අංකය තමයි දාන්නේ

ප්‍ර: දැන් ඔය මොන ලිපිය සම්බන්ධයෙන්ද ඔබ කතා කරන්නේ? පළමුවෙනි SIS ලිපිය සම්බන්ධයෙන් ද නැත්නම් දෙවනුවට එන TID වාර්තාව සම්බන්ධයෙන්ද?

පි: දෙවනුවට එන.

ප්‍ර; දෙවනුවට එන TID වාර්තාව ?

පි: ඔව්.

ප්‍ර: ඒකේ පෙර යොමු අංකයක් තියෙනවා?

FAIR COMMENT BY JEZEEM

පි: ඒක ඒ කට්ටිය TID එකෙන් අපට එවද්දි ඒ කට්ටිය සඳහන් කරනවා පොලිස්පතිතුමාගේ අභවල් දරණ අංකය යටතේ අභවල් දිනැති ලිපිය ඒකට පිළිතුරු කියලා. ඊට පස්සේ ඒක බැලුවායින් පස්සේ අපි ඒක පෙර අංකය ලෙස ට අපි Excel එකේ සඳහන් කරනවා ඒ අංකය.

ප්‍ර: ඒ කියන්නේ මහත්මයා දැන් TID එකෙන් එන වාර්තාව Inward කරන කොට එහි පෙර අංකය වශයෙන් සඳහන් කරන්නේ ප්‍රථමයෙන්ම දුන්නු SIS වාර්තාවේ Outward අංකය එහෙමද?

පි: නිවැරදියි

ප්‍ර: ඒ අනුව තමයි මෙම ලිපි දෙකෙහි යම් සම්බන්ධතාවයක් තිබෙන බවට මෙම දත්ත ගබඩාවෙන් සොයාගත හැක්කේ ඒ ආකරයෙන් පෙර යොමු අංකය භාවිතා කරමින් ?

පි: නිවැරදියි.

ප්‍ර: දැන් එම උදාහරණය මතම ගිහින් මම ඔබෙන් මෙහෙම ප්‍රශ්නයක් ඇහුවොත් පොලිස්පතිවරයා වෙත දැනගන්නට අවශ්‍ය නම් ඔහු විසින් කැඳවා තිබෙන වාර්තාවන් ලැබීමට නියමිත දිනයන් කවදද කියලා ඒ සම්බන්ධයෙන් සොයා බැලීමේ හැකියාවක් මේ Excel දත්ත ගබඩාව තුල තිබෙනවාද?

පි: තියෙනවා අපි Outward කරන පැත්තට වෙන්න අවසානේ මේ hyperlink එකට වම් අත පැත්තෙන් සඳහන් කරලා තියෙනවා ලිත් දිනය කියලා ඒ ලිත් දිනයට පොලිස්පතිතුමා විසින් දෙන ලිත් දිනයට අපි enter කරලා තියෙනවා.

ප්‍ර: ඒ අනුව වාර්තා කැඳවීමක් වුනොත් යම් දිනයකට අදාලව ලැබීමට නියමිත වාර්තාවන් මොනවද කියලා එය සොයාගෙන ලබා දීමේ හැකියාවක් ඔය දත්ත ගබඩාවට තියෙනවාද?

පි: තියෙනවා.

ප්‍ර: දැන් මහත්මයා මෙම ගරු කොමිෂන් සභාවේ විමර්ශන අංශය විසින් යම් අවස්ථාවක S4 කාර්යාලයට පැමිණ ඔබ දැන් මේ ගරු කොමිෂන් සභාවට සාක්ෂි ලබා දෙමින් සඳහන් කරන්නට යෙදුනු Excel දත්ත ගබඩාවන් නිස්සාරණය කරනු ලැබූ දත්ත කොටසක් ලබා ගැනීමක් සිදුවුනාද?

පි: සිදුවුනා.

ප්‍ර: එහිදි ඔබට ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න පුළුවන්ද මොන කරුණුවලට අදාල දත්ත ද එලෙස ඔවුන් ලබා ගත්තේ කියලා?

පි: වර්ෂ තුනකට 2017,2018,2019 කියන ඒ වගේ Excel වලින් මට කිව්වා මුස්ලිම් කියන ශීර්ෂය යටතේයි සහරාන් තවත් කරුණු හතරක් දුන්නා මට මතක නැහැ දෙකක් ඒ කරුණු 4 යටතේ තමා මට filter කරගෙන අරන් එන්න කිව්වේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර; මා ඔබට සඳහන් කරොත් අන්තවාදී කණ්ඩායම්, මුස්ලිම්, සහරාන්, තවුහිද් යන ශිර්ෂ හතර යටතේ තිබෙන දත්ත තමයි ලබා ගත්තේ කියලා ඔබට එය පිළිගැනිමේ හැකියාවක් තියෙනවද?

පි: නිවැරදියි.

ප්‍ර: එම දත්ත ලබා ගත්තේ කවදද?

පි: කාලවකවානුව මතක නැහැ.

ප්‍ර; මා ඔබට සඳහන් කරොත් එය ලබා ගනු ලැබුවේ 2020. පළමු මස 13 වෙන දින කියලා ඔබට එය පිළිගැනිමේ හැකියාවක් තියෙනවද?

පි: පිළිගත හැකියි.

ප්‍ර: එය කුමන ආකාරයකින් ද එම දත්ත ලබා දුන්නේ ?

පි: CD තැටියකින්.

ප්‍ර: ඒ CD තැටිය ඔබට මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ දුටුවොත් නැවත හඳුන ගන්න පුළුවන්ද?

පි: ඒක computer මතක විදියට මේගාබයිට් 318 ප්‍රමාණයක් තිබ්බේ.

ප්‍ර: එය නැවත දුටුවොත් ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි: පුළුවන්.

**ස්වාමිනි මේ අවස්ථාවේදී CD තැටියක් සාක්ෂිකරු වෙත පෙන්වයි.**

ප්‍ර: සාක්ෂිකරු ඔබට හඳුනා ගැනිමට හැකියාවක් තිබෙනවාද මෙම CD තැටියේ අන්තර් ගතව තිබෙන දත්ත ප්‍රමාණය සම්බන්ධයෙන්?

පි: පැහැදිලිව පේන් නැහැ මට 318 ක වෙනවා වගේ තමයි මට මතක හැටියට

ප්‍ර: එම CD තැටියේ MB 360ක ප්‍රමාණයක් තිබෙනවායි කිව්වොත් ඔබට එය පිළිගන්න පුළුවන්ද?

පි: පිළිගන්න පුළුවන්.

ප්‍ර: දැන් සාක්ෂිකරු මෙම CD තැටිය තුල 2017,2018,2019 වශයෙන් folder තුනක් අන්තර්ගතව තිබෙනවා?

පි: නිවැරදියි.

ප්‍ර: එයට ඔබ ඇතුලත් කරනු ලැබුවේ අදාල වර්ෂවලදි කලින් සඳහන් කරන්නට යෙදුනු filters භාවිතා කරමින් ලබාගත් දත්තයන්ද ?

පි: නිවැරදියි .

ප්‍ර: ඒ වර්ෂ තුන වශයෙන් තියෙන්නේ ඒ තොරතුරු ලැබුණු වර්ෂයන් කිව්වොත් නිවැරදිද?

පි: නිවැරදියි.

**ස්වාමිනි මේ අවස්ථාවේදී 2019 වශයෙන් සඳහන් වෙන folder විවෘත කර සාක්ෂි කරු වෙත පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා.**

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් 2019 folder තුල Attachment File යනුවෙන් තවත් folder සහ Excel Sheet එකක් දර්ශනය වෙනවා Attachment File එක තුල තියෙන්නේ මොනවද?

පි: Outward කිරිමේ දී ලිපි අපි scan කරනවා ඒ scan PDF ආකාරයෙන් තමයි save කරලා තියෙන්නේ එතැන.

ප්‍ර: දැන් ඔබ අර සඳහන් කරන්නට යෙදුනු මෘදු පිටපත් ගබඩා කර තිබෙන්නේ ඇටැච්මන්ට් කියලා සඳහන් වෙන folder එකේ ?

පි: ඔව්.

ප්‍ර: එතකොට එතන Excel sheet එක වශයෙන් තියෙන්නේ මොකක්ද ?

පි: Excel Sheet එක තියෙන්නේ Inward එකයි Outward එකයි දෙකෙන්ම තොරතුරු අන්තර්ගත කරලා අපේ පහසුවට අපි මේවා කරලා තියෙන්නේ.

ප්‍ර; දැන් මහත්මයා Excel Sheet එකේ ඔබට සඳහන් කිරිමට හැකියාවක් තියෙනවද ශිර්ෂ වශයෙන් තියෙන්නේ මොනවද කියලා?

පි: අපිට ලිපි ලැබෙද්දි වම් අත පැත්තට වෙන්න තියෙන්නේ ලිපි ලැබෙන පළවෙනි තීරුවේ තියෙන්නේ ලිපි ලැබීම සම්බන්ධයෙන් අපේ අංකය. ඊට පස්සේ පෙර යොමු අංකය තියෙනවා.

ප්‍ර: දැන් සාක්ෂිකරු පැහැදිලි කරන්න ඔබ සඳහන් කරා වම් අත කෙළවරේම තිබෙන තීරුවේ දක්වා තිබෙන්නේ S4 කාර්යාලයෙන් ලබා දෙන අංකය වශයෙන්?

පි: ඔව්.

ප්‍ර: දැන් මේ රතු තිත තිබෙන තීරුව තමයි ඔබ සඳහන් කරන ආකාරයට S4 කාර්යාලයෙන් ලබා දෙන අංකය ඇතුලත් වෙන තීරුව ?

පි: කෙලවරේම තියෙන අංකය S4 කාර්යාලයෙන් ලබා දෙන අංකය

ප්‍ර: දෙවනුවට තිබෙන තීරුවේ මොනවද තිබෙන්නේ?

පි: පෙර යොමු අංකය.

ප්‍ර; ඔබ මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් පෙර ලේඛන පසු ලේඛන සමඟ යා කරන පෙර යොමු අංකය සඳහන් වෙන්නේ දෙවන තීරුවේ තුන්වන තීරුවේ තිබෙන දත්තයන් මොනවද?

පි තුන් වෙනි තීරුවේ තියෙන්නේ අපිට ලියුම එවන එක් කෙනාගේ Outward අංකය ඒ කියන්නේ SIS එකෙන් ලැබෙනවානම් ඒ කට්ටිය Outward කරන්න යොදා ගන්න අංකය තමයි ඒ තියෙන්නේ.

ප්‍ර; 4 වන තීරුවේ?

පි: 4 වෙන තීරුවේ අපිට ලැබෙන්නේ කාගෙන්ද කියලා SIS නම් SIS, special branch නම් special branch වශයෙන්?

ප්‍ර: 5 වන තීරුවේ සඳහන් වන දත්ත මොනවද?

පි: අපිට ලැබුණු දිනය.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: S4 කාර්යාලයට ලැබුණු දිනය?

පි: දිනය.

ප්‍ර; ඉන් අනතුරුව තිබෙන තීරුවේ?

පි: ලිපියේ ශීර්ෂය ඒ කියන්නේ හෙඩින් එක තමයි තියෙන්නේ.

ප්‍ර: හෙඩින් එකට පස්සේ තියෙන තීරුවේ මොනවද තියෙන්නේ?

පි: එතනින් පස්සේ Outward කිරීම සඳහා යොදාගන්න තීරුව තියෙන්නේ එතන තියෙන්නේ අපේ Outward අංකය තියෙන්නේ. එතකොට ඊට පස්සේ දිනය තියෙනවා .

ප්‍ර: ඒ කියන්නේ එය S4 කාර්යාලයෙන් Outward වන දිනය?

පි; Outward වන දිනය. ඊට පස්සේ යන තීරුව යවන තැන ඊළඟට ලිත් දිනය තියෙනවා .

ප්‍ර: දැන් යවන තැන වශයෙන් ඔබ අදහස් කරන්නේ පොලිස්පතිතුමාගේ endorsement එක අනුව අදාල තොරතුර කා වෙත ද යොමු කර තිබෙන්නේ කියන එක?

පි: නිවැරදියි.

ප්‍ර: ඉන් අනතුරුව තියෙන තීරුවේ සඳහන් වෙන්නේ මොනවද?

පි: ලිත් දිනය තියෙන්නේ.

ප්‍ර: ලිත් දිනය වශයෙන්?

පි: ලිත් දිනයක් ඉල්ලා සිටියොත් අපි එතන සඳහන් කරනවා පොලිස්පතිතුමාගෙන් සඳහන් කරන ලද ලිත් දිනය.

ප්‍ර: ඔබ සඳහන් කරේ ඒ අදලා බුද්ධි තොරතුරු යවන ලද ස්ථානයෙන් යම් වාර්තාවක් හෝ වෙනත් යමක් කැඳවීමට පොලිස්පතිවරයා විසින් දිනයක් ලබා දී තිබෙනවා නම් එය ලිත් දිනය තීරුවේ සඳහන් වන බව?

පි: නිවැරදියි .

ප්‍ර: ලිත් දිනයට පසුව තිබෙන තිරුවේ මොනවද සඳහන් වෙන්නේ?

පි: පසුව තිබෙන තීරුවේ අපි Attachment එක link කරලා තියෙනවා hyperlink මාර්ගයෙන්.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරන්නේ මේ තොරතුරු ඇතුලත් කර තිබෙන බුද්ධි තොරතුරේ මෘදු පිටපත hyperlink එකක් මාර්ගයෙන් මෙම තීරුවේ දක්වා තිබෙන බව

පි: ඔව්.

ප්‍ර: මේ hyperlink එකක click කරොත් එය අදාල මෘදු පිටපත පෙන්වා දීමක් සිදුවෙනවද?

පි: ඔව් නිවැරදියි.

**ස්වාමිනි මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් සාක්ෂි ලබා දෙන අදාල Excel sheet එකේ පළමුවන දත්ත ඇතුලත් වෙන පලමු වන පේළියේ ඇති Hyperlink එක මත click කර එහි ශීර්ෂය වශයෙන් ජාතික තවුහිද්**

FAIR COMMENT BY JEZEEM

**ජමාත් නායක මොහොමඩ් සහරාන් විසින් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන බවට ලද තොරතුරක් සම්බන්ධව වශයෙන් සඳහන් වන ලිපි එම පේළියේ තිබෙන hyperlink එක මත click කර ගරු කොමිෂන් සභාවට දිස්වන ආකාරයට පෙන්වීමට ගෞරවයෙන් ඉල්ලා සිටිනවා**

ප්‍ර; දැන් මහත්මයා ඔබට මේ තීරයේ දිස්වෙනේ Excel Sheetඑකේ තිබුණු පළමු වන පේළියට අදාලව ඒ අදාල තොරතුර ඇතුලත් කර S4 කාර්යාලයට ලැබුණු ලේඛනයද?

පි: ඔව්/.

ප්‍ර: එය ස්කෑන් කර පරිගනකය තුල ගබා කර ගත්ත මෘදු පිටපතක් තමයි මෙයින් දිස්වෙන්නේ.

පි නිවැරදියි.

**ස්වාමිනි මේ අවස්ථාවේදි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන්නට යෙදුනු CD තැටිය C847 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.**

ප්‍ර: දැන් hyperlink එක දක්වන තීරුවට පස්සේ Excel sheet එකේ වෙනත් තීරු තිබෙනවද දත්ත ඇතුලත් කරනු ලබන?

පි: අපි එක තිරුවක් තියෙනවා . වෙනත් කිවයුතු කරුණු කියලා. ඒකේ බොහෝ දුරට අපට CD එකක් ආවොත් එහෙම ඒ DVD පටයක් හැර CD එකක මෙගා බයිට් ප්‍රමාණය අඩු හින්දා ඒක අපි කොපි කරලා ඉවර වෙලා ඔතන link කරනවා අපිට හදිසියට ඕන වුනොත් නැත්නම් අපිට වෙනත් මොනවාහරි කියන්න අපි ලිපි බැහැර කරනවා වෙනත් තැනකට ලිපි බැහැර වෙලා තිබුනොත් Inward අංකයෙන් බැහැර කරනවා නම් ඒකේ සඳහන් කරනවා මෙහෙම Inward office අංකයෙන් අහවල් office එකට දුන්නා කියලා ඉවර වෙලා

ප්‍ර: ඒ කියන්නේ වෙනත් විශේෂ කරුණු ඒ ලිපිය සම්බන්ධයෙන් වෙනත් විශේෂ කරුණු දක්වන්නට අවසාන තීරුව භාවිතා කරනවා?

පි: භාවිතා කරනවා.

ගරු මැතිතුමණි මේ අවස්ථාවේදී C 847 වශයෙන් ලකුණු කරන්නට යෙදුනු CD තැටිය තුල 2017, 2018, 2019 වශයෙන් folder තුනක් දිස්වෙනවා එහි 2017 folder ය තුල තිබෙන Excel Sheet එක (නැවත ප්‍රශ්නය සකස් කර ඉදිරිපත් කරයි)

ප්‍ර: ගරු මැතිතුමණි C 847 CD තැටිය තුල තිබෙන folders තුන අතුරින් 2019 folder තුල තිබුණු Excel Sheet එක C 847 A වශයෙන් ලකුණු කිරීමටත් එහි මුද්‍රිත පිටපත C 847 A වශයෙන් ලකුණු කිරීමටත් C 847

FAIR COMMENT BY JEZEEM

තිබුණු CD තැටිය 2018 වර්ෂය සඳහා වන folder තුල තිබෙන Excel sheet එකේ මුද්‍රිත පිටපත C 847 B වශයෙනුත්

ප්‍ර: දැන් සාක්ෂිකරු 2017 වර්ෂයේ folder විවෘත කරාම ඒ තුල Excel Sheet තුනක් දිසවෙනවා ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ExcelSheet තුනේ මොනවද තියෙන්නේ කියලා?

පි: 2017 මැද වර්ෂයේදී IT එක හරහා අපිට වෙනම Software එකක් හඳුන්වලා දුන්නා. ඒක අපේ තිබ්බ කාර්ය බහුලතාවය මත ඒක අපිට පරිහරණය කරන්න බැහැ. අපි පුරුදු වෙලා තිබ්බේ මේ Excel එකට ඊට පස්සේ පළවෙනිම Excel එක තියෙන්නේ අපි පවත්වාගෙන ගියපු එක. ඊට පස්සේ දෙවනි එක තියෙන්නේ අර අපිට හඳුන්වලා දුන්නු මෘදුකාංගයෙන් නැවත අපිට ලබා දුන්නා මේ Excel එකට පරිවර්තය කරලා දුන්නා නැවත IT එක ඒ කොටසයි ඊට පස්සේ අපි නැවත 2017.05 වෙනි මාසේ සිට continue මේ විදයට හදපු ටික තමයි තියෙන්නේ.

ප්‍ර: නැවත පැහැදිලි කරන්න සාක්ෂිකරු පළමුවෙන්ම තිබෙන Excel Work sheet එකෙහි තිබෙන්නේ ඔබලා විසින් පවත්වා ගෙන යන්නට යෙදුණු Excel මෘදුකාංගය හරහා ගබඩා කර තිබුණු Excel sheet එක?

පි: නිවැරදියි.

ප්‍ර: දෙවනුවට තියෙන්නේ මොකක්ද ඒ Excel sheet එකේ මොනවද තියෙන්නේ?

පි: දෙවනුවට තියෙන්නේ ITඑක හරහා Access point උපයෝගී ඉතුරු කරගෙන අපිට හදලා දුන්නා Software එකක්. ඒකෙත් Inward Outward එක කරන්නේ. නමුත් ඒක අපිට කරන්න බැරිවුනා. අපහසු වුනා ලියුම් ගොඩ ගැහුනා. ඊට පස්සේ අපි කිව්වායින් පස්සේ අපේ ස්ථානාධිපතිතුමාට නැවත අරකට අපි පෙර කරපු Excel එකට කරන්න කියලා කිව්වා. දෙවනුව තියෙන්නේ ඒකෙන් filter කරලා අපිට නැවත හදලා දුන්නා දැන් IT එකේ.

ප්‍ර; තුන් වනුවට තියෙන්නේ මොකක්ද Excel sheet එකේ?

පි; නැවත අපි Excel sheet එක ආරම්භ කරා ඊට පස්සේ ආයේ අර පරණ එක ඒකේ ඉතුරු ටික.

ප්‍ර: දැන් සාක්ෂිකරු 2017 වර්ෂය සඳහා තිබෙන Excel sheet තුන අතුරින් එකක 2017 වර්ෂයේ සම්පූර්ණ ලැබුණු තොරතුරුවලට අදාලව ඇතුලත්වන Excel Sheet එකක් තියෙනවද?

පි: නැත.

ප්‍ර: ඒ තුනේම Excel Sheet තුනක තුනේම තමයි 2017 වර්ෂයේ ලැබුණු තොරතුරු තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව්

ප්‍ර: දැන් ඒ Excel sheet තුනෙහි තිබෙන තොරතුරු යම් තොරතුරක් Excel Sheet දෙහෙක තිබීමේ හැකියාවක් තිබෙනවද?

පි: නැත.

ප්‍ර: ඔබ සඳහන් කරන්නේ මේ Excel sheet තුනේ තිබෙන්නේ එකිනෙකට වෙනස් තොරතුරු බව ?

පි: නිවැරදියි.

ප්‍ර: ගරු මැතිතුමණි මේ අවස්ථාවේදී C 847 CD තැටිය තුල 2017 වශයෙන් සඳහන්ව තිබූ folder විවෘත කිරීමේදී Excel sheet තුනක් දිස්වනවා. ස්වාමිනි 2017 folder තුල තිබුණු Excel sheet තුන අතුරින් ප්‍රථමයෙන්ම දිස්වන Excel sheet එක C 847 C - 1 වශයෙනුත් දෙවනුවට දිස් වන Excel sheet එකෙහි මුද්‍රිත පිටපත C 847 C 02 වශයෙනුත් තුන්වනුවට Excel sheet එකෙහි මුද්‍රිත පිටපත C 847 C3 වශයෙනුත් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර: දැන් සාක්ෂිකරු රාජ්‍ය බුද්ධි සේවාවෙන් සහ විශේෂ කාර්යාංශයෙන් ලැබෙන බුද්ධි තොරතුරු වලට අමතරව S4 කාර්යාලයට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයක් හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුව, විශේෂ විමර්ශන අංශය සහ පළාත් බුද්ධි කොට්ඨාශ මගින් තොරතුරු ලැබීමක් සිදු වෙනවද ?

පි: විශේෂයෙන්ම බුද්ධි තොරතුරු ආවොත් ඒ කියන්නේ එහෙම filter වෙලාම එන්නේ නැහැ ඒක අදාල Branch එකක් තිබ්බොත් ඒ Branch එකට යනවා. S2 එක ඉල්ලා තිබ්බොත් අමතරව වෙන ලියුම් එනවා අපේ Office එකට ඒ පලාත් අනුව

ප්‍ර: බුද්ධි තොරතුරු ඇතුලත්ව පැමිණෙන ලේඛන ලැබෙන්නේ නැහැ?

පි: නිවැරදියි කියන්න බැහැ.

ප්‍ර: පැහැදිලිව කියන්න?

පි: නිවැරදිව කියන්න බැහැ ඒ සම්බන්ධව.

ප්‍ර: දැන් ඔබ මේ ඉදිරිපත් කරන්නට යෙදුනු Excel Sheet එකෙන් දැන් ඔබ සඳහන් කරානේ පොදු Excel Sheet එකක් පවත්වාගෙන යනවාය කියලා මේ බුද්ධි තොරුතුරු ඇතුලත් කිරීමට. එහි තිබෙන්නේ රාජ්‍ය බුද්ධි සේවාවෙන් ලැබුණු තොරතුරු සහ විශේෂ කාර්යාංශයෙන් ලැබුණු තොරතුරු විතරයි?

පි: නිවැරදියි.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර: සාක්ෂිකරු ඔබ ප්‍රකාශ කෙරුවා නේද දැන් මේ ඔබ S4 අංශයේදී පවත්වාගෙන යනු ලබන මෙම දත්ත ගබඩාවේ දී අතරේදි යම් අවශ්‍ය

Proof Copy
FAIR COMMENT BY JEZEEM

තොරතුරු ලබා ගැනීමට ඒ යම් නමක් නැත්නම් සංවිධානයක නමක් යොදලා ඒ දත්තවලට search කිරීමේ නැත්නම් සෙවීමේ ක්‍රමවේදයක් තියෙනවා කියලා search function එකක් තියෙනවා කියලා?

පි: ඔව් ගරු ස්වාමිනි.

ප්‍ර: තියෙනවා නේද?

පි: තියෙනවා ස්වාමිනි.

ප්‍ර: දැන් ඒ search function එකෙන් හොයා ගන්න පුළුවන් වෙන්නේ ඔබ දැන් කොමිෂන් සභාවට පෙන්නපු ඒ මාතෘකාව Excel Worksheet එකේ තියෙන මාතෘකාව විතර ද ඒකේ search වෙන්නේ නැත්නම් ඔබ පෙන්නපු අර දකුණ පැත්තේ තව කොනට PDF කරලා තියෙන තිබ්බ පිඩිඒප් කරන ලේඛනත් එම search function එකෙත් සෙවීමක් වෙනවද?

පි: PDF කරලා තියෙන අන්තර් ගතය ලබා ගන්න බැහැ ස්වාමිනි අපි Excel එකේ enter කරලා තියෙන ඉස්කෝලේ පොත්තේ හෝ font එකකින් enter කරලා තියෙන එකක් විතරයි අපිට filter කරලා ගන්න පුළුවන් ගරු ස්වාමිනි.

ප්‍ර: PDF Document එක search වෙන්නේ නැහැ?

පි: PDF Document එක අපි search කරන්නේ අපේ Outward අංකයට අපේ Outward අංකයේ ගහලා search කරොත් ඒක අපිට ලැබෙනවා ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ ඔය පද්ධතියේ search function එක නැත්නම් සෙවීමේ ක්‍රමවේදය පාවිච්චි කරන්න පුළුවන් ක්‍රම කීපයක් තියෙනවා?

පි: නිවැරදියි ගරු ස්වාමිනි.

ප්‍ර: එකක් ඒ Excel Worksheet එකේ ඔබ යොදන මාතෘකාව යටතේ වෙනම search එකක් කරන්න පුළුවන් ?

පි: නිවැරදියි ගරු ස්වාමිනි.

ප්‍ර; එතකොට ඒකට එහෙම search එකක් කෙරුවොත් අර PDF වශයෙන් ගබඩා කරලා තියෙන ලේඛන සෙවිම සිදුවන්නේ නැහැ. ඒ අන්තර් ගතය සිදුවන්නේ නැහැ අන්තර්ගතය සෙවීමක් සිදු වන්නේ නැහැ?

පි: නැහැ ස්වාමිනි.

ප්‍ර: නමුත් search function එක ඒ PDF ලේඛනවල අන්තර් ගතය සොයන්න කියලා යෙදුවොත් ඒක කරන්න පුළුවන් ?

පි: බැහැ ගරු ස්වාමිනි.අන්තර් ගතය සොයන්න බැහැ ගරු ස්වාමිනි PDF එකේ අන්තර් ගතය සොයන්න බැහැ ස්වාමිනි.

වේලාව.ප.ව 2.00

මෙතැන් සිට මුතුමාලි

Proof Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව.02.00 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප : දැන් නැවත පැහැදිලි කර ගැනීමක් කරන්නේ. ඔය ඔබ කියන ඔය Excel work sheet එකේ මේ කොමිෂන් සභාවට පෙන්නපු work sheet එකේ අර ඔබලා දාලා තියෙන මාතෘකාවට වැටෙන පුද්ගලයෙක්ගේ නැත්නම් කණ්ඩායමක නමක් ඒ search function එකෙන් හොයා ගන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමිනි.

ප : නමුත් දකුණු පැත්තේ කොණේ තියෙන අවසන් තීරු දෙකේ අවසන් තීරු දෙකක දාලා තියෙන අර PDF වශයෙන් hyperlink එකක් දාලා තියෙන ලේඛන තුළ අන්තර්ගතය ඒ search function එකෙන් search කරන්න බෑ කියන එකද ඔබ කියන්නේ?

පි : ඔව් ස්වාමිනි.

ප : ඒක search කරන්න බෑ? search කරන්න පුළුවන්ද බැයිද?

පි : PDF එක Open කළායින් පස්සේ ඒකේ අන්තර්ගතය තියෙනවා නම් heading එකට අමතරව යමක් ඒ කියන්නේ ගරු ස්වාමිනි එතන සඳහන් වෙලා තියෙනවා නම් කාල වකවානුව එතකොට

ප : අපි හිතමුකෝ heading එකේ සහරාන්ගේ නම නෑ උදාහරණයක් ලෙස?

පි : ඔව්.

ප : නමුත් ඒ PDF එකේ සහරාන්ගේ නම තියෙනවා?

පි : අන්තර්ගතයේ ගරු ස්වාමිනි.

ප : ඔව්. එතකොට ඔබ search කරන කොට සහරාන්ගේ නම දැම්මොත් PDF එක අරින්නේ නැතුව නිකම් search කෙරුවොත් අර PDF එක හොයා ගන්න පුළුවන්ද?

පි : බැහැ ස්වාමිනි.

ප : හරි එතකොට ඔබගේ දත්ත පද්ධතියේ ක්‍රමවේදයක් කොහොමත්ම නැද්ද ඔය තියෙන මාතෘකාවලට අමතරව එම PDF ලේඛනවල තිබෙන දත්ත හොයා ගැනීමේ ක්‍රමවේදයක් නැද්ද?

පි : අපිට දෙන නිර්ණායක අනුව ඒ කියන්නේ දින වකවානුවක් හරි එතකොට මොකක් හරි සිදුවීමක් සම්බන්ධයෙන් දුන්නොත් ඒක filter කරලා දුන්න හැකි ඔහොම ගරු ස්වාමිනි. ඒ කියන්නේ අපිට

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

SIS එකෙන් එන ලියුම් ටික අපිට අරන් දෙන්න කිව්වොත් ටක් ගලා SIS ටික filter කළ හැකි.

ප්‍ර : filter කරන්න පුළුවන් එවන ආයතන හැටියට?

පි : ඔව්.

ප්‍ර : නමුත් ඒ PDF document එක ඇතුළේ තියෙන අන්තර්ගතය filter වෙන්නේ නෑ?

පි : නැහැ ස්වාමිනි .

ප්‍ර : නේ ඒකද ඔබ කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔබ මේ කොමිෂන් සභාවට ලබා දීලා තියෙන මේ 2019 දත්ත ගොනුව විවෘත කරන්න. ඒ 2019 දත්ත ගොනුවට අනුව සහරාන් නැත්නම් තවුහිද් නැත්නම් අන්තවාදය නැත්නම් මුස්ලිම් කියන නම් හතරෙන් අඩංගු ලේඛනයක් ඉස්සෙල්ලම සඳහන් වෙන්නේ කවද්ද?

පි : පැහැදිලි නෑ.

ප්‍ර : පැහැදිලි නෑ.

පි : නෑ. 04/09 වෙනිදා ලැබුණ සහරාන් කියන නිර්ණායකය යටතේ filter කරන ලිපිය තමයි ඔය උඩින්ම තියෙන්නේ.

ප්‍ර : 04/09 ?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ?

පි : ඊට පස්සේ 05/21 ඒත් සහරාන්ගේ filter කරන ලද ලිපිය තියෙන්නේ. 05/21 ලැබුණු ලිපිය ගරු ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ නේද මේ දත්ත කොමිෂන් සභාවට ලබා දුන්නේ?

පි : නිවැරදි ගරු ස්වාමිනි.

ප්‍ර : හරිද . දැන් ඔබ කියන හැටියට 2019 අප්‍රේල් 10 වෙනිදට පස්සේ සහරාන්ගේ නම සඳහන් රාජ්‍ය බුද්ධි සේවයෙන් එවපු ලියුමක් පොලිස්පතිවරයාට ලැබුණේ නැද්ද?

පි : මාතෘකාව heading එක සඳහන් ලිපි ලැබිලා නෑ මේ document එක අනුව සහ heading එකේ සඳහන් වෙලා නෑ සහරාන් කියලා ඉවර වෙලා. ඊට අමතරව අන්තවාදී කියලා ඉවර වෙලා තියෙන folder මේ යටතේ ලැබිච්ච යටින් සඳහන් වෙලා තියෙනවා.

**(සාක්ෂිකරුට X 95 දරණ ලේඛනය පෙන්වයි.)**

ප්‍ර : ඔය X 95 දරණ ලේඛනය සම්බන්ධයෙන් තොරතුරු මේ කොමිෂන් සභාවට ඔබ ඉදිරිපත් කරපු CD තැටියේ අන්තර්ගත වෙනවද?

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පි : මෙම නිර්ණායක යටතේ 2019 නැත ස්වාමිනි. ඉදිරිපත් වෙන්නේ නැත ස්වාමිනි.

ප්‍ර : නෑ ඔය ලේඛනය හරි නම් ඉදිරිපත් වෙන්න ඕනේද?

පි : මට ලබා දුන්නු නිර්ණායක යටතේ ඉදිරිපත් මට දීලා තියෙන්නේ සහරාන්, අන්තවාදී, මුස්ලිම්, තවුහිද්. ඒ මාතෘකාවේ filter කරපු හතරෙන් එකක් සඳහන් වෙලා නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : සහරාන්ගේ නම නැද්ද ඔතන?

පි : මාතෘකාවේ නෑ ස්වාමිනි.

ප්‍ර : ලියුමේ තියෙනවා?

පි : සඳහන් වෙලා තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර : සඳහන් වෙලා තියෙනවා? නමුත් දත්ත ඇතුළත් කිරීමේදී ඒක මේ සහරාන්ගේ නමින් දත්ත ඇතුළත් කරලා නැද්ද?

පි : සහරාන්ගේ නම මාතෘකාවේ සඳහන් වෙලා නැති හින්දා මේ filter කරද්දී මේ කොටසට සම්බන්ධ වෙලා නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබ ඔය ලියුම කලින් දැකලා තියෙනවද?

පි : ඔව් ගරු ස්වාමිනි මේක අපේ කාර්යාලයට ලැබුණු ලිපියක්.

ප්‍ර : ලැබුණු ලිපියක්. ඒක පොලිස්පතිවරයා දැකපු බවට පිටසනක් තියෙනවද?

පි : Outward කිරීමේදී සඳහන් කරලා තියෙනවා ගරු පොලිස්පති පුජීත් ජයසුන්දර මහත්මයාගේ අත්සන.

ප්‍ර : ඔතන Outward කරලා තියෙන හැටියට හරි නම් ඔය ලේඛනය ඔබගේ දත්ත ගබඩාවේ ඇතුළත් වෙන්න ඕනේද?

පි : දත්ත ගබඩාවේ මේක සඳහන් වෙලා තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර : තියෙනවා?

පි : තියෙනවා ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබ ඒක දැකලා තියෙනවා?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : අපිට දුන්නු ඒකේ නෑ?

පි : මට කල්‍යාණතුංග මහත්මයා නිර්ණායක හතරක් යටතේ filter කරලා රැගෙන එන්න තමයි දුන්නේ. ඒ නිර්ණායක හතර තමයි තවුහිද්, සහරාන්, මුස්ලිම්, අන්තවාදී කියන. ඒ හතරේ filter කරද්දී heading එකේදී තමයි filter කළේ. ඒ heading වල මේ තිබ්බ ඒවා තමයි මේ filter කරලා මම ඉදිරිපත් කළේ ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබ ඒ වේලාවේදී කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන්ට දැනුවත් කෙරුවද ඒ filter කිරීම මඟින් කරන්නේ මාතෘකාව

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පමණයි අන්තර්ගතය filter වෙන්නේ නෑ කියලා ඔබ දැනුම් දුන්නද?

පි : දැනුම් දුන්නා ගරු ස්වාමිනි.

ප්‍ර : දැනුම් දුන්නා ?

පි : දැනුම් දුන්නා ගරු ස්වාමිනි.

**********

**<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය</u>**

ප්‍ර : දැන් සාක්ෂිකරු ඔබට පෙන්වා සිටින X 95 ලේඛනයේ ඔබගේ පෙර සාක්ෂියේ සඳහන් කළ ආකාරයට මෙම ලිපිය S 4 කාර්යාලයට ලැබී තිබෙන බවට සනාථ කළ හැකි යම් සටහනක් තිබෙනවද? දැන් ඔබ සඳහන් කළානේ යම් අංක යෙදීමක් සිදු වෙනවා inward කිරීමේදී කියලා එවැනි සටහනක් තිබෙනවද?

පි : සටහනක් තියෙනවා. අපේ inward කරලා තියෙනවා. inward අංකය INT 559/19 කියලා සඳහන් කරලා තියෙනවා. ඊට අමතරව පොලිස්පතිතුමා හිටපු පොලිස්පති පුජිත් ජයසුන්දර මහතාගේ අත්සන තබා තියෙනවා. Outward අංකය අපි 361 ලෙස සඳහන් කරලා තියෙනවා. ඒ ටික හඳුනා ගැනීමට හැකියි.

ප්‍ර : දැන් ඒ අනුව මෙම ලේඛනය S 4 කාර්යාලයේ inward registry යට ඇතුළත් වී තිබෙනවා. ඊට අමතරව S 4 කාර්යාලයෙන් එය Outward කිරීමකුත් සිදු වෙලා තිබෙනවා?

පි : තිබෙනවා.

ප්‍ර : දැන් ඔබ ඔය සඳහන් කළානේ INT/559 ද? INT අංකය?

පි : INT 559/19

ප්‍ර : 559/19 වශයෙන් අංකයක් ලබා දීලා තිබෙනවා කියලා? එයින් ගම්‍ය වෙනවද මෙම ලේඛනය සම්බන්ධයෙන් ඔබ අර සඳහන් කරපු පොදු Excel sheet එකට ඇතුළත් කරලා තියෙනවයි කියලා?

පි : ගම්‍ය වෙනවා.

ප්‍ර : ඒ කියන්නේ මේ ලේඛනය සම්බන්ධ තොරතුරු ඔබ සඳහන් කරන්නට යෙදුණු පොදු Excel sheet එකට ඇතුළත් කරලා තියෙන්නේ?

පි : ඇතුළත් කරලා තියෙන්නේ.

ප්‍ර : මෙහි මෘදු පිටපතක් ලබා ගෙන එය පරිගණකය තුළ ගබඩා කර තිබෙනවද?

පි : තිබෙනවා.

**********

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර : ඔබ S 4 අංශයේ කවදා ඉඳලා සේවයේ යෙදිලා ඉන්නවද?

පි : ගරු ස්වාමිනි 2016.08.08 සිට පොලිස්පති ලේකම් කොට්ඨාශයට වාර්තා කළා. මාස දෙකකට පසු තමයි S 4 කාර්යාලයේ රාජකාරී වාර්තා කරන්නේ.

ප්‍ර : හරි ඒ කියන්නේ 2016 ඔක්තෝම්බර් මාසේ විතර ඉඳලා S 4 කාර්යාලයේ සේවය කරනවා කියලා කිව්වොත් හරිද?

පි : නිවැරදි ගරු ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබගේ මතකයේ හැටියට සහරාන් හෂීම් සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු 2016 වර්ෂයේදීත් පොලිස්පති කාර්යාලයට ලැබුණද?

පි : 2016 මම පොලිස්පති ලේකම් කාර්යාලයේ S 2 කාර්යාලයේ හිටියේ. ඊට අමතරව පොත් පත් වල සඳහන් වෙලා තියෙනවා මේ ලැබුණා කියලා සමහර ලිපි වලින් heading එකේ තියෙනවා.

ප්‍ර : ආ..... ඒ කියන්නේ ඔබ මේ දත්ත ගබඩාව පරීක්ෂා කිරීමේදී ඔබට පෙනී ගියා යම් අවස්ථාවක පොලිස්පති වෙත සහරාන් හෂීම් සම්බන්ධයෙන් තොරතුරු 2016 වර්ෂයෙත් ලැබිලා තිබ්බා කියලා ඒකද හරි?

පි : මතකයේ විදිහට නිවැරදි ගරු ස්වාමිනි.

ප්‍ර : මතකයේ විදිහට නිවැරදි? දැන් ඔය දත්ත පද්ධතියට ඇතුළත් කරන දත්ත කාට හරි මකන්න පුළුවන්ද?

පි : අපේ පරිගණක තුනක් තියෙනවා ගරු ස්වාමිනි. එකක් ප්‍රියදර්ශන මහත්මයාගේ office එකේ තියෙන්නේ ඊට මීටර් කිහිපයකට මෙහා අපේ office එක තියෙන්නේ. එතකොට base එක විදිහට පාවිච්චි කරන්නේ අපි ප්‍රියදර්ශන මහත්මයාගේ office එකේ තියෙන එක. එතකොට අපේ office එකේ password දාලා තියෙන්නේ. එතකොට ඒ අපේ ඉන්න නිලධාරීන් තුන්දෙනාට ඒකට යන්න පුළුවන්. ඊට අමතරව ප්‍රියදර්ශන මහත්මයාගේ office එකේ SI මහත්මයෙක් ඉන්නවා. ඒ මහත්මයාට හරි ප්‍රියදර්ශන මහත්මයාට හරි නැත්නම් අපිට හරි තමයි ඒක බලන්න පුළුවන්නේ. ඊට අමතරව IT සම්බන්ධයෙන් පොලිස්පතිතුමා ඒ දවස්වල රාළහාමි කෙනෙක් හිටියා IG office එකේ. ඒ රාළහාමිට බලන්න පුළුවන්. අනිත් කට්ටියට බලන්න බැරි විදිහට තමයි ඒක හදලා තිබ්බේ password එක හරහා.

ප්‍ර : නෑ මම ඇහුවේ බලන්න පුළුවන් කාටද කියන එක නෙවෙයි. ඒ පද්ධතියට ඇතුල් වෙලා දැන් ඔබ කියනවනේ password එකක් ඕනේ කියලා ඇතුල් වෙන්න. ඒ password එක දීලා තියෙන එක්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කෙනෙකුට පුළුවන්ද ඇතුල් වෙලා ඒකේ තියෙන දත්ත මේ මකන්න. Erase කරන්න?

පි : මකන්න පුළුවන් ගරු ස්වාමිනි.

ප්‍ර : මකන්න පුළුවන්. එහෙම මැකීමක් සිදු වෙනවා නම් ඒක පස්සේ අවස්ථාවක හොයා ගන්න පුළුවන්ද කවුද මැකුවේ කියන එක?

පි : එහෙම දැනුමක් නෑ ස්වාමිනි.

ප්‍ර : එහෙම දැනුවත් වීමක් නෑ. මකලා තියෙනවද කියලා හොයන්න පුළුවන්ද?

පි : ඒ අපේ ලියුමේ Attachment එක Hyperlink එකේ නැත්නම් අපි පසුව බලනවා මොකද වුණේ කියලා ඉවර වෙලා සමහර විට අපිට අතපසුවීමකින් Link කරන්න බැරි වෙලා වෙන්න පුළුවන්. නැත්නම් Attachment එකේ හරි තියෙනවා. මකලා එහෙම අපිට අවස්ථා හම්බ වෙලා නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : නෑ හම්බ වුණාද නැද්ද කියන එක නෙවෙයි මම අහන්නේ. මකන්න පුළුවන්ද කියන එකයි මම අහන්නේ?

පි : ඒ සම්බන්ධයෙන් දැනුමක් නෑ ගරු ස්වාමිනි.

**********

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : දුෂ්මන් මහත්මයා

පි : ගරු ස්වාමිනි

ප්‍ර : දැන් ඔබ මේ රාජකාරී කරපු පසුගිය කාලය තුළ ඒ කියන්නේ 2016 ඔක්තෝම්බර් මාසයේ ඉඳලා ඔබ මේ දක්වාම ඔය ස්ථානයේ සේවය කරනවනේ ඔය S 4 අංශයේ?

පි : නිවැරදි ගරු ස්වාමිනි.

ප්‍ර : දැන් මේ ගබඩා කරලා තියෙන දත්ත වරින් වර කවුරුහරි ප්‍රයෝජනයට ගත්තද?

පි : පොලිස්පතිතුමා ඇතුළු අපේ කාර්යාලයේ සියළු දෙනාම මේ ප්‍රයෝජනයට ලබා ගන්නවා ගරු ස්වාමිනි.

ප්‍ර : ඔබට මතකද අන්තිමට මේ දත්ත 2019 අප්‍රේල් 21 ට පෙර කවදද පොලිස්පතිතුමා අවසාන වශයෙන් ඔබෙන් තොරතුරු ඉල්ලා හිටියේ කියල?

පි : මගෙන් ඉල්ලා සිටින්නේ නෑ ගරු ස්වාමිනි.

ප්‍ර : කාගෙන්ද ඉල්ලා හිටියේ?

පි : අපේ ප්‍රියදර්ශන මහතා හරහා තමයි අපිට මේ එවැනි ඉල්ලීමක් ලැබුණෙත් ලැබෙන්නේ. ප්‍රියදර්ශන මහත්මයා කියනවා conference එකක් තියෙනවා. ඒකට අදාළව සහරාන් සම්බන්ධයෙන් නම් උදාරණයක් වශයෙන් සහරාන්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

සම්බන්ධයෙන් තියෙන ලිපිය අපෙන් ගිහිල්ලා තියෙන ටික එකතු කරලා අපට දෙන්න කියලා. එතකොට වර්ෂය සඳහන් කළොත් ඒ වර්ෂයේ සිට කාල වකවානුව අපි අරගෙන දෙනවා. ලිපි ටික අරගෙන file එක හදලා දෙනවා.

ප : දැන් ඔබට මතකද 2019 අප්‍රේල් 21 ට පෙර මේ තොරතුරු මේ දත්ත මොකක් හරි conference එකකට හරි ආරක්ෂක මණ්ඩල රැස්වීමට හරි වෙන සම්මේලනයකට හරි මොනවට හරි ගත්ත බවක් ඔබට මතකද?

පි : මතකයක් නෑ ස්වාමිනි.

ප : එහෙම ගත්තේ නෑ කිව්වොත් හරිද?

පි : නෑ ස්වාමිනි මතකයේ තියෙනවා විවිධ අවස්ථාවල විවිධ හේතූන් මත එහෙම අපි filter කරලා දීලා තියෙනවා.

ප : කාටද දුන්නේ?

පි : ප්‍රියදර්ශන මහත්මයාට.

ප : ඒක කවුරු ප්‍රයෝජනයට ගත්තද කියන්න ඔබ දන්නේ නෑ නේද?

පි : ප්‍රියදර්ශන මහත්මයාගෙන් බොහෝ දුරට ප්‍රයෝජනයට ගන්නේ පොලිස්පතිතුමා ගරු ස්වාමිනි.

ප : පමණයිද?

පි : පමණයි.

ප : පමණයි. එතකොට ඒ ප්‍රයෝජනයට ගත්තා කියලා ඔබ හිතනවා නම් ඒ ප්‍රයෝජනයට ගත්ත දත්තයන් පාවිච්චි කළාද නැද්ද කියන එක ගැන ඔබ කියන්න දන්නේ නැනේ?

පි : දන්නේ නෑ ස්වාමිනි.

ප : ඒක දන්නේ නෑ. දැන් මේ දත්තවල තිබෙන්නාවූ නිවැරදිතාවය පිළිබඳව ඔබට තහවුරු කරන්න පුළුවන්ද 100% මේ දත්ත නිවැරදි කියලා?

පි : අපි ඇතුළත් කිරීමේදී අංකවල සමහර වෙනස්වීමක් වෙන්න පුළුවන් සමාන අංක මේවා වෙන්න පුළුවන්. ඊට අමතරව ගරු ස්වාමිනි heading එකේ අකුරුවල වෙනසක් ඇති වෙන්න පුළුවන්. හිස් space තියෙන එකේ අකුරු වල වෙනසක් ඇති වෙන්න පුළුවන්. අන්න ඒ වගේ පොඩි පොඩි දේවල් හැරෙන්න අනිත් සියල්ල අන්තර්ගතය නිවැරදි කියලා මම කියනවා ස්වාමිනි.

ප : දැන් මේවා තොරතුරු දත්ත ඇතුළත් කළාට පස්සේ මේ ඒ දත්ත double check කරන්නේ නැද්ද කවුරුවත් දෙවෙනි වරටත් නැවත පරීක්ෂා කරලා බලලා නිවැරදිද හරිද කියලා සොයන ක්‍රමයක් තියෙනවද?

Fair Comment BY JEZEEM

පි : අපි inward, Outward කියලා Excel දෙකක පවත්වාගෙන යනවා ගරු ස්වාමිනි. ඊට අමතරව තමා Excel 01 කියලා ඒ දෙකම එකතු කරලා එකක් හදලා තියෙන්නේ. එතකොට අපි ඒ දෙපාරක් බැලවෙනවා. ඊට අමතරව අපි PDF යවන Outward කරන ලිපිය scan කරද්දී එක සැරයක් බැලවෙනවා. ඊට අමතරව ඒක link කරද්දී rename කරද්දී තව සැරයක් බැලවෙනවා ගරු ස්වාමිනි. ඒ කරලා තමයි අපි යවන්නේ ගරු ස්වාමිනි.

ප්‍ර : හොඳයි දැන් ඔබට මතකද 2019 අප්‍රේල් මාසේ 09 වෙනිදා දැන් එක වාර්තාවක් ඇවිල්ලා තිබුණනේ ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එතකොට අප්‍රේල් 09 වෙනිදා සිට අප්‍රේල් 20 වෙනිදා දක්වා පසුගිය කාල තුළ ඒ කියන්නේ 2019 අප්‍රේල් 09 ට පෙර සිදු වූ සිද්ධීන් හෝ අදාළ තොරතුරු සම්බන්ධයෙන් වාර්තා කැඳවීමක් අප්‍රේල් 09 වෙනිදා ඉඳලා අප්‍රේල් 20 වෙනිදා වෙනකම් සිද්ධ වුණාද කියලා ඔබට කියන්න පුළුවන්ද?

පි : මතකයක් නෑ ස්වාමිනි.

ප්‍ර : ඒක මතකයක් නෑ.

**********

**<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>**

ප්‍ර : සාක්ෂිකරු

පි : ගරු මැතිනියනි

ප්‍ර : Excel sheet වලට දැන් කිසියම් ලැබුණු inward Document එකක් enter කරනවනේ නේද ඕගොල්ලන් නේද? Manual enter කරලා තමයි මේ data base එකේ තියෙන්නේ scan කරලා නෙවෙයි නේ?

පි : scan කරපු කොටස hyperlink මාර්ගයෙන්

ප්‍ර : ඒ කියන්නේ Attachment හරි මොනවා හරි තිබුණොත්නේ?

පි : ඔව් මැතිනියනි.

ප්‍ර : ලියුමක් නම් heading එක enter කරනවා ඒ වගේ enter කරනවා නේද Manual ?

පි : ඔව් මැතිනියනි.

ප්‍ර : එතකොට ඕගොල්ලන් දැන් අපි හිතමුකෝ අප්‍රේල් මාසේ 09 වෙනිදා ලියුමක් ඔබගේ අංශයට ලැබුණා කියලා පොලිස්පති කාර්යාලයෙන්. ඒ ලියුම enter කරන date එක ඒ time එක ඒවාත් ඕගොල්ලෝ enter කරනවද නැත්නම් system එකේම automatically ම enter කරපුවාම එනවද මේ date and time ?

FAIR COMMENT BY JEZEEM

පි : නෑ ස්වාමිනි අපි enter කරන දෙයක් විතරයි

ප්‍ර : මේකෙන් ගන්නේ?

පි : ගන්නේ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

**සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අතිලතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසමි. අවශ්‍ය නොවන බව දන්වයි.**

**සාක්ෂිකරු මුදා හරිමි.**

දැන් වේලාව : ප.ව.02.25 යි.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන් තබන ලදී.

President Seaetary's Copy

FAIR COMMENT BY JEZEEM

**2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.**

දිනය: 2020.07.15 වේලාව:ප.ව.02.25 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

**පෙනී සිටීම:-**

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.
* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ රවිෂානි පීරිස් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**සාක්ෂි අංකය : 145**
**නම : ජගත් රුවන් කුමාර ගජවීර ආරච්චිගේ**
**වයස : අවුරුදු 59**
**ආගම : බෞද්ධ**
**රැකියාව : පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ, ව්‍යවස්ථාදායක සේවා**

**සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.**

**<u>රජයේ අධිනීතිඥ දිලන්ත එස්.කළුදුරුවගේ මහතා</u>**

ප්‍ර : මහත්මයා දැනට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා අංශයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් සේවය කරන්නේ කිව්වොත් නිවැරදිද?

පි : එහෙමයි.

ප්‍ර : මහත්මයා වෘත්තියෙන් නීතිඥවරයෙක්?

පි : එහෙමයි.

ප්‍ර : වශයෙන් දිවුරුම් දීලා තිබෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ දිවුරුම් ලබා දීමට පෙර මහත්මයා යම් කිසි විශ්ව විද්‍යාල උපාධියක් සම්පූර්ණ කරලා තිබෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : ඒ කොයි විශ්ව විද්‍යාලයෙන්ද ලබා ගත්තේ ?

පි : කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිය.

ප්‍ර : නීතිවේදී උපාධිය ලබා ගෙන තිබෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : ඉන් අනතුරුව මහත්මයා නීති විද්‍යාලයේ අධ්‍යාපනය ලබා තිබෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : ඒ නීති විද්‍යාලයේ විභාග සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තමයි නීතිඥවරයෙක් වශයෙන් දිවුරුම් දුන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : මහත්මයා මොන වසරකද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සේවයට එකතු වන්නේ?

පි : 1981 වර්ෂයේ.

ප්‍ර : ඒ කුමන තනතුරකටද?

පි : පාර්ලිමේන්තු නිලධාරීයෙක් වශයෙන්.

ප්‍ර : ඉන් අනතුරුව මහත්මයා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරන අතර උසස්වීම් ලබා තිබෙනවද?

පි : එහෙමයි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ උසස්වීම් ලබා ගෙන මහත්මයා ඔය දැනට සේවය කරන අධ්‍යක්ෂක ව්‍යවස්ථාදායක සේවා කියන තනතුරට උසස් වුණේ මොන අවුරුද්දෙද?

පි : මට මතක හැටියට 2016 හෝ 17 වර්ෂයේ තමයි උසස් වීමක් ලැබුණේ.

ප්‍ර : ඒ 2016 හෝ 17 වර්ෂය දැන් මහත්මයා ඔය සඳහන් කරපු වර්ෂයේ ඉඳලා මේ දක්වාම මහත්මයා ඒ ධුරයේ කටයුතු කරනවා?

පි : ඔව් මේ දක්වා කටයුතු කරනවා.

ප්‍ර : ඔය පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කිරීමේදී මහත්මයාගේ රාජකාරී ප්‍රධාන වශයෙන් මොන රාජකාරීද මහත්මයා ඉෂ්ට කරනු ලබන්නේ?

පි : පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා අංශය දෙපාර්තමේන්තුව යටතට අංශ කීපයක් ගැනෙනවා. ඒ කියන්නේ පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ කටයුතු සහ ප්‍රධාන වශයෙන් පාර්ලිමේන්තුවේ තියෙන සියලුම කාරක සභාවල කටයුතු ඒ වගේම පාර්ලිමේන්තුවේ පුස්තකාලය සහ පාර්ලිමේන්තුවේ කතා පරිවර්තන සේවා සහ භාෂණ පරිවර්තන සැපයීමේ අංශ 09 ක් මේ විවිධ කටයුතුවල යෙදෙනවා. ඒ සියලු අංශ තියෙන්නේ මගේ යටතේ.

ප්‍ර : ඒ අංශ නිසි පරිදි රාජකාරී ඉෂ්ට කරනවාද යන්න අධීක්ෂණය කිරීම මහත්මයාගේ රාජකාරීය කිව්වොත් නිවැරදිද?

පි : එහෙමයි.

ප්‍ර : දැන් මහත්මයා 2016 නොවැම්බර් මාසය වන විටත් ඔය ධුරයේ රාජකාරී කරමින් කටයුතු කළාද?

පි : ඊට කලින් මා කටයුතු කළේ පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ කටයුතු මූලික වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දෙන සභා ලේඛන කාර්යාංශයේ ප්‍රධානියා වශයෙන්.

ප්‍ර : ඒ කොයි අවදියෙද?

පි : මට නිශ්චිත වශයෙන් කියන්න අමාරුයි ඊට කලින් අවුරුදු වසර කීපයක්ම මා ඒ අංශයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කළා.

ප්‍ර : දැන් මහත්මයා පාර්ලිමේන්තුවේ ඒ අනුව දැන් ලබා තිබෙන අත්දැකීම් සහ ඒ වෘත්තිය පළ පුරුද්ද අනුව මහත්මයාට පාර්ලිමේන්තු පරිවය එහෙම නැත්තම් මේ parliament practice කියන එක ගැන හොඳ අවබෝධයක් තිබෙනවා?

පි : එහෙමයි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප : දැන් ඔය පාර්ලිමේන්තුවේ සැසිවාර පවත්වන අවස්ථාවල ඔය ගරු මන්ත්‍රීතුමන්ලාගේ කතා එහෙම නැත්නම් ඒ පාර්ලිමේන්තු විවාද වාර්තා ගත කිරීමක් සිද්ධ වෙනවා නේද?

පි : එහෙමයි සිද්ධ වෙනවා.

ප : එය ලිඛිත වාර්තාවක් වශයෙන් ලබා ගැනීමටත් හැකියාව තිබෙනවද?

පි : තිබෙනවා.

ප : එය කුමන නමකින්ද හඳුන්වන්නේ?

පි : පාර්ලිමේන්තුවේ නිල වාර්තාවක් නිකුත් කරනවා හැන්සාඩ් වාර්තාව නමින්.

ප : හැන්සාඩ් වාර්තාව නමින්. ඒ හැන්සාඩ් වාර්තාව පිටපතක් විදිහට මුද්‍රිත පිටපතක් විදිහට ලැබෙන ක්‍රියාදාමය මේ ගරු කොමිෂන් සභාවේ දැන ගැනීම පිණිස කෙටියෙන් හඳුන්වන්න ඒ හැන්සාඩ් වාර්තාකරුවන් මඟින් වාර්තා කිරීමේ සිට ඉතාම කෙටියෙන්?

පි : හොඳයි. ගරු මැතිතුමනි පාර්ලිමේන්තුවේ සභා ගර්භයට ආසන්නවම පිහිටා තිබෙනවා පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාකරුවන්ගේ කුටිය නමින් මැදිරියක්. ඒ මැදිරියේ පහසුකම් සපයලා තියෙනවා මේ පාර්ලිමේන්තුවේ කතා කරන සියලු දේම හැන්සාඩ් වාර්තාකරුවන්ට අසා සිටින්නට. Heads phone සහ speakers මාර්ගයෙන් speakers ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරන කොට ඉතාම හඬ අඩුවෙන් පාවිච්චි කරන්නේ සභා ගර්භයට බාධාවක් නොවෙන විදිහට. නමුත් සියලු දෙනාටම Head phone පාවිච්චි කිරීමෙන් මේ කතා ශ්‍රවණය කිරීමේ හැකියාව තියෙනවා සියලුම හැන්සාඩ් වාර්තාකරුවන්ට. ඒ සියලුම හැන්සාඩ් වාර්තාකරුවන් එක් හැන්සාඩ් වාර්තාකරුවෙකුට සාමාන්‍යයෙන් පැය භාගයක කාල පරාසයක් තමයි වෙන් කරලා තියෙන්නේ shift එකක් හැටියට. එතකොට ඒ කාල පරාසය ඇතුළත හැන්සාඩ් වාර්තාකරු හෝ වාර්තාකාරිය පැමිණ තමන්ගේ short hand note පොතේ තමන් මේ අසා සිටින කතාව ලඝුලේඛනය මඟින් සටහන් කර ගන්නවා. ඒ හා සමඟාමීව මේ සියලුම කතා audio තාක්ෂණයෙන් MP 3 දත්ත මඟින් කතා පටිගත කරනවා. ඒ වගේම මේ සියලුම කතා සභා ගර්භයේ සවිකරලා තියෙන video කැමරා මඟින් MP 4 තාක්ෂණය ඔස්සේ video පටිගත කිරීමකට ලක් කරනවා. ඊට පස්සේ මේ හැන්සාඩ් වාර්තාකරුවන් තමන්ගේ කාල පරාසය ඉවර වුණාම තමන්ගේ අංශයට ගිහිල්ලා මේ කාල පරාසය ඇතුළත කතා වෙච්ච සියලුම දේවල් යතුරු ලියනය කරනවා පරිගණකය

FAIR COMMENT BY JEZEEM

මාර්ගයෙන්. ඊට පස්සේ මේ සියලු කතා සහකාර හැන්සාඩ් සංස්කාරකවරුන්ගේ අධීක්ෂණයට ලක් වෙනවා. ඒ කියන්නේ යම් කිසි භාෂාමය ගැටලුවක්, පද යෙදුම්වල ගැටලුවක්, ව්‍යාකරණ ගැටලුවක්, වාක්‍ය සකස් කිරීමේ ගැටලුවක් තියෙනවා නම් සංස්කාරකවරුන්ට පුළුවන් ඒවා නිවැරදිව පෙළගස්වන්න. ඊට පසුව හැන්සාඩ් සංස්කාරකතුමියගේ පෞද්ගලික අධීක්ෂණයකුත් සිදු වෙලා ඊට පසුව මේක යවනවා රජයේ මුද්‍රණාලයට. ඊට පසුව තමයි මේ හැන්සාඩ් වාර්තාවක් හැටියට මුද්‍රණයෙන් මේක එළි දක්වන්නේ.

ප : ස්තූතියි ඔබේ ඒ පැහැදිලි කිරීමට. ඒ මහත්මයා දැනට විස්තර කරපු ආකාරයෙන් තමයි හැන්සාඩ් මුද්‍රිත පිටපතක් විදිහට ලබා ගන්නට හැකි වෙන්නේ?

පි : එහෙමයි.

ප : ඔය හැන්සාඩ් නියම ආකාරයෙන් මුද්‍රණය කළාට පස්සේ එය පොදු ලේඛනයක් බවට පත්වෙනවා නේද?

පි : ඔව් මේක public Document එකක් ඒ කියන්නේ ප්‍රසිද්ධ ලේඛනයක් බවට පත් වෙනවා හැන්සාඩ් වාර්තාව රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණයට කළාට පස්සේ.

ප : දැන් මහත්මයා මීට පෙර ප්‍රකාශ කළා ඔය ගරු මන්ත්‍රීතුමන්ලාගේ කතා පාර්ලිමේන්තු සැසිවාර වල ශ්‍රව්‍ය දෘෂ්‍ය වශයෙන් පටිගත කිරීමක් සිද්ධ වෙන බවට?

පි : එහෙමයි.

ප : ඒ පටිගත කරපු දර්ශන යම් අවස්ථාවක පසුව ලබා ගැනීමට අවශ්‍ය වුනොත් එය මහත්මයලගේ පාර්ලිමේන්තුවේ කුමන අංශයකින්ද ලබා ගත හැකි වන්නේ?

පි : සාමාන්‍ය වශයෙන් හැන්සාඩ් වාර්තාව පිළිබඳව කටයුතු කරන්නේ හැන්සාඩ් දෙපාර්තමේන්තුව මඟින්. නමුත් මේ දෘශ්‍ය පටිගත කිරීම් හෝ ශ්‍රව්‍ය පටිගත කිරීම් කටයුතු කරන්නේ පාර්ලිමේන්තුවේ සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව මඟින්. ඒ ගොල්ලො ඒ සම්බන්ධීකරණ ඉංජිනේරුවේ නිලධාරීන් මහත්වරුන් මේ වාර්තා පිටපත් සුරැකිව තබා ගන්නවා .

ප : ස්තූතියි. මගේ ඊළඟ ප්‍රශ්නේ වෙන්නේ මහත්මයා දැන් ඔය පාර්ලිමේන්තු සැසිවාර පැවැත්වෙන අවස්ථාවලදී ඒ සැසිවාර පොදු මහජනතාවට සහ මාධ්‍යවේදීන්ට විවෘතවද පවතින්නේ?

පි : සාමාන්‍ය වශයෙන් සෑම විටම පාර්ලිමේන්තු සැසිවාර මාධ්‍යයට විවෘතයි මහජනතාවටත් විවෘතයි. නමුත් යම් යම් අවස්ථාවල යම් යම් හේතූන් උඩ ගරු කතානායකතුමාට පුළුවන් යම් කිසි සභා

Presidential Secretariat
FAIR COMMENT BY JEZEEM

වාරයක් මාධ්‍යවේදීන්ගෙන් තොරව පවත්වන්න හෝ මහජනතාවගෙන් තොරව පවත්වන්නට කියලා තීරණය කරන්න. සමහර අවස්ථාවලදී පාර්ලිමේන්තු රැස්වීම පවත්වාගෙන යන අතරතුර යම් කිසි තත්ත්වයක් උද්ගත වුනොත් කතානායකතුමා තීරණය කරනවා නම් මේ වේලාවේ මහජන gallery යේ පිටස්තර අය සිටීම සුදුසු නැහැ කියලා. එතකොට ගරු කතානායකතුමා නියෝගයක් දෙනවා මේ වේලාවේ gallery යේ සිටින අය සහ හෝ අවශ්‍ය නම් වාර්තාකරුවන් ඉවත් කරන්න කියලා නමුත් සාමාන්‍ය වශයෙන් පුවත්පත් වාර්තාකරුවන් ඉවත් කිරීම සිදු වන්නේ නැහැ මහජන gallery වල සිටින උදවිය පමණයි gallery වලින් ඉවත් කරන්නේ.

ප : දැන් මම මහත්මයාගේ අවධානය යොමු කරන්නට කැමතියි 2016 වර්ෂයේ නොවැම්බර් මාසයට. 2016 වර්ෂයේ නොවැම්බර් මාසය විශේෂ මාසයක් නේද සාමාන්‍ය පාර්ලිමේන්තු කටයුතුවලට?

පි : සාමාන්‍යයෙන් නොවැම්බර් දෙසැම්බර් මාසවලදී තමයි අය වැය විවාදය පාර්ලිමේන්තුවේදී පැවැත්වෙන්නේ.

ප : 2016 නොවැම්බර් මස මහත්මයාගේ සටහන් බලලා මහත්මයාට කියන්න පුළුවන්ද 2016 නොවැම්බර් මස 18 වෙනිදා පාර්ලිමේන්තුව පැවැත්වෙච්ච දිනයක්ද?

පි : එහෙමයි එදින පැවැත්වෙච්ච දිනයක්.

ප : එදින පාර්ලිමේන්තුවේ කුමක්ද සිද්ධ වෙලා තිබෙන්නේ විශේෂයෙන්?

පි : මා ළඟ තියෙන සටහන් වලට අනුව ගරු මුදල් ඇමතිතුමා විසින් විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කළාට පසුව මේ දින කීපය පුරාවට පාර්ලිමේන්තුවේ මේ විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳව දෙවෙනිවර කියවීමේ විවාදය පැවැත්වෙලා තියෙනවා.

ප : ස්තූතියි. දෙවනවර කියවීමේ විවාදය තමයි 2016 නොවැම්බර් මාසයේ සිදු වෙලා තිබෙන්නේ විශේෂයෙන් නොවැම්බර් 18 වෙනි දින ඔය විවාදය පවත්වා තිබෙනවා?

පි : එහෙමයි.

ප : එදා මම සඳහන් කරන දිනය 2016 නොවැම්බර් මස 18 වෙනිදා එවකට ගරු අධිකරණ සහ බුද්ධ ශාසන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරපු විජේදාස රාජපක්ෂ මහතා පාර්ලිමේන්තු සැසිවාරයට සහභාගි වෙලා තිබෙනවද?

පි : තිබෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අනුව ඒ මහතා විසින් 2016 නොවැම්බර් මස 18 වෙනිදා පාර්ලිමේන්තුවේ විවාදයට සහභාගි වෙලා කතාවක් කරලා තිබෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : ඒ කතාවක් කරලා තිබෙනවා නම් ඒ කතාව පාර්ලිමේන්තු විවාදවල වාර්තා ගත වෙලා තිබෙනවද?

පි : 2016 නොවැම්බර් මස 18 වන සිකුරාදාට පාර්ලිමේන්තුවෙන් නිකුත් කරලා තියෙන හැන්සාඩ් වාර්තා පිටපතේ 248 වන කාණ්ඩයේ 7 වන කලාපයේ ඒ කතාව සටහන් වෙලා තියෙනවා.

ප්‍ර : ඒ කලාපයේ මහත්මයා දැන් සඳහන් කරපු කලාපයේ කුමන column එකකද ඒ කතාව ආරම්භක column එක වශයෙන් සඳහන් වෙන්නේ?

පි : විජේදාස රාජපක්ෂ ගරු විජේදාස රාජපක්ෂ මහතාගේ කතාව සඳහන් වෙන්නේ 1623 column එක යටතේ තමයි පූර්ව භාග 11 යි 13 ට එතුමාගේ කතාව පටන් අරගෙන තියෙන්නේ.

ප්‍ර : එතුමාගේ කතාව පටන් අර ගෙන තිබෙන්නේ ස්තූතියි.

**ගරු මැතිතුමනි 2016 නොවැම්බර් මස 18 වෙනි දින පාර්ලිමේන්තු විවාද අන්තර්ගත වන හැන්සාඩ් වාර්තාව දැනටමත් මෙම ගරු කොමිෂන් සභාව හමුවේ C 291 වශයෙන් සළකුණු කොට තිබෙනවා. එහි එවකට ගරු අධිකරණ සහ බුද්ධ ශාසන අමාත්‍ය විජේදාස රාජපක්ෂ මහතාගේ කතාව ආරම්භ වන column එක C 291 (A) වශයෙන් දැනටමත් මෙම කොමිෂන් සභාව හමුවේ ලකුණු කොට ඉදිරිපත් කර තිබෙන බව ගෞරවයෙන් සැලකර සිටිනවා.**

ප්‍ර : මහත්මයා මම මීළඟ මහත්මයාගේ අවධානය යොමු කරන්න කැමතියි ඒ විජේදාස රාජපක්ෂ එවකට ගරු අමාත්‍යතුමාගේ කතාවට අවධානය යොමු කරන්න කැමැතියි. ඒ විජේදාස රාජපක්ෂ මහත්මයාගේ කතාවේ යම් කිසි ස්ථානයක සඳහන් වෙලා තිබෙනවද මේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා දෙමළ මිනිසුන්ට සහ මුස්ලිම් මිනිසුන්ට බැන වැදිලා ඒ බැන වැදීම සම්බන්ධයෙන් යම් යම් වෙබ් අඩවිවල කතා පල කරනවයි කියලා යම් ස්ථානයක සඳහන් කරලා තිබෙනවද?

පි : සඳහන් කර තිබෙනවා.

ප්‍ර : කුමක්ද ඒ සඳහන් කර තිබෙන්නේ?

පි : ගරු මැතිතුමනි column 1628 මේ 4 වෙනි ඡේදයේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා. අපේ හාමුදුරුවෝවරු දෙමළ මිනිසුන්ට මුස්ලිම් මිනිසුන්ට බැනලා ඒ වෙබ් අඩවිවල කතා පළ කරනවා එසේ සඳහන් වෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඊට පසුව තවදුරටත් ඒ කතාව ගලා ගෙන යමින් සඳහන් කරලා තිබෙනවද මේ රටේ තිබෙනවා තවුහිද් ජමාත් කියලා සංවිධානයක් සහ ඒ සංවිධානයේ නායකයාගේ යම් කිසි ක්‍රියාකලාපයක් සම්බන්ධයෙන් වන විස්තරයක් කතාවේ සඳහන් කරලා තිබෙනවද?

පි : සඳහන් වෙලා තිබෙනවා.

ප්‍ර : කුමක්ද එය.

පි : එම 1628 column එකේම 4 වෙනි ඡේදයේ මෙන්න මෙසේ සඳහන් වෙනවා. මේ රටේ තිබෙනවා තවුහිද්, ජමාඅත් කියලා සංවිධානයක්. ඒ සංවිධානයෙත් නායකයා කියන මනුස්සයාත් බුදුරජාණන් වහන්සේ මීනි මසු කාපු තැනැත්තෙක් විදියට හඳුන්වමින් බුද්ධාගමට බරපතල ලෙස අගෞරව කරමින් ආගමට නිගරු කරමින් යනවා. දැන් ඔහු අත්අඩංගුවට අරගෙන තිබෙනවා.

ප්‍ර : ස්තූතියි. ඉන් අනතුරුව මහත්මයා එම කතාවේ යම් ස්ථානයක සඳහන් වෙලා තිබෙනවද ISIS සංවිධානය සම්බන්ධයෙන්?

පි : සඳහන් වෙලා තිබෙනවා.

ප්‍ර : කොයි ස්ථානයකද තිබෙන්නේ ඒ කුමන ?

පි : මේ හැන්සාඩ් වාර්තාවට අනුව 1628 column එකේ පස්වෙනි ඡේදයේ අවස්ථා තුනක තිබෙනවා 1629 column එකේ එක අවස්ථාවක එක ස්ථානයක සඳහන් වෙනවා මේ ISIS සංවිධානය ගැන එතුමා කතා කරලා තියෙනවා.

ප්‍ර : ස්තූතියි දැන් එහි තිබෙනවද යම් ස්ථානයක මේ ISIS සංවිධානයට ශ්‍රී ලංකාවේ පවුල්වල ඉන්න සාමාජිකයන් සම්බන්ධ වීමක් ගැන ඒ මහත්මයා අදහස් දක්වා තිබෙනවද?

පි : තිබෙනවා.

ප්‍ර : කුමන ආකාරයෙන්ද ප්‍රකාශ කරලා තිබෙන්නේ?

පි : මෙම හැන්සාඩ් වාර්තාවේ 1628 column එකේ පස්වෙනි ඡේදයේ සඳහන් වෙනවා මෙන්න මේ ආකාරයට. අපේ රටේ පවුල් හතරකට සම්බන්ධ 32 දෙනෙක් මේ වන විට සිරියාවට ගිහිල්ලා ISIS සංවිධානයට සම්බන්ධ වෙලා තිබෙනවා.

ප්‍ර : ඊට අමතරව මහත්මයා එහි තිබෙනවද ලංකාවේ පවුල්වල පුද්ගලයන් සිරියාවට ගිහිල්ලා ISIS සංවිධානයේ කටයුතුවලට සම්බන්ධ වෙලා තිබෙනවයි කියලා ?

පි : තිබෙනවා.

ප්‍ර : කොහොමද ඒ ගරු මන්ත්‍රීතුමන් එය ප්‍රකාශ කරලා තිබෙන්නේ?

Parliament Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

පි : මේ ඒ පිළිබඳව ස්ථාන දෙකක ඇත්තටම සඳහන් වෙනවා column 1628 යටතේ අවසානයට සඳහන් වෙනවා අර මම කලින් කියපු තැන. 1629 ඡේදයේ සඳහන් වෙනවා 1629 column එකේ පළවෙනි ඡේදයේ සඳහන් වෙනවා මේ ආකාරයට. ඒ පවුල්වලට අදාළ 32 දෙදෙනෙක් සිරියාවට ගිහිල්ලා ISIS සංවිධානයේ කටයුතුවල යෙදී තිබෙනවා.

ප්‍ර : ඒ ආදී වශයෙන් තමයි සඳහන් වෙන්නේ?

පි : එහෙමයි .

ප්‍ර : ඒ වගේම එවකට ගරු ඇමතිතුමන්ගේ කතාවේ යම් ස්ථානයක සඳහන් වෙලා තිබෙනවද මේ මුස්ලිම් පාසල්වලට දේශන පවත්වන්න ගුරුවරුන් වශයෙන් විදේශීකයන්ගේ පැමිණීමක් සම්බන්ධයෙන්?

පි : සඳහන් වෙලා තිබෙනවා.

ප්‍ර : කොහොමද ඒ කුමන වචනවලින්ද ඒක සඳහන් වෙලා තිබෙන්නේ?

පි : 1629 column එක යටතේ පළවෙනි ඡේදයේ සඳහන් වෙනවා මේ ආකාරයට. ඒ වාගේම සමහර මුස්ලිම් ජාත්‍යන්තර පාසල්වල දේශන පවත්වන්න යම් යම් අය එනවා. ඒ අය එන්නේ ගුරුවරු වශයෙන් නොවේ. සංචාරක වීසා මත නෙවෙයි. ඒ උදවිය ඇවිල්ලා ඒකේ තවදුරටත් කියනවා ඒ උදවිය ඇවිල්ලා බේරුවල කල්මුණේ කල්එළිය, කුරුණෑගල ආදී ප්‍රදේශවල තිබෙන මුස්ලිම් පාසල් කිහිපයකට ගිහිල්ලා දරුවන්ගේ මනස විකෘති කරනවා. අන්තවාදය උගන්වනවා යන ආදී වශයෙන්.

ප්‍ර : ස්තූතියි ඒ වගේම ඒ මහත්මයාගේ කතාවේ යම් ස්ථානයක සඳහන් වෙනවද මුස්ලිම් ඉස්ලාම් ආගම අදහන තැනැත්තන්ගේ නිකායන් සහ ඒ නිකායන් වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් යම් සඳහනක් තිබෙනවද?

පි : සඳහන් වෙනවා.

ප්‍ර : කුමක්ද තිබෙන්නේ?

පි : 1629 column එකේ දෙවෙනි ඡේදය යටතේ සඳහන් වෙනවා තබ්ලික් ජමාඅත්, තවුහිද් ජමාඅත්, සුන්නත් වල් ජමාඅත්, ජමාඅතේ ඉස්ලාමී යනුවෙන් ඒ ගොල්ලන්ගේ නිකාය විදිහට තිබෙන සංවිධාන හතරක් මේ රටේ ක්‍රියාත්මක වෙනවා.

ප්‍ර : ඊට පසුව කුමක්ද තිබෙන්නේ?

පි : එතන ඉඳලා තිබෙනවා ඒ උදවියත් ඇණ කොටා ගන්නවා. ඒ කට්ටියත් මරා ගන්නවා.

ප්‍ර : ඒ ආකාරයෙන් තමයි සඳහන් වෙන්නේ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි.

**ගරු මැතිතුමනි ඒ අනුව මේ වන විටත් C 291 වශයෙන් ලකුණු කොට තිබෙන අදාළ column ලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා. ඒ අනුව C 291 වශයෙන් දැනටමත් ලකුණු කොට තිබෙන හැන්සාඩ් වාර්තාවේ 1628 වන column එක C 291 ( B ) වශයෙනුත්, 1629 column එක C 291 ( C ) වශයෙනුත්, සළකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා .**

ප්‍ර : දැන් මහත්මයා කිව්වා ඔය ගරු මන්ත්‍රීවරුන්ගේ කතා video තාක්ෂණය භාවිතා කරලා record කරනවා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔය හැන්සාඩ් වාර්තාවේ තිබෙන කතාව video ගත කිරීමක් සිද්ධ කරලා තිබෙනවද මහත්මයා?

පි : සිද්ධ කරනවා.

ප්‍ර : ඒ video දර්ශනය මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සඳහා රැගෙනවිත් තිබෙනවද අද? එම video දර්ශනයෙහි පිටපතක් මහත්මයාගේ ප්‍රකාශය ලබා දෙන අවස්ථාවේදී පොලිස් විමර්ශන අංශයට ලබා දීමක් සිද්ධ කළාද?

පි : 2019/12/03 වෙනි දින මෙම හැන්සාඩ් වාර්තාවේ පිටපත් සහ එම කතාව අඩංගු video දර්ශන පිටපත් මෙම කොමිෂන් සභාව වෙත භාර දීලා තියෙනවා.

**ගරු මැතිතුමනි එම අමාත්‍යාවරයාගේ කතාව දැනටමත් C 288 වශයෙන් කොමිෂන් සභාව හමුවේ CD පටයක් වශයෙන් ලකුණු කොට තිබෙනවා. එම CD පටයේ අන්තර්ගතය සහ මෙම සාක්ෂිකරු විසින් පොලිස් විමර්ශන ඒකකට ලබා දුන් CD පටයෙහි අන්තර්ගතය සියලු ආකාරයෙන්ම එක සමාන බව කොමිෂන් සභාවේ අවධානයට යොමු කර සිටිනවා. ගරු මැතිතුමනි මේ අවස්ථාවේදී එම video දර්ශනය වාදනය කොට එය සාක්ෂිකරු මාර්ගයෙන් හඳුනා ගැනීම සඳහා අවසර අයැද සිටිනවා.**

ප්‍ර : දැන් ඔය මහත්මයා මේ අවස්ථාවේදී දැකපු video පටය මේ කොමිෂන් සභාවේ විමර්ශන ඒකකය වෙත ලබා දුන් video පටය කියලා මහත්මයාට හඳුන ගන්න පුළුවන්ද?

පි : පුළුවන්.

ප්‍ර : ස්තූතියි. මහත්මයා 2016 නොවැම්බර් මස 22 වන දින පාර්ලිමේන්තු සැසි පැවැත්වෙච්ච දිනයක්ද?

පි : නොවැම්බර් මස 22 වෙනි දිනයත් පාර්ලිමේන්තුව පැවැත්වෙච්ච දිනයක්.

ප්‍ර : ඒ දිනයේදී පාර්ලිමේන්තු සැසිවාර පැවැත්වෙච්ච දිනයක්?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි.

ප්‍ර : එම දිනයේදී එවකට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කළ මුජුබර් රහුමාන් කියන මහත්මයා ඒ පාර්ලිමේන්තු සැසියට සහභාගි වෙලා තිබෙනවද?

පි : තිබෙනවා.

ප්‍ර : ඒ මහත්මයා පාර්ලිමේන්තු සැසිවලට සහභාගි වෙලා විවාදයට සහභාගි වී කතාවක් කරලා තිබෙනවද?

පි : එදින කතාවක් කරලා තිබෙනවා.

ප්‍ර : කතාවක් කරලා තිබෙනවා. එය කුමන හැන්සාඩ් වාර්තාවකද සඳහන් වෙලා තිබෙන්නේ වාර්තා වෙලා තිබෙන්නේ?

පි : 2016 නොවැම්බර් 22 වෙනි අඟහරුවාදා දිනයට අදාළව නිකුත් කළ 249 වන කාණ්ඩයේ 3 වන කලාපයේ හැන්සාඩ් වාර්තාවේ එම කතාව අඩංගු වෙනවා.

ප්‍ර : මහත්මයා එම හැන්සාඩ් වාර්තාවේ පිටපතක් අද කොමිෂන් සභාවට ගෙනවිත් ඉදිරිපත් කරනවද?

පි : ඉදිරිපත් කරනවා.

ප්‍ර : හොඳයි. ස්තූතියි

**ඒ අනුව ගරු මැතිතුමනි 2016 නොවැම්බර් මස 22 වෙනි දින දාතමින් යුතුව නිකුත් කරන ලද 249 වන කාණ්ඩයේ 03 වන කලාපය වන පාර්ලිමේන්තු විවාද ඇතුළත් හැන්සාඩ් වාර්තාව C 848 වශයෙන් ලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.**

**********

දැන් වේලාව : ප.ව.03.00 යි.
මෙතැන් සිට ල/ලේ :- සචිනි මෙය.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව: පෙ.ව.03.00
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

**<u>රජයේ අධිනීතිඥ දිලන්ත එස්.කළුදුරුවගේ මහතා.</u>**

**වීඩියෝ පටයක් ධාවනය කරයි.**

උ: එහි එවකට ගරු මන්ත්‍රීවරයකු වූ මුජුබර් රහුමාන් මහතාගේ කතාව කුමන Column එකකින් ද ආරම්භ වන්නේ?

පි: එම 2016 නොවැම්බර් 22 වෙනි අහඹරුවාදා හැන්සාඩ් වාර්ථාවේ 548 වෙනි Column මෙම කතාව ආරම්භ වෙනවා.

ප්‍ර: 548 වන Column මෙන් තමයි මුජුබර් රහුමාන් මහතාගේ කතාව ආරම්භ වන්නේ ?

පි: එහෙමයි.

ප්‍ර: එම කථාව තුල යම් අවස්ථාවක එවක ගරු අමාත්‍යවරයකු වූ විජේදාස රාජපක්ෂ මැතිතුමාගේ කථාවකට අවධානය යොමුකරමින් සිදු කළ ප්‍රකාශයක් අන්තර්ගත වෙනවද?

පි: අන්තර්ගත වෙනවා.

ප්‍ර: කථාවකට ප්‍රතිචාරයක් වශයෙන් සිදු කරපු ප්‍රකාශයක් අන්තර් ගත වෙනවාද ?

උ: අන්තර් ගත වෙනවා.

ප්‍ර: ඒ කුමන Column එකක ද එය අන්තර්ගත වන්නේ?

උ: එම හැන්සාඩ් වර්ථාවේ 549 වන Column මේ දෙවන ඡේදයේ එම සඳහන් කිරීම අන්තර්ගතයි.

ප්‍ර: එහි කොයි ආකාරයෙන් ද මේ විජේදාස රාජපක්ෂ මැතිතුමාගේ කතාවකට අවධාන යොමුකිරීම කියන එක සඳහන් වෙලා තිබෙන්නේ?

උ: දෙවනි ඡේදයේ මුලින්ම සඳහන් වෙනවා වේලාව සීමිත නිසා මම ඊළඟට අවධානය යොමු කරන්න කැමතයි අපේ ගරු විජේදාස රාජපක්ෂ මැතිතුමා මීට දවස් කීපයකට කලින් සඳහන් කළ කාරණයක් සම්බන්ධව.

ප්‍ර: ඒ ආදි වශයෙන් තමයි මේ විජේදාස රාජපක්ෂ අමාත්‍යවරයාගේ කථාවට අවධානය යොමු කර තිබෙන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: එහි සඳහන් වෙනවා ද එම කතාවට ප්‍රතිචාරයක් එම විජේදාස රාජපක්ෂ මැතිතුමාගේ කථාවට ප්‍රතිචාරයක් වශයෙන් ISIS සංවිධානයට ලංකාවේ පුද්ගලයන්ගේ සහභාගීත්වය සහ ඒ අදාළ සංඛ්‍යා ලේඛන සම්බන්ධයෙන් මුජුබර් රහුමාන් මහතාගේ ප්‍රතිචාරය කොයි ආකාරයෙන් ද දක්වා තිබෙන්නේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: එම හැන්සාඩ් වාර්තාවේ 549 වන Column මේ 2 ඡේදයේ මෙන්න මේ ආකාරයට සඳහන් වෙනවා. එතුමා කිව්වා ISIS සංවිධානයට ලංකාවේ 32 දෙදෙනෙක් සම්බන්ධයි කියලා. එතුමාට කවුරු ඒ සංඛ්‍යා ලේඛන ලබාදුන්නා ද කියන්න මම දන්නේ නැහැ. මම එතුමාට කියන්න ඕන ඒ සංඛ්‍යා ලේඛන නිවැරදි නැහැ කියලා.

ප්‍ර: ඒ වගේම එම මුජුබර් රහුමාන් මහතාගේ කථාවේ තියෙනව ද ISIS සංවිධානයට යම් තැනැත්තන් සම්බන්ධයෙන් සම්බන්ධ වෙච්ච සඳහනක් සහ ඔවුන්ගේ ක්‍රියාකලාපය සහ ඔවුන් මේ රටේ රැඳී සිටිනවද පිට වෙලා ගියාද කියන එක සම්බන්ධයෙන් යම් කිසි ප්‍රතිචාරයක් දක්වා තිබෙනවාද?

උ: තිබෙනවා.

ප්‍ර: කුමක්ද සඳහන් කරලා තිබෙන්නේ?

උ: එම දෙවනි ඡේදයේම මෙන්න මේ අකාරයට සඳහන් වෙනවා. මීට අවුරුදු එකහමාරකට කලින් බුද්ධි අංශ වාර්තා කලා ලංකාවේ 4 දෙනෙක් ISIS සංවිධානයත් එක්ක සම්බන්ධකම් පවත්වලා මේ රටින් පිටවෙලා ගියා කියලා.

ප්‍ර: ඒ වගේම එහි සඳහන් වෙනද මේ IS සමාජිකයන් සම්බන්ධයෙන් ලංකාවේ බුද්ධි අංශ වල සොයා ගැනීම් ගැන මුජුබර් රහුමාන් මහතා කොයි ආකාරයෙන් ද ප්‍රතිචාර දක්වා තිබෙන්නේ කියලා ?

උ: සඳහන් වෙනවා.

ප්‍ර: කොහොම ද තිබෙන්නේ?

උ: අර මා මුලින් කියපු ආකාරයට එම වාක්‍ය පටන් ගන්නකොටත් එතුමා කියලා තියෙනවා මේ අකාරයට මීට අවුරුදු එක හමාරකට කලින් බුද්ධි අංශ වර්තා කළා යන ආදිය වශයෙන් කියලා ඊළඟට අවසානයේ සඳහන් කරනවා ඒකත් සැකකරනවා කියලා පමණයි බුද්ධි අංශ වර්ථාවේ තිබෙන්නේ .

ප්‍ර: ඒ වගේම ඒ විජේදාස රාජපක්ෂ මැතිතුමාගේ කථාවට ප්‍රතිචාරයක් වශයෙන් මේ ජාතික සංහිදියාව කියන කාරණය මූලික කරගෙන යම්කිසි ප්‍රකාශයක් සිදු කර තිබෙනවා ?

උ: තිබෙනවා.

ප්‍ර: කොහොමද තිබෙන්නේ.

උ: එම දෙවනි ඡේදයේ අවසානයට මේ ආකරයෙන් සඳහන් වෙනවා. මේ රටේ ජාතික සංහිදියාව ඇති කරගෙන යන මේ වෙලාවේ අපි යම් යම් දේවල් කියන කොට ඉතා වගකීමෙන් කටයුතු කරන්නි ඕනෑය කියලා මා විශ්වාස කරනවා මේ රටේ ජාතික සමඟිය ගොඩනගන්නයි අපි මේ රජයක් හැටියට උත්සහ කරන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හරි ඒ ජාතික සංහිදියාව සම්බන්ධයෙන් මුජුබර් රහුමාන් මහතාගේ ප්‍රතිචාරය තමයි කතාවේ දක්වා තිබෙන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: ඊට පසුව ඒ කථාවේ සඳහන් වෙලා තිබෙනවද මේ ඩේලි නිව්ස් පුවත්පතේ යම් කිසි පළ කිරීමක් සම්බන්ධව ?

උ: එහෙමයි.

ප්‍ර: කොයි ආකාරයෙන් ද සඳහන් වෙලා තියෙන්නේ?

උ: එම දෙවනි ඡේදයේම සඳහන් වෙනවා රජයේ අදහස් පළ කරන ඩේලි නිව්ස් පුවත් පත ඊළඟ දවසේ - 2016.නොවැම්බර් 19 වන සෙනසුරාදා පුවත්පතේ මුල් පිටුවේ ඒ පිළිබඳව මෙසේ සඳහන් කර තිබෙනවා. 32 Lankans join Islamic state movement ඩේලි නිව්ස් පුවත්පතෙන් මම අහනවා "සංහිදියාව ඇති කරන්නද එහෙම කරේ" කියලා.

ප්‍ර: ඒ වගේම මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් යම්කිසි සඳහන් කරමින් එහි දේශකයන් පැමිණීම සහ ආගමික සිද්දස්ථාවලත් ජාත්‍යන්තර පාසල් වලත් මේ දේශකයින්ගේ ඉගැන්වීම් කටයුතු කිරීම සම්බන්ධව මුජුබර් රහුමාන් මහත්මයා එම කතාවේ යම්කිසි සඳහනක් කරලා තිබෙනවද ?

උ: සඳහන් කරලා තිබෙනවා. එම 549 වන Column සේම 05 Column මයේ සඳහන් වෙනවා මේ අකාරයට පසුගිය කාලය තුළම මේ චෝදනා තිබුණා මුස්ලිම් ජනතාවට එරෙහිව චෝදනා තිබුණා. එතුමා කිව්වා පිටරටවලින් දේශකයෝ ආවා කියලා. කිසිම ආගමක සිද්ධස්ථානයකවත් ජාත්‍යයන්තර පාසැල් වලවත් කිසිම රටකින් දේශකයෝ ඇවිල්ලා උගන්වන්නේ නැහැ. සංචාරක වීසා වලින් ඇවිල්ලා කවුරුත් ආගමික කටයුතු වල යෙදෙන්නේ නැහැ යනාදි වශයෙන්.

ප්‍ර: ඊ ළඟට කුමක් ද සඳහන් කරලා තිබෙන්නේ?

උ: ඊළඟට එතුමා කියලා තියෙනවා එතුමා පලකල ඒ චෝදනා සියල්ල පසුගිය කාලේ මුස්ලිම් සිංහල ගැටුම් ඇති කරන්න කටයුතු කල සංවිධාන වලින් කිව්ව දේවල් .

ප්‍ර: දැන් ඔය මුජුබර් රහුමාන් මහතාගේ කථාව ශ්‍රව්‍ය දෘශ්‍යාකාරයෙන් පටිගතකොට එහි වීඩියෝ දර්ශනයක් මහත්මයා මේ කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ලබා දුන්නද?

උ: ලබා දුන්නා.

ප්‍ර: එය මහත්මයාට අද දින ඉදිරිපත් කරන්න පුළුවන්ද?

උ: පුළුවන් .

ප්‍ර: එම වීඩියෝ දර්ශනය පේනවා සිටීම සඳහා අවසර අයැදි සිටිනවා ගරු මැතිතුමණි ඉතාම කෙටි වීඩියෝ දර්ශනයක්

**ගරු මැතිතුමණි මීට පෙර අවස්ථාවකත් මුජුබර් රහුමාන් මන්ත්‍රීවරයාගේ කතාවක් අන්තර්ගත වීඩියෝ පටයක් මෙම ගරු කොමිෂන් සභාවට**

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

**ඉදිරිපත්කොට තිබෙනවා. නමුත් එම විඩියෝ දර්ශනය යම්කිසි මාධ්‍ය ආයතනයකින් ලබාගත් එක් කොටසක් පමණයි අන්තර්ගත වෙනන්නේ ඒ අනුව එහි ඔර්ජිනල් කොපි එක වශයෙන් මෙය වෙනම සලකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා . සම්පූර්ණ කතාව මේ අවස්ථාවේදී වෙනම මාර්කින් එකක් ලබා දීලා ලකුණු කිරීමට අවසර අයැද සිටිනවා. ඒ අනුව ගරු මැතිතුමණි පෙර අවස්ථාවක මුජුබර් රහුමාන් මන්ත්‍රීවරයාගේ කතාවේ කොටසක් ඇතුළත් වන වීඩියෝ දර්ශනයක් දැනටමත් මන්ත්‍රීවරයාගේ කථාවේ කොටසක් ඇතුළත් වන විඩියෝ දර්ශනයක් දැනටමත් C 290 වශයෙන් ලකුණු කොට තිබෙනවා කෙසේ වුවද මේ අවස්ථාවේ එකී මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තුවේ 2016 නොවැම්බර් මස 22 වැනිදා කතාව ඇතුළත් සම්පූර්ණ විඩියෝ පටය මෙම සාක්ෂිකරු මාර්ගයෙන් ලබාගෙන එය C290 A වශයෙන් සලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.**

ප්‍ර: එම වීඩියෝ දර්ශනය නැවත දැක්කොත් මහත්මයට හඳුනාගන්න පුළුවන් ද?

උ: පුළුවන්.

**වීඩියෝ පටයක් ධාවනය කරයි.**

**********

**<u>ගරු අදිකාරී මැතිණිය.</u>**

ප්‍ර: MR. ගජවීර ඔබ මෙම කොමිෂමේ පොලිස් ඒකකයේ දුන්න ප්‍රකාශයේ සඳහන් කරනවා පාර්ලිමේන්තුවේ කාරකසභා සියල්ලම ඔබගේ විෂය පථය යටතට වැටෙනවා කියලා?

උ: එහෙමයි.

ප්‍ර: එය ඔබ පාර්ලිමේන්තුවේ කාරක සභා කිව්වාහම ඒකට අයිති වෙනව ද 2015 පෙර තිබුණු උපදේශක කාරක සභා සහ 2015 පසුව ඇති කරන ලද ආංශික අධීක්ෂණ කමිටු කියන දෙක?

උ: ඇතුළත් වෙනවා.

ප්‍ර: ඔබ මෙම කමිටුවල රැස්වීම් වලට සහභාගි වෙනව ද අධ්‍යක්ෂකවරයා ලෙස?

උ: අනිවාර්යෙන්ම සෑම රැස්වීමකටම සහභාගී නොවුණත් ඉඩකඩ ලැබෙන පරිදි පුළුවන් තරම් අවස්ථාවන්වලදී සහභාගි වෙනවා.

ප්‍ර: ඔබට කියන්නට පුළුවන් ද 2015 වසරට පෙර තිබුණු උපදේශක කාරක සභාවල පෙර ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා රැස්වීම් වලට ඔබ සහභාගි වුණේ කිනම් වර්ෂයේ ද? 2015 පෙර

උ: මට මතකයෙන් කියන්න අපහසුයි නිශ්චිතවම.

ප්‍ර: 2014 වසරේ ඔබ සහභාගි වුණා ද? උපදේශක කාරක සභාව?

FAIR COMMENT BY JEZEEM

උ: ගරු මැතිණියනි දින වකවානු වශයෙන් මට මතයට නැගෙන්නේ නැහැ. නමුත් බොහෝ අවස්ථා වලදී සහභාගි වෙන්න ඇති.

ප්‍ර: එහෙම නම් ඔබට කියන්නට පුළුවන් ද මෙම කොමිසන් සභාවට ඔබ සහභාගී වූ 2015 වසරට පෙර ඔබ සහභාගී වූ රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව උපදේශක කාරක සභාවේ දී ඉස්ලාම් ආගමික අන්තවාදය පිළිබඳව එහි අවධානම පිළිබඳව සාකච්ඡා වුණා ද කියලා?

උ: ඒ කාරක සභාවේ දී මේ පිළිබඳව වරින් වර සාකච්ඡාවෙලා තිබෙන බව දන්නවා.

ප්‍ර: එම කාරක සභාන් වලට ආරක්ෂක අමාත්‍යවරයා සහභාගී වෙනව ද?

උ: ගරු මැතිණියනි ආරක්ෂක අමාත්‍යයවරයා බොහෝ දුරට වන්නේ අතිගරු ජනාධිපතිතුමිය හෝ ජනාධිපතිතුමා. ඒක නිසා සෑම විටම එතුමන් ඒ රැස්වීමට සහභාගි නොවුණත් බොහෝ අවස්ථාවලදී ස්ථාවර නියෝගය ප්‍රකාරව රාජ්‍යය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා සහභාගි වෙනවා. නමුත් ඇතැම් අවස්ථාවලදී චන්දිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය ජනාධිපතිනිය වෙලා හිටපු අවස්ථාවලදීත් මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිව සිටි අවස්ථාවලදීත් අපි උපදේශක කාර්යක සභා රැස්වීම් අරලියගහ මන්දිරයේ පැවැත්තුවා ආරක්ෂාව සලසා ගැනීමේ ගැටළුවක් ඇති විය හැකිය කියන තත්ත්වය නිසා. එම අවස්ථාවලදී අති ගරු ජනාධිපතිතුමත් අතිගරු ජනාධිපතිතුමිය පෞද්ගලිකවම එම රැස්වීම් වල මුලසුන හෙබුවා.

ප්‍ර: ආරක්ෂක විෂය භාර අමාත්‍යයවරයා හෝ නියෝජ්‍ය අමත්‍යවරයා හැර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබුණු ත්‍රිවිධ හමුදාවල ප්‍රධානීන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජාතික බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක සහ යුධ හමුදා බුද්ධි ඒකකයේ ප්‍රධානියා එවැනි නිලධාරිවරුන් මෙම උපදේශක කරක සභාවට සහභාගි වෙනව ද?

උ: ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා අනිවාර්යෙන්ම සහභාගී වෙනවා. සියලුම ත්‍රිවිධ හමුදාපතිවරුන් පොලිස්පතිතුමා මෙම රැස්වීමට සහභාගී වෙනවා. නමුත් ගරු මැතිණියනි බුද්ධි අංශ වල ප්‍රධානීන් සහභාගි වුණා ද කියලා මට මතකයෙන් කියන්න අපහසුයි. නමුත් ඒ එක එක රැස්වීම සඳහා අපි පැමිණීමේ නාමලේඛනයක් අත්සන් කරනවා ඒ පැමිණි නිලධාරීන් විසින්ම. ඒ නාමලේඛනය පරීක්ෂා කරහොත් මට කිවත හැකියි නිශ්චිත දවසක කිනම් නිලධාරීන් පැමිණ සිටියා ද කියලා.

ප්‍ර: සාමාන්‍යයෙන් මෙම උපදේශක කාරක සභාවන් මාසෙකට වරක් පවත්වනවා ද කොහොම ද? කාර්තුමය වශයෙන් ද පවත්වන්නේ?

උ: ස්ථාවර නියෝගවල නියම කරලා තිබෙන්නේ හැකි තරම් දුරට මාසෙකට වරක් පවත්වන්න කියලා. නමුත් මට මතක හැටියට අතිගරු

FAIR COMMENT BY JEZEEM

ජනාධිපතිතුමාගේ ආරක්ෂක අමාත්‍යාංශයේ රැස්වීම් ඇතැම් අවස්ථාවල මාස දෙකකට වරක් හෝ තුනකට වරක් පැවතුන අවස්ථාත් තියෙනවා.

ප්‍ර: මහත්මයා ඔබට මතකයක් තියෙනවා ද ඉස්ලාම් ආගමික අන්තවාදය කතා කරා සේම ජාතික තවුහිජ් ජමාත් කියන සංවිධානයක් හෝ සහරාන් හෂිම් කියන පුද්ගලයෙක් පිළිබඳව හෝ 2015 පෙර පැවති උපදේශ කාරක සභාවලදී සාකච්ඡාවට භාජනය වුණා ද කියන එක?

උ: මට එකවරම මතකයෙන් ඒකට පිළිතුරු දෙන්න අපහසුයි.

ප්‍ර: ඔබට කියන්නට පුළුවන් ද 2015 පසුව ඇති කරන ලද ආංශික අධීක්ෂණ කමිටු කියන ඒවා උපදේශක කාරක සභාවම වෙනත් නමකින් ඉදිරිපත් වීමක්ද සිද්ධ වුණේ ?

උ: නැහැ.

ප්‍ර: එකේ දී මොකද්ද සිද්ධ වුණේ?

උ: ඒ කාර්ය භාර්ය මද වශයෙන් වෙනස්. මද වශයෙන් නෙවෙයි ඒක ටිකක් වෙනස්. ගරු මැතිණියනි මට අවසර දෙන්න ඒක පොඩ්ඩක් පැහැදිලි කරන්න. ඇත්තටම 2015 තමයි මේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා පිහිටවපු ආණ්ඩුව යටතේ තමයි මේ ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය පිහිටුවේ. එතකොට අපි එක කාරක සභාවක් ඒ යටතේ ආංශික අධීක්ෂණ කාරක සභා 16 ක් පිහිටෙව්වා. ඒ 16 න් එකක් තමයි ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණය කාරක සභාව. එතකොට ඒ යටතේ ආරක්ෂක ,නීතිය හා සාමය යන ආදී අමාත්‍යාංශ කිහිපයක අමාත්‍යාංශ එකට ගොනු කරමින් තමයි මේ ආංශික අධීක්ෂණ ක්‍රමය ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය පිහිටෙව්වේ. ඒ කියන්නේ අමාත්‍යාංශ 35 ක් තිබුණට මේ 35 ම ගොඩක් කොටස් 16 කට බෙදලා තමයි මේ ආංශික අධීක්ෂණ කාරක ක්‍රමය පිහිටවලා තිබුණේ. එතකොට ජාතික ආරක්ෂාව පිළිබඳව ආංශික කාරක සභාවට අයිති ජාතික ආරක්ෂක අමාත්‍යාංශය නීතිය හා සාමය අමාත්‍යාංශය ආගමන විගමන අංශය ඒ වගේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු ගණනාවක් එකට කැටි කරලා තමයි මේ ජාතික ආරක්ෂක ආංශික අධීක්ෂණ කාර්ක සභාව පිහිටෙව්වේ.එතකොට ඒ පාර්ලිමේන්තුවේ සම්මත කරපු යෝජනාවක් මඟින් උපදේශක කාරක සභා ක්‍රමය තාවකාලිකව යටපත් කරා. ඉංග්‍රීසියෙන් කියනවනම් Suspended තාවකාලිකව නැවැත්තුවා. නමුත් පසුකාලීනව මන්ත්‍රීවරු ඉල්ලීම් කරා නැවත වාරයක් මේ උපදේශක කාරක සභා ක්‍රමය පිහිටුවන්නට කියලා. ඒ අනුව ඊට වසර දෙකකට පස්සේ අපි පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කරලා නැවත වාරයක් උපදේශක කාරක සභා ක්‍රමය පිහිටෙවුවා. මේ කාරක සභා ක්‍රම දෙකේ තිබෙන මූලික වෙනස තමයි ගරු මැතිතුණියනි ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයින් වෙන්න බැහැ අමාත්‍යාංශ තනතුරක් දරණ කිසිවෙකුට. එම කාරක සභාවක මූලාසනය දරන්ටත් බැහැ. ඒ වගේම

FAIR COMMENT BY JEZEEM

තමන්ගේ විෂය පථය අයිති කාරක සභාවක සාමාජිකයෙක් වෙන්න බැහැ. නමුත් වෙනත් විෂය පථයක් තියෙන කාරක සභාවක සාමාජිකයෙක් වෙන්න පුළුවන්. ආංශික අධීක්ෂණ කාරක සභාවක සභාපතිවරයා සෑම විටම පත්කරන්නේ ඒ කාරක සභාවේ මන්ත්‍රීවරුන්ගේ ජන්දයකින් කවුරු හරි සමාන්‍යය තනතුරක් නොදරන මන්ත්‍රීවරයෙක් තමයි බොහෝ වෙලාවට සභාපතිවරයා හැටියට පත් වෙන්නේ. නමුත් උපදේශක කාරක සභා ක්‍රමය යටතේ අනිවාර්යෙන්ම ඒ අමාත්‍යාංශයේ විෂය අයිති ගරු අමාත්‍යයතුමා තමා එම කාරක සභාවේ සභාපති. හැබැයි අතිගරු ජනාධිපතිතුමා යටතේ ඒ විෂය තියෙන කොට එතුමාගේ නියෝජ්‍යය අමත්‍යවරයා තමයි නිල බලයෙන්ම ඒ කාරක සභාවේ සභාපති ධුරය දරන්නේ.

ප්‍ර: MR. ගජවීරට කියන්න පුළුවන් ද 2015 පසුව ඇති කරපු ඔය ආරක්ෂක විෂය පිළිබඳව ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී ඉස්ලාම් ආගමික අන්තවාදය පිළිබඳව සාකච්ඡාවට භාජනය වුණා ද?

උ: යම් යම් අවස්ථාවල ඒ පිළිබඳව කතා කළ බව මතකයි.

ප්‍ර: ඒ වගේම මම මෙම කොමිෂමට ඔබගෙන් දැනගන්නට කැමති 2015 වසරෙන් පසුව ජාතික තවුහිද් ජමාත් කියන සංවිධානය සහ සහරාන් හෂීම් කියන පුද්ගලයා පිළිබඳව හෝ ISIS ත්‍රස්තවාදීන් ශ්‍රී ලංකාවේ සබඳතා පවත්වන ඉස්ලාම් ආගමික පිරිසක් පිළිබඳව බොහෝ කරුණු වාර්තා වුණා ද 2015 පසුව ඇති වෙච්ච කමිටුවේ දී?

උ: පාර්ලිමේන්තු කාරක සභාවල වරින් වර ඒ පිළිබඳව කතා කරලා තිබෙනවා.

ප්‍ර: ඒ පිළිබඳව තොරතුරු අපිට මෙම කොමිෂම හමුවට ලබාගන්නවා නම් ඒවා කෙසේද ලබාගත හැකි ?

උ: ගරු මැතිණියනි මට කාලයක් ලබා දුන්නොත් මං කොමිෂන් සභාවට ඒ සියලු වාර්තා ලබාදෙන්නම්.

ප්‍ර: 2015 පසුව ආරක්ෂාව පිළිබඳව ආංශික අධීක්ෂණ කමිටුවලට සහභාගී වුණා ද ඔය ආරක්ෂක අමාත්‍යාංශයේ දැන් ඒ කමිටුවලට නිලධාරී හෝ එම විෂය භාර ඇමතිවරයා සභාපති නොවුණාට එම කමිටුවට අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන් පොලීසියේ ප්‍රධානියා පොලිස්පතිතුමා ඊට පස්සේ ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් එවැනි අය සම්බන්ධ වුණා ද මේ ආංශික අධීක්ෂණ කමිටුවට කාරක සභාවට ?

උ: ආංශික අධීක්ෂණ කමිටුවට සාමාන්‍යයෙන් අර උපදේශක කාරක සභාවට වගේ අනිවාර්යෙන් සහභාගී වෙන්නේ නැහැ අමාත්‍යාංශ වල නිලධාරීවරුන්. යම්කිසි ගැටළුවක් සාකච්ඡා කරන්න තියෙනව නම් අපි ඒ වෙලාවට ඒ අදාළ නිලධාරීන් කැඳවනවා. ඒක නිසා මට අවසරය ඉල්ලා සිටිනවා ඒ ලේඛන පරීශීලනය කරන්නෙ නැතුව මට එකපාරට පිළිතුරක් දීමට අපහසුයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: MR. ගජවීර ඔබ ළඟ තිබෙනවා ද 2015 ට පෙර පැවති උපදේශක කාරක සභාවල මේ ආරක්ෂක විෂය භාරව පැවති සංයුතියත් 2015 පසුව ඇති කරන ලද ආංශික අධීක්ෂණ කාරක සභාවල් වල මෙම රාජ්‍ය ආරක්ෂාව ආරක්ෂක නීතිය හා සාමය එම විෂයන්ට අදාළව එම කමිටුවල සංයුතිය කුමක්ද කියන එක?

උ: මගේ ළඟ දැනට නැති වුණත් මට ඒ සියලු තොරතුරු ලබාදෙන්න පුළුවන්.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අතිඋතුම් මැල්කල් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් විමසමි. අවශ්‍ය නොවන බව දන්වයි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කටයුතු වලට දැක්වූ සහයෝගය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තූතිය පළ කරනවා.
සාක්ෂිකරු මුදා හරිනවා.

වේලාව: ප.ව.03.25

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව**

**දිනය: 2020.07.16** **වෙලාව:- පෙ.ව.09.55**

(සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි)

**ගරු විනිසුරු මඩුල්ල:-**

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - **සභාපති**

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - **සාමාජික**

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - **සාමාජික**

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - **සාමාජික**

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - **සාමාජික**

**<u>පෙනී සිටීම:</u>**

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර, දිලන්ත එස්.කළුදුරුවගේ සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ චමත් ප්‍රනාන්දු මහතා කොමිසමේ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**පෙර දින සාක්ෂි දුන් සාක්ෂිකරු නැවත කැඳවයි.**

**<u>සම්පූර්ණ නම: වඩුගේ කෞෂාල් නාලක ද සිල්වා</u>**

**<u>නැවත කැඳවා ප්‍රතිඥා දෙයි. (ඉංග්‍රීසි බසින් ප්‍රතිඥාව ලබා දෙයි)</u>**

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>**

ප්‍ර : ඔබ පසුගිය දින සාක්ෂි දෙන විට මේ ගරු කොමිෂන් සභාවට කියා සිටියා ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ සේවය කරද්දි 2014 වර්ෂයේ දී එම බුද්ධි සේවාවේ තිබූ ත්‍රස්ත විමර්ශන ඒකකය සහ ආගමික අන්තවාදී ඒකකයන් එක්කාසු කර ඔබට එම නව ඒකකය භාරදුන් බව?

පි : එහෙමයි. මුස්ලිම් ආගමික අන්තවාදය.

ප්‍ර : මුස්ලිම් ආගමික අන්තවාදී සම්බන්ධයෙන් වන ඒකකය සහ ත්‍රස්තවාදී විමර්ශන ඒකකය තමයි එකතු කරලා එක් ඒකකයක් හැටියට 2014 ස්ථාපිත කළේ?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ එම ඒකකය භාර රාජ්‍ය නිවේදිත නිලධාරියා වශයෙන් කටයුතු කළේ?

පි : ඔව් නියෝජ්‍ය අධ්‍යක්ෂක.

ප්‍ර : ඔබ තවදුරටත් කියා සිටියා එදා මෙම ඒකකය විසින් 2014 දී ඉස්ලාම් ආගමික අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු සෙවීමට නිලධාරීන් 40 දෙදෙනෙකු පමණ නැගෙනහිර ප්‍රදේශයට යොදවා තිබුණ බව?

පි : ඔව් 40 දෙනෙක්ට වඩා හිටියා.

ප්‍ර : 40 ට වඩා හිටියා. ඊට අමතරව අනෙකුත් ප්‍රදේශයන්වල ඒ කියන්නේ නැගෙනහිර නොවන ප්‍රදේශයන්වලටද නිලධාරීන් යොමු කරලා තිබ්බද?

පි : ඔව් මට භාරදීලා තිබ්බේ උතුරු නැගෙනහිර පළාත් දෙකම. එතකොට උතුරු පළාතෙත් හිටියා, නැගෙනහිර පළාතෙත් හිටියා. සමස්ථයක් වශයෙන් ගත්තාම මගේ subject එකට අදාලව මුළු ලංකාවේම.

ප්‍ර : ඒ කියන්නේ මුළු ලංකාවේම නිලධාරීන්.

පි : නැහැ රාජ්‍ය බුද්ධි සේවාවේ කාර්යාල තියෙනවා හැම කොට්ඨාශයකම. පොලිස් කොට්ඨාශයකම. ඒ කියන්නේ දිසා බුද්ධි සේවා කාර්යාංශය කියලා. එතකොට ඒකේ ඒ නිලධාරීන්ව අපි තෝරා ගන්නවා උදාහරණයක් ගත්තොත් මගේ subject එකටත් එක්කෙනෙක් පත් කරනවා ඒ කාර්යාංශයේ. එහෙම ගත්තාම ඒ ඔක්කෝම මුළු ලංකාවේම ආවරණය වෙලා තමයි

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තියෙන්නේ. එතකොට අපි ලියුමක් එවන්නේ OIC ට. OIC ඒ කරන නිලධාරියට කියලා ඒ වැඩේ කරනවා.

ප : ඔබට මා පැහැදිලි කර ගැනීමක් වශයෙන් ඇසුවොත්, ඉස්ලාම් ආගමික අන්තවාදය සම්බන්ධයෙන් අවශ්‍යතාවය මත රට පුරා විහිදී සිටින සියළුම රාජ්‍ය බුද්ධි සේවාවට සම්බන්ධ නිලධාරීන්ගෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාවක් 2014 වර්ෂයේ තිබුණා කියලා කිව්වොත් හරිද?

පි : ඔව් 2014 ත්, ඊට ඉස්සෙල්ලත් තිබ්බා.

ප : දැන් මෙම ඉස්ලාම් ධර්මය සම්බන්ධව ඒ තොරතුරු ඒ අන්තවාදී කරුණු සම්බන්ධයෙන් තොරතුරු හොයන්න ඒ නිලධාරීන් යොමු කිරීමේදි ඔබ ඒ සඳහා යොමු කළේ සිංහල නිලධාරීන් පමණක්ද?

පි : නැහැ.

ප : ඒ කියන්නේ අන්‍ය ජාතිකයනුත් යොමු කරන්න යෙදුනද?

පි : ඔව් වැඩි වශයෙන් මුස්ලිම් නිලධාරීන් හිටියේ.

ප : සමාවන්න.

පි : වැඩි වශයෙන් හිටියේ මුස්ලිම් නිලධාරීන්.

ප : මෙම කාර්යය ඒ කියන්නේ ඉස්ලාම් ආගමික අන්තවාදය සම්බන්ධයෙන් තොරතුරු සොයන්නට යෙදුනු මේ මුස්ලිම් නිලධාරීන් ඒ සම්බන්ධයෙන් කොයි ආකාරයක ප්‍රතිචාරයක්ද ඔබ වෙත දැක්වූයේ කියලා මතකයක් තියෙනවද?

පි : එහෙම විශේෂ සැළකිල්ලක් දැක්වූයේ නැහැ. නමුත් ඒගොල්ලන්ට දුන්නු රාජකාරිය සිදු කරන්න ඕනේ. ඒක තමයි මගේ නියෝගය. ඒ නියෝගය අනුව ඒගොල්ලන් ක්‍රියාත්මක වෙනවා.

**********

**<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>**

ප : තමන් කිව්වා නැගෙනහිර පළාතෙත් තමන්ගේ බුද්ධි නිලධාරීන් ආවේක්ෂණ රාජකාරීවලට යොදලා තිබ්බා කියලා?

පි : එහෙමයි .

ප : ඒ යොදලා තිබ්බේ එක එක පොලිස් ස්ථානවලද?

පි : නැහැ, නැහැ.

ප : වෙනම අංශයක් තිබ්බද?

පි : රාජ්‍ය බුද්ධි සේවාවේ ඉන්නේ හැම පොලිස් කොට්ඨාශයකම SSP Division කොට්ඨාශයක් තියෙනවානේ, කොට්ඨාශයට තියෙනවා DIB එකක්. දිසා බුද්ධි සේවා කාර්යාංශය. ඊට අමතර ලෙස අපි unit එකකුත් පිහිටවනවා. ඒ unit එක උදාහරණයක් ගත්තොත්, අම්පාරේ එකක් තිබ්බා, මඩකලපුවේ එකක් තිබ්බා,

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ත්‍රිකුණාමලේ එකක් තිබ්බා. ඒවගේ ඒවා අපි බිහි කළේ LTTE ත්‍රස්තවාදී කාලේ තමයි ඒවා දැම්මේ. අර DIB කට්ටියට අමතරව තව කට්ටියක් දැම්මා. Unit දාලා තොරතුරු ලබා ගන්න. ඉතින් ඒක එහෙමම ක්‍රියාත්මක වුණා මම ඉන්න කොට. එතකොට ඒ නිලධාරීන් ඉන්නේ ඒ ස්ථානවල. ඒගොල්ලන් Independently තමයි ඒ වැඩේ කරන්නේ.

ප්‍ර : ඒ කියන්නේ මුලින් වාර්තා කරන්නේ කෙලින්ම කොළඹ බුද්ධි අංශයට?

පි : ඔව් මගේ subject එක නම් මට වාර්තා කරනවා.

ප්‍ර : ඒ DIG ට ඒ කට්ටියට කාටවත් DIG ට වත් වාර්තා කරන්නේ නැහැ?

පි : නැහැ, නැහැ

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>**

ප්‍ර : දැන් මෙම නිලධාරීන් ඒ කියන්නේ මුස්ලිම් නිලධාරීන් බුද්ධි රාජකාරී සිදු කර ඒ තොරතුරු ලබා දීමේදි ඔවුන්ට කිසියම් චකිතයක් හෝ නොසන්සුන් භාවයක් ඔබ නිරීක්ෂණය කළාද එම නිලධාරීන්ගෙන්?

පි : එහෙම විශේෂ චකිතයක් නම් තිබුන් නෑ. දුන්න නියෝගය ක්‍රියාත්මක කළා.

ප්‍ර : ඒ වගේම ඔබ කියා සිටියා 2014 දී මේ නව ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් පත් වුණාට පස්සේ තමයි ඔබ දැන ගත්තේ අබ්දුල් රාසික් විසින් ශ්‍රී ලංකා තවුහිද් ජමාත් කියලා සංවිධානයක් 2012 වර්ෂයේදී පිහිටුවාගෙන තිබ්බා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔබ මෙම ඒකකයේ සේවය කරද්දි නියෝජ්‍ය අධ්‍යක්ෂක වරයා වශයෙන්, එතකොට ඔබේ තනතුර වුයේ පොලිසියේ මොකක්ද තනතුර?

පි : ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී.

ප්‍ර : ඔබට දැන ගන්නට ලැබුණද මද්‍රාසා පාසැල් සම්බන්ධයෙන්?

පි : එහෙමයි.

ප්‍ර : එම දැන ගැනීමට අනුව මොකක්ද ඔබට වාර්තා වුණේ?

පි : උදාහරණයක් ගත්තොත් දිවයින පුරා ඔය පාසැල් පිහිටුවලා තියෙනවා. ඒ පාසැල්වලට විදේශීය රටවලින් Lecturer හැටියට එනවා කට්ටියක්. ඊට අමතරව ගත්තොත් යම් යම් ස්ථානවල ඒකාකාරී ලෙස එහෙමත් නැත්නම් අන්තවාදී ලෙස ක්‍රියාත්මක

FAIR COMMENT — BY JEZEEM —

වෙනවා කියලා තොරතුරු ලැබුණා. ඉතින් අපි ඒවා විමර්ශනය කරන්න ඒ ඒ නිලධාරීන් පත් කළා. ඒවායේ සත්‍ය අසත්‍යතාවය තහවුරු කර ගන්න.

ප්‍ර : එහිදී ඔබට පත් කරන ලද නිලධාරීන්ගෙන් ලැබුණු තොරතුරු මොනවද කියලා මතකයක් තියෙනවද?

පි : මට විශේෂ මතකයක් නම් නැහැ, නමුත් මට මතක හැටියට නම් අර පිටරටින් එන කට්ටිය ගැන අවධානයක් යොමු කළා, ඒ කොහොමද ඒගොල්ලන් එන්නේ, වීසා ගන්නේ කොහොමද, මොකක් කියලද වීසා ගන්නේ ඒ සම්බන්ධයෙන් මට මතකයි මම ආගමන විගමන දෙපාර්තමේන්තුව සමඟ සහ විදේශ අමාත්‍යාංශය සමඟ සාකච්ජා කළා කොහොමද මේ වීසා ගන්නේ කියලා. ඉතින් ඒ Procedure එක මම දැන ගත්තට පස්සේ මගේ මතකයේ හැටියට..

ප්‍ර : පොඩි බාධා කිරීමක් කරනවා, ඒගොල්ලොන් වීසා ලබා ගැනීම සඳහා ඒ කියන්නේ විදේශයෙන් මද්‍රාසා පාසැල්වල දේශන සඳහා විදේශයෙන් පැමිණෙන පුද්ගලයන් ඒ වීසා ලබා ගැනීම සඳහා රජයේ අමාත්‍යාංශයකින් අවසර ලබා ගැනීමක් සිදු කරනු ලැබුවද?

පි : මම දන්න තරමින් මට මතක හැටියට මුස්ලිම් කටයුතු ඒ දෙපාර්තමේන්තුවෙන් විදේශ අමාත්‍යාංශයට තමයි මම හිතන්නේ ඒ ලියුම යවන්නේ, ඒගොල්ලන් තමයි ඊට පස්සේ ආගමන එකට යවන්නේ.

ප්‍ර : දැන් මෙම වීසා ලබා ගැනීමට දෙන අවසරය එහෙම නැත්නම් ඒ සඳහා අනුමැතිය ඔබට අනුව ලබා දෙන්නට යෙදුනේ මුස්ලිම් කටයුතු සම්බන්ධ අමාත්‍යාංශය විසින්ද?

පි : ප්‍රශ්නය ආපහු.

ප්‍ර : ඒ කියන්නේ මේ විදේශයෙන් පැමිණෙන මේ මද්‍රාසා පාසැල්වල දේශකයන්ට වීසා ලබා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදීම සිදු කලේ මුස්ලිම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින්ද?

පි : මගේ මතකයේ හැටියට මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තුව. ඒකෙන් තමයි යවන්නේ ලියුම Request කරලා.

ප්‍ර : ඔබට වැටහුණාද මේ ඔබගේ විමර්ශනයන්වලදී මෙම පැමිණෙන දේශකයන් කිසියම් හෝ ආකාරයක පරික්ෂාවකට එහෙම නැත්නම් ඔවුන් දේශනා කරන දේවල් මොනවද යන්න සම්බන්ධයෙන් සැළකිලිමත්වීමක් රටේ පවතිනවද නැද්ද කියලා අනාවරණය වුණාද?

පි : නැහැ රටේ ඒ වෙන කොට එහෙම සැළකිලිමත් භාවයක් තිබුණේ නැහැ. නමුත් මගේ නිලධාරීන් මට මතකයි මට කියනවා මෙතන

FAIR COMMENT BY JEZEEM

සමහර හුඟක් එන්නේ වහබ් වාදය පතුරුවන කට්ටිය ඒ අදාල රටෙන්, මට ඒ රටේ නම කියන්න අවශ්‍ය නම් මම කියන්නම්.

ප : ඔව් කියන්න?

පි : සෞදි අරාබියෙන් තමයි හුඟක් එන්නේ. එතකොට ඒ කට්ටිය වහබ් වාදයත් එක්ක යන කොට මෙතන ප්‍රශ්නයක් වෙන්න පුළුවන් ඉදිරියේදි කියන එක අපි සාකච්ඡා කළා. ඒ අනුව තමයි අපි ඇහුවේ වීසා ගන්න එකට අපි ගියේ. කාගේ අවසරය ඇතුවද ගන්නේ, අපිට කරන්න පුළුවන් දේ මොකක්ද ඒ සම්බන්ධයෙන් ඒ කියන්නේ SIS එකට මොකක්ද කරන්න පුළුවන් ඒ සම්බන්ධයෙන් ඒ කට්ටිය එන කට්ටිය ගැන ඒ කියන්නේ පොඩි ඒ කියන්නේ border control එකක් තියෙනවානේ. එතකොට ඒ border control එකෙන් මොකක්ද කරන්න පුළුවන්.

ප : ඒ අනුව කිසියම් පියවරක් ඔබලා ගත්තද?

පි : මගේ මතකයේ හැටියට අපි ඒක සාකච්ඡා කරලා අපේ අධ්‍යක්ෂකතුමා සමඟත් සාකච්ඡා කරලා අමාත්‍යාංශයටත් දැනුම් දීලා ඒ වීසා ලබා ගැනීමේ ක්‍රමවේදයක් ඇති කළා. ඒ කියන්නේ අපෙනුත් clearance ගන්න කියලා.

ප : අපෙන් කියන්නේ කාගෙන්ද?

පි : SIS එකෙන්.

ප : SIS එක කොහොමද clearance දෙන්නේ මේ විදේශිකයන්ට?

පි : සමහර අවස්ථාවල අපේ Data base එකේ තියෙන්න පුළුවන් යම් කරුණු. එහෙම නැත්නම් අපිට පුළුවන් ඒ විදේශ බුද්ධි අංශයත් සමඟ සාකච්ඡා කරන්න. කෙසේ වෙතත් අපි කරන්නේ අපේ විදේශ බුද්ධි කටයුතු භාරව ඉන්න ඒ නියෝජ්‍ය අධ්‍යක්ෂකට ඒක යොමු කරනවා.

ප : එම වැඩ පිළිවෙල ඔබ මෙම නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් සිටින විට ක්‍රියාත්මක කරනු ලැබුවද?

පි : ඔව්.

ප : දැන් ඒ අනුව ඔබට දැනීමක් තියේද මෙසේ ලංකාවට ඒමට හෝ බලාපොරොත්තු වූ දේශකයන්ට වීසා නොලැබුණ බවට?

පි : ඒක මට මතකයක් නැහැ.

ප : දැන් ඔබලා මෙම මද්‍රාසා පාසැල් සම්බන්ධයෙන් විශේෂයෙන් මේ විජාතික දේශකයන් සම්බන්ධයෙන් පරීක්ෂා කරන අවස්ථාව වන විට ඔබලාට වාර්තා වුණාද ලංකාවේ ඒ වන විට වීසා සහිතව හෝ වීසා රහිතව රැඳී සිටින දේශකයන් සම්බන්ධයෙන්?

පි : වීසා සහිතව තමයි හිටියේ රහිත එක නම් මට මතක නැහැ.

President Secretariat
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : කිසියම් අවස්ථාවක දේශකයන් හෝ දේශකයෙක් රටින් පිටුවහල් කරන්නට කටයුතු කරනු ලැබුවද?

පි : මට මතකයක් නැහැ.

ප්‍ර : ඔබ මෙම මද්‍රාසා පාසැල් සම්බන්ධයෙන් කරන ලද බුද්ධි විමර්ශනයන් සම්බන්ධයෙන් ඊට අමතරව යමක් කීමට තියෙනවද උසාවියට?

පි : මද්‍රාසා පාසැල් මම ඉගෙන ගත්ත එකක් තමයි ඔය අංශය භාරව ගියාම මම මද්‍රාසා පාසැල් ගැන දැනන් හිටියේ නැහැ, ඊට පස්සේ මම ඉගෙන ගත්තා ඒකේ මොකක්ද වෙන්නේ කියලා. ඉතින් ඒක ටිකක් අර අසාමාන්‍ය විදියට තමයි මම දකින විදිය. පෞද්ගලික මතය මගේ. අසාමාන්‍ය විදියට තමයි ඒක සිදු වෙන්නේ. දැන් සාමාන්‍යයෙන් ගත්තොත් ඕනම ආගමකට අදාලව දහම් පාසැල් තියෙනවා. කතෝලික ආගමෙත් තියෙනවා, බෞද්ධ ආගමෙත් තියෙනවා. නමුත් මේක ඒකටම අනුයුක්ත වෙලා ඒකම සිදු කරන්න ඕන කියන ප්‍රතිපත්තිය තමයි තියෙන කියන එක මම ඉගෙන ගත්තේ. ඒ කියන්නේ එතකොට පාසැල් යාමක් සිදු වෙනවාද නැද්ද කියන ප්‍රශ්නය මෙතනට එනවා. ඕන කෙනෙක්ට පාසැල් යන්න ඕනමනේ. එතකොට ඒ අනුව තමයි අපි විමර්ශනය කරගෙන යද්දි අපිට යම් යම් දේවල් තේරුම් ගත්තේ විශේෂයෙන් මේ පිටරටින් එන කට්ටියව පාලනය කරනවා නම් මෙතන අර එන ප්‍රශ්න හුඟක් අඩුවෙනවා. එහෙනම් වීසා දීමේදී යම් ක්‍රමවේදයක් අනුගමනය කරන්න ඕන. ඒ ක්‍රමවේදය තමයි වීසා ගන්න කොට ඒක ඒගොල්ලන් අවශ්‍ය තොරතුරු දැනුම් දෙන්න ඕන ආගමන විගමන දෙපාර්තමේන්තුවට. ඒවා පාදක කර ගන්න පුළුවන් බුද්ධි අංශවලට. එතකොට අපි දන්නවා මිතුරෙක්ද සතුරෙක්ද එන්නේ කියලා අප රටට.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>**

ප්‍ර : පැහැදිලි කර ගැනීම් 2 ක් අවශ්‍යයි. ඔබ කිව්වා අර වීසා ලබා ගැනීමේ ක්‍රමවේදයේදී ඔබ අධ්‍යක්ෂකවරයෙක් මාර්ගයෙන් ඒ clearance එක ලබා ගැනීමට කටයුතු කෙරුවා කියලා? ඒ කියන්නේ Director ප්‍රොරින් ඉන්ටෙලිජන්ස්?

පි : ඔව් ස්වාමිණි මම ත්‍රස්ත මර්ධන හිටියා වගේම අපේ ඉන්නවා වෙනම අංශයක් තිබ්බා මම හිතන්නේ BMICH එකේ තිබ්බේ විදේශ බුද්ධි. ඒකට තමයි අපි යවන්නේ.

ප්‍ර : එවකට ඒ තනතුර දැරූ නිලධාරියාගේ නම මොකක්ද? ඔබට මතක් වුනොත් ලියලා දෙන්න පුළුවන්?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මතකද?

පි : මතක් වුණාට පස්සේ.

ප්‍ර : දෙවෙනි ප්‍රශ්නේ ඔබ කිව්වා අර මද්‍රසා පාසැල් වලට තිබ්බා වෙනත් ආගම්වලට වඩා වෙනස් දෙයක්, ඒ කියන්නේ ඒ පාසැල්වලටම ළමයින් යැවීමක් සිදු වෙනවා කියලා.?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ කට්ටිය වෙන ආණ්ඩුවේ පාසැල්වලට යන්නේ නැහැ?

පි : එහෙම තමයි මගේ මතකයේ හැටියට. මම ඉගෙන ගත්ත දේ.

ප්‍ර : ඔබ ඒ ඉගෙන ගත්තු දේ අනුව එවැනි ක්‍රමවේදයක් තිබ්බොත් එය අර violent extremism වලට යන ක්‍රමවේදයේ එකක් වන exclusivism යන තැනට ඒක උපකාරයක් වෙනවද නැද්ද?

පි : වෙන්න පුළුවන්. ඒ එන දේශකයෝ දෙන දේශනත් එක්ක ඒ extremism එක ඔළුවට දානවා නම් එතනින් ඔබ්බට යන්න ඉඩකඩ තියෙනවා.

ප්‍ර : මගේ ප්‍රශ්නය සමහරක් විට පැහැදිලි වෙන්නේ නැතුව ඇති, ඔබ කිව්වානේ මද්‍රාසා පාසැල්වලට යන ළමයින් ඊට පස්සේ වෙන පාසැල්වලට යන්නේ නැතුව සම්පූර්ණයෙන්ම ඒ පාසැල්වලට යැවීමේ සම්ප්‍රදායක් තිබ්බා කියලා? එහෙම නේද ඔබ කිව්වේ?

පි : එහෙමයි මට මතක හැටියට.

ප්‍ර : එහෙම වුනොත් එතකොට ඒ ළමයින් අර ඒ ළමයින්ගේ වයසේ ඉන්න වෙනත් ආගම්වල ළමයින් සමඟ සම්මිශ්‍රණයක් වෙන්නේ නැහැ නේද?

පි : නැහැ.

ප්‍ර : එහෙම වුනොත් අර exclusivism කියන ස්ථානයට ඒ ළමයින් තල්ලු වෙනවද නැද්ද?

පි : වෙන්න පුළුවන්.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>**

ප්‍ර : දැන් ඔබ කියා සිටින්නේ මෙම මද්‍රාසා පාසැල්වල ඉගෙන ගත්ත ශිෂ්‍යයන්ට ඔවුන් ලංකාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ තිබෙන විෂය නිර්දේශයට යටත් වන්නේ නැහැ කියලද?

පි : මගේ මතකයේ හැටියට නම් එම මද්‍රාසා පාසැල් තිබ්බා. දැන් මම දන්නේ නැහැ වෙනස් වෙලාද කියලා.

ප්‍ර : මම කියන්නේ 2014?

පි : හරි.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඔබ කියා සිටියා එම මද්‍රාසා පාසැල්වලට විදේශයෙන් පුද්ගලයන් පැමිණිලා දේශනා සිදු කළා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ වගේම එම දේශකයන් බොහොම දෙනෙක් වහබ් වාදය ඉගැන්වීම තමයි සිදු කලේ කියලා ඔබ මීට පෙර කියා සිටියා?

පි : එහෙමයි.

ප්‍ර : නිවැරදි ද?

පි : වහබ් වාදයට සම්බන්ධ කට්ටිය තමයි ඇවිල්ලා හිටියේ.

**********

**ගරු බන්දුල අතපත්තු මැතිතුමා:**

ප්‍ර : නාලක සිල්වා මහතා දැන් ඔබ කිව්වානේ මද්‍රාසා පාසැල් සඳහා lecturers ලා ලංකාවට එවන කොට ඔවුන් පිළිබඳව සෞදි අරාබියේ බුද්ධි අංශවලින් විමර්ශනයක් කරනවා කියලා?

පි : නැහැ සර්. විමර්ශනය අපට එහේ විමර්ශනය කරන්න බැහැ. අපි යවන්නේ විදේශිය බුද්ධි පැත්ත බලන නියෝජ්‍ය අධ්‍යක්ෂකට ඇරියම එයා කරන්නේ ඉස්සෙල්ලා Records බලනවා. Records බලලා ඒකෙන් යමක් තියෙනවා නම් අපි ඒක කරනවා, නැත්නම් එයාට අවශ්‍ය නම් එයාට පුළුවන් ඒ රටට කතා කරලා විස්තර ගන්න.

ප්‍ර : එක පුද්ගලයෙක් පිළිබඳවත් ඇඩ්වර්ස් රිපෝට් එකක් ආවේ නැද්ද?

පි : මට මතකයක් නැහැ 2014 හින්දා මට එච්චර මතකයක් නැහැ, සමාවෙන්න.

**********

**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:**

ප්‍ර : ඔබ පෙර දිනයේ සාක්ෂි දෙන කොට කියා සිටියා 2015.02.27 වෙනිදා ඔබව ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයට එහි අධ්‍යක්ෂක වශයෙන් පත් කළා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ අධ්‍යක්ෂකවරයා වශයෙන් එකී කොට්ඨාශයට පත් කරන විට පොලිස්පති වශයෙන් සිටියේ කවුද කියලා මතකයක් තියෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : කවුද?

පි : එන්.කේ. ඉලංගකෝන් මහතා.

ප්‍ර : ඔබ මෙම කොට්ඨාශයට අධ්‍යක්ෂක වශයෙන් එන විට ඔබට පොලිස්පතිවරයා කිසියම් උපදෙසක් දුන්නද?

පි : එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොකක්ද ඒ?

පි : එතුමා තමයි මාව තෝරගෙන තිබ්බේ ඔතන්ට දාන්න. ඒ අනුව තමයි එයා කිව්වේ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයට අදාලව රාජ්‍ය බුද්ධි සේවාවේ ත්‍රස්ත මර්ධන කටයුතු සම්බන්ධයෙන් සහ ඔය මුස්ලිම් අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් තියෙන දැනුමත් එක්ක තමයි මාව තෝරා ගත්තේ. ඒ අනුව ඒ කොට්ඨාශය ඒ විදියට පවත්වාගෙන යන්න ඒ බුද්ධි අංශයේ සිදු කළ රාජකාරියත් මේ අංශයට අනුයුක්ත කරමින් ඒ කියන්නේ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයට ලබා දෙමින් ඒ දැනුම ඔක්කොම ලබා දෙමින් ඒක හොඳ ආයතනයක් බවට පත් කරන්න පොලිසියේ ත්‍රස්ත මර්ධන කටයුතු සම්බන්ධයෙන් ඉදිරියට යන්න පුළුවන් හොඳ ආයතනයක් බවට පත් කරන්න කියලා.

ප්‍ර : ඔබට මෙම උපදෙස ලබා දුන්නම ඔබ ත්‍රස්ත විමර්ශක කොට්ඨාශයේ අධ්‍යක්ෂක වශයෙන් පත් වුණාට පස්සේ එම කොට්ඨාශයේ ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කළාද?

පි : ඔව් ඒක කලේ 2017 වසරේ මුල වගේ.

ප්‍ර : මොකක්ද ඔබ කළේ?

පි : මෙතනදි මම යමක් කියන්න අවශ්‍යයි ස්වාමිණි අවසර ඇතුව. මාව තෝරා ගැනීම සම්බන්ධයෙන් ඉලංගකෝන් මහත්තයට මම ස්තූතිවන්ත වෙනවා. නමුත් මම පුද්ගලිකව දැක්ක එකක් තමයි මට ලබා දුන්න ස්ථාන මාරුව දේශපාලනික ස්ථාන මාරුවක්. එම නිසා ඒක මම කියන්න අවශ්‍යයි මොකද 25 වෙනිදා මට එනවා ස්ථාන මාරුවීම 20 වෙනිදා යම් පත්තර වගයක මට විරුද්ධව ඒ කියන්නේ ප්‍රධාන පෙලේ පත්තර නෙමෙයි වෙනත් පත්තරවල මට විරුද්ධව දැඩි ලෙස දෝශාරෝපණය කරනවා. දේශපාලනික ලෙස දෝශාරෝපණය කරලා දවස් 5 යි ස්ථාන මාරුවීම ලැබෙනවා. ඉතින් ඒ හින්දා මම 27 වෙනිදා තමයි මම ගිහිල්ලා බාර ගත්තේ. එතුමා මං කෙරෙහි තබා තිබූ විශ්වාසය මං ඒක ඒ අයුරින්ම තිබ්බා. කිසිදු මොහොතක මම ඒක පළුදු වෙන්න තිබ්බේ නැහැ, නමුත් මගේ කැමැත්තක් තිබුනේ නැහැ එතනට යන්න. නමුත් එතුමාගේ ඉල්ලීම මම ගරු කරලා එතුමාගේ ඉල්ලීම පරිදි මම ගියා. ගිහිල්ලා එතුමා කිව්ව දේ මම ඉෂ්ඨ කළා. එතකොට එතනදි මම දැක්ක දෙයක් එතුමා මුලින්ම මට මතකයි 2015 හෝ 2016 මුල වගේ චාවකච්චේරි ප්‍රදේශයේ යම් සිදුවීමක් වුණා ඒක සම්බන්ධයෙන් සහ දෙමටගොඩ බන්ධනාගාර බස් රථයකට වෙඩි තිබ්බා පාතාල කණ්ඩායමක් විසින්. ඒ විමර්ශනයේ මට කතා කරලා කිව්වා ඔබට හැකිනම් මේක කරන්න අපරාධ කොට්ඨාශයෙන් කරනවා, ඔයාගේ දැනුමත්

FAIR COMMENT BY JEZEEM

එක්ක ඒක කරන්න කියලා. මට පුළුවන් වුණා මගේ නිලධාරීන් යොමු කරලා දවස් 5 ක් 6 ක් වෙන කෙටි කාලෙකදී ඒ සම්පූර්ණ කණ්ඩායම අල්ලන්න. අල්ලලා මට මතක හැටියට T56 අවි 10 ක් සමඟ ඔක්කොම අවි 28 ක් අපි recover කළා. ඒ වගේ එතුමාගේ බලාපොරොත්තු වෙච්ච රාජකාරිය මම කළා. ඊට පස්සේ එතුමා විශ්‍රාම ගියායින් පස්සේ පූජිත් ජයසුන්දර මහත්තයා ඇවිල්ලා ඕක ඔහොමම කරන් යන්න කිව්වා. ඉතින් ඒක එහෙම අරන් යන කොට මගේ නිලධාරීන් එක්ක මම කතා කරන කොට මම කිව්ව එකක් තමයි දැන් අපි LTTE පැත්තමනේ යන්නේ. එතකොට LTTE එක විමර්ශනය කරන්න අංශ 4 ක් තිබ්බා. මම කිව්වා අපි එක අංශයක් කරමු LTTE එක. දෙවෙනි අංශය අපි ඉදිරියේදි තර්ජණයක් වෙන්න පුළුවන් අන්තවාදය. ඒ අන්තවාදය මුස්ලිම් අන්තවාදය. ඒක හින්දා ඒක විමර්ශනය කරන්න එකක් දාමු. 3 වන එක අපි දාමු පාතාල ඒ කියන්නේ මහා පරිමාණ අපරාධකරුවන් සම්බන්ධයෙන් විමර්ශනයන්. ඒ අනුව තමයි අපි ප්‍රතිව්‍යුහගත කලේ. 2017 මගේ මතකයේ හැටියට පෙබරවාරී මාසේ විතර.

ප : ඔබ කියා සිටියා එම ප්‍රතිව්‍යුහගත කිරීමේදී ආගමික අන්තවාදය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට වෙනම ඒකකයක් කොට්ඨාශය තුළ පිහිටෙව්වා කියලා?

පි : එහෙමයි.

ප : දැන් මීට අමතරව ඔබ කටයුතු කළාද දැන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය මෙසේ ප්‍රතිව්‍යුහගත කරන අවස්ථාවේදි විමර්ශන කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය වන උපකරණ ඒ කියන්නේ පරිගණක සම්බන්ධයෙන් වේවා ඉන්ටනෙට් සම්බන්ධයෙන් හෝ වේවා කිසියම්ම හෝ මෙවැනි දේවල් සම්බන්ධයෙන් අවශ්‍ය උපකරණ මිළදී ගැනීමට ඔබ කටයුතු කළාද?

පි : එහෙමයි.

ප : මොකක්ද ඔබ කළේ?

පි : මූලික වශයෙන් අපේ කොට්ඨාශයේ ඒ කියන්නේ සංවර්ධනයක් ඇති කරන්න මං තීරණය කළා. නිලධාරීන්ගේ සුඛවිහරණය සඳහා. ඒකේදී අවශ්‍ය කරන තාක්ෂණික උපකරණත් මිළදී ගන්නත් අපි ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තා. ඒකේදි මට මතකයි අපි LTTE සංවිධානයේ අපි කියනවා ඒක Asset recovery කියලා. Terrorismවලට අදාල Asset recovery. ඒ Asset recoveries වලට අපි මූලික අවධානයක් යොමු කරන්න ගත්තා. ඒ අනුව අපිට පුළුවන් වුණා LTTE එකේ මුදල් සෑහෙන ප්‍රමාණයක්

FAIR COMMENT BY JEZEEM

සොයාගෙන රාජසන්තක කරන්න. ඒ වගේම දේපල, චංචල, නිශ්චල දේවල සෑහෙන ප්‍රමාණයක් 2015.,16,17 අපිට පුළුවන් වුණා සොයාගෙන කිලිනොච්චිද, කොළඹ ද හැම තැනම සොයා ගෙන රාජසන්තක කරන්න. එතකොට ඒවායින් ලැබිච්ච මුදල්වලින් තමයි මම පොලිස්පතිතුමාට යෝජනා කලේ අපිට තාක්ෂණික උපකරණ ලබා දෙන්න කියලා.

ප : දැන් ඔබ පොලිස්පතිතුමාගෙන් තමයි එම ඉල්ලීම කලේ?

පි : එහෙමයි මොකද TID එක එතුමා යටතේ නේ Direct තිබ්බේ.

ප : එතකොට ඒ ඉල්ලීම මත ඒ ඉල්ලීම පොලිස්පතිතුමා අනුමත කළාද?

පි : ඔව් අනුමත කළා කියන්නේ ටෙන්ඩර් බෝඩ් එකට දැම්මා මිළදී ගැනීම් සිදු කරන්න.

ප : ඒ සඳහා ආරක්ෂක ලේකම්වරයාගේ අනුමැතිය ලැබුණද?

පි : නීතිය හා සාමය අමාත්‍යාංශයේ ලේකම් යටතේ අපි හිටියේ. මට මතක නැහැ දැන්.

ප : දැන් ඔබ මෙම ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ සේවය කරන අවස්ථාවේදි ආවේක්ෂණ රාජකාරී සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබා ගැනීමට කටයුතු කළාද?

පි : ඔව්. ඒක ඇවිල්ලා අර බංගලාදේශයේ සිදු වුණා ISIS පහර දීමක්. එතකොට ඒකේදී ජපන් ජාතිකයෝ 9 දෙනෙක්ද, 10 දෙනෙක්ද මියගියා. ඒ අනුව අපිට හුහක් මිළ අධිකයි ආවේක්ෂණ භාණ්ඩ. අපිට එහෙම සල්ලි ටිකක් ගන්න අමාරු හින්දා මට මතකයි ජපන් රජයෙන් ආපු නිලධාරියෙක් මගෙන් ඇහුවා ලංකාවෙත් මෙහෙම දෙයක් වෙයිද කියලා. එතකොට මම කිව්වා එහෙම නොවෙන්න අපි වගබලා ගන්නම් කියලා. ඊට පස්සේ මොනවද අවශ්‍ය අපිට ත්‍රස්ත මර්ධන කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මුකුත් තියෙනවද ඇහුවා. ඒ අනුව මම කිව්වා අපිට ආවේක්ෂණ රාජකාරී සඳහා අවශ්‍ය උපකරණ වගයක් තියෙනවා මම පොලිස්පතිතුමා මගින් දැනුවත් කරන්නම් කියලා. ඒ අනුව ඒවා ලැබුණා අපිට.

ප : ඒ අනුව ඒ ආවේක්ෂණ රාජකාරී සඳහා ජපානෙන් මොනවද ලැබුනේ?

පි : අපිට නවීන වැන් රථයක් හම්බ වුණා. ඒවායේ ආවේක්ෂණ කරන්න පුළුවන් විදියේ එහෙම කැමරා හයි කරලා. ඒක බොහොම නවීනයි, නමුත් හම්බ වුනේ 2018 වගේ හම්බ වුනේ. ඒක තමයි හම්බ වුනේ.

ප : වාහනයකින් කොහොමද ආවේක්ෂණය කරන්නේ?

පි : ඒකේ අපි මුලිකව බලාපොරොත්තු වුනේ..

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මෙම ජපන් රජයෙන් ලැබිච්ච මෙය ආධාරයක් වශයෙන්ද ලැබුනේ නැත්නම් මිලදී ගෙනද?

පි : නැහැ නොමිලේ.

ප්‍ර : මේ ආධාරයක් වශයෙන් ලැබුණ මේ රථය පාවිච්චි කරලා කිසියම් අපරාධයක් කරනු ලබන පුද්ගලයෙකු හඳුනා ගැනීමට හැකියාවක් ලැබෙනවද?

පි : ඔව් ඒකේ තියෙන ඒ කැමරා එකත් එක්ක පුළුවන්.

ප්‍ර : එසේම එම තොරතුරු ලබා ගැනීමෙන් පසු එම පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමට පවා හැකියාව තිබුණද ඒ ලැබෙන තොරතුරු මත?

පි : ඔව්, තොරතුරු කියන්නේ ඒකේ තියෙන්නේ අපිට මට ඒක Explain නොකර කියන්න බැහැ. ඒකයි මම කිව්වේ...

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**:

ප්‍ර : මේ අහන ප්‍රශ්නෙට උත්තර දෙන්න. ඒ වාහනය භාවිතා කිරීමෙන් යම්කිසි තැනැත්තෙකු සොයනවා නම් ඒකට ආධාරයක් කර ගන්න පුළුවන්ද?

පි : පුළුවන්. ඒ පුද්ගලයාගේ ඡායාරූපය තියෙනවා නම් අපිට පුළුවන්.

**********

**<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>**

ප්‍ර : එම වාහනය තමන්ලා පාවිච්චි කළාද කොයි අවස්ථාවක හරි?

පි : නැහැ ස්වාමිණි ඕක මම ඉන්න කොට මාසෙකට ඉස්සෙල්ලා වගේ ලැබුණේ. ඊට පස්සේ ඒකේ තියෙන සියුම් භාවය සහ මේකත් එක්ක අපි බොහොම පරිස්සම් වුණා භාවිතා කරන කොට. අපි Trial තමයි 2, 3 ක් කලේ. කරලා හොඳ අවස්ථාවක් ලැබුනේ නැහැ අපිට ඒක කොළඹින් පිට යවලා හරි කොළඹ හරි පාවිච්චි කරන්න.

ප්‍ර : ඒ අත්හදා බැලීම් සාර්ථක වුණාද?

පි : ඔව් සාර්ථක වුණා.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>**

ප්‍ර : ඒ රථය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් වන පුහුණුවක් ඔබලාට ලැබුණද කොහෙන් හරි?

පි : නිලධාරීන් 5 දෙනෙක්ට පුහුණුව ලබා දුන්නා ජපන් රජයෙන්. මට පුළුවන් මාධ්‍යය නැතුව ඕන වෙලාවක ඒ sensitive ඒවා කියන්න.

FAIR COMMENT — BY JEZEEM

**********

**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:**

අපි එක්තරා අවස්ථාවක ඒ තොරතුරු වැඩි විස්තර අනුව ගමු.

**********

**ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:**

ප්‍ර : දැන් ඔබ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂක වශයෙන් සිටින විට ඔබ එම කොට්ඨාශයේ සිටි නිලධාරීන්ට අවි පුහුණුව සම්බන්ධව දැනුමක් තිබ්බාද නැද්ද? අවි පරිහරණය සම්බන්ධව?

**********

**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:**

ප්‍ර : දැන් ඔබ කිව්වා නේද ජපන් රජයෙන් මේ වාහනය ඔබට ලැබුණා කියලා ත්‍රස්ත විමර්ශන ඒකකයට. එම වාහනය දිගටම ත්‍රස්ත විමර්ශන ඒකකයට පාවිච්චි කරන්න අවසර ලබා දීලා තිබ්බද? නැත්නම් ඒක එක්තරා අවස්ථාවක නැවැත්තුවද?

පි : මට පසුකාලීනව දැන ගන්න ලැබුණා මගේ අත්අඩංගුවට ගැනීමත් එක්ක ඒක භාවිතා කරන එක තහනම් කරලා තිබ්බයි කියලා.

ප්‍ර : කවුද තහනම් කරලා තියෙන්නේ?

පි : CID එකෙන්. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්.

ප්‍ර : ඒ නියෝගය ලබා දුන්න පුද්ගලයාගේ නම දන්නවා නේ ඔබ?

පි : දන්නේ නැහැ මට දැන ගන්න ලැබිච්ච එකක් තමයි මම එච්චර හාරා අවුස්සන්න ගියේ නැහැ ස්වාමිණි. ඒක එතන එවෙලේ හිටපු වැඩ බලන අධ්‍යක්ෂක ජගත් ක්‍රිෂාන්ත මහත්තයා දන්නවා ඔක්කොම.

ප්‍ර : දැන් ඔබ කිව්වානේ පිංතූරයක් තිබ්බොත් ඒ පුද්ගලයෙක් හඳුනා ගන්න හැකියාවක් තිබ්බා කියලා ඒ වාහනය භාවිතා කිරීමෙන්?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට සහරාන් හෂිම්ගේ පිංතූරයක් තිබ්බා නම් ඔහුව සොයා ගැනීමට එම වාහනය උපකාරයක් වෙන්න තිබ්බද?

පි : ඔව් ඒ කියන්නේ...

ප්‍ර : විස්තර පස්සේ කියන්න ඔව්ද නැද්ද?

පි : ඔව්.

**********

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>**

ප්‍ර : සාක්ෂිකරු දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝගයක් දෙන්න පුළුවන්ද TID එකට වාහනය භාවිතා කරන්න නැවැත්වීමට?

පි : ඒ කට්ටිය විමර්ශනයක් පරිදිනේ ඔය නැවැත්තුවා කියන්නේ. එහෙම නම් බැහැ පොලිස්පතිතුමාට කියන්නේ නැතුව බැහැ ස්වාමිණි.

ප්‍ර : පොලිස්පතිතුමාගේ නියෝගය නැතුව එහෙම කරන්න පුළුවන්ද?

පි : බැහැ.

ප්‍ර : එහෙම නම් එසේ TID එක ඒක භාවිතා කිරීම නැවැත්තුවේ මොකද?

පි : දන්නෑ ස්වාමිණි. මම අත්අඩංගුවට අරන් නේ ඒ වෙන කොට.

ප්‍ර : ඔබ කියන්නේ එහෙම නියෝගයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දෙන්න බැහැ පොලිසිපතිවරයාට පමණයි තමන්ගේ TID එකට නියෝගයක් දිය හැක්කේ?

පි : විමර්ශන කටයුතු සිදු කලේ මට විරුද්ධව නම් ගරු ස්වාමිණි ඒක මට අදාල වෙන්න ඕනේ. නමුත් ආයතනයට අදාලව යමක් කරනවා නම් පොලිස්පතිතුමාට කියන්න ඕන ඒක.

ප්‍ර : TID එක තිබ්බේ පොලිස්පතිවරයා භාරයේද?

පි : පොලිස්පතිවරයා යටතේ.

**********

**<u>ගරු අදිකාරී මැතිනිය</u>**:

ප්‍ර : මිස්ටර් සිල්වා ඔබ සඳහන් කරන ලද මෙම ජපන් රජයේ ප්‍රධානයක් ලෙස ලැබුණු මෙම සුවිශේෂී රථය ශ්‍රී ලංකාවේ ඔබගේ ආයතනයට ලැබුනේ කවදාද?

පි : මට මතක හැටියට 2018 අගෝස්තු මාසේ. අගෝස්තු හෝ ජූලයි මාසේ. ඒකත් එක්ක නවීන ජීප් රථ 11 කුත්, බයිසිකල් 20 කුත් ලැබුණා.

ප්‍ර : ඒ සියල්ලම ප්‍රදානවලට ලැබුණේ ජපන් රජයෙන්?

පි : මගේ ඉල්ලීම මතයි දුන්නේ ත්‍රස්ත මර්ධන කටයුතු සඳහා.

**********

**<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>**

ප්‍ර : ඒ භාර ගැනීමේ උත්සවයට කවුද ආවේ?

පි : පොලිස්පතිතුමා. එහෙම විශේෂ උත්සවයක් තිබුණේ නැහැ, නමුත් පොලිස් මූලස්ථානයට තමයි ජපන් කට්ටිය ඇවිල්ලා ඒක පොලිස්පතිතුමාට භාර දුන්නේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**********

**<u>ගරු අදිකාරී මැතිනිය:</u>**

ප : ඔබේ එම විශේෂ රථය භාවිතා කිරීමෙන් අයින් කරපු අවස්ථාවේදි අර ප්‍රදානය ලැබුණු අනෙකුත් සියළුම රථත් භාවිතයෙන් අයින් වුණාද?

පි : නැහැ, නැහැ.

ප : ඒ රථ භාවිතා කළා ත්‍රස්ත විමර්ශන කටයුතු සඳහා?

පි : ඔව්. ඒක අපේ අංශයට දුන්නේ බයිසිකල් 2 කුයි, සමාවෙන්න බයිසිකල් 10 යි හම්බ වුනේ. බයිසිකල් 2 කුයි, ජීප් රථයකුයි අපිට හම්බ වුණා. අනිත් ඒවා ලංකාව වටේම

ප : තියෙන පොලිස් ස්ථානවලට?

පි : පොලිස් ස්ථාන නෙමෙයි විශේෂ අපරාධ අංශවලට දීලා තිබ්බා පොලිස්පති තුමා.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>**

ප : දැන් ඔබ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයෙන් මාරු කලාට පසුව ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය නැවත පත් වුණාද අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති යටතට?

පි : මම දන්නේ නැහැ ස්වාමීණි.

ප : ඔබ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය භාර ගන්නා විට එය තිබුණේ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති යටතේ?

පි : එහෙමයි. නැහැ නැහැ භාර ගන්න කොට ස්වාමීණි නියෝජ්‍ය පොලිස්පති චන්ද්‍ර නිමල් වාකිෂ්ට මහත්තයා හිටියේ. එතකොට එතුමා හිටියේ පොලිස්පතිතුමා යටතේ. ඊට පස්සේ එතුමාගේ.. මම ඇවිල්ලා දවස් 5 කින් වගේ එතුමා ස්ථාන මාරු වුණා. එතකොට නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් පත් කලේ නැහැ. ඒ හින්දා තමයි අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහත්තයට පරිපාලන කටයුතු බලන්න කිව්වේ පොලිස්පතිතුමා.

ප : ඔබ වැඩ බලන නියෝජ්‍ය පොලිස්පති වශයෙන් පත් වුණාට පසුව නැවත ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය පොලිස්පතිතුමා ...

පි : පොලිස්පතිතුමා යටතට පත් කලා.

ප : දැන් ඔබ කිසියම් හෝ අවස්ථාවක ඔබගේ නිලධාරීන්ට ඒ කියන්නේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ සේවය කරන නිලධාරීන්ට විශේෂ අවි පුහුණුවක් ලබා ගතයුතු බවට තීරණය කළාද?

FAIR COMMENT — BY JEZEEM

පි : එහෙමයි.

ප්‍ර : කොයි ආකාරයටද ඒ?

පි : මම විදේශ පුහුණු කටයුතුවලට ගියාම සම්මන්ත්‍රණ සහ පුහුණු කටයුතුවලට ගියාම ඒ රටවල්වල ත්‍රස්ත මර්ධන නිලධාරීන් සමඟ සාකච්ඡා කරන කොට මම දැන ගත්ත දෙයක් තමයි ඒ අංශවලට වෙනම අවි සහිත කණ්ඩායමක් ඉන්නවා ඕනම මොහොතක ක්‍රියාත්මක වෙලා ත්‍රස්තවාදීන් අත්අඩංගුවට ගන්න. හෝ අන්තවාදීන් හරි. එතකොට මම මගේ නිලධාරීන් සමඟ ඇවිල්ලා කතා කලාම අපිට එහෙම දෙයක් අපේ අංශයේ නැහැ ස්වාමීණි සාමාන්‍ය නිලධාරීන් සාමාන්‍ය අවි පුහුණුව ලබපු නිලධාරීන් ඉන්නේ. ඉතින් ඒ වගේම අපිට යම් අවස්ථාන්වලට මුහුණ දෙන්න සිදු වුණා. දැන් ගත්තොත් ඔඩ්ඩුසුඩාන් සිදුවීමේදී, චාවකච්චේරි සිදුවීමේදි අපේ නිලධාරීන්ට රෑට පවා යන්න වුණා වැටලීම් කරන්න පුද්ගලයන් අත්අඩංගුවට ගන්න උතුරු පළාතෙයි, නැගෙනහිර පළාතෙයි. එතකොට ඒ යන නිලධාරීන් සිවිල් ඇඳුමෙන් යන නිසා ඒගොල්ලන්ට ආරක්ෂාව ඉතා අත්‍යාවශ්‍යයි. ඒ අනුව තමයි මම තීරණය කලේ 10 දෙනෙක් වගේ කණ්ඩායමක් ඕනෑම ත්‍රස්තවාදීයෙක්, ත්‍රස්තවාදී කියන එක්කෙනා අවියෙන් හෝ පුපුරණ ද්‍රව්‍ය වලින් තමයි අපිට මුහුණ දෙන්න එන්නේ. එහෙනම් අපි ඒකට ලෑස්ති වෙන්න ඕනේ. මම නිලධාරීන් ආරක්ෂා කරන්න ඕනේ. එතකොට නිකම් ගිහිල්ලා ඔවුන් අත්අඩංගුවට ගන්න බැහැ. එහෙනම් ඕනෑම මොහොතක ඕනම අවස්ථාවක යන්න පුළුවන් විදියට මම 10 දෙනෙක්ගේ කණ්ඩායමක් පුහුණු කරන්න අවධානය යොමු කරලා පොලිස්පතිතුමාට යෝජනා කරලා ඇරියා මම.

ප්‍ර : ඔබ එය ලිඛිතවද ඉදිරිපත් කළේ?

පි : ලිඛිතව ඉදිරිපත් කලේ. හැම දෙයක්ම ලිඛිතව, නීත්‍යානුකූලව ඉදිරිපත් කරලා තියෙන්නේ.

ප්‍ර : ඔබ ඉදිරිපත් කරපු ඒ ලිඛිත ඉල්ලීම අද දින දුටුවොත් හඳුනා ගන්න පුළුවන්ද?

පි : එහෙමයි.

**(2017.04.29 දින දරන ලිපියක් සාක්ෂිකරුට පෙන්වා සිටී)**

පි : එහෙමයි.

**<u>එම ලිපිය මේ අවස්ථාවේදී C849 ලෙස ලකුණු කර ඉදිරිපත් කරනවා</u>**.

ප්‍ර : මෙම C849 දරන ඔබගේ ඉල්ලීමේ කිසියම් හෝ සටහනක් පොලිස්පතිතුමා විසින් තබා තියෙනවාද?

පි : ඔව් මට.

Presidential Secretariat
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කාටද ඒ ආමන්ත්‍රණය වෙලා තියෙන්නේ?

පි : පළවෙනියෙන් මට දාලා තියෙන්නේ. Speak early කියලා.

ප්‍ර : ඒ අනුව ඔබ පොලිස්පතිතුමා සමඟ සාකච්ඡා කළාද?

පි : එහෙමයි.

**මෙම අවස්ථාවේදි මෙම ලිපියේ ඡායාස්ථ පිටපතක් පමණයි ගරු කොමිෂන් සභාව ඉදිරියේ තිබෙන බවත් ගෞරවයෙන් සැල කර සිටිනවා.**

ප්‍ර : ඒ අනුව ඔබ පොලිස්පතිවරයා සමඟ සාකච්ඡා කලාම C849 න් ඔබ කළ යෝජනාව පොලිස්පතිවරයා අනුමත කළාද?

පි : එහෙමයි.

ප්‍ර : අනුමත කළා. ඒ සදහා පුහුණුව ලබා ගැනීමට ඔබ ඒ නිලධාරීන් 10 දෙනෙකුට පුහුණුව ලබා ගැනීමට කිසියම් අංශයක් පුහුණුව ලබා දෙන ලෙස පොලිස්පතිවරයා කිසියම් කොට්ඨාශයකින් පොලිසියේ තියෙන කොට්ඨාශයකින් ඉල්ලීමක් කළාද?

පි : මමද

ප්‍ර : නැහැ පොලිස්පතිවරයා?

පි : ඔව් පොලිස්පතිතුමා කමාඩාන්ට් STF ට දාලා තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ අණදෙන නිලධාරී විශේෂ කාර්ය බලකායට ඉල්ලා සිටියා?

පි : ඔව් පොලිස්පතිතුමා approve කරලා තියෙනවා.

ප්‍ර : ඔබ ඒ C849 දරන ඉල්ලීම පොලිස්පතිතුමා විසින්..?

පි : අනුමත කළා. පොලිස්පතිතුමා යටතේ තමයි STF එකත් තියෙන්නේ. අනුමත කරලා තියෙන්නේ.

ප්‍ර : C849 අනුමත කළාට පසුව ඔබගේ නිලධාරීන් ඒ 10 දෙනාට ඒ විශේෂිත පුහුණුව ලැබුණාද?

පි : නැහැ, ලැබුණේ නැහැ.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් C849 අනුමත කලාට පස්සේ පොලිස්පතිතුමා ඒ සම්බන්ධයෙන් අණදෙන නිලධාරී විශේෂ කාර්යය බලකාය පොලිස්පතිතුමාට කිසියම් දෙයක් ලිඛිතව දැන්වුවාද නැද්ද කියන්න ඔබට දැනීමක් තියෙනවද?

පි : මම හිතන්නේ එවලා තිබ්බා මගේ මතකයේ හැටියට.

ප්‍ර : ඔබ ඒ ලිපිය දුටුවද?

පි : ඔව්. රැකියාව කරන කොට දුටුවා.

**(මේ අවස්ථාවේදි 2017.06.23 ලෙස පෙනෙන පොලිස්පති පූජිත් ජයසුන්දර ආමන්ත්‍රණය කරන ලද අණදෙන නිලධාරී විශේෂ කාර්යය බලකාය විසින් යොමු ගතකර ඇති විශේෂ කාර්යය**

FAIR COMMENT BY JEZEEM

**බලකාය, ශ්‍රී ලංකා පොලිසිය ලෙස සඳහන් ලිපි ශීර්ෂයේ තිබෙන ලිපිය සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)**

ප : හඳුනා ගන්නවද?

පි : ඔව්.

**<u>එය C850 ලෙස මේ අවස්ථාවේදී මා ලකුණු කර ඉදිරිපත් කරනවා. එයත් ඡායාස්ථිත පිටපතක් ගරු කොමිෂන් සභාව ඉදිරියේ තිබෙන බවත් ගෞරවයෙන් සැල කර සිටිනවා.</u>**

ප : මේ C850 මගින් අණදෙන නිලධාරී STF විශේෂ කාර්යය බලකාය පොලිස්පතිතුමාට දැනුම්දීලා තියෙන්නේ එම පුහුණුව ලබා දෙන්න පුළුවන්ද බැරිද කියලද?

පි : ප්‍රතිඵලදායක නොවන නිසා බැහැයි කියලා.

ප : මොකක්ද ප්‍රතිඵලදායික නොවන්නේ?

**(සාක්ෂිකරු එම ලේඛනයට අවධානය යොමු කරයි)**

මොකක්ද ප්‍රකාශ කර තියෙන්නේ අණදෙන නිලධාරීවරයා?

පි : ඒ පුහුණුව ලබා දීමෙන් ප්‍රතිඵලදායි සේවාවක් අපේක්ෂා කළ නොහැකියි කියලා.

ප : දැන් අවශ්‍යතාවය මත STF විශේෂ කාර්යය බලකායේ උදව්ව ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය වෙත ලබා දිය හැකි බව ප්‍රකාශ කර තියෙයිද C850 හි?

පි : එහෙමයි.

ප : දැන් ඔබ ඉල්ලා සිටියේ පුහුණු කාලය මාසයක් පමණද?

පි : පුහුණු කාලයක් මම සඳහන් කරලා නැහැ ඒ අදාල පාඨමාලව තමයි සඳහන් කරලා තියෙන්නේ.

ප : මෙම C850 හි දක්වලා තිබෙනවා ඔබේ නිලධාරීන්ට ඒ කියන්නේ විශේෂ කාර්යය බලකායේ දක්වලා තියෙනවා TID එකේ නිලධාරීන්ට ඇයි එම පුහුණුව ලබා දිය නොහැක්කේ කියලා?

පි : ඔව්.

ප : මා ඔබෙන් අහන්නේ ඔබ කිසියම් අවස්ථාවකදි සහකාර පොලිස් අධිකාරීවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පොලිසියට සම්බන්ධ වෙන විට විශේෂ කාර්යය බලකායේ නිලධාරීන්ට ඒ කියන්නේ එයට සම්බන්ධ නිලධාරීන්ට ලබා දෙන පුහුණුව නෙමෙයි වෙනත් පුහුණුවක් ඔබට ලැබුණද?

පි : ඔව්.

ප : ඔබ සමඟ සම්බන්ධ වූ සහකාර පොලිස් අධිකාරීවරුන් වශයෙන් සම්බන්ධ වූ සියළුම නිලධාරීන්ට ලැබුණද එය?

පි : අපි 7 දෙනාටම මාසික පුහුණුවක් ලැබුණා විශේෂ කාර්යය බලකා කටුකුරුන්ද පුහුණු පාසලේදි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එම පුහුණුව STF පුහුණුවමද?

පි : සාමාන්‍යයෙන් අපිට weapon and Tactic සහ explosive training එක දුන්නා.

ප්‍ර : ඔබ ඉල්ලා සිටියේ මොන වගේ පුහුණුවක්ද ලබා දෙන්නේ කියලා ඔබේ නිලධාරීන්ට?

පි : මම මුලික වුනේ දැන් උදාහරණ ගත්තොත් රාජ්‍ය බුද්ධි සේවාවේ ඉන්න කොට යුදමය වාතාවරණයේදි 2006, 2009 ආරක්ෂක ලේකම් තුමත් CNI මහත්තයත්, කීර්ති ගජනායක මහත්තයත් ත්‍රස්ත මර්ධන කටයුතුවලට පුර්ණ නිදහස සහ ඒ අවශ්‍ය සියළු දේවල් ලබා දුන්නා. එතකොට ඒකේදි මූලිකව මම මෙතන මතක් කරන්නේ ජයන්ත වික්‍රමරත්න මහත්මයා පොලිස්පති හිටියේ. මහින්ද බාලසුරිය මහත්තයා තමයි එතකොට අණදෙන නිලධාරී හිටියේ විශේෂ කාර්යය බලකායේ සහ විශේෂ කාර්යාංශයත් භාරව හිටියේ. එතුමා මට එතුමාගෙත් ඉල්ලීමක් තිබ්බා කොළඹ නගරය ආරක්ෂා කිරීමේ සම්පුර්ණ වගකීම මට පවරලා තිබ්බ නිසා මට STF එකේ මට මතක හැටියට ප්ලැටුන් teams 3 ක් හරි 4 ක් හරි දුන්නා ඕනෑම මොහොතක ඒගොල්ලන්ව Summon කරලා අවශ්‍ය වැටලීම් සිදු කරන්න. ඒකෙන් අපි පළවෙනිම වැටලීම අපි කරෙත් මීගමුවේ දී මරාගෙන මැරෙන බෝම්බ කරුවෙක් අත් අඩංගුවට ගත්තා ඒක මට ගිය සැරේ කියන්න අමතක වුණා ඒක. ඔහුගෙන් තවත් දෙන්නෙක් අල්ලලා කිලෝ 30 ක් පුරවලා තිබ්බ Suicide මෝටර් බයික් එකකුත් ඒ කණ්ඩායමට recover කරන්න පුළුවන් වුණා SIS කණ්ඩායමට. ඒකෙන් වත්මන් ආණ්ඩුකාර රොෂාන් ගුණතිලක මහත්තයාගේ ජීවිතය බේරා ගන්න පුළුවන් වුණා. ඉතින් ඒ වගේ හුඟක් තියෙනවා අපි කරපුවා. ඒවා අවශ්‍ය නැහැ මම හිතන්නේ ඒවා. හුඟක් දේවල් අපි කළා. රට LTTE ග්‍රහණයෙන් බේරා ගන්න. මට දුන්න වගකීම මම ඉෂ්ඨ කළා. ඒකට මට ලැබෙන්න ඕන දේවල් ලැබුණා. ආරක්ෂක ලේකම්තුමාගෙන් සහ මගේ නායකයින්ගෙන්. මෙතන මේ අවස්ථාවේ දී මම දැක්ක එකක් තමයි පුහුණුව දෙන්න කියන්නේ මේ කාටවත් ගහන්නවත් මුකුත් කරන්න නෙමෙයි. ඕනෑම මොහොතක ඕනෑම අවස්ථාවකට මුහුණ දෙන්න පුළුවන් වෙන්න ඕන. ත්‍රස්තවාදියා එන්නේ මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කරන්න එනවා නම් එයාව අතින් අල්ලන්න බැහැනේ, එතකොට අපේ නිලධාරීන්ට ආරක්ෂාව දෙන්න ඒ ඕනෑම මොහොතක ක්‍රියාත්මක වෙන්න පුළුවන් නිලධාරීන් 10 දෙනාට සාමාන්‍යයෙන් ගත්තොත් දෙන අවි පුහුණුවට අමතරව විශේෂ ගනයේ පුහුණුවක්

FAIR COMMENT BY JEZEEM

ලබා දෙන්නේ. මොකද මම දන්නවා ඒ දෙන Police College එකේ දෙන පුහුණුවත් මම දන්නවා, STF එකේ දෙන පුහුණුවත් දන්නවා මම ඒකට ගිය හින්දා. ඒක හින්දා තමයි ඕන වුනේ අපිට පුළුවන් විශේෂ කාර්යය බලකායට කතා කරලා කියන්න එන්න යන්න කියලා. නමුත් ඒ යන කාලය ඇතුලත කමඩාන්ට call එක දීලා ඒ team එක ලෑස්ති කරගෙන ඒ team එක අපි ගාවට එන කොට වෙන්න ඕන දේවල් වෙලා ඉවරයි. එතකොට අපි ගාව තියෙන්න ඕන ඕනම මොහොතක ක්ෂණිකව විහිදෙන්න. අපි ඕකට කිව්වොත් එහෙම ඇමරිකාවේ වචනයෙන් Quick reaction team එකක්. ඒකක් තියෙන්න ඕනේ අපි ගාව. ඒක තමයි මම කිව්වේ අපි ගාව ඒ QRT එකට ඕන කරන weapon training එක තමයි මම දෙන්න කිව්වේ. එතකොට ඒ course එකේ තියෙන training එක මොකක්ද කියලා මම දන්නේ නැහැ. නමුත් ඒ training එකට අදාල කරන weapons මොනවද ඒ course එක කරන කට්ටිය දන්නවා. ඒක තමයි මම කිව්වේ මේ විදියට පුහුණු කරලා දෙන්න මගේ reaction team එකට ඕන මොහොතක කිලිනොච්චිද ඕනම තැනක රෑද, දවල්ද, උදේද ඕන තැනක ගිහිල්ලා ඒ ත්‍රස්තවාදීන්ව මෙල්ල කරන්න හෝ අපේ කණ්ඩායමේ ආරක්ෂාවට අවශ්‍ය විදියට පුහුණුව ලබා දෙන්න කියලා.

දැන් වේලාව : පෙ.ව. 10.55 යි
මෙතැන් සිට ල/ලේ :- යමුනා දසනායක මිය විසින්ය.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව:පෙ.ව.10.55
පෙර සටහන් ගැනීම:- ල/ලේ දම්මිකා මිය.
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක විසිනි.

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ සංජීව දිසානායක මහතා</u>**

ප්‍ර නමුත් එම පුහුණුව ඔබලාට ලැබුනේ නැහැ?

උ ලැබුනේ නැහැ.

ප්‍ර දැන් ඔබ 2017 වර්ෂයේදී TID එක ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඔබ පියවර ගත්තාද ඔබගේ නිළධාරීන්වරුන්ට හෝ නිළධාරිවරුන් කීප දෙනකුට අමතර භාෂාවක් ඉගෙන ගැනීමට?

උ එහෙමයි.

ප්‍ර මොකක්ද ඒ භාෂාව?

උ අරාබි භාෂාව.

ප්‍ර එයඔබ ලිඛිතව පොලිස්පතිවරයාගෙන් කරන ලද ඉල්ලීම ප්‍රතිඵලයක් වශයෙන්ද ලැබුනේ?

උ ලැබුනද මන්දන්නේ නැහැ ඉල්ලීම නම් කලා.

ප්‍ර ඒ කියන්නේ ඔබ ඉල්ලිමක් කලා.

ප්‍ර එම ඉල්ලීම ඔබට අද දින දුටුවහොත් ඔබට අදුනාගන්න පුලුවන්ද?

උ එහෙමයි.

ප්‍ර 2017/07/24 දිනැති වැඩබලන නියෝජ්‍ය පොලිස්පති ත්‍රස්තවාදි විමර්ශන දිසාව විසින් පොලිස්පති ආමන්ත්‍රණය කරමින් අරාබි භාෂාව පුහුණුවීම සඳහා නිළධාරිවරුන් දෙදෙනකු නම් කර අනුමැතිය ඉල්ලා ඇති ලිපිය සාක්ෂිකරුට පෙන්වා සිටි. සාක්ෂිකරුට හදුනාගන්න පුලුවන්ද?

උ එහෙමයි.

ප්‍ර මෙහි ඔබේ අත්සන තියෙනවාද?

උ එහෙමයි.

ප්‍ර එම ලිපිය C.851 ලෙස ලකුණු කර ඉදිරිපත් කරනවා ගරු කොමිෂන් සභාව වෙත මෙම සඳහා පොලිස්පති වරයා අනුමැතිය ලබාදී තිබෙනවාද?

උ එහෙමයි.ගරු ස්වාමීනි මට ඒක පොඩ්ඩක් කියන්න අවශ්‍යයි.ඒක 2017/08/24 මම යවලා තියෙන්නේ. එදා ඉදන් මං මේ අන්තවාදය ගැන හොඳ විශ්ලේෂණයක් කරලා තිබ්බේ. ඒකට හුඟක්ම පාදක වුනේ ඔය SIS එකෙන් ලැබිච්ච දැනුමයි පිටරට ගිහිල්ලා ගත්ත පුහුණුව සහ සම්මන්ත්‍රණ වලදී විශේෂයෙන්ම එක්සත් ජාතින්ගේ සංවිධානය සහ ඉන්ටපෝල් එකත් එක්ක තමයි මට ලැබුනේ. මේ පලවෙනි පැරා එකේම මම ලියලා තියෙනවා වර්තමානයේ ලොව පුරා ක්‍රියාත්මක වෙමින් පවතින ඉස්ලාම් අන්තවාදීන් ගේ තොරතුරු බොහෝ මාධ්‍ය තුලින් අන්තර්ජාතිකව ප්‍රදර්ශණය වුනේ අරාබි භාෂා මඟින් බව

FAIR COMMENT — BY JEZEEM

නිරික්ෂණය වී ඇත. ඒ 2017 ඉඳන්ම තමයි මං පටන්ගත්තේ මේ ගමන යන්න ගරු ස්වාමීනි. ඒක මම විශේෂයෙන්ම මෙම උත්තරීතර කොමිසමට කියන්න අවශ්‍යයයි. ඒ විශ්ලේෂණය analyse කරන එක අනිවාර්යයෙන් තිබෙන්න ඕනේ. ඕනෑම දෙයක් analyse කරන්න ඕනේ.

ප්‍ර දැන් සාක්ෂිකරු ඔබ ත්‍රස්ත විමර්ෂන කොට්ඨාශයේ අධ්‍යක්ෂක සහ පසුව එහි නියෝජ්‍ය පොලිස්පති වශයෙන් කටයුතු කිරීමේදි ආරක්ෂක ලේකම්තුමා ඉදිරියේ සතිපතා පවත්වන ලද ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමට ඔබ සහභාගි වුනාද ?

උ එහෙමයි.

ප්‍ර සහභාගි වුනා .

ප්‍ර ඔව් 2015 යම් පැහැදිලි කිරීමක් කරන්න කමක් නැද්ද ස්වාමීනි.

මම අතීතයට ගියොත් 2006 තමයි ගෝඨාභය රාජපක්ෂ මහතා පැමිණීමෙන් පසු ආරක්ෂක ලේකම් හැටියට CNI කියන තනතුර ඇති කරේ. ජාතික බුද්ධි ප්‍රධානී. බොහොම විශිෂ්ඨ සේවයේ නිළධාරියෙක් පත් කලා ඒකට කපිල හෙන්දාවිතාරණ කියන මහත්මයා. හොඳ දැනුමක් තියෙන විශේෂයෙන්ම බුද්ධි සම්බන්ධයෙන්. එතුමා මඟින් රාජ්‍ය බුද්ධි සේවාව, ත්‍රිවිධ හමුදා බුද්ධි සේවා, පොලිසියේ විශේෂ කාර්යංශය යම් සම්බන්ධීකරණයක් ඇති කරා. ඒවා තමයි බුද්ධි අංශයේ යුද්ධමය වාතාවරණය ඒ කියන්නේ 2009 මැයි 19 අවසන් කරපු ඒ යුද්දෙදි ලොකු කාර්ය භාරයක් කරන්න පුළුවන් වුනේ ඒකෙන් මට පවා. මට පවා ඒක කරන්න පුළුවන් වුනේ මනා සම්බන්ධීකරණය හින්දා. එතකොට ඒ එතුමා තමයි මේ අඟහරුවාදා රැස්වීම ආරම්භ කරේ මගේ මතකයේ හැටියට. මම ඒ රැස්වීමට මුලිකව සහභාගි වුනා රාජ්‍ය බුද්ධි වෙනුවෙන් පලමුවෙනිම රැස්වීමට. ඒක ඊට පස්සේ ක්‍රමාණුකූලව යනකොට යුද්දෙත් එක්ක එහෙමම ආරක්ෂක ලේකම්තුමා මේ මෙහෙයවන්න ගත්තා. එතකොට අපේ අධ්‍යක්ෂකතුමා කිර්ති ගජනායක මහත්මයා ගියේ. TID එක අවායින් පස්සේ TID director ටත් ඒකට include කරලා තිබ්බා ඒ අඟහරුවාදා රැස්වීමට ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයත් සහභාගි වෙන්න ඕනේ.ඒ අනුව තමයි මං බොහොම සන්තෝෂයෙන් ආයේ සැරයක් ඒකට ගියේ නමුත් ඒක ගිහිල්ලා මං ඒකට තව කියන්න ඕනේද ඒක? ගියේ මම 2017/10/04 වෙනිදා වෙනකල් විතරයි මම ගියේ.

ප්‍ර ඒ කියන්නේ ඔබ 2015/02/27 අධ්‍යක්ෂක ත්‍රස්ත විමර්ෂණ කොට්ඨාශ ටත් වශයෙන් සම්බන්ධ වුනා?

ප්‍ර සම්බන්ධ වෙලා ඊට පස්සේ නියෝජ්‍ය පොලිස්පති ලෙසත් මම රැස්වීමට ගියා.

ප්‍ර සතිපතා?

FAIR COMMENT BY JEZEEM

උ සතිපතා ගියා තියනකොට සතිපතාද කියලා මට මතක නැහැ තියන කොට මම රැස්වීමට ගියා. ඉන්පසු ඇතිවූ යම් හේතුවක් යම්කිසි සිදුවීමක් මත 2017/10/04 වෙනිදා ලිඛිතව පොලිස්පතිතුමාට දැනුවත් කර මම ඒ රැස්වීමට යන එක නතර කර ඒ වෙනුවට වැඩ බලන අධ්‍යක්ෂ යොමු කලා.

ප ඔබ අවසානයට එම රැස්වීමට සහභාගිවූ දිනය මොකක්ද ?

උ මේ තියෙන විදියට නම් 2017/09/24.

ප 2017 සැප්තැම්බර් 24 ?

උ ඔව්.

ප දැන් ඔබ පොලිස්පති වරයා වෙත ඉදිරිපත් කළ ලිපිය අද ඔබ බාරයේ තියෙනවාද ?

උ ඒකේ පිටපතක් තමයි තියෙන්නේ. ඒක පැහැදිලි කරන්න ඕනේ ස්වාමිනි පුද්ගලික හේතු කිසිවක් නැහැ . නමුත් යම් සිදුවීමක් පාදක කරගෙන තමයි මං යන එක නවත්වලා ගියේ. මට මතකයි ගිය වාරෙත් ඔබතුමා මගෙන් ඇහුවා පොලිස්පති තුමා අපි දෙන තොරතුරු බර කරලා කතා කරනවාද කියලා. නමුත් ඒකට පිළිතුරු දෙන්න මට මේක තිබුනේ නැති හින්දා තමයි මම හරියට පිළිතුරක් දුන්නේ නැත්තේ. එදා ඉඳන් මං ගියේ නැති හින්දා තමයි පොලිස්පති තුමා කතා කරාද නැද්ද මුකුත් දන්නේ නැහැ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u>**

ප ඇයි ගියේ නැති හේතුව මොකක්ද ?

උ එවකට සිටි ආරක්ෂක ලේකම්තුමා සමඟ ඒ කියන්නේ එතන රැස්වීමේ මත ගැටුමක් ආවා.ඒ මත ගැටුමෙන් පස්සේ මං ගියේ නැහැ.

ප නම් කරන්න ?

උ කපිල වෛද්‍යරත්න මහතා.

ප මොකක්ද මත ගැටුම?

උ ඔය රාජ්‍ය බුද්ධි සේවා යම් කරුනක්

ප අන්තවාදය සම්බන්ධවද?

උ නැහැ අන්තවාදය සම්බන්ධව නෙමේ වෙනත් හේතුවක් මුලිකව ගත්තොත් මම ගියාම මගේ මතය මං ප්‍රකාශ කරනවා ඕනෑම මොහොතක රටේ සිදුවීමක් දැන් වුනොත් contingency plan එකක් තියෙනවාද ඒ සිදුවීමට ගත යුතු පියවර සම්බන්ධයෙන් නිළධාරීන් දැනුවත්ද ? මොකද යුද්ධය අවසන් වුනාට පස්සේ ටිකක් එන්න එන්න ඒ අවස්ථා ඒක හොඳටම දැක්ක එකක් තමයිඔබතුමා දකින්න ඇති දැන් ඔය පාස්කු ප්‍රහාරය සිදුවුනායින් පස්සේ දවසක් ගානක් ගියානේ carfew එක දාගන්න. ඒවගේ තීරණ ගන්න ඕනේ ටක් ගාලා contingency plan

FAIR COMMENT BY JEZEEM

තියෙනවාද ඉතින් මං ඒවා අහනවා ඉතින් මං ඒවා කථා කතා කරනවා ඉතින් ඒ සම්බන්ධයෙන් යම් යම් මත ආවා ඉතින්.

ප්‍ර ඒක විස්තර කරන්න ?

උ ඒ මතත් එක්ක මේ අන්තවාදයට අමතරව මගේ මතය මම කිව්වා ඉතින් ඕනෑම මොහොතක අපි ලෑස්ති වෙන්න ඕනේ කියලා ඉතින් ඒවුනාට සමහර වෙලාවට හිතනවා ඇති මං නැවත යුද්ධයක් ගේන්න හදනවා කියලා ඒක හින්දා ඒ මතෙත් එක්ක මට යම් දෝෂාරෝපන ආවා.

ප්‍ර කවිද දෝෂාරෝපනය කෙරුවේ ?

උ ඒ ආරක්ෂක ලේකම්තුමා තමයි අන්තිමට දෝෂාරෝපනය කරා මට. ඊට අනිත් එක පාදක වුනේ ගරු ස්වාමීනි අර මට මතක හැටියට FETO කියලා Turkey වල තියෙනවා දැන් ඒක සම්බන්ධයෙන් මං මේක sensitive හින්දයි මං කැමති

ප්‍ර නැහැ ඒක දැනටමත් කොමිෂන් සභාව ඉදිරියේ තියෙනවා.

උ ඒ වෙලේ මට මතකයි රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂ කිව්වා ඒ රැස්වීමේ මේ FETO සංවිධානය සම්බන්ධයෙන් සහ තානාපති මොනවද කිව්වා කියලා. ඒ අවස්ථාවේ මට දෝෂාරෝපනයක් ආවා මම ඒවට ඇක්ෂන් ගත්තේ නැහැ කියලා ඉතින් ඇක්ෂන් ගන්න මම ඒවා දන්නේ නැහැ.ඒවා share කරන්න එපායි සාමාන්‍යයෙන් intelligence මමත් දන්නවා intelligence. මම හිටපු එක්කනා නේ අපිට හම්බෙන intelligece share කරන්න ඕනේ. share කරන්නේ නැතුව මම දන්නේ නැහැනේ Director TID වුනාට අහසින් කඩා වැටෙන්නේ නැහැනේ intelligence. එතකොට intelligence share වෙන්න ඕනේ.එතකොට ඒ sharing එක නැති වෙන කොට මට ඇක්ෂන් ගන්න බැහැ. මට ඇක්ෂන් ගන්න බැහැ. අනිත් එක sharing එක ආවා විතරක් නෙමේ ඒක විමර්ෂනය කරන්න මම ඕන මොහොතක සැදී පැහැදී ඉන්නවා නමුත් share වෙන්න ඕනේ ඒක.ඒ share වුනේ නැති හින්දා ඉතින් මම එක පාරටම ඒ කතාව එවෙලේ කියනකොට එවෙලේ තමයි මං දන්නේ .

ප්‍ර දැන් පොඩ්ඩක් අපි ඕක පිලිවෙලට යං ?
දැන් ඔබ කියනවානේ FETO සංවිධානය තුර්කිය FETO සංවිධානය සම්බන්ධයෙන් යම් තොරතුරක් ඔය බුද්ධි සමාලෝචන රැස්වීමක අනාවරණය වුනා කියලා?

උ 2017/09/24 වෙනිදා තමයි ඒක කිව්වේ.

ප්‍ර 2017/09/24 වෙනිදා ඒක බුද්ධි සමාලෝචන මංඩලයට දැනුම්දුන්නේ කවිද ?

උ එවෙලේ රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂ හිටපු නිලන්ත ජයවර්ධන මහත්මයා කිව්වා තුර්කියේ තානාපතිතුමා ඇවිල්ලා එතුමා හම්බවෙලා

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

මොනවද විස්තර වගයක් කිව්වා කියලා මෙහේ ඉන්න කට්ටියක් ගැන හෝ මට මතක හැටියට.

ප FETO සංවිධානය ගැන?

උ FETO සංවිධානය ගැන.

ප එතකොට එවෙලේ තමයි අර දෝෂාරෝපනය ආවේ මම කිසිම දෙයක් ඒ සම්බන්ධයෙන් ඇක්ෂන් ඇරන් නැහැ කියලා එතකොට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂත් ඒවෙලේ කිව්වා සර් නාලක මුකුත් දන්නේ නැහැ කියලා නමුත් එවෙලේ ලොකු දෝෂාරෝපනයක් මට ආවා ඉතින් ඒ දෝෂාරෝපනය මට පිළිගන්න බැහැ ගරු ස්වාමිනි මම යන්නේ නාලක ද සිල්වා හැටියට නෙමේ මම යන්නේ නියෝජ්‍ය පොලිස්පති ත්‍රස්තවාදී විමර්ෂණ කොට්ඨාශය හැටියට එතකොට එතුමායි මායි බොහොම හුග කාලෙක සිට පුද්ගලිකව හඳුනනවා ඉතින් නමුත් මම දන්නේ නැහැ ඇයි එහෙම දෝෂාරෝපනය කරන්නේ කියලා මට ලැජ්ජාවක් ඇති වුනා ඒක තමයි මම පොලිස්පති තුමාට කිව්වා මට ආයේ රැස්වීමට යන්න බැහැ අධ්‍යක්ෂක යවන්න අවසර ඉල්ලුවා හා කිව්වා .අධ්‍යක්ෂක තමයි යැව්වේ ඊට පස්සේ .

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ප දෝෂාරෝපනය කරන්න පදනමක් ඇතිනේ මොකක්ද ඒ පදනම.?

උ දන්නේ නැහැ ස්වාමීනි.

ප නිකම් දෝෂාරෝපනයක් කරන්නේ නැහැනේ සාමාන්‍යයෙන්?

උ ඒක තමයි මටත් තියෙන ප්‍රශ්ණය.

ප නැත්නම් කව්රුහරි කියපු කේලමක් අහලා ?

උ වෙන්න ඇති. ඒක තමයි මං මුලිකව හිතන්නේ.

ප නැත්නම් තමන් ගේ මොකක් හරි අඩුපාඩුවක් ඒ අවස්ථාවේදි දැකලා ඒක කියලා?

උ අඩුපාඩුවක් දකින්න මම දැනන් හිටියේ නැහැනේ ගරු ස්වාමීනි. එතකොට කව්රු හරි කේලමක් හරි මොකක් හරි කියලා වෙන්න ඇති නැතුව මාව හොඳට අඳුරන් නැතුව මට දෝෂාරෝපනය කරන්නැහැනේ.

ප මොනව කියලාද දෝෂාරෝපනය කලේ?

උ ඒ අර FETO සංවිධානයට අදාලව ඒ ලංකාවට ඇවිල්ලා ඉන්න කට්ටිය ගැන විමර්ෂණය කලේ නැහැ කියලා. ඉතින් විමර්ෂනය කරන්න මම දැනන් ඉන්න එපාය. ත්‍රස්තවාදී විමර්ෂණ කොට්ඨාශයට විමර්ෂණය කරන්න එන්න ඕනේ තොරතුරු දැන් උදාහරණයක් ගත්තොත් කාත්තන්කුඩි එකත් පැමිණිල්ල ආවාම තමයි සාමාන්‍යයෙන් අපි විමර්ෂණය කරන්න පටන් ගන්නේ එතකොට ඒක එන්න ඕනේ අපිට එන්න නැතිව අපි දන්නේ නැහැනේ ගරු ස්වාමීනි

FAIR COMMENT BY JEZEEM

**********

**<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මහතා.</u>**

ප්‍ර දැන් නාලක සිල්වා මහත්මයා ඔබට දෝෂාරෝපනය ආපු වෙලාවේ ඔබ පිළිතුරු වශයෙන් ආරක්ෂක ලේකම්තුමාට මොනවද කිව්වේ ?

උ මං කිව්වා මං දන්නේ නැහැ කියලා.

ප්‍ර ඔබ ඒ පිළිබඳව නොදැන සිටි බව ඔහුට දැනුම් දුන්නා ?

උ ඔව්.

ප්‍ර ඒත් ඔහු ඔබට දොස් පැවරුවා ?

උ එහෙමයි

ප්‍ර ඒ දොස් පවරන කොට ඔබව Defend කරන්න ඔබ වෙනුවෙන් කතා කරන්න එතන හිටපු අය කව්රුත් උදව් කරේ නැද්ද ?

උ නැහැ නිශ්ශබ්දව හිටියා. නමුත් අවසානයේදි මට මතක හැටියට සිසිර මෙන්ඩිස් මහත්මයාද කොහේද කිව්වා සර් නාලක දන්නේ නැහැ මේවා මුකුත් අපි කියලා නැහැ තාම කියලා.

ප්‍ර ඊට පස්සේ මොකක්ද වුනේ?

උ ඊට පස්සේ නිශ්ශබ්ද වුනා.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

ප්‍ර දැන් ඔබට මතකද නිලන්ත ජයවර්ධන මහතා ඔය FETO සංවිධානය සම්බන්ධ මොකක්ද ප්‍රකාශ කෙරුවේ කියලා?

උ ඒ තානාපතිතුමා ඇවිල්ලා එයාව හම්බ වෙලා මේ ලංකාවේ කට්ටියක් ඉන්නවා කියන එක තමයි කිව්වේ .

ප්‍ර ඊට අමතරව ලංකාවේ සිටින තැනැත්තන් ඒ සංවිධානයේ ඒ තැනැත්තන් සමග මේ සම්බන්ධතා පවත්වන එකත් කිව්වාද ?

උ ඒක මතකයක් නැහැ ස්වාමිනි.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>**

ප්‍ර දැන් මෙම තොරතුරු 2017/09/24 වෙනි දින ලැබුනා ම ඔබ ඉල්ලා සිටියේ නැද්ද එම තොරතුර ඒ කියන්නේ තුර්කි තානාපතිවරයා විසින් ඒ ලබා දුන්න තොරතුර ඔබ වෙත ලබා දෙන්න කියලා ඉල්ලීමක් කලේ නැද්ද ?

උ ඉල්ලා සිටියා.

ප්‍ර එතකොට ඒ ඉල්ලීම මත ඔබට එම තොරතුර ලබා දුන්නාද ?

උ නැහැ.

ප්‍ර එය ලබා නොදෙන්න හේතුවක් තිබුනාද ?

FAIR COMMENT BY JEZEEM

උ දන්නේ නැහැ. ඉතින් මම කිව්වා මට ලබා දෙන්න කියලා නමුත් ඒක දෙන්නම් කිව්වාට දුන්නේ නැහැ.

ප එම තොරතුර ලබාදීම සඳහා එවකට පැවති රජයේ ප්‍රතිපත්ති වලට යම් බලපෑමක් වෙන්න පුළුවන්ද නැද්ද කියලා කවුරු හරි ප්‍රකාශ කලාද ?

උ ප්‍රකාශ කලේ නැහැ. මට ඒක පුද්ගලිකව කියන්න පුලුවන් පුලුවන්. මගේ මතය ටිකක් වෙනස්. ඕනෑම මොහොතකට රට මුහුණ දෙන්න පුළුවන් වෙන්න ඕනේ. ආරක්ෂක අංශ මුහුණ දෙන්න පුළුවන් වෙන්න ඕනේ. අපිට මුහුණ දෙන්න පුළුවන් වෙන්න ඕනේ. එහෙම තමයි මං පුහුණුව ලබලා තියෙන්නේ. සමහරවිට ඒක වෙනත් කෙනෙක් පිලිගන්නේ නැතුව ඇති නමුත් ඉතින් දැන් මේ සිදු වෙච්ච එකෙන් දැන් තේරෙන්න ඇතිනේ.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ප සාක්ෂිකරු එදින බුද්ධි සමාලෝචන මණ්ඩලයේදිද සාකච්ඡා වුනේ ?

උ ඔව්.

ප ඒකේ තීරණයක් කරාද මොකක්හරි ඒ සම්බන්ධව ඒ FETO සංවිධානය ගැන ස්ථානයේදි යම් තීරණයකට එළඹුනාද ?

උ මට මතක නැහැ ස්වාමීනි.

ප සාකච්ඡා කරලා මොකක්ද තීරණය කරේ?

උ මං හිතන්නේ මට මතක හැටියට නිලන්තට කිව්වා තවදුරටත් සාකච්ඡා කරන්න හරි මොකක් හරි කිව්වා මිනිට්ස් වල ඇති.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u>**

ප ඔබ මීට ස්වල්ප මොහොතකට පෙර ඇයි ප්‍රකාශ කෙරුවේ ඇයි දැන් ඔබ කියපු එක හරි කියලා පේනවා කියලා ?

උ ඒ කියන්නේ දැන් පාස්කු ප්‍රහාරයත් සමඟ දැක්ක දේ මං මුළු වෙලේම සර්ට කියන්නේ මම විශ්ලේෂණය කරනවා කියලා analyze කරනවා කියලා ඒක තමයි මං පුහුණු වෙලා තියෙන්නේ. යමක් තොරතුරක් ලැබුනා හෝ ඒක බුද්ධි වේවා ඕපන් සෝස් වේවා අපි ඒක ඇනලයිස් කරන්න ඕනේ ඒ analyze එක වාසි වෙන්න පුලුවන් අවාසි වෙන්න පුලුවන් සාර්ථක වෙන්න පුලුවන් අසාර්ථක වෙන්න පුලුවන් යමෙකුට ඒක වෙනස් විදියට දකින්න පුලුවන් නමුත් මගේ රාජකාරිය ඒක analyze කරලා කියන එක.

**********

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ප්‍ර තමන් කිව්වා FETO සංවිධානය දැන් තමන් කිව්වා මේක තමයි දැන් වුනදේ කියලා එතකොට තමන් කියන්නේ FETO සංවිධානය යි මේ ප්‍රහාරයයි අතර යම්කිසි සම්බන්ධතාවයක් තමන්ට තියනවාද කියලා?

උ නැහැ නැහැ මම කිව්වේ analyzing එක ගැන මං කියන්නේ මම ඇනලයිස් කරලා කියන දේ වෙන දෙයක් උදාහරණයකට ගත්තොත් මේ මොහොත් දැන් මේ බී. එම්. අයි. සි. එච් එක ඇතුලේ බෝම්බයක් ගියොත් ප්‍රහාරයක් එල්ල වුනොත් අපි ගන්න ඇක්ෂන් එක මොකක්ද. ඒක තමයි අපි ආරක්ෂක නිළධාරින් හැටියට අපේ යුතුකමනේ ඒක . ඒක අපිට සාමාන්‍ය මිනිසුන් ගෙන් බලාපොරොත්තු වෙන්න බැහැනේ. එතකොට අපිව ඒකට මුහුණ දෙන්න ඕනේ. මම ත්‍රස්තවාදී විමර්ෂණ කොට්ඨාශයේ නියෝජ්‍ය පොලිස්පති ලෙස හිටියේ නැත්නම් වෙන අංශයක හිටියානම් මට ඔය අදහස කියන්න බැහැනේ. එතකොට මේ ත්‍රස්තවාදී විමර්ෂන කොට්ඨාශය කියන්නේ ත්‍රස්තවාදින් එක්කයි අපි මේ කතා කරන්නේ. මගේ විෂය පථය, විෂය පථයේදි ත්‍රස්තවාදින් කියන කට්ටිය එක එක වේසයෙන් ඉන්නවා අපි ඒකට මුහුණ දෙන්න ඕනේ . අපිට හිතන්න බැහැ නැහැ නැහැ suicide දෙන්නේ නැහැ මේ ගොල්ලෝ ඇවිල්ලා lonewolf ඇටැක් එකක් කරයි බස් එකක් ඇරන් ඇවිල්ලා හප්පයි ඒ ඔක්කෝටම මුහුණ දෙන්න පුලුවන් පොලිසිය කට්ටිය. මම දැනගන්න ඕනේ හදන්න අපේ ආයතනයට.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර ඔබකෙටියෙන් කියන්නේ 2017 වන විට ත්‍රස්තවාදී ප්‍රහාරයකට මුහුණ දීම සඳහා contingency plan එකක් නැත්නම් සැලැස්මක් බුද්ධි අංශ හෝ ආරක්ෂක අංශ වල පැවතියේ නැහැ කියලාද?

උ පැවතියේ නැහැ කියන මතය මට කියන්න බැහැ මම ඇහුවේ එහෙම තියෙනවාද කියලා. මගේ අදහසක් සාකච්ඡාවේ මූලික පරමාර්ථයක්නේ සාකච්ඡා කරන්න පුලුවන් හින්දා තමයි මම ඇහුවේ ඒක මගේ පුද්ගලික විදිය මම DIG TID හැටියට මං ඇහුවේ. අපි ඕනෑම මොහොතක ලෑස්ති වෙන්න අපිට ක්‍රමවේදයක් තියෙන්න ඕනේ

ප්‍ර හරි ඔබ ප්‍රශ්නයක්නේ ඇහුවේ ඒ රැස්වීමේදි ?

උ ඔව්.

ප්‍ර ඒකට උත්තරයක් ලැබුනාද?

උ ඒ වෙලේ මම ඔක අහනකොට ස්වාමීනි හිටියේ වෙන ලේකම්වරයෙක් කරුණාසේන හෙට්ටිආරච්චි මහත්මයා හිටියේ එතකොට සාකච්ඡා කලා ත්‍රිවිධ හමුදාවේ තියෙන ප්‍රතිපත්ති එහෙම සාකච්ඡා කලා සාමුහිකව කථා කලා ඒක.

FAIR COMMENT BY JEZEEM

**********

**ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**

උ දැන් FETO සංවිධානය තමන්ගේ කටයුතු තමන් ත්‍රස්ත විමර්ෂණය විෂය පථයට අයත් වෙනවාද ?

උ නැහැ ත්‍රස්තවාදීන් FETO සංවිධානය තුර්කියේ කරන දේවල් වලට අදාලව වෙන්නේ නැහැ නමුත් මෙහේ මොනවහරි කරලා ඒ පැමිණිල්ල ආවොත් අනිවාර්යයෙන් අපිට නම් එව්වේ අපි විමර්ෂණය කරන්න ඕනේ.

ප්‍ර දැන් එදින සාකච්ඡා වුන දේ තමන්ගේ විෂය පථයට තමන්ගේ රාජකාරිවලට අදාල වුවාද ?

උ ස්වාමීනි.

ප්‍ර එදින සාකච්ඡා වුන දේ FETO සංවිධානය ගැන තමන්ගේ ත්‍රස්තවාදී විමර්ෂණ කාර්යංශයේ විෂය පථයට අයත් වුනාද ?

උ ස්වාමිනි දැන් එදා ඒ කියපු දේ අනුව යම් විමර්ෂණයක් කරන්න ඕනේ නම් ඒ අපිට නම් එව්වේ පොලිස්පතිතුමාට පස්සේ අපිට නම් එව්වේ ඒක අපිට අදාල වෙනවා.

ප්‍ර තමන්ලට විමර්ෂනයක් කියන්න කියන්නේ ත්‍රස්තවාදී විමර්ෂන කොට්ඨාශයේ විෂය පථයට ඇතුලත්වන්නේනම් පමණක්නේද?

උ ඒක පොලිස්පති තුමා තිරණයක් කරන එකක් ස්වාමීනි.
මොකද දැන් පාතාල මර්ධනය ඒවාට පවා අපේ ආයතනය පාවිච්චි කරානේ. එතකොට පොලිස්පති තුමාගේ discretion එක පොලිස්පති තුමා තීරණය කරන්නේ මේක කාටද දෙන්නේ මොකක්ද කරන්නේ කියලා.

ප්‍ර දැන් පොලිස්පතිතුමත් එදා හිටියාද?

උ මතක නැහැ ස්වාමීනි.

ප්‍ර එතකොට ආරක්ෂක ලේකම්වරයා තමන්ට කිව්වේ තමන් ඇයික්‍රියා මාර්ග ගත්තේ නැහැ කියලා එය ත්‍රස්තවිමර්ෂණ අංශයේ විෂය පථයට අයත් වෙන නිසාද?

උ වෙන්න ඇති.

**********

**ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.**

ප්‍ර ඔබ මෙම ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීමට සහභාගි නොවන බවට පොලිස්පති වරයා වෙත දැන්වූ 2017/10/04 දරණ ලිපියමේ අවස්ථාවේදි.C 852 ලෙස ලකුණු කර ඉදිරිපත්කර සිටිනවා.එය මේ අවස්ථාවේදි C 852 වශයෙන් නොව NDS 1 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u>**.

NDS 1 වශයෙන් ලකුණු කරන ලද ලේඛණයේ ඡායා පිටපතක් ලබාගෙන එය සාක්ෂිකරුට නිකුත්කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>**

එසේම NDS 1 යනු ඡායාස්ථ පිටපතක් බවයි පෙනී යන්නේ එය කොමිෂන් සභාවට දන්වා සිටිනවා .

ප්‍ර 2006 අවුරුද්දේ ඔබ රජය බුද්ධිසේවයේ ඉන්න විට ඔබ කියා සිටියා ඔබ ආරක්ෂක සම්බන්ධිකරණ රැස්වීමට සහභාගි වූ බව?

උ එහෙමයි.

ප්‍ර ඒ කියන්නේ ඔබ සෑම සතියකම ඒ සඳහා සහභාගි වුනාද?

උ නැහැ ස්වාමීනි.

ප්‍ර නැත්නම්?

උ මුලිකව ගත්තොත් රැස්වීම් 5 කට 6 ට පමණ සහභාගි වුනායින් පස්සේ තමයි ඊට පස්සේ මගේ මම හිටියේ මහීල් ඩුල් මහත්මයාට. ඉතින් මහීල් ඩුල් මහත්මයා ඊට පස්සේ යන්න ගත්තා ඒකට.

ප්‍ර මෙම 2006 අවුරුද්ද ගැන කථා කරන්නේ මෙම ආරක්ෂක සම්බන්ධිකරණ රැස්වීමට කවිද සහබාගි වුනේ නිල වශයෙන්?

උ ඒකට කපිල හෙන්දාවිතාරණ මහත්මයාගේ මුලිකත්වයෙන් තමයි පටන් ගන්න කොට කරේ.

ප්‍ර ආරක්ෂක ලේකම්තුමා සහභාගි වුනාද?

උ නැහැ ඊට පස්සේ තමයි එතුමා ආවේ.

ප්‍ර එතුමා ආවේ ඔබ සහභාගි වන අවස්ථාවේදී ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් නෙමේද මේ රැස්වීම තිබ්බේ.?

උ නැහැ කපිල හෙන්දාවිතාරණ මහත්මයා ඒක සාමාන්‍ය බුද්ධි සමාලෝචන රැස්වීමක් ලෙස පටන් ගත්තේ.

ප්‍ර ආරක්ෂක සම්බන්ධිකරණ රැස්වීම ඊට පස්සේද තිබ්බේ නැත්නම් ඒ වන විටඑහෙම රැස්වීමක් තිබ්බාද නැද්ද කියලා මතකයක් තියෙනවාද ?

උ ඒ කියන්නේ අගහරුවාදා රැස්වීම නේද ?
දැන් ඒ අහහරුවාදා මගේ මතකයේ හැටියට අහහරුවාදා තමයි ඒක පටන්ගත්තේ ඉතින් ඒක එහෙමම දිගටම කරගෙන ගියා.

ප්‍ර මෙම රැස්වීමේදී මොනවද සිදුවුනේ?

උ අර මං කිව්වානේ මේකේ තිබ්බ ලොකුම දේ තමයි අර ජාතික බුද්ධි ප්‍රධානී තනතුර ඇති කරලා කපිල හෙන්දාවිතාරණ මහත්මයා පත්වුනායින් පස්සේ එතුමා බුද්ධි අංශ එකතු කරලා මේ

FAIR COMMENT BY JEZEEM

සම්බන්ධීකරණයක් පවත්වන්න ගත්තා. ඉතින් ඒකේදි ඒ ඒ බුද්ධි අංශ ඒ ඒ තොරතුරු ඉදිරිපත් කරනවා.

ප්‍ර එතකොට දැන් මෙම බුද්ධි අංශතොතරතුරු ඉදිරිපත් කිරීමේදීජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි තොරතුරුත් අනාවරණය වුනාද ඔබ ඒ ගියපු අවස්ථාවන්හිදි.?

උ ඔව් ඒ කාලේ හැටියට ජාතික ආරක්ෂාවට අදාල ඒවා තමයි ඉදිරිපත් කරන්නේ විශේෂයෙන්ම LTTE සංවිධානයට අදාලව.

ප්‍ර එවැනි තොරතුරක් මෙම රැස්වීමේදී ඉදිරිපත් කරාම ඒ සම්බන්ධව පියවර ගැනීම නැත්නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ මුලික වගකීම කවුරු විසින්ද බාරගෙන සිදු කලේ?

උ දැන් ඔය රැස්වීම ආරම්භ කලේ කපිල හෙන්දාවිතාරණ මහත්මයා ආරම්භ කරායින් පස්සේ අපි තොරතුරු හුවමාරු කරගත්තාම ඒ රැස්වීමේදී යම් ඉදිරි කටයුත්තක් කරන්න අවශ්‍යනම් එතුමා ඒක සිදු කරනවා එහෙම නැත්නම් වැඩිදුර විමර්ෂන තව කරන්න අවශ්‍ය නම් ඒ බුද්ධි විමර්ෂණ ඒ ඒ ආයතන ඒවා කරනවා. කරලා ඊලඟ රැස්වීමේදි ඒවා දැනුම් දෙනවා.

ප්‍ර දැන් සාක්ෂිකරු ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ 2015 වෙනකල් අවුරුදු 10 ක් පමණ සේවය කළා?

උ එහෙමයි.

ප්‍ර ඔබ සමග සම්බන්ද වූ මුලින්ම පොලිස් සේවයට සම්බන්ධ වූ සහකාර පොලිස් අධිකාරිවරයෙකු හෝ වරුන් මෙම කාලයේදි ඔබ සමඟ රාජ්‍ය බුද්ධි සේවයේ සිටියාද නැද්ද ?

උ මාත් සමග සම්බන්ධ වෙච්ච නැහැ.

ප්‍ර කව්රුවත් හිටියේනැහැ?

උ නැහැ.

ප්‍ර එසේම ඔබ කියා සිටියා එම සිද්ධිය සම්බන්ධයෙන් ජාතික තවිෂික් ජමාද් සංවිධානයට එරෙහිව ලිඛිතව පැමිනිල්ලක් ඔබලා වෙත ත්‍රස්ත විමර්ෂණ කොට්ඨාශයවෙත ලැබුනා කියලා?

උ ඔව් පොලිසපති වරයා වෙත ගියාම එතුමා එවලා තිබ්බා පැමිණිල්ලක්.

ප්‍ර ඔබ තවදුරටත් කියා සිටියා එම පැමිණිල්ලේ තිබ්බේ පෙර දිනයේදි මා ඔබට පෙන්වා සිටි X 93 දරණ ලේඛණයේ සඳහන් කරුණු වලට සමාන කරුණු කියලා ?

උ එහෙමයි.

ප්‍ර දැන් ඒ අනුව ඔබ ඒ කියන්නේ ත්‍රස්ත විමර්ෂන කොට්ඨාශය විසින් සහරාන් හාෂිම් කියන පුද්ගලයා සම්බන්ධව විමර්ෂණයක් සිදු කල බව ඔබ කියා සිටියා?

උ එහෙමයි.

Resident Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඔබ තවදුරටත් කියා සිටියා මෙම පුද්ගලයා සම්බන්ධයෙන් සහ NTJ කියන සංවිධානය සම්බන්ධව විමර්ෂණය කිරීම සඳහා කල්මුණේ ඒකකයේ නිළධාරියෙක් ඒ සම්බන්ධයෙන් යොමු කල බව?

උ එහෙමයි.

ප්‍ර එසේම එම නිළධාරිවරයා ඔබට වාර්තා කර සිටියාද ඒ ඔහු කරන්නට යෙදුණු රාජකාරි හෝ රාජකාරි සම්බන්ධයෙන්?

උ ඔව්. අයි. පි. පතිරණට තමයි එවන්න ඕනේ ඒකේ වාර්තාව.

ප්‍ර ඒක සතිපතාද කොයි ආකාරයටද ගෙන්නුවේ කියලා මතකද?

උ සෑම ඉරු දිනකම එවන්න ඕනේ. සතිපතා.

ප්‍ර දැන් මෙම නිළධාරිවරයාට ඒ කියන්නේ කල්මුණේ ඒකකයේ සිටි පොලිස් නිළධාරිවරයාට NTJ සහ සහරාන් සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලීමට නියෝග කරේ ලිඛිතවද නැද්ද?

උ ලිඛිතව.

ප්‍ර ඒ ලිඛිත නියෝගය අද ඔබට දුටුවොත් හඳුනාගන්න පුලුවන්ද?

උ පුලුවන්

ප්‍ර මේ අවස්ථාවේදි 2017/06/02 වෙනි දිනැති යතුරුලියනය කර ඇති මේ ඔබ විසින් ලබා දෙනලද ලිඛිත නියෝගයද?

උ එහෙමයි.

ප්‍ර මේ අවස්ථාවේදි යතුරුලියනය කර ඇති 2017/06/22 දිනැති සටහන X116 ලෙසලකුණු කර ඉදිරිපත් කර සිටිනවා . මෙම X 116 කියන ලේඛණය ඔබ විසින් පිළියෙල කරන්නට යෙදුණු ලේඛණයක්ද?

උ නැහැ මේක මම දුන්න නියෝග පරිදි ස්ථානාධිපති කල්මුණේ විසින් දාලා තියන ඕඩර් එකක්.

ප්‍ර දාලා තියෙන නියෝගයක් ?

උ ඔව්.

ප්‍ර මෙම X 116 කියන ලේඛණයේ ඔබ විසින් සඳහන් කරන්නට යෙදුණු නියෝගය අඩංගු වෙනවාද ?

උ එහෙමයි.

ප්‍ර මෙම X116 කුමන ඡේදයේද එම නියෝගය අඩංගු වෙන්නේ?

උ 2 වෙනිඡේදයේ.

ප්‍ර ඉලක්කමෙන් දාලා තියෙන ?

උ 1

ප්‍ර අංක 1 කරුණාකර මෙම ඡේදය කියවන්න .
නිළධාරිවරුන් ගේ නම් සඳහන් නොකර.

උ 1 තියෙන්නේ නිළධාරියාගේ නම ඊට පස්සේ තමයි අර ඡේදය තියෙන්නේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කාත්තන්කුඩි ප්‍රදේශය ක්‍රියාත්මක ඉස්ලාම් අන්තවාදී සංවිධාන දෙකක් වන ජාතික තව්හිද් ජමාද් සංවිධානය සහ ඉස්තිහාද් අයතුල්ලා සුන්නතුල් වල්ජමාත් සංවිධානයේ ක්‍රියාකාර්තිවය සහ ඉදිරි සැලසුම් සම්බන්ධව දෙනිකව සොයා බැලීමට කටයුතු කරන්න. ඒ අනුව දෙනිකව ලබා ගන්නා තොරතුරු ගොනුවකට සකස් කර ගැනීමෙන් පසු වාර්තාවක් සකස් කර සෑම ඉරු දිනකම පැය නවයට පෙර නි.පො.ප. තුමා වෙත හා ස්ථානාධිපති මූලධර්මවාදී හා අන්තවාදී විමර්ෂන අංශය වෙත ෆැක්ස් අංක යොමු කල යුතුයි. තවද ඔබ විසින් මේ සම්බන්ධයෙන් විෂය ගොනුවක් සකස් කරගෙන පවත්වාගෙන යා යුතු අතර ලබා ගන්නා ලද තොරතුරු තුල විශේෂ තොරතුරක් වේ නම් හැකි විගස නි.පො. ප. තුමාට හෝ ස්ථානාධිපති මූලධර්මවාදී හා අන්තවාදී විමර්ෂණ අංශය වෙත දුරකථන මගින් දැනුම් දීමට ක්‍රියා කල යුතුය. ඒකකයේ උපසේවා රාජකාරි හෝ රාත්‍රී ආරක්ෂක රාජකාරි සඳහා වාර්තා නොකලයුතු අතර නි.පො.ප. තුමා විසින් පවරා ඇති රාජකාරියට අමතරව වෙනයම් රාජකාරියක් සඳහා යොමු වන්නේනම් ඒ සම්බන්ධයෙන් නි.පො.ප තුමාගෙන් අවසර ලබාගත යුතුය.

ප්‍ර මෙය ඔබ විසින් ලබා ගන්නා ලද නියෝග අනුව අදාල නිළධාරියා වෙත එහි කල්මුණේ ඒකකයේ ස්ථානාධිපති විසින් ලබා දෙන ලද නියෝගයක්ද?

උ එහෙමයි.

ප්‍ර එය නිවැරදිද?

උ එහෙමයි.

ප්‍ර මෙසේ ගොනු ගත කරන ලද නිළධාරිවරයා ඒ ඔහු විසින් කරන්නට යෙදුණු ආවේක්ෂණ රාජකාරි සම්බන්ධව ඔබවෙත හෝ ස්ථානාධිපති මූලධර්මවාදී විමර්ෂණ ඒකකය වෙත හෝ වාර්තා කරන්නට යෙදුණාද නැද්ද?

උ එහෙමයි.

ප්‍ර වාර්තා කරාද?

උ ඕ. අයි. සි. ට වාර්තා කලා.

ප්‍ර දැන් ඔබ විසින් මෙසේ විමර්ෂනයට යොමු කරන ලද්දේ එක් නිළධාරියෙකු පමණද?

උ මුස්ලිම් නිළධාරියෙක් හින්දා ඒ මුස්ලිම් නිළධාරියා යොමු කරලා එයාට ප්‍රවාහන පහසුකම් සහ අනිකුත් දේවල් දෙන්න තව නිළධාරියෙක් පත් කරන්න කියලා OIC ට කිව්වා.

ප්‍ර නම් වශයෙන් ඔබ ලබා දුන්නේ එක් නිළධාරියෙකුගේ නම් පමණයිද?

උ ඔව් ඒ කියන්නේ ඒ රාජකාරියට ඒ මුස්ලිම් නිළධාරියා .

ප්‍ර මෙම නිළධාරිවරයා 2017 ඔබ විසින් මේ ආවේෂණ රාජකාරි සඳහා යොමු කලාට පසුව 2018 සැත්තැම්බර් 17 ඔබ TID එකෙන් ඉවත්ව යන

FAIR COMMENT BY JEZEEM

තෙක් එම රාජකාරියම සිදු කරාද නැද්ද යන්න පිළිබඳව ඔබට මතකයක් තියෙනවාද ?

උ ඒකම කලා කියලා කියන එක මතකයක් නැහැ නමුත් එයාට දුන්න රාජකාරිය එයා පතිරණත් එක්ක කතා කරලා කටයුතු කරන්න ඕනේ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

ප්‍ර සාක්ෂිකරු මේ කොමිෂන් සභාවට පැහැදිලි කෙරුවනේ එක් නිළධාරියෙක් ත්‍රස්ත විමර්ෂණ ඒකකයෙන් ඔබ පත් කෙරුවා කියලා මේ සහරාන් හෂිම් සහ ඔහුගේ කණ්ඩායෙම සම්බන්ධයෙන් ආවේෂණ රාජකාරි කරන්න ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර බුද්ධි අංශයකට සාමාන්‍යයෙන් සංවෘත සහ විවෘත මූලාශ්‍ර වලින් තොරතුරු ලැබෙනවා?

උ එහෙමයි.

ප්‍ර ඔබ විසින් මේ පත් කරන ලද නිළධාරියාගෙන් ඔබට සංවෘත තොරතුරු ඒ කියන්නේ ground information ලැබුනාද?

උ ඔව් ස්වාමීනි. මූලිකව ගත්තොත් අපි බුද්ධි අංශයක් නෙමේ විමර්ෂණ අංශයක් එයාගෙන් මම හුඟක්ම බලාපොරොත්තු වුනේ ඒ සංවිධාන දෙක පිළිබඳ ground information ගන්න සහරාන් ගැන ගන්න මොකද open එක අපිට කරන්න පුලුවන්නේ කොළඹ ඉඳන් .එතකොට ඒකේ ගැබ් වෙලා තිබ්බේ ස්වාමීනි අත් අඩංගුවට ගැනිමට. මොකද ඒ වෙනකොට අපි ගාව වොරන්ට් එකක් තිබුනේ නැතත් අර සිදුවීමෙන් පස්සේ කාත්තන්කුඩි පොලිසියේ වොරන්ට් එකක් තිබ්බා නේ. එතකොට ඒ පොලිසියට සහයෝගයක් දෙන්න පුලුවන් නේ අපිට.එතකොට ඒක තමයි මගේ රහසිගත ගැබ්විම ඒක මං කියන්න ගියේ නෑ කාටවත් නමුත් ground information ගන්න තමයි මූලිකව එයාව පත් කලේ. මොකක්ද වෙන්නේ කියන එක.

ප්‍ර එතකොට ඔබ 2017 සැප්තැම්බර් මාසේ ඉවත් කරන්නේ තනතුරෙන් කවද්ද ?

උ සැප්තැම්බර් 17.

ප්‍ර 2017 සැප්තැම්බර් 17? සැප්තැම්බර් 17 වෙනිදා අත්අඩංගුවට පත්වෙන තෙක් ඔය නිළධාරියාගේ සවෘත තොරතුරක් ලැබුනාද සහරාන් හෂිම් කොහේද ඉන්නේ කියලා ?

උ නැහැ ඒක ඉන්න තැන හම්බ වුනේ නැහැ නමුත් ඒ සංවිධානය සම්බන්ධයෙන් ඒවා ලැබුනා.

ප්‍ර සහරාන් හෂිම් කොයි කොයි ස්ථාන වල සැරසරිනවාද කියලත් ඔබට ලැබුනාද?

FAIR COMMENT BY JEZEEM

උ ඒ තොරතුරු ඔස්සේ තමයි අර කුරුණෑගල ප්‍රදේශයෙයි කුලියාපිටිය මට මතක හැටියට ස්වාමීනි ඒ ප්‍රදේශය අපි සොයා බැලීම් සිදු කරේ එයා දුන්න ඒවා මත තමයි.

ප ඔබ අත්අඩංගුවට ගන්නේ 2018 නේද ?

උ 2018 සැත්තැම්බර් 17 ට්‍රාන්සර් කරනවා ඔක්තෝබර් 25 තමයි අත්අඩංගුවට ගන්නේ .

ප එතකොට 2018 ඔක්තෝබර් 25 වෙනකල් ඔබට මේ නිළධාරියගෙන් ලැබෙනතොරතුරු අනුව සහරාන් හෂිම් ගැවසෙන ස්ථාන පිළිබඳ ඔබටතොරතුරු ලැබුනාද ?

උ ස්වාමීනි 9/17 වෙනකල් විතරයි මම TID හිටියේ. ඊට පස්සේ මන් compulsory leave ඇරියනේ .

ප 2018 සැප්තැම්බර් 17 වෙනකල් ඒ තොරතුරු ලැබුනාද?

උ අනිවාර්යයෙන්ම පතිරණට ලැබෙන්න ඇති

ප එතකොට ඒ තොරතුරු ඔබ බෙදා ගැනීමක් කෙරුවාද අනිත් අංශ සමඟ?

උ අනිත් අංශ කියන්නේ බුද්ධි අංශද?

ප ඔව්?

උ නැහැ.

ප ඇයි කෙරුවේ නැත්තේ?

උ අපි කරන්නේ විමර්ෂණයක්නේ ස්වාමීනි එතකොට මම ඒක බෙදා ගන්නේ පොලිස්පතිතුමා සමඟ. එතකොට පොලිස්පතිතුමාට වාර්තා කලාම පොලිස්පතිතුමා සමඟ කියනවානම් අපි අනිත් ඒවට කියන්න ඕනේ කියලා කියන්න පුළුවන්. අපි බුද්ධි අංශයක් ලෙස නෙවේ අපි විමර්ෂණයක් කරන්නේ පුද්ගලයෙක්ව අත්අඩංගුවට ගන්න.එතකොට ඒක ඒ කියන්නේ ඒක ෂෙයා කරන්න ඕනේ කියන පදනමේ ඉදන් නෙමේ අපි කරන්නේ. අපි කරන්නේ නීත්‍යානුකූලව නීතියට අනුව අවේක්ෂණය කරලා පුද්ගලයෙක් අත්අඩංගුවට ගන්න. නමුත් ඒකේ තියනවා නම් වැදගත්ම තොරතුරු වැදගත්ම තොරතුරු එනවානම් මට පුළුවන් පොලිස්පතිතුමාට කියලා අනිත් අංශවලට දැනුවත් කරන්න.

ප ඔබට පොඩ්ඩක් කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුලුවන්ද ඔබ දැන් මම අහපු ප්‍රශ්ණයට දෙන උත්තරයයි මීට කලින් FETO සංවිධානය සම්බන්ධයෙන් ප්‍රශ්ණයට දීපු උත්තයයි අතර පැහැදිලි ඝට්ටනයක් තියෙනවාද නැද්ද ? ඔබ ඉස්සෙල්ලා කිව්වා FETO සංවිධානය සම්බන්ධයෙන් එබට දෝෂාරෝපනය කරන කොට ඔබ කිව්වා තොරතුරු බෙදා ගැනිමක් තිබ්බේ නැහැ කියන එක එතකොට ඔබට ක්‍රියාත්මක වෙන්න අනිත් බුද්ධි අංශ වලින් ඔබට තොරතුරු ලබා දුන්නේ නැහැ කියන එක යි ඔබ කියන්නේ ?

උ එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් එතකොට මේ සහරාන් සම්බන්ධයෙන් ඔබ කියනවා ඔබට ලැබුනු අනිත් තොරතුරු බුද්ධි අංශවලට ලබා දුන්නේ නැහැ එතන ගට්ටනයක් නැද්ද ?

උ ස්වාමීනි බුද්ධි අංශයයි විමර්ෂණ අංශයයි කියන්නේ දෙකක්. බුද්ධි අංශයක් කියන එක බුද්ධි තොරතුරු ලබා ගත්තාම ඒක ෂෙයා කරන තත්වයට ආවාම ඒ අධ්‍යක්ෂ තීරණය කරලා ඒ අදාල ආයතනය සමඟ ෂෙයා කර ගන්නවා. විමර්ෂන අංශයක් කියන්නේ ඊට හාත්පසින්ම වෙනස් එතකොට විමර්ෂන අංශයක් කියන්නේ බුද්ධි තොරතුරු පාදක කරමින් යම් විමර්ෂණයක් කරන්න පුලුවන්. එතකොට ඒ බුද්ධි තොරතුර අපිට එන්න ඕනේ. පැමිණිල්ල එන්න ඕනේ. එතකොට මම ගිහිල්ලා කුඩා බුද්ධි අංශයක් ඇති කරගෙන එතනින් තොරතුරු ලබා ගත්ත පලියට මම බුද්ධි අංශයක් වෙන්නේ නැහැ. එතකොට මම යන්න ඕනේ ඒ ආයතනයට අදාලව තියන රාමුව ඇතුලත තමයි මම ක්‍රියාත්මක වෙන්න ඕනේ.එතකොට මම සහරාන් හෂිම් ගැන හෝ වෙනත් කෙනෙක් ගැන විමර්ෂනය කරනවා නම් පොලිස්පති වරයා ගේ නියෝග මත අපි විමර්ෂනය කරල ලබා ගන්න දේ පොලිස්පතිතුමාට ඇරියාම පොලිස්පතිතුමාට පුලුවන් මේක තීරණය කරන්න සි.අයි. ඩි. එකට හරි වෙන කෙනෙක්ට ලබා දෙනවාද කියලා එහෙම නැත්නම් එස්. අයි. එස්. ඩිරෙක්ටර්ට උදාහරණයක් ගත්තොත් මගෙන් අහන්න පුලුවන් අයි.ජී. හරහා හෝ ඩිරෙක්ට් ඔයා මේ සම්බන්ධයෙන් විමර්ෂනයක් කරනවාද අපිට ඒකට තොරතුරු ලබාදෙන්න පුලුවන්ද කියලා එතකොට අපි ලබාදෙනවා.

ප්‍ර ඔබ කියන හැටියට ඔබ ඔබගේ ආවේෂණ නිළධාරියා මගින් ලබා ගත්තු සවෘත තොරතුරු ඒ කියන්නේ සහරාන් හෂින් සම්බන්ධ තොරතුරු අර අගහරුවාදා දිනවල ලැබිච්ච බුද්ධි තොරතුරු සමාලෝචන රැස්වීමේදි පවා කිවවේ නැහැ ?

උ නැහැ ඒකේ මම අනිවාර්යයෙන් කියන්න ඇති අද දවස දක්වා මොකද සහරාන් ගැන සබ්ජෙක්ට් එක කථා කලාම මමත් මගේ ප්‍රසන්ටේෂන් එක කරන්න එපැයි.

ප්‍ර එතකොට ඔබ ඒ බුද්ධි සමාලෝචන රැස්වීමේදි සහරාන් හෂිම් ගේ ආගිය තැන් පිළිබඳ ඔබට ලැබුනු තොරතුරු ප්‍රකාශ කෙරුවාද ?

උ මිනිට්ස් බලමු ස්වාමීනි මොකද මට ස්ථිරවම කියන්න බැහැ මොකද දිවරුම් දීලා කථා කරන හින්දා මට ඒක මිනිට්ස් බලලා කිව්වොත් හොඳයි.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>**

ප්‍ර සාක්ෂිකරු සහරාන් සම්බන්ධයෙන් වරෙන්තු ලබා ගැනිමෙන් පසුව ඔබ ඔහු සොයාගෙන එම සිටින ස්ථානය පරීක්ෂා කලාද ?

FAIR COMMENT BY JEZEEM

උ ස්වාමීනි.

ප්‍ර සහරාන් හසීම්ගේ වරෙන්තු ලබා ගැනීමෙන් පසුව ඔහු සිටින ස්ථාන පරීක්ෂා කලාද ?

උ ඔව් ස්වාමීනි.

ප්‍ර ඔහු කිසියම් අවස්ථාවක විදේශගත වෙලාකියලා තමන්ට තොරතුරු ලැබුනාද ?

උ එහෙම තොරතුරක් මට මතකයි පතිරණ ඇවිල්ලා කියනවා නමුත් ඉතින් අපිට ඒවා අනුමානනනේ ඊට පස්සෙ තමයි අපි බැලුවේ එයාගේ පාස්පෝට් එක ප්‍රකාරව රට ගිහිල්ලාද කියලා නමුත් එහෙම පාස්පෝට් එක ප්‍රකාරව රට ගිහිල්ලා තිබුනේ නැහැ. ඒ අනුව තමයි මම රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂකට ලියුමක් ඇරියේ මෙයාගේ ගමන් තහනම් කරන්න ඒ කියන්නේ ස්ටොප් ලිස්ට් එකට දාන්න කියලා රට යන්න ආවොත් හෝ පැමිණෙනකොට අල්ලලා අපිට බාර දෙන්න කියලා .

ප්‍ර එතකොට තමන්ලා ඔහු විදේශගත වෙලා සිටි බවට තොරතුරු ලැබුනේ නැත්නම් ඇයි ඔබලා නිල් නෝටිස් එක ගන්න ක්‍රියා කරේ. නිල් නෝටිස් එක ගන්න ඕනේ යම් රටක ඉන්නවා නම් ඒ තොරතුර දීලා නේද ?

උ ඔව් ස්වාමිනි අපි දැන් පුද්ගලයෙක් නැතිවුනාම අපිට අනුමාන කිරීම් වෙනවානේ එක්කෝ මෙහේ ඉන්න පුලුවන් හැංගිලා නැත්නම් රට ගිහිල්ලා ඉන්න පුළුවන් ඊට අදාල හැම එකක්ම අපි ගන්න ඕනේ. එතකොට දැන් උදාහරණයක් ගත්තොත් මම stop list එකට යවන්නේ ඒකයි. stop list එකට යවන්නේ එයා වෙන නමකින් හෝ වෙන passport එකකින් ගිහිල්ලානම් ඉතින් අපිට ඒක අල්ලන්න අමාරුයි නමුත් අපි හිතමුකෝ එයාගේ passport එකෙන්ම රට ගිහිල්ලා කියන අනුමානයෙන් නම් ආයේ එයා එනකොට ඒ තියන ඩීටේල් එක්ක ගන්න පුලුවන් . යන්න ආවොත් අල්ලන්න පුලුවන්. ඒ තියන ඩීටේල් එක්ක අල්ලන්න පුලුවන්. යන්න ආවොත් අල්ලන්න පුලුවන්. අල්ලලා අපිට දැනුවත් කරන්න පුලුවන්.

දෙක අනුමාන කලොත් එයා රට ගිහිල්ලා කියලා බ්ලු නෝටිස් එක තමයි ඉස්සෙල්ලා ගන්න ඕනේ. ඒ රටවල් වලට අපි ඔය හොයන එක්කනා දැනුවත් කලාම ඒ රටේ ඉන්නවාද නැද්ද කියලා ඒ ගොල්ලන් ඉන්ටපෝල් එක හරහා අපිට කියනවා.

ප්‍ර ඒ රට නම් කරන්න ඕනෙනේ ඒ අවස්ථාවේදී?

උ නැහැ ඒක open එකක්නේ වෙන්න ඕනේ.

ප්‍ර බ්ලු නෝටිස් එක ?

උ open යවන්නේ. ඉන්ටපෝල් ඔක්කොටම ලෝකේ ඔක්කෝටම යවන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එම රට දැනුවත් කරන්න එම රට මොකක්ද කියලා දාන්න ඕනේ නැද්ද ?

උ. දාන්න ඕනේ නම් පුලුවන් අපි දන්නවා. අපි දන්නේ නැහැනේ ස්වාමීනි. ඒකෙන් තමයි නෝටිස් එක යවන්නේ. වටේටම. එතකොට එක රටකින් ආවොත් එහෙම මෙන්න මෙයා ඉන්නවා අපේ රටේ කියලා අපි ඊට ගරු අධිකරණය මාර්ගයෙන් රෙඩ් නෝටිස් එක ගන්න ක්‍රියාත්මක වෙන්නේ.

ප්‍ර බ්ලු නෝටිස් එක ඇරියාද ?

උ බ්ලු නෝටිස් එක ගන්න මං පතිරණට බාර දීලා තිබ්බේ මන් මගේ මතකයක් නැහැ ගත්තද නැද්ද කියලා.

උ මතකයක් නැහැ ස්වාමීනි.

ප්‍ර ගත්තාද නැද්ද කියලා මතකයක් නැහැ ?

උ මතකයක් නැහැ.

**********

<u>ගරු විනිසුරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර මිස්ට නාලක සිල්වා ඔබ ආරක්ෂක අමාත්‍යාංශයේ බුද්ධි සමාලෝචන රැස්වීමට සහභාගි වෙච්ච අවස්ථාවකදි 2017 වසරේ මාර්තු මාසේ 10 වෙනිදා කාත්තන්කුඩි යේ අලියාර් මංසන්ධියේ සහරාන් සහ අනිත් වෙනත් මුස්ලිම් සංවිධානයක් අතර ගැටුමෙන් පසුව සහරාන් මන්නාරම් සිලාවතුර ප්‍රදේශයෙන් රහසිගතව ධීවර යාත්‍රාවකින් ඉන්දියාවට ගියා කියන එක පිළිබඳ තොරතුරක් සාකච්ඡා වුනාද ?

උ මතකයක් නැහැ ස්වාමීනි.

ප්‍ර ඔබ 2017 වසරේ අවසානයටම කවදාද ගියේ ආරක්ෂක අමාත්‍යාංශයේ සම්බන්ධිකරණ රැස්වීමට.?

උ 2017/09/ 24 මගේ මතකයේ හැටියට.

ප්‍ර ඔය ගැන සාකච්ඡා වුනේම නැහැ ?

උ සාකච්ඡා වෙන්න මට අර මිනිට්ස් බැලුවානම් පුලුවන් මම කිව්වේ අර අවුරුද්දක්ම හිටියේ නැති හින්දයි මම මාස 07 ක් හිරේ හිටපු හින්දයි මට පොඩ්ඩක් සමාවෙන්න මට මෙච්චර මානසික පීඩනයත් එක්ක ටිකක් අමතක වෙලා තියෙන්නේ.

ප්‍ර නැහැ. ගරු කොමසාරිස්තුමත් ඇසුවනේ ඔබගෙන් ප්‍රශ්ණයක් ඇහුවානේ බ්ලු නෝටිස් එකක් ලබා ගන්න කොට රටක් ගැන සඳහන් කල යුතුයිද කියලා ?

උ එහෙමයි.

ප්‍ර මා ඔබට මෙම ප්‍රශ්ණය යොමු කරන්නේ ඔබට මතකයක් තියෙනවාද සහරාන් ඉන්දියාවේ සිටින බවට හෝ තොරතුරු ලැබූ නිසා ඔබ මෙම නිල් නිවේදනය ලබා ගැනීමේදී එවැනි කරුණු පාදක කරගත්ත බවට.

FAIR COMMENT BY JEZEEM

උ නැහැ අපිට රටක් මගේ මතකයට අනාවරණය වුනේ නැහැ ස්වාමීනි. නමුත් අර හොයා ගන්න බැරිකොට අපිට ගතයුතු පියවරවල් එක්ක තමයි ඔය රට ගියා කියන අනුමානය එන්නේ. එතකොට ඒ අනුමනයත් එක්ක තමයි අර පියවරවල් ගන්නේ .බිලු නෝටිස් එක ගන්නේ තියනවා stop list එකට දාන්න කියනවා ඒ පැත්ත. රට ඇතුලේ ඉන්නවා කියන එකට අනුමානයට තමයි ඒ ඉන්න තැන් wait කරන්න කණ්ඩායම් යොමු කරන්නේ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u>**

ප මිස්ට සිල්වා ඔබලා සහරාන් ගේ මුහුණු පොත ආවේශණය කෙරුවා නේද ?

උ එහෙමයි.

ප මුහුණුපොතෙන් හොයාගන්න පුළුවන් නේද ඒ පෝස්ටින් දාන්නේ කොයි රටෙන්ද කියලා ?

උ ටී. ආර්. සි. එකට කිව්වොත් පුලුවන්.

ප පුලුවන්නේද ? එවැනි ප්‍රයත්නයක් දැරුවේ නැද්ද ?

උ කරා ස්වාමීනි. ටී. ආර්. සී එක දැනුවත් කලා SL CERT එකට පතිරණ පර්සනලි ගියා ඔය තැන් දෙකටම.

ප එතකොට අනාවරණය වුනේ නැද්ද ඔය කොහෙන්ද මේ පෝස්ටින් එන්නේ කියලා?

උ කිව්වේ නැහැ.

ප කිව්වේ නැද්ද ඇහුවේ නැද්ද ?

උ මට කිව්වේ නැහැ. මං දන්නේ නැහැ පතිරණ දන්නවාද කියලා මට දැනුවත්වීමක් වුනේ නැහැ කොහේ ඉඳන්ද ඔපරේට් වෙන්නේ කියලා.

ප ඒ තොරතුරු ලබා ගන්න හැදුවද ටී. අයි. ඩි. එකෙන් ?

උ අනිවාර්යයෙන්ම. ඒ ලියුමුත් යැව්වා අපි.

**********

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>**

ප මෙම X 116 ඔබ කියා සිටියා ඔබගේ නියෝගයන් සඳහන් වෙනවා කියලා ?

උ එහෙමයි

ප නිවැරදියි නේද ?

උ එහෙමයි.

ප මේ අවස්ථාවේදි ගරු කොමිෂන් සභාවට ප්‍රකාශයක් ලබා දී තිබෙන එය වාර්තා කර තිබෙනවා 2020/07/11 වෙනි දින. එහි X 116 හි ආවේක්ෂණ රාජකාරි සිදුකල යුතු බවට දක්වන්නට යෙදුනු නිළධාරිවරයාගේ ප්‍රකාශය

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එම ප්‍රකාශනයේ තිබෙන ලේඛණ කිහිපයක් සාක්ෂිකරුට පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා. දිනයක් නොමැති ලේඛණයක් සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා.

ප්‍ර ඔබට මෙම ලේඛණය අත්සන් කර ඇති පුද්ගලයා හඳුනාගන්න පුලුවන්ද ?

උ නම සඳහන් නැහැ.

ප්‍ර පෙර සඳහන් කරපු නිළධාරිවරයාද ?

උ ඔව්.

ප්‍ර මෙම ලේඛණය ඔබ වෙත ලැබුනාද නැද්ද කියලා මතකයක් තියෙනවාද?

උ මතක නැහැ.

මින් පසු සටහන් ගැනීම ල/ලේ ඉන්ද්‍රාණි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : පෙ.ව. 11.55 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

**ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :**

ප්‍ර : මෙම ලේඛනය කියවලා බැලුවොත් ඔබට මතකයක් තියෙනවද මෙම ලේඛනය ඔබ වෙත ලැබුණු ලේඛනයක්ද නැද්ද කියලා?

පි : මේක මතකයක් නම් නැහැ. නමුත් අනිවාර්යයෙන්ම මගේ Office එකට එන්න ඇති මේක. Date එකක් නැහැ ඒකේ. මතක නැත්තේ ඒකයි.

ප්‍ර : ඔබ විසින් අර පෙර නම් කරන ලද බුද්ධි නිලධාරිවරයා සපයන ලද තොරතුරු මත කල්මුණේ ඒකකයේ ස්ථානාධිපති විසින් ඔබ වෙත එවූ වාර්තාවක්ද මෙම 2017.07.09 දිනය සහිතව තිබෙන්නේ?

පි : එහෙමයි. නියෝජ්‍ය පොලිස්පතතුමාට Address කරලා තියෙන්නේ.

ප්‍ර : ඔබට මෙම ලිපිය ලැබුණාද නැද්ද කියලා මතකයක් තියෙනවද?

පි : එහෙම මතකයක් නැහැ. අනිවාර්යයෙන් Office එකට එන්න ඇති. මේවා ලැබුණහම අනිවාර්යයෙන් අපි වාර්තාත් කරනවා.

පි : මේවා එව්වහම ස්වාමීනි මම අනිවාර්යයෙන්ම පතිරණට දානවා. පතිරණ තමයි එතනින් එහාට ඊට පස්සේ විමර්ශනය කරන්න ඕන. මට මතකයක් නැහැ. සමාවෙන්න ඒ සම්බන්ධයෙන්.

**********

**ගරු සභාපතිතුමා :**

ප්‍ර : පතිරණ නිලධාරියාගේ නම සඳහන් කරපු හින්දා ප්‍රශ්නයක් අහන්න අවශ්‍යයි. ඔබ කිව්වානේ සහරාන් හෂීම්ට විරුද්ධව වරෙන්තුවක් ලබා ගත්තා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : එවැනි වරෙන්තුවක් ලබා ගැනීමේ අරමුණ මොකක්ද?

පි : දැන් අපි Open Source වලින් දැක්කනේ ස්වාමීනි විශේෂයෙන්ම තෙල්දෙණියේ සිදුවීමක් වුණා. ඒ ....,

ප්‍ර : හරි. ඔබ ලබා ගත්තේ විවෘත වරෙන්තුවක්නේ?

පි : ඔව්. ICCPR Act එකෙන්.

ප්‍ර : විවෘත වරෙන්තුව ලබා ගැනීමෙන් තියෙන ප්‍රයෝජනය මොකක්ද?

පි : ඔහු අත් අඩංගුවට ගැනීමටනේ.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔව්. ඒ කියන්නේ විවෘත වරෙන්තුවක් කාටද ක්‍රියාත්මක කරන්න පුළුවන්?

පි : පොලිස් නිලධාරියෙකුට.

ප්‍ර : ඒ කියන්න් ඕනම පොලිස් නිලධාරියෙකුට ක්‍රියාත්මක කරන්න පුළුවන්?

පි : ඔව්.

ප්‍ර : මේ රට තුළ ඉන්න ඕනෑම පොලිස් නිලධාරියෙකුට ක්‍රියාත්මක කරන්න පුළුවන්.

පි : ඔව්. අපි දැනුවත් කළොත් පුළුවන්.

ප්‍ර : එතකොට ඒ විවෘත වරෙන්තුවක් ලබා ගැනීමේ ප්‍රධාන අරමුණක් නේද සියළුම පොලිස් ස්ථාන දැනුවත් කිරීම රටේ?

පි : ඔව්. පුළුවන්. එහෙම කරන්න අවශ්‍ය නම් පුළුවන්.

ප්‍ර : අවශ්‍ය නෙමෙයි. විවෘත වරෙන්තුවක්, දැන් සහරාන් හෂීම් දැන් හැංගිලා ඉන්නවා කියලා ඔබලා දන්නවනේ?

පි : ඔව්.

ප්‍ර : ඔබලා විවෘත වරන්තුවක් ලබා ගන්නවා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට විවාත වරෙන්තුවක් මගින් ඕනෑම පොලිස් නිලධාරියෙකුටත් සහරාන් හෂීම්ව අත් අඩංගුවට ගන්න පුළුවන්?

පි : එහෙමයි.

ප්‍ර : එවැනි විවෘත වරෙන්තුවක් යම් පුද්ගලයෙකුට විරුද්ධව තියෙනවා කියලා පොලිස් නිලධාරින් දැනුවත් කරන්නේ කොතනින්ද?

පි : අපේ ඒ ආයතනය ගත්තා නම් ඒ විවෘත වරෙන්තුව ක්‍රමවේදය නම් ස්වාමීනි, ඒ කියන්නේ අපිට පුළුවන් මම හිතන්නේ TM එකක් හරහා, ඒ කියන්නේ Telephone Message එකක් හරහා කියන්න. නැත්නම් පොලිස්පතිතුමා මගින් තමයි යවන්නේ මට මතක හැටියට.

ප්‍ර : ඔබ TM එකක් මගින් පොලිස් නිලධාරීන් දැනුවත් කෙරුවද?

පි : නැහැ නැහැ නැහැ.

ප්‍ර : ඇයි කෙරුවේ නැත්තේ?

පි : අපි ලංකාව පුරාම ක්‍රියාත්මක වීමේ ආයතනයක්. ඒ හින්දා අපේ ආයතනයට ඒක කරන්න පුළුවන් හින්දා තමයි අපේ ආයතනයේ කට්ටිය යොමු කරලා තියෙන්නේ.

ප්‍ර : නමුත් රටේ තිබ්බ සියළුම පොලිස් ස්ථාන දැනුවත් කෙරුවා නම් සහරාන් හෂීම් අත් අඩංගුවට ගැනීම වඩාත් පහසු වෙනවා නේද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : පහසු වෙන්න පුළුවන් ස්වාමීනි. එහෙම ඉතිං ඒ කට්ටිය ක්‍රියාත්මක වුණා නම්. නමුත් අපි...,

ප්‍ර : නැහැ. ක්‍රියාත්මක වෙන්න ඔවුන්ට දැනුම් දීමක් කරන්න ඕන නේද?

පි : අනිවාර්යයෙන්. අනිවාර්යයෙන්.

ප්‍ර : ඔබ පිළිගන්නවද ඔබගේ ත්‍රස්ත විමර්ශන ඒකකය මගින් පොලිස් ස්ථානවලට සහරාන් හෂීම් සම්බන්ධයෙන් තිබ්බ විවෘත වරෙන්තුව දැන්වුවේ නැහැ කියන එක?

පි : මම දැන්වුවේ නැහැ.

ප්‍ර : දැන්වුවේ නැහැ?

පි : ඔව්.

ප්‍ර : ඊට අමතරව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ දෙවන ක්‍රමවේදය තමයි එම විවෘත වරෙන්තුව CRD, Criminal Record Division එකට දැන්වීම?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔබ පොලිස් නිලධාරීයෙක් වශයෙන් හරි නේද මම කියනවා?

පි : ඔව්. එහෙමයි.

ප්‍ර : එතකෙට CRD එක මාර්ගයෙනුත්, CRD එකට විවෘත වරෙන්තුව දැන්වුවා නම් ඒක රටේ ඉන්න සියළුම පොලිස් නිලධාරීන් දැනුවත්වීමක් සිද්ධ වෙනවා?

පි : අනිවාර්යයෙන්.

ප්‍ර : සහරාන් හෂීම්ට විරුද්ධව ලබා ගත්තු විවෘත වරෙන්තුව CRD අංශයට දැනුවත් කෙරුවද?

පි : පතිරණගෙන් තමයි අහන්න ඕන ස්වාමීනි.

ප්‍ර : පතිරණ නිලධාරියා කොමිසම ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් කිව්වා දැනුම් දුන්නේ නැහැ කියලා?

පි : ආ එහෙනම් හරි.

ප්‍ර : එතකොට ඔබ මේ විවෘත වරෙන්තුවක් සහරාන් හෂීම්ට විරුද්ධව ලබා ගත්ත එකේ සම්පූර්ණ ප්‍රතිඵල ලබා ගැනීමක් සිදුවෙලා නැහැ නේද?

පි : ගරු ස්වාමීනි මම නියෝජ්‍ය පොලිස්පති හැටියට ආයතනයේ පරිපාලන කටයුතු සහ අවශ්‍ය කරන නියෝග ලබා දෙනවා. එතකොට විමර්ශනය කරන නිලධාරීන් තමයි ඒ විමර්ශනයට අදාළ ඉදිරි පියවරයන් සියල්ලක්ම ගන්න ඕන. ඒ සඳහා යම් අවසරයක් ගන්න ඕන නම් මගෙන් ගන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නෙමෙයි. නමුත් ඒගොල්ලන්ට පූර්ණ නිදහස මම දීලා තිබ්බේ ඒ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගන්න ඕන පියවරවල් සියල්ලක්ම ගන්න. එතකොට ඔබතුමා කියන විදියට CRD එක දැනුවත් කිරීම හෝ All Island Message ගහන එක හෝ ඒ විමර්ශන නිලධාරියා සතු මූලිකම වගකීමක්. එතකොට ඒ වගකීම එතුමා හිතනවා නම් මම කරන්න අවශ්‍ය නැහැ යම් හේතුවක් මත, මොකක් හරි හේතුවක් මත. ඒක ගැන මම අහන්න යන්නේ නැහැ. ඒක මම අහන්නේ නැහැ. මම විමර්ශන නිලධාරීන්ගේ රාජකාරියට බාධා කරන්නේ නැහැ. ඒගොල්ලන් හිතනවා නම් මේක රහසිගතවම ගිහිල්ලා මෙයාව ගන්න ඕන කියලා ඒක ඒ විදියට කරන්න ඕන. All Island Message ගහගෙන ඒක කරන්න බැහැයි කියලා එයා හිතනවා නම්, මේක රහසිගතවම ගිහිල්ලා ගන්න ඕන කියලා හිතනවා නම් ඒ ක්‍රමවේදය අපි අනුගමනය කරන්න ඕන. All Island Message ගහගෙන ඒක කරන්න එයා ඒක ගැහුවම ඒ විමර්ශනයට බාධා වෙනවා නම්, ඒ පුද්ගලයා හැංගෙනවා කියන සැකයක් එනවා නම් ඉතිං ඒ ඔක්කොම ඒ විමර්ශන නිලධාරියා සතු Discretion එකක්.

ප : නමුත් දැන් සහරාන් හෂීම්ගේ නම ආරක්ෂක අමාත්‍යාංශයේ තිබ්බ බුද්ධි සමාලෝචන රැස්වීම්වල මතු වෙනවා?

පි : එහෙමයි.

ප : ඔබත් එම රැස්වීම්වලට සහභාගී වෙනවා 2017 එක්තරා මාසයක් වෙනකම්?

පි : එහෙමයි.

ප : ඊට අමතරව ඔබට පොලිස්පතිවරයා විටින්විට දැනුවත් කරනවා සහරාන් හෂීම්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වැඩිදුර වාර්තා ලබා දෙන්න කියලා?

පි : එහෙමයි.

ප : ඔබ ඒ අනුව වැඩිදුර වාර්තා ලබා දුන්නා කියලා ඔබ කියනවා?

පි : එහෙමයි.

ප : එතකොට ඔය පසුබිම තුළ ඔබට වගකීමක් පැවරෙන්නේ නැද්ද මේ ගත්තු විවෘත වරෙන්තුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියළු ක්‍රම සහ ක්‍රමවේද සම්පූර්ණයෙන්ම පාවිච්චි කරන්න?

පි : ඒ ක්‍රමවේද අපි පාවිච්චි කරලා තියෙනවා ස්වාමීනි. දැන් කළේ නැහැ කියලා කියනවා නම් කියන්න පුළුවන් All Island Message එක ගැහුවේ නැති එක. All Island Message එක ගහපු නැති එකයි, CRD එකට කියපු නැති එකයි. නමුත් අනිකුත් ඒවා අපි කරලා තියෙනවනේ. රට යන එක වළක්වන්න, රට ගියා නම් ඒක සම්බන්ධයෙන් හොයන්න. එතකොට මේ ඔක්කෝම ඒ විමර්ශක

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

නිලධාරියයි, එයාගේ අධීක්ෂණ නිලධාරියාගේ වගකීමක් තමයි ඒවා කරන එක. එතකොට මට කරන්න තියෙන එක තමයි ඒ කරන දේවල් සම්බන්ධයෙන් පොලිස්පතිතුමා වාර්තා ඉල්ලනවා නම් ඒවා දෙන්න පුළුවන්. එතකොට විමර්ශන නිලධාරියාගේ අභිමතයක් තියෙනවා. එ අභිමතයට ගරු කරන්න ඕන, ඒකට යන්න දෙන්න ඕන. හැබැයි නීත්‍යානුකූලව. එතකොට ඒ අභිමතයට තමයි මම ඉඩ දීලා තියෙන්නේ. එතකොට එතුමා හිතනවා නම් නැහැ මම යන්න ඕන මගේ Team එකත් එක්ක ගිහිල්ලා මෙයාව අල්ල ගන්න ඕන කියන පදනමේ ඉන්නවා නම් ඒකට අපි ඉඩ දෙන්න ඕන ස්වාමීනි. ඒක නැහැ නැහැ නැහැ ඕක කරන්න බැහැ අපි All Island Message ගහලා, මේක ඔක්කොම පත්තරේ දාගෙන මේවා කරන්න ඕන කිව්වොත් එහෙම ඒක කරන්න පුළුවන් බැරිකමක් නැහැ Wanted කියන එක දාන්න පුළුවන්. නමුත් සහරාන් හෂීම් කියන පුද්ගලයා දැන් හැංගිලා ඉන්න මිනිහෙක්. එතකොට දැන් මේ හැංගිලා ඉන්න මිනිහව අපි Operation එකක් කරලා අල්ලන්න යන පරමාර්ථයෙන් තමයි අපි මේ යන්නේ. ඊට අමතර ලෙස කාත්තන්කුඩි පොලීසියෙනුත් යනවා එයාව අල්ලන්න. ඒගොල්ලොනුත් Warrant එකක් අරන් තියෙනවා.

ප්‍ර : දින වරෙන්තුවක්?

පි : දින වරෙන්තුවක් අරන් තියෙනවා. ඉතිං ඒගොල්ලොන්ටත් ඒක යන්න පුළුවන් ස්වාමීනි. නමුත් අපි යන්නේ ලංකාව පුරාම ක්‍රියාත්මක වන ආයතනයක් වගේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව. අපිට පුළුවන් ඒක කරන්න. මම ඒ නිලධාරීන්ට ඒ ශක්තිය දීලා තිබ්බේ.

ප්‍ර : පතිරණ නිලධාරියාගේ අධීක්ෂණ නිලධාරියා කවුද?

පි : සහකාර පොලිස් අධිකාරීවරයෙක් හිටියා.

ප්‍ර : කවුද නම?

පි : එක්කෝ ජගත් නිශාන්ත නැත්නම් සමන් පෙරේරා. ඒ දෙන්නගෙන් එක්කෙනෙක් ස්වාමීනි. නැහැ නැහැ 2017 හිටියේ ෆොන්සේකා හිටියේ.

ප්‍ර : ෆොන්සේකා නිලධාරියා?

පි : ෆොන්සේකා, ජගත් නිශාන්ත ඔය දෙන්නගෙන් එක්කෙනෙක්.

**********

President's Secretariat Copy
FAIR COMMENT
BY JEZEEM

**ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :**

ප්‍ර : ද සිල්වා මහත්මයා දැන් ඔබ සඳහන් කළ ආකාරයට මේ පිළිබඳව ඔබ විමර්ශනය කරලා ඔය සහරාන් සම්බන්ධයෙන් වරෙන්තුවක් ලබාගෙන ඔබ මේ පිළිබඳ නීති උපදෙස් ලබා ගැනීමට නීතිපතිවරයාටත් ඉල්ලීමක් ඉදිරිපත් කළාද?

පි : වරෙන්තුව ලබා ගැනීමට පෙර නේද සර්.

ප්‍ර : හොඳයි. වරෙන්තුව ලබා ගැනීමට පෙර හෝ ඔබ නීතිපතිවරයාගෙන් ඉල්ලීමක් කළාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒකට ලැබිච්ච ප්‍රතිඵලය මොකද්ද?

පි : මගේ මතකයේ හැටියට නම් මොකුත් ආවේ නැහැ.

ප්‍ර : එතකොට ඔබට වරෙන්තුව ක්‍රියාත්මක කර ගැනීම සම්බන්ධයෙන් නීතිපති උපදෙස් පැතීමේ අවශ්‍යතාවයක් නැහැ නේ?

පි : අපි 2018 දිනේ ඔය වරෙන්තුව ගත්තේ.

ප්‍ර : ඔව්?

පි : ඒ අනුව අපි මුලින්ම අධිකරණයට කරුණු වාර්තා කරලා දෙවෙනි අවස්ථාවේ තමයි ඕක ගත්තේ. එතකොට ඒක ගත්තම අපි සෑහීමකට පත් වුණා, අධිකරණයත් සෑහීමකට පත් වෙච්ච හින්දනේ ඒක නිකුත් කළේ. ඉතිං ඊට පස්සේ අපි අපේ ගමන ගියා. අපි බලාපොරොත්තුවෙන් හිටියා නීතිපති දෙපාර්තමේන්තුව කවදා හරි අපිව දැනුවත් කරයි කියලා, අපිට උපදෙස් දෙයි කියලා?

ප්‍ර : ලැබුණද?

පි : මම ඉන්නකොට නම් ලැබුණේ නැහැ මගේ මතකයේ හැටියට. ලැබුණා නම් අනිවාර්යයෙන් මටනේ එන්නේ ලියුම. නැත්නම් අධ්‍යක්ෂට යවන්නේ. නමුත් මේක නීතිපති එකට ලියුම් දෙකම ඇරියේ අධ්‍යක්ෂ හින්දා අධ්‍යකෂට තමයි එන්නේ පිළිතුරු. CID එකේ අධ්‍යක්ෂට තමයි වැඩි මේකක් තියෙන්නේ විමර්ශනවලට අදාළව. මට තියෙන්නේ නියෝජ්‍ය පොලිස්පති හැටියට පරිපාලනමය කටයුතු.

ප්‍ර : නමුත් අධ්‍යක්ෂවරයා කිසියම් ක්‍රියාමාර්ගයක් ගන්නේ නැත්නම් ඔබ එහි ප්‍රධානියා හැටියට ඔබට යුතුකමක් සහ වගකීමක් තියෙනවා නේද ඇයි මේක මෙහෙම වුණේ? ඇයි මෙහෙම වුණේ නැත්තේ ඒ පිළිබඳව සොයා බලා ඊළඟ පියවර ගන්න?

පි : අනිවාර්යයෙන්. ඒක පුළුවන්.

ප්‍ර : ඔබ ඒ සම්බන්ධයෙන් කටයුතු කළේ නැත්තේ ඇයි?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අපි එක File එකක් යවලා ඊට පස්සේ දෙවෙනි File එකත් ඇරියනේ ස්වාමීනි. ඊට පස්සේ මට මතකයක් නැහැ මම ඊට පස්සේ දුරකථනයෙන් හෝ ගිහිල්ලා හම්බ වෙලා හෝ මම හෝ මගේ නිලධාරීන් ගිහිල්ලා හම්බ වුණාද කියලා. ඉතිං ඒක ආවේ නැහැයි කියලා විශේෂත්වයක් මම සැළකුවේ නැහැ. නමුත් ඒක අධ්‍යක්ෂ දැන ගන්න ඕන ඒක ගිහිල්ලා කරන්න. එයාගේ Job එක ඒකනේ.

ප්‍ර : නමුත් ප්‍රතිඵලයක් තවම ලැබුණේ නැහැ කියලා ඒ සම්බන්ධයෙන් සිහි කැඳවීමක් හෝ නැවත මතක් කිරීමක් හෝ වෙනත් පියවරක් ගැනීමට ඔබ කටයුතු කළේ නැහැ?

පි : මම හිතන්නේ දෙවෙනි File එක ඇරියේ අපි එහෙම නේද ස්වාමීනි. මට මතක නැහැ දෙවෙනි File එක දැක්කොත් මට කියන්න පුළුවන් ඒක.

හොඳයි. බොහොම ස්තුතියි.

**********

**ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :**

ප්‍ර : සාක්ෂිකරු නීතිපතිවරයාට තමන් ඒ උපදෙස් ලබා ගැනීම සඳහා අවශ්‍ය සියළු කරුණු දන්වා යැව්වද?

පි : මම නෙමෙයි අධ්‍යක්ෂ තමයි යවලා තිබ්බේ ස්වාමීනි. එමනිසා ඒ ගොනුව දැක්කොත් මට කියන්න පුළුවන්.

ප්‍ර : තමන් දන්නේ නැහැ සියළු කරුණු උපදෙස් ලබා ගැනීමට, උපදෙස් දීමට අවශ්‍ය වන තීරණ ගැනීමට අවශ්‍ය වන සියළු කරුණු ඇරියද කියලා තමන්ට කියන්න බැහැ?

පි : නැහැ. ඒක මට මතකයක් නැහැ ස්වාමීනි. ඒක අධ්‍යක්ෂ තමයි ඒක ඒ File එක හදලා ඇරලා තිබ්බෙත්. ඉතිං ඒක අඩුවක් තියෙනවා නම් අනිවාර්යයෙන් කියයිනේ අපිට.

**********

**ගරු සභාපතිතුමා :**

ප්‍ර : තව අවසාන ප්‍රශ්නයක් තියෙනවා ඔබ කියපු හැටියට. දැන් ත්‍රස්ත විමර්ශන ඒකකය නීතිපති දෙපාර්තමේන්තුවත් එක්ක කාලයක් තිස්සේ රාජකාරී කටයුතු කරනවනේ?

පි : එහෙමයි.

ප්‍ර : ඔබට දැනුමක් තියෙනවනේ ඔය ත්‍රස්ත විමර්ශන ඒකකයේ කටයුතු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ වෙනම නිලධාරියෙකුත් පත් කරලා තියෙනවා කියලා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි.

ප්‍ර : දන්නවා නේද?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට ඔය ගොනුව යවනවිටත් ඒ නිලධාරියාගේ නම දන්නවනේ?

පි : එහෙමයි.

ප්‍ර : ගොනුව ඇරියම පස්සේ ඒ නිලධාරියාට කථා කෙරුවේ නැද්ද?

පි : හුඟාක් ඒවාට කථා කරනවා ස්වාමීනි. මම හිතන්නේ මේකටත් කථා කළා. නමුත් ඉතිං මේ ...,

ප්‍ර : මේකට කාටද කථා කෙරුවේ?

පි : අපි Deal කෙරුවේ නවාවි මහත්මයත් එක්කනේ.

ප්‍ර : එතකොට සහරාන් හෂීම්ගේ File එක ගැන කිව්වද?

පි : ඔව්. ඒ File එකට අමතරව තව Fileඋත් අපි කථා කරනවා. මම මේ File එක එවලා තියෙනවා. මේකට පොඩ්ඩක් පිළිතුරු එවන්න ඒ වගේ අපි කියනවා කථා කරලා. නමුත් දැන් මට මතක නැහැ මේකටම කථා කෙරුවද කියලා. නමුත් අනිවාර්යයෙන්ම නවාවි මහත්මයාට ඇවිල්ලා කථා කරන්න කියලා මගේ නිලධාරීන් කිව්වොත් මම එතුමාට කථා කරනවා.

ප්‍ර : සහරාන් හෂීම්ගේ File එක ගැන කථා කෙරුවද නැද්ද කියන එක ඔබට මතකයක් තියෙනවද?

පි : දැන් මතකයක් නැහැ ස්වාමීනි. නමුත් මගේ නිලධාරීන් ඇවිල්ලා කිව්වා නම් සර් මේ File එක ගැන පොඩ්ඩක් කථා කරන්න කිව්වා නම් මම කථා කරනවා. ඒ File එකට අමතරව ඕන File එකක් මම කථා කරනවා.

ප්‍ර : කථා කෙරුවේ නැත්නම් ඒකෙන් තේරෙන්නේ ඒකට වැඩි අවධානයක් යොමු වුණේ නැහැ කියන එකද?

පි : නැහැ. අවධානයක් යොමු වුණේ නැත්නම් මෙච්චර ක්‍රියාමාර්ග ගන්නේ නැහැනේ ස්වාමීනි. අවධානයක් යොමු කරලනේ තියෙන්නේ මම. එතකොට මට කොටින්ම කිව්වොත් බෝම්බ යනකම්ම සහරාන් හෂීම් ගැන දන්නේ නැති ලංකාව අපි කොහොම හරි ඊට ඉස්සරලා ඉඳන් අපි යමක් කළානේ. මේ TID එක යමක් කළානේ අපි. ඒක ගැන අපි සන්තෝෂ වෙනවා. මම නිහතමානීව සන්තෝෂ වෙනවා. ඇත්තම කියනවා නම් මම දැනුවත් වෙලා හිටියෙත් නැහැ මට මතකයක් තිබුණෙත් නැහැ ඔය පත්තරවල යනකම් මෙහෙම කරලා තියෙනවා කියලා. මොකද මම එතකොට සිර භාරයේ හිටියේ. ඉතිං මට එච්චර ඒක

FAIR COMMENT BY JEZEEM

ගැන මතකයක් තිබුණේ නැහැ. නමුත් මම බොහොම ආඩම්බර වෙනවා අපි යමක් කරලා තියෙනවා කියලා.

ප්‍ර : ඔය නීතිපති දෙපාර්තමේන්තුවට ඔය ගොනුව යොමු කළේ හේතුව ඔබ මීට කලින් දවසේ ඔබ කොමිසමට විස්තර කෙරුවා නේද?

පි : නැහැ.

ප්‍ර : මතක නැද්ද?

පි : නැහැ. හේතුව.

ප්‍ර : ඇයි මේ ගොනුව නීතිපති දෙපාර්තමේන්තුවට..,

පි : ආ ඔව්. නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළේ ස්වාමීනි දැන් අපි යමක් කරන්න ඉස්සරලා ඒ ආයතනයේ ක්‍රමවේදයනේ. ඒ ආයතනයේ ක්‍රමවේදයට අනුව නීතිමය උපදෙස් පැතීම හොඳයි කියන පදනමෙන් තමයි අධ්‍යක්ෂ යවලා තියෙන්නේ.

ප්‍ර : නමුත් ඔබට ඒ 2017 වෙනකොට දැනුමක් තිබ්බේ නැද්ද 2007 දී ලංකාවේ සම්මත කර ගත්තු ICCPR පනත ගැන?

පි : ස්වාමීනි මේ ගොනුව යැව්වේ අධ්‍යක්ෂ. එතකොට ICCPR එක ගැන මම හෝ එතුමා දැනන් හිටියද මම දන්නේ නැහැ. මමත් දැනන් හිටියා. නමුත් අපි ඒකට ගැණෙන වරදක් කරලාද කියන එකට නීති උපදෙස් ගන්න එකනේ කෙරෙන්න ඕන. එතකොට අපිට පුළුවන්නේ කියන්න නැහැ මේක PT එකෙන් යන්න පුළුවන්, ICCPR යන්න පුළුවන්, දණ්ඩ නීති සංග්‍රහයෙන් යන්න පුළුවන් කියලා අපිට අභිමතයක් අරගෙන කටයුතු කරන්න පුළුවන්. නමුත් ඊට පස්සේ මගේ නිලධාරීන්ට මුහුණ දෙන්න වෙනවනේ අපි කියමු වැරදි නීතිය භාවිතා කළොත් ඒ නිලධාරීන් අමාරුවේ වැටෙනවනේ මගේ නියෝගය ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා. එතකොට නිලධාරීනුත් ආරක්ෂා කරන් හරියාකාරව තමයි මේක කරන්න ඕන. මොකද තවම ඒ වෙනකොට සහරාන් හෂීම් ප්‍රචණ්ඩ අන්තවාදයට ආවා තමයි. ඒ ප්‍රචණ්ඩ අන්තවාදයට ආපු හින්දා තමයි කාත්තන්කුඩි පොලීසියෙන් ගන්නේ දින වරෙන්තුවක්.

ප්‍ර : හරි. නමුත් ඔබ මේ දැන් මීට ඉස්සරලා මම අහපු ප්‍රශ්නයට උත්තර දෙමින් ඔබ කිව්වා සහරාන් හෂීම්ට විරුද්ධව විවෘත වරෙන්තුව ගත්තේ ICCPR පනත යටතේ කියලා?

පි : ඔව්. ඒ 2018

ප්‍ර : එතකොට ඒ විවෘත වරෙන්තුව ගත්තේ ඔබ ICCPR පනත යටතේ නීතිපති උපදෙස් ලැබෙන්න පෙර?

පි : පෙර. ඒක ගැන පොඩ්ඩක් කිව්වට කමක් නැද්ද.

ප්‍ර : කියන්න?

FAIR COMMENT BY JEZEEM

පි : අර තෙල්දෙණියේ සිදුවීමක් වුණා මාර්තු මාසයේ මට මතක නැහැ මේ දෙපැත්තක් මුස්ලිම් සිංහල කෝලාහලයේදී. ඒකෙදී මම තමයි අර යම් කණ්ඩායමක් අත් අඩංගුවට අරගන්නේ. ඒ ක්‍රියාවලියෙන් තමයි ICCPR Act එක ගැන ලොකු දැනුමක් අපිට ආවේ. මොකද මම ඒ ක්‍රියාවලියේදී මම සම්බන්ධ වුණේ යසන්ත කෝදාගොඩ මහත්මයත් එක්ක. එතකොට එතුමා තමයි මට ICCPR Act එක ගැන ලොකු පැහැදිලි කිරීමක් කළේ. මෙන්න මේවා මේවා මේවා තමයි මේ ICCPR Act එකට වැටෙන්නේ කියලා. එතකොට ඒක තමයි මම මගේ නිලධාරීන්ට ඇවිල්ලා පැහැදිලි කළේ මෙන්න මේවා කරනවා නම්, මේවා වෙනවා නම් ICCPR Act කියන එකෙන් යන්න පුළුවන් කියලා. ඒ අනුව තමයි ඔය පතිරණලා ගිහිල්ලා ඒ ගණයට වැටෙන කියලා තීරණය මත තමයි ඒ ගියේ. මම ඒකට යසන්ත කෝදාගොඩ මහත්මයාට ස්තුතිවන්ත වෙනවා මට ලොකු දැනුමක් ලබා දුන්නාට ඒ සිදුවීමට අදාළ විමර්ශනයේදී.

ප්‍ර : එම පැහැදිලි කිරීම ඔබගේ මතකයේ හැටියට ඔබ ත්‍රස්ත විමර්ශන ඒකකය භාරව හිටපු නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු නිලධාරියාගෙන් ලැබුණේ නැද්ද?

පි : මට මතක නැහැ ස්වාමීනි. මොකද මේ සිදුවීමට අදාළව ඒ තෙල්දෙණියේ සිදුවීමට අදාළව අපට උපදෙස් දුන්නේ යසන්ත කෝදාගොඩ මහත්මයා. මොකද එතුමත් එක්ක තමයි ඒක කථා කළේ.

ප්‍ර : නැහැ. මම ඇහුවේ ඔබ දන්නවනේ නීතිපති දෙපාර්තමේන්තුවේ ත්‍රස්ත විමර්ශන ඒකකය භාරව නිලධාරියෙක් හිටියා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඔහුගෙන් ඔය ඔබ කෝදාගොඩ මහත්මයාගෙන් ලැබුණු පැහැදිලි කිරීම ලැබුණද නැද්ද කියන එකයි මම ඇහුවේ?

පි : නැහැ. එතකොට මට මතකයක් නැහැ ස්වාමීනි. අධ්‍යක්ෂට හම්බ වුණාද දන්නේ නැහැ. මම කෝදාගොඩ මහත්මයත් එක්ක තමයි ඔය සිදුවීම සම්බන්ධව ICCPR Act එක ගැන දැනුමක් ලැබුවේ.

**********

**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :**

ප්‍ර : නීතිපති දෙපාර්තමේන්තුවෙන් 2017 වර්ෂයේදී උපදෙස් ඉල්ලූ බව ඔබ කියා සිටියා?

පි : අධ්‍යක්ෂතුමා.

ප්‍ර : අධ්‍යක්ෂතුමා?

පි : අධ්‍යක්ෂ තමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට කුමන කරුණක් සම්බන්ධයෙන් එහෙම නැත්නම් කුමන කරුණු සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලුවාද කියලා ඔබට දැනීමක් තියෙනවද?

පි : මට දැන් මතකයක් නැහැ. ගොනුව දැක්කොත් මට කියන්න පුළුවන්.

ප්‍ර : ඒ කියන්නේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ ගොනුව දුටුවොත් ඔබට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න පුළුවන් කියලා තමයි ඔබ කියන්නේ.

පි : ඔව්. ඒ ලිපිය දැක්කොත් කියන්න පුළුවන්.

ප්‍ර : ඒ ඔබට මතකයක් තියෙනවද මා පෙර දිනයේ අසා සිටියා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ යම් ප්‍රතිපාදනයක් ගැන? නැහැ සමාවෙන්න. මා ඔබෙන් විමසා සිටියා සහකාර පොලිස් අධිකාරීවරයෙකු වශයෙන් ඔබ කටයුතු කිරීමේදී අධ්‍යක්ෂ, අපරාධ වෙත නඩු ගොනු යොමු කිරීමක් සම්බන්ධයෙන්?

පි : එහෙමයි.

ප්‍ර : එහිදී අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 393, 394, 395 යන වගන්තීන්, 393 වන වගන්තිය යටතේ තමයි පොලිසිය මගින් නීතිපතිවරයාගෙන් උපදෙස් ලබා ගන්නේ කියලා මම ඔබට යෝජනා කළොත් ඔබ පිළිගන්නවද?

පි : ඒක දැක්කොත් කියන්න පුළුවන්.

**********

**ගරු සභාපතිතුමා :**

මේ අවස්ථාවේදී උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥවරයා විසින් ත්‍රස්ත විමර්ශන ඒකකය සහ නීතිපති දෙපාර්තමේන්තුව අතර සිදු වූ රාජකාරිමය කටයුතු සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම තවදුරටත් නොකරන ලෙසට දන්වමි. මන්ද යත් අදාළ කරුණු සම්බන්ධයෙන් චෝදනාවට ලක් වී ඇත්තේ නීතිපති දෙපාර්තමේන්තුවේ යම් නිලධාරීන් වන හෙයිනුත්, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කොමිෂන් සභාව විසින් ප්‍රශ්න ඇසීමෙන් සිදු කරන බව දන්වන අතර, මතු දිනෙක එම නිලධාරීනුත් කොමිසම ඉදිරියට කැඳවන බව දන්වන අතර, අවශ්‍ය වුණොත් ඔවුන්ට නීතීඥ සහායක් ඒ අවස්ථාවේදී ලබාගත හැකි බව සඳහන් කර තබමි.

**********

**ගරු බන්දුල අතපත්තු මැතිතුමා :**

ප්‍ර : නාලක සිල්වා මහත්මයා ඔබ කියා සිටියා ඔබ අත් අඩංගුවට ගත්තේ කවදද?

පි : 2018 ඔක්තෝම්බර් 25 වෙනිදා.

FAIR COMMENT BY JEZEEM

**********

**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :**

ප්‍ර : දැන් ඔබ කියා සිටියා මේ 2017.03.10 වෙනිදා සහරාන් කාත්තන්කුඩියේ සිදු වූ සිදුවීම සම්බන්ධයෙන් වලිඋල්ලා පදනම මගින් එවන ලද පැමිණිල්ලට අනුව ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය විමර්ශනයක් සිදු කළ බව?

පි : පොලිස්පතිතුමාගේ නියෝග මත.

ප්‍ර : දැන් මෙම නියෝග මත ඔබ කටයුතු කිරීමේදී පොලිස්පතිවරයා වෙත එම විමර්ශනයේ ප්‍රගතිය ඔබ විසින් හෝ ඔබගේ කොට්ඨාශය විසින් වාර්තා කළාද?

පි : එහෙමයි.

ප්‍ර : ඔබට හැකියාවක් තියෙද මේ අවස්ථාවේදී කියන්න එම වාර්තා කිරීම් සතිපතාද, මාස්පතාද කොයි ආකාරයෙන්ද සිදු වුණේ කියලා?

පි : වාර්තා බැලුවොත් කියන්න පුළුවන්.

ප්‍ර : නැතුව ඔබට මතකයෙන් කියන්න බැහැ?

පි : මතක නැහැ.

ප්‍ර : දැන් ඔබට මතකයක් තියෙනවද මෙම 2017.03.10 වෙනි දින සිදු වූ සිදුවීමට අමතරව සහරාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් හෝ ISIS සංවිධානය සම්බන්ධයෙන් හෝ පොලිස්පතිවරයාව දැනුවත් කිරීමට ඔබ කටයුතු කළාද කියලා?

පි : එහෙමයි.

ප්‍ර : මොකද්ද කළේ?

පි : සති වාර්තාවල.

ප්‍ර : ඒ කියන්නේ ඔබ විසින් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද සති වාර්තාවල ඒ බව සඳහන් කළාද?

පි : එහෙමයි. අපි අර Open Sources Monitor කරනවනේ. ඒ අනුව ලබාගත් දේවල් අපි පොලිස්පතිතුමාගේ වාර්තාවට ඇතුළත් කරනවා.

ප්‍ර : පොලිස්පතිතුමා වෙත යොමු කරන වාර්තාවට ඇතුළත් කළා?

පි : එහෙමයි.

ප්‍ර : එම වාර්තාවට සහරාන් ගැන ඇතුළත් වුණාද නැද්ද කියන්න ඔබට මතකයක් තියෙනවද?

පි : සහරාන් ගැන මොනවා හරි ඇවිල්ලා තිබ්බා නම් තවුහික්ගෙන් හරි කාගෙන් හරි ඇවිල්ලා තිබ්බා නම් අපි දානවා. ඒ වාර්තාව හදන්නේ මූලිකවම පතිරණනේ. එයාගේ Subject එකට.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එතකොට ඒ වාර්තාව මා ගාවට ආවහම ඒක සමාලෝචනය කරලා අපි පොලිස්පතිතුමාට අවශ්‍ය කරන දැනුම ලබා දෙනවා ඒ වාර්තාවෙන්.

ප්‍ර : එතකොට මේ Lone Wolf Attacks ගැන ඔබ පොලිස්පතිවරයා දැනුවත් කළාද?

පි : ඔව් එහෙමයි.

ප්‍ර : එතකොට පොලිස්පතිවරයාට අමතරව ජනාධිපති හෝ අගමැති ආරක්ෂක කොට්ඨාශවලට මේ සම්බන්ධව දැනුම් දීමට ඔබ කටයුතු කළාද?

පි : අතිගරු ජනාධිපතිතුමා හෝ අගමැතිතුමා විදේශ සංචාරයන්වලට යනකොට සමහර අවස්ථාවලදී අපෙන් ආරක්ෂක තත්ත්ව වාර්තා ඉල්ලනවා. ඒ තත්ත්ව වාර්තාවලට ඒක ඇතුළත් කළා මට මතකයි. විශේෂයෙන්ම Lone Wolf Attacks ගැන අපි ඇතුළත් කළා. ඒ වෙනකොට ලෝක ප්‍රවණතාවයක් වෙලා තිබ්බ හින්දා.

ප්‍ර : කාට කාටද ඔබ ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළේ?

පි : අතිගරු ජනාධිපතිතුමා හෝ අගමැතිතුමා විදේශ සංචාරයන්ට යනවා නම් සමහර අවස්ථාවල අපෙන් ඉල්ලනවා ආරක්ෂක තත්ත්වය වාර්තා. Threat Assessment Report එකක්. ඒකට ඇතුළත් කරනවා එහෙම.

ප්‍ර : එසේම ඔබ ඒ සම්බන්ධයෙන් අර බුද්ධි සමාලෝචන රැස්වීමේදී කරුණු දක්වන්නට යෙදුණාද?

පි : අනිවාර්යයෙන් කරන්න ඇති. මට මතකයක් නැහැ. Minutes බැලුවොත් මට අනිවාර්යයෙන් මට කියන්න පුළුවන්. මොකද ඒ වෙනකොට ඒක ප්‍රවණතාවයක් වෙලානේ තිබ්බේ.

ප්‍ර : දැන් ඔබ කියා සිටියා 2018 වර්ෂයේදී මේ සහරාන් සම්බන්ධයෙන් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කළා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය මගින්?

පි : කොට්ඨාශය මගින්.

ප්‍ර : ඒ නඩු අංකය ඔබට මතකයක් තියෙනවද ඒ නඩු අංකය මොකද්ද කියලා?

පි : නැහැ. වාර්තාවල ඇති. මතක නැහැ.

ප්‍ර : එහි අංකය B/92358/08/18 කිව්වොත් ඔබ ඒක පිළිගන්නවද?

පි : වාර්තාව දැක්කොත්.

ප්‍ර : මා යෝජනා කරනවා ඔබට ඒක තමයි අංකය කියලා?

පි : මතකයක් නැහැ. වාර්තාව හරිනම් හරි.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

(C-292 සාක්ෂිකරුට පෙන්වා සිටිනවා මේ අවස්ථාවේදී)

ප්‍ර : (C-292 හඳුනා ගනියි) එසේම මෙම C-292 ට ඇතුළත් වෙනවා 2018.07.02 වෙනි දින ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් ගොනු කරන්නට යෙදුණු වැඩිදුර වාර්තාව?

පි : එහෙමයි.

ප්‍ර : මෙම වැඩිදුර වාර්තාව සමඟ විවෘත වරෙන්තුවක් ඉල්ලා සිටියා කියලා ඔබ කියා සිටියා ගරු අධිකරණයෙන් මේ සහරාන් කියන පුද්ගලයාට එරෙහිව?

පි : එහෙමයි.

ප්‍ර : ඔබට එම වරෙන්තුව දුටුවොත් අද හඳුනා ගන්න පුළුවන්කමක් තියෙනවද?

පි : එහෙමයි.

ප්‍ර : කෙසේ වෙතත් මෙම C-292 මගින් ඔබ ඉල්ලා සිටි වරෙන්තුව හෝ විවෘත වරෙන්තුව ත්‍රස්ත විමර්ශනයට කොට්ඨාශයට ලැබුණා කියලා ඔබ දන්නවා?

පි : එහෙමයි.

ප්‍ර : සාක්ෂිකරු ඊට අමතරව ඔබ කියා සිටියා මෙම සහරාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් විදේශ ගමන් තහනම් කරන නියෝගයක් ලබා ගත්තා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : එම නියෝගය ලබා ගත්තේ කොයි කාලයේද කියලා, කවද්ද කියලා ඔබට දැනීමක් තියෙනවද?

පි : නැහැ. මතක නැහැ. අර Open warrant එකට පස්සේ තමයි.

ප්‍ර : එම Travel ban එහෙම නැත්නම් විදේශ ගමන් තහනම් කිරීමේ නියෝගය ඔබලා විසින් ක්‍රියාත්මක වෙලාද ලබා ගත්තේ නැත්නම් වෙනත් විමර්ශන ආයතනයක් මාර්ගයෙන්ද ඒක ලබා ගන්නට යෙදුණේ?

පි : අපිට ඒක කරන්න බැහැ. ඉතිං අදාළ අංශයේ ඉල්ලීම් පරිදි මම රාජ්‍ය බුද්ධි සේවාව වෙත ලිපියක් යොමු කළා.

ප්‍ර : ඒ අනුව සහරාන් කියන පුද්ගලයා විදේශ ගතවීම වැළැක්වීමේ නියෝගයක් ඔබලාට ලබා ගන්න හැකියාව ලැබුණාද?

පි : අපි ලියුම ඇරියා. ඒක කළාද නැද්ද කියලා මට දැනුවත්වීමක් නැහැ.

ප්‍ර : ඔබ කියා සිටින්නේ ඉල්ලීම පමණයි ඔබ සිදු කළේ කියලා?

පි : ඉල්ලීම කළා. නමුත් ඒක වුණාද නැද්ද කියලා දන්නේ නැහැ.

ප්‍ර : ඒ ඉල්ලීම කරන්න යෙදුණේ ලිඛිතවද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ලිඛිතව.

ප්‍ර : ඔබ විසින්ද?

පි : ඔව්. මගේ අත්සනින්.

ප්‍ර : ඒ ලිඛිත ඉල්ලීම ඔබට අද දින දුටුවොත් හඳුනා ගන්න පුවවන්ද?

පි : පුළුවන්.

(2018.05.16 දිනැති රාජ්‍ය බුද්ධි සේවාව වෙත සහරාන් හෂීම් යන අය සම්බන්ධයෙන් විදේශ ගමන් තහනමක් ලබා ගැනීමට අදාළ ලිපිය සාක්ෂිකරුට පෙන්වා සිටිනවා)

**(හඳුනා ගනියි. එම ලේඛනය C-852 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා)**

ප්‍ර : මෙම ඉල්ලීමට අමතරව ඔබ විසින් කියා සිටියා සහරාන් කියන පුද්ගලයාට එරෙහිව විවෘත වරෙන්තුවක් ලබා ගන්නට යෙදුණු බව?

පි : ඔව්. පතිරණ විසින්.

ප්‍ර : B/92358/08/18 දරන නඩුවේ නීති කෘත්‍යයේ සහරාන් කියන පුද්ගලයාට එරෙහිව ලබාගත් විවෘත වරෙන්තුවද ඔබ ඉදිරියේ තිබෙන්නේ?

පි : එහි සඳහන් කර ඇති පරිදි නම් එහෙමයි.

ප්‍ර : එහි දිනය 2018.05.04 වෙනිදා කිව්වොත් නිවැරදිද?

පි : නැහැ 2018 ජූලි 09.

ප්‍ර : 2018.07.09?

පි : 07.09.

**(එම විවෘත වරෙන්තුව C-853 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා)**

ප්‍ර : සාක්ෂිකරු ඔබ කියා සිටියා මෙම විමර්ශනයන් සිදු කරන අවස්ථාවේදී ඔබ ඔත්තුකරුවන් යොදාගෙන සිටි බව?

පි : එහෙමයි.

ප්‍ර : දැන් මෙම ඔත්තුකරුවන්ට ඔබ ගෙවීමුත් සිදු කළාද නැද්ද කියලා මතකයක් තියෙනවද?

පි : ලේඛන දැක්කොත් කියන්න පුළුවන්.

ප්‍ර : ඔබට දැක්කොත් කියන්න පුළුවන්?

පි : ඔව්.

**********

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

**ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :**

ප්‍ර : සාක්ෂිකරු ත්‍රස්ත විමර්ශන අංශයට මුදල් ගෙවා ඔත්තුකරුවන් තබා ගැනීමට හැකියාවක් තියෙනවද?

පි : ඒක මම පැමිණීමෙන් පසු පොලිස්පති ඉලංගකෝන් මහත්මයාට ලිඛිතව දැනුම් දීමෙන් පසු එතුමා මම හිතන්නේ මට මතක හැටියට රුපියල් ලක්ෂයක මුදලක් නිදහස් කළා ඔත්තුකරුවන් නඩත්තු කරන්න.

ප්‍ර : ඒ කියන්නේ මාසයකටද? කොපමණ කාලයකටද?

පි : ඒක කාලසීමාවක් නැහැ. මාසයට හෝ අවුරුද්දට වුණත් පුළුවන්. ලක්ෂයක් නිකුත් කරනවා.

ප්‍ර : එච්චරයි. ඒ කියන්නේ එක්කෙනෙකුටද, ඔත්තුකරුවෙකුටද?

පි : නැහැ නැහැ ස්වාමීනි. මගේ නිලධාරීන් ඔත්තුකරුවන් පවත්වාගෙන යනවනේ. එතකොට ඒ කට්ටියට ගෙවන්න.

ප්‍ර : ඒක කලින් තිබ්බේ නැහැ. ඒ පහසුකම තිබ්බේ නැහැ කලින්?

පි : තිබිලා තියෙනවා යුධමය අවස්ථාවේ.

**********

**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :**

ප්‍ර : දැන් සාක්ෂිකරු ඔබගේ සේවා කාලය තුළ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ ඔබගේ සේවා කාලය තුළ ඔබට කීමට හැකියාවක් තියෙනවද රාජ්‍ය බුද්ධි සේවාව මෙම සභරාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය සමඟ බුද්ධි තොරතුරු හුවමාරුවක් සිදු වුණාද නැද්ද කියලා?

පි : ලේඛන තියෙනවා නම් ...,

ප්‍ර : නැහැ. ඔබගේ මතකයෙන් මම අහන්නේ?

පි : මට මතක නැහැ.

ප්‍ර : මෙම කාල වකවානුව තුළ ඔබ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂ සහ එහි නියෝජ්‍ය පොලිස්පති වශයෙන් සිටි කාලය තුළදී සභරාන් යන අය සම්බන්ධයෙන් වන බුද්ධි තොරතුරු රාජ්‍ය බුද්ධි සේවාව ඔබගේ කොට්ඨාශය සමඟ හුවමාරු කර ගත්තද නැද්ද කියලා මතකයක් තියෙනවද?

පි : මතකයක් නැහැ.

**********

**ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :**

ප්‍ර : සාක්ෂිකරු රාජ්‍ය බුද්ධි සේවයේ සහ තමන් ත්‍රස්ත විමර්ශන අංශය අතර හොඳ සම්බන්ධතාවයක් මෙම කාලසීමාවේ තිබුණද?

පි : නැහැ ස්වාමීනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ආ...?

පි : නැහැ.

ප්‍ර : එතකොට කියන්න තමන්ගේ පරීක්ෂණ කටයුතුවලට සම්බන්ධයෙන් යම් යම් නියෝග ලබා දීමේ කටයුතු රාජ්‍ය බුද්ධි සේවාව කළාද තමාගේ කාලය තුළදී?

පි : පොලිස්පතිතුමා හරහා.

ප්‍ර : හරහා කළා. ඒ සම්බන්ධතාවයක් නොතිබුණේ ඇයි?

පි : සම්බන්ධතාවයක් නොතිබුණේ යම් හේතු මත. පුද්ගලික හේතු මත වෙන්න ඇති අධ්‍යක්ෂවරයාගේ.

ප්‍ර : කවුද අධ්‍යක්ෂවරයාව හිටියේ?

පි : නිලන්ත ජයවර්ධන. ඒ වගේම මේක කොමිසමට විතරක් කියන්න තිබ්බොත් හොඳයි ස්වාමීනි.

ප්‍ර : ඇයි?

පි : ප්‍රසිද්ධ වෙනවට මම කැමති නැහැ. ඒවා එච්චර අදාළ නැහැ. ආන්දෝලනාත්මක වෙන්න ඕන නැහැ ස්වාමීනි.

ප්‍ර : එහෙනම් පසුව කියන්න. ඔබලා විමර්ශනය කරන්න ගිය අල්කයිඩා සාමාජිකයෙක් අවි පුහුණුව ලබලා ආපු අවස්ථාවකදී එම විමර්ශන කටයුතු නවත්වන්න කියලා නියෝග ලැබුණද?

පි : එහෙමයි. පොලිස්පතිතුමාගෙන්.

ප්‍ර : ඒ පොලිස්පතිතුමාට ලැබුණේ බුද්ධි සේවාවේ ඉල්ලීමක් අනුවද?

පි : එහෙමයි. බුද්ධි සේවාවේ උපදෙසක් මත තමයි ඒක වුණේ ස්වාමීනි.

ප්‍ර : ඇයි ඒ හේතුව මොකද්ද?

පි : ඒක ස්වාමීනි දැන් පුද්ගලයා ආවම අපි Airport එකේදී අපි ප්‍රශ්න කරලා එයාව මට මතක හැටියට එයාට කිව්වා අපි දැනුම් දෙන දවසට TID එකට එන්න කියලා වැඩිදුර ප්‍රශ්න කරලා ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. ඒක දැනුවත් කළහම මට මතක නැහැ ආවද නැද්ද කියලා. නමුත් ඒක දැනුවත් කළහම මට මතකයි රාජ්‍ය බුද්ධි සේවාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කෙනෙක් හිටියා සම්පත් කුමාර මහත්මයා. මට කථා කරලා කිව්වා ඒගොල්ලන් විමර්ශනයක් කරනවා. ඒක හින්දා මෙයාට Disturb කරන්න එපා කියලා. එතකොට මම එතුමාට කිව්වා ඒක එහෙම මමත් ඉතිං Subject එකේ හිටපු එක්කෙනානේ ස්වාමීනි, රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු එක්කෙනානේ. මම කිව්වා එහෙම කරන්න අමාරුයි. අපිට මෙයාගෙන් ප්‍රශ්න කරන්න අත්‍යවශ්‍යයි ඇයි ලංකාවට ආවේ කියලා. ලංකාවට ආවේ මොකද එතකොට ISIS එක පරාජය

FAIR COMMENT — BY JEZEEM

ලබමින් ඒ පරාජයත් එක්ක ඒ සාමාජිකයින් ඒ ඒ රටවල්වලට යොමු කරන කාලයේ. එතකොට මට දැන ගන්න ඕන වුණා ඇයි මෙයා ආවේ කියන එක. හානියක් කරන්න හෝ නැත හෝ දැන ගැනීමට අපට ඕන ප්‍රශ්න කරන්න.

ප්‍ර : ඒ කාලසීමාව කවදද? 2018?

පි : මට ලියුම දැක්කොත් මම හිතන්නේ 2018 මම හිතන්නේ මට මතක හැටියට.

ප්‍ර : හරි. ඊට පස්සේ?

පි : ඊට පස්සේ මම කිව්වා ඕගොල්ලන් විමර්ශනය කරන්න. නමුත් මට මෙයාව ගෙන්වන්න අවශ්‍යයි කියලා. ඔවුන් කිව්වා එපා Disturb කරන්න එපා එයාට. ඒගොල්ලන් විමර්ශනයක් කරනවා කියලා. මම කිව්වා එහෙනම් මට ලිඛිතව අවශ්‍යයි කියලා. ලිඛිතව මට අවශ්‍යයි පොලිස්පතිතුමාගෙන් කියලා.

ප්‍ර : ලිඛිතව දුන්නද?

පි : ඊට පස්සේ තමයි පොලිස්පතිතුමා එවලා තිබ්බේ.

ප්‍ර : ඒ පරීක්ෂණවලට මොනව වුණාද කියලා...?

පි : ආ සම්පත් කුමාරත් මට ලිඛිතව එවලා තිබ්බා. නමුත් මම ඒක එච්චර මේකක් කළේ නැහැ. මොකද එහෙම ක්‍රමවේදයෙන් පිට හින්දා. අපි ඒ ඒ ආයතනවලට උදව් කරන්න ඕන ස්වාමීනි. ඒ ඒ ආයතනවලට උදව් කරන්න ඕන, ඒගොල්ලන්ගේ විමර්ශනයට අපි උදව් කරන්න ඕන. ඒගොල්ලන් අපිට උදව් කරන්න ඕන. ඒක තමයි අන්‍යොන්‍ය සම්බන්ධතාවය. ඒක තමයි සම්බන්ධිකරණය. නමුත් ඉතිං මම කොහොමද විමර්ශනයක් නවත්වන්නේ. මම කොහොමද එයාට එන්න එපා කියන්නේ. එතකොට මගේ නිලධාරියා කියනවා නම් මට මෙයාව ඕනෙයි කියලා ප්‍රශ්න කරන්න, එතකොට මම ඒ නිලධාරියාට ඉඩ දෙන්න ඕන නේ. එතකොට තමයි මම කිව්වේ මට එහෙනම් පොලිස්පතිතුමාගෙන් නියෝගයක් දෙන්න කියලා.

ප්‍ර : ඇයි ඒ හේතුව මොකද මෙහෙන් නැවැත්වීමට හේතුව විමර්ශනය?

පි : ඒගොල්ලන් විමර්ශනයක් කරනවා කියලා

ප්‍ර : ඒ විමර්ශනයට කුමක් වූවාද කියලා දන්නේ නැද්ද?

පි : දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම නිලන්ත ජයවර්ධන දැන් අර ආරක්ෂක ලේකම් ඉදිරියේදී ඔබ දෝෂාරෝපනයට ලක් වුණා කිව්වා නේද?

පි : එහෙමයි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එම අවස්ථාවේදිත් නිලන්ත ජයවර්ධන අධ්‍යක්ෂවරයා ඒ Feto සංවිධානය ගැන විමර්ශනය කිරීම සම්බන්ධව විරුද්ධව කථා කළා නේද?

පි : ඒ කියන්නේ අපිද.

ප්‍ර : නැහැ නැහැ. නිලන්ත ජයවර්ධන, බුද්ධි සේවා අධ්‍යක්ෂ එය හොඳ නැහැයි කියලා කරන්න එපා කියලා ...?

පි : නැහැ. එතුමා එවෙලේ සාකච්ඡා කරලා කිව්වේ එතුමා මේක කිව්වට පස්සේ මම එවෙලේ කිව්වනේ මට තොරතුරු දෙන්න කියලා විමර්ශනය කරන්න. එතකොට කිව්ව එකක් තමයි දැන් අපි විමර්ශනය කරන්න ගත්තහම TID එක ඒක Open Inquiryයක් වෙනවා. එතකොට ඒක ප්‍රසිද්ධ වෙලා ඒක මුස්ලිම් ප්‍රජාවට ඇතුළු ඒ රාජ්‍ය තාන්ත්‍රිකයට ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන් කියලා. ඉතිං ඒක හින්දා ඒගොල්ලන් විමර්ශනය කරනවා. අපිට කරන්න කරලා අවශ්‍ය නම් අපිට කියන්නම් කියලා. Open Inquiry කරන්න ඕන නම්.

ප්‍ර : දැන් ඔබ කියන විදියට ඔබයි, යම්කිසි බුද්ධි සේවා අධ්‍යක්ෂ හා ඔබලා අතර යම්කිසි පෞද්ගලික ආරවුලක් තිබ්බා කිව්වා. ඒ සම්බන්ධව පසුව ප්‍රකාශයක් කරන්න?

පි : පුද්ගලික කියන වචනය මම භාවිතා කරන්නේ නැහැ. නමුත් මත ගැටුම් තිබ්බා ස්වාමීනි. ඉතිං ඒ මත ගැටුම් මත තමයි ඒක මම වෙනම කොමිසමට කියන්නම් ලිඛිතවත් තියෙනවා මා ගාව.

**********

**ගරු බන්දුල අතපත්තු මැතිතුමා :**

ප්‍ර : නාලක සිල්වා මහත්මයා ඔය හා සමානව ප්‍රශ්නයක් මට ඔබගෙන් අහන්න තියෙනවා. දැන් මේ ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම්වලදී ඔබ තුර්කි තානාපතිවරයා විසින් මෙරටට දන්වා සිටිය 30 දෙනෙකුගෙන් යුක්ත කණ්ඩායමක්, ත්‍රස්තවාදී කණ්ඩායමක් මේ රටට ආවා කියලා හිටන් කිව්වහම ඒ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන්න ඔබ අවසර ඉල්ලුවද?

පි : ඔව්. එවෙලේ ඒ බුද්ධි තොරතුරු දැනුවත් කරනකොට තමයි මම කිව්වේ විස්තර මට දෙන්න, මම විමර්ශනය කරන්නම් කියලා.

ප්‍ර : ඉතිං ඒකට අවසරයක් ලැබුණේ නැහැ නේද?

පි : නැහැ නැහැ.

ප්‍ර : ඒ මොකද්ද ඒකට හේතුව?

පි : දන්නේ නැහැ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ IGP ලව්වාවත් බැලුවේ නැද්ද ඒ සම්බන්ධයෙන් කටයුතු සළසා බලන්න මේ ...?

පි : නැහැ. ඒ කියන්නේ පොලිස්පතිතුමා එවෙලේ හිටියද නැද්ද කියලා මට මතක නැහැ. නමුත් විමර්ශනයක් කරන්න අවශ්‍ය නම් පොලිස්පතිතුමාට එවනවනේ ස්වාමීනි. ඉතිං ඒක හින්දා මම ඒක මගේ නිලධාරීන්ට දැනුවත් කළා. නමුත් විමර්ශනය කරන්න පොලිස්පතිතුමා එවන්නේ නැතුව මට කරන්න බැහැනේ. ඉතිං ඒක හින්දා මම බලාපොරොත්තුවෙන් හිටියා ඒ තොරතුරු ලබා දෙයි කියලා.

ප්‍ර : ඒ පරීක්ෂණය පැවැත්වීම නැවැත්තුවේ කවුද? ඒකට මැදිහත් වුණේ?

පි : නැවැත්වීමක් නෙමෙයි ස්වාමීනි. දැන් එවෙලේ 09.24 සාකච්ඡාව යන වෙලේ ඒක කිව්වහම මම ඉල්ලුවා ඒ තොරතුරු මට දෙන්න පොලිස්පතිතුමා මගින්. අපට Open Inquiryයක් කරන්න කියලා. මොකද අපි කියමුකෝ ස්වාමීනි දැන් Feto කියන ත්‍රස්තවාදී සංවිධානයක සාමාජිකයෝ ලංකාවට ඇවිල්ලා ඉන්නවා නම් අපි අනිවාර්යයෙන් විභාගයක් කරන්න එපැයි ඒ කට්ටිය ගැන. මොනවද කරන්නේ, කොහේද ඉන්නේ, මොකද්ද කරන්නේ කියලා අපි දැන ගන්න එපැයි. ඊට පස්සේ ත්‍රස්තවාදී ප්‍රහාරයක් ඒගොල්ලන් එල්ල කළොත් එහෙම ඉතිං අපේ Job එක අපි කරලා නැහැනේ.

ප්‍ර : දැන් නිලධාරියෙක් කියා සිටියද ඒක තුර්කියට අයිති වැඩක් අපිට අවශ්‍ය නැහැ කියලා හිටන් එහෙම කිව්වාද?

පි : නැහැ නැහැ. ඒ නිලධාරියා කිව්වා එයා තවදුරටත් ඒ තුර්කි තානාපතිත් එක්ක කථා කරලා අවශ්‍ය ඒගොල්ලන් ක්‍රියාමාර්ග SIS එක ගන්නවා කියලා. SIS එක Inquiry කරනවා. SIS එක කරනවා කියලා.

ප්‍ර : නමුත් ඔබතුමාට දැන ගන්න ලැබුණද SIS එක එහෙම දෙයක් කළා කියලා?

පි : නැහැ. අපිට දැනුවත් කළේ නම් නැහැ.

හොඳයි බොහොම ස්තුතියි.

**********

FAIR COMMENT BY JEZEEM

**ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :**

ප : ඔබ කියා සිටියා දැන් ලිපියක් ලැබුණු බව සම්පත් කුමාර කියන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගෙන් ඔබ වෙත මෙම නිලාබ්දීන් මොහොමඩ් රිම්සාන් සම්බන්ධයෙන් විමර්ශනය නතර කරන්න කියලා ඉල්ලා සිටි බව?

පි : එහෙමයි.

ප : එම ලිපිය දුටුවොත් ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි : එහෙමයි.

(2018.04.06 දිනැති රාජ්‍ය බුද්ධි සේවාවේ ලිපි ශීර්ෂයක් යටතේ සම්පත් කුමාර කියන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා මෙම සාක්ෂිකරු ආමන්ත්‍රණය කරන ලද ලිපිය පෙන්වා සිටියි. පරීක්ෂා කර බලයි)

ප : හඳුනා ගන්න පුළුවන්ද?

පි : එහෙමයි.

ප : හඳුනා ගනියි.

**(එකී ලිපිය X-117 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා)**

ප : ඔබ කියා සිටියා පොලිස්පතිවරයා වෙත යම් යම් වාර්තා ඉදිරිපත් කරන්නට යෙදුණු බව?

පි : එහෙමයි.

ප : එම වාර්තා ඔබ විසින් ඉදිරිපත් කරන ලද වාර්තා ඔබට අද දින දුටුවොත් හඳුනා ගන්න පුළුවන්ද?

පි : පුළුවන්.

(මේ අවස්ථාවේදී X-24 සාක්ෂිකරුට පෙන්වා සිටිනවා)

ප : හඳුනා ගන්න පුළුවන්ද?

පි : එහෙමයි.

ප : කුමක්ද මේ X-24 කියන්නේ?

පි : අර වලිඋල්ලා Trust එකෙන් එවපු අර ලබා දුන්න පැමිණිල්ලට අදාළව විමර්ශනය කරන්න අනුමැතිය ඉල්ලනවා.

ප : ඒ කියන්නේ පොලිස්පතිතුමාගෙන් අර වලිඋල්ලා පදනම විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට අවසර ඉල්ලනවා මෙම 2017.03.30 කියන X-24 දරන ලිපියෙන්?

පි : එහෙමයි.

ප : එය ඔබගේ අත්සනින් යොමු කරන ලද ලිපියක්ද?

පි : එහෙමයි.

ප : ඒ සඳහා පොලිස්පතිවරයා අනුමත කර තිබේද?

පි : එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔහුගේ අත්සන ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි : එහෙමයි.

ප්‍ර : පොලිස්පති කවුද එවකට හිටපු?

පි : පූජිත ජයසුන්දර මහතා.

ප්‍ර : එතුමාගේ අත්සන ඔබ මට පෙර දැකලා තිබෙනවාද?

පි : එහෙමයි.

ප්‍ර : කොයි ආකාරයටද?

පි : මට එවන ලිපිවල.

ප්‍ර : ඔබ වෙත රාජකාරී වශයෙන් ඉදිරිපත් කරන ලිපිවල?

පි : ඔව්.

(X-25 සාක්ෂිකරු වෙත පෙන්වා සිටියි)

ප්‍ර : හඳුනා ගන්න පුළුවන්ද?

පි : එහෙමයි.

ප්‍ර : මෙම X-25 ඔබ විසින් පොලිස්පතිවරයා වෙත 2017.04.27 වෙනි දිනැතිව ඉදිරිපත් කරන ලද වැඩිදුර වාර්තාවක්ද?

පි : එහෙමයි.

ප්‍ර : එහි ඔබ කුමක්ද සඳහන් කර තිබෙන්නේ?

පි : ඔක්කොම කියන්න ඕනද.

ප්‍ර : ඔව්. අවශ්‍යම දේ?

පි : අපි ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ මුහුණු පොත ආවරණය කරපු එක සඳහන් කරලා තියෙනවා. ඒකේ ගිණුම් හිමියන් කොච්චර ඉන්නවද, Share කරලා තියෙන ගාණ ඒවා සඳහන් කරලා තියෙනවා. නීතිමය වගන්ති කිහිපයක් සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : මොනවද ඒ නීතිමය වගන්ති?

පි : ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 15 වන පරිච්ඡේදයේ 291 (අ) වගන්තිය.

ප්‍ර : මෙහි පුද්ගලයෙක් සම්බන්ධයෙන් ඔබ සඳහන් කරලා තියෙද X-25?

පි : නැහැ. NTJ සංවිධානය නේ.

ප්‍ර : ජාතික තවුහිද් ජමාත් සංවිධානය හෝ සහරාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් සඳහන් කරලා තියෙනවද?

පි : ජාතික තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධයෙන් සඳහන් කරලා තියෙනවා. සහරාන්ගේ නම භාවිතා කරලා නැහැ. නමුත් NTJ සංවිධානය ගැන තමයි තියෙන්නේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මෙය ඔබ විසින් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද කුමන කරුණට අදාළ වාර්තාවක්ද?

පි : අර වයතුල්ලා සංවිධානය කරපු පැමිණිල්ලේ ප්‍රගති වාර්තාව. වැඩිදුර වාර්තාව.

දැන් වේලාව : ප.ව. 12.55 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රානි මිය විසින්ය.
වේලාව ප.ව.12.55 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

**<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>**

(X13 ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටී)

ප්‍ර : 2018.01.07 දිනැති මෙම වාර්තාව ඔබ විසින් පොලිස්පතිවරයා වෙත යවන ලද වාර්තාවක්ද?

පි : 2018.01.07.

ප්‍ර : ඔව්. ඔබගේ අත්සන තිබේද?

පි : එහෙමයි.

ප්‍ර : මෙම වාර්තාව කුමන කරුණක් අරඹයාද යවලා තිබෙන්නේ?

පි : මේක අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යන අය සම්බන්ධවනේ.

ප්‍ර : අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ්?

පි : ඔව්.

ප්‍ර : මා ඔබට කියා සිටියොත් 2019.04.21 ඒ සිදු වූ බෝම්බ ප්‍රහාර මාලාවේ දෙහිවල ට්‍රොපිකල් ඉන් ලැඟුම් හලේ දී මරාගෙන මැරෙන ප්‍රහාරය දියත් කළ බෝම්බකරුගේ තමයි මේ කියලා ඔබ ඒක පිළිගන්නවද?

පි : මාධ්‍ය මගින් මේ නම දැක්කා මම.

ප්‍ර : නැහැ මම ඔබට කියා සිටිනවා මේ ගරු කොමිෂන් සභාවට සාක්ෂි වශයෙන් ඉදිරිපත් වෙලා තිබෙනවා ඒක ඔබ පිළිගන්නවද කියලා මම අහන්නේ?

පි : මේ පුද්ගලයා කියලා

ප්‍ර : ඔව්?

පි : වෙන්න පුළුවන්.

ප්‍ර : නමුත් මේ ඔබගේ අත්සනින් ගිය ලේඛනයක් කියලා ඔබ පිළිගන්නවද?

පි : එහෙමයි.

(X 14 ලේඛනය සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)

ප්‍ර : මෙයත් ඔබගේ අත්සනින් පොලිස්පතිවරයා වෙත යවන ලද වාර්තාවක්ද?

පි : එහෙමයි.

ප්‍ර : කුමන කරුණක් අරඹයාද මෙම 2018.03.05 දිනැති වාර්තාව ඔබ ඉදිරිපත් කර තිබෙන්නේ?

පි : අර අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ්

ප්‍ර : සම්බන්ධයෙන්?

පි : එහෙමයි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඒ කියන්නේ අබ්දුල් ලතීෆ් මොහොමඩ් සහ ඔහුගේ අන්තවාදී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කිව්වොත් හරිද?

පි : එහෙමයි.

**********

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>:

ප : සාක්ෂිකරු අබ්දුල් ලතීෆ් ගෙන්නලා ප්‍රශ්න කළාද ත්‍රස්ත විමර්ශන අංශයට?

පි : මතකයක් නැහැ ස්වාමිණි.

ප : කුමන අවස්ථාවකවත්?

පි : මගේ මතකයක් නැහැ.

**********

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>

(X16B සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)

ප : ඔබට මා කියා සිටින්නේ මෙම X16B යනු ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය විසින් අබ්දුල් ලතීෆ් ජමීල් කියන තැනැත්තාගෙන් වාර්තා කරන ලද ප්‍රකාශයේ පිටපතක් කියලා ඔබ ඒක පිළිගන්නවද?

පි : මම දන්නේ නැහැ මොකද ඒක දෙමලෙන් තියෙන්නේ.

**(X16B (1) සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)**

ප : X16B(1) යනු මෙම ඔබ පෙර පෙන්වා සිටි X16B හි සිංහල පරිවර්ථනය බව පොලිස් පරීක්ෂක පතිරණ මෙම ලේඛනය ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියා. මම ඔබට කියන්නේ මෙම X16B යන්න මේ අබ්දුල් ලතීෆ් මොහොමඩ් ජමීල් යන අයගේ ප්‍රකාශය කියලා කිව්වොත් ඔබ පිළිගන්නවද?

පි : ඔව් ඒක සඳහන් වෙලා තියෙන විදියට නම් එහෙමයි.

(<u>**සාක්ෂිකරු වෙත මේ අවස්ථාවේදී X34B පෙන්වා සිටිනවා. 2018.03.16 දිනැති වැඩිදුර වාර්තාව**</u>.)

ප : මෙම වැඩිදුර වාර්තාව අත්සන් කර තියෙන්නේ ඔබද?

පි : එහෙමයි.

ප : කුමන පුද්ගලයා සම්බන්ධයෙන්ද?

පි : නැෂනල් තවුහිද් ජමාත් නායකයා වන මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන්.

ප : සහරාන් සම්බන්ධයෙන්?

පි : ඔව්.

ප : කුමක්ද ඔහු එහිදි පවසන්නේ?

Project Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : මැතිවරණයේදී ජන්දය ප්‍රකාශ කිරීම නොකලයුතු බවට පවසන්නේ ඇයි යන්නට 2018.01.28 වන දින වීඩියෝ...

ප්‍ර : සහරාන් විසින් මැතිවරණයකදී ජන්දය පාවිච්චි නොකල යුත්තේ ඇයි කියන කාරණය සම්බන්ධයෙන් වන වාර්තාව?

පි : නොකලයුත්තේ ඇයි කියන එක Video වීඩියෝ එකක් ගිහිල්ලා තියෙනවා එයාගේ website එකේ. ඒක සම්බන්ධව.

ප්‍ර : ඒ සම්බන්ධයෙන්?

පි : ඔව්.

ප්‍ර : ඒ වගේම එම X34B සමඟ එම දේශනයෙන් ලබා ගන්නා ලද පරිවර්ථනයක් යොමු කර තියෙනවද? ඒ කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදීව පවත්වන මැතිවරණයකදී මුස්ලිම් ජාතිකයන් ජන්දය නොදිය යුත්තේ මන්ද කියන එක තමා මෙහිදී ප්‍රකාශ කර තියෙන්නේ නේද?

පි : දන්නේ නැහැ ඒක කියවන්න ඕන.
(සාක්ෂිකරු ලේඛනයට අවධානය යොමු කරයි)

පි : ඔව් ඒ වාර්තාවේ තියෙනවා සඳහන් කරලා. මැතිවරණයේදී ජන්දය ප්‍රකාශ කිරීම නොකලයුතු බව පවසන්නේ ඇයි යනුවෙන් නිකුත් කල Video මගින්.

ප්‍ර : මෙය ඔබ පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද වැඩිදුර වාර්තාවක්?

පි : එහෙමයි.

ප්‍ර : එයත් අර වලිඋල්ලා පදනම විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සම්බන්ධව ඉදිරිපත් කරපු වැඩිදුර වාර්තාවක්ද?

පි : නැහැ මේ වෙනම. සමාජ ජාලාව පරීක්ෂා කරලා යවපු එකක් මේ.

**(X34C සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා)**

ප්‍ර : මෙය ඔබගේ අත්සනින් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද වාර්තාවක්ද?

පි : නැහැ. ඒක අධ්‍යක්ෂක අත්සන් කර තියෙන්නේ. වැඩ බලන අධ්‍යක්ෂක.

**(X35C සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා)**

ප්‍ර : මෙය ඔබ විසින් අත්සන් කර ඇති ලේඛනයක්ද?

පි : නැහැ. අධ්‍යක්ෂක විසින්

**(X35D සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා)**

ප්‍ර : ඔබගේ අත්සන තිබේද?

පි : නැහැ. අධ්‍යක්ෂක අත්සන් කරලා තියෙන්නේ.

**( X16 සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)**

පි : අධ්‍යක්ෂක.

FAIR COMMENT BY JEZEEM

**(X34 D සහ X36 D සාක්ෂිකරුට පෙන්වා සිටී)**

ප්‍ර : මෙම ලේඛනවල ඔබගේ අත්සන තිබේද?

පි : නැත අධ්‍යක්ෂක.

**(X36 D සාක්ෂිකරුට පෙන්වා සිටී)**

පි : නැත අධ්‍යක්ෂක.

(X38B සාක්ෂිකරුට පෙන්වා සිටී)

පි : මගේ අත්සන.

ප්‍ර : මෙම X38B ඔබ කුමන කරුණක් සඳහා යොමු කරන ලද වාර්තාවක්ද?

පි : තවුහිද් ජමාත් සංවිධානයේ ජිහාද් කිරීමට පසුපසින්න එපා යනුවෙන් සමාජ ජාලා හරහා Video පටයක් යොමු කිරීම.

ප්‍ර : සමාවන්න මොකක්ද?

පි : ජිහාද් කිරීමට පසුබසින්න එපා යනුවෙන් සමාජ ජාලා හරහා Video පටයක් යොමු කිරීම.

ප්‍ර : කවුරු විසින්ද?

පි : තවුහිද් ජමාත් සංවිධානයේ සහරාන් විසින්

ප්‍ර : මෙය 2018.06.07 දිනැතිව ඔබ විසින් යොමු කරන ලද ලිපියක් පොලිස්පතිවරයා වෙත?

පි : එහෙමයි. විශේෂ වාර්තා මේ විදියට යොමු කරනවා.

**(X41B සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)**

ප්‍ර : මෙහි ඔබගේ අත්සන තිබේද?

පි : එහෙමයි.

ප්‍ර : මෙය ඔබ විසින් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද ප්‍රගති වාර්තාවක්ද?

පි : එහෙමයි.

ප්‍ර : කුමන කරුණක් අරඹයාද ඔබ එය පොලිස්පති වෙත යොමු කර තිබෙන්නේ?

පි : ජිහාඩ් සහ මුජයිහිදීන්වරුන් පිළිබඳ NTJ නායක මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් විසින් සමාජ ජාලා හරහා සිදු කර ඇති ප්‍රචාරණය.

**(X41B හඳුනා ගනී)**

**(X38C සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)**

පි : අධ්‍යක්ෂක විසින් යොමු කර තියෙන්නේ.

**(X41C සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)**

පි : මගේ අත්සන.

ප්‍ර : 2018.08.26 දිනැති මෙම X41C ඔබ විසින් පොලිස්පතිවරයා වෙත යොමු කර තිබෙන කාරණය මොකක්ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ජිහාඩ් සහ මුජයිහිදීන්වරු පිළිබඳ NTJ නායක මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් විසින් සමාජ ජාලා හරහා සිදු කර ඇති ප්‍රචාරණය. ඒකේ ප්‍රගති වාර්තාව.

ප්‍ර : ප්‍රගති වාර්තාවක්?

පි : ඔව්.

ප්‍ර : සහරාන් සම්බන්ධයෙන්?

පි : සහරාන් සම්බන්ධයෙන්.

**(X 42B සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)**

පි : මගේ අත්සන.

(සාක්ෂිකරුගේ අත්සන හඳුනා ගනී)

ප්‍ර : 2018.09.12 දිනැති X42B කියන මෙම ලේඛනය ඔබ කුමන කරුණක් අරඹයා ද පොලිස්පතිවරයා වෙත යොමු කර තියෙන්නේ?

පි : ඉස්ලාම් රාජ්‍යයට අපහාස කරන අය අල්ලාට බිය වන්න. යනුවෙන් නායකයා විසින් සිය සමාජ ජාලා ගිණුම් හරහා Video පටයක් ප්‍රචාරණය කිරීම.

ප්‍ර : කවුද නායකයා?

පි : මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන්.

**(X 39B සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)**

පි : අධ්‍යක්ෂක විසින්.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>**

කොමිෂන් සභාවේ කටයුතු දිවා ආහාරය සඳහා පස්වරු 2 තෙක් කල් තබනවා.

**********

**දිවා විවේකයෙන් පසුව නැවත කොමිෂම රැස්වේ.**

දැන් වේලාව ප.ව. 2.25 යි

**<u>දිවා විවේකයට පෙර සාක්ෂි දුන් සාක්ෂිකරු නැවත කැඳවා ප්‍රතිඥා දෙයි.</u>**

**<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>**

ප්‍ර : සාක්ෂිකරු ඔබ කියා සිටියා ඔබ වසර 10 ක පමණ කාලයක් රාජ්‍ය බුද්ධි සේවාවට සම්බන්ධ වෙලා එහි ත්‍රස්ත විමර්ශන ඒකකය පසුව ත්‍රස්ත සහ ඉස්ලාම් ආගමික අන්තවාදී ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක සහ සහකාර අධ්‍යක්ෂකවරයා වශයෙන් කටයුතු කළා කියලා?

පි : සහකාර අධ්‍යක්ෂකවරයා ලෙස ප්‍රතිත්‍රස්ත කොට්ඨාශය මුලින්ම. ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂක ලෙසත් ඒකේමයි. ඊට පස්සේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නියෝජ්‍ය අධ්‍යක්ෂක විශේෂ පරීක්ෂණ විශේෂ මෙහෙයුම් සහ border control ඒ කියන්නේ දේශසීමා පාලන, ඊට පස්සේ නියෝජ්‍ය අධ්‍යක්ෂක පරිපාලන, ඊට පස්සේ ආයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ප්‍රතිත්‍රස්ත සහ මුස්ලිම් අන්තවාදී සංවිධාන පිළිබඳ විමර්ශන.

ප්‍ර : ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ එහි සේවය කරන කාලයේදී නිලන්ත ජයවර්ධන වර්ථමාන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා සේවය කළාද?

පි : එහෙමයි.

ප්‍ර : ඔහුගේ අත්සන ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : ඔව් පුළුවන්.

**(X94 දරන ලේඛනය සාක්ෂිකරු වෙත පෙන්වා සිටී)**

ප්‍ර : මෙම X94 කියන ලේඛනය ජ්‍යෙෂ්ඨ නියෝජ්ය පොලිස්පති නිලන්ත ජයවර්ධන විසින් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද ලිපියක් එහි නිලන්ත ජයවර්ධන මහතාගේ අත්සන තිබෙනවද?

පි : ඔව්.

ප්‍ර : සාක්ෂිකරු මෙය 2019.04.09 දිනැතිව අධ්‍යක්ෂක, රාජ්‍ය බුද්ධි සේවාව විසින් මා පෙරකී ලෙස පොලිස්පතිවරයා වෙත යොමු කරන්නට යෙදුනු තොරතුරක්?

පි : එහෙමයි.

ප්‍ර : ප්‍රථමයෙන් කියන්න මෙය බුද්ධි තොරතුරක්ද, නැත්නම් සාමාන්‍ය තොරතුරක්ද කියලා ඔබට කීමට හැකියාවක් තියෙනවද? සියල්ලම කියවන්න?

**(සාක්ෂිකරු ලේඛනයට අවධානය යොමු කරයි)**

පි : කියෙව්වා.

ප්‍ර : මෙය නිශ්චිත බුද්ධි තොරතුරක්ද, තොරතුරක්ද නැත්නම් කුමක්ද කියලා ඔබගේ මතය අනුව පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : දැන් මේකේ පළවෙනි Para. එක කියෙව්වම ඒකේ වටිනාම දෙයක් තියෙනවා. විදේශ බුද්ධි අංශයක් විසින් තොරතුරු වාර්තා කර ඇත. ඒ මොකක්ද, මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කිරීමේ සුදානමක්. එතකොට සර් මේක ඉතා වැදගත් පළවෙනි Para. එක. විදේශ බුද්ධි අංශයක් දීලා තියෙන්නේ මරාගෙන මැරෙන ප්‍රහාරයක්. ඒක කරන්න පුළුවන් ත්‍රස්තවාදීන්ට පමණ නේ. හැම මිනිහෙක්ටම ගිහිල්ලා මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කිරීමේ ප්‍රවනතාවයක් නැහැනේ. යම් ආගමික හෝ සමාජීය හෝ ආර්ථිකමය හෝ බලපෑමක් හේතුවෙන් ඔය කවුරු හරි මරාගෙන

FAIR COMMENT BY JEZEEM

ඒ ගමන යන්න පුළුවන්. නමුත් මෙතන පැහැදිලිව කියනවා සහරාන් හෙවත් සහරාන් හෂීම් ඔහුගේ අනුගාමිකයන් හා එක්ව කියන්නේ තව කිහිපයක් ඉන්නවා. මෙරට තුළ මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කිරීමට සුදානමක් තියෙනවා. එතකොට ඒ Para. එක හොඳ Intelligence එකක්. Specific Intelligence එකක්. ඊට පස්සේ දී පල්ලෙහාට යන කොට අන්තිම Para. එක තියෙනවා, ඉහත සඳහන් තොරතුර පිළිබඳව රහසිගත පරීක්ෂණ සිදු කරමින් පවතී. එතකොට ඒකට ඉස්සෙල්ලා තියෙනවා මේ කියන suspects ලා ගැනත් ඔවුන් දැනට සිටින තැනත් කියනවා. එතකොට ඒක ඒ තොරතුරේ සඳහන් කරලා තියෙන කොට ඒක බුද්ධි තොරතුරක් ලෙස ගන්න පුළුවන්. නිකන් තොරතුරක් නෙමෙයි. මොකද නිශ්චිත නොවනවා නම් එහෙම සඳහන් කරන්නේ නැහැනේ. මෙතන ඉන්නවා කියලා. බොරු වාර්තා එවන්න විදියක් නැහැනේ. මේකේ ඊටත් වඩා වැදගත් දේ තමයි අන්තිම Para. එකේ ආයි ගහනවා මේ ලියලා තියෙන විදියට නිශ්චිතව සඳහන් කල බවට මේ වන තෙක් නිරීක්ෂණය වී නොමැතිලු. ආයේ doubt එකක් ගේනවා මෙතන. ඉතින් මේක තමයි මගේ නිරීක්ෂණය සහ විශ්ලේෂණය.

ප්‍ර : දැන් මෙම බුද්ධි තොරතුර පොලිස්පතිවරයා වෙත යොමු කරන අවස්ථාවේදි ඊට පෙර ලේඛනගත පරීක්ෂණයක් සිදු කළාද, සහ එමගින් අනාවරණය වන කරුණු සඳහන් කිරීම අවශ්‍යවනවද නැද්ද?

පි : මූලිකව ගත්තොත් මේවගේ බුද්ධි තොරතුරක් ආපු ගමන්ම ක්ෂණිකව ඒක වාර්තා කිරීම තමයි සිදු විය යුත්තේ. ඊට පස්සේ පුළුවන් ප්‍රමාදයකින් තොරව වාර්තා කිරීම. ඊට පස්සේ පුළුවන් අපි කියමුකෝ පැය 24 ට විතර පස්සේ ලේඛනගත පරීක්ෂණයක් සිදු කරලා ඒ ලේඛනගත වාර්තාත් තව වාර්තා තියෙනවානේ, ඒවත් ඇතුලත් කරලා අපිට ඒ වාර්තාව වැඩිදුර වාර්තාවක් යවන්න පුළුවන්.

ප්‍ර : දැන් එය අනිවාර්යය ද නැද්ද කියලා මම ඔබගෙන් අහන්නේ, ඔබ 2006 කාලයේ මානුෂික මෙහෙයුම සිදුවන කාලෙට අනුව ඔබ කොළඹ ප්‍රදේශය භාරව රාජ්‍ය බුද්ධි සේවාවේ සේවය කළා ප්‍රතිත්‍රස්ත ඒකකයේ. එමගින් ඔබ කියා සිටියා විශාල උවදුරු සිදු වෙන්නට ගිය ප්‍රහාරයන් වළක්වා ගන්නට හැකි වුණා කියලා. ඒ අනුව මා ඔබෙන් අසන්නේ මෙම බුද්ධි තොරතුර ඉදිරිපත් කිරීමේදී මෙම තොරතුරේ සටහන් පුද්ගලයන් ලේඛනගත වෙලා

Presidential Secretariat
FAIR COMMENT BY JEZEEM

ඉන්නවද, ඔවුන් සම්බන්ධයෙන් මේතාක් කර ඇති විමර්ශනයන් මොනවාද යන්න සඳහන් කිරීම අවශ්‍ය වෙනවද නැද්ද කියලා?

පි : ඒක අතිරහස්‍යයි කියලා ගහල තියෙන හින්දා ඒක සඳහන් කලාට කමක් නැහැ. ඒක පොලිස්පතිතුමාගේ හෝ ඒ කියවන එක්කෙනාගේ දැන ගැනීම සඳහා නැත්නම් ඕක දැන ගත්තොත් පොලිස්පතිතුමා හෝ කියවන එක්කෙනා බලයිනේ මේ කවුද සහරාන් හෂිම් කියන්නේ කියලා. දන්නේ නැත්නම්.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාව මෙම ලිපිය ලියලා තියෙන්නේ 2019.04.09 වෙනිදා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ වන විට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් මෙම X94 සඳහන් සහරාන් නැමැත්තාට විවෘත වරෙන්තුවක් ලබාගෙන තියෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : ඊට අමතරව ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය ඉල්ලා තිබෙනවා රාජ්‍ය බුද්ධි සේවාවෙන් මෙම සහරාන් සම්බන්ධයෙන් ගුවන් ගමන් තහනමක් ලබා ගන්න කියලා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් මෙම තොරතුරු මෙම X94 දරන ලේඛනයට ඇතුලත් විය යුතුද නැද්ද?

පි : ඇතුලත් විය යුතුයි.

ප්‍ර : අනිවාර්යයෙන්ම ද නැත්නම් සුදුසු ද?

පි : අනිවාර්යය කියන්නේ දැන් අපි මේ වගේ තොරතුරු දැනුම් දෙනවා නම් අපිට මේක සඳහන් කරන්න පුළුවන් අපි ගුවන් ගමන් තහනමක් TID එකෙන් ඉල්ලලා අපි ඒකත් කරලා තියෙනවා කියලා කියන්න පුළුවන්.

ප්‍ර : ඔබතුමාගෙන් මම නිශ්චිත පිළිතුරක් මේ වෙලාවේ බලාපොරොත්තු වෙන්නේ, ඔබගේ වසර 10 ක සේවා කාලය තුළ සහ මානුෂීය මෙහෙයුම කාලයේදි කොළඹ භාරව ප්‍රතිත්‍රස්ත ඒකකයේ සහකාර අධ්‍යක්ෂක වශයෙන් ඔබ සිටි බව කියා සිටියා. එවන් පසුබිමක ඔබට අනුව මෙම X94 සමඟ එහි නම් සඳහන් පුද්ගලයන් හා පුද්ගලයෙකුගේ උදාහරණයක් ලෙස සහරාන් සම්බන්ධයෙන් වන පෙර විවෘත වරෙන්තුව ලබා ගැනීම, ගුවන් තහනමක් ලබා ගැනීම යන කාරණා මෙම X94 ට ඇතුලත් විය යුතුද නැද්ද අනිවාර්යයෙන්?

පි : මම නම් ඇතුලත් කරනවා.

ප්‍ර : ඇයි ඒ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එතකොට තමයි ඒ බුද්ධි තොරතුරක් නම් මේක නිශ්චිත වෙන්නේ. අපි පැහැදිලි කරනවා මෙන්න මේ මේ දේවල් තියෙනවා පුද්ගලයාට විරුද්ධව. Open warrant එකක් තියෙනවා, ගුවන් ගමන් තහනම් කරලා තියෙනවා, එතකොට ඒ කියවන එක්කෙනාට ඒ සියළුම විස්තර අපි ලබා දෙනවා.

ප්‍ර : යම් හෙයකින් මෙම බුද්ධි තොරතුරේ නම් සඳහන් නැනැත්තන් ඒ කියන්නේ X94 හි 2018 දෙසැම්බර් මාසේ මාවනැල්ලේ සිදු වූ බුදු පිළිමවලට හානි කිරීම, වනාතවිල්ලුවේදි 2019 ජනවාරී මාසේ 16 වෙනිදා පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම සහ වවිනතිව්වලදි පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ඝාතනය කිරීමට මෙම X94 සඳහන් එක් සැකකරුවකු හෝ සියළු දෙනාම සම්බන්ධ බවට රාජ්‍ය බුද්ධි සේවාව දැන සිටියා නම් එය මෙම X94 ට ඇතුලත් විය යුතුද නැද්ද?

පි : අනිවාර්යයෙන්ම.

ප්‍ර : ඇයි?

පි : මෙය වැදගත් නිශ්චිත බුද්ධි තොරතුරක් ලෙස කියවන කෙනාට යවනවා නම් එනම් පොලිස්පතිතුමාට යවනවා නම් අපි සතු සියළු තොරතුරු ඇතුලත් කිරීම තමයි යෝග්‍ය වෙන්නේ. එතකොට තමයි ඒ පුද්ගලයාට යම් අවබෝධයක් ඇවිල්ලා ගතයුතු පියවරයන් ඉන් පස්සේ තීරණය කරන්න පුළුවන්. මොකද අපි ගාව බුද්ධි තොරතුර සම්පූර්ණයෙන්ම තියෙනවා නමුත් අපි ඒක දෙන්නේ 50% ක් නම් ඉතුරු 50 හංගනවා නම් ඒක අර කියවන එක්කෙනාට, action ගන්න ඉන්න කෙනාට ඒක අපහසුතාවයක් තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ මෙම තොරතුර ඇතුලත් කරලා පොලිස්පතිවරයා වෙත යොමු කොලොත් ඔහු විසින් ගතයුතු පියවර සම්බන්ධයෙන් ඔහුට නිශ්චිත අවබෝධයක් ලැබෙනවා කියලද ඔබ කියන්නේ?

පි : නිශ්චිත අවබෝධයකුත් ලැබෙනවා, අනිත් එක තමයි මේකේ පිටපතක් දාලා තියෙනවානේ ජෙ.නි.පො.ප. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව. එතකොට මේ සිදුවීම් දෙකම එයා විමර්ශනය කරපු එක්කෙනෙක්නේ, වනාතවිල්ලුව වේවා, මාවනැල්ල වේවා එතකොට ඒක තව වඩාත් තවත් වැඩිදුර විස්තර කරන්න පුළුවන් මේ ජෙ.නි.පො.ප. තුමාගෙන් ගන්නත් පුළුවන් IG මහත්තයට ඕන නම්, එහෙම නැත්නම් ජෙ.නි.පො.ප තුමා දැන ගන්න ඕනේ යවන්න IG මහත්තයට. එහෙම නැත්නම් අපේ ලියුම යවන නිලන්ත ජයවර්ධන ගාව තියෙනවා නම් ඒ ඔක්කොම විස්තර ඇතුලත් කිරීම වඩා හොඳයි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප : දැන් ඔබ කියා සිටියා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් වගකීමක් තිබ්බා කියලද පොලිස්පතිවරයා දැනුවත් කරන්න මෙම මාවනැල්ල සහ වනාතවිල්ලුව සිද්ධිවලට මේ සහරාන් සම්බන්ධයි කියලා?

පි : අනිවාර්යයෙන්ම මම හිටියා නම් මේ තනතුරේ මට පිටපතක් ආව නම්, මම ඒ පිටපත ප්‍රකාරව action එකක් ගන්න ඕනේ. එහෙනම් පොලිස්පතිතුමාට වාර්තාවක් ඉදිරිපත් කරන්න ඕන. මේ කියන කතාවල මෙන්න මේවා අපි ගාව තියෙනවා තොරතුරු කියලා.

ප : ඔබ දැන් ඒ කියන්නේ එය සිදු කලයුත්තේ කවුරු විසින්ද?

පි : මේ පිටපත් යවලා තියෙන්නේ,

ප : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව. ඔබ මෙම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මෙම වගකීම පැවරෙන බව පවසන්නේ එකී දෙපාර්තමේන්තුව විසින් ඔබව අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් භාරයට පත් කල නිසාද?

පි : නැහැ. කිසිසේතම නැහැ. පිටපතක් යොමු කරන කොට මේ පිටපත අපි කියමුකෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අමතක කරමු කෝ. ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂකට එව්වා නම් දැන් මොකක්ද එතුමා ගන්න ඕන තීරණය. එතුමා ගන්න ඕන action එක. මේක file කරන්න බැහැනේ. මට එව්වා නම් මම ගන්න ඕන action එකක් තියෙනවා. ඒකනේ මට පිටපතක් එවලා තියෙන්නේ. ඒක හින්දා මාව අත්අඩංගුවට ගත්තා කියන එක කිසිම අදාලත්වයකුත් නැහැ, වෛරයකුත් නැහැ මුකුත් නැහැ. මම කියන්නේ පිටපතක් යවනවා නම් මේ වගේ වැදගත් එකක්, that is actionable you have to take action on that. මගේ විශ්ලේෂණය ඒකයි. මට කොලයක් එව්වා නම් පිටපතක් හෝ මම action එකක් ගන්න ඕන. ඉතින් ඒකටනේ මේ එවලා තියෙන්නේ. එතකොට මේකේ පැහැදිලිව සඳහන් කරලා තියෙනවා නේ, ඔය මාවනැල්ලයි ඔය ඔක්කොම සඳහන් කරලා තියෙන කොට අපි ගාව තියෙන තොරතුරුත් IG මහත්තයට දුන්නයි කියලා කිසිම වරදක් නැහැ ඒකේ.

**********

**<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>**

ප : සාක්ෂිකරු කලින් මෙම තොරතුරු පොලිස්පතිතුමාට දැන ගැනීමට යවා තිබුණ නම් ඒවා සඳහන් කිරීම අවශ්‍යද?

පි : රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂකටද

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔව් බුද්ධි සේවය විසින් මෙම කරුණු, දැන් ඔබ කිව්ව කරුණු සිද්ධීන් සම්බන්ධව දැනුවත් කරලා තිබ්බා නම් පොලිස්පතිතුමා, නැවත වරක් ඔය ලියවිල්ල දැමීම අත්‍යාවශ්‍යද?

පි : ඒක මම කියන්නේ අධ්‍යක්ෂකගේ අභිමතයක් ඒක. එයාට ඕන නම් මේකේ නිශ්චිත තොරතුරු විතරක් යවන්න පුළුවන්, වැඩිපුර දාන්න ඕන නම් එයාට ඒක දාන්නත් පුළුවන්. ඒක එයාගේ අභිමතයක් ලෙස තමයි මම දකින්නේ.

ප්‍ර : දැන් අපරාධ අධ්‍යක්ෂක වෙත ඕක යැව්වාම ඔහුට පමණක් යම්කිසි ක්‍රියාමාර්ගයක් මෙම ප්‍රහාරය වැලැක්වීම සඳහා ගත හැකිද නැත්නම් ඔවුන් සියළු දෙනාම සාමූහිකව සාකච්ඡා කර එක් පියවරක් ගතයුතුද?

පි : ස්වාමිණි දැන් මේ තොරතුර ආවම අපි ඉස්සර මමත් ඔය තත්ත්වයේ හිටපු නිසා අපි බුද්ධි තොරතුරක් ආවාම අධ්‍යක්ෂකතුමත් එක්ක කතා කරලා ඒකේ වැදගත් භාවය mark කරලා එවේලේම පොලිස්පතිතුමාට දුරකථනයෙන් හෝ වෙනත් සංවේනිවේදන ක්‍රමයකින් දැනුවත් කරනවා. විශේෂයෙන් දුරකථනයෙන්. එතකොට සමහර වාර්තා තියෙනවා අපි කියමුකෝ මේ වගේ බුද්ධි වාර්තා පුද්ගලිකව by hand ගිහිල්ලා දීලා තියෙනවා මම පවා. ගිහිල්ලා දීලා තියෙනවා පොලිස්පතිතුමාට. ඒ මොකද ඒකේ තියෙන රහස්‍ය භාවය සහ වැදගත් භාවය හේතුකොට ගෙන. එතකොට අධ්‍යක්ෂකතුමා IG මහත්තයට කිව්වම මම නාලක එවනවා ලියුමක් කිව්වම ඒ ක්‍රියා පිළිවෙත සිදු වෙනවා. එතකොට ඒකේ දී වැඩියමක් පොලිස්පතිතුමා දැන ගන්න ඕන නම් අධ්‍යක්ෂකතුමාත් එක්ක සාකච්ඡා කරනවා. කරලා ඒ මොනවා හරි තියෙනවා නම් ඒ අධ්‍යක්ෂකතුමා හරහා අපිටත් ඒ නියෝගය ලැබෙනවා. එතකොට එතනදි මට තිබ්බ වාසනාවන්තකම තමයි මට දීල තිබ්බා teams, STF එකෙන් වේවා ඒ හැම දෙයින්ම. එතකොට ඒ තොරතුරට ක්ෂණික action අපි ගත්තා. මගේ මූලිකත්වයෙන් මගේ නිලධාරීන් අපි ඒ බුද්ධි තොරතුර offensive Intelligence පැත්තට හරවලා ඒක යනවා. offensive Intelligence පැත්තට අරන් ගිහිල්ලා අපි සතුරා හඹා ගිහිල්ලා අර නිලධාරීන් හරහා අත්අඩංගුවට අරගෙන produce කරනවා. TID නම් TID යි. CCD ඒ වගේ තැන්වල produce කරනවා. එතකොට මේකේදීත් සාකච්ඡා කළා නම් හොඳයි යන මතයේ තමයි මම පුද්ගලිකව ඉන්නේ.

**(X113 සාක්ෂිකරුට පෙන්වා සිටී)**

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : X113 කියන්නේ X94 දරන ලේඛනය සකස් කිරීමට හේතු වූ විදෙස් බුද්ධි තොරතුර කියලා කිව්වොත් නිවැරදි ද?

පි : ඒ වගේ තමයි පේන්නේ.

ප්‍ර : දැන් සාක්ෂිකරු මෙහි අවසාන ඡේදයේ යමක් සඳහන් වෙනවා නැවත වාර්තා කිරීමක් සම්බන්ධයෙන්?

පි : දෙවෙනි පිටුවේ ඔව්.

ප්‍ර : ඒ අදාල තොරතුර ඉදිරිපත් කරමින් ඒ තොරතුර ඉදිරිපත් කරන්නා කියා සිටිනවා මේ සම්බන්ධයෙන් නොපමාව ක්‍රියා කර නැවත ඔවුන්ව දැනුවත් කරන්න කියලා කිව්වොත් හරිද?

පි : හරි.

ප්‍ර : දැන් සාක්ෂිකරු මෙම X113 හි එම ඡේදයේ දැක්වෙන කරුණු සලකලා බැලුවාම X113 සම්බන්ධයෙන් ගත් පියවර X93 කියන පොලිස්පති වෙත යොමු කරන ලද ලිපියේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක විසින් සඳහන් කලයුතු වෙනවද නැද්ද? Did I make my Self here?

පි : Not really

ප්‍ර : X113 හි කියා තිබෙනවා ඒ තොරතුරුකරු විසින් ඒ තොරතුර පිළිබඳ ගත්ත පියවර නැවත ඔවුන් වෙත වාර්තා කරන්න කියලා, නිවැරදි ද?

පි : හරි.

ප්‍ර : ඒ අනුව රාජ්‍ය බුද්ධි සේවාව කිසියම් පියවරක් ගත්තා නම් ඒ ගන්නා ලද පියවර X94 දරන පොලිස්පති වෙත යොමු කරපු තොරතුරේ සඳහන් කළයුතු වෙනවාද නැද්ද?

පි : තොරතුරුකරුට පිළිතුරු දුන්නා කියන එක සඳහන් කිරීම සම්බන්ධයෙන් මට මතයක් කියන්න බැහැ මොකද අධ්‍යක්ෂකවරුන්ගෙන් අධ්‍යක්ෂවරුට ඒක වෙනස් වෙනවා.

ප්‍ර : නමුත් එසේ පිළිතුරු ලබාදිය යුතු වන බව පොලිස්පතිවරයා දැනුවත් කිරීමේ අවශ්‍යතාවයක් තියෙනවද? That you have to give a feedback about the action taken and therefore I am submitting this letter

පි : feedback to the Indian counterpart

ප්‍ර Yes.

පි : That is feedback to clear myself. The Question is so and so has inform IG Police that the feedback was given

ප්‍ර : Or we have to give a feedback

පි : ඒක මම හිතන්නේ අධ්‍යක්ෂකතුමාගේ අභිමතයක්.

FAIR COMMENT BY JEZEEM

ප : සාක්ෂිකරු මෙම 2019.04.21 වන දින ප්‍රහාරයෙන් පසුව ඔබට දැනීමක් තියෙනවද රාජ්‍ය බුද්ධි සේවාවේ කිසියම් හෝ නිලධාරියෙකු හෝ නිලධාරීවරුන්ට තමා විසින් සිදු කරන්නට යෙදුන සේවයට අලලා සම්මාන හෝ පැසසුම් ලැබුණාද නැද්ද කියන්න?

පි : මට නිළ නොවන මට්ටමින් මට දැන ගන්න ලැබුණා එහෙම ලැබුණයි කියලා.

ප : කාටද? කාගෙන්ද ?

පි : දන්නේ නෑ. ජනාධිපති සම්මාන කියලා තමයි මට ආරංචි වුණේ.

ප : කුමන නිලධාරීවරුන්ටද, වරයාටද ?

පි : අධ්‍යක්ෂක ඉදන් සමහර නිලධාරීන්ට.

ප : රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක සහ සමහර නිලධාරීන්ට බවටයි ඔබට ආරංචි වුණේ, තොරතුරු තියෙන්නේ?

පි : ඔව්. නිළ නොවන.

ප : එය කුමන කරුණක් අරඹයා ලබා දීපු සම්මානයක්ද කියන්න ඔබට වාර්තා වුණාද?

පි : ඔව් ඒ කියන්නේ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයට අදාලව සිදු කළ ක්‍රියාවලියට අදාලව ගත් ක්‍රියා මාර්ග.

ප : ඒ කියන්නේ බෝම්බය පුපුරන්නට ඉඩ දීමද?

පි : ඒක මට කියන්න බැහැ. මට ආරංචියක් නේ මේක. ආරංචියක් නේ ආවේ.

ප : ඔබට 3 වන පාර්ශවයකින් අසා දැනගත් කරුණක් තමා ඔබ කියා සිටින්නේ?

පි : 3 වන පාර්ශවයකින් මට දැන ගන්න ලැබුණා. මම ඒක භාරව අවුස්සන ගියේ නැහැ.

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>**

ප : සාක්ෂිකරු ඔබ ත්‍රස්ත විමර්ශන ඒකකයේ විමර්ශන හැකියාව තවත් ශක්තිමත් සහ වර්ධනය කිරීම සඳහා 2018 වර්ෂයේදී යම්කිසි යෝජනාවක් නීතිය හා සාමය අමාත්‍යාංශයේ ලේකම්ට යොමු කෙරුවද යම් උපකරණ ලබා ගැනීමක් සඳහා?

පි : ආ..ඔව්. තාක්ෂණික උපකරණද?

ප : ඔව්.

පි : පොලිස්පතිතුමා හරහා.

ප : මොකක්ද ඉල්ලීම? කවුද එවකට හිටපු ලේකම්?

පි : පද්මසිරි ජයමාන්න මහතා.

ප : මොකක්ද කරපු ඉල්ලීම්?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : තාක්ෂණික උපකරණ ලබා ගැනීම.

ප්‍ර : මොකක් සඳහා තාක්ෂණික උපකරණ ලබා ගැනීමද?

පි : විමර්ශන කටයුතු, ආවේක්ෂණ රාජකාරී සඳහා.

ප්‍ර : ඒ ඉල්ලීමට අනුමැතිය ලැබුණද?

පි : නැහැ මම ඉන්න කල් නම් ලැබුන් නැහැ.

ප්‍ර : ඒක ප්‍රතික්ෂේප කිරීමක් සිදු වුණාද?

පි : නැහැ, නැහැ ඒක මම හිතන්නේ ස්වාමිණි කැබිනට් එකට යවන්න ඕන කිව්ව හින්දා ඒක මොකක් හරි එහෙම තමයි කිව්වේ. ප්‍රමාදයක් වුණා මම යවලා හුඟක් මම හිතන්නේ මාස 2 ක් විතර හිටියා. මුකුත් සම්බන්ධයක් තිබුන් නැහැ.

ප්‍ර : ඔබ මේ කොමිෂමට ප්‍රකාශ කෙරුවා නේද 2017 වර්ෂයේදි FOTO සංවිධානය සම්බන්ධයෙන් යම් සාකච්ජාවක් පැවතුනා කියලා බුද්ධි සමාලෝචන රැස්වීමේදී?

පි : එහෙමයි.

ප්‍ර : ඒ අවස්ථාවේදි ඔබ කිව්වා නේද ඔබ ඉල්ලීමක් කෙරුවා කියලා ඒ FETO සංවිධානය සම්බන්ධයෙන් තොරතුරු ත්‍රස්ත විමර්ශන ඒකකයට ලබා දෙන්න කියලා?

පි : එහෙමයි.

ප්‍ර : එම ඉල්ලීමට අවසරය ලැබුණද?

පි : එහෙම ලැබුන් නැහැ, එහෙම තොරතුරු ආවේ නැහැ ස්වාමිණි. මම ඉන්නකන් නම් ආවේ නැහැ.

ප්‍ර : ඒ අවස්ථාවේදී එම තොරතුරු ලබා දිය නොහැකි බවට යම් නිලධාරියෙක් ප්‍රකාශයක් කෙරුවද?

පි : මගේ මතකයේ හැටියට අපේ අධ්‍යක්ෂකතුමා, රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂකතුමා කිව්වේ තවදුරටත් එයා සාකච්ජා කරලා අවශ්‍ය වෙලාවට open inquiries ගන්න අපට එවන්නම් කියලා.

ප්‍ර : ප්‍රතික්ෂේප කිරීමක් සිදු වුනේ නැද්ද?

පි : එවෙලේ මට මතක නැහැ ස්වාමිණි. ... හා ඔව්, එවෙලේ දෙන්න බැහැයි කිව්වා මොකද එවෙලේ දුන්නොත් එහෙම ඒගොල්ලන්ගේ inquiry වලට බලපානවා කියලා. සහ ඒ අවස්ථාවේ තිබ්බ රටේ තත්ත්වයත් එක්ක.

ප්‍ර : ඒ රටේ තත්ත්වය පැහැදිලි කරන්න?

පි : ඒ කියන්නේ දැන් මම open inquiry කරන්න ගියොත් එහෙම ඒක එක පැත්තකින් විදේශිකයෝ, අනික් පැත්තෙන් තවත් ජාතියක් සම්බන්ධයෙන් නේ. එතකොට ඒ පුද්ගලයෝ පිළිබඳ අපි විමර්ශනය කරන්න ගියාම inquiry කරන්න ගියාම සමඟියට හෝ වේවා සංහිදියාවට හෝ වේවා ප්‍රශ්නයක් ඇති වෙන්න

Registrar of Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පුළුවන්. ඒ වගේම රාජතාන්ත්‍රිකව ප්‍රශ්නයක් ඇති වෙන්නත් පුළුවන්. ඒක නිසා හරියට ඒගොල්ලන් inquiry කරලා සම්බන්ධ කට්ටියගේ ඒවා ඉදිරියේදි කියන්නම් කිව්වා. නමුත් අපිට අවශ්‍ය වුනේ list එක ගන්න ස්වාමීණි.

දැන් වේලාව : ප.ව. 3.00 යි
මෙතැන් සිට ල/ලේ :- යමුනා දසනායක මිය විසින්ය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් ගැනිම ල/ලේ දම්මිකා
සටහන් ගැනිම ල/ලේ යමුනා දසනායක විසිනි.
වේලාව. ප. ව. 3.00

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>**

ප්‍ර මෙම කොමිෂන් සභවේ විමර්ෂණ ඒකකයට ප්‍රකාශයක් ලබා දුන්නා නේද 2020/01 /21 වෙනි දින ?

උ දිනේ මතක නැහැ දුන්නා ස්වාමීනි.

ප්‍ර එම ප්‍රකාශයේ මෙහෙම සඳහන් කරලා තියෙනවා නම් ඒක හරිද ?

උ තවද තුර්කි තානාපති විසින් තුර්කි දේශයේ ත්‍රස්ත කටයුතු වලට සම්බන්ධ 30 කට අධික පිරිසක් ලංකාවට පැමිණ ඇති බවට ආරක්ෂක අමාත්‍යාංශයේදි අඟහරුවාදා රැස්වීමේදි 2018 වර්ෂයේ දිනක රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන එවකට සිටි ආරක්ෂක ලේකම් කපිල වෛද්‍යරත්න මහතා වෙත වාර්තා කිරීමේදි එම තොරතුරු වහාම මා වෙත සෘජුව හෝ පොලිස්පතිතුමා මගින් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා නමුත් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා එය ලබා දිය නොහැකි බවත් එය තුර්කියේ ප්‍රශ්ණයක් බවත් විවෘත පරීක්ෂණ සිද කිරීමෙන් මුස්ලිම් ජනතාවට අගතියක් සිදුවන බවත් එය යහපාලනයට බාධාවක් බවත් ප්‍රකාශ කලා. එය ආරක්ෂක ලේකම් විසින්ද පිලිගත්තා. එලෙස ඔබගේ ප්‍රකාශයේ සඳහන් වෙලා තිබ්බා නම් එය හරිද ?

උ හරි.

ප්‍ර එදින සිදුවුයේ දේ ඔබ නිවැරදිව විස්තර කරලා තියෙනවාද ?

උ ඔව්.

**********

**<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මහතා</u>**

ප්‍ර නාලක සිල්වා මහත්මයා ඔබ රාජකාරි කරන කාලයේ පකිස්ථානයෙන් අන්තර්ජාල ආවේක්ෂණ උපකරණ ලබා ගන්න ඔබ උත්සාහ කලා නේද?

උ ඔව්.

ප්‍ර ඒක කරගන්න පුලුවන් වුනාද ?

උ බැරිවුනා.

ප්‍ර හේතුව?

ප්‍ර මම ඉස්සෙල්ලා කිව්වේ ස්වාමිනි පේපර් එක ඇරියා secretaryට. IG මහත්මයා approve කරලා ඊට පස්සේ ඉතින් මුකුත් වුන් නැහැ

ප්‍ර ඒකේ තියෙන අත්‍යාවශ්‍ය භාවය ඔබ නැවත මතක් කරලා දීලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ කිව්වා දෙසැරයක්ම කිව්වා . එතකොට තමයි කැබිනට් එකට යවන්න ඕනේ කියලා මොකද මිල අධික හින්දා.

ප්‍ර ඔව් ඇත්තටම මගේ ප්‍රශ්නය වෙන්නේ පස්සේ මෙවැනි අත්‍ය වශ්‍ය දේවල් ඔබට අරගන්න බැරිවෙච්ච නිසා වුන පාඩුව මොකක්ද?

උ පාඩුව මගේ නිළධාරින්ට අපිට තිබ්බ සීමිත දේවල් වලින් තමයි ස්වාමිනි අපි අන්තර්ජාල පහසුකම මොනිටර් කලේ එතකොට සීමිත දැනුම සහ සීමිත උපකරණ තිබ්බා ඉතින් ඕවගේ හොද රටවල් කීපයකින්ම ඇවිල්ලා විශේෂයෙන්ම යු. එන් එකෙන් පවා ඇවිල්ලා මටත් මගේ නිලධාරින්ටත් පෙන්නුවා අන්තර්ජාලය මොනිටර් කරන විදිය. ඉතින් ඒවා දැක්කම ඉතින් අප ආයතනයට ඒවා අත්‍යවශ්‍යයයි අපි ත්‍රස්ත මර්දන සහ විමර්ෂණ කොට්ඨාශය නම් අපි ට ඒවා අත්‍යවශ්‍යයයි අපිට ඉදිරි ගමනක් යන්න. මොකද දැන් හුඟක්ම තියෙන්නේ අන්තර්ජාලය ඔස්සේම සිදුවන අන්තවාදය හෝ ප්‍රචන්ඩ අන්තවාදය හෝ ත්‍රස්තවාදය එතකොට අපිට ඒවා මොනිටර් කරන්න තියෙනවා නම් ඒක ලොකු දෙයක් අපිට. ලොකු වාසනාවක් ඒක ලබා ගන්න තමයි මං උත්සාහ කලේ ඉතින් යම් ප්‍රමාදයක් ඇතිවුනා මං දන්නේ නැහැ ඒවා ලැබිලාද කියලා මං දන්නේ නැහැ මම ඉන්න කොටනම් ලැබුනේ නැහැ.

ප්‍ර දැන් ඇත්තටම ඒ ඉල්ලපු දේවල්ඒ කාලේ ලැබුන නම් ඔබ හිතන විදියට සහරාන්ට ඔහුගේ ක්‍රියාකාරකම් ඒ විදියට කරගෙන යන්න බැරිවෙන්න ඉඩ තිබුනා නේද ?

උ හුඟක් දුරට ස්වාමිනි එයා කරේම මේ social media එකෙන්නේ. අපිට තිබ්බා හරියට මොනිට කරලා ස්වාමිනි මගෙන් ඉස්සෙල්ලා ඇහුවා වගේ අර අන්තර්ජාලයෙන් ඉන්න තැන හොයා ගන්න පුළුවන් එක අයි. පි . ඇඩ්‍රස් මට මතකයි පරිසණක දැනුමක් මට එච්චරම නැහැ නමුත් දන්න දේ මං ඉගෙන ගත්ත දේ මං දැන ගත්තා අනිවාර්යයෙන්ම ඒ වගේ ඒවා ගෙන් හොයා ගන්න පුලුවන්

ප්‍ර දැන් ඒකේ අවසාන තේරුම වෙන්නේ මේ සහරාන් යම් ආකාරයක ප්‍රහාරයක් එල්ල කරලා මෙපමණ විනාශයක් සිදු කරන එක ඔබට අවශ්‍ය අවස්ථාවේදි ඒ උපකරණ නොලැබීමෙන් වැලකී ගියා නේද ?

උ ඒකත් එකක් ඒ වගේම තව කීපයකුත් තිබ්බා ස්වාමිනි.

ප්‍ර ඒ මොනවාද ?

උ ඒවා කැමතියි මම කොමිසමට කියන්න .
ඉදිරිදින හෝ.වෙනින් දවසක. හුඟක් තියෙනවා මට කියන්න.

ප්‍ර තව එකක් මම ඔබෙන් අහනවා . ත්‍රස්තවාදීන් උපදින්නේ නැහැ ත්‍රස්තවාදීන් බිහි කරනවා කියලා ඔබ මතයක් දරනවා ඒක විස්තර කරන්න පුලුවන්ද ?

උ අනිවාර්යයෙන් . ස්වාමිනි රටේ ඕනෑම තැනක උපදින දරුවෙක් තම ජීවිතය ගත කරන කොට ඒ උපදින කොට ත්‍රස්තවාදියෙක් වෙලා

FAIR COMMENT
BY JEZEEM

උපදින්නේ නැහැ. කුඩු කාරයෙක් කව්රුත් වෙලා උපදින්නේ නැහැ. බොහොම හොඳ ජීවිත රටාවක් යනවා පසු කාලිනව සමාජිය, ආර්ථික වේවා,ආගම වේවා වෙච්චි අසාධාරණ කමක් වේවා මත ඒ සිත්තැවුලෙන් අන්තවාදි අදහස් ඇති වෙන්න පුලුවන්. ඒ අදහස් එක්ක ඒ කියන්නේ දැන් ඇයි ප්‍රභාකරන්ට පුලුවන් වුනේ suicide bombers ලව නිර්මාණය කරන්න? ප්‍රභාකරන්ගේ suicide bombers ලා වැඩි වශයෙන් පටන් ගන්න කොට හිටියේ ස්ත්‍රීන්. හුහක්ම ස්ත්‍රීන් ඇයි ගියේ කියන එක අපි ඒක විශ්ලේෂණය කරලා බලන්න ඕනේ ඇයි ස්ත්‍රීන් ඒ තත්වයට ගියේ කියලා. එතකොට suicide bomber කෙනෙක් නිර්මාණය කරන්න අමාරුයි හරි අමාරුයි මට suicide වෙන්න පුලුවන් නමුත් තවත් කෙනෙක් ඒක ඒ අදහස් ඔළුවට දාලා suicide bomber කෙනෙක් කරන්න පුලුවන් කමක් තියෙන්න ඕනේ

එතකොට මේ ත්‍රස්තවාදින් කියන මේ ලේබල් එක එනකොට හොඳට හිටපු කෙනෙක් ත්‍රස්තවාදියෙක් වෙන්නේ එකපාරටම හෝ අන්තවාදය හරහා ත්‍රස්තවාදියෙක් වෙන්නේ ඒ යම් හේතුවක් මත. ආර්ථික වේවා. සමාජ වේවා, පවුලේ වේවා, ආගමික වේවා, මේ හේතු කාරණා මත ඇති වෙච්ච ව්‍යාකූලතාවය එක්ක තමයි යන්නේ තවත් කෙනෙක් මරාගෙන හෝ ඒ ගමන යන්නේ. එතකොට ඒකයි මම කිව්වේ අපේ common phrase එකක් තියෙනවා terrorists are not born but made ඉතින් අපි ඒක මම suicide bombersලා ජීවතුන් අතර අල්ලපු කෙනෙක්. එතකොට ඒ කට්ටිය එක්ක කථා කරන කොට තේරිච්ච එකක් තමයි ඒ පුද්ගලයාට මැරෙන්න අවශ්‍යතාවයක් නැහැ නමුත් එයාට මැරෙන්න තත්වයට පත් වෙලා ඉවරයි. ඒ කියන්නේ එයාව ඒ තත්වයට පත් කරලා තියෙන්නේ මානසිකව නමුත් අද ඉන්නවා බන්ධනාගාරතව ඒ මං අල්ලපු කට්ටිය. දැන් ජීවත් වෙලා ඉන්නවා නැත්නම් මැරෙන්න තමයි හිටියේ. ඒ හැම දෙයක්ම මම ඉස්සෙල්ලත් කිව්වේ ඒකයි සර් අපි විශ්ලේෂණය කරන්න ඕනේ මං හුහක්ම ට්‍රේනින් ලැබුවේ Analysis සම්බන්ධව එතකොට හැම අර පෙන්නපු බුද්ධි තොරතුරු විශ්ලේෂණය කරන්න ඕනේ. ඒ විශ්ලේෂණය කරන්න දැනුමක් නැත්නම් එක්කෙනෙක්ව ගෙන්වලා අහන්න ඕනේ මොකක්ද මේ බුද්ධි තොරතුර මොකක්ද මේ ලියලා තියෙන්නේ සහරාන් කෙනෙක් ගැන ලිව්වේ මොකක්ද මේ කියලා අහන්න ඕනේ. එහෙම නැත්නම් තොරතුරු දෙන එක්කෙනා ඒ විශ්ලේෂණය කරන්න ඕනේ. මෙයා threat මෙයා suicide attack එකක් දෙන්න යන්නේ මෙයා National Security threat එකක් immediate threat එකක්. මේකට promt action ගන්න ඕනේ. ඒක ලියවෙන්න ඕනේ අර කොලේ immediate action prompt action National Security එකට සෘජු තර්ජනයක්

FAIR COMMENT
BY JEZEEM

තියෙන්නේ මෙයාගෙන් මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කරනවා එයාගේ කට්ටිය එක්ක. එතකොට ඒ සෘජු තර්ජනය තියෙන්න ඕනේ ලියලා.ඒ වගේ තමයි ඒ ඇනලයිස් කරන්න ඕනේ එතකොට ඔබතුමාගේ ප්‍රශ්ණයට මං උත්තරය දෙන්නේ Terrorists are not born but made due to various reason සමාජ තත්වය ඔක්කොමත් එක්ක ඒක තමයි මං ඉගෙන ගත්ත දේ.

**********

**<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ප්‍ර සාක්ෂිකරු දැන් අර බුද්ධිමය තොරතුරක් රාජ්‍ය සේවයට ලැබුනා නේද ?රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ විසින් බාරදුන්නානේ බුද්ධිමය තොරතුරක් පොලිස්පති වරයාට ?

උ එහෙමයි.

ප්‍ර දැන් ලිපියක් පෙන්නුවේ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එම ලිපියේ සඳහන් පුද්ගලයින්ගෙන් කී දෙනෙක් ත්‍රස්ත විමර්ෂණ අංශය හඳුනාගෙන තිබ්බද 2018 වර්ෂයේදී?

උ සහරාන් හිටියා.

ප්‍ර කී දෙනෙක් හිටියාද?

උ ( ලිපියක් පරික්ෂා කර බලයි ) අනිත් එක තමයි ස්වාමිනි ඉන්දියාවෙන් එවපු ලියුමේ තියන එකයි ලංකාවේ එකයි සංසන්දනය කරන්න ඕනේ ඒ දෙකේ තියෙන වෙනස. මෙයා පැහැදිලිව ගහනවනේ The Input may kindly be inquired in to on priority and a feed back given to us මේ වචනය අපිත් ගහනවා චෙන්නායි ඉන්නකොට ලියන්නේ එහෙමයි මගේ counter part ට. එහේ ඉන්න පොලිස්පති තුමාට එහෙම තමයි අපි දෙන්නේ බුද්ධි අංශේ ඒ කරන ක්‍රමවේදයක්. අපිත් අභාෂය ගත්තේ එංගලන්තයෙන්නේ. ඒ ක්‍රමවේදය තමයි අපි අනුගමනය කරන්නේ. ඔය ඔක්කෝම බේසික් කෝස් එක අපිට උගන්වනවා. ලියුම යවන විදිය අරව මේවා මමත් චෙන්නායි ගිහිල්ලා අවුරුදු එක හමාරක් ඉන්න කොට අපිත් තොරතුරු දෙන්නේ එහෙමයි . රහසිගත තොරතුරු දෙන්නේ එහෙමයි. Priority නම් priority නැත්නම් අපි ඒක කියන්න ඕනේ මොකක්ද කියලා මේකේ අහපු ප්‍රශ්ණයට සර් සහරාන් හෂිම් හරි. මට රිල්වාන් සම්බන්ධයෙන් මට මතකයක් නැහැ. මිල්හාන් සම්බන්ධයෙනුත් මට ඇත්තටම මතකයක් නැහැ ඒක සහරාන් හෂිම් නම් මට හොඳට මතකයි

ප්‍ර අනිත් කට්ටිය?

උ මේකේ ඉන්නේ රිල්වානුයි, මිල්හානුයි. ආමි මොහිදින් , ආමි මොහිදින් අහලා තියෙනවා .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ආමි මොහිදින් කවුරු වශයෙන්ද අහලා තියෙන්නේ කවුද කියලා ?

උ ඔය මේ ඒ පැත්තේ චන්ඩියෙක් වගේ හිටපු කෙනෙක් සහරාන් හෂිම් එක්ක .

ප්‍ර ඔහු සම්බන්ධයෙනුත් තිබ්බාද වාර්තා ඇවිල්ලා TID එකට ?

උ ඒක බලන්න ඕනේ ස්වාමිනි මට එච්චර මතකයක් නැහැ.

**********

**<u>ගරු විනිසුරු අදිකාරි මැතිණිය.</u>**

ප්‍ර මිස්ට සිල්වා ඔබ 2018 වසරේදි නේද ඔබට අර ජපානයෙන් ලබා දුන්න අධි තාක්ෂණික මෙවලම් සහ රථවාහන සංඛ්‍යාව ලැබුනේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එහි වටිනාකම ඔබට දල වශයෙන් කියන්න පුලුවන්ද ?
කොතරම් වටිනා සම්පත් ප්‍රමාණයක්ද ඔබගේ කාර්යාලයට ලැබුනේ ?

උ කෝටි 3 ක් විතර. මම හිතන විදියට කෝටි 3 කට වඩා.

ප්‍ර දැන් ඔබ 2018 වසරේ අර සහරාන් අත්අඩංගුවට ගැනිම සඳහා open warrant එකක් ගත්තානේ ?

උ එහෙමයි.

ප්‍ර ඒ මොන මාසෙද ?

උ ජුලි මාසේ 2018 ජුලි මාසේ.

ප්‍ර ඔබට මේ උපකරණ ලැබුනෙත් 2018 ජුලි මාසේ හරි අගෝස්තු මාසේ හරි නේද ?

උ ජුලි හරි අගෝස්තු තමයි.

ප්‍ර එතකොට ඔබ මේ උපකරණ ලැබුනාට පසුව සහරාන් ගේ ඡායාරූප භාවිතා කරමින් ඔහුගේ අර අත්අඩංගුවට ගැනීමේ නිවේදනයක් ලබා ගත්තාට පස්සේ ඔහුගේ ඡායාරූපයක් මෙම අධිතාක්ෂණික උපකරණයට ඇතුල් කරලා ඔහු කොහේද සිටින්නේ කියලා සොයා බැලීමට උත්සාහයක් ගත්තාද ?

උ ස්වාමිනි වාහනයේ සහ ඊට අදාල ක්‍රියාකාරිත්වය මං පුර්ණ ලෙස කියන්නම් කොමිසමට එතකොට ස්වාමිනි පැහැදිලි වෙයි මොකක්ද ඒකෙන් අපිට කරන්න පුලුවන් කියලා .

ප්‍ර ඔබ දැන් කියන්නද හදන්නේ?

උ මොකද ඒක දැන් ඉදිරියේදිත් පාවිච්චි කරනවා නම් ඒක සෙන්ටිසිව් ඉෂු එකක් .

**********

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

ප්‍ර දැන් කෙටියෙන් උත්තරයක් දෙන්න ඒක ක්‍රියාත්මක කරන්න හැදුවද නැද්ද කියලා ?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ  ක්‍රියාත්මක කරන්න හදන්න ඉස්සෙල්ලා ඒ softwareඑක දාන්න ඕනේ .ස්වාමිනි. ඒ software එක දැම්මාම පස්සේ තමයි ඒක පුලුවන් වෙන්නේ.

**********

**ගරු විනිසුරු අදිකාරි මැතිණිය**

ප  softwareඑකක් දුන්නේ නැද්ද ඒ සමාගමෙන්?

උ  නැහැ ඒක අපි මිලදී ගන්න ඕනේ වාහනය තමයි අපේ ඉල්ලිමට දුන්නේ ඒකත් දීම සම්බන්ධයෙන් මං ස්තූති වන්ත වෙනවා එහෙම දෙන්න බැදිලා නැහැ ඒ ගොල්ලන්

ප  ඒ softwareඑක ඉතාම ගණන් software එකක්ද ?

උ  ඒහෙම තමයි.

ප  ගණන් ?

උ  එහෙම තමයි.

ප  ඒ නිසාද ඒ ලබා ගැනීම ප්‍රමාද වුනාද ?

උ  ඒක ස්වාමීනි මන් හිතන්නේ මං දාපු ෆයිල් එකෙත් ඒ software එකෙත් තියෙනවා මතක හැටියට ඒකට කියන්නේ facial recognition එතකොට ඒක දැම්මම තමයි ඉදිරියට යන්නේ.

ප  දැන් මෙම රථය ඔබගේ ඒකකයේ අවශ්‍යතාවයට ලබා දුන්න රථයක් නේ. මෙම රථය ඔබගේ ඒකකයෙන් අයින් කරලා කොහාටද දුන්නේ ?

උ  මං දන්නේ නැහැ අයින් කලා කියලා ස්වාමිනි.

ප  ඔබ භාවිතා කලේ නැහැනේද එම රථය?

උ  මම අත්අඩංගුවට ගන්න කම් නම් ටී. අයි. ඩී එකේ තිබ්බේ. දැන් කොහේ තියෙනවාද දන්නේ නැහැ ස්වාමිනි.

ප  ඔබ අත්අඩංගුවට ගත්තේ 2018 ඔක්තෝබර් 25 වෙනිදා නේද ?

උ  එහෙමයි.

ප  2018 ඔක්තෝබර් 26 මොකද වුනේ මේ රටේ ?

උ  රජය මාරුවුනානේ.

ප  මේ සියලුම සිදුවීම් මම දන්නේ නැහැ ඔබගේ නඩුවට අගතියක් වෙනවා නම් ඔබ උත්තරයක් නොදී සිටින එක හොඳයි සහ මමඉල්ලා සිටිනවා මගේ ප්‍රශ්ණය ඉවත් කරන්න කියලා ?

ප  ඔබ බුද්ධි නිළධාරියෙක් රාජ්‍ය බුද්ධි සේවයේ දීර්ඝකාලීන අත්දැකීම් තියෙන ඒවාගේම ශ්‍රීලංකා පොලිසියේ දිර්ග කාලීන අත්දැකීම් තියෙන ඒ වාගේම ශ්‍රී ලංකා පොලිසියේ දිර්ඝ කාලීන විමර්ෂණ අත්දැකීම් ඇති නිළධාරියෙකු ලෙස ඔබට කුමක්ද කිමට ඇත්තේ මේ සියලුම සිදුවීම් අතර පවතින සබඳතාවය ඒ කියන්නේ ඔබ මෙම ඔබගේ ඒකකය තාක්ෂණික ව ඉතාම දියුණු මෙවලම් භාවිතා කරමින් කිසියම් පුද්ගලයෙකු සොයා ගැනිමට උත්සාහ ගත්තා ඊට පස්සේ ඒ සඳහා ඔබට අවශ්‍ය සම්පත් නොලැබී යාම ඒ එක්කම ඔබ අත්අඩංගුවට

FAIR COMMENT BY JEZEEM

පත්වීම ඒ සමගම රජය මාරුවීම මේ කරුණු කාරණා අතර පවත්නා සබඳතාවය පිලිබඳ ව ඔබට කිසියම් අදහසක් තිබෙනවාද ?

උ ස්වාමිනි නඩු කටයුත්තට අගතියක් නොවෙන්න මං උත්තරයක් දෙන්නම්. රජය මාරුවිම සම්බන්ධයෙන් නම් මට මුකුත් කියන්න විදියක් නැහැ ඒක දේශපාලන. නමුත් මෙම බුද්ධි තොරතුර පොලිස්පතිතුමාට පැමිණි මොහොතේ මගේ පිලිගැනිම නම් මම එවෙලේ හිටියා නම් එතුමා මගෙන් අහනවා මෙහෙම තොරතුරක් ඇවිල්ලා තියෙනවා එන්න කියලා මට එන්න කියනවා අනිවාර්යයෙන්ම . ඇවිල්ලා මොකද ත්‍රස්තවාදයට අදාලයිනේ. නැහැ මගෙන් අහනවා එහෙමනම් අපි එදා කරපු ක්‍රමවේදය එතුමාට මං පැහැදිලි කරනවා මෙන්න මේ විදියට මේ විදියට කරන්න පටන් ගන්න කියලා . ගයිඩ් කරනවා මං පොලිස්පති තුමාව ඒ මගේ රාජකාරිය. මගේ රාජකාරිය ඩී. අයි. ජී. ටී. අයි. ඩී හැටියට. මගේ රාජකාරිය පොලිස්පතිතුමා ගයිඩ් කරන එක. ඒවා මං කොමිසමට ඉදිරි දිනයේදි ඕනේ නම් කියන්නම් . මේ ගයිඩන්ස් එක මට එතුමාට දෙන්න මම ඉගෙන ගත්තා අර කාලේ කොහොමද අපි කොළඹ ප්‍රහාරවල් වැලැක්කුවේ අපි සුපර් මෑන්ලා නෙවේ අපි කරා යම් ක්‍රියා මාර්ගයක් ගත්තා. ඒ තමයි මිනිසුන් දැනුවත් කිරීම මේ තොරතුර ආපු වෙලේ අර වෝන්ටඩ් කියන මාධ්‍ය මගින් ප්‍රසිද්ධ කරානම් ෆොටෝස් ටික දාලා මෙන්න මෙයා අවශ්‍යයයි ඉදිරි ප්‍රහාරයක් කියන්න බැරිනම් මොකක්හරි අවශ්‍ය කරනවා මෙයා ගැන තොරතුරු දෙන්න මෙයා ගැන අවදානයෙන් ඉන්න කියලා ගැහුවානම් අර 19 වෙනිදා උදේ සහරාන් ගිහිල්ලා තිබ්බනේ ට්‍රයල් රන් එකක් ෂැන්ග්‍රිලා හෝටලයට උදේ මාධ්‍යයෙන් මං දැක්කා ඒක. සිකුරාදා උදේ trial ran එකක් ගිහිල්ලා තිබ්බා restaurant එකට බලන්න. කොහොමද වෙන්නේ කියලා . ඇත්තටම එයා තමයි surveillance එකක් කරලා තියෙනවා එයා. එයා surveillance එකක් කරලා. එතකොට එයා surveillance එකක් කරලා trial ran එක ගිහිල්ලා තමයි ඊලගට ඇටෑක් එක දුන්නේ. එතකොට අර වැඩේ අර විදියට දාලා තිබ්බා නම් පත්තරයේ හරි කොහේ හරි සෙකියුරිටි එක්කනා දන්නවානේ ස්වාමිනි මේ ඇවිල්ලා ඉන්නේ පත්තරයේ ඉන්න මිනිහා නේද කියලා. ඒ මිනිස්සු දන්නේ නැහැ මුකුත් . එතකොට මේ හෝටල් මැනේජර්ස්ලට එහෙම නැන්තම් පල්ලියට කියන්න තිබ්බා ඒවා ප්‍රශ්ණයක් නෙමේ මොකක්ද ඕක දැන් පැහැදිලිව අරකේ තියෙනවානේ මරාගෙන මැරෙන්න යන්නේ කියලා. ඉතින් තවත් මොනවද අපිට ගන්න තියෙන නෑ නෑ මේක මේක වුන් නැත්නම් මම නම් ස්වාමීනි මම ගැන මේ කථා කරන්නේ මම දැන් මේක කියලා වුන් නෑ කියමුකෝ . වුන් නැති එක සන්තෝෂෙට කාරණාවක් නේ. මම මොනවහරි කරපු හින්දා. අපි පත්තරයේ දාලා මිනිස්සු දැනුවත් කරලා

FAIR COMMENT — BY JEZEEM

යම් සතුරාට ක්‍රියාත්මක වෙන්න තියෙන අවස්ථාව අපි එයාට අඩියක් පස්සට තියන්න ක්‍රමවේදයක් හදලා තියෙනවා අපි සතුරට වඩා අඩි දෙකක් ඉස්සරහට යන්න ඕනේ. සතුරාට ක්‍රියාත්මක වෙන්න බැරි තත්වයක් අපි උදා කරන්න ඕනේ එයාට චකිතයක් ගේන්න ඕනේ. එයාට ප්‍රශ්ණයක් ඇති කරන්න ඕනේ. එතකොට පත්තරයේ ෆෝටෝ ගිහිල්ලා මේවා වුනාම චකිතයක් එනවා දැන් මම එලියට ගියාම මාය අදුරාගනිද මාව අල්ලා ගනීද මොනවා වෙයිද. චකිතයක් එන්න ඕනේ. එතකොට මේ ක්‍රමවේදයත් එක්ක ගත්තාම හුඟක් තියෙනවා ස්වාමිනී අර අන්තිම දවසේ කියන්නම්. ස්වාමිනි මගේ අත්අඩංගුවට ගැනීම තිබුනේ නැත්නම් මගේ මතය නම් මම සුපර් මැන් කෙනෙක් නෙවේ මගේ මතය නම් මම අනිවාර්යයෙන්ම පොලිස්පතිතුමාවත් ගයිඩ් කරලා එයාට කියනවා මෙන්න මේ විදියට කරලා අපි කාදිනල් තුමා දැනුවත් කරලා පල්ලි ටික වස්සලා ඒවා කරන්න ඕනේ කියලා. ඕක මහ ලොකු දෙයක් නෙමේ අපි ඉස්සරත් ඕවා කරා. මහින්ද රාජපක්ෂ ජනාධිපති තුමා පත්වුනාට පස්සේ එතුමාගේ ආරක්ෂක අංශයත් සමග සෘජුව සම්බන්ධ වෙලා එතුමා ඇතුලු එතුමාගේ පවුලේ සියලුම ගමන් බිමන් වලට ආවේක්ෂණ රාජකාරි යොදලා ඒ වට ආරක්ෂාව දෙන්න පි.එස්. ඩි. එකට සහයෝගය දෙන්න එස්. අයි. එස් . එක පත් කරේ මාව. මාව පත් කරේ. ඒ දවස්වල වැඩ ඔක්කෝම දෙනවා. එතකොට එතුමා කොහේ ගියත් එතුමාගේ පවුලේ උදවිය කොහේ ගියත් අපි ඒ ආරක්ෂාව දෙනවා. උදේද දවල්ද රෑද ඕනේ වෙලාවක දෙනවා කොහේ ගියත් මගේ ටීම් එකක් වෙනම ලෑස්ති කරන් හිටියේ ඒකට. අපි එතුමාගේ ජීවිතය රැක්කා යුද්ධ කාලේ ඒ වගේ දාලා ඒවාගේ ගන්න ඕනේ පියවරවල් ටික ගන්න ඕනේ.

ප්‍ර මිස්ට නාලක සිල්වා ඔබ තමයි මෙම කොමිසම හමුවේදි කරුණු ඉදිරිපත් කලේ මෙම තොරතුරු මට ලැබුනා නම් මම කාදිනල්තුමා ට සංචාරක හෝටල් කළමණාකරුවන්ට දන්වනවා ඒ මගින් ප්‍රහාරයක් වැලැක්වුනානම් ඒ තුලින් මට සතුටුවෙන්නට පුලුවන් කියලා . නමුත් මෙම කොමිසම හමුවේ සාක්ෂි ඉදිරිපත් කරන ලද පොලිසියේ ඉතාම ඉහල තනතුරුවල සියලුම නිළධාරීන් ප්‍රකාශ කලේ මේක පිළිබඳව අපි කටයුතු කරලා මෙම ප්‍රහාරය සිදු නොවුනානම් අපිට විනයානුකූලව කටයුතු කරනවා අපිට රැකියාව අහිමි වෙනවා එවැනි පිළිතුරු තමයි මෙම කොමිසමට ලබා දුන්නේ ඔබ වෙනත් ආකාරයකින් පිළිතුරක් ලබා දීම සුවිශේෂී දෙයක් ලෙස තමයි මෙම කොමිෂම දකින්නේ. ඔබට කියන්න පුලුවන්ද ? ඔබ සිටියා නම් ඔය දේ කරනවා කියනවානේ. පොලිස් දෙපාර්තමේන්තුව තුල පොලිස්පතිතුමා සමඟ වැඩ කරන නිළධාරින් සංඛ්‍යාවක් සිටිනවානේ රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියත් නිලන්ත ජයවර්ධන මහත්මයාත් පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙක් ඔය

FAIR COMMENT BY JEZEEM

කිසිවෙකුටත් ඇයි බැරිව ගියේ පොලිස් පති තුමාට කියන්නට මේ කොල කෑල්ල දැක්කට පස්සේ පොලිස්පතිතුමනි හෝ සර් මේක මෙහෙම සරලව ගත යුතු දෙයක් නෙවෙයි ඔබ සඳහන් කර ආකාරයකට contingency එකක් හදන්න ඕනේ වහාම රැස්වීමක් තියමු වහාම ලේකම්තුමා හම්බ වෙමු වහාම ජනාධිපතිතුමාව දැනුවත් කරමු එවැනි දේවල් කියන්නට ඇයි පොලිසියේ කිසිවෙකුටවත් බැරිවුනේ?

උ ඒක තමයි මටත් තියෙන ප්‍රශ්ණය ස්වාමීනි. මොකද මම නිවැරදි කිරීමක් කරන්න ඕනේ ස්වාමීනි මම හිටියානම් කාදිනල්ට දැනුවත් කරන්න නෙවේ මම එහෙමනම් කියනවා පොලිස්පතිතුමාට මේ මේ විදියට කරන්න කියලා මොකද පල්ලිය නම් අඩුම ගානේ අපි කාදිනල්තුමා අමතක කරලා දාමුකෝ ඒ ඒ සිනියර් ඩි. අයි. ජී. මහත්වරු , ඩි. අයි. ජී. මහත්වරුන්ට සම්මන්ත්‍රණයක් තියලා කිව්වා නම් ඕගොල්ලන්ගේ ඒරියා එකේ ෆාදර්ස්ලා දැනුවත් කරන්න කියලා ඒ ගොල්ලන් ඒක දැනුවත් කරන්න ඕනේ හෝටල් කළමණාකාරිත්වය දැනුවත් කරන එක මොකද අපි එල්. ටී. ඊ කාලේ ගත්තොත් හෝටල් වලට තර්ජනයක් තිබ්බා. ලොකු තර්ජනයක් තිබ්බා එතකොට අපි ගිහිල්ලා හෝටල් කළමණාකාරිත්වයට මම ගිහිල්ලා කථා කලා මගේ ඕ. අයි. සිත් කථා කලා. නිළධාරින් වෙනම පත් කලා. පත් කරලා කළමණාකාරිත්වයට කිව්ව එකක් තමයි හැමදාම උදේට අපිට කියන්න ඕනේ ඕගොල්ලන්ගේ මට්ටමින් සැක කව්ද ඇවිල්ලා ඉන්නේ වෙකින් කරලා ලිස්ට් එක නම් ලිස්ට් එක ලිස්ට් එක දෙන්න බැහැ කිව්වා පුද්ගලිකත්වය අරවා මේවා කියලා නමුත් අපි ඒකත් ගත්තා කොහොමහරි ඒ සැක කවුරු හරි හිටියා නම් අපි එවෙලේම ඒ කාමරය හෝ ඒ පුද්ගලයා වෙක් කරනවා වෙක් කරන්නේ පොලිසිය ඔස්සේ . ඒ වගේ පුලුවන් Preventive measures ඇති වෙන්න ගන්න එතකොට අපි කියමුකෝ එහෙම ගත්තයි කියලා එහෙම බුද්ධි තොරතුරක් හින්දානේ ඒක කරේ අපි එතකොට කාටවත් විනය පියවර ගන්න බැහැනේ වුන්නැත්නම් බුද්ධි තොරතුරක් මතනේ අපි මේ ක්‍රියාත්මක වෙලා තියෙන්නේ ඒක උන් නැත්නම් අපි සන්තෝෂ වෙන්න ඕනේ. වුනායින් පස්සේ මොකක්ද දැන් කියන්නේ ඊට පස්සේ.

ප මොකක්ද ඔබ ඒකෙන් අදහස් කරන්නේ ඇත්ත වශයෙන් මෙම කොමිසම හමුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිළධාරින් ප්‍රකාශ කරපු ආකාරයේ දෙයක් සිද්ධ වෙන්නේ නැහැ ඇත්ත වශයෙන්ම ඔවුන් මේ පිළිබඳව කටයුතු කරලා මේ ප්‍රහාරය වලක්වා ගත්තානම් නේද ?

උ තමන් කළ යුතු රාජකාරිය තමන් කලා නම් යමක් වෙලා තියෙන්න ඕනේ ගරු ස්වාමීනි අඩු ගානේ එක බෝම්බයක් හරි මැඩපැවත්වෙලා තියෙන්න එපායි මේක කෙලින්ම ඔක්කොම ගියානේ . කතෝලිකයෙක් හැටියට මම බොහොම කනගාටු වෙනවා දුක් වෙනවා ඒ සම්බන්ධයෙන්

FAIR COMMENT BY JEZEEM

පල්ලිවලට මම හිටියානම් මමත් එදා දවසේ කොච්චිකඩේ පල්ලියේ තමයි ඉන්නේ නමුත් එලියේ හිටියා නම් අපිට මිට වඩා යමක් කරන්න තිබ්බා කියන මතයේ තමයි මන් ඉන්නේ. නඩුවට අගතියක් නොවෙන්නයි මම උත්තර දෙන්නේ ස්වාමිනි.

ප්‍ර ඔබ සඳහන් කලා මෙම කොමිසම හමුවේදි මද්‍රාසා පාසැල් වල පවත්නා කටයුතු පිළිබඳව ඔබගේ විමර්ෂණවලදි හමුවි ඇති තොරතුරු අනුව මෙම මද්‍රාසා පාසැල් පවත්වන්නෙත් ලංකාවේ සාමාන්‍යයෙන් පාසැල් පවත්වන වේලාවල්වලදීද ? පෙරවරු හතහමාර සවස එක හමාරද එහෙම නැත්නම් කොහොමද මද්‍රාසා පාසැල් පවත්වන කාලය ?

උ ඒකට නම් මට නිසි උත්තරයක් දෙන්න මතකයක් නැහැ පොඩ්ඩක් අවුට් ඔෆ් ටච්

ප්‍ර මොකද ඔබ සඳහන් කලා මෙම ඉස්කෝල වල අධ්‍යාපනය නොලබනවා මේවා වලට යන ළමයි ඒක නිසා ඔවුන් ආගම විතරක් අධ්‍යයනය කිරීම තුලින් ඔවුන් එක්තරා අන්තයකට ගොස් ඔවුන්ටම ආවේණික වූ සමාජ ක්‍රමයක් නිර්මාණය කරගෙන ඉවත්වීමට උත්සාහ වීමක් සිදුවීම තුලින් ආගමික අන්තවාදය ත්‍රස්තවාදය කරා යාම දක්වා වර්ධනය වීමට මද්‍රාසා පාසැල් වලින් හැකියාව තියෙනවාද?

උ හැකියාව තියෙනවා.

ප්‍ර නමුත් ඔබ දන්නේ නැහැ මේ මද්‍රාසා පාසැල් කියන්නේ පාසැල් පද්ධතිය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ආකාරයෙන්මද ක්‍රියාත්මක වෙන්නේ කියන එක ?

උ මොකද මම දන්න තරමින් ස්වාමීනි මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවෙන්නේ ඕක රෙජිස්ටර් වෙලා කරගෙන යන්නේ මම දන්නේ නැහැ අධ්‍යාපන අමාත්‍යාංශයේ රෙජිස්ටර් වෙලා නැද්ද කියලා නමුත් අපි දැක්කේ ඒක නිකම් අසාමාන්‍යයයි. ඒ හින්දා තමයි අපි ඒදා ඒ තින්දු තීරණ ගන්න වුනේ.

ප්‍ර මද්‍රාසා පාසැල් නියාමනය කිරීම සම්බන්ධයෙන් මොකක්ද ඔබට මෙම කොමිසම හමුවේ කීමට තිබෙන්නේ ? කොහොමද මෙම මද්‍රාසා පාසැල් නියාමනය කරනවා නම් කල යුත්තේ ? මේවා වසා දැමීම සාර්ථක පිළිතුරක් වෙනවාද නැත්නම් තවදුරටත් ගැටළුව වැඩිවීමේ තත්වයකට යා හැකිද?

උ මද්‍රාසා පාසැල් කියන එක වසා දමන්න පුලුවන් නම් ඒක හොඳයි නමුත් ඒක කරන්න බැරි දෙයක්නේ . ඒක තර්කානුකූල නැහැ. එතකොට මොකද දහම් පාසැල් කියන එක ඔනෑම ආගමක මද්‍රාසා හැර ඉරිදා දවස්වල තියෙන්නේ ඒකේ මගේ ළමයිනුත් යනවා. ඒවායේ ආගම කියලා දෙනවා මිසක් ඉන් ඔබ්බට යන්නේ නැහැ. මේ මද්‍රාසා කියන එකේ අනිත් දේ තමයි මම දකින දේ මම රාජ්‍ය බුද්ධි සේවයේදිත් කිව්වේ පිටරටින් එනවා දේශකයෝ මෙන්න මේ දේශකයෝ පාලනය

FAIR COMMENT BY JEZEEM

වෙන්න ඕනේ . මේ දේශකයෝ ඇවිල්ලා මොනවද කියන්නේ මොන අදහස්ද දරන්නේ ඒ අදහස් මොනවද මේ ළමයින්ට දාන්නේ කියන එක නියාමනයක් තියෙන්න එපායි එහෙනම් ඒ වගකීම ගන්න ඕනේ මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තුව. ඒ වගකිම ගන්න ඕනේ ඒ ලෙක්චර කියන දේ පිළිබඳ සම්පූර්ණයෙන්ම වගකීම ගන්න ඕනේ එහෙම නැත්නම් අපේ රටේ ඉන්න ලෙක්චර්ස් ලා දාලා හරි කරන්න කියන්න . නමුත් අපි පිටින් ආවම දන්නේ නැහැනේ ස්වාමිනි මෙයා මොනවද කියන්නේ මොනවද කරන්නේ කියලා.

ප දැන් එම දේශකයන් අපේ රටේ දේශකයන් වුනත් මද්‍රාසා පාසැලක් ඇතුලට දැම්මාට පස්සේ ඔහු මොනවද උගන්වන්නේ කියන එක දැන ගන්නට ක්‍රමයක් නැහැනේ මේ බුද්ධි අංශ විසින් කවුරුන්හරි ඉස්ලාම් ශිෂ්‍යයෝ හැටියට ඇතුලට දාලා තොරතුරු හෙව්වේ නැත්නම්?

උ පුලුවන් ස්වාමීනි බුද්ධි අංශයක් කියන්නේ ඕක කරන්න ඕනේ. බුද්ධි අංශයක් තියෙන්නේ ඒකට තමයි. පල්ලියටත් දාන්න ඕනේ මද්‍රාසා පාසැලටත් දාන්න ඕනේ ඔක්කොටම දාන්න ඕනේ.

ප එහෙම දාන සැලැස්මක් තිබුනාද ඔබ මේ ආගමික අන්තවාදය පිළිබඳව අර අංශයක් ස්ථාපිත කරලා කටයුතු කරපු කාලේදි ඔය ඉස්ලාම් මද්‍රාසා පාසැල් සහ විශේෂයෙන්ම ඉස්ලාම් පල්ලි තියෙන්නේ සිකුරාදා විශේෂ දේශණාවක් එම පල්ලි වලට දැම්මාද ඔය කියන තොරතුරු සෙවීම සඳහා සිකුරාදා ඒ ගොල්ලන්ගේ ජුම්මා මස්ජුත් පල්ලි සිකුරාදා ඒගොල්ලන්ගේ ආගමික දේව මෙහෙය සහඊට පස්සේ පවත්වනවානේ දේශණවක් ?

උ ඔව් ස්වාමිනි

ප ඒ දේශනාවලදි තව්හිද් ජමාද් ඉස්ලාම් දේවස්ථානවල ආගමික අන්තවාදි දේශණා පවත්වන බවට තොරතුරු බුද්ධි තොරතුරු විශාල වශයෙන් ලැබිලා තියෙනවා මෙම කොමිසමටත් එතකොට ඔබගේ ඒකකය ඔය 2014 පිහිටවූ දවසේ සිට ඔබලා මේ පිලිබඳව සොයා බැලුවාද ?

උ ස්වාමිනි ඒකකය මා දන්න තරමින් 2002 වගේ තමයි ආරම්භ කරලා තියෙන්නේ මුස්ලිම් අන්තවාදය . මම 2014 එනකොට කරේ දෙක එකතු කරන එකක් වුනේ මොකද පරිපාලනයට ලේසි වෙන්න මොකද මට උතුරු නැගෙනහිර දෙකත් දුන්නාම පරිපාලනයට ලේසි වෙන්න බුද්ධි තොරතුරු රැස්කරන්න ලේසි වෙන්න තමයි ඒ දෙක එකතුකරලා දුන්නේ පරිපාලනයට එතකොට නමුත් ඔය අංශය ඒ කාලේ ඉඳන්ම තිබ්බා. එතකොට ඒකට හරියන්න තමයි ඒ නිළධාරින් අනුයුක්තගත කරලා තිබ්බේ උදාහරණයක් ගත්තොත් එල්. ටී. ටී. ඊ කේස් එකේදි දෙමල නිළධාරින් ලොකු සේවයක් අපිට කලා ඒ ගොල්ලන් තමයි අපි දැම්මේ තොරතුරු ලබා ගන්න. ගම්මාන ඇතුලට දැම්මා සමහර එල් .

FAIR COMMENT BY JEZEEM

ටී. ටී. ඊ. ඇතුලට ඇතුලේ කට්ටිය පවා රන් කරන්න පුලුවන් වුනේ ඒ දෙමල නිළධාරින් හින්දා අපිට මුස්ලිම් නිළධාරිගෙනුත් අපි බලාපොරොත්තු වෙන්නේ ඔය ජුම්මා එකට ගියාම ඉතින් රටට යම් අහේනියක් වන ජාතික ආරක්ෂාවට යම් තර්ජනයක් වෙන වැඩක් තියෙනවා නම් කියන එක. ඉතින් ඒක නියමානුකූලව ඒ කාලේ සිදුවුනා කියන එක මට කියන්න පුලුවන් නමුත් ඉන් ඔබ්බට.

ප්‍ර ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ සිටින කාලේදි සිද්ධ වුනාද එහෙම දෙයක් මෙම මද්‍රාසා පාසැල් සහ ජුම්මා මස්ජිත් පල්ලි වල සිකුරාදා දේව මෙහෙයෙන් පසු දේශණය පිළිබඳව මේ ඒවා ආවේශණය කිරිමක් සිද්ධ වුනාද? රාජ්‍ය බුද්ධි සේවයේ ඔබ රාජකාරි කරන කාලයේ ?

උ මගේ නියෝගයක් තිබ්බේ ස්වාමිනි දැන් ඔය නිළධාරින් යනවානේ හැම නිළධාරියෙක්ම පුජාවට යනවානේ ගිහිල්ලා ආවන් පස්සේ ඒතම ඕ. අයි. සි. ට දැනුවත් කරන්න ඕනේ. සියලු දෙයක්ම. මොනවද වුනේ මොනවහරි කිව්වාද ඒක. ඕ. අයි. සි. තමයි ඊට පස්සේ සහකාර අධ්‍යක්ෂ මගින් මට වැදගත් දේ එවන්නේ. මම ඊට පස්සේ අධ්‍යක්ෂක තුමාට යවනවා. ඉතින් මද්‍රාසා පවා ඒ ස්ථානාධිපති මට නම කියන්න පුලුවන් වෙන දවසක ස්ථානාධිපතට පවරලා තිබ්බේ ඒ මද්‍රාසා ආවේක්ෂණය කරන්න කියන්න ඒ සම්බන්ධයෙන් සොයා බලන්න වෙනම ඒ නිළධාරින් යොදවලා ඒ ඒරියා එකේ නිළධාරින් තමයි කරන්න ඕනේ.

ප්‍ර ඒ කියන්නේ මුස්ලිම් නිළධාරින්ද ඔබ අදහස් කරන්නේ ?

උ මුස්ලිම්.

ප්‍ර ඔබ මෙම කොමිසමේ ප්‍රකාශයක් ලබා දුන්න ප්‍රකාශයක සඳහන් කරලා තියෙනවා මුස්ලිම් නිළධාරින් යැවිම තමයි සුදුසුයි කියලා ඔබ අදහස් කරනවා නමුත් බොහොමයක් එම තොරතුරු ලබා දිමේදි එම යම් චකිතයක් පෙන්නුම් කල අතර එයට හේතුව ලෙස මා දකින්නේ තමන්ගේ ආගම ගැන සහ ජාතිය ගැන විමර්ෂණයක් සිදු කරනවා යැයි ඔවුන් තුල පිලිගත නොහැකි අදහසක් මුල්බැස තිබුනා ඔබ එය වෙනස්කිරිමට ඔවුන්ට උපදෙස් දුන්නා කියලා ?

උ ඔව්

ප්‍ර මොකක්ද ඔබ ඒකෙන් කියන්නට අදහස් කරන්නේ ඇත්ත වශයෙන්ම එහෙම තත්වයක් තියෙනවාද මුස්ලිම් නිළධාරින්ට තමන්ගේ ආගම කෙරෙහි ඇති අසීමිත බැඳිම නිසා සහ ඔවුන් දෙවියන්ව විශ්වාස කිරීම නිසා ඔවුන් ඇවිල්ලා පල්ලියක මෙන්න මේ වගේ දෙයක් ආගමික අන්තවාදි දේශණයක් පවත්වනවා කියලා කියන්න එකට තියෙන අවස්ථාව අඩුයි කියලා කියන එකද ඔබ මේකෙන් කියන්නට උත්සාහ කෙරේ?

FAIR COMMENT
BY JEZEEM

උ ස්වාමිනි මම ගෞරවයෙන් ඉල්ලනවා ඕක අර බුද්ධි අංශයකට අදාල දෙයක් හින්දා සෙන්සිටිව් හින්දා මම කොමිසමට ඒක අනිවාර්යයෙන්ම කියන්නම් ඉදිරියේදි.

ප්‍ර දැන් ඔබ සඳහන් කලානේ ආගමික දේශකයින් ලංකාවට එන එක ගැන ඔබ 2014 වසරේදි ජාතික බුද්ධි ප්‍රධානි ආරක්ෂක අමාත්‍යාංශය යටතේ රාජකාරි කල ජාතික බුද්ධි ප්‍රධානීගේ කාලයේදි 2015 ට පෙර විදේශවල් වලින් පැමිණි එහෙම ඉස්ලාම් ආගමික දේශකයන් විශාල සංඛ්‍යාවක් පිටුවහල් කරපු බව ඔබ දැනගෙන හිටියාද ? 100 කට අධික සංඛ්‍යාවක් වගේ තමයි මගේ මතකේ නිවැරදි නම් කරුණු ඉදිරිපත් වුනේ.

උ පිටුවහල් කරන්න ඇති ස්වාමීනි වීසා problem එක ආපු වෙලාවේ මට මතක හැටියට හුහක් කට්ටිය පිටුවහල් කලා වීසා ඒ කියන්නේ උදාහරණයක් ගත්තොත් ලෙක්චර් එකක් දෙන්න එන්න ඕනේ නියමානුකූලව වීසා අරගෙන ටුවරිස් වීසා එකෙන් ඇවිල්ලා ලෙක්චර්ස් දෙන්න එන්න බැහැ. එතකොට ඒ වගේ ඒවා වාර්තා කරලා තිබ්බා නම් ඒ වීසා නීති උල්ලංඝණය කිරීමට අදාලව deport කරන්න ඇති ස්වාමීනි නැත්නම් repatriate කරන්න ඇති.

ප්‍ර ඔබ රාජකාරි කරන අවදියේදි පවා ඔබ බරපතල ප්‍රශ්ණයක් බව අවබෝධ වී තිබුනානේ මේ රටේ විදේශිය ඉස්ලාම් ආගමික දේශකවරුන් මද්‍රාසා පාසැල් වල දේශනා පැවැත්වීම ගැන . ඔබ විසින් ආරක්ෂක අමාත්‍යාංශයේදි කරන ලද සාකච්ඡා වලදී මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතුයි කියලා මේ කරුණු කාරණා කථා කරලා ඒ කියන්නේ මේ කණ්ඩායමක් ආපුහාම ඒ ගොල්ලන්ව යවනවා ඊට පස්සේ ආයේ තව කණ්ඩායමක් එවනවා . ඊට පස්සේ ඒ ගොල්ලන් යවනවා වගේ නැතුව මේ වගේ මොකක් හරි ක්‍රමවේදයක් නීති රෙගුලාසි ගැසට් කිරීමක් එවැනි කටයුත්තක් සිදු වුනාද ?

උ මට මතකයි එක සැරයක් ඕක විශාල ලෙස සාකච්ඡා කරලා ඊට පස්සේ කරුණාසේන හෙට්ටිආරච්චි ලේකම්තුමා ඔය Emigration කට්ටියත් ගෙනල්ලා මට මතකයි ලොකු සාකච්ඡාවක් කලා වීසා දීම සම්බන්ධයෙන් ඔය subject එකට අදාලව මොකද ඔය බුද්ධි අංශ කීපයක් පැමිණිලි කලා. ඒ පැමිණිලි වලත් එක්ක තමයි සාකච්ඡා කලා අපිත් සාකච්ඡා කලා අපේ අදහසුත් දිලා ඒකට යම් ක්‍රියා මාර්ගයක් ගන්න එතුමා වෙර දැරුවා මම දන්නේ නැහැ එතනින් ඔබ්බට මොකක් වුනාද කියලා ඒක බුද්ධි අංශයත් සමඟ ගිය මෙහෙයුමක්.

ප්‍ර ඔබ සම්බන්ධ වුනාද 2015 වසරේ සිට ප්‍රතිශස්ත්‍ර පනතක් අලුතින් ඇති කිරීම සඳහා කටයුතු කරන අවස්ථාවට ඔබ සහභාගි වෙලා තියෙනවාද ?

උ එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ පනත අලුතින් ඇති කරන්න අවස්ථාවේදි මේ ඔය විදේශ රටවල් වලින් ඉස්ලාම් ආගමික අන්වාදයේ දේශණා පවත්වන දේශකයන් ඒම වැලැක්වීම සදහා කිසියම් නීතිමය ප්‍රතිපාදනයන් එම පනතට හෝ ඇතුල් කරන්න ඕනේ කියලා සාකච්ඡා වුනාද ?

උ ඔව් ස්වාමිනි මට මතක හැටියට නම් පොලිස්පතිතුමා වෙනුවෙන් තමයි මං සහභාගි වුනේ හ එතකොට එතුමා ඒ කමිටුවේ හිටියා. එතුමා වෙනුවට තමයි මං සහභාගි වුනේ. ඒකෙදි පැහැදිලිව මං ප්‍රකාශ කරපු එකක් තමයි දැන් තියෙන PTA එකට වඩා ප්‍රබල එකක් අවශ්‍යයයි අපේ රටට . විශේෂයෙන්ම විදේශීය ත්‍රස්තවාදීන් ගෙන් අපේ රට බේරා ගන්න .එතකොට දැන් තියන PTA එකෙන් මම හිතන්නේ එච්චරම අපිට අර විදේශ රටක මොනව හරි කරලා ලංකාවට ආවොත් එහෙම ඒ මිනිහට ඇක්ෂන් එකක් ගන්න ටිකක් අමාරුයි. එතකොට ඒ වගේ දේශකයෝ කෙසේ වෙතත් විදේශියව සිදුවන ක්‍රියාකාරකම් විශේෂයෙන්ම අයි. එස් අයි. එස් ඇතුලු ඒ ක්‍රියාදාම වලට අදාලව ලංකාවේ ක්‍රියාත්මක වෙන්න පුලුවන් විදියට ප්‍රබල පනතක් හැදුවා සොරි Draft එකක් හැදුවා.

ප්‍ර දැන් ඔබ මෙම කොමිසමට පෙටෝ සංවිධානය පිළිබඳව ඔබ ඉල්ලූ තොරතුරු නොලැබූ බව ප්‍රකාශ කලා නේ ?

උ එහෙමයි.

ප්‍ර නේද ?

උ එහෙමයි.

ප්‍ර ඔබ ඇත්ත වශයෙන්ම කීවොත් ශ්‍රී ලංකා පොලිසියේ ඉතාමත්ම ඉහළ බුද්ධි නිළධාරියෙක් ඒ වගේම විමර්ෂන විශේෂඥයෙකු ලෙස කටයුතු කරලා තියෙනවානේ ?

උ එහෙමයි.

ප්‍ර ඔබට ආරක්ෂක අමාත්‍යාංශයේ හෝ එස්. අයි. එස්. එක පෙටෝ සංවිධානය ගැන තොරතුරු ලබා නොදුන් අවස්ථාවකදි ඔබට ස්වයං අභිප්‍රේරණයකින් යුතුව ඔබගේ රිසර්ච් ඇන්ඩ් Development unit එක ලවා මේ පෙටෝ සංවිධානය ගැනි හෙවිමට අවස්ථාවක් නොතිබුනාද ?

උ ස්වාමිනි මෙතන ආපු තොරතුර තමයි පෙටෝ සංවිධානයට අදාල සාමාජිකයින් වගයක් ලංකාවට ඇවිල්ලා ඉන්නවා ඒක සම්බන්ධයෙන් ඒ තානාපති කියපු එකක්. ස්වාමිනි කියපු විදියට මට පුලුවන් Research and Development එක දාලා ඒක කරන්න. නමුත් දැන් මම ඉල්ලන්නේ ඒ පුද්ගලයින්ගේ නම් ලිස්ට් එකනේ ඒ ඉන්න තැන් ඇතුලු නම් ලිස්ට් එකනේ ඒකයි මම ඉල්ලන්නේ ඒක නැතුව මට බැහැ මගේ තියෙන වපසරියයි මගේ තියන සිමිත මෙව්වත් එක්ක දැන් මුලු ලංකාවට පිර පිර ඒ කට්ටිය හොයන්න බැහැ. නමුත් ඒක තියෙන එක්කනා ඉන්නවා

FAIR COMMENT BY JEZEEM

එයාට පුලුවන් ඒක දෙන්න අපිට පුලුවන් ඒක ගිහිල්ලා මේව කරන්න රිසර්ච් එක දාලා කරත් ඒ ලංකාවට ආව කට්ටිය ගැන අනාවරණය වීමක් වෙන්නේ නැහැ මම දන්න තරමින්. ඒක සංවිධානය ගැන අනාවරණය වීම නෙවෙයි ලංකාවේ ඉන්න කට්ටිය ගැන අනාවරණය වෙන්නේ නැහැ.

ප්‍ර දැන් ඔබ රිසර්ච් ඇන්ඩ් Development unit එක හරහා පෙටෝ සංවිධානය ගැන හෙව්වා නම් ඔබට ලැබුණු තොරතුරු මත ඔබ පොලිස්පතිතුමාට කියනවා මෙම සංවිධානය ඉතාම භයානක ත්‍රස්තවාදී සංවිධානයක්. තුර්කියේ ඔවුන් අපේ රටේ යම් යම් ක්‍රියාකාරකම් කිරීම තුලින් ත්‍රස්තවාදීන් හෝ ආගමික අන්තවාදි කටයුතු සිදුවෙලා මේක ජාතික ආරක්ෂාවට මේක බලපාන්නට පුලුවන් කියලා ඔබට තිබුනානේ පොලිස්පතිතුමාට කියන්නට මේ තොරතුරු කොහොමහරි ආරක්ෂක අමාත්‍යාංශයෙන් හෝ එස්. අයි. එස් එකෙන් ලබා ගැනිමට කටයුතු කරමු කියලා ?

උ ඔය ස්වාමිනි කියන දේ මගේ ලිපිය අර ලිපිය යවපු වෙලේ ලිපිය මම බයි හැන්ඩ් ගිහිල්ලා බාර දෙන කොට මම සියල්ලක්ම පැහැදිලි කලා පොලිස්පතිතුමාට මෙන්න මේ මේ හේතු මත තමයි මේ රැස්වීමට යන්න කැමති නැත්තේ මොකද මම කියනවා නම් මට තොරතුරු ඕනේ කියලා ඒ තොරතුරු මට ලබා දෙන්නේ නැත්නම් ඒ රැස්වීමට වෙනත් හේතු මත මට ඒ රැස්වීමට යන්න බැහැ මට එම නිසා කරුණාකරලා මේ ක්‍රමවේදය මට හදලා දෙන්න කියලා නමුත් අපි ඒ රැස්වීම කඩා කප්පල් කලේ නැහැ මං වෙනුවෙන් අධ්‍යක්ෂක තුමා ගියා.

ප්‍ර ඔබ 2018 /10 / 25 වෙනි දින දක්වාම රාජකාරි කරන කොට සහරාන් පිළිබඳව හෙව්වානේ ඔහුගේ නැෂනල් තව්හිද් ජමාද් සංවිධානය ගැන

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඔබ ඒ කරුණු සෙවිමේදි ඔබට ජමාතේ මිල්ලතු ඉබ්‍රාහිම් කියන සංවිධානය පිළිබඳ තොරතුරු වාර්තා වුනාද ?

උ තොරතුරු වාර්තා වෙන්න ඇති ස්වාමිනි මට දැන් නම නම් මතකයි නමුත් තොරතුරු සම්බන්ධයෙන් මට ඩෙකියුමන්ට් බලන්නේ නැතුව මට කියන්න ටිකක් අමාරුයි. නම නම් මතකයි.

ප්‍ර ඒකේ නායකයා කවුද කියලාවත් මතකයක් තියෙනවාද ?

උ මතක නැහැ ස්වාමීනි.

ප්‍ර උමායිඩ් මොහොමඩ් කියලා කෙනෙක් හැටියට යෝජනා කලොත් ඔබට ?

උ මතකයක් ඔළුවට එන්නේ නැහැ

ප්‍ර සහරාන් හෂීම් එන්. ටී. ජේ සංවිධානය නායකයා ලෙස ටද ඔබලා හඳුනාගෙන තිබුනේ ?

උ මුලින් නායකයා පස්සේ මං හිතන්නේ .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර පස්සේ කියන්නේ කවදායින් පස්සේද ?

උ මේ ප්‍රහාරයෙන් පස්සේ නායකයා වෙන එක්කෙනෙක් වුනා මෙයා මට මතක නැහැ මොකක්ද එයාගේ නිලය . ඊට පස්සේ ඒ නිලයෙන් තමයි එයා හිටියේ.

ප්‍ර දැන් මේ සහරාන් නායකයා නම් සංවිධානයක නායකයා නම් සංවිධානයේ නායකයා ඉස්සෙල්ලාම මියයාම පිළිබඳව ඔබට බුද්ධි නිළධාරියෙකු ලෙස කුමක්ද කීමට ඇත්තේ ?

උ සාමාන්‍යයෙන් ගත්තොත් මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කිරීමේදි එයාගේ සංවිධානයේ කට්ටියට නම් එයා ආදර්ශයක් දීලා තියෙනවා නමුත් එයාට ඉදිරි කටයුතු කරන්න අවශ්‍යතාවයක් තිබ්බා නම් සමහර විට එයාගේ ඔය ඊට පස්සේ හිටපු නායකයාට දෙන්න ඇති නමුත් මම හිතන්නේ අද ඒ ඔක්කොම ව්‍යාර්ථ වෙලා තියෙනවා මටත් තිබ්බ ප්‍රශ්ණයක් තමයි ඇයි මෙයා මරාගෙන මැරුනේ කියලා මුලිකවම කටයුත්තේදී. නමුත් ඒක සමහර විට සැලැස්මක් අනුව කටයුතු කරන්න ඇති.

ප්‍ර අප්‍රේල් 21 ප්‍රහාරයට ඉස්සෙල්ලා සහරාන් දස වැදෑරුම් කරුණු කාරණා ඉදිරිපත් කරලා දේශණයක් පවත්වලා ඒ මේ කොමිසම හමුවේ ඉදිරිපත්වුනා එහිදී සහරාන් හඳුන්වන්නේ 2019/04/21 ප්‍රහාරයේ කණ්ඩායම මුජයිදින්වරුන් ලෙස මුජයිදීන් වරු කියන්නේ කවුද කියලා ඔබට මෙම කොමිසමට කරුණු කියන්නට පුලුවන්ද ?

උ මුජයිදීන්වරු කියන්නේ අර ඇෆ්ගනිස්ථානයේ අර නිවැරදිද දන්නේ නැහැ ස්වාමීනි මට මතකයෙන් කියන්නේ ඇෆ්ගනිස්ථානයේ ඉන්න ප්‍රහාරකයන් කණ්ඩායමක් තමයි මං හිතන්නේ ඔය මුජයිදීන්වරු ලෙස හැදින්වුයේ. මගේ මතකේ හැටියට එක්කෝ රුසියාවට විරුද්ධව සහ ඇමරිකාවට විරුද්ධව කරපු සටනේදි මට එහෙම නිශ්චිතව කියන්න විදියක් නැහැ ආගමට අදාලවයි ඔක්කෝම කරන්නේ. අර දස වැදෑරුම් එක නම් මම දැන ගත්තේ මාධ්‍යයෙන් ස්වාමීනි මම දැනන් හිටියේ නැහැ ඒ සම්බන්ධයෙන් ඒ කාලේ මම හිටියේ නැති හින්දා.

ප්‍ර මම ඔබට යෝජනා කරන්නට කැමතියි මුජයිදීන්වරු න් කියන්නේ ඔබ කියන දේට අමතරව ඔබ කියන දේ හරි ඉස්ලාම් රාජ්‍යයක් සදහා කරන්නාවූ අරගලයකදී යුද්ධයකදී මිය යන සටන්කාමීන් තමයි මුජයිදීන්වරුන් ලෙස අයි . එස් සංකල්පය ලෙස හඳුන්වන්නේ. එතකොට මුජයිදීන්වරුන්ට අධ්‍යාත්මක ස්පිල්වුවල් ලිඩර්ෂිප් එකක් කවුරුහරි ඉස්ලාම් ආගමික පිලිගත් මවුලවි වරයෙකු වගේ කෙනෙක් ලබා දිය යුතු යි. ඔබගේ විමර්ෂණ වලදි හෙලිවුනාද එහෙම මෙම තරුණ කණ්ඩායමට Spiritual leadership එකක් දිපු කවුරු හරි දේශිය හෝ විදේශිය රටක ඉදගෙන මෙහෙයවපු කිසියම් ඉස්ලාම් ආගමික අධ්‍යාත්මික නායකයකු සිටි බව ?

FAIR COMMENT BY JEZEEM

උ ඔය තව්හිද් ජමාද් එක ඇති වෙන්න හේතුව තමිල්නාඩ් තව්හිද් ජමාද් එකේ ජේනුල් මට අනිත් නම මතක නැහැ එයා තමයි තමිල්නාඩු තව්හිද් ජමාද් එක අනුසාරයෙන් ශ්‍රී ලංකා තව්හිද් ජමාද් එක ලංකාවේ බිහි කලේ එයානම් දෙසැරයක් තුන්සැරයක් ඇවිල්ලා තිබ්බා නමුත් ඊට පස්සේ එන එක තහනම් කරා මගේ මතකයේ හැටියට ඒ ආනුසාරයෙන් තමයි දැන් ඔක පහකට හයකට බෙදිලා ගිහිල්ලා නැෂනල් තව්හිද් ජමාද් එකත් ඇතිවුනේ එතකොට මම හැමදාම මන් දරපු මතය තව්හිද් ජමාද් එකක් ලංකාවට අවශ්‍ය නැහැ. මුස්ලිම් මිනිස්සු පාරම්පරික විදියට අදටත් ජීවත් වෙනවා හෙටත් ජීවත් වෙනව කවදත් ජීවත් වෙනවා තව්හිද් ජමාද් කියන එකක් අවශ්‍ය නැහැ. අවශ්‍ය නම් ඒ ඉන්න නායකයෝ කියන්න ඕනේ ඇයි අත්‍යවශ්‍ය කියලා ඇත්ත වශයෙන්ම ඒක අන්තවාදයට යන්නේ නැහැ යන මතය ඒ ගොල්ලන් කියන්න ඕනේ. අපේ මතය මේකයි කියලා නමුත් සහරාන් ගෙන් පස්සේ ඒක මම Analyze කරපු එකක් තමයි තව්හිද් ජමාද් කියන එකක් අවශ්‍ය නැතිකොට මේ එකක් ඇති කරගෙන අයි. එස් . අයි එස්. පදනම් කරගෙන ඒවා සමාජ ජාලා මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරගෙන යනකොට එතකොට ඒක ලංකාවට ඒක තර්ජනයක් වෙනවා . නමුත් අපි නීත්‍යානුකූලව නීතියට අනුව.තමයි ඒකට දත්ත දෙන්න ඕනේ තහනම් සංවිධානයක් නෙවේනේ ස්වාමිනි ඒ හින්දා මම දැක්ක එකක් තමයි ඔය ඉන්දියාවේ ඉන්න එක්කනා සහරාන්ට අමතරව ඉන්දියාවේ එක්කනා තමයි මගේ මතකයේ හැටියට ඒ ගොල්ලන්ට ඔය ඉන්නේ

ප්‍ර එහෙම නැතුව ලංකාවේ වෙනත් කිසිදු එක්කෙනෙක් පිලිබඳව තොරතුරු වාර්තා වුනාද ?

උ මම හඳුනාගත්තේ නැහැ.

ප්‍ර මෙම සහරාන් ඇතුලු කණ්ඩායම දේශපාලනික වශයෙන් ශ්‍රී ලංකාවේ කිසියම් දේශපාලඥයෙකු හෝ කණ්ඩායමක් සහයෝගයක් ලබා දිලා තියෙන බවට ඔබගේ විමර්ෂ වලදි තොරතුරු හෙලිවෙමින් තිබුනාද ?

උ මට මතකයක් නැහැ ස්වාමිනි නමුත් මට මතකයි මම පොඩ්ඩක් මතකය ආවර්ජනය කරලා කියන්නම් ස්වාමිනි මට මොකක් හරි නමක් මතකයි ඒ නම කියන්නම් මම.

**********

FAIR COMMENT
BY JEZEEM

**<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>**

සාක්ෂිකරුගෙන් වැඩිදුර සාක්ෂි ලබා ගැනිම කල් තබමි.
සාක්ෂිකරුට නැවත පැමිණිය යුතු දිනය දන්වන බව සඳහන් කරමි.
සාක්ෂිකරුට නැවත ජුලි මස 25 වෙනි දින ප. ව. 1.00 ට කොමිෂන් සභාව ඉදිරියේ පෙනි සිටින ලෙසට දන්වමි.
සාක්ෂි කරු මුදාහරිමි.

කොමිෂන් සභාවේ දැන්විම් මත ත්‍රුස්ත විමර්ෂණ හා මර්ධන අංශයෙන් එවන ලද නිල ගොනු නැවතත් ඒ රැගෙන ආ නිළධාරියාට බාර දෙන අතර ජුලි මස 25 වෙනි දින ප. ව. 1.00 ට එය නැවත එම ලේඛණ කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරමි.

එම නියෝගයට අමතරව පොලිස් කොස්තාපල් සිරිවර්ධනට නියෝග කරන්නේ ජුලි මස 24 වෙනි දින උදෑසන 09.00 පසුව විනාඩි 30ටත් අදාල ගොනු මෙම කොමිසමට සහාය දක්වන නීතිපති දෙපාර්තමේන්තුවේ උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සංජීව දිසානායක මහතාට ලැබිමට සලස්වන ලෙසට. කොමිෂම් සභාව ඉදිරියේ අද දිනට නියමිතව සාක්ෂි මෙහෙයවීමට ඇති අනිත් සාක්ෂිකරුගේ සාක්ෂිය මුල සිටම මාධ්‍ය නොමැතිව ලබා ගන්නා බව සඳහන් කරමි.

**********

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM